5.19 In the restaurant 05 (Lobby Lift Landing) (21.04.2019) පැය 08.53.12 (පැ138(22))

5.20 In the restaurant 06 (Ports of Call 1) (21.04.2019) පැය 08.53.13 (පැ138(23))

5.21 In the restaurant 07 (Ports of Call 1) (21.04.2019) පැය 08.51.25 (පැ138(24))

5.22 Entering the Room (3rd F/NW 01) (21.04.2019) පැය 08.30.06 (පැ138(25))

5.23 Leaving the Room (3rd F/NW 01) (21.04.2019) පැය 07.17.40 (පැ138(26))

5.24 Coming back to the restaurant (Lobby Back Door) (21.04.2019) පැය 08.53.16 (පැ138(27))

5.25 In the Restaurant 08 (Ports of Call 1) (21.04.2019) පැය 08.50.52 (පැ138(28))

5.26 In the Restaurant 10 (Ports of Call 03) (21.04.2019) පැය 08.51.25 (පැ138(29))

5.27 In the restaurant 11 (Ports of Call 04) (21.04.2019) පැය 08.51.25 (පැ138(30))

5.28 Leaving the restaurant (Ports of Call 01) (21.04.2019 පැය 08.51.48 (පැ138(31))

5.29 Leaving the restaurant 02 (Lobby Back Door) (21.04.2019) පැය 08.51.48 (පැ138(32))

5.30 Leaving the Hotel 03 (Lobby Entrance) (21.04.2019) පැය 08.53.26 (පැ138(33))

5.31 Leaving the Hotel 04 (Way Coming to Pouch) (21.04.2019) පැය 08.53.50 (පැ138(34))

5.32 Leaving the Hotel 05 (Main Exit) (21.04.2019) පැය 08.54.13 (පැ138(35))

6. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින චූදිතයෙකු වන අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය පැ.148 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත ‘‘ආ’’ උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල සිටින බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

“ආ” උපලේඛනය

6.1 “01.Coming into the mosque.avi” (21.04.2019) පැය 11.57.23 (පැ148(3))

6.2 “02.In the mosque.avi” (21.04.2019) පැය 11.58.04 (පැ148(4))

6.3 “03.Leaving the mosque.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(5))

6.4 “04.Outside the mosque.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(6))

6.5 “05.In the mosque.avi”(21.04.2019) පැය 11.58.04 (පැ148(7))

6.6 “06.In the mosque 2.avi” (21.04.2019) පැය 11.58.04 (පැ148(8))

6.7 “07.Coming-out Staircase.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(9))

6.8 “08. Staircase 2.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(10))

6.9 “09. Praying.avi” (21.04.2019) පැය 14.45.10 (පැ148(11))

6.10 “10. Praying 2.avi” (21.04.2019) පැය 11.58.41 (පැ148(12))

6.11 “11. Quesioning.avi” (21.04.2019) පැය 15.05.45 (පැ148(13))

7. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය කොළඹ 03, ධර්මපාල මාවත, අංක 60/ඒ හි පිහිටි Dinemore අවන්හලෙන් ලබාගත් පහත “ඇ” උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල දිස්වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගැනීමට එකඟ වන බවත්,

“ඇ” උපලේඛනය

7.1 Camera 07 සිසිටීවී කැමරාවෙන් ලබාගත් දර්ශනයේ තිරයේ දිස්වන දිනය සහ වේලාව 19/04/2019 පැය 21:57:47 (පැ 964)

8. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය පැ.148 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "ඈ" උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල සිටින බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

"ඈ" උපලේඛනය

8.1 අංක 11_0[159] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/20 පැය 11:54:58 (පැ.965)

8.2 අංක 12_0[157] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/20 පැය 12:22:23 (පැ.966)

8.3 අංක 6_0[152] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/21 පැය 06:24:47 සහ පැය 06:51:28 (පැ.967)

9. පැ.116, පැ.138, පැ.148 සහ පැ 124 ලෙස සලකුණු කර ඇති සංයුක්ත තැටිවල අන්තර්ගත සිසිටීවී දර්ශන නරඹා එම දර්ශනවල දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් දර්ශනය වන බවට සුල්තාන් ඔමර් කත්තා (පැ.සා. 1365) සහ ඔමර් කත්තා අක්බර් අලි (පැ.සා. 2214) යන අය විසින් මේ වන විටත් හඳුනාගෙන ඇති බව එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්, පවසා එය වාර්තා කර ඇත.

අපරාධ නඩුවකදී පිළිගත් කරුණක් යලි ඔප්පු කර සිටීම කිසිසේත් අවශ්‍ය වන්නේ නැත. ඒ බවට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 (2) වගන්තිය යටතේ පහත පරිදි පැහැදිලිව සඳහන් කර ඇත.

> ***"It shall not be necessary in any summary prosecution or trial on indictment for either party to lead proof of any fact which is admitted by the opposite party or to prove any documents the authenticity and terms of which are not in dispute and copies of any***

documents may by agreement of the parties be accepted as equivalent to the originals. Such admissions may be made before or during the trial. Such admissions shall be sufficient proof of the fact or facts admitted without other evidence."

ඉහත සඳහන් නෛතික තත්වය ***Rajendran Sajusani Pradarshani v The Attorney General.CA 311/2009 (High Court of Colombo Case No. HC 1929/2004)*** යන 2018 අගෝස්තු 03 දින ප්‍රකාශ කර ඇති අධිකරණ තීන්දුවේ දී ගරු තුරෙරාජා විනිසුරුතුමා පෙන්වා දී ඇති කරුණු මා මෙම නඩුව සම්බන්ධයෙන් ද අදාළ කර ගනිමි. එමෙන්ම ***W.H.Thulyananda Senananda v AG (C.A. (P.H.C) APN 28/2014 H.C. Colombo HCR 17/2014 MC KADUWELA B55620/ (55056)*** යන 2014.7.7 දිනැති අධිකරණ තීන්දුවේ දී සලාම් විනිසුරුතුමා පෙන්වා දී ඇති

" It is important to note that the commission of the offence is not proved with the making of this purported admission. Once an admission is recorded

according to law, the prosecution has to prove the other ingredients of the offence.

"The purpose of recording an admission is to dispense with the burden of proving any fact or to prove the authenticity of any document at the trial." (පිටුව 10)

ඉහත කී විනිශ්චතා අධිකරණ තීන්දුවල හරයන්ද සැලකිල්ලට ගෙන ඒ අනුව අප විසින් ඉහත සඳහන් කර ඇති පරිදි මෙම නඩුවේ දෙපාර්ශවය විසින් ලිඛිතව දෙපාර්ශවයේ එකඟතාවයෙන් යුතුව මෙම අධිකරණයේ ගොනුකර ඇති සියලු පිළිගැනීම් වලට අදාළ කරුණු මෙම අධිකරණය ඉදිරියේ ඔප්පු වූ කරුණු ලෙසට මෙම තීංදුව සඳහා අදාළ කර ගනිමු.

<u>කොටහේන ශාන්ත අන්තෝනි මුණිඳුන්ගේ දේවස්ථානයේ</u>

<u>තුවාල ලැබූවන් සම්බන්ධයෙන් චෝදනා</u>

අධිචෝදනා පත්‍රයේ සඳහන් 7746 වන චෝදනාවේ සිට 11370 වන (17 වන චූදිත මිය යාම මත ඔහුට එරෙහිව ඇති චෝදනාවන් ඉවත් කරන ලදී) දක්වා වූ චෝදනාවන් සියලුම චූදිතයන්ට එරෙහිව ගොනුකර ඇත්තේ; වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 21 වන දින හෝ ඊට ආසන්න දිනයක දී ඉහත

පළමු චෝදනාවේ සඳහන් ක්‍රියා කලාපයේ දී කොටහේනදී දැනට මියගොස් සිටින අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් විසින් අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමෙන් වරද සිදු කළ බව ද, එකී වරද සිදු කරන අවස්ථාවේදී පහත වගුවේ නම් සඳහන් පුද්ගලයන් හට පහර දුන් බවත් එම අවස්ථාවේ දී එකී තැනැත්තන්ට තුවාල සිදු වූ බැවින්, දැනට මියගොස් සිටින එකී අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා (දැනට මියගොස් සිටින17 වන චූදිත හැර) ඉහත අධි චෝදනා පත්‍රයේ සඳහන් 1 සිට 25 දක්වා සෙසු සියලුම චූදිතයන් දැනට මියගොස් සිටින අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් යන අයට අනුබල දුන් බැවින් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

ඉහත චෝදනා අතුරින් කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ තුවාල ලැබූවන් සම්බන්ධයෙන් දැනට මියගොස් සිටින 17 වන චුදිතට එරෙහිව පහත අංක දරන අධි චෝදනා 17 වන චූදිත මියයාම මත ඉවත් කර ගන්නා ලදි. (7762, 7787, 7812, 7837, 7862, 7887, 7912, 7937, 7962, 7987, 8012, 8037, 8062, 8087, 8112, 8137, 8162, 8187, 8212, 8237, 8262, 8287, 8312, 8337, 8362, 8387, 8412, 8438, 8462, 8487, 8512, 8537, 8562, 8587, 8612, 8637, 8662, 8687, 8712, 8737, 8762, 8787, 8812, 8837, 8862, 8887, 8912, 8937, 8962, 8987, 9012, 9037, 9062, 9087, 9112, 9137, 9162, 9187, 9212, 9337, 9262, 9287, 9312, 9337, 9362, 9387, 9412, 9437, 9462, 9487, 9512, 9537, 9562, 9587, 9612, 9637, 9662, 9687, 9712, 9737, 9762, 9787, 9812, 9837, 9862, 9887, 9912, 9937, 9962, 9987, 10012, 10037, 10062, 10087, 10112, 10137, 10162, 10187, 10212, 10237, 10262, 10287, 10312, 10337, 10362, 10387, 10412, 10437, 10462, 10487, 10512, 10537, 10562, 10587, 10612, 10637, 10662, 10687, 10712, 10737, 10762, 10787, 10812, 10837, 10862, 10887, 10912, 10937, 10962, 10987, 11012, 11037, 11062, 11087, 11112, 11137, 11162, 11187, 11212, 11237, 11262, 11287, 11312, 11337, 11362)

ඉහත සඳහන් පරිදි සමස්තයක් ලෙස 2019.04.21 පාස්කු ඉරිදා දින කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ 2019.04.21 දින සිදුවූ සිද්ධියෙන් තුවාල වීමට ලක් වූ අධි චෝදනා පත්‍රයේ නම් සඳහන් පුද්ගලයින්ගේ නිසි පරිදි වෛද්‍ය පරීක්ෂණයන් ට ලක් කර ඇති බව එක් එක් තුවාලකරුගේ වෛද්‍ය වාර්තාවන් එකී තුවාල කරුවන් සහ ඔවුන් ව පරීක්ෂා කරන ලද වෛද්‍යවරුන් සාක්ෂියට නොකැඳවා සාක්ෂි ලෙස පිළිගැනීමට මෙම නඩුවේ සියලුම චූදිතයින් විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 414 සහ 420 වගන්ති ප්‍රකාරව පිළිගැනීම් ලෙස වාර්තා කර ඇති බැවින් එකී කරුණු සියල්ල ඔප්පු වූ කරුණු වන බැවින් ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සාක්ෂි මෙහෙයවීමක් මෙම නඩුවේ දී අවශ්‍ය වන්නේ නැත.

2019.04.21 වන පාස්කු ඉරිදා දින ස්වයංඝාතක බෝම්බ පිපිරීම් 8 ක් දිවයිනේ විවිද ස්ථාන වල සිදුකර ඇති අතර එම ස්ථානයන් වන්නේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, කටුවාපිටිය මීගමුව ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, කොළඹ කිංග්ස්බරි හෝටලය, කොළඹ ෂැංග්‍රිලා හෝටලය (බෝම්බ පිපිරීම් 2ක්), කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, මඩකලපුව සියෝන් දෙවස්ථානය, දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලය යන ස්ථානයන් වේ. මෙම නඩුවේ පැමිණිල්ලෙන් සාක්ෂි මෙහෙයවීමේ දී එක් එක් ස්ථානයට අදාළව මියගිය අය සහ තුවාල කරුවන් සම්බන්ධව සහ අදාළ අපරාධ ස්ථානයන් සම්බන්ධ විමර්ශනයන්

සම්බන්ධයෙන් වෙන වෙනම සාක්ෂි මෙහෙයවීමක් සිදුකර ඇත. ඒ අනුව ඒ අනුව එකී සාක්ෂි වෙන් වෙන් ව ගෙන අප විසින් සළකා බලන ලදී.

2023.10.10 දින පැමිණිල්ල වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල්තුමිය මෙම නඩුවේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කිරීමට ප්‍රථමයෙන් කෙටි ආරම්භක දේශනයක් ඉදිරිපත් කරන ලද අතර ඉන් අනතුරුව නඩුවේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් සක්ෂිකරුවන් 547ක් කැඳවා නඩු භාණ්ඩ පැ-1 සිට පැ.2076ක් ලකුණු කරමින් 2026-8-13 දින පැමිණිලේ නඩුව අවසන් කරන ලදී.

එම අවස්ථාවේ මෙම නඩුවේ සියලුම චූදිතයින්ගෙන් ඔවුන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් විත්ති වාචකය කැඳවීමට අප විසින් තීරණය කරන ලද අතර ඒ අනුව ඔවුන්ට අවශ්‍යනම් සාක්ෂිකූඩුවට පැමිණ සාක්ෂි ලබා දිය හැකි බව සහ ඔවුන් වෙනුවෙන් සාක්ෂි කැඳවියහැකි බව ද එසේම ඔවුන්ට අවශය නම් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කල හැකි බව සහ එවන් ප්‍රකාශවල සාක්ෂිමය වටිනාකම සම්බන්ධ නෛතික තත්වය ද පහදා දෙන ලද අතර ඔවුන්ට අවශය නම් විත්තිකූඩුවේ නිහඩව නිශ්ෂබ්දව සිටීමට ඇති අයිතිවාසිකම ද ඇතුළුව ඔවුනට ව්‍යවස්ථාපිතව උරුම වී ඇති සියලු අයිතිවාසකම් අප විසින් අධිකරණයේ දමිළ භාෂා පරිවර්තක මහතා මගින් විස්තරාත්මකව පහා දා දෙන ලදී. එසේම ඔවුන් ගන්නා ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් මනාව

කරුණු සලක බලා අධිකරණයට පැවසීම සඳහා ප්‍රමාණවත් කලයක් ලබා දෙමින් මෙම නඩුව පසුදින එනම් 2026-8-14 දින කැඳවීමට නියම කරන ලදී.

මෙම නඩුව 2026-8-14 දින කැඳවන ලද අවස්ථාවේ 06 වූදිත හැර අනෙකුත් සියලුම වූදිතයින් විත්ති කූඩුවේ සිට ප්‍රකාශයන් කරන බවට පවසා සිටින ලදී. එසේම ඔවුන් වෙනුවෙන් සාක්ෂිකරුවන් ද කැදවන බවට දන්වා සිටින ලදී. 06 වූදිත පමණක් තමා විත්තිකූඩුවේ නිහඬව සිටින බවට දන්වා සිටින ලදී. මෙම නඩුවේ සියලුම වූදිතයින් බන්ධනාගාරගතව සිටින බැවින් ඔවුනට විත්තියේ නඩුව සඳහා සූදානම් වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම සුදුසු බවට අප විසින් තීරණය කරමින් මෙම නඩුවේ විත්තියේ විභාගය සඳහා 2026-8-17 දිනට නියම කරන ලදී. එදින වූදිතයින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කිරීම ආරම්භ කරන ලද අතර 2026-8-20 දින වූදිතයින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කිරීම අවසන් කරන ලදී.

ඉන් පසු විත්තියේ සාක්ෂිකරුවන් කැඳවීම 2026-8-24 දින අවසන් කරමින් මෙම නඩුවේ විත්තියේ විභාගය අවසන් කරන ලදී.ඉන්පසු අවස්ථා කීපයක දී දෙපාර්ශවය විසින් ම මෙම නඩුවේ නීතිඥයින් වල යතුරුලියන දෝශයන් නිවැරදි කරන ලදි.

මෙම නඩුවේ දෙපාර්ශවය විසින් ඔවුන්ගේ ලිඛිත දේශණ 2026-9-8 සහ 9 දිනයන් හි ගොණු කරන ලද අතර අප විසින් මෙම තීංදුව සකස්

කිරීමේ දී එකී සියලු ලිඛිත දේශණයන් හි අඩංගු කරුණු ද විනිශ්චිත අධිකරණ තීන්දුවල හරයන් ද අපගේ සැලකිල්ලට ගන්නා ලදී.

<u>ඔප්පුකිරීමේ භාරය සහ නිර්දෝෂීබවේ පූර්ව නිගමනය</u>

මෙම නඩුවේ පැමිණිල්ල විසින් සහ විත්තිය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි විශ්ලේෂණය කොට ඇගයීමට ලක් කිරීමට ප්‍රථම අප මෙවන් අපරාධ නඩුවකදී අනුගමනය කල යුතු සුවිශේෂ වූ නෛතික සිද්ධාන්ත කෙරෙහි අපගේ අවධානය යොමු කරමු. ඒ අතුරින් සුවිශේෂ සිද්ධාන්තයක් ලෙස විත්තිකරුවන්ගේ නිර්දෝෂිභාවයේ පූර්ව නිගමනය (Presumption of Innocence) රන් හුයක්සේ අපගේ අපරාධ නීති ජාලය පුරාම දිවෙන ආකාරය අප අවධාරණය කරමු. එකී පසුබිම තුල පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් ප්‍රභල සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණිල්ල අපොහොසත් වුවහොත් විත්තිවාචක නොකැඳවාම වූදිතයින්ව නිදොස් කොට නිදහස් කල යුතුය. එසේම පැමිණිල්ල විසින් ප්‍රභල නඩුවක් ගොඩනගා ඇති බවට මෙම අධිකරණයට පෙනී යන්නේ නම් පමණක් විත්තියේ සාක්ෂි සළකා බැලීම සිදුකල යුතුය.

මෙම නඩුවේ වූදිතයින් සියලු දෙනාම විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කර ඇති අතර එම ප්‍රකාශයන් මනාව සළකා බැලීම අපගේ වගකීම වන අතර එකී ප්‍රකාශයන් මගින් පැමිණිල්ලේ නඩුකරය සම්බන්ධයෙන් යම්

සාධාරණ සැකයක් මතුකරන්නේ නම් එම සැකයේ වාසිය විත්තියට ලබා දිය යුතු බව අප දනිමු. එසේම මෙම නඩුවේ ඇතැම් චූදිතයින් වෙනුවෙන් විත්තියේ සාක්ෂි ද කැදවන ලද අතර එම සියලුම සාක්ෂි ද මනාව සළකා බැලීම අප විසින් සිදුකල යුතු බව ද අපගේ වගකීම බව අප දනිමු.

<u>චූදිතයින් වෙනුවෙන් නීතීඥවරුන් පෙනී සිටීම</u>

මෙම නඩුවේ චූදිතයින්ට අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන් සිංහල සහ දමිළ භාෂාවලින් කියවා පැහැදිලි කර දුන් අවස්ථාවේ ඔවුන් වෙනුවෙන් නිසි පරිදි නීතීඥ පෙනී සිටීමක් සිදු කරන ලද අතර ඉන් අනතුරුව මෙම නඩුව ප්‍රථමයෙන්ම විභාගයට ගත් 2023.10.10 දින සිට මෙම නඩුව වැඩිදුර විභාගයට ගත් 2026.01.12 වන දින දක්වා සියලු චූදිතයන් වෙනුවෙන් නිසි පරිදි නීතීඥවරු පෙනී සිටි අතර 2026.01.12 දින මෙම නඩුවෙහි 12 සහ 13 චූදිතයන් හැර අනිකුත් චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතීඥවරුන් එදින වන විට අධිකරණය ඉදිරියේ පැවති 08 වන චූදිත විසින් පැ.සා.2095 සහකාර පොලිස් අධිකාරී විජිත පෙරේරා යන අයට ලබා දුන්නා යැයි පවසන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16 (1) වගන්තියට අදාළ පාපෝච්චාරණයක් හා සම්බන්ධ ශක්‍යතා අතුරු පරීක්ෂණය පවත්වා අවසන් වනතුරු පමණක් තමන්ලා චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින බවත් මෙම නඩුව දිනපතා විභාගයට ගැනීමට නියම කර ඇති බැවින් තමාලාට එලෙස දිනපතා නඩු විභාගය සඳහා මෙම

අධිකරණයට පැමිණීමට නොහැකි බව දන්වා ඔවුන් මෙම මෙම නඩුවේ චූදිතයින් වෙනුවෙන් පෙනී සිටීමෙන් ඉවත්වන ලදී.

ඒ අනුව මෙම නඩුවෙහි 12 සහ 13 චූදිතයන් හැර අනිකුත් සියලුම චූදිතයන්ට ඔවුන් කැමති නීතීඥවරුන්ගේ සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අවස්ථාව ලබා දුන් අතර ඒ සඳහා චූදිතයින්ගේ ආසන්නම ඥාතීන් සමඟ දුරකථනයෙන් සම්බන්ධ වී කරුණු සාකච්ඡා කිරීමට සහ චූදිතයන්ගේ ආසන්නම ඥාතීන්ට චූදිතයින් මුණගැසී කරුණු සාකච්ඡා කිරීමට ඉඩ ලබා දෙන ලෙසට අධිකරණය මඟින් ඔවුන් රඳවා සිටින බන්ධනාගාර අධිකාරීවරුන්ට නියෝග කර ඇති අතර ඒ අනුව ඒ සඳහා අධිකරණ නියෝග ප්‍රකාරව චූදිතයන්ට අවස්ථාව ලබා දුන් බවට අදාළ බන්ධනාගාර අධිකාරීවරුන් විසින් මෙම අධිකරණයට ලිඛිතව දැනුම් දී ඇත.

තවද 2026.01.20 දින මෙම අධිකරණය මඟින් නියෝග කර ඇත්තේ මෙම නඩුවෙහි නීතීඥ නියෝජනයක් නොමැති චූදිතයින් සඳහා රජයේ වියදමින් නීතීඥවරුන් පත් කිරීම සළකා බැලීම සඳහා සුදුසු නීතීඥවරුන්ගේ විස්තර මෙම අධිකරණයට එවන ලෙසට ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපතිවරයා වෙතද මෙම අධිකරණය මඟින් ලිඛිතව දැනුම් දී ඇති අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතීඥ සංගමය මඟින් මෙම අධිකරණයට දැනුම් දී ඇත්තේ ඒ සම්බන්ධයෙන් නීතීඥවරුන් වෙත දැනුම්

දීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බවයි. ඒ අනුව අධිකරණය මඟින් යලිත් වතාවක් ශ්‍රී ලංකා නීතීඥ සංගමය වෙත ඒ සම්බන්ධයෙන් යලි දැනුම් දීමක් කර ඇති අතර එසේම, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව වෙත ද, කොළඹ මහාධිකරණයේ නීතීඥ සංගමය වෙතද අධිකරණය මඟින් දැනුම් දී ඇති අතර චූදිතයන්ට ඔවුන්ගේ ආසන්න ඥාතීන් සමඟ කරුණු සාකච්ඡා කර නීතීඥ සහාය ලබා ගැනීමට තවදුරටත් අධිකරණය මඟින් දැනුම් දෙන ලද අතර 2026.01.26 වන දින මෙම නඩුවෙහි 01 සහ 10 චූදිතයන් වෙනුවෙන් නඩුව ආරම්භයේ සිටම රජයේ වියදමින් පත් කරන ලද නීතීඥ මහතා ද අධිකරණය අමතමින් තමාට එම චූදිතයන් දෙදෙනා වෙනුවෙන් තවදුරටත් පෙනී සිටීමට අපහසු බවට පවසා එකී චූදිතයින් වෙනුවෙන් පෙනීසිටීමෙන් ඉවත්වීමට අවසර ඉල්ලා සිටීම මත එම නීතීඥ මහතා 01 සහ 10 චූදිතයන් වෙනුවෙන් කර ඇති පත් කිරීම අධිකරණය මඟින් අවලංගු කරන ලදි.

ඒ අනුව එම චූදිතයන් ඇතුළුව 12 සහ 13 චූදිතයින් හැර අනිකුත් සියලුම චූදිතයන්ට ඔවුන්ගේ වියදමින් නීතීඥ සහාය ලබා ගන්නා ලෙස යලිත් දැනුම් දීම් කරන ලද අතර චූදිතයන්ට ඔවුන්ගේ ආසන්නම ඥාතීන් සමඟ දුරකථනයෙන් අමතා ඔවුන්ට නීතීඥ සහාය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට තවදුරටත් අධිකරණයෙන් අවස්ථාව ලබා දෙන ලදි. ඒ සඳහා සියලුම චූදිතයින් ට අවශ්‍ය සහය ලබා දෙන ලෙසට ඔවුන්ව රඳවා සිටි බන්ධනාගාරවල අධිකාරීවරුන්ට නියෝග කරන ලදී.

පසුව මෙම නඩුවේ චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂම නියෝජනය කරමින් පැමිණි නීතීඥවරයෙකු 04 වන චූදිත වෙනුවෙන් රජයේ වියදමින් පත් කරන ලද අතර එසේම, අනිකුත් චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂම වෙනුවෙන් නීතීඥවරුන් කීපදෙනෙකු අධිකරණයට පැමිණ ඉදිරිපත් වුව ද එම අවස්ථාවේ චූදිතයින් ඔවුන්ට රජයේ වියදමින් නීතීඥ සහාය අවශ්‍ය නොවන බවට අධිකරණයට දැනුම් දී රජයෙන් පත් කරන ලද නීතීඥවරුන්ගේ සහය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව චූදිතයන් හට යලිත් වතාවක් ඔවුන් කැමති නීතීඥවරුන්ගේ සහාය ලබා ගැනීමට පියවර ගන්නා ලෙසට අධිකරණය මඟින් දැනුම් දී ඇති අතර 04 වන චූදිත වෙනුවෙන් පෙනී සිටින නීති ආධාර කොමිෂමෙන් පැමිණි නීතීඥ මහතාගේ සේවය ද තමාට අවශ්‍ය නොවන බවත් තමාගේ නඩුව තමා විසින්ම පවත්වාගෙන යන බවට 04 වන චූදිත අධිකරණයට පවසා සිටි අතර එසේම, චූදිතයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා අධිකරණයට පැමිණ සිටි නීති ආධාර කොමිෂම නියෝජනය කරමින් පැමිණි නීතීඥවරුන්ගේ සහායද තමාලාට අවශ්‍ය නොවන බවට චූදිතයන් විසින් එකහෙලාම පවසා සිටින ලදී. ඒ අනුව චූදිතයන් ඔවුන් විසින් වෙනත් නීතීඥවරුන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු නොකරන්නේ නම් අපරාධ නඩුවක් වන මෙම නඩුවේ චූදිතයන්ටම ඔවුන්ගේ නඩුව ඉදිරියට

පවත්වාගෙන යාමට වගකීමක් තිබෙන බවට අධිකරණය මඟින් චූදිතයන්ට කරුණු පහදා දෙන ලදි.

ඒ අනුව යළිත් වතාවක් චූදිතයන්ට ඔවුන් කැමති නීතීඥවරුන්ගේ සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මාසයකට ආසන්න කාලයක් අධිකරණය මඟින් වරින් වර කල් ලබා දී ඇති පසුබිම සැලකිල්ලට වෙනත් විකල්පයක් ද නොමැති බැවින් අඩක් විභාගයට ගෙන ඇති මෙම නඩුව 2026.02.09 වන දින සිට දිනපතා විභාගයට ගන්නා බවට චූදිතයන්ට අධිකරණය මඟින් දැනුම් දෙන ලද අතර 2026.02.09 වන දිනද චූදිතයන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඔවුන් කැමති නීතීඥවරු පත් කරගැනීමට පියවර ගෙන නොතිබීම සහ ඔවුන්ට සහාය දීම සඳහා රජයේ වියදමින් නීතීඥ සහය අවශ්‍ය නොවන බවට දන්වා සිටීමද ඔවුන්ට නීතීඥ සහාය ලබා දීම සඳහා නීති ආධාර කොමිෂන් සභාව නියෝජනය කරමින් අධිකරණයට පැමිණි නීතීඥවරුන්ගේ සහාය ද තමාලාට අවශ්‍ය නොවන බවට චූදිතයන් විසින් දැනුම් දීම මත චූදිතයන්ට ඔවුන්ගේ නඩුව ඔවුන් විසින්ම පවත්වාගෙන යාමට සිදු වන බවට තව දුරටත් කරුණු පහදා දී ඒ සඳහා චූදිතයන්ට තවත් අවස්ථාවක් ලබා දෙමින් මෙම නඩුවේ වැඩිදුර විභාග කටයුතු 2026.02.11 දිනට නියම කරන ලදි.

2026.02.09 දින ද මෙම නඩුවෙහි 12 සහ 13 හැර අනිකුත් සියලුම චූදිතයන් ඔවුන් වැඩිදුර නඩු විභාගය සඳහා සූදානම් නොමැති බවට

අධිකරණයට දැනුම් දී ඇති අතර එකී කරුණු සළකා බලා එදින මෙම නඩුවේ සාක්ෂි ලබා දීම සඳහා පැ.සා.2140 උපුල් රාජකරුණා යන මහාධිකරණ විනිසුරුවරයා අධිකරණයට පැමිණ සිටියද එම සාක්ෂිකරුගේ සාක්ෂි ලබා නොගෙන මුදවා හැරීමට අධිකරණයට සිදු වී ඇත. ඉන් අනතුරුව මෙම නඩුව 2026.02.11 දින වැඩිදුර විභාගය සඳහා ගන්නා ලද අවස්ථාවේදී 12 සහ 13 වූදිතයන් වෙනුවෙන් පමණක් නීතීඥ රවිදු යසස් මහතා පෙනී සිටි අතර අනිකුත් සියලුම වූදිතයින් වෙනුවෙන් නීතීඥවරු පෙනී නොසිටි අතර එම වූදිතයින් ඔවුන් තමන් වෙනුවෙන්ම නඩු විභාගය සඳහා පෙනී සිටින ලදි. ඒ අනුව එදින නඩුව වැඩිදුර විභාගයට ගන්නා ලද අතර එදින සිට මෙම නඩුවට අදාළව මෙම තීන්දුවේ ඉහත අවස්ථාවක විස්තරාත්මකව සඳහන් කර ඇති පිළිගැනීම් වාර්තාකල 2026.4.24 දින දක්වා මෙම නඩුවේ 12 සහ 13 වූදිතයන් හැර අනිකුත් සියලුම වූදිතයින් ඔවුන් විසින් ඔවුන් වෙනුවෙන්ම පෙනී සිටීමින් පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීම ඔවුන් විසින්ම සිදු කරමින් අතුරු පරීක්ෂණ සඳහා ඔවුන් වෙනුවෙන් සාක්ෂි ඔවුන් විසින්ම කැඳවමින් නඩු විභාග කටයුතු පවත්වාගෙන යන ලදි.

කෙසේ වෙතත් 2026.4.23 දින මෙම නඩුවේ 12 සහ 13 වූදිතයින් වෙනුවෙන් පෙනී සිටි නීතීඥ රවිදු යසස් මහතා හට මෙම නඩුවට අදාළව සීමිත පිළිගැනීම් වාර්තා කිරීමේ කාර්‍ය සඳහා පමණක් සියලුම වූදිතයින් වෙනුවෙන් පෙනී සිටින ලෙසට සියලු වූදිතයින්ගෙන් ලද ලිඛිත සහ වාචික

උපදෙස් මත නඩුවට අදාළව ඉදිරිපත් කර ඇති චෝදනාවල සඳහන් විත්දිත තැනැත්තන් හා තැනැත්තියන් මියගිය බව සහ ඔවුන්ගේ අනන්‍යතාවයන් ද නඩුවට අදාළ තුවාලකරුවන් සම්බන්ධ විස්තර සහ ඔවුන්ට අදාළ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ වෛද්‍ය වාර්තාවන් ද හඹ නොකරන බව පවසා විත්තිය පිළිගෙන ඇති අතර ඒ අනුව විස්තරාත්මක ලිඛිත පිළිගැනීම් දෙපාර්ශවය විසින් ම අත්සන් තබා 2026.4.30 දින අධිකරණයේ භාෂණ පරිවර්තක සාක්ෂියට කැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය ප්‍රකාරව අදාළ ලිඛිත පිළිගැනීම් ඔහු මගින් විධිමත් ව ලකුණු කරන ලදී. අදාළ පිළිගැනීම් එක් එක් බෝම්බ ප්‍රහාරයන් නිසා මියගිය සහ තුවාල ලැබූ අය සම්බන්ධයෙන් වන අතර එකී සියලු පිළිගැනීම් අප විසින් ඒ ස්ථානයන්ට අදාළ අනෙකුත් සාක්ෂි ද සමග වෙන් වෙන් ව ගෙන අප විසින් සළකා බලන ලදී .

ඒ අනුව 2019.04.21 දින මෙම නඩුවට අදාළ සිද්ධීන් සිදු වූ බව සහ එකී සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස අධි චෝදනාපත්‍රයේ සඳහන් මරණකරුවන් මිය ගොස් තිබීම සහ අධිචෝදනා පත්‍රයේ සඳහන් තුවාලකරුවන්ට තුවාල සිදුවී තිබීම විත්තිය හඹ නොකර පිළිගෙන ඇති බැවින් අදාළ චෝදනාවන් ට අදාළ අනිවාර්යයෙන් ඔප්පු කලයුතු සංඝටකයන් අතුරින් 2019.04.21 සිදු වූ සිද්ධීන් ස්වයංඝාතක බෝම්බ ප්‍රහාරයන් බව සහ එකී ස්වයංඝාතක බෝම්බ පිපිරවීම් සිදු කරන ලද්දේ දැනට මියගොස් සිටින අලවුදීන් අහමද් මුආත් හෙවත් මුවාත්,

අච්චිමොහොමඩ් මොහම්ඩ් හස්තූන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන්, මුහ්හමදු හාසිම් ජහරාන් හෙවත් මොහොමඩ් කාසිම් ජහරාන් හෙවත් මුහම්මදු කාසිම් මොහොමඩ් ජහරාන් හෙවත් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්, මොහොමඩ් ඊබ්‍රාහීම් ඉල්හාම් මොහොම්ඩ්, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්, මොහම්ඩ් ඊබ්‍රාහිම් ඉන්සාෆ් අහම්ඩ් හෙවත් මොහම්ඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහම්ඩ්, අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයම බවට සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුකිරීම සිදුකල යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින් ම වේ.

තවද මෙම නඩුවේ පළමු වන අධිචෝදනාවේ සහ වෙනත් අධිචෝදනාවල නම් සඳහන් දැනට මියගොස් සිටින අලවුදීන් අහමද් මුආත් හෙවත් මුවාත්, අච්චිමොහොමඩ් මොහම්ඩ් හස්තූන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන්, මුහ්හමදු හාසිම් ජහරාන් හෙවත් මොහොමඩ් කාසිම් ජහරාන් හෙවත් මුහම්මදු කාසිම් මොහොමඩ් ජහරාන් හෙවත් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්, මොහොමඩ් ඊබ්‍රාහීම් ඉල්හාම් මොහොම්ඩ්, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්, මොහම්ඩ් ඊබ්‍රාහිම් ඉන්සාෆ් අහම්ඩ් හෙවත් මොහම්ඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහම්ඩ්, අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් සහ මොහොමඩ් කාසිම් මොහොම්ඩ් කාසිම් මොහොම්ඩ් රිල්වාන්, මොහොමඩ් කාසිම් මොහොම්ඩ් ෂෙයිනි හෙවත් ෂෙයිනි මවුලවි, සහ අහමදු ලෙබ්බෙ

මොහොමඩ් නියාස් යන පුද්ගලයින්ගේ අනන්‍යතාවය ඔප්පුකිරීම සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි කැඳවීමකින් තොරව එකී පුද්ගලයින්ගේ අනන්‍යතාවයන් සියලුම චූදිතයින් ගේ එකඟත්වය මත එකී පිළිගැනීම් වාර්තා කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරුන්ගේ පිළිගැනීම හේතු කොටගෙන එකී කරුණු 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය ප්‍රකාරව පිළිගැනීම් ලෙස 2026.7.10 දින ද දෙපාර්ශවය විසින් ම අත්සන් තබා අධිකරණයේ භාෂණ පරිවර්තක සාක්ෂියට කැඳවා ඔහු මඟින් විධිමත් ව ලකුණු කරන ලදී. කෙසේ වෙතත් ඉහත කී පුද්ගලයින් මියගියේ ඔවුන් විසින් ම සිදු කරන ලද ස්වයංඝාතක බෝම්බ පිපිරවීම් නිසාම බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීම පැමිණිල්ලේ වගකීම වේ.

ඉහත පරිදි පිළිගැනීම් වාර්තා කිරීමෙන් පසුව යලිත් මෙම නඩුවේ 12 සහ 13 චූදිතයින් හැර අනෙකුත් චූදිතයින් වෙනුවෙන් නීතිඥ පෙනී සිටීමක් නොමැතිව ඔවුන් විසින් ම පෙනී සිටිමින් ඔවුන්ගේ නඩු කටයුතු පවත්වාගෙන ගිය ද පසුව මෙම නඩුවේ 2, 7, 8, 10, 15 18 සහ 19 චූදිතයින් වෙනුවෙන් නඩුවිභාගය අවසානය දක්වා ම නීතිඥ විමුක්ති රාජපක්ෂ මහතා සමඟ නීතිඥ කනිල් මද්දුමාගේ මහතා පෙනීසිටින ලදී. එසේම 20 සිට 25 දක්වා චූදිතයින් වෙනුවෙන් නීතිඥ ඇඩම් හාලේ මහතා සමඟ නීතිඥ සංජීව රුවන්පතිරණ මහතා මෙම නඩුව අවසන් වන තුරු පෙනී සිටින ලදී.

ඒ අනුව මෙම නඩුවේ විත්තියේ නඩු විභාගය ද අවසන් වූ 2026-8-24 දින දක්වා ම 2, 7, 8, 10, 12, 13, 15, 18, 19, 20, 21, 22, 23, 24, 25 යන චූදිතයින් වෙනුවෙන් ඉහත පරිදී නීතිඥවරුන් පෙනී සිටින ලද අතර 1, 3, 4, 5, 6, 9, 11, 14 සහ 16 චූදිතයින් නීතිඥ සහය ලබා නොගෙන ඔවුන් විසින් ම ඔවුන්ගේ නඩු විභාගය පවත්වාගෙන යන ලදී. එලෙස නීතිඥ සහය ලබා නොගෙන තමන්ලා විසින් ම නඩු කටයුතු පවත්වාගෙන ගිය චූදිතයින්ට අවශ්ය සියලු ලිපි ද්‍රව්‍ය නඩු විභාගය අවසානය දක්වාම අධිකරණයෙන් නොමිලේ ලබා දෙන ලද අතර ඔවුනට මෙම නඩුවට අදාළ සියලුම නීති කෘතීන් වල පිටපත් ද ගාස්තුවෙන් තොරව එකී චූදිතයින්ට ලබා දීමට අප පියවර ගන්නා ලදී. එසේම 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් මෙම නඩුවේ පැමිණිල්ලෙන් කැඳවන ලද සියලුම සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි වල සාරාංශය සහ අන්තර්ඝතය ද විත්තියේ සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි සියල්ලේම සාරාංශය සහ අන්තර්ගතය ද නීතිඥ සහය ලබා නොගෙන සිය නඩු විභාගය පවත්වාගෙන ගිය 1, 3, 4, 5, 6, 9, 11, 14 සහ 16 චූදිතයින්ට මෙම අධිකරණයේ දමිළ භාෂණ පරිවර්තක මහතා මඟින් සමකාලීනව යලි පැහැදිලි කර පහදා දීමට අප විසින් පියවර ගන්නා ලදී.

මෙවන් අපරාධ නඩුවක ඉදිරිපත් කර ඇති සාක්ෂි සළකා බැලීමේ දී අධිකරණය එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිළිගත හැකිභාවය සළකා බැලීමේ දී සාක්ෂි විශ්ලේශනයේ දී පොදුවේ භාවිතා වන අප්‍රමාදිත්වය,

ඒකාකාරීභාවය, වියහැකිභාවය ඇතුළු පරීක්ෂාවන් යොදා ඇගයීමට ලක් කල යුතු අතර සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මත පරස්පරතාවන් ලකුණු කර තිබීම හෝ ඌණතාවන් අධිකරණයේ අවධානයට ලක් කර ඇති විට ඒවා වෙන් වෙන්ව සළකා බලා ඒවා මඟින් අදාළ සාක්ෂිකරුගේ සාක්ෂියෙහි සහ පැමිණිල්ලේ නඩුවේ හරයටම යම් බලපෑමක් සිදුවන්නේ ද? යන්න අප විසින් මනාව සළකා බැලිය යුතුය. එකී පරස්පරතා සහ ඌණතා නඩුවේ හරියටම බලපාන්නේ නම් එහි වාසිය විත්තියට ලබා දිය යුතු බවට අප වගබලා ගත යුතුය.

තවද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී සාක්ෂිකරුවන් සාමාන්‍ය මනුෂ්‍යයන් වන බැවින් ඔවුන්ගෙන් ගණිතමය නිවැරදිතාවයකින් සහ සිද්ධීන් සම්බන්ධව යාන්ත්‍රිකව පටිගත කරන ලද සිද්ධි මාලාවක් නැවත විකාශනය කරන්නාක් මෙන් සාක්ෂි ලබා දීමක් බලාපොරොත්තු විය නොහැකි අතර සාමාන්‍ය මනුෂ්‍යයන්ට අමතකවීම් සහ අතපසුවීම් මෙන්ම යම් යම් සිද්ධි සිතේ ධාරණය කර ගැනීමේ ශක්තිය සහ මතක තබා ගැනීමේ ශක්තිය එක් එක් සාක්ෂිකරුගෙන් වෙනස් වන බව සහ එවැනි සාක්ෂිකරුවන්ගේ අධ්‍යාපනික, සමාජීය, සහ අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන අප විසින් සාක්ෂි විශ්ලේෂණය කලයුතුය. ඉහත සීමාවන්ට යටත්ව සාක්ෂිකරුවෙකු විසින් කරුණු වසන් නොකොට සම්පූර්ණ සත්‍ය හෙළිදරව් කලයුතු බවට අධිකරණය බලාපොරොත්තු වියයුතු අතර පොදුවේ ඉහත දැක්වූ සිද්ධාන්ත සහ පරීක්ෂණයන් ඒ ඒ

අවස්ථාවට උචිත පරිදි අදාළ කරගෙන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල පිළිගත හැකිභාවය සහ සත්‍යභාවය පිළිබඳව සාක්ෂි විශ්ලේෂණය කිරීමෙන් පසුව චෝදනා ඔප්පු වී තිබේද යන්න සම්බන්ධයෙන් නිගමනයන්ට එලඹිය යුතුය. ඒ අනුව ඉහත සඳහන් පිළිගත් නෛතික සිද්ධාන්තයන් අපගේ මනසෙහි තබා ගෙන මෙම නඩුවෙහි ඉදිරිපත් කරන ලද සාක්ෂි සියල්ල අප විසින් විවෘත මනසින් යුතුව පරීක්ෂා කර බලන ලදී .

<u>පාස්කු බෝම්බ ප්‍රහාර මාලාවේ එක් එක් බෝම්බ පිපුරුණු ස්ථානයන්ට අදාළ සාක්ෂි වෙන් වෙන්ව සළකා බැලීම.</u>

කොටහේන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේදී සිදු වූ බෝම්බ පිපිරීම.

කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ 2019.04.21 වන දින සිදු වූ සිදු වීමෙන් තුවාල ලද පුද්ගලයින්ට අදාළව ඉදිරිපත් කරන ලද විස්තරාත්මක පිළිගැනීම් මගින් එකි සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

ඉහත කී පිළිගැනීම්වලට අනුව 2019-4-21 දින කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පිපිරීමෙන් පුද්ගලයන් 56 දෙනෙක් මියගොස් ඇති අතර එකී පුද්ගලයන් 56 දෙනා එලෙස බෝම්බ පිපිරීමකට හසුව මියගොස් ඇති කරුණ පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතුය. කෙසේ වුවත් මෙම නඩුවේ සියලුම චූදිතයින් විසින් 2026.4.23 දින සහ 2026.4.30 දින 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය ප්‍රකාරව සිදු කරන ලද පිළිගැනීම් වාර්තා කිරීම මඟින් කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ 2019.04.21 දින සිදු වූ සිදුවීමෙන් අධිචෝදනා පත්‍රයේ සඳහන් කර ඇති එකී මරණකරුවන් මියගොස් ඇති කරුණ පිළිගත් කරුණක් බැවින් ඒ අනුව එකී මරණකරුවන් 56 දෙනාගේ මරණයන් සනාථ කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සාක්ෂියක් මෙහෙයවීමක් අවශ්‍ය වන්නේ නැත. කෙසේ වෙතත් කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදුවීමක් සිදු වී තිබීම මිස බෝම්බ පිපිරීමක් සිදු වූ බව මෙම නඩුවේ සියලු චූදිතයින් පිළිගත් කරුණක් නොවන බැවින් එකී මරණකරුවන් 56 දෙනා මියයාමට හේතුව <u>බෝම්බ පිපිරීමක්</u> නිසා බව ඔප්පු කිරීම පැමිණිල්ලේ වගකීම වේ.

එසේම 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේදී ස්වයංඝාතන බෝම්බයක් පුපුරුවාහැරි තැනැත්තා

අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් නැමැත්තාම බවට පහත සඳහන් පිළිගැනීම් මඟින් සනාථ වී ඇත.

<u>අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් (කොච්චිකඩේ බෝම්බ පිපිරීම)</u>

1. දැනට මියගොස් සිටින අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 970063013V බවත්, එහි ඡායාස්ථ පිටපතක් පැ. 1182 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

2. දැනට මියගොස් සිටින අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් යන අයගේ නමින් අංක M 2217582 සහ N 3157177 දරන විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර තිබූ බවත්, එය තහවුරු කිරීම සඳහා එකී විදේශ ගමන් බලපත්‍ර සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ, එනම් අංක M 2217582 දරන විදේශ ගමන් බලපත්‍රයට අදාළ ගුවන් මගී

විස්තර (Passenger Inquiry) වාර්තාව සහ අංක N 3157177 දරන විදේශ ගමන් බලපත්‍රයට අදාළ පරිගණක දත්ත (Current travel document details report and Passenger Inquiry) වාර්තා පිළිවෙලින් පැ' 1183 සහ පැ' 1184 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

3. දැනට මියගොස් සිටින අලව්දීන් අහමඩ් මුආත් හෙවත් මුආත් 2019.04.21 වන දින කොව්විකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේදී අධිවෝදනා පත්‍රයේ සඳහන් සිද්ධියේදී මියගිය බවත්, ඉහත නම් සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයේ කොටස් පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී මොහොමඩ් රිස්වි අබ්දුල් රහීම් (පැ.සා. 182), මීරා සාහිබ් ෆිරිදවුස් (පැ.සා. 185) සහ අහමඩ් ලෙබ්බේ අලව්දීන් යන අය විසින් මේ වන විටත් හඳුනාගෙන ඇති බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී දෙපාර්ශවය පිළිගෙන ඇත.

4. ඉහත නම් සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයෙන් ලබාගත් පේශි සාම්පලය ජාන පරීක්ෂාවක් සඳහා

කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 10193/19 දරන නඩුව යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවත්, එකී පේශි සාම්පලය ෆකීර් මුහෙස්දීන් වල්කිස් නොහොත් ෆකීර් මොහිදීන් බල්කිස් (පැ.සා. 186) සහ අහමදු ලෙබ්බේ අලාවිදීන් යන අයගෙන් ලබාගත් කොපුල් සෛල සාම්පල සමඟ සසඳා ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න (පැ.සා. 1444) සහ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක වී.ජේ. බණ්ඩාරනායක (පැ.සා. 1436) විසින් 2019.05.08 දිනැති අනුක්‍රමික අංක සීබී/483/19 (ජේබී/602/19) (සීබී/522/19 හා සම්බන්ධිත) සඳහන් වාර්තාව (පැ 920) නිකුත් කළ බවත්, එකී වාර්තාවට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කරන ලද එකී පේශි සාම්පල දැනට මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත්ගේ බවට තහවුරු කරන ලද බවත්, එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

5. පැ.47 සහ පැ.47(1) ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන පුද්ගලයාගේ හිස දැනට මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් යන අයගේ බව 1979 අංක

15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

6. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.26 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පැ.50 ලෙස සලකුණු කර ඇති සිසිටීවී දර්ශනයේ වාහනයෙන් බැස කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවාස්ථානය වෙත බෑග් එකක් පිටේ දමාගෙන ඇවිද යන පුද්ගලයා පැ.47 සහ පැ.47(1) ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන දැනට මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් යන අය බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

7. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.163 ලෙස සලකුණු කරන ලද සැනලි ධාවකයේ SONY XC1 64GB Memory Card යන ෆෝල්ඩරයේ 00463 ලෙස අංකනය කර ඇති වීඩියෝ දර්ශනයේ දර්ශනය ආරම්භවී මිනිත්තු 05 තත්පර 41 දී මුහුණ නිරාවරණය කරන පුද්ගලයා පැ.47 සහ පැ.47(1) ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන දැනට මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් යන අය බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ

ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

8. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.124 සහ පැ.124A ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටිවල පැ.124(1) ලෙස සලකුණු කරන ලද සීසීටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව පැය 16:28:34 ට කැප් තොප්පියක් සහ සුදු පැහැති ටීෂර්ට් එකක් පැළඳ විදුලි සෝපානයේ සිට එළියට එන පුද්ගලයා දැනට මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් යන අය බවට, මීරා සාහිබ් ෆිර්දවුස් (පැ.සා. 185) යන අය විසින් හඳුනාගෙන ඇති බවත්, එකී සාක්ෂිකරු සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

ඉහත කී විස්තරාත්මක පිළිගැනීම්වලට අනුව කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදු වූ සිද්ධිය එනම් 2019-4-21 දින ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා හැරීම සිදුකර ඇත්තේ අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් නැමැත්තාම බවට කිසිදු හබකිරීමකින් තොරව සනාථ වී ඇත. ඒ අනුව 2019-4-21 දින කොටහේන ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බයක් පුපුරුවාහැර බැතිමතුන් 56 දෙනෙකුගේ මරණය සිදුකර 141 ප්‍රමාණයක් තුවාල කිරීමට ලක් කර

ඇත්තේ එකී අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් නැමැත්තාම විසින් ම බවට මෙම අධිකරණයේ සනාථ වී ඇත.

කෙසේ වුවත් එලෙස එකී අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් නැමැත්තා විසින් පුපුරුවා හරින ලද ස්වයංඝාතක බෝම්බයේ ප්‍රබලත්වය සහ ඉන් මනුෂ්‍යයට මෙන් ම දේපලවලට සිදුවන බලපෑම සම්බන්ධයෙන් මෙම අධිකරණයේ කරුණු පෙන්වා දීම සඳහා එකී ස්වයංඝාතක බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ පැ. සා. 1566 විශේෂඥ වෛද්‍ය ඩී. එල්. එම්. සේනානායක යන සාක්ෂිකරුගේ සාක්ෂිය පැමිණිල්ලෙන් මෙහෙයවන ලදී.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පිපිරීමට අදාළව ඉදිරිපත් කරන ලද සාක්ෂි

2019.04.21 දින කොටහේන කොච්චිකඩේ පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සම්බන්ධව පැමිණිල්ලෙන් මුලින් ම සක්ෂියට කැඳවා ඇත්තේ පැ.සා.155 කුරුකුලසූරිය ඇන්ටන් ජූඩ් රාජ් ප්‍රනාන්දු නැමැති කතෝලික පියතුමා වේ. එම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 1999 සැප්තැම්බර් මස සිට පූජක වරම් ලබා සේවය කළ දේවස්ථානයන් පිළිබඳව විස්තර කරමින් සාක්ෂි ලබා දී ඇති අතර 2014 සිට 2021 වසර දක්වා කොටහේන ශාන්ත

අන්තෝනි දේවස්ථානයේ සිද්ධස්ථාන පාලක පියතුමා හැටියට කටයුතු කළ බවත් 2019 අප්‍රේල් මාසය වනවිට තමා සමඟ සහායක පියතුමන් ලෙස චාමර නැමැති පියතුමා කටයුතු කළ බවත් පවසමින් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ එහි පෞරාණික බව සහ එය කිතුණු ජනතාවට එම දේවස්ථානයේ ඇති වැදගත්කම සහ ශුද්ධ වූ ශාන්ත අන්තෝනි මුණිතුමා පිළිබඳ කිතුණු ජනතාවට ඇති විශ්වාසය පිළිබඳව සහ වසර 200 කට වඩා පැරණි ශාන්ත අන්තෝනි මුණිදුන්ගේ ප්‍රාතිහාර්ය ප්‍රතිමාව එහි තැන්පත් කර තිබූ බවත් එහි වන්දනා මාන කටයුතු කිරීම සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම ජනතාව පැමිණෙන බවත් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරු තම සාක්ෂියේදී ජේසුස් ක්‍රිස්තූන් වහන්සේ අවසාන භෝජනය වන පාස්කු භෝජනය පැවැත්වීම සහ ඉන්පසු උන්වහන්සේ අත්අඩංගුවට ගෙන නඩු විභාගය පවත්වා පාස්කු සිකුරාදා දින එනම් මහ සිකුරාදා දින කුරුසයේ එල්ලා මරණයට පත් කිරීම ඉන්පසු එළඹෙන සෙනසුරාදා රාත්‍රියේ පාස්කු ඉරිදා උදෑසන මළවුන්ගෙන් උත්ථානය වීමේ දිනය පාස්කු ඉරිදා ලෙස සමරන බවට පවසා පාස්කු ඉරිදා දිනයෙහි ඇති ආගමිකමය වැදගත්කම පිළිබඳ විස්තරාත්මක සාක්ෂියක් ලබා දී ඇත.

2019 වර්ෂය වනවිට කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි උදේ 6.00 ට දෙමළ භාෂාවෙන් පළවෙනි දේව මෙහෙය

පවත්වන බවත්, දවල් 12.00 ට සිංහල භාෂාවෙන් දෙවන දේව මෙහෙය පවත්වන බවත්, සවස 6.00 ට ජප මාල උච්චාරණය කිරීම සිදු කරන බවත්, සතියේ දින වල අඟහරුවාදා හැර සාමාන්‍යයෙන් මෙම දේව මෙහෙයන් දෙක සිදු කරන බවත් අඟහරුවාදා දින පමණක් උදේ 6.00 ට ශුද්ධ වූ අන්තෝනි මුණිතුමන්ගේ නූවානය සහ දිව්‍ය පූජාව පවත්වන බවත් දහවල් 11.30ට ඉංග්‍රීෂි භාෂාවෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර වන්දනාව පවත්වන බවත් ඉන්පසු දිව්‍ය පූජාව ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන බවත් පවසා ඇත. එසේම, සවස 5.30ට සිංහල භාෂාවෙන් දිව්‍ය සත්ප්‍රසාද පවත්වා ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ දිව්‍ය මෙහෙය පවත්වන බවත් සෙනසුරාදා සවස 6.00 ට ඉංග්‍රීසි භාෂාවෙන් ඉරිදා දිනට වලංගු දිව්‍ය පූජාව පවත්වන බවත් ඉරිදා දින වල සාමාන්‍යයෙන් උදේ 5.30 ට දෙමළ භාෂාවෙන් පළවෙනි දේව මෙහෙයත්, උදේ 7.30 ට දෙමළ භාෂාවෙන් දෙවන දේව මෙහෙයත්, දහවල් 12.15 ට සිංහල භාෂාවෙන් පළවෙනි දේව මෙහෙයත්, සවස 5.15 ට සිංහල භාෂාවෙන් දෙවන දේව මෙහෙය පවත්වන බවටත් සාක්ෂි ලබා දී ඇත.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය මහල් තුනකින් යුක්ත ගොඩනැගිල්ලක් බවත් පළවෙනි මහලෙන් උඩ කොටසේ පියතුමන්ලා නවාතැන් ගෙන සිටින බවත් පවසා පල්ලියේ පිහිටීම විස්තර කරමින් සාක්ෂි ලබා දෙමින් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට අදාළ ගොඩනැගිල්ල සහ ඒ අවට භූමිය නිරූපණය කරන

පිඹුරු පත් 04 කින් යුක්ත වූ ගොනුව පැ.25 ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇත. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබාදෙමින් දේවස්ථානයට ළඟා විය හැකි මාර්ගයන් පිළිබඳව විස්තර කරමින් සාක්ෂි ලබා දී ඇති අතර පැ.25 දරන ලේඛනයෙහි කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දොරටු 05 කින් යුත් ප්‍රධාන ශාලාව පිහිටි ආකාරය විස්තර කරමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

එම ප්‍රධාන ශාලාව තුළ තිබෙන ආරුක්කු විස්තර කරමින් සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇති අතර දේවස්ථානයට එල්ල වූ ප්‍රහාරයට අදාළව අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් විසින් ලබා ගන්නා ලද ඡායා රූප ඇතුළත් සංයුක්ත තැටියක් සහ CCTV දර්ශනද අඩංගු දර්ශන ඇතුළත් සංයුක්ත තැටිය පැ.26 ලෙස ලකුණු කර ඇති අතර එහි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද ඡායා රූපය පැ.27 ලෙසද ලකුණු කර ඇත. දේවස්ථානය තුළ තිබෙන වැදගත් ස්ථානයන්, ආරුක්කු, ශුද්ධ වූ ශාන්ත අන්තෝනි මුනිතුමාගේ ප්‍රතිමාව තැන්පත් කර තිබෙන ස්ථානය, දේවස්ථානයේ කොරිඩෝව සහ ජනෙල් ඇතුළු ප්‍රදේශ, දේවස්ථානයේ ප්‍රධාන ශාලාවට පිවිසෙන දොර ආදිය නිරූපණය කරන ඡායාරූප පැ.28, පැ.29, පැ.30, පැ.31, පැ.32, පැ.33, පැ.34 ආදිය ලෙස ලකුණු කර ඇති අතර එසේම, දේවස්ථානය තුළ තිබූ අල්තාරය සහ වන්දනා මාන කරන ජනතාව දණගහ ගෙන සිටින ආකාරය පෙන්නුම් කරන එසේම, බෝම්බ පිපිරිච්ච තැන පෙන්නුම් කරන ස්ථානය පෙන්නුම් කරන CCTV දර්ශනයන්ද සාක්ෂිකරු

විසින් හඳුනාගෙන ඇති අතර බෝම්බය පිපිරුණ ස්ථානය දිස්වෙන ඡායාරූපය පැ.36 ලෙස ලකුණු කර ඇත.

එසේම, දේවස්ථානයේ විදුලි පද්ධතියට අදාළ වයර් සහ උපාංග පිපිරීමෙන් විනාශ වී ඇති ආකාරය පෙන්නුම් කරන ඡායාරූපය පැ.38 ලෙසද දේවස්ථානය තුළ කාන්තාවන්ට සහ පිරිමින්ට වෙන් වෙන් වශයෙන් පෝළිම් වීමට තබා ඇති අත්වැල් තිබුණු ස්ථානයට අදාළ ඡායාරූප පැ.39, පැ.40 ලෙස ලකුණු කර ඇති අතර එසේම, දේවස්ථානයෙහි වහලේ කොටස සහ උළුවල කොටස් සෙසු සුන්බුන් අතර තිබෙන ආකාරය පෙන්වන ඡායාරූපයක් පැ.41 ලෙස ලකුණු කර ඇති අතර ප්‍රහාරයෙන් මියගිය තැනැත්තන් පෙන්නුම් කරන ඡායාරූප පැ.43, පැ.44, පැ.45, පැ.46 ලෙස ලකුණු කර ඇති අතර එසේම, බෝම්බය පිපිරීමෙන් පසු විමර්ශන අවස්ථාවේදී පසු දින බෝම්බය පිපිරුණු තැන වහලය පැ.47 ලෙස ලකුණු කර ඇති අතර එම ඡායාරූපයට අනුව එහි මිනිස් සිරුරක හිස කොටස දිස්වන ආකාරය එම ඡායාරූපයෙන් පෙනී යන බවත් එය බෝම්බ ගෙනාපු කෙනාගේ හිස යැයි පසුව විමර්ශන අවස්ථාවේදී තමන්ලාට දැනගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 අප්‍රේල් මාසය වනවිට පල්ලියෙහි CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කර තිබූ බවත් දේවස්ථානය තුළ තිබූ CCTV පද්ධතිය පාස්කු මංගල්‍යයට ප්‍රථමයෙන් අලුත්වැඩියා කර ප්‍රතිසංස්කරණය කිරීමට

නොහැකි වුණු බවත් සාක්ෂිකරු පවසා ඇත. බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවූ අවස්ථාව වනවිට පල්ලියේ තිබූ CCTV කැමරාවලින් යම් ප්‍රමාණයක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව පල්ලියෙහි තිබූ ඩී.වී.ආර් යන්ත්‍ර වැඩිදුර පරීක්ෂණ සඳහා විමර්ශන නිලධාරීන් විසින් ගලවා රැගෙන ගිය බවත් එම ඩී.වී.ආර් යන්ත්‍ර ගලවා ගැනීමේ කාර්ය තමාගේ මෙහෙයවීම යටතේ කුවින්ටස් පියතුමන්ගේ අධීක්ෂණය යටතේ සිදු වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.එසේම, එම CCTV දර්ශනවල දිනය නිවැරදි ලෙස 2019.04.21 ඉරිදා ලෙසට සඳහන් වී තිබුණ ද ඒවායේ සඳහන් වේලාවන් නිවැරදි නොවන බවත් බෝම්බය පුපුරා ගිය නිශ්චිත වේලාව උදෑසන 8.45 ට වුවද CCTV දර්ශනවල වේලාව වෙනස් වී තිබුණු බවට එනම් පැයයි විනාඩි 10 ක පමණ වේලාවේ වෙනසක් සිදුවී තිබුණු බවට සාක්ෂිකරු පවසා ඇත.

පල්ලියේ මෙම බෝම්බ පිපිරීම නිසා පල්ලියට සිදුවූ හානි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් තක්සේරු කරන ලද බවත් ඔවුන් විසින්ම නැවත ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද බවත් එලෙස දිවා රෑ නොබලා අලුත්වැඩියා සිදු කර යලි සිද්ධස්ථානය විවෘත කිරීමට සුදුසු ආකාරයෙන් සකස් කර දුන් බවත් පවසා තක්සේරු වාර්තාවට අනුව සිදුවූ හානිය රුපියල් මිලියන 41 යි 125 347.91 ක් වශයෙන් ගණනය කර ඇති බවත් එසේ වුවත් එයට වඩා විශාල මුදලක් අලුත්වැඩියා කටයුතු සඳහා වැය වන බවත් සාක්ෂිකරු පවසා ඇත. අදාළ තක්සේරුවට

අදාළ ලේඛනය පැ.48 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. පසුව දේවස්ථානය අසල නවතා තිබූ සැක කටයුතු වෑන් රථයක් CCTV දර්ශනවලට අනුව දිස්වෙන බවත් එසේම, දේවස්ථානයට පැමිණි සැක කටයුතු පුද්ගලයෙක් සම්බන්ධයෙන්ද දේවස්ථානයට යාබද ප්‍රදේශයේ නිවසක CCTV කැමරා පද්ධතිය තුළින් අනාවරණය වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

සැක කටයුතු පුද්ගලයෙක් සහ වෑන් රථයක් සංචරනය වීමට අදාළ CCTV දර්ශන පෙළ පැ.49 ලෙස ලකුණු කර ඇති අතර එම දර්ශන 2019.04.21 දින 07:57:57 ට අදාළ බවත් එම සැක කටයුතු සුදු පාට වෑන් රථය කොටුව ප්‍රදේශයේ සිට මට්ටක්කුලිය දෙසට ධාවනය වන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පසුව එම සැක කටයුතු වෑන් රථය නැවත එම ස්ථානයෙන් පිටත්ව නැවත කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට දෙසට ධාවනය කෙරෙන ආකාරය පෙන්නුම් කරන CCTV දර්ශනය පැ.50 ලෙස ලකුණු කර ඇත.

එම වෑන් රථය පදවාගෙන පැමිණි තැනැත්තා වෑන් රථයෙන් බැස රියදුරු අසුනින් බැස නැවත පිටුපස කොටසෙන් වෑන් එක තුළට ඇතුල්වන ආකාරයක් දිස්වන බවත් වෑන් රථයෙන් බැස කැප් හැට් එකක් පැළඳ පුද්ගලයෙකු පා ගමනින් පල්ලිය දෙසට ගමන් කරන බව දිස්වෙන බවත් ය.

අදාළ CCTV වීඩියෝ පටයෙහි වේලාව 8.15 ත්ත්පර 17 යන ස්ථානය වෙද්දී බෝම්බය පුපුරා ගිය මොහොත දිස්වන බවත් එම CCTV දර්ශනවලට අනුව 2019.04.21 වන දිනය නිවැරදිව සටහන් වී තිබෙන බවත් එහි සඳහන් වේලාව 08.15 ට බවත් මෙම CCTV දර්ශනවල සටහන් වී තිබෙන වේලාව 08.15 වැරදි බවත් බෝම්බය පිපිරී ගියේ සියලුම ඔරලෝසුවල වේලාව නැවතී තිබුණේ සහ දේවස්ථානයේ ප්‍රධාන කණුවේ ඔරලෝසුවද නැවතී තිබුණේ පෙරවරු 8.45 ට බවත් සාක්ෂිකරු පවසා ඇත. ඒ අනුව එම CCTV දර්ශනවල නියමිත වේලාවට වැඩියෙන් පැය භාගයට වැඩි වේලාවක් CCTV දර්ශනවල පෙන්නුම් කරන බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.22 දින වන බෝම්බ පිපිරීමේ සිද්ධියට පසු දින බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ නිලධාරීන් පැමිණ අදාළ ස්ථානයේ සියලුම පුද්ගලයන් ක්ෂණිකව ඉවත් කර සැක කටයුතු වැන් රථය නිෂ්ක්‍රීය කිරීමකට වාහනයේ තිබූ බෝම්බ නිෂ්ක්‍රීය කළ බවත් එවිට එම වාහනය පුපුරා ගිය බවත් වැන් රථයේ පිපිරී යාමෙන් පසු ඒ අවට ගෙවල්වලට සහ වරාය තාප්පයට හානි සිදු වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම බෝම්බ පිපිරීමේ සිදුවීමෙන් පසුව බෝම්බ පිපිරීමෙන් මියගිය අයව සිහි කරන්න දේවස්ථානය තුළ ස්මාරකයක් හදන්න බැරි නිසා දේවස්ථානය අසල තිබූ ඉටිපන්දම් කුටිය ඉවත් කර මෙම ස්ථානයෙහි

ස්මාරකයක් ඉදි කළ බවත් මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය නිසා මියගිය මරණකරුවන් 54 ක් මියගොස් තිබූ බවත් දේවස්ථානය තුළදී 100 කට අධික ප්‍රමාණයක් තුවාල ලැබූ බවත් අතපය අහිමි වෙච්ච අය සිටි බවත් මෙම බෝම්බ ප්‍රහාරය නිසා කුඩා දරුවන්, තරුණ පුද්ගලයන්, මව්වරුන්, පියවරුන් ගණනාවක් මියගිය බවත් ඇතැම් දරුවන් කෑලිවලට කැඩී හඳුනා ගන්නට බැරි තත්ත්යට පත්වී සිටි බවත් ය.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමාට දැනගන්නට ලැබුණු තොරතුරුවලට අනුව තමා පවසා සිටි සැක කටයුතු වාහනය තුළ ගෑස් සිලින්ඩර් 04 ක්, වොෂින් මැෂින් ටයිමර් එකකට සම්බන්ධ කර පුපුරන්න ලෑස්ති කරලා තිබුණු බවත් වොෂින් මැෂින් එකේ ටයිමර් එක පුපුරන්න සූදානම් කරන්න තිබී ඇත්තේ 9.45 ට බවත් 9.45 ට වොෂින් මැෂින් ටයිමර් එක පිපිරුවා නම් ඉතා විශාල විනාශයක් වෙන්න ඉඩ තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 01, 10, 22, 24, 3, 7, 8, 11, 12, 18, 19, 20, 21 යන චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර 5, 6, 13, 14, 16 චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත.

හරස් ප්‍රශ්නවලදී විත්තියෙන් මෙම සාක්ෂිකරුගෙන් විමසා ඇත්තේ 2019.04.21 දින පාස්කු දිනයට පෙර යම් දිනයක යම් පහර දීමක් සම්බන්ධයෙන් පෙර සිකියුරිටි ඇලට් එකක් එනම් ආරක්ෂක තොරතුරක්

මෙම සාක්ෂිකරුගේ දේවස්ථානයේ පාලක මණ්ඩලයට ලැබී තිබුණාද යන්න සම්බන්ධයෙන් විමසා ඇති අතර සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත්තේ කිසිදු අවස්ථාවක එවැන්නක් තමාලාට දැනුම් දුන් නැති බවත් කවරෙකු හෝ තමාලාට ඒ පිළිබඳව දැනුම් දී තිබුණා නම් තමාලාට දේව මෙහෙයවන් අවලංගු කිරීමට ඉඩ තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

වැඩිදුරටත් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම දේවස්ථානයට ප්‍රහාර එල්ල කිරීමට පැමිණි ත්‍රස්තවාදීන්ගේ නම් ගම් විස්තර සහිතව කතෝලික සභාවට පෙර දැනුම් දීමක් ලැබී තිබෙන බවට වුවද, සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත්තේ තමාලාට පෙර කිසිම දැන ගැනීමක් තිබුණේ නැති බවයි.

එවකට සිටි ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා මෙම ප්‍රහාරයෙන් පසුව දේවස්ථානයට පැමිණියාද සම්බන්ධයෙන් විමසා ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ එම මහතා පැමිණි බවත් කෙසේ වුවත් තමාව මුණ ගැසුණේ නැති බවත් ඔහු පැමිණ ආපසු පිටව යාමේදී ඔහු යම් ප්‍රකාශයක් සිදු කර ගොස් ඇති බව මාධ්‍ය තුළින් දැනගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ ද මෙවැනිම පිපිරීමක් සිදුවුණු බවත් ඉන් අනතුරුව එම දේවස්ථානය අලුත්වැඩියා කර නැවත විවෘත කිරීමේ මංගල්‍යයේදී කොළඹ

අගරදගුරු කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් විසින්ද යම් ප්‍රකාශයක් කර ඇති බව සාක්ෂිකරු පවසා ඇත.

විත්තියෙන් අසා ඇත්තේ එම මංගල්‍යයේදී කාදිනල් මැල්කම් රංජිත් අගරදගුරු හිමිපාණන් විසින් ප්‍රකාශයක් කරමින් මෙම ප්‍රහාරය පසුපස ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් තිබෙන බවට පවසා ඇති බවට සාක්ෂිකරු පවසා ඇති අතර ඉන්දීය අගමැති මෝදි ලංකාවට පැමිණි අවස්ථාවේදී කොච්චිකඩේ දේවස්ථානයට පැමිණි බවත් ඉන්දීය මහකොමසාරිස්වරයාද අවස්ථා කීපයක දේවස්ථානයට පැමිණි බවත් බෝම්බ සිද්ධියෙන් පසු විවිධ පරීක්ෂණ කණ්ඩායම් විවිධ රටවල් වලින් පවා පැමිණි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර කොළඹ අගරදගුරු හිමිපාණන් විසින් උන්වහන්සේට ලැබුණු කුමන තොරතුරක් මත එවැනි ප්‍රකාශයක් කළා ද යන්න ගැන තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු දිගින් දිගටම පවසා ඇත්තේ මේ වනවිට පාස්කු ප්‍රහාරය සිදුවී දීර්ඝ කාලයක් ගත වී ඇති බවත් මේ වනතුරු විත්දිතයන්ට සාධාරණයක් ඉටු වී නැති බවත් මෙම සිද්ධියෙන් අහිංසක ජනතාව ජීවිත පූජා කළේ කතෝලික දේවස්ථානයේ ආගමික වතාවත්වලට පැමිණ සිටි අවස්ථාවේ බවත් ඒ හේතුව මතම මෙම සිද්ධියේ විත්දිතයන් වෙනුවෙන් හඬක් නගන්න තමාලාට සාධාරණ අයිතියක් තිබෙන බවත් තමාලා දිගින් දිගටම පවසා සිටින්නේ විත්දිතයන්ට සාධාරණයක් ඉටු විය යුතු බවට සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත.

විත්තිය වෙනුවෙන් වැඩිදුරටත් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසමින් මෙම පාස්කු ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් ජනාධිපති විශේෂ කොමිෂමක් පත් කර තිබීම සහ එම කොමිෂන් සභාව මඟින් ලබා දී තිබෙන නිර්දේශ සහ නිගමනයන් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් කරුණු විමසා ඇති අතර විත්තියෙන් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ අදාළ ජනාධිපති කොමිෂන් සභාවට අදාළ කොමිෂන් සභා වාර්තාවල සියලුම වෙළුම් අගරදගුරු තුමන්ට සහ පියතුමන්ලාට ලැබී නොමැති බව වන අතර සාක්ෂිකරු පවසා ඇත්තේ අවස්ථා ගණනාවක අදාළ වෙළුම් ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීම් කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරුද පවසා ඇත්තේ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ සිදු කර මෙම ප්‍රහාරය පිටුපස්සේ කවුද සිටියේ යන්න සොයා බැලිය යුතු බවත් දේශපාලන අධිකාරිය පිළිබඳව තමාලාට විශ්වාසයක් නැතත් ගරු අධිකරණය පිළිබඳව තවම තමාලාට විශ්වාසයක් තිබෙන බවත් සාක්ෂිකරු අධිකරණය අමතා පවසා ඇත.

විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ පාස්කු ඉරිදා සිද්ධිය සම්බන්ධව ආරක්ෂක අංශයෙන් දැනගෙන මෙම දේවස්ථානයට ඉතාමත් අඩුවෙන් ආරක්ෂාව ලබා දී ඇති බවට යෝජනා කර ඇතද සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට ඒ ගැන කෙලින් කියන්න හැකියාවක් නැති බවත් ඔවුන් එලෙස දැනගෙන සිට ඇති බව පසුව තමා දැනගත්

කරුණුවලට අනුව පෙනී ගිය බවත් එලෙස දැනගෙන සිට එදින ආරක්ෂාව නොදී සිටියාද, වෙන හේතුවක් නිසා ආරක්ෂාව නොදි සිටියාද යන්න සම්බන්ධයෙන් තමාට පැවසිය නොහැකි බවත් සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි විශ්ලේෂණය

පැ.සා.155 කුරුකුලසූරිය ඇන්ටන් ජූඩ් රාජ් ප්‍රනාන්දු නැමැති කතෝලික පියතුමාගේ සාක්ෂිය සමස්තයක් ලෙස ගෙන සළකා බැලීමේදී පෙනී යන්නේ මොහුගේ සාක්ෂිය තුළින් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි අභ්‍යන්තර සහ බාහිර පිහිටීම සම්බන්ධ භෞතිකමය කරුණු ද එසේම, එම දේවස්ථානය සම්බන්ධ ඓතිහාසික කරුණුද කතෝලික ජනතාවට පමණක් නොව සියලු ආගම්වලට අයිති ජනතාව වන්දනා මාන කටයුතු සඳහා පැමිණෙන තැනක් ලෙසට මෙම දේවස්ථානයේ ඇති වැදගත්කම මෙන්ම විශේෂයෙන් කතෝලික ජනතාවට ශාන්ත අන්තෝනි මුණිදුන්ගේ වැදගත්කම සහ විශේෂයෙන් ජේසුස් ක්‍රිස්තූන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය වීමට අදාළ ඉතා වැදගත් ආගමික සංසිද්ධියක් වන පාස්කු ඉරිදා දිනයේ ඇති වැදගත්කම සම්බන්ධයෙනුත් ආගමික මෙන්ම ඓතිහාසික කරුණු රාශියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් අධිකරණය ඉදිරියේ හෙලි වී ඇත.

2019.04.21 දින එනම් මෙම දේවස්ථානයෙහි මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු බෝම්බ පිපිරවීම සිදු වූ දින වනවිට එම දේවස්ථානයේ තිබූ තත්ත්වය සහ එදින දේවස්ථානය තුළ බෝම්බ පිපිරීමට සිද්ධියට මද වේලාවකට ප්‍රථමයෙන් බැතිමතුන් දේවස්ථානයට පැමිණ සිටි ආකාරය සහ දේවස්ථානයෙහි එකී බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවූ ස්ථානයට අදාළ CCTV කැමරා වීඩියෝ දර්ශන රාශියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පැමිණිල්ලෙන් ලකුණු කර ඇත.

ස්වයංඝාතක බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදු වූ එදින ජෝයි මරියරත්නම් නැමැති පියතුමණ් විසින් උදෑසන දේව මෙහෙය උදෑසන 08.00ට පවත්වන ලද ආකාරය සහ උදෑසන 8.45 ට බෝම්බය පිපිරීම සිදු වූ ආකාරය සහ එයට අදාළ CCTV දර්ශන මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති අතර මෙම සාක්ෂිකරු බෝම්බය පිපිරුණු අවස්ථාව වනවිට මෙම දේවස්ථානයෙහි ඉහළ මහලේ ඔහුගේ කාර්යාලයෙහි සිට ඇති ආකාරය සහ බෝම්බ පිපිරීමේ හේතුව නිසා බැතිමතුන්ට සිදුවූ හානිය මෙන්ම දේවස්ථානයට සිදුවූ හානිය සම්බන්ධයෙන්ද සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් කරුණු ඉදිරිපත් වී ඇත.

තවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් වැඩිදුරටත් හෙලි වන්නේ මෙම බෝම්බය පිපිරුණු දේවස්ථානය ඉදිරිපිට දේවස්ථානයට මදක් නුදුරින් සැක සහිත වෑන් රථයක් තිබුණු ආකාරය සහ පසුව ආරක්ෂක

හමුදාවන් සහ බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ නිලධාරීන් පැමිණ අවට පුද්ගලයන් එම ස්ථානයෙන් ආරක්ෂිතව ඉවත් කර එම වාහන තුළ තිබූ බෝම්බ නිෂ්ක්‍රීය කරන ලද ආකාරය සහ එම අවස්ථාවේදී එම වෑන් රථය පිපිරී සුනුවිසුනු වුනු ආකාරය පිළිබඳව සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් එම දර්ශනයන්ට අදාළ ඡායාරූපද හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. එසේම, එම පුපුරා ගිය වෑන් රථයෙන් බැස සැක කටයුතු පුද්ගලයෙකු කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට ගමන් කරන ලද ආකාරය CCTV දර්ශන තුළින් හඳුනාගෙන මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

එසේම, ඉහත කී සැක කටයුතු වාහනයෙන් 2019.04.21 වන දින සැක කටයුතු පුද්ගලයෙකු ඉන් බැස පෙරවරු 8.12 ට පමණ පල්ලිය දෙසට ගමන් කරන ලද ආකාරය සහ ඉන්පසුව පෙරවරු 8.15 ට පල්ලිය තුළ බෝම්බ පිපිරීම සිදුවූ ආකාරය පිළිබඳව සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇති අතර සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් වැඩිදුරටත් හෙලි වන්නේ අධිකරණය ඉදිරියේ තමා නිරීක්ෂණය කරන ලද පැ.49 සහ පැ.50 දරන CCTV දර්ශනවලට අනුව බෝම්බය පුපුරා ගියේ උදෑසන 8.45 ට බවත් CCTV දර්ශනවල එම වේලාව සඳහන් වන්නේ උදෑසන 8.15 ලෙස බවත් CCTV දර්ශනවලට අදාළ වේලාවෙහි පැය ½ කට පෙර වේලාවක් සඳහන් වී ඇති බවත් කෙසේ හෝ බෝම්බ පිපිරීම සිදු වුනේ පෙරවරු 8.15 නොව පෙරවරු 8.45 ට බවටත් සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සැබැවින්ම පිළිගත හැකි විශ්වාසනීය සාක්ෂියකි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ද පැ.49 සහ පැ.50 දරන වීඩියෝ පටවල අඩංගු දර්ශන තුළින්ද එසේම, පැ.38 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයට අනුව බෝම්බය පුපුරා යාමෙන් දේවස්ථානයෙහි වහල ප්‍රදේශයට සිදුවී ඇති හානිය සහ පැ.47 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයට අනුව මෙම දේවස්ථානය තුළ ස්වයංඝාතක බෝම්බය පිපිරීමට පසු දින වහලයේ මත තිබී සොයා ගෙන ඇති මිනිස් හිස බෝම්බය පුපුරවන ලද තැනැත්තාගේ හිස බවට පසුව තමාට දැනගන්නට ලැබුන ද, එම බෝම්බය පුපුරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය කුමක්ද යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුට දැනීමක් තිබී නොමැති බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පෙනී යයි.

කෙසේ වෙතත් මෙම සාක්ෂිකරු සාක්ෂි ලබාදී පවසා ඇති කරුණු තුළින් සහ පැමිණිල්ලෙන් මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති CCTV දර්ශන මෙන්ම පැ.38 වශයෙන් ලකුණු කර ඇති ඡායාරූපයෙන්ද, පැ.26 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි ඇති ඡායාරූප අතරින් එම් යූ ඩබ් ඒ ටී එච් අංක 03 ජේ බී ජී ලෙස සඳහන් පැ.47 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයෙහි සිටින තැනැත්තා මෙම බෝම්බය පිපිරීම සිදු කරන ලද තැනැත්තා බවට යම් ආකාරයක පරිවේශණීය සාක්ෂිමය කරුණු තුළින් පෙනී යන අතර කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව අප විසින් ඉහතින් සඳහන් කරන ලද පිළිගැනීම් වලට අනුව පැ.47 සහ පැ.47(1) ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන පුද්ගලයාගේ හිස දැනට

මියගොස් සිටින අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් යන අයගේ බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇති පසුබිම තුළ මෙම දේවස්ථානය තුළ ස්වයංඝාතක බෝම්බය පුපුරවාහැරීම සිදුකර ඇත්තේ අලවිදීන් අහමඩ මුආත් හෙවත් මුආත් බවට මැනැවින් සනාථ වී ඇත.

අප විසින් ඉහතින් සඳහන් කරන ලද පරිදි මෙම සාක්ෂිකරුගේ සමස්ත සාක්ෂිය තුළින් 2019.04.21 දින පෙරවරු 8.45 ට කොච්චිකඩේ ශාන්ත අන්තෝනි සිද්ධස්ථානය තුළ ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බව සහ එම දේවස්ථානයෙහි පාස්කු මංගල්‍ය දේව මෙහෙයට පැමිණ ඇති බැතිමතුන් විශාල ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත් වී ඉතා විශාල තැනැත්තන් ප්‍රමාණයක් තුවාල වීම්වලට ලක් වී දේවස්ථාන ගොඩනැගිල්ලටද බලවත් ලෙස හානි සිදුවී ඇති බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මනාව කරුණු ඉදිරිපත් වී ඇති බවට පෙනී යයි.

මෙම සාක්ෂිකරුගෙන් විත්තියෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී කර ඇති යෝජනාවන් මෙන්ම මෙවැනි ප්‍රහාරයක් සිදුවුණු බවට බෝම්බ පිපිරීමේ සිදුවීමට පෙර යම් ආරක්ෂිත තොරතුරක් ලැබී ඇති බවට විත්තියෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරු ලබා දී ඇති පිළිතුරුවලින් හෙලිවන කරුණු හුදෙක් ප්‍රවාදක කරුණු පමණක් වන අතර කෙසේ වෙතත් මෙම

සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ප්‍රධාන වශයෙන් හෙලි වන්නේ අප විසින් ඉහතින් සඳහන් කරන ලද පරිදි 2019.04.21 වන දින එනම් පාස්කු ඉරිදා දින පෙරවරු 8.45 ට කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තුළ සැබැවින්ම ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදුවී ඇති බව සහ එය මනා සූදානමකින් යුතුව, සැලැසුම් සහගතව සිදු කර ඇති ක්‍රියාවක් බව සහ බැතිමතුන් බොහෝ පිරිසක් සහභාගී වී ඇති පෙරවරු 8.30 ට පැවති දිව්‍ය පූජාව අවස්ථාවේ එනම් ජෝයි මරියරත්නම් පියතුමා විසින් දේව මෙහෙය සිදු කරන ලද අවස්ථාවේදී බොහෝ බැතිමතුන් දණ ගසාගෙන යාඥා කරමින් සිටි අවස්ථාවේදී එමෙන්ම කාන්තාවන් සහ පුරුෂයින් වෙන් වෙන්ව දෙපස වාඩි වී යාඥාවන් සිදු කරමින් සිටි අවස්ථාවේ ක්‍රිස්තු භක්තියකයන්ගේ වැදගත්ම දිව්‍ය පූජා ආගමික කටයුත්තේදී වැදගත්ම යාඥාවක් වන විශ්වාසයේ යාඥාව සිදු කරන අවස්ථාවේදී මෙම බෝම්බය පිපිරවීම සිදු කර තිබීම තුළින් එම බෝම්බය පිපිර වූ තැනැත්තාගේ ඒකායන අරමුණ වී ඇත්තේ බොහෝ පිරිසකට ඉන් හානි සිදු කිරීමම බවට මැනවින් පෙනී යයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව එම බෝම්බය පිපිරවීම සැබැවින්ම සිදුවී ඇත්තේ පෙ.ව.8.45 ට වන අතර ඒ බවට මෙම සාක්ෂිකරු නිශ්චිතවම කරුණු සනාථ කරමින් පවසා සිටින්නේ එම බෝම්බ පිපිරවූ වේලාවේම පෙරවරු 8.45 ට දේවස්ථානයේ තිබූ සියලුම ඔරලෝසු එම අවස්ථාවේ නතර වූ බවට පවසා තිබීම තුළින් සහ විශේෂයෙන් පැ.27 ලෙස

ලකුණු කර ඇති දේවස්ථානයෙහි ප්‍රධාන වශයෙන් පැවති ඔරලෝසුවේ වේලාවද එලෙස පැය 8.45 ට නතර වී තිබීම තුළින්ම බවට පෙනී යන අතර අප විසින් පෙර අවස්ථාවක නිරීක්ෂණය කරන ලද පරිදි පල්ලියට අදාළ CCTV දර්ශනවල පෙරවරු 8.45 වෙනුවට පෙරවරු 8.15 ලෙස සඳහන් වී තිබීම පිළිබඳව මෙම සාක්ෂිකරු විසින් අධිකරණයේ පිළිගත හැකි පරිදි කරුණු ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු අධිකරණයේ පවසා සිටි කරුණු බැහැර කිරීමට තරම් යුක්ති සහගත හේතුවක් අප හට පෙනී නොයන අතර ඒ අනුව උදෑසන 8.45 වෙනුවට උදෑසන 8.15 ලෙස CCTV දර්ශනවල වේලාව වැරදි ආකාරයෙන් සඳහන් වී තිබී ඇති බව පැහැදිලිව පෙනී යන අතර ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු විසින් 2024.01.09 දින පස්වරු 2.35 ට ලබා දුන් සාක්ෂිවල පිටු අංක 2 හි සඳහන් නීති කෘත්‍යය පරික්ෂා කර බැලීමේදී මැනවින් පෙනී යයි.

කෙසේ වුවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීමට ලක් කිරීමේදී අප විසින් ඉහතින් සඳහන් කර ඇති හේතූන් වලට යටත්ව මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය සත්‍ය විශ්වාසනීය සාක්ෂියක් බවට අප තීරණය කරමු.

පැ.සා.174 ජූඩ් ජෝශප් මරියරත්නම් නැමැති පියතුමා සාක්ෂි ලබා දෙමින් ඔහු 1995 සිට පැවිදි දිවියට ඇතුළත්ව හංවැල්ල, යාපනය, අලුත්කඩේ ප්‍රදේශවල සේවය කරන ලද බවට සාක්ෂි ලබා දී ඇති අතර,

2019.04.21 දින පාස්කු ඉරිදා දින වන විට අලුත්කඩේ ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මීෂම භාරව පියතුමා ලෙස කටයුතු කරමින් සිටි බව එදින තමාට කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දේව මෙහෙයක් දෙමළ භාෂාවෙන් පැවැත්වීමට සරෝජ් ජූඩ් රාජ් නැමැති පියතුමා විසින් ආරාධනා කළ බවත් ඒ අනුව තමා කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට ගොස් අල්තාරයේ සිට ඉදිරිය බලාගෙන උදෑසන 08.00ට දේව මෙහෙය ආරම්භ කළ බවත් ඒ අවස්ථාවේ පල්ලිය පිරිලා සෙනඟ සිටි බවත් එදින පාස්කු ඉරිදා දින බැවින් පල්ලිය ඔක්කෝම බැතිමතුන්ගෙන් පිරී තිබුණු බවත් තමා එලෙස විනාඩි 40 ක් පමණ දේව මෙහෙය පවත්වාගෙන යමින් සිටියදී 04 වන විශ්වාසයේ යාඥාව සිදු කරමින් සිටියදී එක්වරම ගිනි බෝම්බයක් වැනි එකක් ශබ්දයක් එක්කම තමාගේ ඉදිරියේ ප්‍රධාන දොරෙන් වම් පැත්තේ දුටු බවත් එම අවස්ථාවේදී මොකක්දෝ එකක් ඉගිලිලා එනවා වගේ තමා දුටු බවත් පසුව එය බෝම්බයක් බව තමා දැනගත් බවත් එම අවස්ථාවේ තමා දිව ගියේ නැති බවත් අල්තාරයේම සිටි බවත් තත්පර ගණනකින් තමා අල්තාරයෙන් බැස ඉස්සරහට ගිය බවත් එම අවස්ථාවේ බෝහෝ බැතිමතුන් බෝම්බ පිපිරීමෙන් තුවාල ලබා වැටී සිටි බවත් තමාට කිසිදු තුවාලයක් සිදු වුනේ නැති බවත් පවසා ඇත. ඉන්පසු තමා පියතුමාට එන්න යැයි කෑ ගසා පවසා රැස්ව සිටි අනිකුත් සියලුම අය සමඟ එක්ව තුවාලකරුවන් ඉවත් කිරීමට උදව් උපකාර කළ බවත් මෙම පිපිරීම නිසා පල්ලිය තුළ බලවත් හානි සිදුවී

තිබුණු බවත් පල්ලියේ වහලයට ද හානි සිදුවී තිබුණු බවත් පවසා ඇත. මෙම සාක්ෂිකරුට පැ.35 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන අඩංගු වීඩියෝ දර්ශන අධිකරණය ඉදිරියේ වාදනය කර නැරඹීමට ඉඩ සලස්වා ඇති අතර එම වීඩියෝ දර්ශන නරඹමින් තමා එදින අල්තාරය ඉදිරිපිට දේව මෙහෙය පවත්වමින් සිටි ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. එසේම, විශ්වාසයේ යාඥාව සිදු කරන ලද වේලාවට අදාළ වීඩියෝ දර්ශනයද නරඹමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇති අතර සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ බෝම්බය පුපුරා ගියේ පෙරවරු 8.40 සිට 8.45 ට පමණ බව වේ.

මෙම සාක්ෂිකරුගෙන් සියලුම චිත්තිකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න කිසිවක් නොමැති බවට අධිකරණයට දැනුම් දීමෙන් පසුව මෙම සාක්ෂිකරුව මුදා හැර ඇත.

පැ.සා.174 ජූඩ් ජෝශප් මරියරත්නම් නැමැති පියතුමාගේ සාක්ෂියට අනුව 2019.04.21 දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි පල්ලිය තුළ මෙම සාක්ෂිකරු විසින් උදෑසන 8.00 ට ආරම්භ වූ දේව මෙහෙය පවත්වමින් සිටි අවස්ථාවේදී පෙරවරු 8.45 ට බෝම්බය පුපුරා යාම සහ එම අවස්ථාවේදී දේව මෙහෙයේ සුවිශේෂ යාඥාවක් වූ විශ්වාසයේ යාඥාව සිදු කරමින් සිටි අවස්ථාවේදී පල්ලිය තුළ බැතිමතුන්ගෙන් පිරී ගොස් තිබී ඇති බව සහ බෝම්බ පිපිරීම නිසා බැතිමතුන්ට මෙන්ම දේවස්ථානයටද බලවත් ලෙස

හානි සිදු වී ඇති බවට මැනවින් කරුණු පැහැදිලි වේ. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුවද ඔහු විසින් විශ්වාසයේ යාඥාව පවත්වා ඇත්තේ පෙ.ව.8.45ට වන අතර එම අවස්ථාවේ බෝම්බය පිපිරුණු බවට වන සාක්ෂිය මෙම අධිකරණයේ මෙම සාක්ෂිකරුට ප්‍රථමයෙන් සාක්ෂි ලබා දුන් පැ.සා.155 අන්ටන් ජූඩ් රාජ් ප්‍රනාන්දු පියතුමාගේ සාක්ෂිය සමඟ මනා ඒකකාරීභාවයක් පෙන්නුම් කරයි. මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය චිත්තිය විසින් හරස් ප්‍රශ්නවලට ලක් කර නොමැති බැවින් අධිකරණය ඉදිරියේ අවිවාදිතව ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව එම සාක්ෂිය සත්‍ය විශ්වාසනීය සාක්ෂියක් ලෙස අප පිළිගනිමු.

පැ.සා. 177 පලනි අන්ඩි කරන මහා රාජන් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 2009 සිට 2021 වසර වනතුරු පිටකොටුවේ පිහිටි WINNER WINEY STORES ආයතනයේ මුදල් අයකැමි ලෙස සේවය කළ බවත් එම ආයතනය සතියේ දවස් 07 ම විවෘත කර තිබෙන බවත් එය පිටකොටුව සහ මට්ටක්කුලිය යා කෙරෙන මාර්ගයට මුහුණලා පිහිටා තිබෙන බවත් පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.26 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි 2019.04.21 උදෑසන 8.46 ට අදාළ CCTV දර්ශන විවෘත අධිකරණයේදී මෙම සාක්ෂිකරුට නැරඹීමට වාදනය කර ඇති අතර එය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එම CCTV දර්ශන අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව තමාගේ ආයතනයෙහි සවිකර ඇති CCTV කැමරාවෙන් ලබා ගත් බවත් තමා සේවය කළ ආයතනයේ සවිකර තිබූ CCTV කැමරාවෙහි වේලාව පැය ½ක් වැඩිපුර සටහන් වෙලා තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.අදාළ CCTV දර්ශන නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි බෝම්බයක් පිපිරුණු දිනයේ පිටකොටුව පැත්තේ ඉදන් මට්ටක්කුලිය පැත්තට සුදු පාට වෑන් එකක් 8:57:18 යන වේලාවට CCTV දර්ශනවල පෙනෙන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

පැ.සා. 177 පලනි අන්ඩි කරන මහා රාජන් නැමැති සාක්ෂිකරු කිසිදු හරස් ප්‍රශ්න ඇසීමට ලක් වී නොමැති අතර එම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලි වන්නේ 2019.04.21 දින උදෑසන සුදු පැහැති වෑන් රථයක් මෙම සාක්ෂිකරු සේවය කළ ආයතනය ඉදිරියෙන් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තිබෙන පැත්තට ගමන් කර ඇති ආකාරය සාක්ෂිකරු විසින් CCTV දර්ශන ඇසුරින් හඳුනාගෙන ඇති බව වන අතර එම CCTV දර්ශනය පැ.54 ලෙස ලකුණු කර ඇති අතර එම කරුණ හැර මෙම සාක්ෂිකරුට අදාළ බෝම්බය පිපිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු දැනීමක් තිබී නොමැති බව පෙනී යයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වැදගත් වන්නේ පැ.26 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි 2019.04.21 දින මෙම සාක්ෂිකරු සේවය කළ ස්ථානයට අදාළව ලබා ගෙන CCTV දර්ශන මත සුදු පැහැති වෑන් රථයක් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි පල්ලිය දෙසට එදින උදෑසන ගමන් කරන ආකාරය හෙලිවන අතර එසේම, මෙම සාක්ෂිකරු සේවය කළ ආයතනයේ සවිකර තිබූ CCTV කැමරාවේ වේලාව වැඩිපුර පැය ½ක් සටහන් වී තිබූ බව හෙලිවේ.

ඉහත සාක්ෂිය අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.155 කුරුකුලසූරිය ඇන්ටන් ජූඩ් ප්‍රනාන්දු යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන් පවසා ඇති පරිදි පැ.49 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළෙහි බෝම්බය පිපිරුණු වේලාව ලෙසට 08.15 ලෙස සඳහන් වී තිබීම වැරදි සහගත වීම සහ එම CCTV දර්ශනවල වේලාවෙහි පැය ½ක වෙනසක් තිබීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් සාක්ෂිය සහ මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අතර මනා ගැළපීමක් දක්නට ඇත.

පැ.සා.183 අල්පොන්සු ප්‍රනාන්දු නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු මේ වනවිට අංක 04, නිව්හැම් චතුරස්‍රය, කොළඹ 13 යන ස්ථානයේ පදිංචිව සිටින බවත් තමාගේ නිවස අසල තිබෙන නිව්හැම් චතුරස්‍රය නැමැති පාර සෙන් ඇන්තනීස් මාවතට සම්බන්ධ වන බවත්

නිව්හැම් චතුරස්‍රය නැමැති ස්ථානයේ සිට මීටර් 600 ක් පමණ දුරින් ශාන්ත අන්තෝනි දේවස්ථානය පිහිටා ඇති බවත් නිව් හැම් චතුරස්‍රය තිබෙන ස්ථානයේ සිට විනාඩි 05 කින් ඇවිදගෙන දේවස්ථානයට යාමට හැකි බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහුගේ නිවසේ CCTV කැමරාවක් ශාන්ත අන්තොනි මාර්ගය ආවරණය වන පරිදි සවිකර තිබුණු බවත් ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව තමා පොලිස් නිලධාරීන්ට ප්‍රකාශයක් ලබා දුන් බවත් තමාගේ CCTV කැමරාවට අදාළ රෙකෝඩරයද ලබා දුන් බවත් පවසා ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ 2019.04 වෙනි මාසේ පල්ලිය තුළ බෝම්බයක් පිපිරුණු බවත් එයට පසු දින සුදු පාට වැගන්-ආර් කාර් එකක් තුළ තිබී දෙවෙනි බෝම්බය පිපිරීම සිදු වුණ බවත් එම සුදු පාට වැගන්-ආර් කාර් රථය තමාගේ ගේ ඉදිරිපිට නවතා තිබූ කාර් රථයක් බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා ඉහත ලිපිනයේ තමාගේ බිරිඳ සහ දියණිය සමඟ පදිංචි වී සිටින බවත් පල්ලියේ බෝම්බය පිපිරුණු දින වන විට තමාගේ දියණිය වන රිමෝනා කැෆ්රා නැමැත්තිය පල්ලියෙහි ගීතිකා කණ්ඩායමට සම්බන්ධ වී ඇති බවත් සුදු පාට වෑන් රථය පුපුරා ගිය දිනයේ එයට පැයකට පෙර බුද්ධි අංශයෙන් පැමිණ තමාගේ CCTV එකේ දර්ශන නරඹා තමාලාට නිවසින් ඉවත් වෙන්න යැයි දැනුම් දුන් බවත් එම

සුදු පැහැති වාහනය CCTV කැමරාවල මුලින්ම බැලුවේ තමාගේ දියණිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

දියණිය තමාට දැනුම් දුන් පසු තමාද CCTV දර්ශනය නරඹා තමා සැක කටයුතු වාහනය සම්බන්ධයෙන් පොලිසියට දැනුම් දුන් බවත් තමාගේ දියණිය පල්ලියේ පියතුමාට ඒ ගැන දැනුම් දීමක් කළ බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා CCTV දර්ශන නැරඹීමේදී තමා පැවසූ වැන් රථය පදවාගෙන ආ තැනැත්තා තමාගේ නිවස ඉදිරිපිට එම වාහනය ඉස්සරහට පස්සට බොහොම අමාරුවෙන් දමා අමාරුවෙන් වාහනය නවත්වාගෙන එම වාහනය ඉස්සරහ දොර වහලා මැද දොරෙන් ඇතුල් වෙලා විනාඩි 4 ක් 5 ක් ඇතුලේ සිට බෑග් එකක් කරේ දමාගෙන වැන් රථයෙන් බැස කෙලින්ම පල්ලිය දෙසට ගිය බව තමා CCTV දර්ශනය තුළින් දුටු බව පවසා පැ.49 දරන CCTV දර්ශන නරඹමින් සාක්ෂි ලබා දී ඇත. මෙම CCTV දර්ශනවල සඳහන් දිනය 2019.04.21 වන බවට ද සාක්ෂිකරු පවසා ඇත.

පැ.50 දරන CCTV දර්ශන පෙළද විවෘත අධිකරණයේදී සාක්ෂිකරු විසින් නරඹා එයට අනුව තමා ඉහත සඳහන් කළ වැන් රථයෙන් පැමිණි පුද්ගලයා බෑග් එකක් දාගෙන වැන් රථයෙන් බැස පල්ලිය දෙසට යන දර්ශනය එහි තිබෙන බවට හඳුනාගෙන ඇත.

පැ.51 දරන CCTV දර්ශන පෙළ ද සාක්ෂිකරු විසින් නරඹා සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ 2019.04.22 දින තමාගේ නිවස ඉදිරිපිට නවතා තිබී පිපිරුණු වෑන් රථය බවත් එම පැ.51 දරන CCTV දර්ශන පෙළට අනුව පල්ලියේ පියතුමා තමාගේ නිවසට පැමිණ CCTV දර්ශන බලලා යන ආකාරයද එම CCTV දර්ශනයෙහි තිබෙන බවට සාක්ෂිකරු පෙන්වා හඳුනාගෙන ඇත. එසේම, ආරක්ෂක අංශ නිලධාරීන් පැමිණ තමාගේ නිවස ඉදිරිපිට නවතා තිබූ වෑන් රථය පරීක්ෂා කරන ආකාරය දිස්වන දර්ශනද එනම් පැ.51 දරන දර්ශන පෙළද සාක්ෂිකරු විසින් නරඹා හඳුනාගෙන ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ තමාගේ නිවසේ තිබූ CCTV කැමරාවලට අදාළ දර්ශනවල වේලාව නිවැරදිව සටහන් වී තිබුණු බවත් එහි සඳහන් දර්ශනවල වේලාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමාගෙන් ප්‍රශ්න කළ බවත් එම CCTV කැමරාවල නිවැරදි වේලාවන් ඇතුළත් කර තිබෙන බවට තමා විසින් පවසා සිටි බවටත් සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් නොමැති බවට සියලුම චූදිතයන් වෙනුවෙන් අධිකරණයට දැනුම් දීමක් කර ඇත.

පැ.සා.183 අල්පොන්සු ප්‍රනාන්දු නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පැහැදිලිව අධිකරණයට පෙනී යන්නේ 2019.04.21 දින සැක

කටයුතු පුද්ගලයෙකු සුදු පැහැති වැගන්-ආර් වර්ගයේ කාර් රථයකින් පැමිණ එම වෑන් රථය තමාගේ නිවස ඉදිරිපිට යම් ස්ථානයක නවතා එම පුද්ගලයා එම වෑන් රථයෙන් බැස වෑන් රථයේ මැද දොරෙන් ඇතුළට ගොස් මඳ වේලාවක් සිට ඉන්පසු විශාල බෑගයක්ද දා ගෙන රථයෙන් බැස කෙලින්ම බෝම්බ පිපිරීම සිදු වූ පල්ලිය දෙසට ගමන් කර ඇති බව සහ එදින ඉන්පසු බෝම්බ පිපිරීමක් සිදුවී ඇති බව සහ එදිනට පසු දින එනම් 2019.04.22 දින තමා විසින් පෙර සඳහන් කරන ලද සුදු පාට වැගන්-ආර් වර්ගයේ වෑන් රථය ආරක්ෂක අංශ නිලධාරීන් පැමිණ පරීක්ෂාවට ලක් කිරීම සහ පසුව එම වෑන් රථය එහි බෝම්බ පිපිරීමක් සිදුවී තිබීම සිදුවී ඇති බව සනාථ වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු සඳහන් කළ වෑන් රථය 2019.04.21 දින මොහුගේ නිවස ඉදිරිපිට නවතා තිබීමෙන් පසු එහි පැමිණි පුද්ගලයා එම වෑන් රථයේ මැද කොටසට ඇතුල් වී විශාල බෑගයක් ද රැගෙන වෑන් එකෙන් බැස කෙලින්ම බෝම්බ පිපිරීම සිදුවූ ශාන්ත අන්තෝනි දේවස්ථානය පැත්තට ගමන් කර ඇති පසුබිම තුළ සහ එදින දේවස්ථානය තුළ බෝම්බ පිපිරීමක් සිදුවී තිබීම සහ එදිනට පසු දින එනම් 2019.04.22 දින ඉහත කී සැක සහිත වෑන් රථය තුළ තිබී තවත් බෝම්බයක්ද පුපුරා ගොස් ඇති බැවින් 2019.04.21 දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි බෝම්බ පිපිරීම සිදු කරන ලද සැක

කටයුතු පුද්ගලයා පැමිණ ඇත්තේ එම වෑන් රථයෙන්ම බවට මනාව පැහැදිලි වේ.

එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහුගේ නිවසේ සවිකර තිබූ CCTV කැමරාවට අදාළ පැ.49, පැ.50, පැ.51, පැ.52 යන CCTV දර්ශනවලින් පැ.49 සහ පැ.50 දරන CCTV දර්ශන 2019.04.21 දිනටද, පැ.51 සහ පැ.52 CCTV දර්ශන දෙක 2019.04.22 දිනට අදාළ CCTV දර්ශන බවටද අධිකරණය ඉදිරියේ මනාව සාක්ෂි ඉදිරිපත් වී ඇත.

පැ.සා.21 මාඩසාමි තේවර් බාලසුබ්‍රමනියම් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 2019.04.21 වන දින පාස්කු දවසේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයට තනිවම ගිය බවත් එදින තමා පල්ලියෙන් ඉටිපන්දම් අරන් ඇතුළට ගොස් ඉටිපන්දම් තියාගෙන සිටි බවත් පවසා ඇති අතර පැ.35 දරන වීඩියෝ දර්ශනය නරඹමින් එහි තිබෙන්නේ ශාන්ත අන්තෝනි පල්ලිය බවත් පවසා එම වීඩියෝ දර්ශනවල මෙම සාක්ෂිකරු සිටි ස්ථානය පෙන්වා දී සාක්ෂි ලබා දී ඇත. එලෙස සිටියදී රැවුල පොඩ්ඩක් වවා තිබුණු පුද්ගලයෙකු කලිසමක් ඇඳගෙන කහ පාට ෂර්ට් එකක් ඇඳගෙන බෑග් එකක්ද දා ගෙන පල්ලිය තුළ තිබෙන කණුවක් තිබෙන පැත්තට ගිය බවත් ඔහු එලෙස ගොස් නැවතුන ස්ථානය පල්ලිය සෙනග පිරී සිටි නිසා තමාට දකින්න බැරි වුණ බවත් ඉන්පසු එකවරම ලොකු පිපුරුම් ශබ්දයක් පැමිණි බවත් තමා බිම වැටුණු බවත්

තමා නැගිට බලන විට තමාගේ කකුල්වලට තුවාල සිදු වී තිබුණු බවත් තමාගේ ඇඳුම් කිසිවක් තිබුණේ නැති බවත් ට්‍රන්ක් එක පිටින් සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාගේ එක කකුලක කටු එළියට ඇවිත් තිබුණු බවත් තමා වටපිට බලද්දී බොහෝ මිනිසුන් වැටී සිටි බවත්, පසුව තමා කොළඹ රෝහලට ගෙන ගිය බවත්, තමා අවුරුද්දයි මාස 1 ½ ක් පමණ රෝහල්ගතව සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය නිසා තමාගේ කන් දෙක ඇසීමටද හානි සිදු වුණ බවත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමාට පසු අවස්ථාවක වන්දියක් ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා පෙර සඳහන් කළ පරිදි ලොකු බෑග් එකක් දා ගෙන රැවුල ටිකක් වවාගෙන සිටි පල්ලිය තුළට ගමන් කළ පුද්ගලයාගේ මුහුණ තමා දැක්කේ නැති බවත් තමා දැක්කේ ඔහුගේ පිටුපසින් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.50 දරන CCTV දර්ශන පෙළ සාක්ෂිකරුට නැරඹීම සඳහා විවෘත අධිකරණයේ නැරඹීම සඳහා වාදනය කර ඇතද තමා පෙර සඳහන් කළ පුද්ගලයා හඳුනාගැනීමට අපහසු බවත් සිද්ධිය සම්බන්ධයෙන් තමාගෙන් රෝහලේදී පොලිසියෙන් ප්‍රකාශයක් සටහන් කර ගත් බවටත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 14 සහ 15 චූදිතයන් වෙනුවෙන් පමණක් වන අතර අනිකුත් චූදිතයන් වෙනුවෙන්

හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී ද මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහු එම සැක කටයුතු පුද්ගලයාගේ මුහුණ දැක්කේ නැති බව වේ.

පැ.සා.21 මාරසාමි දේවන් බාලසුබ්‍රමනියම් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන්නේ ඔහු 2019.04.21 දින උදේ වරුවේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි සිදුවූ බෝම්බ පිපිරීමෙන් තුවාල ලත් වින්දිතයෙකු බවත් ඔහුට එම සිද්ධිය සම්බන්ධයෙන් යම් ආකාරයක වන්දියක් ද ප්‍රධානය කර ඇති බවයි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව විශාල බෑගයක් රැගෙන කලිසමක් සහ කහ පැහැයට හුරු ඇඳුමක් ඇඳ සිටි සැක සහිත පුද්ගලයෙකු බෝම්බය පිපිරීමට ආසන්න මොහොතේ දේවස්ථානය තුළට ගමන් කරනවා මෙම සාක්ෂිකරු දැක ඇතද මෙම සාක්ෂිකරු එම තැනැත්තාගේ මුහුණ නිශ්චිතවම දැක නොමැති අතර ඔහු එම තැනැත්තාව දැක ඇත්තේ පිටුපසෙනි.

ඒ අනුව එම සැක කටයුතු පුද්ගලයාගේ නිවැරදි අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කරුණු හෙලි නොවන අතර කෙසේ වෙතත් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි පල්ලිය තුළ 2019.04.21 දින උදෑසන සැබැවින්ම බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බව සහ එයින් බැතිමතුන්ට තුවාල සිදුවී ඇති බව සහ මෙම සාක්ෂිකරුද එක් තුවාලකරුවකු වන බවද ඔහුගේ සාක්ෂිය තුළින් අධිකරණය ඉදිරියේ

කරුණු සනාථ වී ඇත. අප විසින් පෙර අවස්ථාවක සඳහන් කර ඇති පරිදි ස්වයංඝාතක බෝම්බකරුගේ අනන්‍යතාවය මේ වනවිටත් විත්තියෙන් පිළිගෙන ඇති පසුබිම තුළ මෙම සාක්ෂිකරු බෝම්බකරුගේ මුහුණ නිශ්චිතවම දැක නොමැති වුවද එයින් ඔහුගේ සාක්ෂියට කිසිදු බලපෑමක් සිදුවන්නේ නැත.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙහි සිදුවූ බෝම්බ පිපිරීමෙන් තුවාල ලත් අධි චෝදනා පත්‍රයේ නම් සඳහන් සාක්ෂිකරුවන් වන අනිකුත් තුවාලකරුවන්ට එසේ තුවාල සිදු බව සියලු චූදිතයින් විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 414 සහ 420 වගන්තීන් ප්‍රකාරව පිළිගැනීම් ලෙස වාර්තා කරන ලද බැවින් සහ ඔවුන්ගේ වෛද්‍ය වාර්තා ඇතුළු ලේඛණ ද පිළිගැනීම් මතම ලකුණු කර ඇති බැවින් එකී තුවාලකරුවන් කිසිවෙකු යලි සාක්ෂි ලබා දීම සඳහා නොකැඳවන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 182 මොහොමඩ් රිස්වි අබ්දුල් රහීම්2026.06.25 දින සාක්ෂි දෙමින්, තමාගේ බිරිඳ වන ෆාතිමා සුමෙයියා අලවුඩීන් යන අයගේ සහෝදරයකු වන මොහොමදු මුවාත් අලවුඩීන් යන අය 2019.04.21 දින කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දී බෝම්බයක් පුපුරවාගෙන මිය ගිය බවට කියා සිටින ලදී. මියගිය මුවාත් යන අයගේ ඒ වන විට වයස 25 ක් 26 පමණ වන බවත් ඔහු APIIT ආයතනයේ නීති උපාධිය කල බවත්, වැඩි දුරටත් කියා සිටි

සාක්ෂිකරු සිය බිරිඳගේ සහෝදරයා වන එනම් මස්සිනාගේ මෘත ශරීරයේ හිස කොටස තමා හඳුනාගත් බව කියා සිටින ලදී. එහි ඡායාරූප තමාට පළමුව පෙන්වූ බවත් ඉන් අනතුරුව මෘත ශරීරාගාරයට ගොස් මළ සිරුරේ හිස කොටස හඳුනාගත් බව කියා සිටින ලද අතර පිපිරීම සිදුවූ ස්ථානයේ ලබා ගන්නා ලද ඡායාරූපයේ පැ.26 දරන සංයුක්ත තැටියේ ඇතුළත්ව තිබූ පැ.47 දරන ‘‘head 4.jpg’’ යන ඡායාරූපය තම බිරිඳගේ සහෝදරයාගේ හිසෙහි ඡායාරූපයක් බවට හඳුනාගන්නා ලදී.

එසේම එම සාක්ෂිකරුට පැ.51 ලෙස සලකුණු කරන ලද විඩියෝ දර්ශනය ප්‍රදර්ශනය කරන ලද අතර එහිදී අහමඩ් මුවාත් යන මෙම මරණකරු සුදු පැහැති වෑන් රථයකින් බැස ලොකු බෑගයක් ද පිටේ දමාගෙන ගමන් කරන බවට එම දර්ශන ආශ්‍රයෙන් හඳුනාගෙන සාක්ෂි දෙන ලදී. එසේම අහමඩ් මුවාත් යන අයගේ පියා වන අහමඩ් අලවුදීන් සහ මව වන බල්කීස් නැන්දා යන අය එම මුවාත් යන අයගේ මෘත ශරීරයේ අනන්‍යතාවය සඳහා DNA පරීක්ෂණය සඳහා සහභාගි වූ බවද සාක්ෂිකරු කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අතරතුර පැමිණිල්ල සහ චිත්තිය විසින් මෙම පාස්කු ප්‍රහාරයට අදාළ බෝම්බ පිපිරීම් සිදුවූ ස්ථානයන්හි බෝම්බ පුපුරවාගෙන ස්වයංඝාතනයට ලක්වූ පුද්ගලයන්ගේ අනන්‍යතාවය

සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීම් කිහිපයක් ලකුණු කරන ලදී. එසේ වුවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දී බෝම්බයක් පුපුරවාගෙන මිය ගිය මොහොමදු මුවාත් අලවුදීන් යන අය එම ස්ථානයට පැමිණීමත් එම පැමිණි වාහනයත් යන කරුණු දෙක සනාථ කර ඇති අතර මෙම නඩුවේ සාක්ෂි දුන් අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලින් එනම් විශේෂයෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 1603 විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරි සමරනායක මහතාගේ සාක්ෂියෙන් හෙලි වූ වැඩි දියුණු කරනලද පිපිරුම් උපක්‍රමයක් සහිතව එම ස්ථානයේ අටවා තිබූ පසුව පුපුරා ගිය එකී අංක WP PJ-4080 දරන වාහනය මෙම බෝම්බ පිපිරීම සඳහා යොදා ගැනීම සිදුකර ඇති බව මනාව තහවුරු වේ. මෙම සාක්ෂිකරුව කිසිදු හරස් ප්‍රශන ඇසීමකට ලක් කර නොමැති බැවින් මෙම සාක්ෂිය අවිවාදයෙන් යුතුව මෙම අධිකරණයේ ඉදිරිපත් වී ඇති අතර ඔහු ලබා දුන් සාක්ෂිය එ අනුව විශ්වාසනීය සාක්ෂියක් ලෙස අප පිළිගනිමු.

කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පිපිරීම සිදුකල තැනැත්තාගේ පශ්චාත් මරණ පරීක්ෂණය

පැමිණිල්ලේ සාක්ෂි අංක 1566 වෛද්‍ය සේනානායක සාක්ෂි ලබා දෙමින් තමා කොළඹ අධිකරණ වෛද්‍ය හා විෂවේදී ආයතනයට

අනුබද්ධව නීති වෛද්‍ය නිලධාරී ලෙස 2013 වර්ෂයේ අග භාගයේ සිටම එම ආයතනයේ සේවය කරන බවත් තමා වෛද්‍යවරයෙක් වශයෙන් 2012 වර්ෂයේ දිවුරුම් දීම සිදු කල බවත් තමා වෛද්‍යවරයෙක් වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිය හැදෑරීම සිදු කල බවත් ඉන් අනතුරුව, 2012 වර්ෂයේ අග භාගය රාජගිරිය කාසල් රෝහලට සම්බන්ධවත්, ඉන්පසුව ළමා රෝහල බොරැල්ලටත් අනුයුක්තවත් සේවය කල බවත්, ඉන්පසුව කොළඹ අධිකරණ වෛද්‍ය ආයතනයට සම්බන්ධ වුණ බවත්, තමා 2018 වර්ෂයේදී විශේෂඥ අධිකරණ වෛද්‍යධාරී තනතුර සඳහා අධ්‍යාපන කටයුතු සිදු කල ද එය 2021 වර්ෂයේ තාවකාලිකව නතර කල බවත් පවසා ඇත. තමාගේ රාජකාරී කටයුතු අතර වාරයේදී පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවන් දළ වශයෙන් 4000 කට ආසන්න ප්‍රමාණයක් සිදු කර ඇති බවත් ඒ වාර්තා අතරේ පිපිරීම් නිසා, පිළිසීම් නිසා මිය ගිය තැනැත්තන් පරීක්ෂා කර ඔවුන් සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවන් සංස්කරණය කර ඉදිරිපත් කර තිබෙන බවත් පවසා ඇත.

තමා අලව්ඩීන් අහමඩ් මුවාත් කියන තැනැත්තා සම්බන්ධයෙන් 2019 වර්ෂයේ මැයි මස දෙවැනි දින සම්පාදිත පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවක් කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කල බවත් පවසා ඇත. 2019 වර්ෂයේ හතරවෙනි මාසේ 21 වෙනි දින ශ්‍රී ලංකාවේ සිදුවුණු පාස්කු බෝම්බ ප්‍රහාරයක් සමග ශරීරය කුඩා කැබැලි වලට කැඩී ගිය මළ සිරුරුන් ඊට අමතරව බෝම්බය නිසා පිළිස්සුම් තුවාල සහිත සිදුරු

වී ගිය සිරුරුත් තමාලාගේ අධිකරණ වෛද්‍යධාරී කාර්යාලය වෙත ලැබුණ බවත් ඒ අතර අලව්ඩීන් අහමඩ් මුවාත් යන අයගේ ශරීර කොටස් 2019 වර්ෂයේ අප්‍රේල් 22 වෙනිදා උදේ 10.23 ට ලැබුණ බවත්, ඒවා මෝචරියේ තැන්පත් කරලා තිබුණ බවත් එම අලව්ඩීන් අහමඩ් මුවාත් යන අය 2019 වර්ෂයේ හතරවෙනි මාසේ 21 වෙනි දින ජීවිතක්ෂයට පත් වෙලා තිබෙන බවත් ඔහුගේ ශරීර කොටස් T 200 අංකය යටතේ සුදු පැහැති ප්ලාස්ටික් බෑගයක දමා සුරක්ෂිතව තැන්පත් කර තිබිදී තමා වෙත පරීක්ෂාව සඳහා ඉදිරිපත් කල බවත් සිරුර කොටස මැදි වයසේ පුද්ගලයෙකුගේ වයස අවුරුදු 20ත් 40ත් වයස අතර පරතරයක පිරිමි පුද්ගලයෙකුගේ මළ සිරුරු කොටසක් බවත් එහි හිසත් විනාශ වී ගිය ගෙලේ කොටසකුත් අන්තර්ගත වී තිබුණ බවත් එම සිරුරු කොටස පරීක්ෂා කරන මොහොතේ මද වශයෙන් නරක්වීමට භාජනය වී තිබුණ බවත් සිරුරු කොටස දැලිව කළු පැහැති වී තිබුණු සිරුරු කොටසක් බවත් හිස කෙස් පිළිස්සී ගොස් මුහුණ පිළිස්සී ගොස් තිබුණු බව හඳුනා ගත්ත බවත් ඒ සමගම සිරුරේ හිසේ පිටුපස සම ගැලවී ගොස් කන් වලට හානි සිදු වෙලා තිබුණ බවත් බෙල්ල විශාල ආකාරයෙන් හානි වෙලා තිබුණ බවත් පවසා එම කොටස් තමා ඡායාරූප ගතකර සංයුක්ත තැටියක් ලෙස රැගෙන විත් තිබෙන බව පවසා එම සංයුක්ත තැටිය පැ.1003 ලෙස ලකුණු කර ඇත. තමා එම ශරීර කොටස් සම්බන්ධයෙන් නිරීක්ෂණ තමගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට තමා ඇතුළත් කර තිබෙන බවත් තමා එම හිස මතුපිටින් පරීක්ෂා

කර බලද්දී එය පිරිමි පුද්ගලයෙකුගේ බවට හඳුනා ගත් බවත් හිසේ ඉදිරිපස ප්‍රදේශයේ පිළිස්සුම් තුවාල හැර වෙන අනෙකුත් තුවාල දක්නට ලැබුණේ නැති බවත් හිසේ පිටුපස සම සම්පූර්ණයෙන්ම ගැලවිලා ගොස් හිස් කබල පිටුපස නිරාවරණය වෙලා තිබුණ බවත් එහි පිළිස්සුම් තුවාල පහක් හඳුනාගෙන තියෙන බවත් හිසේ ඇස උඩින් නළලේ තුවාල දෙකකුත්, නාසයේ තුවාලයකුත්, ඊට අමතරව උඩු තොලේ පිළිස්සුම් තුවාලයකුත්, ඊට අමතරව මුහුණේ වම් පසට වෙන්න හකුව ප්‍රදේශයේ පිළිස්සුම් තුවාලයකුත් හඳුනා ගත් බවත් පවසා ඇත. මරණකරුගේ හිසේ පිටුපස ඔක්සිපිටල් බෝන් කියන අස්ථිය පිපිරීමට ලක් වෙලා තිබුණ බවත්, ඊට අමතරව හිසේ පිටුපස රේඛීය බිඳී යාමකුත්, හිසේ මුහුණේ ඉදිරිපස දෙපස දෙපැත්තෙම ඇසට යටින් පිපිරීම් තුවාල තිබූ බවත් ඊට අමතරව උඩු හනුව පුපුරා ගොස් තිබුණ බවත් පවසා සාක්ෂිකරු හිස් කබලක ආදර්ශකයක් අධිකරණයට පෙන්වමින් මරණකරුගේ හිසෙහි සහ මුහුණේ අස්ථීන් හග්න වී තිබූ ස්ථානයන් පැහැදිලි කර එලෙස අස්ථි බිඳීමකට ලක් වෙන්න දැඩි බලයක් අවශ්‍ය බවට පවසා ඇත. එමෙන් ම හිස් කබල සහ හිස සළකා බැලීමේදී ස්වාමීනි අස්ථි බිඳී යාම හිසේ ඉහළින් ආපු බලයක් හැටියට හඳුනා ගන්න හැකියාවක් නැති බවත් බලය පැමිණීමට ඉඩ ඇත්තේ බොහෝ දුරට හිසට පහළින් යෙදුණු බලයක් නිසා සිදුවී හැකි ආකාරයේ පිපිරුම් බවත් ගෙලේ සම සහ ඊට අභ්‍යන්තර මාංශ පේශීන් ස්වරාලය, ගලනාලය, අස්ථීන්, රුධිරවාහිනී සියල්ලම විනාශ වෙලා ගොස්

තිබුණා බවත් අස්ථි කැබලි, මාංශ පේශීන් දක්න ලැබුණ බවත් පිළිස්සී ගිය සහ කළු පැහැති වුණු මාංශ පේශීන් දක්නට ලැබුණ බවත් එවන් දේවල් හිසකට දැඩි තාපයක් යටතේ දක්නට ලැබෙන බවත් පවසා විවෘත අධිකරණයෙහි ඇති පුලුල් තිරය මත පෙනීමට සලස්වන ලද ඡායාරූපයේ තියෙන හිස හඳුනාගෙන එය තමා විසින් පශ්චාත් මරණ පරීක්ෂණයේ දී පරීක්ෂා කල බවත් එම හිස ගොඩනැගිල්ලක වහලයක් උඩ තිබී සොයාගෙන ඇති බවත් බෝම්බකරු වන අලව්ඩීන් අහමඩ මුවාත් යන අය බෝම්බයක් පිටේ තියෙන බෑග් එකක දාගෙන ඉන්න අවස්ථාවක ඒ බෝම්බය පුපුරා යෑමේදී හිසට මේ වැනි හානි වෙන්න පුළුවන් බවත් එවන් වෙලාවක එම පිපිරීමත් සමඟ හිස ගැලවී ඉහළට විසිවීමේ හැකියාවක් තියෙන බවත් පවසා ඔහු විසින් අලව්ඩීන් අහමඩ මුවාත් යන අය සම්බන්ධයෙන් පවත්වන ලද ඔහුගේ පශ්චාත් මරණ පරීක්ෂණට අදාළ වාර්තාව පැ.1003 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙහි මරණයට හේතුව ලෙස Decapitation due to explosive injury එනම් පිපිරීමක් නිසා හිස ගෙලෙන් ගැලවී යෑම නිසා සිදු වූ මරණයක් ලෙස සඳහන් කර ඇති බව පවසා ඇත.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය අධිකරණයේ දමිල භාෂණ පරිවර්තක මහතා මගින් සියලුම චූදිතයන්ට යළි

පහදා දීමට කටයුතු කරන ලද අතර සියලුම චූදිතයින්ට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට පවසා ඇත.

මෙම වෛද්‍ය සාක්ෂිය විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලිව පෙනී යන්නේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තුළ ස්වයං ඝාතක බෝම්බයක් පුපුරුවා හැර ඇති පුද්ගලයා අලවිඩීන් අහමඩ මුවාත් නැමැත්තා බවට ඔහුගේ අන්‍යතාවය කිසිදු සැකයකින් තොරව සනාථ වී ඇති බවත් බෝම්බයක් පිටේ තියෙන බෑග් එකක දාගෙන ඉන්න අවස්ථාවක එම බෝම්බය පිපිරීමත් සමඟ හිස ගැලවී ඉහළට විසිවීමේ හැකියාවක් තියෙන බවත් ය. මෙම වෛද්‍යවරයා විසින් එලෙස ඉදිරිපත් කරන ලද වෛද්‍ය මතය විත්තිය විසින් කිසිසේත් හබයකට ලක් කර නොමැති පසුබිම තුළ එය අවිවාදිතව පිළිගැනීමට අප හට කිසිදු බාධාවක් නැත.

<u>රජයේ රසපරීක්ෂක ලබා දුන් සාක්ෂි</u>

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා. 1440 ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක වර්ණකුලසූරිය ඇලෙක්ස් රුෂාන් ප්‍රනාන්දු තමා 2004 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට බැඳී පුපුරන ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශයේ දීර්ඝ කාලීනව සේවය කල බවත්, තමා ඇමරිකා එක්සත් ජනපදයේ ලුසියානා විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් පිපුරුම් විද්‍යාව පිළිබඳ පාඨමාලාව, US-ICITAP පාඨමාලාව සහ එක්සත් රාජධානියේ

ස්ට්‍රැත්ක්ලයිඩ් විශ්වවිද්‍යාලයෙන් වෝහාරික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය ලබාගෙන තිබෙන බවටත් පවසා ඇත. ඔහු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අධිකරණ විද්‍යා අංශය කොටස් 7 කින් ද ආහාර විද්‍යා අංශය ලෙස ප්‍රධාන කොටස් දෙකක් පවතින බවත් පුපුරන ද්‍රව්‍ය අංශයේ නඩු වාර්තා සඳහා "CE" (Case of Explosives) අංකයක් ද, අභ්‍යන්තර ලිපිගොනු පවත්වා ගැනීමට "JE" අංකයක් ද ලබා දෙන බවත් පවසා ඇත.

එසේම රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත නඩු භාණ්ඩ භාර ගැනීමේදී මහේස්ත්‍රාත්වරයාගේ ආදර්ශ මුද්‍රාව සහිත ආවරණ ලිපියක් අනිවාර්ය වන බවත් භාණ්ඩ භාරගත් පසු දෙපාර්තමේන්තුව විසින් සංදේශයක් (Memorandum) නිකුත් කරනු ලබන බවත් පවසා තමා සිය සේවා කාලය තුළ වාර්තා 3000 කට අධික ප්‍රමාණයක් පිළියෙල කර ඇති බවත් ස්ථානීය පරීක්ෂණ 300 කට වැඩි ප්‍රමාණයක් සිදු කර ඇති බවත් පවසා ඇත.

වැඩිදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ, 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා දින කොළඹ 13 කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදු වූ බෙදජනක පිපිරීම සම්බන්ධයෙන් එවකට මහේස්ත්‍රාත් ලංකා ජයරත්න මහත්මියගේ දැනුම් දීම මත තමා එදින පෙරවරු 11.45 ට පමණ එම ස්ථානයට ගොස් විමර්ශන ආරම්භ කරන ලද බවත්, එම ස්ථානයේ

අධිකරණ වෛද්‍ය නිලධාරී ඡන්න පෙරේරා මහතා ඇතුළු පොලිස් නිලධාරීන් සිටි බවත් දේවස්ථානය තුළ පොළොව මට්ටමට ඉහළින් සිදු වූ අධිබල පිපිරීමක් නිසා වීදුරු ආවරණ බිඳී, බිත්ති සහ ගෘහ භාණ්ඩ මත මිලිමීටර් 6.2 - 6.5 ප්‍රමාණයේ වෘත්තාකාර සිදුරු පළුදුවීම් ඇතිවී, ලේ හා ශරීර කොටස් තැවරී තිබූ බවත්, පොළොවේ ආවාටයක් හමු නොවූ බවත් නිරීක්ෂණය කර ඇත. දේශීයව සංස්ලේෂණය කරන ලද යූරියා නයිට්‍රේට් (යූරියා සහ නයිට්‍රික් අම්ලය මිශ්‍ර කර සාදන ලද) අධිබල පුපුරන ද්‍රව්‍ය, ලෝහ බෝල ස්ථර, ඩෙටනේටරයක්, විදුලි පරිපථයක්, ස්විචයක් සහ බැටරියක් යොදාගෙන සකසන ලද බෝම්බයක් පිටුපසට පැළඳ සිටි ආත්මඝාතකයා සිටගෙන සිටියදී ස්විචය වැසීමෙන් මෙම පිපිරීම සිදු කර ඇති බවත්, එම පිපිරීමෙන් ආත්මඝාතකයාගේ හිස කඳින් වෙන්ව ගොස් තිබූ බවත් සාක්ෂිකරු නිගමනය කර ඇත.

කොච්චිකඩේ දේවස්ථාන පිපිරීමට අදාළව සාක්ෂිකරු සහ එවකට ආණ්ඩුවේ රස පරීක්ෂක ඒ. වැලිඅංග මහතා විසින් පිළියෙල කරන ලද පිටු 5 කින් යුත් රස පරීක්ෂක වාර්තාව (JE/251/19, CE/465/19, කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ B10193/06/19 නඩුවේ 411 පිටුව) පැ.1842 ලෙස ලකුණු කරන ලදී. රස පරීක්ෂක ටේප් පටිවලින් මුද්‍රා තබා තිබූ නඩු භාණ්ඩ කවරය පැ.1843 ලෙස ලකුණු කෙරුණු අතර, එම කවරය තුළ තිබූ අධිබල පශ්චාත් පිපුරුම් ආවරණ සහිත පළුදු වූ ලෝහ බෝල අඩංගු

ශිප්ලොක් කවරය පැ.1844 ලෙසත්, ලෝහ බෝල ගැටීමෙන් ගෝලාකාර නෙරුම් සහිතව පළුදු වූ ලෝහ තහඩු කැබලි දෙක පැ.1845 ලෙසත්, තැඹිලි පැහැති වෙළඳ ලාංඡනයක් හා ෆෝම් කුෂන් සහිත දෙකෙළවර දැඩි ලෙස පළුදු වූ බෑග් පටි කැබැල්ල පැ.1846 ලෙසත් ලකුණු කරනු ලැබීය. තවද එම පටියට සමානකම් දක්වන පැ.869 (B) ලෙස ලකුණු කර ඇති බැක්පැක් බෑගය සහ සාක්ෂිකරුට පෙන්වන ලද පැ.130 (7) වීඩියෝ දර්ශනයේ සිටින පුද්ගලයා පැළඳ සිටින බෑගය ද සංසන්දනාත්මකව හඳුනා ගන්නා ලදී.

<u>පොලිස් සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1634 විශ්‍රාමික ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනිල් ජයරත්න, 2026.07.20 දින සාක්ෂි දෙමින්, තමා 2018.07 වන මාසේ සිට 2021.10 වන මාසය දක්වා වෙරළබඩ පොලිසියේ අපරාධ පරීක්ෂණ අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කළ බවත්, 2019.04.21 වන දින වෙරළබඩ පොලිස් බල සීමාවට අයත් කොච්චිකඩේ දේවස්ථානයේ දී විශාල පිපිරීමක් සිදුවූ අතර එදින තමා නිවාඩු ලබා ගොස් සිටිය ද එය ආරංචි වූ වහාම සේවයට වාර්තා කොට පෙරවරු 11.00 වන විට කොච්චිකඩේ දේවස්ථානය වෙත ළඟා වූ බවත් තමා යන විටත් උසස් පොලිස් නිලධාරීන්, යුධ හමුදා සහ නාවික හමුදා නිලධාරීන්, විශේෂ කාර්ය බලකායේ බට පිරිස් එම ස්ථානයේ සිටි අතර එම ස්ථානයේ විශාල පිපිරීමක් සිදුවී විශාල විනාශයක් සිදුවී දොරටු වලින් එළියට ගලා තිබූ මස්

කැබලි නිරීක්ෂණය වූ බවත් කියා සිටින ලදී. කොළඹ අපරාධ කොට්ඨාශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අපරාධ වාර්තා කොට්ඨාශය (CRD) යන නිලධාරීන් ද ඒ වන විට කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමිය ද එම ස්ථානයට පැමිණ සිටි අතර වෙරළබඩ පොලිසියේ නිලධාරීන් ආරක්ෂාවටත් අවට මෙහෙයුම් කටයුතු සහ අනෙකුත් රාජකාරි සඳහාත් යෙදවූ අතර දේවස්ථානය තුළ තිබූ මෘත දේහ මහෙස්ත්‍රාත්තුමිය ඉදිරිපිට දී ඉවත් කරගැනීම සිදුවූ බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදී. මෙම, 2019.04.21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාරය ස්වයංඝාතක බෝම්බ ප්‍රහාරයක් බවට තමාට දැනගන්නට ලැබුණු බවත් කියා සිටි සාක්ෂිකරු එදින එනම් 2019.04.21 පස්වරු 6.30ට පමණ තමා එම ස්ථානයෙන් ඉවත්ව ගිය බවත්, 2019.04.22 වන දින පෙරවරුවේදී තවත් මළසිරුරක කොටසක් ශාන්ත අන්තෝනි දේවස්ථානයේ වහලය මත තිබෙන බව දැනගන්නට ලැබුණු බැවින් 2019.04.22 වන දින පෙරවරු 6.30ට පමණ නැවතත් එම ස්ථානයට ගොස් බෝම්බ පිපිරුණු ස්ථානය වහලය උඩ Ventilation fan එකක කවරයක් ගැලවුණු තැනක රැඳී තිබූ කඳින් වෙන්වූ මිනිස් හිසක් කැඩුණු වහල ආවරණය කිරීමට ගිය නාවික හමුදා නිලධාරීන් විසින් සොයා ගෙන තිබූ බවත් තමා එම ස්ථානයට නැග එය පරීක්ෂාකර බලා කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමිය වෙත එය දැන්වූ අතර ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමිය ද අපරාධ වාර්තා කොට්ඨාශයේ නිලධාරීන්ද, රජයේ රස පරීක්ෂක, අධිකරණ වෛද්‍ය නිලධාරීන්ද සහ පොලිස් නිලධාරීන්ද එම

ස්ථානයට පැමිණ හිස රැඳී තිබූ ස්ථානයේ දී ම එය නිරීක්ෂණය කළ බවත් ඔවුන් විසින් එම නිරීක්ෂණවලින් පසුව ඡායාරූප රැගෙන මහෙස්ත්‍රාත්තුමියගේ නියෝගය පරිදි එකී හිස ආවරණය කොට වෙරළබඩ පොලිසියේ පොලිස් කොස්තාපල් 74270 කුමාර යන නිලධාරියා මගින් ඉනිමගක ආධාරයෙන් වා කවුළුවෙන් එළියට ගත් බව සාක්ෂි දෙමින් කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුට පැ.26 දරන සංයුක්ත තැටියෙහි ඇතුළත්ව තිබූ පැ.47 දරන ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එම ඡායාරූපයේ ඇති මිනිස් හිස බෝම්බ පිපිරුණු ස්ථානය වහලය උඩ Ventilation fan එකක කවරයක් ගැලවුණු තැන රැඳී තිබූ කඳින් වෙන්වූ මිනිස් හිස බවට සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එසේම ඒ සඳහා උපයෝගී කරගත් ඉණිමග සහ පොලිස් කොස්තාපල් 74270 කුමාර එම ඡායාරූපයේ දර්ශනය වන බවද ඔහු කියා සිටින ලදී. තවද එම හිස ඉවතට ගෙන ආවරණය කිරීමෙන් අනතුරුව එම හිස ඇතුළත් ආවරණය BBPX වශයෙන් අක්ෂර ගත කොට tag එකක් ගැට ගසා වෙරළබඩ පොලිසියට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක ජයසූරිය භාරයේ අධිකරණ වෛද්‍ය කාර්යාලය වෙත යොමු කරන ලද බව කියා සිටින ලදී.

කිසිදු විත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1634 සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 1596 සාක්ෂි විශ්ලේෂණය සඳහා පහත සාක්ෂි අංක 1596 ගේ සාක්ෂි අවසානයේ කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1596 විශ්‍රාමික උප පොලිස් පරීක්ෂක ලාල් ජයසූරිය 2026.07.20 දින සාක්ෂි දෙමින්, තමා වෙරළබඩ පොලිසියට අනුයුක්තව තවද, 2019.04.21 දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය සහ එම දේවස්ථාන භූමියට පූර්ණ ආරක්ෂාවක්දේවස්ථානයේ ඒ අපරාධ ස්ථානයේ අවට ආරක්ෂක රාජකාරිය රාජකාරි කරමින් සිටියදී 2019.04.22 වන දින, එනම් 2019.04.21 වන දින සිදුවූ පාස්කු ප්‍රහාරයෙන් පසු දින, තමාට වෙරළබඩ පොලිසියේ අපරාධ අංශයේ පොලිස් පරීක්ෂක ජයරත්න මහතා විසින් කළු පාට පොලිතීන් බෑගයක ඔතන ලද මිනිස් හිසක් ලබා දුන් බවත් තමා එය කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත භාරදී එම භාරදීම ලේඛන ගත කොට නැවත කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ ඉදිරිපස ප්‍රදේශයේ ආරක්ෂා කිරීමේ රාජකාරියට වාර්තා කළ බව කියා සිටින ලදී.

කිසිදු විත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1634 පොලිස් පරීක්ෂක ජයරත්න සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 1596 සාක්ෂි විශ්ලේෂණය

මෙම සාක්ෂිකරුවන් මෙම නඩුවට අදාළවන ප්‍රධානතම සිද්ධිය වන 2019.04.21 දින සිදු වූ ප්‍රහාරාත්මක බෝම්බ පුපුරවා ගැනීමේ එක් ස්ථානයක් වන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය වෙත සිද්ධිය සිදුවී මද වේලාවකින් එම ස්ථානයට ගොස් නිරීක්ෂණ සටහන් කරන ලද නිලධාරියකු වේ.

මෙම කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බෝම්බ පුපුරවා ගැනීම සිදුකළ මරාගෙන මැරෙන බෝම්බකරුවකු වූ අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත් ගේ කඳින් වෙන්වූ හිස සොයාගැනීමෙන් අනතුරුව එය විධිමත්ව අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීමෙන් තහවුරු කරයි.

මේ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරී සේනානායක මහතා විසින් 2019.10.09 දින සකස් කරන ලද පැ.1003 දරන වෛද්‍ය වාර්තාවේ අන්තර්ගත කරුණු අනුව එය වඩාත් තහවුරු වේ. මරාගෙන මැරෙන බෝම්බකරුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් පැමිණිල්ල සහ විත්තිය විසින් වර්ෂ 2026.07.10 දින අපරාධ නඩු විධාන සංග්‍රහ 420 වගන්තිය යටතේ කරන ලද පිළිගැනීම මගින් වැඩි දුරටත් තහවුරු කර ඇත. පැමිණිල්ලේ සාක්ෂි අංක 182 මොහොමඩ් රිස්වි අබ්දුල් රහීම්ගේ

සාක්ෂියෙන් කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දී බෝම්බයක් පුපුරවාගෙන මිය ගිය මොහොමදු මුවාත් අලවුඩීන් යන අය එම ස්ථානයට පැමිණීමත් එම පැමිණි වාහනයත් යන කරුණු දෙක සනාථ කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1603 පොලිස් අධිකාරි දිමුතු සුරංග සමරනායක සාක්ෂි දෙමින්, තමා වර්ෂ 1999 සිට පොලිස් විශේෂ කාර්ය බලකායේ සේවයට බැඳී මේ වනවිට පොලිස් අධිකාරි තනතුරේ සේවය කරන බවත්, තමා විශේෂ කාර්ය බලකායේ බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් සේවය කළ අතර තමාට රටේ පැවති ත්‍රස්තවාදී සමයේ සිට මේ දක්වාම පුපුරන ද්‍රව්‍ය හැසිරවීම සම්බන්ධයෙන් සහ බෝම්බ නිෂ්ක්‍රීය කටයුතු සම්බන්ධයෙන් රාජකාරිය පැවරී තිබූ බවත්, 1999 සිට 2025 පෙබරවාරි 20 දක්වාම බෝම්බ නිෂ්ක්‍රීය කිරීම කටයුතුවල තමා යෙදී සිටිය අතර ඒ සම්බන්ධයෙන් දේශීය පාඨමාලා 22ක් ද, විදේශීය පාඨමාලා 16ක් ද, සම්පූර්ණ කර ඇති අතර මහා බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, පකිස්ථානය වැනි රටවල්වලින් පුහුණුවීම් ද, ලබාගෙන ඇති බවත් කියා සිටින ලදී.

නේටෝ සහ වෝසෝ ප්‍රතිපත්තීන්වලට අනුව නිෂ්පාදනය නොකරන ලද නිර්මාණාත්මක බෝම්බ නිෂ්ක්‍රීය කිරීම සම්බන්ධයෙන් තමා හදාරා ඇති බවත්, එනම් එකී වැඩි දියුණු කළ (IED) බෝම්බවලට

නිශ්චිත හැඩයක් හෝ පාටක් හෝ එය පුපුරුවා හැරීමේ නිශ්චිත ක්‍රමයක් නොමැති බවත්, වෙඩි බෙහෙත්, යූරියා සහ ඩීසල් වැනි ද්‍රව්‍ය උපයෝගී කරගනිමින් වැඩිදියුණු කරනු ලබන (IED) බෝම්බ හෝ පුපුරන උපක්‍රම සාදා භාවිතා කිරීම 70 දශකයේ සිට ක්‍රියාත්මක වූ බවත්, ඔහු කියා සිටින ලදී.

වර්ෂ 2019.04.21 වන පාස්කු ප්‍රහාරය දියත් වූ දිනයේදී තමා බෝම්බ පුපුරණ ලද ස්ථානවලට ගොස් ඒවා නිරීක්ෂණය කළ බවත්, 2019.04.22 වන දින තමා 2019.04.21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් සකස් කරමින් සිටියදී දහවල් 02.00ට පමණ කොච්චිකඩේ දේවස්ථාන, එනම් 2019.04.21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාර සිදු වූ දේවස්ථාන, ආසන්නයේ සැක කටයුතු වැන් රථයක් තිබෙන බවට තමාට ලතීෆ් මහතා විසින් දැනුම් දුන් බවත්, තමාගේ පලපුරුද්ද අනුව එය සාමාන්‍යයෙන් බෝම්බ පිපිරීමකින් පසුව දෙවන ප්‍රහාරයක් ද සැලසුම් කර තිබෙන අවස්ථාවක් විය හැකි බව තමාට තේරුම් ගිය බැවින් එම ස්ථානය වහාම ආරක්ෂිතව තබන ලෙසට දැනුම් දී උප පොලිස් පරීක්ෂක ප්‍රියන්ත ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට පිටත් කර හැරිය බවත් විනාඩි 20ක පමණ කාලයක දී උප පොලිස් පරීක්ෂක ප්‍රියන්ත තමාට කථා කොට ‘‘සර් මට ටිකක් අප්සට්" යනුවෙන් දැනුම් දුන් බවත් කියා සිටින ලදී. උප පොලිස් පරීක්ෂක ප්‍රියන්ත යනු පලපුරුදු නිලධාරියකු බවත් ඔහු එසේ දැනුම් දීම බරපතල කාරණයක්

ලෙස තමාට පෙනී ගිය බැවින් ඒ පිළිබඳ විමසීමේදී ඔහු තමාට ‘‘පරිපථයේ පැත්තක් වැහෙනවා. මට කියවගන්න බැහැ" යනුවෙන් දැනුම් දුන් බවත් ඒ අනුව එය ඉතා බැරෑරුම් අවස්ථාවක් ලෙස තමාට තේරුම් ගිය බැවින් එම ස්ථානයේ සියලු දෙනා ඉවත් කොට ආරක්ෂා සහිතව කටයුතු කරන ලෙස දැනුම් දී තමාද එම ස්ථානයට ගිය බවත් කියා සිටින ලදී. සාක්ෂිකරුට පැ.52 දරන CCTV දර්ශන පෙල නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන ලද අතර එහිදී තමා යොමු කළ කණ්ඩායමක් වැන් රථය පසුපස දොර විවෘත කොට පරීක්ෂා කරමින් සිටියදී ක්ෂණිකව එම ස්ථානයෙන් ඉවත් වන ආකාරය අනුව තමා යොමු කළ කණ්ඩායම පරිපථයේ අවධානම අවබෝධ කරගත් වහාම එතනින් ඉවත් වීම එම දර්ශනයේ ඇතුළත්ව ඇති බව කියා සිටින ලදී. තමා යතුරු පැදි කණ්ඩායමේ යතුරු පැදි කරුවකු සමඟ එම ස්ථානයට ගමන් කළ අතර තමා ආරක්ෂක ඇඳුම් කිසිවක් ඇඳ ගැනීමට තරම් කාලයක් නොතිබූ බැවින් නිළ ඇඳුමින් පමණක් සැරසී ගොස් එම වැන් රථයේ රියදුරු අසුනට පසු පසින් ඇති අසුනට එනම් මඟින් සිටින කොටස පරීක්ෂා කර බැලූ බවත් එය තුළ වොෂින් මැෂින් ටයිමරයක් සමඟ ගෑස් සිලින්ඩර තුනක් ද, විශේෂිත ද්‍රව්‍යයක් බහාලන ලද බහාලුමක් ද, වයර් අග්‍ර දෙකක් සහ ඉතා තුනී තඹගුස් නූලක් ද නිරීක්ෂණය වූ බවත් එහි කොටසක් චීත්ත රෙද්දක් වැනි රෙද්දකින් වසා තිබූ අතර එහි ගැටයක් ගසා තිබූ බවත් එසේම රුපියල් 1000 කොළ දෙකක් පිටු පස ආසනය මත තිබූ බවත්, වැන් රථයේ පිටු පස දොර අරින ස්ථානයට ද තඹගුස් නූලක් ගැට

ගසා තිබුණු අතර ඒ අනුව යම් පෙළඹවීමක් මඟින් ආකාර තුනකින් කුමන හෝ ආකාරයකට පිපිරවීමට සූදානම් කර තිබූ බෝම්බයක් තමා නිරීක්ෂණය කළ බවත් කියා සිටින ලදී. එහිදී තමාගේ නිරීක්ෂණ අනුව එක ස්ථානයක ගෑස් සිලින්ඩර තුනක් තබා එහි මැද හිස් අවකාශයේ ප්‍රධාන පිපිරුම් කාණ්ඩය ද, තවත් ගෑස් සිලින්ඩරයක් ඊට ආසන්නයේ ද තිබූ අතර වොෂින් මැෂින් ටයිමරය ඒ වන විටත් බින්දුවට පැමිණ තිබූ බවත් කියා සිටින ලදී. රෙදි සෝදන යන්ත්‍රයේ ටයිමරය වොල්ට් 09 (9v) බැටරියකට සම්බන්ධ කර තිබූ අතර එහි එක අග්‍රයක් ගෑස් සිලින්ඩර තුන මැද තිබූ ප්‍රධාන පිපිරුමට සම්බන්ධ කර තිබූ අතර අනෙක් අන්තය තැන් තුනකින් පාලනය වන ලෙසටත් කුමන හෝ ස්ථානයක් හරහා පරිපථය සම්බන්ධ වීමක් සමඟම බෝම්බය පුපුරා යන ලෙසට සකස් කර තිබූ බවත් කියා සිටින ලදී. ඉන් පළමුවැන්න වොෂින් මැෂින් ටයිමරය බින්දුවට පැමිණීමත්, දෙවැන්න වෑන් රථයේ පිටුපස දොර ඇරිය හොත් Cloth Clip එකක් මඟින් පරිපථය සම්පූර්ණ වී බෝම්බය පුපුරා යාමටත්, තුන්වැනි ක්‍රමය ලෙසට පිටුපස තිබූ චිත්ත රෙද්ද ඉවත් කිරීමට කටයුතු කළ හොත් උපක්‍රමය ක්‍රියාත්මක වී බෝම්බය පුපුරා යාමටත් එය සකස් කර තිබූ බව සාක්ෂිකරු කියා සිටින ලදී. රෙදි සෝදන මැෂිමේ ටයිමර් එක බින්දුව දක්වා පැමිණ තිබුණද එම උපක්‍රමය මඟින් බෝම්බය ක්‍රියාත්මක වී නොතිබූ අතර රුපියල් 1000 කොළ දෙකක් එම ස්ථානයේ තිබීම කිසිවෙකු ලවා පිපුරුම් උපක්‍රමය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා යොදන ලද උපක්‍රමයක් බව

තමාට පෙනී ගිය බවත් කියා සිටින ලදී. ඒ වන විටත් එම බෝම්බය පිපිරීමට ආසන්නතම නැතහොත් ඔවුන්ගේ භාෂාවෙන් කියන්නේ නම් භාගෙට පත්තු වූ බෝම්බයක් (Half – cocked) ලෙසට එය පැවති බවත් එබැවින් පරිපථය සඳහා විදුලිය ලබා දෙන බැටරියෙන් ලබා දෙන්නා වූ බලය විසන්ධි කිරීමට තමා තීරණය කළ අතර ඒ සඳහා Crocodile Hook යනුවෙන් හඳුන්වනු ලබන උපකරණයක් අවශ්‍ය වූ අතර ඒ වන විට එම ස්ථානයේ සිටි ගුවන් හමුදා බෝම්බ නිශ්ක්‍රීය අංශයෙන් එම උපකරණය ලබා ගෙන විදුලිය විසන්ධි කිරීමට උත්සාහ කළද ඒ සමඟම පරිපථය ක්‍රියාත්මක වීම සිදුවූ බැවින් තමා වේගයෙන් එම ස්ථානයෙන් ඉවත් වූ බවත් එසේ ඉවත්ව විනාඩියකටත් අඩු කාලයකදී බෝම්බය පුපුරා ගොස් ගිය බවත් කියා සිටින ලදී. එහිදී Control Explosion එකක් සිදුවූ බවත් කියා සිටින ලදී.

එම අවස්ථාවේදී කිසිවෙකුටත් තුවාල සිදු නොවූ අතර වරාය තාප්පය සම්පූර්ණයෙන් ද, වට පිට තිබූ නිවාස වලට ද, පිපිරීමෙන් හානි සිදුවූ බව කියා සිටින ලද සාක්ෂිකරු පැ.53 දරන ඡායාරූපයෙහි දැක්වෙන්නේ එම වැන් රථය පුපුරා ගිය ස්ථානය බවට හඳුනාගන්නා ලදී. සාක්ෂිකරුට පැ.1177(U) වශයෙන් සලකුණු කරන ලද වොල්ට් 09 බැටරියක්ද, පැ.1117(R) ලෙස සඳහන් බැටරි කනෙක්ටර් තුනක්ද පෙන්වා සිටින ලද අතර පුපුරා ගිය බෝම්බයේ තමා නිරීක්ෂණය කළ බැටරි සහ කනෙක්ටර්වලට සමාන බව සාක්ෂිකරු පිළිගන්නා ලදී. පාස්කු බෝම්බ

ප්‍රහාරයේදී ස්වයංඝාතක බෝම්බකරුවන් විසින් පුපුරවා ගත් ස්ථානවල තිබූ බයිසිකල් බෝල විශාල ප්‍රමාණයක් තමා නිරීක්ෂණය කළ ද මෙම වෑන් රථය පුපුරා ගිය ස්ථානයේ බයිසිකල් බෝල යොදා ගත් පිපිරුම් උපක්‍රමයක් නිරික්ෂණය නොවුණු අතර එය සඳහා වෙනස් ක්‍රමයක් භාවිතා කර තිබූ බවත් කියා සිටින ලදී. 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර එයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටියේ තමා බෝම්බය සහ එහි පරිපථය හඳුනාගත් අතර විද්‍යාත්මක පරීක්ෂණයක් තමා සිදු නොකළ බවත් මෙම බෝම්බය සාමාන්‍ය පුද්ගලයෙකුට සකස් කළ නොහැකි අතර ඒ සඳහා විශේෂ දැනුමක් ලබා ගත යුතු අතර කියා සිටින ලදී. තවද, පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර එවැනි ප්‍රහාරයක් සම්බන්ධයෙන් බුද්ධි වාර්තාවක් තමාට ලැබී නොතිබූ බව කියා සිටින ලදී.

නැවත ප්‍රශ්නවලදී බෝම්බය සකස් කිරීම සඳහා අන්තර්ජාලය හෝ විවිධ මූලාශ්‍ර උපයෝගී කරගෙන දැනුම ලබාගත හැකි වුවත් ඒ සඳහා නිසි පලපුරුද්ද නොමැති අවස්ථාවකදී එම බෝම්බය නිෂ්පාදනය වැරදීම් වන බවත් කියා සිටින ලදී. අධිකරණයෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් එවැනි වැරදීම්වලදී ජීවිතය අහිමිවීම, නැතහොත් ශරීරයේ කොටස්වලට බරපතල හානි සිදුවීම සිදුවිය හැකි බවත් සාක්ෂිකරු කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 182 මොහොමඩ් රිස්වි අබ්දුල් රහීම්ගේ සාක්ෂියෙන් කොළඹ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දී බෝම්බයක් පුපුරවාගෙන මිය ගිය මොහොමදු මුවාත් අලවුඩීන් යන අය එම ස්ථානයට පැමිණීමත් එම පැමිණි වාහනයත් යන කරුණු දෙක සනාථ කර ඇති අතර, මෙම සාක්ෂියෙන් හෙලි වූ වැඩි දියුණු කරන ලද පිපිරුම් උපක්‍රමයක් සහිතව එම ස්ථානයේ අටවා තිබූ පසුව පුපුරා ගිය එකී අංක WP PJ-4080 දරන වාහනය මෙම බෝම්බ පිපිරීම සඳහා යොදා ගැනීම තහවුරු වේ. එසේම මොහොමදු මුවාත් අලව්දීන් යන අය දේවස්ථානයට ප්‍රහාර එල්ල කිරීමට අමතරව එම ප්‍රහාරයෙන් පසුව දෙවන ප්‍රහාරයක්ද එල්ල වන සේ උපක්‍රමශීලිව අංක WP PJ-4080 දරන වාහනය තුළ බෝම්බ සවිකර තිබීම මඟින් විශාල ජීවිත හානියක් සහ දේපල හානියක් කිරීමේ චේතනාවෙන් කටයුතු කර ඇති බව පෙනී යයි.

මීගමුව කටුවාපිටිය ශුද්ධ වූ සෙබස්තියන් මුණිඳුන්ගේ දේවස්ථානයේදී සිදු වූ බෝම්බ පිපිරීම.

චෝදනා අංක 1646 සිට 4520 දක්වා චෝදනා ගොනු කර ඇත්තේ සියලුම චූදිතයන්ට එරෙහිව මීගමුව කටුවාපිටිය දී දැනට මියගොස් සිටින අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් හෙවත් කස්තුන් හෙවත් අබු මොහොම්මද් විසින්

අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයෙහි සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්වෙතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමේ වරද සිදු කළ බවද, එකී වරද සිදු කිරීමේ දී පහත නම් සඳහන් අයවලුන්ගේ මරණය සිදු කිරීමෙන් දැනට මියගොස් සිටින එකී අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් හෙවත් කස්තුන් හෙවත් අබු මොහොම්මද්, 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (උ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා සියලුම චූදිතයින් දැනට මියගොස් සිටින අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් හෙවත් කස්තුන් හෙවත් අබු මොහොම්මද්ට අනුබල දීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවට ය. (17 වන චූදිත නඩු විභාගය අතරතුරදී මිය යන ලද බැවින් ඔහුගේ චෝදනා ඉවත් කරගන්නා ලදි)

මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ සිදු වූ බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි සහ තුවාලකරුවන්ගේ සාක්ෂි

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2194 චානක නිශාන්ත රණසිංහ නැමැති සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් තමා මීගමුව කටුවාපිටිය ප්‍රදේශයේ 2018 මාර්තු මස සිට අධිකරණයේ සාක්ෂි ලබා දුන් දින දක්වාම පදිංචි වී සිටින බවත් තමා පදිංචි නිවස ආසන්නයෙහි කතෝලික භක්තිකයින් ඉතා විශාල ප්‍රමාණයක් සිටින බවත් තමාගේ නිවසට කිලෝමීටර් 02 ක් පමණ දුරින් කටුවාපිටිය දේවස්ථානය පිහිටා තිබෙන බවත් කටුවාපිටිය දේවස්ථානයෙහි 2019.04.21 දින බෝම්බ පිපිරීම සිද්ධිය සිදු වුණ බවත් එදින වනවිට තමාගේ නිවසේ CCTV පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ පැවති බවත් තමාගේ නිවසින් පිටත මහ පාරද ආවරණය වන පරිදි CCTV කැමරා සවිකර තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසු විමර්ශන නිලධාරීන් විසින් තමාගේ නිවසට පැමිණ තමාගේ නිවසේ CCTV දර්ශන පරීක්ෂා කිරීම් කළ බවත් එයට අදාළ CCTV පද්ධතිය තමා විසින් විමර්ශන නිලධාරීන්ට ලබා දුන් බවටත් පවසා අදාළ CCTV දර්ශන අඩංගු සිඩී තැටිය පැ.64 ලෙස ලකුණු කිරීමට පැමිණිල්ලෙන් කටයුතු කර ඇති අතර එම CCTV සීඩී තැටිය විවෘත අධිකරණයේ වාදනය කර එහි අඩංගු වීඩියෝ

දර්ශනවලින් මෙම සාක්ෂිකරුගේ නිවස පිහිටි ස්ථානය සහ නිවසේ තාප්පය ගේට්ටුව තිබෙන ආකාරයන් මෙම සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම CCTV දර්ශනවලට අනුව තමාගේ ගෙදර ඉදිරිපිට පාරෙන් පුද්ගලයෙකු පිටුපසින් විශාල බෑගයක් රැගෙන ගමන් කරමින් සිටින ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම දර්ශනය පැය 8:22:47 ට දිස්වෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන එම දර්ශනය පැ.64 (1) ලෙස ලකුණු කර ඇති අතර එලෙස තමා CCTV දර්ශනයෙන් හඳුනාගත් තැනැත්තා තමාගේ නිවස ඉදිරිපිට පාරේ ඇවිදගෙන යමින් පල්ලිය දෙසට ගමන් කරන ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එයට අදාළ CCTV දර්ශනය පැ.64 (2) ලෙස ලකුණු කර ඇති අතර එසේම, පසුව විමර්ශනයේදී එම පුද්ගලයා තමාගේ නිවස අසල නිවසක නතර වී සිට ඇති තැනැත්තෙකු බවට විමර්ශනයේදී හෙලි වී ඇති බවත් එම නිවස ද විමර්ශන නිලධාරීන් විසින් පරීක්ෂා කරන ලද බවට තමාට දැන ගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එම සැක කටයුතු පුද්ගලයා නැවතී සිට ඇති නිවස සාක්ෂිකරු තමාගේ නිවස ඉදිරියෙන් ගමන් කර අතුරු පාරෙහි හැරෙන විට තම අසල්වාසියෙකුගේ නිවසක් තිබෙන බවත් එම නිවසේ මෙම සැක කටයුතු පුද්ගලයා රැඳී සිටි බවට පසුව කතා බහ වුණ බවත් පවසා තමා විසින් පවසා සිටි එම නිවස ද CCTV දර්ශනවල හඳුනාගෙන ඇති සාක්ෂිකරු එය පැ.69 ලෙස ලකුණු කිරීමක් කර ඇත.

එම නිවස කළු පාට ගේට්ටුවක් සහිත සුදු පාට බිත්ති සහිත තට්ටු දෙකේ නිවසක් බවත් සාක්ෂිකරු පවසා ඇත. පෙර අවස්ථාවක පැ.56 (2) (A) ලෙස ලකුණු කර ඇති ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා දී ඇති අතර එයට අදාළ නිශ්චල ඡායාරූපයෙහි පැ.64 (1) පැ.64 (2) යන ඡායාරූපවල මෙම සාක්ෂිකරු විසින් හඳුනාගත් බෑග් එකක් දමාගෙන සිටි තැනැත්තා සිටින බවට හඳුනාගෙන ඇති අතර පෙර අවස්ථාවක පැ.56 (2) (A) (1) ලෙස ලකුණු කර ඇති පුද්ගලයාව මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන තමා විසින් පෙර අවස්ථාවක සඳහන් කර සිටියේ එම පුද්ගලයා සම්බන්ධයෙන්ම බවට සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීම තුළින්ද පෙනී යන්නේ 2019.04.21 වන දින උදේ වරුවේ මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය දෙසට විශාල බෑගයක්ද රැගෙන මෙම සාක්ෂිකරුගේ නිවසට ඉදිරියෙන් ගමන් කර ඇති පිරිමි පුද්ගලයා එනම් පැ.56 (4) (A) (i) ලෙස ලකුණු කර ඇති නිශ්චල ඡායාරූපයෙහි සිටින පුද්ගලයා මෙම සාක්ෂිකරුගේ නිවසට අදාළ CCTV දර්ශනවලින් පැ.64 (1) සහ පැ.64 (2) ලෙස ලකුණු කර ඇති නිශ්චල දර්ශනයන්වලට අදාළ දර්ශනවල සිටින පුද්ගලයාද එකම පුද්ගලයා බවට මැනවින් පෙනී යන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඉහත කී සැක කටයුතු පුද්ගලයා නවාතැන් ගෙන සිට ඇත්තේ මෙම සාක්ෂිකරුගේ

නිවසට මඳක් ආසන්නයේ පිහිටි අසල්වාසී නිවසක බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලිවන අතර පැ.69 ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති CCTV දර්ශනයක නිශ්චල ඡායාරූපයට අනුව එම පැ.69 දරන නිශ්චල ඡායාරූපය දිස්වෙන කළු පාට ගේට්ටුවක් සහිත තට්ටු දෙකේ නිවසෙහි ඉහතකී පැ.56 (4) (A) (i) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයෙහි සඳහන් පුද්ගලයා එනම් මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය තුළ බෝම්බ පිපිරීමට එකහෙලාම සම්බන්ධ පුද්ගලයා නැවතී සිට ඇති නිවස බවට ද කරුණු හෙලි වේ.

කෙසේ වුවත් අප විසින් ඉහත අනිකුත් සාක්ෂිවලදී සඳහන් කරන ලද ආකාරයෙන්ම එලෙස මෙම සාක්ෂිකරු විසින් හඳුනාගත් පැ.64 (i) සහ පැ.64 (ii) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනවලට අදාළ දර්ශනවල සිටින සැක කටයුතු පුද්ගලයා සැබැවින්ම කවර තැනැත්තෙක්ද එම තැනැත්තා කුමන ජාතිකයෙක්ද එම තැනැත්තාගේ සැබෑ අනන්‍යතාවය මෙම අධිකරණය ඉදිරියේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ. එසේම, මෙම සාක්ෂිකරු මෙම බෝම්බ පිපිරීමේ දී තුවාලකරුවෙකු නොවේ.

මෙම සාක්ෂිකරුවද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට සඳහන් කර ඇති බැවින් මෙම සාක්ෂිකරුගේ

සාක්ෂියද කිසිදු ආකාරයක අභියෝගයකට ලක් වීමකින් තොරව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත.

තුවාලකරුවන් ගේ සාක්ෂි

මෙම බෝම්බ පිපිරීමේ දී තුවාල වීමට ලක් වී ඇති පැ.සා.814 ලක්ෂ්මන් ශ්‍රීලාල් ෆොන්සේකා නැමැති පියතුමා සාක්ෂි ලබා දෙමින් ඔහු 1990 වසරේ පූජකවරය ලබා දිවයිනේ විවිධ ස්ථානවල මීෂම් භාර පියතුමෙක් ලෙස සේවය කළ බවත් 2018 වසරේ සිට 2021 වසර දක්වා කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මීෂම් භාර පියතුමා ලෙස සේවය කළ බවත් එම දේවස්ථානයට වසර 150කට අධික ඉතිහාසයක් තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර 2019.01.20 දින දේවස්ථානයේ 150 වන ජුබිලිය අති උත්කර්ෂවත් ලෙස පැවත් වූ බවත් එම උත්සවයෙන් පසු 2019.04.21 දින පාස්කු මංගල්‍යය පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබූ බවත් තමන් 2019.04.21 දින එනම් ඉරිදා දින පූජාව පැවත්වූයේ නැති බවත් තමා පැවැත්වූයේ ඊට පෙර දින පූජාව බවත් පාස්කු ඉරිදා උදෑසන දේව මෙහෙය උදෑසන 7.00ට සංජීව අප්පුහාමි නැමැති සහායක පියතුමා විසින් සහ සමීර නැමැති පියතුමා විසින් පැවැත්වීමට කටයුතු යොදා තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

එදින උදෑසන 7.00 ට ආරම්භ කරන ලද දේව මෙහෙය අවසන් වීගෙන එද්දී වින්සන් සභාවේ තැනැත්තෙකු නැගී සිට තමා විසින් (මෙම

පියතුමා) අදාළ කාලපරිච්ඡේදයේ සිදු කරන ලද කාර්යයන් අගයමින් කතාවක් කළ බවත් එම අවස්ථාවේදී තමා සහායක පියතුමන් දෙන්නා සමඟ හිඳගෙන සිටි බවත් එම අවස්ථාවේදී කොණ්ඩේ බෙල්ල දක්වා වවාගෙන තිබෙන කණ්නාඩියක් පැළඳ තොප්පියක් දමා ලොකු බෑග් එකක් රැගෙන පුද්ගලයෙකු මහ දොරෙන් ඇතුල් වෙන්න ආවද එම ස්ථානයේ ජූජාවට පැමිණි සෙනග 900 ක් 1000 ක් පමණ සිටි නිසා එම තැනැත්තාට ඇතුළට එන්න බැරි වුණ බවත් ඉන්පසු එම තැනැත්තා අනිත් පැත්තෙන් ඇවිත් පළවෙනි දොරෙන් ඇතුල් වීමට උත්සාහ කළද එතනින්ද ඒමට බැරි වුණ බවත් ඉන්පසු එම තැනැත්තා දෙවෙනි දොරෙන් තල්ලු කරගෙන එද්දීම බැතිමතෙකුගේ සපත්තුවක එම තැනැත්තා පැටලුණු බවත් එවිටම බෝම්බයක් පිපිරී වහලය ගැලවී ගිය බවත් ලොකු ශබ්දයක් ඇති වුණ බවත් තමාවද බිම වැටී ටයිල් එකේ වැදී තුවාල වී ලේ ගැලූ බවත් එම අවස්ථාවේ සිහි නැති වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම සිදුවීම සිදුවන විට හරියටම වේලාව 08.48 බවත් බෝම්බය පිපිරෙන වේලාවේම තමාගේ අතේ තිබුණු ඔරලෝසුව දෙස බැලීමේදී වේලාව 08.48 බවත් සාක්ෂිකරු පවසා ඇත. බෝම්බය පිපිරුණු අවස්ථාවේදී උඩ සිවිලිම කඩා වැටී තමා සමඟ සිටි අනිත් පියතුමන්ලා දෙදෙනාටම කැපුම් තුවාල සිදුවුණු බවත් දේව මෙහෙය පැවැත්වූ සංජීව අප්පුහාමි පියතුමාටද කැපුම් තුවාල සිදු වුණ බවත් එසේම, පල්ලිය තුළ බොහෝ තුවාලකරුවන් මැරී වැටී තිබූ බවත් බෝම්බ පිපිරීම සිදුවී විනාඩි

10 ක් 15 ක් කාලය තුළ ක්ෂණිකව වාහන ඇවිත් තුවාලකරුවන්ව රෝහල්වලට ගෙන ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට පිවිසෙන්න ගේට්ටු තුනක් තිබෙන බවත් මීගමුවේ ඉදන් කෙලින්ම පල්ලියට එන්න පුළුවන් ප්‍රධාන මාර්ගයක් තිබෙන බවත් ශාන්ත සෙබස්තියන් මාවතෙන්ද දේවස්ථානයට ඇතුළු විය හැකි බවත් දේවස්ථානයෙහි මහ දොරවල් තුනක් තිබෙන බවත් දෙපැත්තේ එක පැත්තකින් දොරවල් තුන බැගින් දොරවල් හයක් තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් කර ඇති මෙම දේවස්ථානයට අදාළ පිඹුරක් මෙම සාක්ෂිකරු මඟින් පැ.55 ලෙස ලකුණු කර ඇති අතර එහි දේවස්ථානය පිහිටි ස්ථාන ගත වී තිබූ ආකාරය පිළිබඳව සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.එම පැමිණිල්ලෙන් පැ.55 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙහි කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය ඇතුළත සහ පිටත මාර්ග දිස්වෙන සිතියම විත්තිය විසින් හඹ නොකරන බවට පවසා එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය ප්‍රකාරව පිළිගැනීමක් ලෙසද වාර්තා කර ඇත.

මෙම සාක්ෂිකරු මඟින් දේවස්ථානයෙහි දොරටු පිහිටි ආකාරය, අල්තාරය පිහිටි ස්ථානය ඇතුළු වැදගත් ස්ථාන රාශියක් සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවා ඇත. එසේම, මෙම දේවස්ථානයේ CCTV කැමරා

පද්ධතියක් තිබුණු බවත් කැමරා 06කට අදාළ රූපවාහිනී තිර 06කින් යුත් කැමරා පද්ධතියක් බවත් එම කැමරා පද්ධතිය තමාගේ කාර්යාලයෙහි සවිකර තිබූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව මෙම CCTV කැමරාවල අඩංගු දර්ශන එම CCTV කැමරා දේවස්ථානයෙහි සවි කරන ලද පුද්ගලයාම කැඳවා ගෙන ඇවිත් පරීක්ෂාවට ලක් කළ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර අදාළ CCTV දර්ශන අඩංගු සිඩී තැටියක් පැ.56 ලෙස ලකුණු කර එහි අඩංගු CCTV දර්ශන රාශියක් පැමිණිල්ල මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇත.

එසේම, අදාළ බෝම්බ පිපිරීම සිදු වුණ දින මෙම සාක්ෂිකරු වාඩි වී සිටි ස්ථානය, අල්තාරය පිහිටි ස්ථානය, සැක කටයුතු පුද්ගලයා පල්ලිය තුළට පැමිණෙන ආකාරය එසේම, සැක කටයුතු පුද්ගලයා බෑග් එකක් කරේ එල්ල ගෙන නැමී නැමී එනවා තමා දුටු ආකාරය CCTV දර්ශනවලින් දිස්වෙන බව සහ තමා එලෙස දුටු පුද්ගලයා CCTV දර්ශනවල සිටින ආකාරය පෙන්වා දෙමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා සිටි පරිදි දේව මෙහෙයෙන් අනතුරුව චාමින්ද නැමැත්තෙකු මෙම සාක්ෂිකරුගේ සේවය අගය කරමින් ස්තුති කතාව කරමින් සිටි දර්ශනයද CCTV දර්ශනය තුළින් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එසේම, පල්ලියෙහි අල්තාරය පිහිටා තිබූ ස්ථානය ද අල්තාරයෙහි තමා සහ අනිත් පියතුමන්ලා දෙදෙනා සිට ගෙන සිටින

ආකාරය සහ චාමින්ද නැමැත්තා ස්තූති කතාව පවත්වමින් සිටින ආකාරයද CCTV දර්ශනය තුළින් සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහුට පෙන්වා දෙන ලද CCTV දර්ශන පරීක්ෂා කර බලමින් සාක්ෂිකරු පෙර සඳහන් කරන ලද පරිදි පල්ලිය තුළට පැමිණි සැක කටයුතු පුද්ගලයාව පැ.56 දරන CCTV දර්ශන පටයෙහි හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එලෙස හඳුනාගත් එම පුද්ගලයාට අදාළ විස්තර ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වන ලදුව සාක්ෂිකරු එය හඳුනාගෙන ඇත. එකී විස්තර ඡායාරූපය පැ.56 (04) (A) ලෙසට ලකුණු කිරීමක් කර ඇත. තවද පැමිණිල්ල විසින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වැඩිදුරටත් මෙහෙයවීමේදී මීගමුව සහ කුරුණෑගල අපරාධ පරීක්ෂනාගාර මඟින් ලබා ගන්නා ලද නිශ්චල ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි 04 කින් නිශ්චල ඡායාරූප ඇතුළත් සංයුක්ත තැටි පැ.57 (1, 2, 3, 4) ලෙස ලකුණු කිරීමක් කර ඇති අතර පැ.57 (1) සංයුක්ත තැටියේ අඩංගු ඡායාරූප මෙම සාක්ෂිකරුට පෙන්වා සාක්ෂි මෙහෙයවීමේදී එම ඡායාරූප වල පල්ලියෙහි ඔරලෝසුව අල්තාර කුළුණක උඩ වම් පැත්තේ තිබෙන ආකාරය හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එම ඡායාරූපයට අදාළ ඔරලෝසුවෙහි වේලාව 8.47 ලෙස පෙනෙන බවට සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

එසේම, මෙම ඡායාරූප පිපිරීමට පසුව ගත්ත ඒවා බවට සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇති අතර එසේම, දේවස්ථානය තුළ පිපිරීම නිසා මිනී ගොඩක් තිබුණු බවට පවසා එවන් එක් ඡායාරූපයක් පැ.59 ලෙස සාක්ෂිකරුගෙන් ලකුණු කර ඇති අතර තවත් ඡායාරූපයි පැ.60 ලෙසද එසේම, එලෙසම මිය ගිය පුද්ගලයන් පෙන්නුම් කරන ඡායාරූපයක් පැ.62 ලෙසද ලකුණු කර ඇති අතර මෙම දේවස්ථානය තුළ පිපිරීම නිසා මිය ගිය පුද්ගලයන් ගණන නිශ්චිතවම තමාට පැවසීමට නොහැකි බවත් දළ වශයෙන් එය 120 කටත් අධික බවත් සිද්ධියෙන් තුවාල වූ ගණන ද තමාට දළ වශයෙන් කියන්නට අපහසු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මිය ගිය අය අතර කුඩා දරුවන් වැඩිවියේ දරුවන් එසේම, අවුරුදු 50 ට වැඩි පිරිස ගොඩක් සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තවත් වැඩිමහල් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් එනම් මිය ගිය පුද්ගලයෙකුගේ ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වන ලදුව එය පැ.03 ලෙස ලකුණු කර ඇත.

මෙම පිපිරීම නිසා දේවස්ථානයට සිදුවූ හානිය සම්බන්ධයෙන් අලාභය සම්බන්ධයෙන් තක්සේරු කිරීමට තමාට අවස්ථාවක් නොලැබුණු බවත් තමාට පසුව පැමිණි පියතුමා විසින් එම කටයුතු සිදු කළ බවත් පැ.60 සහ පැ.61 දරන ඡායාරූපවලට අනුව දේවස්ථානයට සිදුවී ඇති අලාභයන් පෙන්නුම් කරන බවටත් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 04 සහ 15 චූදියන් යන චූදිතයන් දෙදෙනා වෙනුවෙන් පමණක් වන අතර අනෙකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුගෙන් විත්තියෙන් අසා ඇත්තේ පාස්කු ඉරුදින උත්සවය සඳහා බැතිමතුන්ගේ ආරක්ෂාව සලසා ගැනීම සඳහා යම් පියවරක් ගෙන තිබුණාද එවැනි ඉල්ලීමක් පොලිසිය වෙත කර තිබුණාද යන්න සම්බන්ධයෙන් වන අතර සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ පාස්කු ඉරිදාව සඳහා තමාලා එලෙස ආරක්ෂාවක් ඉල්ලා සාමාන්‍යයෙන් ආරක්ෂාවක් ඉල්ලා සිටින්නේ නැති බවයි.

විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ පාස්කු ඉරිදා සම්බන්ධයෙන් හෝ එදිනට එන බැතිමතුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිසි සැලකීමක් නැති බවට යෝජනා කර ඇති අතර සාක්ෂිකරු එයට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ පාස්කුවට තමාලා සිරිතක් වශයෙන් එලෙස ආරක්ෂාවක් ඉල්ලා සිටියේ නැති බවත් තමා එම දේවස්ථානයෙහි සේවය කළ අවුරුදු 05ක කාල සීමාව තුළම එවැනි ආරක්ෂාවක් ඉල්ලා සිටියේ නැති බවයි.

විත්තියෙන් දිගින් දිගටම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ පාස්කු ප්‍රහාරයෙන් පසුව දේවස්ථානය යලි යථාතත්ත්වයට පත් කර 2019 ජූලි මස 21 වන දින පැවති උත්සවයට කාදිනල්තුමා ඇතුළු ස්වාමීලා 50 ක්

60 ක් පමණ සහභාගී වුණ බවත් එදින සවස දිවා පූජාවද පැවැත්වූ බවත් එදින කාදිනල් වහන්සේ විසින් දීර්ඝ දේශනාවක්ද කළ බවත් වේ. කාදිනල්තුමා විසින් කරන ලද දේශනයේදී පවසපු කරුණු කුමක්ද සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් විමසූ විට ඔහු පවසා ඇත්තේ තමාට ඒ ගැන පැහැදිලි මතකයක් නොමැති බවයි.කෙසේ වෙතත් සාක්ෂිකරු පවසා ඇත්තේ මෙම අපරාධයන් කරපු අය නීතියේ රැහැනට හසු කරන්නට ඕන යනුවෙන් යාඥා කරන්න යැයි කාදිනල්තුමා පැවසූ බවට සාක්ෂිකරු පවසා ඇති අතර විත්තියෙන් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ කාදිනල්තුමා විසින් මෙම සිද්ධිය ජනාන්තර කුමන්ත්‍රණයක් බවට පවසා ඇති බව වුවද සාක්ෂිකරු සඳහන් කර අත්තේ තමාට ඒ පිළිබඳ දැනීමක් නොමැති බවයි. එසේම, විත්තියෙන් යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු කිසිම අවස්ථාවක මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ පොලිසියට ප්‍රකාශයක් ලබා දී නොමැති අතර සාක්ෂිකරු ද පවසා ඇත්තේ තමා එලෙස ප්‍රකාශයක් කළේ නැති බවත් තමාට අසත්‍ය කියන්නට කිසිදු අවශ්‍යතාවයක් නැති බවත් එම සිද්ධියෙන් පසු තමා සිටි තත්ත්වය අනුව තමාගේ සහායක පියතුමා විසින් සිද්ධිය සම්බන්ධයෙන් පුද්ගලයන්ගෙන් අසන ලද කරුණුවලට පිළිතුරු දීම සිදු කළ බවටත් පවසා ඇත.

පැ.සා.506 පලිහවඩනගේ අනුෂා කුමාරි ප්‍රනාන්දු නැමැති සාක්ෂිකාරිය සාක්ෂි ලබා දෙමින් ඇය කටුවාපිටිය ජූඩ් මාවතේ පදිංචි

වෙලා සිටින බවත් කතෝලික තැනැත්තියක් වන තමා ආගමික කටයුතු සඳහා තමා නිරන්තරයෙන්ම යන පල්ලිය වන කටුවාපිටිය සෙබස්තියන් මුණිතුමාගේ දේවස්ථානයට යන බවත් පවසා ඇති අතර තමාගේ ස්වාමිපුරුෂයාගේ නම සෙනරත් ආරච්චිගේ ඩොනෙක් ශාන්ත කුමාර අප්පුහාමි බවත් තමාට වැඩිමහල් දියණියක් සහ පුතෙක් ලෙස දරුවන් දෙදෙනෙක් සිටි බවත් වැඩිමහල් දුවගේ නම සජිනි විනෝරා දුලක්ෂි අප්පුහාමි බවත් පුතාගේ නම විමුක්ති තරිඳු අප්පුහාමි බවත් 2019.04.21 වන දින වනවිට ඇගේ දියණියට අවුරුදු 21 ලබන්න සිටි බවත්, ඒ වනවිට පුතාගේ වයස අවුරුදු 13 ලබන්න සිටි බවත් ඇය පවසා ඇති අතර කටුවාපිටිය දේවස්ථානයේ සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් තමාගේ ඉහත කී දරුවන් දෙදෙනාම මිය ගිය බවත් එදින තමා තමාගේ දරුවන් සහ පවුල සමඟ කටුවාපිටිය සෙබස්තියන් මුණිතුමාගේ දේවස්ථානයට ගිය බවත් එදින උදෑසන දේව මෙහෙයට තමා ද දරුවන් දෙදෙනාද ස්වාමිපුරුෂයාද සහභාගී වුණ බවත් දේව මෙහෙය අවසානයේ පල්ලියේ පියතුමා සිටින අවසන් දින කීපය බැවින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන චාමින්ද ප්‍රියදර්ශන නැමැත්තා විසින් පියතුමා සම්බන්ධයෙන් එනම් ගරු ශ්‍රීලාල් ෆොන්සේකා පියතුමා සම්බන්ධයෙන් ස්තුති කතාවක් පැවැත්වූ බවත් එම ස්තුති කතාව අවසන් කිරීමට ප්‍රථමයෙන් පල්ලිය තුළ ගුහාව පැත්තේ කොරිඩෝ එකින් මනුෂ්‍යයෙක් ලොකු ට්‍රැවලින් බෑග් එකක් අරගෙන ඉස්සරහට ගෙන ගොස් ඉස්සරහා දොරෙන් එබෙනවා තමා දැක්ක බවත්

ඉන්පසු දෙවන දොරෙනුත් එබෙනවා දැක්ක බවත් තමා සිටියේ තුන්වන දොරට කිට්ටුවෙන් බවත් තමා දුටු එම පුද්ගලයා විදේශිකයෙක් වගේ තමාට පෙනුන බවත් තමාගේ ගමේ පකිස්ථාන් අය නිතරම ගැවසෙන නිසා තමා එලෙස පවසන බවත් ඉන්පසු එම තැනැත්තා දොරෙන් අඩි තුනක් විතර ඉස්සරහට ඇවිත් නැමෙනවා වගේ දැක්ක බවත් ඊට පසු කුමක්ද වුනේ කියලා තමාට හිතා ගන්නත් බැරි වුණ බවත් එම අවස්ථාවේ පල්ලිය තුළ තිබූ බංකු පේළියෙහි තුන්වෙන බංකුවේ තමා සහ දුව සිටි බවත් පළවෙනි බංකුවේ තමාගේ පුතා සහ මහත්තයා සිටි බවත් පිපිරීම වෙනකොට පොළොව හෙල්ලෙනවා වගේ පිපිරීමක් ආව බවත්, ඉන්පසු තමාට සිහි නැතිව ගිය බවත් සිහිය ආව ගමන් තමා දරුවන්ව මහත්තයාවයි හෙව්ව බවත් එම අවස්ථාවේ තමාගේ මුහුණට තුවාල සිදුවී ඇස් පෙනීමද බොහොම අඩු වෙලා තිබුණු බවත්බොහොම අමාරුවෙන් තමා සොයන විට දුව සිටි තැනින් ඉස්සරහා වැටිලා ඉන්න බව දැකපු බවත් දුවට කතා කළද දුව කතා කළේ නැති බවත් මහත්තයාවද හෙව්වද මහත්තයා හිටපු තැන පේන්න හිටියේ නැති බවත් එතන තිබුණ බංකුවත් තිබුණේ නැති බවත් එය කුඩු පට්ටම් වෙලා තිබුණු බවත් තවදුරටත් හොයා බලන විට තාත්තා සහ පුතා හරහට වැටිලා මුණින් අතට වැටිලා සිටි බවත් තමා එම අවස්ථාවේදී ස්වාමිපුරුෂයාව හඳුනා ගත්තේ ඔහුගේ අතේ මුදු ගොඩක් දාලා තිබුණ නිසා ඒ අතින් තමාගේ මහත්තයා බවට හඳුනා ගත්ත බවත්

එම අවස්ථාවේදී තමාගේ දරුවන්ව බේරා දෙන්න යැයි තමා කෑ ගැසූ බවත් මෙම සාක්ෂිකාරිය හඬමින් සාක්ෂි ලබා දෙමින් පවසා ඇත.

සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ මෙම බෝම්බ පිපිරීමෙන් එදින පල්ලියට ගිය තමාගේ ස්වාමිපුරුෂයාගේ නංගි සහ නංගිගේ දුවලා දෙන්නා සහ පුතාද මිය ගිය බවත් නංගිගේ ලොකු දුව අවුරුදු 13 ක් බවත් නංගිගේ දෙවන දුව අවුරුදු 10 ක් පමණ බවත් නංගිගේ පුතා වයස අවුරුදු 06 ක ළමයෙකු බවත් ඇය පවසා ඇති අතර මෙම පිපිරීම නිසා තමාගේ ඇස් අස්සේ තවමත් යකඩ බෝලයක් තිබෙන බවත් එය ඉවත් කරන්න බැහැ යැයි වෛද්‍යවරු පැවසූ බවත් මුහුණේ යකඩ බෝලයක් තිබී ඉවත් කළ බවත් පිපිරීම නිසා තුවාල වූ අනිත් පුද්ගලයන්ගෙන් විසිරුනු මස් වැදලි ඇගේ මුහුණ පුරා එල්ලී තිබුණු බවත් සාක්ෂිකාරිය වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇති අතර මෙම පිපිරීමෙන් ලත් තුවාල නිසා තමා කොළඹ ඇස් රෝහලේ ප්‍රතිකාර ගත් බව ඇය පවසා ඇති අතර තමාලා මුලින්ම ගෙන ගියේ මීගමුව රෝහලට බවට තමාගේ දුව මීගමුව රෝහලේ බිම දමා තිබූ බවත් දුව කට ඇර ඇර හයියෙන් හුස්ම ගන්න දැගලුව බවත් දුවගේ ඇඳුම් උඩ ගිහිල්ලා තිබුණු බවත් තමා රෙද්දක් සොයා දියණියගේ යටි කය වැහුව බවත් පසුව තමා දුවව බේරා දෙන්න යැයි කෑ ගසන විට දොස්තර කෙනෙක් ඇවිත් දුවව අයිසියු එකට දාන බවට පැවසූබවත් තමාවද ඇඳකට ගිහින් දැම්ම බවත් පවසා ඇත.

පසුව තමා කොළඹ ඇස් රෝහලේදී කෑ ගසමින් තමාගේ දුව ගැන විමසූ විට දුව මෙම සිද්ධියෙන් මියගොස් ඇති බවට තමාට දැන ගන්නට ලැබුණු බවත් එදින රාත්‍රියේ තමාව බලන්න පැමිණි අක්කාගේ පුතාගෙන් තම දියණිය මිය ගිය බවට දැනගත්ත බවත් මෙම බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් තමාගේ ස්වාමිපුරුෂයාද තමාගේ පුතාද මිය ගිය බවත් ඇය හඬමින් අධිකරණයට පවසා ඇත.

තමාට බෝම්බ පිපිරීම නිසා සිදුවූ තුවාල සම්බන්ධයෙන් තමා තවමත් ප්‍රතිකාර ගන්න බවත් තමාගේ වම් කන සම්පූර්ණයෙන්ම ඇහෙන්නේ නැති බවත් නිතර ස්නායු ආබාධ එන බවත් තමාට ස්ට්‍රෝක් එකක් වගේ ඇවිත් දකුණු පැත්ත පණ නැතිව ගිය බවත් බෝම්බ පිපිරීමට පෙර තමාගේ කන් දෙක යතා තත්ත්වයේ තිබුණ බවත් ඇස් පෙනීමත් හොඳටම තිබුණු බවත් සාක්ෂිකාරිය පවසා ඇත.

මිය යනවිට තමාගේ ස්වාමිපුරුෂයා වඩු ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත් අරන් ඉදි කිරීම් කටයුතු සිදු කළ තැනැත්තෙකු බවත් ස්වාමිපුරුෂයා මිය යනවිට තමා රැකියාවක් කළේ නැති බවත් තමාට මේ වනවිටත් කිසිදු රැකියාවක් කර ගැනීමට නොහැකි බවත් පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.56 (4) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන මෙම සාක්ෂිකාරියට ද නැරඹීමට ප්‍රදර්ශනය කර ඇති අතර එම CCTV දර්ශන නරඹමින් මෙම

සාක්ෂිකාරිය සහ ඇගේ ස්වාමිපුරුෂයා සහ ඇගේ දරුවන් එදින පල්ලිය තුළ සිටි ආකාරය ඇය විසින් එම CCTV දර්ශනවලින් හඳුනාගෙන ඇත.

ඇගේ පුතා සහ දියණිය එදින ඇඳ සිටි ඇඳුම්වල වර්ණයන් විස්තර කරමින් පල්ලිය තුළ තම දරුවන් සිටි ස්ථානයන් පෙන්වා දෙමින් ඔවුන්ව හඳුනාගෙන ඇය සාක්ෂි ලබා දී ඇත. එසේම, ඇගේ සාක්ෂියේදී සඳහන් කරන ලද පරිදි පල්ලිය තුළට බෑග් එකක් රැගෙන පැමිණි පිරිමි පුද්ගලයා පැ.56 (4) දරන CCTV දර්ශනයෙහි සිටින බවත් පවසා පෙන්වා හඳුනාගෙන පෙර අවස්ථාවක පැ.56 (4) (A) ලෙස ලකුණු කරන ලද නිශ්චල ඡායාරූපයද සාක්ෂිකාරිය හඳුනාගෙන එම ඡායාරූපයේ සිටින්නේ එම තැනැත්තා බවට පෙන්වා හඳුනාගෙන ඇති අතර මෙම සාක්ෂිකාරියගෙන් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත.

<u>කටුවාපිටිය බෝම්බ පිපිරීමේ තුවාලකරුවන්ගේ සාක්ෂි ඇගයීම</u>

මෙම බෝම්බ පිපිරීමේ වින්දිතයෙකු වන පැ.සා.814 ලක්ෂ්මන් ශ්‍රීලාල් ෆොන්සේකා නැමැති පියතුමාගේ සාක්ෂිය සමස්තයක් ලෙස ගෙන විශ්ලේෂණය කර ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් 2019.04.21 දින වනවිට මෙම සාක්ෂිකරු සේවය කළ මීගමුවේ කටුවාපිටියේ ශාන්ත සෙබස්තියන් දේවස්ථානයෙහි 2019.04.21 වන දින

පෙරවරුවේ පැවති පාස්කු දේව මෙහෙය අතරතුර පෙරවරු 8.48ට පමණ බෝම්බ පිපිරීමක් සිදු වුණ බව සහ එම බෝම්බ පිපිරීම නිසා බැතිමතුන් ඉතා විශාල ප්‍රමාණයක් මිය ගොස් ඉතා විශාල ප්‍රමාණයකට තුවාල සිදු වුණ බව වේ.

එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දී විස්තර කර ඇති පරිදි කොණ්ඩය බෙල්ල දක්වා වවා ගත් කණ්නාඩි කුට්ටමක් පැළඳ තොප්පියක් දමාගෙන ලොකු බෑග් එකක් රැගත් සැක කටයුතු පුද්ගලයෙකු පල්ලිය තුළට මුලින්ම ප්‍රධාන දොරෙන් ඇතුල් වීමට උත්සාහ කළද සෙනඟ ගොඩක් සිටි නිසා ඔහුට එම ස්ථානයෙන් ඇතුල් වීමට නොහැකිව ඉන්පසුව ඔහු එයට මදක් අනිත් පැත්තෙන් තිබූ දොරෙන්ද ඇතුළට ඒමට උත්සාහ කළද එතනින් ද ඔහුට එන්නට බැරි වූ පසු ඔහු සෙනඟද තල්ලු කරගෙන දෙවන දොරෙන් ඇතුළට එන අවස්ථාවේදී බැතිමතෙකුගේ සපත්තුවක පැටලුන බව සහ එම අවස්ථාවේදී බෝම්බය පිපිරීම සිදු වුණ බවට වේ.

එම සැක කටයුතු පුද්ගලයාගේ නිශ්චිත අනන්‍යතාවයක් මෙම සාක්ෂිකරුට නිබී නොමැති අතර කෙසේ වෙතත් සිද්ධිය සිදුවූ දින පල්ලිය තුළට පැමිණි පුද්ගලයාව මෙම සාක්ෂිකරු විසින් CCTV දර්ශන ආශ්‍රයෙන් හඳුනා ගෙන ඇති අතර විශේෂයෙන්ම මෙම අධිකරණය ඉදිරියේ පැ.56 (4) (A) ලෙස සහ පැ.56 (4) (A) (i) ලෙස නිශ්චල ඡායාරූපයේ සිටින

පුද්ගලයාම එලෙස පල්ලිය තුළට පැමිණි සැක කටයුතු පුද්ගලයා සහ එම පුද්ගලයා ඉහත පරිදි බලවත් උත්සාහයක් දරා පල්ලිය තුළට ඇතුළු වීමට කටයුතු කර ඇති ආකාරය සහ දෙවන දොරටුවෙන් පල්ලිය තුළට සෙනඟ තල්ලු කර දමා බලහත්කාරයෙන් ඇතුළු වීමට කටයුතු කළ අවස්ථාවේදී බැතිමතෙකුගේ සපත්තුවක පය පැටලීමක් සිදුවී එම අවස්ථාවේදී පිපිරීම සිදුවී ඇති බවට ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය තුළින් හෙලිවන අතර එම සාක්ෂිය විත්තිය විසින් හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී කිසිදු ආකාරයකින් හබ කිරීමකට ලක් කිරීමක් කර නොමැති පසුබිම තුළ එම කරුණ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සැබැවින්ම පිළිගත හැකි විශ්වාසනීය සාක්ෂියක් බව මෙම අධිකරණයට පැහැදිලිව පෙනී යයි.

කෙසේ වෙතත් ඉහත පරිදි මෙම සාක්ෂිකරු විසින් පැ.56 (4) (A) (01) ලෙස ලකුණු කරන ලද නිශ්චල ඡායාරූපයෙහි සිටින පුද්ගලයාගේ සැබෑ අනන්‍යතාවය සම්බන්ධයෙන් සහ එම පුද්ගලයාගේ නම කුමක්ද, ඔහු කවරෙක්ද, යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුට කිසිදු දැනීමක් නොමැති පසුබිම තුළ එම පුද්ගලයාගේ අනන්‍යතාවය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ.

ඉහතින් සඳහන් කරන ලද පරිදි මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මෙම නඩුවෙහි 04 සහ 15 චූදිතයන් හැර අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස්

ප්‍රශ්නවලට ලක් කිරීමක් කර නොමැති බවට එනම් හරස් ප්‍රශ්න නොමැති බවට සැල කර ඇති බැවින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය එම චූදිතයන් වෙනුවෙන් කිසිදු ආකාරයකින් හබ කිරීමකට ලක් වී නොමැති බවට මෙම අධිකරණයට මැනවින් පෙනී යයි.

කෙසේ වෙතත් 2019.04.21 වන දින පෙරවරු 8.48ට සහ පෙරවරු 8.49ත් අතර වේලාව තුළදී මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය තුළ මෙලෙස ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සැබැවින්ම සිදු වී ඇති බව සහ එමඟින් එම දේවස්ථානයට බලවත් ලෙස හානි සිදු වී එදින පාස්කු ඉරිදා දේව මෙහෙයට සහභාගී වෙමින් සිටි බාල, මහළු, වැඩිහිටි බැතිමතුන් ඉතා විශාල ප්‍රමාණයක් මිය ගොස් ඉතා විශාල ප්‍රමාණයක් තුවාල ලබා ඇති බවට මෙම සාක්ෂිකරු විසින් අධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂිය සැබැවින්ම විශ්වාසනීය සාක්ෂියක් බවට අප පිළිගනිමු.

කටුවාපිටිය සෙබස්තියන් මුණිඳුන්ගේ පල්ලියේ බෝම්බ පිපිරීමේ දී තුවාල ලබා ඇති පැ.සා.506 පලිහවඩනගේ අනුෂා කුමාරි ප්‍රනාන්දු යන සාක්ෂිකාරියගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් 2019.04.21 දින පෙරවරුවේ මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය තුළදී ඇය සහ ඇගේ ස්වාමිපුරුෂයා සහ දරුවන් දෙදෙනා ද සහභාගී වූ පාස්කු ඉරිදා දේව මෙහෙය සිදුවූ අවස්ථාවේදී ඉතා විශාල ප්‍රමාණයක් බැතිමතුන් දේවස්ථානය තුළ සිට ඇති

බව සහ එම අවස්ථාවේදී දේව මෙහෙය අවසන් වීමට ආසන්නයේ චාමින්ද නැමැති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා විසින් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.814 ශ්‍රීලාල් ෆොන්සේකා පියතුමාව ඇඟයීමට ලක් කරමින් කතාවක් කරමින් සිටි අවස්ථාවේදී පැ.56 (4) (A) (1) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයෙහි පෙන්වා සිටි පුද්ගලයා විශාල බෑගයක්ද රැගෙන පල්ලියේ ප්‍රධාන දොරෙන් ඇතුළු වීමට උත්සාහ කළද ඉන් ඇතුළු වීමට නොහැකි වූ තැන දෙවෙනි දොරෙන්ද ඇතුළු වීමට උත්සාහ කළ බවටත් ඇය සාක්ෂි ලබා දී ඇති පසුබිම තුළ ඉන්පසු එම තැනැත්තා පල්ලිය තුළට දොරෙන් අඩි තුනක් පමණ ඉදිරියට ඇතුළු වී ඉස්සරහට නැවෙනවා සමඟම මෙම බෝම්බ පිපිරීම සිදු වුණු බවට පවසා ඇති පසුබිම තුළ එම පල්ලිය තුළ ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කර ඇත්තේ පැ.56 (4) (A) (1) ලෙස පෙන්වා ඇති ඡායාරූපයෙහි සඳහන් පුද්ගලයාම බවට මනාව පැහැදිලි වේ. එම බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් ඉතා අවාසනාවන්ත ලෙස මෙම සාක්ෂිකාරියගේ ස්වාමිපුරුෂයා සහ එකම දියණිය සහ එකම පුතාද ජීවිතක්ෂයට පත් වී ඇති බවට ඇය සංවේදීව අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති අතර තවත් පුද්ගලයන් රාශියකට ජීවිත අහිමි වී බොහෝ පිරිසකට තුවාල සිදු වූ බවටද ඇය ලබා දුන් සාක්ෂිය කිසිදු ආකාරයකින් හබ කිරීමකට ලක් වී නැත.

ඒ අනුව මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය තුළින්ද පෙර අවස්ථාවක පැ.සා.814 ලක්ෂ්මන් ශ්‍රීලාල් ෆොන්සේකා යන පියතුමා විසින් සාක්ෂි ලබා

දුන් සාක්ෂියේදී සඳහන් කළ කරුණු මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියෙන් මනා ලෙස සැසඳෙන අතර ඒ අනුව 2019.04.21 පාස්කු ඉරිදා දින උදේ පෙරවරු 8.48 ට පමණ මෙලෙස මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය තුළදී ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සැබැවින්ම සිදුවී ඇති බවට සහ එමඟින් පුද්ගල මරණ රාශියක් සිදුවී පුද්ගලයන් ගණනාවකට බරපතල තුවාල සිදුවීම් සිදු වී ඇති බව සහ දේවස්ථානයටද බලවත් ලෙස හානි සිදු වී ඇති බවට මැනවින් සාක්ෂි ඉදිරිපත් වී ඇත.

මෙම සාක්ෂිකාරිය හඬමින් අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති අතර ඒ අනුව අධිකරණයේ සාක්ෂි ලබා දුන් අවස්ථාව වනවිටත් ඇයට මෙම සිද්ධිය නිසා ඇති වී තිබූ කම්පනය පහව ගොස් තිබී නොමැති අතර ඇගේ එකම දියණිය සහ එකම පුතා ද සිද්ධියෙන් මිය යාම නිසා ඇය ඉතා අසරණතාවයට පත් වී බලවත් ලෙස කම්පාවට ලක් වී ඇති ආකාරය ඇය සාක්ෂි ලබා දී ඇති ආකාරය පරීක්ෂා කර බැලීමේදී අධිකරණයට මැනවින් පෙනී යයි.

එසේම, මෙම බෝම්බ පිපිරීම හේතුකොටගෙන ඉතා හොඳින් කන් ඇසෙන තැනැත්තියක් ලෙස සිටි, ඇස් පෙනෙන තැනැත්තියක් ලෙස සිටි මෙම තැනැත්තියගේ ඇස් පෙනීමටද බලවත් බාධාවන් ඇති වී, ඇගේ කන් ඇසීමටද හානි සිදුවී බෝම්බ පිපිරීම නිසා යකඩ බෝලයක් ඇගේ ඇසක් තුළද තැන්පත් වී තිබී ඇති ආකාරය ඇයගේ සාක්ෂිය තුළින් හෙළිවන අතර

ඒ අනුව පල්ලිය තුළ සිදුවී ඇති මෙම ස්වයංඝාතක බෝම්බ පිපිරීමෙහි ප්‍රබල බලපෑම පිළිබඳව ඇගේ සාක්ෂිය තුළින්ද ගරු අධිකරණය ඉදිරියේ විශ්වාසනීය සාක්ෂි ඉදිරිපත් වී ඇති බවට අප තීරණය කරමු.

කෙසේ වෙතත් පැ.56 (4) (A) (1) නැමැති ඡායාරූපයෙහි සඳහන් පුද්ගලයා එනම් මෙම පල්ලිය තුළ බෝම්බ පිපිරීමේ ක්‍රියාවට එකහෙලාම සම්බන්ධ බවට පෙනී යන බෙල්ල දක්වා කොණ්ඩය වවාගෙන කැප් එකක්ද පැළඳ විශාල බෑගයක්ද රැගෙන පල්ලිය තුළට පැමිණි පුද්ගලයාගේ සැබෑ අනන්‍යතාවය මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය තුළින් සැබෑ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීම සිදු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ.

මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය තුළදී සිදුවූ බෝම්බ පිපිරීමෙන් තුවාල ලත් අධි චෝදනා පත්‍රයේ නම් සඳහන් සාක්ෂිකරුවන් වන තුවාලකරුවන්ට එසේ තුවාල සිදු බව සියලු චූදිතයින් විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 414 සහ 420 වගන්තීන් ප්‍රකාරව පිළිගැනීම් ලෙස වාර්තා කරන ලද බැවින් එකී තුවාලකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීම අවශ්‍ය වන්නේ නැතත කෙසේ වුවත් මෙම නඩුවෙහි පිළිගැනීම් වාර්තා කිරීමට ප්‍රථමයෙන් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමේදී තුවාල ලත් සාක්ෂිකරුවන් 200 කට අධික ප්‍රමාණයක් මෙම අධිකරණයේදී සාක්ෂි

ලබා දීම සිදු කර ඇති අතර, අනෙකුත් තුවාලකරුවන්ට සහ මරණකරුවන්ට අදාළව පිළිගැනීම් වාර්තා කිරීම සඳහා මෙම නඩුවෙහි චූදිතයින් එකඟතාවය පල කරන ලද්දේ 2026 අප්‍රේල් මස 30 දින වේ. කෙසේ වුවත් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයෙහි බෝම්බ පිපිරීම සිදු කළා යැයි පවසන අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අයට අදාළව පහත සඳහන් කරුණු පිළිගැනීම් ලෙස විධිමත්ව වාර්තා කර ඇත.

1. දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 940462916V බවත්, එහි ඡායාස්ථ පිටපතක් පැ. 1185 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.
2. පැ.825 සහ පැ.838 යන ලේඛනවල එකී ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් වී ඇති බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

3. දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අයගේ නමින් අංක N 7851276 දරන විදේශ ගමන් බලපත්‍රය නිකුත් කර තිබූ බවත්, එය තහවුරු කිරීම සඳහා එකී විදේශ ගමන් බලපත්‍රය සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ පරිගණක දත්ත (Current travel document details report and Passenger Inquiry) වාර්තා පැ.1186 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

4. දැනට මියගොස් සිටින අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් 2019.04.21 වන දින මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී අධිවෝදනා පත්‍රයේ සඳහන් සිද්ධියේදී මියගිය බවත්, ඉහත නම් සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයේ කොටස් පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී උසනාර් අච්චි මොහොමදු (පැ.සා. 693), අබ්දුල් ලතීෆ් නවුමාන් උම්මා (පැ.සා. 694) සහ අච්චි මොහොම්මදු මොහොම්මදු අස්මීර් (පැ.සා. 695) යන අය විසින් හඳුනාගෙන ඇති බව එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

5. ඉහත නම් සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයෙන් ලබාගත් පටක සාම්පල ජාන පරීක්ෂාවක් සඳහා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක එල් 95839/19 දරන නඩුව යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවත්, එකී පටක සාම්පල උසනාර් අච්චි මොහොමදු (පැ.සා. 693), අබ්දුල් ලතීෆ් නහමන් උම්මා (පැ.සා. 694) සහ අච්චි මොහොම්මදු මොහොම්මදු අස්මීර් (පැ.සා. 695) යන අයගෙන් ලබාගත් රුධිර සාම්පල සමඟ සසඳා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක වී.ජේ. බණ්ඩාරනායක (පැ.සා. 1436) සහ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න (පැ.සා. 1444) විසින් 2019.05.07 දිනැති අනුක්‍රමික අංක සීබී/489/19 (ජේබී/569/19) සඳහන් වාර්තාව (පැ. 921) නිකුත් කළ බවත්, එකී වාර්තාවට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කරන ලද එකී පටක සාම්පල අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන්ගේ බවට තහවුරු කර ඇති බවත්, එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15

දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

6. පැ.834, පැ.835, පැ.836 සහ පැ.861 ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන පුද්ගලයා දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

7. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.56 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සීසීටීවී දර්ශන අතුරින් මේ වන විටත් පැ.56(2), පැ.56(3) සහ පැ.56(4) ලෙස සලකුණු කර ඇති සීසීටීවී දර්ශනවලින් උපුටා ගන්නා ලද පැ.56(2)(a), පැ.56(3)(a), පැ.56(4)(a) සහ පැ.56(4)(B) ලෙස සලකුණු කර ඇති නිශ්චල රූප රාමුවල දර්ශනය වන, පැ.56(2)(a)(1), පැ.56(3)(a)(1), පැ.56(4)(a)(1) සහ පැ.56(4)(B)(2) ලෙස සලකුණු කර ඇති බෑග් එකක් පිටේ දමාගෙන ඇවිද යන පුද්ගලයා දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් බවට, පහත විස්තර කර ඇති සීසීටීවී දර්ශනවල නිරූපණය වන බව ඊට අදාළ සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

"අ" උපලේඛනය

7.1 ch02_20190421084000.avi (පැ.56(1))

7.2 ch05_20190421084000.avi (පැ.56(2))

7.3 ch14_20190421084000.avi (පැ.56(3))

7.4 ch04_20190421084000.avi (පැ.56(4))

8. තවද ඉහත විස්තර කරන ලද පැ.56(2)(a)(1), පැ.56(3)(a)(1), පැ.56(4)(a)(1) සහ පැ.56(4)(B)(2) ලෙස සලකුණු කර ඇති සීසීටීවී දර්ශනවල පෙනෙන පුද්ගලයා දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් පැ.16 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "ආ" උපලේඛනයේ විස්තර කර ඇති සීසීටීවී දර්ශනවල දර්ශනය වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

"ආ" උපලේඛනය

8.1 CH06_2019-04-19_090650_2019-04-19_102343_ID0427 හි තිරයේ දිස්වන වේලාව පැය 09:15:50 සිට පැය 09:16:25 (පැ.16(2))

8.2 CH02_2019-04-19_060125_2019-04-19_017817_ID0388 හි තිරයේ දිස්වන වේලාව පැය 06:20:45 සිට පැය 06:21:38 (පැ.840(2))

8.3 CH02_2019-04-19_083511_2019-04-19_095204_ID0410 හි තිරයේ දිස්වන වේලාව පැය 09:17:00 සිට පැය 09:17:50 (පැ.840(6))

8.4 CH03_2019-04-19_084052_2019-04-19_095745_ID0422 හි තිරයේ දිස්වන වේලාව පැය 09:16:40 සිට පැය 09:17:15 (පැ.840(4))

9. ඉහත විස්තර කරන ලද පැ.56(2)(a)(1), පැ.56(3)(a)(1), පැ.56(4)(a)(1) සහ පැ.56(4)(B)(2) ලෙස සලකුණු කර ඇති සිසිටීවී දර්ශනවල පෙනෙන පුද්ගලයා දැනට මියගොස් සිටින බෝම්බ පිපිරීමේ සිද්ධියේදී අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අය කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, අංක: 176 හි පිහිටි නිව් ලුක් අල් හරමානියා වෙළඳසැලෙන් ලබාගත් පහත "ඇ" උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනයෙන් දිස්වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

"ඇ" උපලේඛනය

9.1 CAM07 18-04-2019 ලෙස තිරයේ තොරතුරු දිස්වන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව පැය 14:10:00 සිට පැය 14:30:55 (පැ.922)

10. ඉහත විස්තර කරන ලද පැ.56(2)(a)(1), පැ.56(3)(a)(1), පැ.56(4)(a)(1) සහ පැ.56(4)(B)(2) ලෙස සලකුණු කර ඇති සිසිටීවී දර්ශනවල පෙනෙන පුද්ගලයා දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අය අංක 290, ගාලු පාර, ගොරකාන, පානදුර ලිපිනයේ පිහිටි කීල්ස් සුපිරි වෙළඳසැලෙන් ලබාගත් පහත "ඈ" උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනයෙන් දිස්වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

"ඈ" උපලේඛනය

10.1 අංක 10.50.29.195_04_20190410_20.00.00-21.00.00[H][@19f80b][1] – copy.mp4 දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන

වේලාව පැය 20:16:30 සිට පැය 20:16:40 සහ 20:27:45 සිට පැය 20:28:05 (පැ.923)

11. තවද ඉහත විස්තර කරන ලද පැ.56(2)(a)(1), පැ.56(3)(a)(1), පැ.56(4)(a)(1) සහ පැ.56(4)(B)(2) ලෙස සලකුණු කර ඇති සීසීටීවී දර්ශනවල පෙනෙන පුද්ගලයා දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් පැ.844 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "ඉ" උපලේඛනයේ විස්තර කර ඇති සීසීටීවී දර්ශනවල දර්ශනය වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

"ඉ" උපලේඛනය

11.1 11_0[157] ලෙස සඳහන් විදුලි සෝපානය සීසීටීවී දර්ශනයෙහි තිරයෙහි දිස්වන දිනය 2019.04.20 වේලාව 11:53:41 සිට පැය 11:54:49 (පැ.924)

11.2 16_0[157] ලෙස සඳහන් විදුලි සෝපානය සීසීටීවී දර්ශනයෙහි තිරයෙහි දිස්වන දිනය 2019.04.20 වේලාව 16:23:17 - (පැ.925)

12. පැ.57 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ අංක IMG_4611 (පැ.926), IMG_4612 (පැ.927), IMG_4613 (පැ.928), IMG_4647 (පැ.929), IMG_4648 (පැ....), IMG_4649 (පැ.930) සහ IMG_4650 (පැ.932) දරන ඡායාරූපවල දැනට මියගොස් සිටින අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් යන අයගේ හිස දර්ශනය වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇත.

ඉහත කී විස්තරාත්මක පිළිගැනීම් වලට අනුව මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් මුනිදුන්ගේ දේවස්ථානයේ සිදු වූ සිද්ධිය එනම් 2019-4-21 දින ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා හැරීම සිදුකර ඇත්තේ අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් නැමැත්තාම බවට කිසිදු හබකිරීමකින් තොරව සනාථ වී ඇත. ඒ අනුව 2019-04-21 දින මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් මුනිදුන්ගේ දේවස්ථානයේ බෝම්බයක් පුපුරුවා හැර බැතිමතුන් 115 දෙනෙකුගේ මරණය සිදුකර 298 ක ප්‍රමාණයක් තුවාල කිරීමට ලක් කර ඇත්තේ එකී අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් විසින්ම බවට මෙම අධිකරණයේ සනාථ වී ඇත.

කෙසේ වුවත් එලෙස එකී අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් විසින් පුපුරුවාහරින ලද ස්වයංඝාතක බෝම්බයේ ප්‍රබලත්වය සහ ඉන් මනුෂ්‍යයන්ට මෙන්ම දේපලවලට සිදුවන බලපෑම සම්බන්ධයෙන් මෙම අධිකරණයේ කරුණු පෙන්වා දීම සඳහා එකී ස්වයංඝාතක බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ විශේෂඥ වෛද්‍ය දීප්ති විජේවර්ධන යන සාක්ෂිකරුගේ සාක්ෂිය පැමිණිල්ලෙන් මෙහෙයවන ලදී.

කටුවාපිටිය බෝම්බ පිපිරීමට අදාළ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන්ගේ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 1707 ලහිරු කසුන් විජේසේකර සාක්ෂි දෙමින්, තමා වර්ෂ 2019 වර්ෂයේ දී කුරුණෑගල අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති වශයෙන් සේවය කළ බවත් ඒ වන විට තමාට අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමේ සහ අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ද, රාගම විශ්ව විද්‍යාලයෙන් අපරාධ විද්‍යාව පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් ද හදාරා තිබූ බවත්, තමා 2019.04.21 වන දින මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් එම ස්ථානයට ගොස් නිරීක්ෂණය කළ බවත් කියා සිටින ලදී. තමා සමඟ උප පොලිස් පරීක්ෂක උපුල් කුමාර, පොලිස්

සැරයන් 27436 වසන්ත, පොලිස් සැරයන් 58465 සේනාරත්න, පො.කො. 50999 නලීන්, යන නිලධාරීන් එම ස්ථානයට ගිය බවත් තමා යන විටත් එම දේවස්ථානයට ආරක්ෂාව ලබා දී තිබූ අතර මීගමුව සහ නුගේගොඩ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර වල නිලධාරීන්ද එම ස්ථානවල සිටි බවත් කියා සිටින ලදී. තමා එම ස්ථානයට ගොස් එහි පල්ලියේ ඉදිරිපස ගේට්ටුවේ සිට පල්ලිය දෙසට බලන විට වම් පස ප්‍රදේශය වන ලූර්දු ගුහාව තමාගේ පරීක්ෂාවට ලක් වූ බවත් එදින ලුර්දු ගුහාව ආශ්‍රිතව අංක 01 සිට 18 දක්වා වූ අංකනය කරන ලද ස්ථාන 18ක් තමා පරීක්ෂා කර, අංක 01 ලෙස සලකුණු කළ ලූර්දු ගුහාව තුළ දරන ස්ථානයෙන් ඇතුළත විදුලි පරිපථය උඩ කුඩා ඡායාරූපයක් ද, 02 වන දොර උළුවහුවේ සිට මීටර් 31.3 ක දුරින් උතුරු දිශාවෙන් මීටර් 35 ක් දුරින් අසල කළු හා රතු පැහැති ත්‍රීවිල් එකක ෂීට් කවර අංක 02 ලෙස ද, දොර උළුවහුවේ සිට මීටර් 33.6 ක් උතුරු දිශාවට වන්නට කොන්ක්‍රීට් බංකුව අසල තිබූ කැමරාවක හෝ අත් ඔරලෝසුවක ඉදිරිපස ඉලක්කම් සහිත රවුමක් අංක 03 ලෙස ද, දොර උළුවහුවේ සිට මීටර් 18.9 ක් දුරින් තිබූ LED විදුලි බල්බ් එකක් අංක 04 ලෙස ද, දොර උළුවහුවේ සිට මීටර් 36 ක දුරින් ඉදිරිපිට කොන්ක්‍රීට් බංකුවල 02 වන හා 03 වන පේළි අතර තිබූ කුඩා යකඩ බෝල්ලයක් තිබූ ස්ථානය අංක 05 ලෙස ද, දකුණු උළුවහුවේ උතුරු දිශාවෙන් මීටර් 32.7 ක දුරකින් බංකු පේළි අතර තිබූ යකඩ බෝල්ලයක් ඇති ස්ථානය අංක 06 ලෙස ද, දකුණු දොර උළුවහුවේ සිට උතුරු දිශාවෙන් මීටර් 33.2 ක දුරකින් 03

වෙනි හා 04 වෙනි බංකු පේළි අතර යකඩ බෝල ඇති ස්ථානය අංක 07 ලෙස ද, එම දොර උළුවහුවේම සිට උතුරු දිශාවට මීටර් 33.8 ක් දුරින් 03 වෙනි හා 04 වෙනි බංකු පේළි අතර තිබූ යකඩ බෝලය ඇති ස්ථානය අංක 08 ලෙස ද, සලකුණු කළ බව කියා සිටින ලදී.

එම දොර උළුවහුවේ උතුරු දිශාවෙන් මීටර් 36.1 දුරින් 05 වෙනි හා 06 වෙනි බංකු පේළි අතර තිබූ හව් සිම් කාඩ්පතක ඉවත් කරන ලද ප්ලාස්ටික් කොටසක් තිබූ ස්ථානය අංක 09 ලෙසත්, දොර උළුවහුවේ සිට උතුරු දිශාවට වන්නට මීටර් 34 ක් දුරින් 06 වෙනි හා 07 වෙනි බංකු පේළි අතර තිබූ යකඩ බෝල දෙකක් තිබූ ස්ථානය අංක 10 ලෙසත්, දොර උළුවහුවේ සිට මීටර් 37ක් දුරින් 07 වෙනි හා 08 වෙනි බංකු පේළි අතර සොයා ගත් යකඩ බෝලයක් තිබූ ස්ථානය අංක 11 ලෙසත්, දොර උළුවහුවේ සිට උතුරු දෙසට මීටර් 37.3 ක් දුරින් 07 වෙනි හා 08 වෙනි බංකු පේළි ඉදිරිපිට තිබූ යකඩ බෝලයක් ඇති ස්ථානය අංක අංක 12 ලෙසත්, දොර උළුවහුවේ සිටම උතුරු දිශාවට වන්නට මීටර් 24.5 ක් දුරින් කොන්ක්‍රීට් කැට අල්ලලා තිබූ ප්‍රදේශයයේ යකඩ බෝලයක් තිබූ ස්ථානය අංක 13 ලෙසත්, එම ස්ථානයේ ම යකඩ බෝල 3 ක් තිබි සොයා ගත් ස්ථානය අංක 14 ලෙසත්, දොර උළුවහුවේ සිට වයඹ දිශාවට වන්නට මීටර් 43.6 ක් දුරින් "*7 ඒවා තුනක්*" ලෙසට සඳහන් පෙන්ටෝච් බැටරි කැබැල්ලක් තිබූ ස්ථානය අංක 15 ලෙසත්, දොර උළුවහුවේ සිට උතුරු දෙසට කොන්ක්‍රීට් කැට අල්ලා ඇති මාර්ගයේ අත් ඔරලෝසුවක ඉදිරිපස මුහුණත බවට සැක කරන රවුම්

කොටසක් තිබූ ස්ථානය අංක 16 ලෙසටත්, දොර උළුවහුවේ සිට උතුරු දෙසට වීමට මීටර් 8.7 ක දුරින් එම දොර ඉදිරිපිට විලෝ ගහ යට ඔරලෝසුවක බව සැකකරන කොටසක් තිබූ ස්ථාන අංක 17 ලෙසත්, දොර උළුවහුවේ සිට උතුරු දෙසට වීමට මීටර් 8.1 ක දුරින් විලෝ ගස් යට තිබූ යකඩ බෝල දෙකක් ඇති ස්ථානය අංක 18 ලෙසටත් තමා විසින් සලකුණු කරන ලද බව කියා සිටින ලදී.

එමෙන්ම තමා විසින් මෙම අංකනය කරන ලද සියළු ස්ථාන ඉන් පසු රජයේ සහකාර රස පරීක්ෂකවරයාත් සමග නැවත නිරීක්ෂනය කළ බවත් එහිදී සහකාර රස පරික්ෂක බණ්ඩාර මහතා දැන්වූ පරිදි අංක 2 දරන ෂීට් කවර මෙම සංසිද්ධියට අදාළ නොවන බැවින් ඒවා නඩු භාණ්ඩයක් වශයෙන් ලබා ගැනීම සිදු නොකරන ලද බවත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව තමා වර්ෂ 2019.04.22 වන දින ද එම ස්ථානයට ගිය බවත් එසේ ගොස් 2019.04.21 දින පරික්ෂා කරන ලද ස්ථානයේ දොරටුව අසල ප්‍රදේශය සහ දේවස්ථානය ඉදිරිපස කොටස සහ දේවස්ථානයේ වම් පස කොටස තමාගේ නිරික්ෂණයට ලක් කළ බවත් කියා සිටින ලදී. වම් පස කොටස වශයෙන් තමා හඳුන්වන්නේ දේවස්ථානය ඉදිරිපිට සිට බලන විට සෙබස්තියන් මාවත පැත්තට වන ප්‍රදේශය බවත් එම ස්ථානයේ සිටි අනෙකුත් නිලධාරීන්ගෙන් විමසා දැන ගැනීමේ දී බෝම්බකරු ඇතුල් වූ දොරටුව පැත්ත වම් පැත්ත වශයෙන් හැඳින්වීමක් කළ අතර එකී වම්

පැත්තේ තිබූ කොරිඩෝවෙන් බෝම්බකරු ලෙස හැඳින්වූ පුද්ගලයා දේවස්ථානයට ඇතුල් වූ ප්‍රදේශය පරික්ෂා කරන අංක 19 සිට 30 දක්වා අංකනය කළ බවත් එයින් බෝම්බකරු ඇතුල් වූ පෙදෙස අංක 19 සිට 25 දක්වා ඇතුළත් කළ බවත් කියා සිටින ලදී.

එකී වම් උළුවහුවේ සිට මීටර් 4.1 ක දුරින් කොරිඩෝවේ අඩි 3 × 6 අතර ප්‍රමාණයේ උළු ගොඩක්, එම උළු ගොඩ ඇති ස්ථානය තමා අංක 19 ලෙස සලකුණු කළ බවත් එම උළු ගොඩ මත තිබූ සැම්සුන් වර්ගයේ ඉදිරිපස වීදුරුව ඉරිතලා ගිය දුරකථනය නිරීක්ෂණය වූ අතර එම දුරකථනය අංක 19(1) ලෙස සලකුණු කර තමා භාරයට ගත් බවත් එම ස්ථානයේ තිබූ Rewards යනුවෙන් සඳහන් කාඩ් පතක් අංක 19(2) වශයෙන් තමා භාරයට ගත් බවත්, Maxell යනුවෙන් සඳහන්ව තිබූ මෝටරයක් 19(3) වශයෙන් සඳහන් කර තමා භාරයට ගත් බවත් තවද එහි තිබූ යකඩ බෝල 24ක් 19(4) වශයෙන් බෑගයක දමා තමා භාරයට ගත් බවත් කියා සිටින ලදී. තවද එම ස්ථානයේ තිබූ බ්‍රේස්ලට් ගාංචු කොටස පැ.19(5) වශයෙන් ද රන් පැහැති මුහුණත සහිත කැරලි මාල කොටසක් සහ කාන්තා අත් ඔරලෝසුවක් පැ.19(6) වශයෙන් ද මුදල් නෝට්ටු, කාසි සහ කොල කැබලි තිබූ කාන්තා මුදල් පසුම්බියක් පැ.19(7) වශයෙන් ද සලකුණු කොට තමා භාරයට ගත් බව කියා සිටින ලදී.

අංක 20 වශයෙන් තමා සලකුණු කරන ලද්දේ වම් පස කොරිඩෝවේ වම් අත පැත්තේ කොන්ක්‍රීට් කණුව මුල තිබූ අඩි 1×5 ප්‍රමාණයේ උළු ගොඩක් බවත් දොර උළුවහුවේ සිට මීටර 4.3ක් උතුරු දිශාවට වන්නට කොන්ක්‍රීට් ගල් අතුරා තිබූ පෝටිකෝව මත තිබූ සිටිසන් වර්ගයේ අත් ඔරලෝසු පටිය තිබූ ස්ථානය අංක 21 ලෙස ද, සලකුණු කරන ලද අතර දොර උළුවහුවේ සිට මීටර 4ක් දුරින් හමුවන පැසේජ කොටසේ උළු කැබලි විසිරී තිබූ ස්ථානය අංක 22 වශයෙන් සලකුණු කරන ලද අතර එම ස්ථායේ තිබී යකඩ බෝල 11ක් තමා භාරයට ගත් බවත් කියා සිටින ලදී. උළුවස්සට දකුණු පැත්තෙහි තිබී යකඩ බෝල 28 ක් සොයා ගත් අතර එයට අමතරව එම ස්ථානයේ ම බැංකු කාඩ් පතක කොටසක් සහ සුදු යකඩ මාල කොටසක් සොයා ගත් අතර එම ස්ථානය අංක 23 වශයෙන් සලකුණු කරන ලද බව කියා සිටින ලදී. තවද දොර උළුවහුවේ සිට මීටර 4.1ක දුරින් වම් උළුවහුවේ වම් අත පැත්තේ පැසේජය මත උළු ගොඩක් තිබූ අතර එම ස්ථානයේ යකඩ බෝල 5ක් සොයා ගත් බවත් එය අංක 24 වශයෙන් සලකුණු කරන ලද බව කියා සිටින ලදී. දේවස්ථානය වටේ ඉදිරිපිට ප්‍රදේශයේ නිදහස් කොටසේ කොරිඩෝව නැතහොත් මණ්ඩපය යන ස්ථානයේ උළු කැලි, වෙනත් බාහිර දේවල් විසිරී තිබූ ස්ථානයේ තිබී යකඩ බෝල 25ක් සොයා ගත් අතර එම ස්ථානය අංක 26 වශයෙන් සලකුණු කරන ලද බව කියා සිටින ලදී.

තමාගේ නිරීක්ෂණවලදී දේවස්ථාන ගොඩනැගිල්ලේ දකුණු පස කොටස අංක 27 සිට 30 දක්වා සලකුණු කොට තිබූ බවත් එම කොටසේ

බෝම්බකරු ඇතුල් වුණේ යැයි කියන දොරට ප්‍රතිවිරුද්ධ පැත්තේ ඇති දොර අසල ප්‍රදේශයේ තිබී යකඩ බෝල 15ක් සොයා ගත් අතර එය අංක 27 වශයෙන් ද එම පැත්තේ ම සණ්ඨාර කුළුණ පිහිටි ස්ථානයේ තිබී යකඩ බෝල 12ක් සොයා ගත් අතර එම ස්ථානය අංක 28 වශයෙන් ද, දෙවන දොර (අංක 27 ස්ථානයේ) සිට පහළට බැසීමට ඇති ස්ථානයේ කොන්ක්‍රීට් ගල් අතුරා තිබූ ස්ථානයේ තිබී යකඩ බෝල 16ක් සොයා ගත් අතර එම ස්ථානය අංක 29 ලෙස ද, එම ස්ථානයෙන්ම සොයා ගත් ඔරලෝසුවක බවට සැක කළ හැකි පරිපථ කොටසක් තිබූ ස්ථානය පැ.30 වශයෙන් ද සලකුණු කළ බව සාක්ෂිකරු කියා සිටින ලදී.

නැවත තමා 2019.04.23 වන දින ද එම ස්ථානයට ගිය අතර ආණ්ඩුවේ රස පරීක්ෂක, වෛද්‍යවරුන්, මීගමුව සහ ගම්පහ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන්, එම ස්ථානයේ සිටි අතර එදින තමා නඩු භාණ්ඩ භාර ගැනීමක් සිදු නොකළ බව කියා සිටින ලදී. ඉන් අනතුරුව 2019.04.24 වන දින රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ බණ්ඩාර සහ සුසන්ත යන මහත්වරුන් සමඟ මෙම බෝම්බ පිපිරීමේ පිපිරුම් කේන්ද්‍රය සොයා ගැනීමේ පරීක්ෂාවට තමා සහභාගිවූ බවත් එහිදී දේවස්ථානය පිටත සෑම ස්ථානයක්ම පරීක්ෂා කොට යකඩ බෝල දුරින්ම වැදී ඇති ස්ථානය හඳුනාගැනීමට කටයුතු කළ බවත් මීටර 164 ක් පමණ දුරක් දක්වා එම යකඩ බෝල විහිදී තිබූ අතර එවැනි ස්ථාන 12 ක් හඳුනාගෙන ඒ එක් එක් ස්ථානවල සිට නූල් ඇද පිපිරුම් ස්ථානය හඳුනාගැනීමක් සිදුකළ බවත් කියා සිටින ලදී. ඒ සඳහා

දුර මැනීමේ උපකරණ භාවිතා කළ අතර එම ගණනයත් සමඟ බෝම්බකරු ඇතුල් වුණේ යැයි සැලකෙන දොර හා එම ගණනය කිරීම් සැසඳුන බවත් ස්ථිර ලක්ෂ්‍යයක් ලෙස දේවස්ථානයේ ඇතුල් පැත්තේ සිට බලන විට එම දොරෙහි වම් උළුවහුව ගණනය කිරීම් සඳහා භාවිතා කළ බවත් කියා සිටින ලදී. සාක්ෂිකරුට පැ.07 ලෙස සලකුණු කර ඇති සංයුක්ත තැටිය තුළ තිබූ පැ.56(4) දරන CCTV දර්ශනය පෙන්වා සිටින ලද අතර එහිදී එම දර්ශනයේ සාක්ෂිකරු කියා සිටින දොර හඳුනාගන්නා ලද අතර එහි නිශ්චල ඡායාරූපය වන පැ.56(4)(a) ද සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එම නිශ්චල ඡායාරූපයේ ඇති සාක්ෂිකරු හඳුනාගන්නා ලද දොර පැ.56(4)(a)(7) ලෙස සලකුණු කරන ලදී. තවද පැ.56(4) CCTV දර්ශන පෙලෙහි විනාඩි 03 තත්පර 59 හි දර්ශනය වන බෑගයක් කරේ දමාගෙන යන පුද්ගලයා පැමිණි ස්ථානයත් අවට ගස් සහ නිවාස වලත් දක්වා ප්‍රදේශවලට විහිදී ගිය යකඩ බෝල වැදී සලකුණු වූ ස්ථාන නිරීක්ෂණය කිරීමේදී එම ස්ථානයේ සිට දේවස්ථානයේ වම් පැත්තේ මීටර 63.1 ක් දුරින් පිහිටි චාන්දනී නැමති අයකුගේ නිවස තුළ පිහිටි කණ්නාඩියට ද යකඩ බෝල වැදී හානි සිදුවී තිබූ අතර එම ස්ථානයට පිපුරුම් ලක්ෂ්‍යයේ සිට මීටර 66.2 ක් දුර තිබූ බවත් කියා සිටින ලදී. තමා විසින් භාරයට ගත් නඩු භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 36/2019 සිට 70/2019 දක්වා සලකුණු කර පොලිස් කොස්තාපල් 82340 ප්‍රනාන්දු යන නිලධාරියාට භාරදුන් බවත් සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී. තමා සමඟ ගිය පොලිස් සැරයන් 58465 සේනාරත්න විසින්

අපරාධ ස්ථානයේ ඡායාරූප ලබාගත් බව කියා සිටින සාක්ෂිකරු ඔහුට පෙන්වන ලද පැ.57(4) දරන ඡායාරූප අතුරෙන් DSC_0446.JPG ඡායාරූපයේ ලුර්දු ගුහාව හඳුනාගන්නා ලද අතර එම ඡායාරූපය දැක්වෙන ප්‍රදේශය තමා විසින් පරීක්ෂා කිරීමට ලක්කල බව කියා සිටිමින් එම ඡායාරූපය පැ.1223 ලෙස සලකුණු කරන ලදී. තවද පැ.57(4) DSC_0448.JPG ඡායාරූපයෙහි දැක්වෙන්නේ ලුර්දු ගුහාව ඉදිරිපිට ඇති බංකු බවත් කියා සිටින ලද සාක්ෂිකරු එම ඡායාරූපය පැ.1224 ලෙස සලකුණු කරන ලදී. පැ.57(4) DSC_0500.JPG හි අඩංගු ස්ථානය තමා යකඩ බෝල හඳුනාගත් අංක 10, 11, 12 යන ස්ථාන බව කියා සිටිමින් එම ඡායාරූපය පැ.1225 වශයෙන් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව දැනටමත් පැ.1042 ලෙස සලකුණු කර තිබෙන රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තු කවරය සහ ඊට අන්තර්ගත කර ඇති නඩු භාණ්ඩ සාක්ෂිකරුගේ අවධානයට යොමු කරන ලද අතර ඒ තුළ තිබූ පැ.1043 වශයෙන් සලකුණු කරන ලද කාඩ් බෝඩ් පෙට්ටියේ තිබූ පැ. 1137 ලෙස සලකුණු කරන ලද දේපල කුවිතාන්සි අංක 39/2019 ඇතුළත් ලෝහ බෝලය දමන ලද ලිපිකවරය පැ.1226 ලෙසත් ඒ තුළ තිබූ හාෆ්ෂීට් කොල කැබැල්ල පැ.1226(1) ලෙසත් යකඩ බෝලය පැ.1226(2) ලෙසත් සලකුණු කරන ලදී. පැ.1138 ලෙස සලකුණු කරන ලද දේපල කුවිතාන්සිය වූ පි.ආර්.40/2019 ට අදාළ ලිපිකවරය පැ.1227 ලෙස ඒ තුළ ඇති සුදු පාට කොළ කැබැල්ල පැ.1227(1) ලෙසත් යකඩ බෝලය

පැ.1227(2) වශයෙනුත් සලකුණු කරන ලදී. පැ.1139 දරන දේපල කුවිතාන්සි අංක 41/2019 යටතේ වූ ලිපිකවරය පැ.1228 ලෙසටත් සුදු පාට කොළ කැබැල්ල පැ.1228(1) ලෙසත් යකඩ බෝලය පැ.1228(2) ලෙසත් සලකුණු කරන ලදී. එසේම පැ.1140 ට අදාළ පි.ආර්.42/2019 දරන ලිපිකවරය සහ ඒ තුළ ඇති සුදු පැහැති කොළ කැබැල්ලකින් ඔතා ඇති යකඩ බෝල සියල්ලම පැ.1229 ලෙස සලකුණු කරන ලදී. පැ.1143 ට අදාළ පි.ආර්.45/2019 අදාළ නඩු භාණ්ඩ සියල්ල පැ.1230 වශයෙන් ද, පැ. 1144ට අදාළ පි.ආර්. 46/2019 දරන දේපල කුවිතාන්සියට අදාළ නඩු භාණ්ඩ වන යකඩ බෝලය ඇතුළත් ලිපි කවරය සහ කඩදාසි කැබැල්ල පැ.1231 වශයෙන් ද, පැ.1145 දරන ලේඛනයේ සඳහන් පි.ආර්.47/2019ට අදාළ ලිපිකවරය තමා සුදු පැහැති කඩදාසි කැබැල්ලක ඔතා ඇති යකඩ බෝලය පැ.1232 වශයෙන් ද, සලකුණු කරන ලද අතර ඉන් අනතුරුව දේපල කුවිතාන්සි අංක 48/2019 සිට 70/2019 දක්වා වූ නඩු භාණ්ඩ පිළිවෙළින් පිළිවෙළින් පී.ආර්.48/2019 ට අදාළ ලිපි කවරය සහ ඊට අන්තර්ගතව ඇති සුදු පැහැති කඩදාසි වල ඔතා තිබෙන යකඩ බෝල සියල්ලක්ම පැ.1233 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 49/2019 ට අදාළ ලිපි කවරය සහ ඊට ඇතුළත් කර ඇති සුදු පැහැති කඩදාසි කැබැල්ලකින් ඔතා තිබෙන පෙන්ටෝච් බැටරිය යන නඩු භාණ්ඩ සියල්ලක්ම පැ.1234 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 52/2019 යටතේ වූ ලිපි කවරය සහ සුදු පැහැති කොළ කැබලි වලින් ඔතා තිබෙන යකඩ

බෝල 02 ක් අඩංගු ලිපි කවරය යන සියල්ලක්ම පැ.1235 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 56/2019 යටතේ වූ ලිපි කවරයක බහා සුදු පැහැති කොළ වලින් ඔතා තිබෙන යකඩ බෝල 44 ක් අඩංගු ලිපි කවරය සහ එම නඩු භාණ්ඩ සියල්ලක්ම පැ.1236 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 62/2019 යටතේ නඩු භාණ්ඩ ලෙස සුදු පැහැති කොළයකට ඇතුළත් කොට ඇති යකඩ බෝල 11 සහ ලිපිකවරය යන නඩු භාණ්ඩ සියල්ලක්ම පැ.1237 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 63/2019 යටතේ ඇති ලිපි කවරයද, ඊට ඇතුළත් කර ඇති සුදු කොළයක බහා තිබෙන කාඩ් පතක කොටස සහ යකඩ බෝල 28 යන නඩු භාණ්ඩ සියල්ලක්ම පැ.1238 ලෙසටත්, දේපල කුවිතාන්සි අංක 64/2019 යටතේ වන ලිපි කවරයද, ඊට ඇතුළත් කර ඇති සුදු කොළයක් මඟින් ආවරණය කොට තිබෙන යකඩ බෝල 05 යන නඩු භාණ්ඩ සියල්ලක්ම පැ.1239 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 65/2019 ට අදාළ ලිපි කවරයද, ඊට ඇතුළත් කර ඇති සුදු කොළය සහ එම සුදු කොළයෙන් ආවරණය කර ඇති යකඩ බෝල 11 ක් අඩංගු නඩු භාණ්ඩ යන සියල්ලක්ම ලිපි කවරය සමඟ පැ.1240 ලෙසටත්, දේපළ කුවිතාන්සි අංක 66/2019 ට අදාළ ලිපි කවරයද, ඊට ඇතුළත් කර ඇති සුදු පැහැති කොළය සහ එම සුදු කොළ කැබැල්ලෙන් ආවරණය කර ඇති යකඩ බෝල 25 යන නඩු භාණ්ඩ සියල්ලක්ම ලිපි කවරය සමඟ පැ.1241 ලෙසටත් සළකුණු කර සිටින ලදී.

PR 67/2019 ලිපිකවරය ඊට ඇතුළත් කර තිබෙන සුදු කොළය සහ එම සුදු කොළයෙන් ආවරණය කර ඇති යකඩ බෝල 15 ක් අඩංගු නඩු භාණ්ඩය සහ ලිපිකවරය යන සියල්ලක්ම පැ.1242 ලෙසද, PR 68/2019 ලිපිකවරයද, ඊට ඇතුළත් කර තිබෙන සුදු කොළයකින් ආවණය කර ඇති යකඩ බෝල 12 යන නඩු භාණ්ඩ සියල්ලක්ම ලිපි කවරය පැ.1243 ලෙසද, PR 69/2019 යටතේ වන ලිපිකවරයට ඇතුළත් කර තිබෙන සුදු කොළ වලින් ආවරණය කර ඇති යකඩ බෝල 16 ක්ද, සහ රෙදි වලට සමාන කැබලි යැයි අඩංගු කොටස් හා වයර් කැබැලිද අන්තර්ගතව ඇති ලිපිකවරයද සමඟ පැ.1244 ලෙසද, දේපල කුවිතාන්සි අංක 70/2019 ට අදාළ ලිපිකවරය සහ ඊට සුදු කොළයකින් ආවරණය කොට තිබෙන ඔරලෝසුවක යැයි සැක කෙරෙන විදුලි පරිපථ කොටස යන සියල්ලක්ම පැ.1245 ලෙස ද සලකුණු කරන ලදී.

මේ සම්බන්ධයෙන් තමා විසින් විධිමත්ව තොරතුරු සටහන් පොත්වල සටහන් ඇතුළත් කළ බවද ඔහු විසින් වැඩි දුරටත් සාක්ෂිදෙමින් කියා සිටින ලදී.

කිසිදු විත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත.

විශ්ලේෂණය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී මෙම අපරාධ ස්ථානයේදී මෙම සාක්ෂිකරු විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ හා ඒවා තිබූ ස්ථානය මගින් මෙම දේවස්ථානයට සිදුවූ හානිය මෙන්ම විශේෂයෙන් ම යකඩ බෝල විසිවී ඇති දුර ප්‍රමාණය අනුව පිපුරුම් උපක්‍රමයේ ප්‍රබලත්වය මැනවින් තහවුරු වී ඇත.

මෙම අපරාධ ස්ථානය පරීක්ෂාවට ලක් කර ඇති පැ. සා. 1434 රජයේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක රුවන් බණ්ඩාර යන සාක්ෂිකරුගේ සාක්ෂියේදී පැහැදිලිව විස්තර කරන ලද පිපුරුම් උපක්‍රමයේ ප්‍රබලත්වයත් උපරිම හානියක් කිරීම සඳහා කුඩා ප්‍රමාණයේ යකඩ බෝල රාශියක් යොදා ගෙන තිබීමත් මෙම සාක්ෂිය මගින් ද තහවුරු වේ.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1436 විශ්‍රාමික අතිරේක රස පරීක්ෂක බණ්ඩාරනායක මහත්මිය සාක්ෂි දෙමින් තමා වර්ෂ 2025 දී විශ්‍රාම යන විට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කළ බවත්, මූලික සුදුසුකම් සපුරාලීමෙන් පසුව එනම් රසායන විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධියක් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට වර්ෂ 1993දී සේවයට බැඳී වසර 32කට ආසන්න කාලයක් සේවය කළ අතර එහිදී අධිකරණ මස්තු විද්‍යාව සහ DNA

විශ්ලේෂණ අංශයට අනුයුක්තව කටයුතු කළ බවත්, තමාට ඒ පිළිබඳව ඉන්දියාව, ඇමරිකා එක්සත්ජනපදය, එක්සත් රාජධානිය, දකුණු කොරියාව, හොංකොං ආදි රටවලින් න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලැබී ඇති බවත් කියා සිටින ලද අතර DNA යන අනන්‍යතාවය එක් පුද්ගලයෙකුට අනන්‍ය වූ දෙයක් බවත්, සම නිවුන්නු සම්බන්ධයෙන් හැර පුද්ගලයන් දෙදෙනෙකුට එකම DNA රටාව පිහිටීමේ හැකියාවක් නොමැති බවට සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

එසේම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට පරීක්ෂාව සඳහා සාම්පලයක් ලද විට පළමු පියවර ලෙස එහි DNA නිස්සාරණය සිදු කරන බවටත්, ඉන් අනතුරුව PCR පරීක්ෂාව සිදු කරන බවත් ඉන්පසුව Genetic Analyzers උපකරණය මඟින් DNA රටාව ලබා ගෙන ඒවා සංසන්දනය කර සම්භාවිතාව ගණනය කිරීමක් සිදු කරන බවටත් අදාළ ක්‍රමවේදය පැහැදිලි කරමින් කියා සිටින ලදි. ඒ සියලු කටයුතු සඳහා සිය දෙපාර්තමේන්තුවේ සියලු උපකරණ සහ පරීක්ෂණාගාර රසායනික ද්‍රව්‍ය, විධිමත් ප්‍රමිතියකින් යුක්ත බවටත්, නිසි ක්‍රියාකාරිත්වයෙන් ඇති බවටත් සැලකිලිමත් වන බවට ඇය වැඩිදුරටත් කියා සිටින ලදි.

මෙම නඩුව සම්බන්ධයෙන් තමාට කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B13099/19, මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ 95839/19 සහ කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ B10193/19 යන

අධිකරණවලින් විශ්ලේෂණය සඳහා නඩු භාණ්ඩ ලැබුණු බව ඇය කියා සිටින ලදි. මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 95839 සඳහා වූ නඩු භාණ්ඩ DNA පරීක්ෂාව සඳහා 2019.10.11 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් 9865 මයුර නිලධාරියා විසින් භාර දී ඇති බවත්, ඒ අනුව CB/1506/19 දරන සංදේශය නිකුත් කර ඇති බවත් කියා සිටිමින් එකී සංදේශයේ පිටපත පැ. 1489 වශයෙන් සලකුණු කරන ලදි. එම ලේඛනයට අනුව තමාට පාර්සල් 1ක් ලැබුණු බවත් (ලැබුණු පාර්සල් සංඛ්‍යාව සම්බන්ධයෙන් යතුරුලියන දෝෂය විවෘත අධිකරණයේ සිදු කරන ලදි.) එම CB1506/19 යටතේ ලැබුණු පාර්සලය වර්ෂ 2020.02 වැනි මස විශ්ලේෂණය කළ බවත් එහි පැ.38 සිට පැ.52 දක්වා ලැබී තිබූ අතර පැ.38 ලෙස කොණ්ඩ බූලයක්, පැ.39 ලෙස මුඛ ආවරණයක්, පැ.40 ලෙස සෙරෙප්පු දෙකක්, පැ.41 ලෙස දිග කලිසමක්, පැ.42 ලෙස බැනියමක්, පැ.43 ලෙස පිස්න 5ක්, පැ.44 ලෙස දත්බුරුසු 3ක්, පැ.45 ලෙස ටීෂර්ට් එකක් සහ සරමක්, පැ 46 ලෙස නැවත කොණ්ඩ බූලයක්, පැ.47 සිට පැ.50 දක්වා පිස්නයක් සහ පාලක පිස්නයක්, පැ.51 සිට පැ.52 දක්වා දත්බුරුසු 3ක්. එනම්, පැ.51 දත්බුරුසු 3ක් සහ පැ.52 රේසරයක් වශයෙන් ද, නැවතත් පැ.51 යටතේ සනීපාරක්ෂක තුවායක්, බ්‍රසියරයක්, පැ.52-1 යටතේ බැනියමක් සහ පැ.52-2 යටතේ සරමක් යන නඩු භාණ්ඩ විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කර තිබූ බවත්, කියා සිටින ලදී.

එම භාණ්ඩ ලැබීමෙන් පසුව තමා ඒවා පරීක්ෂාව සහ විශ්ලේෂණය කොට 2021.03.03 වන දින පිටු 5කින් යුත් වාර්තාවක් සකස්කොට තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වන එවකට ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂකවරයා ලෙස සේවය කළ D.H.L. ජයමාන්ත මහතා විසින් ද නැවත පරීක්ෂා කර බලා අත්සන් තැබූ බවත් කියා සිටිමින් එකී CB1506/19 දරන පිටු 5කින් යුත් වාර්තාව පැ. 1490 ලෙස සලකුණු කරන ලදි. සාක්ෂිකාරියට ඉන් අනතුරුව පැ.1054 සිට පැ.1074 දක්වා නඩු භාණ්ඩ පෙන්වා සිටින ලද අතර ඇය සතුව ඇති ලිපි ගොනුවේ ඇති ඡායාරූප සහ සටහන් ද පෙන්වා සිටින නඩු භාණ්ඩ පරීක්ෂා කර බලා එකී නඩු භාණ්ඩ සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලදි.

තමා විසින් හඳුනාගන්නා ලද තමාගේ වාර්තාවේ පිටු අංක 01 සහ 02 යටතේ ලැයිස්තුගත කර ඇති පැ.39 මුඛ ආවරණය, පැ.41 දිග කලිසම, පැ.44 –U එක් දත්බුරුසුවක්, පැ.50 පිස්නය, පැ.52-1 බැනියම සහ පැ.52-2 සරමද, පැ.44 යටතේ තිබූ දත්බුරුසු 3 පිළිවෙළින් පැ.44-1, පැ.44-2 සහ පැ.44-3 වශයෙන් ද පැ.41හි දිග කලිසමත්, පැ.39 මුඛ ආවරණයේත් ඉෙව සාම්පල් හඳුනාගත් බවත් පෙර සඳහන් කළ PCR පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව DNA රටා සමඟ ඒවා DNA රටාව සංසන්දනය කිරීමේ කටයුතු කළ බවත්, පැ. 50 පිස්නය පැ.52-1 බැනියම සහ පැ.52-2 සරම සම්බන්ධයෙන් ද DNA ඇලීල රටා ලබා ගැනීමක් සිදු කළ බවත් මේ සම්බන්ධයෙන් සැකකරුවන්ගේ සාම්පල ලබා ගැනීම සඳහා කොටුව

මහෙස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් ලැබී තිබූ අතර ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතට ගොස් එහි අදාළ පුද්ගලයන්ගේ සාම්පල් වර්ෂ 2019.12.24 දින කොටුව ම.ඵ. B13099/19 යටතේ ලද නියෝග පරිදි කළ බවත් එහි දී සැකකරුවන් හතළිස්දෙනෙකුගේ කොපුල් සෛල සාම්පල් තමා ලබාගත් බවත් එසේ සාම්පල් ලබාගත් සියලු පුද්ගලයන්ගේ ඡායාරූප, නම, හැඳුනුම්පත් අංක විස්තර ඇතුළත් කොට ඇලීල රටා ජනනයකොට යොමු අංක CB/2002/19 යටතේ වාර්තාගත කළ බවත් කියා සිටින ලදි. එසේම මියගිය පුද්ගලයන්ගේ ශරීර කොටස්වලින් ලබාගන්නා ලද සාම්පලද ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඥාතීන්ගෙන් DNA සාම්පලද ලබා ගැනීම සිදු කළ අතර ඒ සියලුම සාම්පලවල ඇලීල රටාවන් දත්ත පද්ධතියට ඇතුළත් කළ බවත් CB1506/19 යටතේ යොමු කර තිබූ නඩුභාණ්ඩ සම්බන්ධයෙන් ඇලීල රටාවන් පැ.1490 දරන වාර්තාවේ සඳහන්ව ඇති බවත් කියා සිටින ලදි. එහිදී පැ.45-2 සරම, පැ.41-1 දිග කලිසම, පැ.44 යටතේ එවන ලද අංක 3 ලෙස නම් කරන ලද දත්බුරුසුව යන ද්‍රව්‍යවල අඩංගු ජෛව සාම්පල අතුරින් පැ.45(2) යන සරමත්, පැ.41(1) යන දිග කලිසමෙත් තිබූ ජෛව සාම්පල අච්චි මොහොමදු මොහොමදු හස්තූන් යන පුද්ගලයාගේ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය අඩංගු බවට තමා නිගමනයකට පැමිණි බවත්, අංක 44(3) දරන දත්බුරුසුවේ අඩංගු ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය හයාතු මොහොමඩ් අහමඩ්

මිල්හාන් යන අයගේ DNA සමඟ සැසඳෙන බවටත් තමා නිගමනය කළ අතර එම නිගමනය පැ.1490 වාර්තාවේ සඳහන් කළ බවත් කියා සිටින ලදි.

මෙහිදී එම වාර්තාවේ අයිතම අංක 6.6හි 41(1) දරන දිග කලිසම සඳහා ලැබුණ මිශ්‍ර DNA ඇලීල රටාව අච්චි මොහොමදු මොහොමදු හස්තූන් යන අයගේ DNA ඇලීල රටාව සමඟ ලැබීමේ සම්භාවිතය අනුව පුද්ගලයන් බිලියන 20.8 කින් එක් අයෙකුගේ බවත් එමෙන්ම 6.7 ඡේදයට අනුව 44(3) දත් බුරුසුව සඳහා වූ රටාව ගණනය කිරීමේදී එවන් ඇලීල රටාවක් ඇති වෙනත් බාහිර පුද්ගලයන් හමුවීමේ සම්භාවිතාවය පුද්ගලයන් කොඩිරිලියන 06 කින් එක් අයෙකු බවත් යැයි කියා සිටින ලදී. නඩු භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු ඒවා නිසි පරිදි මුද්‍රා තැබීමක් කර සුරක්ෂිතව ගබඩා කිරීමක් සිදු කළ බව කියා සිටි සාක්ෂිකාරිය නඩු භාණ්ඩ මුද්‍රා තැබීමට උපයෝගී කරගන්නා ලද කවරය පැ.1053 හඳුනා ගන්න ලදී. එම නඩු භාණ්ඩ 2026/07/16 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් 44726 ඩී.එම්. ජයසේකර නිලධාරියා වෙත භාරදීමක් සිදු කර දෙපාර්තමේන්තුවෙන් බැහැර කරන ලද බව ද කියා සිටින ලදී.

කොටුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී/13099/19 යටතේ DNA පරීක්ෂණය සඳහා නඩු භාණ්ඩ CB/656/19යටතේ නඩු භාණ්ඩ විශ්ලේෂණය කල බවත්, CB/656/19 යටතේ 2019.05.13 වෙනි දින පොලිස් කොස්තාපල් 82734 එස්.ඩී.දර්ශන නිළධාරියා විසින් පාර්සල් 05 ක් භාර දීඇති බවත් ඒ පාර්සල් මුද්‍රා යහපත් තත්ත්වයේ තිබූ බවත් කියා

සිටිමින්, CB/656/19 තුන්වනුව භාරදුන් කොටසට අදාළ සංදේශයේ කාර්යාල පිටපත පැ.1491 වශයෙන් සළකුණු කරන ලදී. එම නඩු භාණ්ඩ වනුයේ අංක 01 ලෙස DSI වර්ගයේ කොළ පාට රබර් සෙරෙප්පු යුගලයක්, අංක 02 ලෙස රෝස පාට රබර් සෙරෙප්පු යුගලයක්, අංක 03 ලෙස කළු පාට රබර් සෙරෙප්පු යුගලයක්, අංක 04 ලෙස ක්‍රීඩා සපත්තු යුගලයක්, අංක 05 ලෙස නිල් පැහැති ආරක්ෂක හිස් වැසුමක්, අංක 06 ලෙස හිස් වැස්මක්, අංක 07 ලෙස බූල් බෑන්ඩ් එකක්, අංක 08 ලෙස බූල් බෑන්ඩ් එකක්, අංක 09 ලෙස කෙස් කොටස් 09 ක්, අංක 10 ලෙස කෙස් කොටස් 18 ක්, අංක 11 ලෙස සුදු පැහැති හිස් වැස්මක්, අංක 11(1)(A) ලෙස සුදු පැහැති හිස් වැස්මක්, අංක 11(2) රබර් සෙරප්පු යුගලයක්, අංක 11(3) දත් බුරුසුවක්, අංක11(4) පනාවක්, අංක 11(5) පනාවක්, අංක 13(1) රබර් සෙරප්පු යුගලයක්, අංක 13(2) දත් බුරුසුවක්, අංක 13(3) දත්බුරුසුවක්, අංක 20 යටතේ කෙස් කොටස් 13 ක්, අංක 21 යටතේ කෙස් කොටස් 09 ක්, අංක 22 යටතේ කෙස් කොටස් 12 ක්, අංක 23 යටතේ කෙස් කොටස් 06 ක් බව කියා සිටි සාක්ෂිකාරිය, එම නඩු භාණ්ඩ විශ්ලේෂණය 2019.06.04 වෙනි දින ආරම්භකර පරීක්ෂා කිරීමෙන් පසුව වාර්තාවක් පිළියෙළ කර එම වාර්තාව මහෙස්ත්‍රාත් අධිකරණය වෙතටත් අදාළ විමර්ශන අංශ වෙතටත් යොමු කිරීම සිදු කළ බවත් කියා සිටිමින් පිටු 07 කින් සමන්විත CB/656/19 තුන්වන කොටස යන රජයේ රස පරීක්ෂක වාර්තාව පැ.1492 වශයෙන් සළකුණු කරන ලදී.

විශ්ලේෂණය කරන ලද භාණ්ඩ වල විස්තරය පැ.1492 වාර්තාවේ පිටු අංක 01 සහ 02 යටතේ අන්තර්ගත වී ඇති බවත් එම භාණ්ඩ අතරින්, 13 යටතේ වූ 11(A) හිස් වැස්මෙන් ලබාගන්නා ලද කෙස් සාම්පලවල, 15 යටතේ වූ 11(3) දත් බුරුසුවෙන්, 17 යටතේ වූ 11 (5) පනාවෙහි වූ කෙස්වලින්, 19 යටතේ වූ 13(2) දත් බුරුසුවෙන් ජෛව සාම්පල ජනනය කිරීමට ඇයට හැකියාවක් ලැබුණ බවත් විශ්ලේෂණය කළ පසුව ඉන් ලද ඇලීල අංක රටාවන් පැ. 1492 වාර්තාවේ අන්තර්ගත කළ බවත් කියා සිටිමින් එම නඩු භාණ්ඩවල 19 යටතේ වූ 13(2) දත් බුරුසුවෙන් ලැබුණු එම DNA ඇලීල අංක රටාව අප විසින් ජෛව සාම්පල පරීක්ෂාවෙන් අනතුරුව තහවුරු කරගන්නා ලද මොහොමඩ් සහරාන්ගේ ජෛව ද්‍රව්‍ය අඩංගු වූ බවට මතයකට එළඹෙන්න හැකියාවක් ලැබුණ බවත් කියා සිටින ලදී.

පැ.1492 වාර්තාවේ 8.1 යටතේ සඳහන් කර තිබෙන නිරීක්ෂණයන්ට අදාළ T(130), T (126) ලෙස සඳහන් පේෂි සාම්පලය වන බෝම්බ ප්‍රහාරයෙන් මියගිය පුද්ගලයන්ගේ සාම්පල ඉදිරිපත් කරන ලද අංක T(130), T(126) යන අංකවලට අදාළ ඇලීල අංක රටා දත්ත ගබඩාවේ අන්තර්ගතව තිබූ බවත් සාක්ෂිකාරිය කියා සිටින ලදී.

17 යටතේ වූ 11(5) පනාවෙහි වූ කෙස් සාම්පලය නිස්සාරණය කිරීමෙන් ඒ සඳහා ලැබුණු DNA ඇලීල අංක රටාව අබ්දුල් කාදර් ෆාතිමා කාදියා කියන තැනැත්තියගේ යන බවටත් 15 යටතේ වූ 11(3) දත් බුරුසුවේ වූ එම

සාම්පල නිස්සාරණයෙන් ලැබුණු DNA රටාව මොහොමඩ් සහරාන් හුසෙයිදා යන අයගේ බවටත් අනාවරණය වූ බවත්,

හිස්වැස්මෙන් ලබා ගන්නා ලද කෙස් සාම්පල් නිස්සාරණයෙන් දෙදෙනෙකුට අදාළව DNA රටාවන් එනම් අබ්දුල් කාදර් ෆාතිමා කාදියා කියන අයගේ කෙස් අඩංගු සහ මොහොමඩ් සහරාන් යන අයගේ කෙස් ද අඩංගු වූ බවට අනාවරණය වූ බවත්, අබ්දුල් කාදර් ෆාතිමා කාදියා සහ මොහොමඩ් සහරාන් හුසෙයිදා දැරියගේත් DNA සාම්පල කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ 9924/2018 යන නඩු අංකය යටතේ පැ.1 සහ පැ.2 වශයෙන් ඉදිරිපත් කර තිබුණ බවත් ඒ සඳහා CB/600/19 යොමු අංකය යටතේ නිසි පරිදි දත්ත පද්ධතියට ඇතුළත් කර ගබඩා කිරීමක් සිදු කරන ලද ඇලීල අංක රටාව සමග සංසන්දනය කර එම මතයට එළඹුණ බවත් කියා සිටින ලදී.

මේ අවස්ථාවේදී සාක්ෂිකාරියට CB/656/part 3, MC court CN-B13099/19 සටහන් සහිත පාර්සලය පැ.1493 ලෙස සලකුණු කර එහි ඇතුළත තිබූ භාණ්ඩ සාක්ෂිකාරියට පෙන්වන ලද අතර, ඒ තුළ තිබූ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය නුගේගොඩ, පී. ආර්. 127/2019 ලෙස සටහන් සහිත නිල් පැහැති හෙල්මටය පැ.1495 ලෙස සලකුණු කරන ලදී. HC/TAB/2972, CB 656/19, CE/19 යන සටහන් සහිත නඩු භාණ්ඩ පාර්සලය තුල තිබූ, අංක 04 ලෙස ඇති ක්‍රීඩා සපත්තු යුගල පැ.1497 වශයෙන් ද, සලකුණු කරන ලදී.

මුල් අවස්ථාවේදී හඳුනාගන්නා ලද හෙල්මටය තුළ තිබී කෙස් සාම්පල ලබා ගැනීම සිදුකළ බවත් ඒවා නැවත මුද්‍රා කොට CB665/19(3) ලෙසට සටහන් කළ බව එම ලිපිකවරය තුළ තිබූ කෙස් සාම්පලය සහ සුදු පැහැති කොළය පැ.1499 ලෙසට රූට් ලෙස සඳහන් විස්තර කරන ලද කොළය පැ.1500 ලෙසද, අංක 03 වශයෙන් සලකුණු කරන ලද කළු පැහැති සෙරෙප්පු යුගලය පැ.1502 වශයෙන් ද, කළු, අලු සහ දම් පැහැති සෙරෙප්පු යුගලය පැ.1506 වශයෙන් ද, DSI වර්ගයේ කොළ පාට රබර් සෙරෙප්පු යුගලය පැ.1509 වශයෙන් ද, අංක 06 යටතේ වන ලද හිස් ආවරණය පැ.1512 වශයෙන් ද, අංක 11 ලෙස අංකනය කරන ලද කාමරයේ තිබී සොයා ගන්නා ලද ටොමී ලෙස සඳහන් සෙරෙප්පු යුගලය පැ.1515 ලෙස ද, අංක 07 ලෙස අංකනය කරන ලද දුඹුරු පැහැති වූල් බෑන්ඩ් එක පැ.1518 ලෙස ද, අංක 11 ලෙස අංකනය කරන ලද කාමරයේ තිබී සොයා ගන්නා ලද දත්බුරුසු සාක්ෂිකාරිය විසින් පැ.1075 (D) නඩු භාණ්ඩයද, 11(1) වශයෙන් සටහන් කර ඇති හිස්වැස්ම පැ.1075(M) දරන නඩු භාණ්ඩයද, හඳුනාගෙන සලකුණු කරන ලදී.

එසේම අංක 08 ස්ථානයෙන් සොයා ගන්නා ලද කොළ පැහැති වූල් බෑන්ඩ් එක පැ.1523 වශයෙන් ද, අංක 10 ලෙස අංකනය කරන ලද කෙස් කොටස් සාම්පලය පැ.1525 වශයෙන් ද, එයට අදාළ Root ten hair ලෙස සඳහන් කොළ කැබැල්ල පැ.1523 වශයෙන් ද, අංක 09(B) ලෙස අංකනය කර ලද කෙස් සාම්පලය පැ.1528 ලෙස ද, එහි Root eight hair ලෙස සඳහන්

කොළ කැබැල්ල පැ.1529 ලෙසද, සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලදී. එසේම අංක 11(5) ලෙස සලකුණු කරන ලද කෙස් සහිත පනාව ඒ වන විටත් පැ.1075(J) වශයෙන් සලකුණු කර තිබූ අතර සාක්ෂිකාරිය හඳුනා ගන්නා ලදී. අංක 2 ලෙස අංකනය කළ රෝස පැහැති රබර් සෙරෙප්පු යුගල පැ.1533 ලෙසත් අංක 11(7) ලෙස අංකනය කළ කෙස් සහිත දම් පැහැති පනාව පැ.1537 ලෙස ද, අංක 11(1) අංකනය කළ මුස්ලිම් ජාතිකයක් පළඳින සුදු පැහැති හිස් වැසුමෙන් ලබා ගන්නා කෙස් කොටස් සාම්පල් 05ක් ඇතුළත් නඩු භාණ්ඩ පැ.1539 වශයෙන් ද, 13(2) ලෙස අංකනය කළ ඒ වන විටත් පැ.1075(G) දරන රතු සහ සුදු පැහැති දත් බුරුසුවද සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නා ලදී. අංක 09 දරන කෙස් කොටස් සාම්පලය පැ.1541 ලෙස ද, අංක 10 ලෙස සඳහන් කෙස් කොටස් 18ක් වූ නඩු භාණ්ඩ පැ.1543 වශයෙන් ද, අංක 13(3) ලෙසට අංකනය කරන ලද දත් බුරුසුව පැ.1546 ලෙසද, අංක 11 ලෙස සලකුණු කර කාමරයෙන් ලබා ගන්නා ලද කෙස් කොටස් 6ක් ඇතුළත් කෙස් සාම්පලය පැ.1548 වශයෙන් ද, කෙස් කොටස් 13ක් සහිත සාම්පලය පැ.1550 ලෙසද, එහි Root ten hair යන සටහන ඇතුළත් කොළය පැ.1551 වශයෙන් ද, සාක්ෂිකාරිය හඳුනාගන්නා ලද අතර මෙම භාණ්ඩ ලකුණු කිරීමේදී ඒවා රජයේ රස පරීක්ෂක කාර්යාලයේදී විශ්ලේෂණයෙන් පසුව ඇතුළත් කර රජයේ රස පරීක්ෂක කාර්යාලයේ මුද්‍රාවෙන් මුද්‍රා තබා විධිමත්ව අධිකරණය වෙත එවා තිබූ අතර අදාළ භාණ්ඩ සලකුණු කිරීමට

පෙර එකී මුද්‍රා සහිත කවර සහ ඇතුළත වූ කවරද වෙන වෙන ම සලකුණු කරන ලදී. එම සියලුම කවර සහ මුද්‍රා සාක්ෂිකාරිය විසින් හඳුනාගෙන තහවුරු කරන ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඇයව නැවත කැඳවන ලෙසට 03 වන චූදිත විසින් ඉල්ලීමක් කරන ලද අතර, ඔහුට එම අවස්ථාව ලබා දෙන ලදී. එහිදී තමා විසින් පරීක්ෂා කරන ලද නඩු භාණ්ඩ අතරින් පැ.44 යනු දත්බුරුසුවක් බවත්, ඒ සමඟ සම්පූර්ණ වශයෙන් දත්බුරුසු 3 ක් තිබුන අතර, එහි PR 84/19 ලෙස සටහන්ව තිබූ අතර, මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ මුද්‍රා යහපත් තත්ත්වයේ තිබූ බවත් කියා සිටින ලදී. එසේම 2019.12.24 දින සැකකරුවන්ගේද ඩී. එන්.ඒ. සාම්පල් තමා විසින් ලබාගත් බවත්, විශ්ලේෂණයේදී ලත් සියළු දත්තයන් පැ.1490 වාර්තාවේ පැහැදිලිව වගුවක ආකාරයෙන් සඳහන් කර ඇති බවත්, දත්බුරුසු 03 ක් තිබූ බැවින් ඒවා 44(1), (2), (3) වශයෙන් සලකුණු කර බවත්, පැ. 44(3) හයාතු මොහොම්මදු අහමදු මිල්හාන් යන අයගේ DNA බවටත් තහවුරු වූ බවටත් කියා සිටින ලදී. ඇයගෙන් පැ. 45(2) සහ පැ. 41(1) ලෙස නම් කරන ලද සරම සහ දිග කලිසම සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසා ඇති අතර, ඒවා එක් අයෙකු හෝ කිහිප දෙනෙකු විසින් භාවිතා කිරීමට හැකියාව ඇති බවත් කියා සිටි සාක්ෂිකාරිය පැ. 44(3) චංචල භාණ්ඩයක් වන අතර, DNA එම භාණ්ඩ මත පතිත වූයේ කවදාද යන්න නිශ්චිතව කීමට හැකියාවක් නොමැති බවත් කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකාරිය ඇතුළු නිලධාරීන් කණ්ඩායම විසින් පාස්කු ප්‍රහාරයේ මියගිය අයගේ සහ සැකකරුවන්ගේ සාම්පල විශ්ලේෂණය කර ඩී.එන්.ඒ. (DNA) වාර්තා සකස් කර ඇති බව මෙම සාක්ෂියෙන් අනාවරණය වේ. එසේම ඇයගේ විශේෂඥභාවය සම්බන්ධයෙන්ද විශ්ලේෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන්ද එම ක්‍රමවේදය සම්බන්ධයෙන්ද දෙන ලද සාක්ෂි අප විසින් මනාව සළකා බලන ලද අතර, එම සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් යුතු සාක්ෂි ලෙසට අප තීරණය කරමු. එසේම මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබුණු නඩු භාණ්ඩ (පැ.38 සිට පැ.52) විශ්ලේෂණය කිරීමේදී, පැ.45(2) සරමෙහි සහ පැ.41(1) දිග කලිසමෙහි තිබූ ජෙව සාම්පල "අච්චි මොහොමදු මොහොමදු හස්තූන්" නැමැති අයගේ DNA සමඟ ගැළපෙන බවත්, පැ.44(3) දත් බුරුසුවේ තිබූ ජෙව සාම්පල "හයාතු මොහොමඩ් අහමඩ් මිල්හාන්" නැමැති අයගේ DNA සමඟ ගැළපෙන බවට ඇය විසින් දෙන ලද සාක්ෂිය 03 වන විත්තිකරු විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කලද එම හරස් ප්‍රශ්න වලින් ඇයගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය බිඳ වැටී නොමැති බව පැහැදිලිව පෙනී යයි. ඒ අනුව ඇයගේ සාක්ෂිය අප පිළිගනිමු.

කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවකට අදාළව, පරීක්ෂා කරන ලද දත් බුරුසුවක (13(2)) තිබූ ජෙව සාම්පල "මොහොමඩ් සහරාන්" ගේ DNA සමඟ ගැළපෙන බවත්, පනාවක (11(5)) තිබූ කෙස් සාම්පල "අබ්දුල්

කාදර් ෆාතිමා කාදියා" (හාදියා) ගේ DNA සමඟ ගැළපෙන බවත්, දත් බුරුසුවක (11(3)) තිබූ සාම්පල සහරාන්ගේ දියණියගේ DNA සමඟ ගැළපෙන බවත් නිගමනය කර ඇත. ඒ සම්බන්ධයෙන් හඬයක් නොමැති බව පැහැදිලිව පෙනී යයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1712 පොලිස් කොස්තාපල් 82340, සමීර ජීවන්ත ප්‍රනාන්දු යන සාක්ෂිකරු සාක්ෂි දෙමින්, තමා වර්ෂ 2019 මීගමුව මූලස්ථාන පොලිස්ථානයට අනුයුක්ත මීගමුව අපරාධ පරීක්ෂණාගාරයේ භාණ්ඩ භාරකරු වශයෙන් සේවය කළ බවත් තමාට ලැබෙන භාණ්ඩ බාහිර අයකුගේ ප්‍රවේෂයකින් තොරව සුරක්ෂිතව තබා ගන්නා බවත් වර්ෂ 2019.04.23 වන දින කුරුණෑගල අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක විජේසේකර නිලධාරියා විසින් නඩු බඩු කුවිතාන්සි අංක 37/2019 සිට 70/2019 දක්වා නඩු භාණ්ඩ 35ක් ද, ගම්පහ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක කොල්ලුරේ මහතාගෙන් නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 70 සිට 97 දක්වා නඩු භාණ්ඩ 27ක් ද, ගම්පහ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් කොස්තාපල් 63323 රත්නායකගෙන් නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 98/2019 යටතේ DVD තැටියක් ද, මීගමුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ උ.පොා.ප. සිරිපති මහතාගෙන් නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 99/2019 සිට 102/2019 දක්වා නඩු භාණ්ඩද, පොළොන්නරුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොා.ප. බෝදරගම මහතා විසින් නඩු භාණ්ඩ කුවිතාන්සි අංක103/2019 යටතේ භාරදෙන ලද

DVD තැටියක් ද, මීගමුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් සැරයන් 27480 උපතිස්ස යන නිලධාරියාගෙන් 2019.04.24 වන දින නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 104/2019 යටතේ DVD තැටියක් ද, තමා භාරයටගෙන ආරක්ෂා සහිතව තැබූ බවත් ඒවායින් නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 43/2019, 53/2019, 54/2019, 95/2019, 99/2019, 100/ 2019, 101/2019 යටතේ වූ නඩ භාණ්ඩ 2019.04.23 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක සුගත් මහතා වෙත නිසි පරිදි භාරදුන් බවත් ඉතිරි නඩු භාණ්ඩ 62 ක් 2019.05.06 දින මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ භාරකරු ලෙස එවකට සේවය කළ දිසානායක යන නිලධාරියාට විධිමත්ව භාරදුන් බවත් භාරගන්නා අවස්ථාවේ සිට භාරදෙන අවස්ථාව දක්වා ඒවායේ මුද්‍රා යහපත් තත්ත්වයෙන් තිබූ බවත් සාක්ෂිකරු කියා සිටින ලදී.

සාක්ෂිකරු විසින් එම අවස්ථාවේදී ඔහුට පෙන්වා සිටින ලද ගම්පහ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක කොල්ලුරේ මහතා විසින් භාරදෙන ලද 71/2019 සිට 97/2019 දක්වා නඩු භාණ්ඩ කුවිතාන්සියට අදාළ ඒ වන විටත් ලකුණු කර තිබූ පැ.1006 සිට 1015 දක්වාත්, 1018 සිට 1021 දක්වාත්, 1023 සිට 1027 දක්වාත්, පැ.1029 සිට 1036 දක්වා වූ දේපළ කුවිතාන්සි පිටපත් හඳුනාගන්නා ලදී. දේපළ කුවිතාන්සි අංක PR 36/19 පැ. 1134 ලෙසත් දේපළ කුවිතාන්සි අංක 37/19 පැ. 1135 ලෙසත් සලකුණු කරන ලදී.

එසේම සාක්ෂිකරුට පෙන්වන ලද PR 38/19 පැ. 1136 ලෙසටත්, 39/19 පැ.1137 ලෙසටත්, 40/19 පැ. 1138 ලෙසටත්, 41/19 පැ. 1139 ලෙසටත්, 42/19 පැ. 1140 ලෙසටත්, 43/19 පැ. 1141 ලෙසටත්, 44/19 පැ. 1142 ලෙසටත්, 45/19 පැ. 1143 ලෙසටත්, 46/19 පැ.1144 ලෙසටත්, 47/19 පැ. 1146 ලෙසටත්, 48/19 පැ. 1147 ලෙසටත්, 50/19 පැ. 1148 ලෙසටත්, 51/19 පැ. 1149 ලෙසටත්, 52/19 පැ. 1150 ලෙසටත්, 53/19 පැ. 1151 ලෙසටත්, 54/19 පැ. 1152 ලෙසටත්, 55/19 පැ.1153 ලෙසටත්, 56/19 පැ. 1154 ලෙසටත්, 57/19 පැ. 1155 ලෙසටත්, 58/19 පැ. 1156 ලෙසටත්, 59/19 පැ. 1157 ලෙසටත්, 60/19 පැ.1158 ලෙසටත්, 61/19 පැ. 1159 ලෙසටත්, 62/19 පැ. 1160 ලෙසටත්, 63/19 පැ. 1161 ලෙසටත්, 64/19 පැ. 1162 ලෙසටත්, 65/19 පැ. 1163 ලෙසටත්, 66/19 පැ. 1164 ලෙසටත්, 67/19 පැ. 1165 ලෙසටත්, 68/19 පැ. 1166 ලෙසටත්, 69/19 පැ. 1167 ලෙසටත්, 70/19 පැ. 1168 ලෙසටත් සාක්ෂිකරු විසින් සලකුණු කරන ලදී. එසේම, දේපළ කුවිතාන්සි අංක PR 98/19 පැ. 1169 ලෙස සලකුණු කරන ලද අතර, දේපළ කුවිතාන්සි අංක 99/2019 ලෙසටත්, පැ. 1170 ලෙසටත්, 100/19 පැ. 1171 ලෙසටත්, 101/19 පැ. 1172 ලෙසටත්, 102/19 පැ. 1173 ලෙසටත් සාක්ෂිකරු විසින් සලකුණු කරන ලදී. එසේම, දේපළ කුවිතාන්සි අංක PR 103/2019 පැ. 1174 ලෙසටත්, PR 104/19 පැ. 1175 ලෙසටත් සාක්ෂිකරු විසින් සලකුණු කරන ලදී.

මෙම සාක්ෂිකරුගෙන් සියළුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඉදිරිපත් නොකරන ලද අතර ඒ අනුව මෙම කිසිදු විවාදයකින් තොරව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී මෙම සාක්ෂිකරු හලාවත අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නිලධාරියෙකු වශයෙන් සිටියදී 2019.04.23 දින මීගමුව මූලස්ථාන පොලිසියට අනුයුක්තව මීගමුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ සේවය කරමින් සිටියදී, කටුවාපිටිය පල්ලියේ පිපිරීමට අදාළව කුරුණෑගල, ගම්පහ, මීගමුව සහ පොළොන්නරුව යන අපරාධ ස්ථාන පරීක්ෂණාගාරවලින් සොයාගත් නඩු භාණ්ඩ PR 36/2019 සිට 104/2019 දක්වා ආරක්ෂිත සේප්පුවේ තබා, ඉන් නඩු භාණ්ඩ කිහිපයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් පරීක්ෂක සුගත් වෙත ලබා දී ඇති අතර, ඉතිරි නඩු භාණ්ඩ 62ක් 2019.05.06 දින මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ භාරකරු වන ඩී.එන්.සී. දිසානායක වෙත නිසි පරිදි මුද්‍රා සහිතව භාර දී ඇත. ඒ අනුව අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද ඉහත සඳහන් නඩු භාණ්ඩ නිසිපරිදි රජයේ රස පරීක්ෂකවරයා වෙත මුද්‍රා යහපත් තත්ත්වයේ තිබියදී බාර දීමට අදාළ අතිනත දාමය මැනවින් තහවුරු වී ඇත.

පැ,සා 1567 වෛද්‍ය ඩී.කේ. විජයවර්ධන යන සාක්ෂි කරු සාක්ෂි ලබා දෙමින් තමා හලාවත දිස්ත්‍රික් රෝහලෙහි සේවය කරන බව පවසා

ඇති අතර එසේහ 1992 වසරේ සෝවියට් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව පිළිපඳ ආචාර්ය උපාදිධිය ලබා 1995 වසරේ සිට පූර්ණ කාලීනව අධිකරණ වෛද්‍ය කටයුතු වල නියැලුණ බව පවසා ඇති අතර, 2019 වසරේ මීගමුව දිස්ත්‍රික් මහ රෝහලෙහි අධිකරණ වෛද්‍ය නිලධාරියා ලෙස සේවය කරන ලද බවත්, පවසා 2019.04.21 දින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ බෝම්බ පිපිරූ ස්ථානයට ගොස් සොකෝ නිලධාරී ශ්‍රීපති යන නිලධාරියා විසින් පෙන්වා දුන් ස්ථාන පරීක්ෂා කරන ලද බවත් පවසා අදාළ බෝම්බ පිපිරීම සිදුකළා යයි පවසන ස්වයංඝාතක බෝම්බකරුගේ ශරීර කොටස් එදිනම මෘත ශරීරාගාරයට ගෙනවිත් තිබුන බවත් ඒවා එදිනම නැවතත් අනෙකුත් පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කරන අවස්ථාවේදී පරීක්ෂාකර බලා ඉන් අනතුරුව එදින මධ්‍යම රාත්‍රිය පසු වෙන තෙක් පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කරන අතර වාරයේදී මෙම ශරීර කොටස් වෙනම ශීතාගාරයක තැන්පත් කර වැඩිදුර පරීක්ෂණ සඳහා ආරක්ෂාවෙන් ආරක්ෂා සහිතව තබා 2019.04.23 දින එම ශරීර කොටස් එළියට අරගෙන නැවත පරීක්ෂා කර එහි අස්ථි කැඩී ගොස් තිබෙන ආකාරය සහ ශරීරයේ අනෙකුත් කොටස් වලින් වෙන් වී තිබූ ආකාරය පරීක්ෂා කරනු ලැබුව බවත් මෙම හිස ඒ කියන්නේ ගෙල ගෙලෙන් ඉහළට ඇති හිස කොටස සහ දණ හිසෙන් පහළ ඇති කකුල් කොටස් ශරීරයේ ඉතිරි කොටස් සුනුවිසුනු වීම හේතුවෙන් වෙන්ව යාමක් පෙන්නුම් කරන ස්වභාවයක් නිරීක්ෂණය කල බවත් පවසා ඇත.

එසේම 2019-4-27 වන දින මෙම මිය ගිය අයගේ ඥාතීන් පැමිණි බවත් ඔවුන්ට මෘත ශරීරයේ කොටස් පෙන්වා හඳුනා ගැනීමට සැලැස්සුව බවත් එහිදී මරණකරුගේ ඥාතීන්ගෙන් ඇතැමෙක් එය හඳුනා ගත්තද මව තමාගේ පුතාගේ ශරීර කොටස් වශයෙන් එම ශරීර කොටස් පිළිගැනීමට අකමැති වුණ බවත් ඉන් අනතුරුව එම මරණකරුගේ සහෝදරයාගේ දෙපා පරීක්ෂා කල බවත් එයට හේතුව මිය ගිය බෝම්බකරුගේ දෙපාවල කකුලේ ඇඟිලිවල විශේෂ ලක්ෂණයක් තමා නිරීක්ෂණය කල බැවින් එනම් ඔහුගේ පාදයේ දෙවැනි ඇඟිල්ල මහපට ඇඟිල්ලට වඩා දිග බැවින් බවත් තමා පරික්ෂා කිරීමේ දී ඔහුගේ එම සහෝදරයාගේද එම ලක්ෂණය ඒ ආකාරයටම තිබුණ බවත් එලෙස බාහිර ලක්ෂණ අනුව හඳුනා ගැනීමෙන් අනතුරුව වැඩිදුර පරීක්ෂණ සඳහා ඩී.එන්.ඒ සාම්පල එම ශරීර කොටස් වලින් ලබා ගෙන ඒවා රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඩී.එන්.ඒ හඳුනා ගැනීම සඳහා කටයුතු කල බවත් සාක්ෂිකරු පවසා ඇත. එහිදී මරණකරුගේ එනම් ස්වයං ඝාතක බෝම්බකරුගේ මව වන අබ්දුල් ලතීෆ් රහුමාන් උම්මා නැමැති අයගේ රුධිර සාම්පල දෙකක් සහ එම ස්වයංඝාතක බෝම්බකරුගේ පියාගේ රුධිර සාම්පල දෙකක් සහ එනම් උස්නාර් අච්චි මහමුදු නැමැති අයගේ සහ අච්චි මහමුදු මොහොමදු අස්මීර් නැමැති ස්වයංඝාතක බෝම්බකරුගේ වැඩිමල් සහෝදරයාගේ රුධිර සාම්පල දෙකක් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ කැමැත්ත මත ලබා ගෙන ඉන් අනතුරුව ස්වයංඝාතක බෝම්බකරුගේ ගෙල ප්‍රදේශයෙන් ගත් කඟේරුකා

කැබලි සහ පේෂි පටකය සහ දකුණු කකුලේ පේෂි පටකය සහ වම් කකුලේ පේෂි පටකය සාම්පල සඳහා ලබා ගෙන රුධිර සාම්පල බහලුම් වල බහා ලියුම් කවල තැන්පත් කර මුද්‍රා තබා පටක සාම්පල ප්ලාස්ටික් බෝතල් තුනක තැන්පත් කර ඒවා ආවරණය කර මුද්‍රා තබා අත්සන් තබා රජයේ රස පරීක්ෂක වෙත යොමු කල බවත් එලෙස යොමු කරන ලද ඩී.එන්.ඒ සාම්පල පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒ ඩී.එන්.ඒ සාම්පල සංසන්දනය කිරීමෙන් පසු ඒ පටක මරණකරුගේ මරණකරුගේ ශරීර කොටස් වලින් ලබාගත් පටක සාම්පල් වල අනන්‍යතාවය තහවුරු කරමින් එම පටක සාම්පල එම හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් වූ පියාගේ සහ මවගේ දරුවෙක් හා අවිවි මොහොමදු අස්මීර් නැමැති අයගේ සහෝදරයෙක්ගේ බවට ඩී.එන්.ඒ වාර්තාවලින් තහවුරු වූ බවත් එලෙස මරණකරුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව පශ්චාත් මරණ වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ බවත් පවසා ඇත.

2026.07.10 වන දින පැමිණිල්ල සහ විත්තිය විසින් ගරු අධිකරණය ඉදිරියේ සටහන් කර ඇති පිළිගැනීම හේතු කොට ගෙන මරණකරුගේ පටක සාම්පල සහ ලේ සාම්පල සම්බන්ධයෙන් පරීක්ෂා කොට බලා පැය.921 ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාව හා සම්බන්ද කරුණු දැනටමත් පිළිගැනීමක් සිදු කොට ඇති හෙයින් පිළිගැනීමක් ලෙස සටහන් කර ඇති හෙයින් එකී කරුණු සම්බන්ධයෙන් වැඩිදුර සාක්ෂි විමසීමක් මෙම සාක්ෂිකරුගෙන් සිදු නොකරන බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

සාක්ෂිකරු වැඩි දුරටත් සාක්ෂි දෙමින් තමා 2019-6-21 දිනත් මරණ පරීක්ෂණය පැවැත්වූ බවත් එම ශරීර කොටස් විච්ඡේදනය කර බලා ඔහුගේ මරණයට හේතු වූ කරුණු ලෙසට ශරීරයට ස්පර්ශ වන දුර ප්‍රමාණයකට සිට සිදු වූ බෝම්බ පිපිරීමක් හේතුවෙන් ශරීරය කුඩා කොටස් වලට ඛණ්ඩනය වීමෙන් සිදු වූ මරණයක් වශයෙන් මරණයට හේතුව දක්වා තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සිද්ධියට අදාළව පශ්චාත් මරණ පරීක්ෂණ 103ක් තමා විසින් සිදු කර තිබෙන බවත් ඒවා නොයෙක් ආකාරයට ඛණ්ඩනය වූ සහ විකෘති වූ සහ ඉරී ගිය, කැඩී බිඳී ගිය සහ පිපිරීම් බලයන්ට භාජනය වූ මෘත ශරීර බවට තමා නිරීක්ෂණය කළ බවත් නමුත් මෙම පාද කොටස් දෙක සහ හිස තමා විසින් නිරීක්ෂණය කරන ලද ඉතිරි පශ්චාත් මරණ පරීක්ෂණ වලට ලක් වූ අයගේ ශරීර කොටස් වලට වඩා වෙනස් බව පෙනුන බවත් එය ශරීරයට සම්බන්ධ වූ ස්ථානයෙන් තිවෘර වෙන් වී ගිය ස්වභාවයක් සහ එහෙමෙන්ම අධික ක්ෂණික තාපයකට භාජනය වූ බව පෙන්නුම් කරනවා. එමෙන්ම ඒවා පිපිරුම් ස්ථානයේ සිට සෑහෙන දුරකට විස්ථාපනය වූ බව දකින්නට ලැබුණ බවත් එමෙන් ම හිස ඉහළට ගොස් නැවත පොළොවට පතිත වීමට පෙර විනාශයට පත් වූ බංකුවක් උඩ තිබුණ බවත් එම ශරීර කොටස් විසිරී ගිය ආකාරය සහ එහි තමා නිරීක්ෂණය කරන ලද ලක්ෂණ අනුව එය ස්වයංඝාතක බෝම්බකරුවෙකුගේ ස්පර්ශ වන දුර ප්‍රමාණයක සිට සිදු වූ අධිබලැති පිපිරීම්වලදී ඉතිරි වන ශරීර කොටස් වලට සමාන ලක්ෂණ පෙන්නුම් කළ

බවත් සාක්ෂිකරු පවසා ඇත. පෙර අවස්ථාවක පැ.56 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියක අඩංගු සීසීටීවී දර්ශනය විවෘත අධිකරණයේ ස්ථාපනය කර ඇති පුළුල් තිරයක් මතට ප්‍රොජෙක්ටරයක් ආධාරයෙන් ප්‍රදර්ශනය කරන ලද අතර් එකී වර්ණ වීඩියෝ දර්ශනයට අනුව යම්කිසි තැනැත්තෙක් පිටේ තරමක් සෑහෙන තරමක් බරැති ගමන් බෑගයක් එල්ල ගෙන එය සමබර කිරීම සඳහා ඉදිරියට නැමිලා එන තරුණ රැවුලක් වවාගත් තැනැත්තෙක් සිටින ආකාරය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ අධි බලැති පුපුරන ද්‍රව්‍ය මෙම වීඩියෝ දර්ශනයේ දුටු ආකාරයට යම්කිසි තැනැත්තෙක් ගමන් බෑග් එක අසුරා ශරීරයට ස්පර්ශ වන සේ තබාගෙන පැමිණ පිපිරීමක් සිදු කළා නම් සම්පූර්ණ ශරීරයේ එනම් කඳ කොටස සහ ඇතැම් විට අත් සම්පූර්ණයෙන් සුනු විසුනු වී කුඩා කොටස් වලට කැඩී විසිරෙන අතර ගාත්‍රාවල එනම් අපර ගාත්‍රාවල කකුල් වල තමා විසින් සොයා ගන්නා ලද කොටස් ඉතිරි වන සේ එනම් හිසේ ගෙලෙන් ඉහළට ඇති කොටස් සහ දෙපා ඉතිරි වන සේ ඉතිරි ශරීර කොටස් කුඩා කැබලි වලට කැඩී සුනු විසුනු වී යෑමේ හැකියාව ඇති බවට වෛද්‍ය වරයා මතයක් ප්‍රකාශ කර ඇත.

තමා 2019-4-21 වන දින කටුනායක ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට ගොස් ඒ පරීක්ෂා කරන ලැබූ අවස්ථාවේදී මරණකරුගේ හිස තමා විසින් හඳුනා ගත් බවට සාක්ෂිකරු පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ. 902 ලෙස සලකුණු කරන ඡායාරූපයක් සාක්ෂිකරුගේ

අවධානයට යොමු කිරීමෙන් පසු එය පරීක්ෂා කර බලා එම ඡායාරූපය අනුව හිස කඳින් වෙන් වී ගොස් තිබෙන බවත් ග්‍රයිවී කශේරුකා හා පිටේ මෘදු පටක වැදැල්ලක් සමඟ සහ ඔහුගේ රැවුල් සහ කොණ්ඩය flash burns නැමැති ක්ෂණිකව ඇතිවන ක්ෂණික ගිනි ජාලාවකට අසූ වී ක්ෂණිකව පිළිසුණු ස්වභාවය පෙන්නුම් කල බවත් එය ස්වයං ඝාතක බෝම්බකරු ලෙස හඳුනාගත් මරණකරුගේ හිස පිළිඹු වෙන ඡායාරූපයක් බවත් එම මෙම ඡායාරූපය තමා විසින්ද විවිධ කෝණ වලින් ලබා ගෙන තිබෙන බව සාක්ෂිකරු පවසා ඇත.එසේම තමා විසින් සකස් කර ඉදිරිපත් කරන ලද පැ.1002 දරන පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ මරණයට හේතුව ලෙස තමා disintegration වශයෙන් සඳහන් කර තිබෙන බවත් disintegration වශයෙන් සඳහන් ඇති ඉංග්‍රීසි වචනයේ තේරුම ශරීර කොටස් කුඩා කැබලි වලට කැඩී එම ශරීර කොටස් ඉතිරි වීම අදහස් කරන බවත් එය සිදුවී ඇත්තේ ස්පර්ශ වන දුර ප්‍රමාණයක සිට සිදුවූ බෝම්බ පිපිරීමකින් වශයෙන් සඳහන් කරන ලද බවත් එහි තිබූ පිළිස්සුම් තුවවල ස්වභාවය අනුව සහ හිස සහ කකුල් වල කොටස් ශරීරයේ අනිකුත් ඊට සම්බන්ධ කොටස් වලින් කැඩී වෙන් වී ගිය ආකාරය අනුව තමා එය තීරණය කරල බවත් එය බෝම්බ පිපිරීමකදී ස්වයංඝාතක බෝම්බකරුවෙක්ගේ ශරීර කොටස් වලට සිදුවන ආකාරයේ හානියක් බවට තමාගේ පූර්ව අත්දැකීම් හා පළපුරුද්ද අනුව තමා නිරීක්ෂණය කළ බවත් සාක්ෂිකරු පවසා ඇත. දීර්ඝ ලෙස

සාක්ෂි ලබා දුන් මෙම සාක්ෂිකරුගෙන් සියළු චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට පවසා ඇත.

විශ්ලේෂණය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් සහ ඔහු විසින් සකස් කර ඉදිරිපත් කරන ලද පැ.1002 දරන පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ මරණයට හේතුව ලෙස ඔහු විසින් disintegration වශයෙන් සඳහන් කර තිබෙන කරුණ තුළින් සහ ස්වයංඝාතක බෝම්බකරුගේ ශරීර පටක කොටස් ආසන්න ඥාතීන්ගේ ඩී.එන්.ඒ සාම්පල සමග සංසන්දනය කිරීමෙන් පසු ස්වයංඝාතක බෝම්බකරු වන්නේ අච්චි මොහොමදු මොහොමදු හස්තූන් නැමැත්තා බවට ඉතා නිවැරදිව තහවුරු වී ඇති බව පෙනී යයි. 2026-7-10 වන දින පැමිණිල්ල සහ චිත්තිය විසින් අධිකරණය ඉදිරියේ සටහන් කර ඇති පිළිගැනීම හේතු කොට පැ.921 ලෙස ලකුණු කර ඇති ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාව හා සම්බන්ද කරුණු දැනටමත් පිළිගැනීමක් සිදු කොට ඇති හෙයින් පිළිගැනීමක් ලෙස සටහන් කර ඇති හෙයින් එහි අඩංගු ඩී.එන්.ඒ විශ්ලේශනයන් තුළින් ද ස්වයංඝාතක බෝම්බකරු වන අච්චි මොහොමදු මොහොමදු හස්තූන් යන අයගේ අනනයතාවය මනාව තහවුරු වී ඇත.

<u>කොළඹ කිංග්ස්බරි හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීම.</u>

කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළව මුලින් ම සාක්ෂි මෙහෙයවීම ආරම්භ වී ඇත්තේ 2024-1-23 දින වන අතර එලෙස මෙහෙයවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සළකා බැලීමට ප්‍රථමව කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළව ඉදිරිපත් කර ඇති චෝදනාවන් කවරේද? යන්න සළකා බැලීම සුදුසු වේ.

මෙම නඩුවේ අධි චෝදනා අංක 4521 සිට 4745 දක්වා චෝදනා ගොනු කර ඇත්තේ සියලුම චූදිතයන්ට එරෙහිව 2019.04.21 කිංග්ස්බරි හෝටලයේදී දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබු අබ්දුල්ලා විසින් අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් කිංග්ස්බරි හෝටලයේදී සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්වේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමේ වරද සිදු කළ බවද, එකී වරද සිදු කිරීමේ දී පහත නම් සඳහන් අයවලුන්ගේ මරණය සිදු කිරීමෙන් දැනට මියගොස් සිටින එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබු අබ්දුල්ලා, 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු

වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා සියලුම චූදිතයින් දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබු අබ්දුල්ලා අනුබල දීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවට ය. (17 වන චූදිත නඩු විභාගය අතරතුරදී මිය යන ලද බැවින් ඔහුගේ චෝදනා ඉවත් කරගන්නා ලදි)

කිංග්ස්බරි හෝටලයේදී සිදු වූ බෝම්බ පිපිරීමෙන් පුද්ගලයන් 09 දෙනෙක් මියගොස් ඇති අතර මෙම නඩුවේ පැමිණිල්ලෙන් පැ.82 ලෙස ලකුණු කර ඇති ලේඛනයේ සඳහන් 2019.04.21 වෙනි දින කිංග්ස්බරි හෝටලයේ අමුත්තන් වශයෙන් පැමිණි පුද්ගලයන් අතරින් මියගිය පුද්ගලයන් 09 දෙනෙකු වන රූ මැනුවෙල් ද කුන්හා ලූකස් (Rui Manuel Da Cunha Lucas), ඇල්බර්ටෝ චාවේස් ගෝමස් (Alberto Chaves Gomez), මරියා ගොන්සාලේස් විසෙන්ටේ (Maria Gonzales Vicente), ෂෙත්තිපල්‍යා රාමක්‍රිෂ්ණප්පා නාගරාජ් (Shetipalya Ramakrishnappa Nagaraja), වැන්ග් ලී වේ (Wang Li Wei), ලී ජියාන් (Li Jian), පෑන් වෙන් ලියාන් (Pan ven liang), ලී ඩාවෙයි (Li dawei), ක්‍රිෂ්මන් ජයවර්ධන (Krishman Jayawardhna) යන පුද්ගලයන් ගේ නම් සහ තොරතුරු ඇතුළත් ඉහත කී පැ.82 ලේඛනය 2024.02.07 දින විත්තිය විසින් හඹ

නොකිරීම මත 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් වශයෙන් වාර්තා කර ඇත. ඒ අනුව 2019.04.21 දින කිංග්ස්බරි හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීමෙන් ඉහත කී තැනැත්තන් 09 දෙනා මියගොස් ඇති කරුණු අධිකරණය ඉදිරියේ ඔප්පු වූ කරුණකි. මෙකී කරුණු 2026.4.30 දින දෙපාර්ශවය විසින්ම අත්සන් තබා අධිකරණයේ ගොනුකරන ලද විස්තරාත්මක පිළිගැනීම් වලද තවදුරටත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළව මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය සම්බන්ධයෙන් පහත සඳහන් පිළිගැනීම් දදෙපාර්ශවයේ එකගතාවය මත විධිමත් ව ලකුණු කර ඇත.

දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් 2019.04.21 වන දින කොළඹ කිංග්ස්බරි හෝටලයේදී අධිචෝදනා පත්‍රයේ සඳහන් සිද්ධියේදී මියගිය බවත්,

ඉහත නම් සඳහන් මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තාගේ මෘත ශරීරයේ කොටස් පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී මොහොමඩ් මහබූක් මොහොමඩ් කබීර් (පැ.සා. 912), මොහොමඩ් අබූබකර් මොහොමඩ් ඉසාම් (පැ.සා. 913) යන අය විසින් මේ වන විටත් හඳුනාගෙන ඇති බව එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

ඉහත නම් සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයෙන් ලබාගත් පේශි සාම්පල ජාන පරීක්ෂාවක් සඳහා කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 13100/19 දරන නඩුව යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවත්, එකී පේශි සාම්පල මරණකරුගේ බිරිඳ වන මොහොමඩ් වසීර් අයිෂා සිද්ධිකා සහ හා මරණකරුගේ දියණිය වන හබ්බා අසාම් යන අයගෙන් ලබාගත් රුධිර සාම්පල සමඟ සසඳා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක වී.ජේ. බණ්ඩාරනායක (පැ.සා. 1436) සහ නියෝජ්‍ය රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න (පැ.සා. 1444) විසින් 2019.06.18 දිනැති අනුක්‍රමික අංක සීබී/531/19 (ජේබී/721/19) සඳහන් වාර්තාව (පැ. 948) නිකුත් කළ බවත්, එකී වාර්තාවට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කරන ලද එකී පේශි සාම්පල දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්ගේ බවට තහවුරු කර ඇති බවත්, එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

පැ.834, පැ.835, පැ.836 සහ පැ.861 ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන පුද්ගලයා දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.13 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සීසීටීවී දර්ශන අතුරින් පැ.13(26) සීසීටීවී දර්ශනයේ තිරයේ දිස්වන දිනය සහ වේලාව අනුව 2019.04.21 පැය 08:44 ට කැප් තොප්පියක් පැළඳගෙන කරේ බෑග් එකක් සහ අතේ කුඩා බෑගයක් සහිතව විදුලි සෝපානයෙන් පිටතට පැමිණෙන පුද්ගලයා පැ.834, පැ.835, පැ.836 සහ පැ.861 ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය බවත්, එකී නම් සඳහන් දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය ලිඛිත පිළිගැනීම් සමග අමුණා ඇති "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සීසීටීවී දර්ශනවල දර්ශනය වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී පිළිගෙන ඇත.

එසේම දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.834, පැ.835, පැ.836 සහ පැ.861 ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, අංක: 176 හි පිහිටි නිව් ලුක් අල් හරමානියා වෙළඳසැලෙන් ලබාගත් පහත "ඉ" උපලේඛනයේ සඳහන් කර ඇති සීසීටීවී දර්ශනයෙන් දිස්වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගෙන ඇති අතර, ඒ අනුව ඉහත සඳහන් පිළිගත් කරුණු ඔප්පු කිරීම සඳහා යලි කිසිදු සාක්ෂියක් මෙහෙයවීම අවශ්‍ය වන්නේ නැති අතර එම කරුණු සියල්ල මෙම අධිකරණය ඉදිරියේ ඔප්පු වූ කරුණු ලෙස මෙම තීන්දුව සකස් කිරීමේ දී අපගේ සලකිල්ලට ගන්නා ලදී.

මෙහි දී ඉහත කී පිළිගැනීම් වලට අනුව 2018-4-18, 2019-4-19, 2019-4-20 සහ 1019-4-21 දිනවල මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය ගැවසුන ස්ථානයන් සහ විශේෂයෙන් ම ඔහු කිංග්ස්බරි හෝටලයේ දී සිදුවූ සිද්ධිය නිසා මියගොස් ඇති බව මැනවින් සනාථ වී ඇත. විශේෂයෙන් පැ.13 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ තිබී "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සීසීටීවී දර්ශන අතුරින් පැ.13(26) සීසීටීවී දර්ශනයේ තිරයේ දිස්වන දිනය සහ වේලාව අනුව 2019.04.21 පැය 08:44 ට කැප් තොප්පියක් පැළඳගෙන කරේ බෑග් එකක් සහ අතේ

කුඩා බෑගයක් සහිතව කිංග්ස්බරි හෝටලයේ විදුලි සෝපානයෙන් ඔහු පිටතට පැමිණෙන ආකාරය සහ ඔහු සිටින ආකාරය පැ.834, පැ.835, පැ.836 සහ පැ.861 ලෙස සලකුණු කරන ලද ඡායාරූපලින් මනාව දිස් වේ.

කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි.

මෙම පිපිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලෙන් මුලින් ම සාක්ෂි මෙහෙයවීම සිදු කර ඇත්තේ 2024-1-23 දින වේ. මුලින් ම පැ.සා. 862 කංකානම් අප්පුහාමිලාගේ වැලේරියන් රුක්මාල් පාලිත නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා එඩේරමුල්ල, වත්තල, ප්‍රදේශයේ පදිංචිව සිටින බවත් තමා හෝටල් කළමණාකරන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු බවත් තමා ඩුබායි රටේ එක්සත් අරාබි රාජධානියකදී එම රටේම ද්විතීය අධ්‍යාපනය ලබා මැලේසියාවට ගොස් එහිදීද අධ්‍යාපන කටයුතු සිදු කර 2016 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි බවත් ඉන්පසු තමා කොළඹ කිංග්ස්බරි හෝටලයෙහි පිළිගැනීමේ කවුන්ටරයේ සේවයට බැඳුණු බවත් එහිදි තමාට පැවරී තිබූ කාර්යය වන්නේ අමුත්තන් හෝටලයට පැමිණෙන විට ඇතුළු වීම සම්බන්ධයෙන් දත්ත ඇතුළත් කිරීම සහ මුදල් භාර ගැනීමේ කටයුතු සිදු කර එම අමුත්තන්ව රැගෙන යාම සහ ඔවුන්ට අදාළ වාර්තා පිළියෙල කිරීම බවත් එම කාලයේ මයික්‍රෝ ඔපෙරා නැමති පරිගණක පද්ධතියක් තමාලාගේ හෝටලයෙහි පරිගණක මෘදුකාංගය ලෙස තිබුණු බවත් හෝටලයෙහි කාමර වෙන් කරවා ගැනීම සඳහා පමණක් වෙනම

අංශයක් තිබෙන බවත් තමා විසින් සිදු කළේ හෝටලයට ඇතුල් වන අමුත්තන් පිළිගැනීම සහ ඔවුන් හෝටලයට ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.17 වන දින තමා විසින් අමුත්තන්ගේ කාමර වෙන් කිරීමක් සිදු කරන ලද බවත් පවසා එලෙස කාමර වෙන් කිරීමකට අදාළ ලේඛනයක් පැ.70 ලෙස ලකුණු කර ඇති අතර එයට අදාළ තහවුරු කිරීමේ අංකය 3371373 බවත් එහි සඳහන් නම අබ්දුල්ලා අබ්දුල්ලා ලෙස සඳහන්ව ඇති බවත් එනම් කාමරය වෙන් කරගන්නා ලද තැනැත්තාගේ නම එය බවත් එම තැනැත්තාගේ දුරකථන අංකය 077-92077-30 බවත් එම තැනැත්තා පිරිමි පුද්ගලයෙක් බවත් එම පුද්ගලයා හෝටලයට නැවතීමට පැමිණෙන දිනය 2019.04.20 දිනය බවත් පැ.70 අනුව හෝටලය වෙන් කර ගැනීම කළේ එක දවසකට පමණක් බවත් ඒ අනුව පැ.70 ලේඛනයේ වැලේරියන් ලෙස තමාගේ නම සඳහන් කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඒ සඳහා තමා විසින් රු.17, 500/ ක අත්තිකාරම් මුදලක් ලබා ගත් බවට පවසා එය සනාථ කරන එනම් මුදල සඳහන් ලේඛනය සාක්ෂිකරු හඳුනාගෙන පැ.71 ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.13 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියක වාදනය කර පෙන්වා ඇති අතර එහි කිංග්ස්බරි

හෝටලයේ පිළිගැනීමේ කවුන්ටරයේ තිබෙන ලොබි කොටස සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති අතර 2019.04.17 වන දිනට අදාළ එම CCTV දර්ශනවල තමා සිටින බව සහ එසේම, නිශාර් නැමැති කැෂියර් නිලධාරියෙක්ද අජිත් නැමැති අධීක්ෂණ නිලධාරියෙක්ද සිටින බවත් තමා ඉදිරියේ අමුත්තන්ද සිටින බවට පවසා එසේම, ආධුනික පුහුණුවන නිලධාරියෙක් වන අසේල නැමැත්තාද එම දර්ශනයේ සිටින බවත් තමා ඉදිරියේ සිටි අමුත්තා පැය 14.06 ට කැෂියර් එකේදී මුදල් ලබා දෙන ආකාරය එම දර්ශනයෙන් පෙන්නුම් කරන බවත් සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනාගෙන තමා අත්තිකාරම් මුදලට අදාළ රිසිට් පත එම තැනැත්තාට දුන් ආකාරයද CCTV දර්ශනයේ පෙන්නුම් කරන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තවදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ කිංග්ස්බරි හෝටලයෙහි සිද්ධියක් සිදුවූ දින තමා දුම් පානය සඳහා වෙන් කර තිබුණු ස්ථානයේ සිටි බවත් එය තිබුණේ හෝටලයේ පිටුපස බවටත් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 13 වන චූදිත වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනිකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. 13 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී සඳහන් කළ පරිදි අප්‍රේල් 17 වන දින මෙම සාක්ෂිකරු එළියට පැමිණ හෝටලයේ කාමරයක් තුළ අබ්දුල්ලා නැමැත්තාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට මෙම

සාක්ෂිකරු කටයුතු කළ බවත් එලෙස එම අවස්ථාවේදී එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත්‍රය අනුව තමා කරුණු තහවුරු කරගෙන එම ජාතික හැඳුනුම්පතෙහි විස්තර කාමර වෙන් කිරීමේ දත්ත ඇතුළත් පද්ධතියට ඇතුළත් කළ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.70 ලේඛනය සාක්ෂිකරුට පෙන්වා හරස් ප්‍රශ්න අසා ඇති අතර එය පරීක්ෂා කර බලා සාක්ෂිකරු පිළිගෙන ඇත්තේ තමා එහි අදාළ තැනැත්තාගේ මුල් නම හා අග නම ඇතුළත් කර තිබෙන බවත් ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය ඇතුළත් කර නැති බවත් දුරකථන අංකය පමණක් ඇතුළත් කර ඇති බවයි.

13 චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු විසින් පැ.76 දරන බිල්පත නිකුත් කරන ලද අවස්ථාවේදී කාමරය බුක් කරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය තහවුරු කරගන්න විස්තර කිසිවක් බිල්පතට ඇතුළත් කර නොමැති බව වන අතර එය ඇත්ත වෙන්න පුළුවන් බවට සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහුට සිංහල භාෂාව තේරුම් ගැනීමට හැකියාවක් නැති බවට ඔහු පවසා ඇතද ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන් බවත් එම ප්‍රකාශය සිංහල භාෂාවෙන් ලියා තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට එම ප්‍රකාශය තවත් පුද්ගලයෙකු විසින් එය පරිවර්තනය කරන ලද බවයි.

විත්තියෙන් දිගින් දිගටම මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී පැ.71 ලේඛනයද පෙන්වා දෙමින් එහිද කිසිදු ස්ථානයක මෙම සාක්ෂිකරු විසින් අදාළ කාමරය බුක් කරන ලද අමුත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය එම ලේඛනයේද සඳහන් කර නැති බව යෝජනා කර ඇති අතර සාක්ෂිකරු එය පිළිගෙන ඇත. එසේම, 13 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මුස්ලිම් සමාජය තුළ අබ්දුල්ලා යන නම සඳහන් ඕනෑ තරම් පුද්ගලයන් සිටින බවට වන අතර සාක්ෂිකරු එය පිළිගෙන ඇත.

මෙම පැ.සා.862 කංකානම් අප්පුහාමිලාගේ වැලේරියන් රුක්මාල් පාලිත යන සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් මෙම සාක්ෂිකරු විසින් කිංග්ස්බරි හෝටලයේ අමුත්තන් හෝටලයට ඇතුළත් කර ගැනීම සඳහා කාමර වෙන් කිරීම් ඇතුළු ක්‍රියාවලිය සිදු කරන අවස්ථාවේදී එහි ප්‍රධාන නිලධාරීයෙකු ලෙස කටයුතු කර ඇතත්, එසේම 2019.04.17 වන දින කාමරයක් බුක් කර ගැනීම සඳහා පැමිණි පුද්ගලයා විසින් මෙම සාක්ෂිකරුට එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත්‍රය පවා ලබා දී තිබුණද මෙම සාක්ෂිකරු විසින් එම තැනැත්තාගේ ලිපිනය හෝ ජාතික හැඳුනුම්පත් අංකය හෝ පැ.70 ලේඛනයට හෝ පැ.71 ලේඛනයට ඇතුළත් කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැති බවයි. හුදෙක් මෙම සාක්ෂිකරු සිදු කර ඇත්තේ එම පුද්ගලයාගේ නම අබ්දුල්ලා අබ්දුල්ලා යැයි පමණක් සඳහන් කර ඇති බව

වන අතර සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලදී පවසා ඇත්තේ එම පුද්ගලයාගේ නමෙහි මුල සහ අග කොටස පමණක් එලෙස ඇතුළත් කර තිබෙන බවයි. ඒ අනුව මෙම සාක්ෂිකරු එදින හෝටලයට පැමිණි අදාළ අමුත්තාගේ විස්තර පැ.70 සහ පැ.71 ලේඛනවල සඳහන් කිරීමේදී නිසි උද්‍යෝගකින් කටයුතු කර නොමැති තැනැත්තෙකු බව පෙනී යයි. කෙසේ වෙතත් පැ.70 සහ පැ.71 දරන ලේඛන මඟින් සැබැවින්ම 2019.04.17 වන දින ජංගම දුරකථන අංක 077-92077-30 ට අදාළව ජංගම දුරකථන අංකය ලබා දුන් අබ්දුල්ලා අබ්දුල්ලා නැමැත්තා විසින් 2019.04.20 දිනට එනම් එක් දිනයකට පමණක් කාමරයක් වෙන් කරවාගෙන ඇති කරුණ සහ ඒ සඳහා තහවුරු කිරීමේ අංක 3371373 නිකුත් කර තිබූ බවට පමණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලි වන අතර මෙම සාක්ෂිකරු විසින් පවසා සිටි අදාළ කාමරය වෙන් කරවා ගත් අබ්දුල්ලා අබ්දුල්ලා නැමැත්තා කවරෙක්ද එසේම, ඔහු විසින් ලබා දුන්නා යැයි පවසන ජංගම දුරකථන අංක 077-9207730 දරන ජංගම දුරකථනය සැබැවින්ම එම අබ්දුල්ලා අබ්දුල්ලා නැමැත්තාගේ ජංගම දුරකථනය වන්නේ ද යන්න සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ කරුණු තහවුරු කිරීම සිදු කළ යුත්තේ මෙම නඩුවෙහි පැමිණිල්ල විසින්ම වේ.

පැ.සා.868 තොටගමුව පතිරනලාගේ අසේල හසිත බණ්ඩාර යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා හෝටල් කළමණාකරන ඩිප්ලෝමා හදාරන බවත් හෝටල් කළමණාකරය සම්බන්ධයෙන් පශ්චාත් උපාධියද

හදාරන බවත් පවසා ඇති අතර අධිකරණයේ සාක්ෂි ලබා දුන් අවස්ථාව වන විට ඔහු ෂැංග්‍රිලා හෝටලයේ සේවය කරන බවත් එයට ප්‍රථමයෙන් ඔහු කිංග්ස්බරි හෝටලයේ අවුරුදු 2 ½ ක් සේවය කළ බවත් එහිදී ෆ්‍රන්ට් ඔෆිස් ඒජන්ට් කෙනෙක් ලෙස සේවය කිරීම සඳහා පුහුණුවීම් ලද බවත් පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.13 ලෙස ලකුණු කර ඇති කිංග්ස්බරි හෝටලයට අදාළ CCTV දර්ශන අඩංගු වීඩියෝ දර්ශනයක් පෙන්වා දුන් අවස්ථාවේදී සාක්ෂිකරු එහි දිස්වන්නේ කිංග්ස්බරි හෝටලයේ රිසෙප්ෂන් එක බවට හඳුනාගෙන ඇත.

එය 2019.04.20 දින පැය 19.31 ට අදාළ වීඩියෝවක් බවත් එම වීඩියෝ දර්ශනයේ තමාද සිටින බවත් එම වීඩියෝ දර්ශනයේ පෙන්නුම් කරන කවුන්ටරයෙහි තමා සමඟ සේවය කළ අනිත් නිලධාරීන්ද සිටින බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ හෝටලයට කාමරයක නවාතැන් ගන්න පුද්ගලයා පැමිණි පසු නම සහ රෙසවේෂන් එකක් තිබෙනවා දැයි බලන බවත් රෙසවේෂන් එකේ අංකයද බලන බවත් එම පුද්ගලයා ලංකාවේ කෙනෙක් නම් ජාතික හැඳුනුම්පත පරීක්ෂා කර බලන බවත් විදේශ රටක පුද්ගලයෙකු නම් විදේශ ගමන් බලපත්‍රය පරීක්ෂා කර බලන බවත් එසේම, එම පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ලබා ගැනීමටද කටයුතු කරන බවත් එම පුද්ගලයාගෙන් යම් විද්‍යුත් ලේඛනයකට අත්සන් ලබා ගැනීමක්ද කරන බවත් සාක්ෂිකරු පවසා ඇත.

වීඩියෝ දර්ශනය තවදුරටත් නරඹමින් අදාළ අමුත්තා විසින් හැඳුනුම්පතක් ඉදිරිපත් කරන ආකාරය සහ නැවතත් එම ලේඛනය එම තැනැත්තාට භාර දෙන ආකාරය සහ එම අවස්ථාවේදී එම අමුත්තා විසින් රෙසවේෂන් කාඩ් එක අත්සන් කරන ආකාරය පෙන්නුම් කරන බවත් හෝටලයෙහි නවතින්න එන සෑම පුද්ගලයෙක්ම එම ලේඛනයේ අත්සන් කළ යුතු බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරුට කිංග්ස්බරි හෝටලයට අදාළ එවන් රෙජිස්ටර් කාඩ් එකක් පෙන්වා පැ.73 ලෙස ලකුණු කර ඇති අතර එසේම, පැ.13 දරන වීඩියෝ පටයේ සිටින අමුත්තාගේ නම අබ්දුල්ලා අබ්දුල්ලා බවත් එහි දිනය ලෙස 2019.04.20 ලෙස සඳහන් කර ඇති බවත් පැ.73 ලෙස ලකුණු කරන ලද ලේඛනය සහන් නැමැති නිලධාරීයා විසින් සකස් කළ බවට එහි සඳහනක් වන බවත් පැ.13 වීඩියෝ දර්ශනයෙහි සිටින අමුත්තා විසින් කවුන්ටරයේ සිටි සුපවයිසර්වරයාට මුදල් ලබා දීම දර්ශනයක්ද තිබෙන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එම තැනැත්තාගේ හැඳුනුම්පතේ පිටපත දැක්කොත් හඳුනාගන්න පුළුවන් යැයි පවසා සාක්ෂිකරුට හැඳුනුම්පතක පිටපතක් පෙන්වා එය පැ.74 ලෙස ලකුණු කර ඇති අතර එම පැ.74 ලේඛනයට අනුව අදාළ අමුත්තා පැමිණි වේලාව පැය 19.38 බවත් ඇඩ්වාන්ස් මුදල රු.7500/ ක් බවත් එම තැනැත්තා වෙකින් වෙන වේලාවේ රුපියල් 7309.22 ක් ගෙවා

තිබෙන බවත් එම අමුත්තා සම්බන්ධයෙන් තමාට පුද්ගලික දැනීමක් නොමැති බවත් සාක්ෂිකරු සාක්ෂියේදී පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද 13 වන චූදිත වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති අතර අනිකුත් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුට පැ.73 ලේඛනය පෙන්වමින් එහි සඳහන් නම අබ්දුල්ලා අබ්දුල්ලා බවට සාක්ෂිකරු පවසා ඇතද එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත පරික්ෂා කිරීමක් කළද එම ජාතික හැඳුනුම්පතේ පිටපතක් මෙම සාක්ෂිකරු භාරයේ නොමැති බවට පිළිගෙන ඇත.

තමා විසින් එම අවස්ථාවේදී පරික්ෂා කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් තමාට පෙන්වා සිටියද හඳුනාගන්න බැරි බවත් තමා විසින් පරික්ෂා කරපු ජාතික හැඳුනුම්පතේ තිබුණු නමද තමාට මතකයේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාට පෙන්වා දෙන ලද බිලේ තිබෙන අබ්දුල්ලා කියන නම ජාතික හැඳුනුම්පතේ තිබෙන නමද යන්න මට මේ අවස්ථාවේදී පැවසීමට නොහැකි බවට සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම පැ.සා.868 තොටගමුව පතිරනලාගේ අසේල හසිත බණ්ඩාර යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පෙනී යන කරුණක් වන්නේ ද 2019.04.20 දිනද අබ්දුල්ලා අබ්දුල්ලා නැමැති නමක් සඳහන් අමුත්තෙකු විසින් පැය 19.31 ට කිංග්ස්බරි හෝටලයට ඇතුළු වී පැය 19.38 ට එම

තැනැත්තා හෝටලයට ඇතුළු වූ වේලාව සඳහන් පැ.74 දරන ලේඛනයට අනුව සඳහන් කරමින් පැ.13 දරන වීඩියෝ දර්ශනයෙහි එම තැනැත්තා සිටින බවට හඳුනා ගැනීම පමණක් සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව පැ.13 CCTV දර්ශනවලට අදාළ වීඩියෝ පටයට අදාළව 2019.04.20 දින සවස 7.30 ට පසු වේලාවක කිංග්ස්බරි හෝටලයෙහි අබ්දුල්ලා අබ්දුල්ලා යැයි නමක් සඳහන් කරමින් පැ.13 වීඩියෝ පටයෙහි පෙන්නුම් කරන පුද්ගලයා පැ.73 සහ 74 දරන ලේඛන ප්‍රකාරව සැබැවින්ම එදින එනම් 2019.04.20 දින රාත්‍රියේ නවාතැන් ගෙන තිබෙන බවට කරුණු අධිකරණය ඉදිරියේ සනාථ වී ඇත.කෙසේ වෙතත් අප විසින් පෙරද සඳහන් කරන ලද පරිදි ඉහත කී අබ්දුල්ලා අබ්දුල්ලා යන නමින් සඳහන් පුද්ගලයා සහ පැ.73 පැ.74 ලෙස ලේඛනවල සඳහන් පුද්ගලයා එකම පුද්ගලයෙක් වන්නේද 2019.04.20 දින පැය 19.38 ට හෝටලයට ඇතුළු වී ඇති එදින රාත්‍රියේ හෝටලයේ නැවතී සිට ඇති පුද්ගලයා සැබැවින්ම කුමන නමකින් යුතු කවර පුද්ගලයෙක්ද යන්න සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ඉදිරිපත් වී තිබේද? යන්න සළකා බැලිය යුතුය.

පැ.සා.870 අටානි නිකිත පතිරණගේ රංජිත් කුමාරසිරි නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු කිංග්ස්බරි හෝටලයෙහි වසර 16 ක් තිස්සේ සේවය කරන බවත් ඔහු එම හෝටලයේ හවුස් කීපින් එනම් ගෘහ කළමණාකරන අංශයේ සේවය කරන ලද බවත් තමා 2019 වසර වනවිට එම හෝටලයේ මිනිබාර් අංශයේ සේවය කළ බවත් ඒ සඳහා තමා

හෝටලයේ සියලුම කාමරවලට යාම සිදු කළ බවත් හෝටලයේ සියලුම තට්ටු CCTV කැමරා මඟින් ආවරණය වන බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.13 ලෙස ලකුණු කර ඇති CCTV වීඩියෝ දර්ශනයක් පැ.13 (6) ලෙස මෙම සාක්ෂිකරුට පෙන්වා ලකුණු කර ඇති අතර එය මඟින් හෝටලයෙහි 08 වන තට්ටුවේ ලිෆ්ට් එක තිබෙන ස්ථානය පෙන්වන බවත් එයට අදාළ දිනය 2019.04.20 බවත් වේලාව පැය 19.41 බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එම දර්ශනයෙහි පුද්ගලයන් දෙදෙනෙකු පෙන්නුම් කරන බවත් එම වීඩියෝ දර්ශනයේ සිටින පුද්ගලයා තමා සමඟ එදින කතා කළ බවත් තමා මිනි බාර් එක ලොක් කරන්න ඉදිරියට යන විට මෙම තැනැත්තා ඉදිරියට එනවිට තමා එම තැනැත්තාගෙන් කාමර අංකය ඇසූ බවත් ඉන් පසු තමා කාමරය පෙන්වා සිටි බවත් තමා විසින් පෙන්වපු කාමරයේ කාමර අංකය 819 බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

පැ.සා.2197 කළුතර වෙදගේ එන්ස්ටස් ජයේන්ද්‍ර ෆොන්සේකා යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2010 වසරේ සිට හේලීස් ෆෙන්ටන්ස් ආයතනයෙහි සේවය කරන බවත් එම ආයතනය මඟින් CCTV පද්ධති ස්ථාපනය කර නඩත්තු කිරීම් කරන බවත් තම ආයතනයෙන් කොළඹ කිංග්ස්බරි හෝටලයට CCTV පද්ධතිය ස්ථාපනය කර නඩත්තු කිරීම්

කරන ලද බවත් 2019 අප්‍රේල් මාසය වනවිටත් එලෙසම CCTV පද්ධතියට අදාළ සේවා සපයමින් තිබූ බවත් පවසා ඇත.

2019.04.21 වන දින කිංග්ස්බරි හෝටලයෙහි බෝම්බ පිපිරීමක් සම්බන්ධයෙන් තමාට එස්.එම්.එස් පණිවිඩයකින් දැන ගන්නට ලැබුණු පසු තමා එදින උදේ වරුවේ කිංග්ස්බරි හෝටලයට ගිය බවත් පිපිරීමෙන් සිදු වීමෙන් පසුව CCTV පද්ධතිය ක්‍රියා විරහිත වෙලා තිබුණු බවත් ගිනි ගැනීමක් සිදුවේවි යන හේතුව මත විදුලියද විසන්ධි කර තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම CCTV පද්ධතිය යලි යථාවත් කිරීමට තමාගේ ඉංජිනේරුවකු වන නිලංග කුමාර යන අයට හැකියාවක් ලැබුණු බවත් පවසා ඇත. එසේම, අදාළ CCTV පද්ධතියේ එනම් කිංග්ස්බරි හෝටලයේ තිබෙන කැමරාවලට අදාළව දිනයක් සහ වේලාවක් සඳහන් වන බවත් එය ප්‍රෝග්‍රෑම් එකකින් කර රෙකෝඩින් සර්වර් එකට ඇතුළත් කර තිබෙන බවත් දර්ශනවල තිබෙන වේලාව ශ්‍රී ලංකාවේ සම්මත වේලාව බවත් එම දර්ශනවල තිබුණු වේලාව සහ සම්මත වේලාව අතර වෙනත් කිසිදු වෙනසක් තිබුණේ නැති බවත් තමා ගොස් CCTV පද්ධතිය නැවත පණගැන්වූ පසුව දර්ශන නැරඹීමේදී හා ඒවා නරඹන විටත් එහි වේලාව නියමිත පරිදි සම්මත වේලාව ලෙස තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලිවන්නේ බෝම්බ පිපිරීමට ලක් වී ඇති කොළඹ කිංග්ස්බරි හෝටලයට අදාළ CCTV පද්ධතිය ස්ථාපනය කර එහි නඩත්තු කිරීම් සිදුකර ඇත්තේ මෙම සාක්ෂිකරු සේවය කරන ලද හේලීස් ෆෙන්ටන්ස් ආයතනය මඟින් වේ. එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා ඇති පරිදි අදාළ CCTV දර්ශනවල සඳහන් වේලාවන් ශ්‍රී ලංකාවේ සම්මත වේලාවන් බවටද කරුණු ඉදිරිපත් කර ඇත.

පැ.සා.906 ගීමුණි ලක්මාල් ද සිල්වා යන සාක්ෂිකරු වසර 13 ක් තිස්සේ කිංග්ස්බරි හෝටලයේ සේවය කරන බවත් 2019 අප්‍රේල් මාසය වනවිට තමා විධායක නිලධාරියෙකු වශයෙන් සේවය කළ බවත් 2019 අප්‍රේල් මාසය වන විට තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ලෙස එනම් මූල්‍ය කළමණාකරු ලෙස හේරත් බණ්ඩාර නැමැති නිලධාරියා සේවය කළ බවත් එම නිලධාරියා 2021 වසරේ මාලදිවයිනට ගොස් ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 අප්‍රේල් මාසය වනවිට විධායක නිලධාරියෙකු ලෙස තමා හෝටලයේ බැංකු ගිණුම් කටයුතු සිදු කරන ලද බවත් පවසා ඇති අතර 2019.04.21 වන දින හෝටලයේ බෝම්බ පිපිරීමක් සිදු වුණ බවත් එදින තමා සේවයට වාර්තා කළ දිනයක් නොවන බවත් සාක්ෂිකරු පවසා ඇති

අතර එම බෝම්බ පිපිරීමෙන් හෝටලයට වුණ අලාභ හානි සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කරන ලද බවත් එයට අදාළ අලාභ හානිය තක්සේරු කළේ නිරෝෂන් නැමැති පුද්ගලයෙකු බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අදාළ අලාභ හානි පිළිබඳ වාර්තාව රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා ලබා දීමක් කළ බවත් පවසා තමාගේ සාමාන්‍ය රාජකාරි කටයුතු අතරතුර තමා සඳහන් කරන ලද මූල්‍ය කළමණාකාර හේරත් බණ්ඩාර මහතාගේ අත්සන හඳුනන බවට පවසා ඇති සාක්ෂිකරු පැ.125 ලෙස ලකුණු කර ඇති පිටු 59 කින් සමන්විත ලේඛනයක ඇති අත්සනක් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම පැ.125 දරන තක්සේරු වාර්තාවේ දැක්වෙන කරුණු ප්‍රකාරව කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමෙන් සිදු වූ හානිය සහ එහි වටිනාකම කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හබ නොකරන බවට පැවසීම මත එම කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇති අතර කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවටද සඳහන් කර ඇත. ඒ අනුව පැ.125 දරන තක්සේරු වාර්තාව කිසිදු විවාදයකින් තොරව අධිකරණය ඉදිරියේ සාක්ෂියක් ලෙස ඉදිරිපත් වී ඇත.ඒ අනුව එම වාර්තාවෙහි සඳහන් කරුණු අධිකරණයේ සැලකිල්ලට ගැනීමට කිසිදු නෛතික බාධාවක් නැත.මෙම බෝම්බ පිපිරීමෙන් සිදු වූ හානිය සහ එහි වටිනාකම දැක්වෙන වාර්තාවක් පැ.125 ලෙස ලකුණු කර ඇති පිටු 59කින් සමන්විත ලේඛනයක් වන අතර මෙම පැ.125 දරන

වාර්තාවේ දැක්වෙන කරුණු ප්‍රකාරව කිංග්ස්බරි හෝටලයට මෙම බෝම්බ පිපිරීමෙන් සිදු වූ හානිය සහ එහි වටිනාකම කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හඹ නොකරන බවට පැවසීම මත එම කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇති අතර කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවටද සඳහන් කර ඇත. ඒ අනුව එම වර්තාව හඹ කිරීමකින් තොරව පිළිගෙන ඇති බැවින් එකී වාර්තාවට අනුව 2019-4-21 දින සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් කිංග්ස්බරි හෝටලයට සිදු වී ඇති හානිය සහ එහි මුළු වටිනාකම රු 300, 749, 415.29 ක් වේ

පැ.සා.873 දිසාපති ලේකම්ලාගේ සඳුන් මධුශංක ලක්මාල් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019 වසර වනවිට ඔහු ලාෆ්ස් ආයතනයේ සුපර් මාර්කට් එකේ ස්ථිර සේවකයෙකු ලෙස සේවය කරන ලද බවට පවසා සාක්ෂි ලබා දී ඇති අතර ලාෆ්ස් ආයතනයට අදාළ CCTV දර්ශන පටයක් පැ.75 ලෙස ලකුණු කර අධිකරණය ඉදිරියේ වාදනය කර ඇති අතර එයට අදාළ දිනය 2019.04.20 ලෙස සටහන් වී ඇති බවත් එම CCTV වීඩියෝ දර්ශනයේ පැය 21.24.23 ට මෙම සාක්ෂිකරු තමා කැෂියර් එකේ බිල් කරමින් සිටින බවත් තමා ආසන්නයේ කතීෂ් වැනි නමකින් යුතු සේවකයෙකුද සිටි බවත් එවිට වේලාව පැය 21.27 බවත් යම් පාරිභෝගිකයෙකු තමාගෙන් භාණ්ඩ මිලදී ගන්නවා ඉන් පෙන්නුම් කරන බවත් ඔහු තමාගෙන් රෙඩ්බුල් ඩ්‍රින්ක් එක ගැන ඇසූ බවට තමාට මතක

බවත් එම පුද්ගලයාව තමා එදිනට පෙර දැක ඇති පුද්ගලයෙකු නොවන බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවදුරටත් CCTV දර්ශනය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එම තමාගෙන් රෙඩ්බුල් එකක් ගැන විමසූ පුද්ගලයා ලාෆ්ස් ආයතනයෙන් පිටතට පිටවී යන විට ආයතනය තුළ සිට බෑග් එකක් අරගෙන යන ආකාරය එම දර්ශනයෙන් පෙනෙන බව සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

පැ.සා.873 දිසාපති ලේකම්ලාගේ සඳුන් මධුශංක ලක්මාල් යන සාක්ෂිකරුගේ සාක්ෂියේ දී පවසා ඇති පරිදි ඔහු සේවය කල ලාෆ්ස් ආයතනයේ දී 2019.04.20 පැය 21.24.23 ට මෙම සාක්ෂිකරුගෙන් රෙඩ්බුල් ඩ්‍රින්ක් එක ගැන ඇසූ පුද්ගලයාව තමා එදිනට පෙර දැක ඇති පුද්ගලයෙකු නොවන බවත් සාක්ෂිකරු පවසා ඇති බැවින් ඔහුගේ සාක්ෂියෙහි ප්‍රබල සාක්ෂිමය වටිනාකමක් නොමැති බව පෙනී යයි.

පැ.සා.928 තුවාන් සෆ්රාස් ග්‍රහම්මන් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 2019.04.18 වන දින විවාහ වුණ බවත් එම විවාහයෙන් පසු තමාලා කිංග්ස්බරි හෝටලයේ තුන්වන මහලේ හෝ 4 වන මහලේ දවස් තුනක් කාමරයක නවාතැන් ගෙන සිටි බවත් 2019.04.20 දින බොරලැස්ගමුවේ කින්රෝස් නැමති රිසෙප්ෂන් හෝල් එකේ විවාහ

උත්සවය පවත්වා තමාලා කිංග්ස්බරි හෝටලයට පැමිණි බවත් 2019.04.21 වන දින උදේ කිංග්ස්බරි හෝටලයේ බ්‍රවුන්ෂෝ නැමැති ආපන ශාලාවෙන් උදේ ආහාරය ගැනීම සඳහා උදෑසන 8.30 ට පමණ තමා සහ බිරිඳ එම ආපන ශාලාවට ගිය බවට පවසා ඇත.

එදිනට අදාළ CCTV දර්ශනයන් නරඹමින් එම අවස්ථාවේදී හෝටලයෙහි හාබර් කෝට් එකේ තමාලා කෑම ගනිමින් සිටි අවස්ථාවේදී එම 2019.04.21 පැය 08.40.25 ට අදාළ දර්ශනවල තමා සහ බිරිඳ සිටින ආකාරය සහ එදින තමාලා ඇඳ සිටි ඇඳුම් පැළඳුම්වලින් ද හඳුනාගෙන තමාලා වාඩි වී සිටි ස්ථානයන්ද හඳුනාගෙන ඇති අතර එම CCTV දර්ශනවලට අනුව පැය 8.45.02 ට බැක්පැක් එකක් දාගත් කැප් එකක් පැළඳ ගෙන සිටි අතේ යමක් තබා ගෙන සිටි පුද්ගලයෙකු ඇතුළු වෙනවා දිස් වෙන බවත් ඔහුගේ අතේ ජූස් එකක් තිබෙන බව පෙනෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර අදාළ පිපිරීම සිදු වුණ වේලාව තමාට නිශ්චිතව මතක නැති බවත් එම පිපිරීමෙන් තමාගේ කකුල් පොඩ්ඩක් සිරීමක් පමණක් සිදු වුණ බවත් බිරිඳට සහ තමාට වෙනත් තුවාල කිසිවක් සිදු වුනේ නැති බවත් පසුව තමාලා ජාතික රෝහලට රැගෙන ගිය බවත් තමාලාගේ කන් ඇහෙන්නේ නැතිව තිබූ බවත් තමාලා ඒ සම්බන්ධයෙන් පෞද්ගලික අංශයෙන් ප්‍රතිකාර ලබා ගත් බවත් තමාලා ජාතික රෝහලෙන් ටිකට් කපාගෙන ගොස් පෞද්ගලික ප්‍රතිකාර ලබා ගත් බවටත් පවසා ඇත.

මෙම සාක්ෂිකරු විසින් ඔහුගේ බිරිඳ සහ ඔහු සිටින CCTV දර්ශන හඳුනාගෙන ඇති අතර එම දර්ශනය පැ.13 (08) ලෙස ලකුණු කර ඇති අතර මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත.

මෙම පැ.සා.928 තුවාන් සෆ්රාස් ග්‍රහම්මන් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය තුළින්ද පෙනී යන්නේ 2019.04.21 වන දින පෙරවරු 8.47 ආසන්න වේලාව තුළ කිංග්ස්බරි හෝටලය තුළ හාබර් කෝට් නැමැති අවන්හල තිබෙන ස්ථානයෙහි බෝම්බ පිපිරීමක් සැබැවින්ම සිදු වී ඇති බවට කරුණු හෙලිවන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී සඳහන් කර සිටි පරිදි බැක් පැක් එකක් පැළඳ අතේ ෂූස් එකක්ද තබා ගෙන එම ස්ථානයට ඇතුළු වී සිටි ඇති තැනැත්තා කවරෙක්ද යන්න සම්බන්ධයෙන් කරුණු කිසිවක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් එම තැනැත්තාගේ අනන්‍යතාවය කුමක්ද යන්න සම්බන්ධයෙන් සාක්ෂි හෙලි නොවන අතර කෙසේ වුවත් ඉහත පරිදි වාර්තා කර ඇති පිළිගැනීම් තුළින් පැ.13 (08) දරන CCTV දර්ශනයෙහි වීඩියෝවෙහි සිටින එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් කරුණු හෙලි වේ.

පැ.සා.891 රණතුංග ආරච්චිලාගේ සමන් කුමාර රණතුංග නැමැති සාක්ෂිකරු කිංග්ස්බරි හෝටලයෙහි ෂිෆ්ට් ඉංජිනියර්වරයෙකු ලෙස කටයුතු කරන බවත් එම හෝටලය තමා වසර 10 ක් තිස්සේ සේවය කරන බවත්

එම හෝටලයේ කාමර තට්ටු මහල් 10 කින් යුතු කාමර 239 ක් තිබෙන හෝටලයක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර 2019 අප්‍රේල් මාසයේ කිංග්ස්බරි හෝටලය තුළ බෝම්බ පිපිරීමක් සිදුවුණ බවත් එම හෝටලයට අදාළ ප්ලෑන් තුනක් තමා විසින් 2019.04.22 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් බවට පවසා සාක්ෂිකරු විසින් අදාළ ප්ලෑන් පැ.76, පැ.77, ලෙස ලකුණු කිරීම් කර ඇති අතර එම පැ.76 දරන ලේඛනයෙහි තමා බෝම්බය පිපිරුණු ස්ථානය ඉංග්‍රීසි E අකුරින් සලකුණු කර තිබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එසේම, පැ.76 දරන ප්ලෑන් එක හාබර් කෝට් නමින් හැඳින්වෙන ස්ථානය බවත් එම කාලයේ එය මල්ටි කුෂින් නමින් හඳුන්වා තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම පැ.77 දරන ලේඛනයෙහි 08 වන තට්ටුවේ කාමර අංක 819 තමා විසින් ඉංග්‍රීසි F අකුරින් සටහන් කර තිබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ද ලබා දුන් බවට සඳහන් කර ඇත.

මෙම පැ.සා.891 රණතුංග ආරච්චිලාගේ සමන් කුමාර රණතුංග යන සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. හුදෙක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කිංග්ස්බරි හෝටලයෙහි පිහිටීම සම්බන්ධයෙන් සහ එයට අදාළ සැලැස්ම සම්බන්ධයෙන් කරුණු හෙළිවන අතර විශේෂයෙන් හාබර්

කෝට් යැයි සඳහන් කරන ලද රෙස්ටුරන්ට් එක එනම් ආපන ශාලාව තිබූ ස්ථානය කවර ස්ථානයක්ද එසේම, බෝම්බය පිපිරුණු ස්ථානය කුමක්ද යන්න සම්බන්ධයෙන් පමණක් එම ලේඛනය එනම් ප්ලෑන් එක තුළින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙලි වේ. කෙසේ වෙතත් 2019.04.21 දින කිංග්ස්බරි හෝටලය තුළ හාබර් කෝට් නැමැති ස්ථානයේදී බෝම්බය පිපිරී ඇති බව පමණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලි වේ.

පැ.සා.876 නාගහමුල්ල කංකානම්ගේ ප්‍රසාද් ඉන්දික කරුණාරත්න යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2019 වසරේ කිංග්ස්බරි හෝටලයට අනුයුක්තව එහි හාබර් කෝට් නැමැති අවන්හලෙහි සුපර්වයිසර් කෙනෙක් විදියට රාජකාරී කරන ලද බවත් එම අවන්හලෙහි 2019 අප්‍රේල් මාසය වනවිට සේවයකයන් 23 ක් 25 ක් පමණ සේවය කරන ලද බවත් සාක්ෂිකරු පවසා ඇති අතර හාබර් කෝට් නැමැති ආපන ශාලාව එනම් භෝජනාගාරය අසල ප්‍රේස්ට්‍රි ෂොප් එකක්ද තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර හාබර් කෝට් අවන්හලේ 2019 වසර වනවිට පුද්ගලයන් 80 කට 82 කට පමණ ඉඩ තිබුණු බවත් එහි පුටු 235 කට වැඩිය පුටු දැමිය හැකි බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර එම හාබර් කෝට් භෝජනාගාරයට අදාළ CCTV කැමරා තිබුණු බවටද සාක්ෂිකරු පවසා ඇති අතර 2019.04.21 දින උදේ තමා සේවයට වාර්තා කළ බවත් එදින 100 කට වැඩි ප්‍රමාණයක් උදෑසන කෑම ගන්නට පැමිණි බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ හාබර් කෝට් භෝජනාගාරයේ 2019.04.21 වන දින උදෑසන 8.41 ට පමණ විදේශිකයන් රාශියක් ද ශ්‍රී ලාංකිකයන්ගෙන් මුස්ලිම් ජාතික කපල් එකක් සිටි බවත් තවත් අම්මා සහ දුවෙක් සිටි බවත් පවසා ඇති අතර, එදින අවහන්හල තුළ බෝම්බය පිපිරුනේ උදෑසන 08.45 ට මෙන් මතක බවත් එම බෝම්බය පිපිරුනේ ජූස් කවුන්ටරය ඉදිරියේ බවත් ඒ අසල තිබෙන මේසයේ අංකය 71 හෝ අංක 72 ලෙස තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, උදෑසන 08.45:04 ට ට්‍රැවලින් බෑග් එකක් උරහිසේ එල්ලා ගත් අතේ යමක් තබා ගෙන සිටින පුද්ගලයෙකු කැෂියර් කවුන්ටරය ඉදිරිපිට බුෆේ එකේ ජූස් කවුන්ටරය ඉදිරිපිට සිටින ආකාරය වීඩියෝ දර්ශනය තුළින් සාක්ෂිකරු පෙන්වා දෙමින් එම තැනැත්තා රෙස්ටුරන්ට් එකේ හරි මැදට ගොස් වටයක් කැරකී ආපසු පැමිණ හෝටලයේ සේවකයෙකුට කථා කරන ලද බව පෙනෙන බවත් එම අමුත්තා ජූස් කවුන්ටරයෙන් ජූස් එකක් ලබා ගත් බවත් එවිට වේලාව උදෑසන 08:46:27 බවත් එම අවස්ථාව වන විට කැසිනෝ ක්‍රීඩාව සඳහා පැමිණෙන ඉන්දීයන් ජාතියකන් දෙදෙනෙකුට ද බෝම්බ පිපිරීම නිසා තුවාල සිදුවුණු බවත් එක් අයෙකුට බරපතල ලෙස තුවාල සිදුවුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, ජූස් බාර් එක තිබෙන ස්ථානයේ ඉදිරිපිට පෘතුගීසි ජාතිකයෙකු සිටින බවත් ඔහු සහ ඔහුගේ බිරිඳ මධුසමය ගත කිරීම සඳහා හෝටලයට පැමිණි අය

බවත් එම තැනැත්තා ද මෙම බෝම්බ පිපිරීම නිසා ජීවිතක්ෂයට පත් වූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

වැඩිදුරටත් CCTV දර්ශන රූප රාමු නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ මෙම වීඩියෝ දර්ශනවල හෝටලයෙහි සේවකයන් පිරිසක් ද සිටින ආකාරයට පෙනෙන බවත් ඉන් හෝටලයෙහි සේවය කළ ක්‍රිෂ්මන් ජයවර්ධන නැමති සේවකයා එහි සිටින බවත් ඔහු ද මෙම පිපිරීම නිසා මිය ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. උදෑසන 08:47:06 ට පමණ CCTV වීඩියෝ දර්ශනය නරඹමින් සාක්ෂිකරු එම අවස්ථාවේ දී බෝම්බ පිපිරීම සිදු වුණ බවත් එම බෝම්බය පිපිරෙන විට තමා සිටියේ වම් අත පැත්තේ ඇතුල් වීමේ දොරටුව ඉදිරිපිට බවත් තමාට ද එම අවස්ථාවේ දී ගැහුවා වගේ රිදීමක් සිදු වුණ බවත් ඔළුවේ සිරීමක් සිදුවුණු බවත් පවසා ඇති අතර, හාබර් කෝට් අවහන්හලේ පිපිරීමෙන් ආහාර ගනිමින් සිටි අමුත්තන් 8 ක් හෝ 9 ක් මිය ගිය බවත් එක් හෝටල් සේවකයෙකු ද මිය ගිය බවත් දළ වශයෙන් 10 කට 20 කට පමණ තුවාල සිදු වුණ බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර, සේවකයන් 8 දෙනෙකුට පමණ බරපතල තුවාල සිදු වුණ බවත් ඔවුන් මාස 7 ක් 8 ක් රෝහල්ගත වී සිටි බවත් ඒ අතරින් දෙදෙනෙකු වන සමිඳු නැමැත්තා සහ බුද්ධික නැමැත්තා එලෙස රෝහල්ගත වී ප්‍රතිකාර ලැබූ අය බවත් ඔවුන් සීනියර් වේටර්ලා බවත් සාක්ෂිකරු පවසා ඇත.

බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසු තමා ද තුවාලකරුවන් රෝහලට යැවීමට උපකාර කළ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ බෑග් එකක් කරේ දමා ගෙන ජූස් බාර් එක තිබෙන ස්ථානයට එදින පැමිණි තැනැත්තාට එදින තමා සුභ උදෑසනක් සර් යැයි ද පැවසූ සහ ආචාර කළ බවත් එලෙස සාමාන්‍යයෙන් තමාලා එම අවන්හලට එන සෑම අයටම ආචාර කිරීම සිදු කරන බවත් සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් Gourmate Station යැයි සඳහන් ආපන ශාලාවෙහි සේවය කළ සේවකයන්ට ද මෙම සිද්ධිය නිසා තුවාල සිදුවුණු බවත් පවසා පැ.13 CCTV වීඩියෝ පටයෙහි එයට අදාළ දර්ශන නරඹා හඳුනා ගෙන ඇති අතර, හෝටලයේ සේවය සඳහා පැමිණි දමිළ ජාතික ගැහැනු ළමයෙකුට ද එම අවස්ථාවේ දී තුවාල සිදු වී ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන් බවටත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

මෙම පැ.සා.876 නාගහමුල්ල කංකානම්ගේ ප්‍රසාද් ඉන්දික කරුණාරත්න යන සාක්ෂිකරුගේ සාක්ෂිය සමස්තයක් ලෙස ගෙන පරික්ෂා කර බැලීමේ දී පෙනී යන කරුණක් වන්නේ 2019.04.21 වන දින කිංග්ස්බරි හෝටලයෙහි හාබර් කෝට් ආපන ශාලාව සහ Gourmate Station යනුවෙන් සඳහන් කොටස තිබෙන ස්ථානයේ 2019.04.21 වන

දින පෙ.ව. 08:45 ට පමණ බෝම්බයක් පිපිරීම සිදුවුණු බවට සහ එම බෝම්බ පිපිරීම තුළින් අවන්හලෙහි එම අවස්ථාවේ දී භෝජන ගැනීමට පැමිණ සිටි පෘතුගීසි ජාතික යුවළක් මිය ගිය බව ද, ඉන්දීය ජාතිකයන් කිහිප දෙනෙකුට ද බරපතල ලෙස තුවාල සිදු වී තවත් පුද්ගලයන් 10 කට පමණ තුවාල සිදු වුණ බවට ද, හෝටල් සේවකයන් කිහිප දෙනෙකුට තුවාල සිදු වුණ බවට ද කරුණු හෙළි වී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ට්‍රැවලින් බෑග් එකක් උරහිසේ එල්ලා ගෙන සැක කටයුතු පුද්ගලයෙකු එදින පෙ.ව.08:45 ට පමණ හාබර් කෝට් අවහන් තුළට ඇතුල් වී එහි තිබෙන ජූස් බාර් එක ලඟට ගොස් ජූස් එකක් ද ලබා ගෙන ඇති බව හෙළි වන අතර එසේම, අදාළ අවස්ථාවේ දී බෝම්බය පිපිරීම සිදු වී ඇති අතර, මෙම සාක්ෂිකරුට එලෙස ට්‍රැවලින් බෑග් එකක් කරේ දමා ගෙන පැමිණි තැනැත්තාව CCTV දර්ශන වලින් දැක අධිකරණයේ සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී හඳුනා ගැනීම විනා එම තැනැත්තාගේ නම හෝ ඔහු කුමන ජාතිකයෙක් ද, ඔහු හෝටලයේ නේවාසිකව සිටි තැනැත්තෙක් ද, බාහිර තැනැත්තෙක් ද යන කිසිදු කරුණක් පිළිබඳව මෙම සාක්ෂිකරුට දැනීමක් නිබී නොමැති බව පෙනී යයි. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ද පැමිණිල්ලෙන් අධිකරණය ඉදිරියේ පෙන්වා දී ඇත්තේ 2019.04.21 දින උදේ වරුවේ 08:45 ට පමණ කිංග්ස්බරි හෝටලයේ හාබර් කෝට් අවන්හල තුළ බෝම්බ පිපිරීමක් සිදු වී පුද්ගලයන් කිහිප දෙනෙක් මිය ගොස් පුද්ගලයන්

ගණනාවකට බරපතල තුවාල සිද්ධ වී ඇති බව වන අතර, කෙසේ වෙතත් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇති ආකාරය අනුව එම බෝම්බ පිපිරීමේ ක්‍රියාව සිදු කර ඇත්තේ අදාළ හෝටලයෙහි අභ්‍යන්තරයෙහි හෝටලය මධ්‍යයට පැමිණ ජූස් බාර් එකක් තිබෙන තැනට ගොස් ජූස් එකක් ද ගත් විශාල ට්‍රැවලින් බෑග් එකක් කරේ දමා ගෙන පැමිණි තැනැත්තා විසින්ම බවට පෙනී යන අතර, එම තැනත්තාගේ අනන්‍යතාවය මෙම නඩුවේ දී ඉහත පරිදි වාර්තා කර ඇති පිළිගැනීම් තුළින් සනාථ වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්නවලට ලක් කිරීමක් කර නොමැති අතර, මෙහි දී මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් මෙම නඩුවෙහි කිසිදු චූදිතයෙකු සම්බන්ධයෙන් කරුණක් හෙළි නොවන බැවින් විත්තිය වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් අසා නොමැති ආකාරය පැහැදිලි වේ.

පැමිණිල්ලෙන් ඊලඟට සාක්ෂි දීම සඳහා කැඳවා ඇත්තේ පැ.සා. 889 අයිවන් ධම්මික තුඩුවේවත්ත නැමැත්තා වන අතර ඔහු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ 2017 අගෝස්තු මස 14 වැනිදා සිට ඔහු කිංග්ස්බරි හෝටලයෙහි ආරක්ෂක අධ්‍යක්ෂක ලෙස සේවය කරන ලද බවයි. තවද ඔහු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ ඔහු එම රැකියාවට යාමට ප්‍රථමයෙන් පොලිස් දෙපාර්තමේන්තුවෙහි සේවය කර නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස විශ්‍රාම ගොස් සිටි බවත් ඔහු පොලිස්

දෙපාර්තමේන්තුවෙහි වසර 40 කට ආසන්න කාලයක් සේවය කළ බවටත් සාක්ෂි ලබා දී ඇත.

2019 අප්‍රේල් මස වන විට කිංග්ස්බරි හෝටලයේ ආරක්ෂක නිලධාරීන් 25 ක් පමණ තමා යටතේ සේවය කළ බවත් එසේම, ආරක්ෂක කළමණාකරු ලෙස කීඩිස් ෂෝ නැමැත්තා සේවය කළ බවත් හෝටලයෙහි ආරක්ෂක නිලධාරීන් පැය 12.00 සේවා මුර දෙක බැගින් සිදු කරන බවත් 2019.04.19 දින වන විට හෝටලයේ ආරක්ෂාව සඳහා සර්ටීස් ලංකා නැමති පෞද්ගලික ආරක්ෂක සමාගමෙන් ද සේවය ලබා ගෙන තිබුණ බවත් එම පෞද්ගලික ආරක්ෂක ආයතනයේ නිලධාරීන් 18 දෙනෙක් පමණ තමාලාගේ ආයතනයෙහි සේවය කළ බවත් එම ආරක්ෂක නිලධාරීන් රථ වාහන ගාලට රථ වාහන ඇතුල් වන ස්ථානයේ දී රථ වාහන හැසිරවීම සිදු කරන බවත් කුණු කසල බැහැර කරන ස්ථානයේ රාජකාරිවලට අමතරව හෝටලයේ එළියේ තිබෙන කොටසේ ද ආරක්ෂාවට සිටි බවත් පවසා ඇත.

2019.04.21 දිනය වන විට ආරක්ෂක නිලධාරීන් 10 දෙනෙක් පමණ සේවය කළ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් තමා කළල්ගොඩ පාර, පන්නිපිටිය ප්‍රදේශයේ සිටි බවත් 2019.04.21 වන දින උදේ තමාට නිවසේ සිටින විට උදෑසන 8.50 ට පමණ තමාට හෝටලයෙහි සේවයකරන ෆර්නැන්ඩු නැමති නිලධාරියා දුරකථනයෙන් අමතා හෝටලයෙහි ඇතුලේ කෑම කන තැන ගෑස් ටැංකියක් පුපුරලා කට්ටියට

තුවාල වෙලා යැයි දැනුම් දුන් බවත් ඒ අවස්ථාවේ දී තුවාලකරුවන් ඉක්මණින් ඉවත් කර, අනෙක් අය ඉවත් කර ගින්නක් තිබෙනවා නම් පැතිරීම වළක්වන්න යැයි තමා උපදෙස් ලබා දී ඉක්මණින් එනවා යැයි පවසා හෝටලයට පැමිණි බවත් තමා හෝටලයට පැමිණෙන විට වේලාව උදේ 09:25 ට පමණ බව, ඒ එන අතරතුරදීම තවත් හෝටල්වලට මෙවැනි සිද්ධීන් සිදු වෙලා තිබෙන බවට තමාට දැන ගන්න ලැබුණු බවත් හෝටලයට පැමිණි පසු තමා අදාළ පිපිරීම සිදු වුණා යැයි පවසන ස්ථානයට යාමට උත්සාහ කළ ද ඒ වන විටත්, පොලිසියේ සහ ගුවන් හමුදාවේ, නාවික හමුදාවේ නිලධාරීන් ඇවිත් තුවාලකරුවන්ව ගෙන යමින් සිටි බවත් ඒ අනුව තමාට ඇතුළට යන්න ලැබුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාගේ අවුරුදු 40 ක පොලිස් සේවයේ අත්දැකීම් අනුව උතුරු නැගෙනහිර ප්‍රදේශවල ද තමා සේවය කර ඇති බවත් ඒ අනුව තමාගේ පළපුරුද්ද හා නිරීක්ෂණයන් අනුව මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් සිදු වී තිබෙන බවට තමාට හැඟී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, හෝටලයේ 2019 වසරේ අප්‍රේල් මාස වන විට CCTV පද්ධතියක් පැවතුන බවත් එය පෙන්ටම්ස් නැමති සමාගමේ එනම් හේලීස් සමූහ ව්‍යාපාරයට අයත් සමාගමක් මගින් ස්ථාපනය කරන ලද CCTV පද්ධතියක් බවත් තමා පැමිණි අවස්ථාවේ දී තමාට CCTV දර්ශන නැරඹීමට හැකියාවක් ලැබුණේ නැති බවත් තමාගේ මතකයේ හැටියට එම කාලයේ CCTV කැමරා 90 ක්

පමණ හෝටලයෙහි ක්‍රියාත්මක වී තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. කෙසේ වෙතත් පෙන්ටම්ස් සමාගමේ නිලධාරීන් පැමිණ CCTV පද්ධතිය යථාවත් කිරීම සිදු කරන ලද බවත් ඒ අනුව සවස 6.00 පමණ වන විට එය යථාවත් කළ බවත් ඉන් පසු තමාට CCTV දර්ශන නැරඹීමට ලැබුන බවත් එම දර්ශන නැරඹීමෙන් පසු තමාට කිංග්ස්බරි හෝටලයෙහි අංක 819 හි නැවතී සිටි තැනැත්තෙකු විසින් මෙම ප්‍රහාරය එල්ල කර ඇති බව දැන ගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවද සාක්ෂිකරු පවසා ඇති පරිදි අදාළ බෝම්බය පිපිරුණ ස්ථානයට අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද පැමිණ පරීක්ෂණ පැවැත් වූ බවත් පවසා ඇති අතර, වැඩිදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ මෙම බෝම්බ පිපිරවීම සිදු වූ කාලය වන විට හෝටලයට පැමිණෙන පුද්ගලයන්ගේ ගමන් මළු පරික්ෂා කිරීමක් සිදු නොවුණ බවත් එම කාලය වන විට රටේ ප්‍රශ්න තිබුණේ නැති නිසා සාමකාමී වාතාවරණයක් තිබුණ නිසා එලෙස පරික්ෂා කිරීමක් අවශ්‍ය වුනේ නැති බවත් පවසා ඇත.

මෙම බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසු ආරක්ෂක ක්‍රියාදාමයන් සම්පූර්ණයෙන් වෙනස්කළ බවත් ඉන් පසු ගමන් මළු පරික්ෂා කිරීම් ආදී සිදු කරන ලද බවත් තාක්ෂණික උපකරණ ද ඒ සඳහා ලබා ගෙන තිබුණ බවත් එවැනි තාක්ෂණික උපකරණ මෙම පිපිරීමේ සිද්ධිය සිදු වූ දිනට

ප්‍රථමයෙන් ලබා ගෙන තිබුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා විසින් කරුණු සොයා බැලීමේ දී අදාළ පිපිරීමට සම්බන්ධ පුද්ගලයා 2019.04.20 දින රාත්‍රී හෝටලයෙහි නවාතැන් ගැනීමට පැමිණ ඇති බවට තමාට දැනගන්නට ලැබුන බවට පවසා පැ.13 (6) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පටයන් නරඹමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

එසේම, කාමර අංක 819 හි නවාතැන් ගැනීමට පැමිණ ඇති තැනැත්තාගේ නම මොහොමඩ් මුබාරක් යැයි තමාට දැන ගන්නට ලැබුන බවත් එසේම, එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් හෝටලයට ඇතුළු වූ කාමරය ලබා දෙන අවස්ථාවේ දී ලබා දී තිබෙන බවට දැන ගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, CCTV දර්ශනවලට අනුව එම තැනැත්තා කාමර අංක 819 ට එදින රාත්‍රී පැය 19.42 ට ගමන් කරන ආකාරය CCTV දර්ශනවල දිස්වෙන බවටත් සාක්ෂිකරු පෙන්වා හඳුනා ගෙන ඇත. 2019.04.20 දින පැය 19.42 ට කාමර අංක 819 හි සිටි තැනැත්තා රාත්‍රී 9.00ට කාමරයෙන් පිට වී යන ආකාරයක් පෙන්නුම් කරන CCTV දර්ශනය මෙම සාක්ෂිකරු මගින් පැ.13 ලෙස ලකුණු කර ඇති අතර, පැ.13 (12) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය අනුව අදාළ සැක කටයුතු තැනැත්තා කාමර අංක 819 ට ඇතුල් වන අවස්ථාවේ දී ඔහු බැක් පැක් එකක් කරේ එල්ලා ගෙන සිටින ආකාරය සහ තවත් බෑග් එකක් අතේ අරගෙන යන ආකාරය නිරීක්ෂණය වන බවට සාක්ෂිකරු අධිකරණයට සාක්ෂි ලබා දී ඇති අතර, එම

තැනැත්තා පසුව කාමරයෙන් එළියට එන විට අතේ ගෙන ගිය බෑග් එක කාමරයෙන් එළියට එන විට බැක් පැක් එකක් විදියට පිටේ දමා ගෙන එනවා පෙනී යන බවත් එම තැනැත්තා කාමරයේ දොර ලොක් කර නැවත එය ඇරෙනවා ද යන්න පරීක්ෂා කරන ආකාරයත් CCTV දර්ශන තුළින් පෙනී යන බවටත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, 2019.04.20 දින පැය 21:02 ට එම පුද්ගලයා 8 වැනි මහලේ කාමරයෙන් එළියට ඇවිත් ජීම් එක පිහිටි ස්ථානයට ආසන්නයේ තිබෙන ලොබි එක දෙසට එන ආකාරයත් පෙනී යන බවත් ඔහු හෝටලයේ ලොබි මේන් එන්ට්‍රන්ස් එකට ගමන් කරන ආකාරයත්, ඉන් පසු පැය 21:05 ට එම තැනැත්තා හෝටලයේ ප්‍රධාන දොරටුවෙන් එළියට ගමන් කරන ආකාරය CCTV දර්ශනවල දිස් වෙන බවට සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. එසේම, එම තැනැත්තා එලෙස හෝටලයෙන් එළියට ගොස් ජනාධිපති මාවත දෙසට ගමන් කරන බවත් එම දර්ශන තුළින් පෙනී යන බවටත් සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. එසේම, තවදුරටත් CCTV දර්ශන අනුව එම සාක්ෂිකරු පවසා ඇත්තේ 2019.04.20 දින පැය 23:48:10 ට තමා පෙර හඳුනා ගත් කාමර අංක 819 හි සිට හෝටලයෙන් පිටතට ගිය තැනැත්තා ත්‍රීවිල් එකකින් පැමිණ පාරේ ලංකා බැංකුව පැත්තෙන් බැස පාර පැන හෝටලයට පැමිණෙන බවත් එම අවස්ථාවේ දී ඔහු සන්තකයේ පෙර හෝටලයෙන් යන විට රැගෙන ගිය බෑගය නොව වෙනත් බෑග් එකක්

තිබෙන ආකාරය ද තමා CCTV දර්ශන වලින් නිරීක්ෂණය කරන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එලෙස හෝටලයට ඇතුළු වූ එම තැනැත්තා හෝටලයට ඇතුළු වී ලිෆ්ට් එකට ඇතුළු වන බවත් ඉන් පසුව 8 වන මහලට ඔහු ගමන් කරන බවත් ඉන් පසු පැය 23.51 ට පමණ ඔහු ලිෆ්ට් එකෙන් බැස 8 වන මහලෙහි තිබෙන ඔහු සිටි කාමරය ඇතුළට ගමන් කරන බව පෙනී යන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, CCTV දර්ශන තවදුරටත් නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ 2019 අප්‍රේල් 21 වන දින උදේ 08.43.09 ට පෙර කී පුද්ගලයා ඔහු සිටි කාමරයෙන් එළියට එන බවත් කාමරයෙන් එළියට එන විට බෑග් එකක් කරේ එල්ලාගෙන එන බවත් සාක්ෂිකරු හඳුනාගෙන අතර, එම බෑගය ඊට පෙරදින රාත්‍රී ඔහු කාමරයට එනකොට ඔහු අතේ අරන් ආ බෑග් එක බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. බිම් මහලේ තිබෙන හාර්බ කෝට් රෙස්ටොරන්ට් එකට අදාළ CCTV දර්ශන නරඹමින් 2019.04.21 පැය 08.46.20 ට පෙර කී තැනැත්තා හාබර් කෝට් එකට මෙහා පැත්තේ තිබුණු ග්‍රිල් එකේ තිබුණු වීදුරු කඩාගෙන වැටෙන ආකාරය පෙනී යන බවත් සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර එසේම, පැය. 8.47 ට CCTV දර්ශන අනුව මේන් එන්ට්‍රන්ස් එකේ දොර ගැලවී වැටෙන ආකාරයක් පෙනෙන බවත් පැය. 8.56 දර්ශනවලට අනුව තුවාලකරුවන් රෝහලට රැගෙන යන දර්ශන CCTV දර්ශන තිබෙන බවත් සාක්ෂිකරු CCTV දර්ශන තුළින් නරඹා අධිකරණයට ඒ ආශ්‍රයෙන් සාක්ෂි ලබා දී

ඇත. එසේම, පැය 9.43 ටඅදාළ CCTV දර්ශනවලට අනුව ආරක්ෂක අංශයේ සහකාර කළමණාකාර ක්‍රීක් ෂෝ නමැත්තා එම දර්ශන වල සිටින බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තමා මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන් බවත් සාක්ෂිකරු තම සාක්ෂියේදී පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 2, 9, 23, 4, 15, සහ 13 චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, අනෙකුත් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැත. හරස් ප්‍රශ්න වලදි විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ හෝටලයට පැමිණෙන ඕනෑ තරම් පුද්ගලයන් බැක් පැක් අරන් යන එන බවත් එක් පුද්ගලයෙක් පමණක් බැක් පැක් එකක් අරන් යන එක තමාට විශේෂ දෙයක් නොවන බවත් ය. එසේම, 2019.04.21 වන දින පාස්කු ඉරිදා දිනයේ කිංග්ස්බරි හෝටලයේ විශේෂ ඉවෙන්ට් එකක් පවත්වනවා යැයි සැලසුම් කර තිබුණේ නැති බවත් අනෙකුත් ඉරිදා දිනවලට කරන ක්‍රියා පටිපාටියෙන් එදිනටත් ක්‍රියාත්මක කරන බව එසේම, සාක්ෂිකරුට විත්තියෙන් යෝජනා කර ඇත්තේ 2019.04.21 දින වන විට ආරක්ෂක අංශයෙන් ඉතා අඩු පිරිසක් හෝටලයේ ආකරක්ෂාව සඳහා යොදා ගෙන තිබෙන බවට යෝජනා කලද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත.

එසේම, මෙම සාක්ෂිකරු අදාළ සිද්ධිය සිදුවූ බෝම්බ පිපිරීම සිදු වුණ වෙලාවේ හෝටලයේද නොසිටි තැනැත්තෙකු බවත් ඔහු නොදුටු සිද්ධියක් සම්බන්ධයෙන් සාක්ෂි දෙන බවට විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත. එසේම, මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 2019.04.21 දින හෝටලයෙහි ආරක්ෂාව සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙන බවට කිසියම්ම හෝ තොරතුරක් ලැබී තිබුණේ නැති බවත් එදින තමා සේවයට වාර්තා කිරීමක්ද කල නැති බවත් ය.

එසේම, සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ සාමාන්‍යයෙන් තමා සෑම ඉරිදා දිනයකම නිවාඩු ලබා ගැනීමද කරන බවට පවසා ඇත.

මෙම පැ.සා.889 අයිවන් ධම්මික තුඩුවේවත්ත නමැති හෝටලයෙහි ආරක්ෂක අධ්‍යක්ෂකවරයාගේ සාක්ෂිය තුළින් පෙනී යන කරුණක් නම් 2019.04.21 කිංග්ස්බරි හෝටලය තුළ බෝම්බය පුපුරණ අවස්ථාව වන විට ඔහු එදින නිවාඩු ලබා නිවසේ සිට ඇති බව වන අතර ඔහු විසින් මෙම අධිකරණයේදී එදිනට අදාළ හෝටලයේ CCTV දර්ශන නැරඹීම සිදු කර ඒ ආශ්‍රයෙන් සාක්ෂි ලබා දී ඇත. හුදෙක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළි වන්නේද එදින හෝටලයෙහි හාබර් කෝට් අවන්හල තුළ බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බව වේ. එසේම, මෙම සාක්ෂිකරු වසර 40 කට අධික කාලයක් පොලිස් සේවයේ නිරතව සිට ඇති තැනැත්තෙකු බවට ලබා දී ඇති සාක්ෂිය තුළින් හා මරාගෙන මැරෙන බෝම්බ පිපිරීමක් හා සම්බන්ධ

සිද්ධීන් පිළිබඳ ඔහුට එවැනි සිදුවීම් වලට මුහුණ පා අත්දැකීම් ලබා තිබෙන නිලධාරීයෙකු බවට පවසා ඇති පසුබිම තුළ සැබැවින්ම හෝටලය තුළ එවැනි මාරගෙන මැරෙන බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බවට පමණක් කරුණු කිව්වද එම බෝම්බ පිපිරීම සිදු කල පුද්ගලයා කවරෙක්ද යන්න පිළිබඳ නිශ්චිතව සාක්ෂියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉදිරිපත් වී නොමැත.

මෙම සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී කිංග්ස්බරි හෝටලයේ කාමර අංක 819 නමැති කාමරයේ සිටි පසුව නම දැනගත් මොහොමඩ් මුබාරක් යන තැනැත්තා මෙම සිද්ධියට සම්බන්ධ බවට කරුණු පවසා ඇතද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ තුළින් ඔහු එම පුද්ගලයා ගේ නම මොහොමඩ් මුබාරක් බවට දැන ගත් ආකාරය පිළිබඳ සාක්ෂි මෙහයවීමක් කර නොමැති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහු හෝටලයට ඇතුල් වෙන අවස්ථාවේ එනම් කාමරය වෙන් කර ගත් අවස්ථාවේ ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය එම ස්ථානයට භාර දි ඇති බවට දැන ගැනීමට ලැබුණු බව පමණි. කෙසේ වෙතත් මෙම සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දී පවසා ඇති පරිදි, මෙම සාක්ෂිකරුට අදාළ තැනැත්තාගේ සැබෑ නම මොහොමඩ් මුබාරක් යැයි පෞද්ගලිකව දැනීමක් තිබී නැති අතර, හුදෙක් ඔහුද එම කරුණ ඔහුට දැනගැනීමට ලැබුණු කරුණක් පමණක් බව හෙළිවේ. හෝටලයෙහි බෝම්බ පිපිරීමක් සිදු වීම විනා එය සැබැවින්ම සිදු කලේ කවර තැනැත්තෙකු ද යන්න ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සාක්ෂියක් මෙම

සාක්ෂිකරුගෙන් අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී නැත. ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා ඇත්තේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් මෙලෙස සිදුවී ඇති බව වේ.

මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා. 896 නඩරාජා ඩිලංග ආනන්ද කුමාර නමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු හේලිස් පෙන්ටන්ස් ආයතනයෙහි අවුරුදු 10 ක් තිස්සේ සේවය කරන බවත් එහි ඉංජිනේරුවරයෙකු ලෙස CCTV සිස්ටම්, ඇක්සස් කොන්ට්‍රෝල් පීඒ සිස්ටම්, කොන්ෆරන්ස් සිස්ටම් යනාදි කාර්යන් සඳහා සේවා සැපයීම කරන බවත් පවසා ඇති අතර, තම ආයතනයෙන් කොළඹ කිංගස්බරි හෝටලයේ CCTV පද්ධතිය ස්ථාපිත කර එය නඩත්තු කිරීමද තම ආයතනයෙන් කළ බවත් පවසා ඇත.

2019 අප්‍රේල් මාසය වන විට අදාළ CCTV කැමරා පද්ධතියේ CCTV කැමරා අනු ගණනක් පමණ සවිකර තිබෙන බවත් එම කැමරා අනූ ගණනට අදාළ දර්ශන බේස්මන්ට් එකේ, සර්වියර් රූම් එකේ, සිස්ටම් එකේ තැන්පත් වී තිබුණ බවත් 2019 අප්‍රේල් මාසය වන විට මේ සර්වේ එකේ හාඩ් ඩිස්ක් 08ක් පමණ තිබුණ බවත් එම සර්වේ රූම් එක වසා තිබෙන කාමරයක් බවත් එහි ආරක්ෂාව හෝටලයේ ආරක්ෂක අංශයෙන් සිදු කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එහි නඩත්තු කිරීම සිදු කර ඇත්තේ තමන්ලා එම ආයතනයට ගොස් බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 අප්‍රේල් 21 කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීම සිදු වූ දිනම CCTV දර්ශන ලබා ගැනීමේ අවශ්‍යතාවයක් සහ ඒ වන විට CCTV පද්ධතිය සම්පූර්ණයෙන්ම බිඳවැටිලා තිබුණ නිසා එය යාවත්කාලීන කිරීම සඳහා තමා පැය 10, 11 පමණ උදේ වරුවේ ගිය බවත් තමගේ ප්‍රධානියා වන සුදේශ් නමැත්තාද තමා සමඟ ගිය බවත් තමන්ලා හෝටලයට ගියද පොලිස් නිලධාරීන් එය අදාළ ස්ථානය අපරාධ ස්ථානයක් බවට පත් කර තිබූ බවත් තමාලාට ඒ තුළට යාමට බැරි වුණ බවත් කෙසේ වෙතත් තමාලා නිසි පරිදි අවසර ලබා ගෙන CCTV පද්ධතිය තිබෙන ස්ථානයට ගොස් එය යථාවත් කිරීමට කටයුතු කරන ලද බවත් ඒ සඳහා පැයක් පැය 1 ½ ක කාලයක් ගතවූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාලා එදින සවස් වන තුරුම සවස 7, 8 පමණ වන තුරු අදාළ හෝටලයේ රැඳි සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එම කාලයේ එම හෝටලයේ ආරක්ෂක කටයුතු බාරව ධම්මික තුඩුගේ නමැති නිලධාරියා සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාලා විසින් අදාළ CCTV පද්ධතියේ කැමරා පටිගත වී තිබුණු දර්ශන උකහා ගත් බවත් තමාගේ මතකයේ හැටියට එම සිදුවීම සිදුවෙච්ච දිනයට දවස් 6 ක් හෝ 7 ක් ආපස්සට අදාළ දත්ත තමාලට උකහා ගැනීමට හැකි වූ බවත් එම CCTV දර්ශන රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හාඩ් ඩිස්ක් එකකට දමා භාරදීමක් සිදු කල බවත් අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමාගෙන්ද ප්‍රකාශක් සටහන් කර ගත් බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරුට නිසි පරිදි මුද්‍රා තබා තිබූ දෘඩ තැටියක් පෙන්වා ඇති අතර එය පැ.78 ලෙස ලකුණු කර ඇත. එහි සඳහන් සීරියල් අංකය තමා විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ලබා දුන් සීරියල් අංකය බවත් එසේම, බීවීආර් යන්ත්‍රයේ ගබඩා වී තිබූ CCTV දර්ශන පටිගත වී තිබුණු බවත් ඒවා වල වේලාවක් සහ දිනයක් සටහන් වී තිබුණ බවත් ඒවා තුළින් එම අවස්ථාවේ රටේ පවතින වේලාව එම අවස්ථාවේ පවතින වේලාව අතර වෙනසක් තමා නිරීක්ෂණය කරේ නැති බවත් පවසා ඇති අතර එම සාක්ෂිකරුගෙන්ද චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළි වන කරුණ වන්නේ 2019.04.21 වන දින වන විට කොළඹ කිංගස්බරි හෝටලය තුළ මෙම සාක්ෂිකරු සේවය කල හේලිස් පෙන්ටන්ස් ආයතනය මඟින් CCTV කැමරා පද්ධතියක් සවිකර ඇති බව සහ බෝම්බය පිපිරූ දිනයේ මෙම සාක්ෂිකරු ඇතුළු නිලධාරීන් එම බෝම්බ පිපිරුණු ස්ථානයට ගොස් අදාළ CCTV පද්ධතියේ තැන්පත්වී තිබූ දත්තයන් උකහා ගෙන දෘඩ තැටියකට දමා ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විධිමත්ව භාර දීම සිදු කර ඇති බව හෙළි වේ. කෙසේ වෙතත් මෙම සාක්ෂිකරු අදාළ බෝම්බය

පිපිරුණ අවස්ථාව වන විට මෙම කිංග්ස්බරි හෝටලයෙහි සේවය කල තැනැත්තෙකු නොවන අතර, ඔහු එම හෝටලයට ගොස් ඇත්තේ බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව CCTV දර්ශන ලබා ගැනීම සඳහා පමණක් බව අධිකරණයේදී කරුණු සනාථ වේ.

මෙම සාක්ෂිකරුගෙ සාක්ෂිය මඟින් මෙම නඩුවේ චූදිතයන් සම්බන්ධයෙන් හෝ මෙම කිංග්ස්බරි හෝටලය තුළ බෝම්බ පිපිරීමට දායක වූ පාර්ශවයන් කවරෙක්ද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකයක් ඉදිරිපත් වී නැත. අදාළ CCTV දර්ශන අඩංගු දෘඩ තැටිය පැ.79 මඟින් මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 13 වන චූදිත වෙනුවෙන් පමණක් වන අතර අනිකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. 13 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න වලට ලක් වීමෙන්ද සාක්ෂිකරු 13 චූදිත වෙනුවෙන් අසා ඇත්තේ CCTV දර්ශන වල තිබෙන දර්ශන වෙනස් කිරීමේ හැකියාවක් විශේෂඥයෙකුට තිබෙනවාද යන්න වන අතර සාක්ෂිකරු එයට පිළිතුරු දෙමින් විශේෂඥයෙකුට හැකියාවක් තිබෙන බවට පවසා ඇත.

පැ.සා. 902 දමින්ද අජිත් ජයවර්ධන නමැති සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඔහු කිංග්බරි හෝටලයෙහි ඉදිරිපස අංශයේ අධ්‍යක්ෂ හැටියට කටයුතු කරන බවත් 2013 වර්ෂයේ සිට තමා කිංග්ස්බරි

හෝටලයේ සේවය කරන බවත් 2019 වසරේ කාමර අංශයේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කල බවත් පවසා හෝටලයෙහි පුද්ගලයන් කාමර වෙන්කරවා ගැනීමට පැමිණීමේදි එයට අදාළ දත්ත ෆ්‍රන්ට් ඩෙස්ක් තිබෙන ස්ථානයේ සිදු කරන ආකාරය පිළිබඳව සාක්ෂිකරු විස්තරාත්මකව අධිකරණයට කරුණු දක්වා ඇති අතර එසේම, මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.70 ලෙස ලකුණු කර ඇති කිංග්ස්බරි හෝටලයට අදාළ ගෙස්ට් සිස්ටම් එකේ දත්ත සටහන හඳුනාගෙන ඇති අතර රෙජිස්ට්‍රේෂන් කාඩ් එකක් බව එහි ඉන්හවුස් ඩීටේල්ස් තිබෙන බව සාක්ෂිකරු පවසා ඇති අතර එම ලේඛනයට අදාළ දත්ත ඇතුළත් කර තිබෙන්නේ වැලේමියන් නමැති පුද්ගයෙක් විසින් බවයි එම නිලධාරීයා තමා රාජකාරි මට්ටමින් හඳුනන නිලධාරීයෙකු බව සාක්ෂිකරු පවසා ඇත.

පැ.70 සහ පැ.71 යන ලේඛන දෙකම මෙම සාක්ෂිකරුට පරීක්ෂාව සඳහා ලබා දී ඇති අතර, එම ලේඛන දෙකම එකම පුද්ගලයෙකුට අදාළ බවත් එම පැ.71 දරන ලේඛනය යටින් 2022.07.20 දින තමා විසින් අත්සනක් යොදා තිබූ බවත් සාක්ෂිකරු එය හඳුනාගෙන පවසා ඇත. මෙම සාක්ෂිකරුට පැ.80 ලෙස ලකුණු කරමින් ලේඛනයක් පෙන්වා ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ එම පැ.80 දරන ලේඛනයේ පැ.70 සහ පැ.71 දරන ලේඛන අතර යම් සම්බන්ධයක් පවතින බවත් එම පැ.80 දරන ලේඛනයේ පාස්පෝට්, එන්.අයි.සී යැයි සඳහන් දෙකක් තිබෙන බවත් සිස්ටම් එක පරීක්ෂා කර බැලීමේදී එහි යම් විස්තර අංක ඇතුළත් කර ඇතද

සිස්ටම් එකෙන් පෙන්වා දෙන්නේ අන්තිම අංක 2 පමණක් බවත් එය අයි.ටී ආරක්ෂාව නිසා අන්තිම අංක දෙක පමණක් පෙන්වන සිදුවන බවත් පවසා ඇත. එනම් ගෙස්ට්ලාගේ ආරක්ෂාව සඳහා මෙම දත්ත සැම කෙනාටම නොපෙනන ආකරයෙන් එලෙස පවත්වාගෙන යන බවත් සඳහන් කර ඇත.

පැ.80 ලේඛනයෙහි අදාළ පුද්ගලයාගේ උපන්දිනය ජංගම දුරකථන අංකය සඳහන් වෙන බවත් සඳහන් කර ඇත. සාක්ෂිකරුට පැ.සා.81 ලෙස පෙන්වා ලකුණු කර ඇති අතර එහි 2020.07.22 දින තමා විසින් අත්සන් කර තිබෙන බවත් එය කාමර අංක 819 භාවිතා කළ පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් බවට තමා විසින් තමාගේ අත් අකුරෙන් සටහනක් දමා තිබෙන බවත් එම පුද්ගලයාගේ නම මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් බවත් එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය තමා 87340312V ලෙස සඳහන් කර ඇති බවත් එය පැ.80 ලේඛනයේ අන්තිම ඉලක්කම් දෙක සමඟ ගැලපෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.71 ලෙස සඳහන් කර ඇති ගෙස්ට් රෙජිස්ට්‍රේෂන් කාඩ් නමැති ලේඛනය සාක්ෂිකරුට පෙන්වා දී ඇති අතර එම ලේඛනයෙහි හෝටලයට චෙකින් වෙච්ච පුද්ගලයා විසින් අත්සනක් තබා තිබෙන බවත් එයට ගෙස්ට් ඉන්ෆොමේෂන් නම්බර් ලෙසට 3371373 යන අංකය වෙන් වී ඇති බවත් 2020.07.22 ලෙස එම ලේඛනයෙහි තමා විසින් අත්සන් කර තිබෙන බවත්

සාක්ෂිකරු පවසා ඇති අතර තමා එම අත්සන් තබා එම ලේඛන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන් බවත් පවසා තමා විසින් එම ලේඛන ඔපෙරා සිස්ටම් එකෙන් ලබා ගෙන බාරදුන් ලේඛන බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.81 දරන ලේඛනය විශාලන කාචයක් මඟින් පරික්ෂා කර බලමින් එහි අංක තමා විසින් ලිවීමේදි 87334031 යැයි ලියා තිබෙන බවත් එහි අවසාන අංක 312 වී යැයි සටහන් කර තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.82 ලෙස මෙම සාක්ෂිකරු විසින් ලේඛනයක් ලකුණු කර ඇත. එම ලේඛනයේ හේලිස් ආයතනයේ චෙයාමන්ගේ මුද්‍රාව තබා තිබෙන බවත් එහි මොහාන් පණ්ඩිත නමැති චෙයාමන්ගේ අත්සන තිබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර මෙම ලේඛනයෙහි මියගිය පුද්ගලයන් හා රෝහලට ගිය පුද්ගලයන්ගේ නම් සටහන් නම් ලැයිස්තුවක් බවත් එනම් හෝටලයේ අමුත්තන්ගේ තොරතුරු බවත් සාක්ෂිකරු පවසා ඇත. එම ලේඛනය විත්තිය විසින් හඹ නොකරන බවට පවසා සිටින බව එනම් පැ.82 ලේඛනය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ හඹ නොකළ පිළිගත් කරුණක් ලෙස වාර්තා කර ඇත.

පැ.82 ලේඛනයට අනුව හෝටලයේ රැඳී සිටි අමුත්තන් අතරින් මියගිය 9 දෙනෙක්ගේ විස්තර සඳහන් වන බවත් 415 කාමරයෙහි ලූකස් රුවී නමැති පෘතුගීසි ජාතිකයෙකු සිට ඇති බව 615 නමැති කාමරයේ

ඇල්බට්රෝ ෂාවේස් මරියා ගොන්සාලෙස් වින්සන් යැයි ස්පාඤ්ඤ ජාතිකයන් දෙදෙනෙකු සිට ඇති බවත් 810 නමැති කාමරයේ නාගරාජ් නාමක්‍රිෂ්නප්පා නමැති ඉන්දීය ජාතිකයෙක් 819 අංකය සඳහන් කාමරයේ අබ්දුල්ල අබ්දුල් යැයි ශ්‍රී ලංකන් ජාතිකයෙකු, 304 අංකය සඳහන් කාමරයෙහි වෑන්ලී වේ යන චීන ජතිකයෙකුද, 524 අංකය සඳහන් කාමරයෙහි යීජීඇන් නමැති චීන ජාතිකයෙක්ද අංකය සඳහන් 528 කාමරයෙහි වෑන්වෙන් හියාන් යන චීන ජතිකයාද අංකය සඳහන් 816 කාමරයේ ලීදාබේ නමැති චීන ජාතිකයා සිට ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත.

හෝටලයේ බෝම්බ පිපිරීමෙන් හාර්බර් රෙස්ටොරන්ට් එකේ වේටර්වරයෙකු වන ක්‍රිෂ්මන් ජයවර්ධන අය මියගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. පැ.සා.82 ලේඛනයේ තුවාල ලබා රෝහල් වල සිටින අමුත්තන්ගේ විස්තර ද ඇතුළත් වන බවත් අංක 727 කාමරයෙහි සිටි යුවාන් වොන් ලියැන් යන චීන ජාතිකයාද, 810 අංකය සඳහන් ජයරාම් පුරුෂෝත්තම් යන ඉන්දීය ජාතිකයාද, 714 අංකය සඳහන් චකදිල්ලා වීරසිංහ ද යන ශ්‍රී ලාංකික ජාතිකයාද, 530 අංකය සඳහන් කාමරයෙහි සැන්යනන් සහ සෙන්සින් යන චීන ජාතිකයන් දෙදෙනා ද සිට ඇති බවත් 723 අංකය සඳහන් කාමරයේ දහන් ශෆ්රාස් නමැති ශ්‍රී ලාංකික ජාතිකයා සිටි බවත් 726 අංකය සඳහන් කාමරයේහි යුවාන් කියු කිං, යූවී වැන් යන චීන ජාතිකයන් දෙදෙනා සිට ඇති බවත් ඔවුන් දෙදෙනාම කාන්තාවන්

බවටත් සටහන් වී ඇති බවටත් සාක්ෂිකරු පවසා ඇත. එම ලේඛනයෙහි තම ආයතනයේ වෙයාමන් මොහාන් පණ්ඩිත මහතාගේ නිළ මුද්‍රාව සහ අත්සන තිබෙන බවට පවසා එම ලේඛනයේ පැ.83 ලෙස ලකුණු කර ඇත.

පැ.83 ලෙස ලකුණු කරන ලද ලේඛනය සම්බන්ධයෙන් තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ දෙකක්ද ලබා දුන් බව සාක්ෂිකරු පවසා ඇත. 13 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදි පැ.80 දරන ලේඛනය පෙන්වා දෙමින් එහි එම ජාතික හැඳුනුම්පත යැයි සඳහන් ස්ථානයේ අවසානයේ අවසාන අකුරු 2 V යැයි සටහන් කර ඇති බවත් එම ලේඛනයෙහි අඩංගු විස්තරවලට අනුව එය අබ්දුල්ලා අබ්දුල්ලා යන අයට අයත් බවට පෙනී යන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම දත්තයන් එම ලේඛනයට අතුළත් කර තිබෙන්නේ හෝටලයේ රෙසවේෂන් එක දාපු පිළිගැනීමේ නිලධාරී විසින් බවත් කෙසේ නමුත් කාමරයට ගිහින් තිබෙන්නේ මුබාරක් නමැති පුද්ගලයෙකු බවත් චෙකින් වන විට පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කර ගන්නා බවත් මෙම සිද්ධියට අදාළව චෙකින් වුණ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය 873340312V බවත් එම සාක්ෂිකරුට විත්තියෙන් යෝජනා කර ඇත්තේ ඔහු විසින් 2019.04.21 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශයෙහි 873340316V ලෙස ජාතික හැඳුනුම්පත් අංකය සඳහන්

කර ඇති බවට වන අතර එසේම, පැ.80 ලෙස ලකුණු කර ඇති ලේඛනයේ තිබෙන ජාතික හැඳුනුම්පතේ තිබෙන අංකයෙහි අවසන් අංක 2 ත් මෙම සාක්ෂිකරු විසින් පොලිසියට ලබා දී ඇති ප්‍රකාශයේ සඳහන් වී ඇති අවසන් අංක 2 ත් අතර වෙනසක් තිබෙන බවත් සාක්ෂිකරු පිළිගෙන ඇත. සාක්ෂිකරු පවසා ඇත්තේ තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශක් ලබා දීමේදි තමා විසින් සිදු කලේ අදාළ අංකයන් පවසා සිටීම බවත් එය සටහන් කලේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ පොලිසියේ නිලධාරීයෙකු බවත් තමා අංකය ලබා දුන්නේ පැ.81 ලේඛනය පදනම් කරගෙන බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් අනෙකුත් කිසිදු චුදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැති අතර, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් 2019.04.20 වන දින කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරීමේදි මියගිය පුද්ගලයින් පිළිබඳ විස්තර ඉදිරිපත් වී ඇති අතර එසේම, එදින කාමර අංක 819 වෙන්කර ගෙන ඇති තැනැත්තාගේ නම අබ්දුල්ලා අබ්දුල් යැයි නමක් සඳහන් වුවද පැ.80 ලේඛනයට අනුව එම කාමර අංක 819 ට ඇතුළත් ව කාමරයට ගොස් ඇත්තේ මුබාරක් නැමැත්තෙක් බවට සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව, වෙනත් කෙනෙකුට වෙනත් කෙනෙකු වෙනුවෙන් කාමරයක් බුක් කරන්නට පුළුවන් බව වන අතර, කාමර අංක 819 ට අදාළ එම කාරයට ඇතුල් වීමට කටයුතු කල අනෙක් තැනැත්තාගේ විස්තර සටහන් කර තිබෙන්නේ පිළිගැනීමේ නිලධාරී විසින්

වන අතර, මෙම කරුණ මෙම සාක්ෂිකරු විසින් සිදු කල ක්‍රියාවක් නොවන බව පෙනී යයි.

කෙසේ වෙතත් කිංග්ස්බරි හෝටලයේ කාමර අංක 819 එහි නැවතී සිටි තැනැත්තා ලෙස මෙම කාමරය බුක් කිරීම සිදු කර ඇති අබ්දුල්ලා අබ්දුල්ලා යන පුද්ගලයා සහ මෙම කාමරයට ඇතුල්වීමට පාවිච්චි කර ඇති තැනැත්තාගේ නම මුබාරක් ලෙස සඳහන් වී ඇති අතර ඒ අනුව එනම් මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යැයි නමක් සඳහන් කර ඇති පැ.81 දරන ලේඛනයෙහි මෙම සාක්ෂිකරු අත් අකුරෙන්ම යොදා ඇති සටහනක් වන බැවින් එම මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් සහ පැ.70 සහා පැ.71 දරන ලේඛන වලට අනුව අදාළ රෙසවේෂන් එක කල පුද්ගලයා අබ්දුල්ලා අබ්දුල්ලා යැයි සඳහන් කර ඇති බැවින් සහ කාමර අංක 819 ට සැබැවින්ම ඇතුල් වී ඇති මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන තැනැත්තා සම්බන්ධයෙන් මෙම නඩුවේ වාර්තාකර ඇති පිළිගැනීම් ආශ්‍රයෙන් සළකා බැලිය යුතු වේ.

<u>මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්ට අදාළ පිළිගැනීම්</u>

1. දැනට මියගොස් සිටින මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 873340312V බවත්, එකී ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථ පිටපතක් පැ’81 සහ එහි සූචිපතයේ ඡායාස්ථ පිටපතක් පැ.814 ලෙස ලකුණු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන්

සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

2. පැ.7, පැ.816, පැ.817, පැ.818, පැ.822, පැ.833, පැ.841 සහ පැ.842 යන ලේඛනවල එකී ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් වී ඇති බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

3. දැනට මියගොස් සිටින මොහොමඩ් අසාමී මොහොමඩ් මුබාරක් යන අයගේ නමින් අංක N 6725891 දරන විදේශ ගමන් බලපත්‍රය නිකුත් කර තිබූ බවත්, එය තහවුරු කිරීම සඳහා එකී විදේශ ගමන් බලපත්‍රය සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ පරිගණක දත්ත (Current travel document details report and Passenger Inquiry) වාර්තා පැ. 1192 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

4. දැනට මියගොස් සිටින මොහොමඩ් අසාමී මොහොමඩ් මුබාරක් යන අයගේ රියදුරු බලපත්‍රයේ අංකය A 019214711 බවත්, එකී රියදුරු

බලපත්‍රය සහ එහි පිටපත පිළිවෙලින් පැ.8 සහ පැ.859 ලෙස ලකුණු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

ඉහත පිළිගැනීම් තුළින් ද කිංග්ස්බරි හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදුකර ඇති තැනැත්තා මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් බවට කිසිදු සැකයකින් තොරව ඔහුගේ අනන්‍යතාවය සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී ඇති බව අපහට පෙනී යයි.

<u>පොලිස් සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1729 වික්‍රමගේ මෙත්තානන්ද සාක්ෂි දෙමින්, 2019.04.21 වන දින තමා නිවාඩු ලබා සිටි අතර එදින සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් පසුව සේවයට වාර්තා කළ බවත් පසු දින එනම්, 2019.04.22 වන දින කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරුණු ස්ථානය වන ‘‘හාබර්කෝට්’’ යන ස්ථානයට තමා ගිය බවත් එම ස්ථානය සුන්බුන්, අබලි ද්‍රව්‍ය විසිරී තිබුණු අතර එහි හැකි අයුරින් ඡායාරූප ගත කළ බවත් කියා සිටින ලදී. ඉන් අනතුරුව 2019.04.25 වන දින පැ.18:05ට පමණ නැවතත්

තමා කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරුණු ස්ථානයට ගිය බවත් එම ස්ථානයේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කොටුව පොලිසියේ උප පොලිස් පරීක්ෂක හෙට්ටිආරච්චි මහතා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද සිටි අතර 10 දෙනෙකුගෙන් පමණ පිරිසක් සුන්බුන් ඉවත් කිරීමේ කටයුතුවල යෙදී සිටි බව කියා සිටින ලදී. සුන්බුන් ඉවත් කරන අවස්ථාවේදී යම් ද්‍රව්‍යයක් සොයා ගත හොත් එය විමර්ශන නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලෙසට සුන්බුන් ඉවත් කරන නිලධාරින්ට දැනුම් දී තිබූ බවත් ඒ අනුව පිළිස්සී ගිය හැඳුනුම්පතක්, විදේශ ගමන් බලපත්‍රයක්, ඡායාරූප අලවන ලද කුඩා පොත් දෙකක් සහ කළු පාට මුදල් පසුම්බියක් හමු වූ බවත් එම භාණ්ඩ කොටුව පොලිස්ථානයෙන් පැමිණි සිටි හෙට්ටිආරච්චි නැමති නිලධාරියාට භාරදී තිබූ අතර ඒවා නැවත අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට භාර ගැනීම සඳහා තමාට ස්ථානාධිපති උපුල් මහතාගෙන් නියෝග ලද බැවින් තමා ගොස් එම නඩු භාණ්ඩ කොටුව පොලිසියෙන් භාරගෙන කොළඹ මධ්‍යම අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නඩු භාණ්ඩ භාර ගැනීමේ කුවිතාන්සි 37/2019 ට ඇතුළත් කර ලද බව කියා සිටින ලදී. එකී PR අංක 37/2019 දරන ලේඛනය පැ.1220 ලෙස ලකුණු කරන ලදී. එයට අදාළ නඩු භාණ්ඩ පාර්සලය විවෘත අධිකරණයේ දී සාක්ෂිකරුට පෙන්වන ලද අතර එය සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එකී නඩු භාණ්ඩ පාර්සලයේ පිටත කවරය පැ.1221 වශයෙන් ද එය තුළ තිබී සාක්ෂිකරු විසින් හඳුනාගන්නා

ලද සුදු පැහැති කොලයක ඔතන ලද මදක් පිළිස්සී ගිය හැඳුනුම්පත සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද අතර එම සුදු කොළය පැ.1221(A) ලෙසත් මදක් පිළිස්සී ගිය හැඳුනුම්පත පැ.1221(B) වශයෙන් ද සලකුණු කරන ලදී. එම හැඳුනුම්පතේ අංක 73340312V බවත් එය මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයට අයත් බවත් නඩු භාණ්ඩ පරීක්ෂාකර බලමින් සාක්ෂිකරු කියා සිටින ලදී. මෙම නඩු භාණ්ඩ අපරාධ පරීක්ෂණාගාරය වෙත විධිමත්ව මුද්‍රා තබා භාරදී තිබීමත් ඒවා අධිකරණයට ඉදිරිපත් කරන තුරු වෙනත් කිසි පාර්ශවයකට ප්‍රවේෂයක් නොතිබූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී.

කිසිඳු චිත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් කිංග්ස්බරි හෝටලයේ බෝම්බ පිපිරුණු ස්ථානය වන ‘‘හාබර්කෝට්’’ හි තිබී මරාගෙන මැරුණු බෝම්බකරු වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්ගේ 73340312V දරන හැඳුනුම්පත සොයාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි කිසිඳු ආකාරයකින් විස්වාසනීයත්වයෙන් තොර බවට අපහට පෙනී යන්නේ නැත. එසේම මෙම හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීමක්

සිදුකර ඇත්තේ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් විසින් බවට ඉහතින් ඉදිරිපත් කර ඇති අනෙකුත් සාක්ෂි සහ වාර්තාකර ඇති පිළිගැනීම් තුළින්ද මැනවින් පෙනී යයි.

කිංග්ස්බරි බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව

අධිකරණයේදී ලකුණු කරන ලද පැ. 1478 දරණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අමතරව වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා විසින් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවක් පෙන්වා ඒ සම්බන්ධයෙන් ද සාක්ෂි දුන් සාක්ෂිකරු, එම වාර්තාවෙහි ඇති කරුණු තමා අධ්‍යයනය කළ බවත්, තමාගේ දැනුම සහ පළපුරුද්ද අනුව එම වෛද්‍ය වාර්තාවේ දක්වා තිබෙන කරුණු සමඟ තමා එකඟ වන බවත් කියා සිටිමින්, වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා විසින් සම්පාදනය කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1481 ලෙස සලකුණු කරන ලදී. එම මියගිය පුද්ගලයාගේ අනන්‍යතාවය DNA වාර්තාවක් මගින් සසඳා තහවුරු කරගෙන ඇති බවත්, නියමිත ක්‍රමවේදය යටතේ එම කටයුතු සිදුකර ඇති බවත් කියා සිටින ලදී.

එම වෛද්‍ය වාර්තාවට අනුව පරීක්ෂණය සඳහා ඉතුරු වී තිබෙන ශරීර කොටස් වශයෙන් පිරිමි පුද්ගලයෙකුගේ ගෙලෙහි 6 වන සහ 7 වන කශේරුකා මට්ටමෙන් වෙන්ව ගිය හිසක කොටසක් බවත්, එම හිසෙහි

මුහුණ ප්‍රදේශයේ උඩු රැවුල සහ යටි රැවුල හොඳින් වැවී තිබෙන බවත්, හිස පිටුපස මෘදු පටකවල ගැලවී ගිය ධාරිත තුවාලත්, හිස් කබලේ අස්ථි රේඛීය භග්න ගණනාවකින් යුක්ත බවත්, මොළය විශාල ලෙස ධාරිත තුවාලවලට ලක්වී තිබෙන බවත්, නිකටේ සිට මුහුණේ 10 cmක පමණ ධාරිත තුවාලයක් තිබෙන බවත්, හිසේ දකුණුපැත්තේ 8cmක ධාරිත තුවාලයක් තිබෙන බවත්, මුහුණේ දෙපසම අස්ථි බිඳී ගොස් තිබෙන බවත්, උඩුතල්ලේ අස්ථිය මධ්‍ය ලක්ෂයෙන් බිඳීගොස් තිබෙන බවත්, යටි හනුවේ අස්ථිය මධ්‍ය රේඛාවෙන් බිඳී ගොස් තිබෙන බවටත්, මුඛය ක්‍රියාත්මක වන Temporomandibular Joint දෙපසම අස්ථි භග්න වී තිබෙන බවටත්, ගෙල ආශ්‍රිතව ශ්වාසනාලය, ගලනාලය සහ රුධිරනාල ඉරී සහ මාංශ පේශී ඉරී වෙන් වී තිබෙන බවටත් වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා නිරීක්ෂණය කර ඇති බවත් සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී. මරණයට හේතුව ලෙස Explosive injuries එසේ නැත්නම් පිපිරුම් තුවාල ලෙස සටහන් කර ඇති බවත් මෙය බෝම්බ පිපිරීමක් නිසා සිදු වූ මරණයක් ලෙස පැහැදිලිව කිව හැකි බවත්, එක්ස් කිරණ පරීක්ෂණ අනුව පිපිරීමකින් ද්විතියිකව තැන්පත් වූ යකඩ කොටස් හඳුනාගෙන ඇති අතර හිසෙහි, හිස් කබලේ පතුලට බලයක් යෙදී තිබෙන බවට මේ වාර්තා කියවීමෙන් තමාට පෙනී යන බවත්, ඒ අනුව බෝම්බය ගෙලට පහළ ශරීරයේ ඕනෑම ස්ථානයක ස්පර්ශ වෙමින් තිබිය යුතු බව සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී.

වාර්තාවට අනුව වෛද්‍ය එල්. එම්. ද සිල්වා මහතා විසින්, මොහොමඩ් අසාද් මොහොමද් මුබාරක් යන පුද්ගලයාගේ ශරීර කොටස් මාංෂ පේශි සහ අස්ථි කොටස් ඩී. එන්. ඒ. පරීක්ෂණය සඳහා යොමු කර තිබෙන බවටත්, මෘදු පටක හා නිරාවරණය වූ අස්ථි කොටස් පුපුරන ද්‍රව්‍ය සංසටක හඳුනා ගැනීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත යොමු කර තිබෙන බවත් වාර්තාවේ සඳහන්ව ඇති බවද සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගේ විශේෂඥභාවය සහ නිපුණතාවය අධිකරණය ඉදිරියේ මතයක් ප්‍රකාශ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් හබ කිරීමක් නොමැති අතර චූදිතයින් වෙනුවෙන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් ද සිදු නොකරන ලදී.

<u>විශ්ලේෂණය</u>

පාස්කු ප්‍රහාරයෙන් මියගිය සහ තුවාල ලැබූ පුද්ගලයන්ගේ වෛද්‍ය පරීක්ෂණ සහ මරණ පරීක්ෂණ වාර්තා සකස් කිරීමට මොහු දායක වී ඇත.

මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්ගේ (සහරාන් හසීම්) බිරිඳ සහ දියණියගේ ඩී.එන්.ඒ. (DNA) වාර්තා සමඟ සසඳා අනන්‍යතාවය තහවුරු කරගැනීමෙන් පසු 2019.08.06 දින සහරාන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා ඇත.

සහරාන්ගේ මරණය බෝම්බ පිපිරීමකින් හිස, ගෙල, උදරය සහ පපුවට සිදුවූ බහුවිධ මරණීය තුවාල නිසා සිදුවූවක් බවත්, බෝම්බය ශරීරයට ස්පර්ශ වන මට්ටමේ ඉතා සමීපව තිබී ඇති බවත් සාක්ෂි දුන්නේය.

මීට අමතරව, දැනට විදේශගතව සිටින වෛද්‍ය මලින්ත ද සිල්වා විසින් සකසන ලද, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැති බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව (T-148) සම්බන්ධයෙන්ද මොහු සාක්ෂි ලබා දුන්නේය.

එහිදී මුබාරක්ගේ අනන්‍යතාවය දියණියගේ හා බිරිඳගේ DNA මඟින් තහවුරු කරගෙන තිබූ අතර, මරණයට හේතුව පිපිරුම් තුවාල බවත්, බෝම්බය සහිත බෑගයක් පිටේ රඳවාගෙන සිටීමෙන් මෙවැනි තුවාල සිදුවිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි</u>

2019.04.21 දින ෂැංගිලා හෝටලයේ සිදු වූ ස්වංඝාතක බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි අප විසින් පහතින් විස්තරාත්මකව සම්පිණ්ඩනය කර විශ්ලේෂණය කර ඇත.

ශ්‍රැංගිලා හෝටලයට අදාළ සාක්ෂි මෙහෙයවීම 2023.10.10 දින ආරම්භ කරන ලද අතර සිදු වූ බෝම්බ පිපිරීම් වලට අදාළව ප්‍රථමයෙන්ම සාක්ෂි දීම සඳහා පැමිණිල්ලේ සාක්ෂි අංක 943 නිශංකා හංසමාලි වැලිකල

යන සාක්ෂිකාරිය සාක්ෂියට කැඳවන ලද අතර ඇය තම සාක්ෂියේදී පවසන ලද්දේ ඇය 2017 වසරේ සිට 2020 වසර දක්වා කොළඹ පිහිටි ෂැංග්‍රිලා හෝටලයේ සේවය කරන ලද බවත් මුලින්ම ඇය හවුස් කීපින් අංශයේ මාස 06 ක් සේවය කර ඉන්පසු එම හෝටලයේ ආහාර පාන අංශයෙහි 2018 ඔක්තෝම්බර් සිට රාජකාරී කරන ලද බවත් ඉන්පසු එම හෝටලයෙහි පිහිටි ටේබල් වන් නැමැති අවන්හලෙහි සේවය කරන ලද බවත් එලෙස සේවය කිරීමේදී තමාට නිල් පාට බිලවුස් එකක් සහ කළු පාට ට්‍රවුසර් එකක් නිළ ඇඳුමක් ලෙස ඇද රාජකාරී කිරීමට සිදු වුණ බවත් ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බය පිපිරෙන අවස්ථාව වන විටත් තමා ඇදගෙන සිටියේ එම නිළ ඇඳුමම බවත් ඇය පවසා ඇති අතර බුෆේ රෙස්ටුරන්ට් එකක් වන ටේබල් වන් අවන්හලෙහි සේවය කරන ලද බවත් එදින ඊස්ටර් බ්‍රාන්ච් එක තිබුණු නිසා එයට සූදානම් වීම සඳහා එදිනට පෙර දින රාත්‍රියේ තමා හෝටලයේ නේවාසිකාගාරයේ නැවතී සිටි බවත් තමා ඊස්ටර් බ්‍රාන්ච් එක ලෙස අදහස් කළේ ඊස්ටර් එකට පැමිණෙන අමුත්තන්ට තිබෙන විශේෂ දිවා භෝජනය බවත් ඇය පවසා ඇත.

2021.04.21 දින පාන්දර 06 ට සේවයට වාර්තා කළ බවත් එම ටේබල් අවන්හලෙහි A B C D යැයි කොටස් හතරක් නම් කර එම කොටස් හතරටම වෙන වෙනම ගෙවීම් කවුන්ටර් තිබුණු බවත් එදින ටේබල් වන් අවන්හලට උදෑසන ආහාර ගැනීම සඳහා 50 කට පමණ අධික පිරිසක් පැමිණ සිටි බවත් තමාට පැවරී තිබුණේ අමුත්තන් පැමිණි විට ඔවුන්ගේ

රූම් නම්බර් එක අරගෙන එම අමුත්තන්ව කැඳවා ගෙන ගොස් මේස වල වාඩි කරලීම බවත් අවන්හලට ඇතුළු වීම සඳහා එක දොරක් තිබුණු බවත් එලෙස තමා සහ ප්‍රදීපා නැමැති ගෑණු ළමයෙකු ද අමුත්තන් පිළිගැනීමේ ක්‍රියාව සිදු කරන ලද බවත් ඇය පවසා ඇත. එලෙස තමා සේවය කරමින් සිටියදී උදේ 10.00 ට කලින් මුලින්ම තමා අමුත්තන් දෙදෙනෙකු රැගෙන මුහුදු පැත්තට වෙන්න තිබුණු C සහ D යන අංශ දෙසට ගොස් අමුත්තන්ව වාඩි කරවා සිටි අවස්ථාවේදී පළවෙනි බෝම්බය පිපිරුණු බවත් එයට මදක් ඉදිරියෙන් තිබුණු එක්සිට් එක පැත්තට වන්නට බාර් එක තිබුණු හරියේ දෙවෙනි බෝම්බය පිපිරුණු බවත් ඉන්පසු තමා වටපිට බලන විට මුකුත් පෙනුනේ නැති බවත් කළුවර වෙලා තිබුණු බවත් බුමේ එක තිබුණු ස්ථානයේ ගෑස් එක සහ ෆිජ් ද තිබුණු බවත් ඇතුළේ එම ප්‍රදේශයම කළු වෙලා තිබුණු බවත් මුකුත් පෙනුනේ නැති බවත් පවසා ඇත.

එම පිපිරුණු බෝම්බයෙන් තමාගේ ඔළුවට ද තුවාල වෙලා කොළඹ රෝහලට යැවූ බවත් ඇය පවසා ඇති අතර මෙලෙස බෝම්බ පිපිරුණු අවන්හල පිහිටා තිබුණේ තුන්වෙනි මහලේ බවත් දෙවෙනි බෝම්බය පිපිරුණු එක්සිට් එක හරියේ ගෙස්ට්ලාට එළියට යන්න පුළුවන් පරිදි විදුලි පඩිපෙළ පහළට යාමට පිහිටා තිබුණු බවත් විදුලි පඩිපෙළට අමතරව අවන්හලට එන්නට විදුලි සෝපානයක්ද තිබුණු බවත් එම විදුලි සෝපානයෙන් හෝටලයේ නැවතී සිටින අයට ඕනෑම මහලකින් පැමිණෙන අමුත්තෙකුට තුන්වන මහලට පැමිණ අවන්හලට ඒමට හැකි

බවත් ඇය පවසා ඇති අතර එසේම, ටේබල් අවන්හල ආවරණය වන පරිදි කැමරා පද්ධතියක් ද තිබුණු බවත් ඇය පවසා ඇත.

සිද්ධියෙන් තුවාල වූ පසු තමා රෝහලේ නැවතී සිටියේ එක දිනයක් පමණක් බවත් ඇය පවසා ඇත. මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය සිදු කරන ලද විමර්ශන නිලධාරීන් විසින් තමාට ඡායාරූප දෙකක් පෙන්වා සිටි බවත් එම ඡායාරූපවල සිටි එක් පුද්ගලයෙකු තමා හඳුනා ගත් බවත් තමා එලෙස හඳුනාගත් පුද්ගලයා සිද්ධිය සිදු වූ වේලාවේ තමාගේ පිටිපස්සෙන් යනවා දැක්ක බවත් එම තැනැත්තාගේ නම සහරාන් බව පසුව දැනගත් බවත් ඇය පවසා ඇති අතර මෙම නඩුවට අදාළව මුද්‍රා තබා තිබූ නඩු භාණ්ඩ පාර්සලයක අඩංගුව තිබූ වර්ණ ඡායාරූප හතරකින් යුතු ලේඛනයක් හඳුනාගෙන එම ලේඛනය 4 වන පිටුවේ තමා විසින් තමා අත්සන තැබූ බවට පවසා එම අත්සන හඳුනාගෙන ඇති අතර එම අත්සන පැ.01 (1) ලෙස ලකුණු කර ඇත. මෙම පිටු හතරකින් යුතු ලේඛනය පැ.01 ලෙස ලකුණු කර ඇත.

එම ලේඛනයේ තිබෙන ඡායාරූප හතර අතුරින් හතර වන පින්තූරයේ සිටින තැනැත්තා සිද්ධිය සිදු වූ දින ගෙස්ට්ලා දෙදෙනෙක් අරන් යන අවස්ථාවේ එම තැනැත්තා තමා ඉන්න පැත්තෙන් ගමන් කරනවා දැක්ක බවට ඇය පවසා ඇති අතර, තමා ඡායාරූපයේදී හඳුනා ගත් තැනැත්තා අවන්හලේ C, D, යන මුහුදු පැත්තට වන්නට තිබුණු ස්ථානය

පැත්තට එම තැනැත්තා සිටගෙන සිටි බවත් ඇය පවසා ඇති අතර ඇය විසින් රෝහලේ සිට ඇගේ අත් අකුරින්ම ඇද හිසපත මත "මාගේ කැමැත්තෙන් රෝහලෙන් බැහැරව යමි" යැයි ලියූ බවට සඳහන් කරන ලද ඇද හිසපත පැ.02 ලෙස ලකුණු කර ඇගේ අත්සනද පැ. 02 (1) ලෙස ලකුණු කර ඇත.

එසේම, ඇය විසින් හඳුනා ගන්නා ලද පැ.01 දරන ඡායාරූපයෙහි සිටි පුද්ගලයා මෙරුන් පාට ඇඳුමක් ඇඳගෙන සිටි බවට පවසා ඇති අතර රජයේ රසපරීක්ෂක විසින් ෂැංග්‍රිලා හෝටලයේ CCTV කැමරා පද්ධතියේ ගබඩා කර තිබූ දත්ත ඇතුළත් සීඩී තැටියක් පැ.03 ලෙස ලකුණු කර ඇති අතර එම සීඩී තැටිය අධිකරණය ඉදිරියේ විකාශනය කර විවෘත අධිකරණයේ ස්ථාපනය කර තිබූ විශාල පුළුල් තිර දෙක මත ප්‍රදර්ශනය කරන ලද අතර එම CCTV දර්ශනය නරඹමින් ඇය අඬමින් සාක්ෂි ලබාදී ඇති අතර, එම CCTV දර්ශනවල ඇය සිටින ස්ථානය ඇය හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. තවද එම CCTV දර්ශන නරඹමින් බෝම්බය පිපිරුණු දින තමා විසින් අවන්හලේ මුහුදු පැත්තේ තියෙන මේසයට රැගෙන ගිය අමුත්තන් දෙදෙනාවද ඇය CCTV දර්ශන මත හඳුනාගෙන ඇති අතර CCTV දර්ශනවලට අනුව එදින පැය 08.52.56 ලෙසට පෙන්වා දී ඇත. තමා විසින් පැ.01 දරන ලේඛනයේ තියෙන ඡායාරූපයේ සිටි පුද්ගලයාවද CCTV දර්ශනවලින් හඳුනා ගනිමින් ඔහු මෙරුන් පාට ටී ෂර්ට් එකක් සහ කළු පාට කලිසමක් ඇඳන් කැප් එකක්ද දාගෙන බෑග් එකක් පිටේ රැගෙන

යන තැනැත්තා බවට පෙන්වා CCTV රූප රාමුවලට අනුව පැය 08.52.43 නිශ්චල රූප රාමුවෙහි සිටින පුද්ගලයා පැ.03 (1) (B) (1) ලෙස ලකුණු කර ඇති අතර තමා විසින් එලෙස හඳුනාගත් පුද්ගලයා අවන්හල තුළට ඇතුළු වීම සහ ඒ තුළ ගමන් කරන ආකාරය අවන්හල තුළ ඇවිද ගිය ආකාරය ඇය CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇත.

තවද තමා විසින් එලෙස හඳුනාගත් තැනැත්තා සමඟ නිල් පාට හෝ අළු පාට ටී ෂර්ට් එකක් ඇඳ කළු පාට කලිසමක් ඇඳ බෑක් පැක් එකක් ද එල්ලාගෙන පුද්ගලයෙකු ගමන් කරන ආකාරය හඳුනාගෙන එම පුද්ගලයන් දෙදෙනා අවන්හල තුළට පිවිසෙන ආකාරය හඳුනාගෙන ඇය සාක්ෂි ලබා දී ඇති අතර වීඩියෝ දර්ශනවලට අනුව අවන්හලෙන් එලියේ පල්ලෙහාට යන විදුලි පඩිපෙළ තිබෙන ස්ථානය ද ඇය විසින් පෙන්වා හඳුනාගෙන ඇති අතර එදින තමා සේවය කළ සෙක්ෂන් D යන ස්ථානයද ඇය විසින් පෙන්වා හඳුනාගෙන ඇත. එසේම, එදින අවන්හලේ තමා සමඟ සේවය කළ මෙම බෝම්බ පිපිරීම නිසා මියගිය තේජානි නැමැති සේවකයාවද CCTV දර්ශනවලින් ඇය හඳුනාගෙන ඇති අතර තමා විසින් පෙර විස්තර කරන ලද මෙරූන් ටී ෂර්ට් එකක් ඇඳගෙන කළු කලිසමක් ඇඳගෙන සිටි පුද්ගලයාවද අළු පැහැති ටී ෂර්ට් එකක් සහ කළු පැහැති කලිසමක් ඇඳ බෑක් පැක් එකක් පැළඳ සිටි පුද්ගලයා අවන්හලෙහි C කොටසට ගමන් කරන ආකාරය සහ තමා සමඟ සේවය කළ බෝම්බ පිපිරීමෙන් මියගිය තේජාන් නැමැත්තා අළු පාට බෑක් පැක් එකක් දාගෙන

සිටි තැනැත්තා සිටි ස්ථානය ආසන්නයෙහිම සිටින බවට හඳුනාගෙන ඇති අතර එම සිද්ධියෙන් මියගිය තේජානි නැමැත්තා එලෙස සිටි ස්ථානය පැ.03 (3) (b) (1) ලෙස ලකුණු කර ඇත.

එසේම, අවන්හලෙන් එන්ට්‍රන්ස් එකෙන් පහළට යන්නට තිබෙන එනම් දෙවන මහලට යන්න තිබෙන පඩිපෙළ සහ දෙවන මහලේ සිට උඩට එන්නට ද තිබෙන පඩිපෙළ තිබෙන ස්ථානයට අදාළ CCTV දර්ශනයද ඇය විසින් හඳුනාගෙන ඇති අතර තමන් විසින් පෙර අවස්ථාවක පෙන්වා සහරාන් යැයි තමා විසින් හඳුනාගත් තැනැත්තා එනම් මෙරූන් පාට ටී ෂර්ට් එකක් සහ කළු පාට කලිසමක් සහ බැක් පැක් එකක් දාගෙන සිටි පුද්ගලයා දෙවෙනි මහලේ සිට තුන්වෙනි මහලට විදුලි පඩිපෙළ දිගේ ගමන් කළ ආකාරය සහ ඉන්පසු එම තැනැත්තා එම තුන්වෙනි මහලේ සිට දෙවෙනි මහලට බැස්ස එම තැනැත්තා ලොබියේ පිහිටි එනම් දෙවෙනි මහලේ තිබුණු ලොබියේ ජුවලරි ෂොප් එක පැත්තට ගමන් කරන ආකාරය සහ එම අවස්ථාවේ එනම් CCTV දර්ශනවලට අනුව 8.54 තත්පර 18 ට පළවෙනි බෝම්බය පිපිරෙනවා වීඩියෝ දර්ශනයෙහි තිබෙන බවට ඇය හඳුනාගෙන ඇත.

එසේම, පෙර අවස්ථාවක තමා සිටි තුන්වෙනි මහලේ සිට දෙවෙනි මහලට විදුලි පඩිපෙළ දිගේ ගිය තමා විසින් හඳුනාගත් මෙරූන් පාට ටී ෂර්ට් එකක් ඇදගත් පුද්ගලයා දෙවෙනි මහලේ සිට තුන්වෙනි මහලට එන

දර්ශනය ද දැක ඇය හඳුනාගෙන ඇති අතර එදින තුන්වෙනි මහලේ සිට හතරවෙනි මහලට යාම සඳහා එන්ට්‍රන්ස් එකේ සිද්ධියෙන් මියගිය හවුස් කීපින් රැකියාව කළ ඊශානි නැමැත්තිය සිටිනවා ඇය හඳුනාගෙන ඇති අතර තමා විසින්ම පෙර හඳුනාගත් බැක් පැක් එකක් දාගෙන ඉන්න පුද්ගලයා තුන්වෙනි මහලේ එන්ට්‍රන්ස් එකේ නැවතී සිටින බව ඇය හඳුනාගෙන එම ස්ථානයේ 8:54:59 ට දෙවෙනි බෝම්බය පිපිරූ බවට ඇය පෙන්වා හඳුනාගෙන ඇත.

එසේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමාට පෙන්වා සිටි ඡායාරූපවල සිටි තැනැත්තා සහරාන් නැමැත්තා බවට තමා විසින් හඳුනාගන්නා ලද්දේ කට්ටිය පසුව කතා වුණ නිසා නිව්ස් වලින් එහෙම දැක්ක නිසා බවත් තමා එම පුද්ගලයාව කලින් දැන හඳුනාගෙන සිටි පුද්ගලයෙකු නොවන බවත් ඇය පවසා ඇත.

මෙම සාක්ෂිකාරිය සාක්ෂි ලබා දුන් දිනය වනවිට මෙම නඩුවේ චූදිතයින් වෙනුවෙන් නීතීඥ නියෝජනයන් තිබූ අතර 1, 10, 22 සහ 24 චූදිතයන් වෙනුවෙන් ද, 2, 9, 23 චූදිතයන් වෙනුවෙන් ද, 13 චූදිත වෙනුවෙන් ද පමණක් ඇයව හරස් ප්‍රශ්න වලට ලක් කිරීමක් කර ඇති අතර, අනිකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් ඇගෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී ද ඇය පවසා ඇත්තේ 2019.04.21 වන දින තමා පවසා සිටි පරිදි බෝම්බ ප්‍රහාරය වෙච්ච දිනයේ පැමිණි පුද්ගලයන්

දෙදෙනාවම තමා පෙර කවදාවත් දැක නැති පුද්ගලයන් බවත් එම පුද්ගලයන් දෙදෙනාගෙන් තමා හඳුනාගත් පුද්ගලයා එනම් පසුව නිව්ස්වලින් දැක සහරාන් යැයි තමා විසින් හඳුනාගත් පුද්ගලයා තමා සහරාන් බවට පෙර දැන සිටියා නම් හෝටලය ඇතුළට එන්න දෙන්නේ නැති බවද ඇය පවසා ඇත. එසේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් තමාගෙන් ප්‍රකාශයක් සටහන් කර ගන්නා අවස්ථාවේ තමා අධිකරණයේ දුටු වීඩියෝ දර්ශන සහ ඡායාරූප තමාට පෙන්වා සිටි බවත් සාක්ෂිකාරිය පවසා ඇත.

ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරුම්වලින් තුවාල සිදු වූ, අධිචෝදනා පත්‍රයේ නම් සඳහන් සාක්ෂිකරුවන් වන අනිකුත් තුවාලකරුවට එසේ තුවාල සිදු බව සියලු චූදිතයින් විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 414 සහ 420 වගන්තීන් ප්‍රකාරව පිළිගැනීම් ලෙස වාර්තා කරන ලද බැවින් එකී තුවාලකරුවන්ගෙන් කිහිපදෙනෙකු හැර අනිකුත් තුවාලකරුවන් කිසිවෙකු යලි සාක්ෂි ලබා දීම සඳහා නොකැඳවන ලදී.

ෂැංග්‍රිලා හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරුම් වලට අදාළව පැ.සා.1012 රුක්මන් තිලකරත්න නමැති විශ්‍රාමික හමුදා නිලධාරියා සාක්ෂි ලබා දෙමින් තමා යුධ හමුදා සේවයේ වසර 18ක් සේවය කර විශ්‍රාම යාමෙන් පසු 2017 සැප්තැම්බර් මාසයේ සිට 2021 මැයි මස

කොළඹ ෂැංග්‍රිලා හෝටලයෙහි CCTV ඔපරේටර් ලෙස සේවය කරන ලද බවත් ෂැංග්‍රිලා හෝටලයෙහි CCTV ආවේක්ෂණ රාජකාරී සඳහා පස් දෙනෙක් පමණ සිටි බවත් ඔවුන් සේවා මුරයට සේවය කරන ලද බවත් තමන්ලා සේවය කිරීමේදී තමන්ලාට නිළ ඇඳුමක්ද හෝටලයෙන් ලබා දී තිබෙන බවත් තමාලාව අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ නිලධාරීන් කිහිප දෙනෙක්, ආරක්ෂක අධ්‍යක්ෂක කෙනෙක් සහ සහකාර මැනේජර්ලා සහ සුපවයිසර්ලා සිටි බවත් පවසා ඇති අතර, හෝටලයට අදාළ CCTV දර්ශන නැරඹීම සඳහා ෂැංග්‍රිලා හෝටලයට කාර්ය මණ්ඩලය පැමිණෙන ස්ටාෆ් එන්ට්‍රන්ස් එකේ සෙකියුරිටි ඔෆිස් එක පැත්තෙන් ඇතුල් වූ පසු ෆයර් කමාන්ඩ් සෙන්ටර් එක තිබෙන බවත් ඒ අසල CCTV කාමරය තිබෙන බවත් CCTV තිබෙන කාමරයට යා හැක්කේ ඉතා සීමිත පිරිසකට පමණක් බවත් CCTV මොනිටර් 09 ක් තිබෙන බවත් එයට අදාළ මොනිටර් 09 න් එක මොනිටරයක් දිගටම වැඩ කරන බවත් අනෙත් ඒවා තත්පර ගණනෙන් මාරු වෙන බවත් දිගටම වැඩ කළේ ලිෆ්ට් එක ළඟ තිබෙන මොනිටරය බවත් පවසා ඇති අතර, එක් තිරයක දර්ශන 16 ක් පෙනෙන්නට සකස් කර තිබුණු බවත් යම් හෙයකින් තිරය වෙනස් වුවහොත් එම තිරය නැවත ආපසු ගිහින් රිවයින් කර බලන්නට හැකියාවක් තිබෙන බවත් පවසා ඇති අතර, අදාළ තිර වල දර්ශන පටිගත කිරීම් වෙනස් නොවී දින 30 ක් පමණ තිබෙන බවත් ඉන්පසුව එළඹෙන 30 වන දිනයේ ඒවා නැති වෙන බවත් පවසා ඇත. එසේම, හෝටලයෙහි CCTV දර්ශන

පටිගත වීම් දවස් 07 පුරා පැය 24 පුරාම සිදු වන බවත් සාක්ෂිකරු පවසා ඇත. 2019 වසර වන විට සවි කර තිබූ කැමරා පද්ධතිය තෙල්කෝ වර්ගයේ බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 උදෑසන 7.00 සිට පස්වරු 16.00 දක්වා තමාගේ සේවා කාල සීමාව බවත් එදින තමා උදේ 7.00 ට සේවයට පැමිණි බවත් එලෙස සේවයට වාර්තා කළ අවස්ථාවේ CCTV කාමරය තුළ වෙන කිසිවෙකු සිටියේ නැති බවත් එදිනද තමා සුපුරුදු පරිදි CCTV දර්ශන නැරඹූ බවත් එලෙස නරඹන අවස්ථාවේදී තමා උදේ රාජකාරී කරමින් සිටින විට එක පාරටම සද්දයක් ඇසී තමා එළියේ සිටි සුපවයිසර් ලහිරු නමැති තැනැත්තා ලඟට ගොස් සද්දයක් ආවා ගිහින් බලන්න කියූ බවත් තමා දොර වහගෙන ඇතුළට එන කොටම නැවතත් පෙර සද්දය මෙන්ම සද්දයක් ආව බවත් එම අවස්ථාව වන විට ලිෆ්ට් එකේ මොනිටර් එක ක්‍රියාත්මක තත්වයෙන්ම තිබුණ බවත් එම අවස්ථාවේදී ලිෆ්ට් එකෙන් දුම් යනවා වගේ සහ තුවාලකාරයෝ වැටිලා ඉන්නවා තමා දුටු බවත් එම අවස්ථාවේම හෝටලයේ තිබෙන ආරක්ෂක පද්ධතිය ක්‍රියාත්මක වී ස්ප්‍රිරින්ක්ලර් පුපුරා වතුර ගලන්න පටන් ගත් බවත් එවලේම හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක වන එනවුන්ස් සිස්ටම් එකද වැඩ කළ බවත් තමාද ස්ට්‍රැචර් එකක් අරගෙන තුවාලකරුවන්ට උදව් කිරීමට පඩිපෙළ දිගේ ලෙවල් ත්‍රී එකට ගිය බවත් ලිෆ්ට් එකේ ප්‍රශ්නය තිබුණේ ලෙවල් ත්‍රී එකේ බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා ලෙවල් ත්‍රී එකට යන

විට ලෙවල් ත්‍රී එකේ ලොබි එකේ කාන්තාවක් තුවාල වී සිටිය බවත් ඉන්පසු තමා අනෙක් අයගේ උදව් ඇතිව ඇයව පහළට රැගෙන ආව බවත් තමාට එම අවස්ථාවේදී ලොකු පිපිරීමක් වෙලා තිබෙන බවට පෙනී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට අනුව හෝටලයේ ඉස්සරහා ලොබි එක ආවරණය වන පරිදි අමුත්තන් පිළිගැනීමේ ස්ථානයෙහි කැමරා සවි කර තිබූ බවත් ඉන්පසු එම ස්ථානයට ආරක්ෂක අංශ නිලධාරීන් විමර්ශන කටයුතු සඳහා පැමිණි බවත් පවසා ඇති අතර, තමාගේ සුපවයිසර්, සාමාන්‍යාධිකාරීවරයා සහ විමර්ශන නිලධාරීන්ද එම දර්ශන පරීක්ෂා කිරීමට දර්ශන නැරඹූ බවත් ලෙවල් ත්‍රී එකේ ටේබල් 1 නමැති රෙස්ටුරන්ට් එකේ පිපිරීමක් වී ඇති බවට කට්ටිය කතා වුණ බවත් ඒ අනුව තමාලා CCTV දර්ශන රිවයින් කර සැක කටයුතු පුද්ගලයන් ඇතුල් වීමක් සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලූ බවත් පවසා ඇති අතර, පෙර අවස්ථාවක පැ.03 ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන අඩංගු සංයුක්ත තැටිය විවෘත අධිකරණයේ තිර මත දර්ශනය කර සාක්ෂිකරුට නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර, එම CCTV දර්ශන වල 2019.04.17 වන දින පැය 13.51 සිට 13.57 දක්වා වූ CCTV දර්ශන සාක්ෂිකරුට පෙන්වා දී ඇති අතර, එම CCTV දර්ශන පැ.3 (6), පැ.3 (7) ලෙස ලකුණු කර ඇත.

එසේම, හෝටලයෙහි 02 වන මහළේ Main Lobby Drop Off ලෙස සඳහන් 2019.04.17 පැය 13.57 ට අදාළ CCTV දර්ශනය පැ.3 (8) ලෙස ලකුණු කර ඇති අතර, මෙම සාක්ෂිකරු 2019.04.19 වන දින පැය 07:26:54 ට අදාළ CCTV දර්ශනය නරඹමින් සාක්ෂි ලබා දී ඇති අතර, එම CCTV දර්ශනය පැ.3 (9) ලෙස ලකුණු කර ඇති අතර එසේම, 2019.04.19 පැය 07.28 ට අදාළ ලෙවල් 2 Main Lobby Drop Off ලෙස සඳහන් කර ඇති CCTV දර්ශනය පැ.3 (10) ලෙස ලකුණු කර ඇත. එසේම, 2019.04.17 වන දින 07:28:24, 07:28:55 දක්වා CCTV දර්ශනය පැ.3 (11) ලෙසට ලකුණු කර ඇත. එසේම, Guest Lift ලෙස සඳහන් ස්ථානයෙහි 2019.04.19 දින 07.29 ට අදාළ CCTV දර්ශනය පැ.3 (12) ලෙසද, එසේම, 2019.04.19 දින 07.29 ට Table 1 Entrance ලෙස සඳහන් කර ඇති CCTV දර්ශනය පැ.3 (13) ලෙසද, ලෙවල් ත්‍රී Table 1 Cashier නමැති ස්ථානයට අදාළ 2019.04.19 පැය 07.30 සහ 07.31 ට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (14) ලෙසද, Level 3 Table 1 Cashier ලෙස සඳහන් 2019.04.19 දිනට අදාළ 09:09:45 සිට 09.09.14 ට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (14) ලෙසද, ටේබල් 1 Main Entrance ඇතුල්වීමේ දොරටුව ආවරණය වන පරිදි තිබූ සවි කරන ලද කැමරාවෙහි CCTV දර්ශනය 09:10:45 සිට 09.10:50 දක්වා ආවරණය කරන CCTV දර්ශන පෙළ පැ.3 (16) ලෙසද, හෝටලයේ 02 වන මහළේ බෝල් රූම් Lobby Entrance නමැති ස්ථානයේ 2019.04.19 දින පැය 09:11:45 සිට

09.12:58 දක්වා වූ CCTV දර්ශන පෙළ පැ.3 (17) ලෙස සාක්ෂිකරු හඳුනා ගෙන ලකුණු කර ඇති අතර එසේම, Main Lobby 01 හි 04.19.2019 දින 09:13:36 සිට 09:14:19 දක්වා කාලයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (18) ලෙසද, එසේම, එල්02.32 බෝල් රූම් Lobby Drop Off 2 04/19/2019 09:22:08 සිට 09:22:34 දක්වා වූ කාලයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (19) ලෙසත්, එසේම, 2019.04.20 දින එල් 02.27 Main Lobby Drop Off යැයි සඳහන් කැමරාවේ 19:56:20 සහ 19:57:31 දක්වා වූ CCTV දර්ශන පෙළ පැ.3 (20) ලෙසත්, එල්02.43 ෆ්‍රන්ට් ඔෆිස් 04/20/2019, 19:57:39 සිට 20:07:12 දක්වා වූ කාල පරාසයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (21) ලෙසත්, එසේම, එල්02.23 Main Lobby 04/20/2019 20:07:09 සිට 20:07:24 දක්වා වූ කාලය පරාසය තුළට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (22) ලෙස හඳුනා ගෙන ඇති අතර, එය අමුත්තන්ට පාවිච්චි කිරීම සඳහා වෙන් කර තිබූ විදුලි සෝපානය අසළ කැමරාවෙහි දර්ශනයක් බව සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරුගේ වැඩිදුර සාක්ෂි මෙහෙයවීමේ දී 2019.04.20 දින අමුත්තන්ට වෙන් වූ විදුලි සෝපාව තිබෙන ස්ථානයේ ඇති 20:07:22 සිට 20:10:00 දක්වා කාල පරාසයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (23) ලෙසත්, ලිෆ්ට් එක ඇතුළේ සවි කර තිබූ කැමරාවට අදාළ 2019.04.20 දිනට අමුත්තන්ට වෙන් වූ විදුලි සෝපාවේ Lift Number 05 දරන කැමරාවේ පැය 20 මිනිත්තු 07 සිට පැය 20 යි මිනිත්තු 08 දක්වා

කාලයට අදාළ දර්ශන පැ.3 (24) ලෙසත්, එසේම, 2019 අප්‍රේල් 20 දින අමුත්තන් සඳහා වෙන් වූ සෝපාන අතරින් 04 වන සෝපානයේ පැය 20:09 ට පසුව පටිගත වූ CCTV දර්ශන පෙළ පැ.3 (25) ලෙසද, එසේම, 06 වන මහළේ ගෙස්ට් ලිෆ්ට් ලොබි එක අසළ පිහිටි කැමරාවකින් 2019.04.20 දින පැය 20 මිනින්තු 10 න් ඔබ්බට පටිගත වූ CCTV දර්ශන පෙළ පැ.3 (26) ලෙසද, 06 වන මහළේ G/R Corridor B East ප්‍රදේශයට අදාළව 2019.04.20 දින පැය 20 මිනිත්තු 10 ට පටිගත වූ CCTV දර්ශන පෙළ පැ.3 (27) ලෙස ලකුණු කර ඇති අතර එසේම, 2019.04.20 දින පැය 20:20 ට අදාළ 06 වන මහළේ B East නමැති Corridor එකේ කැමරා කෝණයකින් පටිගත වූ දර්ශන පෙළ පැ.3 (28) ලෙසද, 2019.04.20 හෝටලයේ 06 වන මහළේ අමුත්තන් සඳහා වෙන් කරන ලද විදුලි සෝපානය අසළ සවි කර තිබූ කැමරාවෙහි පැය 20.21 ට පටිගත වූ දර්ශන පෙළ පැ.3 (29) ලෙසද, 2019 අප්‍රේල් 20 පැය 20.21 ට අමුත්තන් විදුලි සෝපානයේ ඇතුළත තිබෙන CCTV දර්ශන පෙළ පැ.3 (30) ලෙසද, 2019 අප්‍රේල් 20 දින පැය 20:22 සිට පැය 20:23:04 දක්වා වූ CCTV දර්ශන පෙළ පැ.3 (31) ලෙසද, 2019.04.20 දින Main Lobbyයෙහි සවි කර තිබූ කැමරාවෙන් ග්‍රහණය කර ගන්නා පැය 20:33 ට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (32) ලෙසද හඳුනා ගෙන ලකුණු කර ඇත.

එසේම, 2019.04.20 දින පැය 20:29 සිට ඔබ්බට අමුත්තන් හෝටලයට ඇතුල් වීමට සහ පිටවීමට තිබෙන දොරටුව අසල සවි කරන

ලද කැමරාවේ Main Lobby Drop Off යනුවෙන් සඳහන් CCTV දර්ශන පෙළ පැ.3 (33) ලෙසද, 2019.04.20 පැය 20.29 ට Main Lobby Drop Off කැමරාවෙන් පටිගත වූ දර්ශන පෙළ ද පැ.3 (34) ලෙසද, 2019 අප්‍රේල් 21 දින පාන්දර 01.46 ට පටිගත වූ Main Lobby Drop Off යන ස්ථානයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (35) ලෙසද, 2019.04.21 දින පැය 01.48 ට Main Lobby ය ආවරණය වන ආකාරයෙන් පටිගත වී ඇති CCTV දර්ශන පෙළ පැ.3 (36) ලෙසද, 2019.04.21 දින පැය 01: 48 සිට අමුත්තන්ගේ සෝපානයන් පිහිටි ලොබියේ ඉහළ සවිකර තිබූ CCTV කැමරාවේ දර්ශන පෙළ පැ.3 (37) ලෙසද, 2019.04.21 පාන්දර 01.48 සිට ඔබ්බට 01 වෙනි විදුලි සෝපානය ඇතුළේ සවි කරන ලද කැමරාවකින් ග්‍රහණය කර ගන්නා ලද CCTV දර්ශන පෙළ පැ.3 (38) ලෙසද, 2019.04.21 දින 01 වන මහළේ කොරිඩෝ එකක සවි කර තිබූ කැමරාවකින් පාන්දර 01.49 න් ඔබ්බට පටිගත වී ඇති CCTV දර්ශන පෙළ පැ.3 (39) ලෙසද, හෝටලයේ 06 වන මහළේ පිහිටි කැමරාවකින් 2019.04.21 දින පැය 08:08:11 සිට 08:08:36 දක්වා කාලයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (40) ලෙසද, 2019 අප්‍රේල් 21 දින පෙරවරු 08:09:03 සිට 08:09:22 දක්වා වූ කාලයට අදාළව හෝටලයේ අමුත්තන් සඳහා වෙන් වූ විදුලි සෝපාන අංක 05 තුළ පටිගත වී තිබූ CCTV දර්ශන පෙළ පැ.3 (41) ලෙසද, 2019.04.21 පැය 08:09:21 සිට 08:09:28 දක්වා වූ එනම්: 03 වන මහළේ අමුත්තන් සඳහා වෙන් වූ විදුලි සෝපානය අසල

සවි කර තිබූ කැමරාවට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (42) ලෙසද සාක්ෂිකරු හඳුනා ගෙන ලකුණු කර ඇති අතර, 2019.04.21 දින පැය 08:13:04 සිට 08:13:41 දක්වා වූ කාලය තුළ 03 වන මහළ සහ 02 වන මහළ අතර දිවෙන විදුලි පඩිපෙළ තිබෙන ස්ථානයේ තිබෙන කැමරාවේ පටිගත වූ CCTV දර්ශන පෙළ පැ.3 (43) ලෙසද, 2019.04.21 දින පැය 08:13:44 සිට පැය 08:09.04 දක්වා කාලයට අදාළ CCTV දර්ශන පෙළ එනම්, බෝල් රූම් ෆ්ලෝ නමැති ස්ථානය ආවරණය වන CCTV දර්ශන පෙළ පැ.3 (44) ලෙසද, 2019.04.21 දින 03 වන මහළේ විදුලි පඩිපෙළ ආසන්නයේ සවි කරන ලද කැමරාවකින් පෙරවරු 08.18 සිට 08.19 දක්වා වූ කාල පරාසයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (45) ලෙසද, 03 වෙනි මහළේ ලිෆ්ට් එක ආවරණය වන ලෙස ලබා ගෙන ඇති 2019.04.21 දින 08:19:52 දරන CCTV දර්ශන පෙළ පැ.3 (46) ලෙසද සාක්ෂිකරු විසින් හඳුනා ගෙන ලකුණු කර ඇත.

එසේම, 06 වන මහළේ අමුත්තන්ගේ විදුලි සෝපාන ලොබියෙහි සවි කරන ලද 2019.04.21 දින පෙරවරු 08.20 සිට ඔබ්බට ග්‍රහණය කර ගන්නා ලද දර්ශන පෙළක් අඩංගු දර්ශන පෙළ පැ.3 (47) ලෙස ලකුණු කර ඇත. එසේම, මෙම සාක්ෂිකරුට පෙන්වන ලදුව 2019.04.21 වන දින 06 වන මහළේ G/R Corridor B East 617.613 ට අදාළ දක්වා වූ ප්‍රදේශය ආවරණය කරන කැමරාවකින් පැය 08.21 සිට පටිගත වූ දර්ශන පෙළ පැ.3 (48) ලෙස ලකුණු කර ඇති අතර, එම ප්‍රදේශයම ආවරණය කරමින් පැය

08.50 සිට 08.51 දක්වා වූ කාල පරාසයට අදාළ දර්ශන පෙළ පැ.3 (49) ලෙස ලකුණු කර ඇත.

එසේම, එදිනම 06 වන මහළේ අමුත්තන්ගේ සෝපානය අසළ සවි කරන ලද කැමරාවකින් පැය 08:51 සිට ඔබ්බට පටිගත වූ දර්ශන පෙළ ඇතුළත් CCTV දර්ශන පෙළ පැ.3 (50) ලෙස මෙම සාක්ෂිකරුට පෙන්වා ලකුණු කර ඇති අතර, 2019.04.21 දින පැය 08:51 සිට ඔබ්බට පටිගත වූ L C Guest Lift 01 යන ස්ථානයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (51) ලෙස ලකුණු කර ඇත.

එසේම, එදිනටම අදාළව පැය 08:52:24 ට අදාළව L 03.06. Guest Lift Landing යන ස්ථානයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (52) ලෙස ලකුණු කර ඇති අතර එසේම, 03 වන මහළේ Table 01 අවන්හලෙහි අමුත්තන් ඇතුළු වන දොර ලඟ සවි කර ඇති කැමරාවකින් 2019.04.21 දින පෙවරු 08.52 සිට ඔබ්බට ග්‍රහණය කර ගන්නා ලද CCTV දර්ශන පෙළ සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර එසේම, පෙර අවස්ථාවක පැ.3 (1) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ ද සාක්ෂිකරුට පෙන්වන ලද අවස්ථාවේදී එයද 03 වන මහළේ ටේබල් 01 අවන් හළ ඇතුළත 2019.04.21 පැය 08:52:30 සිට පැය 08:55:29 දක්වා වූ දර්ශන පෙළක් බවට පිළිගෙන ඇත. එසේම, පෙර අවස්ථාවක පැ.3 (3) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළද සාක්ෂිකරුට පෙන්වන ලද අවස්ථාවේදි

එයද 03 වන මහළේ ටේබල් 01 නමැති රෙස්ටුරන්ට් එකේ ඇතුළේ සවි කරන ලද කැමරාවකින් 2019.04.21 වන දින 08:53:37 ට දැක්වෙන CCTV දර්ශන පෙළක් බවටත් සාක්ෂිකරු හඳුනා ගෙන ඇත.

එසේම, මෙම සාක්ෂිකරුට පෙන්වන ලදුව සාක්ෂිකරු විසින් හඳුනා ගත් 2019.04.21 පැය 08:54:00 සිට 09:05:59 දක්වා කාල පරාසය තුළට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (53) ලෙස ලකුණු කර ඇති අතර, පෙර අවස්ථාවක පැ.3 (4) ලෙස ලකුණු කර තිබූ CCTV දර්ශන පෙළ සාක්ෂිකරු විසින් හඳුනා ගෙන එය 2019.04.21 දින 03 වන මහළේ ටේබල් 01 අවන් හලට ඇතුල් වෙන ස්ථානයට අදාළ 08:53:24 සිට 08:54:48 කාල පරාසයට අදාළ CCTV දර්ශන පෙළක් බවට මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගෙන ඇත. එසේම, පැ.3 (5) ලෙස පෙර අවස්ථාවක ලකුණු කර තිබූ CCTV දර්ශන පෙළද සාක්ෂිකරු විසින් හඳුනාගෙන එය 03 වන මහළේ විදුලි පඩිපෙළ අසල වූ CCTV කැමරාවෙන් 2019.04.21 පැය 08:53 සිට 08:55 දක්වා කාලයට අදාළව පටිගත වූ දර්ශනයක් බවත් පවසා හඳුනා ගෙන ඇත. එසේම, 2019.04.21 දින 403 වන මහළේ ටේබල් 01 වන් හලට ඇතුල් වෙන ස්ථානයේ කැමරාවේ පෙරවරු 8.54 සිට පැය 8.55 දක්වා කාල පරාසයට අදාළ CCTV දර්ශන පෙළ සාක්ෂිකරු විසින් පැ.3 (54) ලෙස හඳුනාගෙන ලකුණු කර ඇති අතර, පෙර අවස්ථාවක පැ.3 (6), පැ.3 (7) පැ.3 (8) ලෙස ලකුණු කර ඇති 2019.04.17 වන දිනට අදාළ CCTV දර්ශන කිහිපයද

සාක්ෂිකරුට පෙන්වන ලදුව ඒවා මේන් ලොබි ඩ්‍රොප් ඕෆ් නමැති කැමරාවෙන් ලබා ගෙන ඇති දර්ශන බවට සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර, එදින ත්‍රීවිල් රථයකින් පැමිණ එම අවස්ථාවේ බසින ලද පුද්ගලයා නිල්පාට ටී ෂර්ට් එකක් සහ එහි කොළරය සහ අත් දෙක සුදු පටියක් අල්ලා තිබෙන බවත් කළු සපත්තු දෙකක් පැළඳ සිටින බවත් එම සපත්තුවේ අඩිය සුදු පාට බවත් කලිසම සුදු පාටට හුරු බවත් ඔහු අතේ ඔරලෝසුවක් බැඳ ෆෝන් එකක් වැනි දෙයක් අතේ තබා ගෙන කැප් එකක් දමාගෙන බැක්පැක් වර්ගයේ බෑග් එකක් උරහිසට තිබෙන ආකාරයට පැළඳ ගෙන යන ආකාරයක් දිස්වෙන බවට පවසා එය 2019.04.17 දින පැය 13:31 ට ඔබ්බට පටිගත වූ දර්ශනයක් බවට හඳුනා ගෙන ඇත.

එසේම, එලෙස ඇතුළු වන එම පුද්ගලයා හෝටලය තුළ ලොබි එක තුළට ගමන් කරන බව එහි අමුත්තන් ලියාපදිංචි කරන ස්ථානයට එනම්, 02 වෙනි මහළේ ලොබි ඒරියා එකේ අමුත්තන් ලියාපදිංචි කරන ස්ථානයට ගමන් කළ ආකාරය ඉන් දිස්වන බවට සාක්ෂි දී පවසා එයට අදාළ CCTV දර්ශන පෙළ පැ.3 (7) ලෙස ලකුණු කර ඇත.

පැ.3 (8) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ නැරඹීමෙන් පසුව මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ, එහි සඳහන් වන්නේ 2019.04.17 පැය 13:57:15 ට පටිගත වූ දර්ශන පෙළක් බවත් තමා විසින් පෙර දර්ශනවලදී දුටු බවට සඳහන් කරන පුද්ගලයා මෙම දර්ශනයේද සිටින

බවත් ඔහු හෝටලයේ ලොබි එක තුළ සිට හෝටලයෙන් පිටත දෙසට ගමන් කරනවා දිස්වන බවක් පවසා ඇති අතර එසේම, පැ.3 (9) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළ මෙම සාක්ෂිකරු විසින් පරීක්ෂා කර බලා පවසා ඇත්තේ, එය 2019.04.19 වන දින පැය 07.26 ට CBB – 3681 දරන සුදු පාට සුසුකි වර්ගයේ වෑන් රථයක් හෝටලය තුළට ගමන් කරන ආකාරය පෙන්වූ බවත් පැ.3 (10) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළට අනුව පැ.3 (9) හි දුටු රථය පැ.3 (10) දර්ශනයේත් තිබෙන බවත් එම රථය මේන් ලොබි එක ඉදිරිපිට අමුත්තන් හෝටලයට ඇතුල් වන ස්ථානයෙහි නවතා තිබෙන බවත් සාක්ෂිකරු හඳුනා ගෙන ඇත.

එලෙස පැමිණි CBB–3681 දරන වාහනයෙන් පුද්ගලයන් දෙදෙනෙකු බසින ආකාරය සහ එම රථයේ වම්පසින් බැස්ස කෙනා නිල් පාට කැප් එකක් පැළඳ කළු පාටට හුරු කලිසමක් සහ සුදු පාටට හුරු සපත්තු 02 ක්ද නිල් පාටට හුරු ටී ෂර්ට් එකක් පැළඳ සිටින බවත් වාහනයේ දකුණු පස සිටින පුද්ගලයා නිල් පාට කැප් එකක් පැළඳ රැවුල වවාගෙන සිටින, නිල් පාටට හුරු ටී ෂර්ට් එකක් ඇඳ සිටින බවත් එහි දකුණු උරහිසේ සුදු පාට ඉරක් තිබෙන බවත් නිල් පාට සපත්තු 02 ක් පැළඳ සිටින බවත් එහි අඩිය සුදු පාට බවත් එලෙස බැස්ස එම පුද්ගලයන් දෙදෙනා හෝටලය තුළට 2019.04.19 දින පෙරවරු 07.27 ට ඇතුල් වන ආකාරය පටිගත වී තිබෙන බවත් සාක්ෂිකරු විසින් සාක්ෂි දී පවසා ඇති අතර, එම පුද්ගලයන් දෙදෙනා එලෙස හෝටලය ඉදිරිපස දොර ලඟින්

බැස හෝටලය ඇතුළට යන ආකාරය පැ.3 (11) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනවලට අනුව පෙනී යන බවත් එයට අනුව ඔවුන් ලොබි එක තුළ සිටින බවත් ඔවුන් දෙදෙනා ඉන්පසු අමුත්තන්ගේ විදුලි සෝපානය පැත්තට ගමන් කරනවා දිස්වන බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පැ.3 (12) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළද පෙන්වන ලද අවස්ථාවේදී එය විදුලි සෝපාන අංක 05 ඇතුළත තිබෙන කැමරාවෙන් ලබා ගත් දර්ශන බවත් එයට අනුව මුලින් CBB – 3681 දරන රථයෙන් බැස හෝටලයට පැමිණි පුද්ගලයන් දෙදෙනා අමුත්තන්ට වෙන් කර තිබුණු 05 වෙනි සෝපානයට ඇතුල් වන බව දිස්වන බවත් එලෙස ඇතුල් වන්නේ 02 වෙනි මහළෙන් බවත් ඔවුන් 03 වන මහළ දක්වා ගමන් කරන බවත් ටේබල් 01 අවන්හල තිබෙන්නේ 03 වන මහළේ බවත් සාක්ෂිකරු අදාළ දර්ශන පරික්ෂා කර බලා හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.3 (13) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ පෙන්වූ අවස්ථාවේදී එම දර්ශන පෙළ 2019.04.19 පැය 07:29:48 සිට පටිගත වූ දර්ශනයක් බවත් එම දර්ශනයට අනුවද තමා පෙර විස්තර කරන ලද CBB – 3681 රථයෙන් පැමිණි පෙර කී පුද්ගලයන් දෙදෙනා table 1 අවන්හල ඇතුළට යන ආකාරය දිස්වන බවට පවසා ඇත. එසේම, පෙර අවස්ථාවක පැ.3 (14) ලෙස ලකුණු කර ඇති

CCTV දර්ශන පෙළ පරීක්ෂා කර බලා ඇති මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ එයට අනුව පෙර කී පුද්ගලයන් දෙදෙනා අවන්හලේ අසුන් ගන්නා ආකාරය පෙන්නුම් කරන බවත් එසේම, පෙර අවස්ථාවක පැ.3 (15) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන රාමු පරීක්ෂා කරමින් මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමා පෙර පැවසූ පරිදි එදින උදේ හෝටලය වෙත CBB – 3681 රථයෙන් පැමිණි පෙර පුද්ගලයන් දෙදෙනා ඔවුන් සිටි තැනින් නැගිට ගමන් කළ ආකාරය පෙන්නුම් කරන බවත් පැ.3 (16) CCTV දර්ශන පෙළ නිරීක්ෂණය කරමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එයට අනුව ඉහත කී පුද්ගලයන් දෙදෙනා අවන්හලෙන් එළියට ගමන් කරන ආකාරයක් පෙන්නුම් කරන බවයි.

පැ.3 (17) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළද නැරඹූ සාක්ෂිකරු පවසා ඇත්තේ, ඉහත කී පුද්ගලයන් දෙදෙනා එයට අනුව මේන් ලොබි එක පැත්තට ගමන් කරන බව පෙනී යන බවත් පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.3 (18) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළ නැරඹූ සාක්ෂිකරු පවසා ඇත්තේ, පෙර කී පුද්ගලයන් දෙදෙනාම සිටින බවත් පෙර අවස්ථාවක පැ.3 (19) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති CCTV දර්ශන රාමුව පරීක්ෂා කළ සාක්ෂිකරු එහිද තමා විසින් පෙර විස්තර කරන ලද පුද්ගලයන් දෙදෙනා සිටින බවත් ඔවුන් දෙදෙනා 2019.04.19 දින පැය 09:22:05 ට ලොබි එක ඇතුළේ සිට වාහනයකට නඟින දර්ශනයක් බවත් එම වාහනයේ අංකය පැහැදිලිව පෙනෙන්නේ

නැති බවත් එය සුදු පාට Wagon.R වර්ගයේ කාර් රථයක් බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර, පැ.3 (19) සහ පැ.3 (20) CCTV දර්ශන පෙළට අනුව අදාළ වාහනය Suzuki Every වර්ගයේ කුඩා වෑන් රථයක් බවත් එයට අදාළ CCTV දර්ශන පටිගත වී ඇත්තේ 2019.04.20 පැය 19:56 ට බවත් එම වාහනයේ අංකය අපැහැදිලි බවත් එම වාහනයෙන් පුද්ගලයන් දෙදෙනෙකු බසිනවා දිස්වන බවත් වම්පසින් බසින පුද්ගලයා රතුපාට ටී ෂර්ට් එකක් ඇඳ විශාල රෝද තිබෙන බෑග් එකක් රැගෙන සුදුපාට අඩිය තිබෙන තනි කළු පැහැති සපත්තු 02 ක් පැළඳ සිටින බවත් යටිකයට කළු පාට දිග කලිසමක් ඇඳ සිටින බවත් වාහනයේ දකුණු අත පැත්තෙන් බැස්ස 02 වන පුද්ගලයා කැප් එකක් දමාගෙන නිල් පාටට හුරු කොට ටී ෂර්ට් එකක් හැඳ අඩිය සුදු පාට නිල් පාටට හුරු සපත්තු 02 ක් පැළඳ කළු දිග කලිසමක් හැඳසිටින බවත් එම පුද්ගලයා රෝද සහිත විශාල බෑග් එකක් ඇඳගෙන යනවා පෙනී යන බවත් එම තැනැත්තා බැක්පැක් වර්ගයේ බෑගයක්ද පැළඳ සිටින බවත් ඔවුන් හෝටලයේ 02 වෙනි මහළේ අමුත්තන් ලියාපදිංචි කරන ස්ථානයට යන ආකාරය පෙනෙන බවටත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.3 (22) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළද පරීක්ෂා කර බලා ඇති මෙම සාක්ෂිකරු එයට අනුව ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයින් දෙදෙනා 02 වෙනි මහළේ විදුලි සෝපානය තිබෙන පැත්තට ගමන් කරන බවත් පැ.3 (23) සහ පැ.3 (24) ලෙස ලකුණු කරන ලද

CCTV දර්ශනයන්ට අනුව ඉහත කී පුද්ගලයන් දෙදෙනා ඔවුන් රැගෙන එන ලද රෝද සහිත බෑග් දෙක සහ පිටේ බැක්පැක් බෑග් 02 ක්ද එල්ලා ගෙන 02 වන මහලෙන් විදුලි සෝපානයට ඇතුළු වෙන ආකාරය පෙන්නුම් කෙරෙන බවත් ඔවුන් උඩු මහළට ගමන් නොකර නැවතත් සෝපානයෙන් එළියට බසින ආකාරය දිස්වන බවටත්, ඉන්පසු ඔවුන් දෙදෙනා සෝපාන අංක 04 විදුලි සෝපානය තුළ සිටගෙන සිටින ආකාරය පැ.3 (25) දරන CCTV දර්ශනය තුළින් පෙනෙන බවත් ඔවුන් එම සෝපානයෙන් 06 වන මහල දක්වා ගොස් විදුලි සෝපානයෙන් බැස 06 වන මහලේ කොරිඩෝ B East යන ප්‍රදේශයේ තියෙන කාමර 617/613 දක්වා වූ කාමර පෙළ කැමරා දර්ශනයෙන් පෙනෙන ස්ථානයේ සිටින බවට පෙනෙන බවත් ඔවුන් දෙදෙනා තමා පෙර පැවසූ පරිදි Suzuki Every වර්ගයේ වාහනයෙන් බැස පැමිණි අවස්ථාවේ ඇද සිටි ඇදුම්වලින් සහ ඔවුන් රැගෙන පැමිණි බැක් පැක් සහ රෝද සහිත ලොකු බෑග් ද සමඟ සිටින බවට CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇත.

එසේම, 2019.04.20 දින පැය 20.21.53 ට අදාළ CCTV දර්ශන එනම් පැ.03 (31) දරන CCTV දර්ශන පෙළ පරීක්ෂා කරමින් සාක්ෂිකරු පවසා ඇත්තේ තමා පෙර හඳුනාගත් රතු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන සිටි බැක්පැක් එකක් සහිත පුද්ගලයා Main Lobby එකේ සිට එකේ මැද සිට හෝටලයෙන් පිටතට යන්න හදන ආකාරයත් පැ.3 (31) දරන CCTV දර්ශන තුළින් පෙනෙන බවත් ඔහු අතේ තිබුණු හෑන්ඩ්ෆෝන් එක ඔපරේට්

කරමින් Main Lobby Drop Off නැමැති ස්ථානයෙන් ඔහු අතේ ජංගම දුරකථනයක් තබා ගෙන රතු පාටට හුරු කාර් රථයක ඉදිරිපස දොර ඇර එයට නැග ඉදිරියට ගමන් කරන ආකාරය දිස්වෙන බවට සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු හට පැ.03 (35) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ පෙන්වා ප්‍රශ්න කිරීමේදී සාක්ෂිකරු පවසා ඇත්තේ එම දර්ශන L O 02/27 Main Lobby Drop Off යන ස්ථානයේ සවි කරන ලද CCTV කැමරාවේ දර්ශනවලට අනුව 2019.04.21 දින පාන්දර පැය 1 යි මිනිත්තු 46 ට තමා විසින් පෙර අවස්ථාවක රතු පැහැති ටී ෂර්ට් එකක පැළඳ සිටි පුද්ගලයා ලෙස හඳුනා ගත් තැනැත්තා එනම් 20 වන දින රාත්‍රියේ බැක් පැක් එකක් රැගෙන රතු පාට කාර් එකක නැග හෝටලයෙන් එළියට ගිය තැනැත්තාම සුදු පාට Wagon.R වර්ගයේ කාර් රථයකින් පැමිණ එළියට බහිනවා දිස්වන බවත් එම අවස්ථාවේ ඔහුගේ අතේ පෙර දින රාත්‍රියේ රැගෙන ගිය බැක් පැක් එක නොමැති බවත් අතෙහි ෂොපින් බෑග් එකක් වැනි යමක් තබාගෙන හෝටලය තුළට ගමන් කරන ආකාරය දිස්වන බවට හඳුනාගෙන ඇති අතර, එම පුද්ගලයාම 2019.04.21 පෙරවරු 1.48 ට අමුත්තන්ගේ විදුලි සෝපානයට නැග ඒ තුළ ගමන් කරන ආකාරය පැ.03 (38) දරන CCTV දර්ශන මඟින් පෙනී යන බවත් එසේම, පැ.03 (39) දරන CCTV දර්ශනවලට අනුව දිස්වෙන බවත් එසේම, පැ.03 (40) CCTV දර්ශන එනම් 06 වෙනි මහලේ Corridor B East එහි කාමර අංක 613 සිට 617 දක්වා කාමර දිස්වෙන ස්ථානයෙහි පෙර කී රතු ටී ෂර්ට් එකක්

ඇදගෙන සිටි රැවුල වවාගෙන සිටි පුද්ගලයා දර්ශනය වන බවත් එසේ පැ.03 (41) දරන CCTV දර්ශනය අනුව 06 වෙනි මහලේ විදුලි සෝපාන අංක 05 තුළින් එම පුද්ගලයා 03 වන මහලට පැමිණ 03 වන මහලේ පිහිටි ටේබල් වන් මහලට යනවා දිස්වෙන බවත් එසේම, පැ.03 (43) CCTV දර්ශනය අනුව එම පුද්ගලයා තුන්වන මහලේ සිට 02 වන මහල දක්වා විදුලි පඩිපෙළ දිගේ පහළට ගමන් කරන බවත් ඔහු දුරකථන ඇමතුමක් ගන්නා ආකාරය දිස්වන බවත් පැ.03 (44) දරන CCTV දර්ශන රාමුවට අනුව පෙනී යන බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.03 (45) දරන CCTV දර්ශනවලට අනුව 2019.04.21 පැය 08.13 ට එම පුද්ගලයා දෙවෙනි මහලේ සිට තුන්වන මහල දක්වා විදුලි පඩිපෙළ දිගේ පැමිණෙන ආකාරය දිස්වෙන බවත් එලෙස පැමිණි ඔහු තුන්වන මහලේ සිට දුරකථන ඇමතුමක් ගනිමින් එම මහලේ ලිෆ්ට් එක ඇතුළට යන ආකාරය දර්ශනය වන බවත් ඔහු එම ලිෆ්ට් එක තුළින් 06 වන මහල දක්වා ගමන් කර ඉන්පසු ඔහු හයවෙනි මහලින් බැස ලිෆ්ට් ලොබි ඒරියා එකේ ගමන් කරන ආකාරය දිස්වන බවත් එලෙස ගමන් කරමින් හයවන මහලේ Corridor B East ප්‍රදේශයෙහි පිහිටි 613 සිට 617 දක්වා කාමර තිබූ ප්‍රදේශයෙහි සිටින බවට හඳුනාගෙන ඇත.

පැ.03 (49) දරන CCTV දර්ශන පෙළ නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එයට අනුව හයවන මහලේ කාමර අංක 613 සිට 617 දක්වා වූ

කාමර ආවරණය වන CCTV දර්ශනයට අනුව පුද්ගලයන් දෙදෙනෙක් බැක්පැක් දෙකක් පැළඳ ලොබි එකේ එහාට මෙහාට ගමන් කරනවා දිස්වෙන බවත් එම පුද්ගලයන් දෙදෙනා 2019.04.20 දින කාර් රථයකින් හෝටලයට පැමිණි පුද්ගලයන් දෙදෙනාම බවට මෙම සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර පැ.03 (51) දරන CCTV දර්ශනවලට අනුව ද එම පුද්ගලයන් දෙදෙනා විශාල බැක්පැක් දෙකක් පැළඳගෙන 06 වෙනි මහලෙන් ගොඩවී තුන්වන මහලෙන් බහින ආකාරය පෙනී යන බවත් එම දර්ශනය හයවන මහලෙන් තුන්වන මහලට ගමන් කිරීමට ඇති විදුලි සෝපානය ඇතුළත තිබූ CCTV කැමරාවේ පටිගත වූ දර්ශන පෙළක් බවත් එයට අනුව 06 වන මහළේ සිට විදුලි සෝපානයෙන් පැමිණි ඉහත කී පුද්ගලයන් දෙදෙනා තුන්වෙනි මහලේ ටේබල් වන් අවන්හල දෙසට ගමන් කරන ආකාරය දිස්වන බවත් එම පුද්ගලයන් දෙදෙනා 2019.04.20 දින හෝටලයට පැමිණි අවස්ථාවේ ඇදගෙන සිටි ඇදුම්ම මෙම අවස්ථාවේද ඇදගෙන සිටි ආකාරය මෙම සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එසේම, පෙර අවස්ථාවක පැ.03 (02) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ නැරඹීමෙන් පසු මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ එම පුද්ගලයන් දෙදෙනා ඔවුන් පැළඳ සිටි බැක්පැක් සමඟම ටේබල් වන් අවන්හල තුළට ඇතුළු වන ආකාරය දිස් වූ බවත් පෙර අවස්ථාවකදී පැ.03 (01) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන පෙළ එනම් ටේබල් වන් අවන්හල ඇතුළත සවිකර ඇති CCTV කැමරා දර්ශනවලට අනුව සහ පෙර

අවස්ථාවක පැ.03 (03) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළද නැරඹීමෙන් පසු තමා විසින් පෙර හඳුනාගත් බැක් පැක් දෙකක් පැළඳගෙන සිටි පුද්ගලයන් දෙදෙනා හිසෙහි කැප් දෙකක් ද පැළඳගෙන සිටින ආකාරය පෙනී යන බවත් එවිට වේලාව පැය 08:52:29 න් ඔබ්බට පටිගත වූ දර්ශනයක් බවත් වන අතර පෙර අවස්ථාවක පැ.03 (53) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එය 2019.04.21 වන දින පැය 08.54 ට ඔබ්බට පටිගත වූ තුන්වන මහලේ Guest Lift Landing යන කැමරාවෙන් ලබාගෙන ඇති CCTV දර්ශනවලට අනුව විදුලි සෝපානයෙන් දුමක් පිටවෙනවා නිරීක්ෂණය වන බවට සාක්ෂිකරු පවසා ඇත.

එසේම, පෙර අවස්ථාවක පැ.03 (04) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එයට අනුව තමා පෙර හඳුනාගත් පුද්ගලයන් දෙදෙනාගෙන් රතු පාට ටී ෂර්ට් එකක් ඇදගෙන සිටි පුද්ගලයා ටේබල් වන් අවන්හලෙන් හිසේ කැප් එකක්ද පැළඳගෙන එළියට එන බවත් අළු පාටට හුරු නිල් පාටට වගේ පෙනෙන බැක් පැක් එකක් පිටේ එල්ලගෙන අවන්හලෙන් එළියට පැමිණ එතනින් එහා පැත්තට ඇති පඩිපෙළ දෙසට යන බවක් පෙනෙන ආකාරය පෙනෙන බවත් හඳුනාගෙන ඇති අතර, ඔහු තුන්වන මහලේ සිට දෙවන මහල දක්වා ගමන් කරන බවත් එම අවස්ථාවේ විදුලි පඩිපෙළ වම් පැත්තේ විශාල දුමක් නිරීක්ෂණය වන බවත් එම අවස්ථාවේම විදුලි පඩිපෙළ දෙකම ක්‍රියාවිරහිත වන බවත්

එලෙස ක්‍රියාවිරහිත වුනු විදුලි පඩිපෙළ දිගේ දෙවන මහලේ සිට තුන්වන මහල දක්වා පුද්ගලයෙකු පැමිණෙන ආකාරය තමාට දර්ශනය වන බවත් එලෙස පැමිණෙන තැනැත්තා එයට මොහොතකට පෙර තුන්වන මහලේ සිට දෙවන මහලට බැක් පැක් එකක්ද පැළඳ ගමන් කරන ලද තැනැත්තාම බවත් එම තැනැත්තාම එම බැක් පැක් එකම දාගෙන කැප් එකත් දාගෙන දෙවන මහලේ සිට තුන්වන මහලට එනවිටත් ඒ වනවිට ක්‍රියාවිරහිතව තිබූ විදුලි පඩිපෙළ දිගේ එන ආකාරය නිරූපණය වන බවත් ඔහු එම පඩිපෙළෙහි නොපෙනී යනවාත් සමඟම විශාල දුමක් දිස්වෙන බවත් එයට අදාළ CCTV දර්ශනය තුන්වන මහලෙහි සවිකර තිබූ l03/16 එස්කැවේලේටර් ලෑන්ඩ් යන කැමරාවේ පටිගත වී ඇති බවත් එම දර්ශනය 2019.04.21 දින පැය 08:53:39 ට පටිගත වූ දර්ශනයක් බවත් පවසා සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරු විසින් පෙර අවස්ථාවක පැ.03 (54) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළ නරඹමින් එය තුන්වන මහලේ ටේබල් වන් අවන්හලට ඇතුල්වන ස්ථානයේ තිබෙන කැමරාවෙන් 2019.04.21 පැය 08:54:05 සිට පටිගත වූ දර්ශන පෙළක් බවත් එම දර්ශනයට අනුව ගොඩනැගිල්ල එනම් අවන්හල දෙදරන ආකාරයෙන් මේස උඩ තිබුණු ඒවා වැටෙන ආකාරයත් විශාල දුමක් තිබෙන බවත් අවන්හලේ ආහාර ගනිමින් සිටි අමුත්තන් සහ සේවකයන් මහලෙන් එළියට දිවයන අයුරුත් ඒ සමඟම

විශාල දුමක් සහිත ගින්දරක්ද පෙනෙන අකාරය දිස්වන බවට සාක්ෂිකරු පවසා ඇත.

තමා විසින් මෙලෙස අධිකරණයේදී නරඹා හඳුනාගත් CCTV දර්ශන ඇතුළත් CCTV දර්ශන පට 54 ම තමා මෙම සිද්ධියෙන් පසු අවස්ථාවක හෝටලයේදී බැලූ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විමර්ශන අතරතුර තමාගෙන් ප්‍රකාශයක් සටහන් කරගන්නා ලද අවස්ථාවේදී මෙම අධිකරණයේ පැ.01 ලෙස ලකුණු කර තිබෙන කොල 4 කින් යුතු ලේඛනය තමාට පෙන්වා සිටි බවත් එම ලේඛනයෙහි 01 පිටුවේ සහ 04 පිටුවේ තමා විසින් අත්සන් ද යොදා තිබෙන බව පවසා එම අත්සන් එම සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

තමා විසින් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් නරඹන ලද CCTV දර්ශනවලදී හඳුනාගත් පුද්ගලයන් එනම් නිල් පාට ටී ෂර්ට් එකක් ඇඳ තුන්වන මහලේ අවන්හලේ නැවතුනු පුද්ගලයා බවත් එසේම, පැ.01 ලේඛනයේ 04 වන පිටුවේ මෙම සාක්ෂිකරු අත්සන් තබා ඇති ස්ථානයේ සිටින පුද්ගලයාද තමා විසින් පෙර හඳුනාගත් රතු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන සිටි පුද්ගලයා වශයෙන් හඳුනාගෙන ඇති අතර එම පුද්ගලයන් දෙදෙනාම 2019.04.20 දින හෝටලයට පැමිණි පුද්ගලයන් දෙදෙනාම 2019.04.20 දින හෝටලයට පැමිණි පුද්ගලයන් දෙදෙනාම බවත් 2019.04.21 දිනද ඔවුන් හෝටලයේම සිටි තමා විසින් ඉහත කී පරිදි

CCTV දර්ශන මඟින් හඳුනාගත් පුද්ගලයන් දෙදෙනා බවට සාක්ෂිකරු එකහෙලාම හඳුනාගෙන සාක්ෂි දී ඇත.

මෙම සාක්ෂිකරුව 01, 10, 22 සහ 24 චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතීඥ මහතා විසින් 03, 07, 08, 11, 12, 18, 19, 20, 21 05, සහ 16 චූදිතයන් වෙනුවෙන් ද, 13 වන චූදිත වෙනුවෙන් ද, හරස් ප්‍රශ්න ඇසීමට ලක් කර ඇති අතර, අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට කරුණු දක්වා ඇත.

මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේ දී විත්තිය විසින් ගෙන ඇති ස්ථාවරය වන්නේ 2019 වසරේ අප්‍රේල් මාසය වනවිට ෂැංග්‍රිලා හෝටලයට අමුත්තන් පැමිණෙන විට හෝටලයට පිවිසීමට පෙර ඔවුන්ව පරීක්ෂණ යන්ත්‍රය තුළින් පරික්ෂා කර ඇතුළත් කිරීම කරන බවත් ඒ අනුව හෝටලයට පැමිණෙන සෑම පුද්ගලයෙකුවම හෝටලයට ඇතුළුවීමට ප්‍රථමයෙන් පරික්ෂා කිරීම සඳහා පරීක්ෂණ යන්ත්‍රන ක්‍රමයක් හෝ 2019 අප්‍රේල් මාසය වන විට එවැනි පරීක්ෂණ යන්ත්‍රයක් තිබුණේ නැති බවත් සාක්ෂිකරු එය එක හෙලාම ප්‍රතික්ෂේප කරමින් දැනුවත් කර ඇත්තේ එවැනි ස්කෑන් පරීක්ෂණ යන්ත්‍රයක් ෂැංග්‍රිලා හෝටලයේ තිබුණේ නැති බවත් වන අතර එසේම, මෙම නඩුවට අදාළ ප්‍රශ්නගත දිනයේ සිදුවූ සියලුම දේවල් පටිගත කරපු සියලුම දේවල් අධිකරණයට ඉදිරිපත් කර නොමැති බවත් එසේම, ඉදිරිපත් කර ඇති CCTV දර්ශනද යම් කෙනෙක් විසින්

සංස්කරණය කරන ලද ඒවා බවට යෝජනා කර ඇත ද එසේම, පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සියලුම වීඩියෝ දර්ශන පසුව සංස්කරණය කරන ලද දර්ශන බවට යෝජනා කර ඇත ද, සාක්ෂිකරු එකී යෝජනාවන් එකහෙලාම ප්‍රතික්ෂේප කර ඇති ආකාරය ඔහුගේ සාක්ෂිය පරීක්ෂා කර බැලීමේදී පෙනී යන අතර සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත්තේ එවකට ෂැංග්‍රිලා හෝටලයේ පැවති CCTV පද්ධතිය තිබෙන හෝටලයේ ආරක්ෂක අධ්‍යක්ෂකගේ අනුමැතිය නොමැතිව කිසිදු වෙනත් අයෙකුට ඇතුළු වීමට නොහැකි බවත් තමා විසින් අධිකරණයේ නරඹන ලද කිසිදු වීඩියෝ දර්ශනයක් කිසිදු ආකාරයකින් සංස්කරණය වීමක් වී නොමැති බවයි.

පැ.සා.2191 ළහිරු ශානිෂ විතානගේ යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ 2017 වසරේ සිට සේවයේ නිරත වූ බවත් එම හෝටලය අමුත්තන් සඳහා විවෘත කරන ලද්දේ 2017.11.16 දින වන බවත් එයට ප්‍රථමයෙන් තමා 2016 සහ 2017 වසරවල ෂැංග්‍රිලා හෝටලය හම්බන්තොට සේවය කළ බවත් 2012 සිට 2016 දක්වා අබුඩාබිහි ෂැංග්‍රිලා හෝටලයේ සේවය කරන ලද බවත් තමා අබුඩාබි ෂැංග්‍රිලා හෝටලයේ CCTV ක්‍රියාකරුවෙකු වශයෙන් සේවය කළ බවත් තමා කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ ආරක්ෂ අංශයේ වැඩ පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරන ලද බවත් 2019.04.21 දින වනවිට තමා කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ ආරක්ෂක අධීක්ෂකයෙකු ලෙස සේවය කරන ලද බවත් පවසා ඇත.

2019.04.21 දිනය වන විට ෂැංග්‍රිලා හෝටලයේ ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරීන් යොදා තිබුණු බවත් ඇවන්ගාඩ් ආයතනය සහ ස්ටීල් වඕර්ඩ් නැමැති ආයතන දෙකෙන්ද ආරක්ෂක නිලධාරීන්ගේ සේවය ලබා ගත් බවත් එම කාලයේ කිසිදු ආරක්ෂක උපකරණ පද්ධතියක් තිබුණේ නැති බව CCTV කැමරයක් වෙනම තිබුණු බවත් ඇතුළු වන වාහන සාමන්‍යය පරික්ෂා කිරීම් සිදු කළ බවත් හෝටලයේ සේවකයන්ගේ බෑග් ආදිය පරික්ෂා කිරීම සිදු කළ බවත් පවසා ඇත.

2019.04.21 දින වන විට ෂැංග්‍රිලා හෝටලයේ පැවති CCTV පද්ධතිය එක්ස්ප්‍රෝ ලංකා ආයතනය මඟින් සවිකර තිබූ බවත් තමා 2017 වසරේ සේවයට එනවිටත් එය සවිකර තිබූ බව එම CCTV යන්ත්‍ර පරික්ෂා කිරීම සඳහා වරින් වර එක්ස්ප්‍රෝ ලංකා ආයතනයේ නියෝජිතයන් පැමිණි බවත් මෙම නඩුවේ සාක්ෂිකරුවෙකු වන ෂැංග්‍රිලා හෝටලයේ *CCTV* ප්‍රධාන කාර්මික ශිල්පි තරිදු අමින්ජිත් යන අය සිටි බව හෝටලයේ *CCTV* කැමරා පද්ධතිය පරික්ෂා කර බලන නිලධාරීන් අධික්ෂණය කිරීමේ කාර්ය තමාට පැවරී තිබුණු බවත් තමාට ඉහලින් සකකාර ආරක්ෂක කළාමණාකරු ධම්මික යන අයත් ආරක්ෂක සහායක මාලක චන්ද්‍රදාස යන අයත් සිටි බවත් 2019.04.21 දින *CCTV* දර්ශන පරික්ෂා කිරීම සඳහා යොදවා සිටි ඒ තම ආයතනයේ සේවයේ නියුතු රුක්මන් අය යන බවත් රුක්මන් නැමැත්තා 2019.04.21 දින උදේ 7 සිට සවස 4 දක්වා සේවා මුරයට සේවය කරන ලද බවත් එදින තමා සමඟ කනිෂ්ක නැමැති අධික්ෂණ

නිලධාරියාද *CCTV* කාමරයේ සිටි බවත් *CCTV* පද්ධතිය හෝටලයේ සේවකයන් පැමිණීමට ඇති දොරටුවේ දකුණ පස පිහිටා තිබුණු බවත් එම *CCTV* කාමරයට ඕනෑම අයෙකුට ඕනෑම අවස්ථාවක අතුළු වීමට බැරි කාමරයක් බවත් එහි දොරට කී කාඩ් එකක් තිබුණ බවත් ඒ අනුව *CCTV* කාමරයට වෙනත් කිසිදු ඇතුළු වීමට වෙනත් කිසිදු යතුරක් නොමැති බවත් කී කාඩ් එක මඟින් පමණක් ඇතුළු විය හැකි බවත් *CCTV* කාමරයට මුලින්ම ඇතුළු වූ පසු එය තුළ ඇති එෆ් සී සී එනම් ෆයර් කමාන්ඩ් සෙන්ටර් තිබුණු බවත් පවසා ඇති අතර මෙම *CCTV* මෙහෙයුම් මැදිරියට අනවසරයෙන් කිසිවෙකුටවත් ඇතුළු වීමට නොහැකි බවට ඔහු පවසා ඇත.

2019.04.21 වෙනිදා වනවිට කොළඹ ෂැන්ගිලා හෝටලයේ *CCTV* කැමරා 362 ක් ස්ථාපනය කර තිබුණු බවත් *CCTV* පද්ධතිය බාහිරින් නඩත්තු කිරීමට පැමිණෙන අයටද ආරක්ෂ අධ්‍යක්ෂකගෙන් අවසර ගතයුතු බවත් පවසා ඇත. 2019.04.21 වන දින උදේ වරුවේ අටයි පනස් ගානකට පමණ බෝම්බ පිපිරීමක් සිදු වූ බවත් එම ශබ්දය ඇසෙද්දී තමා ආරක්ෂක කාර්යාලයේ සිටි බවත් එම අවස්ථාවේදී *CCTV* මෙහෙයුම් මැදිරිය තුළ රුක්මන් නැමති නිලධාරියා දර්ශන පරික්ෂා කරමින් සිටි බවත් තමාට ශබ්දයක් ඇසී තමා එළියට ගිය බවත් එවිටම ෂැංග්‍රිලා හෝටලයේ චේෆ් කෙනෙක් ලේත් සමග එළියට පැමිණෙනවා දැක්ක බවත් ඉන්පසු තමා හෝටලයෙන් පිටතට යා හැකි සේවකයන් හෝටලයෙන් පිවිසෙන දොරෙන් පිටතට ගමන් කර තමා ලොබිය තුළට ගමන් කළ බවත් එම

ලොබියට පිපිරුම් සිදුවුණු තුන්වන මහල දර්ශනය වන බවත් එම ස්ථානයේ එම දර්ශනය වන තැන මිනිසුන් කෑ ගසමින් සිටිනවා දැක්ක බවත් එතන තිබුණ වීදුරු සියල්ල කැඩී ලොබියෙන් පිටතට පැමිණ තිබුණු බවත් මනුෂ්‍යයෙකුගේ අත් කැබැල්ලක් තමාගේ ඉස්සරහා තිබුණු බවත් තමා ලොබි එකේ සිට පිපිරුම් සිදුවුණ ස්ථානයට යන්න උත්සාහ කලද එතනින් යන්න අපහසු වූ බවත් පසුව තමා කෙසේ හෝ පිපිරුම් ස්ථානය ගිය බවත් කෙසේ වෙතත් *CCTV* දර්ශන නැරඹූ රාජකාරි සිදු කළ රුක්මන් නැමැත්තා දිගින් දිගටම එනම් පිපිරුමෙන් පසුවද *CCTV* කාමරයේ සිටියේ නැති බව තමාලා සියලු දෙනා එකතු වී තුවාලකරුවන් එළියට අරගෙන යන්න උදව් කළ බවත් සාක්ෂිකරු පවසා ඇත.

පසුව ෂැංග්‍රිලා හෝටලයේ සාමාන්‍යාධිකාරිවරයා විසින් සිද්ධිය සිදු වී සුළු මොහොතකට පසුව තමාට *CCTV* දර්ශන නැරඹීමට නියෝග කළ බවත් එම ස්ථානයේ කනිෂ්කද සිටි බවත් තමා සහ කනිෂ්ක හැර වෙනත් කිසිවෙකු එම ස්ථානයට ආ නැති බවත් *CCTV* දර්ශන නැරඹීමේදී ටේබල් වන් නැමැති අවන්හල ඇතුළත සහ එයට ඇතුල්වන ස්ථානයෙහි සැක කටයුතු පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධයෙන් තමාට *CCTV* දර්ශනවලින් තමාට දකින්න ලැබුණු බවත් කනිෂ්ක නැමැති නිලධාරියාද තමාට එය පෙන්වූ බවත් එම දර්ශනවලට අනුව එම පුද්ගලයන් දෙදෙනා 6 වෙනි මහලේ කාමර අංක 616 සිට ටේබල් වන් අවන්හලට පැමිණි බව පෙනී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 වන දින මෙම සිද්ධියෙන් බෝම්බ පිපිරීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ස්ථාන පරික්ෂාවට පැමිණි බවත් එදිනට අදාළ *CCTV* දර්ශන එක්ස්ප්‍රෝ ආයතනය හරහා පසුව විමර්ශන නිලධාරීන්ට නිකුත් කිරීම කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, 6 වන මහලේ 616 නැමැති කාමරය වෙන් කරවා ගැනීම සම්බන්ධයෙන් තමාලා විසින් තොරතුරු සොයා බැලූ බව තමා ෆ්‍රන්ට් ඔෆිස් එකෙන් චෙක් කර 616 කාමරයේ ලැහුම්ගෙන සිටි අමුත්තන් සම්බන්ධයෙන් සොයා බැලූ බවත් නම් වශයෙන් අනාවරණය වුවද තමාට එම නම් හරියට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, අදාළ කාමරයට ප්‍රවේශය සඳහා යතුරු කාඩ් පතක් ෆ්‍රන්ට් ඔෆිස් එකෙන් නිකුත් කරන බවත් එසේම, යතුරු කාඩ් පතක් භාවිතා කරමින් හෝටලයේ කාමරයක දොරක යතුරු විවෘත කිරීමක් ඒ සම්බන්ධයෙන් ගබඩා වන දත්ත 2019.04.21 වන දින වනවිට තිබුණු බවත් තමාටද එම දත්ත පරික්ෂා කර බැලීමට හැකියාවක් තිබුණු බවත් තමා ඒ අනුව 06 වෙනි මහලේ අංක 616 දරන කාමරයට අදාළ දත්ත පරික්ෂා කළ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමා විසින් කරුණු පරික්ෂා කර බැලීමේදී ෆ්‍රන්ට් ඔෆිස් එකෙන් ලැබුණු කාඩ් එක අනුව අදාළ කාමරය භාවිතා කරපු සැකකරුවන් කාමරය දොර ප්‍රථම වතාවට ඇර තිබුණේ 2019.04.20 වන දින බවට හෙලි වන

බවත් එයට අදාළ 616 කාමරයේ දොර ඇරීම සහ වැසීමට අදාළ දත්ත ලේඛන බවට පත් කර තමාලා විසින් අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුවට බාරදුන් බවත් පවසා තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරදුන් ලේඛනය සාක්ෂිකරු විවෘත අධිකරණයේදී හඳුනාගෙන එය ඉලෙක්ට්‍රෝනික් ඩ්‍රෝරියකින් රූම් නම්බර් 0616 ලෙස මාතෘකාව සඳහන් ලේඛනයේ පිටු අංක 50 සිට 59 දක්වා වන ලේඛනය පැ.04 ලෙස ලකුණු කර ඇති අතර, එම පැ.04 දරන ලේඛනයෙහි තමා විසින් දකුණු පස කෙලවරේ 2019.09.25 ලෙස දිනය තබා අත්සන් කරන බවට පවසා එය පැ.04 (B) ලෙස ලකුණු කර ඇත.

එසේම, ඔහු සාක්ෂි දී පවසා ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයේ 6 වෙනි මහලේ අංක 616 කාමරය පිහිටා තිබුණු ස්ථානය ආවරණය වන පරිදි CCTV කැමරා සවිකර තිබුණු බවටත් එයට අදාළව තමා CCTV දර්ශන පරීක්ෂා කළ බවත් පවසා පෙර අවස්ථාවක පැ.27 ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශනය පරීක්ෂා කර බලා එම දර්ශනයේ තිබෙන්නේ 2019.04.20 දින පැය 20.11 ට පුද්ගලයන් දෙදෙනෙක් 616 කාමරයට ඇතුල් වෙන බව නිරීක්ෂණය කළ බවත් අදාළ කැමරාව 613 වැනි කාමරය ඉදිරිපස උඩින් සිවිලිමේ සවිකර තිබුණු *CCTV* කැමරාවක් බවත් අදාළ *CCTV* දර්ශනය 2019.04.20 දින පටිගත වූ දර්ශනයක් බවත් ඒ අනුව එදින පුද්ගලයන් දෙදෙනෙකු විසින් 616 කාමරයේ දොර විවෘත කරගෙන එයට ඇතුළුවීමට

අදාළ දොර විවෘත කිරීම සම්බන්ධ සටහන සාක්ෂිකරු විසින් හඳුනාගෙන එය පැ.4 (C) ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.03 (28) වශයෙන් ලකුණු කර ඇති *CCTV* දර්ශනය විවෘත අධිකරණයේ විකාශය කර නැරඹීමට අවස්ථාව ලබා දුන් පසු සාක්ෂිකරු එය පරීක්ෂා කර බලා එයද 06 වන මහලේ ජී/ආර් කොරිඩෝ බී බී ඒ එස් ටි 613 කාමරයේ ඉහළින් සවිකර තිබූ කැමරාවට අදාළව බවත් පැ.03 (28) දර්ශන පෙළට අනුව 616 කාමරයට ඇතුළු වූ පුද්ගලයන් දෙදෙනාගෙන් පළවෙනියෙන්ම කාමරයට ඇතුළු වූ රතු පාට ටී ෂර්ට් එකෙන් පැමිණි පුද්ගලයා එම කාමරයේ දොර විවෘත කර එළියට පැමිණි බවත් පවසා එයට අදාළ සටහන තිබෙන ස්ථානයේ පැ.04 (D) ලෙස ලකුණු කර ඇත. තමා විසින් පැ.03 (28) දරන *CCTV* දර්ශනය ෂැංග්‍රිලා හෝටලයේදී තමා විසින් නැරඹූ ආකාරයෙන්ම කිසිදු වෙනසක් නොමැතිව අධිකරණයට ඉදිරියට පෙනෙන බවට පවසා ඇත.

සාක්ෂිකරු පැ.03 (39) දරන *CCTV* දර්ශනය පරීක්ෂා කර බලමින් එයද තමා පෙර සඳහන් කළ පරිදි 06 වෙනි මහලේ කොරිඩෝ බී ඊස්ට් 613 කාමරයේ උඩ සවිකර තිබූ කැමරාවට අදාළව *CCTV* දර්ශනයක් බවත් එයට අනුව පෙර පැ.327 සහ පැ.328 යන දර්ශන තුළ සිටි පුද්ගලයා එම කාමරයට ඇතුළුවීම කරන බවට සාක්ෂිකරු *CCTV* රූපරාමු තුළින්

හඳුනාගෙන ඇත. එසේම, පැ.339 ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශන තමා විසින් හෝටලයේදී නැරඹූ අවස්ථාවේ තිබූ තත්ත්වයෙහි කිසිදු වෙනසක් නොමැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.3 (40) ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශන පෙල විවෘත අධිකරණයේදී වාදනය කිරීමේදී එයද 6 වන මහලේ කොරිඩෝ බී ඊස්ට් 613 අංක දරන කාමරය ඉදිරිපස උඩින් සවිකර තිබූ කැමරාවට අදාළ *CCTV* දර්ශනයක් බවත් එම දර්ශනයට අනුව තමා විසින් පෙර දර්ශනවල පෙන්වා දුන් පුද්ගලයා 616 කාමරයෙන් එළියට එනවා දිස්වෙන බවත් පෙර අවස්ථාවක පැ.3 (48) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනයද විකාශනය කර සාක්ෂිකරුට නැරඹීමට ඉඩ ලබා දී ඇති අතර එය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එයද 6 වෙනි මහලේ කොරිඩෝ බී ඊස්ට් නැමැති ස්ථානයෙහි 613 කාමරයට උඩින් සවිකර තිබූ කැමරාවට අදාළ දර්ශනයක් බවත් එයට අනුව 616 කාමරයෙන් එළියට ආ පුද්ගලයා නැවතත් 616 කාමරයට ඇතුළු වෙනවා දිස්වෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරු වැඩි දුරටත් පවසා ඇත්තේ පැ 3 (48), පැ.3 (49) යන දර්ශනද 6 වන මහලේ සවිකර තිබූ කැමරාවට අදාළ දර්ශන බවත් එම දර්ශනවලට අනුව 616 කාමරයේ සිටි පුද්ගලයන් දෙදෙනා 2019.04.21 පැය 8.50 ට 616 දරන කාමරයේ ප්‍රධාන දොරටුවෙන් පිටවීම සිදු කරන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, 6 වන මහලේ පිහිටි 616 දරන කාමරය

සඳහා යතුරු කාඩ් පත නිකුත් කර තිබුණේ ඊබ්රාහිම් ඉල්හාම් මොහොමඩ් යන නම සඳහන් තැනැත්තාට නිකුත් කර ඇති බවත් එම නම ලේඛනයට ඇතුළු වන්නේ ෆ්‍රන්ට් ඔෆිස් එකෙන් එම කාමරයට ගෙස්ට් පැමිණ කාමරය ලබා ගන්නා අවස්ථාවේදී බවත් වේ.

තමා විසින් අධිකරණයේ භඳුනා ගන්නා ලද *CCTV* දර්ශන සංරක්ෂණය කර තැබීමේ අවශ්‍යතාවයක් තිබුණු බවත් ෂැංග්‍රිලා හෝටලයේ ජෙනරල් මැනේජර් විසින් තීරණයක් ගෙන 2019.04.21 දිනට අදාළ පැවති *CCTV* කැමරාවලට අදාළ සර්වස් සංරක්ෂණය කොට ආරක්ෂිතව තබා ඒ වෙනුවට අලුත් සර්වස් යොදන ලද බවත් එම ක්‍රියාව සිදු කරන ලද්දේ ද එක්ස්ප්‍රෝ ටෙක්නොලජී ආයතනය විසින්ම බවත් සාක්ෂිකරු පවසා ඇත.

විමර්ශන නිලධාරීන්ට අමතරව වෙනත් රජයේ ආයතනවල නිලධාරීන් විසින් අදාළ *CCTV* දර්ශන උකහා ගැනීමක් කළාද යන්න සම්බන්ධයෙන් තමාට මතකයක් නැති බවත් තමා විසින් විමර්ශන නිලධාරීන්ට ප්‍රකාශයක් ලබාදීමේදී පැ.04 ලේඛනය ලිඛිතව ටයිප් කර තමා බාර දුන් බවත් එහි තමාගේ අත්සනද තිබෙන බව පවසා හඳුනාගෙන ඇත. එම ලේඛනයෙහි හෝටලයෙහි ආරක්ෂක අංශයේ සිටි සේවකයන්ගේ නම්ද ඔහු විසින් එදින කුමන සේවා මුරයක් යටතේ සේවය කරන ලද්දේද යන්න සම්බන්ධයෙන් විස්තර සඳහන් කර තිබෙන බවටද පවසා ඇත. එම ලේඛනයට අනුව තමා 2019.04.21 වන දින උදෑසන 7 ට ආරම්භක සේවා

මුරයෙහි රාජකාරි කළ බවට තමාගේ විස්තර ඇතුළත් වන බවත් තමා සමග සේවය කල කනිෂ්ක හේරත් නැමැති ආරක්ෂක අධීක්ෂක නිලධාරියා එදින තමාට පසුව අංක 2 යටතේ සේවයට වාර්තා කිරීමට අදාළ විස්තර ඇතුළත් වී තිබුණු බවත් එසේම, තමා සාක්ෂි ලබා දුන් *CCTV* දර්ශන පරීක්ෂා කිරීමේ රාජකාරිය සිදු කළ රුක්මන් නැමැති නිලධාරියාගේ නම අංක 4 ලෙස එම ලේඛනයේම සඳහන් වී තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

තව දුරටත් සාක්ෂි ලබා දෙමින් එම *CCTV* කැමරා පද්ධතියට අමතරව 2019.04.21 දිනය වනවිට හෝටලයට පැමිණෙන අමුත්තන්ගේ ශරීර පරීක්ෂා කිරීම සඳහා විශේෂිත උපකරණ කිසිවක් සවිකර තිබී නොමැති බවත් කෙසේ වෙතත් මේ වනවිට *Xray machine metal ditector, walk through metal ditector* ආදිය හෝටලයේ ප්‍රධාන පිවිසුම් වල සවිකර තිබෙන බවත් 2019.04.21 දින වන විට එවැනි උපකරණ සවිකර නොතිබුණු නිසා පිටතින් පැමිණෙන අමුත්තන්ට නිදහසේ හෝටලයට ඇතුළුවීමට හැකියාව තිබුණු බවත් පවසා ඇත.

2019.04.21 වන දින 08.50 ට සහ ඒ ආසන්න කාලයේ බෝම්බ පිපිරීමෙන් පසුව අංක 616 දරන කාමරයෙහි දොර ස්ටාෆ් කාඩ් එකකින් පැය 09.52 ට විවෘත කර තිබුණු බවත් එයට පසුව තමාගේ කාඩ් එකෙන් එම කාමරය විවෘත කරන ලද බවත් STF එකේ නිලධාරීන් පැමිණි පසු 616

කාමරයේ අදාළ පිපිරීම කර ගත්ත පුද්ගලයන් කාමරයෙන් පිටතට පැමිණි නිසා එම කාමරයේ තවත් මොනවහරි තියෙනවාද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා එම කාමරයට තමා STF නිලධාරීන් සමඟ එම ස්ථානයට ගිය බවත් පවසා ඇත.

STF නිලධාරීන් එම කාමරය පරීක්ෂා කරන උපකරණ රැගෙන විත් තිබුණු බවත් තමා ඒ ස්ථානයට ගොස් ඒ කාමරයේ දොර විවෘත කරන ආකාරය *STF* නිලධාරීන්ට කියා දී එම කාමරයේ දොර විවෘත කළ බවත් එම *STF* නිලධාරීන් එම අවසථාවේ නිළ ඇදුමින් සහ නිළ හැඳුනුම්පත් සහිතව පැමිණි බවත් ඔවුන් කාමරය පරීක්ෂා කරන අවස්ථාවේ තමා කාමරයෙන් පිටත සිටි බවත් එම අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරියෙක් වෙන අම්පාවිල මහතා ඔහුගේ නිළ හැඳුනුම්පතද තමාට පෙන්වා එම ස්ථානයට පැමිණි බවත් ඔහු සමග අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තවත් නිලධාරීන් පැමිණ සිටි බවත් පොලිස් නිලධාරීන්ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද පැමිණි බවත් එම 616 කාමරයට කිසිම අයෙකුට ඇතුළු වෙන්නට දෙන්න එපා බව පවසා එම ස්ථානයේ ආරක්ෂක නිලධාරීන් යොදවා එම ස්ථානයේ *CCTV* කැමරා මගින් නිරීක්ෂණය කරන්න යැයි පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට ලක්වෙමින් පවසා ඇත්තේ 2019.04.21 දින උදැසන 7 ට රාජකාරි ආරම්භ කිරීමට පෙර හෝටලයේ

සියලුම ආරක්ෂක නිලධාරීන් සහභාගී වී ආරක්ෂක රැස්වීමක් පැවතුණු බවත් එම රැස්වීමේදී ඒ වනවිට යම් ආරක්ෂක අවදානමක් සම්බන්ධයෙන් තොරතුරක් වාර්තා වන බවට එනම් සිකියුරිටි ඇලට් එකක් තිබුණු බවට සාකච්ඡා වුනේ නැති බවත් එම රැස්වීමට තමාද සහභාගී වුනු බවත් එම අවස්ථාව වනවිට සැක කටයුතු දෙයක් ගැන කිසිවක් සාකච්ඡා වුනෙ නැති බවත් එදින හෝටලයේ සිටින කිසිම අමුත්තෙකු සම්බන්ධයෙන් කිසිදු සැකයක් මතු වෙලා තිබුණේ නැති බවත් පිපිරීම සිදු වී විනාඩි 45 කට පමණ පසුව *STF* එකේ නිලධාරීන් හෝටලයට පැමිණි බවත් ඔවුන් *CCTV* පරීක්ෂාව සඳහා ඉල්ලීමක් නොකළ බවත් ඒ සඳහා ඉල්ලීම කළේ *CID* එකේ නිලධාරීන් විසින් බවත් බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ *STF* නිලධාරීන් 6 වෙනි මහලේ පිහිටි අංක 616 කාමරය අසලට කැඳවා ගියේ තමා විසින් බවට සාක්ෂිකරු පවසා ඇත.

පැ.04 ලෙස ලකුණු කරන ලද ලේඛනයෙහි 2019.04.21 දින පෙරවරු 09.52 ට 616 කාමරයට ප්‍රවේශ වීමක් සම්බන්ධයෙන් ඇති සටහන පළවන චූදිත වෙනුවෙන් 1 (B) එක ලෙස සහ එක වි 1 (A) ලෙස ලකුණු කර ඇති අතර මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදුන් ප්‍රකාශයේ 616 කාමරයේ දොර සේවකයන් විසින් ඇරියා යැයි සඳහන් කර තිබෙන බව සඳහන් කර ඇත ද, අධිකරණයේ සාක්ෂි ලබාදෙමින් *STF* එකේ නිලධාරීන් තමන්ගේ කාඩ් එක පාවිච්චි කර දොර ඇරියා යැයි පවසා ඇති කරුණ උපුටා දක්වමින්

මෙම සාක්ෂිකරු අසත්‍ය පවසන බවට යෝජනා කර ඇත. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ තමාගේ ප්‍රකාශය ලබා ගත් දවසේ තමා පැවසුවේ කුමක්ද යන්න තමාට හරියට මතක නැති බව වේ. ඒ අනුව හෝටලයේ සේවකයන් විසින් විවෘත කරනවා යැයි මෙම සාක්ෂිකරුගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද ප්‍රකාශයේ සඳහන් කරුණ පරස්පරතාවයක් ලෙස පළවන චූදිත වෙනුවෙන් ලකුණු කරමින් එය **1 (වී) (2)** ලෙස ලකුණු කර ඇත.

පැ.04 ලෙස ලකුණු කරන ලද ලේඛනයට අනුව 2019.04.03 දින සිට 2019.04.21 දක්වා 616 කාමරයේ සිටි අමුත්තන්ගේ විස්තර සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසමින් 2019.04.14 දිනට අදාළ ගෙස්ට් කාඩ් ඇක්ස්ටෙප්ටඩ් යනුවෙන් සටහනක් යොදන බැවින් එදින යම් අමුත්තෙකු එම කාමරය භාවිතා කර ඇති බවට පෙන්වා දෙමින් අදාළ කරුණ 1 (වි) (1) (බි) ලෙස ලකුණු කර ඇත. කෙසේ වෙතත් එයට අදාළ අමුත්තාගේ නමක් එම ලේඛනයෙහි සඳහන් වී නොමැති බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, 2019.04.15 එදිනට අදාළ පළවෙනි Entry එකේද පෙර පරිදිම Guest Card Accepted යැයි සඳහනක් තිබෙන බවත් එහිද අමුත්තාගේ නම සඳහන් වන්නේ නැති බවත් පෙන්වා දී ඇති අතර එම කොටස එක වි 1 (C) ලෙස ලකුණු කර ඇත. එසේම, පැ.04 ලේඛනයේ 53 වන පිටුවේ 2019.04.12 දින පස්වරු 13.44 ට ද අමුත්තකු ඇතුළු වී තිබෙන බවත් එම තැනැත්තාගේ නමද සඳහන් වන්නේ නැති

බවට පවසා ඇති අතර එම කොටස 1 (වි)1 (වි)1 ලෙස ලකුණු කර ඇත. එසේම, පැ.04 ලේඛනයෙහි 2019.04.21 දින 9.52 ට STF නිලධාරීන් ඇතුළු වුනු බවට සටහනෙහි ස්ටාෆ් යනුවෙන් සඳහන් වී තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයේ Guest Entry එකෙන් ගියපු *Guest* කෙනෙකුගේ නම වාර්තාවට ඇතුල් කරන්නේ නැත්තේ ඒ තැනැත්තා විශේෂ පුද්ගලයෙක් නිසා බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ තමා දන්න විදියට එවැනි තත්ත්වයක් නොමැති බවත් කෙසේ නමුත් ලැයිස්තුවට නම් ඇතුල් කරන්නේ තමාලා නොව Front office එකෙන් බවයි. විත්තියෙන් මෙම සාක්ෂිකරුට තවදුරටත් යෝජනා කර ඇත්තේ *මෙම* කාමරයට ඇවන්ගාඩ් ආරක්ෂක නිලධාරීන්ට ද නම සඳහන් නොකර ඇතුළු වීමට විශේෂ කාඩ් පතක් තිබෙන බවට වුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත. එසේම, ෂැංග්‍රිලා හෝටලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇවන්ගාඩ් ආයතනයේ උසස් නිලධාරීන් හෝටලයේ සිටිය බවට විත්තියෙන් කරන ලද යෝජනාවද සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර ඇත. විත්තියෙන් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ඔහු පැවසූ පරිදි 2019.04.21 දින 6 වන මහලේ 616 කාමරයට STF එකේ කට්ටිය යන්නට ප්‍රථමයෙන් ආරක්ෂක නිලධාරීන් එම කාමරයේ රැඳි සිටි බවටද වුවද සාක්ෂිකරු එයද ප්‍රතික්ෂේප කර ඇත.

හරස් ප්‍රශ්න වල දී පැ.03 (27) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය සාක්ෂිකරුට ප්‍රදර්ශනය කර ඇති අතර එම දර්ශනයෙහි 616 ලෙස කාමරයේ අංකය පෙනෙන්නේ නැති බවත් සාක්ෂිකරු පිළිගෙන ඇති අතර සාක්ෂිකරු එය විස්තර කරමින් පවසා ඇත්තේ අදාළ රූපරාමුවට අදාළ කාමරය පටන් ගන්නේ කොනේ තිබෙන 613 කාමරයෙන් බවත් ඉන්පසුව 614, 615 කාමර තිබෙන බවට තමාට පැවසිය හැකි බවයි. CCTV දර්ශනවල කාමරවල අංක ලියා තිබූ බැවින් ඒ අනුව තමාට එය පැහැදිලිව පැවසිය හැකි බවයි. විත්තිය විසින් 5 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදි පැමිණිල්ලේ පැ.03 (1) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන සහ පැ.3 (28) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනද පැ.3 (08) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයද පැ.3 (36) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනද පෙන්වා හරස් ප්‍රශ්න අසා ඇති අතර, විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, 05 (v1) ලෙස විත්තියෙන් ලකුණු කර ඇති සැනලි ධාවකයේ අඩංගු CCTV දර්ශනවලට අනුව 2019.04.20 දින ඉල්හාම් නමැත්තා පිලාරුස් හෝටලයෙහි 2019.04.21 දින පැය 01:34:42 වේලාවට සිට ඇත්තේ ඉහත කී පිලාරුස් හෝටලයේ බවට යෝජනා කර ඇති අතර, අදාළ CCTV දර්ශනයට අනුව එම තැනැත්තා එම ස්ථානයේ සිට නැගිට යන ආකාරයක් සාක්ෂිකරුට යෝජනා කරමින් ඔහුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ ඒ අනුව 2019 අප්‍රේල් 21 පාන්දර 1.48 ට එම තැනැත්තා පිලාරුස් හෝටලයේ සිටි බැවින් ඔහුට එම වේලාවේම

ෂැංග්‍රිලා හෝටලයේ සිටීමට විදියක් නොමැති බවට වුවද, සාක්ෂිකරු පවසා ඇත්තේ 05 (වි1H*)* ලෙස චිත්තිය විසින් ලකුණු කරන ලද CCTV දර්ශනයෙහි සිටි පුද්ගලයාට සමාන පුද්ගලයෙක් එහි සිටින බව වන අතර, පැ.3 (37) ලෙස ලකුණු කර ඇති CCTV වීඩියෝව දර්ශනය කර පෙන්වා ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයට අදාළ පැ.3 (37) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයට අනුව පැය 01.48 ට *lift* එකට නගින්නට සූදානමින් සිටින පුද්ගලයා චිත්තිය විසින් 05 (වි1H*)* ලෙස ලකුණු කරන්නට යෙදුන CCTV දර්ශනයට අනුව බම්බලපිටිය පිලාරූස් හෝටලයේ එම වේලාවේම සිටීමට හැකියාවක් නැති බවට යෝජනා කර ඇතද සාක්ෂිකරු පවසා ඇත්තේ තමා පවසා සිටියේ එම පුද්ගලයාට සමාන පුද්ගලයෙක් බවත් එම පුද්ගලයාම යැයි තමා පවසා සිටියේ නැති බවයි.

චිත්තිය දිගින් දිගටම මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම CCTV දර්ශන සංස්කරණය කරමින් පසුව සංස්කරණය කළ ඒවා බවට වුවද තමාට ඒ සම්බන්ධයෙන් දැනීමක් නොමැති බවයි .

මෙම සාක්ෂිකරු වැඩිදුර හරස් ප්‍රශ්නවලට ලක්වෙමින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයට අදාළව පැවති *CCTV* දර්ශන පෙන්ඩයිව් එකකට ගැනීමට හැකියාව තිබෙන්නේ අදාළ සේවා සැපයුම කරන ලද එක්ස්ප්‍රෝ ලංකා ආයතනයට පමණක් බවත් ෂැංග්‍රිලා හෝටලයේ සේවකයන්ට එකී තොරතුරු ලබා ගැනීමට නොහැකි අතර

සාක්ෂිකරු පවසා ඇත්තේ එක්ස්ප්‍රෝ ලංකා ආයතනයේ නිලධාරීන් පැමිණි පසු ආරක්ෂක අංශයේ නිලධාරීන්ද එම ස්ථානයේ සිටිය යුතු බවත් එසේම, 13 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුට දිගින් දිගටම යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ලේඛන විමර්ශන නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ට අවශ්‍යය පරිදි පසුව සකස් කර දුන් ලේඛන බවට වුවද සාක්ෂිකරු එකී යෝජනාවන් එක හෙලාම ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ එවැනි කිසිදු ලේඛනයක් සාදා නැති බවත් ඒ වන විටත් තමාලා භාරයේ තිබූ ලේඛනවල ඡායාස්ථ පිටපත් පමණක් විමර්ශන නිලධාරීන්ට බාර දීම සිදු කරන ලද බවයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2192 හෝන්ගනගේ තරිඳු අමරජිත් සිල්වා නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 2012 වසරේ සිට 2021 වසර දක්වා එක්ස්ප්‍රෝ ලංකා ටෙක්නොලජී ආයතනයෙහි සහාය කළමණාකරුවෙකු ලෙස සේවය කළ බවත් එම ආයතනය මඟින් *CCTV,* සිකියුරිටි එලාම් සිස්ටම්, පබ්ලික් එඩ්‍රස්, වීඩියෝ ඕඩියෝ, පහසුකම් සේවා සපයන ආයතනයක් බවත් පවසා ඇති අතර, ඔහු තවදුරටත් පවසා ඇත්තේ ඔහුගේ පාසල් අධ්‍යාපනයෙන් පසුව ටෙලිකොමියුනිකේෂන් සිස්ටම් සම්බන්ධ HND ඩිප්ලෝමාවක් හදාර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පුහුණු තාක්ෂණවේදියෙකු ලෙසද කටයුතු කර ඉන්පසු එක්ස්ප්‍රෝ ටෙක්නොලොජී ආයතනයට සම්බන්ධ වූ බවත් පවසා ඇති අතර, තම ආයතනය මඟින් 2019 අප්‍රේල් මාසය වන විට බත්තරමුල්ල RDA

ගොඩනැගිල්ල බම්බලපිටිය පර්ල් ඒ සිටි, පර්ල් ග්‍රෑන්ඩ් හෝටල්, බණ්ඩාරනායක ගුවන් තොටුපොළ සහ ෂැංග්‍රිලා හෝටලයද *CCTV* පද්ධති සේවාවන් සැපයූ බවත් එම ෂැංග්‍රිලා හෝටලය සඳහා *CCTV* පද්ධති සවි කරන ලද්දේ 2015 – 2016 වසරවල බවත් පවසා තම ආයතනය ෂැංග්‍රිලා හෝටලය සමග එළඹුණු ගිවිසුමක් ප්‍රකාරව එම සේවා සැපයීම් සිදු කරන ලද බවත් සේවා ගිවිසුම වසරින් වසර අලුත් කර ඇති බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ෂැංග්‍රිලා හෝටලයෙහි *CCTV* යන්ත්‍ර ස්ථාපනය කරන ලද ස්ථානය සහ ආකාරය සහ එසේම, *XCC* රූම් එකක්ද තිබුණු බවත් පවසා *CCTV* පද්ධතිය ක්‍රියා කරන ක්‍රමවේදය පිළිබඳව විස්තරාත්මක සාක්ෂියක් ලබා දී ඇති අතර එසේම, *CCTV* කැමරා පද්ධතිය තුළ එම කැමරා මගින් ග්‍රහණය කරන රූප රාමු දත්ත බවට පරිවර්තනය වන ආකාරය සහ ඒවා පසුව නැරඹීමට හැකි පරිදි රූප රාමු බවට පත්වන ආකාරය පිළිබඳව එම දත්ත ගබඩා වන ආකාරය පිළිබඳව තාක්ෂණික විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් විස්තරාත්මක සාක්ෂියක් මෙම සාක්ෂිකරු ලබා දී ඇත.

තමාගේ මතකය හැටියට 2021 වසර වනවිට *CCTV* කැමරා 400 කට අධික ප්‍රමාණයක් සවිකර තිබුණු බවත් ඒ අතර ටෙල්කෝ බ්‍රෑන්ඩ් එකේ මොඩල් කීපයක්ද තිබුණු බවත් එසේම, අංශක 360 කෝණයම ග්‍රහණය කරගත හැකි ආකාරයේ ෆිෂ් අයි වර්ගයේ කැමරා ද ස්ථාපනය කර

තිබුණු බවත් පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.03 (31) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශන පෙළ එම *CCTV* දර්ශනවලට අදාළ දර්ශන රූප රාමු පරීක්ෂා කර බලමින් සාක්ෂිකරු ඒවායෙහි වේලාව සඳහන් කර තිබෙන ආකාරයන් පිළිබඳව එනම් ටයිම් සෝන් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වන ආකාරය පිළිබඳව විස්තර කරමින් සාක්ෂි ලබා දී ඇත.

එසේම, පැ.03 (21) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශන ද පරීක්ෂා කරමින් ඇඩ්මින් ප්‍රොෆයිල් එක තමාට පමණක් තිබෙන බැවින් එම *CCTV* දර්ශනවලට දිනය, මාසය, වේලාව ඇතුළත් කළ ආකාරය සම්බන්ධයෙන් සාක්ෂි ලබා දී ඇති අතර පැ.03 (32) ලෙස පැමිණිල්ලෙන් ලකුණු කර ඇති *CCTV* දර්ශන පටය එනම් විත්තිය විසින් 13 (v) (3) ලෙස ලකුණු කර ඇති එම *CCTV* දර්ශන පටයේම ඉහළින් කොළ පාට අකුරුවලින් නම, දිනය, වේලාව ග්‍රිනිච් වේලාව වශයෙන් අදාළ සිස්ටම් එක තුළින්ම ජෙනරේට් කර ඇති දිනය සහ වේලාවන් බවත් එම දත්තයන් මැදිහත් වීමක් කර වෙනස් කළ නොහැකි බවත් එසේම, එම දර්ශන පෙළෙහිම යට කොටසේ සුදු පාටින් දිනයක් සහ වේලාවක්ද සඳහන් වන බවත් එයට පහළින් දිස් වන්නේ කැමරාව නිෂ්පාදිත දිනය සහ වර්ෂය සහ ගමන් කරන වේලාව බවත් සාක්ෂිකරු පවසා ඇත.

නිළ වශයෙන් නිවැරදි දත්ත ලෙස සැලකිල්ලට ගන්නේ අදාළ *CCTV* දර්ශනවල ඉහළින් තිබෙන කොළ පාටින් දිස්වෙන දත්ත බවත් එම

දර්ශනවල පහළ කොටසේ ඇති සුදු පැහැයෙන් දිස්වෙන දිනය සහ වේලාවන් ඇතුළත් දත්ත කැමරාව නිෂ්පාදිත දිනයත් සමඟ යන තොරතුරු බැවින් ඒවා කැමරාව සවිකරපු දිනයේ සිට ඉදිරියට යන දත්ත බවත් ඒ අනුව එවැනි ආකාරයෙන් දිස්වන දත්ත කිසිසේත් තමාලාගේ දත්ත ලෙස අවධානයට ලක් කරන්නේ නැති බවත් පවසා ඇත.

2019.04.21 දින පාස්කු දිනය බවත් එදින ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමක් සිදු වුණු බවත් තමා කතෝලිකයෙකු වන බැවින් තමා පාස්කු ඉරිදාට පෙර බදාදා සිට පාස්කු ඉරිදා ඉවර වීමෙන් පසු එන සතියේ අඟහරුවාදා දක්වා නිවාඩු ලබා සිටි බවත් බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව ෂැංග්‍රිලා හෝටලයෙන් තමාට වාහනයක් ගෙදරටම එවා තමාට හෝටලයට එන ලෙස කැඳවීමක් ලැබුණු බවත් එදින ඇදිරිනීතිය යොදා තිබුණු දිනයක් නිසා එලෙස තමාගේ නිවසට වාහනයක්ද එවා තමාව කැඳවා ගැනීමට කටයුතු කළ බවත් තමා පැමිණි විට බෝම්බ ප්‍රහාරය නිසා කැමරා කීපයක් අක්‍රීය වී තිබුණු බවද එසේම, ආරක්ෂක අංශවල යම් යම් සිදුවීම්වල පටිගත කිරීම්වලට අදාළ වීඩියෝ එළියට ගන්න තමා සහාය දීම කළ බවත් තමා පැමිණෙන විටත් කැමරා කීපයක් හැර අනෙකුත් *CCTV* කැමරා සිස්ටම් වැඩ කරමින් පැවති නිසා ඔවුණට එම අවස්ථාවේ සිදු වූ සියලු දේ නැරඹීමට හැකියාව තිබී ඇති බවත් කෙසේ වෙතත් *CCTV* පද්ධතියට අදාළ ඇඩ්මින් ප්‍රොෆයිල් එක තමා සන්තකව තිබුණු බැවින් හෝටලයෙහි ආරක්ෂක අංශවලට තමාගේ සහාය නොමැතිව එම *CCTV*

දත්ත ඉවත් කරගැනීමට නොහැකි බවත් තමා විසින් පරීක්ෂා කර බැලීමේදී 2019.04.21 දින සහ ඊට ආසන්න දිනවලට අදාළ *CCTV* දර්ශනවලට හානියක් නොවී තිබුණු බවත් ය.

තමා විසින් පසුව අධිකරණ නියෝගයක් මත දින කීපයකදී තමා *CCTV* කැමරාවලට අදාළ තොරතුරු බාගත කිරීම් කර හාඩ් ඩිස්ක් වලට දමා ලබා දුන් බවත් එලෙස බාගත කරන ලද සියලුම දර්ශන සර්වර් යන්ත්‍රයේ තැන්පත් වී තිබූ නිවැරදි දත්තයන් බවත් ඒවා කිසිදු ආකාරයකින් වෙනස්කමට ලක් වූයේ නැති බවත් එම බාගත කිරීමේ කාර්ය සඳහා රජයේ රසපරීක්ෂකවරුන්ද සිටි බවත් මෙම සාක්ෂිකරුට චිත්තිය විසින් 5 (v)1 ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශන පෙළක් දර්ශනය කර පෙන්වා ඇති අතර සාක්ෂිකරු එවා පරීක්ෂා කර බලා පවසා ඇත්තේ එම දර්ශන ෂැංග්‍රිලා හෝටලයේ *CCTV* වලින් ගත්ත දර්ශන වුවද 5 (V)1 (E) ලෙස ලකුණු කර ඇති මෙම දර්ශනවල පෙනෙන ආකාරයට එක දිගට ගන්න ෂැංග්‍රිලා හෝටලයේ *CCTV* කැමරාවලින් බැරි බවත් එම 5 (V)1 (E) ලෙස චිත්තියෙන් ලකුණු කර ඇති දර්ශන පෙළ කැමරා කීපයකින් ලබා ගන්නා ලද දර්ශන එකට එකතු කර ඇති දර්ශන පෙළක් බවත් ෂැංග්‍රිලා හෝටලයේ සවිකර තිබූ *CCTV* කැමරා පද්ධතියේ එලෙස දර්ශන එකිනෙකට අමුණා බැලීමේ හැකියාවක් තිබුණේ නැති බවට පවසා ඇත.

එසේම, ෂැංග්‍රිලා හෝටලයේ තිරයේ දිස්වෙන දත්තයන් මෙම 5 (V)1 (E) CCTV දර්ශනවල දක්නට ලැබන්නේ නැති බවත් ෂැංග්‍රිලා හෝටලයේ CCTV දර්ශනවල ග්‍රිනීච් වේලාව, දිනය, කාලය කොළ පාටින් දිස්වෙන බව 5 (V)1 (E) CCTV දර්ශනවල එම දින වකවානු කොළ පැහැති ආකාරයෙන් නොමැති බැවින් මෙම *CCTV* දර්ශන පෙළ විවිධ කැමරාවලින් ග්‍රහණය කර ගන්නා ලද දර්ශන පෙළක් එකතු කර සකස් කර ඇති දර්ශන පෙළක් බවට සාක්ෂිකරු පවසා ඇත.

ෂැංග්‍රිලා හෝටලයේ ස්ර්වර් යන්ත්‍රයේ දත්ත ගබඩා වී තිබෙන අවස්ථාවේදී එමගින් 5 (V)1 (E) ආකාරයේ දර්ශන පෙළක් පිළියෙල කිරීමට කිසිදු හැකියාවක් නැති බවත් සර්වර් යන්ත්‍රයෙන් දත්ත පෙන් එකකට අරගෙන වෙනත් මෘදුකාංගයක් භාවිතා කර මේ ආකාරයෙන් වීඩියෝ දර්ශන පෙළක් සැකසිය හැකි බවත් එවැනි අවස්ථාවලදී ෂැංග්‍රිලා හෝටලයේ ස්ර්වර් එකට අදාළ සිස්ටම් එකේ දිනය සහ වේලාව සඳහන් වන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

විත්තිය විසින් 5 (වි)1 (එ) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළද පරීක්ෂා කර බලා එහි පහළින් ඇති සුදු පාටින් දිස්වෙන දිනයන් සහ වේලාවන් ෂැංග්‍රිලා හෝටලයෙහි දත්තවල නොමැති බවත් තමාලා නිවැරදි දත්තයන් ලෙස සලකන්නේ ෂැංග්‍රිලා හෝටලයේ CCTV පද්ධතියෙහි නෙට්වර්ක් ටයිම් ෆොටකෝල් එකෙන් ඇතුළත් වන කොළ පාටින්

පෙන්වන දිනය සහ වේලාව ඇතුළු විස්තර පමණක් බවත් ඉහත පරිදි විත්තිය විසින් ලකුණු කර ඇති 5 (වි)1 (ඊ) සහ 5 (වි)1 (එ) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනවල ඇති දත්තයන් ෂැංග්‍රිලා හෝටලයේ නෙට්වර්ක් ටයිම් ෆොටකෝල් එකෙන් ජෙනරේට් නොවී ඇති බැවින් ඒවායේ සුදු පාටින් සඳහන් වේලාවන් සහ දිනයන් කිසිසේත් නිවැරදි දත්ත නොවන බවට සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත.

මෙම සාක්ෂිකරුව සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට විත්තියේ උගත් නීතීඥවරුන් අධිකරණයට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් මෙම අධිකරණයට පැහැදිලිව පෙනී යන්නේ විත්තිය විසින් 5 (V)1 (E) සහ 5 (වි)1 (එ) ලෙස පෙර අවස්ථාවක ලකුණු කර ඇති CCTV දර්ශන ෂැංග්‍රිලා හෝටලයේ නෙට්වර්ක් ටයිම් ෆොටකෝල් එකෙන් උත්පාදනය නොවූ, විවිධ කැමරාවලින් ග්‍රහණය කර ගන්නා ලද දර්ශන පෙළක් වියහැකි බවත් එය වෙනම මෘදුකාංගයක් යොදා දර්ශන පෙළ එකට පෙළගස්වා සකස් කර ඇති CCTV දර්ශන පෙළක් බවත් ඒ අනුව විත්තිය විසින් ලකුණු කරන ලද එම CCTV දර්ශන පෙළෙහි සුදු පාටින් දැක්වෙන දින වකවානු සහ වේලාවන් නිවැරදි දත්තයන් ලෙස කිසිසේත් සැලකිය නොහැකි බවයි.

පැ.සා.1011 කසුන් කාවින්ද නැමැති සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඔහු 2018 වසරේ සිට 2022 වසර වනතුරු කොළඹ ෂැංග්‍රිලා

හෝටලයෙහි ෆ්‍රන්ට් ඔෆිස් ඩිපාර්ට්මන්ට් එකේ සර්විස් ඇසොසියේට්වරයෙකු ලෙස සේවය කළ බවත් ඔහුගේ රාජකාරිය වන්නේ හෝටලයට පැමිණෙන අමුත්තන් හෝටලයට ඇතුළත් කර ගැනීම සඳහා ඔවුන් හෝටලයෙන් පිට කිරීමට අදාළව කටයුතු සිදු කිරීම සහ හෝටලය පිළිබඳ තොරතුරු ලබා දීම සිදු කිරීම බවත් ඔපෙරා නැමැති ඔන්ලයින් සිස්ටම් එක හරහා තොරතුරු ඇතුළත් කරන බවත් එලෙස කාමරයක් ගැනීමට අමුත්තෙකු පැමිණි විට ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය සහ ඇඩ්‍රස් එක ලබා ගන්නා බවත් පාස්පොට් එකක් සහ රියදුරු බලපත්‍ර තිබේ නම් එහි විස්තර ලබා ගන්නා බවත් එසේම, අන්තර්ජාලය හරහාද මාර්ගගත ක්‍රමය ඔස්සේද හෝටලයේ කාමර වෙන්කර ගැනීමට හැකියාවක් තිබෙන බවත් එසේම, දුරකථන ඇමතුම් ලබාදී කාමර වෙන් කරගැනීමට හැකි බවත් පවසා ඇති අතර පැ.05 ලෙස ෂැංග්‍රිලා හෝටලයට අදාළව කාමරයක් වෙන් කරවා ගැනීම සඳහා 393380 දරන තහවුරු කිරීමේ අංකයට අදාළව 2019.04.20 දින නිකුත් කරන ලද රිසිට් පතක් බවට හඳුනාගෙන ඇත.

එසේම, 2019.04.20 දින තමා එදිනට අදාළව පෙර අවස්ථාවකදී පැ.03 (21) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන සාක්ෂිකරු නරඹමින් එහි තමා සිටින බවට හඳුනාගෙන එදින සවස 7.58 ට ගමන් මළු දෙකක්ද රැගෙන උඩුකයට නිල් පාට සහ රතු පාට ඇදුම් ඇඳ ගෙන සිටින පුද්ගලයන් දෙදෙනෙකු සිටින බවත් ඔවුන් නිල් පාට සහ රතු පාට උඩුකය

ඇදගෙන සිටි තැනැත්තන් බවත් තමා ඔවුන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පත් දෙකම ලබාගෙන ඒවා ආපසු ඔවුන්ට බාරදෙන ආකාරය වීඩියෝ දර්ශනයේ තිබෙන බවත් ඔවුන් ඉන්පසු පැය 20.04 ට පමණ මුදල් ගෙවීම කරන ලද බවත් මුදල් ගෙවීමෙන් පසු තමා ඔවුන් දෙදෙනාට පැය 20.07 ට කී කාඩ් එක ලබා දුන් බව පවසා එදිනට අදාළ අමුත්තන්ගේ දත්ත ගබඩාවේ තිබෙන සිස්ටම් එකෙන් ලබා ගත් ස්ක්‍රීන් පිටපතක් හඳුනාගෙන එය පැ.06 ලෙස ලකුණු කර ඇති අතර එහි දත්ත ඇතුළත් කරන තැනැත්තා ලෙසට තමාගේ නම එෆ්.ඕ.කසුන් යැයි සඳහන් වන බව පවසා එය හඳුනාගෙන ඇති අතර පැ.06 ලේඛනයට අනුව අදාළ අමුත්තාගේ නම <u>ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ්</u> බවත් එම පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් අංකය 862442067V ලෙස තමා ඇතුළත් කර ඇති බවත් ලිපිනය ලෙස 658/90, මහවිල පාර්ක්, කොළඹ 09 ලෙස සඳහන් කර තිබෙන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එසේම, ජංගම දුරකථන අංකය 077-5073771 බවත් සඳහන් කර ඇති අතර එසේම, අමුත්තා විසින් ඔහුගේ ඊමේල් ඇඩ්‍රස් එක ලබාදීමට කැමති වුනේ නැති බවට එනම් විද්‍යුත් ලිපිනය ලබා දීමට කැමති වුනේ නැති බවට තමා සටහන් කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, එම අවස්ථාවේදී පැමිණි අනිත් අමුත්තාට අදාළ දත්ත හා සම්බන්ධ ස්ක්‍රීන් ෂොට් පිටපත පැ.07 ලෙස ඔප්පු කිරීමේ භාරයට යටත්ව

ලකුණු කර ඇති අතර, එම පැ.07 ලේඛනයට අනුව අමුත්තාගේ නම වශයෙන් **<u>අසාම් මොහොමඩ් මුබාරක්</u>** බවත් ජාතික හැඳුනුම්පත් අංකය 873340312V බවත් එම තැනැත්තාගේ ලිපිනය ලබා දී නොමැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අසාම් මොහොමඩ් මුබාරක් යන ආගන්තුකයාගේ රියදුරු බලපත්‍රය සාක්ෂිකරු හඳුනාගෙන එහි සඳහන් ජාතික හැඳුනුම්පත් අංකය පැ.07 ලේඛනයේ සඳහන් ජාතික හැඳුනුම්පත් අංකය සමඟ ගැළපෙන බවට පවසා ඇති අතර අමුත්තන් ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන එය පැ.09 ලෙස එය මුල් ලේඛනය සමඟ සසඳා පැ.09 (A) ලෙස ලකුණු කර ඇත.

එම පුද්ගලයන් දෙදෙනා සමඟ තමා විනාඩි 10 ක් පමණ එලෙස කාමර වෙන් කිරීමේ ඩෙස් එක ඉදිරියෙහි කාලය ගත වීමක් සිදු වූ බවත් සාක්ෂිකරු පවසා ඇත්තේ එම අමුත්තන් දෙදෙනාගෙන් මුලින්ම හෝටල් එකේ බුකින් එකක් තිබෙනවා යැයි තමාට පවසා සිටියේ රතු පාට ඇඳගෙන සිටි තැනැත්තා බවත් එම තැනැත්තා එම අමුත්තන් දෙදෙනාගේ ප්‍රධානියා බවට හඳුනාගෙන ඇත. එසේම, තමාට ඉදිරිපත් කළ හැඳුනුම්පතේ තිබෙන ඡායාරූප සමඟ එම පුද්ගලයාගේ රූපය ගැලපෙන බවට තමාට පෙනී ගිය බවත් අනිත් තැනැත්තා එනම් නිල් පාට ෂර්ට් එකක් ඇඳගෙන සිටි රියදුරු බලපත්‍රය ඉදිරිපත් කරපු පුද්ගලයා මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් බවත් කාමරය බුක් කර තිබුණේ එම පුද්ගලයාට බවත් පවසා කාමර ගාස්තු

ලෙස රු.41, 611/. ක් සඳහා තමා විසින් නිකුත් කරන ලද බිල්පත සාක්ෂිකරු හඳුනාගෙන එය පැ.10 ලෙස ලකුණු කර ඇත.

එසේම, එයට අනුව ඔවුන්ට වෙන් කර තිබෙන්නේ කාමර අංක 616 බවත් එම ලේඛනයට අනුව ඔවුන් පැමිණි දිනය 2019.04.20 බවත් පිටවෙන දිනය 2019.04.21 ලෙස තමා සඳහන් කර ඇති බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. පැ.10 දරන බිල තමා විසින් 2019.04.23 වන දින පැය.20.16 ට වෙන් කර තිබෙන බවද සාක්ෂිකරු පවසා ඇත.

තවද එම පැමිණි පුද්ගලයන් දෙදෙනාගෙන් උදේ ආහාර ගන්නවා දැයි තමා විමසීමක් කළ බවත් ඔවුන් උදේ ආහාර ගන්නා බවට පැවසූ බවත් තමා එම ගණනද එකතු කර ඉහත පරිදි තමා රු.41, 616/. බිල නිකුත් කළ බවත් ඉන්පසු තමා ඔවුන්ට ඩිජිටල් කී කාඩ් එකක් ලබා දී ඔවුන් දෙදෙනාගේ ගමන් මළු දෙක රූම් එකට ගෙන යාම සඳහා බෙල් ඩෙස්ක් එකට බාර දෙන ස්ථානය පෙන්වා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. එදින තමාගේ සේවය පාන්දර 4.30 ට අවසන් වූ පසු තමා ඒ කාලයේ තාවකාලිකව නැවතී සිටි දෙහිවල නවාතැනට ගිය බවත් පසුව තමා නවාතැනේ සිටින විට හෝටල් එකේ බෝම්බයක් පිපිරිලා යැයි තමාගේ යාළුවන්ගෙන් දුරකථන ඇමතුම් කීපයක් පැමිණි බවත් ඉන්පසු තමා දවස් කීපයක් ගෙදර සිට නැවත සේවයට පැමිණි පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යම් ප්‍රකාශයක් ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු 4 කින් සමන්විත ලේඛනය පෙන්වා ඇති අතර එම ලේඛනය තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවෙන් තමාගෙන් ප්‍රකාශයක් සටහන් කරගත් අවස්ථාවේදී තමා දුටු බවත් එම ලේඛනයෙහි පළවන පිටුවේ සහ දෙවන පිටුවේ සිටින නිල් පාට ෂර්ට් එක ඇඳගෙන සිටින පුද්ගලයා තුන්වන සහ 4 පිටුවේ සිටින තමා සමග කතා කළ රතු පාට ටී ෂර්ට එකක් ඇඳගෙන සිටි පුද්ගලයා බවට එම පුද්ගලයන් දෙදෙනාවම සාක්ෂිකරු විසින් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුට පැ.3 (21) දරන CCTV දර්ශන පෙළ පෙන්වා ප්‍රශ්න කර ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ තමා එම CCTV දර්ශන මෙම සිද්ධියෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කටඋත්තරයක් ලබා දීමෙන්ද පසුව අන්තර්ජාලයෙහි නිව්ස් චැනල්වල තිබී දක්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, පැ.10 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙහි අමුත්තාගේ අත්සන තිබිය යුතු ස්ථානයේ අත්සනක් නොමැති බවත් එම ලේඛනය සිස්ටම් එකෙන් ලබාගත්ත එකක් බවත් සහ එය අමුත්තාට ලබා දුන් පිටපතක් බවත් ඒ නිසා එහි අත්සනක් නොමැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර කෙසේ වෙතත් එම ලේඛනයේ අමුත්තා විසින් අත්සන් කර නැති බව සාක්ෂිකරු පවසා ඇත.

එසේම, සාක්ෂිකරු පැ.09 සහ පැ.10 දරන ලේඛන දෙක පරීක්ෂා කර බලමින් එම දෙකෙහි කාමර අංක දෙක වෙනස් බවට පවසා ඇත. කෙසේ වෙතත් පැ.09 සහ පැ.10 නැමැති ලේඛන දෙකේම තිබෙන දෙදෙනාම එකම නම බවත් සඳහන් කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් ඩිජිටල් ඩෝ කාඩ් එක සම්බන්ධයෙන් සහ එය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් විත්තිය දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න නගා ඇත. පැ.06 දරන ලේඛනය සාක්ෂිකරුට පෙන්වමින් විත්තියෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර පැ.7 දරන ලේඛනයද පරීක්ෂා කර බලමින් සාක්ෂිකරු පිළිතුරු ලබා දී ඇත. පැ.8 ලෙස පෙන්වා ලකුණු කර ඇති රියදුරු බලපත්‍රයට අනුව එහි ලිපිනය ලෙස අංක 138/ජී, නිව් මෝල්ට් ස්ට්‍රීට්, කොළඹ 12 ලෙස සඳහන් කර තිබුණු බවත් පවසා ඇත. සාක්ෂිකරු පවසා ඇත්තේ තමා විසින් අමුත්තන් දෙදෙනාගේ දත්ත සිස්ටම් එකට ඇතුළත් කළේ ඔවුන් ඉදිරියේම බවයි.

පැ.10 ලේඛනය පරීක්ෂා කරමින් සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට එම පැ.10 දරන ලේඛනය එනම් මුදල් ගෙවූ බව සනාථ කරන ලේඛනය අමුත්තන්ට දෙන්නට බැරි වුණ බවත් තමා නරඹන එම ලේඛනය පරිගණකයෙන් ස්වයංක්‍රීයව ජෙනරේට් කරපු ලේඛනයක් බවත් එය මුද්‍රණය කර තිබෙන්නේ 2019.04.23 වන දින පැය 20.16 ට බවත් එය තමා විසින් මුද්‍රණය කළේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ පැ.10 දරන ලේඛනය මෙම සාක්ෂිකරු විසින් මෙම නඩුව සඳහාම පසුව සකස් කරන ලද ලේඛනයක් බවට වුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇති අතර මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන්නාද හරියට මතක නැති බවයි. මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී පොලිසිය ඔහුගෙන් කටඋත්තරයක් ලබා ගැනීමේදී ‘‘ඔහුට CCTV දර්ශන දාලා පෙන්නුවේ නැහැ’’ යැයි පවසා ඇතද ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති කටඋත්තරයෙහි **‘‘සැක කරන පුද්ගලයන් දෙදෙනාගේ ආවේක්ෂණ කැමරා දර්ශන පෙන්වා සිටි. එම දර්ශන මා දැන් පරික්ෂා කරමින්’’** යන කොටස විත්තිය විසින් 5 (B)4 ලෙස ලකුණු කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් 06 වන චූදිත වෙනුවෙන් සහ 25 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දීමක් කර ඇත.

පැ.සා.1008 දීපිකා නිළන්ති සත්‍යපාල නමැති සාක්ෂිකාරිය වසර 10 කට අධික කාලයක් Cinnamon Grand හෝටලයේ රාජකාරී සිදුකර 2014 අප්‍රේල් මාසය වන විට කොළඹ ෂැන්ගිලා හෝටලයෙහි Front Office Manager ලෙස සේවයේ නියුතුව සිටි බවත් 2019 අප්‍රේල් මාසය වන විට 70 කට අධික සේවක මණ්ඩලයක් ඇය යටතේ සේවය කළ බවත් පවසා ඇත.

2019.04.21 වන දින දෙනිකව පැවැත්වෙන කළමණාකරණ රැස්වීම උදේ 8.45 ට පමණ හෝටලයෙහි 03 වන මහලෙහි පැවැත්වූ බවත් ඉන්පසු තමා 03 වන මහලේ සිට 02 වන මහලට යමින් සිටි බවත් ඒ යන අතරතුර Table.01 නැමති භෝජනාගාරය පිහිටි 03 වන මහලෙහි රෙස්ටුරන්ට් එකට ඇතුළු වෙන තැනද තමා නතර වුණ බවත් එම රෙස්ටුරන්ට් එකේ අමුත්තන්ට ඇතුළු වීමට තිබුණේ එක දොරටුවක් පමණක් බවත් තමන් Table.01 භෝජනාගාරයට එන අමුත්තන්ට ආචාර කිරීම් සිදු කරන ලද බවත් එලෙස භෝජනාගාරයට පිවිසුණු පුද්ගලයන් 02 දෙනෙකුට තමන් ආචාර කළ බවත් බෝම්බ පිපිරීමෙන් පසුව ඡායාරූප වලින් හඳුනා ගැනීමක් කළ බවත් පවසා පෙර අවස්ථාවක පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු 04 කින් සමන්විත ලේඛනය සාක්ෂිකාරිය විසින් හඳුනා ගෙන එහි ඇති ඡායාරූප හඳුනා ගැනීමක් කර ඇති අතර, තමා එම ඡායාරූප 2019.04.23 වන දින දුටු අවස්ථාවේ තමා විසින් අත්සන් කළ බව පවසා සාක්ෂිකාරිය පැ.01 හි ඇති තම අත්සන හඳුනාගෙන ඇත.

පැ.01 ලේඛනයේ 01 වන පිටුවෙහි සිටින පුද්ගලයා සහ 04 වන පිටුවේ තිබෙන ඡායාරූපයෙහි සිටින පුද්ගලයා යන පුද්ගලයන් දෙදෙනා තමා විසින් පෙර සඳහන් කරන ලද, එනම් ෂැංග්‍රිලා හෝටලයේ Table.01 භෝජන ශාලාවට ඇතුල් වන දොරටුවේදී තමා විසින් ආචාර කරන ලද පුද්ගලයන් දෙදෙනා බවට පෙන්වා හඳුනා ගෙන ඇත. පැ.3 (2) ලෙස

ලකුණු කර ඇති CCTV වීඩියෝ දර්ශනයද මෙම සාක්ෂිකාරියට නැරඹීමට විවෘත අධිකරණයේ ප්‍රදර්ශනය කරන ලදුව මෙම සාක්ෂිකාරිය Table.01 අවන්හලට ඇතුල් වෙන දොරටුව අසල තමා සිටි ස්ථානය ඇය විසින්ම එම දර්ශනයෙහි පෙන්වා හඳුනා ගෙන ඇත. ඒ අනුව 2019.04.21 දින උදේ 08:52 තත්පර 07 ට අදාළ එම දර්ශනයෙහි තමා සිටි ආකාරය ඇය පෙන්වා දී ඇති අතර එසේම, තමා විසින් ආචාර කරන ලද පුද්ගලයන් දෙදෙනා පිටෙහි ගමන් මලු 02 ක් එල්ලා ගෙන රතු සහ කළු කමිස හැඳ තොප්පි පැළඳ සපත්තු දමා ගෙන සිටි බවටද පෙන්වා හඳුනා ගෙන ඇත.

තවද, තමා එම පුද්ගලයාව දකින විට එම ස්ථානයේ තමා සමඟ මානව සම්පත් අධ්‍යක්ෂිකා මධුෂා පීල්ලදෙනිය යන තැනැත්තියද සිටි බවත් තමා ඉහත කී පුද්ගලයන් Table.01 අවන් හලට ඇතුළු වීම කළ අවස්ථාවේ ඔවුන්ට ආචාර කිරීමෙන් අනතුරුව 02 වන මහළේ පිහිටි තමාගේ කාර්යාලයට යමින් සිටියදී විශාල ශබ්ද 02 ක් ඇසුණ බවත් තමා එකවරම එතන තිබුණ ජනේලයෙන් එළිය බැලීමේදී කලබලකාරී තත්ත්වයක් දුටු බවත් ලොබි එකේ සිටි අමුත්තන් සහ හෝටලයේ සේවකයන්ද කලබලයට පත් වී සිටි බවත් ඔවුන්ට කලබල නොවන ලෙස දන්වා තමා හෝටලයේ එළියේ ප්‍රධාන දොරටුව ලඟට ගිය බවත් සාක්ෂිකාරිය පවසා ඇත.

තමා එලෙස හෝටලයේ ප්‍රධාන දොරටුව ලඟට ගිය අවස්ථාවේදී එහි ලොකු ජීවිත හානියක් වෙලා තිබෙන බව දුටු බවත් ශරීර කොටස් වැටී තිබෙනවා දුටු බවත් ඉන්පසු Ambulance වලට කතා කර එසේම, හෝටලයේ තිබෙන පටිගත කරන ලද නිවේදනයන්ද ක්‍රියාත්මක කර අමුත්තන්ට කලබල නොවන ලෙසත් විශේෂ තත්ත්වයක් උද්ගත වී ඇති බවත් කරුණාකර ගොඩනැගිල්ලෙන් ඉවතට යන ලෙසත් එම නිවේදන මඟින් දැනුම් දුන් බවත් ඇය පවසා ඇත.

සාක්ෂිකාරිය වැඩිදුර සාක්ෂි ලබා දෙමින් 2019 අප්‍රේල් මස 21 දින වන විට හෝටලයේ නැවතී සිටි අමුත්තන් ලැයිස්තුව ඇතුළත් In house list යන ලේඛනය හඳුනා ගෙන එය පැ.11 ලෙස ලකුණු කර ඇති අතර, අප්‍රේල් 21 වන දින හෝටලයේ සිදු වූ සිදුවීම නිසා තමා එම ලේඛනයේ පිටපතක් තබා ගත් බවත් එම ලේඛනයේ අමුත්තන්ගේ නම්, පැමිණි දිනයන්, පිටවීමේ දිනයන්, කාමර අංක, කාමරවල පුද්ගලයන් කොපමණ සංඛ්‍යාවක් සිටිනවාද, කාමරවල දරුවන් සිටිනවාද, විශේෂ අමුත්තන්ද, ඔවුන් කාමර වෙන් කර ගෙන තිබෙන්නේ කොහොමද, යන ගමන් මළු පිළිබඳ විස්තර, ඔවුන්ගේ ජාතිය, ගමන් බලපත්‍ර, උපන් දින, දුරකථන අංක යන විස්තර එම ලේඛනයේ සඳහන් වන බවත් එම ලේඛනයට අදාළ තොරතුරු හෝටලයේ පරිගණක පද්ධතියේ වාර්තා ගත වී තිබෙන බව පවසා තමාලා එම විස්තර අඩංගු පැ.11 දරන ලේඛනය

විමර්ශන සඳහා පැමිණි අපරාධ පරීක්ෂණ දොපර්තමේන්තුවේ නිලධාරීන්ට භාර දුන් බවට මතකයක් තිබෙන බවට පවසා ඇත.

මෙම පිපිරීම නිසා හෝටලයේ පරිගණක පද්ධතියද නතර වුණ බවත් සාක්ෂිකාරිය පවසා ඇති අතර, පැ.11 ලේඛනයට අනුව කාමර අංක 616 දරන කාමරයෙහි මොහොමඩ් ඉබ්‍රාහිම් ඉල්හාම් සහ මුබාරක් අසාම් මොහොමඩ් යන පුද්ගලයන් නතර වී සිට ඇති බවට ඇය පවසා ඇති අතර, පැ.11 ලේඛනයට අනුව 2309 දරන කාමරයේ අමුත්තන් කිසිවෙකු හෝ නතර වී සිටි බවක් සඳහන් වන්නේ නැති බවත් ඇය පවසා ඇති අතර, එම සාක්ෂිකාරිය විසින් තවදුරටත් පවසා ඇත්තේ තමාට මතක විදියට අමුත්තන් 20 කට අධික සංඛ්‍යාවක් මෙම සිද්ධිය නිසා මිය ගිය බවත් හෝටලයෙහි සේවකයන් පස්දෙනෙක්ද මෙම සිද්ධිය නිසා මිය ගිය බවත් අමුත්තන් සහ සේවකයන් ගණනාවක්ද රෝහල් ගත කර තිබූ බවක්ද පවසා ඇත.

මෙම සාක්ෂිකාරියට කාමර 616 ට අදාළ පෙර ලකුණු කර තිබූ පැ.9 සහ පැ.10 ලේඛන පෙන්වා හඳුනා ගෙන ඇති අතර, එම ලේඛන මත මෙම සාක්ෂිකාරියද අත්සන් තබා ඇති බවට ඇය විසින් හඳුනා ගෙන ඇත. එසේම, මෙම බෝම්බ වලින් එක පිපිරීමක් සිදුවී ඇත්තේ 03 වන මහලේ පිහිටි Table.01 ආපන ශාලාව ඇතුලේ මුහුදු පැත්ත පෙනෙන ජනෙල් ප්‍රදේශයේ ස්ථානයක බවත් අනෙක් පිපිරීම Table.01 ආපන ශාලාවට

ඇතුල් වන ස්ථානය ආසන්නයේ මදක් දුරින් පිහිටි Scaletor ආසන්නයේ සිදුවූ බවටත් CCTV දර්ශන අනුව තමා නිරීක්ෂණය කළ බවට ඇය පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.5 ලෙස ලකුණු කළ ලේඛනය සාක්ෂිකාරියට පෙන්වා ඇති අතර, ඇය එය පරීක්ෂා කර බලා එය Reception එකේ රාජකාරී කළ ෂෙනෙල් නමැති නිලධාරිනිය විසින් සිදු කරන ලද රාජකාරියට අදාළ ලේඛනයක් බවට පවසා ඇති අතර, තමා මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කීපයක් ලබා දුන් බවට ඇය පවසා ඇති අතර, පැ.3 (1) දරන වීඩියෝ දර්ශනය සහ පැ.3 (2) දරන CCTV වීඩියෝ දර්ශනයද නරඹමින් තමා Table. 01 අවන්හලට ඇතුල් වන ස්ථානයේ දොරටුව අසල සිට ආචාර කිරීම කරන ලද පුද්ගලයන් දෙදෙනාම එම දර්ශන තුළින්ද හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇත.

හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකාරිය පවසා ඇත්තේ, ෂැංග්‍රිලා හෝටලයේ 616 කාමරයේ නැවතී සිටි අමුත්තන් දෙදෙනාම 2019.04.21 වන දින මිය ගොස් ඇති බවට පැ.11 ලේඛනයෙහි සඳහන් වන බවත් එම පැ.11 ලේඛනය මුද්‍රණය කර ඇත්තේ 2019.04.21 දින රාත්‍රී 8.45 ට බවත් පවසා ඇත. වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඇය පවසා ඇත්තේ 2019.04.20 දිනට පෙර දිනයන් වල 616 කාමරයේ සිටි අමුත්තන් පිළිබඳ විස්තර එහි අඩංගු වන්නේ නැති බවය.

කාමර අංක 2003 දරන කාමරයෙහි නැවතී සිටි පුද්ගලයන් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරියගෙන් කරුණු විමසා ඇති අතර, එම කාමරයෙහි ඉන්දීය ජාතිකයන් 03 දෙනෙක් නැවතී සිට ඇති බවටත් ඇය පවසා ඇති අතර එසේම, අංක 620 නමැති කාමරයෙහි ඉන්දියානු ජාතික පිරිමි තැනැත්තන් දෙදෙනෙකු සිට ඇති බවටද පැ.11 ලේඛනයට අනුව සඳහන් වන බවටත් සාක්ෂිකාරිය ප්‍රකාශ කර තිබේ.

විත්තියෙන් ඇගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඇයට යෝජනා කර ඇත්තේ 620 කාමරයෙහි 2019.04.21 දින උදේ 7.45 ට ලියාපදිංචි වී සිටි පුද්ගලයන් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම් කර ඇති අතර, විත්තියෙන් ඇගෙන් වැඩිදුරටත් අසා ඇත්තේ, ඇයට ඉන්දියානු තානාපති කාර්යාලයෙන් ලැබුණු යම් තොරතුරක් සම්බන්ධයෙන් ඇයගේ පොලිස් ප්‍රකාශයේ සඳහන් කළාද යන්න වන අතර, ඇය සඳහන් කර ඇත්තේ තමා ඉන්දියානු තානාපති කාර්යාලයට ඇමතීමක් හෝ කර නැති බවත් තමාට එවැන්නක් දැනුම් දුන් බවක් හෝ මතක නැති බවත් ය.

මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 01, 10, 13, 22, 24 චූදිතයන් සම්බන්ධයෙන් පමණක් වන අතර, අනෙකුත් සියලු චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න කිසිවක් ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2193 මොහොමඩ් ෂහාඩ් ටිරෝන් කාසිම් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා තොරතුරු තාක්ෂණය

සම්බන්ධයෙන් ඇපිට් විශ්ව විද්‍යාලය මඟින් 2009 වසරේ උපාධියක් ලබා ගෙන තිබෙන බවත් තමා 2017 වසරේ කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ IT මැනේජර් ලෙස සේවය කරන ලද බවත් තමාගේ විෂය පථය ලෙස හෝටලයෙහි කාර්ය මණ්ඩලයේ පරිගණකවලට අදාළ තාක්ෂණිකමය ගැටළු සම්බන්ධයෙන් පියවර ගැනීමත්, එසේම, අමුත්තන්ගේ WI.FI සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම බවත් පවසා ඇති අතර, ෂැංග්‍රිලා හෝටලය ආරම්භ කළේ 2017.11.16 දින බවත් ඒ ආසන්න කාලයේ ෂැංග්‍රිලා හෝටලයේ ඔපෙරා නැමැති සිස්ටම් එකක් ස්ථාපනය කළ බවත් එය ෂැංග්‍රිලා හෝටලයේ පහළ මහළේ තිබෙන Server Room එකේහි ස්ථාපනය කර තිබුණ බවත් එම කාමරයට ඇතුළු වීම සඳහා යතුරු නොමැති බවත් Access Card එකක් තිබෙන බවත් එම කාමරයට ඇතුල් විය හැක්කේ Security team එකට සහ ඉන්ජිනියරින් ටීම් එකට පමණක් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, හෝටලයට පැමිණෙන අමුත්තන්ගේ විස්තර දත්ත ගබඩාවට ඇතුළත් කළ පසු එම දත්ත හෝටලයේ දත්ත පද්ධතියට ඇතුළත් කළේ කවුද, කුමන නිලධාරීයෙක් විසින්ද, එසේම, එම දත්ත වෙනස් කර තිබේ නම් ඒවා සම්බන්ධ විස්තරද ඇතුළත් වන බවත් හෝටලයෙහි කාමර වෙන් කිරීමේ අංශයට අදාළ තොරතුරු මාස 06ක් පමණ ආරක්ෂා කර තබන බවත් එසේම, හෝටලයට පැමිණෙන අමුත්තන්ට අදාළව දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති විස්තර වල පිටපත් මුද්‍රණය කර ලබා ගත හැකි බව පවසා පෙර අවස්ථාවක පැ.05 ලෙස

ලකුණු කර ඇති ලේඛනය 2019.04.17 වන දින දහවල් 1.56 ට ෂෙනෙල් නමැති නිලධාරිනිය විසින් ඇතුළත් කරන ලද විස්තර ඇතුළත් රෙසවේෂන් එකක් බවත් එම රෙසවේෂන් එකට අදාළ තහවුරු කිරීමේ අංකය 393380 බවටත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරුට පැ.06 ලේඛනයද පෙන්වා ඇති අතර, එය පරික්ෂා කර බලා සාක්ෂිකරු පවසා ඇත්තේ එයද ෂෙනෙල් නමැති නිලධාරීණිය විසින් 2019.04.17 දින 1.56 ට ඇතුළත් කර ඇති විස්තරවලට අදාළව 2019.04.20 දින රාත්‍රී 8.36 ට කසුන් නමැති නිලධාරියා විසින් එය යාවත්කාලීන කිරීමක් සිදු කර ඇති බවයි. පැ.7 ලේඛනය කසුන් නමැති නිලධාරියා විසින් 2019.04.20 දින 08.01 ට සකස් කරන ලද ලේඛනයක් වන බවත් එසේම, එකී කසුන් නැමැති නිලධාරියා විසින්ම 2019.04.20 දින 08.06ට පෙර කී රෙසවේෂන් නම්බර් 393380 ට අදාළව විස්තර යාවත්කාලීන කර එහි Adults 2 යන්න ඇතුළත් කර තිබෙන බවත් දිනය 2019.04.21 යැයි සඳහන් කර තිබෙන බවත් රාත්‍රී 08.08 ට කාමර අංක 616 ට Key card 02 ක් සකස් කර තිබෙන බවටත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම නඩුවට අදාළ බෝම්බ පිපිරීම සිදුවූ දින තමා නිවාඩු මත සිටි දිනයක් බවත් එදා සිද්ධිය ආරංචි වූ විගසම තමා හෝටලයට පැමිණ පරික්ෂා කිරීමේදී පරිගණක පද්ධතියට අදාළ දත්ත ගබඩාවලට අදාළ Servers වලට හානියක් සිදුවී තිබුණේ නැති බවත් Server Room එක

Down floor එකේ තිබුණ නිසා එයට හානියක් වී තිබුණේ නැති බවත් පවසා පෙර අවස්ථාවක පැ.11 ලෙස ලකුණු කර ඇති හෝටලයට අදාළ අමුත්තන්ගේ විස්තර ඇතුළත් ලේඛනය හඳුනා ගනිමින් එයට අමතරව විමර්ශන නිලධාරීන් විසින් ඉල්ලා සිටි පරිදි ඒ ඒ ස්ථාන වලට අදාළ Screen Shot Print කර ලබා දීමද සිදු කරන ලද බවටත් සාක්ෂිකරු විසින් පවසා ඇත.

පැ.සා.1007 ෂෙනෙල් මවින්දි ඇන්තනී නැමැති සාක්ෂිකාරිය අධිකරණයේ සාක්ෂි ලබා දෙමින්, ඇය 2018 වසරේ Hospitality Management උපාධියක් සම්පූර්ණ කර 2018 ෂැංග්‍රිලා හෝටලයේ පුහුණු වීමක් ලබා 2019 ෆ්‍රන්ට් Office Associate කෙනෙක් ලෙස සේවය කරන ලද බවත් හෝටලයට පැමිණෙන අමුත්තන් හෝටලයට ඇතුල් කර ගැනීම සහ හෝටලයෙන් පිටවීමට අදාළව ආසන වෙන් කිරීමේ කවුන්ටරයට අදාළව රාජකාරී කටයුතු සිදු කරන ලද බවත් එම කවුන්ටරය හෝටලයේ පළමුවන මහලේ ලොබි එකේ තිබෙන බවත් එහි කවුන්ටර් 04 ක් තිබෙන බවටත් ඇය පවසා ඇත.

එම සාක්ෂිකාරිය තවදුරටත් පවසා ඇත්තේ, Online Website එකක් හරහාද 03 වන පාර්ශවයක් මඟින් හෝටලයේ කාමරයක් වෙන් කර ගැනීමට පහසුකම් සලසා ඇති බවත් හෝටලයේ යම් කාමරයක් වෙන් කර ගැනීම සඳහා අදාළ කාමරයේ නවතින පුද්ගලයාම අනිවාර්යයෙන්

පැමිණීම අවශ්‍ය නැති බවත් කාමර වෙන් කරවා ගන්නා අවස්ථාවේදී මුදල් ගෙවීම සිදු කෙරෙන බවත් එලෙස පුද්ගලයෙක් කාමර වෙන් කරවා ගැනීමක් සිදු කරන අවස්ථාවකදී එයට අදාළ තොරතුරු දත්ත Opera System එකෙන් පරිගණකයට ඇතුළත් කරන බවත් තමාටද පරිගණක භාවිතය පිළිබඳ දැනීමක් තිබෙන බවත් තමාගේ User Name එක FO SHNELLE බවත් පවසා සාක්ෂි ලබා දී ඇති අතර, පැ.05 ලේඛනය හඳුනා ගනිමින් එය තමා විසින් විස්තර ඇතුළත් කරන ලද දත්ත වල Screen Shot එකක් බවත් එය 2019 අප්‍රේල් 17 දිනට අදාළව පැ.01.56ට අදාළ රෙසවේෂන් එකකට අදාළ බවත් පවසා එය හඳුනා ගෙන ඇත.

පැ.3 (7) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය නරඹමින් එහි 2019.04.17 දිනට අදාළව Front Office එකේ Main Lobby එකට අදාළ දර්ශන තිබෙන බවටත් හඳුනා ගෙන ඇති අතර, එම CCTV දර්ශනවලට අනුව මැද කවුන්ටරයේ තමා සිටින බවත් එසේම, නිමේෂා යනුවෙන් හඳුන්වන නිලධාරිනියද එහි සිටින බවත් තමා ඉදිරිපිට කැප් එකක් පැළඳ බෑග් එකක් එල්ලන් සපත්තු දමා ගෙන කලිසමක් සහ කමිසයක් හැඳ ගත් පුද්ගලයෙකු සිටින බවත් එම තැනැත්තා පැ.5 ලේඛනයට අදාළ රෙසවේෂන් එක සිදු කිරීම සඳහා පැමිණි තැනැත්තා බවත් තමා රෙසවේෂන් එක එම තැනැත්තා නමින් ඔහු පැවසූ පරිදි සෑදූ බවත් එම රෙසවේෂන් එක වෙන කෙනෙක් වෙනුවෙන් යැයි එම තැනැත්තා විසින් තමාට පැවසූ බවත් එලෙස කාමරයක් වෙන් කළේ 2019

අප්‍රේල් 20 දිනට පුද්ගලයන් දෙදෙනෙකු සඳහා එක දවසකට කාමරයක් වෙන් කිරීමක් බවත් තමා ඉදිරියට පැමිණ රෙසවේෂන් එක කළ පුද්ගලයාගේ නම මොහොමඩ් හම්ෂාඩ් බවට සඳහන් වන බවත් එම රෙසවේෂන් එක තහවුරු කිරීම සඳහා 393380 අංකය එයට නිකුත් වූ බවත් ඇය පවසා ඇති අතර, අදාළ පැ.5 ලේඛනයේ මොහොමඩ් හම්ෂාඩ් නමැත්තාගේ හඳුනා ගැනීමේ අංකයන් කිසිවක් තමා ඇතුළත් කර නැති බවත් ඇය පවසා ඇත.

2019 අප්‍රේල් 21 දින තමා වැඩට ආවේ නැති බවත් මෙම බෝම්බ පිපිරීම දැන ගත් පසු තමා ඊට පසු දින සේවයට පැමිණි බවත් තමා විසින් රෙසවේෂන් එක හදපු නිසා ඒ ගැන තමාගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවටත් ඇය පවසා ඇත. මෙම සාක්ෂිකාරිය හරස් ප්‍රශ්නවලටද ලක් වෙමින් තමා ඉදිරියට පැමිණ රෙසවේෂන් එකට අදාළ පුද්ගලයාව පසුව සම්බන්ධ කර ගැනීමට හෝ තමා ඔහුගේ දුරකථන අංකයක් ලබා ගෙන නැති බවත් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකයද තමා සටහන් කර ගෙන නැති බවටත් ඇය පිළිගෙන ඇත.

එසේම, 2019.04.17 වන දින එලෙස පැමිණි පුද්ගලයාගේ අනන්‍යතාවය තමා තහවුරු කර ගත්තද ඔහුගේ ID එක තමා ගත්තේ නැති බවටත් පවසා ඇත. එසේම, තමාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී

යම්කිසි *CCTV* දර්ශනයක් ප්‍රදර්ශනය කර පෙන්වූ බවට තමාට මතක නැති බවටත් ඇය පවසා ඇත.

එසේම, 2019.04.17 වන දින කාමරය වෙන් කර ගත් පුද්ගලයාගේ නම මොහොමඩ් යනුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවට විත්තිය වෙනුවෙන් ඇයට කරන ලද යෝජනාව ඇය පිළිගෙන ඇති අතර, එම නම තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවසා සිටියේ කෙලෙසද යන්න තමාට මතකයක් නැති බවටද ඇය පවසා ඇත.

පැ.සා.1015 මුණුසාමි මුහුන්දන් නමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා මාලිගාවත්ත බෝධිරාජ මාවතෙහි පදිංචිව සිටින බවත් රැකියාව ලෙස ත්‍රීවිල් රථ රියදුරෙකු ලෙස සේවය කරන ලද බවත් 2019 වසරේ *WP.AVC 1019* දරන ත්‍රීවිල් රථය භාවිතා කරන ලද බවත් තමා එය 2019 හත් වෙනි මාසයේ විකිණීම කළ බවටත් සාක්ෂි ලබා දි ඇත. 2019.04.17 වන දින තමා ඕලන්ද රෝහල ඉදිරිපිට ත්‍රීරෝද රථය නවතා ගෙන සිටියදී බම්බලපිටිය *MC* එකට යාමට හයර් එකක් ගොස් නැවත ඕලන්ද රෝහල දෙසට එමින් සිටියදී *Taj Samudra* හෝටලය ඉදිරිපිටදී යම් තැනැත්තෙකු තමාට අතින් සංඥා කළ බවත් එම තැනැත්තා හෝටලයේ ගේට්ටුව පැත්තේ සිටි බවත් එම තැනැත්තා පාර පැන මුහුද පැත්තට ඇවිත් තමාගේ ත්‍රීවිල් රථයට නැග ෂැංග්‍රිලා හෝටලයට යන්න ඕන බව පැවසූ බවත් එවිට වෙලාව 1.*00* ට පමණ ඇති බවත් එම පුද්ගලයා

තනිව පැමිණි බවත් තමා එම පුද්ගලයාව ෂැංග්‍රිලා හෝටලයේ ලොබි එකේ බැස්සූ බවත් ගාස්තුව වශයෙන් රු.100 ක් තමාට ලැබුණු බවත් එම තැනැත්තා ත්‍රීවිල් රථයෙන් බැස හෝටලය ඇතුළට ගිය බවත් තමා ඉන්පසු පිටවී පැමිණි බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා සමඟ එලෙස ෂැංග්‍රිලා හෝටලයට හයර් එකක් ගිය තැනැත්තා අවුරුදු 30 ක් 35 ක් පමණ වයසැති කෙට්ටු පිරිමි තැනැත්තෙකු බවත් ඔහු ටී ෂර්ට් එකක් හැඳ සිටි බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර, පෙර අවස්ථාවක පැ.3 (6) ලෙස ලකුණු කර ඇති ෂැංග්‍රිලා හෝටලයෙන් ලබා ගන්නා ලද *CCTV* දර්ශන ඇතුළත් වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කර පෙන්වා දී ඇති අතර සාක්ෂිකරු එහි තමාගේ *WP.AVC.1019* නමැති ත්‍රීවිල් රථය තිබෙන බවත් ඒ තුළ තමා සිටින ආකාරය පෙනෙන බවත් එම *CCTV* දර්ශනවලට අදාළ වේලාව 13:51:04 බවටත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 දින රාත්‍රී කොච්චිකඩේ සෙන් ඇන්තනි පල්ලියේ, කිංග්ස්බරි හෝටලයේ සහ ෂැංග්‍රිලා හෝටලයේ, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ පිපිරීම් සිදුවූ බවට තමා දැන ගත් බවත් 2019.04.21 රාත්‍රී පැය 01.30 ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමාගේ නිවසට පැමිණි බවත් ඉන්පසු තමාව ෂැංග්‍රිලා හෝටලයේ පිටිපස්සෙන් බේස්මන්ට් එකට එක්කන් ගිය බවත් එහිදී අදාළ *CCTV* වීඩියෝ නැරඹීමෙන් පසු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් පවසා සිටි තැනැත්තා එහිදී ද හඳුනා ගත් බවට සාක්ෂි ලබා දී ඇත. මෙම

සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 872 පල්ලේ ගෙදර චාමර ධනුෂ්ක බණ්ඩාර යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2019 වසර වනවිට උබර් කුලී රථ සේවාවට සම්බන්ධ වී තමාගේ මිතුරෙකුගේ කාර් රථයක සේවය කළ බවත් බෝම්බ ප්‍රහාරය 2019.04.21 සිදු වුණ බවට සාක්ෂිකරු පවසා ඇති අතර තමාගෙන් ෂැංග්‍රිලා හෝටලයේ සිට කොලොන්නාව දක්වා කුලී ගමනක් යාම සඳහා පිරිමි පුද්ගලයෙකු එනම් කැප් එකක්, ටී ෂර්ට් එකක් සහ ඩෙනිම් කලිසමක් සහ ඩෙක්ෂූස් දමා සිටි පුද්ගලයෙකු උබර් නැමති ඇප් එක හරහා සම්බන්ධ වුනු එනම් පුද්ගලයෙකු හයර් එකක් ගිය බවට සඳහන් කර ඇති අතර පැ.13 ලෙස ලකුණු කර ඇති *CCTV* වීඩියෝ දර්ශනය මෙම සාක්ෂිකරුට නැරඹීමටද ලබා දී ඇති අතර මෙම *CCTV* දර්ශනයෙහි සිටින කැප් එකක් දාගෙන සිටින පුද්ගලයා තමාගේ 2019.04.20 දින පැය 21.05 ට අදාළ වීඩියෝ දර්ශනයෙහි සිටින බවට පවසා එම වීඩියෝ දර්ශනය පැය 13 (7) ලෙස ලකුණු කර ඇති අතර මෙම සාක්ෂිකරුගෙන්ද සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට සඳහන් කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 872 පල්ලේ ගෙදර චාමර ධනුෂ්ක බණ්ඩාර යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.20 දින පැය 21.05

ට අදාළ පැ.13 (7) දරන *CCTV* දර්ශනයෙහි සිටින කැප් එකක් දාගෙන සිටින පුද්ගලයා මෙම සාක්ෂිකරු සමඟ ෂැංග්‍රිලා හෝටලයේ සිට කොලොන්නාව දක්වා කුලී ගමනක් ගොස් ඇති බව පමණක් සනාථ වන අතර කෙසේ වෙතත් එම පුද්ගලයාගේ අනන්‍යතාවය කුමක්ද යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කරුණු කිසිවක් ඉදිරිපත් නොවන අතර අප විසින් පෙර අනිකුත් සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් ද සඳහන් කරන ලද පරිදි මෙම පැ.13 (7) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනයේ සිට මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති ඉහත පරිදි කැප් එකක් ඇඳ ටී ෂර්ට් එකක් සහ ඩෙනිම් කලිසමක් ඇඳ ඩෙක්ෂූස් දමා මෙම සාක්ෂිකරු සමඟ උබර් කුලී රථ සේවාවෙන් කුලී ගමනක් කොලොන්නාවට ගිය පුද්ගලයාගේ නිවැරදි නිශ්චිත අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී තිබේද යන්න සළකා බැලිය යුතුය.

ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ ප්‍රහාරයට අදාළ සාක්ෂි විශ්ලේෂණය

පැමිණිල්ලේ සාක්ෂි අංක 943 නිශංකා හංසමාලි වැලිකල සාක්ෂිකාරියගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් ඇය විසින් පැ.01 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේ සහරාන් වශයෙන් හඳුනාගත් පුද්ගලයා ඇය එදිනට පෙර දන්නා හඳුනන පුද්ගලයෙකු නොවන බවත් සහ එම තැනැත්තා සහරාන් වශයෙන් ඇය

හඳුනාගන්නා ලද්දේ මාධ්‍ය තුළ සඳහන් වී තිබූ නිසා බවට පෙනී යයි. කෙසේ වෙතත් ඇයගේ සාක්ෂියට අනුව 2019.04.21 වන දින ෂැංග්‍රිලා හෝටලයේ දෙවන මහලේ ජුවලරි ෂොප් එක තිබුණු ස්ථානයේ එනම් තුන්වන මහලේ සිට දෙවන මහලට එන පඩිපෙළ ආසන්නයේ පැය 8.54 තත්පර 18 ට පළවෙනි බෝම්බය පිපිරී ඇති බවට සහ ඉන්පසු පැය 8.54 තත්ත්පර 59 ට තුන්වන මහලට ඇතුල් වන ස්ථානයේ දෙවෙනි බෝම්බය පිපිරී ඇති බවට යනුවෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇත.

ඇගේ සාක්ෂියට අනුව ඇය විසින් එලෙස බෝම්බ පිපිරීමට පැමිණි පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකු සහාරාන් බවට හඳුනාගෙන ඇති අතර එම පුද්ගයා සහරාන් නැමැත්තා බවට ඔහුගේ අනන්‍යතාවය ඇය හඳුනාගෙන ඇත්තේ බාහිර පාර්ශවයන්ගෙන් සහ මාධ්‍ය තුළින් ඒ සම්බන්ධයෙන් ප්‍රචාරය වූ ප්‍රවෘත්තිවලින් බවට පැහැදිලිව පෙනී යයි. ඒ හැර මෙම අධිකරණය ඉදිරියේ සිටින චූදිතයන් 24 දෙනා සහ මේ වනවිට මියගොස් ඇති 17 වන චූදිත සම්බන්ධයෙන් කිසිදු කරුණක් හෙළි වන්නේ නැත.

මෙම පැමිණිල්ලෙන් 02 වන සාක්ෂිකරු ලෙසට කැඳවා ඇති **පැ.සා.1012 රුක්මන් තිලකරත්න** නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය මනාව විශ්ලේෂණය කර බැලීමේදී අධිකරණයට පෙනී යන්නේ ඔහුගේ සාක්ෂියේදී ඔහු විසින් හඳුනාගෙන ඇති පැ.03 (1) සිට පැ.03 (54) දක්වා

අංකනය කර ඇති මෙම සාක්ෂිකරු විවෘත අධිකරණයේදී නැරඹීමෙන් අනතුරුව හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති CCTV දර්ශන සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂියෙහි විශ්වාසනීයභාවය සම්බන්ධයෙන් සැක සහිත භාවයක් උත්පාදනය නොවන බවයි.

ඔහුගේ සාක්ෂිය තුළින් මෙම අධිකරණයට මැනවින් පෙනී යන්නේ මෙම අධිකරණය ඉදිරියේ පෙර අවස්ථාවක පැ.01 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙහි පළවෙනි පිටුවේ සහ හතරවෙනි පිටුවේ දිස්වන ඡායාරූපවල සිටින පුද්ගලයන් දෙදෙනා 2019.04.20 දින ෂැංග්‍රිලා හෝටලයට පැමිණ 2019.04.21 වන දින අදාළ බෝම්බ පිපිරීම අවස්ථාව දක්වාම මෙම ස්ථානයේ සිට ඇති පුද්ගලයන් දෙදෙනාම බවත් බෝම්බ පිපිරීමට මොහොතකට ප්‍රථමයෙන් එම පුද්ගලයන් දෙදෙනාම විශාල ප්‍රමාණයේ බැක් පැක් බෑගද පිටෙහි පැළඳගෙන සිට ඇති පුද්ගලයන් දෙදෙනාම වන අතර 2019.04.20 දින ෂැංග්‍රිලා හෝටලයේ හයවන මහලේ කාමර අංක 613 සිට 617 දක්වා වූ කාමර තිබෙන කොටසෙහි එම පුද්ගලයන් දෙදෙනා සිට ඇති බවද එම මහලේ සිට තුන්වන මහලේ පිහිටි ටේබල් වන් අවන්හල වෙත බෝම්බ පිපිරීමට ඉතා ආසන්න වේලාවක් තුළ ඉහත පරිදි බැක් පැක් දෙකක්ද පැළඳ පැමිණ ඇත්තේද එම පුද්ගලයන් දෙදෙනාම බවට මැනවින් සනාථ වේ.

කෙසේ වෙතත් මෙම සාක්ෂිකරු එම පුද්ගලයන් දෙදෙනාගේ අනන්‍යතාවය පිළිබඳ 2019.04.20 දිනට පෙර කිසිදු පෙර දැනීමක් තිබූ අයෙකු නොවන අතර, හුදෙක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මෙම නඩුවෙහි මුලින්ම සාක්ෂි ලබා දුන් සාක්ෂිකාරියක් වන (පැ.සා.943) නිශංකා හංසමාලි වැලිකල යන සාක්ෂිකාරිය එනම් 2019.04.21 දින ෂැංග්‍රිලා හෝටලයේ ටේබල් වන් අවන්හලෙහි ආහාර පාන අංශයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී 2019.04.21 දින පෙරවරු 8.54 යි තත්පර 18 ට සහ එදිනම පෙරවරු 8.54 යි තත්පර 59 ට පුපුරා ඇති ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු වූ අවස්ථාවට අදාළව CCTV දර්ශන ආශ්‍රයෙන් ලබා දුන් සාක්ෂිය මනාව තහවුරු කිරීමක් කරන අතර කෙසේ වෙතත් එලෙස ඉහත පරිදි ඉතා ආසන්න අවස්ථා දෙකකදී බෝම්බ පුපුරා හැරීම සිදු කරන ලද පුද්ගලයන් දෙදෙනා එනම් පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු හතරකින් යුතු ලේඛනයෙහි පළවෙනි පිටුවේ සහ හතරවෙනි පිටුවේ අඩංගු ඡායාරූපවල සිටින තැනැත්තාම බවට සහ එලෙස ඉහත පරිදි ඉහත කී පිපිරීම් දෙක සිදු කරන ලද්දේ සහරාන් සහ ඉන්සාෆ් යන අය බවට එම පුද්ගලයන් දෙදෙනාගේ අනන්‍යතාවය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ. ඒ අනුව ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී තිබේද? යන්න සම්බන්ධයෙන් අප සළකා බැලිය යුතුය.

විශේෂයෙන් 13 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුට පැ.3 (32) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය පෙන්වමින් එම CCTV දර්ශන තිරයේ පහළ කෙළවරේ 12/25/2014 ලෙස දිනයක් සඳහන් වී ඇති බවත් එසේම, පැ.3 (21) දරන CCTV දර්ශනය 13 වන චූදිත වෙනුවෙන් 13 (V) (1) ලෙස ලකුණු කරමින් සාක්ෂිකරුගේ අවධානයට ලක් කර ඇත්තේ එම CCTV දර්ශනයේද පහළ කෙළවරේ 2014.12.25 යන දිනය සඳහන්ව තිබෙන බවත් පැ.3 (23) දරන CCTV දර්ශනයද ඒ ආකාරයෙන්ම සාක්ෂිකරුට පෙන්වා දෙමින් එයද 13 (V) (2) ලෙස ලකුණු කරමින් එම CCTV දර්ශනයේද 2014.12.25 යනුවෙන් දිනයක් සඳහන් වී තිබීම යෝජනා කර ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ, අදාළ CCTV දර්ශන තමාලා විසින් පරීක්ෂා කරන ලද මොනිටර් එකේ එවැන්නක් සඳහන් වන්නේ නැති බවත් තමා සඳහන් කරන ලද පරිදි එම CCTV දර්ශනයේ ඉහළ ප්‍රදේශයේ තමා සඳහන් කළ දින සහ වේලාවන් කොළ පාටින් සඳහන් වී තිබෙන බවයි.

එසේම, විත්තියෙන් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, ඔහු විසින් මෙම සාක්ෂිකරුගේ අවධානයට ලක් කරන ලද CCTV දර්ශන සංස්කරණය කිරීමට ලක් කර ඇති බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට ඒ ගැන ප්‍රකාශයක් කිරීමට නොහැකි බවත් 2014.12.25 දින වන විට ෂැංග්‍රිලා හෝටලය විවෘත වීමක් හෝ වෙලා තිබුණේ නැති බවත් වේ.

පැ.සා.1012 රුක්මන් තිලකරත්න යන නමැති විශ්‍රාමික හමුදා නිලධාරියාගේ සාක්ෂිය ඇගැයීමට ලක් කිරීමේ දී පෙනී යන කරුණක් නම් මෙම සාක්ෂිකරුගේ සාක්ෂි වලට අනුවද, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.943 නිශ්ශංකා හංසමාලි වැලිකල යන සාක්ෂිකාරිය විසින් තම සාක්ෂියේදී CCTV දර්ශන නරඹමින් ලබා දුන් සාක්ෂි තහවුරු කරමින් සාක්ෂි ලබා දී ඇති ආකාරය පෙනී යයි.

විත්තියෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, ඔහු හට CCTV දර්ශන පිළිබඳව මනා දැනීමක් නොමැති තැනැත්තෙකු බවට වුවද එම සාක්ෂිකරුගේ සාක්ෂිය සමස්තයක් ලෙස ගෙන ඇගයීමට ලක් කිරීමේදී ඔහු දේශීයව මෙන්ම විදේශීයවද හෝටල් ආශ්‍රිත රැකියා වල නිරත වෙමින් CCTV නිරීක්ෂණ කාමර වල සේවය කර මනා පළපුරුද්දක් ඇති තැනැත්තෙකු බව පෙනී යන අතර, ඒ අනුව බලන කළ ඔහු විසින් මෙම නඩුවට අදාළව පැමිණිල්ලෙන් මෙම අධිකරණය ඉදිරියේ ලකුණු කරන ලද පැ.3 (1) සිට පැ.3 (54) දක්වා CCTV දර්ශනයන් නරඹමින් ඔහු විසින් ලබා දී ඇති සාක්ෂි සම්බන්ධයෙන් කිසිදු සැක සහිත භාවයක් අප හට පෙනී යන්නේ නැත. ඒ අනුව ඔහු ලබා දුන් සාක්ෂිය සත්‍ය සාක්ෂියක් ලෙසට අප පිළිගනිමු.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුවද 2019.04.21 වෙනි දින පෙරවරුවේ ෂැංග්‍රිලා හෝටලය තුළ එකිනෙකට ඉතා ආසන්න වේලාවන්

තුළ බෝම්බ 02 ක් පිපිරී ඇති බව සනාථ වී ඇති අතර එසේම, එකී බෝම්බ පිපිරවීමට අදාළව සාක්ෂිකරු විසින් විවෘත අධිකරණයේදී නරඹා හඳුනා ගන්නා ලද CCTV දර්ශන වල සිටින විශාල ප්‍රමාණයේ බැක්පැක් පැළඳ සිටි පිරිමි තැනැත්තන් දෙදෙනා 2019.04.17 දින ෂැංග්‍රිලා හෝටලයට පැමිණ ඇති බව සහ එසේම, ඔවුන් 2019.04.21 දින බෝම්බ පිපිරවීමේ සිද්ධිය සිදුවූ අවස්ථාව දක්වාම ෂැංග්‍රිලා හෝටලයේ නැවතී සිට වරින් වර හෝටලයෙන් පිටතට ගොස් යළි පැමිණ ඇති බව සනාථ වන අතර, එම පුද්ගලයන් දෙදෙනා බෝම්බ පිපිරවීමට මද වෙලාවකට ප්‍රථමයෙන් 2019.04.21 දින 06 වන මහළේ සිට 03 වන මහළේ පිහිටි Table one අවන් හලට විශාල ප්‍රමාණයේ Backpack 02 ක් පැළඳ ගෙන පැමිණි ආකාරයද සනාථ වන අතර එසේම, එම පුද්ගලයන් දෙදෙනා ෂැංග්‍රිලා හෝටලයේ 06 වන මහළේ කාමර අංක 616 හි නැවතී සිට ඇති ආකාරය අධිකරණය ඉදිරියේ සනාථ වී ඇති අතර, එම පුද්ගලයන් දෙදෙනා පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු 04 කින් සමන්විත ලේඛනයෙහි 01 වන පිටුවේ සහ 04 වන පිටුවේ තිබෙන ඡායාරූප වල සිටින පුද්ගලයන් දෙදෙනා එලෙස 2019.04.21 දින ෂැංග්‍රිලා හෝටලයේ Table one අවන්හල ආසන්නයේ සිදු වූ ස්වයංඝාතක බෝම්බ 02 ක් පිපිරවීමට අදාළ පුද්ගලයින් දෙදෙනා බවට කරුණු සනාථ වී ඇත.

කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව දෙපාර්ශවය විසින් ම දින විධිමත්ව වාර්තා කර ඇති පිළිගැනීම් ප්‍රකාරව එම පුද්ගලයින් දෙදෙනාගේ නිශ්චිත අනන්‍යතාවය සම්බන්ධයෙන් හබ කිරීමක් සිදු වී නොමැත.

පැ.සා.2191 ළහිරු ශානිෂ විතානගේ යන සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් පැ.04 ලෙස ලකුණු කර ඇති, ෂැංග්‍රිලා හෝටලයේ කාමර අංක 616 ට අදාළ ඉලෙක්ට්‍රොනික් ඩ්‍රොරීන්ඩින් සම්බන්ධ පිටු අංක 50 සිට 59 දක්වා වන ලේඛනයේ තොරතුරුවලට අනුව 2019.04.20 දින රාත්‍රී 8.11 ට බෝම්බ පිපිරීමට සම්බන්ධ යැයි සැක කරන පුද්ගලයන් දෙදෙනා ඉහත කී 616 කාමරයට ඇතුළු වී ඇති බව සහ එම පුද්ගලයන් දෙදෙනා 2019.04.21 දින 08 වෙනි පැය 50 වෙනි විනාඩියට එම කාමරයෙන් දොර විවෘත කර පිටතට පැමිණ ඇති බව සහ බෝම්බ පිපිරීමෙන් පසුව එකී 616 අංක දරන කාමරය 2019.04.21 උදේ 09.52 ට මෙම සාක්ෂිකරු භාරයේ තිබූ දොර විවෘත කිරීමේ කාඩ් පත මඟින් ආරක්ෂක නිලධාරීන් *STF* නිලධාරීන් ඉදිරියේ බෝම්බ පරීක්ෂා කරන උපකරණද රැගෙන පැමිණි *STF* නිලධාරීන්ගෙන් එක් නිලධාරියෙකු තමාගේ කාඩ් පත ලබාගෙන එම කාමරයේ දොර විවෘත කළ බවට හෙලිවන අතර, ඒ අනුව 2019.04.21 දින පැය 08.50 හා ඒ ආසන්න කාලයෙන් පසුව එනම් අදාළ බෝම්බ දෙක පිපිරීමෙන් පසුව කාමර අංක 616 ප්‍රථම වරට විවෘත වී ඇත්තේ මෙම සාක්ෂිකරු ඉදිරියේ කාමරයට ඇතුළු වීමේ දොර විවෘත කිරීමේ කාඩ්පත මෙම සාක්ෂිකරුගේ

කාඩ්පත උපයෝගී කරගෙන ඇත්තේ බෝම්බ නිෂ්ක්‍රීය අංශයේ නිලධාරීන් පමණක් බව පෙනී යන අතර මෙම සාක්ෂිකරු මඟින් මෙහෙයවා ඇති සමස්ත සාක්ෂිය අනුව ෂැංග්‍රිලා හෝටලයේදී 2019.04.21 වන දින පෙරවරුවේ එකිනෙකට ආසන්නම වේලාවක් තුළ සිදු වූ බෝම්බ පිපිරීමට සම්බන්ධ ඉහත කී පුද්ගලයන් දෙදෙනා නැවතී සිට ඇත්තේ ඉහත කී කාමර අංක 616 හි ම බවට මැනවින් සනාථ වේ. එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින්ද හෙලිවන පරිදි මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1012 රුක්මන් තිලකරත්න නැමැති සාක්ෂිකරු පැ.03 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයට අනුව බෝම්බ පිපිරීමේ දර්ශනය සිදුවූ අවස්ථාව වනවිට CCTV කාමරයෙහි CCTV දර්ශන නිරීක්ෂණය කරමින් සිටි නිලධාරියා බවට ද සනාථ වේ.

එසේම සමස්තයක් ලෙස ගෙන මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2192 තරිදු අමරජීත් සිල්වා යන සාක්ෂිකරුගේ සාක්ෂිය ද ඇගයීමට ලක් කිරීමේදී ඔහු ස්වාධීනව, ෂැංග්‍රිලා හෝටලයෙහි CCTV කැමරා පද්ධතියට අදාළ ඇඩ්මින් ෆොපයිල් එක භාරව සිටි නිලධාරියා වශයෙන්, ෂැංග්‍රිලා හෝටලයේ කළමණාකාරීත්වයෙන් කරන ලද දැනුම් දීම මත ෂැංග්‍රිලා හෝටලයෙහි CCTV පද්ධතියට අදාළව සර්වර් යන්ත්‍රයේ තැන්පත් වී තිබූ දත්තයන් නිවැරදිව නිසි තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ බාගත කිරීම් සිදු කර හෝටලයේ ආරක්ෂක අංශ වෙත බාරදීමට අදාළව රාජකාරිමය කටයුත්තක් සිදු කරන ලද තැනැත්තෙකු බවයි.

විත්තියෙන් ඔහුව කිසිදු හරස් ප්‍රශ්න කිරීමකට ලක් කර නොමැති බැවින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය කිසිදු අභියෝගයකට ලක් නොවී මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති සාක්ෂියක් බවට අප තීරණය කරමු.

පැ.සා.1011 කසුන් කාවින්ද නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් වන්නේ 2019.04.20 දින ෂැංග්‍රිලා හෝටලයෙහි අමුත්තන් පිළිගැනීමේ ස්ථානයේදී මෙම නඩුවට අදාළව පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු 04 කින් සමන්විත ලේඛනයෙහි තිබෙන ඡායාරූපවල සිටින පුද්ගලයන් දෙදෙනා 2019.04.20 වන දින ෂැංග්‍රිලා හෝටලයට රාත්‍රී 8.07 ට පමණ ජීව දත්ත තොරතුරු ලබා දී කාමර අංක 616 ට අදාළව ගෙවීම් කටයුතු සිදු කිරීමක් කර එම කාමරයට ඇතුළු වීම සඳහා අවශ්‍යය වන ඩිජිටල් කී එකද එනම් විද්‍යුත් යතුරද එම පුද්ගලයන් දෙදෙනා විසින්ම ලබාගෙන ඇති බව වන අතර එසේම, ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළ CCTV දර්ශන අතුරින් පැ.03 (21) දරන CCTV දර්ශනයෙහි ද එම පුද්ගලයන් දෙදෙනා සිටින බවට හඳුනාගෙන තිබීම තුළින් අදාළ බෝම්බ දෙක පිපිරවීමේ සිද්ධියට අදාළ සැකකරුවන් දෙදෙනා ලෙසට මෙම අධිකරණයේ මුලින්ම සාක්ෂි ලබා දීම සිදු කළ පැ.සා.943 නිෂංකා හංසමාලී වැලිකල යන සාක්ෂිකාරිය ලබා දුන් බෝම්බ පිපිරීම සිදුවුණු ස්ථානයට ඉතාම ආසන්නයේ පිහිටි Table.01 අවන්හලේ සේවය කළ නිෂංකා හංසමාලී වැලිකල යන අය විසින් ලබා

දුන් සාක්ෂිය හා මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අතර මනා ගැලපීමක් තිබෙන බව සනාථ වී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.20 දින මෙම සාක්ෂිකරු විසින් හෝටලයට පැමිණි අමුත්තන් දෙදෙනෙකු ලෙස ජීව දත්ත විස්තර ලියාපදිංචි කර කාමර අංක 616 ඔවුන්ට වෙන් කර දීමට අදාළ විද්‍යුත් යතුර ලබා ගෙන ඇති මෙම සාක්ෂිකරුට නම් ලබා දී ඇති මොහොම්ඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා සහ ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් යන පුද්ගලයන් දෙදෙනා විසින්ම 2019.04.21 දින පෙරවරු 8.50 ට ආසන්න වේලාව තුළ ෂැංග්‍රිලා හෝටලයේ තුන්වන මහලේ Table.01 අවන්හල අසල බෝම්බ දෙක පිපිරීම කරන ලද පුද්ගලයන් දෙදෙනාම බවට ඔවුන්ගේ අනන්‍යතාවය මෙම අධිකරණය ඉදිරියේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති අතර එනම් ඉහත කී නම් දෙකෙන් හැඳින්වෙන පුද්ගලයන් දෙදෙනා පැ.01 ලෙස ලකුණු කර ඇති පිටු 4 කින් යුතු ලේඛනයෙහි ඇති ඡායාරූපවල සිටින පුද්ගලයන් දෙදෙනාම බවට සාධාරණ සැකයෙන් ඔබ්බට පැමිණිල්ල විසින් ඔප්පු කර ඇත.

පැ.සා.1008 දීපිකා නිලන්ති සත්‍යපාල නමැති සාක්ෂිකාරියගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීම තුළින්ද පෙනී යන්නේ, ෂැංග්‍රිලා හෝටලයේ Table. 01 අවන්හල තුළ සහ ඊට ආසන්නයේ පිහිටි විද්‍යුත්

පඩිපෙල අසල බෝම්බ 02 ක් පිපිරීම සිදුවී තිබීම මෙන්ම පැ.01 දරන ලේඛනයේ සහ පැ.3 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන පෙළෙහි සිටින පුද්ගලයන් දෙදෙනා මෙම සාක්ෂිකාරියට ෂැංග්‍රිලා හෝටලයේ 03 වන මහළේ Table. 01 අවන්හලට ඇතුළු වන ස්ථානයේදී මුහුණට මුහුණ මුණ ගැසී ඇය විසින් ඔවුන් දෙදෙනාට ආචාර කිරීමක්ද සිදුකර ඇති බව වන අතර එසේම, එම අවස්ථාවේදීද ඔවුන් දෙදෙනා පිටෙහි බෑග් 02 ක් එල්ලා ගෙනද සිට ඇති බවට වන කරුණද, එසේම, ෂැංග්‍රිලා හෝටලයේ කාමර අංක 616 හි නැවතී සිට ඇති මොහොමඩ් ඉබ්‍රාහිම් ඉල්හාම් සහ මුබාරක් අසාම් මොහොමඩ් යන පුද්ගලයන් දෙදෙනාම 2019.04.21 දින බෝම්බ සිද්ධියෙන් මියගොස් ඇති බවට පැ.11 දරන හෝටලයේ නැවතී සිටි අමුත්තන්ගේ විස්තර ඇතුළත් ලේඛනයෙහි විස්තර ඇතුළත් කර ඇති බවට වේ.

කෙසේ වුවත්, ෂැංග්‍රිලා හෝටලයෙහි Table. 01 අවන්හල තුළ සහ එයට ආසන්න විද්‍යුත් පඩිපෙළ ආසන්නයේ බෝම්බ 02 ක් පුපුරණු ලද පුද්ගලයන් දෙදෙනා ඉහත පරිදි කාමර අංක 616 හි නැවතී සිට ඇති මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් සහ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන පුද්ගලයන් දෙදෙනාම බවට මෙම නඩුවට අදාළව දෙපාර්ශවය විසින් ම පිළිගෙන ඇති 2026-07-10 දිනැති පිළිගැනීම් තුළින් මැනවින් සනාථ වේ.

මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2193 මොහොමඩ් ෂහාඩ් ටිරෝන් කාසිම් යන මෙම සාක්ෂිකරුගෙන් 05 සහ 16 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර, අනෙකුත් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නැති අතර, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම්, පෙර අවස්ථාවක පැ.05, පැ.06, පැ.07 ලෙස ලකුණු කර ඇති සහ පැ.11 ලෙස ලකුණු කර ඇති ලේඛනයන් ෂැංග්‍රිලා හෝටලයෙහි පරිගණක දත්ත පද්ධතියෙන් Opera නමැති දත්ත ගබඩා වීමේ System එක හරහා ලේඛන ලබා ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී තිබීම සනාථ වේ. කෙසේ වෙතත් මෙම නඩුවට පාදක වන සිද්ධියට අදාළ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් හා එයට වගකිවයුතු පුද්ගලයන් සම්බන්ධයෙන් කිසිදු දැනුමක් මෙම සාක්ෂිකරුට තිබී නොමැති බව පෙනී යන අතර, ඉහත කී පරිගණක ආශ්‍රිත මුද්‍රිත ලේඛණ වල පැවැත්ම, ඒකාග්‍රතාවය සහ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් පමණක් ඔහුගේ සාක්ෂියෙන් කරුණු ඉදිරිපත් වී ඇති ආකාරය අපහට පෙනී යයි.

පැ.සා.1007 ෂෙනෙල් මවින්දි ඇන්තනී නමැති සාක්ෂිකාරියගේ සාක්ෂි ඇගයීමට ලක් කිරීමේදී සනාථ වන්නේ ෂැංග්‍රිලා හෝටලයෙහි කාමර අංක 616 පුද්ගලයන් දෙදෙනෙකු වෙනුවෙන් වෙන් කරවා ගැනීම සඳහා 2019.04.17 වන දින මෙම සාක්ෂිකාරිය ඉදිරියට පැමිණ ඇති ඇය පවසන පරිදි මොහොමඩ් හම්ෂාඩ් නමැති පුද්ගලයෙකු පැමිණ ඇති බව සහ

එම තැනැත්තා විසින් ලබා දුන් තොරතුරු ඇතුළත් කර මෙම සාක්ෂිකාරිය විසින් පැ.05 දරන ලේඛනයට අදාළ දත්ත පරිගණක ගත කිරීමට පියවර ගෙන ඇති බවයි. මෙම නඩුවට අදාළව ෂැංග්‍රිලා හෝටලයෙහි 2019.04.21 වන දින බෝම්බ පිපිරීම සිදුවූ දිනයේ මෙම සාක්ෂිකාරිය සේවයට වාර්තා කර නොමැති බව ඇගේ සාක්ෂිය තුළින් හෙලි වන පසුබිම තුළ එකී බෝම්බ පිපිරීමට අදාළව කරුණු කිසිවක් පවසා සිටීමට මෙම සාක්ෂිකාරියට හැකියාවක් තිබී නැති අතර, හුදෙක් ෂැංග්‍රිලා හෝටලයේ කාමර අංක 616 පුද්ගලයන් දෙදෙනකු වෙනුවෙන් 2019.04.20 දිනට වෙන් කරවා ගැනීමට අදාළව මොහොමඩ් හම්ෂාඩ් නමැත්තා විසින් ෂැංග්‍රිලා හෝටලයෙහි ඇය සේවය කළ කවුන්ටරය ඉදිරියට පැමිණ තොරතුරු ලබා දී ඉහත කී කාමරය වෙන් කරවා ගැනීමේ ක්‍රියාවලිය සිදුවී ඇති බව පමණක් පැහැදිලි වේ. ඒ හැර මෙම නඩුවෙහි චූදිතයන් කිසිවකු සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියෙන් කිසිදු කරුණක් හෙළි නොවේ.

පැ.සා.1015 මුණුසාමි මුහුන්දන් නමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයේ නැග 2019.04.17 වන දින ෂැංග්‍රිලා හෝටලයේ ලොබි එකෙන් බැස හෝටලය තුළට පුද්ගලයෙකු ගිය බවට පමණක් සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි කිසිවක් මෙම සාක්ෂිකරුගෙන් ඉදිරිපත් වී නැති අතර, හුදෙක් එම දිනයේ එම වේලාවේ

මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයෙන් එම පුද්ගලයා ෂැංග්‍රිලා හෝටලයට හයර් එකක් යාම පමණක් සනාථ වේ. සමස්තයක් ලෙස ගෙන ඔහුගේ සාක්ෂිය ඇගයීමේදී ඔහුගේ සාක්ෂිය මඟින් ඉහත කී බෝම්බ පිපිරීම්වලට අදාළව පාර්ශවයන් සම්බන්ධයෙන් හෝ මෙම නඩුවේ වූදිතයන් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

පැ.සා. 1016 අබ්දුල් නාසර් මොහොමඩ් නසීර් යන ත්‍රීරෝද රථ රියදුරාගේ සාක්ෂියෙන් හුදෙක් හෙලි වන්නේ, 2019.04.17 වන දින මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයෙන් ෂැංග්‍රිලා හෝටලයේ සිට කිංග්ස්බරි හෝටලය දක්වා පුද්ගලයෙකු කුලී ගමනක් යාම සිදු කර එම තැනැත්තා කිංග්ස්බරි හෝටලයේ සිට යළි පැමිණ මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයෙන් ඩෑම් ස්ට්‍රීට් පොලිස් ස්ථානය දක්වා ගමන් කිරීම පමණක් වන අතර, එලෙස පැ.13 දරන CCTV දර්ශන පටයට අනුව මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයේ ගමන් කරන ලද පුද්ගලයාගේ බාහිර ස්වරූපය සහ ඔහු හැඳ සිටි ඇදුම් පැළඳුම් සම්බන්ධයෙන් විනා එම පුද්ගලයාගේ නිශ්චිත අනන්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

පැ.සා.1018 මදනසිංහ නිමේෂ් චාමින්ද නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමේදී පෙනී යන කරුණක් නම් ඔහුට අයත් SP CBB 3681 දරන වාහනයෙන් 2019.04.19 දින උදෑසන 7.27 පැ.3 (10) CCTV

දර්ශනයෙහි සිටින පුද්ගලයන් දෙදෙනා ෂැංග්‍රිලා හෝටලයට කුලී ගමනක් ලෙස රැගෙන ගොස් බැස්සවීම සිදු කර ඇති බව වේ. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් ලකුණු කර ඇති පැ.15 දරන දුරකථන විස්තර වාර්තාවට අනුව අංක 071-2345007 අංක දරන එවකට මෙම සාක්ෂිකරු භාවිතා කළ මොබිටෙල් ජංගම දුරකථන සම්බන්ධතාවයට අදාළ පැ.15 දරන දුරකථන විස්තර වාර්තාවට අනුව 2019.04.19 දින එම දුරකථනය සමඟ අංක 077-5075441 දරන ජංගම දුරකථනයෙන් ඇමතුම් ලැබී තිබීම හෙළිවන අතර කෙසේ වෙතත් එකී ජංගම දුරකථන අංකය එනම් පැ.17 ලෙස ලකුණු කර ඇති දුරකථන විස්තර වාර්තාවට අදාළ ජංගම දුරකථන අංකයෙහි හිමිකරුවා කවරෙක්ද යන්න සම්බන්ධයෙන් කිසිදු කරුණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් හෙලි නොවේ.

පැ.සා.1019 නිරෝෂන් ප්‍රදීප් කුමාර සිරිවර්ධන නැමැති විශ්‍රාමික හමුදා නිලධාරියාගේ සාක්ෂිය ඇගයීම තුළින් පෙනී යන කරුණක් වන්නේ 2019.04.19 දින පෙරවරුවේ පුද්ගලයන් දෙදෙනෙකු ඔහුගේ කුලී රථයෙන් ෂැංග්‍රිලා හෝටලයේ සිට ලකී ප්ලාසා ගොඩනැගිල්ල අසලට කුලී ගමනකින් රැගෙන ගොස් බැස්සවීම පමණක් වන අතර, ඔහු පැ.16 දරන CCTV දර්ශන සහ පැ.03 (19) දරන CCTV දර්ශන නරඹමින් ඒවායේ සිටින පුද්ගලයන් දෙදෙනා එලෙස තමා සමඟ ෂැංග්‍රිලා හෝටලයේ සිට ලකී ප්ලාසා දක්වා කුලී ගමන් ගිය පුද්ගලයන් දෙදෙනා බවට හඳුනාගෙන ඇති අතර එම කුලී ගමන් ගිය පුද්ගලයාගන් මෙම සාක්ෂිකරුගේ ජංගම

දුරකථනයට අංක 077-5075441 දරන ජංගම දුරකථනයෙන් 2019.04.19 දින පැය 09.22 ට දුරකථන ඇමතුමක් ලැබී ඇති බව හෙලි වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු සඳහන් කර ඇත්තේ සහරාන් නැමැති පුද්ගලයා සහ තවත් පුද්ගලයෙකු ඔහුගේ කුලී රථයෙන් කුලී ගමනක් යාම සම්බන්ධයෙන් පමණක් වන අතර අදාළ පුද්ගලයාගේ නම සහරාන් බව මෙම සාක්ෂිකරු දැනගෙන ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කරගන්නා ලද අවස්ථාවේදී ඔහුට පෙන්වා ඇති CCTV දර්ශන නැරඹීමේදී දැනගත් තොරතුරුවලට අනුව පමණක් වන අතර ඒ හැර මෙම සාක්ෂිකරුට තමා සමඟ ඉහත පරිදි කුලී ගමනක් යාම සිදු කරන ලද පුද්ගලයාගේ නම සහරාන් බව හෝ එම පුද්ගලයා තවත් පුද්ගලයෙකු සමඟ තමා සමඟ කුලී ගමනක් ගිය පුද්ගලයා බවට පූර්ව දැනීමක් මෙම සාක්ෂිකරුට තිබී නොමැති අතර කෙසේ වෙතත් ඔහු සමඟ ඉහත පරිදි කුලී ගමන ගිය පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකු සහරාන් නැමැති පුද්ගලයා බව මෙම සාක්ෂිකරු දැනගෙන ඇත්තේ බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවීමෙන් දින කීපයකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ෂැංග්‍රිලා හෝටලයට අදාළ CCTV දර්ශන නැරඹීමෙන් අනතුරුව පමණක් බවට පැහැදිලි වේ.

පැ.සා.1022 රශිත් විජේවර්ධන වීරකෝන් මාහරන යන සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් ඔහු 2019.04.20 දින රාත්‍රී මොහොමඩ් නැමැති පුද්ගලයෙකු පික්මී පහසුකම් ජාලය හරහා මෙම සාක්ෂිකරුට ජංගම දුරකථන ඇමතුමක් ලබා දී කුලී රියදුරෙකු වන මෙම සාක්ෂිකරු විසින් පදවන ලද වාහනයට නැග ගල්කිස්සේ ටෙම්ප්ල්ස් පාරේ පිහිටි ස්පෑන් ටවර් නැමැති ස්ථානයට කුලී ගමනක් යෑම සිදු කර ඇති බව හෙලිවන අතර එසේම, මෙම සාක්ෂිකරු සමඟ කුලී ගමන ගිය තැනැත්තා ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට සම්බන්ධ පුද්ගලයා බවට මෙම සාක්ෂිකරු විසින් ෂැංග්‍රිලා හෝටලයට අදාළ CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇති බව වේ.

මෙම සාක්ෂිකරු සමඟ පික්මී හරහා කුලී ගමන ගිය තැනැත්තාව 2019.04.20 දිනට ප්‍රථමයෙන් මෙම සාක්ෂිකරු විසින් දන්නා හඳුනන තැනැත්තෙකු නොවන අතර මෙම සාක්ෂිකරු සමඟ කුලී ගමන ගිය තැනැත්තාගේ නම මොහොමඩ් යැයි දැනගෙන ඇත්තේද මෙම සාක්ෂිකරු විසින් භාවිතා කරන ලද ඇන්ඩ්‍රොයිඩ් වර්ගයේ ජංගම දුරකථනයට අදාළව පික්මී ඇප් එක මත එම නම දර්ශනය වීම තුළින් ඔහු එම නම එලෙස පවසා ඇති අතර එම නම එලෙස දර්ශනය වී ඇත්තේ මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට ජංගම දුරකථනයකින් ඇමතුමක් ලබා දුන් පුද්ගලයා වශයෙන් වන අතර මෙම සාක්ෂිකරු විසින් පැ.03 (34) දරන CCTV

දර්ශනය එනම් ෂැංග්‍රිලා හෝටලයට අදාළ 2019.04.20 දින රාත්‍රී කාලයට අදාළ CCTV දර්ශනය නැරඹීම තුළින් එහි මෙම සාක්ෂිකරුගේ සුසුකි-ඇල්ටෝ වර්ගයේ කාර් රථය සැබැවින්ම ෂැංග්‍රිලා හෝටලයට යාම සහ එහිදී මෙම සාක්ෂිකරු විසින් පවසා සිටි මොහොමඩ් නැමැති පුද්ගලයා මෙම සාක්ෂිකරුගේ රථයට නැග ගමන් කිරීමට අදාළව දර්ශනයන් එම පැ.34 දරන CCTV දර්ශනය තුළින් හෙලිවන අතර එසේම, පැ.03 (33) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයද මෙම සාක්ෂිකරු නරඹා එමඟින්ද තමා සමඟ හයර් ගිය මොහොමඩ් නැමැත්තාව හඳුනාගෙන සාක්ෂි ලබා දීමක් කර ඇත.ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් පරිවේශණීය සාක්ෂියක් ලෙස හෙලි වන්නේ 2019.04.21 දින ෂැංග්‍රිලා හෝටලයෙහි සිදුවූ පිපිරීමට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකු 2019.04.20 දින එනම් අදාළ බෝම්බ පිපිරීම සිදු වූ දිනයට පෙර දින රාත්‍රියේ ෂැංග්‍රිලා හෝටලයේ සිට ඇති බව සනාථ වේ.

මෙම සාක්ෂිකරුගෙන් 05 සහ 16 වූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ලකුණු කර ඇති 05 (වි) (6) සහ 05 (වි) (7) යන පරස්පරතාවයන් දෙක සළකා බැලීමේදී එම පරස්පරතාවයන් දෙක තුළින් පමණක් මෙම සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂියෙහි විශ්වාසනීයභාවය සම්බන්ධයෙන් සැක සහිත භාවයක් අප හට පෙනී යන්නේ නැත. ඔහුගේ සාක්ෂිය තුළින් පැමිණිල්ල උත්සාහ දරා ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට සම්බන්ධ එක් පුද්ගලයෙකු ඔහු සමඟ 2019.04.20 දින

රාත්‍රී 8 ත් 8.30 ත් අතර මෙම සාක්ෂිකරුගේ ඇල්ටෝ වර්ගයේ වාහනයේ නැගී ගල්කිස්සේ ස්පෑන් ටවර් යන ස්ථානයට ගිය තැනැත්තා විසින්ම බවට පෙන්වා දීම වේ.

මෙම සාක්ෂිකරු මඟින් පැමිණිල්ලෙන් ලකුණු කර ඇති පැ.18 දරන ජංගම දුරකථන විස්තර වාර්තා සහ පැ.20 ලෙස ලකුණු කර ඇති ජංගම දුරකථන කුළුණු විස්තර වාර්තා මඟින් ද පැ.17 ලෙස ලකුණු කර ඇති ජංගම දුරකථන කුළුණු විස්තර වාර්තාවේ සඳහන් අංක 077-5075441 දරන ජංගම දුරකථනයෙන් එම සාක්ෂිකරුට අමතා මෙම සාක්ෂිකරුට පික්මී ඇප් එක හරහා ඇමතුම ලබා දුන් තැනැත්තා එනම් සාක්ෂිකරු පවසන පරිදි ඔහුගේ ජංගම දුරකථනයේ වූ පික්මී ඇප් එක මත මොහොමඩ් වශයෙන් පෙන්නුම් කළ තැනැත්තාම බව සහ එම තැනැත්තා විසින් 2019.04.20 දින රාත්‍රී 8.00ත් 8.30ත් අතර අංක 077-5075441 දරන ජංගම දුරකථන අංකයෙන් සම්බන්ධ වූ තැනැත්තාම බවට පැහැදිලිව පෙනී යයි.

පැ.3 (33) සහ පැ.3 (34) දරන CCTV දර්ශන නරඹමින් මෙම සාක්ෂිකරු විසින් නිශ්චිතවම ඔහුගේ රථයෙන් රත්මලානේ ස්පෑන් ටවර් ආයතනය අසලට කුලී ගමන ගිය තැනැත්තාව හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් මොහොමඩ් යැයි නමකින් මෙම සාක්ෂිකරුට ඉහත පරිදි දුරකථන ඇමතුම ලබා දී මෙම සාක්ෂිකරු සමඟ ඉහත පරිදි 2019.04.20 දින රාත්‍රී 8 ත් 8.30 ත් අතර කුලී ගමන ගිය තැනැත්තා

ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙකු බවට මනාව පැහදිලි වේ. කෙසේ වුවත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු විසින් අධිකරණයේ පවසා සිටි කරුණු මඟින් ඔහු සත්‍ය පැවසූ තැනැත්තෙකු බව පෙනී යන අතර පික්මී ඇප් සම්බන්ධතාවය මත නිරන්තරයෙන් කුලී ගමන් ගොස් ඇති රියදුරෙකු වන මෙම සාක්ෂිකරුට ඔහු පැවසූ ආකාරයෙන් පික්මී ජංගම දුරකථන ඇප් එක හරහා කුලී ගමන් ඇණවුම් කිරීම් නිරන්තරයෙන් සිදු වී ඇති බව පෙනී යන අතර එවන් පසුබිමක් තුළ මෙම නඩුවට අදාළ බෝම්බ පිපිරීමේ සිද්ධියට දින දෙකකට පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමේදී ඔහු ජංගම දුරකථන අංක සඳහන් කිරීමේදී 05 (වි) (6) ලෙස විත්තියෙන් ලකුණු කර ඇති පරස්පරතාවය එනම් මොහුගේ ජංගම දුරකථනයට දුරකථන ඇමතුමක් ලබා දුන්නේ 076-8948867 යන අංකයෙන් බවට සඳහන් කර තිබීම හුදෙක් ප්‍රමාද දෝෂයක් බව පෙනී යන අතර මෙම සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දී පවසා ඇති පරිදි ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන් අවස්ථාවේදී සිට ඇති මානසික තත්ත්වය එනම් සාක්ෂිකරු විසින්ම පවසා ඇති පරිදි මෙම අධිකරණයේ පවසා ඇති පරිදි ‘‘පමණක් වේලාවට මට ඒ වේලාව සමහර විට මිස් වෙන්න ඇති මම දන්නේ නැහැ මගේ මානසික තත්ත්වය උඩ එදා ලොකු පෙෂර් එකක හිටියේ මම එදා’’ (2023.11.22 පස්වරු 03.05 සාක්ෂි සටහන් පිටු අංක 03) යන්න තුළින් පැහැදිලිව පෙනී යයි. එවන් පසුබිමක්

තුළ මෙම 05 සහ 16 චූදිතයන් වෙනුවෙන් එවකට පෙනී සිටි නීතිඥවරුන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කර ඇති ප්‍රකාශය ආශ්‍රයෙන් ලකුණු කර ඇති 05 (වි) (6) සහ 5 (වි) (7) යන පරස්පර විරෝධතාවයන් ඔහුගේ සාක්ෂිය හරයටම බලනොපාන පරස්පර විරෝධතාවයන් බවට අප තීරණය කරමු.

මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.1006 ශක්ති මූර්ති ශන්මුගම් යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ෂැංග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීම නිසා හෝටලයට සිදු වී ඇති අලාභය සම්බන්ධයෙන් පැ.21 දරන ලේඛනය තුළින් කරුණු සනාථ කර ඇති අතර පැ.21 දරන ලේඛනය සම්බන්ධයෙන් හෝ එහි අන්තර්ගතයන් සම්බන්ධයෙන් විත්තිය කිසිදු හඬ කිරීමක් කර නොමැති පසුබිම තුළ එම ලේඛනයේ අඩංගු කරුණු කිසිදු අභියෝගයකින් තොරව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති අතර එසේම, වසර 30 කට අධික කාලයක් ගණකාධිකාරී ක්ෂේත්‍රය සම්බන්ධ අත්දැකීම් තිබෙන, වසර 07 කට අධික කාලයක් ෂැංග්‍රිලා හෝටලයෙහි මූල්‍ය පාලක ලෙස සේවය කර ඇති මෙම සාක්ෂිකරු විසින් තම සාක්ෂියේදී සාක්ෂි ලබා දෙමින් ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීම නිසා රුපියල් බිලියන 2.7 ක පාඩුවක් හෝටලයට සිදුවූ බවට ලබා දුන් සාක්ෂිය විශ්වාසනීය සත්‍ය සාක්ෂියක් ලෙස අප තීරණය කරමු.

තවද හරස් ප්‍රශ්න ඇසීමට ලක් නොකර කිසිදු ආකාරයකින් අභියෝගයකට ලක් වී නොමැති පැ.සා.1023 රණසිංහ ආරච්චිලාගේ හේමන්ත අමිත් රණවීර යන පික්මී ආයතනයේ රියදුරාගේ සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන්නේ 2019.04.21 දින පාන්දර 01.04 ට ජංගම දුරකථන අංක 077-5075441 දරන ජංගම දුරකථනය දෙමටගොඩ මහවිල ගාඩ්ර්න් නැමැති ස්ථානයේ සිට සම්බන්ධ වී එම දුරකථන ඇමතුම ලබා දුන් තැනැත්තා දෙමටගොඩ ගුවන් පාළම අසලින් මෙම සාක්ෂිකරුගේ කුලී රථයට නැග කොල්ලුපිටියේ පිහිටි පිලාරුස් ආයතනයට 2019.04.21 දින පාන්දර 01.34 ට ගොස් ඇති බව සහ එම තැනැත්තා එම වාහනයෙන් බැස කොල්ලුපිටිය පිලාරුස් ආයතනයට ගොස් ඇති බව සනාථ වේ. මෙම සාක්ෂිකරු ඔහු සමඟ එම කුලී ගමන ගිය පිරිමි තැනැත්තාව පැ.23 දරන සිඩී තැටියේ අඩංගු CCTV දර්ශන ඇසුරින් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පෙර අවස්ථාවක පැ.17 ලෙස ලකුණු කරන ලද දුරකථන විස්තර වාර්තාවෙහි මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථන අංකය තවත් ජංගම දුරකථන අංකයක් වන 077-5075441 දරන ජංගම දුරකථනය සමඟ 2019.04.21 පැය 01.10.22 ට සම්බන්ධ වී ඇති බවත් එම ජංගම දුරකථන අංකයම එදින පැය 01.04.09 ට ද මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනය සමඟ සම්බන්ධ වී ඇති කරුණ ද සනාථ වන අතර එම පැ.17 දරන දුරකථන විස්තර වාර්තා ලේඛනයට අනුව මෙම සාක්ෂිකරුගේ ජංගම

දුරකථනය සමඟ මහවිල ගාඩ්ර්න්ස් නැමැති ස්ථානයෙන් ආරම්භ වූ දුරකථන ඇමතුමක් සම්බන්ධ වී ඇති බව සනාථ වී ඇත.

ඒ අනුව අධිකරණයට පෙනී යන්නේ ජංගම දුරකථන අංක 77.5075441 දරන ජංගම දුරකථනය අංකය භාවිතා කරන ලද තැනැත්තා 2019.04.21 දින පාන්දර 1.04 ට සහ පාන්දර 1.10 ට මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනය හා සම්බන්ධ වී තිබීම තුළින් එකී ජංගම දුරකථන අංක 77.5075441 භාවිතා කළ පුද්ගලයා මහවෙල ගාර්ඩින්ස් නැමැති ස්ථානයේ සිට ඇති බවයි.

පැ.සා.1024 තුවාන් අක්‍රම් හුසේන් යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් 2019.04.21 දින පැ.3 (35) සහ පැ.23 (1) දරන CCTV දර්ශනවල සිටින පුද්ගලයා ඔහු සමඟ කොල්ලුපිටියේ පිලාරූස් ආයතනයේ සිට ෂැංග්‍රිලා හෝටලය දක්වා කුලී ගමන ගිය පුද්ගලයාම බවට හඳුනාගෙන ඇති අතර කෙසේ වෙතත් එම පුද්ගලයාගේ අනන්‍යතාවය එනම් එම පුද්ගලයාගේ නම, ලිපිනයන් පිළිබඳව කිසිදු දැනීමක් මෙම සාක්ෂිකරුට තිබී නොමැති අතර මෙම පුද්ගලයා එම අවස්ථාවේදී ඇඳ සිටි ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් පමණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවේ.

පැ.සා.1025 මොහොමඩ් මන්සූර් මොහොමඩ් රිෆාන් යන සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක්

වන්නේ මෙම සාක්ෂිකරුගේ කුලී රථයෙන් ජංගම දුරකථන අංක 077-5075441 දරන දුරකථන අංකය මඟින් ඇමතුම ලබා දී එම ජංගම දුරකථන ඇමතුමට අදාළව පානදුරේ ෂරිෆ් මාවතේ සිට විශාල ගමන් මළු දෙකක්ද සමඟ රැවුල වවාගත් පිරිමි තැනැත්තන් දෙදෙනෙකු කොළඹ ෂැංග්‍රිලා හෝටලයට ගෙන ගොස් බැස්සවීමක් සැබැවින්ම සිදු වී ඇති බව පෙනී යන අතර එම කරුණ මෙම සාක්ෂිකරු විසින් පෙර අවස්ථාවක මෙම අධිකරණයේ ලකුණු කර ඇති පැ.03 (20) දරන CCTV දර්ශන තුළින් ද සනාථ වන අතර මෙම සාක්ෂිකරු සමඟ 2019.04.20 දින උදේ වරුවේ ඉහත කී කුලී ගමන යාම සඳහා ජංගම දුරකථන ඇමතුමක් ලබා දී ඇති ජංගම දුරකථන අංක 077-5075441 දරන ජංගම දුරකථන අංකයම පැ.24 දරන ජංගම දුරකථන විස්තර වාර්තාවේද, පෙර අවස්ථාවක පැ.17 ලෙස ලකුණු කර ඇති දුරකථන විස්තර වාර්තාවේද අඩංගු වන්නේ 077-5075441 දරන එකම ජංගම දුරකථනය බවටද සනාථ වේ.

පැ.සා. 1016 අබ්දුල් නාසර් මොහොමඩ් නසීර් යන අය සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 වසර වන විට ත්‍රීරෝද රථ රියදුරෙකු ලෙස කටයුතු කළ බවත් ඔහුට අංක 201.4592 දරන බටර් පාට ත්‍රීවිල් රථය තිබුණ බවත් මෙම බෝම්බ පිපිරීම සිදුවූ දිනයට පෙර දින තමාගේ ත්‍රීවිල් රථයෙන් ෂැංග්‍රිලා හෝටලයේ සිට කිංග්ස්බරි හෝටලය දක්වා එක් පුද්ගලයෙකු හයර් එකක් ගිය බවත් එම පුද්ගලයා තමා සමඟ යාමේදී කිසිවක් කතා කළේ නැති බවත් ඉන්පසු කිංග්ස්බරි හෝටලය ලඟ විනාඩි 10 ක් තමාට ඉන්න යැයි

එම තැනැත්තා පැවසූ බවත් කේක් එකක් ඇණවුම් කරලා එන්නම් යැයි එම තැනැත්තා පැවසූ බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එම පුද්ගලයා රැවුල වවා කැප් එකක් දමාගෙන ස්කූල් බෑග් එකක් පැළඳ ඩෙනිම් කලිසමක් සහ ෂර්ට් එකක් හැඳ සිටි බවත් ඉන්පසු එම පුද්ගලයා විනාඩි 20කින් පමණ පැමිණි පසුව ඩෑම් ස්ට්‍රීට් පොලිසිය දක්වා යන්න කිව්ව බවත් ඉන්පසු තමා ඔහුව දමා ගෙන ගොස් පොලිසියට එහායින් කව්චේරිය ළඟින් එම තැනැත්තාව බැස්සවූ බවත් තමාට රුපියල් 220 ක ගාස්තුවක් ලබා දුන් බවටත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පැ.13 ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශන ඇතුළත් සීඩී තැටියක් වාදනය කර විකාශනය කර පෙන්වා දුන් අවස්ථාවේදි එහි තමාගේ ත්‍රීවිල් රථය තිබෙන බව සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර, එයට අදාළ දිනය 2019.04.17 දිනය බවටත් සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. තමා සාක්ෂියේදී පැවසූ කරුණු මෙම *CCTV* දර්ශනයෙන් ඒ ආකාරයෙන් පෙනී යන බවද සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාගේ ත්‍රීවිල් රථයෙහි කුලී ගමනක් ගිය පුද්ගලයාවද සාක්ෂිකරු එම *CCTV* දර්ශන මඟින් හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකරුගෙන් සියලුම චුදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

පැ.සා.1018 මදනසිංහ නිමේෂ් චාමින්ද නමැති රියදුරා සාක්ෂි ලබා දෙමින්, තමා 2017 වසරේ වැගන්-ආර් වර්ගයේ, ලියාපදිංචි අංක *SP CBB. 3681* දරන වාහනය මිළදී ගත් බවත් තමා අමතර රැකියාවක් ලෙස රියදුරු රැකියාවේ යෙදෙන බවත් තමා ස්ථිර වශයෙන් කළේ බේකරි වෘත්තියේ යෙදීම බවත් පවසා ඇත.

තවද, 2019 වසරේ තමාගේ වාහනය උබර් ආයතනයේ ලියාපදිංචි කර ඒ හරහා කුලී ගමන් බිමන් යාම සිදු කළ බවත් 2019 වර්ෂයේ එලෙස උබර් කුලී ගමන් යාම සඳහා තමා විසින් 071-2345007 දරන දුරකථන අංකය භාවිතා කළ බවත් පවසා එම දුරකථන අංකය ලබා ගැනීම සඳහා තමා විසින් මොබිටෙල් ආයතනයට ලබා දුන් ඉල්ලුම් පත්‍රයෙහි පිටපත හඳුනා ගෙන එය පැ.14 ලෙස ලකුණු කර ඇත. එම ලේඛනයෙහි තමාගේ අත්සන තිබෙන බවටද සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. එසේම, එහි තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය 891754000 *V* යන්න පැහැදිලිව සටහන් වී තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 අප්‍රේල් මස 21 දින සිදුවූ බෝම්බ පිපිරීමට අදාළව තමාගේ වාහනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමාගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, පෙර අවස්ථාවක පැ.3 (9) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනය විකාශනය කරන ලදුව එය පරික්ෂා කර බලමින් එහි දිස් වන *SP CBB.3681*

දරන වාහනය තමාගේ වාහනය බවට සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර, එය 2019.04.19 දින 07:26:59 ට අදාළව ෂැංග්‍රිලා හෝටලයට ඇතුල් වන ස්ථානය බවත් පැ.3 (10) *CCTV* දර්ශනවලට අනුව පැ.3 (9) ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශනයේ තිබෙන සුදු පාට වැගන්-ආර් කාර් රථය තමාගේ කාර් රථය බවත් පැ.3 (9) සහ පැ.3 (10) *CCTV* දර්ශන අනුව තමා විසින් මගීන් දෙදෙනෙකු ෂැංග්‍රිලා හෝටලයට රැගෙනවිත් ඇති බවත් එම පුද්ගලයන් දෙදෙනා ඉන්පෙර තමා සමඟ ගමන් ගොස් නැති පුද්ගලයන් දෙදෙනෙකු බවත් එම පුද්ගලයන් දෙදෙනා තමාගේ වාහනයට කොහේ සිට ගොඩ වුණාද යන්න තමාට මතක නැති බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ ජංගම දුරකථන විශ්ලේෂණ වාර්තාවක් පැ.15 ලෙස ලකුණු කර ඇති අතර, 2019.04.19 දින උදෑසන තමා උබර් ආයතනය හරහා තමාගේ වාහනයේ ෂැංග්‍රිලා හෝටලයට හයර් එකක් ගොස් ඇති බවත් 2019.04.21 දින 07:19:57 ට තමාගේ ජංගම දුරකථනය සමඟ 077-5075441 දරන අංකය සම්බන්ධ වී ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, පැ.16 ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශන අඩංගු තැටියද වාදනය කර සාක්ෂිකරුට නැරඹීමට ඉඩ සලස්වා ඇති අතර, විශේෂයෙන් පැ.3 (10) *CCTV* දර්ශනයට අනුව තමාගේ වාහනයෙන් පුද්ගලයන් දෙදෙනෙකු ගමන් කර ෂැංග්‍රිලා හෝටලයේ බසින ලද දර්ශනයක් සාක්ෂිකරු හඳුනා ගෙන එම පුද්ගලයන්

දෙදෙනා ඇඳ සිටි ඇඳුම් පැළඳ සිටි සපත්තු විස්තර කරමින් එම *CCTV* දර්ශනවල සිටින පුද්ගලයන් දෙදෙනා තමාගේ සුදු පාට වැගන්-ආර් වාහනයෙන් 2019.04.19 දින ෂැංග්‍රිලා හෝටලයට පැමිණි පුද්ගලයන් දෙදෙනා බවට සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ දුරකථන විස්තර වාර්තා පැ.15 ලෙස ලකුණු කර ඇති අතර එම දුරකථන විස්තර වාර්තාවල තමාගේ ජංගම දුරකථන අංකයට අමතරව අංක 077-5075441 යනුවෙන් දුරකථන අංකයක් සඳහන් වී තිබෙන බවද සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, පැ.16 ලෙස ලකුණු කර ඇති සහ පැ.03 (10) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනයන්ට අනුව තමා විසින් එම දර්ශනවල අඩංගු පුද්ගලයන් දෙදෙනාව ඉහත පරිදි තමාගේ වැගන්-ආර් වර්ගයේ වාහනයේ නංවාගේ ඔවුන් ෂැංග්‍රිලා හෝටලයට කුලී ගමනක් ගොස් ඔවුන් එහි බස්සවා ඇති බවට පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුව 04, 05 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්නවලට ලක් කර ඇති අතර 04, 05 චූදිතයන් වෙනුවෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුගේ වාහනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රදවා තබා ගෙන එයට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම සාක්ෂිකරුට නිකුත් කරන ලද රිසිට් පතට අනුව මෙම සාක්ෂිකරු විසින් *WP SPG* . 2827 දරන කාර්

රථය විමර්ශන නිලධාරීන්ට භාරදෙන ලද බවට සඳහන් කර ඇති කරුණ මෙම සාක්ෂිකරුට යෝජනා කළ විට සාක්ෂිකරු තමා එවැන්නක් පැවසුවේ නැති බවට පවසා ඇති අතර ඔහු පවසා ඇත්තේ තමාගේ වාහනයේ ලියාපදිංචි අංකය *SP CBB* 3681 බවට වන බවයි.

පැ.සා.1019 නිරෝෂන් ප්‍රදීප් කුමාර සිරිවර්ධන නැමැති විශ්‍රාමික හමුදා නිලධාරියා සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 වකවානුවේ ඌබර් ආයතනයට සම්බන්ධ වී රියදුරෙක් ලෙස සේවය කළ බවත් 2019.04.18 හෝ 19 වන දින සහරාන් නැමැති පුද්ගලයා සහ තවත් අයෙක් තමාට අයිති *CBB.*7819 දරන සුසිකි වැගන්-ආර් නැමැති සිල්වර් කලර් වාහනයෙන් කුලී ගමනක් යාම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දී ඇති අතර එවකට තමා විසින් භාවිතා කළ 077-6082459 දරන ජංගම දුරකථනය තමා පාවිච්චි කළ බවත් එම ජංගම දුරකථනයට අමතරව 076-9853344 යන ජංගම දුරකථන සම්බන්ධතාවයද තමා විසින් භාවිතා කර ඇති බවත් තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය 701382641 *V* බවත් පවසා අදාළ ජංගම දුරකථන විස්තර වාර්තා පැ.18 ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇත.

පැ.16 ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනය විකාශනය කර එය පෙන්වන අවස්ථාවේදී එය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එසේම, පැ.3 (19) දරන *CCTV* දර්ශනද නරඹමින් පවසා ඇත්තේ ඒවාට අනුව තමා විසින් 2019.04.19 දින වේලාව පෙරවරු 9.22ට මගීන් දෙදෙනෙකු

ෂැංග්‍රිලා හෝටලයේ සිට කොල්ලුපිටියේ ලකී ප්ලාසා එක ගාවට ඇරගෙන යාම සිදු කරන ලද බවත් තමාගේ වාහනයෙන් එලෙස කුලී ගමන ගිය පුද්ගලයන් දෙදෙනාව හෝටලයේ බෝම්බ පුපුරා දවස් කීපයකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමාව ෂැංග්‍රිලා හෝටලයට රැගෙන ගොස් පෙන්වන ලද *CCTV* දර්ශන නැරඹීමෙන් පසු එම දර්ශනවල සිටින පුද්ගලයන් දෙදෙනා 2019.04.19 දින තමා සමඟ කුලී ගමන ගිය පුද්ගලයන් දෙදෙනා බවට හඳුනාගෙන ඇති අතර මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ දුරකථන විස්තර වාර්තාව පැ.19 ලෙස ලකුණු කර ඇති අතර එයට අනුව 2019.04.19 දින උදෑසන 9.22 ට ජංගම දුරකථන අංක 077-5075441 දරන ජංගම දුරකථනයෙන් තමාගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලැබී තිබුණු බවත් පවසා හඳුනාගෙන ඇති අතර තමාගේ කුලී ගමන සඳහා තමාට මුදල් රුපියල් පන්සීය ගණනක් ලැබුණු බවට මතක බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය 701382641 *V* බවට මෙම සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 02, 05, 09, 16, 23 යන චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට පවසා ඇත. හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයේ සිට ඔහු සඳහන් කළ පුද්ගලයන් දෙදෙනාව රැගෙන ගොස් බස්සපු ස්ථානයට තිබෙන දුර සම්බන්ධයෙන් බව පෙනී යයි.

පැ.සා.1022 රශිත් විජේසිරිවර්ධන වීරකෝන් මාහරන නැමැති සාක්ෂිකරුව සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 වසරේ පික්මී ආයතනයට සම්බන්ධ වී රියදුරෙකු ලෙස කටයුතු කළ බවත් තමාගේ රතු පාට ඇල්ටෝ වර්ගයේ *CAG.*2763 අංක දරන කාර් රථය තමා පික්මී ආයතනයට අනුයුක්තව හයර් යාම සඳහා භාවිතා කර ඇති බවත් පවසා ඇති අතර, 2019.04.20 දින රාත්‍රී 8 ත් 8.30 ත් අතර තමාගේ ජංගම දුරකථනයට වෙනත් ජංගම දුරකථනයකින් දුරකථන ඇමතුමක් ලැබුණු බවත් තමාට මොහොමඩ් නැමැත්තෙකු සිංහල භාෂාවෙන් කතා කළ බවත් පික්මී ඇප් එකේද තමාට පෙන්නුම් කළේ මොහොමඩ් යන නම බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාට එම දුරකථන ඇමතුම එන විට තමා ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට සිටි බවත් තමාට දුරකථන ඇමතුම අදාළ තැනැත්තාගෙන් ලැබුණේ අංක 077-5075441 අංකයෙන් බවත් එම දුරකථන ඇමතුම ප්‍රකාරව තමාට ඇමතීම ලබා දුන් මොහොමඩ් නැමැත්තාගේ ලෝකේෂන් එක තමාට පෙනී ගිය බවත් ඔහුව පික් අප් කිරීමට තිබෙන්නේ ෂැංග්‍රිලා හෝටලයට බවත් ඒ අනුව තමා ෂැංග්‍රිලා හෝටලය ළඟට ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

පසුව තමා එම තැනැත්තා එනතුරු ෂැංග්‍රිලා හෝටලයෙහි විනාඩි 03 ක් 04 ක් සිටි බවත් එලෙස සිටින විට තමාට දුරකථන ඇමතුම ලබා ගත්

තැනැත්තා පැමිණ තමාගේ වාහනයේ වම් පැත්තේ පිටුපස දොරෙන් වාහනයට ගොඩ වුනු බවත් එම තැනැත්තා තමා එදිනට පෙර දැන හඳුනන තැනැත්තෙක් නොවන බවත් පික්මී ඇප් එකට අනුව යායුතු ලොකේෂන් එක ලෙස දෙහිවල, ටෙම්ප්ලස් පාරේ, ස්පෑන් ටවර් නැමැති ස්ථානයට යා යුතු බවට විස්තර වැටුණු බවත් ඒ අනුව තමා කුලී ගමන යාම සඳහා පැමිණි පුද්ගලයාවද වාහනයේ නග්ගාගෙන කුලී ගමන යාමට පිටත් වූ බවත් ඉන්පසු එම තැනැත්තා තමාට ගමන ආරම්භ කරන ලෙසට අතින් සංඥාවක් දුන් බවත් එම අවස්ථාවේ ඔහු තමාට අතින් පොඩ්ඩක් ඉන්න යැයි පවසා ඔහුගේ දුරකථනයට ආන්සර් කළ බවත් ඉන්පසු තමාලා ගෝල්ෆේස් ප්‍රධාන මාර්ගයේ ගමන් කර ගල්කිස්සේ ස්පෑන් ටවර් නැමැති ස්ථානයට ගිය බවත් එම ස්ථානයට ළඟා වනවිට වේලාව රාත්‍රී 8.45 ත් 9 ත් වූ බවත් අදාළ කුලී ගමන සඳහා තම රථයේ කුලී ගමන ගිය තැනැත්තා රු.578 ක් තමාට දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.20 දිනට පසු දින තමාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැමිණ ප්‍රශ්න කිරීම් කර එම හයර් එක සම්බන්ධයෙන් විස්තර විමසා සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.20 දිනට පසු දින බෝම්බ පිපිරීම්වලට අදාළව ප්‍රධාන නිවුස්වලින් තමා බෝම්බ පිපිරීම් සම්බන්ධයෙන් දැනගත් බවත් ටාජ් හෝටලයේ, කිංග්ස්බරි එකේ, සේන්ට ඇන්තනි චර්ච් එකේ, ෂැංග්‍රිලා එකේ,

ට්‍රොපිකල් ඉන් එකේ, මෙලෙස බෝම්බ පිපිරී ඇති බවට තමා දැනගත් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිවසට පැමිණ ප්‍රශ්න කිරීම් කළේ 2019.04.22 උදේ 8.30 ත් 9.00ත් අතර බවත් ඔහු පවසා ඇති අතර තමා සමඟ ඉහත පරිදි කුලී ගමන ගිය මොහොමඩ් නැමැති තැනැත්තා ෂැංග්‍රිලා හෝටලයේ පිපිරීම සම්බන්ධයෙන් කටයුතු කළ තැනැත්තෙකු බවට මාධ්‍ය මඟින් දැනගත් බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට ඔහුගේ ජංගම දුරකථන අංකයට අදාළ දුරකථන විස්තර වාර්තාව පෙන්වා එය පැ.18 ලෙස ලකුණු කර ඇති අතර එම ලේඛනය ආශ්‍රයෙන් 2019.04.20 දින ඔහු පික්මී ඇප් එක හරහා හයර් යාමට අදාළව ලැබුණු දුරකථන ඇමතුම සම්බන්ධයෙන් සහ ඇමතුමට අදාළ අංකය සම්බන්ධයෙන්ද මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථන අංකය සම්බන්ධයෙන්ද මෙම සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ සාක්ෂි දී ඇත.

එසේම, මෙම සාක්ෂිකරුගේ අංක 077-6534133 දරන ජංගම දුරකථනයට අදාළ 2019.04.09 දින සිට 2019.04.22 දක්වා වූ ජංගම දුරකථන විස්තර වාර්තාව ද මෙම සාක්ෂිකරු මඟින් පැ.20 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම, මෙම අධිකරණය ඉදිරියේ පෙර අවස්ථාවක පැ.03 (34) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනය විවෘත අධිකරණයේ විකාශනය කර නැරඹීමට ඉඩ ලබා දුන් අවස්ථාවේ එම *CCTV* දර්ශනයෙහි

මෙම සාක්ෂිකරු විසින් විස්තර කළ ඔහුගේ වාහනය තිබෙන ආකාරය සහ ඔහු ෂැංග්‍රිලා හෝටලයට හයර් එක සඳහා ගිය විස්තරද එසේම, ෂැංග්‍රිලා හෝටලයේදී මොහොමඩ් නැමැත්තා මෙම සාක්ෂිකරුගේ කුලී රථයට නගින ආකාරයද ඉන්පසු එම ස්ථානයෙන් පිටවෙන ආකාරයද සාක්ෂිකරු හඳුනාගෙන ඇත. පෙර අවස්ථාවක පැ.03 (33) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනයක සිටින පුද්ගලයාවද හඳුනාගෙන තමා සමඟ හයර් එක ගිය තැනැත්තා එහිද සිටින බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම සඳහා විත්තියට අවස්ථාව ලබා දී ඇතද, ඔහුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 05 සහ 16 යන චූදිතයන් දෙදෙනා වෙනුවෙන් පමණක් වන අතර අනිකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

05 සහ 16 චූදිතයන් වෙනුවෙන් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2019.04.23 වන දින ලබා දී ඇති ප්‍රකාශයෙහි ඔහු විසින් අංක 076-8948867 යන අංකයට ඔහු විසින් 2019.04.20 දින රාත්‍රී 8.00 ට පමණ ෂැංග්‍රිලා හෝටලයේ සිට ගල්කිස්සට කුලී ගමන යාම සඳහා දුරකථන ඇමතුම ලබා දුන් පුද්ගලයා සමඟ ඇමතුමක් දී සම්බන්ධ වූ යන කරුණ අවධානයට ලක් කරමි. එම ප්‍රකාශයෙහි මා විසින් භාවිතා කරන දුරකථන අංක 077-6534133 මඟින් ඇමතුමක් ලබා ගත් බවට සඳහන් කරන කරුණෙහි එම

දුරකථන අංකය පමණක් 05 (*V*) (06) ලෙස පරස්පරතාවයක් ලෙස ලකුණු කර ඇති අතර එසේම, මෙම සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශයෙහි ‘‘එම පුද්ගලයා බෙස්ලයින් පාරේ ඔරියන් සිටි කියන ස්ථානයට යායුතු බවට’’ යැයි සඳහන් කර තිබෙන කරුණ 05 (*V*) (7) ලෙස පරස්පරතාවයක් ලෙස ලකුණු කර ඇත.

පැ.සා.1006 ශක්ති මූර්ති ශන්මුගම් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා ෂැංග්‍රිලා හෝටලයේ මූල්‍ය පාලක ලෙස අවුරුදු 07 ක් තිස්සේ සේවය කරන බවත් පවසා ඇති අතර තමා වරලත් ගණකාධිකාරීවරයෙක් ලෙස වෘත්තීය සුදුසුකම් ලබා තිබෙන බවත් තමාට ගණකාධිකාරී ක්ෂේත්‍රයේ වසරක වෘත්තීය පළපුරුද්දක් තිබෙන බව පවසා ඇත. ඔහු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයේ ටේබල් වන් අවන්හල තුළ සහ එයට යන පඩිපෙළේ 2019.04.21 දින බෝම්බ පිපිරීමක් සිදු වුණ බවත් එදින තමා සේවයට වාර්තා කර නොතිබූ බවත් එම බෝම්බ පිපිරීම නිසා ෂැංග්‍රිලා හෝටලයේ එදිනෙදා කටයුතු ඇනහිටීමකට ලක් වී මාස 3 ක් පමණ යනතුරු ව්‍යාපාර කටයුතු කර ගැනීමට නොහැකි වූ බව පවසා ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ෂැංග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීම හේතුකොටගෙන සිදුවූ අලාභ හානි ගණනය කර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තාවක් නිකුත් කරන ලද බවත් පවසා අදාළ පිපිරීම නිසා රුපියල් බිලියන 2.7 ක පාඩුවක් හෝටලයට සිදු වන

බවට එම වාර්තාවේ සඳහන් කරන ලද බවට පවසා එම වාර්තාව පැ.21 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 3, 7, 8, 11, 12, 18, 19, 20 සහ 21 චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ෂැංග්‍රිලා හෝටලයට පිවිසීම සඳහා අමුත්තන් පැමිණෙන අවස්ථාවල එහි සවිකර තිබෙන මෙටල් ඩිටෙක්ටර් යන්ත්‍රය පාවිච්චි කර අමුත්තන් හෝටලයට ඇතුල් කරන බවට වන අතර සාක්ෂිකරු එයට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ එම කාලවකවානුවේ තිබුණු ආරක්ෂාව සම්බන්ධයෙන් සැකයක් නොතිබුණු නිසා මෙටල් ඩිටෙක්ටර් එකක් අවශ්‍ය වී තිබුණේ නැති බවත් ය.

හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ *LTTE* ප්‍රශ්නවලින් පසු ෂැංග්‍රිලා හෝටලයට ඇතුළු වන සියලුම අමුත්තන් මෙටල් ඩිටෙක්ටර් හරහා ඇතුළු වෙන බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ තමා හුදෙක් මූල්‍ය පාලක ලෙස කටයුතු කරන බැවින් තමාට ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට අපහසු වන බව අතර හෝටලයේ ආරක්ෂාව සම්බන්ධ කටයුතු පිළිබඳව තමාට පවසා සිටීමට හැකියාවක් නොමැති බවයි.

පැ.සා.1023 රණසිංහ ආරච්චිලාගේ හේමන්ත අමිත් රණවීර යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු පික්මී ආයතනයේ රියදුරෙකු ලෙස රැකියාව කරන බවත් ඔහු 2019 වසරේ නිසාන් නිල් පාට වැගන්-ආර් රථයක් කුලී රථ ධාවනය සඳහා භාවිතා කළ බවත් එහි අංකය *WPCBC.* 8644 බවත් එම වාහනය තමාගේ බිරිඳ වන නෙත්මි නිශාමලී අතපත්තු යන අයගේ නමින් ලියාපදිංචි කර තිබෙන බවත් පවසා ඇත.

පික්මී ආයතනයට අනුබද්දව තමාගේ කුලී රථය භාවිතා කිරීම සඳහා පික්මී ආයතනයෙන් තමාලාට එයාර්ටෙල් ජංගම දුරකථනයක් ලබාදී තිබුණු බවත් පවසා ඇති අතර පාස්කු ඉරුදින ප්‍රහාර සිදු වූ දින එම අවස්ථාවේදී තමා දෙමටගොඩ සිට කොල්ලුපිටියේ පිලාවුස් එකට යන්න හයර් එකක් ගිය බවත් ඒ සඳහා දෙමටගොඩ ගුවන් පාළම අසලින් හයර් එක යාම කළ බවත් ඒ සඳහා ඇණවුම ලැබුණේ පික්මී ආයතනයේ ඇප් එක හරහා බවත් එම හයර් යාම සඳහා ඉල්ලුම් කළ පුද්ගලයා තමා සමඟ දුරකථනයෙන් එක් වතාවක් කතා කර මන් ලොකේෂන් එකට ඇවිල්ලා ඉන්නේ යැයි පැවසූ බවත් පසුවද ඔහු තමාට දුරකථන ඇමතුමක් ලබා දුන් බවත් එම පුද්ගලයා පිරිමි තැනැත්තෙකු බවත් එම හයර් ගියේ තමා එදින රාත්‍රී 11 යි ගානට බව සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ එයාර්ටෙල් ආයතනයෙන් නිකුත් කළ දුරකථන විශ්ලේෂණ වාර්තාව මෙම සාක්ෂිකරු

මඟින් පැ.22 ලෙස ලකුණු කර ඇති අතර එයට අනුව 075.3439928 දරන ජංගම දුරකථන අංකය තමාගේ නමින් නිකුත් කර ඇති බවත් තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය 822853749 *V* බවත් තමා බොරැල්ල කොටා පාරේ පදිංචිව සිටි බවත් පවසා ඇත. පැ.22 ජංගම දුරකථන විස්තර වාර්තාවට අනුව දුරකථන අංක 077-5075441 නැමැති ජංගම දුරකථනයෙන් 2019.04.21 පාන්දර 1.10 ට තමාගේ ජංගම දුරකථනයට එලෙස ඇමතුමක් ලැබී තිබුණු බවත් එම දුරකථන අංකය ඉදිරියෙන් මහවෙල ගාඩ්ර්න්ස් *CN*0421 ලෙස සඳහන්ව ඇති බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පැ.23 ලෙස ලකුණු කරන ලද *CCTV* දර්ශන ඇතුළත් සිඩී තැටියක් වාදනය කර එහි අඩංගු වීඩියෝ දර්ශන 10 ක් අතුරින් 08 වන වීඩියෝ දර්ශනය විවෘත අධිකරණයේ වාදනය කර නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර එම *CCTV* දර්ශනයට අනුව එහි තමාගේ වාහනය තිබෙන බවත් එය කොල්ලුපිටිය පිලාවූස් එක අසල පාකින් එකේ තිබෙන බවත් තමාගේ වාහනයෙන් බැස පුද්ගලයෙකු 2019.04.21 දින පැය 01:34:32ට එළියට එන බව පෙනෙන බව සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම නිල් පැහැති වැගන්-ආර් වාහනය තමාගේ වාහනය බව සාක්ෂිකරු වීඩියෝ දර්ශනය නරඹමින් හඳුනාගෙන ඇති අතර එම *CCTV* වීඩියෝ දර්ශනයෙහි අතෙහි ඉටි බෑග් එකක් තබා ගෙන පුද්ගලයෙකු සිටින බවට හඳුනාගෙන එම පුද්ගලයා දෙමටගොඩ සිට තමා සමඟ පිලාවූස් ආයතනයට හයර් එකක් ගිය පුද්ගලයා බවට

හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට සියලුම චූදිතයන් වෙනුවෙන් ප්‍රකාශ කර ඇත.

පැ.සා.1024 තුවාන් අක්‍රම් හුසේන් යන සාක්ෂිකරුද සාක්ෂි ලබා දෙමින් තමා පික්මී සහ උබර් ආයතනවලට සම්බන්ධ වී තම වාහනය යොදා කුලී ගමන් යන බවත් තමා 2015 නොවැම්බර් මාසයේ සිට ඉහත කී ආයතනවලට සම්බන්ධ වී කටයුතු කරන ලද බවත් පවසා ඇත. 2019 පාස්කු ප්‍රහාරය සිදුවූ 2019.04.21 දිනට පෙර දින පාන්දර තමා එයාර්පෝට් එකේ සිට කොළඹ මරීනා මෝල් නැමැති හෝටලයට උබර් එකින් හයර් එකක් ආව බවත් එලෙස පැමිණි පසු තමාට මරීනා එක ළඟ සිටියදී තමාට පිලාරුස් අවන්හලේ සිට ෂැංග්‍රිලා හෝටලයට යාමට තවත් හයර් එකක් ලැබුණු බවත් ඒ අනුව තමා පිලාරුස් ආයතනය අසලට ගිය පසු තමාගෙන් කුලී ගමන ඉල්ලා සිටි පුද්ගලයා එදින තමා භාවිතා කළ *CAY*.1549 ලියාපදිංචි අංකය දරන සුදු පාට වැගන්-ආර් වාහනයේ පිටිපස්සේ ආසනයට නන්වාගෙන ගොස් ෂැංග්‍රිලා හෝටලයේ බස්වන බවට පවසා සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුට පැ.03 (35) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනය විවෘත අධිකරණයේ ප්‍රදර්ශනය කර නැරඹීමට ඉඩ සැලසූ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු එහි තමාගේ වාහනය තිබෙන ආකාරය සහ එහි ෂැංග්‍රිලා හෝටලයට ඇතුළු වී කුලී ගමන ගිය ආකාරය විස්තර කරමින්

සාක්ෂි ලබා දී ඇති අතර තම වාහනයේ කුලී ගමන ගිය තැනැත්තා සිටින ආකාරයද *CCTV* දර්ශන තුළින් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. එසේම, පැ.23 (1) ලෙස ලකුණු කර ඇති කොල්ලුපිටියේ පිලාරුස් ආයතනය ඉදිරිපිටට අදාළ *CCTV* දර්ශනද විවෘත අධිකරණයේ වාදනය කර මෙම සාක්ෂිකරුට පෙන්වා දී ඇති අතර සාක්ෂිකරු එහිද තමාගේ වාහනය තිබෙන ආකාරය සහ තමා සමඟ ෂැංග්‍රිලා හෝටලයට කුලී ගමන යාමට කටයුතු කරන ලද තැනැත්තා තම වාහනයට නගින ආකාරයද පෙන්වා එම තැනැත්තාවද *CCTV* දර්ශනය තුළින් හඳුනා ගැනීමක් කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 13 වන චූදිත සම්බන්ධයෙන් පමණක් වන අතර අනිකුත් කිසිදු චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නැත. එම 13 වන චූදිත වෙනුවෙන් යෝජනා කර ඇත්තේ 23 (1) දරන *CCTV* දර්ශනයට අනුව එහි සඳහන් වේලාව පැය 1:52:42 බවට සාක්ෂිකරු පිළිගෙන ඇති අතර පැ.3 (35) *CCTV* දර්ශනයට අනුව තමා සමඟ හයර් එක ගිය තැනැත්තා ෂැංග්‍රිලා හෝටලයේ බසින ලද වේලාව පැය 1:48:47 යැයි විත්තියෙන් කළ යෝජනාව සාක්ෂිකරු පිළිගෙන ඇති අතර මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ අදාළ *CCTV* දර්ශනයේ තිබෙන වේලාව හරිද වැරදිද යන්න සම්බන්ධයෙන් තමාට කියන්න බැරි බවයි.

පැ.සා.1025 මොහොමඩ් මන්සූර් මොහොමඩ් රිෆාන් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 වසර වන විට පික්මී සහ උබර් ආයතනය සමඟ සම්බන්ධ වී රියදුරෙකු ලෙස කටයුතු කළ බවත් එලෙස සේවය කරමින් සිටියදී 2019.04.21 දිනට පෙර දින එනම් 20 දින සවස් වරුවේ තමා පානදුර තම නිවසේ සිටින විට පානදුර සේව්පාස මාවතේ සිට කොළඹ ෂැංග්‍රිලා හෝටලයට යාම සඳහා තමාගේ ජංගම දුරකථන අංක 077-8730013 දරන අංකයට ඇමතුමක් ලැබුණු බව පවසා පෙර අවස්ථාවක පැ.18 ලෙස ලකුණු කර ඇති දුරකථන කුළුණු විස්තර ලේඛනය ආශ්‍රයෙන් සාක්ෂිකරුගේ සාක්ෂිය මෙහෙයවා ඇත.

සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ එම කුලී ගමනට අනුව පිරිමි පුද්ගලයන් දෙදෙනෙකු තමාගේ කුලී රථයෙන් ෂරිෆ් මාවතේ සිට ෂැංග්‍රිලා හෝටලයට ගමන් කරන ලද බවත් එම පුද්ගලයන් දෙදෙනා රැවුල වවා සිටි පුද්ගලයන් බවත් ඔවුන් කතා කරන භාෂා විලාශය අනුව එම පුද්ගලයන් මුස්ලිම් ජාතිකයන් බව තමාට වැටහුණු බවත් තමා එම පුද්ගලයන් දෙදෙනාව ෂරිෆ් මාවතෙන් වාහනයට නග්ගා ගැනීමට යනවිට එම පුද්ගලයන් දෙදෙනා ලොකු බ්‍රීෆ් කේස් දෙකක් ද වාහනයට දමා ගත්ත බවත් එදින වනවිට තමා භාවිතා කළ වාහනය අංක 7981 සුසුකි එවරි වර්ගයේ වාහනයක් බවත් පවසා සාක්ෂි ලබා දී ඇත.

පෙර අවස්ථාවක පැ.03 (20) ලෙස ලකුණු කර ඇති *CCTV* දර්ශනය සාක්ෂිකරුට නැරඹීමට ප්‍රදර්ශනය කර ඇති අතර එම දර්ශනයෙහි තම වාහනය තිබෙන බවත් පවසා එහි අංකය 9289 බවත් තමා පෙර සඳහන් කරන ලද්දේ තමා එදිනට පෙර ධාවනය කරන ලද වාහනයේ අංකය බවත් තමා 2019.04.20 දින පානදුරෙන් තමා විස්තර කළ පිරිමි පුද්ගලයන් දෙදෙනා සමඟ කුලී ගමන පැමිණීම සඳහා තමා භාවිතා කළේ *WP PI* 9289 අංකය දරන වාහනය බවත් සාක්ෂිකරු පවසා බ්‍රීෆ් කේස් දෙකක් ඩිකියට දමා ගත් බවයි.

තමා විසින් ෂැංග්‍රිලා හෝටලයට එම පුද්ගලයන් දෙදෙනාව ගෙන ගොස් බැස්සවූ බවත් තමා සමඟ එම පුද්ගලයන් දෙදෙනා ගමන් කිරීමේදී පිටුපස සීට් එකේ සිටි ඔවුන්ගෙන් අයෙකුට ජංගම දුරකථන ඇමතුමක් ලැබුණු බවත් ඔහු එයට හිමින් පිළිතුරු ලබා දුන් බව තමාට පෙණුනු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරුගේ ජංගම දුරකථන කුළුණු වාර්තාවට අනුව තමාට මෙම කුලී ගමන යාම සඳහා ඇමතුම ලැබුණේ 077-5075441 දරන ජංගම දුරකථනය බවත් සාක්ෂිකරු පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.17 ලෙස ලකුණු කර ඇති ජංගම දුරකථන විස්තර වාර්තාව සාක්ෂිකරුට පෙන්වා ඇති අතර එහි සඳහන් වන 077-5075441 දරන ජංගම දුරකථනයේ තමා සමඟ කුලී ගමන යාම සඳහා තමාට ඇමතුම ලබා දී ඇති ජංගම දුරකථන අංකය බවට සාක්ෂිකරු පවසා

සාක්ෂි ලබා දී ඇත. එසේම, තමා සමඟ කුලී ගමන ගිය පුද්ගලයන් දෙදෙනා එදිනට පෙර කිසිදු දවසක දැක නැති පුද්ගලයන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර 2019.04.21 දින උදේ ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බවත් තවත් තැන්වලද බෝම්බ පිපිරී ඇති බවත් දැනගත් බවට සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 13 වන චූදිත වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනිකුත් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් වැල්ලවත්ත රාම ක්‍රිෂ්ණා පාර අසලදී අත්අඩංගුවට ගත් බව වන අතර විත්තිය මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුගෙන් ඔහු පැවසූ කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශවල සටහන් වී නොමැති බවට වුවද සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත්තේ තමා අධිකරණයේ පැවසු සියල්ලම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවසූ බවයි.

අපරාධ ස්ථාන පරීක්ෂණාගාර පොලිස් නිළධාරීන්ගේ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 1815 කෝනාර මුදියන්සේලාගේ වත්තෙගෙදර රාජපක්ෂ යන සාක්ෂිකරු සාක්ෂි දෙමින්, තමා 1989.06.15 වන දින පොලිස් සේවයට බැඳී 2006 වර්ෂයේ සිට අපරාධ ස්ථාන

නිරීක්ෂණාගාර නිලධාරියෙක් ලෙස සේවය කරන බවත්, 2019 අප්‍රේල් 21 වන දින නුගේගොඩ කොට්ඨාශ අපරාධ පරීක්ෂණාගාරයට අනුයුක්තව සේවය කරමින් සිටියදී, අපරාධ වාර්තා කොට්ඨාශයේ අධ්‍යක්ෂකගේ නියෝග පරිදි ෂැංග්‍රිලා හෝටලයට ගමන් කළ බවත් තමා එම ස්ථානයට දහවල් 12.20ට පමණ ළඟා වීමෙන් අනතුරුව තමාට ෂැංග්‍රිලා හෝටලයේ 06 වන මහලෙහි 616 දරන කාමරය පරීක්ෂා කරන ලෙසට නියෝගයක් ලැබුණු අතර තමාත් ගල්කිස්ස කොට්ඨාශ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට අනුයුක්ත පොලිස් සැරයන් 37986 රූපසේන සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක වීරසිංහ සමග එදින පැය 12:35 සිට පැය 18:30 දක්වා එම ස්ථානය පරීක්ෂා කර දළ සැලැස්මක් සකස් කොට එහි තිබූ භාණ්ඩ කිහිපයක් අනාවරණය කර ගත් බව කියා සිටිමින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ BC 2010/2019/CM 02 වෙළුමෙහි B ගොනුවේ ඇති පිටු 03 කින් යුතු එම ස්ථානයේ දළ සැලැස්ම පැ.1199 ලෙසත් එහි පිටු 03, පිළිවෙළින් 1199 (1), (2), (3) ලෙසත් සලකුණු කරන ලදී. කාමරයේ ඇඳ මත තිබී අංක 01 ලෙස සුදු පාට මේස් බැනියමේ තිබී කෙස් කොටස් කිහිපයක් ද, අංක 02 වශයෙන්, ඇඳ මත තිබූ අත් සහිත සුදු පාට මේස් බැනියමක් ද, අංක 03 වශයෙන් එම ඇඳ මත තිබූ නිල් සහ අළු පැහැති ටී ෂර්ට් එකක් ද, නාන කාමරයේ සින්ක් එකේ වම් පැත්තේ තිබූ අංක 04 දරන දත් බුරුසුවත්, දකුණු පැත්තේ තිබූ අංක 05 ලෙස අංකනය කරන ලද දත් බුරුසුවත් සහ

කාමරයේ පුටුවක් මත තිබූ නිල් පාට සරමක් ද, ප්ලාස්ටික් කුණු බඳුන තුළ රට ඉඳි ඇට දෙකක් ද නඩු භාණ්ඩ ලෙස තමා භාරයට ගත් බව කියා සිටින ලදී. එසේම එම කාමරයේ ඇඳ අසල නිල් පාට බෑගයක් ද ඊට මදක් ඈතින් විශාල ප්‍රමාණයේ බෑග් තවත් බෑග් දෙකක්ද තිබුණු බව කියා සිටින ලද අතර එම නිල් පාට බෑගයේ තිබී 138/E, නිව් මුවර් පාර, (New Moor Street) කොළඹ 12 ලිපිනයේ සහ මොහොම්මදු අසාම් මොහොමඩ් මුබාරක් යන නම සහිත අංක A019214711 දරන රියදුරු බලපත්‍රය සොයාගත් බවත් එය එම අවස්ථාවේදීම එම ස්ථානයේ සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් අධිකාරී අම්පාවිල මහතාට භාරදුන් බව කියා සිටිමින් පැ.08 වශයෙන් සලකුණු කරන ලද එකී රියදුරු බලපත්‍රය හඳුනාගන්නා ලදී. එසේම එම ස්ථානය අපරාධ වාර්තා කොට්ඨාශයේ නිලධාරීන් මඟින් ඡායාරූප ගත කරන ලද බවත් අංක 01 ලෙස කාමරයේ ඇඳ මත තිබූ සුදු පාට මේස් බැනියමේ තිබී කෙස් කොටස් කිහිපය නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක 119/19 ට ඇතුළත් කළ බව කියා සිටින ලද සාක්ෂිකරු එම දේපල කුවිතාන්සි පත්‍රය පැ.1200 වශයෙන් සලකුණු කරන ලදී.

අංක 02 වශයෙන් ඇඳ මත තිබූ අත් සහිත සුදු පාට මේස් බැනියම නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක 120/19 ට ඇතුළත් කළ බව කියා සිටින ලද සාක්ෂිකරු එම දේපල කුවිතාන්සි පත්‍රය පැ.1201 වශයෙන් සලකුණු කරන ලදී. අංක 03 වශයෙන් එම ඇඳ මත තිබූ නිල් සහ අළු පැහැති ටී

ෂර්ට් එක නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක 121/19 ට ඇතුළත් කළ බව කියා සිටින ලද සාක්ෂිකරු එම ටීෂර්ට් එකෙහි වම් පැත්තේ kalenji වශයෙන් සඳහන්ව තිබූ බව ද කියා සිටින ලදී. එම දේපල කුවිතාන්සි පත්‍රය පැ.1202 වශයෙන් සලකුණු කරන ලදී. කාමරයේ පුටුවක් මත තිබූ නිල් පාට සරම දේපල කුවිතාන්සි අංක 122/19ට ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1203 වශයෙන් සලකුණු කරන ලදී.

එසේම නාන කාමරයේ සින්ක් එකේ වම් පැත්තේ තිබූ අංක 04 දරන දත් බුරුසුව සහ දකුණු පැත්තේ තිබූ අංක 05 ලෙස අංකනය කරන ලද දත් බුරුසුව වෙන වෙන ම කවරවල බහා නඩු භාණ්ඩ කුවිතාන්සි පත් 123/2019ට ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු එකී නඩු භාණ්ඩ කුවිතාන්සිය පැ.1204 වශයන් සලකුණු කරන ලදී. එමෙන්ම ප්ලාස්ටික් කුණු බඳුන තුළ තිබූ රට ඉඳි ඇට දෙකක් දේපල කුවිත්නාසි අංක 124/2019ට ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සි අංකය පැ.1205 වශයෙන් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව තමා විසින් එම නඩු භාණ්ඩ තමා භාරයේ ආරක්ෂිතව තබා ගෙන 2019.06.03 වන දින පොලිස් කොස්තාපල් 82732 දර්ශන නිලධාරියා විසින් අධිකරණයට භාරදී ඉන් අනතුරුව තමා විසින් රැගෙන ගොස් 2019.06.10 දින ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත භාරදුන් බවත් සක්ෂිකරු පවසා සිටින ලදී. අපරාධ ස්ථානයෙන් තමා භාණ්ඩ භාරයට

ගෙන රජයේ රස පරීක්ෂකවරයා වෙත භාරදෙන තුරු ඒවා නිසි පරිදි මුද්‍රා තබා තිබූ අතර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත භාරදෙන අවස්ථාව වන විට දී ද එම මුද්‍රා යහපත් තත්ත්වයේ තිබූ බවද සාක්ෂිකරු පවසා සිටින ලදී.

මෙම සාක්ෂිකරුට රජයේ රස පරීක්ෂකවරයා වෙතින් අධිකරණය වෙත ලැබී තිබූ ඒ වන විටත් පැ.1076 වශයෙන් සලකුණු කරන ලද පාර්සලය තුළ ඇති පි.ආර්.119/2019 දරන ලිපිකවරය තුළ අඩංගු 2019.04.21 දිනය සහ තමාගේ අත්සන සහිත සුදු කඩදාසිය ද එහි තිබූ කුඩා කෙස් කොටස් දෙකක් ද පෙන්වා සිටින ලද අතර සාක්ෂිකරු විසින් ඒවා හඳුනාගන්නා ලදී. එම ලිපිකවරය පැ.1207 වශයෙන් ද ඒ තුළ තිබූ කෙස් කොටස් පැ.1207(A) වශයෙන් ද සලකුණු කරන ලදී. දේපල කුවිතාන්සි අංක 120/2019ට අදාළ බාහිර කවරය පැ.1208 වශයෙන් සලකුණු කරන ලද අතර එය තුළ තිබූ මේස් බැනියම සහ එහි සඳහන් EBONY යන සලකුණ ද සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එම නඩු භාණ්ඩ පැ.1209 වශයෙන් සලකුණු කරන ලදී. දේපල කුවිතාන්සි අංක 121/2019 අඩංගු ලිපිකවරය සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එය පැ.1210 වශයෙන් සලකුණු කරන ලදී. ඒ තුළ තිබූ KALENJI යනුවෙන් සඳහන් ටීෂර්ට් එක සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එය පැ.1211 වශයෙන් සලකුණු කරන ලදී. දේපල කුවිතාන්සි අංක 122/2019 ඇතුළත් ලියුම් කවරය සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එය පැ.1212 වශයෙන් ද ඒ තුළ තිබූ සරම පැ.1213 වශයෙන් ද සාක්ෂිකරු හඳුනාගෙන සලකුණු

කරන ලදී. එමෙන් ම දේපල කුවිතාන්සි අංක 123/2019 අඩංගු ලිපිකවරය පැ.1214 වශයෙන් ද ඒ තුළ තිබූ සුදු පැහැති සහ කොළ පැහැති කෙදි සහිත දත් බුරුසුව පැ.1215 වශයෙන් ද, පැ.1216 වශයෙන් සලකුණු කරන ලද කවරය තුළ තිබූ සුදු පාට දත් මදින බුරුසුව පැ.1217 වශයෙන්ද සාක්ෂිකරු විසින් හඳුනාගැනීමෙන් අනතුරුව සලකුණු කරන ලදී. සාක්ෂිකරු විසින් සොයා ගන්නා ලද රට ඉදි ඇට දෙක ඇතුළත් දේපල කුවිතාන්සි අංක 124/2019 දරන ලිපිකවරය පැ.1218 වශයෙන් ද ඒ තුළ තිබූ අඩංගු 2019.04.21 දිනය සහ තමාගේ අත්සන සහිත සුදු කඩදාසියද එකී රට ඉදි ඇට දෙක වෙන් වෙන් වශයෙන් ඔතන ලද කොළ කැබලි දෙක හඳුනාගන්නා ලද සාක්ෂිකරු එය පිළිවෙළින් පැ.1219(1), පැ.1219(2) වශයෙන් සලකුණු කරන ලදී.

මෙම සාක්ෂිකරු ඔහු විසින් සිදුකළ රාජකාරිය සම්බන්ධයෙන් ඉහත පරිදි දීර්ඝ සාක්ෂියක් ලබා දුන්න ද කිසිදු විත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත.

<u>විශ්ලේෂණය</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1815 කෝනාර මුදියන්සේලාගේ වත්තෙගෙදර රාජපක්ෂ යන සාක්ෂිකරු ඉහත පරිදි ලබා දුන් සාක්ෂිය අප විසින් මනාව විශ්ලේෂණය කර බලන ලද අතර, එම සාක්ෂිය මගින් ෂැංග්‍රිලා හෝටලයේදී බෝම්බ පුපුරවාගෙන මියගිය මොහොම්මදු අසාම්

මොහොමඩ් මුබාරක් බෝම්බ පුපුරවා ගැනීමට පෙර දින එම හෝටලයේ නවාතැන් ගෙන සිට ඇති බව මැනැවින් තහවුරු වේ.

මෙම නඩු විභාගයේ දී ශ්‍රැන්ගිලා හෝටලයේ බෝම්බ පිපිරීම් සිදුකරන ලද මුහම්මදු හාසීම් ජහරාන් හෙවත් මොහොමඩ් කාසිම් ජහරාන් හෙවත් මුහම්මදු කාසිම් මොහොමඩ් ජහරාන් හෙවත් මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් සහ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් යන අයගේ අනන්‍යතාවය සනාථ කරන ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක මෙන්ම විදේශ ගමන් බලපත්‍ර සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ පරිගණක දත්ත ලේඛන මෙම නඩුවෙහි දෙපාර්ශවය විසින්ම පිළිගැනීම් ලෙස වාර්තාකර තිබීම හෙතුකොට ගෙන ඔවුන්ගේ අනන්‍යතාවයන් සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1809 එලයාදුර ප්‍රසාද් සේනාදර ද සිල්වා සාක්ෂි දෙමින්, තමා 2000 වර්ෂයේ පොලිස් සේවයට බැඳී 2006 වර්ෂයේ සිට අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට සේවය කරන බවත් 2019 අප්‍රේල් 21 වන දින තමා කොළඹ දකුණ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ සේවය කළ අතර එදින 9:35ට පමණ ස්ථානාධිපතිවරයාගෙන් ලැබුණු දුරකථන ඇමතුමක් පරිදි කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට තමා ගිය බවත් එහිදී කොටුව ෂැංග්‍රිලා හෝටලයේ පිපිරීමක් සිදුවී ඇති බවත් විමර්ශන කටයුතු සඳහා එම ස්ථානයට ගොස් සහභාගී වන ලෙසට

ස්ථානාධිපතිවරයා තමාට දැන්වූ අතර තමා කොටුව ෂැංග්‍රිලා හෝටලයට පෙ.ව.10.30ට පමණ ලහා වූ විට එදින එනම් 2019.04.21 දින පැය 08:50ත් 09:00ත් අතර කාලයේ දී ෂැංග්‍රිලා හෝටලයේ තුන්වන මහලේ Table 1 යන අවන්හල තුළ බෝම්බයක් පිපිරී තිබූ බවත් තමා යන විටත් හෝටල් පරිශ්‍රය ඉදිරියේ බිඳී ගිය වීදුරු කොටස්, සුන් බුන්, ලී කොටස් තිබූ අතර මෘත ශරීර 03ක් පමණ සහ ශරීර කොටස් කිහිපයක් රෙදි වලින් වසා තිබූ බවත් නිරික්ෂණය වූ බව කියා සිටින ලදී. Table 1 අවන්හල තුළ සෑම තැනකම සුන්බුන් විසිරී, ජල නල කැඩී, සිවිලිමේ කොටස් ගැළවී, ඒ තුළ තිබූ වයර් සහ බට ද ඇතුළත තිබූ පිටු සහ වීදුරු ආදිය විසිරී ගොස් තිබූ බවත් කියා සිටි සාක්ෂිකරු තමා එම අවස්ථාවේදී ම බෝම්බය පිපිරීය ස්ථානය වශයෙන් එක් ස්ථානයක්ද, පසුව තවත් ස්ථානයක් ද, වශයෙන් ස්ථාන දෙකක් බෝම්බ පිපිරී ගිය ස්ථාන වශයෙන් හඳුනාගත් බව කියා සිටින ලදී.

Table 1 අවන්හලෙහි පැති 04න් අවන්හලට ඇතුළු වන විට දකුණු පැත්තේ වීදුරු කොටස් සවි කර තිබූ තීරුවක් තිබූ බවත් එම ස්ථානයේ වීදුරු කොටස් කැඩී සිවිලිමට දැඩි හානි සිදුවී තිබූ අතර එම ස්ථානයේ සිට බැලූ විට ගාලු මෝදර මුහුදු දර්ශනය වන අතර දකුණු පස තරමක් විශාල කොන්ක්‍රීට් කණු 04ක් තිබූ අතර එක කොන්ක්‍රීට් කණුවක් අසල ටයිල් මත පළමු පිපිරීම සිදුවූ ස්ථානය ලෙසට හඳුනාගත් බව කියා සිටින ලදී.

එසේම තමා නිරීක්ෂණය කරන ලද ස්ථානවලින් 01 සිට 07 දක්වා දළ සටහනේ ලකුණු කරන ලද ස්ථානවල තිබූ මිනිස් සිරුරු කොටස් වලින් රුධිර සාම්පලද, අංක 08 ලෙස ලකුණු කරන ලද ස්ථානයෙන් කුඩා වියලි කෝෂ සවි කළ හැකි ආකාරයේ වයර් කිහිපයක් සම්බන්ධ කර ආවරණය කරන ලද ප්ලාස්ටික් කොටසක් ද, අංක 09 වශයෙන් සලකුණු කරන ලද ස්ථානයේ කුෂන් කර මැදින් සහ දෙපසින් නිල් පාට ඉරි සහිතව පිටේ එල්ලන් යන බෑගයක උරහිසට සම්බන්ධ වන කොටසක් සොයාගත් බවත් එම ස්ථානයේම තිබී කළු පාට හෙල්මට් එකක් ද, අංක 10 යන ස්ථානයේ තිබී කළු පැහැති අත් ආවරණයේ කොටසක් ද, සොයා ගත් බව කියා සිටින සාක්ෂිකරු ඒ වන විටත් එම ස්ථානයට රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතා සහ කණ්ඩායමක් ද මහෙස්ත්‍රාත්තුමිය ද, පොලිස් නිලධාරීන් ද, පැමිණ සිටින ලද බවත් එම ස්ථානය භාරව කොම්පඤ්ඤ වීදියේ පොලිසියේ විමර්ෂණ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නාලක මහතා සිටි බවත් කියා සිටි සාක්ෂිකරු තමා පස්වරු 05:10ට පමණ එදින පරීක්ෂණ කටයුතු අවසන් කොට තමා භාරයට ගත් නඩු භාණ්ඩ මුද්‍රා තබා කොළඹ දකුණ, අපරාධ පරීක්ෂණාගාරයේ නඩු භාණ්ඩ භාරකාර උප පොලිස් පරීක්ෂක ජයරාජ්ට භාරදුන් බව කියා සිටින ලදී. එම නඩු භාණ්ඩ වන, අංක 01 සිට 07 දක්වා ස්ථානවලින් ලබා ගන්නා ලද භාණ්ඩ PR55/2019ට ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1441 වශයෙන් ද, අංක 08 ස්ථානයෙන් ලබා ගත් නඩු

භාණ්ඩවලට අදාළ දේපල කුවිතාන්සිය PR56/2019 පැ. 1442 වශයෙන් ද, අංක 09 ස්ථානයට අදාළ භාණ්ඩ භාරදුන් දේපල කුවිතාන්සි අංක 57/2019 පැ.1443 වශයෙන් ද, අංක 11 ස්ථානයෙන් සොයා ගන්නා ලද අදාළ භාණ්ඩ භාරදුන් දේපල කුවිතාන්සි අංක 58/2019 පැ.1444 වශයෙන් ද, පිපිරීම සිදුවූ ස්ථානයේ අවට විසිරී තිබූ බෝම්බයක කොටස් විය හැකි බවට නිරීක්ෂණය වූ භාරයට ගන්නා ලද අදාළ භාණ්ඩ භාරදුන් දේපල කුවිතාන්සි අංක 59/2019 පැ. 1445 වශයෙන් ද, සාක්ෂිකරු විසින් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව තමා 2019.04.22 දින උදෑසන 08:35 සිට පැය 16:30 දක්වා එම ස්ථානය පරීක්ෂණයට භාජනය කළ බවත් එහිදී Table 1 අවන්හලට ඇතුළු වන, පිළිගැනීමේ නිලධාරියා සිටි ස්ථානය දෙවන පිපිරීම සිදුවූ ස්ථානය ලෙසට තමා හඳුනාගෙන දළ සටහනක් ඇතුළත් කළ බවත් එම ස්ථානයෙන් පොළොව කැඩී තිබූ ටයිල් කැබලි, සිමෙන්ති කොටස් සහ පස් සාම්පලයක් ගෙන එම ස්ථානය අංක 12 ලෙස නම් කළ බවත් අංක 13 ලෙස නම් කරන ලද ස්ථානයෙන් OXEIO සඳහන් අඩිය සුදු උඩ කළු පාට සපත්තු යුගලයක් තමා භාරයට ගත් බවත් අංක 14 ලෙසට ස්වයංක්‍රීය තරප්පු පෙළ ඔස්සේ පැමිණ Table 1 අවන්හලට ඇතුළු වන ස්ථානයේ ටයිල් වල තිබූ බෝම්බය පිපුරුවා යැයි කියන ස්ථානයේ තිබූ කඩතොළුවලින් සාම්පලයක් ද ලබා ගත් අතර අංක 12 සහ 14 ලෙසට සඳහන් කළ ස්ථානයෙන් ලබා ගත් පස් සාම්පල දෙක PR60/2019ට

ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1446 වශයෙන් සලකුණු කරන ලදී. අංක 13 ලෙස නම් කරන ලද ස්ථානයෙන් භාරයට ගත් සපත්තුව දේපල කුවිතාන්සි අංක 61/2019 ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1447 වශයෙන් සලකුණු කරන ලදී. මෙම නඩු භාණ්ඩ සියල්ල නඩු භාණ්ඩ භාර නිලධාරියා වන උ.පොා.ප. ජයරාජ්ට භාර දුන්බව කියා සිටින ලදී.

තමා නැවතත් 2019.04.23 වන දින එම ස්ථානයට ගිය අතර එදිනද එම ස්ථානය පරීක්ෂාවට ලක් කර ඊයම් පතුරු කිහිපයක් සොයාගත් බවත් සහ යකඩ බෝල කිහිපයක්, යකඩ බෝල බහාලූ සලකුණු සහිත කුඩා පතුරු කොටස් කිහිපයක් තම බාරයට ගෙන ඒවා දේපල කුවිතාන්සි අංක 63/2019ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1448 වශයෙන් සලකුණු කරන ලදී. පසුදින එනම් 2019.04.24 දින ද එම ස්ථානයට ගොස් ජංගම දුරකථනයක කොටස් කිහිපයක් අංක 15 ලෙස සලකුණු කළ ස්ථනයෙන් භාරයට ගත් බවත් අංක 16 යන ස්ථානයෙන් කලිසමක පිටුපස සාක්කුව විය හැකි මුදල් පසුම්බියත් සමඟ කොටසක් ද, ඒ ආසන්නයේ ම තිබූ PUMA ලෙස සඳහන් කළු පැහැති සපත්තු ජෝඩුවක්ද සොයා ගත් අතර ඉහත සඳහන් කළ 16 යටතේ ස්වාමීනි මුදල් පසුම්බියේ තිබූ ෂැන්ග්‍රිලා කලම්බු, මිස්ටර් හම්සාඩ් මොහොමඩ් ලෙස සඳහන් කාඩ් එකක්. එකේ තිබ්බා ප්‍රේමවන්ද්‍ර පලතුරු වෙළඳසැල යනුවෙන් සඳහන්ව තිබූ බවත්. ඊට අමතරව මුදල් නෝට්ටු කීපයක්ද, තිබූ අතර ඒ

සියල්ල 16(1), 16(2), 16(3) යටතේ සළකුණු කළ බවත් කියා සිටින ලදී. අංක 15 ස්ථානයෙන් ලබා ගන්නා ලද භාණ්ඩ සියල්ල දේපල කුවිතාන්සි අංක 64/2019ට ඇතුළත් කළ බව කියා සිටින සාක්ෂිකරු එකී දේපල කුවිතාන්සිය පැ.1449 වශයෙන් සලකුණු කරන ලදී.

එසේම ඉහත අංක 16 සහ 16(1), 16(2), 16(3) ලබා ගන්නා ලද භාණ්ඩ සියල්ල දේපල කුවිතාන්සි අංක 65/2019ට ඇතුළත් කළ බව කියා සිටින සාක්ෂිකරු එකී දේපල කුවිතාන්සිය පැ.1450 වශයෙන් සලකුණු කරන ලදී. අංක 17 ලෙස අපරාධ ස්ථානයේ සළකුණු කරන ලද PUMA සළකුණ සදහන් පිපිරීමෙන් විනාශ වී ගිය කළු පැහැති සපත්තු ජෝඩුව දේපල කුවිතාන්සි අංක 66/2019ට ඇතුළත් කළ බව කියා සිටින සාක්ෂිකරු එකී දේපල කුවිතාන්සිය පැ.1451 වශයෙන් සලකුණු කරන ලදී.

2019.04.25 දින ද උදෑසන 9.00 සිට පැය 16:25 දක්වා ඉහත ස්ථානය පරීක්ෂා කළ බවත් එහිදී Kelenji ලෙස සඳහන් තද නිල් පැහැති කැප් තොප්පිය කොටසක් පෙර දින අංක 12 ලෙස සඳහන් ස්ථානයේ කැඩී තිබූ සිවිලිමේ උඩ කොටසේ රැඳී තිබී සොයාගත් බවත් Table 1 අවන්හලේ ඇතුල් වන ස්ථානයේ 02 වන පිපිරීම සිදුවූ ස්ථානයේ තිබී

එක සපත්තුවක Reebok ලෙසත් අඩිය කළුපාටයි, සුදුපාටයි, ත්‍රිකෝණාකාර සලකුණ සහිත සපත්තු දෙකක් සොයා ගත් බවත් එම ස්ථානය අංක 19 ලෙස සලකුණු කළ බවත් කියා සිටි සාක්ෂිකරු Kelenji

ලෙස සඳහන් තද නිල් පැහැති කැප් තොප්පිය කොටස දේපල කුවිතාන්සි අංක 67/2019ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1452 වශයෙන් සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් ඉහත අංකනය කළ නඩු භාණ්ඩ ලෙස භාරයට ගන්නා ලද, පැ.19 ලෙස අංකනය කරන ලද ස්ථානයෙන් ලබා ගත් භාණ්ඩ ඇතුලත් දේපල කුවිතාන්සි පත්‍ර 68/2019 පැ.1453 වශයෙන්ද, පිපිරුම සිදු වූ ස්ථානය අවට විසිරී තිබූ කුඩා කොටස් ඇතුලත් කළ බඩු භාරගැනීමේ කුවිතාන්සි 69/2019 පත පැ.1454 වශයෙන්ද සලකුණු කරන ලද අතර එකී පැ. 1452, පැ. 1453, පැ.1454 ට අදාළ නඩු භාණ්ඩ භාර නිලධාරී උප පොලිස් පරීක්ෂක ජයරාජ් නිලධාරීයාට භාර දුන් බව කියා සිටින ලදී.

2019.04.26 දින නැවත අපරාධ ස්ථානයට ගොස් දෙවන පිපිරුම සිදු වූ Table one අවන්හලට ඇතුල් වූ ස්ථානයේ පිපිරුම සිදු වුනු ස්ථානයට ආසන්නව තිබුණු Axis brand සහ අංක සඳහන් වූ 5366210000766032 ප්ලැටිනම් කාඩ් කොටසක් සොයා ගත් බවත් එය අංක 20 ලෙස සලකුණු කළ බවත් කියා සිටි සාක්ෂිකරු, 20 ස්ථානයෙන් ලබාගත් භාණ්ඩ දේපල කුවිතාන්සියේ අංක 71/2019 ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1455 වශයෙන් සලකුණු කරන ලදී.

එසේම රජයේ රස පරීක්ෂකතුමාගේ උපදෙස් පරිදි පළමු පිපිරුම සිදු වූ ස්ථානයේ අංක 21 දරන සිවිලිමේ යට පැත්තෙන් ලබා ගත් පිස්න සාම්පලය දේපල කුවිතාන්සියේ අංක 72/2019 ඇතුළත් කළ බව කියා

සිටිමින්, එම දේපල කුවිතාන්සිය පැ.1456 වශයෙන් සලකුණු කරන ලද අතර පැ.1455 සහ පැ.1456 යටතේ වූ නඩු භාණ්ඩ භාර නිලධාරී උප පොලිස් ජයරත්න නිලධාරියාට භාරදුන් බවත් කියා සිටින ලදී. තවද, සාක්ෂිකරු තමා විසින් පරීක්ෂා කරන ලද ස්ථානය සම්බන්ධයෙන් විස්තරාත්මකව පිළියෙල කරන ලද පිටු 05 කින් සමන්විත දළ පැ.1457 වශයෙන් ද එක් එක් පිටුව 1457 (01) සිට (07) ලෙසද සලකුණු කරන ලදී.

වැඩිදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු තමා විසින් භාරගන්නා ලද සහ පසුව දේපළ කුවිතාන්සිවලට ඇතුළත් කරන ලද භාණ්ඩ රජයේ රස පරීක්ෂකවරයා වෙත යැවීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් මඟින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත නඩු අංක 13099/19 යටතේ ඉදිරිපත් කල බව කියා සිටිමින් එකී දිවුරුම් ප්‍රකාශය පැ.1458 වශයෙන් සලකුණු කරන ලදී.

සාක්ෂිකරුහට, HC(TAB) 2972/21 සහ C16210 ලෙස සඳහන් පාර්සලයක් තුළ තිබූ නඩු භාණ්ඩ විවෘත අධිකරණයේදී පෙන්වා සිටින ලද අතර ඒවා හඳුනාගනිමින් ඒ වන විටත් සලකුණු කර තිබූ පැ.871 (F) භාණ්ඩය අංක 9 ලෙස සඳහන් කළ එල්ලන් යන බෑග් එකක කොටසක් ලෙස තමා සඳහන් කළ ස්පොන්ච් කොටස සහ හෙල්මට් එකක කොටස ලෙසට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. එසේම පැ.871(K) යනු බෝම්බයට හසුව තිබී තමා භාරයට ගනු ලැබූ, OHCLO ලෙස සඳහන්

අඩිය සුදුපාට උඩ කළුපාට සපත්තු යුගල බවටද සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී.

එසේම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද අපරාධ ස්ථානයේ අංක 8 ලෙස නම් කළ කොටස් නමයකින් යුත් බැට්ටි පැක් එකක ආකාරයේ කොටස පැ. 872(I) වශයෙන්ද, අපරාධ ස්ථානයේ අංක 17 ලෙස නම්කළ ස්ථානයේ බෝම්බයට හසුව කැඩීගිය අඩිය සුදුපාට සපත්තු යුගලය පැ.872(K) ලෙසද, අංක 19 ලෙස සඳහන් කළ පැත්තක ත්‍රිකෝණාකාර ලක්ෂණයක් සඳහන් අළු පාට සහ අඩිය සුදු පාට සපත්තු යුගල.පැ.872(M) වශයෙන්ද, අංක 10 ලෙස සලකුණු කරන ලද කළු පාට අත් ආවරණ කොටස පැ.872(O) වශයෙන් ද, අපරාධ ස්ථානයේ අංක 15 ලෙස නම් කල ජංගම දුරකථනයේ කැඩී ගිය කොටස් පැ.1460 වශයෙන්ද, අංක 12 ලෙස තමා නම් කළ ස්ථානයෙන් ලබාගත් පස් සහ සුන්බුන් කොටස් සාම්පලය පැ.1462 වශයෙන්ද, සාක්ෂිකරු විසින් 2019/04/26 දින අපරාධ ස්ථානයෙන් ලබාගන්නා ලද විසිරී තිබුණු කොටස් බෝම්බය සහ එම බෑග්වල කොටස් පැ.1464 වශයෙන්ද, දෙවන පිපිරුම සිදුවූ ස්ථානයේ විසිරී තිබූ සුන්බුන් කොටස් සියල්ල පැ.1466 වශයෙන් ද, සාක්ෂිකරු විසින් විවෘත අධිකරණයේදී හඳුනාගනිමින් සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් වැඩිදුරටත් සාක්ෂි දෙමින් ඔහු විසින් අපරාධ ස්ථානයේ අංක 18 ලෙස නම් කළ ස්ථානයෙන් ලබාගත් ‘‘කෙලෙන්ජි ’’ නම සඳහන් වන තද නිල්පාට පිපුරුමට හසුවුණ peak එක සහිත cap

කොටස පැ. 1468 වශයෙන්ද, පිපුරුම සිදුවූ ස්ථානය සහ අවටින් ලබා ගන්නා ලද කුඩා බයිසිකල් බෝල සහ සුන්බුන් කොටස් සියල්ල පැ. 1470 වශයෙන්ද, අපරාධ ස්ථානයේ අංක 14 ලෙස දෙවැනි පිපුරුම සිදු වූ ස්ථානයෙන් ලබාගත් පස් සහිත සුන්බුන් සාම්පලය පැ. 1472 වශයෙන්ද, අංක 16 ස්ථානයෙන් ලබාගත් කලුපාට කලිසමක කොටස පැ. 1474 අංක 16 ලෙස නම් කළ කලිසම් සාක්කුව තුළ තිබූ අංක 16 (1) ලෙස නම් කළ කලුපාට මුදල් පසුම්බිය පැ. 1476 වශයෙන්ද, අංක 11 ලෙස සලකුණු කළ කොළපාට ඉරි සහිත සම්පූර්ණයෙන් මුහුණ ආවරණය කරන ලද දැවී ගිය හෙල්මටය පැ. 1477 වශයෙන්ද, හඳුනාගනිමින් සලකුණු කරන ලදී.

චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

විශ්ලේෂණය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් ෂැංග්‍රිලා හෝටලයේ 3 වන මහලේ "Table One" අවන්හලේ පළමු පිපුරුම් ස්ථානයෙන් රුධිර සාම්පල (01 සිට 07 දක්වා), බැටරි පැක් එකක් (08), බෑගයක කොටස් (09) සහ කළු රෙදි අත් ආවරණයක් (10) ලබා ගැනීම, එසේම 2019.04.22 දින පිළිගැනීමේ කවුන්ටරය අසල දෙවන පිපුරුම් ස්ථානය හඳුනාගෙන, පළමු ස්ථානයේ වළෙන් පස් සාම්පලයක් (12), සපත්තු යුගලක් (13) සහ දෙවන ස්ථානයෙන් පස් සාම්පලයක් (14) ලබා ගන්නා ලදී. 2019.04.24 දින විනාශ වූ ජංගම දුරකථන කොටස් (15), කළු කලිසම් සාක්කුවක තිබූ මුදල් පසුම්බියක් (16) සහ රුපියල් 8, 330ක මුදලක්ද, "PUMA" සපත්තු

ජෝඩුවක් (17) ද සොයා ගන්නා ලදී. 2019.04.25 දින සිවිලිම මත තිබී "Kalenji" තොප්පියක පීක් කොටස (18) සහ "Reebok" සපත්තු ජෝඩුවක් (19) සොයා ගැනීම, සහ එකී නඩු භාණ්ඩ දේපළ කුවිතාන්සි අංක 55/2019 සිට 61/2019 සහ 63/2019 සිට 69/2019, 71/2019 සහ 72/2019 යටතේ භාර දීම සිදුකර තිබීම සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර එලෙස සොයාගත් නඩු භාණ්ඩවල පැවැත්ම ඒවා විශ්ලේෂණය සිදුකිරීම සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂකගේ සාක්ෂියෙන් තහවුරු වී ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති විශ්‍රාමික කාන්තා පොලිස් පරීක්ෂක සුමනලතා යන සාක්ෂිකාරිය කිංග්සිබරි හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළව සිදු කරන ලද අපරාධ ස්ථාන පරීක්ෂණය සම්බන්ධයෙන් විස්තරාත්මක සාක්ෂියක් ලබාදී ඇත. ඇය 2007 වර්ෂයේ සිට අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරිනියක් වශයෙන් පරීක්ෂණාගාරයට අනුයුක්තව රාජකාරී කර ඇති බවත්, එසේම ස්වීඩන් පොලිස් නිලධාරීන් මඟින් මාස දෙකක පමණ කාලයක් සහ ඉන් අනතුරුව වරින් වර කළුතර පොලිස් විද්‍යාලයේ අපරාධ ස්ථාන පරීක්ෂාව සම්බන්ධයෙන් කීප වතාවක් පුහුණුව ලබා තිබුන බවත් කොළඹ මධ්‍යම අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ 2007 සිට විශ්‍රාම යන කාලය දක්වාම සේවය කල බවත් පවසා ඇත.

2019 අප්‍රෙල් 21 වෙනිදා පෙ. ව. 9.15ට ලැබුණු දැනුම් දීම අනුව උප පොලිස් පරීක්ෂක කළුආරච්චි නිලධාරියා සහ පොලිස් කොස්තාපල් 70165 දවුන් ද සේකර නිලධාරියා සමඟ පිටත් වුන බවත් අපරාධ ස්ථානයට යද්දී යම් යම් උපකරණ එනම් නිකෝන් ඩී 60 කියන කැමරාව, අපරාධ ස්ථාන පරීක්ෂණ කට්ටලය, වර්සලයිට් එක, ඇඟිලි පාද සලකුණු ලබා ගන්නා උපකරණයක්, ඩී.එල්.කේ උපකරණය රැගෙන ගිය බවත් කොටුව, කොළඹ 1 ජනාධිපති මාවතේ කිංග්ස්බරි හෝටලයට යනකොට වේලාව දළ වශයෙන් 9:30, 35 බවත් ඒ ස්ථානයට යන විටත් එම ස්ථානය අපරාධ ස්ථානයක් වශයෙන් සලකුණු කිරීමක් සිදුවෙලා තිබුණ බවත් ඒ ස්ථානයේ විමර්ශන කටයුතු පොලිස් පරීක්ෂක සූරියකුමාර නිලධාරියා යෙදී සිටි බවත් ස්ථානයේ ආරක්ෂාවට ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රනාන්දු නිලධාරියා උප පොලිස් පරීක්ෂක උපුල් නිලධාරියා පොලිස් කොස්තාපල් 70863 රංගල කියන නිලධාරීන් යෙදී සිටි බවත් මෙම අපරාධය, පැය 8:40ත් 8:46ත් අතර කාලයේ සිදුවුණ බවට දැනගත් බවත් තමා අපරාධ ස්ථානයට ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වෙද්දිම මහජනයා විශාල වශයෙන් එතන සිටි බවත්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් රාශියක් සිටි බවත්, ඒ වගේම විදේශ ජාතිකයනුත් හිටි බවත්, ඒ අසල ගිලන් රථ කීපයක් නවතා තුවාලකරුවන් රැගෙන එය තුළට පටවමින් හිටි බවත්, පිළිගැනීමේ ස්ථානය ආසන්නයේ එළියේ ගිලන් රථ නවතලා තිබුණ බවත්, ඇතුලේ

මෘත ශරීර සුදු රෙදි වලින් වහලා තිබුණ බවත්, මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු බෝම්බයක් පුපුරුවා හැර ඒ ස්ථානයේ මනුෂ්‍ය ඝාතන සහ දේපල වලට අලාභ සිදු කිරීමක් සිදුකර ඇති බව හෙලි වූ බවත් පවසා ඇත.

ඒ සිදුවීම වෙලා තිබුණේ මේ කිංග්ස්බරි හෝටලයේ හාබර්කෝට් කියන කොටසේ මුහුදු වෙරළ පැත්තට වෙන්නට පිටුපස කොටසේ තිරස් අතට කණු කීපයක් තිබුණ ස්ථානයේ බවත් සිද්ධියට අදාළව ඉන් පසුව දළ සටහන් පිළියෙල කිරීමක් සිදු කර තිබෙන බවත් එම ස්ථානය දින කීපයක් පරීක්ෂාවට ලක් කළ බවත් පළවෙනි දවසේ මේ හාබර්කෝට් අවන්හලට ඇතුල් වෙනකොට ඒ ස්ථානයේ පිළිගැනීමේ නිලධාරීන් සිටින ස්ථානයේ ඉදලා දිගටම රතු පාට ලේ වැනි දෙයක් සමඟ වතුර පිරිලා තිබුණ බවත්, බොහොම අපහසුවෙන් ඇතුල් වීමට සිදුවුන බවත් ඒත් එක්කම ඒ පිපිරීමෙන් කිංග්ස්බරි හෝටලේ වහලේ ආවරණය, එක එක කෑම වර්ග ආවරණය කරලා තිබුණු ෂෝකේස් වල වීදුරු විදුලි රැහැන් වායු සමීකරණ යන්ත්‍රයට සවි කරලා තිබුණේ විදුලි රැහැන් සහ අනිකුත් ලී පුටු මේස ආදිය සියල්ලම කැඩිලා විනාශ වෙලා අබිලි ද්‍රව්‍ය බවට පත් වෙලා යාමට ඒමටත් අපහසු තත්ත්වයක තිබුණ බවත් සුන්බුන් ආදිය ඉවත් කිරීමට මුල්ම දවසේ පියවරක් ගන්න දුන්නේ නැති බවත් සාක්ෂි විනාශ වන නිසා ඉවත් කිරීමක් නොකරන ලෙසට ආරක්ෂක නිලධාරීන්ට උපදෙස් දී තිබුන බවත් පවසා ඇත.

පළවෙනි දවසේ කරපු නිරීක්ෂණයන් සියල්ල සිදු කළේ එලෙස තිබුණු තත්ත්වයන් මත බවත් ඊට අමතරව මේ ස්ථානයේ යම් යම් තැන් වල ශරීර කොටස් නිරීක්ෂණය කල බවත් මෙම බෝම්බය පිපිරූ බවට සැක කරන හාබර්කෝට් නමැති අවන්හල් කොටසේ කෙළවර කුළුණු ආසන්නයේ කුළුණු ඒ, බී, සී, ඩී වශයෙන් සලකුණු කල බවත් ඒ සහ බී කියන කුළුණු දෙක අතරේ විශාල වශයෙන් රුධිරය නිරීක්ෂණය කල බවත් ඒ තිබුණු කුළුණු වල යමක් වැදිලා හිල් වුනු ආකාරයේ සලකුණු සහ එතන පොළොවේ තිබුණු ටයිල් කැඩි ආවාට වගේ සෑදුනු ස්ථාන කීපයක් තිබුණ බවත් එම ස්ථානය x ලෙස සලකුණු කල බවත්, x ලෙස සලකුණු කළේ බෝම්බය පිපිරුණු බවට සැක කරන ස්ථානය බවත්ය. එසේම ශරීර කොටස් ඒ සහ බී ලෙස ලකුණු කල කුළුණ ආසන්නයේ වැඩි වශයෙන් තිබුණ බවත්. තමා පිළිවෙලින් ඒවා අංක එකේ සිට 12 දක්වා සලකුණු කල බවත්, ඒ ශරීර කොටස් ඡායාරූප ගත කිරීමෙන් අනතුරුව පෙරහන් කඩදාසි වලට රුධිර සාම්පල් ලබා ගත් බවත් එසේම x කියන ස්ථානය අවට ගෝලාකාර ලෝහ කැබලි ඒ අවට තිබුණ ඒවා පරීක්ෂාවකට ලක් කර තම භාරයට ගත් බවත් එලෙස ගෝලාකාර ලෝහ කැබලි 20ක් සහ අග වෘතාකාර යකඩ කම්බියක්ද භාරගත් බවත් ඊට අමතරව අරාබි අක්ෂර සහිත අත් පොතක් සහ අරාබි සහ ඉංග්‍රීසි අක්ෂර සහිත අත් පොතක් යන භාණ්ඩ තමාගේ භාරයට ගත් බවත් තමා මෙම ස්ථානයේ නිරීක්ෂණයන් කරමින් රැඳී සිටින විට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ රජයේ රස

පරීක්ෂක වැලිඅංග මහතා පැමිණි බවත් සහකාර රස පරීක්ෂක ප්‍රනාන්දු මහතා සහ සහකාර රස පරීක්ෂක ඒ. ඩී. එස් ධර්මරත්න මහත්මිය සිටි බවත්, එම දවසේ කටයුතු කළ යුතු ආකාරය ගැන වැලිඅංග මහත්මයා යම් උපදෙසක් ලබා දුන් බවත්, ඔවුන් 22 වෙනි දිනත් ස්ථාන පරීක්ෂාව සඳහා පැමිණෙන හෙයින් එතෙක් ස්ථානය ආරක්ෂා කරන ලෙසට දැනුම් දුන් බවත්, ඒ ස්ථානයේ ඒ අවස්ථාවේ ආරක්ෂාවට යෙදී සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක සාගර ලියනගේ මහතාට තමා ඒ බව දැනුම් දුන්න බවත්, තමා නැවත ස්ථානයට ගියායින් පසු නඩු භාන්ඩ දේපල කුවිතාන්සි වලට ඇතුළත් කිරීමක් සිද්ධ කළ බවත් 2019.04.21 වෙනි දිනට අදාලව පළවෙනි දේපල කුවිතාන්සිය එනම් පී.ආර් 29/2009 පැ.1076 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

දේපල කුවිතාන්සි අංක 29/19ට ගෝලාකාර ලෝහ කැබලි 20ක් සහ අර්ධ වෘත්තාකාර යකඩ කම්බියක් ඇතුළත් කල බවත් දෙවැනි දේපල කුවිතාන්සිය PR 30/2019 පැ. 1077 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

එසේම පැ.1078 දේපල කුවිතාන්සි අංක 31/2019 යටතේ අංක 01 සිට අංක 12 දක්වා සලකුණු කරන ලද ශරීර කොටස් වලින් ලබා ගන්නා ලද රුධිර සාම්පල් 12ක් භාර දීලා තිබෙන බවත් මෙලෙස සඳහන් කරන ලද දේපල කුවිතාන්සි තුනම නඩු බඩු භාර පොලිස් පරීක්ෂක ආරියරත්න

නිලධාරියාට ඒ පිළිබඳව සටහනක් තබලා භාර දුන් බවත් පොලිස් පරීක්ෂක ආරියරත්න එම භාණ්ඩ භාර ගත් බවට තව සටහනක් තබලා තිබෙන බවත් පවසා ඇත.

2019.04.22 වෙනි දින නැවතත් පොලිස් පරීක්ෂක 37134 මෙත්තානන්ද, පොලිස් කොස්තාපල් 70165 එරංග නිලධාරියා සමග මේ අපරාධ ස්ථානයට ගිහිල්ලා තිබෙන බවත් එදින ද කලින් දින ලෙසම කැමරාවද අපරාධ ස්ථාන පරීක්ෂණ කට්ටලය සහ අපරාධ සටහන් පොත් අපරාධ සටහන් පොත් රැගෙන 9.15 ට පමණ අපරාධ ස්ථානයට ගිය බවත්, ඒ අවස්ථාවේදී අපරාධ ස්ථානය තවදුරටත් ආරක්ෂා පටි යොදා ආරක්ෂා කිරීමක් සිදු කරලා තිබුණ බවත් ඒ අවස්ථාවේදී එම ස්ථානයේ ආරක්ෂාවට පොලිස් පරීක්ෂක ලලන්ත නිලධාරියා, පොලිස් කොස්තාපල් 88266 නිලධාරියා. පොලිස් කොස්තාපල් 91902 ගෞතම නිලධාරියා සහ පොලිස් කොස්තාපල් 83735 ප්‍රදීප් නිලධාරියා සිටි බවත් පවසා ඇත.

එමෙන් ම සැකකරු බෝම්බකරු රැඳී සිටියා යැයි කියනු ලබන සැක කරනු ලබන අටවන මහලේ 819 කියන කාමරය පරික්ෂාවට ලක් කල බවත් ඒ කාමරය පිළිබඳව දීර්ඝ සම්පූර්ණ සටහන් යොදාගෙන තිබෙන බවත් එම කාමරයට ඇතුල් වන විට වම් පැත්තේ නාන කාමරය පිහිටා තිබුණ බවත්, එහි දොරෙන් ඇතුල් වන විට දකුණු පැත්තේ සෝදන බේසම, සින්ක් එක සවි කරලා තිබුණ බවත්, ඒ කොන්ක්‍රීට් එක මත

වීදුරුවක් තිබුණ බවත්, ඒ තුල සුදු පාට දත් බුරුසුවක් තිබුණ බවත් එය අංක 14 ලෙස සලකුණු කර ඡායාරූප ගැනීමෙන් අනතුරුව තමාගේ භාරයට ගත්ත බවත්, ඒ වගේම එම කාමරයේ තිබුණු ඇඳ මත තිබුණු සුදු ඇඳ ඇතිරිල්ල උඩ තව ගුලි කරලා ඔතන ලද සුදු බෙඩ් ෂීට් එකක් තිබුණ බවත් එම පොරවනයේ කහ පාටට හුරු ලී පනාවක් තිබුණ බවත් තමා එය අංක 15 සලකුණු කරලා ඡායාරූප ගැනීමෙන් අනතුරුව තමාගේ භාරයට ගත් බවත් එම පොරවනයේ තවදුරටත් පරීක්ෂා කිරීමේදී රෝම කූප හතරක් තිබුන බවත් එය අංක 16 ලෙස සලකුණු කර ඡායාරූප ගැනීමෙන් අනතුරුව තමාගේ භාරයට ගත් බවත් 819 කාමරය පිළිබඳව දළ සැලැස්මක් ද පිළියෙල කල බවත් මෙම දිනයේ නැවතත් x යන අපරාධ ස්ථානය පරීක්ෂාවට ලක් කර එම ස්ථානයේ තිබී ගෝලාකාර ලෝහ කැබලි 33 සහ ඒ වයර් කොටස් තමාගේ භාරයට ගෙන තිබෙන බවත් නිල් පාට හා අළු පාට අළු හා කළු පැහැති ගමන් බෑගයක කර පටි දෙකක් හා රෙදි පටි කැබැල්ලක් බාරයට ගත් බවත් එම දිනයේ තමා පරීක්ෂා කටයුතු සිදු කරද්දී රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතා සහකාර රජයේ රස පරීක්ෂක රත්නායක මහතා පැමිණි එම මහත්වරුනුත් එම ස්ථානය පරීක්ෂා කර නැවත ස්ථානය පරීක්ෂාවට එනතුරු ස්ථානය ආරක්ෂා කරන ලෙසට පොලිස් පරීක්ෂක සූරිය කුමාර මහතාට දැනුම් දුන්නා බවත් තම භාරයට ගන්නා ලද 14, 15 සහ 16 අංක යොදන ලද භාණ්ඩ, දේපල

කුවිතාන්සි පත් අංක 33/2019 යටතේ ඇතුළත් කරලා භාර දී තියෙන බවත් එම දිනයේ පරීක්ෂා කිරීමේදී කළු පාට සුදු ලේස් සහිත දකුණු කකුලේ සපත්තුවක් සහ තවත් සපත්තුවක් භාරයට අරන් තිබෙන බවත් නැවත කොළඹ මධ්‍යම අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට ගිය පසු එම භාණ්ඩ දේපල කුවිතාන්සියේ අංක 36/19 යටතේ භාරදීමට කටයුතු කරන ලද බව පවසා 36/ 2019 දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1082 වශයෙන් සලකුණු කර ඉදිරි පත් කර ඇත.

23 වෙනිදා ට පසුව 24 වෙනිදා නැවත අපරාධ ස්ථානයට ගිය බවත් එදින වන විට සුන්බුන් ඉවත් කිරීම යම් ආකාරයකින් සිදුවෙලා තිබුණ බවත් එදින යම් යම් භාණ්ඩ තමාගේ භාරයට ගත්තේ නැති බවත් වෙනත් නිලධාරියෙක් සොයා ගත්ත මුදල් පසුම්බියක් කිංග්ස්බරි හෝටලයේ කළමනාකාර මහතාට භාර දුන් බවත් එම මුදල් පසුම්බියේ අයිතිකාර පුද්ගලයා පිළිබඳව අනන්‍යතාවය හෙලිදරව් වෙන තොරතුරු ඇතුලත් රියදුරු බලපත්‍රයක් තිබුණ බවත් ඒ අනුව එය කළමනාකරුට භාරදීමට තීරණය කල බවත් පවසා ඇති අතර එදින තමා විසින් වෙනත් නඩු භාණ්ඩ කිසිවක් සොයා ගත්තේ නැති බවත් පවසා ඇත.

2019.04.26 දිනද තමා නැවතත් එම ස්ථානය පරීක්ෂාව සඳහා ගිය බවත්, එදිනද රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතා එම ස්ථානයේ සිටි

බවත්, එම මහතාගේ උපදෙස් මත බෝම්බය පිපිරුනු හාබර්කෝට් නැමැති කොටසෙහි භාණ්ඩ සහ සුන්බුන් ඉවත් කිරීම කරන ලද බවත්, එම ස්ථානයේ තිබී ගෝලාකාර යමක් කා වැදී තිබූ ඇළුමිනියම් කොටසක්ද, කොළ පාට පටියක් වැනි රෙදි කැබැල්ලක්ද සොයා ගත් බවත් එම අවස්ථාව වන විට රජයේ සහකාර රස පරීක්ෂක බණ්ඩාර මහතා සහ අජිත් මහතාද පැමිණ සිටි බවටත් ඇය පවසා ඇති අතර, තමා විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ වැඩිදුර පරීක්ෂණය සඳහා රජයේ රස පරීක්ෂක නිලධාරීන් විසින් බාර ගත් බවත්, සාක්ෂිකාරිය පවසා ඇත. එම ස්ථානයේ තිබී අංක PE 0605187 දරන විදේශ ගමන් බලපත්‍රය සොයා ගත් බවත්, එසේම කළුපාටට හුරු මෙමරි කාඩ්පතක්ද සොයා ගත් බවත් පවසා තමා විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ සියල්ලෙන් තමා භාරයේ තිබුනු නඩු භාණ්ඩ කොළඹ මධ්‍යම අපරාධ කොට්ඨාෂයට ගෙන ගොස් පොලිස් පරීක්ෂක උපුල් ආරියරත්න මහතාට බාර දී, දේපල කුවිතාන්සි අංක 39/19/40/41 යටතේ බාර දීම් සිදු කරන ලද බවත් පවසා අදාළ දේපල කුවිතාන්සි පත් අධිකරණයේදී හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇති අතර, ඒවා පිළිවෙලින් පැ.1083, පැ.1084, පැ.1085, ආදී ලෙසින් ලකුණු කිරීමක් කර ඇත.

තමා 2019.04.28, 2019.04.29 සහ 2019.04.30 දින වලද යළිත් කිංග්ස්බරි හෝටලයෙහි අදාළ බෝම්බය පිපිරුනු ස්ථානයට ගිය බවත්, එම

දිනයේදීද කාර්ය මණ්ඩලය විසින් සුන්බුන් ඉවත් කිරීම සිදු කල බවත්, එදිනයන්හි තමා විසින් නඩු භාණ්ඩ බාර ගැනීමක් සිදු කර නැති බවත් පවසා ඇත. කෙසේ වුවත් 2019.05.01 දිනද තමා යළිත් එම අපරාධ ස්ථානය පරික්ෂා කිරීම සඳහා ගිය බවත්, ඒ වන විටත් එම ස්ථානය පොලිස් නිලධාරීන් විසින් ආරක්ෂා කරමින් සිටි බවත්, එදින තමා නිලධාරීන් කණ්ඩායම සමඟ එම ස්ථානය පරික්ෂා කිරීමේදී ගෝලාකාර ලෝහ කැබැලි 35 ක් සොයා ගත් බවත් පවසා ඇත. එසේම එදින ඊයම් වැනි කොටස් 6 ක් හා රෙදි කැබැල්ලක් අඩංගු ඉටි කවරයක් සොයා ගත් බවත්, එසේම ග්‍රිල් රෙස්ටොරන්ට් නැමැති කොටසේ තිබී 0771087725 අංකය සඳහන් සුදු පාට ප්ලාස්ටික් සිම් රඳවනයක් තිබී සොයා ගත් බවත්, පවසා තමා එම නඩු භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 43/2019 ට ඇතුළත් කරන ලද බව පවසා එම දේපල කුවිතාන්සිය පැ.1087 ලෙසද ලකුණු කර ඇති අතර, එසේම එම අපරාධ ස්ථානයෙහි දළ සැලැස්මක් සූදානම් කරන ලද බවත් පවසා පිටු 11 කින් යුතු දළ සැලැස්ම පැ.1088 ලෙස ලකුණු කර ඇත. එසේම නිසිපරිදි රස පරික්ෂක දෙපාර්තමේන්තුවේ මුද්‍රා සහිත පාර්සලයක් විවෘත කර ඒ තුළ තිබූ අර්ධ වෘතාකාර යකඩ කම්බිය තමා විසින් සොයා ගත් නඩු භාණ්ඩයක් ලෙස ඇය හඳුනාගෙන ඇති අතර, එසේම ඒ තුල තිබූ ලෝහ කැබැලි 20 ක්ද තමා විසින් සොයා ගත් බවට ඇය හඳුනා ගෙන ඇති අතර, එසේම තවත් කවරයක් තුළ තිබූ ලෝහ

කැබැලි 35 ක්ද තමා විසින් සොයා ගත් නඩු භාණ්ඩ බවට සොයා ගෙන ඇති අතර, එසේම එම පාර්සලය තුළ තිබූ වයර් කොටස් සහ සුන්බුන් ද තමා විසින් සෙයා ගත් නඩු භාණ්ඩයක් ලෙස හඳුනා ගෙන එයද සාක්ෂිකාරිය හඳුනා ගෙන ඇත. එසේම අපරාධ ස්ථානයේ තිබූ කළුපාට අඩිය සහිත සුදු ADIDAS සපත්තුවද තමා විසින් සොයා ගත් නඩු භාණ්ඩයක් බවට හඳුනා ගෙන එය පැ.1092(A) ලෙස ලකුණු කර ඇති අතර. එසේම තවත් ලිපිකවරයක් තුළ තිබෙන සුදුපාට අඩියක් තිබෙන කළුපාට සපත්තුවක්ද සාක්ෂිකාරිය හඳුනා ගෙන එය පැ. 1093(A) ලෙස ලකුණු කර ඇත. එසේම බෝම්බය පිපිරුනු බවට සැක කරන ස්ථානයේ තිබූ දැවුනු සුන්බුන් සහිත කවරයක තිබූ නඩු භාණ්ඩ හඳුනා ගෙන ඒවා තමා විසින් සොයා ගත් නඩු භාණ්ඩ බවට හඳුනා ගෙන ඒවා පැ1094(A) ලෙසට හඳුනා ගෙන ඇත. එසේම තවත් කවරයක් තුළ තිබූ ලෝහ කැබැලි 35 ක්ද හඳුනා ගෙන ඒවා තමා විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ ලෙසට හඳුනාගෙන ඒවා 1095(A) ලෙසට ලකුණු කර ඇත. එසේම තමා විසින් සොයා ගත් ඊයම් වැනි කොටසක් 6 ක් සහ රෙදි කැබැල්ලක් හඳුනාගෙන ඒවා පැ.1096(A) ලෙස ලකුණු කර ඇත. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය අධිකරණයේ දමිල භාෂා පරිවර්තක මහතා මගින් මෙම නඩුවේ සියළුම චූදිතයින්ට විස්තරාත්මවක පහදා දෙන ලද අතර, සියළුම චූදිතයින්

වෙනුවෙන් දන්වා සිටින ලද්දේ මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න කිසිවක් ඇසීමට නොමැති බවයි.

විශ්ලේෂණය

මෙම පැ. සා. 1726 විශ්‍රාමික කාන්තා පොලිස් පරීක්ෂකවරියගේ සාක්ෂියට අනුව ඇය කොළඹ මධ්‍යම කොට්ඨාෂයේ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරිනියක් ලෙස කටයුතු කරමින් සිටියදී 2019.04.21 වන දින කොළඹ කිංග්ස්බරි හෝටලයේ සිදු වූ ස්වයංඝාතක බෝම්බ පිපිරීමට අදාළව අපරාධ ස්ථානය ඇය නිලධාරීන් කණ්ඩායමක් සමඟ ගොස් එදිනම පරීක්ෂා කර ඇති අතර, අපරාධ ස්ථානයෙහි දළ සැලැස්මක්ද ඇඳ ඇති අතර, එකී පිටු 11 කින් යුතු දළ සැලැස්ම පැ.1088 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. ඇය විසින් අපරාධ ස්ථානයේ තිබී සොයා ගනු ලැබූ ලෝහ කැබැලි, ලෝහ ගෝල, කම්බි කොටස්, රෙදි කැබැලි ආදී සියල්ල සම්බන්ධයෙන් ඇය විස්තරාත්මක සාක්ෂි ලබා දී ඇති අතර, එසේම එම අපරාධ ස්ථානයේ තිබූ ද්‍රව්‍ය, මනුෂ්‍ය කොටස් ආදීය රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින්ද පරීක්ෂාවට ලක් කර ඔවුන්ගේ භාරයට ගෙන ඇති බව ඇයගේ සාක්ෂියෙන් හෙළි වේ. එසේම රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතා සහ සහකාර රස පරීක්ෂක ප්‍රනාන්දු මහතා ඇතුළු නිලධාරී කණ්ඩායමක්ද අපරාධ ස්ථානය පරීක්ෂා කර නඩු භාණ්ඩ සොයා

ගෙන ඇති බවට මෙම නිලධාරිනියගේ සාක්ෂියෙන්ද හෙළි වේ. තවද කිංග්ස්බරි හෝටලයේ 08 වන මහලෙහි 819 දරන කාමරයෙහි ස්වයංඝාතක බෝම්බකරු රැඳී සිටි ඇති බවට ඇයගේ විමර්ශනයෙන්ද හෙලි වී ඇති අතර, එම කාමරය තුළ තිබී ස්වයංඝාතක බෝම්බකරුට අයත් යැයි අනුමාන කරන සුදු පැහැති දත් බුරුසුවක්ද එසේම කහපාටට හුරු ලී පනාවක්ද ඇද මත තිබූ රෝම කූප ආදියද නඩු භාණ්ඩ ලෙස ගෙන ඇති බව ඇයගේ සාක්ෂිය තුළින් පෙනී යයි. එසේම ඇයගේ සාක්ෂියට අනුව නිල් පාට හා කළුපාට, අළු හා කළු පැහැති ගමන් බෑගයක කරපටි දෙකක් හා රෙදි කැබැලි දෙකක්ද සොයා ගෙන ඇති බවට ඇයගේ සාක්ෂියෙන් හෙළි වන අතර, ඒවාද රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක් වී ඇති අතර, ඒවා සියල්ල නඩු භාණ්ඩ ලෙස ගෙන ඇති බව ඇයගේ සාක්ෂියෙන් හෙළි වේ.

මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීම සඳහා අවස්ථාව සියළුම චූදිතයන්ට ලබා දුන් අතර, කිසිදු චූදිතයෙක් විසින් හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැති බැවින්. ඇයගේ සාක්ෂිය අවිවාදිතව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත. ඇයගේ සාක්ෂියේදී සඳහන් කරන ලද පරිදි අපරාධ ස්ථානයේ තිබී සොයා ගෙන ඇති නඩු භාණ්ඩ වන යකඩ බෝල කැබැලි, යකඩ බෝල, ලෝහ කැබැලි, වයර් කැබැලි, නිල් පාට හා කළුපාට, අළු හා කළු පැහැති ගමන් බෑගයක කරපටි දෙකක් හා රෙදි කැබැලි දෙකක් ඇතුළු

නඩු භාණ්ඩ සම්බන්ධයෙන් එකී දේපල පරීක්ෂාවට ලක් කර ඇති රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සාක්ෂි ඇසුරින් තවදුරටත් විශ්ලේෂණය කිරීම කළ යුතු වේ.

ස්වයංඝාතක බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව

පැමිණිල්ලේ සාක්ෂි අංක 1501 අධිකරණ වෛද්‍ය නිලධාරී, මහ රෝහල ගම්පහ. මොහොමඩ් නිසාර් රුහුල් හක් මහතා සාක්ෂි දෙමින්, තමා විශේෂඥ අධිකරණ වෛද්‍යවරයෙක් හැටියට ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, එසේම වසර 26ක කාලය තුළ පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වා ඒ සම්බන්ධයෙන් වාර්තා නිකුත් කර ඇති බවත්, ඒ අතර බෝම්බ පිපිරීම්වලින් තුවාල ලැබූ සහ ගිනි අවිවලින් තුවාල ලැබූ පුද්ගලයන්ගේ තුවාල ලැබූ සහ මියගිය පුද්ගලයන් සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ ද ඇතුලත් වන බවත් කියා සිටින ලදී.

සාක්ෂිකරු විසින් සිය සාක්ෂියේදී පිපිරුම් වර්ග කීපයක්ම ඇති බවත් මිකැනිකල් පිපිරුම් උදාහරණයක් ලෙස වාහනයක ටයරයක්, පිපිරීම, විද්‍යුත් පිපිරුම්, අධිපීඩන පිපිරුම් සහ අවපීඩන පිපිරුම් රසායනික ද්‍රව්‍ය වල ක්‍රියාකාරිත්වය නිසා ඇති වන පිපිරුම් එනම් බෝම්බ සහ අමතරව පරමාණුක සහ හයිඩ්‍රජන් වැනි පරමාණුක ශක්තියට අදාළ වන පිපිරුම් ද ලෙස වර්ග කළ හැකි බව ද කියා සිටින ලදී. එසේම බෝම්බ පිපිරීමකදී ඉතා කෙටි කාලයක් තුළ විශාල ශක්ති ප්‍රභේද ගණනාවක් පරිසරයට

නිදහස් වන බවත්, ඒ අතර ආලෝකය, ශබ්දය, අධික පිපිරුම් පීඩන බලයක් සහ විශාල උෂ්ණත්වයක්, ඒ අවට ඇති වන බවත් කියා සිටින ලදී.

වැඩිදුරටත් සාක්ෂිදුන් සාක්ෂිකරු, අධිපීඩන නිදහස් වීම යන සංසිද්ධියට අයත් වන ප්‍රදේශයේ තිබෙන සිරුරක් හෝ වස්තුවක් කුඩා කැබලි වලට බිඳී අතුරුදහන් (Fragmentation & Disappear) වන බවත් කියා සිටි සාක්ෂිකරු, එම ස්ථානයේ පුද්ගලයෙක් සිටියේ නම් එම පුද්ගලයාවද, කුඩා කැබලි වලට පත්ව විසිරී අතුරුදහන් වන බවත් කියා සිටින ලදි. එසේම යම්කිසි පුද්ගලයෙක් ඔහුගේ හිස මත බෝම්බයක් දරාගෙන සිටියොත් ඔහුගේ හිස නැති වී කඳ පමණක්ද, යම් අයෙක් උදරය වටා යම්කිසි බෝම්බ බැඳ ගෙන පිපිරීමක් සිදුකළහොත් එම අවස්ථාවේදි ඔහුගේ සිරුර දෙකඩ වන බවත් පාසැල් බෑගයක් දරාගන්නා ලෙස පිටේ බෝම්බයක් බැදගෙන සිට පුපුරුවා හැරියහොත් ඔහුගේ උදරය සහ පපුව කියන ප්‍රදේශ සම්පූර්ණයෙන්ම විනාශ වී හිස, අත්, දෙපා ඉතුරු වන අතර හිස ඉහළට ද, දෑත් දෙපසට ද විසි වන අතර පාද පොළව මත වේගයෙන් පතිත වීමක් සිදු වන බව කියා සිටින ලදි.

වර්ෂ 2019 අප්‍රේල් 21 වන දින එනම්, පාස්කු ප්‍රහාරය සිදු වූ ඉරු දින තමා කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සේවය කළ බවත් එදින සිදු වූ බෝම්බ ප්‍රහාරය නිසා මෘත දේහයන් විශාල ප්‍රමාණයක් අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත රැගෙන එමින් තිබූ බවත් ඒ අනුව ඒවා හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලද අතර ඒ අනුව

එම මිනිස් සිරුරුවල හඳුනාගත හැකි කොටස් එම කොටසට අදාළ තුවාල සටහන් කරගන්නා ලද අතර X කිරණ පරීක්ෂාවට ලක් කර බවත් ඒ සෑම කොටසකම අනු අංකයක්ද, එක් බහාලුමක කොටස් කිහිපයක් තිබුනහොත් ඒවාට වෙන් වෙන්ව අනු අංකද ලබා දෙමින් සියලුම ශරීර කොටස් අංකගත කොට වාර්තාගත කළ අතර ඥාතීන්ට පෙන්වා හඳුනාගැනීමට අවශ්‍ය වන පරිදි ඒවා ඡායාරූපගත කළ බවද කියා සිටින ලදි.

මුල් අවස්ථාවේ ඡායාරූපවලින් ද දෙවන පියවර ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව එම ඥාතියාට ලබාදෙනු ලබන ලේඛනය සමඟ මහේස්ත්‍රාත්වරයා සහ අධිකරණ වෛද්‍යවරයා ඉදිරියේ මෘත දේහය සෘජුව නිරීක්ෂණය කිරීමට ලබාදී මෘත දේහය ධනාත්මකව හඳුනාගනු ලැබීම සිදුකරන බවත් කියා සිටින ලදී.

අධිකරණය සතුව තිබෙන C7 ලෙස සඳහන් නඩු භාණ්ඩ පාර්සලය තුළ ඡායාරූප අන්තර්ගත සී.ඩී. තැටිය පැ.1479 වශයෙන් සළකුණු කර එහි තිබූ DSC_1516.JPG දරණ ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වන ලද අතර, එහි ඡායාරූපයෙන් පෙන්නුම් කරන්නේ සිරුරක කොටස් බවත්, එහි දකුණු පහළ බාහුව වම් පහළ බාහුව, හිසක් සහ අතක යැයි සැළකිය හැකි කොටස් ඉටි කොළයක් මත තබා තිබෙන බව නිරීක්ෂණය වන බව කියා සිටින ලදී. එම ඡායාරූපය පැ.1480 වශයෙන් සළකුණු කරන ලදී.

සාක්ෂිකරුට කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 13099/19 දරණ නඩු වාර්තාවට අමුණා ඇති පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පෙන්වා සිටින ලද අතර එකී පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ. 1478 වශයෙන් ලෙසට සලකුණු කරමින් එය මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් යන පුද්ගලයාගේ මරණ පරීක්ෂණ වාර්තාව බවටත් එයට අදාළ DNA වාර්තාව වන පැ. 933 ද හඳුනාගන්නා ලදි. එම මරණ පරීක්ෂණ වාර්තාවේ මරණයට හේතුව වශයෙන් බෝම්බ පිපිරීමකින් හිස, ගෙල, උදර සහ පපුවට සිදු වූ බහුවිධ මරණීය තුවාල හේතුවෙන් මෙම මරණය සිදු වී ඇති බවට තමා තීරණය කළ බවත් කියා සිටින ලද සාක්ෂිකරු එම මළ සිරුරෙහි හිස කොටස, මුහුණ ප්‍රදේශය මියගිය තැනැත්තාගේ බිරිඳ විසින් හඳුනාගෙන තිබූ බවත් එහි එම මෘත ශරීරයට අදාළ හිස, පහළ ගාත්‍රා පමණක් ඉතිරිව තිබූ අතර ඒ අනුව පිපිරීම සිදු වන අවස්ථාවේදී සිරුර සහ බෝම්බය ඉතාමත්ම සමීපව ශරීරයට ස්පර්ශව තිබී ඇති බවට තමාගේ නිගමනය බවත් මේ පුද්ගලයාගේ හිස කොටස හඳුනාගත හැකි මට්ටමේ නිරූපද්‍රිතව තිබූ බැවින් මියගිය අයගේ බිරිඳ A.K.F.හාදියා නැමැති අය විසින් හඳුනාගත් බවත් තවත් කොටස් තුනක DNA සාම්පල එකිනෙකට සැසඳුන බවත්, මියගිය පුද්ගලයාගේ බිරිඳගේ සහ දරුවා ගේ DNA පරීක්ෂණ සිදු කර මාතෘත්වය පිතෘත්වය නිවැරදිව DNA මඟින් තහවුරු කරගත් බවත් ඒ අනුව මියගිය පුද්ගලයා නිශ්චිතව මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් නැමැති වයස අවුරුදු 33 පිරිමි

පුද්ගලයා බව තහවුරු කරගෙන ඇති බවත් සාක්ෂිකරු විසින් කියා සිටින ලදී.

එසේම මෙම බෝම්බය මෙම පුද්ගලයාට ස්පර්ශව තිබිය යුතු බවත්, එය සිය වාර්තාවේ Comments යටතේ 03 වෙනි අංකය යටතේ හිස කඳෙන් බලයකින් වෙන්වීමේ ක්‍රියාවලිය සිදු වී ඇත්තේ සිරුර සහ බෝම්බය ඉතාමත්ම සමීපව ශරීරයට ස්පර්ශ මට්ටමේ තිබීම හේතුකොටගෙන බව සඳහන් කර ඇති බවත් ඔහු කියා සිටින ලදී. එම පුද්ගලයා යම් හෙයකින් පිටේ බෝම්බයක් බැඳගෙන එය පුපුරවා හැරිය බවට උපකල්පනය කළොත් එවැනි අවස්ථාවකදී මෙම ආකාරයේ ලක්ෂණ දැකිය හැකිබවත් කියා සිටින ලදී.

අධිකරණයේදී ලකුණු කරන ලද පැ. 1478 දරණ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අමතරව වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා විසින් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවක් හෝ වේවා. සම්බන්ධයෙන් ද සාක්ෂි දුන් සාක්ෂිකරු, එම වාර්තාවෙහි ඇති කරුණු තමා අධ්‍යයනය කළ බවත්, තමාගේ දැනුම සහ පළපුරුද්ද අනුව එම වෛද්‍ය වාර්තාවේ දක්වා තිබෙන කරුණු සමඟ තමා එකඟ වන බවත් කියා සිටිමින්, වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා විසින් සම්පාදනය කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව පැ.1481 ලෙස සලකුණු කරන ලදී. එම මියගිය පුද්ගලයාගේ අනන්‍යතාවය DNA

වාර්තාවක් මගින් සසඳා තහවුරු කරගෙන ඇති බවත්, නියමිත ක්‍රමවේදය යටතේ එම කටයුතු සිදුකර ඇති බවත් කියා සිටින ලදී.

එම වෛද්‍ය වාර්තාවට අනුව පරීක්ෂණය සඳහා ඉතුරු වී තිබෙන ශරීර කොටස් වශයෙන් පිරිමි පුද්ගලයෙකුගේ ගෙලෙහි 6 වන සහ 7 වන කශේරුකා මට්ටමෙන් වෙන්ව ගිය හිසක කොටසක් බවත්, එම හිසෙහි මුහුණ ප්‍රදේශයේ උඩු රැවුල සහ යටි රැවුල හොඳින් වැවී තිබෙන බවත්, හිස පිටුපස මෘදු පටකවල ගැලවී ගිය ධාරිත තුවාලත්, හිස් කබලේ අස්ථි රේඛීය භග්න ගණනාවකින් යුක්ත බවත්, මොළය විශාල ලෙස ධාරිත තුවාලවලට ලක්වී තිබෙන බවත්, නිකටේ සිට මුහුණේ 10 cmක පමණ ධාරිත තුවාලයක් තිබෙන බවත්, හිසේ දකුණු පැත්තේ 8cmක ධාරිත තුවාලයක් තිබෙන බවත්, මුහුණේ දෙපසම අස්ථි බිඳී ගොස් තිබෙන බවත්, උඩුතල්ලේ අස්ථිය මධ්‍ය ලක්ෂයෙන් බිඳීගොස් තිබෙන බවත්, යටි හනුවේ අස්ථිය මධ්‍ය රේඛාවෙන් බිඳී ගොස් තිබෙන බවටත්, මුඛය ක්‍රියාත්මක වන Temporomandibular Joint දෙපසම අස්ථි භග්න වී තිබෙන බවටත්, ගෙල ආශ්‍රිතව ශ්වාසනාලය, ගලනාලය සහ රුධිරනාල ඉරී සහ මාංශ පේශී ඉරී වෙන් වී තිබෙන බවටත් වෛද්‍ය මලින්ත ද සිල්වා මහතා නිරීක්ෂණය කර ඇති බවත් සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී. මරණයට හේතුව ලෙස Explosive injuries එසේ නැත්නම් පිපිරුම් තුවාල ලෙස සටහන් කර ඇති බවත් මෙය බෝම්බ පිපිරීමක් නිසා සිදු වූ මරණයක් ලෙස පැහැදිලිව කිව හැකි බවත්, එක්ස් කිරණ පරීක්ෂණ අනුව පිපිරීමකින් ද්වීතියිකව

තැන්පත් වූ යකඩ කොටස් හඳුනාගෙන ඇති අතර හිසෙහි, හිස් කබලේ පතුලට බලයක් යෙදී තිබෙන බවට මේ වාර්තා කියවීමෙන් තමාට පෙනී යන බවත්, ඒ අනුව බෝම්බය ගෙලට පහළ ශරීරයේ ඕනෑම ස්ථානයක ස්පර්ශ වෙමින් තිබිය යුතු බව සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී.

වාර්තාවට අනුව වෛද්‍ය එල්. එම්. ද සිල්වා මහතා විසින්, මොහොමඩ් අසාද් මොහොමද් මුබාරක් යන පුද්ගලයාගේ ශරීර කොටස් මාංෂ පේශි සහ අස්ථි කොටස් DNA පරීක්ෂණය සඳහා යොමු කර තිබෙන බවටත්, මෘදු පටක හා නිරාවරණය වූ අස්ථි කොටස් පුපුරන ද්‍රව්‍ය සංඝටක හඳුනා ගැනීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත යොමු කර තිබෙන බවත් වාර්තාවේ සඳහන්ව ඇති බවද සාක්ෂිකරු විසින් වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගේ විශේෂඥභාවය සහ නිපුණතාවය අධිකරණය ඉදිරියේ මතයක් ප්‍රකාශ කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් හබ කිරීමක් නොමැති අතර චූදිතයින් වෙනුවෙන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් ද සිදු නොකරන ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් ඔහු පාස්කු ප්‍රහාරයෙන් මියගිය සහ තුවාල ලැබූ පුද්ගලයන්ගේ වෛද්‍ය පරීක්ෂණ සහ මරණ පරීක්ෂණ වාර්තා සකස් කිරීමට මොහු දායක වී ඇති බවට සාක්ෂි දී ඇත.

මෙම සාක්ෂිකරු විසින්ම මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන්ගේ (සහරාන් හසීම්) බිරිඳ සහ දියණියගේ ඩී.එන්.ඒ. (DNA) වාර්තා සමඟ සසඳා අනන්‍යතාවය තහවුරු කරගැනීමෙන් පසු 2019.08.06 දින සහරාන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා ඇති අතර සහරාන්ගේ මරණය බෝම්බ පිපිරීමකින් හිස, ගෙල, උදරය සහ පපුවට සිදුවූ බහුවිධ මරණීය තුවාල නිසා සිදුවූවක් බවත්, බෝම්බය ශරීරයට ස්පර්ශ වන මට්ටමේ ඉතා සමීපව තිබී ඇති බවත් සාක්ෂි ලබා දී ඇත.

මීට අමතරව, දැනට විදේශගතව සිටින වෛද්‍ය මලින්ත ද සිල්වා විසින් සකසන ලද, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැති බෝම්බකරුගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව (T-148) සම්බන්ධයෙන්ද මොහු සාක්ෂි ලබා දී ඇත. එහිදී මුබාරක්ගේ අනන්‍යතාවය දියණියගේ හා බිරිඳගේ DNA මඟින් තහවුරු කරගෙන තිබූ අතර, මරණයට හේතුව පිපිරුම් තුවාල බවත්, බෝම්බය සහිත බෑගයක් පිටේ රඳවාගෙන සිටීමෙන් මෙවැනි තුවාල සිදුවිය හැකි බවත් ප්‍රකාශ කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් සිදුකර නොමැති බැවින් ඔහුගේ සාක්ෂිය අවිවාදිතව ඉදිරිපත්වී ඇත. ඔහුගේ සාක්ෂි මඟින් ශ්‍රෑංගිලා හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම් සිදුකරන ලද සහරාන් නැමැත්තාගේ සහ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් යන අයගේ අනන්‍යතාවය පිළිබඳව පැහැදිලි වෝහාරික සාක්ෂි ඉදිරිපත් වී ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැමිණිල්ලේ සාක්ෂි අංක 1820 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී මහින්ද ජයසුන්දර මහතාගේ සාක්ෂිය තුළින් හෙලි වන්නේ 2019 අප්‍රේල් 21 වන දින ඔහු ෂැන්ග්‍රිලා හෝටලයේ සිදු කළ විමර්ශනයේ දී සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කළ ඉන්ෂාෆ් අහමඩ් නැමැති ස්වයංඝාතක බෝම්බකරු 2019 අප්‍රේල් 17 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ කාමරයක් වෙන් කරවා ගැනීම සඳහා ABC 1019 දරන ත්‍රීරෝද රථයෙන් පැමිණ ඇති බව හෙලී වී ඇති අතර එම පුද්ගලයා එයට පෙර ටාජ් සමුද්‍රා හෝටලයට සහ පසුව කිංග්ස්බරි හෝටලයටද ගොස් ඇති බව මෙම සාක්ෂිකරුගේ විමර්ශනය තුළින් අනාවරණය වී ඇත.ඔහුගේ විමර්ශනයට අනුව ෂැන්ග්‍රිලා හෝටලයේ බෝම්බ පුපුරුවා ගත් ස්වයංඝාතක බෝම්බකරුවන් වන මොහොමඩ් ඊබ්‍රහීම් ඉල්හාම් මොහොමඩ් සහ සහරාන් හෂීම් යන අය 2019 අප්‍රේල් 20 වන දින හෝටලයට පැමිණ ඇති බව හෙලි වී ඇති අතර එසේම අප්‍රේල් 19 වන දිනද ඔවුන් හෝටලයේ ආපනශාලාව වෙත පැමිණ ඇති බව හෙලි වී ඇති අතර ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් නැමත්තා අප්‍රේල් 20 වන දින ෂැන්ග්‍රිලා හෝටලයෙන් පිටව ගල්කිස්ස ස්පෑන් ටවර් නැමැති ස්ථානය වෙත ගොස් රාත්‍රියේ නැවත හෝටලයට පැමිණ ඇති බවත් පැමිණ ඇති බව හෙලි වී ඇත.

කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීම.

කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සිදු වූ බෝම්බ පිපිරීමෙන් මරණයට පත් වූ පුද්ගලයන් 21 දෙනෙකු සම්බන්ධයෙන් චෝදනා අංක 6396 සිට 6920 දක්වා චෝදනා ගොනු කර ඇති අතර මෙහිදී සියලුම චූදිතයන්ට එරෙහිව; සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී දැනට මියගොස් සිටින මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් හෙවත් මොහොමඩ් ඊබ්‍රහිම් ඉන්ෂාෆ් අහමඩ් විසින් අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්වෙතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමේ වරද සිදු කළ බවද, එකී වරද සිදු කිරීමේ දී පහත නම් සඳහන් අයවලුන්ගේ මරණය සිදු කිරීමෙන් දැනට මියගොස් සිටින එකී මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් හෙවත් මොහොමඩ් ඊබ්‍රහිම් ඉන්ෂාෆ් අහමඩ්, 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා දැනට මියගොස් සිටින සෙසු සියලුම චූදිතයින් දැනට

මියගොස් සිටින මොහොමඩ් ඊබ්‍රහීම් ඉන්ෂාෆ් අහමඩ් හෙවත් මොහොමඩ් ඊබ්‍රහිම් ඉන්ෂාෆ් අහමඩ් ට අනුබල දීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවට චෝදනා කර ඇත. (17 වන චූදිත නඩු විභාගය අතරතුරදී මිය යන ලද බැවින් ඔහුගේ චෝදනා ඉවත් කරගන්නා ලදි)

<u>සිනමන් ග්‍රෑන්ඩ් තක්සේරු වාර්තාව</u>

පැ.සා.1152 මහින්ද නිහාල් ගුණවර්ධන යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු වරලත් ප්‍රමාණ සමීක්ෂකයෙකු ලෙස සේවය කරන තැනැත්තෙකු වන අතර ඔහුට ප්‍රමාණ පරීක්ෂකවරයෙක් ලෙස අවුරුදු 44 ක පළපුරුද්දක් තිබෙන තැනැත්තෙකු බව පවසා ඇති අතර ඔහුගේ දීර්ඝ කාලීන වෘත්තීමය පළපුරුද්ද සැලකිල්ලට ගෙන ඔහුගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද විත්තිය හබ නොකරන බවට පවසා ඇති අතර ඒ අනුව පෙර අවස්ථාවක පැ.108 සහ 108 (1) ලෙස ලකුණු කර ඇති මෙම සාක්ෂිකරු විසින් සකස් කර ඇති ලේඛන දෙකම විත්තිය හබ නොකිරීම යන කාරණය මත ඒවා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගත් කරුණක් ලෙස වාර්තා කර ඇත.

එම ලේඛන සර්වේස් ඉංජිනියර්ගේ වාර්තාව බවත් තමා ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා එය පාදක කරගත් බවට සඳහන් කර

ඇති අතර එම ලේඛනය ද විත්තිය විසින් හඹ නොකරන බවට පැවසීම මත එයද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇති අතර එම ලේඛනයද පැ.108 (2) ලෙස ලකුණු කර ඇත.

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළ පොලිස් සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 1869 ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික ජයලාල් කීර්ති ඉද්දමල්ගොඩ යන සාක්ෂිකරු සාක්ෂි දෙමින්, 2019.04.21 වන දින කොළඹ දකුණ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර ස්ථානාධිපතිව සේවය කරමින් සිටියදී පෙරවරු 10:00ට පමණ කොල්ලුපිටිය පොලිස් වසමේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බ පිපිරීමක් සිදුවූ බවට පණිවිඩයක් ලද බවත් ඒ අනුව තමා ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසාත්, පොලිස් සැරයන් සුනිල්, පොලිස් කොස්තාපල් ගමගේ සහ සුරංග යන නිලධාරීන් තමා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්‍රොබේන් අවන්හල වෙත ගිය බවත් කියා සිටින ලදී.

තමා යන විට එම අවන්හල සම්පූර්ණයෙන්ම විනාශයට පත්ව එහි සිවිලිම කැඩී බිමට වැටී පුටු මේස සියල්ල විනාශ වී පිහිණුම් තටාකයේ

දෙසට වූ වීදුරුව කඩාගෙන පිටතට විසිරී තිබූ බව නිරීක්ෂණය කළ බවත් තමා සමග ගිය කොං.කොං.23440 ගමගේට එම ස්ථානයේ ඡායාරූප ගන්නා ලෙසටත් ඉන් අනතුරුව තමා එම ස්ථානයේ තමා නිරීක්ෂණය කර වැඩිම හානියක් සිදුවූ සහ හානිය පැතිරී තිබුණු ආකාරය අනුව තමාට පෙනී ගිය බෝම්බය පිපිරීම සිදුවූ ස්ථානය අංක 01 ලෙසද, එම ස්ථානයේ තිබූ පිරිමි පුද්ගලයෙක්ගෙ හිස කොටස, දණ හිසෙන් පහළ පාද දෙක, වම් පාදය සහ දකුණු පාදය, එම පුද්ගලයාගේ විය හැකි කළු පැහැති සපත්තු දෙකක්, මෙම ප්‍රහාරය සඳහා යොදා ගත් උපකරණය රැගෙන ආ බෑගයේ කොටස් විය හැකි කොටස් ලෙසට තමාට නිරීක්ෂණය වූ ද්‍රව්‍ය ද, ඊට අමතරව එම උපකරණයේ තිබුණු බවට අනුමාන කළ හැකි, ප්‍රමාණයන් එක හා සමාන යකඩ බෝලද, එක් ස්ථානයකට එක්රැස් කර, පිරිමි පුද්ගලයකුගේ හිස කොටස අංක 02 ලෙසද, වම් පාදය අංක 03 ලෙස ද, දකුණු පාදය අංක 04 ලෙසද, වම් සපත්තුව අංක 05ලෙසද, බෑගයේ කොටස් අංක 06 ලෙසද, දකුණු සපත්තුව අංක 07ලෙසද සහ යකඩ බෝල 24ක් අංක 08 ලෙසද අංකනය කර තමා භාරයට ගත් බවත් කියා සිටින ලදී.

තමාත් රස පරීක්ෂක කාර්යාලයේ නිලධාරීන් සහ තවත් නිලධාරීන් එක්ව එම ස්ථානය පරීක්ෂා කළ අතර එම ස්ථානයට කොටුව මහේස්ත්‍රාත්තුමා පැමිණි බවත් කියා සිටින ලදී. ඉන් අනතුරුව තමා මෙම සිද්ධියට අදාළ බෝම්බකරු ඊට පෙරදින රැදී සිටියේ යැයි කියනු ලබන එම

හෝටලයේම 425 කාමරය පරීක්ෂාකර බැලූ බවත්, එහි තිබී පිරිමි පුද්ගලයෙකුගේ කලිසමක් හෝටලයෙන් ලබාගෙන තිබූ ඇදුම් මැසීමට ලබා ගන්නා ලද ඉදිකටු නූල් ආදිය ඇද මත තිබී හිසකෙස් සහ රෝමකූප වල සාම්පල් තමා ලබාගත් බවත් ඒවා අංක 10 ලෙස අංකනය කළ බවත් කියා සිටින ලදී. එසේම එහි මෙට්ටයේ රුධිරය වැනි සලකුණක් තිබුණ අතර එම ස්ථානය අංක 11 ලෙස නම් කර සාම්පලයක් ලබා ගත් බවද කියා සිටින ලදී. 2019.04.21 වන දින තමා විසින් ලබා ගන්නා ලද ඉහත අංක 05 සහ 07 අදාළ භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 52/19ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1176 ලෙසටත්, අංක 6 ස්ථානයෙන් ලබා ගත් භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 53/2019ට ඇතුළත් කළ බවත් කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1177 වශයෙන් ද අංක 10 සහ 11 ස්ථානවලින් ලබා ගන්නා ලද නඩු භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 54/19ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1178 වශයෙන්ද, සලකුණු කරන ලදී. තවද එම ස්ථානයේ අංක 02, 03, 04 ලෙසට විස්තර කරන ලද මිනිස් හිස, පාදයක කොටස් දෙක, වැඩි දුර පරීක්ෂණ සඳහා කොල්ලුපිටිය අපරාධ අංශ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිලන්තට භාරදුන් බවත් කියා සිටින ලද සාක්ෂිකරු ඔහුට පෙන්වන ලද පැ.85 සංයුක්ත තැටියේ ඇති DSC_209.JPG ඡායාරූපය හඳුනාගනිමින් එහි දැක්වෙන්නේ තමා අංක 01 වශයෙන් සලකුණු කළ

බෝම්බ පිපිරීම සිදුවූ ස්ථානය බව කියා සිටිමින් එම ඡායාරූපය පැ.85(10) වශයෙන් සලකුණු කරන ලදී.

පැ.85 සංයුක්ත තැටියේ ඇති DSC_0214.JPG ඡායාරූපය නිරීක්ෂණය කළ සාක්ෂිකරු එම ඡායාරූපය තැප්‍රොබේන් අවන්හලේ සිදු වූ බෝම්බ පිපිරීමට අදාළ බෝම්බය රැගෙන ආ පුද්ගලයා බව හඳුනා ගන්නා ලද අතර එම ඡායාරූපය පැ.85(11) ලෙස සලකුණු කරන ලදී.

පැ.85 සංයුක්ත තැටියේ ඇති DSC_0216.JPG ඡායාරූපය නිරීක්ෂණය කළ සාක්ෂිකරු එම ඡායාරූපය තමා අංක 03 ලෙස සලකුණු කළ ස්ථානය බවත් බෝම්බය රැගෙන ආ පුද්ගලයාගෙන් විය හැකි බවට සැක කරන පාද කොටස් 02 සොයා ගත් ස්ථානය බවට හඳුනාගනිමින් එම ඡායාරූපය පැ.85(12) වශයෙන් සලකුණු කරන ලදී.

පැ.85 සංයුක්ත තැටියේ ඇති DSC_0220.JPG ඡායාරූපය නිරීක්ෂණය කළ සාක්ෂිකරු එම ඡායාරූපය එය බෝම්බය රැගෙන ආ පුද්ගලයාගේ දකුණු පාදය ලෙස හඳුනා ගනිමින් එය පැ.85(13) ලෙස සළකුනු කරන ලදී. DSC_0182.JPG දරණ පැ.85 (9) ලෙස ලකුණු කරන ලද ඡායාරූපය හඳුනාගත් සාක්ෂිකරු එය බොම්බය රැගෙන ආ බෑගයේ කොටසක් බවත් එය අවන්හලට ආසන්නව තිබූ පොකුණේ තිබුණු බවටත් තමා හඳුනා ගන්නා බවත්, පැ.85(1) ලෙසට ලකුණු කරන ලද DSC_0301.JPG දරණ ඡායාරූපයෙ බෝම්බය රැගෙන පැමිණි පුද්ගලයාගේ හිස බවටත් හඳුනාගන්නා ලදී.

මෙයට අමතරව තමා විසින් වර්ෂ 2019.04.21, 22, 23, 24, 25, 26 සහ 2019.05.03 වන දිනවලදී ද තමා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය පරීක්ෂාවට ලක්කල බවත් පැ.85(10) ඡායාරූපය දිස්වන 2019.04.21 වන දින අංක 01 ලෙස සලකුණු කර ස්ථානයේ සහ අංක 09 දරන ස්ථානවලින් සුන්බුන් ඉවත් කළ පසු 2019.04.23 වන දින සාම්පල් ලබාගත් බවත් එම සාම්පල් දේපල කුවිතාන්සි අංක 62/2019ට ඇතුළත් කළ බවත් කියා සිටිමින් එකී දේපල කුවිතාන්සිය පැ.1179 වශයෙන් සලකුණු කරන ලදී.

2019.04.25 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙන් සොයා ගන්නා ලද ජංගම දුරකථන දෙකක් කොල්ලුපිටිය පොලිසියේ අපරාධ අංශයේ නිලධාරීන් වෙත භාරදුන් බවත් 2019.04.23 වන දින සොයාගත් ජංගම දුරකථන දෙකක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උ.කොා.පා හේමන්ත වෙත භාරදුන් බවත්, 2019.04.26 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බය පුපුරා ගිය ස්ථානයේ සිවිලිමට ඉහළ වායු සමීකරණ පද්ධතියේ පිටත ආවරණයෙන් අංක 9(A) වශයෙන් නම් කළ ස්ථානයෙන් සාම්පලයක්ද සුන්බුන් අතර තිබී සොයාගත් බෝම්බකරු ඇඳ සිටි ඇඳුමේ හෝ උපකරණය රැගෙන ආ බෑගයේ කොටසක් විය හැකි 9(B) වශයෙන් සලකුණු කරන ලද භාණ්ඩයක් ද භාරයට ගෙන දේපල කුවිතාන්සි අංක 73/2019ට ඇතුළත් කළ බව කියා සිටිමින්, එම දේපල කුවිතාන්සිය පැ.1180 ලෙසත්, 2019.05.03 දින පරීක්ෂාවේදී සොයා ගන්නා ලද යකඩ

කැබලි දෙකක් දේපල කුවිතාන්සි අංක 75/2019ට ඇතුළත් කළ බව කියා සිටිමින් එම දේපල කුවිතාන්සිය පැ.1181 වශයෙන් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව සාක්ෂිකරුට ඔහු විසින් සොයා ගන්නා ලද භාණ්ඩ පෙන්වා සිටින ලද අතර අංක 05 ස්ථානයෙන් ලබා ගත් වම් පාදයේ සපත්තුව පැ.96(1)(B) ලෙසද, අංක 08 ස්ථානයෙන් ලබා ගත් දකුණු පාදයේ සපත්තුව පැ.96(2)(B) වශයෙන්ද, අංක 10 ස්ථානයෙන් ලබා ගත් කෙස් ගස් සාම්පලය පැ.96(3)(B) ලෙසට ද, අංක 11 ස්ථානයෙන් ලබා ගන්නා ලද රුධිර සාම්පල අඩංගු කොටන් බඩ් කොටස පැ.96(4)(B) වශයෙන් ද හඳුනාගන්නා ලදී.

පැ.972(G) වශයෙන් සලකුණු කොට ඇති අංක 06 ලෙස සටහන් කළ පුපුරණ ද්‍රව්‍ය රැගෙන ආ බෑගයේ කොටස ලෙසද හඳුනාගත් සාක්ෂිකරු වශයෙන් ද, අංක 08 ස්ථානයෙන් ලබා ගන්නා ලද යකඩ බෝල්ල 24 පැ.872(J) වශයෙන් ද, අංක 09 ලෙස සලකුණු කරන ලද ස්ථානයෙන් ලබා ගත් පස් සාම්පලය පැ.872(L) වශයෙන් ද සලකුණු කරන ලදී.

පැ.85 සංයුක්ත තැටියේ ඇති DSC_5884.JPG ඡායාරූපය නිරීක්ෂණය කළ සාක්ෂිකරු එම ඡායාරූපය අංක 09 දරන පස් සාම්පලය ලබා ගත් ස්ථානයේ ඡායාරූපය බව කියා සිටිමින් එය පැ.85(14) වශයෙන් සලකුණු කරන ලදී.

බෝම්බය පුපුරා ගිය ස්ථානයේ සිවිලිමට ඉහළ වායු සමීකරණ පද්ධතියේ පිටත ආවරණයේ අංක 9(A) වශයෙන් නම් කළ ස්ථානයෙන් ලබාගත් සාම්පලය පැ.872(N) වශයෙන් සලකුණු කරන ලදී.

PR79/2019ට ඇතුළත් කරන ලද පිළිස්සී ගිය රෙදි කැබැල්ල පැ.872(Q) වශයෙන් ද, දේපල කුවිතාන්සි අංක 75/2019ට ඇතුළත් කරන ලද ලෝහ තහඩු කැබලි 02 පැ.872(T) වශයෙන් ද සලකුණු කරන ලද සාක්ෂිකරු පැ.872(T) හි දිනය සටහන් වී ඇත්තේ 2019.04.03 ලෙස වුවද එය 2019.05.03 ලෙසට නිවැරදි විය යුතු බවට කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරු කිසිවෙකු හරස් ප්‍රශ්නවලට භාජනය නොකරන ලදී.

<u>විශ්ලේෂණය</u>

බෝම්බකරු රැඳී සිටි සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ අංක 425 කාමරයෙන් හිසකෙස් හා රෝමකූප සාම්පල (අංක 10) සහ මෙට්ටයේ තිබූ රුධිරය වැනි පැල්ලමක සාම්පලයක් (අංක 11) ලබාගෙන ඇත. පසුව, බෝම්බය පුපුරා ගිය ස්ථානය සුන්බුන් ඉවත් කර පිරිසිදු කිරීමෙන් පසු සාම්පල (අංක 09), වායුසමීකරණ පද්ධතියේ පිටත ආවරණයේ සාම්පල (9A), ඇඳුමක හෝ බෑගයක කොටස් (9B) සහ 2019.05.03 දින අවන්හලේ තිබූ ලී කැබිනට්ටුවක රැඳී තිබූ යකඩ කැබලි දෙකක් භාරයට ගන්නා ගෙන ඇත.මෙම නඩු භාණ්ඩ දේපළ කුවිතාන්සි අංක 52/2019, 53/2019,

54/2019, 62/2019, 73/2019, සහ 75/2019 යටතේ උප පොලිස් පරීක්ෂක ජයරාජ් වෙත භාරදී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් සියළු චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න කිසිවක් ඇසීමක් කර නැත. ඒ අනුව මෙම සාක්ෂිය අවිවාදයෙන් යුතුව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත. කෙසේ වෙතත් මෙම සාක්ෂිකරු විසින් සොයාගෙන ඇති නඩු භාණ්ඩ රජයේ රස පරීක්ෂක වරයා වෙත විධිමත්ව යොමුකර ඇති බවට සනාථ වේ. ඒ අනුව රජයේ රසපරීක්ෂක වරයාගේ සාක්ෂිය සළකා බැලීම අප විසින් සිදුකල යුතුවේ. මෙම හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කරන ලද මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහමඩ් හෙවත් මොහොමඩ් ඊබ්‍රහිම් ඉන්ෂාෆ් අහමඩ් යන අයගේ අනන්‍යතාවය සනාථ කෙරෙන ඔහුගේ ජාතික හැඳුනුම්පත සහ විදේශ ගමන් බලපත්‍රය, අංක N 3560923 දරන විදේශ ගමන් බලපත්‍රයට අදාළ පරිගණක දත්ත ඇතුළු ලේඛන කිසිදු හඹ කිරීමකින් තොරව ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

සමස්ථයක් ලෙස මෙම හෝටලයෙහි බෝම්බ පිපිරීමට අදාළව පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සමස්ථ සාක්ෂි මඟින් 2019.04.21 දින ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කර ඇත්තේ, මොහොමඩ් ඉබ්‍රාහිම්

ඉන්සාෆ් අහමඩ් නැමැත්තාම විසින් බවට කිසිදු සැකයකින් තොරව සාක්ෂි ඉදිරිපත් වී ඇත.

පැ.සා. 1131 එළියාදුර නීල් පැට්සන් ද සොයිසා අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඔහු මේ වන විට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ආරක්ෂක අංශයේ ආරක්ෂක නිලධාරීයෙකු ලෙස කටයුතු කරන බවත් 2019 වසර වන විට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි CCTV අංශයෙහි විධායක ආරක්ෂක නිලධාරීයා ලෙස කටයුතු කල බවත් පවසා ඇති අතර, 2019 අප්‍රේල් 21 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සිදු වූ ස්වයංඝාතක බෝම්බ ප්‍රහාරයට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් CCTV දර්ශන ලබා ගෙන තිබීම සම්බන්ධයෙන් සාක්ෂි දීමට පැමිණි බවත් 2019.04.21 දින වන විට තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීයා ලෙස ක්ලිපඩ් අමුණුගම නමැති ආරක්ෂක අධ්‍යක්ෂකවරයා සේවය කළ බවත් තමන්ට අමතරව CCTV අංශයේ තවත් 5 දෙනෙකු සේවය කළ බවත් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ CCTV අංශය තුළ තමාට කාර්යාලයක්ද තිබුණ බවත් පවසා ඇත. 2019.04.21 දින වන විට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ CCTV කැමරා අංශයේ කැමරා 80 ක් සහ 405 ක් අතර ප්‍රමාණයක් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. 2019 අප්‍රේල් මාසය වන විට එම CCTV මෙහෙයුම් මැදිරියට ප්‍රවේශය සඳහා තමාට සහ තමා යටතේ සේවය කල පස් දෙනාට අවසර ලබා දී තිබුණ බවත් එසේම, ප්‍රධාන කළමණාකරුවෙකු වුවද හෝටලය ඇතුළට එනවානම් ආරක්ෂක අධ්‍යක්ෂකවරයාගේ සහ ජී.එම්. ගේ අවසරය රැගෙන ඇතුල්විය යුතු බවත්

සාක්ෂිකරු පවසා ඇති අතර, CCTV මෙහෙයුම් මැදිරිය තුළ CCTV තිර 22 කට අධික ප්‍රමාණයක් තිබුණ බවත් තමාගේ මතකයේ හැටියට ස්ක්‍රීන් 22 ට සමානව ඩී.වී.ආර්. 18 ක් තිබුණ බවත් එම ඩී.වී.ආර්. 2 ක් පමණ තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත. සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට CCTV ආරක්ෂණ සේවයන් සැපයූ ආයතන කිහිපයක් තිබුණ බවත් එක්ස් එල් ආයතනය, පෙන්ටන්ස් ආයතනය, සයෝ ආයතනය යන ආයතන 03 සම්බන්ධයෙන් සාක්ෂිකරු පවසා ඇති අතර, CCTV පද්ධතියට ප්‍රවේශවීම සඳහා මුර පදය ලෙස ඇඟිල්ල තබා අවසර ලබා ගැනීමේ ෆින්ගර් ප්‍රින්ට් පද්ධතියක් තිබූන බවත් එය ආරක්ෂක අධ්‍යක්ෂක තුමාටද තමාට සහ තමා යටතේ වැඩ කල 5 දෙනාට ඒ සඳහා ප්‍රවේශය තිබූ බවත් සාක්ෂිකරු පවසා ඇත. මොහුගේ සාක්ෂිය තුළදී 2019 වසර වන විට හෝටලයේ පැවති CCTV කැමරා පද්ධතීන් ආවරණය වන ස්ථානයන් සම්බන්ධයෙන් විස්තරාත්මකව සාක්ෂි ලබා දී ඇති අතර එසේම, CCTV කැමරා පද්ධතියෙහි තැන්පත් වන දත්තයන් සංරක්ෂණය කිරීම හා ඒවා රෙකෝඩ් කර ඉවතට ගැනීම සම්බන්ධ ක්‍රියාවලිය සම්බන්ධයෙන්ද සාක්ෂිකරු විස්තරාත්මකව සාක්ෂි ලබා දී ඇත. තවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහුට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේම අවුරුදු 20 ක CCTV සම්බන්ධ පළපුරුද්ද තිබුණ බවට පවසා ඇති අතර, ඔහු සඳහන් කර ඇති පරිදි හෝටලයේ පැවති කැමරා 6 ක පමණක් දිනය සහ වේලාව දර්ශනය නොවීමක් සිදුවන බවත් එයට හේතුව ලෙසට එන්ටීබී ටයිම් සවර් එකක්

හරහා CCTV පද්ධතිය සම්බන්ධ කර තිබුණේ නැති බවත් ඒනිසා එන්ටීබී ටයිම් සවර් එකක් හරහා නොගිය හොත් ඇතැම් විට එන්විආර් එකේ කැමරා එකේ ටයිම් එක තමන්ලා බලන ඩිජිටල් ස්ක්‍රීන් එකේ සඳහන් නොවන අවස්ථාද තිබෙන බවට සාක්ෂිකරු පවසා ඇති අතර කෙසේ වෙතත් එම දෝෂය අදාළ CCTV දර්ශනයේ නිරවද්‍යතාවයට බලපාන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. 2019.04.21 දින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් සිදුවූ දිනට පෙර දින රාත්‍රියේ තමා CCTV අංශයේ රාජකාරි කර උදෑසන රාජකාරියෙන් මිදී ගෙදර ගිය බවත් ගෙදර ගොස් උදයේ නිදියගන්න හදන විට තමාට මෙම සිද්ධිය සම්බන්ධයෙන් දැනගන්නට ලැබුණු බවත් තමා නුවර පාරට ආසනන්යේ පදිංචිව සිටින බවත් ඒ අනුව තමා ඒසී බස් එකේ නැඟ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණි බවත් එසේම, සාක්ෂිකරු පවසා ඇත්තේ තමා රාජකාරි කල පෙරදින රාත්‍රියේ පාන්දර රාජකාරියේ යෙදී සිටියදී සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ CCTV දත්ත පද්ධතිය පාන්දර යම් කිසි කාර්මික දෝෂයක් නිසා බිඳ වැටුණු බවත් ඉන්පසු තමා ඉංජිනේරු අංශය සමඟ පැය 2 කට වැඩි වේලාවක් එකතු වී යූපීඑස් හරහා ක්‍රියාත්මක වුනේ නැතිනිසා යූපීඑස් එක පන්නලා විදුලිය ලබා දී සැපයුම ලබා දීලා තමා ගෙදර ගිය බවත් පවසා ඇති අතර, තමාට හෝටලයේ සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් මුලින්ම දැනුම් දුන් අවස්ථාවේදීම රාත්‍රී මෙහෙම දෙයක් වුණා යැයි තමාට මතක් වූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ

මෙලෙස තමා පෙර දින රාත්‍රී එනම් පාන්දර යාමයේ සේවය කරමින් සිටියදී CCTV පද්ධතියට අදාළ මුළු කමාන්ඩ් රූම් එකේම කැමරා එකක් වත් වැඩ කරන්නේ නැතිව අඳුරු වීමට ලක් වුණ බවත් තමා පෙර සඳහන් කළ පරිදි එය යථාවත් කරන ලද බවයි. 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරිදා දින හෝටලයේ ප්‍රධාන අවන්හලේ සන්ඩේ බ්‍රාන්ච් එක එනම් තැප්ප්‍රොබේන් නමැති අවන්හලේ තිබෙන විශේෂ අහාර සැපයීම එදින දවල් ආහාර තුන්සිය ගාණකට ආසන්න ප්‍රමාණයකට ඇණවුම් කර තිබුණ බවත් එසේම, එයිට්‍රියම් නම් එනම් ප්‍රධාන උත්සව ශාලාවේද උදෑසන 200කට ආසන්න පුද්ගලයන් සම්බන්ධ වෙඩින් එකක් සුදානම් කර තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා සිද්ධිය දැන ගැනීමෙන් පසු හෝටලයට එන විට උදෑසන වේලාව පෙ.ව. 10.52 ට තිබුණ බවත් තමා හෝටලයට එන විට සියලුම හෝටලයේ සේවකයින් එළියට දමා සිටි බවත් තමා කාර් පාක් එකෙන් කමාන්ඩ් රූම් එකට යන විටත් මුළු කමාන්ඩ් රූම් එකම සම්පූර්ණයෙන්ම අඳුරේ තිබුණ බවත් තමා ඇතුල් වෙන විට රුබේරු නමැති එදා උදෑසන වැඩ කරන ලද ආරක්ෂක අංශ සාමාජිකයා සහ ආරක්ෂක අංශයේ සුපවයිසර්ලා සහ විධායක නිලධාරීන්ද සහ හෝටලයේ මැනේජර්ලා දෙදෙනෙක් සිට බවත් එස්ටීඑෆ් සාමාජිකයන් දෙදෙනෙක් පමණ ඇතුල්වී සිටි බවත් කාර් පාක් එකෙන් ඇතුල් වීමට තියෙන තැන ඉස්සරහා යුධ හමුදාව පොලිසිය යුනිෆෝම් ඇඳගත් නිලධාරීන් බොහෝ පිරිසක් කමාන්ඩ් රූම් එකට ඇතුල් වෙන්න බලාගෙන සිටි බවත්

සාක්ෂිකරු පවසා ඇත. තමා එලෙස පැමිණෙන විටත් ඉංජිනේරු අංශයේ සේවකයින් මෙහෙයුම් මැදිරිය යථා තත්ත්වයට පත් කිරීමට උත්සහ කරමින් සිටි බවත් තමා එම ස්ථානය පැමිණ විනාඩි 8 ක් 10 ක් ගන්නට ප්‍රථමයෙන් කමාන්ඩ් රූම් එක යථා තත්ත්වය ගත් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තැප්ප්‍රොබේන් අවන්හල ඇතුලේ සවිකර තිබූ කැමරා 4 කට ආසන්න ප්‍රමාණයක් සම්පූර්ණයෙන් පිච්චිලා විනාශ වෙලා ගොස් තිබුණ බවත් ඊට අමරතව පිහිණුම් තටාකය පැත්තේ තිබුණ තැප්ප්‍රොබේන් අවන්හල ආසන්නයේ තිබුණ කැමරා කිහිපයක්ද විනාශ වෙලා තිබුණ බවත් අනෙක් සියලුම කැමරා යථාතත්ත්වයෙන් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තමා පැමිණි පසු තමාට එම ස්ථානයේ සිටි එස්ටීඑෆ් නිලධාරීන් තැප්ප්‍රොබේන් අවන්හල ආසන්නයේ බෝම්බය පුපුරා ඇති බැවින් ‘‘තැප්ප්‍රොබේන් අවන්හලට අදාළ කැමරා ටික හයිලයිට් කරලා ගන්න’’ යැයි පැවසූ බවත් ඉන්පසු තමා එම නිලධාරීන් ඉදිරියේ CCTV දර්ශන නැරඹීමට කටයුතු කළ බවත් එසේම, එස්ටීඑෆ් එකේ සාමජිකයන් සහ ආරක්ෂක අංශයේ සාමාජිකයන් තමාට ජංගම දුරකථනයකින් ශරීරයෙන් වෙන්වී ගිය හිස කොටසක් සම්බන්ධ පින්තූරයක් පෙන්වා සිටි බවත් එම ඡායාරූපය දුවිලි ගොඩේ සුන්බුන් ද තිබී කඳෙන් හිස ගැලවී ගිය ඡායරූපයක් බවත් පවසා 2023.11.29 දිනය සඳහන් කරමින් නිසි පරිදි ලියුම් කවරයකින් ආවරණය කර තිබූ සීවීඩී තැටියක් ඉවතට ගෙන එය පැ.85 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, එම සීවීඩී තැටිය තුළ

අන්තර්ගත ඡායාරූපයක් නරඹමින් එහි සිටින ඡායාරූපය මොහොමඩ් ඉබ්‍රාහීම් ඉන්සාෆ් ඉන්සාම් මොහොමඩ් යන තැනැත්තාගේ බවට තමාට හඳුනා ගන්න පුළුවන් බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. එම ඡායාරූපය තැප්ප්‍රොබේන් අවන්හලේ මැද ප්‍රදේශයේදි ගෙන ඇති ඡායාරූපයක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එය කඳින් වෙන්වී ගිය හිසක් බැවින් එය සුවිසයිඩ් ඇටෑක් එකක් යැයි අවබෝධ කරගත් බවත් තමා ආරක්ෂක අංශයේ සේවයේ යෙදී සිට නීත්‍යානුකූලව ඉවත්වෙච්ච පුද්ගලයෙක් බැවින් සහ නාවික හමුදාවේ ක්‍රියාන්විත රාජකාරි වල තමා නිරතවී සිට ඇති බවත් ත්‍රිකුණාමලය රාජකාරි කරන කාලයේ හබරන, මාර්කබීච්, යකා වංගුව, සම්පූර් ආදි ප්‍රදේශවලදී ආරක්ෂක අංශයට එල්ල වුණ සුවිසයිඩ් ප්‍රහාරවලදී ආපු බොහොමයක් සිරුරු ත්‍රිකුණාමලට ගෙන එන බවත් එවැනි අවස්ථාවලදී එලෙස සුවිසයිඩ් කර ගන්නා පුද්ගලයන්, බෝම්බය පුපුරවන පුද්ගලයන්ගේ බෙල්ලෙන් හිස පළමුවෙන්ම ගැලවිලා යන බව තමාට අවබෝධයක් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.85 ලෙස ලකුණු කර ඇති සීඩී පටයේ අන්තර්ගතව තිබූ මනුෂ්‍ය ශරීරයේ හිසක් සහිත ඡායාරූපය පැ.8 (2) ලෙස ලකුණු කර ඇති අතර, මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලට අදාළ ප්‍රධනා දොරටුවේ CCTV කැමරා සියල්ලම තමා යථාතත්ත්වයට පත් කර ආපස්සට බලාගෙන යන විට තමා ඉහත ඡායාරූපයේ සිටි පුද්ගලයාව හඳුනාගත්ත බවත් එම අවස්ථාවේ ඔහු

සජීවී තත්ත්වයෙන් ඇතුළට පැමිණි ආකාරය සහ එම තැනැත්තා හිස කඳින් වෙන්වී ගිය පුද්ගලයා බවට තමාට පැහැදිලි වුණ බවත් එම තැනැත්තා තැප්ප්‍රොබේන් අවන්හල තුළට ලොකු බෑග් එකක් ද දාගෙන පැමිණ අවන්හල ඇතුලේ සිට යම් ආහාරයක්ද රැගෙන ටික වේලාවක් වාඩිවෙලා සිට ආපසු ප්‍රධාන දොරටුවෙන් එළියට ගොස් නැවතත් තැප්ප්‍රොබේන් අවන්හලට දෙවන අවස්ථාවටත් පැමිණි ආකාරය CCTV දර්ශන වලින් පෙනුන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර, නිසිපරිදි මුද්‍රා තබා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කර තිබී අධිකරණය වෙත යලි ලැබී තිබුණු සීඩී තැටි 2 ක් විවෘත අධිකරණයේදී පරික්ෂා කර එම සීඩී තැටි 2න් 84/2019 වශයෙන් ලියා තිබෙන එසේම, අංක 3 වශයෙන් ලියා තිබෙන සීඩී තැටිය පැ.88 ලෙස ලකුණු කර ඇති අතර එසේම, HD199/2021 පැ.41 වශයෙන් ලියා ඇති සීඩී පටිය පැ.89 ලෙසත් මෙම සාක්ෂිකරුගෙන් ලකුණු කර ඇති අතර, මුලින්ම පැ.88 ලෙස ලකුණු කරන ලද සීඩී පටයෙහි අඩංගු දර්ශන මෙම සාක්ෂිකරුට අධිකරණය ඉදිරියේ වාදනය කර නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර, එම දර්ශනවලට අදාළ දිනය 2019.04.21 උදෑසන 08.46.13 ලෙස පෙන්නුම් කරන බවත් පැය 8.47 තත්පර 07 ට තමා විසින් ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයා ආපන ශාලාව තුළට පැමිණෙන බවත් සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනා ගෙන ඇති අතර, එම තැනැත්තා සපත්තු දෙකක් පැළඳ කලිසමකින් සැරසී ටී ෂර්ට් එකක් ඇඳ ටී ෂර්ට් එකට බෙල්ට්

එකක් සහිත කලිසමක් ඇඳ කලිසමින් යට කර සිටින බව සහ පිටුපස බෑග් එකක් රඳවා ගෙන කැප් තොප්පියක් පැළඳගෙන සිටින තැනැත්තා බවට සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනා ගෙන ඇත. තමා විසින් වැඩිදුරටත් CCTV දර්ශන පරීක්ෂාකර බැලීමේදී එම තැනැත්තාගේ CCTV දර්ශන ආපස්සට පරීක්ෂා කර බැලීමේදී එම තැනැත්තාගේ මුහුණ පැහැදිලිව පෙනෙන ආකාරයේ දර්ශන තිබුණ බවත් තමාගේ රාජකාරී අත්දැකීම් අනුව සහ අවට සිට එම අවස්ථාවේ වටේ සිටි අයත් සමඟ තමාට මෙම බෝම්බ පිපිරුම සමඟ සම්බන්ධ පුද්ගලයාගේ බවට එම තැනැත්තා හඳුනා ගැනීමට වැඩි වේලාවක් ගියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තැප්ප්‍රොබෙන් අවන්හලේදී අලුතෙන් සවි කරන ලද CCTV කැමරා වලට අදාළව 2019.04.21 උදේ 9.06.23 ට අදාළ දර්ශන සාක්ෂිකරු නරඹා ඇති අතර, තවදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ තමා විසින් අදාළ සීසීටිවි දර්ශන වල පෙරවරු 08.07 ට තිබෙන දර්ශන පරීක්ෂා කර බැලීමේදි අදාළ සැකකටයුතු තැනැත්තා තැප්ප්‍රොබෙන් අවන්හලට දකුණ පැත්තේ තිබෙන දොරටුවෙන් ඇතුල් වෙන ආකාරය පෙන්නුම් කරන බවයි. එසේම, එම CCTV දර්ශනවල සිටින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සේවකයන්ද ඔවුන්ගේම නම්වලින්ම සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. තමා CCTV දර්ශන නැරඹීමේදී අදාළ සැක සහිත තැනැත්තා තැප්ප්‍රොබෙන් අවන්හලට ඇතුල් වී විනාඩි 10ක් 12ක් කාලයකින් එම ස්ථානයෙන් පිටත්වී ඇති බවටද පවසා ඇත. එසේම, පැය 08.56 ට තැප්ප්‍රොබෙන් ආපනශාලාවෙන් පිටතට

ගොස් ඔහු ලිෆ්ට් එකට නැඟ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ 4 වෙනි තට්ටුවට නැඟ එතනින් ලිෆ්ට් එකෙන් 425 කොරිඩෝව දිගේ ගොස් කාමර අංක 425 කාමරයට ඇතුල්වන බව CCTV දර්ශන තුළින් තමා නිරීක්ෂණය කළ බවත් එසේම, එම තැනැත්තා තැප්ප්‍රොබෙන් ආපන ශාලාවට පැමිණියේදි 425 කාමරයෙන් බවට 425 කාමරයේ තිබෙන දර්ශනවලට අදාළ CCTV දර්ශන නරඹමින් සාක්ෂිකරු පවසා ඇත. එසේම, 2019.04.21 පෙ.ව. 09.09 ට ද එම තැනැත්තා 425 කාමරයට ඇවිදගෙන යන CCTV දර්ශන තිබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එසේම, ඔහු එලෙස ගමන්කරමින් කොරිඩෝව දිගේ ඇවිදගෙන යන අතර තුරදී වීදුරුවෙන් පහළ ප්‍රදේශය නිරීක්ෂණය කරමින් බලනවා පෙනුන බවත් එදින උදෑසන සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ එයිට්ට්‍රියන් නමැති උත්සව ශාලාවේ විවාහ මංගල්‍යයක් පැවැත්වීමට නියමිතව තිබූ බවත් එම අවස්ථාව වන විට පෝරුවේ මංගල්‍ය පටන් අරගෙන තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. ඉන්පසු නැවත 9.06.40 ට එම තැනැත්තා නැවත වතාවක් අංක 425 කාමරයේ සිට පැමිණ ගෙස්ට් ලිෆ්ට් එකෙන් ගමන්කරන ආකාරය නිරීක්ෂණය කල බවත් පවසා සාක්ෂිකරු පැ.88 සීඩී තැටියේ අඩංගු එම දර්ශනද නරඹා සාක්ෂි ලබා දී ඇත. එසේම, මෙම ස්වයංඝාතක බෝම්බකරු ලිෆ්ට් එකෙන් ග්‍රවුන්ඩ්ෆ්ලෝ එකට පැමිණි තැප්ප්‍රොබෙන් අවන්හල තිබෙන තට්ටුවට බැස තැප්ප්‍රොබෙන් අවන්හලට නැවත වතාවක් පැමිණෙන ආකාරයද සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇති

අතර උදෑස 9.11.54 ට ඔහු CCTV දර්ශනය තුළ දිස්වන බවත් එය බෝම්බය පුපුරා යාමට තත්පර කිහිපයකට පෙර වේලාවක් බවත් CCTV දර්ශන තුළ බෝම්බය පුපුරා යන ආකාරය සටහන් වී තිබෙන උදෑසන 09.12.14 ට දර්ශනද නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ උදෑසන 09.12.34 ට බෝම්බය පුපුරා යාම සිදුවන බවත් 09.12.35 යන වේලාවේදි කැමරාවේ දර්ශනවලට බාධාවන ආකාරයෙන් පෙනී ගොස් ඇති බවට නිරීක්ෂණය කල බවත් පවසා එයට අදාළ නිශ්චල ඡායාරූපයක් පැ.88 (8) (A) ලෙස ලකුණු කර ඇත. තමා විසින් කරුණු සොයා බැලීමේදි එම තැනැත්තා 2019 අප්‍රේල් 20 දින රාත්‍රී මුලින්ම හෝටලයට පැමිණ ඇති බවත් එසේම, තවදුරටත් විමර්ශන කර සොයා බැලීමේදි ඔහු 2019 අප්‍රේල් මස 17 වන දින දා දහවල් පැය 13 ට ආසන්න වේලාවක සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට ඇතුල්වන ආකාරය තමාට දැනගන්නට ලැබුණු බවත් 2019 අප්‍රේල් මස 17 වන දා රිසෙප්ෂන් සිටි චමිලා නමැති තැනැත්තියට එම ස්වයංඝාතකයාගේ මුහුණට සමාන මුහුණක් ඇති පුද්ගලයෙක් ඇවිත් 20 දා සිනමන් ග්‍රෑන්ඩ් එකේ කාමරයක් ගන්න අවස්ථාව ඉල්ලා සිටි බවට තමාට දැනගන්නට ලැබුණු බවත් ඒ අනුව එම තැනැත්තා 2019.04.17, 2019.04.20 යන දින 2 ද සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණ ඇති අකාරය තමාට දැනගන්නට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර 2019 අප්‍රේල් මස 21 දින උදෑසන මෙම ස්වයංඝාතක බෝම්බකරු බෝම්බය සහිත බෑගයද රැගෙන නිල් පාට වැගන්-ආර් රථයක් එනම් CDB-8175

දරන වාහනයෙන් පැමිණෙන ආකාරය CCTV දර්ශනවලට අනුව පෙනී යන ආකාරය පැ.88 දරන සිඩී තැටියේ අන්තර්ගත දර්ශන පරීක්ෂා කරමින් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අදාළ ස්වයංඝාතක බෝම්බකරු එම කාර් එකෙන් ඔහුගේ බෑග් එක අරගෙන එන්න හඳන විට සමන්ත නමැති බෙල් බෝයි සහ ආරක්ෂක අංශයේ ජයකොඩි නමැති පුද්ගලයා ඔහුට උදව් කරන්නට ඉදිරිපත් වන ආකාරයද CCTV දර්ශන වලින් පෙනෙන බවත් CCTV දර්ශනවලට අනුව අදාළ සැක සහිත තැනැත්තා කාර් රථයෙන් එළියට ගන්නා ලද බෑගය සංචාරකයන් රැගෙන යන විශාල ප්‍රමාණයේ ලගේජ් එකක් බවත් එය බිම දිගේ ඇදගෙන යන බෑගයක් බවත් සාක්ෂිකරු CCTV දර්ශන ආශ්‍රයෙන් පවසා ඇති අතර අදාළ සැක කටයුතු පුද්ගලයා ඔහුගේ බෑගය රැගෙන යාමට උපකාර කිරීමට බෙල් බෝයි හට ඉඩ ලබා නොදී එම සැකකටයුතු පුද්ගලයාම එම බෑගය රැගෙන ලොබිය තුළට ඇතුල් වී ඔහු 425 දරන කාමරය ට යාම සඳහා විදුලි සෝපානයට නඟින ආකාරයද CCTV දර්ශන වලින් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එසේම, එම තැනැත්තා 4 වෙනි තට්ටුවට විදුලි සෝපානයේ ගොස් 4 වෙනි තට්ටුවෙන් බැස එළියට ඇවිත් සිටින ආකාරය සහ එම තැනැත්තා කොරිඩෝව දිගේ ගොස් එලෙස ගොස් 425 කාමරයට ඔහු ඇතුල්වෙන ආකාරය සහ එම අවස්ථාවේ රැගෙන ගිය ඇදගෙන යන ට්‍රැවලින් විශාල බෑගයද රැගෙන යන ආකාරය CCTV දර්ශන තුළින් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. එසේම, එම සැකකටයුතු තැනැත්තා 2019.04.17 වන

දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණි ආකාරයට අදාළ CCTV දර්ශන ආශ්‍රයෙන් සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි දී ඇත. 2019.04.17 වන දින පස්වර් 13.28 ට මෙලෙස පැමිණ ඇති බවත් CCTV දර්ශනවලට අනුව පෙනී යන බවත් එම අවස්ථාවේ ඔහු සුදු පාට දිග කලිසමක් ඇඳ, සපත්තු යුගලක් පැළඳ, නිල් පාට ටී ෂර්ට් එකක් සහ සුදු පාටට හුරු බැක් පැක් එකක් පැළඳ ගෙන සිටින ආකාරයද CCTV දර්ශනවලට අනුව පෙනී යන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම තැනැත්තා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පිළිගැනීමේ කවුන්ට්‍රය අසලට ගොස් සිටින ආකාරයද සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනා ගෙන ඇති අතර එම අවස්ථාවේදී පිළිගැනීම් කවුන්ට්‍රයේ සිටි රිසෙප්ෂනිස්ට් සහ කෝල් ලොබි මැනේජර් කෙනෙක් සහ හෝටලට ඇලුතින් පැමිණි සේවකයකු සිටින ආකාරය CCTV දර්ශන තුළින් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර, එහි සිටින කාන්තාව කටුබැද්දගේ චමිලා බවත් සාක්ෂිකරු පවසා ඇත. එම තැනැත්තා එනම් සැක කටයුතු පුද්ගලයා 2019.04.17 වන දින පිළිගැනීමේ කවුන්ටරයේ විනාඩි 8 කට ආසන්න කාලයක් ගත කර එම ස්ථානයෙන් පිටවී යන ආකාරයක් CCTV දර්ශනවලට අනුව පෙනී යන බවත් එසේම, තවදුරටත් CCTV දර්ශන නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ 2019.04.17 වන දින අදාළ සැකකරු වන තැනැත්තා ගාලු පාරෙන් පැමිණ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පිවිසුමින් ඇතුළට ඇවිත් එතනින් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය දෙසට ගමන් නොකර ඔහු පැමිණි ත්‍රිවිල් රථය ක්‍රෙස්කැට්

ෂොපින් මෝල් එකේ ප්‍රධාන දොරටුව දෙසට ගමන් කරන ආකාරය තමා නිරීක්ෂණය කරන බවත් එසේම, මෙම සාක්ෂිකරුට ක්‍රෙස් කැට් ආයතනයට අදාළ CCTV දර්ශන විවෘත අධිකරණයේදී නැරඹීමට ලබා දී ඇති අතර, ඒ අනුව ක්‍රෙස් කැට් ආයතනයට අදාළ CCTV දර්ශන අඩංගු සැනලි ධාවකය පැ.90 ලෙස ලකුණු කිරීමක් කර ඇති අතර, එම දර්ශනවලට අනුව 2019.04.17 පැය 13.25 ට අදාළ තැනැත්තා ක්‍රෙස් කැට් ආයතනය අසලට පැමිණි ත්‍රීවිල් රථයේ සිටින ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. එසේම, එම තැනැත්තා ක්‍රෙස්කැට් ආයතනයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වී යන ආකාරයද සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇති අතර එසේම, ක්‍රෙස් කැට් ෂොපින් මෝල් ආයතනයෙන් සිනමන්ඩ් ග්‍රෑන්ඩ් හෝටලය දෙසට යාමට තිබෙන වීදුරු දොරට අදාළ CCTV දර්ශනයන්ද සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තමා පෙර සඳහන් කල පුද්ගලයා එම වීදුරු දොරෙන් ඇතුල් වී සින්මන් ග්‍රෑන්ඩ් හෝටලය දෙසට ගමන් කරන ආකාරය CCTV දර්ශන වල තිබෙන බවට පවසා පැ.90 දරන CCTV දර්ශන අඩංගු දර්ශනයන් බලමින් සාක්ෂිකරු පවසා ඇත. තවද 2019.04.20 දිනට අදාළ CCTV දර්ශනයන්ද නරඹමින් මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ 2019.04.20 දින රාත්‍රී 7.00 ට ආසන්න වෙලාවක රතු පාට කාර් රථයකින් පැමිණ ප්‍රධාන දොරටුව ඉදිරිපස නැවතීමෙන් පසු අදාළ සැකකටයුතු තැනැත්තා කාර් රථයෙන් බැස හෝටලට ඇතුල් වීමට අදාළ රිසෙප්ෂන් එකෙන් උපදෙස් ලබා ගෙන ඔහු 4

වන තට්ටුවට යාම සඳහා ලිෆ්ට් එකට තිබෙන ස්ථානයට ගමන් කරන ආකාරයද CCTV දර්ශන වලින් දර්ශනය වන බවට සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත. ඉන්පසු එම තැනැත්තා 4 වෙනි මහලට ගොස් 425 කාමරයට ඇතුල් වීමට කටයුතු කරන ආකාරය පිළිබඳව CCTV දර්ශන ඇසුරින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇති අතර, එම සැකකටයුතු තැනැත්තා කාමරයේ දොර අරින්න උත්සහ කරන ආකාරය සහ එම දොර විවෘත නොවුණ නිසා නැවතත් එම තැනැත්තා පිළිගැනීම් කවුන්ට්‍රය වෙත ගමන් කරන ආකාරය සහ ඉන් අනතුරුව හෝටලයේ රිසෙප්ෂන් එකේ සිටින සේවකයෙකු පැමිණෙන ආකාරය සහ එලෙස පැමිණි පුද්ගලයන් දෙදෙනා පැමිණ කාමර අංක 425 තුළට ඇතුල් වන ආකාරය සහ තමා පෙර සඳහන් කරන ලද සැකකටයුතු තැනැත්තාද එම කාමරයට ඇතුල්වන ආකාරයද CCTV දර්ශනයෙන් පෙනෙන බවට සාක්ෂිකරු හඳුනා ගෙන ඇත. එම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා ඇත්තේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි CCTV කැමරා දර්ශනවලට අදාළ ඇතැම් කැමරා කිහිපයක වෙලාව සහ දිනය යම් ප්‍රමාණයකින් වෙනස් වීමක් සිදුව තිබෙන බවත් එයට හේතුව ලෙසට පෙන්ටන්ස් ආයතනයෙන් සවිකරන ලද CCTV කැමරා වලට සහ එක්ස් එල් ආයතනයෙන් සම්බන්ධකරන ලද කැමරා වලට අදාළව ටයිම් සවර් එකක් සම්බන්ධ කර නොතිබුණ නිසා එවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බවද එමඟින් CCTV දර්ශන වල නිරවද්‍යතාවයට කිසිදු බලපෑමක් සිදු වන්නේ නැති බවටද සාක්ෂිකරු පවසා ඇත. සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ

තැප්ප්‍රොබේන් අවන්හලේ සිදුවූ බෝම්බ පිපිරීමෙන් පසු ලබා ගෙන ඇති ඡායාරූප පැ.85 ලෙස ලකුණු කරන ලද සීඩී එකෙහි අන්තර්ගතවන අතර ඒවා මෙම සාක්ෂිකරුට නැරඹීමට ප්‍රදර්ශනය කර ඇති අතර එම ඡායාරූප පැ.85 (3), පැ.85 (4), පැ.85 (5) පැ.85 (6), පැ.85 (7), පැ.87 ලෙසට ලකුණු කිරීම් කල ඇති අතර, ඒ අතරින් කාමර අංක 425 දර්ශනය වන ආකාරයෙන් ලබා ගෙන ඇති ඡායාරූපය පැ.85 (7) ලෙස සාක්ෂිකරු මඟින් ලකුණු කිරීමක් කර ඇත. එසේම, එම කාමරයේ අභ්‍යන්තරයට අදාළ ඡායරූපයක් පැ.85 (8) ලෙස ලකුණු කර ඇති අතර එම ඡායාරූපයට අනුව එම කාමරය තුළ තිබෙන දේ ඇඳුම් පැළඳුම්වලට අමතරව තමා පෙර සඳහන් කරන ලද පරිදි හෝටලයට පැමිණි තැනැත්තා රැගෙන එන ලද ට්‍රැවලින් බෑග් එකද තිබෙන ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරු මඟින් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය සහ ක්‍රෙස්කැට් ආයතනයේ පිහිටීමට අදාළ සැලස්මක් පැ.91 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එසේම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි තැප්ප්‍රොබේන් අවන්හල තිබෙන ස්ථානය පෙන්නුම් කෙරෙන සැලැස්මක් පැ.92 ලෙසද මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඉදිරිපත් කර ඇත. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් තැප්ප්‍රොබේන් අවන්හලේ සිදුවූ පිපිරීම නිසා සංජීවනි නමැත්තියද එසේම, තමාගේ මිතුරෙක් වන යහියා නමැත්තාද නිමල්ෂ නමැති තමාගේ මිතුරෙක්ද නලින් නමැති මුස්ලිම් ලමයෙක් ද ඊබ්‍රාහිම් නමැති මරදාන ප්‍රදේශයේ පදිංචිව සිට මෙම හෝටලයේ සේවය සඳහා පැමිණි 5 දෙනෙක්

මියගිය බව හෝටලයෙන් ලබා ගන්නා ලද ලේඛනයක් වශයෙන් ඇති සේවක ලැයිස්තුවක් පැ.93 ලෙස ලකුණු කර ඇති අතර, එම පැ.93 ලෙස ලකුණු කරන ලද ලේඛනය සියලුම චූදිතයන් වෙනුවෙන් කිසිදු හබ කිරීමකින් තොරව පිළිගැනීම මත එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත. තැප්ප්‍රොබෙන් අවන්හලෙහි ඇතුළත පිපිරුණු බෝම්බය නිසා දේශිය මෙන්ම විදේශීය පුද්ගලයන්ද තුවාලයට පත්වුණ බවත් එසේම, මියගිය බවත් විදේශිකයන් අතර බ්‍රිතාන්‍ය ජාතිකයන් ඇමරිකානු ජාතිකයන් ආරබි ජාතිකයන් ද සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, හෝටලයේදී මිය ගිය විදේශික ජාතිකයන් සම්බන්ධයෙන් ඒ අදාළ ආයතනයන්ගෙන් යම් යම් විමසීම් සඳහා පැමිණි බවත් ඇමරිකන් ජාතිකයන් සම්බන්ධයෙන් ඇමරිකානු තානාපති කාර්යාලයෙන් පැමිණ විමසීම් කරන ලද බවත් ඒවාට තමා සහය දුන් බවත් එසේම, චාල්ස් වෙල්වියා මේරි බෙකමි ඩානා යන ඇමරිකානු රාජ්‍යතාන්ත්‍රික නිලධාරීනියක් 2019 අප්‍රේල් 21 දින සිදුවූ බෝම්බ පිපිරීම නිසා මියගිය බවටත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් 2, 9, 13, සහ 23 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනෙකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. 13 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදි මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ප්‍රකාශයන් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම කර ඇති අතර, එම ප්‍රකාශ වලදි

හෝටලයේ නැවතී සිට සහ මිය ගිය විදේශීය ජාතිකයන්ගේ නම් තමා ප්‍රකාශයේදී සඳහන් කරන ලද බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, 2019.04.21 වන දින බෝම්බ පිපිරීමේ සිද්ධිය වන විට තමා හෝටලයේ සිටියේ නැති බවත් තමා සිටියේ නිවසේ බවත් තමාට මෙම ආරංචිය ලැබීමෙන් පසු තමා හැකි ඉක්මණින් හෝටලයට පැමිණි බවටත් සඳහන් කර ඇත. මෙම සාක්ෂිකරුට පැ.88 ලෙස ලකුණු කරන ලද CCTV දර්ශන අඩංගු දර්ශනයන් වලින් පැ.88 (9), පැ.88 (10) යන CCTV දර්ශනයන් පෙන්වා දෙමින් විත්තියේ හරස් ප්‍රශ්න අසා ඇති අතර, විශේෂයෙන් පැ.88 (9) ලෙස ලකුණු කර ඇති CDB-8175 දරන නිල්පාට කාර් රථයෙහි ඇතුළත සිටින අය කවුරුද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට රියදුරු මහතා සිටින ආකාරය පේන බවත් වාහනයෙන් පිටුපස කොටස කලු පැහැයට තිබෙන නිසා තමාට ඒ ඇතුලේ සිටින අය සම්බන්ධයෙන් එකවර කියන්නට බැරි බවයි. එසේම, පැ.සා.88 (10) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එම CCTV දර්ශනයෙහි සඳහන් වාහනයේ අංකය කීමට අපහසු බව පවසා ඇති අතර එසේම, එම CCTV දර්ශන යේ දිනයක් හෝ වේලාවක් සඳහන් නොවන බවට සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී පවසා සිටි ඇදගෙන යන බැගය සම්බන්ධයෙන් ප්‍රශ්න අසා ඇති අතර එසේම, සාක්ෂිකරු පවසා ඇත්තේ තමා CCTV දර්ශන

නරඹමින් සාක්ෂි ලබා දුන් බවත් එහි තිබෙන රූප වල තිබෙන තමා දුටු බෑග් දැක්ක පමණින් එම බෑග් ඇතුලේ තිබෙන්නේ කුමක්ද යන්න සම්බන්ධයෙන් තමාට හැකියාවක් නැති බවයි. මෙම සාක්ෂිකරුගෙන් 2, 9 සහ 23 චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමඩ් නමැති පුද්ගලයෙකු හඳුනනවාද යැයි හරස් ප්‍රශ්න අසා ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ 2019 අප්‍රේල් මස 21 වන දා බෝම්බ ප්‍රහාරය සිදුවන තුරු තමා එහෙම කෙනෙක් ගැන දන්නේ නැති බවත් 2019 අප්‍රේල් 21 දින බෝම්බ ප්‍රහාරය සිදු වුණාට පසු මාධ්‍ය වලින් ඒ සම්බන්ධ තොරතුරු දැනගත් බවත් තමා හෝටලයේ ආරක්ෂක නිලධාරියා ලෙස රාජකාරි කරන බැවින් 2019 අප්‍රේල් 21 වන දින දා ස්වයංඝාතක බෝම්බයක් පුපුරා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලේ සිටි 21 දෙනෙකුගේ ජීවිත නැති කර ඇති බවත් තමා සමඟ වැඩ කල සහෝදර සේවකයින් දෙනෙකුද මියගොස් ඇති බවත් එදින සවස් වන විට තමාට දැනගන්නට ලැබුණේ මුබාරක් නමැති පුද්ගලයකු 425 කාමරයට චෙකින් වෙලා සිට ඇති බවත් පසුව මාධ්‍ය වලින් හා රජයේ ආරක්ෂක අංශ වලින් තාමට දැනගන්නට ලැබුණේ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් යන දේශිය සංචාරකයා 425 කාමරයේ නැවතිලා සිට මෙම විනාශ සිදු කර ඇති බවයි. මෙම පැ.සා.1131 නීල් පැට්‍රන් ද සොයිසා යන සාක්ෂිකරුගේ සාක්ෂි විශ්ලේෂණය කර පරීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ ඔහු 2019.04.21 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රෝබේන

අවහන්හලෙහි ස්වංයඝාතක බෝම්බයක් පිපිරවීම සිදුවූ දිනය වන විට එම හෝටලයේ විධායක ආරක්ෂක නිලධාරියා ලෙස කටයුතු කර ඇති බව වන අතර එම දිනයේ එනම් බෝම්බය පුපුරණ අවස්ථාව වන විට මෙම සාක්ෂිකරු සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය තුළ නොසිටි අතර එදිනට පෙර දින රාත්‍රී මුර සේවයේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව විවේකය ලබා ගැනීම සඳහා නිවසට ගොස් සිටි අවස්ථාවේදී මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවී ඇති අතර ඔහුට ඒ සම්බන්ධයෙන් මෙහෙයුම් මැදිරියෙන් දැන ගැනීමට ලැබුණු පසු ඔහු පෙ.ව.10, 11 අතර යලි හෝටලයට පැමිණ පරීක්ෂණ කටයුතු වලට සහය වීමක් සිදු කිරීමේදි සහ විශේෂයෙන් හෝටලයේ තැප්ප්‍රොබෙන් අවන්හල තුළ සිදුවී ඇති බෝම්බ පිපිරීමට අදාළව කරුණු හෙළි කර ගැනීම සඳහා හෝටලයෙහි CCTV කැමරා පද්ධතියට අදාළව පරික්ෂාවන් සිදු කිරීමක් කර ඇති බව සහ එම CCTV දර්ශනවලට අනුව 2019.04.21 දින පෙරවරුවේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි තැප්ප්‍රොබෙන් අවන්හලහි ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදුවී තිබීම හා එම සිදුවීම සම්බන්ධයෙන් මෙම හෝටලයෙහි කාමර අංක 425 හි නවාතැන් ගෙන සිට පුද්ගලයා සම්බන්ධ බවට කරුණු හෙළිවී ඇති ආකාරය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර අදාළ කාමර අංක 425 හි නවාතැන් ගෙන සිටි තැනැත්තා 2019.04.17 දින සහ 2019.04.20 දින ද සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණ ඇති ආකාරය මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර සිටින ලද CCTV දර්ශන රාමු සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි

ලබා දීම තුළින් පැහැදිලිව කරුණු සටහන් වී ඇති අතර එසේම, පැ.85 (2) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයට අනුව එහි දිස්වන පිරිමි පුද්ගලයෙකුගේ හිස දැක්වෙන ඡායාරූපය පරීක්ෂා කරමින් එහි සිටින පුද්ගලයා 2019.04.17 වන දින හා 2019.04.20 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණ ඇති තැනැත්තා බවට සහ එම තැනැත්තාම කාමර අංක 425 හි නවාතැන් ගෙන සිටි ආකාරයද එසේම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි තැප්ප්‍රොබේන් අවන්හල තුළට බැක් පැක් එකක්ද රැගෙන පැමිණ සිට ඇත්තේ එම 85 (2) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයෙන් දිස් වන එකම පුද්ගලයා ම බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හා ඔහු CCTV දර්ශන නරඹා ලබා දී ඇති සාක්ෂි තුළින් අධිකරණය ඉදිරියේ මැනවින් කරුණු සනාථ වී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු පවසා ඇති පරිදි එම පුද්ගලයාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් කරුණු විමසීමේදී ඔහු පවසා ඇත්තේ අදාළ කාමර අංක 425 හි නැවති සිට ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කර ඇත්තේ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් යැයි තමාට දැන ගන්නට ලැබුණේ බෝම්බ ප්‍රහාරයෙන් පසුව මාධ්‍යවලින් හා ඒ හා සම්බන්ධ තොරතුරු වලින් බවට ඔහු අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති පසුබිම සහ එසේම, 2019.04.21 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රාබේන් අවන්හල තුළ ස්වයංඝාතක බෝම්බ ප්‍රහාරය සිදු වන අවස්ථාවේ මෙම සාක්ෂිකරු මෙම ස්ථානයේ සිට නොමැති වීමද යන කරුණු සළකා බැලීමේදී මෙම

සාක්ෂකරුට අදාළ බෝම්බ ප්‍රහාරයට සැකකටයුතු තැනැත්තන්ව හෞතිකව දැක බලා ගැනීමට අවස්ථාවක් තීබී නොමැති අතර හුදෙක් CCTV කැමරා වල අඩංගු දර්ශන නරඹමින් මෙම සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති පසුබිම සැලකිල්ලට ගැනීමේදි 2019.04.21 දින පෙරවරුවේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබෙන් අවන්හලේ දී ස්වයංඝාතක බෝම්බයක් පුපුරවා දේශීය සහ විදේශීය පුද්ගලයන් රාශියකගේ මරණය සිදු කර එවැනි විශාල සංඛ්‍යාවකට තුවාල සිදු කිරීමේ සිද්ධියට සම්බන්ධව එම ක්‍රියාව සිදු කර ඇති තැනැත්තා මොහොමඩ් ඉබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් යන නමින් හඳුන්වන තැනැත්තාම බව සහ එම නමින් හඳුන්වන තැනැත්තා සහ පැ.85 (1) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේ දිස්වන ශරීරයෙන් වෙන්වී ගිය පිරිමි හිස හිමි තැනැත්තා වන්නේ මොහොමඩ් ඉබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් යන තැනැත්තාම මිස අන්කිසිවෙක් නොවන බවට මෙම තැනැත්තාගේ අනන්‍යතාවය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීම කල යුත්තේ මෙම නඩුවෙහි පැමිණිල්ල විසින්ම වේ. කෙසේ වුවද සමස්තයක් ලෙස මෙම සාක්ෂිකරු CCTV දර්ශන එනම් පැ.85 දරන සීඩී පටය තුළ තිබූ CCTV දර්ශනයේද පැ. 87, 88, 89 මෙන්ම පැ. යන සීඩී පට වල අඩංගු CCTV දර්ශන නැරඹීමෙන් සහ පැ. 91 සහ සහ පැ.92 ලෙස ලකුණු කර ඇති සැලැස්මල් නරඹිමින් ලබා දුන් සාක්ෂියෙහි විශ්වාසනීයභාවය සම්බන්ධයෙන් කිසිදු සැක සහිත භාවයක් අප හට පෙනී නොයන අතර හරස් ප්‍රශ්නවලදී ද මෙම සාක්ෂිකරු විසින් CCTV දර්ශන නරඹමින් හා

ඉහත කී සැලසුම් දෙක එනම් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හල පිහිටීමට අදාළ සැලැස්මේ හා ක්‍රෙස්කැට් ආයතනයේ සැලැස්ම පරීක්ෂා කරමින් මෙම සාක්ෂිකරු ලබාදුන් සාක්ෂි විශ්වාසනීය භාවයෙන් තොර බවට කිසිදු කරුණක් හරස් ප්‍රශ්නවලදීද අධිකරණය ඉදිරියේ ඉදිරිපත් නොවීම පසුබිම තුළ මෙම සාක්ෂිකරු එම CCTV දර්ශන හා ඡායාරූප සම්බන්ධයෙන් සහ ඉහත කී පැ. 91 හා පැ.92 දරන සැලැස්මවල් දෙක සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂි විශ්වාසනීය සාක්ෂි බවට අප තීරණය කරමි.

පැ.සා.1110 අලුත්ගමගේ සමන්ත යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2003 වසරේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ අමුත්තන් පිළිගැනීමේ නිලධාරියෙකු ලෙස සේවයට බැඳුණු බවත් 2019 වසරේ හෝටලයෙහි බෙල්බෝයි අංශයේ සේවය කරන ලද බවත් තමාගේ රාජකාරිය වන්නේ අමුත්තන් ඇතුළට එනවිට ඔවුන්ට කතා කර වෙල්කම් කර අමුත්තන්ගේ බෑග් රැගෙන රිසිප්ෂන් එකට යාමට මඟ පෙන්වීම සිදු කරන බවත් පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.88 (10) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය මෙම සාක්ෂිකරුට නැරඹීම සඳහා විවෘත අධිකරණයේ වාදනය කර ඇති අතර සාක්ෂිකරු එය නරඹමින් එහි තමා කළු පාට කලිසමක් ඇඳ සුදු ෂර්ට් එකක් ඇඳ ජැකට් එක අළු පැහැති ලා නිල් පාට හුරු ජැකට් එකක් සහ

වේස් කෝට් එකක් ඇඳගෙන සිටිනවා පෙන්වා දෙමින් සාක්ෂි ලබා දී ඇත. එම CCTV දර්ශනයන්ට අනුව තමා ගෙස්ට් කෙනෙක් ළඟට ගොස් ගුඩ්මෝනින් සර් ආ යු වෙකින් යැයි ආචාර කර විමසා එම අමුත්තාගෙන් බෑග් එක ඉල්ලා ගැනීමට උත්සාහ කළද එම තැනැත්තා තමාට බෑග් එක නොදී ඔහු, ‘‘මම හෝටලයේ ඉන්න ගෙස්ට් කෙනෙක් මට කාමර අංක 425 ට යන්න ඕනා’’ යැයි පවසා බෑග් එක තමාට නොදී අනිත් පැත්තට ගත් බවත් එම තැනැත්තා තමා සමඟ කතා කළේ ඉංග්‍රිසි භාෂාවෙන් බවත් පවසා ඇත.

තමාට එම බෑග් එක මතක බවත් එය කළු පාට ට්‍රොලි බෑග් එකක් බවට සාක්ෂිකරු පවසා ඇති අතර රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් මුද්‍රා සහිතව නිසි පරිදි මුද්‍රා තබා ගම් ටේප් ආධාරයෙන් ආවරණය කර තිබී සි බි 575/21 ලෙස සඳහන් කර ඇති බී 13101/19 නඩු අංකය සඳහන් කවරයකින් ආවරණය කර ඇති නිසි පරිදි මුද්‍රා තබා තිබූ බෑගයක් අධිකරණයේ විවෘත කර සාක්ෂිකරුට පෙන්වා ඇති අතර සාක්ෂිකරු එය තමා පෙර පවසා සිටි බෑගය බවට හඳුනාගෙන එය පැ.95 ලෙස ලකුණු කර ඇත.

එසේම, එම පැ.95 බෑගය රැගෙන පැමිණි තැනැත්තා සන්ග්ලාස් දෙකක් දමා, රැවුල පොඩ්ඩක් වවා, කළු පාට ටී ෂර්ට් එකක් ඇඳ, කලිසමක් ඇඳ, කැප් එකක් ද පැළඳ සිටි අයෙක් බවත් පවසා ඇත. සාක්ෂිකරු

වැඩිදුරටත් පවසා ඇත්තේ එදින උදේ 9.00 ත් 9.30 ත් අතර ලොබි එක පැත්තෙන් පිපිරීමක ශබ්දයක් ඇසුණු බවත් එය තැප්ප්‍රොබෙන් රෙස්ටුරන්ට් එකේ සිදු වන්නට ඇති බව දැනගන්නට ලැබුණු බවයි.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 02, 09, 23 චූදිතයන් වෙනුවෙන් පමණක් වන අතර අනිකුත් සියලු චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුගෙන් විමසා ඇත්තේ ඔහු අධිකරණයේදී හඳුනාගත් බෑග් ආකාරයේ තවත් බෑග් වෙනත් අමුත්තන්ද රැගෙන එන බවට සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට අධිකරණයේ හඳුනාගත් බෑගය විශේෂයෙන් මතකයේ තිබෙන්නේ තමා එම බෑග් එක ඉල්ලූ විට දුන්නේ නැති නිසා බවත් සාමාන්‍යයෙන් තමාලා අනිවාර්යෙන්ම අමුත්තන්ගේ බෑග් එක ගන්නා බවත් ඉන්පසුව අමුත්තන් කැඳවා ගෙන යන බවයි. එමනිසා එම සිද්ධිය විශේෂ සිද්ධියක් නිසා මතක බවයි.

එසේම, එලෙස බෑග් එක ඉල්ලුවද තමාට බෑග් එක නොදුන් බවට තමා සේවය කළ යාඩ් එකේ සිටි කැප්ටන් කෙනෙකුට තමා ගොස් දැනුම් දුන් බවත් බොහෝ අවස්ථාවලදී තනියම පැමිණෙන ගෙස්ට්ලාගේ බෑග් ගෙන ගොස් නොදුනහොත් ඔවුන් පැමිණිලි කිරීම් සිදු කරන බවත් මෙම සිද්ධිය සිදු වූ දින උදේම පැමිණි ගෙස්ට් තමා සඳහන් කළ තැනැත්තා නිසා තමාට ඔහු විසින් ඔහුගේ බෑගය තමා රැගෙන යාමට ඉල්ලීමේදී ඔහු එය

රැගෙන යාමට දීම ප්‍රතික්ෂේප කළ බැවින් මෙම සිද්ධිය මතක බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති පැ.95 දරන බෑගය මෙම නඩුවට අදාළව සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලෙහි බෝම්බ පිපිරීමට අදාළ සිද්ධියට සම්බන්ධ බෑගයක් බවට මෙම සාක්ෂිකරුට විශේෂයෙන් දැනුමක් තිබී නොමැති අතර එම බෑගය සහ ඉහත පරිදි තැප්ප්‍රොබේන් අවන්හලෙහි 2019.04.21 දින උදේ වරුවේ සිදුවූ බෝම්බ සිද්ධිය අතර ඇති සම්බන්ධතාවය සම්බන්ධයෙන් සාධාරණ සැකයෙන් ඔබ්බට අධිකරණය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීම මෙම නඩුවේ පැමිණිල්ලේ වගකීම වේ.

පැ.95 ලෙස සාක්ෂිකරු විසින් හඳුනාගෙන ලකුණු කරන ලද බෑගය රැගෙන පැමිණි තැනැත්තා ඇඳන් සිටි ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුට සම්පූර්ණ මතකයක් තිබී නොමැති අතර කෙසේ වෙතත් පෙන්වා සිටියහොත් හඳුනාගත හැකි බවට ඔහු අධිකරණයට පවසා ඇත.

ඒ අනුව මෙම සාක්ෂිකරු පසුව අවස්ථාවක යලි සාක්ෂි දීම සඳහා අධිකරණයේ කැඳවා ඇති අතර එම අවස්ථාවේදී පැ.100 ලෙස ලකුණු කරන ලද රසපරීක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ නිසි පරිදි මුද්‍රා තබා තිබූ කවරයක් තුළ තිබූ ඇඳුම් අතරින් කමිසයක් සාක්ෂිකරුට පෙන්වා ඇති අතර තමා විසින් බෑගය ඉල්ලූ පසු බෑගය ලබා දීම ප්‍රතික්ෂේප කළ

තැනැත්තා ඇඳ සිටි කමිසය එය බවට සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දෙමින් ‘‘මෙක තමයි හරියටම ඇඳුම මට මතකයි’’ යනුවෙන් සාක්ෂි ලබා දී ඇත.

නැවත කැඳවන ලද මෙම සාක්ෂිකරුගෙන් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇති අතර ඒ අනුව පැ.101 ලෙස ලකුණු කර ඇති කමිසය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය කිසිදු හබ කිරීමකින් තොරව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත.

එම තැනැත්තා කැප් එකක් පැළඳ සන්ග්ලාස් දෙකක් දමා සිටි තැනැත්තෙකු බවට මෙම සාක්ෂිකරු තම සාක්ෂියේදී පවසා ඇත. ඒ අනුව පැ.95 බැගය රැගෙන පැමිණි තැනැත්තා පිළිබඳව නිශ්චිතවම අනන්‍යතාවය හඳුනාගැනීමක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ඉදිරිපත් වී නොමැත. කෙසේ වුවත් ඉහත පැ.101 ලෙස ලකුණු කර ඇති කමිසය එම තැනැත්තා ඇඳගෙන පැමිණි කමිසයම බවට මෙම සාක්ෂිකරු නිශ්චිත සාක්ෂියක් ලබා දී ඇත.

පැ.සා.2195 ගැවින් වර්ක්ලි ෆර්නැන්ඩර් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2019 වසර වනවිට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ලොබි මැනේජර් කෙනෙක් ලෙස සේවය කරන ලද බවත් තමා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට සම්බන්ධ වුනේ 2016 වසරේදී බවත් සාක්ෂිකරු පවසා ඇත.

තම රාජකාරි වගකීම වන්නේ සේවකයන්ව සුපර්වයිස් කිරීම බවත් ගෙස්ට්ලාව හමුවී වෙල්කම් කර ඒ අය සමඟ කතා කරන බවත් එයට අමතරව ගෙස්ට්ලාගේ කාමරයන්ද පරීක්ෂා කරන බවත් එම කාමරවලට අවශ්‍ය විශේෂයෙන් ඉල්ලා සිටින දෑ සැපයීමට පියවර ගන්නා බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 දින තමා රාජකාරියට වාර්තා කළ දිනයක් නොවන බවත් 2019.04.20 දින සේවයට වාර්තා කර ඇති බවත් එදින තමා රාත්‍රී 7.00 ඉක්මවනතුරු රාජකාරි කටයුතු කර ඇති බවත් පවසා ඇත. සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ කාමරයක් වෙන් කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකිකයන් නම් රියදුරු බලපත්‍රය හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු බවත් විදේශිකයන් ඔවුන්ගේ ගමන් බලපත්‍ර ඉදිරිපත් කරන බවත් සාමාන්‍යයෙන් කාමරයක් වෙන් කරවා ගැනීමට එන පුද්ගලයන් එලෙස ඔවුන් කවරෙකුගේ නමින් බුක් කරනවාද යන්න අසා විස්තර ලබා ගන්නා බවත් සාමාන්‍යයෙන් කාමරය වෙන් කරන පුද්ගලයාගේ තොරතුරු තමාලාට අවශ්‍යය වන්නේ නැති බවත් අවශ්‍ය වෙන් කිරීම් කරවා ඉන්පසු අදාළ අමුත්තන් හෝටලයට පැමිණි විට ඒ එන පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය තමාලා ලබා ගන්නා බවත් එම විස්තර ඇතුළත් දත්ත තමාලාගේ කම්පියුටර් සිස්ටම් පද්ධතියට ඇතුළත් කරන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, කාමරය බුක් කිරීමට පැමිණෙන තැනැත්තාගෙන් තමාලා ටැබ් එකකට විද්‍යුත් අත්සනක් ලබා ගන්නා බවත් එලෙස තොරතුරු ඇතුළත් කර තමාලා සකස් කරන ලේඛනය ගෙස්ට් රෙජිස්ට්‍රේෂන් කාඩ් ලෙස හඳුන්වන බවත් එහි පිටපතක් කාමරය වෙන් කරවා ගැනීමට පැමිණෙන පුද්ගලයාට ලබා දෙන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. 2019 වසර වනවිට එලෙස තවත් පුද්ගලයෙකු වෙනුවෙන් කාමරයක් බුක් කිරීම සඳහා පැමිණෙන තැනැත්තන්ට යම් මුදල් ගෙවීමක් සිදු කළ පසු පෆෝමා ඉන්වොයිස් එකේ පිටපතක් ලබා දෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.20 දින එදින තමාට මතක හැටියට රාත්‍රී කාලයේ තමා සහ තමා සමඟ වැඩ කරන ලද රවීන්ද්‍ර තංගයියා නැමති සේවකයා විසින් කාමරයක් වෙන් කිරීමේ ක්‍රියාවකට සම්බන්ධ වූ බවත් එම කාමර වෙන් කිරීම සිදු කළ ස්ථානයේ CCTV කැමරා දර්ශන මඟින් ආවරණය වන බවත් පවසා පෙර අවස්ථාවක පැ.88 (29) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය සාක්ෂිකරුට විවෘත අධිකරණයේදී දර්ශනය කිරීමට ඉඩ සලස්වා ඇති අතර එයට අනුව 2019.04.20 දින රාත්‍රී 19.09.17 ට තමා සහ රවීන්ද්‍ර තංගයියා නැමැත්තා තමාලා ඉදිරියට පැමිණි අමුත්තකු කාමර විමසීම කළ පසු එම තැනැත්තාගෙන් හැඳුනුම්පත ඉල්ලා සිට එය පරීක්ෂා කරන ආකාරය CCTV දර්ශනයේ දිස්වන බවත් එම හැඳුනුම්පත ස්කෑන් යන්ත්‍රයට දමා ස්කෑන් කිරීමට තමාලාට නොහැකි බැවින් තමාලා එය

මැනුවල් ඇප් එකකින් සිස්ටම් එකට ඇතුළත් කිරීම කළ බවත් එම පුද්ගලයාට කාමර අංක 425 වෙන් කර දුන් බවත් එය වෙන් කරවා ගත්තේ 2019.04.20 දින රාත්‍රියට පමණක් බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, එම තැනැත්තාගෙන් මුදල් ලබාගෙන පෙෝමා ඉන්වොයිස් එකක් කවුන්ට්‍රයෙන් ලැබූ පසු අදාළ කාමරය බුක් කළ තැනැත්තා එම ඉන්වොයිස් එක කවුන්ට්‍රයේ දමා ගොස් තිබූ නිසා තමා ඔහුට එය භාර දීමට ගමන් කරන ආකාරයක් CCTV දර්ශනයෙහි දිස්වෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරු පැවසු පරිදි කාමර අංක 425 ට අදාළව 2019.04.20 දිනයේ තමාලා විසින් කාමරය වෙන් කිරීමට අදාළව සකස් කළ ගෙස්ට් රෙජිස්ට්‍රේෂන් සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති අතර එය පැ.97 ලෙස ලකුණු කර ඇත. එහි ඩිපාචර් ඩේට් ලෙස සඳහන් වන්නේ 2019.04.24 බවත් 2019.04.20 දිනට පසු දින සිදුවූ සිද්ධියෙන් පසු තමාලා එම කාමරය සම්බන්ධයෙන් සිස්ටම් චෙක් අවුට් කළේ නැති බවත් ඒ අනුව තමාලා එය 21 දිනටද 22 දිනටද ආදී වශයෙන් දීර්ඝ කරමින් සිටි බවත් තමාලා සිස්ටම් චෙක් අවුට් කළේ 2019.04.24 වන දින එනම් කාමරය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතුද අවසන් වීමෙන් පසුව බවට සඳහන් කර ඇත.

පැ.97 ලේඛනයට අනුව අදාළ අමුත්තාගේ නම මුබාරක් මොහොමඩ් අසාම් මොහොමඩ් බවත් එම තැනැත්තාගේ උපන් දිනය 1987.11.29

බවත් එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය 873340312V බවත් එය නිකුත් කර ඇති දිනය 2004.06.01 බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එයට අදාළ රෙසවේෂන් අංකය එනම් කාමර වෙන් කරවා ගැනීමේ අංකය 0002366177 බවත් අදාළ පැ.97 ලේඛනය මුද්‍රණය කර ඇත්තේ 2019.04.24 වන දින ෂලින්දා නැමැති සේවක කාන්තාව බවත් සාක්ෂිකරු පවසා ඇත.

අදාළ කාමර වෙන් කිරීම කළ අවස්ථාවේදී එය වෙන් කිරීම සඳහා පැමිණි තැනැත්තා විසින් රුපියල් හතලිස් දහසක් ගෙවා තිබෙන බවත් කාමරයට අදාළ ගාස්තුව වන්නේ රුපියල් 34, 492.23 ක් බවත් ඒ අනුව ඉතිරි රු.5507.77 ක මුදල ඩිපොසිට් චෙක් වශයෙන් තබා තිබෙන බවත් පවසා අදාළ මුදල් ගෙවීමේ රිසිට් පත හඳුනාගෙන පැ.98 ලෙස ලකුණු කර ඇත.

එම ලේඛනය ද 2019.04.24 මරියෝ කාහිල් නැමැත්තා විසින් මුද්‍රණය කර ඇති බවත් එයට අනුව පැමිණීමේ දිනය 2019.04.20 බවත් වේලාව රාත්‍රී 19.16.40 බවත් ඩිපාචර් වශයෙන් 2019.04.24 දින දවල් 12.00 ලෙස සඳහන් වී ඇති බව සැබැවින්ම එම තැනැත්තා එදින ඇත්තටම පිටව ගියාද යන්න තමාට අවබෝධයක් නැති බවත් බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසුව තමා 22 දින සේවයට වාර්තා කළ බවත් තමාට 2019.04.20 දින කාමර අංක 425 හි නැවතී සිටි පුද්ගලයා සම්බන්ධයෙන්

තමා කිසිම දෙයක් දැනගෙන සිටියේ නැති බවත් එම තැනැත්තා එම සිද්ධියට සම්බන්ධ බවට තමා සේවයට පැමිණි පසු දැනගැනීමට ලැබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.20 දින කාමරයට පැමිණි අමුත්තා හට කාමරයෙන් පිටව යන අවස්ථාවේදී ලබා දෙන එකවුන්ට් ක්ලෝස් කර නිකුත් කරන ලේඛනයක් භාර දීමක් කළාද යන්න තමාට අවබෝධයක් නැති බවත් ගෙස්ට් රෙජිස්ට්‍රේෂන් එනම් පැ.97 ලේඛනයට අනුව එක් අමුත්තෙකුට පමණක් කාමරය වෙන් කර ඇති බව කියන දුරකථන අංකය +94765719429 බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, අදාළ බුක් කරන ලද කාමරයේ යතුර ඇරෙන්නේ නැතිව යම් සිද්ධියක් සිදුවී ආපසු එම කාමරය තම සහෝදර සේවකයෙක් වන කසුන් කුලරත්න විසින් ඇරලා දුන් බවට තමාට මතකයක් තිබෙන බවත් එම තැනැත්තා මේ වනවිට විදේශගතව කැනඩා රාජ්‍යයේ සේවය කරන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අමුත්තන්ගේ යතුර නිසිපරිදි ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී හෝ ගෙස්ට්ගේ යතුර නැති කරගෙන ඇති අවස්ථාවලදී තමාලා එලෙස මාස්ටර් කී යවා දොර ඇරීම සිදු කරන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.88 (32) දරන CCTV දර්ශන නරඹමින් සාක්ෂිකරු එහි දිස්වන ආකාරයෙන් 2019.04.20 දින රාත්‍රී 19.32

ට අදාළ කාමරය විවෘත කිරීම සිදු කරන ආකාරය පෙන්නුම් කරන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.20 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයෙහි කාමර අංක 425 වෙන් කරවා ගැනීමේ ක්‍රියාවක් එදින රාත්‍රී 7.00ට පසුව සිදුවී ඇති අතර එම අවස්ථාවේදී එම කාමරය වෙන් කරවා ඇත්තේ 2019.04.20 දිනට පමණක් බවට පෙනී යන අතර එම කාමරය වෙන් කරවා ගැනීම සඳහා භෞතිකව පැමිණ සිටින තැනැත්තාගේ විද්‍යුත් අත්සනද සාක්ෂිකරු විසින් ලබා ගෙන ඇති අතර කාමරය වෙන් කරවා ගැනීම එදින රාත්‍රී 19.09.17 ට සිදුකර ඇති අතර ඒ සඳහා මුදල් රු.40, 000/. ක් ද ගෙවීමක් සිදු කර ඇති ආකාරය පැහැදිලි වේ.

තවද එම අංක 425 දරන කාමරය වෙන් කිරීමේ ක්‍රියාව සිදු කර ඇති 2019.04.20 දින රාත්‍රී 07.00ට පමණ පැමිණ ඇති තැනැත්තා විසින් අමුත්තාගේ නම ලෙස මුබාරක් මොහොමඩ් අසාම් මොහොමඩ් යන නම සඳහන් ජාතික හැඳුනුම්පත් අංක 873340312V යන අංකය දරන තැනැත්තා වෙනුවෙන් බව පෙනී යන අතර ඒ බවට පැ.97 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙන් මනාව පෙනී යයි.

පැ.97 ලේඛනයට අනුව කාමර අංක 425 හි 2019.04.20 දින රාත්‍රියේ සිට ඇති තැනැත්තා ජංගම දුරකථන අංකය ලෙස +94765719429 ලෙස සඳහන් කර ඇති බැවින් එම ජංගම දුරකථනය සැබැවින්ම කවරෙකු වෙනුවෙන් නිකුත් කර ඇති ජංගම දුරකථනයක්ද යන්න සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ සාක්ෂි මඟින් ඔප්පු කිරීම කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින්ද 2019.04.21 දින පෙරවරුවේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් ආපන ශාලාවේ සිදුවූ ස්වයංසාතක බෝම්බ පිපිරීමට අදාළ පුද්ගලයා 2019.04.20 දින රාත්‍රියේ නවාතැන් ගෙන සිට ඇත්තේ මෙම සාක්ෂිකරු විසින්ද පවසා ඇති පරිදි කාමර අංක 425 තුළ බවට අධිකරණයට පැහැදිලිව කරුණු පෙනී යයි. අප විසින් පෙරද සඳහන් කර ඇති පරිදි කාමර අංක 425 හි එලෙස සිට ඇති පුද්ගලයාගේ සැබෑ අනන්‍යතාවය අධිකරණය ඉදිරියේ ඔප්පු කළ යුත්තේ පැමිණිල්ල විසින්ම වේ.

පැ.සා.1128 බ්‍රයන් සංජය කුමාර යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2013 සිට 2019 දක්වා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ෆ්‍රන්ට් ඔෆිස් ඩිපාර්ට්මන්ට් එකේ ප්‍රධානියා ලෙස සේවය කළ බවත් පවසා ඇති අතර 2019.04.21 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ප්‍රධාන අවන්හල වන තැප්ප්‍රොබේන් අවන්හලේ බෝම්බයක් පුපුරා හෝටලයේ නේවාසිකව සිටි

අමුත්තන් සහ එසේම, හෝටලයේ සේවක මණ්ඩලයේ අය මියගිය බවත් පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.93 ලෙස ලකුණු කර ඇති ලේඛනය එනම් තුවාලකරුවන් සම්බන්ධ නාම ලේඛනය සාක්ෂිකරුට පෙන්වා දෙමින් එම ලේඛනයේම මෙම සාක්ෂිකරුගේ අත්සන තිබෙන ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සාක්ෂිකරු විසින් තම අත්සන හඳුනාගෙන එය පැ.102 ලෙස ලකුණු කර ඇති අතර එම සිද්ධියේදී මියගිය හා තුවාල ලැබූ අය සම්බන්ධයෙන් තොරතුරු තමාලා සිස්ටම් එකෙන් රිපෝට් එකක් ලෙස ලබාගෙන තමාලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් බවට පවසා එම තොරතුරු ඇතුළත් ලේඛනය පැ.103 ලෙස ලකුණු කර ඇත.

එම පැ.103 ලේඛනයට අනුව රෝහල්ගත කළ තැනැත්තන්ගේ නම් ලැයිස්තුවේ අංක 01 ලෙස කුරියාරා අයිරෝ යන නමක් සඳහන් වන බවත් එම වගුවේම පහළ සිට දෙවෙනියට වෙන්සි මේරි ඩෙකමේන් නාඩා යැයි නමක් සඳහන් වන බවත් ඇයව නවලෝක රෝහලෙන් සිංගප්පූරුවට යවා ඇති බවත් ඇයට කුමක් සිදුවුණා ද යන්න සම්බන්ධයෙන් ඉන්පසු තමා නොදන්නා බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, හෝටලයෙහි අමුත්තන් නොවන අමුත්තෙකුගේ හිතවතෙකු හෝ නෑයෙකු වන අයෙක් උදෑසන ආහාර ගැනීම සඳහා පැමිණ ඇති බවත් එම තැනැත්තා ද මෙම සිද්ධියෙන් ජීවිතක්ෂයට පත් වී ඇති බවටත්

සාක්ෂිකරු පවසා ඇත. ලැයිස්තුවේ සඳහන් වන්නේ හෝටලයෙහි නේවාසිකව නවාතැන් ගෙන සිටි පුද්ගලයන් සම්බන්ධ විස්තර පමණක් වන බැවින් හෝටලයේ සේවය කරන අයගේ පවුලේ කවුරු හරි බෝම්බය පිපිරුණු අවස්ථාවේදී අවන්හලට පැමිණ සිටියා ද යන්න තමාට පැවසීමට නොහැකි බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 13 වන චූදිත වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර අනිකුත් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. 13 චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ එක හරස් ප්‍රශ්නයක් පමණක් වන අතර පැ.93, පැ.102, පැ.103 ලේඛන තමා විසින් හදපු ලේඛන නොවන බවත් ඒවා මානව සම්පත් අංශයෙන් සහ ෆ්‍රන්ට් ඔෆිස් එකේ අමුත්තන්ගේ විස්තර වලින් හදපු ලිස්ට් එකක් බවටත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවන්නේ 2019.04.21 දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලේ සිදුවූ බෝම්බ පිපිරීම නිසා මියගිය පුද්ගලයන්ගෙන් හෝටලයේ නේවාසිකව සිට ඇති පුද්ගලයන්ට අදාළ විස්තර ඇතුළත් ලැයිස්තු තුනක් ඉදිරිපත් වීම සම්බන්ධයෙන් පමණක් වේ.

පැ.සා.1144 වැලිසරගේ ප්‍රභාෂ් මාලින්ද සිල්වා මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2023.07.17 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ

සේවයට බැඳුණු බවත් ඊට ප්‍රථමයෙන් ජෝන්ස් කීල්ස් සමූහ ව්‍යාපාරයට අයත් ක්‍රෙස්ට් කැට් ආයතනයේ සේවය කළ බවත් පවසා ඇත. එලෙස ක්‍රෙස්ට් කැට් වෙළෙඳ සංකීර්ණයේ වසර 17 ක් සේවය කළ බවත් පවසා ඇත. 2019 වසරේ තමා ක්‍රෙස්ට් කැට් ආයතනයේ ආරක්ෂක කළමණාකරු ලෙස සේවය කළ බවත් පවසා එම කාලයේ තමාට වෙනම ම කාර්යාලයක් පැවති බවත් එම කාර්යාලය තුළ CCTV පද්ධතිය තිබෙන බවත් බිත්තියට අල්ලා CCTV කැමරා 53 ක් තිබෙන බවත් එයට ප්‍රවේශ විය හැක්කේ මැනේජ්මන්ට් එකේ ඉහළ නිලධාරී සමූහයට සහ තමාට පමණක් බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීමකට අදාළව කෙසේ වුවත් තමාට දිනය නිශ්චිතව කියන්න බැරි බවත් 2019.04.19 වන දිනට අදාළ CCTV දර්ශන නැරඹීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණි බවත් ඔවුන් ඒවා නැරඹීමෙන් පසු එයට අදාළ දත්ත ඉල්ලා සිටි බවත් ඒ අනුව තමා ඔවුන් ඉල්ලා සිටි දර්ශන එයට අදාළ දත්ත ඔවුන්ට ලබා දීමත් බව පවසා පෙර අවස්ථාවක පැ.90 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන වාදනය කර ඔහුට නැරඹීමට ඉඩ ලබා දී ඇති අතර පැ.90 හි 2019.04.17 වන දින පස්වරු 13.23 ට අදාළ දර්ශන තිබෙන බවත් එය ප්‍රධාන දොරටුව එනම් ගාලු පාරට මුණලා තිබෙන ප්‍රධාන දොරටුව ආසන්න ස්ථානය පෙන්නුම් කරන බවත් එසේම, පැ.90 (3), පැ.90 (4) පැ.90 (5), පැ.90 (6), පැ. 90 (7), පැ.90 (8)

ලෙස ලකුණු කර ඇති සියලුම CCTV දර්ශනයන් 2019.04.17 වන දින පස්වරු 1.23 සිට පස්වරු 1.36 දක්වා දිවෙන දර්ශන බවට හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත.

පැ.සා.1108 කරුණාරත්න මොහොන්දිරම්ලාගේ චාමින්ද කරුණාරත්න යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා රියදුරෙකු ලෙස කටයුතු කරන බවත් තමාට CAW- 6664 දරන වැගන්-ආර් වර්ගයේ සුදු පාට රථයක් තිබුණ බවත් තමා එය 2019 වර්ෂයේ පික්මී ආයතනය සමඟ සම්බන්ධ වී ඇති භාවිතා කළ බවත් එම කාලයේ තමා එම පික්මී ආයතනය සමඟ සම්බන්ධ වූ දුරකථන අංකය 071-7877277 බවත් එම දුරකථනය තමාගේ නමින් ලියාපදිංචි කර තිබුණු බවත් තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය 770421357V බවත් පවසා ඇති අතර පැමිණිල්ලෙන් මෙම සාක්ෂිකරුගෙන් ඉහත කී ජංගම දුරකථනයට අදාළ දුරකථන විස්තර වාර්තාව පැ.104 ලෙස ලකුණු කර ඇති අතර 2019.04.17 වන දින සිට 2019.04.24 දින දක්වා වූ මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ විස්තර වාර්තාවක් ද මෙම සාක්ෂිකරු මඟින් පැ.105 ලෙස ලකුණු කර ඇත.

2019.04.20 දින රාත්‍රී තමා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය පිටිපස්සේ වාහන නැවැත්විය හැකි ප්‍රදේශයේ සිටි බවත් එලෙස සිටින විට තමාට

පික්මී ආයතනය හරහා කුලී ගමනක් යාමට ලැබුණු බවත් එය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිට ගල්කිස්සට යාමට බවත් එහි ගල්කිස්සේ කුමන ස්ථානයකට ද යන්න සම්බන්ධයෙන් විස්තර සඳහන්ව තිබුණේ නැති බවත් එම නිශ්චිත ස්ථානය පික්මී විස්තරයට වැටෙන්නේ අදාළ තැනැත්තාව තමාලා පික් කළාට පසුව බවත් සාක්ෂිකරු පවසා ඇති අතර කුලී ගමන යාමට අවශ්‍යය තැනැත්තා සමඟ තමා දුරකථනයෙන් කතා කළ බවත් එම තැනැත්තා පිරිමි තැනැත්තෙකු බවත් පැ.105 දුරකථන වාර්තාවට අනුව තමා එම කුලී ගමන යාමට ඇණවුම් කරන ලද තැනැත්තාට කතා කර ඇත්තේ රාත්‍රී 8.00ට බවත් තමා සමඟ එම පික්මී ඇප් එක හරහා සම්බන්ධ වූ දුරකථන අංකය 076-5719429 බවත් පැ.105 ලේඛනයේ පළමු පිටුවේ 20 වන තීරුවෙහි ඒ පිළිබඳව විස්තර සටහන්ව ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.88 34 ලෙස ලකුණු කර ඇති සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට අදාළ CCTV දර්ශන වාදනය කර පෙන්වා ඇති අතර එය නරඹමින් මෙම සාක්ෂිකරු එහි 2019.04.20 රාත්‍රී 20.12 ට මෙම සාක්ෂිකරුගේ වැගන්-ආර් වර්ගයේ CAW-6664 දරන වාහනය තිබෙන ආකාරය සහ එයට තමා සමඟ කුලී ගමන යාමට ඇණවුම කරන ලද තැනැත්තා වාහනයට නගින ආකාරය පෙන්නුම් කරන බවත් එලෙස කුලී ගමන යාමට තමාගේ වාහනයට නැග්ග තැනැත්තා ශ්‍රී ලාංකික තැනැත්තෙකු බවත් එම තැනැත්තා ඔහුට යායුතු තැන ටෙම්පල්ස් රෝඩ්

එකේ ස්පෑන් ටවර් එක ගාවට බවට තමාට දැනුම් දුන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එදින තමා එම කුලී ගමන ගියාට පසුව වෙනත් කුලී ගමනක් ගියාද යන්න තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරු සමග සම්බන්ධ වූ කුලී ගමන යාම සඳහා ඇණවුම් කරන ලද ජංගම දුරකථන අංක 076-5719429 දරන ජංගම දුරකථනයට අදාළ 2019.04.20 සිට 2019.04.21 දක්වා වූ දුරකථන විස්තර වාර්තාව ඔප්පු කිරීමේ භාරයට යටත්ව පැ.106 ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරු සමඟ කුලී ගමන ගිය තැනැත්තාගේ අතේ කම්පියුටරයක් වැනි යමක් තිබුණු බවත් තමාට හරියටම මතක නැති බව සාක්ෂිකරු පවසා ඇති අතර තමා එම සිද්ධිය සම්බන්ධයෙන් තමාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමාට ඡායාරූපයක් පෙන්වා සිටි බවත් එම ඡායාරූපයේ එහි තමා සමඟ ගල්කිස්ස ස්පෑන් ටවර් එක ළඟට කුලී ගමන ගිය තැනැත්තා සිටින බව තමා හඳුනාගත් බවට පවසා ඇති අතර එම ඡායාරූපය මෙම සාක්ෂිකරුට අධිකරණයේදී පෙන්වා එය පැ.107 ලෙස ලකුණුකර ඇති අතර මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශය ලබාදුන් අවස්ථාවේද එම පැ.107 ඡායාරූපය මත ඔහුගේ අත්සන යොදා ඇති බවටද හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇති අතර ඒ අනුව පැ.107 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයෙහි සිටින තැනැත්තා 2019.04.20 දින රාත්‍රී 8 ට පමණ කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිට මෙම සාක්ෂිකරුට ජංගම දුරකථන අංක 076-5719429 දරන අංකයෙන් කතා කර කුලී ගමනක් ඇණවුම් කර එකී සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිට ගල්කිස්සේ ස්පෑන් ටවර් ආයතනය අසලට ගොස් ඇති කරුණ කිසිදු හඬයකින් තොරව අධිකරණය ඉදිරියේ සනාථ වී ඇති අතර පැ.106 දරන දුරකථන විස්තර වාර්තාවට අදාළ ජංගම දුරකථන අංක 076-5719429 දරන ජංගම දුරකථනය හිමි තැනැත්තා සැබැවින්ම කවරෙක්ද යන්න එම තැනැත්තාගේ අනන්‍යතාවය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම වේ.

පැ.සා.2196 චමිලා දිනූෂා ද සොයිසා සිරිවර්ධන යන සාක්ෂිකාරිය සාක්ෂි ලබා දෙමින් ඇය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ වසර 17 ක් තිස්සේ සේවය කරන ලද බවත් 2019 වසරේ ඇය ෆ්‍රන්ට් ඔෆිස් සුපවයිසර් ලෙස සේවය කළ බවත් පාස්කු ප්‍රහාරය සිදුවූ දිනට දින 04 කට ප්‍රථමයෙන් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය තැනැත්තා බෝම්බ පිපිරූ දිනට දින 04 කට ප්‍රථමයෙන් හෝටලයට පැමිණ තමා ෆ්‍රන්ට් ඔෆිස් එකේ සිටියදී තමා සමඟ කතා කර රූම්ස් සර්විස් ගැන සහ වෙකින් වෙන්නේ කොහොමද යන කරුණු සහ රූම් එකේ වීවි එක ගැන

කරුණු තමාගෙන් ඇසූ බවත් තමා එම සිද්ධිය හෝටලයේ සිකියුරිටි මැනේජර්ට පාස්කු ප්‍රහාර සිද්ධියෙන් පසුව දැනුම් දුන් බවත් පවසා ඇති අතර 21 වෙනිදා බෝම්බ ප්‍රහාර සිද්ධියෙන් පසුව තමා ෆ්‍රන්ට් ඔෆිස් එකේ සිටි යාළුවන් සමඟ මෙම සිද්ධිය ගැන කතා බහ කරන ලද බවත් එසේම, බෝම්බ පිපිරීමේ සිද්ධියට දින 04 කට පෙර සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට පැමිණ තමා සමඟ කතා කළ තැනැත්තා සියදිවි නසා ගෙන මියගිය තැනැත්තා බවට මාධ්‍යවලින් එම තැනැත්තාගේ පින්තූරය දැකීමේදී තමා දැනගත් බවත් තමා සමඟ එම තැනැත්තා කතා කළ අප්‍රේල් මස 17 වෙනි දිනට අදාළව CCTV දර්ශන තිබෙන බවත් පවසා පෙර අවස්ථාවක පැ.88 (21) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන නරඹමින් 2019.04.17 දින පැය 13.14 ට සහ 13.29 ට අදාළ CCTV දර්ශන නරඹමින් එහි තමා සිටින ආකාරයත් තමා සමඟ එදින හෝටලයේ කාමරයක් වෙන් කිරීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කළ එසේම, බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ බවට ජනමාධ්‍ය තුළින් තමා දුටු ඡායරූපයේ සිටින තැනැත්තා එම තැනැත්තාම බවට නිශ්චිතවම හඳුනාගෙන ඇය සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකාරියගෙන්ද සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇති අතර ඒ අනුව ඇගේ සාක්ෂිය කිසිදු අභියෝගයකට ලක් වීමක් නොමැතිව ඉදිරිපත් වී ඇත. ඇගේ සාක්ෂියට අනුව 2019.04.17 වන දින පස්වරු 1.14 ට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ අමුත්තන් පිළිගන්නා ස්ථානයේදී හෝටලයෙහි කාමරයක්

වෙන් කිරීම කළහැකි ආකාරය පිළිබඳව ඇය සමඟ කරුණු සාකච්ඡා කර ඇති තැනැත්තාම 2019.04.21 දින එම හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලෙහි බෝම්බ පිපිරීම සිදු කර ඇති ස්වයංඝාතක බෝම්බකරු බවට මැනවින් පෙනී යයි.

පැ.සා.1430 ඇල්විටිගලගේ දොන් සුදර්ශන් ධර්මරාජ් පෙරේරා යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2006 වසරේ සිට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට අනුයුක්තව සේවය කරන බවත් 2019 වර්ෂය වනවිට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ප්‍රධාන ඉංජිනේරු ලෙස කටයුතු කළ බවත් 2019.04.21 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හලේ සිදුවූ බෝම්බ පිපිරීම නිසා හෝටලයේ දෛනික කටයුතු අඩාල වී යලි අලුත්වැඩියා කර යලි සේවා කටයුතු ආරම්භ කිරීමට විශාල කාලයක් ගත වුණ බවත් බෝම්බ පිපිරීම හේතුකොටගෙන හෝටලයට භෞතිකව සිදුවුණු හානිය සහ ව්‍යාපාර කටයුතු ඇණහිටීම නිසා සිදුවුණ හානිය සම්බන්ධයෙන් යම් තක්සේරුවක් කිරීමක් සිදුවුණ බවත් හෝටලයේ සැකැස්මට සිදුවුණ හානිය සම්බන්ධයෙන් තක්සේරු කිරීමේදී තමාද එයට දායක වුණ බවත් තමා මුල් අවස්ථාවේදී ගණනය කළ ඇස්තමේන්තුවක් ලබාදුන් පසු තමා ඒ සම්බන්ධයෙන් සහතික කරන ලද වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් බව සහ එම වාර්තාව පැ.108 ලෙසත්, එයට අදාළ කෙටි වාර්තාව පැ.108 (1) ලෙසත් ලකුණු කර ඇති අතර එම ලේඛනවලට අනුව මෙම සාක්ෂිකරු විසින් තක්සේරු

කිරීමට දායක වුනු හෝටලයේ සැකැස්මට සිදු වු හානිය නිසා සිදුවුණ පාඩුව මිලියන 228.8 බවට සාක්ෂිකරු සඳහන් කර ඇති අතර එම ගණනය කිරීම තුළ දෛනික ව්‍යාපාර කටයුතු ඇණහිටීම නිසා හෝටලයට සිදුවු හානිය ඇතුළත් වී නොමැති බවට සඳහන් කර ඇති අතර මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කරන ලද ඉහත කී ලේඛන දෙක ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කරන ලද ලේඛන වේ.

මෙම සාක්ෂිකරුගෙන් 1, 10, 13, 22, 24 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති අතර අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමා මඟින් ඉදිරිපත් කරන ලද වාර්තාවන්ට අදාළව වෘත්තිය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු වන මහින්ද ගුණසේකර යන අය විසින් එය සහතික කර තිබෙන බවත් අවසාන වාර්තාව සකස් කර ඉදිරිපත් කළේ මහින්ද ගුණසේකර මහතා විසින් බවත් පවසා ඇත. එසේම, අධිකරණයේ ඉදිරිපත් කළ වාර්තාවන් දෙක සකස් කළේ තමා නොවන බවට කළ යෝජනාවද සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහුගෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇත්තේ බෝම්බ පිපිරීම නිසා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සැකැස්මට සිදුවී ඇති පාඩුව ගණනය කිරීම සම්බන්ධයෙන් පමණක් වන අතර මෙම සාක්ෂිකරුම පවසා ඇති පරිදි එම ලේඛන සකස් කර ඇත්තේ

තක්සේරුකරුවෙකු වන මහින්ද ගුණසේකර නැමැත්තා විසින් වේ. එසේම, මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කරන ලද ලේඛන වන පැ.108 සහ පැ.108 (1) ලෙස ලකුණු කර ඇති ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කර ඇති ලේඛන වන බැවින් ඒවා ඔප්පු කිරීමේ භාරය පැමිණිල්ල මතම පැවරේ.

පැ.සා.1102 මධුරාවලගේ චාමර සුසන්ත මධුරාවල නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු ව්‍යාපාර කටයුතු සහ රියදුරෙකු ලෙස කටයුතු කිරීමද කරන ලද බවත් 2019 වසරේදී රියදුරෙකු වශයෙන්ද කටයුතු කළ බවත් කටුනායක ගුවන් තොටුපොළේ KY-9673 දරන සුදු පාට හොන්ඩා-ෆික්ස් වර්ගයේ වාහනයේ තමා රියදුරු ලෙස කටයුතු කළ බවත් එලෙස තමා 2019.04.19 දින කටුනායක ගුවන් තොටුපොළෙහි පැමිණීමේ පර්යන්තය පැත්තේ සිටියදී පුද්ගලයෙක් පිටත්වීමේ පැත්තේ සිට තමා සිටි දෙසට පැමිණි බවත් එම තැනැත්තා ටැක්සි එකක් ගන්න පුළුවන්ද යැයි කතා කළ බවත් එයට අදාළ ගණන රු.2700.00 ක් යැයි තමා පැවසූ විට එම තැනැත්තා තමාට ‘‘පික්මී උබර් නම් ගොඩක් අඩුයි 2200 නේද’’ යැයි තමාගෙන් ඇසූ බවත් එම තැනැත්තා එම අවස්ථාවේදී ඇදගෙන යා හැකි ට්‍රැවලින් බෑග් එකක්ද රැගෙන ආ බවත් ඔහු ෂර්ට් එකක් යට කර ඇඳ සිටි බවත් එය සුදට හුරු ෂර්ට් එකක් බවත් ඉරි වගේ තිබුණු බවටත් තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඉන්පසු තම සමඟ එම තැනැත්තා කුලී ගමන යාමට පිටත් වුණ බවත් තමා සමඟ ඔහු

පිටකොටුවට ඒමට පැමිණීමේදී ඔහු තමා සමඟ මගට එද්දී කතා කළේ නැති බවත් ඔහු කිසිවෙකුට හෝ කෝල් කරමින් සිටි බවත් එලෙස කෝල් කළේ සිංහල භාෂාවෙන් නොවන බවත් එම තැනැත්තා මුස්ලිම් යැයි තමාට හිතුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඒ අනුව තමා ඔහු සමඟ එම කුලී ගමන ගියේ වේලාව 3.30ට 4.30ට පමණ බවත් පිටකොටුවට යාම සඳහා හයර් එක ගියද හයිවේ එක පසු වූ පසු පිටකොටුවට යන්න ඕනා නැහැ තමාට දෙමටගොඩට යාමට අවශ්‍ය යැයි පැවසු බවත් ඒ අනුව තමා දෙමටගොඩ පාළමට මෙහා තැනින් වමට හැරී ඇතුළට ගිය බවත් එලෙස ගියේ සුවිසල් නිවසක් ඉදිරියට ගිය බවත් පාරෙන් හැරී මීටර 300ක් 400ක් පමණ දුරකින් එම නිවස පිහිටි බවත් එය සුදු පාට ගෙයක් බවත් ඉන්පසු එම තැනැත්තා තමාට රු.3000 ක මුදලක් ලබා දී එම තැනැත්තා ගේ ඇතුළට ගිය බවත් තමා වාහනය එතනින්ම රිවස් කර හරවගෙන ආ බවත් පවසා සාක්ෂි ලබා දී ඇති අතර තමා එම හයර් එක ගිය දිනට පසු දින බෝම්බ ප්‍රහාර සිද්ධියක් සිදුවෙලා තිබන බවට දැනගන්නට ලැබුණු බවත් එය තමා දුටුවේ නිව්ස්වලින් බවත් මෙම සාක්ෂිකරුට පැ.89 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියේ අඩංගු දර්ශන කීපයක් විවෘත අධිකරණයේදී විකාශනය කර පෙන්වා දී ඇති අතර එහි ගුවන් තොටුපොළෙහි පිටවීමේ පර්යන්තය තිබෙන ස්ථානය සහ තමා තරමක් ඇතින් පැමිණීමේ පර්යන්තය තිබෙන ස්ථානයේ සිටින ආකාරයද එසේම, තමාගේ සාක්ෂියේදී පවසා සිටි පරිදි බෑග් එකක් ඇදගෙන ආපු තැනැත්තාව

එම CCTV දර්ශනවල සිටින බවට සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති අතර එහි සිටින තැනැත්තා තමා සමඟ කුලී ගමන ගිය තැනැත්තා බවට සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එසේම, ඔහුගේ සාක්ෂියේදී පවසා සිටි පරිදි දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි නිවසද සාක්ෂිකරු CCTV දර්ශනවලින් හඳුනාගෙන එය තට්ටු දෙකක හෝ තුනක සුවිසල් නිවසක් බවට පවසා සාක්ෂි ලබා දී ඇත.

එසේම, CCTV දර්ශනයක ඡායාරූපයක මුද්‍රිත පිටපතක් සාක්ෂිකරුට පෙන්වා ඇති අතර සාක්ෂිකරු එය හඳුනාගෙන එම ඡායාරූපය තිබෙන නිවසේ ගේට්ටුව ළඟ තමාගේ වාහනය නවත්වා තමා සමඟ කුලී ගමන ගිය තැනැත්තාව බැස්සවූ බවට සඳහන් කර ඇති අතර එම මුද්‍රිත පිටපත් ලේඛනය පැ.109 ලෙස ලකුණු කර ඇත. එදින කුලී ගමන ගොස් එම තැනැත්තාව බැස්සවීමෙන් පසුව තමා කිසිදු අවස්ථාවක එම තැනැත්තාව දුටුවේ නැති බවට සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවන්නේ 2019.04.19 දින 3.30ට 4.30ට කටුනායක ගුවන් තොටුපොළේ පැමිණීමේ පර්යන්තයේ සිට මෙම සාක්ෂිකරු සමඟ දෙමටගොඩ පිහිටි සුදු පැහැති සුවිශාල නිවසක් දක්වා හයර් එකක් ගොස් ඇත්තේ මෙම සාක්ෂිකරු විසින් හඳුනාගත්

පැ.109 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේ සඳහන් නිවස ඉදිරිපිටින් මෙම සාක්ෂිකරු සමඟ කුලී ගමන ගිය තැනැත්තා බැස එම නිවස තුළට යාමක් සිදු කර ඇති බව වන අතර මෙම සාක්ෂිකරු එම තැනැත්තාව එම කුලී ගමන යාමෙන් අනතුරුව කිසිදු අවස්ථාවක දැක නොමැති බැවින් එම තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳව මෙම සාක්ෂිකරුට පෞද්ගලිකව දැනීමක් තිබී නොමැත. මෙම සාක්ෂිකරු පැ.89 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන අඩංගු තැටිය වාදනය කිරීමේදී තමා සමඟ කටුනායක ගුවන් තොටුපොලේ සිට දෙමටගොඩ දක්වා හයර් එකක් පැමිණි තැනැත්තා එහි සිටින බවට මෙම සාක්ෂිකරු CCTV දර්ශන තුළින් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරු සමග හයර් එක පැමිණි තැනැත්තා ඇදගෙන යා හැකි ට්‍රැවලින් බෑග් එකක්ද රැගෙන කටුනායක ගුවන් තොටුපොළේ පැමිණීමේ පර්යන්තයේ තිබූ ස්ථානයේ සිට මෙලෙස මෙම සාක්ෂිකරු සමඟ දෙමටගොඩ පිහිටි සුදු පැහැති සුවිසල් නිවසක් දක්වා කුලී ගමන ගොස් ඇති බවද පැහැදිලි වේ. කෙසේ වුවද මෙම සාක්ෂිකරු සමඟ කුලී ගමන ගිය තැනැත්තා 2019.04.21 දින සිදුවූ බෝම්බ ප්‍රහාර මාලාවට සම්බන්ධ අයෙක් බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත.

පැ.සා.1103 මොහොමඩ් මොරිස් බුල්හි යන සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඔහු ද 2010 වසරේ සිට රියදුරෙකු ලෙස සේවය කළ බවත් 19 වෙනිදා දිනයක තමා විසින් ගමන් කළ කුලී ගමනක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමාගෙන් ප්‍රශ්න කිරීම් කළ බවත් එනම් 19 වෙනිදාට පසු දිනක ලංකාවේ හෝටල් කිහිපයක බෝම්බ පිපිරීම් සිදු වුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා 2019 වසරේ පාවිච්චි කළ ජංගම දුරකථන අංක 076-3029891 යන ජංගම දුරකථනය බවත් පවසා ඩයලොග් සමාගම විසින් නිකුත් කරන ලද දුරකථන විස්තර වාර්තාවක් මෙම සාක්ෂිකරුට පෙන්වන ලදුව එහි තමාගේ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් වී තිබෙන බවත් එම ජංගම දුරකථන සම්බන්ධතාවය කලින් තිබුණේ තමාගේ අම්මාගේ නමට බවත් පසුව එය තමාගේ නමට හැරවූ බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර එම ලේඛනය දුරකථන විස්තර වාර්තාව පැ.110 ලෙස ලකුණු කර ඇත.

එසේම, 2019.04.19 සිට 2019.04.21 දක්වා මෙම සාක්ෂිකරු විසින් භාවිතා කර ඇති ඉහත කී ජංගම දුරකථන අංකයට අදාළ විස්තර වාර්තාවක් පැ.111 ලෙස ලකුණු කර ඇති අතර සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා හයර් එක ගිය දිනයේ තමා පැලියගොඩට එනවිට උබර් හරහා කුලී ගමනක් යාමට ඇණවුමක් ලැබුණු බවත් එහි පිකප් ලොකේෂන් එක තමා පරික්ෂා කර බැලීමේදී එය මහවිල ගාර්ඩින්, දෙමටගොඩ, කොළඹ 10 ලෙස පෙන්නුම් කළ බවත් ඉන්පසු තමා එම ලෝකේෂන් එකට ගොස් එම

ඇණවුම ලැබුණු දුරකථන අංකයට කෝල් කළද එම ඇමතුම්වලට කිසිදු පිළිතුරක් ලැබුණේ නැති බවත් පසුව තමාට ඒ ෆෝන් එකට එම අයගෙන් ඇමතුමක් ලැබී එම ඇමතුම දුන් තැනැත්තා තමාට පවසා සිටියේ ''මගේ අදුරන එක්කෙනෙක්ට මම මේක බුක් කළේ එයා ඉන්නේ මහවිල ගාර්ඩින් තැන ඒ හරියේ පොඩි ළමයින්ගේ ග්‍රවුන්ඩ් එකක් තියෙනවා ඒ ග්‍රවුන්ඩ් එක ගාවට ගියොත් එයාව පික් කරගන්න පුළුවන්'' යැයි තමාට දැනුම් දුන් බවත් පසුව තමා එම ස්ථානයට කීප වරක්ම ගොස් බලා කෝල් කළද දුරකථන ඇමතුම්වලට පිළිතුරු ලැබුණේ නැති බවත් ඉන්පසු තමා එම ස්ථානයේ සිටින විට එක් පිරිමි පුද්ගලයෙකු පැමිණ තමාට සිංහල භාෂාවෙන් කතා කළ බවත් පසුව තමාට දෙමළ පුළුවන් බව එම තැනැත්තාට වැටහුණු බවත් ඉන්පසු එම තැනැත්තා තමා සමඟ දෙමළෙන් කතා කළ බවත් එම තැනැත්තාගේ අතේ බෑග් එකක් තිබ්බ බවත් එය කොම්පියුටර් වගේ බෑග් එකක් බවත් තමා එදින මහවිල ගාර්ඩින් දෙමටගොඩ නැමැති ස්ථානයට මෙම කුලී ගමන ගිය දිනයට පෙර තමා කිසිදු අවස්ථාවක එම ස්ථානයට කුලී ගමන් ගොස් නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ජංගම දුරකථන විස්තර වාර්තාවට අනුව තමා සමඟ එදින සම්බන්ධ වූ ජංගම දුරකථනයේ අංකය 077-5075441 බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

එසේම, එම දුරකථන විස්තර වාර්තාවට අනුව 2019.04.19 පැය 22:03:38 ට තමා මහවිල ගාර්ඩින් නැමැති ස්ථානයේ සිට ඇති බවට සඳහන් වී ඇති බවත් එසේම, 2019.04.19 දින පැය 22:13:53 ටද තමා සිට

තිබෙන්නේ මහවිල ගාර්ඩින්ස් නැමැති ස්ථානයේ බවත් ඒ අනුව 077-5075441 ජංගම දුරකථන අංකය සමග තමා සම්බන්ධ වූ සෑම වේලාවකම තමා සිට තිබෙන්නේ මහවිල ගාර්න්ඩ්ස් නැමැති ස්ථානයේ බවට සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.17 ලෙස ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කර ඇති දුරකථන විස්තර වාර්තාවක් පෙන්වා ඇති අතර එම ලේඛනයෙහි 21, 22, 23, 24, 25 යන තීරුවල සඳහන් විස්තරයන්ට අනුව තමා කුලී ගමන ගිය තැනැත්තාව මහවිල ගාර්න්ඩ්ස් වලින් පික් කර ඔහුව කොල්ලුපිටියේ ඩයින්මෝ එක ළඟින් බැස්ස බවත් එම ස්ථානයට තවත් තැනැත්තෙකු එම තැනැත්තාට කෝල් එකක් දී වාහනයකින් පැමිණි බවත් තමා සමග කුලී ගමන ගිය තැනැත්තා එම ස්ථානයේදී නැවත එම ස්ථානයට පැමිණි තැනැත්තා සමඟ කතා කළ බවත් එම පැමිණි තැනැත්තා තමා සමඟ කතා කළේ නැති බවත් එසේම, තමා සමග ඉහත පරිදි කුලී ගමන ගිය තැනැත්තා තමාට තවත් ගමන් කීපයක් යන්න තියෙනවා යැයි පවසා තමාට එම ස්ථානයේ ඉන්න යැයි පැවසුවද තමාට තවත් ජොබ් එකක් ආව නිසා තමා එම ස්ථානයෙන් පිටත් වී පැමිණි බවත් ඉන්පසුව කිසිදු අවස්ථාවක එම තැනැත්තාව යලි හමුවුනේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දීමේදී තමා විසින් ඡායාරූපයක සිටි පුද්ගලයෙකු හඳුනාගත් බවට පවසා ඇති අතර සාක්ෂිකරුට අපරාධ පරීක්ෂණ දොපර්තමේන්තු ගොනුවේ තිබූ ඡායාරූපයක් අධිකරණයේදී පරික්ෂාව සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේ එම ඡායාරූපයේ සිටින තැනැත්තා තමා සමඟ කුලී ගමන ගිය තැනැත්තාම බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම ඡායාරූපය පැ.112 ලෙස ලකුණු කර ඇත.

එම සාක්ෂිකරු කුලී ගමන යාමට අදාළ CCTV දර්ශන ඔහුට විවෘත අධිකරණයේදී නැරඹීමට ලබා දී ඇති අතර 2019.04.19 දිනට අදාළ CCTV දර්ශනවල මෙම සාක්ෂිකරුගේ වාහනයට නැග කුලී ගමන යාමට ගිය තැනැත්තා තමාගේ වාහනය ඉදිරිපස මගී අසුනට ගොඩවන ආකාරයක් එම දර්ශනයේ පෙනෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම දර්ශනය පැ.113 ලෙස ලකුණු කර ඇත. මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් පෙර අවස්ථාවක පැ.17 ලෙස ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කර ඇති, ජංගම දුරකථන අංක 077-5075441 දරන ජංගම දුරකථනය හිමි තැනැත්තා 2019.04.19 වන දින රාත්‍රියේ මෙම සාක්ෂිකරු

සමඟ මහවිල ගාර්ඩන්ස් නැමැති ස්ථානයේ සිට කොල්ලුපිටියේ ඩයින්මෝ ආයතනය දක්වා කුලී ගමනක් ගොස් ඇති බව වේ. කෙසේ වෙතත් ඉහත කී ජංගම දුරකථන අංක 077-5075441 යන අංකය භාවිතා කර ඇති තැනැත්තා කවරෙක්ද යන්න එම තැනැත්තාගේ අනන්‍යතාවය අධිකරණය ඉදිරියේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ පැමිණිල්ල විසින්ම වේ.

පැ.සා.1109 දිසානායකලාගේ උෂාන් මධුශංක රාජපක්ෂ යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ගල්කිස්සේ ශාන්ත මරියා පාරේ වාසය කරන බවත් 2019 වසරේ ඔහුට අයත් CBB-8175 දරන නිල් පාට වැගන් - ආර් වාහනයේ රියදුරු ලෙස කටයුතු කරමින් කුලී ගමන් යාම සිදු කළ බවත් පවසා ඇති අතර ඔහු 2019 වසරේ 075-68191730 සහ 077-4300208 යන දුරකථන අංක දෙක පාවිච්චි කළ බවත් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංක 9601300553V බවට පවසා පෙර අවස්ථාවක පැ.110 ලෙස ලකුණු කර ඇති ලේඛනය හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරුගේ අංක 077-4300208 දරන ජංගම දුරකථනයට අදාළව 2019.04.16 සිට 2019.04.30 දිනට අදාළ දුරකථන විස්තර වාර්තාව පැ.114 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට 2019.04.21 දින ගල්කිස්සේ සිට සිනමන් හෝටලයට කුලී ගමනක් යාමට ඇණවුමක් ලැබුණු බවත් තමාට

කතා කළ තැනැත්තා සිංහල භාෂාවෙන් කතා කර එහි දමා තිබෙන ලොකේෂන් එකට එන්න යැයි පැවසූ බවත් පික්මී ඇප් එකේ දර්ශනය වූ ලොකේෂන් එක ගල්කිස්සේ ස්පෑන් ටවර් එක බවත් ඉන්පසු තමා එම ස්ථානයට ගොස් කුලී ගමන ඉල්ලුම් කළ පුද්ගලයාට දුරකථන ඇමතුමක් ලබා දී තමා ඇවිත් තිබෙන බව පැවසූ බවත් ඉන්පසු විනාඩි 10 කට 12කට පමණ පසු පුද්ගලයන් දෙදෙනෙක් ලැගේජ් දෙකක් රැගෙන ආ බවත් එම ලැගේජ් දෙක එක සමාන බවත් ඔවුන් දෙදෙනා තරුණ පිරිමි පුද්ගලයන් දෙදෙනෙක් බවට පවසා ඇත. ඔවුන් ටී ෂර්ට්, ඩෙනිම් ඇදගෙන සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

ස්පෑන් ටවර් යැයි තමා පවසපු තැන නිවාස කුලියට දෙන එපාට්මන්ට් එකක් බවත් තමාට 2019.04.21 දිනට පෙර කිසිදු දිනයක තමාට එම ස්ථානයට හයර් යාමට ලැබුණේ නැති බවත් පවසා ඇත. වැඩිදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ එම පැමිණි පුද්ගලයන් දෙදෙනා රැගෙන ආ ගමන් බෑග්වල උස අඩි 2ක් පමණ බවත් ඒවා ඔවුන් විසින් තමාගේ වාහනයට ඩිකියට ඇතුළු කළ බවත් ඒවා තමාට අල්ලන්නට එපා යැයි පැවසූ බවත් ඉන්පසු සිනමන් හෝටලයට යාමට පැවසූ බවත් ඉන්පසු තමා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට ගිය පසු එක් අයෙක් ලැගේජ් එකක් අරගෙන බැස්ස බවත් ඉන්පසු තමාට ටාජ් හෝටලයට යාමට අනිත් තැනැත්තා දැනුම් දුන් පසු එලෙස ගිය බවත් ටාජ් හෝටලයේ දී අනිත් තැනැත්තා බැස බෑග් එකද රැගෙන ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019.04.21 දින උදෑසන 6.50 ට අදාළ CCTV දර්ශන නරඹමින් සාක්ෂිකරු එහි තමා පැවසූ පුද්ගලයන් සිටින බව පවසා ඔවුන් රැගෙන පැමිණි ලැගේජ් තිබෙන බවට හඳුනාගෙන ඇති අතර CCTV දර්ශනයන් පැ.115 ලෙස ලකුණු කර ඇති අතර පැ.88 (9) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයද අධිකරණයේදී විකාශනය කිරීමේදී එහි තමාගේ CBD-8175 දරන වාහනය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ලොබි එකට යන ආකාරය පෙනීමට තිබෙන බව පවසා ඇති අතර එසේම, ටාජ් හෝටලයේ මේන් එන්ට්‍රන්ස් එකට ඇතුළු වන ස්ථානයට අදාළ CCTV දර්ශනද මෙම සාක්ෂිකරුට නැරඹීම සඳහා විවෘත අධිකරණයේ වාදනයක කර ඇති අතර එම CCTV දර්ශනයෙහි තමා ටාජ් හෝටලයට ගෙන ගොස් බස්සන ලද තැනැත්තා හඳුනාගෙන ඇත. අදාළ CCTV දර්ශනය පැ.116 ලෙස ලකුණු කර ඇති අතර එසේම, CCTV දර්ශන තවදුරටත් නරඹමින් එම පුද්ගලයා තමාට මුදල් ගෙවන ආකාරයද දර්ශනය වන බවත් සාක්ෂිකරු පවසා ඇත. එම දසුනට අදාළ CCTV දර්ශනය පැ.117 ලෙස ලකුණු මෙම සාක්ෂිකරුගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රකාශයක් සටහන් කරගත් අවස්ථාවේදී පැ.117 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයේ පෙන්නුම් කරන පුද්ගලයාගේ ඡායාරූපයක්ද තමාට ලබා දුන් බවත් එහිදී එම තැනැත්තාව තමා හඳුනාගත් බවට පවසා එම ලේඛනයේ තමා විසින් අත්සනක්ද තැබූ බවට පවසා සාක්ෂි ලබා දී ඇති අතර ඒ අනුව එම ලේඛනය පැ.118 ලෙස ලකුණු කර ඇත.

පෙර අවස්ථාවක පැ.95 ලෙස ලකුණු කර ඇති නඩු භාණ්ඩය වන බෑග් එක සාක්ෂිකරුට පෙන්වා පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති අතර සාක්ෂිකරු එය හඳුනාගෙන එම බෑගය හා සමාන බෑග් දෙකක් තමා සමග හයර් එක පැමිණි පුද්ගලයන් රැගෙන ආ බව අධිකරණයේ දී හඳුනාගත් පැ.95 දරන බෑගය ඉන් බෑගයක් බවට හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

පෙර අවස්ථාවක පැ.114 ලෙස ලකුණු කර ඇති දුරකථන විස්තර වාර්තාව යලි පරීක්ෂා කරමින් 2019.04.21 දින උදෑසන 6.06 ට තමාට තමා සම්බන්ධ වූ දුරකථන අංකය එහි 56 තීරුවේ පෙනෙන බවත් එය 076-5719429 බවත් පවසා සාක්ෂිකරු එය හඳුනාගෙන ඇති අතර සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.106 ලෙස ලකුණු කර ඇති දුරකථන විස්තර වාර්තාවද පරීක්ෂාව සඳහා ලබා දී ඇති අතර පැ.106 දුරකථන විස්තර වාර්තාවේ දැක්වෙන දින සහ වේලාවන් පැ.114 ලෙස ලකුණු කර ඇති මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ කුළුණු වාර්තාවේ සඳහන් දින සහ වේලාවන් සම්බන්ධයෙන් ගැලපෙන බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු හරස් ප්‍රශ්නයක් ඇසීමට නොමැති බවට සියලුම චූදිතයන් වෙනුවෙන් අධිකරණයට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ පැ.88 (9), පැ.88 (10), මෙන්ම පැ.116 යන CCTV දර්ශනවල සිටින පුද්ගලයන්

දෙදෙනා 2019.04.21 දින තමා සමග ගල්කිස්සේ ටෙම්ප්ල්ස් පාරේ පිහිටි ස්පෑන් ටවර් එපාර්මන්ට් නැමැති ස්ථානයේ සිට පික්මී සම්බන්ධතාවය ඔස්සේ මෙම සාක්ෂිකරු සමඟ කොළඹ ෂැංග්‍රිලා හෝටලයට සහ තවත් එක් අයෙක් ටාජ් සමුද්‍රා හෝටලයට ගමන් කර ඇති ආකාරය සහ ඔවුන් දෙදෙනාම එකම ආකාරයේ අඩි 2 ක් පමණ උස ගමන් මළු දෙකක්ද මෙම සාක්ෂිකරුගේ වාහනයේ ඩිකියේ දමා රැගෙන ඇවිත් ඇති ආකාරය සහ එම බෑග් රැගෙන පැමිණි පුද්ගලයන් දෙදෙනා මෙම සාක්ෂිකරුට එම බෑග් දෙක මෙම සාක්ෂිකරුගේ ඩිකියට දැමීමට හෝ ඇල්ලීමට හෝ ඉඩ ලබා දී නොමැති බවයි.

පෙර අවස්ථාවක පැ.95 ලෙස ලකුණු කර ඇති බෑගය ඉන් එක් බෑගයක් බවට මෙම සාක්ෂිකරු එය නිශ්චිතවම හඳුනාගෙන ඇති පසුබිම තුළ සහ පෙර අවස්ථාවක මෙම අධිකරණයේ සාක්ෂි ලබාදුන් පැ.සා.1110 අලුත්ගමගේ සමන්ත නැමැති සාක්ෂිකරු එනම් 2019.04.21 දිනයේ වනවිට සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ එදින උදෑසන 6.30 ට වාහනයකින් පැමිණ බැස ට්‍රැවලින් බෑග් එකක්ද රැගෙන පුද්ගලයෙකු පැමිණීම සහ එම තැනැත්තා තමාට බෑග් එක අල්ලන්නට නොදී රැගෙන යාමට නොදී එම තැනැත්තා විසින්ම එය හෝටලයට තුළට රැගෙන යාම සිදු කර ඇති බව සහ එම අවස්ථාවේ ඔහු කාමර අංක 425හි ඒ වන විටත් නැවතී සිටින අයෙකු බවට සඳහන් කර තිබීම තුළින් සහ එම තැනැත්තා රැගෙන එන ලද බෑගය පැ.95 ලෙස ලකුණු කිරීමක් කර ඇති පසුබිම තුළ ගල්කිස්සේ

ස්පෑන් ටවර් නැමැති ස්ථානයේ සිට 2019.04.21 දින පැ.සා.1109 උෂාන් මධුශංක රාජපක්ෂ යන අයගේ වාහනයෙන් ගල්කිස්සේ ස්පෑන් ටවර් නැමැති ස්ථානයේ සිට කොළඹ ෂැංග්‍රිලා හෝටලයට පැමිණ ඉන්පසු එම වාහනයෙන් බැස බෑගය කිසිවෙකුට අල්ලන්නට නොදී හෝටලයේ කාමර අංක 425 තුළට ගොස් ඇති තැනැත්තා එකම පුද්ගලයා බවට මැනවින් පෙනී යයි.

පැ.සා.1058 වැල්ලගේ සමීරද සිල්වා යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් 2007 වසරේදී සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට සාමාන්‍ය සේවකයෙකු ලෙස සම්බන්ධ වී 2019 වසර වනවිට කැප්ටන් කෙනෙක් වශයෙන් සේවය කරමින් කස්ටමර් ස්ර්විස් කටයුතු සිදු කිරීම කරන ලද බවත් තමාට ප්‍රධාන වශයෙන් හෝටලයෙහි රෙස්ටුරන්ට් සම්බන්ධව රාජකාරී පැවරී තිබුණු බවත් 2019.04.21 දින තැප්ප්‍රොබේන් අවන්හලේ ඊස්ටර් සන්ඩේ ස්පෙෂල් ලන්ච් එකක් සඳහා කටයුතු සූදානම් කරමින් සිටි බවත් තමා එම අවන්හලේ සේවය කරමින් සිටියදී බැක්පැක් එකක් දාගත් පුද්ගලයෙකු අවන්හල තුළට පැමිණි බවත් එදින එම කාලසීමාව තුළ තැප්ප්‍රොබේන් අවන්හලට වෙනත් කිසිදු පුද්ගලයෙකු බැක් පැක් එකක් පැළඳ පැමිණියේ සිටි නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම තැනැත්තා පළමුවරට එක වරක් අවන්හල තුළට පැමිණ ටිකක් වෙලා රැඳී සිට මඳ වේලාවකින් එළියට ගිය බවත් ඔහු යලි අවන්හලට

පැමිණි දෙවන අවස්ථාවේදී කලබලයෙන් වගේ ආව බවත් එම අවස්ථාවේ අවන්හලේ ගොඩක් කස්ටර්මස්ලා හිටියේ නැති නිසා එම තැනැත්තා තමාගේ අවධානයට ගැටුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පෙර අවස්ථාවක පැ.88 (6) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනය මෙම සාක්ෂිකරුට නැරඹීම සඳහා විවෘත අධිකරණයේදී වාදනය කිරීමේදී ද එම දර්ශනය නරඹමින් තමා එහි සිටි ස්ථානයන් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

තමා පවසා සිටි පරිදි දෙපාරක් බැක් පැක් එකක් දාගෙන පැමිණි තැනැත්තාවද සාක්ෂිකරු එම CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇති අතර තැප්ප්‍රොබේන් අවන්හල තුළ සිදුවූ බෝම්බ පිපිරීමෙන් තමාගේ උරහිසට සහ කන් දෙකට සහ කකුලට තුවාල සිදුවුණ බවත් එම තුවාල හේතුකොට ගෙන තමා දවස් 05ක් රෝහල් ගත වී සිටි බවත් මුලින්ම මහරෝහලේද ඉන්පසුව නවලෝක රෝහලේද ප්‍රතිකාර ලැබූ බවත් සාක්ෂිකරුගේ සාක්ෂියේදී වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ තමා සඳහන් කර පරිදි බැක් එක්ක පැළඳ දෙවනි වතාවට ද අවන්හල තුළට පැමිණි තැනැත්තා අවන්හලේ යම් ස්ථානයක පුටුවක් අල්ලාගෙන එම ස්ථානයේ සේවය කළ තිළිණි නැමැති සේවිකාවට යමක් පවසමින් සිටින ආකාරයක් CCTV දර්ශනවල දක්නට ලැබෙන බවත් පවසා ඇති අතර මෙම සිද්ධියෙන් ඇයටද තුවාල සිදුවුණ බවත් මෙම බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් තමාගේ කාර්ය මණ්ඩලයේ 05 දෙනෙක්ද මියගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් නොමැති බවට සියලුම චූදිතයන් වෙනුවෙන් අධිකරණයට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර ඇගයීමේදී පෙනී යන කරුණක් වන්නේ 2019.04.21 දින තැප්ප්‍රොබේන් අවන්හල තුළට බැක්පැක් එකක් පැළඳ ගෙන දෙවතාවක් සැක කටයුතු පුද්ගලයෙකු පැමිණීම සහ එම තැනැත්තා හැර වෙනත් කිසිදු අයෙකු බැක්පැක් එකක් පැළඳගෙන තැප්ප්‍රොබේන් ආපන ශාලාවට ඇතුළු වී නොමැති බවට මෙම සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉහත සඳහන් කළ කරුණු හෙලිවන පසුබිම තුළ 2019.04.21 දින පෙරවරුවේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තැප්ප්‍රොබේන් අවන්හල තුළ ස්වයංසාතක බෝම්බ පිපිරවීම සිදු කර ඇත්තේ එම බැක්පැක් එකක් පැළඳ ගෙන පැමිණි පුද්ගලයා විසින් බව පැහැදිලිව හෙලි වේ.

පැ.සා.1152 මහින්ද නිහාල් ගුණවර්ධන යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු වරලත් ප්‍රමාණ සමීක්ෂකයෙකු ලෙස සේවය කරන තැනැත්තෙකු වන අතර ඔහුට ප්‍රමාණ පරීක්ෂකවරයෙක් ලෙස අවුරුදු 44 ක පළපුරුද්දක් තිබෙන තැනැත්තෙකු බව පවසා ඇති අතර ඔහුගේ දීර්ඝ කාලීන වෘත්තීමය පළපුරුද්ද සැලකිල්ලට ගෙන ඔහුගේ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද විත්තිය භාර නොකරන බවට පවසා ඇති අතර ඒ අනුව පෙර

අවස්ථාවක පැ.108 සහ 108 (1) ලෙස ලකුණු කර ඇති මෙම සාක්ෂිකරු විසින් සකස් කර ඇති ලේඛන දෙකම විත්තිය හඹ නොකිරීම යන කාරණය මත ඒවා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගත් කරුණක් ලෙස වාර්තා කර ඇත.

කෙසේ වෙතත් එම ලේඛන සර්විස් ඉංජිනියර්ගේ වාර්තාව බවත් තමා ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා එය පාදක කරගත් බවට සඳහන් කර ඇති අතර එම ලේඛනය ද විත්තිය විසින් හඹ නොකරන බවට පැවසීම මත එයද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇති අතර එම ලේඛනයද පැ.108 (2) ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු හරස් ප්‍රශ්නයක් ඇසීමට නොමැති බවට විත්තිය විසින් දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් හුදෙක් පැ.108 සහ පැ.108 (2) ලෙස ලකුණු කර ඇති ලේඛනවල පැවැත්ම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් වී ඇති අතර විත්තිය විසින් එම ලේඛන කිසිදු හඹයකින් තොරව පිළිගෙන තිබීම තුළින් එම ලේඛන අවිවාදයෙන් යුතුව අධිකරණය ඉදිරියේ සාක්ෂි ලෙස ඉදිරිපත් වී ඇත.

පැ.සා.1115 තුවාන් රිස්වාන් මොහොමඩීන් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 1984 වර්ෂයේ කටුනායක ගුවන්තොටුපොළේ සේවයට බැඳුණු බවත් 2019 වසර වනවිට ගුවන් තොටුපොළේ ආරක්ෂක

අංශය තුළ කාර්යාල කටයුතු කරන බවත් එවකට තමාගේ නිළය ආරක්ෂක මාර්ෂල් ලෙස තමා CCTV භාරව සහ පරිපාලන කටයුතු භාරව කටයුතු කළ බවත් පවසා ඇත.

තමාගේ රාජකාරිය වන්නේ ගුවන් තොටුපොළේ යම් ප්‍රශ්නයක් සිදුවූ විට, පාර්සල් ආදිය නැති වීම සිදුවූ විට ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම බවත් වේ. 2019 වර්ෂයේ ලංකාව තුළ බෝම්බ පිපිරීම් මාලාවක් සිදුවීමට අදාළව යම් CCTV දර්ශන තමා විසින් විමර්ශන ඒකකයන්ට භාර දුන් බවත් එලෙස ලබා දුන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බවත් 2019.04.25 දින CCTV දර්ශන එලෙස ලබා දී ඇති බවට සඳහන් කරමින් එලෙස CCTV දර්ශන ලබාදීමට අදාළ ලේඛනය පැ.119 ලෙස ලකුණු කර ඇත.

පෙර අවස්ථාවක පැ.89 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන විවෘත අධිකරණයේදී තිරය මත දර්ශනය කිරීමේදී සාක්ෂිකරු ඒවා නරඹමින් එම CCTV දර්ශනවලට අනුව කටුනායක ගුවන් තොටුපොළේ පිටත්වීමේ පර්යන්තයට ආසන්න ප්‍රදේශය පෙන්නුම් කරන බවත් එසේම, එම CCTV දර්ශනවලට අනුව වාහන පැමිණ නවත්වන ස්ථානයන්, එයට අනුව එම දර්ශනයන්වල පෙනෙන බවත් එසේම, ඩිපාවර් එක ආරම්භ වන ස්ථානයේ CCTV දර්ශන තිබෙන බවත් පැ.89 සීඩි තැටියේ අඩංගු දර්ශන තුළින් හඳුනාගෙන සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

පෙර අවස්ථාවක පැ.119 ලෙස ලකුණු කර ඇති ලේඛනය පරීක්ෂා කර බලා සාක්ෂිකරු පවසා ඇත්තේ 2019.04.21 වන දින ලංකාවේ සිදුවූ බෝම්බ පිපිරීම්වලට අදාළව 2019.04.19 දිනට අදාළව ගුවන් තොටුපොළෙහි පැමිණීමේ සහ පිටවීමේ පරීයන්ත තිබෙන ස්ථානයන්ට අදාළ CCTV දර්ශනවල පිටපත් සීඩී එකක් ලෙස තමාලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාරදුන් බවට සඳහන් කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් නොමැති බවට දැනුම් දී ඇති අතර ඔහුගේ සාක්ෂිය තුළින් 2019.04.21 දින මෙරට ස්ථාන කීපයක සිදුවූ බෝම්බ පිපිරීම්වලට හා සම්බන්ධව විශේෂ සාක්ෂි කිසිවක් ඉදිරිපත් වී නොමැත.

කෙසේ වෙතත් ඔහු විසින් මෙලෙස ලබා දී ඇති CCTV දර්ශන ආශ්‍රයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1102 මධුරාවලගේ චාමර සුසන්ත මධුරාවල යන සාක්ෂිකරු 2019.04.19 වන දින කටුනායක ගුවන් තොටුපොළෙහි පැමිණීමේ සහ පිටවීමේ පරීයන්තයන් තිබෙන ස්ථානයන්හි සිට දෙමටගොඩ මහවිල් ගාර්ඩන්ස් නැමැති ස්ථානයෙහි තිබෙන සුදු පැහැති සුවිසල් නිවසක් ඉදිරිපිටට පිරිමි පුද්ගලයෙකු හයර් එකක් ගොස් තිබීම සහ එලෙස ගිය තැනැත්තා විශාල ට්‍රැවලින් බෑග් එකක්ද රැගෙන විත් තිබීම පැ.89 ලෙස ලකුණු කර ඇති සීඩී පටය තුළින් පෙනී යන බැවින් පැ.සා.1102 මධුරාවලගේ චාමර සුසන්ත මධුරාවල යන

සාක්ෂිකරු ලබා දුන් සාක්ෂියේදී පවසා ඇති කරුණු මෙම සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇති CCTV දර්ශන අඩංගු සිඩී පටවල අඩංගු කරුණු සත්‍ය බව අධිකරණයට පෙනී යයි.

පැ.සා.1127 රණසිංහ හෙට්ටිආරච්චිලාගේ සුසිල් ප්‍රේමරත්න නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු excel සී ආර් ට්‍රේඩින් ආයතනයේ 2019 වසර වනවිට කාර්මික ශිල්පියෙකු ලෙස සේවය කළ බවත් එහි CCTV අංශයට අනුයුක්තව සේවය කළ බවත් 2019 වසරේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට අදාළ CCTV කැමරා පද්ධති තමා සේවය කළ ආයතනයෙන් සැපයූ බවත් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සවිකර තිබෙන CCTV කැමරා පද්ධතියේ කැමරාවන්හි යම් වේලාවක් දර්ශනය වීමට සකසා තිබුණු බවත් ඒ අනුව සාමාන්‍යයෙන් ඒ වනවිට CCTV කාමරයේ තිබෙන ඔරලෝසුවේ තිබෙන වේලාව සටහන් වන බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 වසරේ තමාලාගේ ආයතනයෙන් crescat ආයතනයේ CCTV සේවා පද්ධතිය සැපයූවේ නැති බවත් එකම දවසක එකම වේලාවකට අදාළව ආයතන දෙකක කැමරාවල වේලාවන් එකිනෙකට වෙනස් විය හැකි බවත් සාමාන්‍යයෙන් විනාඩි 01 ක 02 ක කාලයකට වෙනස් විය හැකි බවත් crescat ආයතනයේ සහ සිනමන් ග්‍රෑන්ඩ් ආයතනයේ CCTV කැමරා පද්ධතියේ වේලාවන් අතර යම් වෙනසක් තිබිය හැකි බවත් පවසා ඇති අතර සාමාන්‍යයෙන් දින දෙකකට සැරයක් CCTV කැමරාවල වේලාව

සැදිය යුතු බවත් එනම් පැය 24 කට වරක් වේලාව නැවත සෑදිය යුතු බවත් සාක්ෂිකරු පවසා ඇත.

කෙසේ වුවත් පවර් කට් එකකින් ඩී.වි.ආර් සහ කැමරා පද්ධතිය ක්‍රියා විරහිත වී නැවත යථාතත්ත්වයට පත්වෙන විට එහි විනාඩි ගණන වෙනස් වෙන්න පුළුවන් බවත් ඒ හැර වේලාව වෙනත් අවස්ථාවල වෙනස් වෙන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් පැමිණිල්ල උත්සාහ දරා ඇත්තේ පෙර අවස්ථාවක මෙම අධිකරණයේ සාක්ෂි මෙහෙයවීමේදී පැ.සා.1144 වැලිසරගේ ප්‍රභාෂ් මාලින්ද සිල්වා නැමැති සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙමින් crescat ආයතනයට අදාළව 2019.04.17 දිනට අදාළ පැ.90 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියෙහි අඩංගු CCTV දර්ශන සම්බන්ධයෙන් සහ එයට සමගාමීව එදිනටම අදාළව සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට අදාළ CCTV දර්ශනවල වේලාවෙහි යම් සුළු වෙනසක් තිබේ නම් එය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා පමණක් බව පෙනී යයි.

පැ.සා.1117 උදය ජනාදිස ලොකුආරච්චි නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 වසර වන විට ශ්‍රී ලංකා ගුවන්තොටුපොළ හා ගුවන් සේවා සමාගමේ සභාපති බවත් එම සමාගමට අදාළ කාර්යාලයක්

කටුනායක ගුවන් තොටුපොළට ආසන්නව තිබුණු බවත් කටුනායක ගුවන්තොටුපොළහි CCTV කැමරා 500 කින් පමණ ආවරණය වන බවත් පවසා ඇති අතර කටුනායක ජත්‍යන්තර ගුවන්තොටුපොලේ CCTV පද්ධතියේ දර්ශනවලට ශ්‍රී ලංකා පොලිසියට, ආගමන විගමන සහ රේගුව යන ආයතනවලට CCTV දර්ශන නැරඹීමේ පහසුකම් පමණක් ලබා දී තිබෙන බවත් එම CCTV දර්ශන වෙනස් කිරීම ආදිය එම ආයතනයට කරන්නට බැරි බව පවසා ඇත.

එසේම, එම CCTV දර්ශවලට අදාළ දත්ත වල පිටපත් සිකියුරිටි අංශයෙන් ලබාදීම සිදුකරන බවත් එලෙස සිස්ටම් එළියට ගන්නා පිටපත්වල දිනය වේලාව යන තොරතුරු අඩංගු වන බවත් කෙසේ වුවත් එම පිටපත රිපේ කරන අතරේ එය වෙනත් ඩිවයිස් එකකින් රෙකෝඩ් කළහොත් එවිට එහි දිනය වේලාව ආදිය සඳහන් වන්නේ නැති බවත් එසේම, එක්ස්පෝට් ඔප්ෂන් එකෙන් ගොස් සාමාන්‍ය වීඩියෝ බවට පරිවර්තනය කරගන්නට පුළුවන් බවත් එවිට එවැනි වේලාව දිනය ආදී විස්තර නැති වෙන්න පුළුවන් බවත් කෙසේ වෙතත් එවැනි අවස්ථාවලදී CCTV දර්ශනයේ content එකේ නිවැරදිතාවයට හිතාමතා බලපෑමක් කලේ නැත්නම් මිස බලපෑමක් වෙන්නේ නැති බවත් පවසා ඇත.මෙම සාක්ෂිකරුට කටුනායක ජත්‍යන්තර ගුවන් තොටුපොළේ මෙම අධිකරණයේ සාක්ෂි ලබාදීමට කටයුතු කරන ස්ථානයන් සම්බන්ධව පෙන්නුම් කරන සිතියකමක් පැ.120 ලෙස ලකුණු කිරීමක් කර ඇත.

පෙර අවස්ථාවක පැ.89 (1) සිට පැ.89 (11) දක්වා ලකුණු කර ඇති CCTV දර්ශන අධිකරණයේ විකාශනය කර මෙම සාක්ෂිකරුට නැරඹීමට ඉඩ සලස්වා ඇති අතර, ඒවා නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එම දර්ශනවල කටුනායක බණ්ඩාරනායක ගුවන්තොටුපලේ පිටවීමේ පර්යන්තයේ සහ පැමිණීමේ පර්යන්තයන්ට අදාළ ස්ථානයන් එමඟින් ආවරණය වන බවත් ඒ අනුව එම CCTV දර්ශන සැබැවින්ම කටුනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපල පරිශ්‍රය සහ ඒ ආසන්නයේ එහි පිහිටීම සම්බන්ධ CCTV දර්ශන බවට පෙනී යයි.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 13 වන චූදිත වෙනුවෙන් පමණක් වන අතර, අනෙකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ඉහත පරිදි අධිකරණය ඉදිරියේ ඉදිරිපත්වී ඇති සාක්ෂිය වන්නේ පෙර අවස්ථාවක පැ.89 ලෙස ලකුණුකර ඇති CCTV දර්ශන අඩංගු සීඩී පටය මඟින් පැමිණිල්ලෙන් ලකුණු කර ඇති පැ.89 (1) පැ.89 (11) දක්වා CCTV දර්ශනවලට අදාළ ස්ථානයන් හී පැවැත්ම හා එම CCTV දර්ශනවල නිරවද්‍යතාවය පමණක් වන අතර, මේ වනවිටත් පැ.89 (1) පැ.89 (11) දක්වා CCTV දර්ශන පැමිණිල්ලෙන් තවත් සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු මඟින් අධිකරණය ඉදිරියේ විකාශනය කර නැරඹීමට අවස්ථාව ලබාදී අධිකරණයට පෙන්වා ඇති අතර, එවන් පසුබිමක් තුළ මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින්ද සැබැවින්ම එම

CCTV දර්ශන කටුනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලෙහි පැමිණීමේ සහ පිටවීමේ පර්යන්ත ආසන්නයේ තිබෙන බවට ලබා දී ඇති සාක්ෂිය පිළිනොගැනීමට කිසිදු යුක්ති සහගත හේතුවක් අපහට පෙනී යන්නේ නැත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.1101 මොහොමඩ් තාහා මොහොම්ඩ් රින්සාන් යන සාක්ෂිකරු රියදුරෙකු වශයෙන් අවුරුදු 25 ක කාලයක් තිස්සේ සේවය කර තිබුණ බව අධිකරණයේ සාක්ෂි ලබාදුන් අවස්ථාව වන විට ඔහු මහජන හයිපර් මාර්කට් යන සුපර් මාකට් එකක එනම් ගම්පොළ බෝතල්පිටියේ පිහිටා තිබෙන ෆුඩ් සිටියක් වැනි ආයතනයක රියදුරු වශයෙන් සේවය කරන බවත් එහි සේවයට යාමට ප්‍රථමයෙන් තමා මාවනැල්ලේ සිට කොළඹට අඩි 14 ½ ක් දිග සුසුකි ලොරියක් පදවනු ලැබීම සිදු කල බවත් තමා 2006 වර්ෂයේ ඉෂානා නමැති කම්පැනි එකකට බැඳි 2019 වසර දක්වා එම ඉෂානා කම්පැනියේ රියදුරු වශයෙන් සේවය කල බවටත් පවසා ඇත.

ඉෂානා සමාගමේ රියදුරා වශයෙන් තමාට කොළඹ සිට මොණරාගල බඩල්කුඹුරට යන්න අවශ්‍ය බවත් එහි සිට තමාලා අමු ගම්මිරිස්, සාදික්කා, කරුංකා ආදිය ගෙනවිත් අපනයනය කිරීමේ කටයුතු අදාළ සමාගම මඟින් සිදු කරන ලද බවත් පවසා ඇති අතර, එම කම්පැනියේ අයිතිකරු වන්නේ ඊබ්‍රාහිම් හාජ්ජියාර් නමැත්තා බවත් ඔහු එම ව්‍යාපාරය තනිවම කලාද

හවුලේ කලාද තමා දන්නේ නැති බවත් තමා ඔහු ලඟ සේවය කල බවත් එයට තමාට වැටුප් ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එම ඉෂානා සමාගමේ ස්ටෝරුව වැල්ලම්පිටියෙහි තිබුණ බවත් පරණ යොන් වීදියේ කාර්යාලය තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තමා රැකියාව කළ කාලයේ නැවතී සිටියේ වැල්ලම්පිටියේ බවත් දවස් 15 කට සැරයක් සහ උත්සව අවස්ථාවන් වලදී මාස 1 ½ ට පමණ වරක් තමා මාවනැල්ලේ පිහිටි තමාගේ නිවසට යෑම සිදු කල බවත් පවසා ඇත.

වැල්ලම්පිටියේ බුත්ගමුව ප්‍රදේශයේ ඊබ්‍රාහිම් මහත්තයාගේ ස්ටෝරුවේ කාමරයක් තමාට දීලා තිබුණ බවත් තමා එහි නැවතී සිටි බවටත් සාක්ෂිකරු පවසා ඇත. තමා පැවසූ ඉෂානා සමාගමේ අයිතිකරු වන ඊබ්‍රාහිම් හාජ්ජියාර් දෙමටගොඩ මහවිල ගාර්ඩන්ස් නමැති ස්ථානයේ පදිංචි වෙලා සිටි බවත් තමාද එම නිවසට ගොස් ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එම නිවසෙහි ඡායාරූපයක් දැක්කොත් හඳුනාගන්න පුළුවන් යැයි සාක්ෂිකරු පවසා ඇති අතර, පෙර අවස්ථාවක පැ.109 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වීමෙන් එය ඊබ්‍රාහිම් හාජ්ජියාර්ගේ නිවස බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

ඊබ්‍රාහිම් නමැත්තාට පිරිමි දරුවෝ 06 ක් සහ ගැහැනු දරුවන් තිදෙනෙකු සිටි බවත් ඔවුන්ගේ නම් වන්නේ ඉෂිරාන්, ඉසාජ්, ඉස්මයිල්, ඉල්හාම්, ඉන්ෂාෆ්, ඉජාසා, ඉබාදා, ඉෂානා ඉස්ලාම් බවත් සාක්ෂිකරු පවසා

ඇත. ඊබ්‍රහාම් මහතාගේ එම දරුවෝ නවදෙනාම දෙමටගොඩ මහවිල ගාර්ඩින්ස් හි සිටි බවත් 2019 වසර වන විට ඉෂානා නැමැත්තිය පමණක් විවාහ වී සිටි බවත් තමා ආවාට පසු වැඩිමහල් පුතා ඉෂිරාන් විවාහ වූ බවත් ඉන්පසුව ඉන්ෂාෆ් පුතාද විවාහ වුණ බවත් ඉන්පසුව ඉල්හාම් විවාහ වුණ බවත් එයට පසුව ඉජාෂා විවාහ වුණ බවත් ඉෆ්ලාල් හා ඉජාෂා විවාහ වුණ බවත් පවසා ඇති අතර ඊබ්‍රාහිම් හාජ්ජියාර්ගේ පුතා වන ඉල්හාම් නමැත්තා විවාහ වුණාට පසුවද දෙමටගොඩ සිට මහවිල ගාර්ඩන්හි තමා පෙර හඳුනාගත් පිංතූරයේ ඇති නිවසෙහි පදිංචිව සිටි බවට සාක්ෂිකරු පවසා ඇත. ඉන්ෂාෆ් නමැති පුතා විවාහ වීමෙන් පසු කොල්ලුපිටියේ ඔහුගේ මාමාගේ නිවසේ සිටි බවත් ඔහු විවාහ වී සිටියේ ආලවුදීන් ජුවලර්ස් ආයතනයේ දියණියව බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඉල්හාම් විවාහ වුණ භාර්යාවගේ නම තමා දන්නේ නැති බවත් 2019 වර්ෂයේ වන විට ඉල්හාම්ට දරුවෝ 03 දෙනෙක් සිටි බවත් 2019 වර්ෂය වන විට ඉන්ෂාෆ්ට දරුවෝ 04 දෙනෙක් සිටි බවත් එම දරුවන්ගේ නම් තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ ඉන්ෂාෆ් නමැත්තා හැරුණ කොට අනෙකුත් දරුවන් 08 දෙනාම වෙන වෙනම තිබූ ගෙවල්වල පදිංචි වී සිටි බවත් ඉජාස් නමැති පුතා මහවිල ගාඩ්න්ස් යාබද පාරේ ආසන්නයේ නිවසක් හදා ගත් බවත් ඉෆ්ලාම් වැඩිපුර සිටියේ නුවර ප්‍රදේශයේ බවත් ඉෂානා නමැත්තිය එම නිවසේද සිටින බවත් මාවනැල්ලටද යන බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඉල්හාම් කෑගල්ලේ කඩයක් කල බවත් ඉන්ෂාෆ් නමැත්තා එක්ස්පෝට් මැනේජර් කෙනෙක් ලෙස සේවය කල බවත් එනම් ඉෂානා ආයතනයේම එක්ස්පෝට් මැනේජර් ලෙස කටයුතු කල බවත් ඔහු විවාහයෙන් පසු ඔහුගේම ආයතනයක් පවත්වාගෙන ගිය බවත් ඉන්ෂාෆ් විසින් එලෙස ආරම්භ කරන ලද ව්‍යාපාරය වන්නේ ටෙලිකොම් එකේ පරණ තඹ වැනි කේබල්ස් ගෙන ඒවා උණු කර ¼ කම්බි වගේ රෝල් කර රට යැවීම බවත් එම ව්‍යාපාර කටයුතු වැල්ලම්පිටිය බුත්පිටිය ආසන්නයේ කරගෙන ගිය බවත් එසේම, ඉන්ෂාෆ් ඔහුගේ කටයුතු ඕල්මූවර් ස්ට්‍රීට් එකේ දී කල බවත් එසේම, ඊබ්‍රාහිම් මහතාගේ වාහනයේ වැඩද තමා විසින් බොහෝ අවස්ථාවල කර තිබෙන බවත් ඉෂාෆ් මහතාගේ රියදුරුද නොමැති අවස්ථාවල තමා ඔහු සමඟද ගමන් බිමන් යාම් ඊම් කල බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඉන්ෂාෆ් විසින් පවත්වාගෙන ගිය තඹ ව්‍යාපාරයේ නම කොලෝසස් බවට සාක්ෂිකරු පිළිගෙන ඇත.

තමා 2019 වසරේ මෙම ඉෂානා කම්පැනියෙන් අයින් වෙන්න හේතුව ප්‍රහාරයක් කලා යැයි ප්‍රශ්නයක් ආව නිසා බව තමාද ඉන්ෂාෆ් සමඟ මන්නාරමට යාමට යැයි පවසා එතනින් ගිය බවත් දිනක් තමාට බ්‍රහස්පතින්දා රෑ ඉන්ෂාෆ් ඔහුගේ ජංගම දුරකථනයෙන් කොල් කර තමාට කථා කල බවත් එකල තමා භාවිතා කල ජංගම දුරකථන අංකය 077-8254948 බවත් තමාගේ ජතික හඳුනුම්පත් අංකය 78054408V බවටත් සාක්ෂිකරු පවසා ඇත. ඩයලොග් සමාගම විසින් නිකුත් කර තිබූ

සේවාලාභී තොරතරු ඇතුළත් ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා දී ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට කියවන්නට බැරි බවත් ය. කෙසේවෙතත් අධිකරණයෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු තමාට තරමක් දුරට කියන්නට පුළුවන් බවත් ඉලක්කම් කියවන්න පුළුන් බවත් පවසා ඇති අතර, ඔහුගේ ජංගම දුරකථනයට අදාළ ලේඛනය මෙම සාක්ෂිකරු මඟින් පැ.121 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ සිකුරාදා දවසක පවුල පිටින් විනෝද චාරිකාවක් යන්න ඕනෑ යැයි පවසා තමාට බ්‍රහස්පතින්දා රෑ ඉන්ෂාෆ් කෝල් කරලා කථා කල බවත් එලෙස කථා කර තමාට මුලින්ම කොල්ලුපිටියට එන්න යැයි පැවසුවද ආපසු ඔහු කෝල් කර දෙමටගොඩට එන්න යැයි පැවසූ බවත් ඔහු නැවත කෝල් එකක් අරන් සිකුරාදා පල්ලියට ගිහින් කොල්ලුපිටියට එන්න යැයි පැවසූ බවත් පවසා ඇති අතර, ඉන්ෂාෆ් විසින් පාවිච්චි කරන ලද දුරකථන අංකය තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු ඩයලොග් සමාගමින් නිකුත් කර තිබෙන සේවාලාභී තොරතුරු ඇතුළත් වාර්තාවක් පරීක්ෂා කර බලා එහි තිබෙන දුරකථන අංකය ඉන්ෂාෆ්ගේ බවට සඳහන් කර ඇත. එම ලේඛනය ඔප්පු කිරීමේ භාරයට යටත්ව පැ.122 ලෙස ලකුණු කර ඇත.

තමාට දැනෙන පරිදි තමා වැල්ලම්පිටිය පල්ලිය ගාවට ත්‍රීවිල් එකක් අරගෙන කොල්ලුපිටියට ගිය බවත් එහිදී V8 ජීප් රථයක නැග දරුවන්

බිරිඳ, බිරිඳගේ පුංචි අම්මා සහ ඉන්ෂාෆ් ගිය බවත් එම ජීප් රථය ඉන්ෂාෆ්ගේ ජීප් රථයක් බවත් එම වාහනය සුදු පාට වාහනක් බවත් එහි අංකය තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එම වාහනයේ ඉදිරිපස ඉන්ෂාෆ් සහ අත දරුවෙක් සිටි බවත් තව පිරිමි ළමයෙක් සහ ගැහැනු දරුවෙක් පිටිපස ආසනයේ බිරිඳ සමඟ සිටි බවත් පුංචි කෙනෙකුත් පිටිපස සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඉන්පසු වාහනය පිටත් වී මුලින්ම පරණ යොන් විදියේ පිහිටි ඔෆිස් එකට ගිය බවත් එහිදි ඉන්ෂාෆ් වාහනයෙන් බැස ගොස් විනාඩි 5කට 10 කට පසු නැවත ආව බවත් ඉන්පසු වාහනය හයිවේ එකට දමා මන්නාරමට යන්න යැයි පවසා ගිය බවත් ඉන්පසු පුත්තලම පාරට හැරෙනකොට ඔහුව එයාපෝට් එකට දාන්න යැයි ඉන්ෂාෆ් තමාට පැවසූ බවත් ඉන්පසු තමා එන්ට්‍රන්ස් එකට කෙලින්ම යන්න හදන විට ඉන්සාෆ් තමාට ඔහුව එහා පැත්තෙන් දාන්න ලෙස පැවසූ බවත් තව එක්කෙනෙක් එන්න ඕනේ යැයි පැවසූ බවත් ඉන්සාෆ් තමාව එතනින් දාල යන්න යැයි පැවසූ බවත් ඊට කලින් තමා ඉන්ෂාෆ් සමඟ අවස්ථා ගණනාවක එයාර්පොට් එකට ගිහින් තිබෙන බවත් වෙනදා ගිය විට ඔහු එන්ට්‍රන්ස් එකට දාලා එන බවත් කෙසේ වෙතත් එම දිනයේ එන්ට්‍රන්ස් එකට දැම්මේ නැති බවත් ඉන්පසු ඉන්සාෆ් වාහනයෙන් බැහැලා ඇවිත් පිටිපස ඩිකියේ තිබුණු බෑග් එක අරන් දෙන්න කියූ බවත් තමා වාහනයෙන් බැහැලා ගොස් ඩිකියේ තිබුණ බෑග් එක අරන් ඉන්ෂාෆ්ට දුන් බවත් ඉන්පසු ඉන්සාෆ් තමාට පරිස්සමින්

පුත්තලමට යන ලෙසත් පුත්තලමේ මාමා සිටින බවත් මාමාත් සමග එකතුව මන්නාරමට යන ලෙස දැනුම් දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම සාක්ෂිකරුට කටුනායක ගුවන්තොටුපලට අදාළ පැ.89 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියේ අන්තර්ගත CCTV දර්ශන වාදනය කර පෙන්වා ඇති අතර, එහි CAS-1411 ලෙස අංකය සඳහන් තමා ඉන්සාෆ් සමඟ කටුනායක එයාර්පොට් එකට ගිය වාහනය පෙනෙන්ට තිබෙන බව පවසා ඇත. එය හඳුනාගෙන ඇති අතර, ඉන්සාෆ් තමා පදවාගෙන ගිය වාහනයෙන් බහින ආකාරය දැක්වෙන දර්ශනයක් තිබෙන බවත් සාක්ෂිකරු විසින් CCTV දර්ශන තුළින් හඳුනාගෙන ඇති අතර, තමාද එම CCTV දර්ශන වල සිටින බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තමා විසින් ඉන්ෂාෆ්ට බෑග් එකක් සහ තවත් පොඩි බෑග් එකක්ද ඩිකියෙන් අරගෙන දුන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඒසේම CCTV දර්ශන තවදුරටත් නරඹමින් එහි ඉන්ෂාෆ් වාහනයෙන් බහින අවස්ථාවේදී වාහනයෙන් ගත්ත බෑග් එක ඔහු ලඟ තබාගෙන සිටින ආකාරය CCTV දර්ශනයේ තිබෙන බවත් ඉන්සාෆ් සුදු පාට කොලරයක් සහිත ටී ෂර්ට් එකක් සහ හඳුනාගෙන ඇත.

පෙර අවස්ථාවක පැ.90 (5) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනද විවෘත අධිකරණයේ විකාශනය කර සාක්ෂිකරුට නැරඹීමට සලසා දී ඇති අතර, එහිද සිටින්නේ ඉන්ෂාෆ් වගේ බව තමාට පෙනෙන බවත් ඔහු එහි

කැප් එකක් පැළඳ සිටි නිසා තමාට හරියටම අඳුනගන්න බැරි බව සාක්ෂිකරු පවසා ඇති අතර, කැප් එක නිසා තමාට හඳුනාගන්න අමාරු වුවද පයින් ඇවිදගෙන යන ආකාරය අනුව තමන්ට පෙනේනේ ඉන්ෂාෆ් වගේ බවත් සාක්ෂිකරු පවසා ඇත. පෙර අවස්ථාවක පැ.88 (11) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයේ ද පැ.88 (12) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයන්ද පෙන්වා දුන් අවස්ථාවේදී ඒවායේ සිටින්නේ පැ.88 (13) ලෙස ලකුණු කර ඇති සහ පැ.88 (14) ද ලෙස ලකුණු කරඇති CCTV දර්ශන සිටින්නේද පැ.88 (5), පැ.88 (7) CCTV දර්ශන වලද ඉන්ෂාෆ් සිටින බවට හඳුනා ගෙන ඇති අතර පැ.88 (6) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනට අනුව 2019.04.21 08.58 ට සහ 09.08 ට අදාළ CCTV දර්ශනවල බෑගයක් කරේ දමාගෙන යන පුද්ගලයා ඉන්ෂාෆ් බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම CCTV දර්ශන 2019.04.21 තැප්ප්‍රොබෙන් සවුත් නමැති කැමරාවෙන් පැය. 09:12:19 ට අදාළ CCTV දර්ශනයේ තොප්පියක් දමාගෙන බැක්පැක් එක පිටුපස කරේ දමාගෙන සිටින තැනැත්තා ඉන්ෂාෆ් බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර, පැ.112 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයේද සහ අදාළ ඡායාරූපය සාක්ෂිකරු පෙන්වා ඇති අතර, එම ඡායාරූපයේද ඉන්ෂාෆ් සිටින බවත්, පැ.107 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේද ඉන්ෂාෆ් සිටින බවත්, පැ.85 (1) ලෙස ලකුණු කර ඇති

ඡායාරූපයේද, පැ.88 (2) (A) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේද ඉන්ෂාෆ් සිටින බව සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර,

රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් අදාළ CCTV දර්ශන විශ්ලේෂණය කිරීම සඳහා මුහුණු හඳුනාගැනීම සඳහා යොමු කරන ලද අධිකරණයේ මුද්‍රාව සහිත පාර්සලයේ තිබූ ඡායාරූපයක් මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන එම ඡායාරූපයේ සිටින්නේද ඉන්ෂාෆ් බවට පවසා ඇති අතර එම ඡායාරූපය පැ.123 ලෙස ලකුණු කර ඇත. පෙර අවස්ථාවක පැ.88 (13) ලෙස ලකුණු කර ඇති වීඩියෝ පටය වාදනය කර සාක්ෂිකරුට නැරඹීමට ඉඩ සලසා ඇති අතර, එහි ඉන්ෂාෆ් සිටින බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර, පෙර අවස්ථාවක පැ.13 ලෙස ලකුණු කර ඇති සීඩි සංයුක්ත තැටියේ තිබෙන වීඩියෝ නරඹමින් එහි තමා පෙර හඳුනා ගත් ඉන්ෂාෆ් නමැත්තා සිටින බවත් ඔහු සුදුපාට කලිසමක් ඇඳ, නිල්පාට ටී ෂර්ට් එකක් ඇඳ, බෑග් එකක් දාගෙන දොර අල්ලගෙන සිටින ආකාරය පෙනෙන බව සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරු හඳුනාගත් එකී වීඩියෝ පටය පැ.13 (31) ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුට පැ.13 (3) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයක්ද නැරඹීමට ඉඩ සලස්වා ඇති අතර, එම වීඩියෝ දර්ශනයේද ඉන්ෂාෆ් නැමැත්තා සිටින බවට හඳුනාගෙන ඇති අතර, එහි ඉන්ෂාෆ් නමැත්තා කැප් දමාගෙන නිල්පාට ටී ෂර්ට් එකක් ඇඳ සුදුපැහැති කලිසමක්

ඇඳ දෙදෙනෙකු සහිත කැෂියර් එකක් වගේ තැනක කතා කරමින් සිටින ආකාරය පෙනෙන බවත් ඊට අදාළ දිනය ලෙස වීඩියෝ දර්ශනයේ පහල කෙළවරේ 17 අප්‍රේල් 2019 14.02.01 ලෙස දර්ශනය වන බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර, පෙර අවස්ථාවක පැ.03 (06) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයක්ද සාක්ෂිකරුට නැරඹීම සඳහා විකාශනය කර ඇති අතර එහිද ඉන්ෂාෆ් නමැති පුද්ගලයා නිල්පාට ටීෂර් එකක් ඇඳ, සුදුපාට කලිසමක් ඇඳ, කැඹ් එකක යන ආකාරය දර්ශනය වන බව සාක්ෂිකරු පවසා ඇති අතර, එම වීඩියෝ දර්ශනයෙහි 2019.04.17 වෙනිදා යැයි සඳහන් වී ඇති බවද අධිකරණයේ අවධානයට ලක් වී ඇත. පැ.3 (8) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයේද ඉන්ෂාෆ් නැමැත්තා සිටින බවත් එහි ඔහු සුදු පැහැති කලිසමක් සහ නිල් පාට ටී ෂර්ට් එකක් සහ කලු පැහැති කැප් එකක් පැළඳ සිටින බවත් ඔහු එහි ඇවිදින ආකාරයෙන් සිටින බවත් පවසා ඇති අතර, එයට අදාළ දිනය 2019.04.17 පැය.13:57:20 බවත් අධිකරණයේ අවධානයට ලක් කර ඇත.

තවත් සිඩී පටයක් පැ.116 (1) ලෙස ලකුණු කිරීමක් කර එම සීඩී තැටිය වාදනය කිරීමේදි 2019.04.17 දිනය සහිත ගොනුව එහි විවෘත කර එහි තිබෙන 2019.04.17 13.50.08 එම්පී 04 යැයි සඳහන් වීඩියෝ දර්ශනය කිරීමේදි එහි ඉන්ෂාෆ් නැමැත්ත දර්ශනය වන බවට පවසා ඇත. එසේම, ඉන්ෂාෆ් නැමැත්තා බෑග් එකක් තබා ගෙන පාර පනින ආකාරයක් දිස්වන

බවත් එය 17.04.2019 – 13.50.17 ලෙසට වෙලාව සඳහන් කර ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, මෙම සාක්ෂිකරු මඟින් එකී වීඩියෝ දර්ශනය පැ.116 (2) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එසේම, 17.04.2019 පැය13.46.52 යැයි වේලාව සඳහන් කර ඇති තවත් CCTV වීඩියෝ දර්ශනයක් පැ.116 (3) ලෙස ලකුණු කර ඇති අතර, සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ ඉන්ෂාෆ් නමැත්තාට ඉල්හාම් යැයි සහෝදරයෙක් සිටින බව වන අතර එම ඉල්හාම් නමැත්තා සමඟ තමා ගමන් ගොස් නැති බවත් තමන්ට ඔහුගේ මුහුණ එච්චර මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තවද ඉන්ෂාෆ් ගේ සිද්ධියේදීම ඉල්හාම් නමැත්තාද මියගිය බවට තමා දැනගත් බවත් පවසා ඇත.

පැ.3 (29) ලෙස ලකුණු කර ඇති CCTV වීඩියෝ දර්ශනය නරඹමින් එම වීඩියෝ දර්ශනයෙහි කොණ්ඩය තට්ටය ගාලා සිටින තැනැත්තා ඉල්හාම් බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත. එහි ඉල්හාම් රතු පැහැති ටීෂර්ට එකක්, කළු පැහැති කලිසමක් ඇඳ බෑග් එකක් අතේ තියාගෙන සිටින බවත් පවසා ඇත. අදාළ වීඩියෝ දර්ශනයේ පැ.3 (29) ලෙස ලකුණු කර ඇති බවත් එය 2019.04.20 දිනට අදාළ වීඩියෝ දර්ශනයක් බව පැමිණිල්ලෙන් අධිකරණයට පෙන්වා දී ඇති අතර පෙර අවස්ථාවක පැ.3 (24)ලෙස ලකුණු කර ඇති බවත් එය 2019.04.20 දිනට අදාළ විඩියෝ දර්ශනයක් බවත් පැමිණිල්ලෙන් අධිකරණයට පෙන්වා දි ඇති අතර පෙර අවස්ථාවක පැ.03 (24) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයද

සාක්ෂිකරු නරඹා තමා පෙර හඳුනාගත් ඉල්හාම් නමැත්තා එම වීඩියෝ දර්ශනයේද සිටින බවත් එහි ඔහු රතු පැහැති ටී ෂර්ට් එකක් හා කළු පැහැති කලිසමක් ඇඳ බෑග් එකක් රැගෙන එනම් බෑග් එකක් ඇදගෙන යන ආකාරය සහ තවත් බෑග් එකක් කරේ තිබෙන ආකාරය පෙනෙන බවට අධිකරණයට සාක්ෂි ලබා දී ඇත. එම වීඩියෝ දර්ශනයද 2019.04.20 දිනට අදාළ විඩියෝ දර්ශනයක් වේ. මෙම සාක්ෂිකරු පැ.03 (41) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයද නැරඹීමට ඉඩ සලසා ඇති අතර, එහිද ඉල්හාම් නමැත්තා රතු ටී ෂර්ට් එකක් කළු කලිසමක් ඇඳ සිටින ආකාරයක් සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

පෙර අවස්ථාවක පැ.3 (42) ලෙස ලකුණු කර ඇති වීඩියෝ පටයක් පෙන්වා ඇති අතර එහිද ඉල්හාම් නමැත්තා සිටින බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එහි ඔහු රතු පැහැති ටී ෂර්ට් එකක් සහ කලු පැහැති කලිසමක් ඇඳ සිටින බවත් හඳුනාගෙන ඇති අතර එසේම, පැ.42 ලෙස පෙර අවස්ථාවක ලකුණු කර ඇති 2019.04.21 වන දිනට අදාළ වීඩියෝ දර්ශනයක් නරඹමින් එහිද තමා පෙර හඳුනාගත් ඉල්හාම් නමැත්තා රතු පැහැති ටී ෂර්ට් එකක් හා කලු පැහැති කලිසමක් ඇඳ බෑග් එකක් රැගෙන කැප් එකක් පැළඳගෙන යන ආකාරය පෙනී යන බවත් පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.3. (50) ලෙස 2019.04.21 දිනට අදාළ වීඩියෝ දර්ශනයක්ද, නරඹා එසේම පැ.3 (51) ලෙස ලකුණු කර ඇති 2019.04.21

දිනට අදාළ වීඩියෝ දර්ශනයක්ද, නරඹා එසේම පැ.3 (2) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයක්ද, නරඹා පැ.3 (2) සහ පැ.3 (1) 2019.04.21 දිනට අදාළ CCTV වීඩියෝ දර්ශනවල ද ඉල්හාම් නමැත්තා සිටින ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇත. පැ.3 (53) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයේද ඉල්හාම් නමැත්තා රතු පැහැති ටී ෂර්ට් එකක් හා කලු පැහැති කලිසමක් ඇඳ බෑග් එකක් දාගෙන සිටින ආකාරය පෙනෙන බවත් එම වීඩියෝ දර්ශනය පැය 08:54:47 විකාශනය වන බවත් එහි ඉල්හාම් නමැත්තා විදුලි පඩිපෙල නැඟ එන ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

මෙම සාක්ෂිකරුට ගල්කිස්ස ස්පෑන්ටවර් යන ස්ථානයට අදාළ වීඩියෝ දර්ශන ඇතුළත් සීඩි තැටියක් පැ.124 ලෙස ලකුණු කරමින් විවෘත අධිකරණයේ වාදනයකර පෙන්වා දී ඇති අතර, එම වීඩියෝ දර්ශන වල ඉල්හාම් නමැති පුද්ගලයා සහ ඉන්ෂාෆ් නමැති පුද්ගලයා යන දෙදෙනාම සිටින බවත් ඉල්හාම් ලෙස හඳුනා ගත් තැනැත්තා රතු පැහැති ටී ෂර්ට් එකක් හා කලු පැහැති කලිසමක් ඇඳ බෑග් එකක් එල්ලාගෙන සිටින බවත් ඔහුගේ අතේ ෆෝන් එකක් තිබෙන බවත් පවසා ඇති අතර, ඉන්ෂාෆ් ලෙස හඳුනාගත් පුද්ගලයාද කලුපැහැති ටී ෂර්ට් එකක් සහ කලිසමක් ඇඳ කැප් එකක් පැළඳ සිටින බවත් පවසා අදාළ වීඩියෝ දර්ශනය අධිකරණයේ අවධානය ලක් කර ඇති අතර එම වීඩියෝ දර්ශනයෙහි 2019.04.20 දින පැය 16:27:47 යැයි සඳහන් කර ඇති දර්ශණය පැ.124 (1) ලෙස ලකුණු කර ඇත.

පෙර අවස්ථාවක පැ.16 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි ඇති වීඩියෝ පටයෙහි පැ.16 (2) ලෙස ඇති වීඩියෝ පටය විකාශනය කර සාක්ෂිකරුට නැරඹීමට ඉඩ සලසා ඇති අතර එම විඩියෝ දර්ශනවලට අනුව ඉල්හාම් සහ ඉන්ෂාෆ් සිටින බවත් අදාළ වීඩියෝ පටය 2019.04.19 දින 09:16:35 වේලාවට අදාළ වීඩියෝ දර්ශනයක් බවත් එහි ඉල්හාම් නමැත්තාද සිටින බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් පැ.03 (10) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයෙහි ඉල්හාම් ලෙස තමා හඳුනාගත් පුද්ගලයා තමා ඊබ්‍රාහිම් හාජ්ජියාර් නැමත්තාගේ නිවසට එනම් දෙමටගොඩ මහවිල ගාඩන්ස් පිහිටි නිවසට අවස්ථා කිහිපයක් ගොස් ඇති බවත් පවසා ඇති අතර, කෙසේ වෙතත් ඔහුගේ අසල්වැසියන් කවුද යන්න සම්බන්ධයෙන් තමාට දැනීමක් නැති බවත් තමා ඊබ්‍රාහිම් හාජ්ජියාර්ගේ නිවසේ සේවය කිරීමේදී තමා වාහනය හෝදන අවස්ථාවේදී වාහනය පිටත් කරන්න ලෑස්තිකරන අවස්ථාවේදී ඉස්සරහා ගෙදර අයත් පිටිපස්සේ ගෙදර අයත් ඇවිත් තමා සමඟ කථා කරන බවත් පෙර අවස්ථාවක පැ.118 ලෙස ලකුණු කර ඇති ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා ඇති අතර එහි සිටින පුද්ගලයන් තමාට හඳුනාගත නොහැකි බව සාක්ෂිකරු පවසා ඇත. පැ.1 ලෙස ලකුණු කර ඇති ලේඛනයේ ඉහළ කොනේ 13 ලෙස අංකය යොදා ඇති ලේඛනයේ සාක්ෂිකරු පරික්ෂා කර බලා එම ලේඛනයේ 4 වන පිටුවේ සිටින්නේ ඉල්හාම් නමැත්තා බවට පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් විත්තිය වෙනුවෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් ඇසීමට නොමැති බවට අධිකරණයට පවසා ඇත. එම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු දෙමටගොඩ මහවිල ගාඩ්න්ස් එනම් මහවිල උද්‍යානයේ පදිංචිව සිටින ඊබ්‍රාහිම් හාජ්ජියාර් මහතාගේ නිවසට අවස්ථා ගණනාවක ගොස් ඇති බව සහ එම අවස්ථාවලදි ඉන්ෂාෆ් සහ ඉල්හාම් යනුවෙන් නම් සඳහන් ඊබ්‍රාහිම් හාජ්ජියාර්ගේ පුතුන් දෙදෙනා මෙම සාක්ෂිකරු හොඳින් දැනගෙන සිට ඇති බව පෙනී යන අතර, මෙම සාක්ෂිකරු මඟින් අධිකරණයේදි ලකුණුකර ඇති CCTV වීඩියෝ පටවල සහ ඡායාරූපවල ඉහත කී ඉන්ෂාෆ් සහ ඉල්හාම් යන පුද්ගලයන් දෙදෙනාම සිට ඇති ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එසේම, ඊබ්‍රාහිම් හාජ්ජියාර් නමැත්තාගේ පුතෙකුවන ඉන්ෂාෆ් නමැත්තා තඹ කම්බි ආශ්‍රිත ව්‍යාපාරයක් පවත්වාගෙන් ගොස් ඇති ආකාරය පිළිබඳවද සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිවී ඇත.

මෙම නඩුවට අදාළ බෝම්බ පිපිරීම් සිදු වූ ස්ථානයන්ට අදාළ CCTV වීඩියෝ දර්ශන විවෘත අධිකරණයේ නැරඹීමෙන් අනතුරුව ඒවායෙහි ඊබ්‍රාහිම් හාජ්ජියාර්ගේ පුතුන් වන ඉන්ෂාෆ් සහ ඉල්හාම් යන දෙදෙනාම සිටින ආකාරය මෙම සාක්ෂිකරු අධිකරණයේ දී නිරීක්ෂණය කර හඳුනාගෙන ඇති අතර මෙම සාක්ෂිකරු ඊබ්‍රාහිම් හාජ්ජියාර් නමැත්තාගේ නිවසට නිතර දෙවේලේ ආගිය තැනැත්තෙකු වන බැවින් ඔහුට ඊබ්‍රාහිම්

හාජ්ජියාර්ගේ පුතුන් වන ඉන්ෂාෆ් හා ඉල්හාම් යන දෙදෙනා සම්බන්ධයෙන් මනා දැනීමක් තිබී ඇති බව ඒ අනුව පෙනී යයි.

<u>මඩකලපුව සියෝන් දේවස්ථානයේදී සිදු වූ බෝම්බ පිපිරීම.</u>

2019.04.21 දින මඩකලපුව සියෝන් දේවස්ථානයෙහි සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ පුපුරවා හැරීම හේතු කොට ගෙන පුද්ගලයන් 31 දෙනෙකු ජීවිතක්ෂයට පත් වී පුද්ගලයින් ඉතා විශාල ප්‍රමාණයක් තුවාල වීමට ලක් වී ඇති අතර, මෙම නඩුවට අදාළව දෙපාර්ශවය විසින්ම එකී සියළුම මරණකරුවන් එදින සිදු වූ බෝම්බ සිද්ධියෙන් මියගිය බවට සහ තුවාල වීම් වලට ලක් වූ බවට විධිමත්ව පිළිගැනීම් වාර්තා කර ඇති අතර, ඒ අනුව එකී පිළිගැනීම් ලේඛන සමඟම එකී මරණකරුවන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ඇතුළු ලේඛන සහ තුවාලකරුවන්ගේ අධිකරණ වෛද්‍ය වාර්තා ඇතුළු වෛද්‍ය ලේඛනද කිසිදු හඹයකින් තොරව මෙම අධිකරණය ඉදිරියේ පිළිගත් කරුණු ලෙසට විධිමත්ව වාර්තා කර ඇත. ඒ අනුව එකී පුද්ගල මරණයන් සහ තුවාල සිදුවීම් සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කිරීම, මෙහෙය වීම අවශ්‍ය වන්නේ නැත.

චෝදනා අංක 6921 සිට 7695 දක්වා චෝදනා පුද්ගලයන් 31 දෙනෙකු මරණයට පත් වීම සම්බන්ධයෙන් ගොනු කර ඇති අතර සියලුම චූදිතයන්ට එරෙහිව 2019.04.21 දින මඩකලපුව සියෝන් දේවස්ථානයේදී

දැනට මියගොස් සිටින මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් හෙවත් අබුමුක්තාර් විසින් අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් මඩකලපුව සියෝන් දේවස්ථානයෙහි සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමේ වරද සිදු කළ බවද, එකී වරද සිදු කිරීමේ දී පහත නම් සඳහන් අයවලුන්ගේ මරණය සිදු කිරීමෙන් දැනට මියගොස් සිටින එකී මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් හෙවත් අබුමුක්තාර්, 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (උ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා සෙසු සියලුම චූදිතයින් දැනට මියගොස් සිටින මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් හෙවත් අබුමුක්තාර්ට අනුබල දීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවට ය. (17 වන චූදිත නඩු විභාගය අතරතුරදී මිය යන ලද බැවින් ඔහුගේ චෝදනා ඉවත් කරගන්නා ලදි.

ඒ අනුව මඩකලපුව සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීමෙන් පුද්ගලයන් 31 දෙනෙකු මරණයට පත් වීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කර ඇත.

මඩකලපුව සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීමට අදාළ පිළිගැනීම්

1. පැ.130 (3) ලෙස සඳහන් CCTV දර්ශනය පැ.සා.1276 මුතුකුමාර් සෙල්වරාසා යන අය විසින් විමර්ශන නිලධාරීන් හට ලබා දීම සඳහා මඩකලපුව ලංකා අයි.ඕ.සී. ෆිනෑන්ස් ස්ථිෂන් අංක 56, ත්‍රිකුණාමලය පාර, මඩකලපුව නැමැති ස්ථානයේ එහි අයිතිකරුගෙන් ලබා ගෙන 2019.04.24 දින විමර්ශන නිලධාරීන් හට නිසියාකාරව ලබා දී ඇති කරුණද සියලුම චූදිතයන් වෙනුවෙන් පිළිගැනීම මත එම කරුණද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.
2. පැ.සා.1275 සාමි තම්බි සුදර්ශන් නැමැති සාක්ෂිකරු විසින් මඩකලපුව එල් බී ෆිනෑන්ස් සමාගමේ කළමණාකරු ලෙස කටයුතු කරමින් සිටියදී පැ.130 (4) ලෙස ලකුණු කර ඇති CCTV වීඩියෝ දර්ශනය නිසියාකාරයෙන් විමර්ශන නිලධාරීන්ට ලබා දී ඇති කරුණ සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකරන බවට දැනුම් දීම මත

එම කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගත් කරුණක් ලෙස වාර්තා කර ඇත.

තවද මඩකලපුව සියෝන් දේවස්ථානයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කරන ලද බවට පැමිණිල්ලෙන් පවසා සිටින මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් යන අයගේ අනන්‍යතාවය සනාථ කෙරෙන ජාතික හැඳුනුම්පත් අංකය 853102210V බවත්, ඊට අදාළ සූචිපතයේ ඡායාස්ථ පිටපතක් පැ.1197 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර එසේම දැනට මියගොස් සිටින මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් යන අයගේ නමින් අංක N 5908136 දරන විදේශ ගමන් බලපත්‍රය නිකුත් කර තිබූ බවත්, එය තහවුරු කිරීම සඳහා එකී විදේශ ගමන් බලපත්‍රය සම්බන්ධයෙන් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ ගුවන් මගී විස්තර (Passenger Inquiry) වාර්තාව පැ. 1198 ලෙස අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත. ඒ අනුව එකී ස්වයංඝාතක බෝම්බකරුගේ අනන්‍යතාවය හඹ කිරීමකින් තොරව අධිකරණය ඉදිරියේ සනාථ වී ඇත.

මඩකලපුව සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීමට අදාළ සාක්ෂි

පැ.සා.1315 නාගයියා ස්ටැන්ලි නැමැති සාක්ෂිකරු පාස්ටර්වරයෙක් ලෙස සේවය කරන බවට සඳහන් කර ඇති අතර ඔහුට සිංහල භාෂාව යම් ප්‍රමාණයක් හැසිරවීමට හැකියාව තිබෙන බවට සඳහන් කර ඇත. තමා මඩකලපුව ප්‍රදේශයේ දේව මෙහෙයේ කටයුතු සිදු කරගෙන යමින් සිටින බවත් තමාලා විසින් පුහුණු වීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවත් එහි ළමුන්ට බයිබලය කියා දෙන බවත් එහි අවුරුදු 16ට ඉහළ ළමයි සිටින බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර සාමාන්‍යයෙන් එම පුහුණුවීම සඳහා තිස්දෙනෙක් පමණ සිටින බවට පවසා ඇත.

තමා 2016 වසරට පෙර විදේශගතව සිටි බවත් 2016 වසරේ සිට මෙරටට පැමිණි පසු සියෝන් සභාවෙහි යෙදී සිටින බවට කරුණු සඳහන් කර ඇත. තමා මඩකලපුව සියෝන් සභාවට අනුයුක්තව වූ කාලයේ එහි පාස්ටර් රොෂාන් මහේෂ් යන අය සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සියෝන් සභාව සහ කතෝලික සභාව අතර යම් වෙනසක් තිබෙන බවත් තමාලා රූප වන්දනා කරන්නේ නැති බවත් තමාලා ආත්මය සම්බන්ධයෙන් පමණක් යාඥා කරන බවත් තමාලා නමස්කාර කරන්නේ පියා පුත්‍රයා සහ ශුද්ධෝත්මයන් වහන්සේ පමණක් බවත් එනම් ශුද්ධ වූ ත්‍රිත්වය වන්දනා කරන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම සියෝන් සභාව සඳහා මඩකලපුවෙහි ශාඛාවක් තිබෙන බවත් එහි ප්‍රධාන ශාඛාව තිබෙන්නේ මහනුවර බවත් එය ලයිට්හවුස් චර්ච් බවත්

සාක්ෂිකරු පවසා ඇත. එනම් ලයිට්හවුස් දේවස්ථානය යටතේ සියෝන් දේවස්ථානය පවත්වා ගෙන යන බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර මඩකලපුව ප්‍රදේශයේ සියෝන් දේවස්ථාන 08 ක් පමණ තිබෙන බවත් ඒවා මරපාලම්, කරවට්ටි, සූයිස් විලේජ්, කළුගාමන්, කල්මුණේ, තාලංකුඩා සහ පරතිව් වේල් යන ප්‍රදේශවල මඩකලපුවට අදාළව තිබෙන බවත් තමා අනුයුක්තව සිටියේ මඩකපුවේ සෙන්ට්‍රල් පාරේ පිහිටි සියෝන් ප්‍රධාන දේවස්ථානයට අනුයුක්තව බවත් එය මඩකලපුව නගරය මැද පිහිටා තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු මඟින් මඩකලපුව සියෝන් දේවස්ථානය පිහිටි බිම සම්බන්ධ සිතියමක් පැ.126 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර 2019.04.21 දින මෙම දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමක් සිදු වුණ බවත් එම අවස්ථාවේදී තමා සිටියේ සභාව ඇතුළේ බවත් එදින වන විට රෝෂාන් මහේෂන් පියතුමා පිටරට ගොස් සිටි බවත් එම බෝම්බ පිපිරුණු දිනයට දින 04 කට පෙර එලෙස පිටරට ගොස් සිටිය බවටත් සඳහන් කර ඇත. සියෝන් සභාව තිබෙන ඉඩමේම තිබෙන නිවසෙහි රෝෂාන් මහේෂන් පූජකතුමා ඔහුගේ පවුලේ අය සමඟ පදිංචිව සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමා මඩකලපුව සතුර් කොන්ඩාන් නැමැති ප්‍රදේශයෙහි තමාගේ බිරිඳ සහ පුතා සමඟ පදිංචි වී සිටි බවත් පවසා ඇති අතර 2019.04.21 දින

උදේ 8.30 වනවිට තමා තමාගේ බිරිඳ සහ පුතා සමඟ දේවස්ථානයට පැමිණි බවත් එදින පාස්කු ඉරිදා දිනය බවත් එනම් එය ජේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට වූ දවස බවත් පවසා එය වැදගත් දිනයක් බවට පවසා සාක්ෂි ලබා දී ඇත. සියෝන් දේවස්ථානයෙහි ඉරිදා දහම් පාසලක්ද පවත්වාගෙන යන බවත් එහි සාමාන්‍යයෙන් ළමයි 100 ක් පමණ සිටින බවත් පවසා ඇති අතර දහම් පාසල පටන් ගන්නේ උදේ 7.30 ට බවත් එය 8.30 / 8.45 පමණ වනවිට අවසන් වන බවටත් සාක්ෂිකරු පවසා ඇත.

උදෑසන 9.00 සිට 11.30 දක්වා තමාලාගේ ඇදහිලි වන්තයන් එසේම, රෝගී මිනිසුන් සුවය පතා වැඩසටහන්වලට පැමිණෙන බවත් පවසා ඇත. 2019.04.21 දින උදේද දහම් පාසල සඳහා ළමුන් රාශියක් පැමිණ සිටි බවත් එදින තමාලාගේ ශාඛා පියතුමෙකු වන තිරිකුමාරන් නැමැති පියතුමාද එනම් ගනේෂ මූර්ති තිරිකුමාරන් නැමැති පියතුමාද පැමිණ සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එදින උදේ 8.30 ට පමණ තමා එනවිට තමාට එම පියතුමාව ඔෆිස් එකේදී හමුවුණ බවත් එලෙස සිටියදී කෙනෙකු ඇවිල්ලා ඉන්නවා පොඩ්ඩක් ඇවිල්ලා හම්බවෙන්න යැයි 8.35ට 8.45ට පමණ පියතුමා තමාට දැනුම් දුන් බවත් ඒ අනුව තමා එම පියතුමාගේ බ්‍රාන්ච් එකට එනම් පියතුමා කටයුතු කරන සෙන්ට්‍රල් පාරේ තිබෙන බ්‍රාන්ච් එකට ගොස් ඔහු සමඟ කතා කළ බවත් තමාලා යනවිට එම තැනැත්තා ඔෆිස් එකේ දොරකඩ ළඟ සිටි බවත් ඉන්පසු තමා එම තැනැත්තා සමඟ තනියෙන් කතා කළ බවත් ඒ අයගේ අම්මාට යාඥා

කරන්න ඇවිල්ලා ඉන්නවා යැයි එම තැනැත්තා තමාට පැවසූ බවත් ඔහු තමාට එම කාර්යාලය ඉදිරිපිට හමුවුණ බවත් එම අවස්ථාවේදී ඔහුගේ නම උමර් යැයි පැවසූ බවත් ඔහුගේ හැඩරුව අනුව ඔහු කුමන ආගමක පුද්ගලයෙක්ද යන්න සම්බන්ධයෙන් තමාට අවබෝධ කරගැනීමට හැකියාවක් තිබුණේ නැති බවත් එම තැනැත්තා කැප් එකක් දාගෙන සපත්තු දාගෙන සිටි බවත් ඒවගේම ඔහු ස්කූල් බෑග් එකක් වැනි බෑග් එකක් ද දාගෙන සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, ''අම්මාට සනීප නැති බවත් ඒ නිසා යාඥා කරන්න ඕනා'' යැයි එම තැනැත්තා තමාට පැවසූ බවත් ඉන්පසු ''අපි රැස්වීම ඉවර වුණාට පස්සේ ඒ වෙනුවෙන් යාඥා කරමු'' යැයි තමා එම තැනැත්තාට පැවසු බවත් තමා එම තැනැත්තාට ''ඇතුළට ඇවිල්ලා වාඩි වෙලා ඉන්න'' යැයි එනම් දේවස්ථානයට ඇතුළට ඇවිත් වාඩි වෙලා ඉන්න යැයි පැවසූ බවත් එවිට ඔහු දේවස්ථානය ඇතුළට ආවේ නැති බවත් ඔහු ටික වේලාවකින් එතනින් යන බවත් ''කෝල් එකක් එනවා ඊට පස්සේ යනවා'' යැයි පැවසු බවත් පසුව තමාට එයාගේ නම දැනගත් පසු මුස්ලිම් ආගමේ තැනැත්තෙක් බවට තමාට හැඟී ගිය බවත් එම තැනැත්තාට ඇතුළට ඇවිත් ඉන්න ලෙස තමා කිව්ව බවත් ඔහු ඉස්ලාම් සහෝදරයෙක් නිසා ඔහුට සමහර විට එම ස්ථානයේ සිටීමට කැමැති නැති බවක් හෝ ලැජ්ජාවක් තිබෙන්නට ඇති බව තමාට හැඟී ගිය බවත් ඒ අනුව තමා ඔහුට බැල්කනියෙන් ගොස් වාඩි වෙලා ඉන්න යැයි පැවසු බවත් සාක්ෂිකරු පවසා ඇත.

එලෙස පැවසූ එම තැනැත්තා පැය භාගයක් පමණ එම ස්ථානයේ සිටින බව පැවසූ බවත් ඔහුට කෝල් එකක් එන බවත් කෝල් එක ආවාට පසුව යනවා යැයි පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඉන්පසු ''දේව මෙහෙය කීයට දැයි පටන් ගන්නේ'' යැයි එම තැනැත්තා තමාගෙන් ඇසූ බවත් තමා එය 9.00 ට පටන් ගන්නා බවත් පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත. එම සංවාදය වෙනවිට වේලාව උදෑසන 8.45 ට පමණ බවත් ඉන්පසු තමා ඇතුළට ගිය බවත් ඔහු පල්ලියට ඇතුළු වෙන ස්ථානයෙහි දොරකඩ සිටි නිසා තමාට ටිකක් තමාගේ සාමය නැති කරගත් බවට තමාට හැඟුන බවත් ඔහු එලෙස පල්ලිය තුළට ඇතුල්වෙන තැන දොරකඩ හිටගෙන ඉන්න එක හරි දෙයක් යැයි තමාට සිතුනේ නැති බවත් ඉන්පසු තමා සභාවේ සේවය කරන යෝගනාදන් නැමැත්තාට එම ස්ථානයට කතා කර මෙම තැනැත්තා ගැන දැනුම් දී එම තැනැත්තාට ''තමා ඇතුළට එන්න කතා කළත් එයා ඇතුළට එන්න කැමති නැති බවත් යාඥා කරන්න ඇවිත් ඉන්නවා. දැන් අපි මොකද කරන්නේ'' යැයි ඇසූ බවත් එම අවස්ථාවේදී ''මෙයා ඊයේත් ආවා'' යැයි එම යෝගනාදන් තමාට පැවසුවද තමා ඒ ගැන සැහීමට පත්වුනේ නැති බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ තමාට යෝගනාදන් ලබා දුන් පිළිතුර සම්බන්ධයෙන් තමා සැහීමට පත් වීමක් නොවුණ නිසා තමා රමේෂ් නැමැති සේවකයාටද කතා කර මෙලෙස පල්ලියට පැමිණ සිටින

තැනැත්තාගේ නම උමාර් යැයි පවසන බවත් ඔටමාවඩියේ සිට පැමිණි බව දන්වා මවට යාඥා කරන්න ඔහු පැමිණ සිටින බවත් එදින රෝගීන් සම්බන්ධයෙන් යාඥා කටයුතු සිදු කරන්නේ නැති දිනයක් බවත් බදාදා දිනයන්වල එලෙස විශේෂ යාඥා පවත්වන බවත් පවසා තමා ඔහුට ඇතුළට ඇවිත් වාඩිවෙන්න කිව්වද ඒකට ද කැමති වුනේ නැති නිසා තමා ඔහුට උඩ බැල්කනියට යන්න කීවද ඒකටත් එම තැනැත්තා කැමති වුනේ නැති නිසා මේ සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ යැයි රමේෂ්ගෙන් විමසූ බවත් එම අවස්ථාවේදී රමේෂ් තමාට ඇතුළට යන ලෙසත් ඔහු එම පැමිණ සිටි උමාර් නැමැත්තාව පිටත් කර යවන්නන් යැයි තමාට පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

පසුව තමා දේවස්ථානය තුළට ගොස් සිටින විට තමාට තමා කලින් සඳහන් කළ පැමිණි උමර් නැමැත්තාව දක්නට ලැබුණේ නැති බවත් තමා බලන විට එම තැනැත්තා එම ස්ථානයේ සිටියේ නැති බවත් ඔහු එම ස්ථානයෙන් ඉවත් වී ඇති බව තමාට හැඟීගිය බවත් කෙසේ වුවත් තමා ඇතුළේ සිට බැලුවද ඔහු පේන්න සිටියේ නැති බවත් එම අවස්ථාවේදී තමාගේ සිත කැළඹිලා තිබුණු බවත් තමා නැවතත් දොරටුව දෙස බැලීමේදී රමේෂ් සමඟ සේවය කරන සවී නැමැත්තා යමෙක් සමඟ බහින් බස්වීමක් ඇති කරගන්නා ආකාරයක් තමාට පෙනුන බවත් දේව සභාවේ එවැනි ක්‍රියා සිදුවන්නේ නැති බවත් එම තැනැත්තාගේ මුහුණ තමා දැක්කේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.සා. 1315 නාගයියා ස්ටැන්ලි දේවගැතිතුමා වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ සසී නැමති පුද්ගලයා සමග යමෙකු බහින් බස් වෙමින් සිටි අවස්ථාවේ දීම තමාගේ සහෝදරියක් විසින් පල්ලියේ යාඥාවල් පටන් අරගෙන තිබුණ බවත් එවිට වේලාව උදෑසන 9.02 ට පමණ ඇති බවත් තමා සසී නැමැත්තා සිටි තැනට යන්න කියලා තීරණය කළ ක්ෂණයෙන්ම පිපිරීමක් ඇති වුණ බවත් පිපිරීම් සිද්ධ වෙච්ච ගමන්ම තමා ද එහාට ගිය බවත් එම අවස්ථාව තුළ දේවස්ථානය තුළ සෙනග 400ක් පමණ සිටිනු ඇති බවත් දහම් පාසල ඒ වන විට අවසන් වී එහි සිටි ළමුන් එළිමහනේ වතුර බීබී උදෑසන ආහාර ගනිමින් සිටි බවත් එම බෝම්බ පිපිරීමත් සමග තමා කම්පනයට පත් වුණ බවත් එම බෝම්බ පිපිරීම නිසා තමා තුවාල වූ අනෙක් අයට උදව් කරමින් සිටින විට තමාගේ කකුලේ යමක් ඇනුන බවත් එම තත්වය තවමත් හරි ගොස් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. බෝම්බ පිපිරීමත් සමගම තමා ඉස්සරහ දොරටුවට ලඟට දුව ගෙන ගිය බවත් එම ස්ථානයේ රමේෂ් වැටිලා සිටි බවත් රමේෂ් එම අවස්ථාවේ දී ඇස් පියන් අරිමින් වහමින් සිටි බවත් රමේෂ් සිටි ස්ථානයේම මිනිස්සු ගොඩක් වැටිලා සිටි බවත් ඒ ඉදිරියෙහි සහෝදර සහෝදරියන් බිම වැටිලා සිටි බවත් ඔවුන්ගේ ඇඟ මතට යතුරුපැදි වැටිලා ගිනි ගනිමින් තිබෙනවා දැක්ක බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, පසුව රමේෂ් රෝහලට ගෙන යාමෙන් පසුව මිය ගිය බවත් සඳහන් කර ඇත. සසී නැමැත්තා ද ඔහුගේ පුතා ද එම ස්ථානයේ දීම මිය ගිය බවත් සසී සමග

බහින් බස් වෙමින් සිටි පුද්ගලයා කවුද යන්න තමාට සොයා ගැනීමට නොහැකි වුනු බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාගේ බිරිඳ සහ දරුවා ද යාඥා කටයුතු සඳහා සහභාගී වීමට එදින පැමිණ සිටි බවත් බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පසු එම අවස්ථාවේ දී බිරිඳ තමාව ඇවිත් හම්බ වුණ විට පුතා කෝ යැයි ඇහුව ද ඇය දැක්කේ නැහැ යැයි පැවසූ බවත් උඩුමහලේ සාමාන්‍යයෙන් පඩි පෙළක දරුවන් වාඩි වී කෑම කන ස්ථානයක් තිබෙන බවත් එහි දරුවන් බිම වැටී මිය ගොස් සිටි බව තමා දැක්ක බවත් තමා එම ස්ථානයට ගොස් බැලුව ද තමාගේ පුතා එම ස්ථානයේ සිටියේ නැති බවත් පුතාව රෝහලට ඇතුළත් කළා යැයි පසුව බිරිඳ දැනුම් දුන් බවත් පුතා බිම් මහලේ වැටිලා සිටි බවට බිරිඳ තමාට පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාට සිද්ධිය ගැන කිසිවෙකුට පැවසීමට හෝ තමාගේ අතේ ජංගම දුරකථනය තිබුණේ නැති බවත් සාමාන්‍යයෙන් තමා දේව මෙහෙය පටන් ගන්න විට ජංගම දුරකථනය බිරිඳට භාර දී යන බවත් එදින එම ජංගම දුරකථනය බිරිඳ බෑග් එකට දාලා තිබී ඇති බවත් සාක්ෂිකරු පවසා ඇත. දේවස්ථානය ඉදිරිපිට දොරටුව අසල යතුරුපැදි සහ වෑන් එකක් ගිනි ගනිමින් තිබූ නිසා කිසිවෙකුට දේවස්ථානයේ සිට එළියට යාමට නොහැකි තත්වයක් ඇති වී තිබුණ බවත් එම නිසා දේවස්ථානයට පිටුපස තාප්පය කඩා එතැනින් තමාලා පාරට ගිය බවත් උඩුමහලේ සිටි දරුවන් ද වහලයෙන්ම පිටුපසින් බැස්ස වූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, පල්ලියේ ප්‍රධාන දොරටුව ඉදිරිපිට

ගිනි ගනිමින් තිබූ යතුරුපැදි දේව මෙහෙයට සහභාගි වීම සඳහා පැමිණි පිරිසගේ යතුරුපැදි බවටත් පවසා ඇත. එසේම, මෙම සාක්ෂිකරුට නිසි පරිදි මුද්‍රා තබා තිබූ සංයුක්ත තැටියක් විවෘත අධිකරණයේ දී විවෘත කර පෙන්වීමට කටයුතු කර ඇති අතර, එය අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය මඩකලපුව ලෙස සඳහන් වී ඇති පාර්සලයක අඩංගු වූවක් බවත් එහි තිබූ සීඩි පටය පැ.128 ලෙස ලකුණු කර ඇති අතර, එහි ඡායාරූප රාශියක් මෙම සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කරමින් ඒවා දේවස්ථානයට අදාළ දේවස්ථානයේ ගේට්ටුව අසල දර්ශනයන් ද බවට පවසා ඇති අතර, දේවස්ථානය අසල ආසන්නයේ තිබෙන නිවාසවලට අදාළ ඡායාරූප ද එහි තිබෙන බවත් එසේම, පිපිරීම සිදු වුණ වෙලාවේ යතුරුපැදි ගිනි ගනිමින් තිබුණ ස්ථානයට අදාළව ඡායාරූප ද තිබුණ බවත් එම දේවස්ථානයේ පුස්තකාලය තිබෙන ස්ථානය ද ඡායාරූප වලින් පෙන්නුම් කරන බවත් එසේම, තවත් ඡායාරූපයක මෙම සාක්ෂිකරු උමර් නැමති පුද්ගලයා සමග කථා කරමින් සිටි ස්ථානයද ඡායාරූපයක දිස්වන බවත් එසේම, තවත් ඡායාරූප වල දේව සභාවට අයත් ප්‍රධාන දොරටුව සහ අනෙකුත් පිවිසුම් ස්ථාන පෙන්නුම් කරන බවත් පවසා ඇති අතර, අදාළ ඡායාරූපයක් පැ.128 (1), පැ.128 (2), පැ.128 (3) ලෙසද ලකුණු කර ඇති අතර එසේම, එදින පල්ලියට පැමිණ තමා සමඟ කතා කරන ලද උමර් නමැති පුද්ගලයා 03 වන දොරටුව තිබූ ස්ථානයේ සිටි බවට තමාට නිශ්චිතවම මතක බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, පැ.128 (4) ලෙස ලකුණු කර ඇති

ඡායාරූපය නරඹමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එහි ළමයින් ගොඩක් වැටිලා ඉන්න පඩිපෙළක් තිබෙන ස්ථානය දිස්වෙන බවත් එසේම, දේවස්ථානයෙහි එල්ලා තිබූ ඔරලෝසුවද බිම වැටිලා තිබෙනවා තමා දැක්ක බවත් එයට අදාළ ඡායාරූපයක්ද දැක්කොත් හඳුනාගත හැකි බවටත් පවසා එම ඔරලෝසුව සාක්ෂිකරු විසින් හඳුනාගෙන එම ඔරලෝසුවේ නැවතී තිබුණ වේලාව 9.03.04 යි අතර වේලාවක් බවත් පවසා එම ඡායාරූපය පැ.128 (5) ලෙස ලකුණු කිරීමක් කර ඇත.

එසේම ගිනි ගනිමින් තිබී යතුරු පැදි තිබූ ස්ථානය අසල තිබී ගිනිගත් වෑන් රථයකට අදාළ ඡායාරූපයක්ද සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති අතර මිය ගිය ළමුන් වැටී සිටි ස්ථානයේ ආසන්නයේ තිබූ, එසේම බෝම්බ පිපිරීමට හසුවූ ළමුන්ව ගිනි නිවීමෙන් පසුව මඩකලපුව ශික්ෂණ රෝහල වෙත ගෙන ගිය බවට සාක්ෂිකරු පවසා ඇති අතර ළමුන් වැටී සිටියා යැයි පවසන ස්ථානයට අදාළ ඡායාරූපයක් පැ.128 (6) ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇත.

මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවූ කාලය වනවිට ඔහුගේ පුතාගේ වයස අවුරුදු 08ක් බවත් බෝම්බ පිපිරීමෙන් තමාගේ පුතාගේ දකුණු උරහිසේද යකඩ බෝලයක් ඇතුළට ගිහිල්ලා පිට පැත්තේ තිබී සැත්කමකින් ඉවත් කළ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තම බිරිඳගේ එක කුස උපන් සහෝදරියගේ දරුවන් දෙදෙනෙකු එදින ඉරු දින දහම්

පාසලට පැමිණ සිටි බවත් එම දරුවන් දෙදෙනාම මිය ගිය බවත් එසේම, තමාගේ සහෝදරියගේ ස්වාමිපුරුෂයාට ද මෙම බෝම්බ පිපිරීමෙන් තුවාල සිදුවුණ බවත් තමාගේ මවගේ කකුල් දෙකටම යකඩ බෝල ඇතුළු වී තිබුණ බවත් තමාගේ සහෝදරියගේ දියණියටත් තුවාල වෙලා තිබුණු බවත් තමාගේ මවගේ එක කකුලක තවමත් යකඩ බෝල තිබෙන බවත් ඇගේ නම නාගයියා පුෂ්පම් බවත් ඇයට තවම හරියට ඇවිද්දන්නත් බැරි බවත් අවුරුදු 60ක තැනැත්තියක් බවට පවසා ඇත.

එසේම තමාගේ සහෝදරියගේ ස්වාමිපුරුෂයා වන ෆ්‍රැන්සිස් ජොන්ෂන් යන අයටද තුවාල සිදුවී තිබුණු බවත් ඔවුන්ගේ අවුරුදු 11 දරුවා වන ජොන්ෂන් ඩෙබෝරා යන අයටත් තුවාල සිදුවුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, බෝම්බ පිපිරීමෙන් මියගිය තමාගේ බිරිඳගේ සොහොයුරියගේ දරුවන් දෙදෙනා වයස අවුරුදු 10 සහ වයස අවුරුදු 11 ළමයින් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.128 (7) ලෙස ලකුණු කර ඇති ඡායාරූපය නරඹමින් සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ එහි සිටින්නේද දහම් පාසල සඳහා පැමිණි සිද්ධියෙන් මියගිය දැරියකගේ ඡායාරූපයක් බවයි.

මෙම සාක්ෂිකරුට තවත් ඡායාරූපයක් පෙන්වා ඇති අතර එහි මුහුණ විකෘති වී තිබෙන නිසා එම තැනැත්තා තමා සමඟ බෝම්බ පිපිරුණ

දින උදේ කතා කළ උමර් නැමැත්තාද යන්න හරියටම හඳුනාගත නොහැකි බවත් පවසා ඇති අතර මෙම සාක්ෂිකරුට සියෝන් දේවස්ථානයට අදාළව පැ.130 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන අඩංගු සිඩී තැටියෙහි දර්ශන නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර එම වීඩියෝ දර්ශනවල තමා සමඟ උමර් නැමැත්තා කතා කරමින් සිටින ආකාරය පෙන්නුම් කරන බවත් එසේම, ඔහු ඇවිදගෙන යන ආකාරය පෙන්නුම් කරන බවත් මෙම සාක්ෂිකරු විසින් එදින පැමිණි උමර් නැමැත්තාව මෙම වීඩියෝ දර්ශන මඟින් හොඳින් හඳුනාගෙන ඇති අතර එය පැ.130 (1) ලෙස ලකුණු කර ඇත.

එසේම පැ.132 ලෙසද සංයුක්ත තැටියක් ලකුණු කර ඇති අතර එහි ද CCTV වීඩියෝ දර්ශන නරඹමින් එම CCTV දර්ශනවල තමා පෙර සඳහන් කළ උමර් නැමැත්තා තොප්පියක් දාගෙන බෑග් එකක අරන් තැඹිලි පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන එන ආකාරය සහ එහි 2019.04.19 පැය 08.27 ලෙස සඳහන් වී ඇති බවද සාක්ෂිකරු පවසා ඇත.

එසේම එම වීඩියෝ දර්ශනවලට අනුව එම උමර් නැමැත්තා තමාලාගේ දේව සභාවට පැමිණෙන කෙටි මාර්ගයෙන් සියෝන් සභාව දෙසට එන ආකාරය පෙන්නුම් කරන බවත් එසේම, එම වීඩියෝ දර්ශනයෙහි මිනිසුන් කෑ ගසමින් දුවන ආකාරය පෙන්නුම් කරන දර්ශනද තිබෙන බවත් එසේම, මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය නිසා මෙම

දේවස්ථානයේ තිබූ පුස්තකාලය මුලිමනින්ම විනාශ වුණ බවත් එදින බෝම්බ පිපිරීමෙන් 31 දෙනෙක් මිය ගිය බවත් ද 85 දෙනෙක් පමණ තුවාල වුණ බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, බෝම්බ ප්‍රහාර නිසා සියෝන් දේවස්ථානයෙහි තුවාල වීමට ලක්වූ සියලුම පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරියේදී ඉදිරිපත් කරන බවට ද පැමිණිල්ලෙන් සඳහන් කර ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත.

මෙම පැ.සා.1315 නාගයියා ස්ටැන්ලි නැමැති දේවගැති තුමාගේ සාක්ෂියට අනුව 2019.04.21 දින මඩකලපුව සියෝන් දේවස්ථානයට පැමිණ බෝම්බ පිපිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති තැනැත්තා උමර් නැමැත්තෙක් බවට හෙලිවන අතර ඔහු ඔටමාවඩි නැමැති ප්‍රදේශයේ සිට පැමිණි බවට එම තැනැත්තා මෙම සාක්ෂිකරු සමඟ කතා බහ කිරීමේදී හෙලිවී ඇති ආකාරයද පෙනී යයි.

එසේම, සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීමට පෙර ඒ අසල ප්‍රදේශයට අදාළව පැ.130 ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයට අනුව එහි පැහැදිලිවම මෙම සාක්ෂිකරු විසින් සඳහන් කරන ලද උමර් නැමැත්තා සිටින බවට සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇති අතර ඒ අනුව මෙම උමර් නැමැත්තා විසින්ම 2019.04.21 දින මඩකලපුව සියෝන් දේවස්ථානය

තුළදී ස්වයංඝාතක බෝම්බ පිපිරීමේ ක්‍රියාවක් සිදු කළ තැනැත්තාම බවට පැහැදිලිව කරුණු ඉදිරිපත් වී ඇත.

පැ.සා.1291 වෛද්‍ය සාරුමතී රවිචන්ද්‍රන් යන සාක්ෂිකාරිය අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඇය මඩකලපුව සෙන්ට්‍රල් පාරේ 1992 වසරේ සිට පදිංචිව සිටින බවත් ඇගේ නිවස ආසන්නයේම සියෝන් දේවස්ථානය පිහිටා තිබෙන බවත් ඇයගේ නිවසේ සිට සියොන් දේවස්ථානයට පයින් ඇවිදගෙන යා හැකි බවටත් පවසා ඇත. 2019.04.21 වන පාස්කු ඉරිදා දින සියෝන් දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමක් සිදුවූ බවත් එම බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් විමර්ශනය පවත්වන ලද විමර්ශන නිලධාරීන් තමාගේ නිවසේ සවි කර තිබූ CCTV කැමරා වලට අදාළ දත්ත ලබා ගත් බවත් පවසා ඇත. කෙසේ වෙතත් තම නිවසේ තිබෙන CCTV දර්ශන වල පවතින වේලාවන් සම්මත වේලාවට වඩා වෙනසක් තිබෙන බව තමා පසුව දැනගත් බවටත් ඇය පවසා ඇත. පැ.132 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියක අඩංගු CCTV දර්ශන මෙම සාක්ෂිකාරියට නැරඹීම සඳහා විවෘත අධිකරණයේදී විකාශනය කර ඇති අතර, එම CCTV දර්ශන වල තමාගේ නිවස පිටුපස තිබෙන තාප්පය සහ සියෝන් දේවස්ථානයට යන පාර ආවරණය කරමින් දර්ශන තිබෙන බවත් සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීම හේතුවෙන් ඇති වූ කම්පනය නිසා තමාගේ නිවසේද ජනෙල් පියනක් විවෘත වූ බවත් බෝම්බ පිපුරුන වේලාව තමාට නිශ්චිතව කිව නොහැකි බවත් උදේ

9.00ට ආසන්න වේලාවක බෝම්බය පිපිරුණ බවත් එම වේලාවේ තමා නිවසේ සිටි බවත් පවසා ඇත. අධිකරණයේ විකාශනය කරන ලද වීඩියෝ දර්ශනය 2019.04.21 ඉරිදා 08.40 තත්පර 34 ක් යැයි පෙනෙන බවත් එම වීඩියෝ දර්ශනයේ සඳහන් වේලාව සහ බෝම්බය පිපුරුනා යැයි පවසන වේලාව අතර විනාඩි 15 ක 20 ක පමණ වෙනසක් තිබෙන බවටත් සාක්ෂිකාරිය පවසා ඇත.

එම බෝම්බ පිපිරීම සිදු කරන ලද තැනැත්තාගේ හිස තමාගේ නිවසේ කෑම කන කාමරය උඩ සිවිලිමත් වහලයත් අතර කොටසේ තිබී විමර්ශන නිලධාරීන් විසින් සොයා ගත් බවත්. අදාළ බෝම්බ පිපිරීමෙන් තමාගේ නිවසේ වහළයට විශාල වශයෙන් හානි සිදුවූ බවත් ඇය පවසා ඇත. පැ.128 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියක් විවෘත අධිකරණයේ වාදනය කර එහි අඩංගු ඡායාරූප සාක්ෂිකාරියට පෙන්වා ඇති අතර, එහි තමාගේ නිවසේ වහලයට සිදුවූ හානි පෙන්නුම් කරන බවට සාක්ෂිකාරිය පවසා ඇති අතර, එයට අදාළ ඡායාරූපයක් පැ.128 (8) ලෙස ලකුණු කර ඇති අතර එසේම, බෝම්බ පිපිරීම සිදු කරන ලද තැනැත්තාගේ හිස තිබුණ ස්ථානය වන ඇගේ නිවසේ කෑම කන ස්ථානයට ඉහලින් තිබුණ සිවිලිම තිබෙන ස්ථානයට අදාළ ඡායාරූපය ඇය හඳුනා ගෙන පැ.128 (9) ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 13 වන චූදිත සම්බන්ධයෙන් පමණක් වන අතර, අනෙකුත් කිසිදු චූදිතයෙකු වෙනුවන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නැත. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව 2019.04.21 දින පෙරවරුවේ 9.00 ට පමණ මඩකලපුව සෙන්ට්‍රල් පාරේ පිහිටි සියොන් දේවස්ථානයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු වී තිබීම සම්බන්ධයෙන් සහ එම ස්වයංඝාතක බෝම්බකරුගේ හිස කඳින් වෙන් වී සියොන් දේවස්ථානය අසලම පිහිටා තිබෙන මෙම සාක්ෂිකාරියගේ නිවසේ සිවිලිමක් මත පතිත වී තිබී සොයා ගෙන තිබීම සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇත. කෙසේ වුවත් එම ස්වයංඝාතක බෝම්බකරු කවරෙක් ද යන්න සම්බන්ධයෙන් ඔහුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරියට කිසිදු දැනීමක් තිබී නොමැත. විත්තියෙන් මෙම සාක්ෂිකාරියට යෝජනා කර ඇත්තේ ඇය විසින් මෙම බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදු වීමෙන් පසු 2019.04.30 දින විමර්ශන නිලධාරීන්ට ලබා දී ඇති ප්‍රකාශයෙහි ඇගේ නිවසේ තිබී හිසක් සොයා ගත් කරුණ සහ ඇගේ නිවසේ සිවිලිම බිඳී හානි වී තිබීම සම්බන්ධයෙන් කිසිදු කරුණක් සඳහන් කර නොමැති බවට යෝජනා කර ඇති අතර, සාක්ෂිකාරිය ඒ සම්බන්ධයෙන් පවසා ඇත්තේ ඇයට එම අවස්ථාවේ දී ඇගේ ප්‍රකාශයේ දී කුමක් සඳහන් කළා ද යන්න මතක නැති බවත් විමර්ශන නිලධාරීන් ඇගෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දීම පමණක් සිදු කළ බවය.

පැ.සා.1277 මයිල්වාහනම් සිවකුමාර් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු වෘත්තියෙන් ත්‍රීරෝද රථ රියදුරෙකු ලෙස කටයුතු කරන බවත් ඔහු මඩකලපුව පොලිස් ස්ථානය අසල තිබෙන ත්‍රීරෝද රථ ගාලේ සේවය කරන බවත් ඔහු සවස 6.00 සිට පසු දින උදෑසන 6.00 දක්වා මඩකලපුව ප්‍රදේශයේ ත්‍රීරෝද රථ ධාවනය කිරීමේ කටයුතු සිදු කරන ලද බවත් පවසා ඇත. මඩකලපුව සියොන් දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමට අදාළ සිද්ධියට සම්බන්ධව විමර්ශන නිලධාරීන්ට ප්‍රකාශයක් ලබා දුන් බවත් පවසා ඇති සාක්ෂිකරු සිද්ධිය සිදු වූ දින උදෑසන 2.30 ට පමණ කොළඹ සිට පැමිණි බස් රථයකින් පුද්ගලයෙකු මඩකලපුව පොලිසිය අසල බැස්ස බවත් එවිට වේලාව පාන්දර 2.30 ට පමණ ඇති බවත් එම බස් එකෙන් බසින ලද පුද්ගලයා තමාගේ ත්‍රීවිල් රථයට නැග මුස්ලිම් පල්ලියට යන්න ඕනේ යැයි පැවසූ බවත් ඉන් පසු තමා යාබද ෂෙඩ් එක ලඟ තිබුණ මුස්ලිම් පල්ලියට ඔහුව නංවා ගෙන ගිය ද, එම පල්ලිය නොව ලොකු මුස්ලිම් පල්ලියට යන්න ඕනේ යැයි පැවසූ බවත් ඔහුව ත්‍රීරෝද රථයේ නංවා ගෙන මඩකලපුව උසාවිය ඉස්සරහ තිබෙන ලොකු මුස්ලිම් පල්ලිය ලඟින් එම තැනැත්තාව බැස්ස වූ බවත් ඒ සඳහා තමා කුලිය වශයෙන් රු.100/- ක් ඔහුගෙන් ලබා ගත් බවත් පවසා ඇත. අධිකරණය ඉදිරියේ පැ.126 ලෙස ලකුණු කර ඇති සිතියම සාක්ෂිකරුට පෙන්වා දීමේ දී තමාගේ ත්‍රීරෝද රථය නවතා තිබූ ස්ථානය සහ ඒ අතර තිබූ පාර විස්තර කරමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත. මෙම කාලයේ තමා පාවිච්චි කරන

ලද ත්‍රීරෝද රථයේ අංකය ABF – 7969 බවත් එය නිල් පාට බජාජ් යර්ලටේ ත්‍රීවිල් රථයක් බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.130 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියක අඩංගු වීඩියෝ දර්ශනයක් විවෘත අධිකරණයේ නරඹමින් එම වීඩියෝ දර්ශනවල මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථය තිබෙන ආකාරය සහ එම ත්‍රීවිල් රථය මුස්ලිම් පල්ලිය ඉදිරියට ගමන් කරන ආකාරය මෙන්ම ත්‍රීවිල් රථයේ පැමිණි තැනැත්තාව ද එම දර්ශන වලින් සාක්ෂිකරු හඳුනා ගෙන සාක්ෂි ලබා දෙමින් තමාගේ ත්‍රීවිල් රථයට නගින විට එම තැනැත්තා උරහිසේ දමා ගෙන එක බෑග් එකක් ද තවත් බෑගයක් ඔහු පැමිණි බස් එකේ ඩිකියෙන් රැගෙන, තවත් බෑගයක් අතින් ද රැගෙන පැමිණ තම ත්‍රීවිල් රථයෙන් ගමන් කළ ආකාරය සාක්ෂිකරු හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇති අතර, මෙම සාක්ෂිකරු තවදුරටත් විවෘත අධිකරණයේ දර්ශනය කර ඇති වීඩියෝ දර්ශන නරඹමින් 2019.04.21 පාන්දර 2.10 ත් 2.30 ත් අතර එලෙස අදාළ බස් රථයෙන් පැමිණි තැනැත්තා තමා සමග ත්‍රීවිල් රථයේ නැග උසාවිය අසල තිබෙන ලොකු මුස්ලිම් පල්ලිය ඉදිරිපිටට ගෙන ගොස් බැස්ස වූ බවට සාක්ෂි ලබා දී ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් 2019.04.21 වන දින පාන්දර 2.00 ත් 2.30 ත් අතරතුර පැ.130 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියෙහි

අඩංගු CCTV දර්ශනවල සිටින පිරිමි තැනැත්තා මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයෙන් ගමන් කර තිබීම සහ එම අවස්ථාවේ දී ඔහු උරහිසේ සහ අතෙහි බෑග් දෙකක් තබා ගෙන සිට ඇති ආකාරය සහ එම පුද්ගලයා කොළඹ සිට පැමිණි සීඝ්‍රගාමී බස් රථයකින් මඩකලපුව නගරයට පැමිණ ඇති බව ද මනාව හෙළි වේ. කෙසේ වෙතත් එලෙස මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයෙන් ගමන් කරන ලද පුද්ගලයාගේ නම, ගම හෝ අනන්‍යතාවය පිළිබඳ කිසිදු සාක්ෂියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉදිරිපත් වී නොමැත. මෙම සාක්ෂිකරුගෙන් ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නොමැත.

පැ.සා.1281 අබුබකර් සාදීර් හසන් නැමති සාක්ෂිකරු ඔඩ්ඩමාවඩි ප්‍රදේශයේ පදිංචි බවත් තමාගේ නිවස ඉදිරිපිට සෙල්ලම් බඩු සහ ලිපි ද්‍රව්‍ය කඩයක් පවත්වා ගෙන යන බවත් පවසා සාක්ෂි ලබා දී ඇති අතර, මෙම සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි ලබා දෙමින් 2018 වර්ෂයේ සිට 2023 වසර දක්වා මඩකලපුව ටවුමේ ජාමියුස් සලාම් මුස්ලිම් පල්ලියේ 2 වන ඉමාම්වරයා ලෙස කටයුතු කළ බවත් එහි ප්‍රධාන මවුලවිතුමා ලෙස කාත්තන්කුඩිය ප්‍රදේශයේ විසූ නියාස් මවුලවිතුමා කටයුතු කළ බවත් එම පල්ලියෙහි දී තමාට පැවරී තිබූ රාජකාරිය වූයේ සුබහ් සහ මහරිබ් යන නැමදීම් කිරීම සහ අදාන් පරායනය කිරීම බවත් සුබහ් යාඥා අළුයම 4.45 සිට අළුයම 5.05 දක්වා සිදු කරන බවත් මහරිබ් යාඥා කිරීම සවස් කාලයේ 6.00 සිට 6.15 දක්වා සිදු කරන බවත් පවසා ඇති අතර, තමා මෙම යාඥා

කිරීම් සඳහා පාන්දර 4.30 ට නින්දෙන් නැගිට පිරිසිදු වී අදාළ කටයුතු සඳහා සූදානම් වන බවත් පවසා ඇති අතර, එම අවස්ථාව වන විට පල්ලිය විවෘත කරන බවත් පල්ලිය අරින්නේ පාන්දර 4.30 ට බවත් එම වේලාවට පෙර පල්ලිය අරින්නේ නැති බවත් පවසා ඇත. මඩකලපුවේ සිදු වූ බෝම්බ පිපිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් තමා සාක්ෂි දීමට පැමිණි බවත් එම බෝම්බ පිපිරීම උදේ 9.00ට පමණ සිදු වූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එම සිද්ධියට අදාළව තමා ඉමාම්වරයෙක් ලෙස සේවය කළ පල්ලියට අදාළ CCTV දර්ශන පල්ලියෙහි නියාස් මවුලවිතුමා විසින් විමර්ශන නිලධාරීන්ට භාර දී ඇති බවත් පවසා පෙර අවස්ථාවක පැ.130 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි අඩංගු CCTV දර්ශන එම සාක්ෂිකරුට නැරඹීමට විකාශනය කර ඇති අතර එම දර්ශනවල 2019.04.21 වන දින ත්‍රීවිල් රථයෙන් බසින පුද්ගලයෙක් පාන්දර 5.42 ට පමණ බෑග් දෙකක් උස්සා ගෙන පල්ලියට එන ආකාරය පෙන්නුම් කරන බවත් එම තැනැත්තා කොළ පාට ටී ෂර්ට් එකක් සහ බොටම් එකක් හැඳ සිටින බවත් එසේම, සාක්ෂිකරු පැ.130 (1) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයක් පෙන්වා ඇති අතර, එහි මුස්ලිම් පල්ලියේ වැසිකිළියට යන ස්ථානය පෙන්නුම් කරන බවත් එම දර්ශනයෙහි තමා පෙර දර්ශනයෙහි සඳහන් කළ පුද්ගලයා සිටින ආකාරය සාක්ෂිකරු හඳුනා ගෙන ඇති අතර එසේම, තවදුරටත් CCTV දර්ශන නරඹමින් උදෑසන 5.08 ට වීඩියෝ දර්ශනවල මෙම සාක්ෂිකරු සිටින ආකාරය සහ එම දර්ශනයෙහි තමා

කලින් හඳුනා ගත් වීඩියෝ දර්ශනයෙහි සිටි කොළ පැහැති ටී ෂර්ට් එකක් ඇඳගෙන පල්ලිය ඇතුළට පැමිණි පුද්ගලයා තමාගේ දකුණු පස පළවෙනියට සිටින බවට හඳුනා ගෙන ඇත. එසේම, එම පුද්ගලයා මද වේලාවකට පසුව තැඹිලි පාට ටී ෂර්ට් එකක් සහ කළු පැහැති කලිසමක් ඇඳ කැප් එකක් ද දමා ගෙන ඔහු පල්ලියට එන විට රැගෙන එන ලද බෑග් දෙක ද රැගෙන පල්ලිය ඉදිරිපිට සිටින ආකාරය පෙන්නුම් කරන බවට පවසා අදාළ වීඩියෝ දර්ශන පැ.130 (7) ලෙස ලකුණු කිරීමක් කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු විසින් CCTV දර්ශනවල හඳුනා ගෙන ඇති පුද්ගලයා මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා. 1277 මයිල්වාහනම් සිවකුමාර් නැමති ත්‍රීවිල් රථ රියදුරා විසින් 2019.04.21 දින පාන්දර 2.30 ට පමණ කොළඹ සිටි පැමිණි බස් රථයකින් පැමිණ මඩකලපුව පොලිස් ස්ථානය අසලින් බැස එකී මයිල්වාහනම් සිවකුමාර් යන අයගේ ත්‍රීවිල් රථයෙන් මඩකලපුව ලොකු මුස්ලිම් පල්ලිය ලඟට හයර් එකක් ගොස් පල්ලිය ඉදිරිපිට බැස්ස බව සහ එම තැනැත්තා ලොකු බෑග් දෙකක් ද රැගෙන එලෙස පල්ලිය ඉදිරිපිටට තමාගේ ත්‍රීවිල් රථයෙන් ගිය බවට ලබා දී ඇති සාක්ෂිය එකී පල්ලියෙහි 2 වන ඉමාම්වරයා ලෙස කටයුතු කරන මෙම පැ.සා.1282 අබුබකර් සාදීර් හසන් යන සාක්ෂිකරුගේ සාක්ෂිය සමග මනා ගැළපීමක් දිස් වේ. එසේම, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.

1315 නාගයියා ස්ටැන්ලි නැමති දේවගැතිතුමා එනම් බෝම්බය පිපිරූ සියොන් දේවස්ථානයට අදාළ සම්බන්ධ පියතුමාගේ සාක්ෂියේ දී පැ.128 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියෙහි පසුව උමර් යැයි නම දැනගත් ඔඩ්ඩමාවඩි ප්‍රදේශයේ පදිංචිව සිටින බවට සඳහන් කිරීමක් කර ඇති තැනැත්තා එකම තැනැත්තෙකු බව පෙනී යයි.

පැ.සා. 1297 ගනේෂමූර්ති තිරුකුමාරම් නැමති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව සාක්ෂි ලබා දෙමින් මඩකලපුව සියොන් දේවස්ථානයෙහි දේවගැතිවරයෙක් ලෙස තමා කටයුතු කරන බවත් එම දේවස්ථානයෙහි ශාඛාවන් කරවෙට්ටි, පුලියන්තිව් ස්ථානවල ද තිබෙන බවත් පවසා ඇති අතර, පුලයන්තිව්වල ප්‍රධාන දේවස්ථානය තිබෙන බවත් එහි ප්‍රධාන දේවගැති ලෙස රොෂාන් මහේන්ද්‍රන් පියතුමා කටයුතු කරන බවත් එම ප්‍රධාන දේවගැතිතුමා නොමැති අවස්ථාවල තමා එතුමා වෙනුවෙන් කටයුතු කරන බවත් පවසා ඇත. මෙම නඩුවට අදාළ සිද්ධිය සිදු වූ 2019.04.21 දින උදෑසන 7.15 ට පුලියන්තිව්වල තිබෙන සියොන් දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමක් සිදු වුණ බවත් එදින වන විට රොෂාන් මහේෂන් ප්‍රධාන දේවගැතිතුමා විදේශගතව සිටි නිසා තමා වැඩ බැලීම සඳහා එම දේවස්ථානයට ගිය බවත් තමා සමග ස්ටැන්ලි නාගයියා දේවගැතිතුමාත් එදින ගිය බවත් 2019.04.21 උදෑසන 7.15 ට පෙර තමා, තමාගේ පිරිමි දරුවන් දෙදෙනා සමග එම දේවස්ථානයට ගිය බවත් එදින පූජාව උදෑසන 9.00 ට ආරම්භ කිරීමට තිබූන බවත් පවසා ඇත. තමා උදෑසන 7.15 ට

පැමිණ විනාඩි 40 ක් පමණ සිටි බවත් එලෙස සිටිය දී තමා නාගයියා ස්ටැන්ලි පියතුමා සමග එදින පූජාව හා සම්බන්ධ කටයුතු සම්බන්ධයෙන් කථා කරමින් සිටි බවත් එලෙස සිටිය දී එළියේ එක්කෙනෙක් ඉන්නවා යැයි තමාලගේ කාර්යාලයේ සේවය කරන ජයකොඩි නැමති පුද්ගලයා තමාට දැනුම් දුන් බවත් ඒ අනුව තමා එළියට ඇවිල්ලා එම පුද්ගලයාව කාර්යාලයේ දොරටුව ලඟ දේවස්ථානයට මුහුණලා සිටිය දී මුණගැසී ඔහු සමග කථා කළ බවත් එම අවස්ථාවේ දී එම තැනැත්තා තැඹිලි පාටට හුරු ටී ෂර්ට් එකක් හැඳ පිටුපස බෑග් එකක් එල්ලා ගෙන ට්‍රැක් බොටම් එකක් ඇඳ ගෙන අතේ කැප් එකක් තියා ගෙන සිටි බවත් තමා එම තැනැත්තා සමග කථා කළ බවත් එවිට ඔහු ඕට්ටමාවඩියේ සිට පැමිණි බවත් ඔහුගේ නම උමර් බවත් ඔහුගේ මවට කකුලේ අසනීප තත්වයක් තිබෙන බව පැවසූ බවත් ඉන් පසු තමා ඔහුට එළියේ ඉන්න එපා ඇතුළට එන්න යැයි පැවසුවද ඔහු ඇතුළට ඒමට එකඟ වුනේ නැති බවත් එළියේම සිට ගෙන සිටි බවත් ඉන් පසු තමා ඔහුව ස්ටැන්ලි නාගයියා දේවගැතිතුමාට ඔහු සමග කථා කිරීමට භාර දී තමා එම ස්ථානයෙන් පිටත් වුනු බවත් ඉන් පසු තමා එළියට පැමිණ ළමයින්ට උදැසන කෑම සඳහා බනිස් අරන් දී තමාගේ දියණියව සහ බිරිඳව එක්ක ගෙන සියොන් දේවස්ථානයෙන් පිට වී ගිය බවත් එම අවස්ථාවේ දී තමාගේ 2 වන පුතා එළියේ සිටින බව දැක්ක බවත් තම වැඩිමහල් පුතා වන සැලොන් ජෙරමායා නැමති අවුරුදු 14 ක පුතා පෙන්න සිටියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තමා ඉන් පසු

යතුරුපැදියෙන් දියණිය සහ බිරිඳ සමග කරවෙටිටි ශාඛා දේවස්ථානයට යාමට පිටත් වූ බවත් එලෙස යමින් සිටිය දී දේවස්ථානයේ ප්‍රශ්නයක් යැයි දේවස්ථානයෙන් සිට මල්ලි කෙනෙක් තමාට දුරකථන ඇමතුමක් ලබා දුන් බවත් තමා යළි දේවස්ථානය අසලට එන විට ගිනි නිවන හමුදාවේ වාහන ඇවිත් තිබුණ බවත් පුද්ගලයන් රාශියක් මිය ගොස් පුද්ගලයන් රාශියකට තුවාල වී සිටි බවත් ආරක්ෂක අංශ නිලධාරීන් ද සිටි බවත් තමා බලෙන්ම වගේ දේවස්ථානය ඇතුළට ගිය බවත් ඉන් පසු තමා ස්ටැන්ලි පියතුමාව හමු වුණ බවත් ස්ටැන්ලි පියතුමාට කථා කර ගන්න බැරුව කම්පනයෙන් සිටි බවත් එම අවස්ථාවේ තමාගේ වැඩිමහල් පුතා දේවස්ථානයෙන් පිටත වත්තේ සිටි බවත් ඉන් පසු තමාගේ බාල පුතා වන මල්කි නැමති පුතා සම්බන්ධයෙන් සොයා බැලූ බවත් පසුව හඳුනා නොගත් පොඩි අයගේ මළ සිරුරු අතරට ගොස් හොඳටම පිළිස්සිලා තිබුණු පුතාගේ මෘත දේහයේ උදෑසන ඇඳ සිටි කමිසයේ කැබැල්ලක් දම් පාටින් තිබුණ බවත් එම කමිසය තමා විසින් ඔහුට අරන් දුන්න කමිසයක් බවත් එම රෙදි කැබැල්ල අල්ලලා බලලා එය තමාගේ පුතා බවට තමා හඳුනා ගත්ත බවත් තමා එලෙස පුතාගේ සිරුර හඳුනා ගත්තේ මඩකලපුව මෘත ශරීරාගාරයේ දී බවත් පවසා ඇත.

පැ.130 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටිය විකාශනය කර එහි තිබෙන CCTV දර්ශන නරඹමින් එහි පැ.130 (7) යන දර්ශනයෙහි සිටින තමා සමග කථා කළ උමර් නැමති පුද්ගලයා බැක් පැක් එකක් පැළඳ ගෙන

හිසේ කැප් එකක් ද පැළඳ ගෙන සිටින ආකාරය සාක්ෂිකරු හඳුනා ගෙන ඇත.

පැ.132 ලෙස ලකුණු කර ඇති සීඩී තැටිය ද වාදනය කර එහි සඳහන් වීඩියෝ දර්ශනවලින් එහි උමර් නැමති පුද්ගලයා දේවස්ථානයට පැමිණෙන පාර අසලින් දේවස්ථානය දෙසට පැමිණෙන ආකාරය සාක්ෂිකරු හඳුනා ගෙන ඇත.

පැ.128 ලෙස ලකුණු කර ඇති සීඩී තැටියේ අඩංගු 128 (10) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයක උමර් නැමති පුද්ගලයාගේ හිස සහිත ඡායාරූපයක් තිබෙන අතර, එයින් ද සාක්ෂිකරු එය තමා පෙර සඳහන් කළ උමර් නැමැත්තා බවට හඳුනා ගෙන ඇත. එසේම, දේවස්ථානයෙහි අභ්‍යන්තරයෙහි උමර් නැමැත්තා පියතුමා සමග කථා බහ කරමින් සිටි ස්ථානනය දිස් වෙන ඡායාරූප සාක්ෂිකරු විසින් නරඹා හඳුනා ගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැති බවට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරු ලබා දී ඇති සාක්ෂියෙන් පෙර අවස්ථාවක මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.1315 නාගයියා ස්ටැන්ලි යන සාක්ෂිකරුගේ සාක්ෂියේ දී සඳහන් කරන ලද කරුණු සමග මනාව සැසඳෙන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ද 2019.04.21 දින උදෑසන මඩකලපුව සියොන් දේවස්ථානයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරවීම සිදු කර ඇත්තේ මෙම

සාක්ෂිකරු ද තම සාක්ෂියේ දී හඳුනා ගෙන ඇති ඔට්ටමාවඩි ප්‍රදේශයේ සිට පැමිණියා යැයි පවසා ඇති උමර් නැමත්තාම බවට මනාව කරුණු පැහැදිලි වේ.

පැ.සා. 1274 මොහොමඩ් ඉර්ෂාඩ් අබ්දුල් සමඩ් නැමති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා දෙමටගොඩ පදිංචිව සිටින බවත් මරදානේ සහිරා විද්‍යාලය අසල කාපට් කඩයක් දමා ගෙන සිටින බවත් එම කාපට් කඩය අසල පදිකයන් මාරු වීමට බස් නැවතුම්පලක් තිබෙන බවත් පවසා ඇති අතර, තමාගේ ව්‍යාපාර ස්ථානයෙහි ආරක්ෂාව CCTV කැමරා සවි කර තිබෙන බවට පවසා පෙර අවස්ථාවක පැ.132 (2) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශන නරඹමින් එයට අනුව 2019.04.20 දිනට අදාළ දර්ශන තිබෙන බවත් එම වීඩියෝ දර්ශනයෙහි වේලාව උදේ 8.00 ලෙස සඳහන් වී ඇති බවට පෙනෙන බවත් එම වේලාව සම්මත වේලාවෙන් පැයක වෙනසක් තිබෙන වේලාවක් බවත් තමා අධිකරණයේ නරඹන CCTV දර්ශනයෙහි 2019.04.20 දින රාත්‍රී 8.00 ලෙස දිස් වන බව සාක්ෂිකරු පවසා ඇති අතර, එම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්නයක් ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත.

පැමිණිල්ලෙන් මෙම සාක්ෂිකරුව කැඳවා ඇත්තේ පැ.132 (2) ලෙස ලකුණු කර ඇති මෙම සාක්ෂිකරුගේ කඩය ඉදිරිපිටට අදාළ වීඩියෝ දර්ශනයෙහි එනම් 2019.04.20 දින රාත්‍රී 8.00 ලෙස සඳහන් කර ඇති

වේලාවෙහි පැයක වෙනසක් තිබෙන බව පෙන්වා දීමට පමණක් බව පෙනී යයි.

පැ.සා.2198 මොහොමඩ් ශකීර් බදුර්දීන් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 2010 වසරේ සිට කොළඹ සහ මඩකලපුව සහ අක්කරේපත්තුව ප්‍රදේශවලට ගමන් කරන බස් රථවලට අදාළව ආසන වෙන් කිරීම් කටයුතු සිදු කරන බවත් 2019 වසරේත් එලෙස ආසන වෙන් කිරීම් කටයුතු සිදු කළ බවත් පවසා ඇති අතර 2019.04.20 දින කල්මුණ ප්‍රදේශයේ සිට යූ.එල්. අලීන් නැමැත්තා ජංගම දුරකථනයෙන් අමතා තමාට වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් ආසනයක් වෙන් කිරීම කරන ලෙසට ඉල්ලා සිටි බවත් එම අලීන් නැමැත්තාද මෙම සාක්ෂිකරුගෙන්ම ආසන වෙන් කිරීම් කරන අයෙක් බවත් ඒ අනුව තමා කොළඹ සිට අක්කරේපත්තුවට යන අංක 2664 දරන බස් රථයෙහි ආසන අංක 02 වෙන් කරවා දුන් බවත් කෙසේ වුවත් අලීන් නැමැත්තා විසින් එම ආසනය වෙන්කරවා දුන් තැනැත්තා මරදානෙන් බස් එකට නගින බවට තමාට දැනුම් දුන් බවත් කෙසේ වෙතත් පසුව තමාට අලීන්ගෙන් ආසනයක් වෙන් කරපු පුද්ගලයා යැයි පුද්ගලයෙකු විසින් ජංගම දුරකථන අංක 076-5684189 නැමැති ජංගම දුරකථනයෙන් 2019.04.20 දින රාත්‍රී 8.07 ටද, 8.22 ට සහ 8.34 ට එලෙස දුරකථන ඇමතුමක් ලබා දී තිබෙන බවත් මුලින්ම රාත්‍රී 8.07 ට එම තැනැත්තා දුරකථන ඇමතුමක් ලබා දී ඔහු ආමර්වීදියේ ඉන්න බවත් තමාට පැවසුවද එදින බස් රථය ආමර්වීදියෙන්

යන්නේ නැති බවත් මරදාන පොලිසියේ ඉදිරිපිට ස්ථානයෙන් බස් එකට නගින ලෙස සහ අලීන් සමඟ ඒ සම්බන්ධයෙන් කතා කරගන්නා ලෙස තමා එම තැනැත්තාට දැනුම් දුන් බවත් පවසා ඇත.

එම තැනැත්තාම දෙවන වතාවට එනම් රාත්‍රී 8.22 ට දුරකථන ඇමතුමක් තමාට රැගෙන එම තැනැත්තා මරදාන පොලිස් ස්ථානය ඉදිරිපිටට ඇවිත් බස් එකට නගිනවා යැයි පැවසූ බවත් ඉන්පසු එම තැනැත්තා රාත්‍රී 8.34 ට ඇමතුමක් ලබා දී එම තැනැත්තා බස් එකට නැග්ග බවට තුන්වන ඇමතුම ලබා දුන් බවත් එලෙස අදාළ බස් රථය මරදාන ප්‍රදේශයෙන් යන විට තමා වැල්ලවත්තේ ගාලු පාරේ තමාගේ නිවසට යමින් සිටි බවත් සාක්ෂිකරු පවසා සිටින ලද අතර මෙම සාක්ෂිකරු විසින් භාවිතා කරන ලද ජංගම දුරකථන අංකය 077-7166283 බවට පවසා එම ජංගම දුරකථනයට අදාළ 2019 අප්‍රේල් මාසයට අදාළ දුරකථන විස්තර වාර්තාව පැ.133 ලෙස ලකුණු කර ඇත.

එසේම, 076-5684189 දරන ජංගම දුරකථනයෙන් ඉහත පරිදි තමාට දුරකථන ඇමතුම් අවස්ථා තුනකදී ලැබුණු බවට පැවසූ විස්තර යලි අවධාරනය කරමින් පැ.134 දරන දුරකථන විස්තර වාර්තාවෙහි පේළි අංක 479, 480 සහ 482 යන පේළිවල එම දුරකථන අංකය සමඟ සම්බන්ධ වූ බවට හඳුනාගෙන පෙන්වා දී ඇත.

තවද ජංගම දුරකථන අංක 077-9814308 දරන ජංගම දුරකථන අංකයකින්ද තමාට 2019.04.20 දින පැය 15.31 ට දුරකථන ඇමතුමක් ලැබී තිබෙන බවත් පවසා 077-9814308 ජංගම දුරකථනයට අදාළ ග්‍රාහක තොරතුරු අඩංගු විස්තර වාර්තාව පැ.135 ලෙස ලකුණු කර ඇත. එම ලේඛනයෙහි එම දුරකථන අංකයට ඉදිරියෙන් muath යැයි සඳහන් කර a හිස්තැනක් ලෙස පෙනෙන බවත් එම නමට ඉදිරියෙන් 970063013 V යැයි ජාතික හැඳුනුම්පත් අංකයක්ද සඳහන් කර තිබුණු බවත් පවසා ඇති අතර එමෙන්ම 077-9814308 දරන ජංගම දුරකථනයට අදාළ විස්තර වාර්තාව ඔප්පු කිරීමේ භාරයට යටත්ව පැ.136 ලෙස ලකුණු කර ඇති අතර එම ලේඛනයේ පළවන පිටුවේ 16 පේළියේ මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථන අංකය වන 077-166283 තිබෙන බවද සාක්ෂිකරු විසින් හාඳුනාගෙන ඇත.

ජංගම දුරකථන අංක 076-5684189 දුරකථන අංකයට අදාළ විස්තරද සහිත දුරකථන විස්තර වාර්තාවක් ඔප්පු කිරීමේ භාරයට යටත්ව පැ.137 ලෙස ලකුණු කර ඇති අතර එම පැ.137 ලේඛනයේද මෙම සාක්ෂිකරුගේ දුරකථන අංකය වන 077-7166283 අංකය 1, 2, 3 පේළිවල මරදාන ස්ටේෂන් නැමැති ස්ථානයට අදාළව සඳහන් වී ඇති බවත් සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 13 වන චූදිත වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති අතර හරස් ප්‍රශ්නවලදීද මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහුට පෙන්වූ පැ.134 දරන දුරකථන ඇමතුම් විස්තර වාර්තාවට අදාළව අලීන් නැමැත්තාට පවසා ආසනයක් වෙන් කරන ලද තැනැත්තා කවුද යන්න සම්බන්ධයෙන් සහ එම තැනැත්තා බස් එකට නැග්ගාද යන්න තමා දැක්කේ නැති බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලි වන්නේ 2019.04.20 දින බස් රථ අංක 2664 දරන බස් රථයෙන් ජංගම දුරකථන අංක 076-5684189 යන අංකයෙන් එම තැනැත්තා එදින රාත්‍රී 20.07 ට, 20.22, සහ 20.34 ට දුරකථන ඇමතුම් තුනක් ලබා දී ඇති බව සහ එසේම, කොළඹ මරදාන සිට එම දුරකථන අංකවලින් ඇමතුම් ලබා දුන් තැනැත්තා ඉහත කී බස් රථයට නැග්ග බවට මෙම සාක්ෂිකරුට දැනුම් දී ඇති බව වන අතර එමෙන්ම පැ.136 ලෙස ලකුණු කර ඇති 077-9814308 දරන ජංගම දුරකථන විස්තර වාර්තාවේ සඳහන් MUATH a a යැයි නම සඳහන් එසේම, ජාතික හැඳුනුම්පත් අංක 970063013 V යන ජාතික හැඳුනුම්පත් අංකයට අදාළ තැනැත්තා සැබැවින්ම කවරෙක්ද යන්න මෙම නඩුවේ පැමිණිල්ල විසින් ඔප්පු කිරීම කළ යුතු ය.

මෙම සාක්ෂිකරු පවසා ඇති පරිදි යූ.එල්. අලීන් නැමැත්තාගේ ඉල්ලීම මත මෙම සාක්ෂිකරු විසින් බස් රථ අංක 2664 දරන බස් රථයෙහි

ආසන අංක 02 ලෙස වෙන් කරවා දුන් ආසනයේ කොළඹ සිට අක්කරේපත්තුව දක්වා ගමන් කළ බස් රථයෙන් ගමන් කළ තැනැත්තා කවරෙක්ද යන්න සම්බන්ධයෙන් එම තැනැත්තාගේ අනන්‍යතාවය පැවසීමට එම තැනැත්තාව සියසින් දැක නැති බැවින් එලෙස බස් රථයේ ආසන අංක 02 හි ගමන් කළ තැනැත්තා කවරෙක්ද යන්න සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ පැමිණිල්ල විසින්ම වේ.

පැ.සා.1279 (අධිචෝදනා පත්‍රයට අනුව සේතු කමර්දීන් අහමඩ් අස්රාස්) ෂෙයිරු හමීඩ්ඩීන් මොහොමඩ් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු අක්කරෙයිපත්තුව පරණ සිනමා පාරේහි පදිංචිව සිටින බවත් පුද්ගලික බස් කොන්දොස්තරවරයෙක් ලෙස කල්මුණේ කොළඹ මාර්ගයේ ගමන් ගන්නා බස් රථවල සේවය කරන බවත් තමාලාගේ පුද්ගලික බස් රථය ගමන ආරම්භ කරන්නේ වැල්ලවත්තේදී බවත් වැල්ලවත්තේ ෂකීල් (පැ.සා.2198 මොහොමඩ් ෂකීල්) නැමැත්තා විසින් ආසන බුක් කිරීම කර ඇති බවත් පවසා ඇති අතර එම බස් රථයට කොළඹ මරදාන ප්‍රදේශයේ මරදාන ධවලගිරි හෝටලය, ඊට එහා පැත්තේ ඩි.එස්.අයි කඩය සහ එයට එහා පැත්තේ රන් ආභරණ වෙළෙඳසැළද බුකින් සෙන්ටර් එකක්ද තිබෙන බවත් බස් රථය නවත්වන්නේ එම ස්ථානයේ පමණක් බවත් වෙන කොහේවත් නවත්වන්නේ නැති බවත් එය නැවත නවත්වන්නේ කටුනායක එයාර්පෝට් එක ළඟ ඔන්ලයින් බුකින් තිබෙන අයව නන්වාගැනීම සඳහා පමණක් බවත් පවසා ඇත.

2019.04.21 දින මඩකලපුව ප්‍රදේශයේ දේවස්ථානයක බෝම්බ පිපිරීමක් සම්බන්ධයෙන් තමා ප්‍රකාශයක් ලබා දුන් බවට සාක්ෂිකරු පවසා ඇති අතර එම බෝම්බ පිපිරීම සිදුවූ දිනට පෙර දවසේ එම සිද්ධියට සම්බන්ධ තැනැත්තෙකු තමාලාගේ බස් රථයෙන් නැග ගොස් ඇති බවත් වැල්ලවත්තෙන් රාත්‍රී 7.30 ට පිටත් වූ බස් රථයෙහි ආසන අංක 02 බුක් කරගෙන සිටින තැනැත්තෙකු මරදානෙන් බස් රථයට නගින බවට සකීර් නැමැත්තා තමාට දැනුම් දුන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරු පැ.132 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියෙහි 132 (2) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනය නරඹමින් එයට අනුව 2019.04.20 දින රාත්‍රී 20.27 ට බස් රථය මරදානේ සහිරා විද්‍යාලය අසල නවතා තිබෙන ආකාරය පෙනෙන බවත් එම වීඩියෝ දර්ශනයට අනුව පැය 20:24 ට තොප්පියක් දමාගෙන ටී ෂර්ට් එකක් ඇඳ සපත්තු දමා බෑගයක් ඔසවාගෙන සිටින තැනැත්තා ආසන අංක 02 හි ගමන් කළ තැනැත්තා බවත් එම තැනැත්තා මඩකලපුවේ බහින බවට තමාට දැනුම් දුන් තැනැත්තා බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පැ.130 (3) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනය පෙන්වා ඇති අතර එයට අනුව 2019.04.21 දින පැය 02. මිනිත්තු 10 ට බස් රථය මඩකලපුව වටරවුම ගාවින් නවත්වා ඇති ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර මඩකලපුවෙහි බස් රථය නවත්වන ලද ස්ථානය REGIONAL DIRECTOR OFFICE යන ස්ථානය බවට

සාක්ෂිකරු විසින් පවසා ඇති අතර එම ස්ථානය මෙම සාක්ෂිකරු විසින් පැ.126 ලෙස ලකුණු කර ඇති සිතියමද පරීක්ෂා කර බලමින් පෙන්වා දෙමින් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුට පැ.130 (4) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයක්ද පෙන්වා ඇති අතර එයට අනුව එදින තමා සේවය කළ බස් රථය මඩකලපුවේ REGIONAL DIRECTOR OFFICE නැමැති ස්ථානයේ නැවැත්වූ පසු ආසන අංක 02 හි වාඩි වී සිටි පුද්ගලයා බස් එකෙන් බසින ආකාරය සහ එම ස්ථානයෙහි ත්‍රීවීල් රථ ගාලක්ද තිබෙන බවද හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු විත්තිකරුවෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවටද දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු කොන්දොස්තර ලෙස සේවය කළ බස් රථයේ ආසන අංක 02 හි සිට ගමන් කරන ලද ටී ෂර්ට් එකක් ඇඳ සපත්තු දමා සිටි බෑගයක්ද ඔසවාගෙන ගිය තැනැත්තා 2019.04.21 පාන්දර 02.10 ට මඩකලපුව REGIONAL DIRECTOR OFFICE යන ස්ථානයෙහි ත්‍රීවීල් පාර්ක් එකක් ළඟ බැස ගිය බව සනාථ වන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ආසන වෙන් කිරීම ක්‍රියාවට සම්බන්ධ වී ඇති පැ.සා.2198 මොහොමඩ් ෂකීල් යන සාක්ෂිකරුගේ සාක්ෂිය ද සනාථ වේ.

ඒ අනුව මඩකලපුව සියෝන් දේවස්ථානයෙහි 2019.04.21 දින උදෑසන ස්වයංඝාතක බෝම්බයක් පුපුරවා හරින ලද තැනැත්තා පැ.130 සහ පැ.132 දරන සිඩී පටවලට අනුව කොළඹ සිට මඩකලපුව දක්වා ගමන් කරන බස් රථයෙන් පැමිණි තැනැත්තාම විසින් බවට යුක්ති සහගතව නිගමනය කළ හැකි සාක්ෂි ඉදිරිපත් වී ඇති බව පෙනී යයි.

මඩකලපුව සියොන් දේවස්ථානයෙහි සිදුවූ සිදුවීමෙන් තුවාල ලත් අධි චෝදනා පත්‍රයේ නම් සඳහන් සාක්ෂිකරුවන් වන තුවාලකරුවන්ට එසේ තුවාල සිදු බව සියලු චූදිතයින් විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 414 සහ 420 වගන්තීන් ප්‍රකාරව පිළිගැනීම් ලෙස වාර්තා කරන ලද බැවින් එකී තුවාලකරුවන් කිසිවෙකු යලි සාක්ෂි ලබා දීම සඳහා නොකැඳවන ලදී.

පැ.සා.1275 සාමි තම්බි සුදර්ශන් නැමැති සාක්ෂිකරු විසින් මඩකලපුව එල්.බී. ෆිනෑන්ස් සමාගමේ කළමණාකරු ලෙස කටයුතු කරමින් සිටියදී පැ.130 (4) ලෙස ලකුණු කර ඇති CCTV වීඩියෝ දර්ශනය නිසියාකාරයෙන් විමර්ශන නිලධාරීන්ට ලබා දී ඇති කරුණ සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකරන බවට දැනුම් දීම මත එම කරුණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගත් කරුණක් ලෙස වාර්තා කර ඇත.

එසේම, පැ.130 (3) ලෙස සඳහන් CCTV දර්ශනය පැ.සා.1276 මුතුකුමාර් සෙල්වරාසා යන අය විසින් විමර්ශන නිලධාරීන්හට ලබා දීම සඳහා මඩකලපුව ලංකා අයිඕසී ෆිනෑන්ස් ස්ටේෂන් අංක 56, ත්‍රිකුණාමලය පාර, මඩකලපුව නැමැති ස්ථානයේ එහි අයිතිකරුගෙන් ලබා ගෙන 2019.04.24 දින විමර්ශන නිලධාරීන්හට නිසියාකාරව ලබා දී ඇති කරුණද සියලුම චූදිතයන් වෙනුවෙන් පිළිගැනීම මත එම කරුණද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

කෙසේ වුවද සියෝන් දේවස්ථානයෙහි බොම්බ පිපිරීමට අදාළව වාර්තාකර ඇති පිළිගැනීම් ප්‍රකාරව එම දේවස්ථානයෙහි බෝම්බ පිපිරීමක් සිදුවී ඇති බව සහ එකී බෝම්බ පිපිරීම සිදුකර ඇත්තේ මොහොමම්ද් නසාර් මොහොම්මදු අසාද් යන අය බවට වෙනත් සාක්ෂි කැඳවීමක් අවශ්‍ය වන්නේ නැත.

<u>දෙහිවල නිව්ට්‍රොපිකල් ඉන් නැමැති ස්ථානයෙහි සිදු වූ බෝම්බ පිපිරීම.</u>

මෙම නඩුවේ අධිචෝදනා පත්‍රයේ චෝදනා අංක 7696 සිට 7745 දක්වා චෝදනා ගොනු කර ඇත්තේ සියලුම චූදිතයන්ට එරෙහිව 2019.04.21 දින දෙහිවල නිව්ට්‍රොපිකල් ඉන්හි දැනට මියගොස් සිටින

අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් හෙවත් අබු හම්සා විසින් අන්‍යාකාරයෙන් එනම්, බෝම්බ පුපුරවා හැරීමෙන් දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හි සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්වෙතනික හෝ එදිරිවාදි හැඟීම් ඇති වීමට සැලැස්වීමේ වරද සිදු කළ බවද, එකී වරද සිදු කිරීමේ දී මෙරිඤ්ඤගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන අයවලුන්ගේ මරණය සිදු කිරීමෙන් දැනට මියගොස් සිටින එකී අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් හෙවත් අබු හම්සා, 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (උ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවත් එකී වරද සිදු කිරීම සඳහා සෙසු සියලුම චූදිතයින් දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබු හම්සාට අනුබල දීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවට වේ.

ඉහත කී මරණයට පත් වූ පුද්ගලයින් දෙදෙනා එම දිනයේ එනම් 2019.04.21 දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නැමැති නවාතැන්පලේ ස්වයංඝාතක බෝම්බය පිපිරුණු කාමරයට යාබද කාමරයක් තුළ නවාතැන් ගෙන සිටි දෙදෙනෙකු වේ.

2019.04.21 දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේ සිදුවූ බෝම්බ ප්‍රහාරය හේතුකොට ගෙන එහි නැවතී සිටි යුවළක් වන මෙරින්නගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන අය මියගොස් ඇති බව සහ වාද්දුවගේ කාංචන මාලා රම්‍යකුමාරි පෙරේරා (පැ.සා.1360) සහ අනිල් සල්ගාදු (පැ.සා.1361) යන අය ඉහත මියගිය මෙරින්නගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන අයගේ මෘත දේහයන් හඳුනා ගැනීම සියලුම චිත්තිකරුවන් වෙනුවෙන් හබ නොකරන බව ප්‍රකාශ කිරීම මත එම කරුණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීම් ලෙස වාර්තා කර ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.2211 තමරා අධිකාරී නැමැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ මහ කොළඹ පළාත් කාර්යාලය තක්සේරුකරු විසින් 2020.01.13 දාතමින් යොමු කර ඇති CM/DMC/LM/2587 නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පොලේ 2019.04.21 දින සිදුවූ බෝම්බ පිපිරීමෙන් රුපියල් හය මිලියන පන්සීය අනුදාහක

අලාභයක් වී ඇති බවට ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාව සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකර පිළිගන්නා බවට සඳහන් කර ඇති හේතුව මත එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

පැ.සා.2209 මොහොමඩ් තාසීර් මොහොමඩ් නිල්වාර් යන ත්‍රී රෝද රථ රියදුරු විසින් ඔහුගේ WP AAG - 5217 යන ත්‍රී රෝද රථයෙන් මෙම නඩුවේ අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන අය දෙහිවල එබනීසර් ප්ලේස් සිට නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පළ වෙත 2019.04.21 දින පස්වරු 1.00 න් පසු වේලාවකදී ගෙන ගොස් හැරලූ බවට වන කරුණුද විත්තිය විසින් සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකර පිළිගැනීම මත එම කරුණුද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

මෙම බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් මෙම නඩුවේ පැමිණිල්ලෙන් කැඳවන ලද සියළු සාක්ෂි අප විසින් සළකා බලන ලදී. මෙහි දී පැමිණිල්ලෙන් කැඳවන සාක්ෂි මඟින් පෙනී යන්නේ ඉහත කී පරිදි දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පලේ ස්වයංඝාතක බෝම්බ පිපිරුම සිදුකළ අබ්දුල් ලතීප් ජමීල් මොහොමඩ් නැමැත්තා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ නැවතී සිටීම සහ එම හෝටලයෙන් පිටවී දෙහිවල නිව්

ට්‍රොපිකල් ඉන් නවාතැන්පලට ගොස් එහි දී ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවාහැරීම සිදුකර ඇති බවය.

පැ.සා.2200 වීරසිංහ ආරච්චිගේ කෞෂල්‍ය ඩන්කන් වීරසිංහ යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා 2014 වසරේ සිට කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයෙහි සේවය කරන ලද බවත් 2019.04.21 දින පාස්කු ප්‍රහාරය සිදුවූ දිනයේ තමා ටාජ් සමුද්‍රා හෝටලයේ පිළිගැනීම් නිලධාරී ලෙස කටයුතු කළ බවත් 2019.04.17 වන දින පස්වරු 1.00 ට තමා පිළිගැනීමේ කවුන්ටර් වලින් අංක 01 කවුන්ටරයේ පස්වරු 1.35 ත් 1.45 ත් සිටියදී තොප්පියක් දාගෙන රෙදිවුල වවාගෙන බෑග් එකක් එල්ලාගත් තැනැත්තෙකු තමා සිටි කවුන්ටරයට තනිව පැමිණ කාමරවල මිල ගණන් විමසා සිටි බවත් එසේම, අඩුවට ගන්න පුළුවන් කාමර ගැනද තමාගෙන් ඇහුව බවත් එම අවස්ථාවේදී තමා ඔහුට ඔන්ලයින් හරහා ගොස් අඩුවට කාමරයක් බුක් කරගන්න හැකි බවට පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පැ.116 (3) ලෙස ලකුණු කර ඇති ටාජ් සමුද්‍රා හෝටලයට අදාළ CCTV දර්ශන පෙන්වා ඇති අතර එයට අනුව 2019.04.17 දින කවුන්ටර් 01 ට අදාළ 01 දින පැය 13:46 ට තමා විසින් පෙර සඳහන් කරන ලද තැනැත්තා එම කවුන්ටරයට පැමිණ තමා සමඟ කතා කරන ආකාරය සහ ඉන්පසුව පිටවී යන ආකාරය පෙන්නුම් කරන බවට පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පැ.116 (3) CCTV වීඩියෝ දර්ශනයෙහි ඔහු විසින් හඳුනාගෙන ඇති තැනැත්තාගේ නමක් හෝ ඔහු කොහේ සිට පැමිණි තැනැත්තෙක්ද යන ආදි විස්තර කිසිවක් පිළිබඳව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කරුණු හෙළි නොවන අතර හුදෙක් 2019.04.17 වන දින පස්වරු 1.46 ට පමණ මෙම සාක්ෂිකරු හඳුනාගත් තැනැත්තා ටාජ් සමුද්‍රා හෝටලයෙහි පිළිගැනීමේ කවුන්ටරයට පැමිණ කාමර වෙන් කිරීම සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් කරුණු විමසා ඇති බව පමණක් සනාථ වේ. මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත. ඒ අනුව ඔහුගේ සාක්ෂිය අවිවාදිතව ඉදිරිපත් වී ඇත.

පැ.සා.1349 මුතුකුමාර සේල්වකුමාර නැමැත්තා සාක්ෂි ලබා දෙමින්, 2017 වසරේ අප්‍රේල් මස 04 වන දින සිට ටාජ් සමුද්‍රා හෝටලයෙහි CCTV ක්‍රියාකරු ලෙස සේවය කළ බවත් 2019 අප්‍රේල් මාසය වනවි ට එම කටයුතු සිදු කළේ තමා පමණක් බවත් එම කාලය වනවිට ටාජ් සමුද්‍රා හෝටලයේ ආරක්ෂක කළමණාකරු ලෙස සේවය කළේ ඉන්දික ප්‍රනාන්දු නැමැත්තා විසින් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර 2019 අප්‍රේල් මාසය වනවිට ආසන්න වශයෙන් CCTV කැමරා 200 ක් පමණ තිබුණු බවත් 2019 වසර වනවිට හෝටලයේ රෙස්ටුරන්ට් 04 ක් පමණ තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවද 2019 අප්‍රේල් වනවිට CCTV කාමරයෙහි ඩිවිආර් 12 ක් තිබුණු බවට සහ මොනිටර් 12 ක් ද තිබුණු බවට සාක්ෂිකරු පවසා ඇති අතර එම CCTV කාමරයට අදාළව කාමරයෙන් CCTV දර්ශන බාගත කිරීම් සඳහා අනිවාර්යෙන්ම ආරක්ෂක කළමණාකරුගෙන් අවසර ලබාගත යුතු බවට සඳහන් කර ඇති අතර ටාජ් සමුද්‍රා හෝටලයට අදාළ CCTV ස්ථාපනය කරන ලද්දේ KAYJAY යැයි ආයතනය විසින් බවත් ඒවා අලුත්වැඩියා කිරීම් කළේද එම සමාගම විසින්ම බවත් සාක්ෂිකරු පවසා ඇත.

පාස්කු ප්‍රහාරයට අදාළව තමා විසින් ටාජ් සමුද්‍රා හෝටලයට අදාළව 2019.04.15 සිට 22 දින දක්වා CCTV දර්ශන පොලිසියට සහ සී.අයි.ඩී එකට ලබා දුන් බවත් පවසා සාක්ෂි ලබා දී ඇති අතර 2019.04.17 වන දිනට අදාළ CCTV දර්ශන අඩංගු තැටියක් මෙම සාක්ෂිකරු මඟින් පැ.116 (1) ලෙස ලකුණු කර එම දර්ශනවලට අනුව 2019.04.17 පස්වරු 1.45 ට ඩෙක්ෂූස් දෙකක් දාගත් ටී ෂර්ට් එකක් සහ කලිසමක්ද ඇඳ සිටි බෑග් එකක්ද රැගෙන එන ලද පුද්ගලයෙකු ත්‍රී රෝද රථයකින් හෝටල් පරිශ්‍රය තුළට ඇතුල්වන ආකාරයක් පෙනී යන බවත් එම තැනැත්තා හිස්වැසුමක්ද පැළඳ සිටින බව පෙනී යන බව එම තැනැත්තා හෝටලයේ ලෝබි එක දෙසට ඇතුළු වී RECEPTION TABLE 01 අසල ඉදගෙන සිටින ආකාරය සහ එම අවස්ථාවේදී ඔහුට හෝටල් සේවකයෙකු විසින් සේවය සපයන

ආකාරය ද CCTV දර්ශන තුළින් පෙනී යන බව පවසා අදාළ CCTV දර්ශනය පැ.116 (03), පැ.116 (4) ලෙස ලකුණු කර ඇත.

සාක්ෂිකරු CCTV දර්ශන තවදුරටත් නරඹමින් ඉහත කී තැනැත්තා 2019.04.17 පැය 13.50 ට හෝටලයේ සිට ගෝල්ෆේස් එක පැත්තට ඇවිදගෙන යන ආකාරය ද හඳුනාගෙන එය පැ.116 (06) ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරු මඟින් 2019.04.20 දිනට අදාළ CCTV දර්ශන අඩංගු සංයුක්ත තැටියක් පැ.138 ලෙස ලකුණු කර ඉදිරිපත් කරමින් එය වාදනය කිරීමේදී 2019.04.20 දින පැය 16.52 ට පෙර අවස්ථාවක තමා පැ.138 (1) ලෙස ලකුණු කරන ලද CCTV දර්ශනයෙහි හඳුනාගත් කාර් රථයේ පිටුපස දොරෙන් තමා පෙර කී තැනැත්තා බැස ඇදගෙන යන බෑග් එකක්ද රැගෙන මේන් එන්ට්‍රන්ස් එකෙන් එළියට යන ආකාරය පෙනී යන බවත් එසේම, එම තැනැත්තා කාර් රථයෙන් බැස හෝටලයෙහි ලොබි එකේ රිසිප්ෂන් එක පැත්තට බෑගයද රැගෙන ගමන් කරන ආකාරය CCTV දර්ශනයෙහි අඩංගු වන බවට පවසා එම CCTV දර්ශනවල පැ.138 (2) සහ පැ.138 (3) ලෙස ලකුණු කර ඇත.

තවද මෙම සාක්ෂිකරු විසින් පවසා ඇත්තේ 2019.04.17 වන දිනට අදාළව CCTV දර්ශනවලද හඳුනාගත් තැනැත්තාම මෙම 2019.04.20 දිනට

අදාළ CCTV දර්ශනවල සිටින බව වන අතර එසේම, එම තැනැත්තා ටාජ් සමුද්‍රා හෝටලයේ සේවිකාවක් කතා කරන ආකාරයද ඉන්පසුව එම අවස්ථාවේදී බෙල්බෝයි වශයෙන් කටයුතු කළ තැනැත්තා සමඟ තමා ඉහතින් හඳුනාගත් තැනැත්තා හෝටලයෙහි ලිෆ්ට් එක දෙසට ගමන් කරන ආකාරය හඳුනාගෙන අදාළ CCTV දර්ශනය පැ.138 (4) ලෙස හඳුනාගෙන ඇති අතර එසේම, CCTV දර්ශන තවදුරටත් නරඹමින් 2019.04.20 පැය 17:07 ට තමා පෙර සඳහන් කරන ලද පුද්ගලයා තුන්වන මහලේ පිහිටි කාමරයකට ගමන් කරන ආකාරය සහ තමා පෙර පැවසූ බෙල්බෝයි එම අමුත්තාගේ බෑගය උස්සගෙන රූම් එක ඇතුළට ඇතුල්වන ආකාරය පෙනෙන බව හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එයට අදාළ CCTV දර්ශනය පැ.138 (05) ලෙස ලකුණු කර ඇත.

තවද එම තැනැත්තා 2019.04.20 පැය 17.39 ට ඔහු සිටි කාමරයෙන් එළියට පැමිණ කොරිඩෝ එකෙන් ගමන් කර තුන්වන මහලේ පිහිටි විදුලි සෝපානයෙන් ගමන් කර එයින් බැස ලොබි එකට ගමන් කරන ආකාරය හඳුනාගෙන එම CCTV දර්ශනය පැ.138 (5), පැ.138 (6), පැ.138 (7) ලෙස ලකුණු කිරීමක් කර ඇත. ඉන්පසු එම තැනැත්තා ලිෆ්ට් එක පැත්තේ සිට අතේ ජංගම දුරකථනයක්ද තබාගෙන ලෝබි එකෙන් එළියට එන ආකාරය සහ එම අවස්ථාව වනවිට පෝච් එක ළඟ නවතා තිබූ වාහන තුනකින් එක්

වාහනයකට එම තැනැත්තා ඇතුල්වන ආකාරයද පෙනී යන බවත් හඳුනාගෙන ඇත.

එසේම, එම කාර් රථය හෝටලයෙන් පිටවී යන ආකාරයද CCTV දර්ශනවල පටිගත වී ඇති ආකාරය සාක්ෂිකරු විසින් CCTV දර්ශන මඟින් හඳුනාගෙන ඇත.

2019.04.21 දිනට අදාළව පැ.116 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනවල පැ.138 (11) ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති අතර ඒ අනුව 2019.04.21 දින පැය 07:08 ට හෝටලයට මෝටර් රථයකින් පැමිණ පුද්ගලයෙකු බසින ආකාරය පෙනී යන බවත් එම තැනැත්තා 2019.04.20 දින හෝටලයට පැමිණි තුන්වන මහලෙහි චෙකින් කළ තැනැත්තා බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

ඔහු පැමිණි නිල් පාට වාහනයෙන් බැස වාහනය පිටුපසට පැමිණ එහි ඩිකිය ඇර බෑග් එකක් ඉවතට රැගෙන වාහනයේ රියදුරුට මුදල් ගෙවා ඉන්පසු එම බෑගය ඇදගෙන හෝටලයට අතුළු වන ආකාරය පෙනී යන බවත් එම බෑගය මෙම තැනැත්තා විසින් 2019.04.20 දින රැගෙන පැමිණි බෑගය නොව පෙර දින රැගෙන එන බෑගයට වඩා විශාල බෑගයක් මෙලෙස මෙම දිනයේ එම වීඩියෝ දර්ශනය පැ.138 (12) ලෙස ලකුණු කර ඇත.

ඉන්පසු එම තැනැත්තා හෝටලයෙහි පිහිටි ports of Call 01 ලෙස සඳහන් වෙන රෙස්ටුරන්ට් එකට ඇතුල්වෙන බවත් එම අවස්ථාවේදී වේලාව උදෑසන 7.09 බවත් එම අවස්ථාව වනවිට එහි සෙනග කිසිවෙකු නොමැති බවත් ඔහු රෙස්ටුරන්ට් එක ඇතුළට ගොස් රෙස්ටුරන්ට් එක බලා ආපසු බෑග් එක රැගෙන නැවත ලොබි එක පැත්තට ගමන් කරන බවත් ඉන්පසු ඔහු බෑගයත් සමඟ ලිෆ්ට් එක තුළට නැග තුන්වන මහලට ලිෆ්ට් එකෙන් ගමන් කර ඔහු රැගෙන පැමිණි බෑගයත් ඒ සමඟ රැගෙන යන බවත් ඉන්පසු 2019.04.21 පැය 8.32 ට එම තැනැත්තා බෑගයක් පිටේ එල්ලාගෙන තව බෑගයක් අතින් ඇදගෙන තුන්වන මහලේ විදුලි සෝපානයට ඇතුළු වන ආකාරය ද CCTV දර්ශනවලින් පෙනී යන ආකාරය එම ලිෆ්ට් එකේන් ඔහු ලෝබි එකට ගොස් පෙරවරු 8.31 වනවිට නැවතත් ඔහු ports of call 01 නැමැති ආපන ශාලාවට ඇතුළු වන බවත් එම අවස්ථාවේදී පෙරට වඩා අමුත්තන් ප්‍රමාණයක් සිටින ආකාරය CCTV දර්ශනවලින් පෙනී යන ආකාරයත්, එම අවස්ථාවේදී තමා හඳුනාගත් තැනැත්තා පිටේ එල්ල ගත් බෑගය සමඟ රෙස්ටුරන්ට් එක තුළ වටපිට බලන බවත් එම අවස්ථාවේදී ඔහු පෙර විදුලි සෝපානයෙන් පහත මහලට රැගෙන එන විට තරමක් කුඩා බෑගය ඔහුගේ අත නොමැති බවට පවසා අදාළ CCTV දර්ශනය පැ.131 (18) ලෙස ලකුණු කර ඇත.

එසේම, ඔහු අවන්හලේ හිටගෙන සිටින ස්ථානයේ පුද්ගලයන් ඔබ මොබ ගමන් කරන ආකාරය ආහාර පාන ලබාගන්නා ආකාරය, ආහාර බෙදා ගන්නා ආකාරය පෙනී යන බවත් එම තැනැත්තා පිටේ බෑගයෙ එල්ලාගෙන ඔහු අත තිබුණු ෆෝන් එක දිහා බලා ඉන්නා බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, ඉන්පසු පැය 08.41 ට එම තැනැත්තා රෙස්ටුරන්ට් එක පැත්තේ ඉදලා ලොබි එක පැත්තට ජංගම දුරකථනයක්ද පාවිච්චි කරමින් එන බවත් ඔහු පැළඳ සිටි පිටේ ඒල්ලා ගත් බෑග් එකේ එකේ පටි සමඟ යමක් සිදු කිරීමක් කර ඉන්පසුව එතනින් පිටත් වී රෙස්ටුරන්ට් එක පැත්තට යලි යන ආකාරය අඩංගු CCTV දර්ශනය පැ.138 (22) ලෙස ලකුණු කර ඇත.

ඉන්පසු එම තැනැත්තා නැවතත් බෑග් එක එල්ලාගෙන රෙස්ටුරන්ට් එකෙන් පිටතට පැමිණ ලිෆ්ට් එකේ නැග තුන්වන මහලෙහි ඔහු සිටි කාමරයට ගොස් එම කාමරයේ සිට ඔහු පිටේ එල්ලගෙන ගිය බෑග් එකට අමතරව තවත් බෑග් එකක් ඇදගෙන කාමරයෙන් එළියට එන ආකාරය දැක්වෙන CCTV දර්ශනය හඳුනාගෙන එය පැ.138 (25) ලෙස ලකුණු කර ඇත.

ඉන්පසු විදුලි සෝපානය ඔස්සේ ලොබි එකට පැමිණ යලිත් වතාවක් රෙස්ටුරන්ට් එක තුළට ඇතුල් වන ආකාරය දර්ශනය වන බවත් ඉන්පසුව ඔහු ෆෝන් එක පාවිච්චි කරමින් වටපිට නිරීක්ෂණය කරන බව පෙනී යන

බවත් එවිට වේලාව උදෑසන 8.50 ට පමණ බවත් ඉන්පසු එම තැනැත්තා මේසයක් ළඟ ඉදගෙන පිටේ එල්ලගෙන සිටි බෑග් එක පැත්තකින් අරන් තබා ෆෝන් එකත් පැත්තකින් තබා බෑග් එකේ යටි පැත්තේ වයර් කෑලි දෙකක් අමුණා යමක් ෂෝට් කරන්න උත්සාහ කරන ආකාරයක් පේන බවත් එම අවස්ථාවේම ඔහුට ඔහුගේ ජංගම දුරකථනයට ඇමතුමක් එන බවත් ඒ සමඟ ඔහු බෑග් එක පිටේ එල්ල ගෙන රෙස්ටුරන්ට් එකේන් එළියට යන ආකාරය දිස්වෙන බවත් ඔහු නැවත ලොබි එක පැත්තට ගමන් කරන බව CCTV දර්ශනය නරඹා හඳුනා ගෙන එම CCTV දර්ශනය පැ.138 (30) ලෙස ලකුණු කර ඇත.

2019.04.21 දින පැය 08.53 ට අදාළ CCTV දර්ශන නරඹමින් එම අවස්ථාවේ ඔහු විසින් කරේ පැළඳ ගෙන සිටි බෑග් දෙකට අමතරව ඔහු විසින් ඇදගෙන එන ලද බෑග් දෙක බෙල්බෝයි කෙනෙක් විසින් රැගෙන ගොස් ඔහුට දෙන ආකාරය සහ ඒ වනවිටත් ඔහු පිටේ පැළඳ ගෙන සිටි බෑගය ඒ ආකාරයෙන්ම තිබෙන ආකාරයද ඉන්පසු ඔහු විසින් ඇදගෙන යා හැකි බෑග් දෙක සහ පිටේ එල්ලාගෙන යන බෑග් එකක් රැගෙන හෝටල් භූමියෙන් පිටත්ව ගාලු පාරට එන ආකාරය දැක්වෙන CCTV දර්ශනය පැ.138 (34) සහ පැ.138 (35) ලෙස ලකුණු කර ඇත.

සාක්ෂි විශ්ලේශණය කර ඇගැයීමට ලක් කිරීම.

ඉහත සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පැහැදිලිව පෙනී යන්නේ 2019.04.20 දින ටාජ් සමුද්‍රා හෝටලයෙහි තුන්වන මහලෙහි කාමරයක නවාතැන් ගෙන සිටි මෙම සාක්ෂිකරු විසින් CCTV දර්ශනවලින් හඳුනාගත් පුද්ගලයා 2019.04.21 දින උදෑසන ටාජ් සමුද්‍රා හෝටලයේ ports of call 01 අවන්හලට ඇදගෙන යන බෑග් දෙකක්ද, පිටේ එල්ලාගෙන යන බෑග් එකක් ද සමඟ ගොස් ඉන්පසුව මඳ වේලාවකට පසුව එම ඔහුගේ ජංගම දුරකථනයට දුරකථන ඇමතුමක් ලැබුණු විගසම එම ස්ථානයෙන් පිටතට ගොස් පෙරවරු 8.54 වන විට ටාජ් සමුද්‍රා හෝටල් භූමියෙන් එළියට පිටත්ව ඔහු සන්තකයේ තිබුණු බෑග් තුනද සමඟ ගාලු පාර දෙසට ගමන් කර ඇති බවයි.

මෙම සාක්ෂිකරු විසින් ටාජ් සමුද්‍රා හෝටලයට අදාළව 2019.04.20 සහ 2019.04.21 දිනට අදාළ CCTV දර්ශන නරඹමින් ඉහත පරිදි ලබා දුන් සාක්ෂිය විත්තිය විසින් කිසිදු හබ කිරීමකට ලක් කර නොමැති අතර කෙසේ වුවත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.17 වන දිනද එම තැනැත්තාම ටාජ් සමුද්‍රා හෝටලයට පැමිණ ඇති අතර ඉන්පසු 2019.04.20 දිනද ඔහු ටාජ් සමුද්‍රා හෝටලයෙහි ඔහු හෝටලයේ සිට ඉවතට පැමිණ ගෝල්ෆේස් දෙසට ගමන්කර ඇති ආකාරය පෙනී යන අතර ඉන්පසු ඉහත පරිදි 2019.04.21 දින ටාජ් සමුද්‍රා හෝටලයෙහි තුන්වන

මහලෙහි ඔහු නැවතී සිටි කාමරයේ සිට පිටෙහි එල්ලාගෙන යන බෑගයක්ද බිම දිගේ ඇදගෙන යන තරමක් විශාල බෑග් දෙකක්ද රැගෙන ports of call 01 අවන්හලට ද ගොස් මඳ වේලාවකට පසුව එයින්ද පිටතට පැමිණ 2019.04.21 දින පෙරවරු 8.54 වන විට ඔහු රැගෙන පැමිණි බෑග් තුනද රැගෙන ටාජ් සමුද්‍රා හෝටලයෙන් පිටතට පැමිණි ආකාරය මැනවින් පෙනී යයි.

කෙසේ වෙතත් එම තැනැත්තා කවර නමකින් යුතු තැනැත්තෙක්ද, ඔහු විසින් රැගෙන යන ලද බෑග් වල තිබුණේ කුමක්ද, ඔහු මෙලෙස එම බෑග්ද සමඟ ටාජ් සමුද්‍රා හෝටලයෙන් පිටතට ගිය පසු ගමන් කරන ලද්දේ කුමන ස්ථානයකට ද, ඉන්පසු ඔහු සිදු කළේ කුමක්ද, යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුට කිසිදු දැනුමක් තිබී නොමැත.

පැ.සා.1347 කොටුව විදානලාගේ ලක්ෂිකා ප්‍රියදර්ශනී පෙරේරා යන සාක්ෂිකාරිය සාක්ෂි ලබා දෙමින් ඇය 2019 වසරේ අප්‍රේල් මාසය වනවිට ටාජ් සමුද්‍රා හෝටලයේ පිළිගැනීමේ නිලධාරීනියක් ලෙස සේවය කළ බවත් තමා රාජකාරී කළ රෙසෙප්ෂන් මේසය පිහිටි ස්ථානය CCTV කැමරාවලින් ආවරණය වී තිබුණු බවත් එම ස්ථානයේ කවුන්ටර් තුනක් තිබුණු බවත් 2019 අප්‍රේල් මාසය වනවිට ටාජ් සමුද්‍රා හෝටලයේ භාවිතා කළ තොරතුරු ගබඩා කිරීමේ පද්ධතිය ඔපෙරා වී 05 යන සිස්ටම් එක බවත් පවසා ඇත.

2019.04.20 දින වනවිට ටාජ් සමුද්‍රා හෝටලයෙහි පෙර කාමර වෙන් කර ගැනීමකින් තොරව පැමිණෙන පුද්ගලයන් කාමර වෙන් කර ගැනීමට ඉල්ලීම් කිරීමේදී අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පාස්පෝට් එක ඉල්ලා සිටින බවත් එලෙස පැමිණෙන තැනැත්තන්ගේ ඊ මේල් ලිපිනය සහ දුරකථන අංකය ලබා ගන්නා බවත් ඉන්පසු එම විස්තර පද්ධතියට ඇතුළත් කරන බවත් පවසා ඇති අතර එම සාක්ෂිකාරියට ටාජ් සමුද්‍රා හෝටලයෙහි කාමරයක් වෙන් කිරීමට අදාළ අංක 851994 දරන රෙජිස්ට්‍රේෂන් කාඩ් එකක් පෙන්වා ඇති අතර එහි මෙම සාක්ෂිකාරියගේ අත්සනද තිබෙන බවට හඳුනාගෙන ඇත.

එම ලේඛනය මත ජමිල් මොහොමඩ් නැමැති පුද්ගලයා එනම් 2019.04.20 දින කාමරයක් වෙන් කරගත් පුද්ගලයා විසින් එම තැනැත්තාගේම අත් අකුරින් ජංගම දුරකථන අංකය ලියා තිබෙන බවත් එයට අනුව ඔහු හෝටලයෙන් ඉවත්ව යන දිනය 2019.04.21 ලෙස සඳහන් කර ඇති බවත් එම කාමරය බුක් කරන ලද්දේ එම එක් පුද්ගලයෙක් සම්බන්ධයෙන් පමණක් බවත් පවසා අදාළ ලේඛනය පැ.139 ලෙස ලකුණු කර ඇත. එම ජමිල් මොහොමඩ් නැමැත්තා විසින් සිදු කරන ලද කාමර වෙන් කිරීමට අදාළව මෙම සාක්ෂිකාරිය විසින් නිකුත් කරන ලද රිසිට්පත හඳුනාගෙන එය පැ.140 ලෙස ලකුණු කර ඇත. එම ජමිල් මොහොමඩ් නැමැත්තා විසින් වෙන් කරවා ගන්නා ලද කාමරය තුන්වන මහලේ පිහිටි කාමරයක් බවත් ඇය පවසා ඇති අතර එම තැනැත්තාගේ

ලිපිනය ලෙස අංක 49, වෙලාම් බොඩ, මහනුවර ශ්‍රී ලංකා ලෙස සඳහන් කර ඇති බවත් සාක්ෂිකාරිය පවසා ඇති අතර මෙම සාක්ෂිකාරියට ජාතික හැඳුනුම්පතක් පෙන්වන ලදුව එය අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තාට අයිති 823533241V යන අංකය දරන ජාතික හැඳුනුම්පත බවට හඳුනාගෙන පැ.141 ලෙසද එහි පිටපත පැ.142 ලෙස හඳුනාගෙන ලකුණු කර ඇත.එම තැනැත්තාට ටාජ් සමුද්‍රා හෝටලයේ තුන්වන මහලේ කාමර අංක 365 ලබා දුන් බවට සාක්ෂිකාරිය පවසා ඇති අතර ඉන්පසු ඔහුට ඉලෙක්ට්‍රෝනික යතුරු කාඩ් පතක් ලබා දුන් බවත් ඇය පවසා ඇති අතර 2019.04.20 දිනට අදාළව ඇය සිදු කරන ලද රාජකාරියට අදාළ CCTV දර්ශනය පැ.138 (4) සාක්ෂිකාරිය විසින් නරඹා එහි තමා සිටින ආකාරය සහ පැමිණි අමුත්තන් සිටින ආකාරය හඳුනාගෙන ඇත. එසේම, තමා විසින් අදාළ අමුත්තා පිළිගත් ආකාරය සහ එම අවස්ථාවේ තමා ඇඳසිටි ඇඳුම් පිළිබඳව විස්තර ඇය විසින් අධිකරණයට පවසා ඇති අතර එසේම, එම අවස්ථාවේදී අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් නැමැති එම තැනැත්තා ටිෂර්ට් එකක සහ කලිසමක් හැඳ බිම ඇදගෙන යන බෑගයක්ද රැගෙන පාවහන් දමා කැප් එකක්ද පැළඳ සිටි ආකාරය ඇය විසින් CCTV දර්ශන තුළින් හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.එම තැනැත්තාට අදාළ කාමර වෙන් කිරීමේ ක්‍රියාව සිදු කර, එම තැනැත්තාගෙන් මුදල් අයකිරීමෙන් පසු මාලිංග නැමැති හෝටල් සේවකයා එම තැනැත්තාට වෙන් කරන ලද

කාමරයට යාම සඳහා සහාය ලබාදෙන ලද ආකාරය ද CCTV දර්ශනයෙහි දිස්වෙන බවට සාක්ෂිකාරිය හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකාරියගෙන්ද සියලුම චූදිතයන් වෙනුවෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් නොමැති බවට සඳහන් කර ඇත.

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව 2019.04.20 දින අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයෙහි කාමර අංක 365 හි නැවතී සිට ඇති ආකාරය සහ එම අවස්ථාවේදී ඔහු බිම දිගේ ඇදගෙන යා හැකි බෑගයක්ද එම කාමරයට රැගෙන ගොස් ඇති ආකාරය පිළිබඳ සාක්ෂි මනාව ඉදිරිපත් වී ඇති අතර පැ.141 ලෙස ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පත්‍රය අනුව එම තැනැත්තා සැබැවින්ම අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන්න මැනවින් සනාථ වී ඇති අතර ඒ අනුව එකී අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තා පාස්කු බෝම්බ ප්‍රහාර සිදුවූ 2019.04.21 දිනට පෙර දින රාත්‍රියේ ටාජ් සමුද්‍රා හෝටලයෙහි කාමර අංක 365 හි නවාතැන් ගෙන සිට ඇති ආකාරය මැනවින් සනාථ වේ.

පැ.සා.1347 කොටුව විදානලාගේ ලක්ෂිකා ප්‍රියදර්ශනී පෙරේරාගේ සාක්ෂියේදී පවසා සිටි පරිදි 2019.04.20 දින අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තා සඳහා ටාජ් සමුද්‍රා හෝටලයේ කාමර අංක 365 වෙන් කර දීමෙන් පසු එම තැනැත්තාව ටාජ් සමුද්‍රා හෝටලයෙහි සේවය කරන ලද පැ.සා.1348 ලොකු හෙට්ටිආරච්චිගේ සුමුදු මාලිංග

හෙට්ටිආරච්චි ඉහත කී අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන තැනැත්තා විසින් එදින ඇදගෙන එන ලද බෑගය රැගෙන ගොස් ඉහත කී අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන තැනැත්තාගේ කාමරයට රැගෙන යාම සිදු කර ඇති කරුණු මෙම නඩුවේ සියලුම වූදිතයන් වෙනුවෙන් හබ නොකරන බවට දැනුම් දීම මත මෙම කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇති අතර ඒ අනුව පැ.සා.1348 ලොකු හෙට්ටි ආරච්චිගේ සුමුදු මාලිංග හෙට්ටිආරච්චි යන සාක්ෂිකරුව මුදාහැරීම සිදු කර ඇත.ඒ අනුව පැ.සා.1347 කොටුව විදානලාගේ ලක්ෂිකා ප්‍රියදර්ශනී පෙරේරාගේ සාක්ෂියේදී පවසා ඇති පරිදි 2019.04.20 දින ඉහත කී ලොකු හෙට්ටි ආරච්චිගේ සුමුදු මාලිංග හෙට්ටිආරච්චි යන අය විසින් ටාජ් සමුද්‍රා හෝටලයේ කාමර අංක 365 හි නැවතී සිටි අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන අයගේ බිම දිගේ ඇදගෙන යන ආකාරයේ බෑගයක් කාමර අංක 365 වෙත ගෙන ගොස් භාර දුන් බවට ලබාදුන් සාක්ෂිය කිසිදු විවාදයකින් තොරව අධිකරණය ඉදිරියේ තහවුරු වී ඇත.

පැ.සා.1340 මැටවිලියා ආචාරිගේ චින්තක සඳරුවන් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහුට අයත්ව තිබූ CAI - 5771 දරන කළු පාට සුසිකි-ඇල්ටෝ වර්ගයේ වාහනයක් 2019.04.20 දින උබර් අප්ලිකේෂන් එක හරහා හයර් එකක් යාම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දී ඇත. එවකට තමා 078-7149791 යන ජංගම දුරකථන අංකය උබර් ඇප්

එක හරහා ලියාපදිංචි කර තිබුණු බවත් 2019.04.20 දින උෘබර් ඇප් එක හරහා තමාට ලැබුණු ඇණවුම මත තමා දෙහිවල ස්පෑන් ටවර් එක ළඟට ගිය පසු රැවුල වවා තිබූ කැප් එකක් දමා සිටි ටී ෂර්ට් එකක් සහ ඩෙනිම් කලිසමක් ඇද සිටි අවුරුදු 25 ක 30 ක පමණ පිරිමි පුද්ගලයෙකු බෑග් එකක්ද රැගෙන තමාගේ වාහනයට ගොඩ වී කොළඹ ටාජ් සමුද්‍රා එකට යාමට පිටත්ව ගොස් ටාජ් සමුද්‍රා හෝටලය ඉදිරිපිටම එම පුද්ගලයාව බැස්සවීමට කටයුතු කළ බවට සඳහන් කර ඇත.

එම සාක්ෂිකරු මඟින් තීරු 09 කින් සමන්විත අංක 077-8465967 දරන ජංගම දුරකථනයට අදාළ විශ්ලේෂණ වාර්තාවක් පැ.143 ලෙස ලකුණු කර ඇති අතර එසේම, එම දුරකථන විශ්ලේෂණ වාර්තාවට අනුව 2019.04.20 දින පැය 16:24 ට එම දුරකථනයෙන් මෙම සාක්ෂිකරුගේ දුරකථනය සමඟ සම්බන්ධ වී ඇති බවට සාක්ෂිකරු පිළිගෙන සාක්ෂි ලබා දී ඇත.මෙම සාක්ෂිකරුට පැ.138 (2) ලෙස ලකුණු කර ඇති 2019.04.20 දිනට අදාළ ටාජ් සමුද්‍රා හෝටලයට අදාළ CCTV දර්ශන නැරඹීම සඳහා විවෘත අධිකරණයේ වාදනය කරන ලද අවස්ථාවේදී එහි පැය 16.53 ට මෙම සාක්ෂිකරුගේ කාර් එක තිබෙන ආකාරය සහ එම තැනැත්තා මෙම සාක්ෂිකරු සමඟ කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයට ගොස් එහි ඔහුව බස්සපු ස්ථානයේදී තමාට මුදල් ගෙවා බෑග් එකත් අරගෙන බැස යන ආකාරය CCTV දර්ශනයෙහි දිස්වෙන බවත් එම CCTV දර්ශනවල මෙම

සාක්ෂිකරුගේ වාහනය පැහැදිලිව පෙනෙන්නට තිබෙන ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් 2019.04.20 දින සවස් වරුවේ ජංගම දුරකථන අංක 077-8465967 දරන ජංගම දුරකථනය හිමි තැනැත්තා මෙම සාක්ෂිකරුට එම ජංගම දුරකථන අංකයෙන් අමතා ඌබර් ඇප් එක හරහා සම්බන්ධ වී ටාජ් සමුද්‍රා හෝටලයට කුලී ගමනක් යාම සිදුවී ඇති බව අධිකරණය ඉදිරියේ මැනවින් සනාථ වී ඇත.එම කුලී ගමන ගොස් ඇත්තේ දෙහිවල ස්පෑන් ටවර් නැමැති ස්ථානයේ සිට වන බැවින් මෙම සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙමින් එලෙස ලබා දී ඇති සාක්ෂිය විත්තිය විසින් හබ කිරීමකට ලක් කර නොමැති බැවින් 2019.04.20 දින සවස 16.53 ට පමණ පැ.138 (1) වීඩියෝ දර්ශනයෙහි සිටින පිරිමි පුද්ගලයාම මෙම සාක්ෂිකරු සමඟ එම කුලී ගමන ගොස් ඇති බවට අධිකරණය ඉදිරියේ මැනවින් සනාථ වී ඇත.

ඉහත සාක්ෂි තුළින් මෙම නඩුවේ පැමිණිල්ල විසින් උත්සහ කර ඇත්තේ දෙහිවල ට්‍රොපිකල් ඉන් නැවාතැන්පලේ දී බෝම්බයක් පුපුරුවා හරින ලද ස්වයංඝාතක බෝම්බකරු අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමත්තා බවට ඔහුගේ අනනයතාවය සනාථ කිරීම බව ඉහත සියළු සාක්ෂි මනාව පරීක්ෂාවේ දී පෙනී යයි.

කෙසේ වුවද මෙම නඩුවේ දී ඉහත කී අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් නැමැත්තා සම්බන්ධයෙන් පිළිගැනීම් වාර්තා කිරීම සඳහා නීතිඥ සභය ලබා නොගෙන තමන්ලා විසින් ම නඩු විභාගය පවත්වාගෙන ගිය 1, 2, 3, 4, 5, 6, 7, 11, 14 සහ 16 වූදිතයින්ගේ උපදෙස් මත ඔවුන් වෙනුවෙන් නීතිඥ කනිල් මද්දුමාගේ මහතා පෙනී සිටිමින් සහ අනෙකුත් වූදිතයින් වෙනුවෙන් ද ඔවුන්ගේ උපදෙස් මත නීතිඥවරුන් පෙනී සිටිමින් පහත පරිදි පිළිගැනීම් වර්තා කර ඇත.

1. දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් 2019.04.21 වන දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හොටෙල්හිදී අධිචෝදනා පත්‍රයේ සඳහන් සිදුවීමේදී මියගිය බවත්,
2. ඉහත නම සඳහන් මියගිය තැනැත්තාගේ මෘත ශරීරයෙන් ලබාගත් පටක සාම්පල ජාන පරීක්ෂාවක් සඳහා ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 917/2/19 දරන නඩුව යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවත්, එකී පටක සාම්පල ජමීල් හම්සා (පැ.සා. 2215), කාලික් ජමීල් (පැ.සා. 2216) සහ ජුවයිරියා ජමීල් (පැ.සා. 2217) යන අයගෙන් ලබාගත් රුධිර සාම්පල සමඟ සසඳා ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක වී.ජේ.

බණ්ඩාරනායක (පැ.සා. 1436) සහ ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න (පැ.සා. 1444) විසින් 2019.05.14 දිනැති අනුක්‍රමික අංක සීබී/633/19 (ජේබී/617/19) දරණ වාර්තාව (පැ.962) නිකුත් කළ බවත්, එකී වාර්තාවට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කරන ලද එකී පටක සාම්පල අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් බවට තහවුරු කර ඇති බවත්, එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

3. ඉහත නම සඳහන් මියගිය තැනැත්තා නැවතී සිටි අංක 41, ටෙම්පල්පාර, ගල්කිස්ස ලිපිනයේ පිහිටි ස්පෑන් ටවර් නිවාස සංකීර්ණයේ තිබී සොයාගන්නා ලද ටී ෂර්ට් එකෙන් ලබාගත් සාම්පල ජාන පරීක්ෂාවක් සඳහා කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 13099/19 දරණ නඩුව යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බවත්, එකී පටක මියගිය අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අයගේ සිරුරු කොටස් වලින් ලබා ගත් පටක සාම්පල සමඟ සසඳා ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්.ජයමාන්න (පැ.සා. 1444) සහ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක වී.ජේ.

බණ්ඩාරනායක (පැ.සා. 1436) විසින් 2019.07.24 දිනැති අනුක්‍රමික අංක සිබී/656/19 (ජේබී/668/19) සිබී/532/19, සිබී/536/19, සිසි/160/19 හා සීඑම්/199/19 හා සම්බන්ධ වාර්තාව (පැ.963) නිකුත් කළ බවත්, එකී වාර්තාවට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කරන ලද එකී ටී ෂර්ට් එකෙන් ලබාගත් පටක සාම්පල අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ්ගේ බවට තහවුරු කර ඇති බවත්, එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟවන බවත්,

4. පැ.155 ලෙස සලකුණු කරන ලද ඡායාරූපවල දර්ශනය වන පුද්ගලයා දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය බව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

5. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.138 ලෙස ලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශන අතුරින් පැ.138(30) සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන දිනය සහ වේලාව අනුව 2019.04.21 දින පැය 08:50:52 ට නිල්පාට කැප් තොප්පියක් පැළඳගෙන කරේ බෑග් එකක් සහිතව ටාජ් සමුද්‍රා

හෝටලයේ අවන්හලට පැමිණ එහි කෑම මේසයක අසුන් ගන්නා පුද්ගලයා පැ.155 ලෙස සලකුණු කරන ලද ඡායාරූපයේ දර්ශනය වන දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය බවත්,

එකී නම සඳහන් දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය පහත "අ" උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල දර්ශනය වන බව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

"අ" උපලේඛනය

5.1 CAI 5871 at the entrance (20.04.2019.) - පැය 16.53.31 (පැ138(2))

5.2 J entering the hotel.mp4 (20.04.2019) Lobby entrance 1 - පැය 16.53.44 (පැ138(3))

5.3 making the reservation.mp4 (20.04.2019) Lobby 01 පැය 17.04.33 onwards (පැ138(4))

5.4 03rd floor corridor.mp4 (3rd F/NW 01) (20.04.2019) පැය 17.07.05 (පැ138(5))

5.5 Leaving room 365.mp4 3rd F/NW 01 (20.04.2019) පැය 17.39.06 (පැ138(6))

5.6 3rd Floor Lift.mp4 (20.04.2019) පැය 17.40.30 සහ පැය 17.40.50 (පැ138(7))

5.7 Leaving the hotel 01.mp4 (20.04.2019) (Lobby Entrance 01) පැය 17.44.09 (පැ138(8))

5.8 Coming Back 21st Morning.mp4 (21.04.2019) (Main Entrance_2) (Cross reference පැය 07.08.06 (පැ138(11))

5.9 Coming back 21st morning 2.mp4 (Pouch) (21.04.2019) පැය 07.08.39 (Cross Reference P117) (පැ138(12))

5.10 Entering the lobby 21st morning.mp4 (21.04.2019) (Lobby Entrance 1) පැය 07.09.08 (පැ138(13))

5.11 Entering the Restaurant.mp4s (Ports of Call 1) (21.04.2019) පැය 08.50.53 (පැ138(14))

5.12 Entering the Lift.mp4 (Guest Lift 01) (21.04.2019) පැය 07.15.51 (Lobby Symbol) (පැ138(15))

5.13 Leaving the Room.mp4 (3rd F/NW) (21.04.2019) පැය 07.17.40 (පැ138(16))

5.14 Entering the lift with backpack.mp4 (Guest Lift 01) (21.04.2019) පැය 08.51.25 (පැ138(17))

5.15 In the restaurant (Ports of Call 4) (21.04.2019) පැය 08.51.25 (පැ138(18))

5.16 In the restaurant (Ports of Call 1) (21.04.2019) පැය 08.51.25 (පැ138(19))

5.17 In the restaurant (Ports of Call 1) (21.04.2019) පැය 08.51.25 (පැ138(20))

5.18 In the restaurant 04 (Ports of Call 03) (21.04.2019) පැය 08.51.25 (පැ138(21))

5.19 In the restaurant 05 (Lobby Lift Landing) (21.04.2019) පැය 08.53.12 (පැ138(22))

5.20 In the restaurant 06 (Ports of Call 1) (21.04.2019) පැය 08.53.13 (පැ138(23))

5.21 In the restaurant 07 (Ports of Call 1) (21.04.2019) පැය 08.51.25 (පැ138(24))

5.22 Entering the Room (3rd F/NW 01) (21.04.2019) පැය 08.30.06 (පැ138(25))

5.23 Leaving the Room (3rd F/NW 01) (21.04.2019) පැය 07.17.40 (පැ138(26))

5.24 Coming back to the restaurant (Lobby Back Door) (21.04.2019) පැය 08.53.16 (පැ138(27))

5.25 In the Restaurant 08 (Ports of Call 1) (21.04.2019) පැය 08.50.52 (පැ138(28))

5.26 In the Restaurant 10 (Ports of Call 03) (21.04.2019) පැය 08.51.25 (පැ138(29))

5.27 In the restaurant 11 (Ports of Call 04) (21.04.2019) පැය 08.51.25 (පැ138(30))

5.28 Leaving the restaurant (Ports of Call 01) (21.04.2019 පැය 08.51.48 (පැ138(31))

5.29 Leaving the restaurant 02 (Lobby Back Door) (21.04.2019) පැය 08.51.48 (පැ138(32))

5.30 Leaving the Hotel 03 (Lobby Entrance) (21.04.2019) පැය 08.53.26 (පැ138(33))

5.31 Leaving the Hotel 04 (Way Coming to Pouch) (21.04.2019) පැය 08.53.50 (පැ138(34))

5.32 Leaving the Hotel 05 (Main Exit) (21.04.2019) පැය 08.54.13 (පැ138(35))

6. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින චූදිතයෙකු වන අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය පැ.148 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත ‘‘ආ’’ උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල සිටින බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

“ආ” උපලේඛනය

6.1 “01.Coming into the mosque.avi” (21.04.2019) පැය 11.57.23 (පැ148(3))

6.2 “02.In the mosque.avi” (21.04.2019) පැය 11.58.04 (පැ148(4))

6.3 “03.Leaving the mosque.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(5))

6.4 “04.Outside the mosque.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(6))

6.5 “05.In the mosque.avi”(21.04.2019) පැය 11.58.04 (පැ148(7))

6.6 “06.In the mosque 2.avi” (21.04.2019) පැය 11.58.04 (පැ148(8))

6.7 “07.Coming-out Staircase.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(9))

6.8 “08. Staircase 2.avi” (21.04.2019) පැය 15.05.55 (පැ148(10))

6.9 “09. Praying.avi” (21.04.2019) පැය 14.45.10 (පැ148(11))

6.10 “10. Praying 2.avi” (21.04.2019) පැය 11.58.41 (පැ148(12))

6.11 “11. Quesioning.avi” (21.04.2019) පැය 15.05.45 (පැ148(13))

7. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය කොළඹ 03, ධර්මපාල මාවත, අංක 60/ඒ හි පිහිටි Dinemore අවන්හලෙන් ලබාගත් පහත “ඇ” උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල දිස්වන බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ දී පිළිගැනීමට එකඟ වන බවත්,

“ඇ” උපලේඛනය

7.1 Camera 07 සිසිටීවී කැමරාවෙන් ලබාගත් දර්ශනයේ තිරයේ දිස්වන දිනය සහ වේලාව 19/04/2019 පැය 21:57:47 (පැ 964)

8. දැනටමත් ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පැ.155 හි දර්ශනය වන දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අය පැ.148 ලෙස සලකුණු කරන ලද සංයුක්ත තැටියේ පහත “ඇ” උපලේඛනයේ සඳහන් කර ඇති සිසිටීවී දර්ශනවල සිටින බව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ

පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත්,

‘‘ඈ’’ උපලේඛනය

8.1 අංක 11_0[159] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/20 පැය 11:54:58 (පැ.965)

8.2 අංක 12_0[157] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/20 පැය 12:22:23 (පැ.966)

8.3 අංක 6_0[152] දරන සිසිටීවී දර්ශනයේ තිරයේ දිස්වන වේලාව 2019/04/21 පැය 06:24:47 සහ පැය 06:51:28 (පැ.967)

9. පැ.116, පැ.138, පැ.148 සහ පැ 124 ලෙස සලකුණු කර ඇති සංයුක්ත තැටිවල අන්තර්ගත සිසිටීවී දර්ශන නරඹා එම දර්ශනවල දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් දර්ශනය වන බවට සුල්තාන් ඔමර් කත්තා (පැ.සා. 1365) සහ ඔමර් කත්තා අක්බර් අලි (පැ.සා. 2214) යන අය විසින් මේ වන විටත් හඳුනාගෙන ඇති බව එකී සාක්ෂිකරුවන් සාක්ෂියට නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේ පිළිගැනීමට එකඟ වන බවත් විධිමත් ව වාර්තා කර ඇත.

අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් නැමැත්තාගේ අනන්‍යතාවය තවදුරටත් සනාථ වන පරිදි 2026-7-20 දින පහත සඳහන් පිළිගැනීම් වාර්තා කර ඇත.

1. දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 823533241V බවත්, එකී ජාතික හැඳුනුම්පත පැ.14 සහ එහි පිටපතක් පැ.142 ලෙස ලකුණු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.
2. දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අයගේ නමින් අංක N 0177003 සහ N 5307123 දරන විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර තිබූ බවත්, එකී විදේශ ගමන් බලපත්‍ර පිළිවෙලින් පැ.152 සහ පැ.154 ලෙස ලකුණු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

3. දැනට මියගොස් සිටින අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් යන අයගේ රියදුරු බලපත්‍රයේ අංකය B 2251472 බවත්, එකී රියදුරු බලපත්‍රය පැ.159 ලෙස ලකුණු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නොකැඳවා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සාක්ෂියක් ලෙස මෙම නඩු විභාගයේදී දෙපාර්ශවයම පිළිගෙන ඇත.

ඒ අනුව ඉහත කී සියළු පිළිගැනීම් මඟින් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2200 වීරසිංහ ආරච්චිගේ කෞෂල්‍ය ඩන්කන් වීරසිංහ, පැ.සා.1349 මුතුකුමාර සේල්වකුමාර, පැ.සා.1347 කොටුව විදානලාගේ ලක්ෂිකා ප්‍රියදර්ශනී පෙරේරා, පැ.සා.1340 මැටවිලියා ආචාරිගේ චින්තක සඳරුවන් යන සාක්ෂිකරුවන් විසින් ලබා දුන් සාක්ෂි තවදුරටත් තහවුරු වී ඇත.

මෙම නඩුවේ සාක්ෂි ලබාදී ඇති පැ.සා.1341 කපුගම ගීගනගේ ප්‍රසාද් ප්‍රියන්ත යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව2019 අප්‍රේල් මාසය වනවිට ඔහුගේ SAG-2828 දරන හොන්ඩා වෙසල් වර්ගයේ සුදු පාට වාහනය 2019.04.20 දින කුලී ගමනක් සඳහා උබර් ඇප් එක හරහා සම්බන්ධ වී යම් පුද්ගලයෙකු කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ සිට පානදුර

පරත්ත පාරට යන ප්‍රදේශයට යාම සිදු කරන ලද බවට පවසා සාක්ෂි ලබා දී ඇත.

2019.04.20 දිනය වනවිට මෙම සාක්ෂිකරු ජංගම දුරකථන අංක 077-3098954 භාවිතා කළ බවත් තම ජාතික හැඳුනුම්පත් අංකය ලෙස 720762170V අංකය බවත් පවසා මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයට අදාළ ජංගම දුරකථන විශ්ලේෂණ වාර්තාව පැ.144 ලෙස ලකුණු කර ඇත.

එම දුරකථන විශ්ලේෂණ වාර්තාවට අනුව 2019.04.20 දින මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනය සමඟ තුන්පාරක් සම්බන්ධ වූ දුරකථන අංකය 077-8465967 බවට සාක්ෂිකරු විසින් පවසා ඇති අතර එම අංකයට අදාළ දුරකථන විශ්ලේෂණ වාර්තාවක් පැ.144 ලෙස මෙම සාක්ෂිකරු මඟින් සලකුණු කර ඇත.

එම ලේඛනය පරීක්ෂා කර බලමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත්තේ එම අංකයෙන් මුලින්ම තමාගේ දුරකථනය සමඟ සම්බන්ධ වී ඇත්තේ පැය 17.37 ට බවත් වන අතර තමා සමඟ හයර් එක ගිය තැනැත්තා රැවුල වවා තිබුණු කෙට්ටු කළු පුද්ගලයෙකු බවත් නිල් පාට ඉරි තියෙන ටී ෂර්ට් එකක් ඇඳ කලිසමක් ඇඳ කැප් එකක් දමාගෙන සිටි අයෙක් බවට පවසා පැ.138 (10) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන නරඹමින් එහි මෙම සාක්ෂිකරු ටාජ් සමුද්‍රා හෝටලයේ සිට පානදුර ප්‍රදේශයට හයර් එක ගිය මෙම සාක්ෂිකරුගේ CAG-2828 දරන වාහනය

හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර අදාළ තැනැත්තා මෙම සාක්ෂිකරුගේ වාහනයේ නැග පානදුර පරත්ත පාරට ගමන් කළ අවස්ථාවේදී එසේම, එම තැනැත්තා සාමාන්‍ය අය ඉඳගන්නා ආකාරයෙන් නොව තමාගේ පිටුපස්සෙන් ඉඳගෙන ගමන් කළ බවත් තමා ඉස්සරහා කණ්නාඩියෙන් බැලීමේදී එම තැනැත්තා පුටු පුටු ගාලා ආගම කියවනවා තමාට තේරුණ බවත් උඟබර් ඇප් එකේ ඔහුගේ නම ජමිල් යැයි දකින නිසා තමා එම තැනැත්තා මුස්ලිම් ජාතිකයෙක් යැයි තේරුම් ගත් බවත් ඔහු වාහනයට නැග්ග වේලාවේ සිට පානදුරට යනතුරුම එක දිගටම ආගම කියවමින් ගිය බවත් කෙසේ වෙතත් ඔහු ලොකු හඬකින් නොව හෙමින් හෙමින් එලෙස ආගම කියවමින් ගිය ආකාරය තමාට ඉස්සහරා කණ්නාඩියෙන් බලන විට පෙනුන බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇති අතර ඒ අනුව මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය කිසිදු විවාදයකින් තොරව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව පැ.138 (10) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනවල සිටින ජමිල් නැමැත්තා 2019.04.20 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ සිට මෙම සාක්ෂිකරුගේ කුලී රථයෙන් පානදුර පරත්ත නැමැති ස්ථානයට ගොස් ඇති කරුණ මැනවින් සනාථ වේ. මෙම කරුණු පැ.138 (8), පැ.138 (9) යන CCTV දර්ශනවලින් ද මැනවින් සනාථ වේ.

පැ.සා.2218 ජෙයරාජ් නිරෝෂන් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු මඩකලපුව දිස්ත්‍රික්කයේ කොක්කඩිචෝලර් ප්‍රදේශයේ පිහිටි බණ්ඩාරමුල්ල නැමැති ස්ථානයෙහි විෂ්ණු කෝවිල පාරේ ඔහුගේ මවගේ නිවසේ පදිංචිව සිටි බවත් ඔහුට අදාළව 075-7735093 යන ජංගම දුරකථන අංකය භාවිතා කළ බවත් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 199116603848 බවත් පවසා ඇති අතර තමා විසින් පෙර ඩයලොග් අංක 076-5535471 දරන අංකය ද භාවිතා කළද එම සිම් පත තමා දිගටම පාවිච්චි කළේ නැති නිසා මාස 06 කට කලින් විසන්ධි වුණ බවත් කෙසේ වුවත් එම සිම් පත තමාගේ ෆෝන් එකේ තියෙන බවත් තමා එම ජංගම දුරකථනය ලබා ගත්තේ අවුරුදු 07 කට පෙර බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට ඩයලොග් ආයතනය විසින් නිකුත් කරන ලද ග්‍රාහක තොරතුරු ලේඛනයක් පැ.143 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර එම ලේඛනයෙහි 05 වන පේළියෙහි සඳහන් එහි ජංගම දුරකථන අංක 077-8465967 දරන අංකය තමා විසින් භාවිතා කරන ලද අංකයක් නොවන බවත් එය තමාගේ නමට මිලදී ගත්තේ නැති බවත් එය තමාගේ ජාතික හැඳුනුම්පත භාවිතා කර මිලදී ගත්තේ නැති බවත් 2018 කාලවකවානුවේ තමාගේ පරණ ජාතික හැඳුනුම්පත නැති වුණ බවත් තමාගේ අලුත් ජාතික හැඳුනුම්පත පරණ ජාතික හැඳුනුම්පත නැතිවී මාස 07 කින් පසු 2019 අවුරුද්දේ ලබා ගත් බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාගේ පෙර පැවති ජාතික හැඳුනුම්පත 2018.06 වෙනි මාසයේ නැති වුණ බවත්

කෙසේ වෙතත් නැතිවී මාසයකින් පස්සේ තමාගේ නැතිවුණ පරණ ජාතික හැඳුනුම්පත ලැබුණු බවත් එම පරණ ජාතික හැඳුනුම්පතේ අංකය 911663848V බවත් එලෙස නැති වුණ ජාතික හැඳුනුම්පතේ අංකයද පැ.141 විස්තර වාර්තාවේ අංක 05 යටතේ සඳහන් වී තිබෙන බව සාක්ෂිකරු පවසා ඇති අතර තමාගේ නැති වී තිබූ පරණ ජාතික හැඳුනුම්පත කවරකු විසින් කුමක් සඳහා පාවිච්චි කළාද යන්න දන්නේ නැති බව සාක්ෂිකරු පවසා ඇත.

එසේම, තමාගේ ජංගම දුරකථන අංක තමා විසින් වෙනත් පුද්ගලයන්ට භාවිතා කිරීම සඳහා ලබා දී නොමැති බවත් ඒවාට අදාළ සිම්පත්ද තමාගේ භාරයේ තිබුණු බවත් පැ.143 ලේඛනයේ 05 වන පේළියේ සඳහන් ජංගම දුරකථන අංක 077-845967 සම්බන්ධයෙන් තමාට දැනීමක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

2019 වසරේ තමා මඩකලපුව ශික්ෂණ රෝහලේ රැකියාවක් කළ බවත් පවසා ඇති අතර 2019.04.20 දිනට පෙර තමා කිසිදු අවස්ථාවක තමා කොළඹ ප්‍රදේශයට පැමිණ නැති බවත් තමා පදිංචි වී සිටියේ වන්දාරමුල්ලේ විෂ්ණු කෝවිල අසල බවත් සාක්ෂිකරු පවසා ඇත. පැ.143 ලේඛනයට අනුව 2019.04.20 එහි පළවෙනි දෙවෙනි සහ තුන්වෙනි හතරවෙනි පේළිවල තිබෙන දුරකථන ඇමතුම් 04 ක් පිළිබඳව සඳහන් වී තිබෙන බවත් ඉන් 1 සහ 2 ටාජ් සමුද්‍රා නැමැති ස්ථානය බවත්, 03 වෙනි

එකද ටාජ් සමුද්‍රා බවත් 04 වෙනි තියෙන ස්ථානය රත්මලාන බවත් ලේඛනය පරික්ෂා කරමින් සාක්ෂි ලබා දී ඇති අතර 2019.04.20 දින තමා ටාජ් සමුද්‍රා හෝටලයේ සහ රත්මලානේ සිටියේ නැති බවට සහ තමා විසින් 2019.04.20 දින එම ලේඛනය පරිදි දුරකථන ඇමතුම් ලබාගෙන නැති බවට පවසා ඇත.

පෙර අවස්ථාවක පැ.139 ලෙස ලකුණු කර ඇති ලේඛනය පරික්ෂා කර බලමින් අංක 077-8465967 දරන ජංගම දුරකථන අංකය එම ලේඛනයේ අතින් ලියා තිබෙන බවත් එහි තිබෙන්නේ තමාගේ අත් අකුරු නොවන බවත් 2019.04.20 දින තමා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ කාමරයක් මිලදී ගෙන නැති බවටත් එකහෙලාම පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇත්තේ 13 වන වූදිත වෙනුවෙන් පමණක් වන අතර හරස් ප්‍රශ්නවලදී තමාගේ පරණ ජාතික හැඳුනුම්පත නැති වීම සම්බන්ධයෙන් තමා පොලිසියට පැමිණිල්ලක් කළ බවත් එලෙස පැමිණිල්ලක් කළ පසුව තමා නව ජාතික හැඳුනුම්පතක් ලබා ගත් බවයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මඩකලපුව ප්‍රදේශයේ පදිංචි මෙම සාක්ෂිකරු 2019.04.20 දිනයේ පදිංචිව සිට ඇත්තේ මඩකලපුව ප්‍රදේශයේ වන අතර එදින මෙම සාක්ෂිකරු ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකයෙන් නිකුත් කර ඇති 077-8465967 දරන ජංගම දුරකථන අංකය

කිසිසේත් භාවිතා කර නැති බවත් තමා එවැනි අංකයක් ලබා ගෙන හෝ නොමැති බවත් තමා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ නැවති සිටීමක් හෝ එම හෝටලයේ කොළඹ ප්‍රදේශයේ කිසිදු ස්ථානයකදී ජංගම දුරකථන ඇමතුමක් ලබා ගෙන නොමැති බවත් පවසා ඇත.

ඉහත පසුබිම තුළ හා 2018 වසරේ 06 වෙනි මාසයේ ඔහුගේ ජාතික හැඳුනුම්පත්‍රය අස්ථානගත වී තිබීම තුළින් එම ජාතික හැඳුනුම්පත භාවිතා කර පැ.143 ලෙස ලකුණු කර ඇති ඩයලොග් ආයතනය විසින් නිකුත් කර ඇති ග්‍රාහක තොරතුරු වාර්තාවෙහි සඳහන් විස්තර අනුව මෙම සාක්ෂිකරුගේ නැතිවුණ ජාතික හැඳුනුම්පත භාවිතා කරමින් 077-8465967 දරන ජංගම දුරකථන අංකය යමෙකු විසින් ලබාගෙන එම අංකය භාවිතා කර 2019.04.20 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයෙහි සිට දුරකථන ඇමතුම් තුනක් සහ රත්මලාන ප්‍රදේශයේ සිට දුරකථන ඇමතුමක් ගෙන ඇති බව පෙනී යන අතර කෙසේ වෙතත් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1341 කපුගම ගීගනගේ ප්‍රසාද් ප්‍රියන්ත යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.20 දින ජංගම දුරකථන අංක 077-8465967 දරන ජංගම දුරකථනයෙන් ඔහුට දුරකථන ඇමතුම් ලබා දී ටාජ් සමුද්‍රා හෝටලයේ සිට පානදුරේ පරත්ත නැමැති ස්ථානයට කුලී ගමනක් ගිය කැප් එකක් දමාගෙන සිටි රැවුල වවාගෙන සිට කෙට්ටු කළු පිරිමි පුද්ගලයා එනම් එම සාක්ෂිකරු සමඟ කුලී ගමන යාමේදී ඔහුගේ වාහනයේ පිටුපස අසුනේ වාඩිවී සම්පූර්ණ ගමනාන්තය දක්වාම සෙමින් මුමුණමින් ආගම

කියවමින් ගිය මුස්ලිම් ජාතික තැනැත්තා විසින් ඉහත කී ජංගම දුරකථන අංක 077-8465967 දරන ජංගම දුරකථන අංකය භාවිතා කර ඇති බවට මැනවින් පෙනී යයි.

ඉහත සාක්ෂි අනුව අංක 077-8465967 දරන ජංගම දුරකථනයට අදාළ සම්බන්ධතාවය ලබා ගෙන ඇත්තේ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.2218 ජෙයරාජ් නිරෝෂන් නැමැති මඩකලපුව වන්දාරමුල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි තැනැත්තාගේ 2018 අස්ථානගත වී ඇති අංක 911663848 V දරන ජාතික හැඳුනුම්පත භාවිතා කරමින් බවට මැනවින් පෙනී යන අතර පැ.සා.1341 කපුගම ගීගනගේ ප්‍රසාද් ප්‍රියන්ත යන අයගේ සාක්ෂියට අනුව ඉහත කී ජංගම දුරකථන අංක 077-8465967 දරන ජංගම දුරකථන අංකයෙන් එම සාක්ෂිකරුගේ ඌබර් ඇප් එක හරහා සම්බන්ධ වූ තැනැත්තාගේ නම ජමිල් යනුවෙන් ඌබර් ඇප් එක තුළින් තමාට දර්ශනය වූ බවට පවසා ඇති පසුබිම තුළ එම තැනැත්තා වන්නේ එම ජමිල් නැමැත්තා වන්නේ 2019.04.20 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ ලියාපදිංචි කාඩ් අංක 851994 යටතේ කාමර අංක 365 හි නැවතී සිට ඇති අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තාම බවට මනාව පැහැදිලි වේ. (පැ.139 ලේඛනය පරීක්ෂා කර බලන්න) එකී අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමත්තා දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන්න් නැමැති නවාතැන්පලේ 2019.04.21 දින දිවා කාලයේ ස්වයංඝාතක බෝම්බයක්

පුපුරුවාගත් තැනැත්තාම බවට මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි මගින් හෙලි වේ.

පැ.සා.1343 දීකිරිවලගේ විමලසේන පෙරේරා යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු යුධ හමුදාවේ සේවයේ නිරතව සිට 1983 වර්ෂයේ විශ්‍රාම යාමෙන් පසුව ආදායම් මාර්ගය ලෙස ත්‍රී රෝද රථ රැකියාවක් කළ බවත් ඔහුට QW-1790 දරන ත්‍රී රෝද රථය තිබෙන බවත් එය නිල් පාට ත්‍රීරෝද රථයක් බවත් තමා 2019 වසර වන විට එම ත්‍රී රෝද රථයේ කොළඹ ටාජ් සමුද්‍රා හෝටලය ඉස්සරහා නවත්වාගෙන කුලී ගමන් යාම සිදු කළ බවත් පවසා ඇත.

2019 අවුරුද්දේ පාස්කු බොම්බ ප්‍රහාර මාලාව සිදුවුණ කාලයේ 2019.04.21 වන දින උදේ 7.45 ත් 8.15 ත් අතර කාල සීමාවේ තමාගේ ත්‍රීරෝද රථයෙන් අත්කොට ෂර්ට් එකක් ඇද කලිසමක් ඇද තොප්පියක් දමාගෙන සිටි පුද්ගලයෙකු බෑග් දෙකක්ද රැගෙන හෝටලයේ පැත්තේ සිට පැමිණ තමාගේ ත්‍රීවීල් රථයට ගොඩවුණු බවත් එක බෑග් එකක් ඔහු කරේ දමාගෙන සිටි බවත් ඉන්පසු එම තැනැත්තා තමාට වැල්ලවත්තට යාමට අවශ්‍යය බවට දැනුම් දුන් පසු තමා එම තැනැත්තාව කුලී ගමන රැගෙන ගිය බවත් එම තැනැත්තා වැල්ලවත්තේ කොමර්ෂල් බැංකුව ළඟින් බැස්ස බවත් එලෙස බැස ත්‍රීවීල් රථය ඇතුලේ තිබුණු බෑග් එක ගත්ත බවත් අනිත් බෑග් එක ඔහුගේ කරේම තිබ්බ බවත් පවසා ඇත.

පැමිණිල්ලෙන් මෙම සාක්ෂිකරුට පී ආර් 81/2019 ලෙස සඳහන් සිඩී තැටියක් විවෘත අධිකරණයේ පැ.146 ලෙස ලකුණු කර එහි තිබෙන CCTV දර්ශන විකාශනය කර නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර එයට අදාළ දිනය ලෙස 2019.04.21 ලෙස දර්ශනය වන බවත් එම CCTV දර්ශනයෙහි මෙම සාක්ෂිකරුගේ ත්‍රීවීල් රථය ගමන් කරන ආකාරය සහ එහි ගමන් කළ තැනැත්තාව ඔහු විසින් වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව ළඟ බැස්සවූ ආකාරය එහි දක්නට ලැබෙන බවට හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දන්වා ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.21 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලය ඉදිරිපිට සිට මෙම සාක්ෂිකරුට අයත් QW-1790 දරන ත්‍රීවීල් රථයෙන් වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව ඉදිරිපිට උදෑසන 7.00 ත් 8.15 ත් අතරතුර පිරිමි පුද්ගලයෙකු ගෙන ගොස් තිබීම සම්බන්ධයෙන් පමණක් සාක්ෂි හෙළිවන අතර එලෙස ගිය තැනැත්තාගේ පිටෙහි බෑගයක්ද එල්ලාගෙන ඊට අමතරව තවත් බෑගයක් ත්‍රීවීල් රථයේ ගෙන ගොස් එම තැනැත්තා බැස්ස ස්ථානයේ දී එම බෑග් දෙක ගෙන ගොස් ඇති බව පෙනීයයි.

මෙම සාක්ෂිකරුට ඉහත කී ත්‍රීවීල් රථයේ ගමන් කළ තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු දැනීමක් නිබී නොමැති බව පෙනී යන අතර පැ.146 දරන සිඩී තැටියෙහි අඩංගු CCTV දර්ශනවලට අනුව 2019.04.21 වන දින සැබැවින්ම මෙම සාක්ෂිකරු මෙලෙස ඔහුගේ ත්‍රීවීල් රථයෙන් හයර් එකක් ගොස් ඇති බවට මැනවින් කරුණු සනාථ වේ.

පැ.සා.1344 සිරිපතුල් දේවගෙදර රණවීර යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු ද ත්‍රීවිල් රථ රියදුරෙකු ලෙස කටයුතු කරන බවත් ඔහුට WP ABH-1241 අංකය දරන ත්‍රීවීල් රථය අයිතිව තිබී එය කුලී ගමන් යාම සඳහා භාවිතා කරන ලද බවට පවසා ඇත.

2019.04.21 දින දෙහිවල ට්‍රොපිකල් ඉන් නැමැති පුද්ගලයන්ට නවාතැන් ස්ථානයෙහි එහි බෝම්බ පිපිරීමක් සිදු වුණ බවත් එම ස්ථානය දෙහිවල සත්තු වත්ත තියෙන පාරේ සුදු අයියා නැමැත්තෙකු විසින් පවත්වාගෙන ගිය බවත් එම තැනැත්තා තමා දන්නා හඳුනන තැනැත්තෙකු බවත් පවසා ඇති අතර 2019.04.21 වන දින තමා දෙහිවල සිට වැල්ලවත්තට ගිය බවත් වැල්ලවත්තේ සිට පොලිසිය ළඟින් යූටර්න් එකක් අරන් එනවිට පුද්ගලයෙකු තමාගේ ත්‍රීවිල් රථයට අත දමා නැග්ග බවත් එම තැනැත්තා තමාගේ වාහනයට නැග්ගේ වැල්ලවත්තේ කොමර්ෂල් බැංකුව ආසන්නයේ බවත් එම තැනැත්තා තමාට රුම් එකක් ඕනා යැයි පැවසු විට තමා පෙර කී සුදු අයියා නැමැත්තාව හඳුනන නිසා තමා එම

තැනැත්තාව එම ස්ථානයට ගෙන ගොස් බැස්සවූ බවත් එවිට වේලාව උදේ 9.25 ට බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාගේ ත්‍රිවිල් රථයේ ගිය තැනැත්තා කැප් එකක් දමා එක බෑගයක් කරේ දමාගෙන තවත් බෑගයක්ද ඔහු රැගෙන ගිය බවත් තමා එම පුද්ගලයාව ට්‍රොපිකල් ඉන් නවාතැනෙහි බස්සවා පිටව ගිය බවත් එදින තමා නිවසට ගියාට පසුව ට්‍රොපිකල් ඉන් එකේ බෝම්බයක් පිපිරී ඇති බව තමාට දැන ගන්න ලැබුණු බවත් මෙම සාක්ෂිකරුට ගල්කිස්ස අපරාධ ස්ථාන පරීක්ෂණාගාරය මඟින් ගන්නා ලද ඡායාරූප අඩංගු සංයුක්ත තැටිය පැ.147 ලෙස ලකුණු කර විවෘත අධිකරණයේ එය වාදනය කර නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර එහි තිබෙන ඡායාරූපවල ට්‍රොපිකල් ඉන් ස්ථානය තිබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන එහි 2019.04.21 දින තමා විසින් තම ත්‍රීවිල් රථය රැගෙන ගොස් පුද්ගලයා බැස්සවූ ස්ථානය සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එයට අදාළ මුද්‍රිත ඡායාරූපයක් පැ.147 (1) ලෙස ලකුණු කර ඇත.

එම ට්‍රොපිකල් ඉන් නවාතැනට හැරෙන පාර පෙන්වන ඡායාරූපයක් පැ.147 (2) ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇත. මෙම සාක්ෂිකරුට පැ.146 දරන සංයුක්ත තැටියේ විවෘත අධිකරණයේ වාදනය කර එහි තිබෙන CCTV දර්ශනය නැරඹීමට අවස්ථාව ලබා දී ඇති අතර එහි මෙම සාක්ෂිකරු පෙරවරු 9.16 ට ඇති දර්ශනයෙහි මෙම සාක්ෂිකරුගේ

ත්‍රීවීල් රථයෙන් වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව ඉදිරියේදී පුද්ගලයෙකු නන්වාගෙන ගමන් කරන ආකාරය මෙම සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇත.

එහි පෙනෙන තමාගේ ත්‍රී රෝද රථයේ ගමන් කළ පුද්ගලයා වාඩිවී ගමන් කළ ආකාරයද හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරුට පී ආර් 39/10 ලෙස අංක කර ඇති CCTV දර්ශන අඩංගු සංයුක්ත තැටියක් පැ.148 ලෙස ලකුණු කර නැරඹීම සඳහා වාදනය කර ඇති අතර එහි ද මෙම සාක්ෂිකරුගේ ත්‍රීවීල් රථය ගමන් කරන ආකාරයත් එය දෙහිවල ට්‍රොපිකල් ඉන් එකට යන ආකාරයත් එසේම, මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයේ එදින ගමන් ගත් සුදු පාට ඉරි තිබෙන කැප් එකක් පැළඳ සිටින පුද්ගලයාද මෙම CCTV දර්ශනවලට අනුව හඳුනාගෙන ඇති අතර එම පුද්ගලයා ට්‍රොපිකල් ඉන් එකේ මේසයක් අල්ලාගෙන අතින් ෆෝන් එක අල්ලගෙන සිටින ආකාරයත් පිටෙහි බැක්පැක් එකක් දාගෙන සිටින ආකාරයත් දර්ශනය වන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් අධිකරණය ඉදිරියේ හෙලි වන්නේ 2019.04.21 දින මෙම සාක්ෂිකරුගේ ත්‍රීවීල් රථයෙන් පුද්ගලයෙකු දෙහිවල ට්‍රොපිකල් ඉන් නැමැති ස්ථානයට කුලී ගමනක් යාම සිදු කර ඇති

බව සහ එම තැනැත්තා පිටෙහි බැක්පැක් එකක් එල්ලාගෙන තවත් බෑගයක්ද රැගෙන එලෙස ගමන් කර දෙහිවල සත්තු වත්ත ආසන්නයේ පිහිටි ට්‍රොපිකල් ඉන් නවාතැන් පොලට ගොස් ඇති ආකාරය වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සහ මෙම සාක්ෂිකරුට ප්‍රථමයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1343 දීකිරිවලගේ විමලසේන පෙරේරා නැමැත්තාගේ සාක්ෂි හෙලිවූ කරුණු තවදුරටත් සනාථ කෙරෙන අතර ඒ අනුව කොළඹ ටාජ් සමුද්‍රා හෝටලය ඉදිරිපිට සිට උදෑසන 7.45 ත් 8.15 ත් පිටෙහි බෑග් එල්ලාගෙන තවත් බෑග් එකක්ද අතෙන් රැගෙන හයර් එකක් ගමන් කරල ලද පුද්ගලයා වැල්ලවත්තේ කොමර්ෂල් බැංකුව ළඟින් බැස ඇති බව සහ එලෙස බැස යන ලද පුද්ගලයාම පැ.සා.1347 සිරිපතුල් දේවගෙදර රණවීර යන සාක්ෂිකරුගේ ත්‍රීවීල් රථයට වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව අසල සිට නැග දෙහිවල පිහිටි බෝම්බයක් පිපිරුණු ට්‍රොපිකල් ඉන් නැමැති නවාතැන්පොලට සැබැවින්ම ගමන් කර ඇති ආකාරය මැනවින් සනාථ වේ.

පැමිණිල්ලෙන් සාක්ෂි දීම සඳහා කැඳවන ලද පැ.සා.2202 සම්පත් දේවේන්ද්‍ර ජයවික්‍රම වීරසූරිය නැමැති සාක්ෂිකරු වැල්ලවත්ත කොමර්ෂල් බැංකු පරිශ්‍රය තුළ සවි කර ඇති CCTV දර්ශනයට අදාළව විඩියෝ දර්ශනයක් මෙම නඩුවට අදාළ විමර්ශන නිලධාරීන් වෙත මෙම සාක්ෂිකරුගේ ආයතනයේ ආරක්ෂක අංශයේ විධායක නිලධාරී ප්‍රසන්න

මනසිංහ යන නිලධාරීයා මඟින් නිසියාකාරයෙන් භාර දී ඇති කාරණය විත්තිය හබ නොකරන බව පවසා එම කරුණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

ඒ අනුව පැමිණිල්ලෙන් උත්සාහ දරා ඇත්තේ මෙම අධිකරණය ඉදිරියේ පැ.146 ලෙස ලකුණු කර ඇති 2019.04.21 දිනට අදාළ CCTV දර්ශන අඩංගු වැල්ලවත්ත කොමර්ෂල් බැංකුවට අදාළ CCTV දර්ශනවල පැවැත්ම සහ එම පැ.146 දරන සිඩී තැටිය විධිමත් ආකාරයෙන් විමර්ශන නිලධාරීන් භාරයට පත්වී ඇති කරුණ වේ.

පැ.සා.1353 ජයතුංගගේ රෝෂාන් ඉන්දික නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2019 වසරේ ටෙන්ට් සහ පුටු හයර් කරන ස්ථානයක රැකියාව කළ බවත් ඉන්පසු එයින් ඉවත් වී දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් ආයතනයේ සේවකයෙකු ලෙස වැඩ කළ බවත් තමාගේ රාජකාරිය වුනේ අමුත්තන් ඇතුළට ගැනීම සහ ඔවුන්ට කාමර සූදානම් කිරීම සිදු කිරීම බවත් වන අතර එසේම, හෝටලයට පැමිණෙන අමුත්තන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සී.ආර් පොතක සටහන් කර ගැනීම තමා විසින්ම කරන බවත් පවසා ඇත.

ට්‍රොපිකල් ඉන් හෝටලයේ බෝම්බයක් පිපිරුණු දිනයේද ඔහු එම ආයතනයේ රැකියාව කළ බවත් පවසා පැ.147 (1) ලෙස ලකුණු කර ඇති සහ පැ.147 (2) ලෙස ලකුණු කර ඇති ඡායාරූප හඳුනාගෙන ඒවා ඔහු

සේවය කරන ලද ට්‍රොපිකල් ඉන් ආයතනයට යන මාර්ගයට අදාළ ඡායාරූප බවට හඳුනාගෙන ඇත.

නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේ බෝම්බය පිපිරුණු දින උදෑසන 7.00 ත් 8.00 ත් අතර වගේ ගැහැනු කෙනෙක් සහ පිරිමි කෙනෙක් කපල් එකක් කාමරයක් ගන්න ආව බවත් තවත් කපල් එකක් එලෙස පැමිණ සිට පිටවී ගිය බවත් එයට අමතරව පිරිමි පුද්ගලයෙකුද උදේ 9.00 ට 9.30 ට පමණ පැමිණ කාමරයක් ඉල්ලා සිටි බවත් එම තැනැත්තා එක බෑගයක් කරේ දාගෙන තවත් බෑගයක් ඇදගෙන යන බෑගයක් ලෙස අරගෙන ආව බවත් ඔහු උස කෙට්ටු මුස්ලිම් කෙනෙක් බවත් සුදු පාට ෂර්ට් එකක් සහ ඩෙනිම් කලිසමක් ඇද සිටි බවත් කැන්වස් වැනි සපත්තු දෙකක් පැළඳ සිටි බවත් පවසා ඇත.

තමා විසින් එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් විස්තර සි.ආර් පොතේ ලියන ලද බවට පවසා පී ආර් 177/19 ට අදාළ සි.ආර් පොතක් පැ.150 ලෙස මෙම සාක්ෂිකරු මඟින් ලකුණු කර ඇති අතර එහි 04 වන පිටුවේ ඇති විස්තර පරික්ෂා කර බලමින් එහි සඳහන් පැමිණි පුද්ගලයාගේ නම අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් අංක 49, වෙලම්බඩ, ලෙස ලියා ඇති බවත් එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය 823533241V බවත් එම තැනැත්තා කාමර අංක 12 හි නැවතී සිට ඇති බවත් එම තැනැත්තා උදේ 9.30 ට යනවා යැයි තමාට පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පෙර අවස්ථාවක පැ.141 ලෙස ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පත පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති අතර තමාගෙන් දෙහිවල ට්‍රොපිකල් ඉන් ආයතනයෙහි කාමරයක් වෙන් කරගන්නා ලද තැනැත්තා මෙම ජාතික හැඳුනුම්පතට අදාළ තැනැත්තා බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එම අබ්දුල් ජමිල් නැමැත්තා උදේ වරුවේ හෝටලයෙන් එළියට යන්න ඕනා යැයි පවසා ගොස් පස්වරු 1.30 ත් 1.40 ට ත් අතර යලි හෝටලයට පැමිණි බවත් එම අවස්ථාවෙහි හෝටලයේ කපල් එකක් නැවතී සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර අබ්දුල් ජමිල් නැමැත්තා එලෙස යලි හෝටලයට පැමිණ කාමරයට ගොස් විනාඩි කීපයක් ඇතුළත එක පාරටම ලොකු ශබ්දයක් ආව බවත් ශබ්දය ඇහිලා තමාලා කට්ටියම එළියට දුවන් ආව බවත් එවිට තමා සිටියේ ඔෆිස් එකේ බවත් ඉන්පසු බලන විට එම ජමිල් නැමැත්තා සිටි කාමරය කුඩු වෙලා වගේ තිබුණු බවත් එම කාමරය අසල තිබූ කාමර අංක 11 සහ 13 ටද හානි වෙලා තිබුණු බවත් පවසා එසේ කාර්යාලයේ වහලයට අලාභ හානි සිදුවුණ බවට පවසා එයට අදාළ ඡායාරූපයක් හඳුනාගෙන එය පැ.147 (3) ලෙස ලකුණු කර ඇත.

එලෙසම කාමරවලට හානි සිදුවූ ඡායාරූපයක් පැ.147 (4) ලෙස හඳුනාගෙන ලකුණු කර ඇත. හෝටලයේ නැවතී සිටි ජෝඩුවද එම පිපිරීමෙන් මරණයට පත් වෙලා සිටි බවත් ඔවුන් සිටි කාමරයේ බිත්තියද

කැඩිලා වැටී තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, කාමර අංක 12 හි සිටි පිරිමි තැනැත්තාද මියගොස් සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.150 ලෙස ලකුණු කරන ලද සි.ආර් පොතෙහි ලියා ඇති සටහනට අනුව හෝටලයට පැමිණි තැනැත්තා එදින රාත්‍රියේද ගත කිරීම සඳහා එම කාමරය ලබාගෙන ඇති බවට සටහන් කර ඇති බවද පවසා ඇත.

තවද මෙම බෝම්බ පිපිරීමෙන් මියගිය කපල් එකක් ලෙස පැමිණි දෙදෙනා මෙම සාක්ෂිකරුගේ ආයතනයේ අයිතිකරු හඳුනන දෙදෙනෙක් බැවින් එම දෙදෙනාගේ විස්තර සි.ආර් පොතේ සටහන් කළේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට N017703 අංක දරන ගුවන් ගමන් බලපත්‍රයක් පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති අතර එම ගුවන් ගමන් බලපත්‍රයට අදාළ ජාතික හැඳුනුම්පත් අංකය 823533241V බවත් මෙම ජාතික හැඳුනුම්පත් අංකයම පැ.141 ලෙස ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පතේ සඳහන් අංකයම බවත් එසේම, පැ.150 (1) ලෙස සටහන් කර ඇති සි.ආර් පොතෙහි සඳහන් ජාතික හැඳුනුම්පත් අංකයම එකම බවත් මෙම සාක්ෂිකරු එම ලේඛන පරීක්ෂා කර බලමින් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුට පැ.152 ලෙස N017703 ලෙස අංකය දරන ගමන් බලපත්‍රයක් පෙන්වා එය පැ.152 ලෙස ලකුණු කර ඇති අතර එම ගමන්

බලපත්‍රයේද එය හිමි තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය ලෙස 823533241V යනුවෙන් සඳහන් වී ඇති බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරුට N5307123 ලෙස අංකය සඳහන් තවත් ගමන් බලපත්‍රයක් පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති අතර එය පැ.154 ලෙස ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුට පැ.118 ලෙස ලකුණු කර ඇති ලේඛනයක් පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇති අතර එම ලේඛනයෙහි N017703 යන අංකය සඳහන් වන බවත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත. එසේම, පැ.152 ලෙස ලකුණු කර ඇති ගමන් බලපත්‍රයේ සඳහන් අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන නම පැ.118 ලෙස ලකුණු කර ඇති ලේඛනයේද අඩංගු වන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එසේම, පැ.152 සහ පැ.154 ලෙස ලකුණු කරන ලද පාස්පෝට් දෙකේම තිබෙන ඡායාරූපවල සිටින්නේ තමා සේවය කළ හෝටලයට පැමිණි අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැති පුද්ගලයාම බවට සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර ඔහු සිටි කාමර අංක 12 තුළ බෝම්බ පිපිරීමෙන් පසුව එම කාමරය තුළ තනිකරම මස් කැබලි තිබුණ බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුට 2019.04.21 දිනට අදාළ පැ.138 දරන සංයුක්ත තැටියක් වාදනය කර එහි පැය 13.46 ට අදාළ දර්ශන සාක්ෂිකරුට පෙන්වා

ඇති අතර CCTV දර්ශනයට අනුව ට්‍රොපිකල් ඉන් හෝටලයේ බෝම්බ පිපිරීමෙන් පසු ගිනි නිවන වාහනයක් පැමිණෙන ආකාරය ඇතුළු දර්ශන සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තවද සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා විසින් පැ.147 දරන හැඳුනුම්පත සහ පැ.150 දරන සි.ආර් පොත විමර්ශන නිලධාරීන්ට භාර දුන් බවයි.

මෙම සාක්ෂිකරුගෙන් 02, 09, 13, 20, 23 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති අතර අනිකුත් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. හරස් ප්‍රශ්නවලදී ද මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ ට්‍රොපිකල් ඉන් හෝටලයට එන්න කලින් හඳුනන තැනැත්තන්ගේ විස්තර ලියා ගන්නේ නැති බවයි. විත්තියෙන් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ පැ.150 ලෙස ලකුණු කරන ලද සි.ආර් පොත 2019.04.21 ට දිනට පසුව සකස් කර ඉදිරිපත් කර ඇති ලේඛනයක් බව වුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව සහ විශේෂයෙන් පැ.150 ලෙස ලකුණු කර ඇති අමුත්තන්ගේ විස්තර සඳහන් කරන ලද ලේඛනයේ සඳහන් කරුණුද එසේම, පැ.141 ලෙස ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පත්‍රය, පැ.152 ලෙස ලකුණු කර ඇති සහ පැ.144 ලෙස ලකුණු කර ඇති විදේශ ගමන් බලපත්‍රයන් ද 2019.04.21 වන දින දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයෙහි බෝම්බ පිපිරීමෙන් මියගිය අබ්දුල් ලතීෆ් ජමිල්

මොහොමඩ් නැමැත්තාගේම බවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර එම තැනැත්තා 2019.04.21 දින දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේ කාමර අංක 12 ඇතුළේ බෝම්බයක් පිපිරීමෙන් මියගොස් ඇති බවද මැනවින් සනාථ වන අතර එම අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තා 2019.04.20 දින දෙහිවල ස්පෑන් ටවර් නැමැති ස්ථානයේ සිට කොළඹ පිහිටි ටාජ් සමුද්‍රා හෝටලයට ගොස් එහි කාමර අංක 365 සඳහා මුදල් ගෙවා වෙන් කරගෙන එහි නැවතී සිට ඇති අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැති ජාතික හැඳුනුම්පත් අංක 823533241V අංකය හිමි අංක 49, වෙලම්බොඩ මහනුවර ලිපිනය සඳහන් පැ.141 ලෙස ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පත්‍රය හිමි එකම තැනැත්තා වන අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන තැනැත්තාම බවට කිසිදු සැකයකින් තොරව අධිකරණය ඉදිරියේ කරුණු සනාථ වී ඇත.

පැ.සා.1350 මොහොමඩ් සමීර් ඉම්තියාස් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් දෙහිවල එබනේසර් පටුමගෙහි පිහිටි මස්ජිත් අල්රහුමාන් නැමැති පල්ලිය තමාගේ පියා විසින් 2012 වසරේ හෝ 13 වසරේ ආරම්භ කළ බවත් එම පල්ලියට පැමිණෙන ජනතාව ඇබනීසර් පල්ලිය යැයි හඳුන්වන බවත් පවසා ඇති අතර 2019 පාස්කු ඉරුදින දිවයිනෙහි බෝම්බ ප්‍රහාර මාලාවක් සිදුවුණ බවත් එම බෝම්බ ප්‍රහාර ගැන දැනගත් පසු තමා තම පියා සමඟ දුරකථනයෙන් සාකච්ඡා කර රටේ පැවති කලබලකාරී වතාවරනය නිසා පල්ලිය තාවකාලිකව වසා දැමීමට තීරණය කළ බවත්

2019.04.21 දින උදෑසන 11 ට පමණ එලෙස එනම් දිවා යාඥාවට පෙර පල්ලියට පැමිණි බවත් එදින පල්ලිය පරිශ්‍රයේ සැක කටයුතු පුද්ගලයෙකු සිටි බවත් එම අවස්ථාව වනවිටත් පල්ලිය තාවකාලිකව වසා දැමීමට තීරණය කර තිබූ නිසා තමා එම තැනැත්තාගෙන් එම ස්ථානයේ සිටීමට හේතුව ගැන විමසූ විට එම තැනැත්තා කෝපයට පත් වූ බවත් තමා එම අවස්ථාවේදී පල්ලිය ආරක්ෂාව සඳහා සිටි ආරක්ෂක ප්‍රධානියා වන අමීර් නැමැත්තාට එම තැනැත්තා සම්බන්ධයෙන් දැනුම් දුන් බවත් එම සැක කටයුතු තැනැත්තා හීන්දෑරි කොණ්ඩය සහ රැවුල වවාගෙන සිටි කලිසමක් සහ කමිසයක් ඇද සිටි අයෙක් බවට සාක්ෂිකරු පවසා ඇත.

අමීර් නැමැති ආරක්ෂක නිලධාරියා එම තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීම් කළ බවත් තමා එම අවස්ථාවේදී එම ස්ථානයෙන් පිටත් වී ගිය බවත් පවසා ඇත. පැ.148 ලෙස ලකුණු කර ඇති CCTV තැටියෙහි අඩංගු දර්ශන සාක්ෂිකරුට පෙන්වා ඇති අතර ඒවා නරඹමින් එහි එබනේසර් පල්ලිය සහ එයට එන පාර දක්නට ලැබෙන බවත් එම CCTV දර්ශන 2019.04.21 දිනට අදාළ බවත් එහි තමා විසින් පෙර සඳහන් කරන ලද සැක කටයුතු තැනැත්තා ගාලු පාර දිසාවේ සිට පල්ලියට පැමිණ පාවහන් ගලවමින් පල්ලිය ඇතුල් වන ආකාරය හඳුනාගෙන ඇති අතර එම තැනැත්තා හැර පල්ලිය තුළ එම අවස්ථාවේදී වෙනත් කිසිවකු නොමැති බවටද CCTV දර්ශන ආශ්‍රයෙන් සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එසේම, දහවල් 12.34

ට එම තැනැත්තා එම ස්ථානයෙන් පිටත් වී යන ආකාරයද CCTV දර්ශනයෙහි දක්නට ලැබෙන බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

එසේම, ඔහු පල්ලියෙන් ඉවතට පැමිණ ඉවත්ව යන ආකාරයද සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර මෙම සාක්ෂිකරු පැ.148 දරන CCTV දර්ශන වැඩිදුරටත් නරඹමින් එහි සඳහන් වේලාව අනුව 1.30 ට සිටින ආකාරය සහ පල්ලියට ඇතුල්වෙන පඩිපෙළ පාමුල පාවහන් දෙකක්ද තිබෙන ආකාරය සාක්ෂිකරු හඳුනාගෙන ඇත. තවද පස්වරු 2.45 වන විට ඔහු පල්ලිය තුළ සිට දොර දෙසට ගමන් කර ඉවතට යන ආකාරයත් එම අවස්ථාව වනවිට පල්ලිය තුළ පුද්ගලයන් පිරිසක් යාඥා කරමින් සිටින ආකාරයත් සාක්ෂිකරු හඳුනාගෙන ඇත.

තවද තමා සඳහන් කළ සැක කටයුතු තැනැත්තා පැය.14.59 ට මුහුදු වෙරළබඩ මාර්ගය අයිනේ ගසක් යට යම් පුද්ගලයෙකු සමඟ කතා කරමින් සිටින ආකාරයද දිස්වෙන බවට හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් තමා පැවසූ තමා සමඟ ආවේගයෙන් කතා කළ සැක කටයුතු පුද්ගලයාගේ ඡායාරූපයක් තමාගේ ජංගම දුරකථනයෙන් ඡායාරූපයක් ලබා ගත් බවත් එදිනට පසු දිනම තමා එම ඡායාරූපය සහ පල්ලියේ CCTV දර්ශන සියල්ල සංයුක්ත තැටියකට දමා දෙහිවල පොලිස් ස්ථානයට භාර දුන් බවත් පවසා තමා විසින් ලබා ගත්

සැක කටයුතු පුද්ගලයාගේ ඡායාරූපය හඳුනාගෙන එය පැ.155 ලෙස ලකුණු කර ඇත.

තවද සාක්ෂිකරු පවසා ඇත්තේ ශ්‍රී ලංකාවේ පුරාවටම සම්මතයක් වශයෙන් යාඥා කිරීම් ආරම්භ වන්නේ දහවල් 12.30 ට බවත් තමා නැරඹූ CCTV දර්ශනවල දහවල් 2.30 ට ආසන්න වේලාවක යාඥාව ආරම්භ කරන ආකාරය දක්නට ලැබෙන බවත් එය CCTV කැමරාවන්හි පටිගත කරන වේලාවේ තිබෙන වරදක් නිසා වී ඇති බවත් තමා පැවසූ CCTV දර්ශනවල පැය කීපයක වෙනස්කමක් දක්නට ලැබෙන බවත් එම CCTV පද්ධතිය කුමන ආයතනයකින් සවි කළාද යන්න තමාට දැනීමක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2019.04.21 දින මධ්‍යහන වේලාවට ආසන්නව මෙම සාක්ෂිකරු පවසා සිටින දෙහිවල ඇබන්සර් පල්ලිය ලෙස හඳුන්වන මුස්ලිම් පල්ලිය තුළට පැ.148 ලෙස ලකුණු කර ඇති සංයුක්ත තැටියේ දිස්වෙන සහ එසේම, මෙම සාක්ෂිකරු විසින්ම ඔහුගේ ජංගම දුරකථනයෙන් ලබාගෙන ඇති පැ.155 දරන ඡායාරූපයෙහි සිටින තැනැත්තා එකම තැනැත්තෙකු බව පෙනී යන අතර එම තැනැත්තා දෙහිවල ට්‍රොපිකල් ඉන් ආයතනයෙහි කාමර අංක 12 තුළ බෝම්බ

පිපිරීමෙන් මියගොස් ඇති තැනැත්තා එකම තැනැත්තෙකු එනම් අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන අයම බව කිසිදු සැකයකින් තොරව සනාථ වී ඇත.

2019.04.21 දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේ සිදුවූ බෝම්බ ප්‍රහාරය හේතුකොට ගෙන එහි නැවතී සිටි යුවළක් වන මෙරින්නගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන අය මියගොස් ඇති බව සහ පැ.සා.1360 වාද්දුවගේ කාංචන මාලා රම්‍යකුමාරි පෙරේරා සහ පැ.සා.1361 අනිල් සල්ගාදු යන අය ඉහත මියගිය මෙරින්නගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන අයගේ මෘත දේහයන් හඳුනා ගැනීම සියලුම චිත්තිකරුවන් වෙනුවෙන් හබ නොකරන බව මත එම කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීම් ලෙස වාර්තා කර ඇත.

තවද පැ.සා.2211 තමරා අධිකාරී නැමැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ මහ කොළඹ පළාත් කාර්යාලය තක්සේරුකරු විසින් 2020.01.13 දාතමින් යොමු කර ඇති CM/DMC/LM/2587 නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පොලේ 2019.04.21 දින සිදුවූ බෝම්බ පිපිරීමෙන් රුපියල් හය මිලියන පන්සීය අනුදාහක අලාභයක් වී ඇති බවට ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාව සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකර පිළිගන්නා

බවට සඳහන් කර ඇති හේතුව මත එය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

පැ.සා.2209 මොහොමඩ් තාසීර් මොහොමඩ් නිල්වාර් යන ත්‍රීරෝද රථ රියදුරු විසින් ඔහුගේ WP AAG-5217 යන ත්‍රීරෝද රථයෙන් මෙම නඩුවේ අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යන අය දෙහිවල එබනීසර් ප්ලේස් සිට නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පළ වෙත 2019.04.21 දින පස්වරු 1.00 න් පසු වේලාවකදී ගෙන ගොස් හැරලූ බවට වන කරුණුද විත්තිය විසින් සියලුම චූදිතයන් වෙනුවෙන් හබ නොකර පිළිගැනීම මත එම කරුණුද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත.

පැ.සා.2208 හජ්ජි මරික්කාර් මොහොමඩ් අමීර් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු 1992 වසරේ සිට 2004 දක්වා ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්තව සේවය කර ඉන්පසු නීත්‍යානුකූලව ඉල්ලා අස්වී පුද්ගලික ආරක්ෂක සේවයේ රැකියාවක් කළ බවත් 2019 අප්‍රේල් මාසය වනවිට ඇන්කා කන්සල්ටන්ස් සර්විස් පුද්ගලික සමාගමට අනුයුක්තව සේවය කළ බවත් පවසා ඇති අතර 2019.04.21 දින තමා කොළඹ වැල්ලවත්තේ පිහිටි තමාගේ නිවසේ සිටි බවත් තමාගේ ප්‍රධානියා විසින් තමාට දුරකථනයෙන් අමතා දෙහිවල එවනේෂර් ප්‍රදේශයේ පිහිටි මුස්ලිම් පූජනීය ස්ථානයට ගොස් එහි සිටින මොහොමඩ් සමීර් නැමැත්තාව මුණගැසෙන

ලෙසට තමාට දැන්වූ බවත් තමා එම තැනැත්තාව මීට පෙර දැන සිටියේ නැති බවත් ඉන්පසු තමා පුද්ගලික ත්‍රීරෝද රථයෙන් එවනේෂර් පල්ලියට ළඟා වෙන විට වේලාව දහවල් 12.45 ට පමණ බවත් එම අවස්ථාවේදී පල්ලියේ පූජාව කිරීම සඳහා පූජකවරුන් සහ බැතිමතුන් පැමිණ සිටි බවත් ඉන්පසු තමා එම ස්ථානයට ආරක්ෂාව ලබා දෙන්න ඇති අවශ්‍යතාවය කුමක්ද යන්න එළිය පරික්ෂා කරමින් සිටි බවත් ඉන්පසු තමා එම පල්ලියෙහි සිටින සමිර් යන අය සමග කතා කරමින් සිටින විට පාරෙන් එහා පැත්තේ පල්ලියේ රැස්වෙලා සිටි කට්ටියක් බහින් බස්වීමක් වෙනවා දැක්ක බවත් සාක්ෂිකරු පවසා ඇත.

පැ.148 (13) ලෙස ලකුණු කර ඇති CCTV දර්ශන නරඹමින් තමාගේ ත්‍රීරෝද රථය එහි තිබෙන බවට හඳුනාගෙන තමා පැවසු පරිදි බහින් බස්වීමක් සිදුවූ අවස්ථාවේදී තමා සිටි ස්ථානයද හඳුනාගෙන ඇති අතර එසේම, පල්ලියෙන් එහා පාරෙන් වම් පැත්තේ ගසක් තිබෙන ස්ථානයෙහි හතරදෙනෙක් වට වී ශබ්දෙන් කතා කරමින් සිටි බවත් එම අවස්ථාවේදී තමා පඩිපෙළෙන් බැස පාරට ඇවිත් ඔවුන් කෑ ගහන්නේ ඇයි දැයි විමසූ විට එහි රැස්වී සිටි පුද්ගලයන්ගෙන් කෙනක් තමාට කතා කර මේ ඉන්න පුද්ගලයා සැක සහිත පුද්ගලයෙක් පැය තුනක කාලයක් රැඳිලා ඉන්නවා, අපි අහපුවාම උත්තරයක් දෙන්නේ නැහැ, එයා ගැන සෝදිසි කරලා බලන්න යැයි තමාට පැවසූ බවත් ඉන්පසු එම ස්ථානයේ සිටි සුදු

පාට ෂර්ට් එක ඇද, කළු පාට කලිසමක් ඇද රැවුල වවා සිටි පුද්ගලයා සමඟ කතා කර ඔහුගේ හැඳුනුම්පත ඉල්ලා සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පැ.155 දරන ඡායාරූපය මෙම සාක්ෂිකරුට පෙන්වන ලදුව එහි සිටින්නේ තමා පැවසූ තැනැත්තා බවට හඳුනාගෙන ඇත.

එසේම, තමා එම තැනැත්තාගේ හැඳුනුම්පත ඉල්ලා සිටීමේදී ඔහු එය ලබාදීම ප්‍රතික්ෂේප කරමින් ඇයි ඔබ පොලිස් නිලධාරීයෙකු දැයි ඇසූ බවත් ඉන්පසු තමා පිළිබඳ විස්තර ඔහුට පැවසීමේදී එම තැනැත්තා ඔහුගේ රියදුරු බලපත්‍රය ලබා දුන් බවත් තමා විසින් රියදුරු බලපත්‍රයේ සඳහන් විස්තර ටික තමා නිරන්තරයෙන්ම අතේ තබාගෙන සිටින පොතෙහි සටහන් කරගත් බවත් එම තැනැත්තා නුවර ලිපිනයක් ලබා දී ටෙලිෆොන් නම්බර් එකක්ද තමාට ලබාදුන් බවත් සාක්ෂිකරු විසින් පවසා ඇති අතර මෙම සාක්ෂිකරු විසින් ඉහත විස්තර සටහන් කරගත්තා යැයි සඳහන් කරන පොත පැ.157 ලෙස ලකුණු කර ඇති අතර එහි අදාළ සැක කටයුතු පුද්ගලයාගේ විස්තර තමා විසින් ලියා ඇති පිටුව 151 1 (ඒ) අකුර ලෙස ලකුණු කර ඇත.

තමා පරීක්ෂා කළ රියදුරු බලපත්‍රයේ තිබුණු නම අබ්දුල් ලතීෆ් මොහොම්ඩ බවත් එහි තිබූ ජාතික හැඳුනුම්පත් අංකය 823533241V බවත් ලිපිනය ලෙස අංක 49, වෙලම්බොඩ, මහනුරව ලෙස සඳහන් වී තිබුණු බවත් පවසා පී ආර් 42/2019 වශයෙන් සඳහනක් ඇති කවරයක බහා තිබූ

රියදුරු බලපත්‍රයක කොටසක් හඳුනාගෙන එය තමා විසින් පෙර පවසන ලද රියදුරු බලපත්‍රය බවත් තමා එහි ඡායා පිටපතක් ද ලබාදී තිබෙන බවට පවසා ඇත. එම රියදුරු බලපත්‍ර යේ අංකය CC2251472 බවත් පවසා අදාළ රියදුරු බලපත්‍රය පැ.159 ලෙස ලකුණු කර ඇත.

තවද එම තැනැත්තා විසින් තමාට ලබාදුන් දුරකථන අංකය වැඩ කරපු නැති දුරකථන අංකයක් නිසා එය විසන්ධි කර තිබෙනවානේ ඇයි මේ නම්බර් එක දෙන්නේ යැයි විමසූ විට එම තැනැත්තා විවාහ වී වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචි වී සිටින බවත් ගෙදරින් ආරවුලක් වී පැමිණි බවත් ඉන්පසු එම තැනැත්තාගේ බිරිඳගේ අංකය යැයි පවසා තමාට දුරකථන අංකයක් ලබා දුන් බවත් එම කාලයේ තමා විසින් තමාගේ ජංගම දුරකථන අංක 077-7819818 යන අංකයට ඇමතුමක් ගැනීමේදී ගැහැනු කෙනෙක් එයට පිළිතුරු ලබා දුන් බවත් ඉන්පසු තමා ජංගම දුරකථනය අබ්දුල් ලතීෆ් ජමිල් මොහොම්ඩ ලබා දුන් බවත් ඔයාගේ සැකය නිසා ඔයාව තහවුරු කර ගැනීම සඳහා ඉල්ලා සිටිනවා යැයි ඔහු තැනැත්තියට පැවසූ බවත් ඉන්පසු තමා එම අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් තැනැත්තාගේ බිරිඳගෙන් විස්තර ලබා ගත් බවත් තමා සමග අනිත් පසින් සම්බන්ධ වූ කාන්තාව සමග තමා මුලින්ම සිංහල භාෂාවෙන් කතා කළ බවත් එවිට ඇයට එය තේරුම් ගන්න බැරි වුණ බවත් ඉන්පසු තමා ඇය සමග දෙමළ භාෂාවෙන් කතා කළද ඇයට දෙමළ භාෂාවෙන් ද කියා ගන්න බැරි නිසා ඇය සමග කුමන භාෂාවෙන් කතා කරන්න පුළුවන්

යැයි අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් ගෙන් ඇසූ විට ඉංග්‍රීසියෙන් පුළුවන් යැයි දැනුම් දුන් නිසා තමා ඇය සමග ඉංග්‍රීසියෙන් කතා කළ විට එවිට ඇය පවසා සිටියේ එයා ගෙදර ආරවුලක් නිසා ගෙදරින් පිට වෙලා ඉන්නේ යැයි විස්තර ලබා දුන් බවත් කෙසේ වෙතත් තමාට එම සැක කටයුතු පුද්ගලයා සම්බන්ධයේ ප්‍රකාශ කරපු දේවල් පිළිබඳව තමා සෑහීමට පත් වුනේ නැති බවත් ඔහු තමාට නුවර ටෙලිෆෝන් නම්බර් එකක් දීම සම්බන්ධයෙන් සැකයක් තමාට තිබුණු බවත් කෙසේ වෙතත් තමා එම අවස්ථාවේදී නුවර ප්‍රදේශයේ දුරකථන අංකය සටහන් කරගත්තේ නැති බවත් පවසා ඇත.

තමා සමඟ කතා කළ එනම් සැක සහිත පුද්ගලයාගේ බිරිඳ යැයි සඳහන් කරන තැනැත්තියගේ විස්තර තමා ලියා ගත් බවත් පවසා පැ.157 (1) දරන පිටුවෙහි එම විස්තර ලියා තිබෙන බවත් ඇගේ දු.ක අංකය 077-9706977 බවත් පවසා තමා විසින් සැක කටයුතු පුද්ගලයාගේ බිරිඳ සමඟ සම්බන්ධ වූ 077-9706977 දරන ඩයලොග් අංකයට අදාළ දුරකථන විස්තර වාර්තාව හඳුනාගෙන එය පැ.160 ලෙස ලකුණු කර ඇති අතර එහි පාරිභෝගිකයාගේ නම ලෙස අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් යැයි සඳහන් වන බවත් ඔහුගේ ලිපිනය අංක 49, වෙලම්බොඩ මහනුවර යැයි සඳහන් වෙන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, මෙම සාක්ෂිකරුගේ ජංගම දුරකථනයෙන් සැක සහිත පුද්ගලයාගේ බිරිඳ යැයි පැවසූ තැනැත්තියට දුරකථන ඇමතුම් ලබා ගැනීම සඳහා මෙම සාක්ෂිකරු භාවිතා කළ දුරකථන අංකය ද පැ.160 ලේඛනය මත හඳුනාගෙන ඇති

අතර එම දුරකථන ඇමතුම් ගත් වේලාව පැය.13.23 බවත් පැ.160 දුරකථන විස්තර වාර්තාවට අනුව 077-9706977 දරන ජංගම දුරකථන අංකයෙන් තමාගේ දුරකථනයට දුරකථන ඇමතුම් දෙකක් යලි තමාගේ දුරකථනයට ලැබුණු බව පවසා සාක්ෂි ලබා දී ඇති අතර එම විස්තර ලබාගෙන තමා පස්වරු 2.00 ට පමණ එම ස්ථානයෙන් පිටවී ගිය බවට සාක්ෂිකරු පවසා ඇත.

පැ.148 (13) ලෙස ලකුණු කර CCTV දර්ශනය නරඹමින් එහි සඳහන් දිනය 2019.04.21 බවත් වේලාව පැය 15.07 යැයි සඳහන් වී ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, CCTV දර්ශනයෙහි මෙම සාක්ෂිකරුගේ ත්‍රීවිල් රථයද දක්නට ලැබෙන බවත් පවසා ඇත අතර මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන නිලධාරීන්ට ප්‍රකාශයක් ලබාදුන් බවට සඳහන් කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට දැනුම් දී ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කර ඇති තැනැත්තා වන අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් නැමැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය සහ අනන්‍යතාවය සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර 2019.04.21 වන දින මධ්‍යාහ්නයේ ඔහු දෙහිවල එබනේෂර් මුස්ලිම්

පල්ලියෙහි එම අවස්ථාවේ සිට ඇති බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද සනාථ වන අතර එසේම, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1350 මොහොමඩ් සමීර් ඉම්තියාස් යන සාක්ෂිකරු විසින් මෙම අධිකරණයේ ලබා දුන් සාක්ෂියේදී අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්ඩ් යන අය සම්බන්ධයෙන් සහ එම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද මැනවින් තහවුරු වී ඇත.

පැමිණිල්ලෙන් ඉහත පරිදි දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටල යේ බෝම්බ පිපිරීමට අදාළව 2024 වසරේ සාක්ෂිකරුවන් ගණනාවක් කැඳවා සාක්ෂි මෙහෙයුමක් කර ඇතද, 2026.07.10 දින මෙම අධිකරණය ඉදිරියේ දෙපාර්ශවයේම එකඟතාවය මත වාර්තා කර ඇති විස්තරාත්මක පිළිගැනීම් ප්‍රකාරව අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් නැමැති පුද්ගලයා 2019.04.21 දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේදී අධිවෝදනා පත්‍රයේ සඳහන් සිද්ධියේදී මියගිය බව පිළිගත් කරුණක් ලෙස වාර්තාකර ඇති බැවින් ඔහුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සහ දෙහිවල ට්‍රොපිකල් හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පුපුරවා හැරීම සිදුකර ඇත්තේ එකී ජමීල් නැමැත්තා විසින්ම බවට අධිකරණය ඉදිරියේ කිසිදු සැකයකින් තොරව සනාථ වී ඇත. කෙසේ වෙතත් ඔහු විසින් පුපුරවා හැර ඇති බෝම්බයෙහි බලපෑම සම්බන්ධයෙන් අධිකරණයට කරුණු පැහැදිලි කිරීම සඳහා ඔහුගේ පශ්චත් මරණ පරීක්ෂණය පවත්වා ඇති පැමිණිල්ලෙන් කැඳවන ලද සාක්ෂි අංක 1542 අධිකරණ වෛද්‍ය සඳාසිවන් රවීන්ද්‍රන් යන

සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් 2019 වසර වනවිට දළ වශයෙන්, පශ්චාත් මරණ පරීක්ෂණ දළ වශයෙන් 2700 සිට 3000 ක් පමණ පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් අධිකරණ වල සාක්ෂි ලබා දී තිබෙන බවත් 2019 අවුරුද්දේ කලුබෝවිල රෝහලේ සේවය කරමින් සිටිය බවත් 2019 අවුරුද්ද වෙන කොට වසර 10ක පළපුරුද්දක් අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයට තිබුණ බවත් ඒ කාලයේ සේවය කළ වෛද්‍ය විශේෂඥ අධිකරණ වෛද්‍ය පී. බී. දසනායක මහතා සහ තමා ඇතුළු කණ්ඩායමේ ප්‍රධානත්වයෙන් යුතුව වෛද්‍ය කණ්ඩායමක් මගින් අබ්දුල් ලතීෆ් ජමීල් මොහම්මද් යන පුද්ගලයෙකු සම්බන්ධයෙන් 2019.05.15 දින පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා වාර්තාවක් පිළියෙල කළ බව පවසා මහෙස්ත්‍රාත් අධිකරණය ගල්කිස්ස වෙත යොමුකර තිබූ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව තමා සහ විශේෂඥ අධිකරණ වෛද්‍ය පී. බී. දසනායක මහතා අත්සන් කල බවත් තමා ඔහු සමග වසර පහක පමණ කාලයක් සේවය කල බවත් ඔහුගේ අත්සන හඳුනාගන්න හැකියාවක් තිබෙන බවත් පවසා ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී/914/18 මුල් නඩු වාර්තාවේ පිටු අංක 772 සිට ඉදිරියට අමුණා ඇති පිටු 6 කින් යුත් වාර්තාව හඳුනාගෙන එය පැ. 1001 ලෙස සලකුණු කර ඇත. එයට අනුව මෙම පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා ප්‍රථමයෙන්ම මෘත ශරීරය සම්බන්ධයෙන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් පියවර ගත් බවත් ඒ වනවිටත් වෛද්‍ය කණ්ඩායම් විසින් දෙහිවල සත්ත්ව උද්‍යානය අසල ගොඩනැගිල්ලක

ස්ථාන පරීක්ෂාවකුත් සිදු කර තිබුණ බවත් එහි සුන්බුන් අතර කොටස් වල ට්‍රොපිකල් ඉන් යන වචනය සඳහන් වෙලා තිබුණ බවත් ආරක්ෂක හේතූන් මත තමාලා එම ස්ථානයේදී මතුපිටින් පරික්ෂාව පමණක් කල බවත් ඒ වෙලාවෙදී අනන්‍යතාවය සනාථ කළ හැකි යම් දේවල් තියෙනවද කියලා සොයා බැලීම කළ බවත් එම දිනට පසු දින අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් විසින් ලබාගත් ඡායාරූප වගයක් තමාලාට ලබා දීලා තිබුණ බවත් නවාතැන්පලේ යම්කිසි එක් ස්ථානයක් දැඩි ලෙස හානියට පත්වෙලා එහි වහල පවා කැඩී වැටිලා තිබුණ බවත් එසේම ගොඩනැගිල්ලේ වහල සහ අනිත් ස්ථාන වලට එතරම් හානි වෙලා තිබුණේ නැති බවත් එම කොටස් වල වහලය සහ බිත්ති ඉතා සුළු ප්‍රමාණයක් හානි වෙලා තිබුණ බවත් එම ස්ථානයේ එක් ස්ථානයක පමණක් කාමරයක් දැඩි ලෙස හානියට පත්වෙලා බිත්ති කැඩී ගොස් සහ වහල කැඩී ගොස් කොටස් එක් ස්ථානයක ගොඩගැහිලා වගේ තිබුණ බවත් ඒ වෙලාවේදී මෙම පොලිස් නිලධාරීන් එම ස්ථානයේ පිළිගැනීමේ කාමරය, පළවෙනි කාමරය, දෙවෙනි කාමරය ආදී වශයෙන් විස්තර කෙරෙන දළ සැලැස්මක් තමාලාට පෙන්නුව බවත් තමාලා යන අවස්ථාවේදී එම කාමරය දැඩිව හානියට පත්වී ගල් එක්තැන් විසිරී ගිහිල්ලා එක් තැනකට ගොඩ ගැහිලා වගේ තිබුණා බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඉන් පසුව සොකෝ නිලධාරීන් පැමිණ 21 වෙනි දින, 22 වෙනි දින සහ 23 වෙනි දින ඔවුන් ලබාගත් ඡායාරූප අපිට එවලා තිබුණ බවත් ඒ

අවස්ථාවේ තමාලාට අවශ්‍ය වන ප්‍රධාන දේවල් තුනක් තමා හඳුනා ගත්ත බවත් එනම් මුලින්ම ජාතික හැඳුනුම්පතක්, හානියට පත් වූ විදේශ ගමන් බලපත්‍රයක් මෙන් ම කොටසක් හානියට පත් වූ රියදුරු බලපත්‍රයක් යන අයිතම තුන පරීක්ෂා කර බලා මරණකරුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් හෙලි වුන ද ඒ කාරණා තුන පමණක් සලකා තමාලා එකවරම අවසන් නිගමනයකට පැමිණියේ නැති බවත් මරණකරු සම්බන්ධයෙන් අනුමාන වශයෙන් පූර්ව නිගමනයකට පැමිණිය බවත් පවසා ඇත. මරණකරුගේ අනන්‍යතාවය නිශ්චිතව නිශ්චය කර ගැනීම සඳහා මුලින්ම ඉතාම විශ්වාසනීය පරීක්ෂණයක් වන DNA පරීක්ෂාව සිදු කිරීම කළ බවත් DNA පරීක්ෂාව සිදු කිරීම සඳහා අවශ්‍ය පටක සාම්පල් හානියට පත් වූ ස්ථානයේ තිබූ හිසකෙස්, මාංශ කොටස්, නියපොතු යොමු කිරීමක් සිදු කළ බවත් මරණකරුගේ DNA පරීක්ෂාව සඳහා වෙනත් සාම්පල සංසන්දනය කිරීමේ කාර්ය සඳහා අධිකරණ නියෝගය පරිදි ඥාතීන් කැඳවීමක් සිදු කර අධිකරණ නියෝගයේ සඳහන් කරන ලද මොහොමඩ් ජමීල් අබ්දුල් ලතීෆ් යන අයගේ බිරිඳ වන ෆාතිමා සිෆානා උමර් කත්තා, ඇයගේ දරුවන් තිදෙනා වන ජමීල් හම්සා කාලිඩ් ජමීල්, ජුවාරියා ජමීල් යන අයගේ ලේ සාම්පල් ලබා ගත් බවත් පවසා ඇත. කෙසේ වුව ද 2026.7.10 වන දින 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය ප්‍රකාරව සටහන් කරගන්නා ලද පිළිගැනීම හේතුවෙන් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පැ.972 දරණ

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු වාර්තාව හා එම වාර්තාව පිළියෙල කිරීමට පාදක වූ පටක සාම්පල සහ ලේ සාම්පල සම්බන්ධයෙන් සටහන් කරනු ලැබූ පිළිගැනීම හේතුකොට ගෙන මෙම සාක්ෂිකරුගෙන් මෙම සාම්පල සම්බන්ධයෙන් නඩු භාණ්ඩ පෙන්වා වැඩිදුර සාක්ෂි මෙහෙවීමට අපේක්ෂා නොකරන බවට පැමිණිල්ලෙන් දැනුම් දී ඇත.

සාක්ෂිකරු වැඩි දුරටත් පවසා ඇත්තේ මරණකරුගේ හානියට පත් වූ ශාරීරික කොටස් ගල්කිස්ස අපරාධ ස්ථාන පරීක්ෂණ සොකෝ නිලධාරී බෑග් පහකින් ඒවා තිබුණ බවත් එම බෑග් X-ray පරීක්ෂාවන්ට ලක් කර ඒවා වල වූ අස්ථි කොටස් පරීක්ෂාවට ලක් කල බවත් ඉන් අනතුරුව භෞතිකව බෑග් වල තිබුණු ශරීර කොටස් වෙන් වශයෙන් පරීක්ෂා කර ඒ ශරීර කොටස් වල විස්තර පැ.1001 දරන පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ සටහන් කළ බවත් එම බෑග් තුළ හානියට පත් වූ ශරීර කොටස්, හානියට පත් වූ අස්ථි කොටස් හා සම්බන්ධ හිසකෙස් ආදිය මෙන් ම ඒ සමගම ගල් සහ වැලි සමග ලෝහමය කොටස් තිබූ බවත් ආගන්තුක ද්‍රව්‍ය සමග ඇතැම් කොටස් වල ඇණ කොටස් සවි වී ඇති ප්ලාස්ටික් කැබලි මෙන් ම ඒ සමගම රෙදි කැබලිත් දකින්නට ලැබුණ බවත් ඒ අතර අමානා යන වචනය තිබුණ පොඩි ප්ලාස්ටික් කැබැල්ලක් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට පෙර DNA වාර්තාව තමාලා වෙත ලැබී තිබුණ බවත් එසේම පරීක්ෂාව සඳහා ලැබී තිබූ බෑග් පහේ තිබූ ශරීර කොටස් පරීක්ෂා කරලා බලා පැ.1001 පශ්චාත් මරණ

පරීක්ෂණ වාර්තාවේ අවසන් පිටුවේ මතයන් කීපයක් සඳහන් කල බවත්, අංක 01 ලෙස සඳහන් කර තිබෙන මතය වන්නේ එම ශරීර කොටස් පරීක්ෂාව සිදු කරගෙන යනවිට එම ශරීර කොටස් පිරිමි පුද්ගලයෙකුගේ බවට මතයකට එලඹුන බවත් එම මතයට එළඹීම සදහා මතුපිට පරීක්ෂා කරන විට සොයා ගත් හිසකෙස් වල ස්වභාවය අනුව ඒවා පිරිමි පුද්ගලයෙකුගේ ලෙසට පෙනුණ බවත්, එසේම තිබුණු අස්ථි කොටස්ද පරීක්ෂාවට ලක් කිරීමේ දී ඒවා පිරිමි පුද්ගලයෙකුගේ බවට පෙනුන බවත් ඊට අමතරව පුරුෂ ලිංගයේ කොටස්ද ද වම් වෘෂණ කෝෂය ද දක්නට ලැබුණ බවත් එහි පෙරසම ඉවත් කිරීමේ ශල්‍ය කර්මයකට එනම් සුන්නත් කිරීමකට ලක් කරලා තිබුණ බවත් තමාලා පරික්ෂා කල හිස, බෙල්ල, ඇඟ ප්‍රදේශය, අත්පා, කකුල, එක් ශරීරයක් ලෙස සකස් කර පරීක්ෂා කර බැලීමේ දී එක් පුද්ගලයෙක්ට වඩා පුද්ගලයන් දෙදෙනෙක් යයි තීන්දු කිරීමට කිසිදු සාක්ෂියක් තිබුණේ නැති බවත් එම තැනැත්තාගේ උස මැනලා බැලීමේ දී සෙන්ටිමීටර් 47. 2 ක් බවට පෙනී ගිය බවත් ඔහුගේ ශරීරයේ කොටස් ඉතාම දැඩි ලෙස හානි සිදුවෙලා තිබුණා. එම ශරීරයේ තිබූ සියලුම අස්ථි කැඩී ගොස් තිබුණ බවත් පපුව ප්‍රදේශයට පිටිපස ප්‍රදේශයේ තිබෙන මෘදු පටක පසාරු කරගෙන ගිය ආකාරයේ තුවාල අටක් නිරීක්ෂණය කල බවත් පිටිපස්ස ප්‍රදේශය සම්පූර්ණ පටක පිපිරීමෙන් ඇතිවෙලා තිබුණ බලපෑම නිසා ශරීරයෙන් ඉවතට ගැලවී විසිවෙලා තිබුණ බවත් පපුවේ මැද අස්ථියට සම්බන්ධ වන කොටසේ සිට කඳ කොටසේ

පිටිපස කොටස දක්වා වූ ප්‍රදේශයේ පසාරු කරගෙන ගිය ආකාරයේ ධාරිත තුවාල 22 ක් දක්නට ලැබුණ බවත් පවසා ඇත. ඒ සමගම පපුව මැද අස්ථිය එනම් ස්ටර්නම් කොටස් තුනකට භග්න වීමට ලක් වෙලා තිබුණ බවත් ඒ සමගම මේ පපුව අස්ථියට සම්බන්ධ වී තිබුණු පර්ශු ද බලවත් ලෙස කැඩී යාමට ලක් වී තිබුණ බවත් එම ප්‍රදේශයේ එම ශරීර කොටස් විසිරී කැඩී විසිරී ගිය ආකාරය පරික්ෂා කිරීමේදී පිපුරුම් තරංග මගින් ඇතිවන්නා වූ හානි එනම් Blast wave effect නිසා ඇති වූ ප්‍රතිඵලයක් ලෙස ශරීර කොටස් ගැලවිලා විසිවී ගොස් තිබුණ බවත් ඒ අනුව බෝම්බ පිපිරීම ඇති වූ මධ්‍යම කේන්ද්‍රයේ සිට තමා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය කල මෙම හානියට පත් වූ පුද්ගලයා කොපමණ දුරකින් සිටියාද යන්න තමාලා අනුමාන කිරීමක් කළ බවත් ඒ අනුව තමාලා ස්ථාන පරීක්ෂණය කිරීමේදී ද අවධානයට ලක් කළ කරුණු අනුව ශක්තිය මධ්‍යම කේන්ද්‍රය සමග සසඳා බලනවිට එම පිපිරුණු ද්‍රව්‍ය ඔහුගේ ශරීරය සමග එකට සම්බන්ධ වී තිබුණා යැයි පවසන්න හැකි බවත් එසේම මෙම මියගිය පුද්ගලයා ඒ වෙලාවේ එම බෝම්බය ළඟ තබාගෙන එය ශරීරයේ බැඳගෙන එම බෝම්බය ඔහුගේ ශරීරයට අලවාගෙන තිබිය යුතු බවත් එම වෙලාවේදී ඔහු එය ක්‍රියා කිරීමට ඔහුගේ අතින් එය හසුරුවමින් සිට ඇති බවට අනුමාන කළ හැකි බවත් එසේ නොමැතිනම් එම බෝම්බය පිපිරීම සිදුවන වෙලාවේදී ඔහු එම පිපිරීමට ඉතා ආසන්නයේ සිටි පුද්ගලයෙක් බවට අනුමාන කළ හැකි බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම ඒ අනුව ඔහුගේ ශරීර හානියට පත් වූ ශරීර

කොටස් ඉතා සූක්ෂම ලෙස පරීක්ෂා කරන විට ඒ අදාළ ස්ථාන පරීක්ෂණයේ ප්‍රතිඵල ද අනුව එම පිපිරීම High energy explosion ලෙස තීරණය කල බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාලා සකස් කල පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ අවසාන පිටුවේ අවසාන නිගමනය යටතේ මරණකරුගේ අනන්‍යතාවය DNA පරීක්ෂණ මගින් තහවුරු කොට මතයක් පළ කර තිබෙන බවත් ඒ අනුව සියයට සියයක්ම එය අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයගේ බවට කිසිදු සැකයකින් තොරව සනාථ කර තිබෙන බවත් මරණයට හේතු වශයෙන් Extensive injuries to the body following high energy explosion or bomb blast ලෙස සඳහන් කර තිබෙන බව පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් සියළුම චූදිතයින් වෙනුවෙන් හරස් ප්‍රශ්ණ කිසිවක් ඇසීමට නොමැති බව පවසා සිටින ලදී.

විශ්ලේශණය

මෙම වෛද්‍ය සාක්ෂිකරුගේ සාක්ෂිය මනාව විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ දෙහිවල ට්‍රොපිකල් ඉන් නැමති නවාතැන්පල තුළ පිහිටි කාමරයක 2019-4-21 දින දහවල් කාලයේ සිදු වී ඇති පිපිරීම ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් බවත් එම බෝම්බකරු වන්නේ අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් නැමැත්තා බවට 100% නිවැරදිව ඔහුගේ අනන්‍යතාවය හෙලි වී ඇති බවත් එසේම බෝම්බකරු විසින් එකී බෝම්බය ළඟ තබාගෙන එය

ශරීරයේ බැඳගෙන එම බෝම්බය ඔහුගේ ශරීරයට අලවාගෙන තිබිය යුතු බවට සහ එම වෙලාවේදී ඔහු එය ක්‍රියා කිරීමට ඔහුගේ අතින් එය හසුරුවමින් සිට ඇති බවට අනුමාන කළ හැකි බවට ද මෙම වෛද්‍ය සාක්ෂිකරු විසින් මතයක් ප්‍රකාශ කර ඇති පසුබිම ද එසේම බෝම්බකරුගේ හානියට පත් වූ ශරීර කොටස් ඉතා සූක්ෂම ලෙස පරීක්ෂා කර බලා එම පිපිරීම high energy explosion ලෙස තීරණය කල බවත් සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුළ සහ එම වෛද්‍ය මතය කිසිසේත් විත්තිය විසින් හරස් ප්‍රශ්න ඇසීමකට ලක් කර නොමැති පසුබිම තුළ මෙම අබ්දුල් ලතීෆ් ජමීල් නැමති ස්වයංඝාතක බෝම්බකරු මෙලෙස දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නැමති නවාතැන්පලේ දී ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා ඇත්තේ චේතනාන්විතවම බවට පෙනී යන අතර එකී ක්‍රියාව මගින් සාහසික ක්‍රියාවක් කිරීමේ වරද සිදු කර ඇති බැවින් එකී අබ්දුල් ලතීෆ් ජමිල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමිල් මොහොමඩ් හෙවත් අබු හම්සා නැමැත්තා 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (උ) වගන්තිය සමඟ කියවිය යුතු 2 (2) (ii) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බව මැනවින් සනාථ වේ. ඔහු විසින් සිදුකර ඇති ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා හැරීමේ සාහසික ක්‍රියාව හේතුකොටගෙන ඒ අනුව 2019-4-21 දින දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නැමති නවාතැන්පලේ දී එකී ස්වයංඝාතක

බෝම්බකරු විසින් චේතනාන්විතවම සිදුකර ඇති මෙම බෝම්බ පිපිරීම නිසා ඔහු සිටි කාමරයට යාබද කාමරයේ සිට ඇති මරණයට පත් වූ මෙරිඤ්ඤගේ පියුමි ශානිකා සල්ගාදු සහ කෝනාර මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත සඳකැලුම් යන දෙදෙනාගේ මරණය එකී ස්වයංඝාතක බෝම්බකරු විසින් චේතනාන්විතව සිදුකර ඇති සාහසික ක්‍රියාව තුළින්ම බවට මනාව පැහැදිලි වේ.

එලෙස අබ්දුල් ලතීෆ් ජමීල් නැමති ස්වයංඝාතක බෝම්බකරු විසින් පුපුරුවා හැර ඇති අධිබලැති බෝම්බයේ අඩංගු වන්නේ ද 2019.4.21 දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ, මීගමුව කටුවපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මෙන්ම මඩකලපුව සියෝන් දේවස්ථානයේ යන කතෝලික දේවස්ථාන වල මෙන් ම කොළඹ පිහිටි තරු පන්තියේ හෝටල් වන ශැන්ග්‍රීලා, කිංග්ස්බරි, සිනමන් ග්‍රෑන්ඩ් යන හෝටල් වල පුපුරුවා හැර ඇති ස්වයංඝාතක බෝම්බකරුවන් විසින් පුපුරුවා හැර ඇති බෝම්බ වල අඩංගු වන්නේ ද එකම රසායන ද්‍රව්‍ය වන යූරියා නයිට්‍රේට් මිශ්‍ර අධිබලැති පුපුරණ ද්‍රව්‍ය වීම තුළින් එම සියළුම ස්වයංඝාතක බෝම්බකරුවන් එකම දවසක එකම වේලාවට එකම සංයුතියකින් යුත් ස්වයංඝාතක බෝම්බ පුපුරුවා හැර ඇති බව මැනැවින් පෙනී යයි.

මෙම සාක්ෂිකරු ලබාදී ඇති සාක්ෂිය මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැමිණිල්ලේ සාක්ෂි අංක 1433 අකුරණගේ චමිලා සමන්ති ධර්මරත්න යන යන ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරියගේ සාක්ෂියෙන් මැනවින් තවදුරටත් සනාථ වේ. එම සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ 2019.04.21 වන දින තමා පිපිරීමට ලක්වූ නිව් ට්‍රොපිකල් ඉන් යන ස්ථානයට යන විටත් එම ස්ථානයේ SOCO නිලධාරී ප්‍රධාන පොලිස් පරීක්ෂක ජගත් ප්‍රියන්ත මහතා සිටි බවත් තමා එම ස්ථානය නිරීක්ෂණය කර ගල්කිස්ස මහෙස්ත්‍රාත් නඩු අංක BR/917/02/19 යටතේ අංක CE/652/19 - JE/68/20 දරන රස පරීක්ෂක වාර්තාව නිකුත් කළ බවත් කියා සිටිමින් එකී වාර්තාව පැ.1989 ලෙස ලකුණු කරන ලදි.

එම ස්ථානයේ කළ නිරීක්ෂණය අනුව එය, දෙහිවල, ආනගාරික ධර්මපාල මාවත, පළමු පටුමගෙහි New Tropical Inn. යන තනි මහලකින් යුතු කාමර කීපයකින් සමන්විත ගොඩනැගිල්ලක වූ නිවාඩු නිකේතනයක් බවත්, එහි දෙවැනි කාමරය හා ඊට යාබද කාමර වල බිත්ති හා වහලය කැඩී බිම පතිත වී තිබුණ අතර මෙම දෙවැනි කාමරය මීටර් 4 x මීටර් 3.25ක විශාලත්වයෙන් යුක්තව එහි සිමෙන්ති පොළව ආවාටයකින් පළුදු වී තිබූ බවත්, එම ආවාටය තරමක් වෘත්තාකාර හැඩැති වන අතර එහි විෂ්කම්භය මීටර් 1.5ක් පමණ හා ගැඹුර සෙන්ටිමීටර් 12ක් පමණ වන බවත් දෙවැනි කාමරය තුළ තිබූ ලෝහමය ඇඳන් දෙකක් පසාරු වී ගිය වෘත්තාකාර සිදුරු සමූහයකින් පළුදු වී තිබූ බවත්, ඒ වගේම වෘත්තාකාර

සිදුරු වල පසාරු වීමේ දිශානතිය විශ්ලේෂණය කිරීමේදී ඒවා ඉහත ආවාටයට ඉහළින් ඊට ආසන්නව නිකුත් වූ ලෝහ බෝල ගැටීමෙන් සිදුරු වී ඇති බව නිරීක්ෂනය වූ බවත්, මෙම දෙවැනි කාමරය ඇතුළතින් ජනිත වූ පීඩනයක් හේතුවෙන් මෙහි බිත්ති පිටතට තල්ලු වී කැඩී ගොස් තිබූ බවත් තමාගේ නිරීක්ෂණයන් බව කියා සිටින ලදී.

එම ස්ථානයේ පොළොව මතුපිට ඉතාම ආසන්නව අඟල් දෙකක් තුනක් පමණ ඉහළින් පිපිරීමක් සිදුවී ඇති බව පෙනී ගිය බවත්, එහි දී වැඩිදුර පරීක්ෂණ සඳහා පළුදු වූ ලෝහ බෝල සමූහයක් සොයා ගත් අතර ඊට අමතරව ආවාටය තුළින් ගත් පස් සාම්පලයක් සහ ආදර්ශ පස් සාම්පලයක්, පාලක පස් සාම්පලයක් ලබා ගත් බවත්, මෙම ලෝහ බෝල වල විෂ්කම්භය කලින් සඳහන් කළ ආකාරයටම මිලිමීටර් 6.2ක විෂ්කම්භයක් සහ බරින් ග්‍රෑම් 1.05ක් බවත් එම ලෝහ බෝල මත අධිබල පශ්චාත් පිපුරුම් ආවරණ හඳුනා ගත් බවත් ඒවා කොළඹ කොටුව නඩු අංක බී/13099/19 යටතේ ෂැංග්‍රිලා හෝටලයේ පිපිරීම සිදුවූ ස්ථානයෙන් ලබා ගන්නා ලද නඩු භාණ්ඩ වල අඩංගු වෙලා තිබූ ලෝහ බෝල වල ප්‍රමාණයෙන් සහ බරින් සමාන බවත්, රසායනාගාර පරීක්ෂණයේදී තමාට අධි පුපුරණ ද්‍රව්‍යයක් වන යූරියා නයිට්‍රේට් වල වැය වූ ශේෂ රසායනිකව හඳුනා ගැනීමට හැකි වූ බවත්, අන්වීක්ෂ පරීක්ෂණයෙන් ලෝහ බෝල තුළ වූ පළුදු වීම් අධිබල පශ්චාත් පිපුරුම් ආවරණ ලෙස තමා හඳුනා ගනු ලැබූ බවත් ඒ අනුව එම ස්ථානයේ අධිබල පුපුරණ ද්‍රව්‍යය පිපිරීමක් සිදුවී

ඇති බවත්, එම ස්ථානයෙන් ගන්නා ලද පස් සාම්පලය තුළද අධිපුපුරණ ද්‍රව්‍යයක් වන යූරියා නයිට්‍රේට් වල ශේෂ හඳුනා ගැනීමක් කළ බවත්, මෙම පිපුරුම් උපක්‍රමය තුළත් CE 162/19 වාර්තාවේ සඳහන් පරිදිම පුපුරණ ද්‍රව්‍ය ලෙස යූරියා නයිට්‍රේට් අධිපුපුරණ ද්‍රව්‍ය යොදා ලෝහ බෝල අඩංගු කරන ලද අධිබල පිපුරුම් උපක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර ඇති බව තමාගේ නිගමනය වන බවත් කියා සිටින ලදී. ඒ අනුව ද අප විසින් ඉහතින් සඳහන් කරන ලද පරිදි දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නවාතැන්පලෙහි ස්වයංඝාතක බෝම්බකරු විසින් පුපුරවා හැර ඇති බෝම්බයෙහි යූරියා නයිට්‍රේට් අධිපුපුරණ ද්‍රව්‍ය අන්තර්ගත බවට මැනවින් සනාථ වේ.

<u>පොලිස් සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1909 මුතුතන්ත්‍රිගේ ශාරද නිවන්ත ප්‍රනාන්දු සාක්ෂි දෙමින්, වර්තමානයේ තමා අතුරුගිරිය පොලිසියේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරන බවත් 2019.04.21 වන දින වන විට තමා ගල්කිස්ස කොට්යාශයේ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ බවත් 2019.04.21 වන දින දෙහිවල පොලිස් වසමේ නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමට අදාළව පරීක්ෂණ සඳහා තමා එම ස්ථානයට පැය 13:35ට එනම් බෝම්බය පිපිරී නොබෝ වේලාවකින් ළඟා වූ බව කියා සිටින ලදී. එම ට්‍රොපිකල්

ඉන් යන ලැගුම්හල දෙහිවල පොලිස් වසමට අයත් බවත් ගල්කිස්ස කොට්ඨාශයේ ජ්‍යෘෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ නියෝග මත තමාත්, කාන්තා පොලිස් පරික්ෂක රුවිරා, කාන්තා උප පොලිස් පරික්ෂක ජයමිණි, කාන්තා පොලිස් කොස්තාපල් 7953 වාසනා යන අය සමඟ එම ස්ථානයට ගිය අතර තමා එම ස්ථානයට ළඟා වන විටත් ජ්‍යෘෂ්ඨ පොලිස් අධිකාරී සමන් ජයසේකර මහතා සහ දෙහිවල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ඉඳුනිල් යන නිලධාරින් සිටි අතර එම ස්ථානය ඉතා කලබලකාරී ස්වරූපයකින් තිබූ අතර පොලිස් නිලධාරීන්ගේ සහාය ඇතිව ස්ථානය පරික්ෂා සුදුසු පරිසරයක් සකස් කර ගැනීමෙන් අනතුරුව පරික්ෂණ කටයුතු ආරම්භ කළ බව කියා සිටින ලදී.

තමා එම ස්ථානයට යන විටත් එම ලැගුම්හලේ කාමරයක සිටි යුවලක් බරපතල තුවාල ලබා කළුබෝවිල ශික්ෂණ රෝහලට රැගෙන ගොස් තිබූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී. අදාළ ස්ථානය විස්තර කරන ලද සාක්ෂිකරු එය ට්‍රොපිකල් ඉන් නමින් හැඳින්වෙන කාමර 08කින් යුත් පැරණි තනි මහල් ගොඩනැගිල්ලක් බවත් දෙපසින් නිවාසද පිටුපසින් එස්.ද එස්. ජයසිංහ ක්‍රීඩාංගනයත් යන මායිම් තුන තාප්පයකින් වට කොට පළවන පටුමගට මායිම්ව ගේට්ටුවක් සහිත ගොඩනැගිල්ලක් බව කියා සිටින ලදී. එම ස්ථානය WP BGA-5272 දරන රතු සහ කළු පැහැති වර්ණයෙන් යුත් ෆල්සර් වර්ගයේ යතුරු පැදියක් තිබූ බවත් එම යතුරුපැදිය ලැගුම්හලේ කාමරයකට පැමිණ සිටි තමා පිපිරීමෙන් අනතුරුව

රෝහල් ගත කරන ලද යුවලට අයත් බව එම ලැගුම්හල පවත්වාගෙන යන සුමිත් විජයලාල් යන අය තමාට පවසා සිටි බවත් සාක්ෂිකරු කියා සිටින ලදී.

එම ලැගුම්හලේ අයිතිරු ඒ වන විට විදේශගතව සිටින ස්ටැන්ලි ධර්මකුමාර යන අයෙකු බවත් සුමිත් විජයලාල් යනු එහි කළමනාකරු වශයෙන් කටයුතු කරන තැනැත්තා බවත් කියා සිටින ලදී. එම ලැගුම්හලේ පිළිගැනීමේ කවුන්ටරය පසු කොට ඇතුළු වූ පසු වම් පස ග්‍රිල් දොරක් සහිතව පැසේජ කොටසකින් කාමරවලට පිවිසීමට ඇති බවත් තමා ඒ අනුව හමු වන පළමු වන කාමරය R1 ලෙසත් දෙවන කාමරය R2 ලෙසත්, තුන්වන කාමරය R3 සහ හතර වන කාමරය R4 ලෙසත් R4 කාමරය පසු කර යන විට දකුණු බිත්තියට මායිම්ව ඇති කාමරය R5 ලෙසත් සලකුණු කළ අතර ඉතිරි කාමර 3 ගොඩනැගිල්ල පිටු පසට මායිම්ව ඒවා පිළිවෙළින් R6, R7, R8 ලෙසට සලකුණු කළ බවත් කියා සිටින ලදී.

මෙම බෝම්බ පිපිරීමෙන් R1 සිට R5 දක්වා කාමර පිහිටි ප්‍රදේශයට හානි වී ඇති බව කියා සිටින සාක්ෂිකරු පැ.147(3) සහ පැ.147(4) ඡායාරූප දර්ශන හඳුනාගනිමින් එම ඡායාරූප මගින් අදාළ ස්ථානයේ සහ ඒ අවට නිරීක්ෂණය වන බවත් වහළ කඩා ගෙන වැටී තිබීම, ගොඩනැගිල්ලේ කොටසක් යාබද අංක 102 වත්තට කඩා වැටී තිබීම පෙනී

යන අතර එමඟින් සිදුවී ඇති දැඩි හානිය නිරීක්ෂණය වන බව කියා සිටින ලදී.

තමා එම ස්ථානය 2019.04.21 දින සිට 2019.05.01 දින දක්වා නිරීක්ෂණය කරමින් පරීක්ෂණ කටයුතු කළ බවත් කියා සිටි සාක්ෂිකරු මෙම බෝම්බ පිපිරීම ඉහතින් විස්තර කරන ලද R2 යන කාමරය තුළ සිදුවී ඇති බවත් එම පිපිරීම හේතුකොට ගෙන ඊට යාබදව පිහිටි R3 කාමරයේ ලැගුම් ගෙන සිටි යුවල මතට එම කාමරයට මායිම්ව තිබූ R2 කාමරයේ බිත්තය කඩා වැටීම නිසා තුවාල ලබා රෝහල් ගත කිරීමෙන් අනතුරුව මිය ගිය බව අනාවරණය වූ බවද කියා සිටින ලදී. මියගිය යුවල ගොඩැල්ල වැකඩ, පානදුර පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 903353414V යන අංකය හිමි අරුණ ප්‍රියන්ත සඳකැළුම් සහ නො.71, උයන්කැලේ, පානදුර පදිංචි මෙරිඤ්ඤගේ පියුමි ශානිකා ලෙසට අනාවරණය වූ බවත් මෙම බෝම්බ පිපිරීම සිදු කරගත් R2 කාමරයේ සිටි පුද්ගලයා නො.49, වෙලම්බඩ මහනුවර ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 823533241V දරන ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර එම කාමරයේ නවාතැන් ගෙන සිටි අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන පුද්ගලයා බවට ඔහු විසින් පිළිගැනීමේ කවුන්ටරයට ලබා දී තිබූ විස්තර අනුව අනාවරණය කරගත් බව කියා සිටින ලදී.

R2 වශයෙන් සලකුණු කරන ලද කාමරය තුළ පිපිරීම් ලක්ෂ්‍ය තමා හඳුනාගත් බවත් එම කාමරය තුළත් පිටත ලැගුම්හලේ තැනින් තැන සහ අවට යාබද ඉඩම්වල, වහලවල් මත, මාර්ගවල සහ මියගිය යුවල පැමිණි යතුරු පැදියේ එක් ස්ථානයක ද විසිරීගිය ශරීර කොටස් රැඳී තිබුණු බව තමා නිරීක්ෂණය කළ බව එම ස්ථානවලින් සාම්පල් ද සොයා ගත් සියළු මස් කැබලි අස්ථි කොටස් කළුබෝවිල අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා වෙත සොයා ගත් අවස්ථාවන් වලදීම ගෙන ගොස් ලබා දුන් බවත් එම නඩු භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 26ක් යටතේ සටහන් කොට ඇති බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී. සාක්ෂිකරුට පැ.147 දරන සංයුක්ත තැටියේ ඇති 0093 දරන ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එම ඡායාරූපයෙහි පිපිරුම් ලක්ෂ්‍යය නිරික්ෂණය වන බවත් එම ස්ථානය යම් ආවාටයක් ආකාරයට සිමෙන්ති කොටස් ගැලවී 12cm පමණ වල කොටසක් සහ 176cm සහ 108cm ප්‍රමාණය රවුම් ආකාරයට ස්ථානයක් නිර්මාණය වී තිබූ බවත් එම ස්ථානයෙන් පස් සාම්පල ලබා ගෙන රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් පැමිණි නිලධාරීන්ට එම සාම්පල ලබා දුන් බවත් සාක්ෂිකරු කියා සිටින ලදී.

එසේම එම මරණකරු රැඳී සිටි කාමරයේ සුන්බුන් අතර තිබී 2014.10.14 දින නිකුත් කර ඇති N5307123 දරන ගුවන් ගමන් බලපත්‍රය සහ 2009.06.08 දි අවලංගු වූ N0177003 දරන අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයට අයත් විදේශ ගමන් බලපත්‍ර දෙක 2019.04.22දි න

සොයාගත් බවත් කියා සිටින ලදී. දැනටමත් පැ.152 වශයෙන් සලකුණු කර තිබූ N0177003 දරන අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමද් යන අයට අයත් විදේශ ගමන් බලපත්‍රය සහ දැනටමත් පැ.154 වශයෙන් සලකුණු කර තිබූ N5307123 දරන අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයට අයත් ගුවන් ගමන් බලපත්‍රය සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී.

එසේම අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයට අයත් අංක B2251472 දරන රියදුරු බලපත්‍රයේ කොටසක් ද සොයාගත් බව කියා සිටිමින් අධිකරණය ඉදිරියේ ලකුණු කර තිබූ පැ.159 දරන රියදුරු බලපත්‍ර කොටස වර්ෂ 2019.04.25 දින සොයාගත් බව කියා සිටින ලදී.

ඊට අමතරව එම ස්ථානයේ තිබී කුඩා යකඩ බෝල හඳුනා ගැනීමක් සිදු කළ බවත් කියා සිටි සාක්ෂිකරු දේපල කුවිතාන්සි අංක 46/2019 යටතේ අංක 01 සිට අංක 01, 02, 03, 04, 05, 08(A), 08(B), 09(A), 10, 11(A), 12, 14, 16, 20, 21, 25 ලෙස අපරාධ ස්ථානය වටා විසිරී තිබුණු මෙම සැකකරුගේ ශරීර කොටස්වලින් පිරිසිදු කොටන් බඩ් වලට ලබා ගන්නා ලද සාම්පල නඩු භාණ්ඩ දේපල කුවිතාන්සි අංක 46/2019 ට ඇතුළත් කර 2019/04/22 දින භාරදීම සිදු කර තිබෙන බවත් කියා සිටිමින් අංක 46/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත <u>පැ.1410</u> වශයෙන් සලකුණු කරන ලදී. එසේම අපරාධ ස්ථානය නම් කළ 09(B), 11(B), 13 ලෙස සලකුණු කළ මස් කොටස්වල රැඳී තිබුණු කෙස් සාම්පල තුනක්

වෙන වෙනම නඩු භාණ්ඩ ලෙස භාරයට ගෙන දේපල කුවිතාන්සි පත් 47/2019 ට 2019/04/22 දින ඇතුළත් කළ බව කියා සිටි සාක්ෂිකරු, එකී දේපල කුවිතාන්සිය පැ.1411 ලෙස සලකුණු කරන ලදී.

තවද බෝම්බකරු භාවිතා කළ බෑගය සහ ඔහු භාරයේ තිබූ බවට සැක කළ නිල් හා සුදු පැහැති කොටු සරම සහ සුදු බැනියම අඩංගු මුද්‍රා පාර්සලය, අංක 22 ලෙස සලකුණු කළ ලබාගත් ටොමී ජීන්ස් ලෙස සඳහන් නිල් පැහැති පොකට් සහිත දිග කලිසම, රෝද කැබලි කීපයක්, ෂිපර් කොටස්, සෙරෙප්පු කොටස්, යට ඇඳුම් කොටස් සහ පෝලෝ කින්ග් ලෙස සටහන් බෑග් කොටස් තමා භාරයට ගෙන එය දේපල කුවිතාන්සිය අංක 48/2019 ට 2019/04/22 වන දින ඇතුලත් කල බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1412 වශයෙන් සලකුණු කරන ලදී. එසේම අංක 18 ලෙස සලකුණු කළ ගලක් ඇල්ලූ කාන්තා මුදුවක් දේපල කුවිතාන්සි පත් PR49/2019 ට 2019/04/22 දින ඇතුලත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1413 වශයෙන් සලකුණු කරන ලදී. එසේම අංක 24 සලකුණු කළ ඩෙනිම් කලිසම, නිල් පැහැති කමිසය, සුදු පැහැති බැනියම හා කළු පැහැති යට කලිසම අඩංගු පාර්සලය දේපල කුවිතාන්සි පත් PR50/2019 ට ඇතුලත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1414 වශයෙන් සලකුණු කරන ලදී. තවද තමා විසින්, අංක 07 ලෙස සලකුණු කළ පිපිරුම සිදු වූ ස්ථානයේ සුන්බුන් අතර තිබූ අංක 02 කාමරයේ රැඳී සිටි පුද්ගලයාගේ බවට සැක කළ 5000 නෝට්ටු 04 ක්, 100

නෝට්ටුවක්, රු.20 නෝට්ටු 03 ක් අඩංගු මුද්‍රා තැබූ ලිපි කවරය දේපල කුවිතාන්සි පත් PR 51/2019 ඇතුලත් කළ බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1415 වශයෙන් සලකුණු කරන ලදී.

එසේම බෝම්බකරුගේ බවට සැක කළ අධිකරණයේදී හඳුනා ගැනීම සිදු කළ විදේශ ගමන් බලපත්‍ර 02 දේපල කුවිතාන්සි PR52 යටතේ ඇතුලත් කළ බව කියා සිටි සාක්ෂිකරු, එකී PR52/2019 ට අදාළ දේපල කුවිතාන්සිය පැ.1416 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

තවදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු බෝම්බකරුගේ බවට සැක කළ රියදුරු බලපත්‍රයේ තොරතුරු අඩංගු චිප් කොටස දේපල කුවිතාන්සි පත් PR 53/2019 ට ඇතුලත් කළ බව කියා සිටි සාක්ෂිකරු, එකී PR53/2019 ට අදාළ දේපල කුවිතාන්සිය පැ.1417 වශයෙන්ද, දේපල කුවිතාන්සි පත් PR 55/2019 යටතේ, අංක 23 ලෙස සලකුණු කළ බෝම්බකරුගේ කාමරයට යාබදව තිබූ අංක 05 සිට 192 දක්වාත් 193 සිට 290 දක්වාත් කොටස් දෙකකට වෙන් වී තිබූ අරාබි භාෂාව වැනි භාෂාවකින් තිබූ බවට නිරීක්ෂණය වූ ආගමික වත්පිළිවෙත් සඳහන් කුඩා පොත් කොටස් නඩු භාණ්ඩ ලෙස භාරයට ගත් බව කියා සිටි සාක්ෂිකරු. එකී PR55/2019 ට අදාළ දේපල කුවිතාන්සිය පැ.1418 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එසේම දේපල කුවිතාන්සි පත් PR 56/2019 යටතේ ඇතුළත් කළේ අංක 25 ලෙස තමා සලකුණු කළ සුන්බුන් අතර තිබූ යකඩ බෝල 46 ක් බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය_පැ.1419 වශයෙන් සලකුණු

කරන ලදී. එසේම තමා විසින්, පිපිරුනු ස්ථානයේ සුන්බුන් අතර තිබී හාරයට ගත් නිකල් පැහැති සංඝත බාර් කොටස් දෙකක් හා කුඩා වයර් කැබලි දෙකක් සහ යකඩ බෝල 117 ක් දේපල කුවිතාන්සි පත් PR58/2019 යටතේ 2019/04/23 දින ඉදිරිපත් බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සි පැ.1420 වශයෙන් සලකුණු කරන ලදී. තවද අංක 31 (A) ලෙස සලකුණු කළ පිපිරුම් ලක්ෂ්‍යය යැයි හඳුනා ගත් ස්ථානයෙන් ලබාගත් පස් සාම්පලයක් සහ 31 (B) ලෙස සලකුණු කළ පිපිරුම් ලක්ෂ්‍යයට 190 cm ක් පමණ දුරින් තමා විසින් 2019/04/24 වන දින ලබාගත් ආදර්ශ සාම්පලය නඩු භාණ්ඩ ලෙස දේපල කුවිතාන්සි පත් PR64/2019 යටතේ ඉදිරිපත් බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1421 වශයෙන් සලකුණු කරන ලද අතර, අංක 32 ලෙස සලකුණු කළ එම පිපිරුම් ස්ථානයේ සුන්බුන් අතර තිබූ විකෘති වූ තහඩු කැබලි, ස්ප්‍රින් කොටස් ආදිය සහ එම ස්ථානයෙන් සොයා ගන්නා ලද යකඩ බෝල 340 ක් දේපල කුවිතාන්සි පත් PR 65/2019 යටතේ 2019/04/24 වන දින ලේඛනගත කළ බව කියා සිටි සාක්ෂිකරු පැ.1422 වශයෙන් සලකුණු කරන ලදී. එසේම, පැ.159 වශයෙන් අධිකරණයේදී හඳුනාගත් පිපිරුම් ස්ථානයේ සුන්බුන් අතර තිබූ බෝම්බකරු වන අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයට අයත්, අංක B 2251472 දරන විජ් එක රහිත පහළ කොටස කැඩී ගිය, 2013/09/24 වන දින නිකුත් කරන ලද, රියදුරු බලපත්‍ර කොටස දේපල කුවිතාන්සි පත් PR 68/2019

යටතේ 2019/04/25 වන දින ඉදිරිපත් බව කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය_පැ.1423 වශයෙන් සලකුණු කරන ලදී.

එම පරීක්ෂණයේදී දින කීපයක් තුළ සිදු කළ කැනීම්වලදී සුන්බුන් අතර තිබී සොයාගත් යකඩ බෝල 1197 ක් දේපල කුවිතාන්සි පත් PR 72/2019 යටතේ 2019/05/01 වන දින ඇතුළත් කළ බවත් කියා සිටි සාක්ෂිකරු එම දේපල කුවිතාන්සිය පැ.1424 වශයෙන් සලකුණු කරන ලදී. මෙසේ සොයාගත් නඩු භාණ්ඩ වලින් කොටසක් ඉදිරි විමර්ශන සඳහා ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය වෙත ද, දෙහිවල පොලිස් ස්ථානය මඟින් ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයට භාර දීමට ද කටයුතු කළ බව කියා සිටි සාක්ෂිකරු රජයේ රස පරීක්ෂකවරයා විසින් පරීක්ෂාවෙන් පසු එවන ලද පාර්සලයේ අඩංගු PR56/2019 යටතේ අතුළත් කර තිබූ බයිසිකල් බෝල 46 හඳුනාගෙන පැ.1427 වශයෙන්ද, PR65/2019 යටතේ ඉදිරිපත් කළ බයිසිකල් බෝල 340ක ප්‍රමාණය ඇතුළත් බයිසිකල් බෝල ප්‍රමාණය පැ.1429 වශයෙන් ද, PR 58/2019 යටතේ ඇතුළත් කළ බයිසිකල් බෝල 117 පැ.1431 වශයෙන් ද, 2019.05.01 දින ඉදිරිපත් කරන ලද යකඩ බෝල 1197 පැ.1433 වශයෙන් ද, පිපිරුම් ස්ථානයෙන් ලබාගත් පස් සාම්පලය පැ.1435 වශයෙන් ද 31(B) යන ස්ථානයෙන් ලබාගත් පස් සාම්පලය 1437 වශයෙන් ද සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් සොයා ගත්තේ යැයි කියන PR48/2019 ට ඇතුළත් බෑගයක රෝද කොටස්, බෑගයක කම්බි, බෑගයක ෂිප් කොටස්, Polo king වශයෙන් සඳහන් කොටස් සහ බෑගයක අවශේෂ වූ සෙසු කොටස් පැ.1440 වශයෙන් සලකුණු කරන ලදී. මෙම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවකු විසින් හරස් ප්‍රශ්න විමසීමක් සිදු නොකරන ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් දෙහිවල ට්‍රොපිකල් ඉන් හි සිදු වූ බෝම්බ පිපිරීමට අදාළව බෝම්බය පුපුරවාගත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් යන අයගේ අනන්‍යතාවයත්, ඔහු විසින් පුපුරවා ගත් බෝම්බයේ ප්‍රබලතාවයත් එම බෝම්බය පිපිරුණු ස්ථානයෙන් සොයා ගන්නා ලද කොටස් මෙම නඩුවේ සිද්ධිමය කරුණුවලට අදාළ අනෙකුත් ස්ථානවලදී සොයාගෙන ඇති නඩු භාණ්ඩත් සමඟ කවර ආකාරයක සම්බන්ධතාවයක් පෙන්වන්නේ ද යන්න මෙම නඩුවේ සමස්ත සාක්ෂි තුළින් සළකා බැලීම සුදුසු වේ.

මෙම නඩුවේ සියලු චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් කරන ලද පොදු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 1400 අබ්දුල් ජබාර් මොහොමඩ් අනස්.

මෙම සාක්ෂිකරු අධිකරණයට සාක්ෂි ලබා දුන් අවස්ථාව වන විට උලපනේ ප්‍රදේශයෙහි පදිංචිව සිටින බවත් ඔහු ඉලෙක්ට්‍රිකල් සුපවයිසර් කෙනෙක් වශයෙන් රාජකාරි කරන බවත් පවසා ඇති අතර ඔහුගේ උපන් ප්‍රදේශය උලපනේ බව අධිකරණය ඉදිරියේදී පවසා ඇත. ඔහු 11 වසර දක්වා උලපනේ ඉක්‍රාම් මුස්ලිම් මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඉන් අනතුරුව උසස් අධ්‍යාපනය සඳහා බේරුවල නාලීමියා විද්‍යාලය වෙත ගිය බවත් පවසා ඇති අතර එසේම, ඔහුට සිංහල භාෂාව මනාව කතා කළ හැකි බවත් එසේම, ඔහුට සිංහල ලියන්න, කියවන්න පුළුවන් බවටත් පවසා ඇති අතර අධිකරණයට සාක්ෂිකරු සාක්ෂි ලබා දුන්නේද සිංහල භාෂාවෙන්ම වේ.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ ඔහුත් පාසලේ 10 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලැබූ කාලසීමාවෙන්ම ඔහු පාසල් සිසුවෙකු වශයෙන් සිටිමින් ඉස්ලාම් සම්බන්ධව පුළුල් අවබෝධයක් යොවුන් සමාජය අතර පැතිරවීම සඳහා කටයුතු කරන සංවිධානයක් වන ජමියා නැමැති සංවිධානයට බැඳුණු බවත් එය ශ්‍රී ලංකා ඉස්ලාමික් ස්ටුඩන්ට්ස් මූවිමන්ට්

එනම් ජමියාතුල් තලබා ඉස්ලාමියා යන නම සහිත ආයතනය සංවිධානයක් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමා බැඳුණේ එම සංවිධානයේ උලපනේ ප්‍රදේශයේ තිබුණ ශාඛාවට බවත් එම සංවිධානය මගින් ඉස්ලාමීය මූලධර්ම ගැන ඉගැන්වීම් සිදු කරන ලද බවත් එසේම, සමාජය තුළ ජීවත් වීමට අවශ්‍ය පුහුණුවද ඉස්ලාම් දහම පිළිබඳ දැනුම පුළුල් කර ගැනීමටද අවස්ථාව ලබා දුන් බවටත් පවසා ඇති අතර එම ජමියා සංවිධානයෙන් වරින් වර විවිධ වැඩසටහන් විවිධ ස්ථානවල පැවැත්වූ බවත් එලෙස තරුණ ප්‍රවර්ධන සංවර්ධන වැඩමුළුවකට තමා හෙම්මාතගම ප්‍රදේශයටද ගිය බවත් එය දින පහක නේවාසික පුහුණුවක් බවත් පවසා ඇති අතර එහිදී, ස්කිල් ඩිවලොප්මන්ට් වැඩ කටයුතු සහ ඇටිවූඩ් ඩිවලොප්මන්ට් කටයුතු සිදු කළ බවත් එසේම, උසස් පෙළ අධ්‍යාපනය කිරීමෙන් අනතුරුව කුමන විෂය ධාරාවකට එනම් උසස් පෙළ හැදෑරීමේදී කුමන විෂය ධාරාවක අධ්‍යාපන කටයුතු හැදෑරීම කළ හැකිද යන්න සම්බන්ධයෙන්ද එම පුහුණු සැසිවාරවලදී මග පෙන්වීම් සිදු කරන ලද බවටත් පවසා ඇත.

තමා 2011 වසරේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එලෙස හෙම්මාතගම ප්‍රදේශයේ පැවැති වැඩමුළුවෙන් අනතුරුව තමා බේරුවල සහ රටේ වෙනත් ස්ථානවලද තිබුණු වැඩමුළුවලට සහභාගී වීමට සිදු කළ ලද බවත් එලෙස දින 20ක

පුහුණු වැඩමුළුවලටත් තමා සහභාගී වුණ බවත් පවසා ඇත. එම වැඩමුළුවලදී දේශකයන් ලෙස කටයුතු කළේ ශ්‍රී ලංකා ඉස්ලාම් ශිෂ්‍ය ව්‍යාපාරයෙහි ඉහළ මට්ටමේ සිටින සහෝදරයන් විසින් බවත් එසේම, එම සංවිධානයෙහි එනම් ශ්‍රී ලංකා ඉස්ලාමික් ඉස්ලාම් ශිෂ්‍ය ව්‍යාපාරයෙහි මව් සංවිධානය වන ජමාත් ඉස්ලාම් සංවිධානයේ මව්ලවිවරුන් මෙන්ම දායකයන් ලෙස අදාළ වැඩසටහන්වලට සහභාගී වීමට පැමිණි බවත් පවසා ඇත. එසේම, තමා සහභාගී වූ වැඩමුළුවලින් දින පහේ වැඩමුළු බොහෝ දුරට නුවර ආශ්‍රිතව පැවතුණ බවත් නුවර ආශ්‍රිතව පදිංචි ළමුන් පැමිණි බවත් පවසා ඇති අතර කෙසේ වෙතත් අදාළ සංවිධානය මගින් සිදු කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා ලංකාව පුරාම සෑම ප්‍රදේශවලින්ම ළමුන් පැමිණ නේවාසිකව සහභාගී වුණ බවත් පවසා ඇත.

තමා 2014 වසර වනතුරු මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන ශිරාන් නැමැත්තාව තමා එම වැඩමුළුවලදී හඳුනාගෙන ආශ්‍රය කිරීම කළ බවත් ඊට අමතරව පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචි තැනැත්තෙක් වන ෆයාස් නැමැත්තාද තමා එලෙසම දීර්ඝ කාලයක් ආශ්‍රය කළ බවත් එසේම, ඉස්ලාම් ශිෂ්‍ය ව්‍යාපාරයේ උසස් මට්ටමේ කටයුතු කළ අය ලෙස තමා මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි සාදික් සහෝදරයාට, සාහිත් සහෝදරයාට, එසේම, හම්දි නැමැති තැනැත්තාද, හුස්නි නැමැත්තාද, එසේම, ශිෂ්‍ය සංවිධානයේ මුලින්ම කටයුතු කරන ලද සජීර් නැමැත්තාද තමා එලෙස

ආශ්‍රය කරන ලද අය බවත් පවසා තමා විසින් සඳහන් කරන ලද සාදික් සහ සාහිත් යන පුද්ගලයන් දෙදෙනා එකිනෙකා සහෝදරයින් බවත් සාක්ෂිකරු පවසා ඇත.

පසුව තමා බේරුවල නාලීමියා උසස් අධ්‍යාපන ආයතනයට ගොස් අධ්‍යාපනය හැදෑරූ බවත් එහි අධ්‍යාපනය ලබා ගැනීමෙන් පසු එහි අවසාන විභාගයෙහි විෂයන් හයක් පමණ තමාට අවසන් කිරීමට නොහැකි වූ බවත් ඒ සඳහා එම විෂයන් සිදු කිරීමට තමාට යළි අවස්ථාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටියද තමාට එම නාලීමියා උසස් අධ්‍යාපන ආයතනයෙන් නිසි පිළිතුරක් ලැබුණේ නැති බවත් ඒ නිසාම තමා එයින් ඉවත් වී තමාගේ වෘත්තීමය පැත්ත වන විදුලි කාර්මික අංශයට යොමු වුණ බවටත් පවසා ඇත. සාක්ෂිකරු පවසා ඇත්තේ තමා සාදික් සහ සාහිත් යන සහෝදරයන් දෙදෙනා දීර්ඝ කාලයක් ආශ්‍රය කළ බවත් මාවනැල්ල බුද්ධ ප්‍රතිමා කැඩීමේ සිද්ධිය සිදුවනතුරුම ඔවුන් සමඟ තමාට සම්බන්ධතා තිබුණ බවත් පවසා ඇත. එසේම, මාවනැල්ල බුදු පිළිම කැඩීමේ සිද්ධිය සිදුවුණේ 2018 දෙසැම්බර් වසරේ බවත් තමාට එම සහෝදරයන් දෙදෙනා සමඟ 2014 වසරෙන් පසුව 2018 වනතුරුම සම්බන්ධකම් පැවතුණ බවත් ශිෂ්‍ය ව්‍යාපාරය හරහාද සම්බන්ධකම් පැවතුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

එලෙස පවසා සාක්ෂිකරු විවෘත අධිකරණයේ අසුන් ගෙන සිටි මෙම නඩුවේ 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයව

අධිකරණයේදී පෙන්වා හඳුනාගෙන ඇති අතර එසේම, ඔහුගේ සහෝදරයා ලෙසට මෙම නඩුවේ 5 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාහිත් අබ්දුල් හක් යන චූදිතවද සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇත. එසේම, ඔවුන් දෙදෙනාගේ පියාද තමා හඳුනන බවත් එම තැනැත්තාව ඉබ්‍රාහිම් මවුලවී යනුවෙන් හඳුනන බවත් පවසා විවෘත අධිකරණයේ සිටි මෙම නඩුවේ 14 වන චූදිත වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් යන චූදිතවද සාක්ෂිකරු විසින් පෙන්වා හඳුනාගෙන ඇත. එසේම, තමා විසින් හඳුනාගත් 04 වන, 05 වන සහ 14 වන චූදිතයින් මාවනැල්ලේ දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචි අය බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, සාක්ෂිකරු පවසා ඇත්තේ තමා 2018 වසරේ සාදික් සහෝදරයා සමඟ එනම් මෙම නඩුවේ 04 වන චූදිත සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම හේතුවෙන් තමාව ශිෂ්‍ය සංවිධානයෙන් එළියට දැම්ම බවත් ඊට හේතුව ලෙසට 04 වන චූදිත විසින් චූදිතගේ දැඩි මතයම තමාද දැරූ නිසා එලෙස තමාව ශිෂ්‍ය සංවිධානයෙන් ඉවත් කළ බවත් තමා පැවසූ දැඩි මතය වන්නේ ඉස්ලාම් මූලධර්මවාදය බවත් ඒ අනුව ඉස්ලාම් මූලධර්මවාදයට ඉතා සමීප අදහස් දැරූ නිසා තමාව සංවිධානයෙන්ද ඉවත් කළ බවටත් පවසා ඇත.

එසේම, සාක්ෂිකරු පවසා ඇත්තේ ඉස්ලාම් ආගම සහ මුස්ලිම් සමාජයට එරෙහිව සිදුවන ක්‍රියාකාරකම් ඒ වගේම තිබෙන ආකල්ප තුරන්

කර ගැනීම සඳහා ආයුධ පවා භාවිතා කරමින් ආරක්ෂා කිරීමට ක්‍රමයක් සකස් කිරීමට තරම් තමාලාගේ මතය තමාලා පුළුල් කරගත් බවත් එසේම, තමා එලෙස ආයුධ භාවිතා කරන තැන දක්වාම සකස් වුණා යැයි අදහස් කරන ලද්දේ ආයුධයක් භාවිතා කර ඉස්ලාම් ධර්මයට විරුද්ධ වන අයට එරෙහිව ආයුධ භාවිතා කර ඔවුන් මරා දැමීමට කටයුතු කිරීමේ තරම් මතයක් දැරූ බවටත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, 2018 වසරේ එලෙස එවැනි මත දැරීම සම්බන්ධයෙන් තමාව ජමියා සංවිධානයෙන් ඉවත් කරන ලද බවත් 04 වන සහ 05 වන චූදිතයන් දෙදෙනා තමාට ප්‍රථමයෙන්ම එම සංවිධානයෙන් අයින් කර තිබූ බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමා මෙම නඩුවේදී හඳුනාගත් 04 වන සහ 05 වන චූදිත වන සාදික් සහ සාහිත් යන අය සමඟ පුත්තලම ප්‍රදේශයේ එළුවන්කුලම ප්‍රදේශයේ අලිවාඩිය නැමැති ප්‍රදේශයේ පුහුණුවීම් දෙකකට පමණ සහභාගී වුණ බවත් එම පුහුණුවීම්වලදී මුස්ලිම් තරුණයන් විදිහට තමාලාට ඇති වන ගැටලු සම්බන්ධයෙන් සහ එසේම, තමා ඒ ගැටලුවලට මුහුණ දීම සඳහා තමාලාගේ මානසික තත්ත්වය සාදා ගැනීම සඳහා සහ ශාරීරික ක්‍රියාකාරකම් සිදු කිරීම ආදිය ද මෙම පුහුණු වැඩමුළුවලදී සිදු වුණ බවත් තමා මුලින්ම එවැනි වැඩමුළු සඳහා සහභාගී වුණේ 2016, 2017 වසරවල බවත් තමා එම වැඩමුළු පැවැති ස්ථානයට තමාව එකඟ කර ගෙන ගියේ මෙම නඩුවේ 4 වන චූදිත වන සාදික් නැමැත්තා විසින් බවත් එම වැඩමුළුව සඳහා 15ක් හෝ 20 දෙනෙක් පමණ ගිය බව තමාට මතක බවත්

තමාලා වෑන් රථයකින් සහ ත්‍රීරෝද රථයකින් ගිය බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එලෙස තමා වැඩසටහන් පුහුණු වැඩමුළු දෙකකට සහභාගී වුණ බවත් එකී වැඩමුළු සඳහා මාවනැල්ල හම්දි සහ හුස්නි යන අයද, ගෙලිඔය ප්‍රදේශයේ ෆයාස් නැමැත්තාද, එසේම, අහ්සන් නැමැත්තාද, අලි යනුවෙන් සඳහන් කරන තැනැත්තාද, ගම්පොළ ප්‍රදේශයේ සිටින හනාන් නැමැත්තාද, පොළොන්නරුවේ ෆයාස් සහ රූමි යන අයද නම් වශයෙන් තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එකී වැඩමුළු සංවිධානය කරන ලද්දේ 04 වන චූදිත වන සාදික් සහෝදරයා විසින් බවද සාක්ෂිකරු පවසා ඇත. එසේම, මෙම සාක්ෂිකරු වැඩදුරටත් පවසා ඇත්තේ එළුවන්කුලම අලිවාඩිය ප්‍රදේශයේ තිබුණු වැඩමුළුව සඳහා 04 වන චූදිත පමණක් නොව 05 වන චූදිත වන සාහිත් නැමැත්තාද සහභාගී වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එම පුහුණුවලදී තමාලා ශාරීරික ක්‍රියාකාරකම් රාශියක් පුහුණු වුණ බවත් පවසා ඇති අතර එසේම, එම පුහුණුවීම් පැවතුණේ තමාලා කැම්පින් එකක් වගේ ස්ථානයක එලෙස එම පුහුණුවීම් කටයුතු කළ බවත් එය ගහක් යාබද කැලෑ ප්‍රදේශයක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, එම ප්‍රදේශයේ එනම් එළුවන්කුලම අලිවාඩිය ප්‍රදේශයේ පුහුණුවීම් පමණක් නොව තමාලා නුවරඑළිය සහ හම්බන්තොට ප්‍රදේශවලද එසේම, තෝපූර් ප්‍රදේශයේ සහ බේරුවල ප්‍රදේශයේද එවැනි ආකාරයේ පුහුණු වැඩමුළු සඳහා සහභාගී වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ තමාගේ මතකයේ හැටියට 2016 පමණ තමා 04 වන චූදිත

සමඟ බේරුවල ප්‍රදේශයට ගොස් සිටි බවත් ඉන්පසු බේරුවල ප්‍රදේශයේ සිට නැවත තමාලා මාවනැල්ල ප්‍රදේශයට පැමිණි බවත් බේරුවල ප්‍රදේශයේදී එනම් 04 වන චූදිත සමඟ බේරුවල ප්‍රදේශයට ගොස් බේරුවල ප්‍රදේශයේ පදිංචි තැනැත්තෙකුගේ නිවසට ගොස් එම තැනැත්තාව මුණ ගැසීම සිදු කරන ලද බවත් බේරුවල ප්‍රදේශයෙන් පදිංචි එම තැනැත්තාට 04 වන චූදිත විසින් කතා කළේ අහමඩ් යන නමින් බවත් ඒ තමාලා ඔහුගෙන් වෙනත් විස්තර අහන්න ගියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එලෙස තමා සහ 04 වන චූදිත පමණක් නොව මාවනැල්ල පදිංචි ශිරාන් නැමැත්තාද, ගම්පොළ පදිංචි හනාන් නැමැත්තාද, එසේම, මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි හම්දි නැමැත්තාද තමාලා සමඟ එලෙස බේරුවල ප්‍රදේශයට ගිය 04 වන චූදිත සමඟ ගිය බවට සාක්ෂිකරු පවසා ඇත. බේරුවල ප්‍රදේශයේදී 04 වන චූදිත විසින් අහමඩ් යනුවෙන් සඳහන් කතා කළ තැනැත්තාගෙන් තමාලා විස්තර කිසිවක් ඇසීමට ගියේ නැති බවත් තමාලාට මෙවැනි වැඩමුළුවලදී කිසිවෙකුගේ පෞද්ගලික විස්තර තමා සාමාන්‍යයෙන් තමාලා අහන්නේ නැති බවත් ඒක තමාලාගේ සංවිධානයෙහි ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කරන ලද ක්‍රියාවක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, සාක්ෂිකරු පවසා ඇත්තේ පසුකාලීන විමර්ශන තුළින් තමාට දැනගන්න ලැබුණේ ඒ බේරුවල සිටි අහමඩ් නැමැත්තාගේ සම්පූර්ණ නම අහමඩ් තාලිෆ් ලුක්මාන් බවත් එම අහමඩ් තාලිෆ් ලුක්මාන් නැමැත්තා අවුරුදු 25ක් පමණ තැනැත්තෙකු බවත්

එම තැනැත්තා ශ්‍රී ලාංකික ද යන්න සම්බන්ධයෙන් තමාට කියන්නට අපහසු බවත් ඔහු බොහෝදුරට භාවිතා කළේ ඉංග්‍රීසි හා අරාබි භාෂාවන් බවත් තමාලා එම තැනැත්තා සමඟ පැය දෙකක් පමණ සාකච්ඡා කළ බවත් එහිදී සාකච්ඡා කරන ලද කරුණු වන්නේ, තමාලාගේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එසේම, ඉස්ලාම් ආගම සම්බන්ධයෙන් සහ එලෙස සාකච්ඡා කරන ලද බවත් එලෙස සාකච්ඡා අවසානයේදී තමාලා ජිහාදය ගැනත් කතා කළ බවත් එය ජාත්‍යන්තර වශයෙන් සහ විශ්වමය වශයෙන් තිබෙන සංකල්පයක් බවට තමාලා එලෙස කතා කළ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඒ වන විට තමාගේ වයස අවුරුදු 20ක් වී තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ තමා ගෝලීය මෙන්ම ජාත්‍යන්තර මානඃකාවක් වන ජිහාදය ගැන කතා කළ බවත් එම ජිහාදය මගින් මුස්ලිම් ක්‍රියාකාරකම්වලට එනම් ඉස්ලාම් හා මුස්ලිම් සමාජයට එරෙහිව සිදුවන ක්‍රියාකාරකම්වලට ප්‍රතික්‍රියා කිරීම සඳහා ආයුධ භාවිතා කරමින් මුස්ලිම් සමාජය සහ ඉස්ලාම් ආගම රැක ගැනීමට කටයුතු කිරීම ජිහාද් ලෙස හඳුන්වන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එනම් ඉස්ලාම් හා මුස්ලිම් සමාජයට විරුද්ධ වන අයට අවි ආයුධවලින් පහර දීමක් සිදු කිරීමට තමාලා සාකච්ඡා කළ බවත් සාක්ෂිකරු පවසා ඇත. එදින තමා එම ස්ථානයේ සිට යළි මාවනැල්ල ප්‍රදේශයට පිටවී ගියේ නැති බවත් ඊට පසු දින තමාට නාලීමියා උසස් ආයතනයෙහි අධ්‍යාපන කටයුතු තිබුණ නිසා

තමා එදින එහි සිට පාන්දරම තමා බේරුවල එම නිවසේ සිට පිටවී ගිය බවත් එනම් පෙර දින රාත්‍රී තමා ගත කළේ අහමඩ් තාලිෆ් ලුක්මාන් නැමැති තැනැත්තාගේ බේරුවල තිබූ නිවසේ බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරු ඔහු විසින් ඔහු සහභාගී වූ සාකච්ඡාවේදී 04 වන චූදිතව ඇතුළු කණ්ඩායම් විසින් සාකච්ඡා කරන ලද කරුණු අතරින් සාක්ෂිකරු පවසා ඇත්තේ ගෝලීය මුස්ලිම්වරුන්ව ආරක්ෂා කිරීම සඳහා සහ ඉස්ලාම් දහම ආරක්ෂා කිරීම සඳහා අවි ආයුධ රැගෙන කණ්ඩායමක් සෑම විටම යුද්ධ කරමින් සිටින බවත් ඒ වගේම එවැනි කණ්ඩායමක් ලෝකයේ සෑම රටකම බිහි විය යුතු බවත් ලංකාව තුළත් එවැනි කණ්ඩායමක් බිහි විය යුතු යන මතය සඳහන් කළ තාලිෆ් අහමඩ් තාලිෆ් ලුක්මාන් විසින් දැරූ මතය බවත් ඒ ගැන ඔහු එම තැනැත්තා කතා කළ බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු තමා සාක්ෂියේදී වැඩිදුරටත් පවසා ඇත්තේ මෙම නඩුවේ 04 වන චූදිත වන සාදික් නැමැත්තා 2014 වසරෙන් පසුව අවුරුද්දක පමණ කාලයක් සඳහා තුර්කිය බලා පිටත් වීමට කටයුතු කළ බවත් පවසා ඇත. එසේම, 04 වන චූදිත තුර්කියට ගියේ තමා බේරුවල නාලීමියා උසස් අධ්‍යාපන ආයතනයේ ඉගෙන ගනිමින් සිටි කාලයේ බවට තමාට යම් මතකයක් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු පවසා ඇත්තේ මෙම නඩුවේ 04 වන චූදිත වන සාදික් සහ 5 වන චූදිත වන සාහිත් යන අය සමඟ තමාද 2016, 2017 වසරවල තෝප්පූර්

නැමැති ප්‍රදේශයට ගිය බවත් එය නැගෙනහිර ප්‍රදේශයේ තිබෙන බවට තමාට යම් දැනීමක් තිබුණ බවත් එලෙස එම තෝප්පූර් ප්‍රදේශයට ගිය අය අතරින් තමාට මතක තිබෙන්නේ 04 වන චූදිත සාදික් සහ 5 වන චූදිත සාහිත් එසේම, ෆවුසාන් නැමැත්තෙක්ද එලෙස ගිය බවත් පවසා ඇති අතර, තමාලා ඒ සඳහා පිටත් ව ගියේ මාවනැල්ල ප්‍රදේශයේ සිට වෑන් රථයකින් බවත් සාක්ෂිකරු පවසා ඇත. එලෙස තමාලා ගමන් කරන ලද වෑන් රථය කුලියට ගත් වෑන් රථයක් බවත් එම වෑන් රථයෙහි තමාලා 5 දෙනෙක් හෝ 6 දෙනෙක් ගමන් කළ බවත් තමාලා එලෙස තෝප්පූර් ප්‍රදේශයට ගොස් පොඩි වාඩියක් වැනි ස්ථානයකට එනම් වාඩියකට ගිය බවත් එය ෆාම් හවුස් එකක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එනම් අවට ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සිදු කරමින් තිබූ ප්‍රදේශයක් බවත් ඒ ස්ථානයේ ආසන්නයේම ගෙවල් තිබුණේ නැති බවත් දුරින් දුරට තරමක් ඈතින් ගෙවල් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එහිදී තමා එම ස්ථානයට යනතුරුත් තමාලා කුමක් සඳහා එම ස්ථානයට යනවාද යන්න සම්බන්ධයෙන් තමාට පැහැදිලිතාවයක් තිබුණේ නැති බවත් කෙසේ වෙතත් එහි ගිය පසු ටී 56 අවියක් අත්හදා බැලීමක් සිදු කිරීම කරන ලද බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාලා එම වාඩියේ එක රැයක් පමණක් සිටි බව තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා පැවසූ එම ටී 56 ගිනි අවිය තමාලා මාවනැල්ල ප්‍රදේශයේ සිට යන විට රැගෙන ගිය ටී 56 ආදියක් නොවන බවත් තමාලා එම ප්‍රදේශයට එම තෝප්පූර්වල එම

ස්ථානයට යන විටත් ගිය පසු එහි එම ස්ථානයට තවත් දෙදෙනෙකු පැමිණ එම ටී 56 ගිනි අවිය ගොවිතැන් කිරීම සඳහා භාවිතා කරන බඩු මුට්ටු අතර තබාගෙන රැගෙන විත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් ගෙනවිත් භාර දී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම නඩුවේ 04 වන චූදිත වන සාදික් විසින් එම ටී 56 සම්පූර්ණයෙන් ගලවලා නැවත සකස් කිරීමට තමාලාට කියා දුන් බවත් ඒ අනුව තමාද එම ටී 56 ගලවා අත්හදා බැලූ බවත් කෙසේ වෙතත් එම ස්ථානයේදී තමාලා එම ටී 56 අවිය ගලවා අත්හදා බැලීම් සිදු කළද, එම ස්ථානයේදී වෙඩි තැබීම් කටයුත්තක් අත්හදා බැලීම කළේ නැති බවත් පවසා ඇත.

එසේම, එම අවස්ථාවේදී තමාලා සමඟ ගිය 05 වන චූදිත කුමක් කළාද යන්න තමාට මතක නැති බවත් මෙවැනි වැඩසටහන් සඳහා යන විට අනිත් අය සිදු කරන දේවල් දිහා බලාගෙන ඉඳීම තමන්ලා සිදු කරන්නේ නැති බවත් තමන්ලාගේ ක්‍රියාවන් තමන්ලා කරගෙන යන බවත් ඒ අනුව තමාට මතක තිබෙන්නේ තමා සිදු කරන ලද දේවල් පමණක් බවත් සාක්ෂිකරු පවසා ඇත. එලෙස ටී 56 අවියක් ගලවා සවි කර අත්හදා බැලීම තමාගේ ජීවිතයේ පළමු වතාවට සිදු වූ එදින සිදු කළ බවත් එලෙස ටී 56 ගලවා නැවත සකස් කිරීම 04 වන චූදිත විසින් තමාලාට පුහුණු කිරීම කළේ අවශ්‍ය වුවහොත් භාවිතා කිරීම සඳහා බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම ටී 56 ගලවා යළි සවි කිරීම පුහුණුවීම් සිදු කළේ එහිදී රාත්‍රී කාලයේ

බවත් තමාලා සිටි වාඩියට එම අවස්ථාවේදී විදුලිබල සම්බන්ධතාවයද තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ තමා එලෙස එම ස්ථානයට ටී 56 තුවක්කුවද සමඟ බඩු පාර්සලය එම වාඩියට ගෙනවිත් දුන් තැනැත්තා තමා දුටු බවත් එම තැනැත්තා වයසක කෙනෙක් බවත් තමාට එම තැනැත්තා කවුද යන්න හරියට මතක නැති බවත් සාක්ෂිකරු තමා සාක්ෂියේදී පවසා ඇති අතර එලෙස තමා එම පුහුණුවීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ඊට පසු දින තමාලා තෝප්පූර් ප්‍රදේශයේ සිට යළි මාවනැල්ල ප්‍රදේශයට පැමිණි බවටත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි ලබා දෙමින් 2018 වසරේ අප්‍රේල් හෝ මැයි මාසයේ තමාලාව නුවරඑළිය ප්‍රදේශයට රැගෙන ගිය බවත් එලෙස තමාලාගේ නුවරඑළිය ප්‍රදේශයට ගියේ මාවනැල්ල ප්‍රදේශයේ සිට වෑන් රථ දෙකකින් බවත් එයින් එකක් මුත්ති නැමැත්තාගේ වාහනයක් බවත් අනිත් වෑන් එක කුලියට ගත් එකක් බවත් එක වෑන් රථයක් එනම් මුත්ති නැමැත්තාගේ වෑන් රථය ඔහු විසින්ම පදවාගෙන ගිය බවත් අනිත් කුලියට ගත් වෑන් රථය මාවනැල්ල ප්‍රදේශයේදී හම්දි නැමැති පුද්ගලයා විසින් පදවාගෙන ගිය බවට තමාට මතක බවත් කෙසේ වෙතත් එම වාහනය එලවාගෙන ගියේ කවුද යන්න තමාට මතක නැති බවත් පවසා ඇත. නුවරඑළියෙහි එම ගිය ප්‍රදේශය ගැන තමා මුලින් හරියටම දැනගෙන සිටියේ නැති වුවද පසුව එය ශාන්තිපුර ප්‍රදේශයේ බවට තමා දැනගත් බවත් එය සාමාන්‍යයෙන් නවාතැන් ගැනීමට

භාවිතා කරන ගෙස්ට් හවුස් එකක් බවත් එය දෙමහල් ගෙස්ට් හවුස් එකක් බවත් එහි තමාලා යන විටත් තමා විසින් නම් නොදන්නා තමා නොදන්නා තවත් පිරිසක්ද එහි සිටි බවත් තමාලා සමඟ එහි මෙම නඩුවේ 04 වන සහ 05 වන චූදිතයන් සිටි බවත් එසේම, ගෙලි ඔය ප්‍රදේශයේ පදිංචි අහ්සන් නැමැත්තාද, අලි නැමැත්තාද, එසේම, ගම්පොළ ප්‍රදේශයේ පදිංචි හනාන් නැමැත්තාද, එසේම, ගෙලි ඔය ප්‍රදේශයේ පදිංචි ෆයාස් සහ සෙයිෆුල්ලා නැමැති අයද එම එහි සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා විසින් සඳහන් කරන ලද අනෙකුත් පුද්ගලයන් එනම් 04 වන සහ 05 වන චූදිතයන් හැර අනෙකුත් පුද්ගලයන් තමා සමඟ ශිෂ්‍ය සංවිධානයේ එකට කටයුතු කළ අය බවටත් සාක්ෂිකරු පවසා ඇත. එලෙස තමාලා නුවරඑළිය ශාන්තිපුර පිහිටි නවාතැන්පොළේ රාත්‍රී දෙකක් ගත කළ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාලා ඒ යන විටත් පුද්ගලයන් 8ක් හෝ 10ක් පමණද පැමිණ සිටි බවත් කෙසේ වුවත් තමාලා ගිය වැන් දෙකේම ගිය කණ්ඩායමේ එකතුව සාමාන්‍යයෙන් 20කට 25කට ආසන්න කණ්ඩායමක් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමා ඇතුළු කණ්ඩායම ඒ ගිය අවස්ථාවේදී එම කණ්ඩායමේ සිටි අය කතා කළේ අබු යන නමින් බවත් එහි අබු මුහාරිබ් යනුවෙන් හඳුන්වන සහරාන් නැමැත්තා සිටි බවත් එහිදී අබු සෙයිදි යනුවෙන් නව්ෆර් මවුලවී නැමැත්තාව හැඳින්වූ බවත් අබු සිලා යනුවෙන් මිල්හාන් නැමැත්තාව හැඳින්වූ බවත් අබු කිතාල් යනුවෙන් හැඳින්වූයේ රිල්වාන් නැමැත්තාව බවත් එසේම, අබු මොහොමඩ් යනුවෙන් හස්තූන්

යන අයව හැඳින්වූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා එම එම අයගේ ඇත්ත නම් දැනගත්තේ විමර්ශනයෙන් බවත් එසේම, එහි අබු හිනා යනුවෙන් තැනැත්තෙකුද සිටි බවත් එහි අබු හිනා නැමැත්තෙක්ද එම කණ්ඩායමේ සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අබු හදීත් යනුවෙන් හැඳින්වූ ගපූර් අන්කල් යැයි පවසන තැනැත්තාද එහි සිටි බවත් අනෙක් අය ගැන තමාට මතකයක් හරියට නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාලා මාවනැල්ල ප්‍රදේශයේ සිට නුවරඑළියේ ශාන්තිපුර නිවසට යන විට වේලාව රාත්‍රී 9 . 10 පමණ වුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, තමාලා යන විටත් කලින් පැමිණ සිටි කණ්ඩායම එනම් අබු යන නම්වලින් හැඳින්වූ කණ්ඩායම ඒ වන විටත් පැමිණ සිටි බවත් ඔවුන් එම කණ්ඩායම තමාලා සිටි කාලය පුරාවටම එම නිවසේ රැඳී සිටි බවත් එසේම, එහි සිටි අබු සෙයිදි යන නමින් හැඳින්වූ තැනැත්තා නව්ෆර් මවුලවී යනුවෙන් තමා දැනගත් බවත් එම තැනැත්තා සම්බන්ධයෙන් තමා නුවරඑළියට යාමටත් ප්‍රථමයෙන්ම දැනුවත්ව සිටි බවත් එම තැනැත්තා ෆේස්බුක් හරහාද ගොඩක් ප්‍රසිද්ධ වෙලා සිටි තැනැත්තෙකු බවත් කෙසේ වෙතත් තමා ඔහු සමඟ ෆේස්බුක් එකෙන් සම්බන්ධ වී සිටියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම අබු සෙයිදි නැමැත්තා හැමෝම හඳුන්වන්නේ මවුලවී කෙනෙක් විදිහට බව පවසා තමාට එම පුද්ගලයා හඳුනාගත හැකි බව පවසා විවෘත අධිකරණයේ සිටි මෙම නඩුවේ 1 වන

චූදිත ලෙස සිටින නව්ෆර් මවුලවී නැමැත්තාවද මෙම සාක්ෂිකරු විසින් අධිකරණයේදී පෙන්වා හඳුනාගෙන ඇත. එසේම, නුවරඑළියේදී තමා හඳුනාගත් අබු සිලා නැමැත්තාව මේ වන විට තමාට අධිකරණයේදී හඳුනා ගැනීමට අපහසු බවත් එදින නුවරඑළියේ දුටු ආකාරයෙන් නොව දැන් ගොඩක් අයගේ බාහිර පෙනුම වෙනස් වෙලා තිබෙන බවත් ඒ අනුව තමාට අධිකරණයේදී එම තැනැත්තා හඳුනා ගැනීමේ අපහසුතාවයක් තිබුණ බවත් කෙසේ වෙතත් එම තැනැත්තාගේ නම මිල්හාන් යැයි තමා දැනගත් බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, නුවරඑළියේ ශාන්තිපුර නිවාඩු නිකේතනයේදී තමාට හමු වූ අබු මුහාරිබ් එසේත් නැතිනම් සහරාන් නැමැති තැනැත්තාද මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙස මැරුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ අබු යන වචනයෙන් අර්ථවත් කරන්නේ තාත්තා යන වචනය බවත් නමුත් සංවිධානය තුළ එනම් තමා පවසන සංවිධානයෙහි සාමාජිකත්වය ලබා ගත් පසු ලැබෙන අබු නාමයක් බවටත් පවසා ඇති අතර තමා පවසන එම සංවිධානය අයිඑස් අයිඑස් සංවිධානය බවත් තමා පැවසූ අයිඑස් අයිඑස් සංවිධානය යනු ඉස්ලාමික් ස්ටේට් ෆෝ ඉරාක් ඇන්ඩ් ෂාම් බවත් එහි අදහස ඉරාක් සහ ෂාම් ප්‍රදේශයේ රාජ්‍ය බවත් තමාට භූගෝල විද්‍යාත්මකව ෂාම් ප්‍රදේශය යනු කුමක්ද යන්න හරියටම පැවසීමට බැරි බවත් එම ෂාම් යන වචනය මේ වන විට බොහෝ දුරට

භාවිතා වෙන්නේ නැති බවත් තමා සිතන පරිදි එයට ඉරානය සහ තුර්කිය ප්‍රදේශයද ආවරණය වන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, මෙම වැඩමුළුවලට සහභාගී වෙච්ච පුද්ගලයෙකු ලෙස තමාට පැවසීමට හැක්කේ එම සංවිධානය පිහිටුවා ගැනීමේ අරමුණ සම්පූර්ණයෙන්ම ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවා ඉස්ලාම් ලෝ ඇන්ඩ් ඕඩර් (Islam Law and Order) එකක් පිහිටුවීම බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ එලෙස නුවරඑළිය ශාන්තිපුර නිවාඩු නිකේතනයේ දළ වශයෙන් 30කට ආසන්න ප්‍රමාණයක් එලෙස එම වැඩමුළුවට සහභාගී වී සිටි බවත් එලෙස 30කට ආසන්න ප්‍රමාණයක් එම නිවසේ රාත්‍රී නැවතී සිටි බවත් එහි කාමර 4ක් හෝ 5ක් තිබුණ බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම ශාන්තිපුර නිවසේ පැවැති වැඩමුළුව උදේ පාන්දර 4ට පමණ ඇහැරිලා තමාලා ආගම නැමදීමේ චාරිත්‍ර සිදු කිරීමෙන් අනතුරුව වැඩසටහන් පටන් ගත් බවත් එය යම් වැඩසටහනකට අනුව ෂෙඩියුල් එකකට අනුව පැවතුණ වැඩසටහනක් බවත් තමාලා නුවරඑළියේ ශාන්තිපුර නිවසේ සිටි පළමු දිනේදී බොහෝදුරට ඉස්ලාමීය මූලික ධර්මයන් ආගමික විශ්වාසයන් ගැන කරුණු සාකච්ඡා කළ බවත් එසේම, තමාලාගේ ආත්මීය පැත්ත හදා ගන්න තමාලාට මග පෙන්වීම් සිදු කිරීම පළමු දවසේ සිදු වුණ බවත් එම දේශනය නව්ෆර් මවුලවී ඇතුළු තමාලා යන විටත් එම එහි කලින්ම පැමිණ සිටි කණ්ඩායම් විසින් සිදු

කරන ලද බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, පළමු දවසේ සවස් වරුව වනතුරුම එනම් ඉස්ලාම් ධර්මයේ මූලික මූලධර්මයන් සහ ආගමික විශ්වාසයන් ගැන කතා කළ බවත් එදින සවස් වරුවෙන් පසුව ජිහාදය සම්බන්ධයෙන් කතා කරන්න පටන් ගත් බවත් එම ජිහාදය සම්බන්ධයෙන් කතා කළේ අබු මුහාරිබ් ලෙස හැඳින්වූ සහරාන් සහ අබු සෙයිදි ලෙස සඳහන් කරන ලද මෙම නඩුවේ 01 වන චූදිත විසින් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම දේශනාවන් සිදු කළේ තමාලා සමඟ මාතලෙන් ගිය කණ්ඩායමට බවත් තමාලා එම ශාන්තිපුර නිවාසයට ගිය පසු වෙනත් කට්ටිය එම ස්ථානයට ආවේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මාවනැල්ල සිට එලෙස තමාලා සමඟ නුවරඑළියේ ශාන්තිපුර නිවාඩු නිකේතනයට යාමට ගිය අය අවුරුදු 20ත් 30ත් අතර තරුණ වයසේ අය බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ මෙම සහරාන් නොහොත් අබු මුහාරිබ් සහ මෙම නඩුවේ 01 වන චූදිත විසින් සාකච්ඡා කරන ලද ජිහාදය යන වචනය ඉස්ලාමීය විද්වතුන් විවිධ අංශයන්වලට කැටගරයිස් කරන බවත් එනම් බුද්ධිමය ජිහාද් ලෙසින් තමාලා කියන එනම් බුද්ධිමය වශයෙන් යම්කිසි ප්‍රශ්නයක් ගොඩනැගෙන විට ඊට උත්තර සපයන එකත් ජිහාදය ලෙසට ඉස්ලාමීය විද්වතුන් අර්ථකතනය කරන බවත් කෙසේ වෙතත් සහරාන් සහ මෙම නඩුවේ 01 වන චූදිත විසින් තමාලාට පහදා දෙන ලද්දේ එලෙස විද්වතුන් විසින් ජිහාදය

සම්බන්ධයෙන් දෙන අර්ථකථනයන් වැරදි බවත් ජිහාදය යනු ආයුධ සන්නද්ධව කටයුතු කිරීම ලෙසට හඳුන්වන බවට සහරාන් සහ 1 වන චූදිත දේශකයන් ලෙස තමාලාට පැහැදිලි කළ බවයි.

එම දේශනාවලදී අයිඩියොලොජී පැත්ත සම්පූර්ණයෙන්ම කතා කරන ලද බවත් එනම් ජිහාදයේ දී ආයුධ භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික පැත්ත නොව ආකල්ප සහ සංකල්ප සම්බන්ධයෙන් එම අවස්ථාවේදී කතා කරන ලද බවත් එසේම, ආයුධ සන්නද්ධව යුද්ධ කිරීමේ සංකල්පය ඔවුන් විසින් කීප වතාවක්ම තමාලාට තහවුරු කරන ලද බවටත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, ජිහාදය කවර ආකාරයකින් ප්‍රායෝගිකව භාවිතා කළ යුතුද යන්න සම්බන්ධයෙන් පළමු දවසේ අවසානයේ සහ දෙවැනි දවසේදී පැහැදිලි කර දුන් බවත් එසේම, ජිහාදයෙන් ඔබ්බට ගොස් ඉස්ලාමීය රාජ්‍යයක් හැටියට කටයුතු කරන්නේ කෙසේද යන්න මාතෘකාවද ඔවුන් පැහැදිලි කරන්න පටන් ගත් බවත් එසේම, අයිඑස් අයිඑස් ඉස්ලාමීය රාජ්‍යයක වැඩ කරන්නේ කෙසේද යන්න ඔවුන් පැහැදිලි කරන්න පටන් ගත් බවත් ඒ යටතේ ජිහාද් යන සංකල්පය ඔවුන් පැහැදිලි කරමින් එසේම, එම ඉස්ලාමීය රාජ්‍යයක් එනම් අයිඑස් අයිඑස් රාජ්‍යයක් හරියට ප්‍රායෝගිකව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් විස්තර කරමින් අබු මුහාරිබ් ඇතුළු එම කණ්ඩායම එනම් සහරාන් ඇතුළු එම කණ්ඩායම ISIS නායකත්වය යටතේ වැඩ කරන සංවිධානයක් හැටියට

තමාලාගේ එම කණ්ඩායමේ සංවිධානය එනම් ඔවුන්ව තහවුරු කිරීමක් කරන ලද බවත් එය තහවුරු කරන්නට ඔවුන්ට ධජයක් ද තිබුණ බවත් ඊට අමතරව ඉන්පසු එම කණ්ඩායමේ නායකත්වය යටතේ වැඩ කරනවා යැයි තමාලාගෙන් ප්‍රතිඥාවක්ද ලබා ගත් බවත් තමාටද තමාලාටද ‘‘අබු’’ නමක් යොදා ගැනීමට අවස්ථාව ලබා දුන් බවත් එම අවස්ථාවේදී තමාලාගේ නම්වලින් වැඩ කරන එක අවදානම් තත්ත්වයක් බැවින් එලෙස තමාලාට ‘‘අබු’’ නමක් යොදා ගැනීමට කටයුතු කළ බවත් එලෙස තමාලාට තමා පැවසූ පරිදි ‘‘අබු’’ නාමය දැරූ පුද්ගලයන් ISIS සංවිධානයට යටත් බව පෙන්වීම සඳහා භාවිතා කරන ලද ධජය එහිදී බැක්ග්‍රවුන්ඩ් එකක් හැටියට භාවිතා කරන ලද බවත් ජිහාදය සහ ඉස්ලාමීය රාජ්‍යයක් ගැන තමාලාට පැහැදිලි කළාට පසු එම ධජය භාවිතා කරන්න පටන් ගත් බවත් එය වැඩමුළුවේ බැක්ග්‍රවුන්ඩ් එකේ ප්‍රදර්ශනය කළ බවත් එම ධජයෙහි ISIS දැනටත් භාවිතා කරන ලාංඡනය තිබුණ බවත් එය සම්පූර්ණයෙන්ම කළු පාට ධජයක් බවත් එසේම, එම ධජයෙහි තිබූ ලාංඡනය නබිතුමාණන් විසින් භාවිතා කරන ලද ඔහුගේ අතේ භාවිතා කරන ලද මුද්දක තිබූ මුද්‍රාවක් බවත් ඒ ඉතිහාසයේ සිටම භාවිතා කර තිබෙන බවත් ඉස්ලාමීය රාජ්‍යයක් ලෙස එය දිගින් දිගටම භාවිතා කර ඇති බවත් එම ලාංඡනය ISIS සංවිධානය නියෝජනය කිරීම සඳහා භාවිතා කරන ලාංඡනය බවත් එම ලාංඡනයෙහි අරාබි භාෂාවෙන් අල්ලාහු රසූල් මොහොමඩ් ලෙස සඳහන් වී තිබුණ බවත් අරාබි භාෂාවෙන් ඇති එයින් අදහස් වන්නේ අල්ලාහ් අල්ලාහ්

යන සංකේතය බවත් නබිතුමාණන් අල්ලාහ් අල්ලාහු තාලාගේ දූතයන් බවට සාක්ෂි දැරීම එනම් නබිතුමාණන් අල්ලාහ් අල්ලාහු තාලාගේ දූතයා බවට සාක්ෂිය දෙන බවට එහි එයින් අර්ථවත් වන බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, නුවරඑළිය වැඩමුළුවේදී ලබා දුන් ප්‍රතිඥාව වන්නේ අල්ලාහ් අල්ලාහු තාලාට යටත්ව නබිතුමාණන් අනුගමනය කර පිළිපැදි ඉස්ලාමීය රාජ්‍යයේ නායකත්වයට දුකේදී හා සැපේදී යටත්ව අපි ක්‍රියා කරනවා යන අර්ථය දෙන ප්‍රතිඥාව එහි තිබුණ බවත් එසේම, ISIS අයිඑස් අයිඑස් කියන එකට යටත්ව ලංකාව තුළද, ලංකාවත් ISIS අයිඑස් අයිඑස් එකට යටත් වූ රාජ්‍යයක් හැටියට භාවිතා කරන බවට ශ්‍රී ලංකාවත් ඉස්ලාමීය රාජ්‍යයක් ලෙස සලකන බවට එම ප්‍රතිඥාව ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාලා ලබා දුන් එම ප්‍රතිඥාව තමාලා සමඟ එහි සිටි කණ්ඩායම් විසින් ප්‍රතිඥා දුන් බවත් එය අරාබි භාෂාවෙන් තිබෙන ප්‍රතිඥාවක් බවත් එම සම්පූර්ණ ප්‍රතිඥාව පිටු එකක් දෙකක් පමණ තිබෙන බවත් ඒ අරාබි භාෂාවෙන් තිබෙන ප්‍රතිඥාවක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එහිදී තමාට තෝරා ගත් අබු නාමය වන්නේ **‘‘අබු කල්ලාද්’’** බවත් එම ‘‘අබු කල්ලාද්’’ යන නමෙහි අර්ථය නබිතුමාගේ සහාබ්වරයෙක්ගේ නමක් බවත් සාක්ෂිකරු පවසා ඇත. එම නම තෝරා ගත්තේ තමා විසින් ම බවත් තමා විසින් තෝරා ගත් එම නම අබු මුහාරිබ් එනම් සහරාන් විසින් සටහන් කර

ගත් බවත් ඔහු එය ලැප්ටොප් එකකින් සටහන් කර ගත් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, ජිහාදයේ ප්‍රායෝගික පැත්ත කතා කිරීමෙන් පසු තමාලා සමඟ සිටි පිරිස කණ්ඩායම් දෙකකට වෙන් කළ බවත් එනම් යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායම සහ මරාගෙන මැරෙන කණ්ඩායම් ලෙස කණ්ඩායම් දෙකකට වෙන් කළ බවත් යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායම ආයුධ සන්නද්ධව සටන් කිරීම කරන කණ්ඩායම බවත් මරාගෙන මැරෙන කණ්ඩායම සූයිසයිඩ් බෝම්බර්ස්ලා බවටත් එම කණ්ඩායම් දෙකෙන් තමාව අයත් වුණේ මරාගෙන මැරෙන කණ්ඩායමට බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ මෙලෙස නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී මොබයිල් ටෙක්නොලොජි එනම් මොබයිල් තාක්ෂණය ගැනද සාකච්ඡා කළ බවත් එනම් මොබයිල් ෆෝන් එකක් ආරක්ෂිතව භාවිතා කරන්නේ කොහොමද? එසේම, ඉලෙක්ට්‍රොනික උපාංග ආරක්ෂාකාරී විදිහට භාවිතා කරන්නේ කොහොමද? එනම් හැන්ඩල් කරන්නේ කොහොමද? යන්න එක ගැනත් කතා කළ බවත් එසේම, තර්ඩ් පාර්ටි ඇප්ස්වලදී එක පාරටම පර්මිෂන් දෙන්නේ නැතුව අවශ්‍ය නම් විතරක් එම ඇප්ස් භාවිතා කරන ආකාරය සහ එසේම, එවැනි තර්ඩ් පාර්ටි ඇප්ස්වලට පර්මිෂන් ඕෆ් කරලා තියෙන එක වැනි තාක්ෂණික දේවල් තමාලාට එම වැඩමුළුවේදී කියා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාලා

සහභාගී වූ එම දේශනවලට යන විට ආරක්ෂක හේතු මත තමාලාට ජංගම දුරකථන අරන් යන්න බැරි බවත් තමාලාගේ තොරතුරු එළියට යන හින්දා තමාලාද එම වැඩමුළුවලට වැඩසටහන්වලට යන විට ජංගම දුරකථන රැගෙන යන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමාට ලබා දුන් පෙන් ඩ්‍රයිව්වල ඉස්ලාමික් ඉස්ලාම් රාජ්‍යයක ආර්ථික ඉකොනොමික් ස්ට්‍රැටජි සහ පොලිටිකල් ස්ට්‍රැටජි පිළිබඳව තිබුණ බවත් එසේම, වැරදිවලට ලබා දෙන දඬුවම්වල වීඩියෝද එසේම, දේශන කීපයක්ද පොත්පත් කීපයක්ද වැනි දේවල්ද තිබුණ බවත් විශේෂයෙන් මරණ දඬුවම ලබා දෙන, අවයවයන් කපා ඉවත් කිරීම සිදු කිරීම සිදු කරන ඒ වගේම නඩු තීන්දු ලබා දෙන ඒවා වීඩියෝ දර්ශනවල තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එලෙස ඉස්ලාමික් ඉස්ලාම් රාජ්‍යයේ ලබා දෙන දඬුවම් ක්‍රියාත්මක කරන ආකාරය එම වීඩියෝවල තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, ඉස්ලාමීය රාජ්‍යයට එරෙහිව කටයුතු කරන අයට ලබා දීපු දඬුවම් එම වීඩියෝවල තිබුණ බවත් ඒ අනුව අයිඑස් අයිඑස් එකට විරුද්ධ වන අයට දෙන දඬුවම් එම පෙන් ඩ්‍රයිව්වල තිබුණ බවත් මරණ දඬුවම් ලබා දෙන වීඩියෝ තිබුණ බවත් හිස කපලා ඉවත් කර දඬුවම් ලබා දෙන ආකාරයත් එම වීඩියෝවල තිබුණ බවත් එසේ ම පළිගැනීම වෙනුවෙන් පුච්චලා මරණ ඒවාත් එම වීඩියෝවල තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, එම පෙන්ඩ්‍රයිව්වල තිබුණු දඬුවම් ක්‍රමවේදය අයිඑස් අයිඑස් සංවිධානය යටතේ ක්‍රියාත්මක වන දඬුවම් පද්ධතියක් හැටියට නිරූපණය වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අයිඑස් අයිඑස් සංවිධානයෙහි ඉහළ නායකත්වය දරන පුද්ගලයා ඉරාක්වල අයෙක් බවත් තමාට එම තැනැත්තාගේ නම එක පාරටම මතක් වන්නේ නැති බවත් පවසා ඇත. තමාලා සහභාගී වූ වැඩමුළුවට නායකත්වය ලබා දුන්නේ 1 වන චූදිත වන අබු සෙයිදි සහ සහරාන් ලෙස තමා හඳින්වූ අබු මුහාරිබ් බවත් සාක්ෂිකරු පවසා ඇත. අබු මුහාරිබ් නැමැති වචනය හර්බ් නැමැති අරාබි වචනයෙන් භාෂාවෙන් එන වචනයක් බවත් එයට යුද්ධය හා සම්බන්ධ අර්ථකථනයක් ලබා දෙන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අබු කිතාල් යන නමින් හඳුන්වන්නේද යුද්ධය හා සම්බන්ධ නමක් බවත් එසේම, එය ඝාතනය හා සම්බන්ධ වන්නා වූ නමක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර අබු මොහොමඩ් යන නමින් නබිතුමාණන්ගේ නාමය යොදා ගැනීමක් හැඳින්වෙන බවත් අබු හිනා යන නමින් ධනපතියා යන අර්ථය පෙන්නුම් කරන බවත් අබු හදීත් යන නමින් යකඩවලට ආසන්න නමක් අර්ථ දැක්වෙන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අබු හිනා ලෙස මෙම නඩුවේ 15 වන චූදිත තමා හඳුනා ගන්නා බවත් අබු හදීත් ලෙසට තමා මෙම නඩුවේ ගෆූර් අන්කල් යැයි හැඳින්වූ 02 වන චූදිත හඳුනා ගන්නා බවත් සාක්ෂිකරු පවසා ඇත. අබු ෆුර්කාන් යන නමෙහි ෆුර්කාන් යන්න අල් කුරාණයට කියන තවත් නමක් බවත් එලෙස අබු ෆුර්කාන් යන නමින්

යුත් තැනැත්තෙකුද තමාලා සමඟ සිටි එම කණ්ඩායමේ සිටි බවට තමාට මතක බවත් එම අබු ෆුර්කාන් නැමැත්තාගේ සාමාන්‍යයෙන් භාවිතා කරන නම තමාට මතක නැති බවත් එසේම, එම නමින් හඳුන්වන තැනැත්තා අධිකරණයේ සිටිනවාද යන්න තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, අබු නජා යනුවෙන් හඳුන්වන පුද්ගලයාගෙන් අබු නජා යන්නෙහි අර්ථය වික්ටරි හෙවත් ජයග්‍රහණය යන නම බවත් එම නමින් තමාලා සහභාගී වූ කණ්ඩායමෙහි එනම් තරුණ කණ්ඩායමේ හෝ වැඩිහිටි කණ්ඩායමේ පුද්ගලයෙක් සිටියාද යන්න තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

නුවරඑළියේ ශාන්තිපුර පැවැති වැඩමුළුව බාධාවකින් තොරව තමාලා පවත්වාගෙන ගිය බවත් එම වැඩමුළුව පවත්වන අවස්ථාවේදී පොලීසියෙන් ප්‍රාදේශීය පොලීසියෙන් හෝ කිසිවෙකු හෝ පැමිණියේ නැති බවත් වැඩමුළුව පැවතුණේ නිවසේ උඩු මහලේ බවත් නුවරඑළියේ තමාලා සිටියේ රාත්‍රී දෙකක් පමණක් බවත් 3 වන දවසේ තමාලා විසිර ගිය බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, එම වැඩමුළුව පැවැති ස්ථානයෙහි තමාලා සමඟ ගිය තරුණ පිරිස සහ එසේම, තමා විසින් පවසා සිටි අබු නම් දැරූ පුද්ගලයන් හැර හැරෙන්නට වෙනත් කිසිදු සිවිල් පුද්ගලයෙකු එම ස්ථානයෙහි සිටියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, එම ස්ථානයට වෙනත් පුද්ගලයන් ඇතුළු වීම වැළැක්වීමට තමාලා මුර කිරීම්

සිදු කරන ලද බවත් එලෙස 2 වන දවසේ රාත්‍රී තමාද එම ස්ථානයෙහි පැය දෙකක පමණ කාලයක් මුර කිරීම් කටයුතු සිදු කරන ලද බවත් සාක්ෂිකරු පවසා ඇත. එලෙස තමා මුර කිරීම් කටයුතු සිදු කළේ තමා සහ අබු සෙයිදි එනම් මෙම නඩුවේ 01 වන චූදිත විසින් බවත් කිසිදු බාහිර වෙනත් පුද්ගලයන් පැමිණීම වැළැක්වීම සඳහා එලෙස මුර කිරීම් කරන ලද බවටත් සාක්ෂිකරු පවසා ඇත. තමාලා මාවනැල්ල සිට ගිය වැන් රථ දෙකෙන්ම තමාලා යළිත් මාවනැල්ලටම පැමිණි බවත් තමාලා නුවරඑළියට යන විටත් එහි සිටි අබු නාමයන් නායකත්වය දැරූ පුද්ගලයන් එම ස්ථානයෙන් පිටත් වී ගියේ කෙසේද යන්න සම්බන්ධයෙන් තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාලා සමඟ සිටි කණ්ඩායමෙහි අබු අබ්දුල්ලා යන නාමය දැරූ තැනැත්තෙක්ද සිටියාද යන්න තමාට මතක නැති බවත් එසේම, එම කණ්ඩායමෙහි අබු බරා යන නම සඳහන් තැනැත්තෙක්ද සිටියාද යන්න තමාට කියන්නට හැකියාවක් නැති බවත් එසේම, තමාලා සමඟ සිටි කණ්ඩායමෙහි අබු හම්සා යන නමින් තැනැත්තෙක්ද සිටියාද යන්නද තමාට මතක නැති බවත් එසේම, අබු මුක්තාර් යන නමින් පුද්ගලයෙකු සිටියාද යන්නද තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම නඩුවේ 04 වන චූදිත වන සාදික් නැමැත්තාට අබු උමර් නැමැති නම ලබා දී තිබුණ බවත් අබු උමර් යන්නෙහි තේරුම නබිතුමාගේ සහායකයා යන අර්ථය බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම නඩුවේ 05 වන චූදිත වන සාහිත් නැමැත්තාට ලබා දී තිබූ අබු නාමය තමාට මතක නැති

බවට සාක්ෂිකරු පවසා ඇති අතර අබු සලා යන නමෙහි අර්ථය ජයග්‍රහණය යන්න බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු තවදුරටත් තමා සාක්ෂියේදී පවසා ඇත්තේ නුවරඑළිය ශාන්තිපුර පැවැති වැඩමුළුවට අමතරව තමාලා තමාගේ මතකයේ හැටියට 2018 වසරේ හම්බන්තොට ප්‍රදේශයටද එවැනි වැඩමුළුවක් සඳහා පිටත් වී ගිය බවත් තමාගේ මතකයේ හැටියට එම හම්බන්තොට පැවැති වැඩමුළුව සඳහා සහභාගී වුණේ 2018 සැප්තැම්බර්වල බවත් තමා ඊට කලින් හම්බන්තොට ප්‍රදේශයට ගොස් නැති බවත් ඊට පසුවද හම්බන්තොට ප්‍රදේශයට ගොස් නැති බවත් ඒ නිසා එම පැවැති නිශ්චිත ස්ථානය තමන්ට කියන්නට අපහසු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාලා එක වෑන් එකකින් එනම් තමාලා නුවරඑළියට ගිය එක් වාහනයක් වන මුෆ්ති නැමැත්තාට අයිති වෑන් රථයෙන් තමාලා හම්බන්තොට ප්‍රදේශයට ගිය බවත් එම වෑන් එකෙහි තමාගේ මතකයේ හැටියට 10 දෙනෙක් පමණ සිටි බවත් තමාව එම වෑන් එකේ කැඳවාගෙන ගියේ 04 වන චූදිත විසින් බවත් සාක්ෂිකරු පවසා ඇත. එම හම්බන්තොට පැවැති වැඩසටහනට සහභාගී වුණේ සම්පූර්ණයෙන්ම ඉස්ලාම් ආගම අදහන සිසුන් බවත් තමාගේ මතකයේ හැටියට තමා අඳුරන අනුරාධපුරයේ සල්මාන් නැමැත්තා එහි සිටි බවත් තවත් කට්ටිය සිටියද තමාට එම අය නම් වශයෙන් මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, එම හම්බන්තොට වැඩමුළුවට ගිය ගමනට 04 වන විත්තිකරුගේ සහෝදරයා වන 05 වන විත්තිකරු වන සාහිඩ් නැමැත්තා ගියාද යන්න තමාට හරියට මතක නැති බවත් එසේම, එම වැඩසටහනට හම්බන්තොට ප්‍රදේශයට ගිය 10 දෙනෙක් පමණ වූ තරුණ පිරිස අතර සිටි එම ගමනට සහභාගී වූ තවත් අය අධිකරණයේ සිටිනවාද යන්න තමාට කියන්නට බැරි බවත් හම්බන්තොටට තමාලා නොදන්නා අයත් පැමිණ සිටි බවත් එසේම, වෙන වෙන උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙන ගන්න ළමයි පවා ඇවිත් සිටි බවත් ඒ නිසා කවුරු පැමිණියාද යන්න සම්බන්ධයෙන් තමාට නිශ්චිතව පැවසීමට හැකියාවක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා පැවසූ පරිදි ගිය අයගෙන් නම් වශයෙන් මතක තිබුණේ සල්මාන්ව පමණක් බවත් අනිත් අයගේ නම් තමාට හරියටම මතක නැති බවත් ඒ අය අධිකරණයේ මේ වන නැති බවත් පවසා ඇත. එම වැඩමුළුවලට තමාලා ගොස් දින එකහමාරක් පමණක් සිටි බවත් එම වැඩසටහන් අතරමග නැවැත්වීමට සිදු වුණ බවත් ඊට හේතුව අබු කිතාල් එනම් රිල්වාන් නැමැත්තා විසින් පුපුරණ ද්‍රව්‍යයක් අත්හදා බැලීමේදී යම්කිසි අනතුරකට මුහුණ පා ඇති නිසා එම වැඩසටහන ඉන්පසු අවලංගු කරන ලද බවත් තමා පෙර පැවසූ ආකාරයට මෙවැනි වැඩමුළුවලට යන විට පැමිණෙන අනෙක් පුද්ගලයන් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් තමාලා සොයා බලන්නේ නැති බවත් ඒ ප්‍රතිපත්තියක් හැටියට සාමාන්‍යයෙන් අනිත් අය එලෙස පැමිණෙන අයගේ පෞද්ගලික විස්තර අහන්නේ නැති

බවත් එය තමාලාගේ සංවිධානයෙහි ප්‍රධාන සංකල්පයක් බවත් ඒ නිසා තමාට හරියටම එම අයව නිශ්චිතව මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමාලා එලෙස හම්බන්තොටට පුහුණු වීමට ගිය ස්ථානය නිවසක් බවත් එයද නුවරඑළියට ගිය ස්ථානයේ ආකාරයෙන්ම රෙන්ට් එකට ගත හැකි ගෙස්ට් හවුස් එකක් බවට තමාට පෙනී ගිය බවත් එම වැඩමුළුවටද සහරාන් එනම් අබු මුහාරිබ් සහ මෙම නඩුවේ 01 වන චූදිත වන අබු සෙයිදි යන අයද සිටි බවත් එසේම, එම වැඩමුළුවෙහි සහරාන් සහ අබු සෙයිදි එදින තමා පවසන 1 වන චූදිතගේ සෙෂන්ස්ද තිබුණ බවත් තවත් සම්පත් දායකයන් පැමිණ සිටියද එම අයගේ නම් තමාට හරියට මතක නැති බවත් පවසා ඇති අතර එදින සහරාන් සහ අබු සෙයිදි ලෙස තමා පවසන 01 වන චූදිත විසින් පැවසූ දේශන හරියටම තමාට විස්තර මතක නැති බවත් ආගමික දේවල් එනම්, ඉස්ලාම් දහමේ තිබෙන විශ්වාසයන් විශ්වාස කළ යුතු දේවල් ගැන ඒ වගේම හැඳින්වීම් ක්‍රම සහ ආත්මීය පැත්ත ගැන වැඩියෙන් කතා කළ බවත් එලෙස වැඩමුළුව පවත්වමින් සිටින අතරතුරදී වැඩසටහන් අතරමග නැවැත්වීමෙන් පසු තමාලා හම්බන්තොට සිට යළි පිටත් වී යන අතරතුරදී වැඩමුළුව නැවැත්වීමට හේතුව තමාට දැනගන්න ලැබුණ බවත් අබු කිතාල් නැමැත්තා විසින් පුපුරණ ද්‍රව්‍යයක් අත්හදා බැලීමේදී අනතුරකට ලක් වී සිටින නිසා එම වැඩමුළුව එතනින්ම නවත්වනවා යැයි පැවසූ බවත් එම අබු කිතාල් ලෙස තමා හඳුන්වන එනම්

රිල්වාන් යැයි සඳහන් කරන තැනැත්තා ගැන පසුකාලීනව තමාට දැනගන්න ලැබුණ ආකාරයට ඔහු සහරාන් නැමැත්තාගේ සහෝදරයෙක් බවට තමාට දැනගන්න ලැබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. ඒ අනුව හම්බන්තොට වැඩසටහන අතරමග නැවැත්වීමෙන් පසු තමාලා ගිය වෑන් රථයෙන් තමාලා යළිත් තමාගේ නිවෙස්වලට පැමිණි බවත් එලෙස පැමිණ සිටි අනෙකුත් දේශකයන් ඇතුළු පිරිස කොහොම ගියාද යන්න තමාට මතක නැති බවත් කෙසේ වෙතත් තවත් වෑන් රථයක් ඇවිත් තිබුණ බවට තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමාලා හම්බන්තොට සිට පිටත් වී යන විට ටී 56 වර්ගයේ අවියක් තමාලා ගිය වෑන් එකේ සයිඩ බෝඩ් එක ගලවා ඒ ඇතුළේ තබා රැගෙන ආ බවත් එය එම සයිඩ් බෝඩ් එක ඇතුළට දානවා තමාද දැක්ක බවත් එසේම, '' මේක ඇතුළේ රයිෆලයක් තියෙනවා මේක ගිහිල්ලා භාර දෙනකම් කාටවත් කියන්න එපා'' යැයි එම අවස්ථාවේදී 4 වන චූදිත පැවසූ දේ තමාට මතක බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාගේ මතකයේ හැටියට අවියකට තිබුණේ එම අවිය පමණක් බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ, සොහොයුරන් වන 04 වන සහ 05 වන චූදිතයන්ගෙන් 04 වන චූදිත සාදික් පමණක් හම්බන්තොට යාමට පැමිණි බවත් හම්බන්තොට සිට නැවත තමාලා මාවනැල්ල ප්‍රදේශයට තමන්ලා ගිය වෑන් රථයෙන්ම පැමිණි පසු මාවනැල්ල

ප්‍රදේශයේ පිහිටි 04 වන සහ 05 වන චූදිතගේ නිවසේ තිබී සල්ෆර් කිලෝ එකක් පමණ ප්‍රමාණයක් සැඟවීම සඳහා 05 වන විත්තිකරු විසින් වෑන් රථයට දමා වෑන් රථයෙන්ම ගොස් මාවනැල්ලේ සිට කිලෝමීටර් 30 ක් 35 ක් ඈතින් පිහිටි මෙම සාක්ෂිකරුගේ නිවසේ පරණ බඩු දමා තිබෙන යාඩ් එකේ තැබූ බවත් කෙසේ වුවත් එදින සවස තමා ඒවා නැවත රැගෙන යන ලෙසට 01 වන විත්තිකරුට දුරකථනයෙන් පැවසූ බවත් එවිට 05 වන විත්තිකරු සාහිඩ් තමාට පිළිතුරු දෙමින් තමා පසුදින උදෙන්ම ත්‍රීවිල් රථයකින් පැමිණ ඒවා රැගෙන ගොස් ෆවුසාන් නැමැත්තාට බාර දෙනවා යැයි පැවසූ බවත් ඒ අනුව පසු දින උදෑසනම 05 වන චූදිත සාහිඩ් යන අය තමාගේ නිවසට පැමිණ සල්ෆර් පාර්සලය රැගෙන ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, සල්ෆර් පාවිච්චි කරන්නේ මොනවාටද යන්න තමා දන්නේ නැති බවත් ඒවා යම් පුපුරන ද්‍රව්‍යයක් සැදීමට භාවිතා කරනවා ඇති බවත් ඔහු පවසා ඇත.

05 වන විත්තිකරුගේ නිවසේ තමාලා හම්බන්තොට සිට වෑන් රථයෙන් පැමිණි අවස්ථාවේ 04 වන සහ 05 වන විත්තිකරු හැර එම නිවසේ එදින සිටියේ ඔවුන්ගේ අත්තම්මා පමණක් බවත් එසේම, තමාලා සමඟ එම අවස්ථාවේදී 04 වන විත්තිකරු තමා ද 04 වන විත්තිකරුද හනාන් නැමැත්තාද මුබෂීර් යනුවෙන් හඳුන්වන තැනැත්තාද 04 දෙනා සිටි බවත් එසේම, තමාලා හම්බන්තොට සිට වෑන් රථයෙන් එලෙස පැමිණ 04

වන සහ 05 වන විත්තිකරුගේ ගෙදරට ගියේ හම්බන්තොට සිට එනවිට රැගෙන ආ ටී.56 ගිනි අවිය සැඟවීමට බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා පෙර පවසා සිටි ෆවුසාන් නැමැත්තාගේ නිවස පිහිටා තිබෙන්නේ මාවනැල්ල ප්‍රදේශයේ බවත් එම ෆවුසාන් නැමැත්තාද තමාලා සමඟ අලිවාඩියෙ ප්‍රදේශයේ පැවැති පුහුණුවීම් වැඩමුළුවට පැමිණි අයෙක් බවත් පවසා ඇත.

තවත් වරක් තෝපුර් ප්‍රදේශයට ගොස් ටී.56 අවියක් අත් හදා බැලීමෙන් පසුව පමින මාසයකට පමණ පසුව එලෙස තමාව පවුසාන් ලගට එක්ක ගියේ 04 වූදිත බවට මතක බවත් එදින ෆවුසාන් ගේ ගෙදරට ගියේ තමාද මාවනැල්ලේ හම්දි සහ තමා සමග නලීමියා ආයතනයේ ඉගෙන ගත් තමා සමග සංවිදානයේ වැඩ කටයුතු කල තමා වසර 3.4 ක් දැන ගෙන සිටි මවනැල්ලේ පදිංචි සාජිත් සහෝදරයද එහි දී 5 විත්තිකරුගේ නිවසට කිලෝමීටර් තුනක් පමණ ඈතින් පිහිටි පවුසාන් ගේ ගෙදර ට ගොස් ගෙදර අසල ගග ලගට ගොස් ටී.56 අවියක් අරගෙන එක උණ්ඩය බැගින් ගග ට ෆයර් කරන්න දුන්න බවත් එය සිදුවුනේ 2017 වසරේ විය හැකි බවත් පවසා ඇති අතර එම වෙඩි තැබීම කල අවස්ථාවේ 04 වූදිත එම ස්ථානයේ සිටියේ නැති බවත් ඔහු තම්න්ලාට ෆව්සාන් ව මුනගගැස්වීමෙන් පසුව එම ස්ථානයෙන් පිටවී ගිය් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සක්ෂිකරු විසින් 09 වන චූදිත ව පෙන්වා තමා සාජිත් යැයි පැවසුවේ ඔහු සම්බන්ධයෙන් බවත් පවසා ඇත.

තවද මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට ජිහාද් සංකල්පය සහ අයි.එස්. අයි.එස් සංවිධානය ගැන මග පෙන්වීම කළේත් 09 වූදිත සාජිත් විසින් බවත් ජිහාදය සහ අයි.එස්. අයි.එස් සම්බන්ධ පොත් පත් කියවීමට ලබා දුන්නේ ද සාජිත් විසින් ම බවත් පවසා ඇත. සහරාන්ගේ සහෝදරයාට පුපුරණ ද්‍රව්‍ය අත් හදා බැලීමකදී තුවාල සිදුවී ඇති බව දැනගත් පසු ඒ වනවිට අබු මුහරිබ් ඇතුළු කණ්ඩායම සහභාගී වූ හම්බන්තොට පැවති වැඩමුළුව අතරමග නැවතීමට සිදු වූ බවත් එලෙස කැන්සල් වූ වැඩමුළුව නැවත මාවනැල්ලේ පිහිටි අබුහිනා ලෙස හඳුන්වන 15 වන වූදිත ගේ නිවසේ පැවත්වූ බවත් එම වැඩමුළුවට 09 වූදිත සාජිත් ද සහභාගී වුණ බවත් එසේම, අබු මුහරිබ් (සහරාන්) මෙන් ම අබු සෙයිදි මෙන් ම අනිකුත් අබු නම් ලැබූ අයම එයට සහභාගී වූ බවත් එදින දේශන පැවැත්වූයේ කව්ද යන්න තමා දනේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවද තමාව එම වැඩමුළුව පැවති 15 වූදිත ගේ නිවසට එක්කක් ගියේ මෙම නඩුවේ 05 වූදිත (සාහිඩ් අබ්දුල් හක්) විසින් බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු පවසා ඇත්තෙ 09 වූදිත ISIS සංවිධානයට අයත් පොත් පත් පරිවර්තනය කිරීමේ කමිටුවේ සාමාජිකයෙක් බවත් එම කමිටුවේ තමාද අබු සෙයිදි (01 වූදිත නවුෆර් මවුලවි) ඉබ්‍රාහිම් මවුලවි (14 වූදිත) ද සිටි බවත් තමාව එම කමිටුවට දැම්මේ 01 වූදිත නවුෆර් මවුලවි) විසින් බවත් එම පරිවර්තන කටයුතු කැකුණගොල්ලෙ පිහිටි 01 වූදිත නවුෆර් මවුලවීගේ නිවසේ පැවති බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරු පවස ඇත්තේ ISIS සංවිධානයේ සංකල්ප තමාද ඉගෙන ගත් බවත් එසේම, ජිහාද් යන සංකල්පයද තමා ඉගෙන ගත්ත බවත් ඒ වනවිට යම්කිසි දුරකට තමාද එම සංකල්පන හරි කියන මතයෙන් සිටි බවත් ඒ මුස්ලිම් සමාජයට හෝ ඉස්ලාම් දහමට ප්‍රශ්නයක් ගොඩනැගෙනකොට, එයට එරෙහිව වචනයෙන් හෝ කතා කිරීම අවශ්‍යයි යන මතයෙන් සිටින අය ආයුධ දරා හෝ එය ආරක්ෂා කල යුතුය යන මතයට එන්න බොහෝ හේතු කාරණා තිබුණු බවත් උදාහරණයක් ලෙස අලුත්ගම සිද්ධිය, මෙන් ම දිගන සිද්ධිය වැනි දේවල් බව තහවුරු කල බවත් තමාලා නිරායුධව සිටීමෙන් වැඩක් නැති බවට වූ මතය හරි යන ස්ථාවරයේ තමා ද සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

ISIS නැමති සංවිධානයත් එක්ක මේ සාදික් මෙන් ම සාහිද් සහෝදරවරුන් ගිවිසුම්ගත වුණාට පසු, ඔවුන්ගේ මතයන් සමග තමා ද ආරම්භයේ එකඟව සිටිය ද පසුකාලීනව ඇතැම් දේවල් සමග එකඟ වෙන්නට බැරි වුණ බවත් ඔවුන් ලබා දුන් අයිඩියොලොජි වීඩියෝස් වල තිබූ ස්ට්‍රැටජීස් වල සහ ප්‍රායෝගික තත්වය අතර වෙනස්කම් තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, මේ අවස්ථාවේ ද ඉස්ලාම් දහම ගැන පැහැදීමක් ලබා දීමට ආයුධවලට මුල් තැන ලබා දිය යුතුය යන මතයේ තමා කොහෙත්ම නොසිටින බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ කෝලාහලයක් ඇති වෙනවා මිස මෙහි යථාර්ථය සමාජගත වෙන්නට බැරි බවට මතයේ තමා සිටි බවත් උතුම් වූ නබිතුමාණන් කිසිදු ඉස්ලාමීය රාජ්‍යයක් උදුර ගත්තේ නැති බවත් එතුමා ඉස්ලාමීය රාජ්‍යයක් බිහි කල බවත් එලෙස ඉස්ලාමීය රාජ්‍යක් බිහි කළාට පසු ඇති වූ යුධමය කාල වකවානු තුළ පවා නබි තුමා තමන්ගේ මිත්‍රවරුන් පාවාදී එතුමා සැඟවුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, තමාලා සමග සිටි එකට කටයුතු කල, ඔවුන්ව විශ්වාස කල සාමාජිකයන් බොහෝ සේ තවමත් දුක් විඳින නමුත් එයට මුල් තැන ලබා දුන් එනම් එකී ආකල්ප, සංකල්ප පතුරවන ලද අය බොහෝ ඉක්මණින් සැඟවුණ බවත් තමා පවා ආරක්ෂක අංශයෙන් කට උත්තරයක් ගද්දී කරන ලද්දේ ඒකට මුල් තැන ලබා දුන්න අයව ආරක්ෂා කිරීම බවත් එසේ වුවද පොලිසියට කට උත්තර දුන් අය තමන් කරපු හැම වැරැද්දක්ම පවසා කට උත්තර ලබා දී තිබෙන බවත් සක්ෂිකරු පවස ඇති අතර තමා ද මුල් අවස්ථාවේ තමාගෙන් වෙච්ච වැරැද්ද සම්බන්ධයෙන් පමණක් පවසූ බවත් මේකට මුල් තැන ලබා දුන්න අයගේ කිසිම තොරතුරක් තමා විසින් ලබා දුන්නේ නැති බවත් එයට හේතුව ඔවුන් ආගම වෙනුවෙන් කටයුතු කරන අය නිසා ඒ විශ්වාසය මත තමා ඔවුන් ගැන හෙලි කළේ නැති බවත් සම්පූර්ණ කටෙඋත්තරේ මුලින්ම හෙලි කළේ නැති බවත් තමන් සමග එකට වැඩ කටයුතු කල අය තමාගේ නම සඳහන් කරමින් කට උත්තර වල

දුරකථන තොරතුරු පවා ලබා දී තිබීම නිසා තමා සම්බන්ධයෙන් විමර්ශන කරන්න පටන් ගත්ත නිසා එම අවස්ථාවේ තමා ද සත්‍ය තොරතුරු ටික හරි ආකාරව ලබා දීමට කටයුතු කල බවත් මෙය ඉස්ලාම් දහම යනුවෙන් හඳුනාගෙන ඉස්ලාම් දහමෙන් පිටත යාමක් යැයි තමාට තේරුම් ගන්න හැකිවූ බවත් තමා අද වන විට සිටින්නේ එම මතයේම බවත් යම්කිසි දවසක මෙම අය ද එය තේරුම් ගනී යන මතය තමා තාමත් දරන බවත් චූදිත පවසා ඇත.

සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ 04 සහ 05 චූදිතයින් අබු මුහරිබ් ඇතුළු අබු නම් දැරූ කණ්ඩායමට එකතු වීම ඔවුන් ISIS එක්ක ගිවිසුම්ගත වීම ලෙස තමා පවසන බවත් ISIS මතවාද ලංකාව තුළ පතුරුවා ලංකාව ISIS දේශයක් බවට පත් පත් කිරීම සඳහා ප්‍රසිද්ධියේ නායකත්වය දුන්නේ අබු මුහාරිබ් (සහරාන්) සහ අබු සෙයිදි ඇතුළු කණ්ඩායම බවය. සාක්ෂිකරු තවදුරත් පවසා ඇත්තේ 14 චූදිත වන ඉබ්‍රාහිම් මවුලවි 01 චූදිත ගේ නිවසේ පැවති පරිවර්තන කටයුතු සඳහා තමා එම නිවසට 09 චූදිත සමග ගිය දිනයේ එම නිවසට පැමිණියා ද යන්න සම්බන්ධයෙන් තමාට සැකයක් තිබෙන බවත් කෙසේ වුවත් ඔහු කමිටුවේ සාමාජිකයෙක්ව සිටි බවත් ය.

තමා දෙල්ගහගොඩ ප්‍රදේශයේ පැවති වැඩමුළුවකට සහභාගී වී නැති බවත් කෙසේ වුවද තමා එම ප්‍රදේශයේ පදිංචි 04, 05 චූදිතයින් සමග පැවති

සම්බන්ධතා නිසා එම ප්‍රදේශයට ගොස් ඇති බවත් ය. 2018 දෙසැම්බර් 23 දින දෙල්ගහගොඩ ප්‍රදේශයේ පැවති, 4, 5 වුදිතයින් විසින් සූදානම් කල අපො.ස (සා.පෙ) සිසුන් සඳහා පැවති වැඩමුළුවකට සහභාගී වූ බවත් ය. 2018.12.24, 25 දිනවල පැවති බුදු පිළිම් කැඩීමේ සිද්ධියෙන් පසුව 05 වුදිත උලපනේ ප්‍රදේශයට පැමිණි බවත් තමා තමා 5 වන වුදිතව ගෙලිඔය සිට උලපනේ මුබයිස් නැමත්තාගේ නිවසට රැගෙන ගොස් තැබූ බවත් පසුදින 05.15 ට බස් රථයෙන් ඔහු පිටවී ගොස් ඇති බවත් ය.

මෙම සාක්ෂිකරුට පැ.163 ලෙස ලකුණු කර ඇති සැනලි ධාවකයේ අඩංගු වීඩියෝ දර්ශනයක් විවෘත අධිකරණයේ පුළුල් තිරයක් මත ප්‍රදර්ශනය කර පෙන් වා සිටීමේ දී එම දර්ශනයේ පසුබිම් තලයේ තිබෙන්නේ ISIS ධජය බවට සාක්ෂිකරු හඳුනාගෙන ඇති අතර එම ධජය නුවර එළිය ප්‍රදේශයේ ශාන්තිපුර නිවාඩු නික්කේතනයේ වැඩමුළුව පවත්වන ලද අවස්ථාවේ දී පසුබිම් තලයේ තිබුණ ISIS ධජය හා සමාන බවත් එහි ඇති අකුරු වලින් සඳහන් කරන්නේ ලා ඉලාහා ඉල්ලල්ලා එනම් අල්ලහ් දෙවියන් හැර කිසි දෙවි කෙනෙක් නැත යන්න බවත් ඉතිහාසයේ නබි තුමන් ගේ කාලයේ සිට ඉස්ලාම් රාජ්‍යක් තුළ පාවිච්චි කර තිබෙන්නේ මෙයට සමාන වූ ධජයක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ISIS සංවිධානය ඉස්ලාමිය රාජ්‍යක් ගොඩනැගීමේ අරමුණින් ගමන් කරන සංවිධානයක් බවත් පවසා ඇත. සාක්ෂිකරු අධිකරණයේ විකාශනය කරන

ලද වීඩියෝ දර්ශනයේ තිබෙන ISIS ධජය පාමුල එරමිණිය ගොතාගෙන වාඩිවී සිටින්නේ අබු මුහරිබ් හෙවත් සහරාන් බවට හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. එකී වීඩියො දර්ශනය පැ.163 (A) ලෙස සලකුණු කර ඇත. එසේම, එම වීඩියෝවේ සිටින පුද්ගලයින් ප්‍රතිඥාව ලබා දෙන්නේ ජිහාදයේ අවශ්‍යතාවය උඩ අල් කුෆූර් එනම් අල්ලා හැර අනිත් සියලු දෙවිවරුන් වන්දනා කරන ක්‍රමය නැති කිරීමට ලබා දෙන දිවුරුම් දීම බවත් එය ඉස්ලාම් රාජයයේ නායකයා වන අබු බකර් අල් බග්දාදි වෙනුවෙන් ලබා දෙන ප්‍රතිඥාව බවත් සාක්ෂිකරු පවස ඇත.

තව ද වීඩියෝ දර්ශනයේ සහරාන් විසින් T.56 අවියක් අත දරා සිටින ආකාරය සම්බන්ධයෙන් සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරුට ෂැංග්‍රිලා හෝටලයේ බෝම්බ පිපිරීමට ආසන්න අවස්ථාවලට අදාළ ව ලබාගෙන ඇති පෙර අවස්ථාවක පැ.03 (50) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනය නැරඹීමට සලස්වා ඇති අතර එම වීඩියෝ දර්ශන වල විදුලි සෝපානයක් තුළ සිටින තැනැත්තා සහරාන් බවට හඳුනාගෙන ඇත.පෙර අවස්ථාවක පැ.56 (2) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනය ද සාක්ෂිකරුට නැරඹීමට සලස්වා ඇති අතර එහි දර්ශනයන් තුළ බැක් පැක් වර්ගයේ විශාල බෑගයක් පැළඳ වටපිටාවේ පුද්ගලයින් රාශියක් සිටින, ඉන්ටර් ලොක් වර්ගයේ ගල් අතුරා ඇති ස්ථානයක සිටින පුද්ගලයා ද

හඳුනාගෙන ඔහු හස්තූන් නොහොත් අබු මොහොම්ඩ් බවට පවසා කෙසේ වුවත් තහවුරු කිරීමට නොහැකි බවට පවසා ඇත.

සාක්ෂිකරු වැඩි දුරටත් පවසා ඇත්තේ තමාගෙන් ආරක්ෂක අංශයන් ප්‍රකාශ කීපයක් ම ලබා ගත් බවත් තමාගෙන් ASP office එකෙන් ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ කෑගල්ල පොලිසියෙන් ද කට උත්තර ගත් බවත් 2019 ජනවාරි 23, 24, 25 දිනවල තමාගෙන් කට උත්තර ගත් බවත් එහිදී තමා පැහැදිලිව විස්තර ලබා දුන් බවත් පවසා ඇත. එසේම, තමාගෙන් යුධ හමුදා බුද්ධි අංශයෙන් ද රාජ්‍ය බුද්ධි අංශයෙන් ද CID සහ TID එකෙන් ද ප්‍රකාශ ගත් බවත් තමාගෙන් 127 ප්‍රකාශයක් ද ලබා ගත් බවත් තමා එය සම්පූර්ණයෙන් ම ස්වේච්ඡාවෙන් ලබා දුන් එකක් බවත් තමාට අධිකරණයේ සාක්ෂි ලබා දීමට කිසිවෙකුගෙන් කිසිම බලපෑමක් නොමැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දුන් 2026.6.3 දින වනවිට මෙම නඩුවේ 12 සහ 13 චූදිතයින් වෙනුවෙන් හැර අනිකුත් සියලුම චූදිතයින් නීතීඥ සහය ලබා නොගෙන ඔවුන් විසින් ම නඩු කටයුතු පවත්වාගෙන යන ලද අතර ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය අධිකරණයේ භාෂා පරිවර්තක මගින් දමිළ භාෂාවෙන් පහදා දීමට කටයුතු කරන ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 01 චූදිත නවුෆර් මවුලවී විසින් ප්‍රථමයෙන් ම හරස් ප්‍රශ්න අසන ලද අතර සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ඉස්ලාම් ආගම යනු සාමය සමාදානය ලෝකවාසීන්ට ලබා දුන් පූර්ණ ආගමක් බවත් අල්ලා දෙවියන් හැර ගස් ගල් සතුන් වැනි දේවල් වැඳීම නොකලයුතු බවටත් නබි තුමාගේ ජීවන රටාව අනුව ජීවත් විය යුතු බවටත් නැමදීමට සුදුස්සා අල්ලා පමණක් බවත් යෝජනා කර ඇති අතර සාක්ෂිකරු එය පිළිගෙන ඇත.

අන්තවාදය සහ මූලධර්මවාදය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු දරන මතය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ ඉස්ලාමීය සංකල්ප සම්බන්ධයෙන් පැහැදිලිකිරීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වෙනමම විද්වත් කමිටුවක් පත් කල යුතු බවත් මෙම චූදිත අසන ප්‍රශ්න තමා මෙම අධිකරණයේ ලබා දුන් සාක්ෂියට පරිබාහිර කරුණු සම්බන්ධයෙන් වන බවත් ය. කෙලින් ම අවි ආයුධ රැගෙන යුද්ධ කිරීමෙන් ඉස්ලාම් දහම සහ මුස්ලිම්වරුන් ආරක්ෂා කිරීමට හැකිය යන මතය තමා කිසිසේත් පිළිගන්නෙ නැති බවත් ඒ හැර තමා ඉස්ලාම් ආගම තුළ තිබෙන සංකල්ප ගැන සාක්ෂි ලබා දුන්නේ නැති බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුට 01 චූදිත විසින් යෝජනා කර ඇත්තේ ඔහු පවසන පරිදි අබු නම් යෙදුවේ රහසිගතව තියාගන්න නොවන බවත් හැමෝම එම අබු නම් දැන ගැනීම සඳහා බවත් ය. එසේම, තමාට අබු

සෙයිද් නමින් පුතෙකු සිටි නිසා මෙම සිද්ධින් සිදුවීමට බොහෝ කාලයකට පෙර සිටම තමාට එම නමින් කතාකරන බවටත් යෝජන කර ඇති අතර ඒ ගැන තමා දැනුවත් නැති බවට සාක්ෂිකරු පවසා ඇත.

01 චූදිත සාක්ෂිකරුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ, තමා 2006 වසරේ සිටම මුහුණුපොත පාවිච්චි කිරීමේදී අබූ සෙයිද් යන නම භාවිතා කර ලිපි ලියා තිබෙන බවට වන අතර, සාක්ෂිකරු තමාට ඒ ගැන නිශ්චිතව පැවසිය නොහැකි බවට පවසා ඇත. නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී තමා කල දේශනයේදී කිසිදු ස්ථානයක තමා කඩුවක් රැගෙන ගොස් යම් පුද්ගලයෙකු කපන්න හෝ පුපුරන බෝම්බ වැනි දෙයක් රැගෙන ගොස් කාටහරි හානියක් ඇති කරන්න කාටවත් හානියක් කිරීමට තමා පැවසුවේ නැති බවට යෝජනා කලද සාක්ෂිකරු එකහෙළාම එකී යෝජනාව තමාට පිළිගත නොහැකි බවට පවසා ඇත. 01 වන චූදිත වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී ජිහාද් සම්බන්ධයෙන් දේශනා කරන විට ආයුධ සන්නද්ධව සටන් කිරීම් කළ යුතු බවට තමා පැවසුවේ නැති බවත් තමා විසින් ජිහාද් සම්බන්ධයෙන් පැවැත්වූ දේශනාවේදී පැවසුවේ කුරානයේ සහ හදීස් වල සඳහන් දේ පමණක් බවත් තමා අල්කිතාල් යන මූලධර්මය ගැන කිසිදු දෙයක් පැවසුවේ නැති බවට චූවද සාක්ෂිකරු එකී යෝජනාවන් තමාට පිළිගැනීමට නොහැකි බවට පවසා ඇත. 01 වන චූදිත සාක්ෂිකරුට අවසාන වශයෙන් යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු ඉස්ලාමීය මූලධර්මයන් වල ජිහාද් සහ කිතාල් යන

මූලධර්මයන් පටලවාගෙන ඒ සම්බන්ධයෙන් හරියාකාර දැනුමක් නොමැතිව සාක්ෂි ලබා දෙන බවට වුවද සාක්ෂිකරු එකී යෝජනාවන් ප්‍රතික්ෂේප කර ඇත.

02 චූදිත විසින් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී යෝජනා කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙ දී සාක්ෂිකරු සමග එකට වාඩිවී ආහාර ගත් බවට වන අතර සාක්ෂිකරු එවැනි සිදුවීමක් නොවුණ බවට පවසා ඇත. එසේම, තමාට අබු හදීත් ලෙසට නමක් තිබුනේ නැති බවත් එය මෙම සාක්ෂිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් උගන්වා ඇති බවත් යෝජනා කර ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ තමා ලබා දුන් ප්‍රකාශයේ ඔහුගේ නම පහැදිලිව සඳහන් කර ඇති බවත් පවසා ඇත. 02 චූදිත පවසා ඇත්තේ තමා කිසිදු අවස්ථාවක මෙම සාක්ෂිකරුව නුවරඑළියේ දී හමු උනේ නැති බවට වන අතර සාක්ෂිකරු එම යෝජනාව එක හෙලාම ප්‍රතික්ෂේප කර ඇත.

3 චූදිත හයාතු මොහොමදු අහමදු මිල්හාන් විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, මෙම සාක්ෂිකරු විසින් ආරක්ෂක අමාත්‍යාංශයට මෙම සාක්ෂිකරු විසින් සකස් කර ඇති ලේඛනයක් ලබාදී ඇති බවට වන අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමාගෙන් ප්‍රශ්න කිරීම් වලදී ඡායාරූප, ලේඛන, හඩපට, වීඩියෝපට සම්බන්ධයෙන් අසන ලද අවස්ථාවේදී තමාගෙන් අසන ලද ප්‍රශ්නයන්

සම්බන්ධයෙන් පිළිතුරු ලෙසට තමා විසින් පැහැදිලි කර දීම් කර ඇති බවයි. 03 වුදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න වලට ලක් වෙමින්ද සාක්ෂිකරු පවසා ඇත්තේ 2018 වසරේ මැයි මාසයේ නුවරඑළියේ පැවැති වැඩ සටහනේදී අබූ නම් යෙදූ සමහර පුද්ගලයන් තමාට මේ වන විට අධිකරණයේදී පෙන්වා දී හඳුනා ගැනීමට අපහසු බවයි. එලෙස අබූ නම් ලැබූ පුද්ගලයන් කීප දෙනෙකුගේ සත්‍ය නම් තමා ඒ වන විට දැනගෙන සිටියේ නැති බවත්, ඒ සම්බන්ධයෙන් තමා අධිකරණයටද ඒ පිළිබඳව පැහැදිලි කරන ලද බවයි. 03 වන චූදිත වෙනුවෙන් වැඩිදුරටත් හරස් ප්‍රශ්න වලට ලක්වීමේදී සාක්ෂිකරු යළි පවසා ඇත්තේ 2019 ජනවාරි 13, 2019 ජනවාරි 23, 2019 ජනවාරි 24, 2019 ජනවාරි 27 තමා විසින් පොලිසියට ප්‍රකාශ ලබා දී ඇති බවත් මෙලෙස තමා කීප වතාවක්ම ප්‍රකාශ ලබා දී තිබෙන නිසා තමාට නිශ්චිතව දින වකවානු මතක නැති බවත් තමා විසින් විස්තරාත්මක ප්‍රකාශයක් සෘජුවම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවත් පවසා ඇති අතර, 2019 ජනවාරි 23 වන දින ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් ප්‍රකාශයේදී ඔහු සඳහන් කර ඇත්තේ 2019 ජනවාරි 13 වන දින ප්‍රකාශය ලබා ගන්නා විට එම ස්ථානයේ ඇති වූ බියක් හේතුවෙන් තමා එදින සම්පූර්ණ ප්‍රකාශය ලබා දුන්නේ නැති බවට එම ප්‍රකාශයේ සඳහන් කර ඇති බව තමා පිළිගන්නා බවත් කෙසේ වෙතත් තමා 2019 ජනවාරි 23 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයෙහි සම්පූර්ණ කරුණු සඳහන් කරන ලද බවයි.

03 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ 2019 ජනවාරි 23 වන දින ඔහු ලබා දුන් ප්‍රකාශයෙහි ටී. 56 සහ 9 මි. මී. වර්ගයේ තුවක්කුව අබු සිලා යන විසින් ගලවා නැවත සකස් කර බවට මෙම සාක්ෂිකරු සඳහන් කර නැති බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට මේ වන විට ඒ සම්බන්ධයෙන් මතකයක් නැති බවත්, සමහර එලෙස පවසා තිබෙන්නත් පුළුවන් නොතිබෙන්නත් පුළුවන් බවයි. එසේම 03 වන චූදිත මෙම සාක්ෂිකරුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ 2019 ජනවාරි 24 දිනද, 2019 ජනවාරි 29 දිනද, 2019 පෙබරවාරි 05 වන දිනද මෙම සාක්ෂිකරු ලබා දී ඇති ප්‍රකාශ වල කිසිදු ස්ථානයක අබු සිලා නැමැත්තා සම්බන්ධයෙන් සඳහන් කර නොමැති බවටද වුවද සාක්ෂිකරු දිගින් දිගටම පවසා ඇත්තේ තමා එලෙස සඳහන් කර තිබීමට හැකි බවත්, එලෙස පවසා නොතිබෙන්නට හැකි බවයි. 03 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ 2019 ජනවාරි 23 දින සිට මාස 06 කට පසුව මෙම සාක්ෂිකරු විසින් මහේස්ත්‍රාත්තුමාට ලබා දී ඇති 127 වගන්තිය යටතේ ලබා දී ඇති ප්‍රකාශයේ අවසාන ඡේදයේ සංවිධානයේ සිටි වැදගත් අය යන කොටසේ ඔහු අබු සිලා යන නම සහ මිල්හාන් යන නම සඳහන් කර ඇති බව වන අතර, සාක්ෂිකරු ඊට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ තමා අබු සිලා යන නම ඒ වන විටත් නුවරඑළිය ප්‍රදේශයේ තිබුනු වැඩමුළුවේදීත් භාවිතයේදී දැන ගෙන සිටි බවත්, නුවරඑළිය වැඩමුළුවේදී එම අබු සිලා නැමැත්තා ටී.56 හා අවිආයුධ හදුන්වාදීම සිදු කරන ලද තැනැත්තා බවත්, ඒ

මතකයෙන් තමා මහේස්ත්‍රාත්තුමාට එම ප්‍රකාශය ලබා දී ඇති බවයි. 03 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු විසින් 2018 මැයි මාසයේ සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රකාශ 06 ක් ලබා දී එම ප්‍රකාශ 06 ම පවසා නැති දේවල් ඔහු අධිකරණයේදී පවසා සිටින බවට වුවද, සාක්ෂිකරු පවසා ඇත්තේ 2018 නොව 2019 වර්ෂයේ තමා ලබා දුන් ප්‍රකාශ වල පැවසූ කරුණු තමා පුළුල් ප්‍රකාශයක් ලබා දී සඳහන් කරන ලද බවත්, එසේම තමා විසින් ලබා දී ඇති ප්‍රකාශ වල අඩංගු දේවල් අංගසම්පූර්ණව මෙලෙස මෙම අධිකරණයේ සාක්ෂි ලබා දීමේදී පවසා සිටීමක් බලාපොරොත්තු වෙන්න බැරි බවත්, තමාට මනුෂ්‍යයෙක් හැටියට සමහර දේවල් අමතක වෙලා ඇති බවත්, සමහර දේවල් තමාට මතක් වෙලාද ඇති බවත් ඒ දේවල් තමා ප්‍රකාශයක් හැටියට ලබා දී තිබෙන බවයි. මෙම සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් ඔහු 2019 ජනවාරි 13, 23, 24, 27 සහ 2019 පෙබරවාරි 05 යන වකවානු වලදී අබුසිලා යන නම පොලීසියට පැවසීමක් නොකර මහේස්ත්‍රාත්තුමා ඉදිරියේ දී අබුසිලා නොහොත් මිල්හාන් යන නම සඳහන් කලේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ මඟ පෙන්වීම යටතේ යැයි යෝජනා කලද සාක්ෂිකරු එකී යෝජනාවන් එකහෙලාම ප්‍රතික්ෂේප කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් 03 වන චූදිත වැඩිදුරටත් හරස් ප්‍රශ්න අසමින් යෝජනා කර ඇත්තේ, මෙම සාක්ෂිකරු සාමාජිකයෙක්ව සිටි ජමියා ශිෂ්‍ය සංවිධානය ත්‍රස්තවාදී සංකල්ප සහ දැඩි අන්තවාදී අදහස් තිබුන නිසා එය ශ්‍රී

ලංකා රජය මගින් තහනම් සංවිධානයක් කල බවත් මෙම සාක්ෂිකරුව ජමියා සංවිධානයෙන් ඉවත් කලේ ඔහු එම සංවිධානයටත් වඩා වැඩි ත්‍රස්තවාදී සහ අන්තාවදී මත දැරූ අයෙක් වන නිසා බවට යෝජනා කලද තමා අන්තවාදී මතය නිවැරදිය යන මතයේ තමා සිටි බව තමා පිළිගෙන ඇති බවත් එය තමා ප්‍රකාශ තුළින් නිවැරදි කර ගත් බවත් සාක්ෂිකරු පවසා ඇත. 03 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, මෙම සාක්ෂිකරු නුවරඑළිය ප්‍රදේශයේ තිබූ වැඩමුළුවේදී ටී.56 සහ 9 MM වර්ගයේ තුවක්කු පුහුණුවක් ලැබූ බවට 2019 ජනවාරි 13 වන දින පොලීසිය ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලද අවස්ථාවේදී පැවසුවේ නැත්තේ තමා එවැනි අවි පුහුණුවක් ලැබුවේ නැති නිසා බවට යෝජනා කර ඇති අතර, එසේම සාක්ෂිකරු එය තමාට පිළිගැනීමට නොහැකි බව පවසා ඇති අතර, හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරු පවසා ඇත්තේ මෙලෙස තමා වෙඩි තැබීමට පුහුණු වුන බවට පොලීසියට ප්‍රකාශයක් ලබා දීමේදී සදහන් කරන ලද බවයි. 03 වන චූදිත යෝජනා කර ඇත්තේ එලෙස වෙඩි තැබීමට පුහුණු වීම වැනි බරපතල දේවල් සහ යම්කිසි පුද්ගලයෙකු අතේ අවිආයුධ තිබෙන බවට දැනගෙන එය පැවසීම වසන් කිරීම ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනත යටතේ වරදවල් බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ තමා සතුව කිසිදු අවස්ථාවක ආයුධයක් තිබුනේ නැති බවත් තමා ස්වේච්ඡාවෙන්ම මහේස්ත්‍රාත්තුමියට ප්‍රකාශයක් ලබා දුන් බවත් වන අතර, විමර්ශන අවස්ථාවේ කිසිදු අවස්ථාවක තමාව අත්අඩංගුවට ගැනීමක් සිදු

වුනේ නැති බවට සාක්ෂිකරු පවසා ඇත. 03 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඔහුව කැඳවීමෙන් පසුව ඔවුන්ට උදව් කලේ නැත්නම් ඔහුව අත්අඩංගුවට ගන්නා බවට බියවද්දා මෙලෙස ප්‍රකාශයක් ලබා දුනහොත් අත්අඩංගුවට ගන්නේ නැහැ යැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔහුට ලබා දුන් පොරොන්දුව නිසා මෙම සාක්ෂිකරු එවැනි ප්‍රකාශයක් ලබා දී ඇති බවට සහ මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ ලේඛන සකස් කිරීමටද සහයෝගය ලබා දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නතර වී සිටීමටද පහසුකම් ආදිය ලබා දී ඇත්තේ ඔවුන් ලබා දුන් පොරොන්දුව පරිදි කටයුතු කල නිසා බවට වුවද සාක්ෂිකරු එකී යෝජනාවන් එකහෙළා ප්‍රතික්ෂේප කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින්ද දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න අසා ඇති අතර, 04 වන චූදිතගේ හරස් ප්‍රශ්න වලදී අසා ඇත්තේ සිංහල භාෂාවෙන් ප්‍රකාශයක් ලබා දිය හැකි ඔහු විසින් 2019 ජනවාරි 13 වන දින ඔහුගේ ප්‍රකාශය දමිල භාෂාවෙන් ලබා දුන්නේ කවර හේතුවකටදැයි විමසූ විට සාක්ෂිකරු පවසා ඇත්තේ මුලින් තමාගේ ප්‍රකාශය දමිල භාෂාවෙන් ලබා දුන්නද තමාට සිංහල භාෂාව හොඳින් හසුරවන්න පුළුවන් බවට ඔවුන් අවබෝධ කර ගත් පසුව තමාගෙන් සිංහල භාෂාවෙන් ප්‍රකාශ ලබා ගත් බවයි. එසේම ඔහු 2019.06 වන මස 28 වන දින 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා දුන්

අවස්ථාවේදී නුවරඑළිය ප්‍රදේශයේ වැඩමුළුවට පුද්ගලයන් විසිදෙනෙක් ආපු බවට සඳහන් කර තිබෙනවා නම් එය නිවැරදි දැයි ඇසූ විට සාක්ෂිකරු පවසා ඇත්තේ තමාගේ මතකයේ හැටියට තමා 15 ක් හෝ 20 ක් යැයි සඳහන් කරන්නට ඇති බවත් වන අතර, ඔහු මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් විට එලෙස පැමිණි ගණන 20 ක් හෝ 25 ක් යැයි සඳහන් කර ඇති බවට සාක්ෂිකරුට යෝජනා කර ඇතිඅතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමා විසින් ලබා දුන් ප්‍රකාශවල සඳහන් කරන ලද්දේ ආසන්න අගයක් බවත් එය වෙනස්වීමට හැකි බවයි. 04 වන චූදිත විසින්ද මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂාව ලබා දී තිබෙන නිසා ඔහු මෙලෙස කරුණු වෙනස් කර කර අධිකරණයේ සාක්ෂි ලබා දෙන බවට චුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත. එසේම මෙම සාක්ෂිකරුගෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාෂයෙන් ප්‍රකාශය ගන්නා විටම ඔහුව සාක්ෂිකරුවෙක් කරන බවට සඳහන් කර වින්දිතයන් ආරක්ෂා කිරීමේ අධිකාරියෙන් ආරක්ෂාව ලබා දී තිබෙන බවට චුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත.

04 වන චූදිත සාදික් අබ්දුල්ලා උලපනේ ප්‍රදේශය වන මෙම සාක්ෂිකරුගේ ගම ප්‍රදේශයේ 2010 වසරේ කුකුල් ගොවිපලක් පවත්වාගෙන ගිය බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු පිළිගෙන ඇති අතර, එසේම එම ගොවිපලේ සාදික් අබ්දුල්ලා නොමැති අවස්ථාවලදී එය

ශුද්ධපවිත කිරීමේ කටයුතු කලේද මෙම සාක්ෂිකරු විසින්ම බවට කරන ලද යෝජනාවට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ සාදික් අබ්දුල්ලා එනම් 04 වන චූදිත පවසා සිටි වේලාවලදී තමා උදව් කිරීම් කර තිබෙන බවත්, සාදික් අබ්දුල්ලා නොසිටි අවස්ථාවල තමා එම ගොවිපලේ සිටියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම 2016, 2017 වසර වල තමා සාදික් අබ්දුල්ලා සමඟ තෝප්පූර් ප්‍රදේශයට ගිය බව සාක්ෂිකරු පිළිගෙන ඇතිඅතර, තමාට නිශ්චිතවම එම ගමන ගිය මාසයන් කුමන මාසවලද යන්න මතක නැති බව සාක්ෂිකරු පවසා ඇත. 04 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු අධිකරණයට සාක්ෂි දී පැවසිය යුතු කරුණු ඔහුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මග පෙන්වා දී ඇති බවත් මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශ 02 හි නතර වෙලා සිටිමින් රාජකාරී කල බවට යෝජනා කලද සාක්ෂිකරු එකී යෝජනාවන් ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අංශයට තමාගේ සම්පූර්ණ සහයෝගය ලබා දුන්නේ තමාගේ තිබුනු වැරදි මතයන් නිරවුල් කර ගැනීම සඳහා බවත් ඔහු පවසා ඇත. වැඩිදුරටත් හරස් ප්‍රශ්න වලට ලක් වෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ තමා අඹූ යන නම් දැනගෙන සිටි බවත් පරීක්ෂණ කටයුතු වලදී තමාට සමහර පුද්ගලයන්ගේ ඇත්ත නම් දැන ගැනීමට හැකි වුන බවත්, පරීක්ෂණ කටයුතු වලදී අඹූ නම් දැරූ පුද්ගලයන්ගේ සත්‍ය නම්

තහවුරු කර ගත් බවත් ඔහු පවසා ඇත. 04 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, ඔහු ස්වාධීන සාක්ෂිකරුවෙකු නොවන බවත් ඔහු ඇතැම් දින වල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නැවතී සිට ආරක්ෂක අමාත්‍යාංශයට යැවිය යුතු ලේඛනයක්ද ඔහු විසින් සකස් කර ඇති බවත් වන අතර, සාක්ෂිකරු එකී යෝජනාවන් ප්‍රතික්ෂේප කර ඇත.

සාක්ෂිකරු වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් පවසා ඇත්තේ තමා හම්බන්තොට ප්‍රදේශයට ගිය බව තම සාක්ෂියේදී සඳහන් කරන ලද බවත් තමා මේ වන විටද සාක්ෂි ලබා දෙන්නේ මතකයේ තිබුනු දේවල් මත බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන් හම්බන්තොට ප්‍රදේශයේ පැවති වැඩමුළුවක් සම්බන්ධයෙන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම් කර ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ තමා 2019 වසරේ ලබා දුන් ප්‍රකාශ වල සඳහන් කර ඇති කරුණු එක් එක් තනි ප්‍රකාශ ලබා දුන් අවස්ථාවේදී තමාගේ තමාගේ මතකයේ හැටියට තමා ප්‍රකාශ ලබා දී ඇති බවත්, තමාගේ මතකයේ තියෙන දේවල් තමා සම්පූර්ණයෙන්ම අධිකරණයට ප්‍රකාශ කල බවත් පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් 2019.06.28 වන දින ඔහු ලබා දී ඇති 127 වගන්තිය යටතේ ලබා දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් 04 වන චූදිත විසින් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ වසර 08 කට පෙර ලබා දුන් කරුණු තමාට ඒ ආකාරයෙන්ම මතකයේ

නැති බවත්, තමාගේ මතකයේ හැටියට තමා සාක්ෂි ලබා දීම කරන ලද බවත් තමා ප්‍රකාශ කීපයක් ලබා දී ඇති බවත් සමස්ත ප්‍රකාශයන් වල සමස්ත කාරණා සම්බන්ධයෙන් තමා අධිකරණයට සාක්ෂි ලබා දුන් බව පවසා ඇත. වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් වැඩමුළුවන් වලදී Back ground එකක් ලෙසට පාවිච්චි කරන ලද ධජය සම්බන්ධයෙන් යළිත් සාක්ෂිකරු කරුණු අවධාරණය කරමින් පවසා ඇති අතර, එසේම තමා සහභාගී වුනු වැඩමුළුවේදී දඩුවම් ක්‍රියාත්මක කරන විදිහ පෙන්නුම් කරන වීඩියෝ දර්ශන පෙන්වූ බවත් ඒවා අඩංගු පිටපත් පෙන් ඩ්‍රයිව් මගින් තමාලාට ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. 04 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විජේරත්න නැමැති නිලධාරියාගේ මඟපෙන්වීම මත මෙම සාක්ෂිකරු විසින් ඔහු 2019.02.05 දිනට පෙර ලබා දුන් ප්‍රකාශ වල සඳහන් නොවන කරුණු එදින ලබා දී ඇති ප්‍රකාශයෙහි සඳහන් කර ඇති බවට වුවද සාක්ෂිරු එකී යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත. සාක්ෂිකරුට 04 වන චූදිත විසින් යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුගෙන් 2019.06.28 දින 127 වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති ප්‍රකාශයේද ලබා දී ඇති අසත්‍ය කරුණු සඳහන් කර ඇති බවට වුවද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කර ඇත. සාක්ෂිකරුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ ඔහු අධිකරණයේ සාක්ෂි ලබා දෙමින් සාදික් අබ්දුල්ලාගේ අබූ නම අබු උමර් යැයි ඔහු අධිකරණයේ සඳහන් කලද ඔහුගේ කිසිඳු ප්‍රකාශයක එවැන්නක් සඳහන් කර නොමැති

බවට වුවද සාක්ෂිකරු පවසා ඇත්තේ ඒ ගැන තමාගේ මතකයේ නැති බවයි. තවද මෙම සාක්ෂිකරුට ලබා දුන් කිසිදු ප්‍රකාශයක ISIS යැයි සඳහන් කර නැති බවත් ඔහු සඳහන් කර ඇත්තේ IS සහ ISIS යනුවෙන් සඳහන් වෙන්නේ එකම සංවිධානයක් බවත් දැනට ලෝකයේ පාවිච්චි කරන්නේ IS යනුවෙන් බවයි. 04 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ඔහු ඉස්ලාම් ආගම සම්බන්ධයෙන් අසත්‍ය කරුණු අධිකරණයේ ප්‍රකාශ කරන බවත් ඔහුගේ ස්ථාවරය සාධාරණය කිරීම සඳහා මෙම සාක්ෂිකරු ආගමික දේවල් වෙනස් කර පවසන බවට වුවද සාක්ෂිකරු එකී යෝජනාවන් සියල්ල ප්‍රතික්ෂේප කර ඇත.

04 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, ඔහු සහභාගී වූ නුවරඑළිය වැඩමුළුවේදී ඔහුට ඉස්ලාම් දේශය යනුවෙන් සඳහන් කලේ නබිතුමා විසින් ඇති කරන ලද ඉස්ලාම් දේශය සම්බන්ධයෙන් බවට වුවද සාක්ෂිකරු තමාට එය පිළිගත නොහැකි බවට පවසා ඇත. එසේම 04 වන සහ 05 වන චූදිතයන් ළඟ මූලධර්මවාදී අදහස් තිබෙන බවට තමා දුටු බවට සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලදී පවසා ඇත. 04 වන චූදිත විසින් මෙම සාක්ෂිකරුගෙන් කුරානයේ අඩංගු සූරා (පරිච්ඡේද) සම්බන්ධයෙන් උදාහරණ පෙන්වමින් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එසේම අල්කුරානයේ 2 වන සූරාව වන අල්වකරා සූරාවේ 190 සිට 193 දක්වා වාක්‍යයන් කියවා දෙමින් හරස් ප්‍රශ්න අසා ඇති අතර, ඒවා පහත පරිදි කියවා පහදා දී ඇත.

190 - කවරෙකු නුඹලා සමග යුධ වන්නේ ද ඔවුන් සමග අල්ලාගේ මාර්ගයෙහි නුඹලා යුධ වදිනු. තවද නුඹලා සීමාව ඉක්මවා නොයවු. සැබැවින්ම අල්ලා සීමාව ඉක්මවන්නන්ට ප්‍රිය නොකරයි.

191 - නුඹලා ඔවුන් හසු වූ තැන ඔවුන්ව ඝාතනය කරවු. තවද ඔවුන් නුඹලාව පිටුවහල් කළ ස්ථානයෙන් නුඹලා ද ඔවුන්ව පිටුවහල් කරනු. තවද ව්‍යසනය ඝාතනයට වඩා ඉතා දරුණුය. කෙසේ නමුත් මස්ජිදය හරාම් අභියස ඔවුන් නුඹලා සමඟ යුධ වදින්නේ නම් නුඹලා ද ඔවුන්ව ඝාතනය කරව්. එසේ එය ප්‍රතික්ෂේප කරන්නන්ගේ ප්‍රතිවිපාකය වනුයේ.

192 - ඔවුන් අල්ලාට (ආදේශ තැබීම) අතහැර දමන්නේ නම් සැබැවින්ම අල්ලා අතික්ෂමාලීය පරම කරුණා හරිතය.

193 - ව්‍යසනය ඇති නොවී තවද දහම අල්ලාටම වන තෙක් නුඹලා ඔවුන් සමග යුධ වදිනු. නමුත් ඔවුන් (ආදේශ තැබීම) අතහැර දමන්නේ නම් සතුරුකම් අපරාධකරුවන්ට එරෙහිව අන් කිසිවෙකුට නොමැත.

එසේම 04 වන චූදිත සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ ඔහු මෙම සාක්ෂිකරු සමග පල්ලිවල නතර වී සිටි අවස්ථාවලදී කුරානයේ සඳහන් වාක්‍යයන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අවස්ථාවේදී ඉහත කී කාරණාවන් හැර තමන්ලා විසින් කුමන හෝ අවස්ථාවකදී නිකම් සිටින පුද්ගලයන් මරන්න ඕනෑ කියලා කථා කරලා තියෙනවද යනුවෙන් වන අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ ඉස්ලාම් දහමට එරෙහිව කටයුතු කරනවා

නම් එම පුද්ගලයන්ව මරන්න ඕනෙ කියලා කථා කරලා තිබෙන බවයි. එසේම තවදුරටත් සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ ආගමික කටයුතු වල නිරතව ඉන්න අයව නිකම් මරන්න ඕනෙ යැයි සාක්ෂිකරුට උගන්වලා තිබෙනවද යනුවෙන් වන අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ ඉස්ලාම් රාජ්‍යයට යටත් නොවන සියලු දෙනා එනම් ISIS මතවාදයට බෙදුනයින් පස්සේ ඒ රාජ්‍යයට නැත්නම් ඒ නායකත්වයට යටත් නොවන සියලු දෙනා ඒ රාජ්‍යයේ සතුරන් ලෙස සලකන බවත්, ඒ නිසා ඔවුන් සමඟ යුධ කිරීමත් ඔවුන්ව මරා දැමීමත් සාධාරණීකරණය කර තමාලා කථා කරලා තියෙන බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම මෙම නඩුවේ 04 වන සහ 05 වන චූදිතයින් මූලධර්මවාදීන් යැයි ඔවුන් දෙදෙනා තමාට සත්‍ය වශයෙන්ම කියා තිබෙන බව සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු බොරු සාක්ෂි ලබා දෙන බවට 04 වන චූදිත වෙනුවෙන් යෝජනා කරමින් සාක්ෂිකරුට පවසා ඇත්තේ මුස්ලිම් පුද්ගලයෙකු ලෙස මෙම සාක්ෂිකරුට අවසාන දිනයේදී දෙවියන් වහන්සේ ඉදිරියේද ඔහුට පරීක්ෂණයක් පැවැත්වෙන බවත් එම පරීක්ෂණයේදී ඔහු මේ සාක්ෂියම ලබා දෙනවාද යැයි විමසූ විට සාක්ෂිකරු ඔව් යැයි නිශ්චිත වශයෙන්ම පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 05 වන චූදිත මොහොමද් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් විසින් හරස් ප්‍රශ්න අසමින් යෝජනා කර ඇත්තේ 2016 හෝ 2017 වර්ෂයේ ඔහු 04 සහ 05 චූදිතයින් සමඟ තෝප්පුර් ප්‍රදේශයට ගමනක්

ගිය බව පැවසුවද, තමා එම කාලයේ ලංකාවේ හිටියේ නැහැ යැයි පවසා අල්ලා දෙවියන්ව විශ්වාස කරන පුද්ගලයෙක් වශයෙන් සිටිමින් මෙම සාක්ෂිකරු බොරු සාක්ෂි දෙන බවට යෝජනා කර ඇති අතර, සාක්ෂිකරු පවසා ඇත්තේ 05 වන චූදිත ලංකාවේ නොසිටිය දවස් ගැන තමාට මතකයේ නැති බවත්, කෙසේ වුනත් තෝප්පූර් ප්‍රදේශයට ගිය සිද්ධියේදී 05 වන චූදිත සිටි බව තමාට මතක බවයි. 05 වන චූදිත සාක්ෂිකරුට වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ නුවරඑළියේදී ඔහුට ලබා දුන් සමහර ලේඛන වල කිසිදු වැරදි කාරණාවක් තිබ්බේ නැති බවත් වන අතර, සාක්ෂිකරු එම යෝජනාව පිළිගත නොහැකි බවට පවසා ඇත. 05 වන චූදිත වැඩිදුරටත් යෝජනා කර ඇත්තේ, එම ලේඛන මෙම සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී නොමැත්තේ එම ලේඛනවල කිසිදු වැරදි දෙයක් තිබුනේ නැති නිසා බවත්, මෙම සාක්ෂිකරු ඒවා පුච්චලා දැමුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම යටතේ බවට චූ එම යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර ඇත. එසේම මෙම සාක්ෂිකරු ඒ ඒ අවස්ථාවට ගැළෙපෙන පරිදි එක් එක් ප්‍රකාශයට වැඩි තොරතුරු ඇතුළත් කරමින් ප්‍රකාශ කරමින් ඉදිරිපත් කර තිබෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම යටතේ බවට වන එම යෝජනාවන් සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර ඇත. සාක්ෂිකරුට දිගින්දිගටම යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුව නිර්මාණය කරන ලද සාක්ෂිකරුවෙක් බවට වන අතර, සාක්ෂිකරු එකී කරුණ ප්‍රතික්ෂේප කර

ඇත. 05 වන චූදිත මෙම සාක්ෂිකරුගෙන් අල්කුරානයේ සඳහන් යම් යම් ආගමික කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න අසා ඇති අතර, අල්ලා දෙවියන් විසින් මුස්ලිම්කරුවන්ට සිදු කළ යුතු දේවල් ලෙසට කර ඇති නියෝගයක් යම් පුද්ගලයෙකු විසින් සිදු කල හොත් එම තැනැත්තාට මූලධර්මවාදියෙක් යැයි පැවසිය නොහැකි බව සාක්ෂිකරු පවසා ඇත. එසේම 05 වන චූදිත තමා මෙම සාක්ෂිකරු සමග කුරානය සම්පූර්ණයෙන් පිළිපැදිය යුතු බවට සහ එහි යම් යම් කොටසක් තමාලා විසින් අත්හැරීම නොකළ යුතු බවට සාකච්ඡා කර තිබෙන බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, මෙම සාක්ෂිකරු 09 වන චූදිත සමඟ ජාමියා නාලිමියා අධ්‍යාපන ආයතනයේදී ඉතා සමීපව කටයුතු කරන ලද බවට පිළිගෙන ඇත. මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දීමේදී පවසා සිටි පරිදි මාවනැල්ලේ ගංගාවක් අයිනේදී සිදු වූ සිදුවීම 2016 හෝ 2017 ආසන්න වර්ෂයක සිදු වූ බවට තමා පැවසූ බවට සාක්ෂිකරු පවසා ඇති අතර, එම ගංගාව අසළ එම සිදුවීම සිදු වුන ස්ථානයෙහි, එම සිදු වීම සිදු වුනේ රාත්‍රී කාලයේ බවත්, එම ස්ථානයේදී ටී.56 ආයුධයක් ගෙනැවිත් මෙම සාක්ෂිකරු 09 වන චූදිත සහ තවත් පුද්ගලයෙකු සමඟ අසළ තිබූ ගංගාවට වෙඩි තැබීම සිදු කල බවට සාක්ෂිකරු පිළිගෙන ඇත.

එසේම එදින එම අවස්ථාවේ තිබිච්ච ආලෝක තත්ත්වය අනුව රාත්‍රී කාලයේ ගංගාව අසළ එය සිදු වුනා නම් එම අවස්ථාවේදී තිබුනේ ටී.56 අවියක් යැයි නිශ්චිතව පැවසීමට මෙම සාක්ෂිකරුට හැකියාවක් නොමැති බවට යෝජනා කලාද ඔහු පවසා ඇත්තේ තමා ඊට කලින් ටී.56 ආයුධය අත්හදා බලා තිබෙන බවත්, ඒ අනුව එම ආයුධය ගැන තමාට සාමාන්‍ය දැනීමක් තිබෙන බවයි. එසේම එම අවස්ථාවේදී තමාලා විසින් ගඟට කරන ලද වෙඩි තැබීම ළඟපාත ගෙවල් වලට ඇසෙන්නට ඇති බවත්, ඔවුන් වෙඩි තැබීමේ ශබ්ධ ඇසුන බවට පොලීසියට හෝ වෙනත් ස්ථානයකට පැමිණිලි කලාද යන්න තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම සාක්ෂිකරු වැඩිදුරටත් හරස් ප්‍රශ්න වලට ලක් වෙමින් 2016, 2017, 2018 වසරවල තමා 09 වන චූදිත සමඟ ජිහාද් ගැන සහ ISIS ගැන කථා වෙලා තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම එම කාලයේ ශ්‍රී ලංකාව තුළ ISIS සංවිධානය තහනම් සංවිධානයක් බවට හෝ ඒ ගැන කථා කිරීමට යම් නීතිමය බාධාවක් තිබ්බද යන්න ගැන තමා දැනුවත් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම සාක්ෂිකරුද පිළිගෙන ඇත්තේ තමා මෙම 09 වන චූදිත සමඟ අධ්‍යාපනය ලැබූ ජාමියා නාමිලියා ආයතනයේ අවසාන වසරේදී ජිහාද් යන මාතෘකාව සම්බන්ධයෙන් ඉගෙන ගත්තද කිතාබුල් ජිහාද් යන්න සම්බන්ධයෙන් ඉගෙන ගත්තාද යන්න තමාලාගේ විෂය මාලාවේ තමාට මතක නැති බවයි. එසේම මෙම සාක්ෂිකරු විසින් මූලික සාක්ෂියේදී විස්තර කරන ලද පරිවර්තන කමිටුවෙහි තමා සමග 09 වන චූදිතත් සිටි

බවත් සාක්ෂිකරු පිළිගෙන ඇති අතර, එසේම 09 වන චූදිත විසින් ත්‍රස්තවාදය හෝ අන්තවාදය ගැන යම්කිසි ලේඛනයක් පරිවර්තනය කලාද යන්න තමා දැනුවත් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා සමඟ ආශ්‍රය කරන ලද අවුරුදු 03 ක පමණ ආසන්න කාලසීමාවේදී 09 වන චූදිත තමාට කිසිම ආයුධ පුහුණුවක් ලබා දී නැති බවත් අහිංසක මිනිසුන්ව මරන්න පවසා නැති බවත් ලංකාව තුළ ත්‍රස්තවාදී ක්‍රියාවක් කරන්නට කුමන්ත්‍රණය කර නැති බවත් අන්‍යාගමික පල්ලිවලට බෝම්බ තියන්න ඕනෑ යැයි පවසා නැති බවට කරන ලද යෝජනාවන් සාක්ෂිකරු පිළිගෙන ඇත. 09 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මුස්ලිම්වරුන්ගේ පල්ලි කැඩුවොත් ගෙවල් කඩන්න ආවොත් ආත්මාරක්ෂක ක්‍රියා ලෙස ඒවා තමාලා ආරක්ෂා කළ යුතු බවට 09 වන චූදිත තමා සමඟ කථා කර ඇති බව සාක්ෂිකරු පිළිගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට ඇති වූ අසාධාරණයක් හේතු කොට ගෙන තමා යම්කිසි මතවාදයක් දැරුවද එම මතවාදයෙන් මේ වන විට තමා මිදී තිබෙන බවත් සාක්ෂිකරු පවසා ඇත. තවද අලුත්ගම, බේරුවල, දිගන, ගිංතොට ආදී ප්‍රදේශවල මුස්ලිම් මිනිසුන්ට සිදු වූ අසාධාරණකම් වලට කොහේ හෝ නඩු පවරා තිබෙනවද යන්න ගැන තමාට දැනීමක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, තමා 09 වන චූදිත සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ 2017.11.01 සිට 2019.04.21 කාලවකවානුවේදී අනුරාධපුර රඹෑව ප්‍රදේශයේදී මල්වානදී, මහනුවරදී,

නුවරඑළියේදී, හම්බන්තොට ප්‍රදේශයේදී, කාත්තන්කුඩි ඔල්ලිකුලම් ප්‍රදේශයේද, පාලමුන ප්‍රදේශයේදී, නාරම්මල ප්‍රදේශයේදී, කටුවාපිටිය ප්‍රදේශයේදී, මඩකලපුව ප්‍රදේශයේදී, පානදුර ප්‍රදේශයේදී, කොටහේන, කොටුව කොල්ලුපිටිය හෝ දෙහිවල ප්‍රදේශයේදී තමා 09 වන චූදිත සමඟ හමු වී කථා කර තිබෙනවාද යනුවෙන් වන අතර, තමාගේ මතකයේ හැටියට නැහැ යැයි සාක්ෂිකරු පිළිතුරු දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 14 වන චූදිත වන රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම් විසින්ද හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සාක්ෂිකරු පිළිගෙන ඇත්තේ මෙම 14 වන චූදිත සහ ඔහුගේ දරුවන් වන 04 වන සහ 05 වන චූදිතයින් 2019 දක්වා අවුරුදු 07 ක් වැනි කාලයක් තිස්සේ තමා හැඳින සිටින බවයි. එසේම තමා 14 වන චූදිතගේ නිවසේ දින කිහිපයක්ම නතර වී තිබෙන බවත් සාක්ෂිකරු පිළිගෙන ඇත. එසේම 14 වන චූදිතගේ ඥාතීන්ද මෙම සාක්ෂිකරු පදිංචි උලපනේ ප්‍රදේශයේ සිටින බව සහ 14 වන චූදිත උලපනේ ජුම්මා පල්ලියේ සිකුරාදා දින දේශනාවන් සිදු කර ඇති බව සාක්ෂිකරු පිළිගෙන ඇත. එසේම 14 වන චූදිත විසින් බොහෝ කාන්තාවන්ට මහපෙන්වීම් දේශනා පවත්වා තිබෙන බවත් නූරුල් හුදා යනුවෙන් ස්ප්‍රිචුවල් කවුන්සලින් සෙන්ටර් එකක් ද පවත්වාගෙන ගිය බව තමා දන්නා බවත් එසේම 14 වන චූදිත විවිධ නගරවල නිවෙස් වලට ගොස් උපදේශන සේවාවන් ලබා දී තිබෙන බවද තමා දන්නා බවත් සාක්ෂිකරු

පවසා ඇත. එසේම 14 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ තමා සාක්ෂි ලබා දීමේ වැදගත්කම දන්නා බවත් හරි දේ සත්‍ය වශයෙන් පැවසීම සාක්ෂි ලබා දීම බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම මෙම නඩුවෙහි සිටින චූදිතයින් 24 දෙනාම මුස්ලිම්වරුන් බවත් ඔවුන් නුවරඑළිය හම්බන්තොට ආදී ප්‍රදේශයට ගොස් ඉගැන්වීම් කටයුතු දේශනා පවත්වා තිබෙන බවට ඔවුන්ට චෝදනා එල්ල කර තිබෙන බවත් ඔවුන් ඉගෙන ගත්තේ ආගම සම්බන්ධ දේවල් බවත්, ඉගැන්නුවෙත් ආගම සම්බන්ධ දේවල් බවත් මෙම සාක්ෂිකරු දන්නවා යැයි චූදිත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ ඔවුන් ආගමේ නාමයෙන් සිටිමින් එවැනි ක්‍රියා කර ඇති බවත් තමා දන්නා බව සාක්ෂිකරු පවසා ඇත.

19 වන චූදිත වන කච්චි මොහොම්මදු මොහොම්මදු ජෙම්සිත් විසින්ද සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසමින් අසා ඇත්තේ, තමා යම්කිසි ස්ථානයක බයාන් දේශනවලට සහභාගී වී සිටිනවා සාක්ෂිකරු දැක තිබේද යනුවෙන් අසා ඇති අතර, සාක්ෂිකරු තමා එලෙස 19 වන චූදිතව දැක නැති බවට පවසා ඇත.

20 චූදිත විසින්ද සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්නයක් ලෙස අසා ඇත්තේ ඔහුව කුමන හෝ බයාන් දේශනා වලදී සාක්ෂිකරු දැක තිබේද යනුවෙන් වන අතර, තමාගේ මතකයේ හැටියට නැහැ යැයි සාක්ෂිකරු

පිළිතුරු දී ඇත. අනිකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට පවසා ඇත.

සාක්ෂිකරුව නැවත ප්‍රශ්න වලට ලක් කිරීමේදී ඔහු පවසා ඇත්තේ නුවරඑළියෙ පැවැති වැඩමුළුවේදී IS මතවාදීන්ට එරෙහිවූවන්ටද දෙන දඩුවම් වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කළ බවත්, එවැනි වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය තාක්ෂණික උපාංග එම වැඩ මුළුවේදී තිබුන බවත් එසේම නුවරඑළිය වැඩමුළුවේදී තමාට දුන්න අත්පත්‍රිකා සහ පෙන් ඩ්‍රයිව් එක තමා විනාශ කලේ තමාද මුලින් එවැනි මතවාදයක සිටපු කෙනෙක් වුවද විමර්ශන ආරම්භ වීමට කලින් තමා ගිය නිසා ඒවා විනාශ කල බවත් තමා එම මතවාදයන් සමඟ එකඟ වුනේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, නුවරඑළියේ සිටි කණ්ඩායමෙහි අබු සිලා ලෙස නම් ලැබූ පුද්ගලයෙකු එම අවස්ථාවේදි හඳුනා ගත් බවත් අබු සිලා යන නමින් වෙනත් පුද්ගලයෙකු එම කණ්ඩායම අතරේ සිටියදී තමා හඳුනා ගත්තේ නැති බවත් අබු සිලා නමින් හඳුනා ගත්තේ තනි පුද්ගලයෙකු බවත්, පසුව විමර්ශන අවස්ථාවේදී එම අබු සිලා යනු මිල්හාන් නැමැති පුද්ගලයා බවට තමා දැන ගත් බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය.

මෙම සාක්ෂිකරුගෙන් 1 චූදිත නවුෆර් මවුලවී විසින් මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න ඇසීමේ දී දේශන පවත්වපු හතරවන ස්ථානය වන 2018 අප්‍රේල් හෝ මැයි මාස වල නුවරඑළියේ පැවත්වූ දේශන වලදී අබු නම් යෙදීමක් සිදුකල බවට කරුණු සාක්ෂිකරුට යෝජනා කර හරස් ප්‍රශ්න අසා ඇත ද තමා කිසිදු අවස්ථාවක එලෙස අබු මොහරිබ් නොහොත් සහරාන් ඇතුළු තවත් පුද්ගලයින් 20 දෙනෙකු පමණ නුවරඑළියේ ශාන්තිපුර නවතැන් ගන්න ගෙස්ට් හවුස් එකකට නොගිය බවට හෝ කිසිදු යෝජනාවක් හෝ කර නැත.

මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් නුවරඑළිය වැඩ මුලුවේ දී සහරාන් සහ මෙම 1 වන චූදිත විසින් තමාලාට දේශකයන් ලෙස පහදා දෙන ලද්දේ විද්වතුන් විසින් ජිහාදය සම්බන්ධයෙන් දෙන අර්ථකථනයන් වැරදි බවත් ජිහාදය යනු ආයුධ සන්නද්ධව කටයුතු කිරීම ලෙසට හඳුන්වන බවට පැවසූ කරුණු මෙම 01 චූදිත විසින් කිසිසේත් ප්‍රතික්ෂේප කිරීමක් හෝ කර නැත.

තවද එම වැඩමුළුවේදී මෙම 01 චූදිත ද සහභාගි වී දේශන පවා සිදුකල බවට සහ එසේම, ජිහාදයේ ප්‍රායෝගික පැත්ත කතා කිරීමෙන් පසු තමාලා සමඟ සිටි පිරිස යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායම සහ මරාගෙන මැරෙන කණ්ඩායම් ලෙස කණ්ඩායම් දෙකකට වෙන් කළ බවත්

යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායම ආයුධ සන්නද්ධව සටන් කිරීම කරන කණ්ඩායම බවත් මරාගෙන මැරෙන කණ්ඩායම සූයිසයිඩ් බෝම්බර්ස්ලා බවටත් සහරාන් විසින් වෙන් කල බවට ලබා දුන් සාක්ෂිය මෙම 01 වූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමේ දී කිසිසේත් ප්‍රතික්ෂේප කර නැත.

එසේම, මෙම සාක්ෂිකරු පවසා සිටි පරිදි අබු නම් දැරූ පුද්ගලයන් හැරෙන්නට වෙනත් කිසිදු සිවිල් පුද්ගලයෙකු නුවරඑළියේ පුහුණු වැඩමුළුව පැවති ස්ථානයෙහි සිටියේ නැති බව සහ එම ස්ථානයට වෙනත් පුද්ගලයන් ඇතුළු වීම වැළැක්වීමට 2 වන දවසේ රාත්‍රී මුර කිරීම් කටයුතු සිදු කළේ තමා සහ අබු සෙයිදි එනම් මෙම නඩුවේ 1 වන වූදිත විසින් බවට ලබා දුන් සාක්ෂිය හෝ තමා එලෙස කටයුතු නොකල බවට මෙම 01 වූදිත විසින් යෝජනාවක් හෝ සාක්ෂිකරුට කර නැත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසන ලද අවස්ථාවේ 01 වූදිත යෝජනා කර ඇත්තේ නුවර එලියේ දී පංති පැවැත්වූ විට එහි දී ජිහාද් දේශනා සිදුකරන විට ආයුධ සන්නද්ධව සටන් කල යුතු බවට තමා විසින් කිසිවිටෙක පවසුවේ නැති බවට වන අතර එම යෝජනාව සාක්ෂිකරු තරයේම ප්‍රතික්ෂේප කර ඇති අතර එම යෝජනාව තුළින් ම පෙනී යන්නේ 01 වූදිත විසින් නුවරඑළියේ එලෙස පංති පවත්වා ඇති බව සහ එම අවස්ථාවේ දී ජිහාද් සම්බන්ධ දේශනා ද කල බව ඔහු විසින් ම පිළිගෙන ඇති බව වේ.

පළවැනි චූදිත මෙන්ම මෙම නඩුවෙහි සාක්ෂිකරුගේ 03 චූදිත මිල්හාන් විසින් ද, 04 වන චූදිත සාදික් අබ්දුල්ලා විසින්ද, 05 වන චූදිත සාහිඩ් අබ්දුල් හක් විසින්ද, 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාදික්, 14 වන චූදිත රශීද් මොහොමඩ් ඊබ්‍රාහිම් විසින්ද, 19 වන චූදිත කච්චි මොහොමෙදු මොහොමදු ජෙම්සිත් සහ 20 වන චූදිත සෙයිනුල් ආබ්දීන් මොහොමඩ් ජසීම් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර මෙම සාක්ෂිකරු ඔහු විසින් මූලික සාක්ෂියේදී දරන ලද ස්ථාවරයේම පිහිටා පිළිතුර ලබාදී ඇති ආකාරය ඔහුගේ සාක්ෂිය තුළින් පෙනී යයි. ඔහුව හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී ඔහු විසින් පොලිසියට ලබා දී ඇති ප්‍රකාශ ආශ්‍රයෙන් පරස්පරතා කිසිවක් සලකුණු කිරීමක් මෙම නඩුවේ චූදිතයින් විසින් සිදුකර නොමැති අතර මෙම සාක්ෂිකරු ඔහු විසින් මුලින්ම පොලිසියට ප්‍රකාශයක් ලබා දීමේදී සත්‍ය කරුණු නොපවසා සිටීමට හේතුව සහ ඉන් පසුව ඔහු විසින්ම තීරණය කර සත්‍ය කරුණු හෙළි කරමින් දීර්ඝ ප්‍රකාශයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදී ඇති ආකාරය පෙනී යන අතර ඔහුගේ සමස්ථ සාක්ෂිය ඇඟයීමට ලක්කිරීමේදී ඔහුට දීර්ඝ කාලයක් තිස්සේ හඳුනන ඉහතකී චූදිතයින්ට එරෙහිව අසත්‍ය සාක්ෂි මෙම අධිකරණය ඉදිරියේ පවසා සිටීමට කිසිදු හේතුවක් තිබෙන බවක් අපහට පෙනී යන්නේ නැත. ඔහුගෙන් අපරාධ නඩු විධාන පනතේ 121(1) වගන්තිය යටතේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවට හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමක් සිදුකර ඇති අතර එසේ වුවද ඔහු අපරාධ

සහායකයකු ලෙස නම් කිරීමක් කර ඔහුව සැකකරුවකු ලෙස හෝ ඉදිරිපත් කර තිබූ බවට කරුණු කිසිවක් පෙනී යන්නේ නැත. ඔහු විසින් සාක්ෂි ලබාදුන් විලාශය නිරීක්ෂණය කිරීමට අපහට අවස්ථාව ලැබුණ අතර ඔහු විසින් ඔහුගෙන් දීර්ඝ ලෙස විත්තියෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී පිළිතුරු ලබාදුන් ආකාරය නිරීක්ෂණය කිරීමේදී ඔහු සත්‍ය කරුණු වසන් කරමින් සාක්ෂි ලබාදුන් සාක්ෂිකරුවකු බවට අපහට පෙනී යන්නේ නැත. ඔහුගේ සාක්ෂියට අනුව සහරාන් නැමති ස්වයංඝාතක බෝම්බකරු විසින් පවත්වන්නට යෙදුණු යම් යම් පුහුණු වැඩසටහන්වලට ඔහු සහභාගිවී ඇත්ද, එසේම සහරාන් විසින් නුවරඑළියේ පැවති වැඩමුළුවේදී මෙම සාක්ෂිකරුවද මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ කණ්ඩායමට නම් කර තිබුණද, සහරාන් ඇතුළු කණ්ඩායම විසින් සිදුකරන්නාවූ ක්‍රියාවන් ඉස්ලාම් දහමේ මූලික ඉගැන්වීම්වලට පරිබාහිර වූ මතවාදයන් බවට කරුණු වටහාගැනීමෙන් පසුව ඔහු නිවැරදි මාර්ගයට පැමිණීමට ඔහු විසින්ම තීරණය කර මෙලෙස සහරාන් ඇතුළු ස්වයංඝාතක බෝම්බකරුවන් සම්බන්ධයෙන් සහ සහරාන්ගේ අනුගාමිකයන් ලෙස සිටින ලද තැනැත්තන්ට එරෙහිව ඔහු මෙලෙස සාක්ෂි ලබාදීමට ඉදිරිපත් වී තිබීම කිසිදු බලපෑමකින් තොර, ඔහු විසින් ස්වේච්ඡාවෙන් ගෙන ඇති පියවරක් බවට අපහට පෙනී යන අතර ඒ අනුව ඔහු දීර්ඝ කලක් තිස්සේ ඇසුරු කරන ලද ඔහුගේම මිතුරන්ට එරෙහිව අසත්‍ය සාක්ෂි මෙම අධිකරණය ඉදිරියේ ලබාදීමට තරම් විශේෂ හේතුවක් තිබූ බවක් අපහට

කිසිසේත් පෙනී යන්නේ නැත. ඒ අනුව ඔහු ලබාදුන් සාක්ෂිය සත්‍ය, විශ්වාසනීය සාක්ෂියක් ලෙස අප තීරණය කරමු.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1402 මොහොමඩ් මිස්බාර් අහමඩ් මුන්සික් යන සාක්ෂිකරු අධිකරණය සාක්ෂි ලබා දෙමින් ඔහු කල්එළිය ප්‍රදේශයේ පදිංචි වෙලා සිටින බවත් එහි තමාගේ පවුලේ අය සමඟ පදිංචි වී සිටින බවත් තමා 2021 වසරේ කොළඹ ප්‍රදේශයට ආව බවත් පවසා ඇති අතර ඊට ප්‍රථමයෙන් තමා මාවනැල්ල ප්‍රදේශයේ ස්ථාන තුනක තමාගේ පවුලේ අය සමඟ පදිංචි වී සිටි බවත් පවසා ඇති අතර ඔහුගේ අධ්‍යාපන පසුබිම පිළිබඳව සඳහන් කරමින් ඔහු සඳහන් කර ඇත්තේ ඔහු 1999 වසරේ අ.පො.ස සාමාන්‍ය පෙළ හදාරා 2002 වසරේ උසස් පෙළ හදාරා 2004 වසරේ එච් එන් ඩී ඩිප්ලෝමාවක් කළ බවත් ඉන්පසු 2010 වසරේ කොළඹ විශ්ව විද්‍යාලයේ බිස්නස් මැනේජ්මන්ට් ඩිප්ලෝමාවක්ද සිදු කළ බවත් ඊට අමතරව බිස්නස් මැනේජ්මන්ට් පිළිබඳ පශ්චාත් උපාධියක් ඔන්ලයින් ඔස්සේ ඉන්දියානු විශ්ව විද්‍යාලයකින් කළ බවත් ඔහු පවසා ඇත. ඔහුගේ පාසල් අධ්‍යාපන පසුබිම ගැන සඳහන් කරමින් ඔහුගේ පහේ ශිෂ්‍යත්වය දක්වා ගමේ පාසල වන අලිගාර් මහා විද්‍යාලයට ගිය බවත් ඉන්පසු ශිෂ්‍යත්වය සමත් වීමෙන් පසු කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයට පැමිණ අ.පො.ස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ යන දෙකම දෙමළ මාධ්‍යයෙන් සිදු කළ බවත් පවසා ඇත. එසේම, ඔහු ඩී.එස්.

සේනානායක විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරූ කාලයේ එහි දෙමළ සිංහල භාෂාව විෂයක් ලෙස තිබුණේ නැති බවත් කෙසේ වෙතත් තමාට හතර සහ පහ ශ්‍රේණි වල සිටි කාලයේ පටන්ම සිංහල පිළිබඳ මූලික දැනීමක් තිබුණ බවත් ඉන්පසු තමා සිංහල කියවන්න අහන්න කතා කරන්න පුරුදු වුණ බවත් කෙසේ වෙතත් තමා වෘත්තීමය වශයෙන් සිංහල භාෂාව ඉගෙනගෙන නැති බවත් පවසා ඇති අතර මෙම සාක්ෂිකරු අධිකරණය හමුවේ සාක්ෂි ලබා දුන්නේ සිංහල භාෂාවෙන් වේ.

සාක්ෂිකරුගේ සාක්ෂි අනුව ඔහු 2004 වසරේදී ශ්‍රී ලංකා ඉස්ලාම් ශිෂ්‍ය සංවිධානයේ සාමාජිකයෙක් බවට පත් වුණ බවත් 2004 වසරේ සිට 2008 වසර දක්වා එහි සාමාජිකයෙක් වශයෙන් සිටි බවත් 2009 වසරේ තමා ඒ ලේකම් බවට පත් වුණ බවත් 2010, 11 සහ 12 වසර වලදී තමා එහි ප්‍රසිඩන්ට් බවට පත් වුණ බවත් පවසා ඇත. එම සංවිධානයේ සාමාජිකයින් සෑම තැනම සිටින බවත් ඔහු පවසා ඇත. එසේම, එම ශිෂ්‍ය සංවිධානයට සම්බන්ධව ප්‍රධාන වශයෙන් කටයුතු කළ අය රාශියක් සිටි බවත් ඉර්ෆාන් නැමැත්තාද සාදික් නැමැත්තාද තමාලා සමඟ සිටි බවත් තමා එහි සේවය කළ කාලයේ සාදික් නැමැත්තා කෝඩිනේටර් පොසිෂන් එකේ සිටි බවත් තමා පැවසූ සාදික් නැමැත්තාගේ ගෙවල් දෙල්ගහගොඩ ප්‍රදේශයේ බවත් කෙසේ වෙතත් සාදික් සහ තමා අතර ලොකු වයස පරතරයක් තිබුණ බවත් සාදික් ශ්‍රී ලංකා ඉස්ලාමීය ශිෂ්‍ය ව්‍යාපාරයේ සම්බන්ධීකාරක එනම්

කෝඩිනේටර් ලෙස වැඩ කරන ලද බව තමා දන්නා බවත් පවසා ඇති අතර එම සාදික්ගේ නිවස පිහිටි දෙල්ගහගොඩ පිහිටා තිබුණේ මාවනැල්ල ප්‍රදේශයේ බවට සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු විවෘත අධිකරණයේ සිටි චූදිතයන් අතරින් මෙම නඩුවේ 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයව පෙන්වා තමා පැවසූ සාදික් එම නැමැත්තා බවත් තමා ඔහුගේ මල්ලී වන සාහිත් නැමැත්තාවද හඳුනන බවත් ඔහුගේ පියා වන ඉබ්‍රාහිම් නැමැත්තාවද හඳුනන බවත් පවසා එම අධිකරණයේ 5 වන චූදිත ලෙස සිටින මොහොමඩ් ඉබ්‍රාහිම් සාහිත් අබ්දුල් හක් යන අයද එසේම, මෙම නඩුවෙහි 14 වන විත්තිකරු වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් යන අයවද විවෘත අධිකරණයේදී පෙන්වා හඳුනාගෙන ඇත.

එසේම, තමා ඔවුන්ගේ නිවසට දෙපාරක් පමණ ගොස් තිබුණ බවත් පවසා ඇති අතර එලෙස ගියේ බොහෝ දුරට 2018 වසරේ බවට පවසා ඇත. තමාලාගේ ශිෂ්‍ය ව්‍යාපාරයේ අරමුණ වුණේ ළමයින්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සහ ආධ්‍යාත්මික පැත්තෙන් ඉස්ලාමීය පැත්තෙන් දැනුම ඉදිරියට ගැනීම බවත් පවසා ඇති අතර එසේම, මේ වන විට එම ශිෂ්‍ය සංවිධානය තහනම් කරපු සංවිධානයක් බවට පත්වී ඇති බවත් එය තහනම් කරන ලද්දේ එහි සාමාජිකයන් පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ බවට වූ චෝදනා මත බවට තමා සිතන බවත් සාක්ෂිකරු පවසා ඇත. පාස්කු

ප්‍රහාරය 2019 වසරේ සිදුවුණ බවත් පාස්කු ප්‍රහාරයෙන් පසු අවස්ථාවක තමාව ආමි එකෙන් අත්අඩංගුවට ගෙන පැය 24කට පසු මාවනැල්ල පොලීසියට භාර දුන් බවත් තමාව එලෙස අත්අඩංගුවට ගෙන මාවනැල්ල පොලීසිය මගින් තමා සම්බන්ධයෙන් විමර්ශනය පැවැත්වූයේ සාදික්ට රට යන්න අනුබල දීමේ චෝදනාව සම්බන්ධයෙන් බවත් සාදික් 2012, 2013 හෝ 2014 වසර වලින් එක අවුරුද්දක තුර්කි රටට ගිය බවත් එලෙස යන්නට ප්‍රථමයෙන් ඔහු තමා සමඟ ඒ ගැන සාකච්ඡා කළ බවත් තමාලා සහිරා පල්ලියේදී අහමඩ් නැමැති පුද්ගලයෙක්ව මුණගැසුණ බවත් එහිදී රටේ පවතින තත්ත්වය, ලෝකයේ තත්ත්වය ගැන තමාලාට පවසා ලංකාවේ ඒ දිනවල මුස්ලිම් මිනිසුන් ලොකු පීඩනයක සිටි බව සහ දීගන ප්‍රශ්නය සහ දර්ගා ටවුම් වල සිදුවූ සිද්ධියද තවත් බොහෝ තැන් වලදී මුස්ලිම් අයට පහර දී ගෙවල් වලට ගිනි තැබීම්, කඩවල් වලට ගිනි තැබීම් වැනි ක්‍රියාවන් සිදුවූ නිසා බොහෝ පීඩන තත්ත්වයක සිටි බවත් එම අවස්ථාවේදී සෙල්ෆ් ඩිෆෙන්ස් කෝස් එකක් තුර්කියේ තිබුණ බවත් යන්න කැමති කෙනෙක්ට මම උදව් කරන්නම් යැයි එකී අහමඩ් නැමැත්තා පැවසූ බවත් එම අවස්ථාවේ එම ස්ථානයේ සාදික් මෙන්ම ඉර්ෆාන් යන අයද තමාද සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා එලෙස අහමඩ් ලෙස පැවසූ තැනැත්තාගේ නම අහමඩ් ලුක්මන් තාලිබ් බවත් එම තැනැත්තාගේ පියා තමාලාගේ ගමේ කෙනෙක් වුවද ඔහු ඕස්ට්‍රේලියානු පුරවැසියෙක් බවත් අහමඩ් නැමැත්තාද ඕස්ට්‍රේලියානු පුරවැසියෙක් බවත් වරෙක ඔහු

තමාට ගමේදී මුණගැසුණ බවත් එම අවස්ථාවේදී ඔහු තුර්කියේ ඉඳලා ආවා යැයි තමාට පැවසූ බවත් තමාට එලෙස පවසා සිටියේ අහමඩ් ලුක්මන් තාලිබ් එනම් තාලිබ් විසින් බවත් පවසා ඇත. එසේම, එම අහමඩ් ලුක්මන් තාලිබ් යන අයගේ පියාගේ නම ලුක්මන් තාලිබ් බවත් එම තැනැත්තා පදිංචිව සිටියේ තමා පදිංචි කල්ලෙලිය ප්‍රදේශයේ බවත් පවසා ඇත. තමා පවසා සිටි සහරා පල්ලිය කොළඹ සහිරා විද්‍යාලයත් සමඟම තිබෙන පල්ලිය බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එම කාලයේ තමා ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ශිෂ්‍ය සංගමයේ වැඩ කළ බවත් ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ඔෆිස් එක මරදානේ පැවති බවත් එවකට එම ජමාතේ ඉස්ලාම් සංවිධානයේ ප්‍රධානියා ලෙස අජ්ජුල් අක්බර් නැමැත්තා සිටි බවත් මෙම නඩුවේ 4 වන සහ 5 වන චූදිතයින්ගේ මාමා එකී අජ්ජුල් අක්බර් නැමැත්තා බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම නඩුවේ 14 වන චූදිත වන ඉබ්‍රාහිම් නැමැත්තාද ජමාතේ ඉස්ලාම් සංවිධානයේ කටයුතු කළ බවත් එම තැනැත්තා සහ අජ්ජුල් අක්බර් යන අය සහෝදරයන් බවත් සාක්ෂිකරු පවසා ඇත.

මරදානේ සහිරා පල්ලියේදී තමා පැවසූ පරිදි අහමඩ් ලුක්මන් තාලිබ් නැමැත්තා තමා සමඟ කරන ලද සාකච්ඡාවේදී තුර්කියේ සෙල්ෆ් ඩිෆෙන්ස් පාඨමාලාවට යාමට සාදික්ට එනම් 4 වන චූදිතට කැමැත්තක් තිබුණ බවත් තුර්කි රටට යාමට නම් තුර්කි භාෂාව ඉගෙන ගැනීම කළ යුතු බවත් ඒ සඳහා තුර්කි භාෂා පාඨමාලාවකට ඉල්ලුම් කර ඒ ආකාරයෙන් වීසා ඉල්ලුම්

කළොත් යන්න පුළුවන් බවට තමාලා දෙදෙනා සාකච්ඡා කළ බවත් ඉන්පසු තමා සහ 4 වන චූදිත සාදික් විසින් අන්තර්ජාලය ඔස්සේ ඒ ගැන විස්තර පරික්ෂා කර බැලූ බවත් කෙසේ හෝ 4 වන චූදිත සාදික්ට තුර්කි රටට යාමට අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීමේ ක්‍රියාවලියට තමා උදව් කළ බවත් තමාගේ යාළුවෙක් හරහා තමා ඔහුට ටිකට් එක ගන්න කටයුතු සූදානම් කළ බවත් ඒ සඳහා කවුරු විසින් මුදල් ගෙව්වාද යන්න තමාට මතක නැති බවත් තමා හරහා ඊමේල් එකකින් ගුවන් ටිකට් පත සූදානම් කර ඔහුට ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. ඒ අනුව සාදික් තුර්කියට ගිය බවත් ඉන්පසු ඔහු නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු තමාට කතා බහ කළ බවත් ඔහු තමාට කතා කළේ ඔහු තුර්කියට යාමෙන් අවුරුද්දක වැනි කාලයක් තුළ බවට තමාට මතක බවත් ඔහු ලංකාවට පැමිණි පසු තමා ඔහු තුර්කියට ගොස් කළේ කුමක්ද යන්න සම්බන්ධයෙන් ඔහුගෙන් කරුණු විමසා සාකච්ඡා කළ බවත් එසේම, එහිදී ඔහු ‘‘තුර්කියට ගොස් ඉන්පසු එහේ සිට තුර්කි දේශ සීමාව පසු කර සිරියාව පැත්තටත් ගිහිල්ලා එහි ටික කාලයක් ඉඳලා නැවතත් තුර්කියට ආවා කියලා’’ යැයි පැවසූ බවත් එම අවස්ථාවේදී තමාටද ලොකු ගැටලුවක් ඇති වුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා පෙර කී අහමඩ නැමැත්තා කීවේ ආත්මාරක්ෂක පාඨමාලාවක් සඳහා තුර්කියට යනවා සම්බන්ධයෙන් බවත් කෙසේ වෙතත් සාදික් තමාට පවසා සිටියේ තුර්කියේ සිට සිරියාවට ගිය බවත් සිරියාවේ එම කාලයේ යුද්ධයක් පැවති ප්‍රදේශයක් බවත් ඒ අනුව එලෙස යුද්ධයක්

පැවති සිරියාවට සාදික් ගියා යැයි සාදික් විසින්ම පැවසීම තමාට ඒයින් ලොකු කම්පනයක්ද ඇති වුණ බවත් සාක්ෂිකරු පවසා ඇත.

සිරියාවෙහි එම කාලයේ අල්කයිඩා ඇතුළු කණ්ඩායම් සහ එරට ආණ්ඩුව අතර යුද්ධමය තත්ත්වයක් පැවති බවත් එසේම, එම අවස්ථාවේ තමා සාදික්ව අමතා සාදික්ට පවසා සිටියේ දැන් ඔයා වෙපන් එක එතන එතන ඉඳලා ඇති. නමුත් අපි වගේ රටකට ඒක අවශ්‍ය නැහැ. කවදාවත් ඕක යූස් කරන්න යන්න එපා යැයි තමා 4 වන වූදිත සාදික්ට පැවසූ බවත් සාදික් තමා පවසන දේවල් සාමාන්‍යයෙන් අහන බවත් ඉන්පසුව තමා සාදික් සමඟ ඒ දේවල් ගැන සාකච්ඡා කළේ නැති බවත් ඔහු පවසා ඇත. සිරියාවේ පැවති රජය එහි මිනිසුන්ට අපරාධ කරන නිසා එරට මිනිස්සු ආයුධ අරන් රජයට එරෙහිව යුද්ධ කළ බවත් ලංකාවේ එහෙම එකක් නැති හින්දා සිරියාවේ එවන්නක් තිබුණද ලංකාවේ එහෙම උවමනාවක් නැහැ යැයි තමා සාදික්ට පවසා සිටි බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, අහමඩ් ලුක්මන් තාලිබ්වද තුර්කියේදී තමාට හමුවුණ බවට සාදික් තමාට පැවසූ බවත් තමා කිසිදු අවස්ථාවක සාදික් සමඟ ලංකාවේදී අහමඩ් ලුක්මන් තාලිබ්ව හමුවී නැති බවත් කෙසේ වෙතත් තමා ඔහුගේ තාත්තාව මුණගැසී තිබුණ බවත් අහමඩ් ලුක්මන් තාලිබ්ගේ තාත්තා මහාචාර්යවරයෙක් බවත් ඔහු කල්ලෙලිය ප්‍රදේශයේ පොඩි ගම්මානයක සිට ඕස්ට්‍රේලියාවේ මහාචාර්ය කෙනෙක් බවත් ඒ අනුව ඔහුව හැමෝම දන්නා බවත් ඔහු ගමට ආපුවාම පල්ලියේදී ගමේ මිනිස්සු ගොස් ඔහු සමඟ

කතා කරන බවත් වරෙක ජමාත් ඉස්ලාම් වැඩසටහනකටද ඔහු පැමිණ සිටි බවත් එම වැඩසටහන පැවතුණේ කල්ලෙලියේදී බවත් තමාද ගොස් ඔහු සමඟ කතා බහ කළ බවත් පවසා ඇත.

එසේම, සාක්ෂිකරු වැඩදුරටත් පවසා ඇත්තේ තමා මෙම නඩුවේ 5 වන චූදිත වන සාහිත් සහ ලුක්මන් තාලිබ් නැමැත්තාද තවත් පුද්ගලයෙකුද ගමනක් ගිය බවත් ඒ සඳහා තමාට කතා කළේ ලුක්මන් තාලිබ් බවත් අඳුරන කෙනෙක් හම්බවෙන්න යනවා යැයි තමාට පැවසූ බවත් තමා එහි පසුබිම දැනගෙන සිටියේ නැති බවත් තමාලාට යන්න වාහනයක්ද සූදානම් කළ බවත් එහි තමාලා සමඟ 5 වන චූදිත සාහිත් සහ තවත් කෙනෙක් ගිය බවත් එම තැනැත්තා කවුද යැයිද තමාට මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එම කාලයේ ලුක්මන් තාලිබ් ඔහුගේ නංගීගේ ගෙදර එනම් තිහාරියේ පිහිටි ඔහුගේ නංගීගේ ගෙදර නැවතී සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. ඉන්පසු තිහාරියේ සිට ලොකුද මුණගැසී තමාලා ත්‍රිකුණාමලය පැත්තේ තෝපූර් හෝ මුතූර් හෝ යන නමකින් යුතුව ස්ථානයකට ගිය බවත් එම නම් දෙක තමාට පැටලිලි සහගත බවත් තෝපූර් හෝ මුතූර් යන ප්‍රදේශ දෙකෙන් එකකට තමාලා එලෙස ගිය බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා එලෙස ගමන් කිරීමේදී තමාට ස්ථානය සොයා ගන්න බැරි වුණ බවත් අන්තිමට තමාලා මුහුදු වෙරළක් තිබුණ ස්ථානයකට ගිය බවත් ඒ ආසන්නයේ ගෙවල් තිබුණ බවත් එහිදී ලුක්මන් ''තාලිබ්ව හමුවෙන්න ඕනේ'' යැයි පවසා ඇති තැනැත්තා එම ස්ථානයට පැමිණි බවත් එම

තැනැත්තා සහ ලුක්මන් තාලිබ් කතා කර කර බීච් එක පැත්තට ගිය බවත් තමාලා බෙන්ච් එකේ වාඩි වෙලා සිටි බවත් ඉන්පසු එම දෙදෙනා නැවත ආවට පසු තමාලා ඒදින රාත්‍රී කෑම කෑ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, ලුක්මන් තාලිබ්ව මුහුදු වෙරළේදී මුණගැසුණ තැනැත්තා අඹ ගස් හේන ඉඩමක් සම්බන්ධයෙන් ලුක්මන් තාලිබ් සහ ඔහු මුණගැසීමට එම ස්ථානයට පැමිණි තැනැත්තා කතා කරනවා තමාගේ කනට ඇසුණ බවත් කෙසේ වෙතත් එම ඉඩම පොඩි ඉඩමක්ද විශාල ඉඩමක්ද යන්න කිසිවක් තමා දන්නේ නැති බවත් එදින එම ඉඩම බලන්න ගියේ නැති බවත් එදින රාත්‍රී තමාලා නැවතී සිටියේද එලෙස ලුක්මන් තාලිබ්ව හමුවෙච්ච පුද්ගලයාගේ නිවසේ බවත් තමාලා එලෙස ලුක්මන් තාලිබ් සමඟ ගිය ගමනේදී ලුක්මන් තාලිබ්ව හමුවුණ තැනැත්තාගේ නම එම පුද්ගලයාගේ නමින් තමන් දැනගෙන සිටියේ නැති බවත් තමාගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී කට උත්තරයක් ගන්න අවස්ථාවේදී ඒ නම අහලා එම තැනැත්තාව එම නම තමාලාගෙන් ඇසීමේදී තමාට එම තැනැත්තාගේ නම මොහිදීන් යන නම බවට මතක් වුණ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර පසුව තමාලා එම මොහිදීන් නැමැත්තාගේ නිවසේ සිට එදිනම රාත්‍රියේ පිටත්වී තිහාරියේ පිහිටි ලුක්මන් තාලිබ්ව තිහාරියට පැමිණ ලුක්මන් තාලිබ්ව එහි බස්සා තමා ඔහු කල්ලෙලියේ නිවසට බස්සා තමාලා සමඟ ගිය අනිත් අය පිටවී ගිය බවත් ඉන්පසු නැවත වතාවක් තමාට ලුක්මන් තාලිබ්ව ලුක්මන් තාලිබ්ගේ අයියාගේ අවමංගල්‍ය කටයුත්තකදී

කල්ලෙලියේ ගමේදී 2014 හෝ 2015 වසරේදී හමුවුණ බවත් තමා දන්නා පරිදි ලුක්මන් තාලිබ් නැමැත්තා අවසාන වතාවට කල්ලෙලියේ ගමට පැමිණියේ ඔහුගේ අයියාගේ මරණ ගමේ කටයුතු සඳහා බවත් පවසා ඇත.

එසේම, පෙර අවස්ථාවක ලුක්මන් තාලිබ් තමාට පොතක් ප්‍රින්ට් කිරීම සඳහා මුදල් වගයක් ලබා දී තිබුණ බවත් එම මුදල් තමා අතින් වියදම් වුණ බවත් තමා එම මුදල් නැවත රිටර්න් කරන්න ඕනේ යැයි ලුක්මන් තාලිබ්ට පැවසූ විට එලෙස අවශ්‍ය නැති බවට ලුක්මන් තාලිබ් තමාට පැවසූ බවත් එම මුදල ලංකාවේ මුදලින් රුපියල් ලක්ෂ තුනකට ආසන්න මුදලක් බවත් එලෙස ලංකාවේ මුදලින් ලක්ෂ තුනකට ආසන්න මුදලක්ට සමාන ඩොලර් ප්‍රමාණයක් එලෙස තමාට ඔහු ලබා දී තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. තමාට මුද්‍රණය කරන්නට යැයි සල්ලි ලබා දුන්නේ ඩොක්ටර් තාරික් සුවයිදාන් නැමැත්තාගේ ස්පීච් එක යූටියුබ් එකේ තිබුණ බවත් එය ද ෆියුචර් ඔෆ් ඉස්ලාම් යනුවෙන් තිබෙන වැඩසටහනක් බවත් එය දෙමළ භාෂාවට පරිවර්තනය කර පොතක් විදිහට මුද්‍රණය කිරීම සඳහා තමාට එලෙස මුදල් ලබා දීම කළ බවත් ඒ වන විටත් එය දෙමළ භාෂාවට පරිවර්තනය කර තිබුණ බවත් ඒ මුද්‍රණය කිරීමේ කාර්ය සඳහා තමාට එලෙස මුදල් ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර කෙසේ වෙතත් තමාට එම පොත මුද්‍රණය කිරීමේ වැඩ කර ගැනීමට නොහැකි වුණ බවත් එම සල්ලි තමා අතින් වියදම් වුණ බවත් කෙසේ වෙතත් ඊට අදාළ පොතද

ඩිසයින් කර තිබුණද තමාට ඒ මුද්‍රණය කර ගැනීමට හැකියාවක් තිබුණේ නැති බව සාක්ෂිකරු පවසා ඇත.

තමා පැවසූ තාරික් සුවයිදාන් නැමැත්තාගේ දේශනයේ අඩංගු වී තිබුණේ නබිතුමාගේ කාලයේත් ඊට පසු කාලීනවත් මෙම ලෝකයේ මුස්ලිම්වරුන් පාලනය කරනකොට හොඳ පාලනයක් තිබුණ බව සහ ඉන්පසු මුස්ලිම්වරුන් එම පාලනයෙන් ඈත් වූ පසු මෙම ලෝකයේ හොඳ පාලනයක් තිබුණේ නැති බව සහ මිනිසුන්ට බොහෝ අසාධාරණ වෙලා තිබුණ බව නබිතුමාගේ කාලයේදීත් බොහෝ අසාධාරණ වෙලා තිබුණ බව සහ ඊට පසු කාලයේත් බොහෝ අසාධාරණ වී තිබුණ බව සහ මුලින් පැවතිච්ච නීතිය සාමය පසු කාලයේ තමාට දකින්නට බැරි බව සහ ඉදිරියට නබිතුමාගේ කාලය වගේම තවත් කාලයක් ඒවී යැයි එම දේශනයේ සඳහන් කර තිබුණ බවත් එම දේශනයේදී තවදුරටත් පවසා තිබුණේ මුස්ලිම් සමාජයක් විදිහට හොඳ කාලයක් ඇති කරන්න තමන්ට පුළුවන් හැකියාවෙන් දායකත්වය දෙන්න ඕනේ යැයි එහි සඳහන් කර තිබුණ බවත් සාක්ෂිකරු පවසා ඇත. පසුව තමාට සාජිත් නැමැති පුද්ගලයෙකු කතා කර මෙහෙම පොතක් ඔයාට දීලා තියෙනවාද යැයි තමාගෙන් ඇසූ බවත් එම අවස්ථාවේදී තමාට එවැනි පොතක් ලබා දී තිබුණ බවත් එය සාජිත් නැමැත්තාට ලබා දෙන ලෙසත් ඔහු ඒක කරන්නම් යැයි තමාට පැවසූ බවත් එසේම, සාජිත් තමාගෙන් අසා සිටියේ ලුක්මන් අන්කල් විසින් මෙම සාක්ෂිකරුට පොතක් දුන්නාද යන්නෙන් බවත් සාක්ෂිකරු පවසා ඇත. එම

සාජිත් නැමැත්තාද තමා ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙක්ව සිටි කාලයේ සිටම දන්නා බවත් ඔහුද මාවනැල්ලේ පදිංචි අයෙක් බවත් ඔහුද ශිෂ්‍ය සංගමයේ වැඩසටහන් වලටද පැමිණි අයෙක් බවත් පවසා ඇති අතර ලුක්මන් තාලිබ් එම සාජිත් නැමැත්තාගේ තාත්තාවද හඳුනන බවත් සාක්ෂිකරු පවසා ඇත. මුල් අවස්ථාවේදී මෙම සාක්ෂිකරුට එම සාජිත් නැමැත්තාව හඳුනා ගන්න පුළුවන් වේවී යැයි පවසා ඔහු මුලින් උත්සාහ කිරීමේදී ඔහු පවසා ඇත්තේ මට ඔහු හඳුනා ගන්න බැහැ යැයි වන අතර කෙසේ වෙතත් පසුව හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී මෙම සාක්ෂිකරු විසින් එම සාජිත් නැමැත්තා මෙම නඩුවේ 9 වන විත්තිකරු බවට සිටින තැනැත්තා බවට පෙන්වා දෙමින් ඔහුව හඳුනා ගැනීමක් කර ඇත. එසේම, සාජිත් නැමැත්තාගේ පියාද ජමාත් ඉස්ලාම් සංවිධානයේ කෙනෙක් බවත් එම සාජිත්ගේ තාත්තාගේ නම රමීෂ් බවත් තමා ඔහු හඳුනන බවත් එම සාජිත් නැමැත්තා තමාට වඩා වයසින් අඩු බවත් සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරු වැඩදුරටත් පවසා ඇත්තේ ඔහු 2015 අගෝස්තු සෞදි අරාබියට ගොස් 2017 දෙසැම්බර් ලංකාවට පැමිණි බවත් තමා සෞදියේ සිටි කාලයේත් ඊට පසුවත් ජමාත් ඉස්ලාමී සංවිධානය සමඟ සම්බන්ධයක් තිබුණේ නැති බවත් මේ වනතෙක් තමාට එම සංවිධානය සමඟ සම්බන්ධයක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

සාදික් සිරියාවට ගොස් පැමිණි පසු තමාට ආපු කම්පනය නිසා සහ අහමඩ් ලුක්මන් තාලිබ් විසින් එලෙස සාදික් සමඟ සිටි බවත් සම්බන්ධයෙන්ද තමාගේ හිතට අමාරුවක් තිබුණ බවත් ඒ අනුව තමා සාදික් සමඟ යලි සම්බන්ධකම් කිසිවක් තබා ගත්තේ නැති බවත් තමාට අවශ්‍යතාවයක්ද තිබුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එනම් සාදික් වැනි කෙනෙක් සිරියාවට ගොස් ආයුධ සන්නද්ධ කණ්ඩායමක් එක්ක අපිට සම්බන්ධයක් තබා ගන්න ලංකාවේ මිනිස්සු හැටියට අවශ්‍ය නැති නිසා තමා එය හොඳ නැති දෙයක් යැයි පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තමා සෞදි අරාබියට ගොස් පැමිණීමෙන් පසු වරෙක තමාට ඉන්ටාර් වැඩසටහනකට ගොස් එන විට තමාට සාදික්ව වරෙක මුණගැසුණ බවත් 2017 වසරේ තමා නුවර ප්‍රදේශයේ වැඩ කළ බවත් එහිදී සාදික් හෝ සාහිත් විසින් තමාට දුරකථන ඇමතුමක් ලබා දුන් බවත් එම වෙලාවේ තමා බස් එකේ සිටින බවට පැවසූ විට නොම්බි අරින වෙලාව නිසා ‘‘අපේ ගෙදර ඇවිල්ලා නොම්බි ඇරලා යන්න’’ යැයි තමාට කතා කළ බවත් කෙසේ වෙතත් තමාට එහි යාම මග හැරීම සඳහා බොහෝ උත්සාහ කිරීම් තමා කළද ගොඩක් කාලෙකට පසුව තමාට කතා කරලා ආරාධනා කරපු නිසා තමා ඔවුන්ගේ ගෙදරට ගිය බවත් එහිදී සාදික් ඔහු විසින් කරන චිකන් ෆාම් එකක් හරි චිකන් හෝ වෙනත් මොකක් හරි ෆාම් එකක් කරනවා යැයි තමාට පැවසූ බවත් එදින ඉන්ටාර් එක පැවති අවස්ථාවේදී සාදික් තමාට

ලැප්ටොප් එකකින් වීඩියෝ වගයක් පෙන්වන්න හැදූ බවත් තමාට එය බලන්නට උවමනාවක් තිබුණේ නැති වුවද තමාට එම වීඩියෝ එක බලන විට ආරම්භයේදීම තේරුණේ මුස්ලිම් අයට එරෙහි වන සිද්ධීන්වල එකතුවක් එම වීඩියෝවේ තිබුණ බවත් එහි යම් දරුණු ක්‍රියාවන් ගොඩක් තිබුණ බවත් එම වීඩියෝ සම්පූර්ණයෙන්ම බලන්නට තමාට වෙලාවක් තිබුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එහි තිබුණේ මුස්ලිම් අයට එරෙහිව සිදුවන යන වීඩියෝවක් බවත් එසේම, එහි යම් දේශනාවක ආරම්භයක් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා එදා සාදික්ව අමතා ‘‘ඔයාට මුස්ලිම් සමාජයට මොකක් හරි කරන්න ලොකු උවමනාවක් ඇති. ඔයා හොඳට ඉගෙන ගත්ත ළමයෙක්. අපේ ළමයින්ට හොඳට අධ්‍යාපනය ලබා දෙන්න. ඔයාගේ සහාය ලබා දෙන්න’’ යැයි තමා සාදික්ට පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු වැඩදුරටත් පවසා ඇත්තේ තමා අයිඑස් අයිඑස් සංවිධානය ගැන අසා තිබුණ බවත් එය සිරියාව හා ඉරාක් ප්‍රදේශයේ තිබුණ බවත් ක්‍රියාකාරීව පැවති බවත් එය ආයුධ සන්නද්ධ ත්‍රස්තවාදී සංවිධානයක් බවත් 4 වන චූදිත සිරියාවට ගියා යැයි පැවසූ කාලයේ සෑම ත්‍රස්තවාදී සංවිධානයක්ම ක්‍රියාකාරීව පැවතිච්ච කාලය බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එසේම, සාක්ෂිකරු වැඩදුරටත් පවසා ඇත්තේ තමා 4 වන චූදිත සාදික් සහ 5 වන චූදිත සාහිත් යන අය අතර පැවති සම්බන්ධතාවයන් සහ ඔවුන් සමඟ සම්බන්ධ වූ අවස්ථාවන් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයෙකුට තමන්ගේ කැමැත්තෙන්ම ප්‍රකාශ

ලබා දුන් බවත් එසේම, තමා විසින් මාවනැල්ල පොලීසියටද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයටද කොළඹ අපරාධ කොට්ඨාසයට යන ආයතන වලටද විවිධ අවස්ථාවලදී ප්‍රකාශ ලබා දී තිබුණ බවටත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් ප්‍රථමයෙන්ම හරස් ප්‍රශ්න අසන ලද්දේ මෙම නඩුවෙහි 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් වේ.

4 වන චූදිත හරස් ප්‍රශ්න අසන අසමින් සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුගේ සාක්ෂි ලබා දීමේදී මෙම සාක්ෂිකරු සමඟ සාදික් අබ්දුල්ලා යන අය තුර්කි රටට ආත්මාරක්ෂක වැඩමුළු වලට යාම සම්බන්ධයෙන් අවශ්‍ය බව සහ තුර්කි භාෂාව ඉගෙන ගත යුතු බවට පැවසූ බවට වන කාරණය සාකච්ඡා කළ බවට පැවසූ කරුණ අසත්‍යයක් බවට මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත. එසේම, මෙම සාක්ෂිකරු විසින් 2019.06.29 වන දින පොලීසියට ලබා දුන් ප්‍රකාශයේ තුර්කි රටේ භාෂාව ඉගෙන ගන්න යන්න පුළුවන් තැනක් හොයලා දෙන්න කියලා මට කිව්වා. ඒ අනුව මම ඉන්ටර්නෙට් එකට ගිහිල්ලා මෙම තුර්කි භාෂාව හැදෑරීමට ස්ථානයක් හොයලා එහි වෙබ් සයිට් ලිපිනය මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් හට දුන්නා යැයි සඳහන් කරලා තිබෙනවා යැයි තිබෙන එය යන කරුණ සම්බන්ධයෙන් මතක තිබෙනවාද යැයි ඇසූ විට සාක්ෂිකරු පවසා ඇත්තේ එවැනි සාකච්ඡාවක් සිදුවුණ බවත් එය ඉන්ටර්නෙට් එකේ

සර්ච් කළ බවත් ඒ ගැන තමාලා දෙදෙනා එදා ඒ සම්බන්ධයෙන් කතා වුණ බවත් එසේම, ඉන්ටර්නෙට් එකේ සර්ච් කළ බවටත් තමා පොලීසියට පැවසූ බවටත් සාක්ෂිකරු පිළිගෙන ඇත. එසේම, 4 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දීමෙන් පවසා සිටි පරිදි තුර්කි භාෂාව හදාරන මුවාවෙන් ආත්මාරක්ෂක වැඩමුළු වලට යාම සම්බන්ධයෙන් කතා කළ බවට මෙම සාක්ෂිකරු අධිකරණයට පවසා සිටි දේ ඔහු 2019.06.29 වන දින ප්‍රකාශයේ කිසිදු ස්ථානයක පවසා නැහැ යැයි යෝජනා කර ඇති අතර සාක්ෂිකරු එය නිවැරදි බවට පිළිගෙන ඇත. මෙම සාක්ෂිකරුගෙන් 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් හරස් ප්‍රශ්න අසා අවසන් කළ අවස්ථාවේදී මෙම සාක්ෂිකරු අධිකරණයට මෙම අවස්ථාවේදී මෙම නඩුවේ 9 වන චූදිත වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් යන අය අධිකරණයට පවසා සිටින ලද්දේ ඔහුට හරස් ප්‍රශ්න ඇසීමට පෙර පවසා සිටියේද හරස් ප්‍රශ්න ඇසීමට නැති බවයි. එම අවස්ථාවේ ම මෙම සාක්ෂිකරු අධිකරණය අමතා පවසා ඇත්තේ තමාට මට ඉස්සෙල්ලා සාජිත් කියන පුද්ගලයා හඳුනා ගන්න බැරි වුණා. නමුත් දැන් ආයි මම බලද්දී මට ඒ පුද්ගලයා හඳුනා ගන්න පුළුවන් වුණා යනුවෙන් වන අතර ඉන්පසු සාක්ෂිකරු විවෘත අධිකරණයේ සිටි 9 වන චූදිතව පෙන්වාගෙන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් යන අයව හඳුනාගෙන ඇත. එකී හඳුනා ගැනීම මත 9 වන චූදිත විසින් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න

ඇසීමක් සිදුවන ලද අතර මෙම සාක්ෂිකරු 9 වන චූදිත වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් යන අයගේ හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් පවසා ඇත්තේ තාරික් සුවයිදාන් නැමැති පුද්ගලයා ඉස්ලාමීය ලෝකයේ ප්‍රසිද්ධ පුද්ගලයෙක් බවට පිළිගැනීමට හැකියාවක් තිබුණ බවත් වන අතර 9 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ද ෆියුචර් ඔෆ් ඉස්ලාම් යන දේශනාවේදී ත්‍රස්තවාදය හෝ අන්තවාදය පෝෂණය කිරීම ගැන කිසිම දෙයක් කියලා නැහැ කිව්වොත් හරිද යනුවෙන් යෝජනා කිරීමේදී සාක්ෂිකරු එය හරි යැයි පිළිතුරු දී ඇත. එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පවසා සිටි පරිදි 9 වන චූදිත දුරකථන ඇමතුමක් ගෙන පොත පරිවර්තනය කරාද යන්න මෙම සාක්ෂිකරුගෙන් අසා සිටි බවට මෙම සාක්ෂිකරු පැවසූවද එම කාල වකවානුවේ ලංකාව තුළ ආගමික දේශන හෝ ලේඛන පරිවර්තනය කිරීමට යම්කිසි තහනමක් තිබුණා ද යැයි විමසූ විට එවැනි තමාට එවන්නක් මතක නැති බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම දේශනාවේදී ඉස්ලාම් ආගමීය සහ පාලන ඉතිහාසය සහ ඉන් ඉදිරියට ඉස්ලාමීය අනාගතය ගැන නබිතුමාගේ අනාගතය ගැන කතා කර තිබුණ බවට එසේම, අනාගතයේදී ඉස්ලාමීය පාලනයක් ලෝකයේ බිහිවේ යැයි නබි නායකතුමාගේ අනාවැකි විශ්වාස කිරීම ත්‍රස්තවාදයක් හෝ අන්තවාදයක් නෙමෙයි යැයි 9 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇති අතර සාක්ෂිකරු පිළිතුරු දී පවසා ඇත්තේ නබි නායකතුමාගේ වචන විශ්වාස කිරීම අපේ විශ්වාසයේ කොටසක් බවයි.

එසේම, මෙම සාක්ෂිකරු ඉදිරියේදී තමා ආයුධ පුහුණුවක් හෝ පුපුරණ ද්‍රව්‍ය පුහුණුවීම් කිසිවක් අරන් නැහැ යැයි කිව්වොත් හරිද යනුවෙන් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇති අතර මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ ‘‘ඒ ගැන අපි දෙන්නාගේ සම්බන්ධයක් නැහැ යනුවෙන්. එසේම, අපි දෙන්නා පොත ගැන හැර වෙන මොනවත් කතා කරලා නැහැ’’ යැයි සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 14 වන චූදිත වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් විසින් හරස් ප්‍රශ්න අසා ඇති අතර ඔහු මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු සහ 14 වන චූදිත අල්ලා දෙවියන් වෙනුවෙන් සහ ඉස්ලාම් ආගම වෙනුවෙන් ඉස්ලාම් ආගමීය කටයුතු සම්බන්ධයෙන් එකට එකතු වී වැඩ කළා කිව්වොත් හරිද යන්නෙන් වන අතර සාක්ෂිකරු පවසා ඇත්තේ අපි කරන හැම ක්‍රියාවෙන්ම බලපොරොත්තු වෙන්නේ අල්ලාගේ තෘප්තිය බවත් එසේම, 14 වන චූදිත වන තමා ලංකාව තුළ විවිධ ප්‍රදේශයන් වල ඉස්ලාම් දහම සම්බන්ධයෙන් ඉස්ලාම් ජීවන මග පෙන්වීම් සම්බන්ධයෙන් සහ ඉස්ලාම් දහමට ජනතාව එකතු කිරීම් වැනි දේවල් සම්බන්ධයෙන් දේශනා කරලා තියෙනවා බවට යෝජනා කර ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ ‘‘ඔව් ඔබ හොඳ කථිකයෙක්. සමාජයේ ගොඩක් අයව දන්නවා අඳුරනවා. ගොඩක් දේශනා කරලා තියෙනවා’’ යනුවෙන් වේ. එසේම, 14 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ 14

වන චූදිත විසින් කාන්තා වැඩමුළු විශාල වශයෙන් සිදු කර තිබෙන බවත් මෙම සාක්ෂිකරුගේ ප්‍රදේශයේද ඔහු විසින් එවැනි කාන්තා වැඩසටහන් වැඩමුළු සිදු කර ඇති බවට යෝජනා කර ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට ඒ ගැන හරියට මතකයක් නැති බවත් එවන්න සිදු කරලා ඇති යනුවෙන් පවසා ඇත.

එසේම, 14 වන චූදිත වැඩදුරටත් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ 14 වන චූදිත විසින් නූරුල් හුදා ස්පිරිචුවල් කවුන්සලින් යන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යමින් විවිධ වර්ගයේ උපදේශන සේවාවන් සිදු කර ඇති අතර සාක්ෂිකරුද පවසා ඇත්තේ එය සත්‍යයක් බවයි. එසේම, 14 වන චූදිත මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ ඉස්ලාමීය කාර්යයක් වන්නේ ඔබට හා මා හට පවරා ඇති වගකීම් වගකීම අප විසින් ඉටු කරලා තියෙනවා යන්නෙන් පැවසූවොත් ඔබ පිළිගන්න පුළුවන්ද යනුවෙන් වන අතර සාක්ෂිකරු ඊට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ අපි දෙන්නාම ඉටු කරලා ඇති. නමුත් එක විදිහටම ඉටු කරාද කියලා දන්නේ නැහැ. මම මගේ විදිහට ඉටු කළා. ඔබතුමා ඔබතුමාගේ විදිහට ඉටු කරලා ඇති යනුවෙන් වේ.

මෙම නඩුවෙහි අනෙකුත් සියලුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නැති බවට පවසා ඇති අතර රජයේ අධිනීතිඥ මහතා විසින් මෙම සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමක් සිදු කර ඇත.

පැ.සා. 1402 මොහොමඩ් මිස්බාර් අහමඩ් මුන්සික් යන අයගේ සාක්ෂිය විශ්ලේෂණාත්මකව සළකා බැලීමේදී අපහට පෙනී යන්නේ මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු මෙම නඩුවේ 4 වන චෝදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයව හොඳින් අඳුරන අයෙක් වන අතර එසේම, ඔහු 4 වන චූදිතගේ සහෝදරයා වන 5 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාහිඩ් යන අයව අයද එසේම, 14 වන චූදිත වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් යන අයවද හොඳින් අඳුරන තැනැත්තෙකු බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් මනාවෙන් පෙනී යයි. එසේම, 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය තුර්කියට යාම සම්බන්ධයෙන් සහ තුර්කියේ සිට සිරියාවට ගොස් ආයුධ පුහුණුවක් ලැබීම සම්බන්ධයෙන් 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින්ම මෙම සාක්ෂිකරුට පවසා ඇති අතර මෙම සාක්ෂිකරු සහ 4 වන චූදිත ඉතා කුළුපගව ආශ්‍රය කර ඇති මිතුරන් වෙයි. මේ අනුව එසේම, මෙම සාක්ෂිකරු 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා සහ ඔහුගේ සහෝදරයා වන 5 වන චූදිත සාහිඩ් යන අය සමඟ මුස්ලිම් ශිෂ්‍ය ව්‍යාපාරයෙහි විවිධාකාර වැඩසටහන් වලදී එක්ව සහභාගී වී කටයුතු කර ඇති තැනැත්තෙක් වන අතර මෙම සාක්ෂිකරුද මුස්ලිම් ශිෂ්‍ය ව්‍යාපාරයෙහි ලේකම් ධුරයේ සහ සභාපති ධුරයේ පවා හොබවා ඇති තැනැත්තෙකි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මෙම සාක්ෂිකරු 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ නිවසට දෙවතාවක් ගොස් ඇති බව පෙනී යන අතර එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 4 වන චූදිත තුර්කියෙහි ආත්මාරක්ෂක වැඩමුළුවක් සඳහා යාමෙන් අනතුරුව 4 වන චූදිත තුර්කියේ සිට දේශසීමාව ඔස්සේ සිරියාවට ගිය බවට සහ එහිදී ආයුධ සන්නද්ධ පුහුණුවීම් ලැබූ බවට 4 වන චූදිතගෙන් දැනගත් පසු මෙම සාක්ෂිකරු කැලඹීමට පත්වී ඇති අතර මෙම සාක්ෂිකරුම පවසන පරිදි ශ්‍රී ලංකාව තුළ එවැනි ආයුධ සන්නද්ධව කටයුතු කිරීම සඳහා තත්ත්වයක් නොමැති වී ඇති පසුබිම තුළ එය නුසුදුසු ක්‍රියාවක් බවට මෙම සාක්ෂිකරුටම තේරුම් ගෙන යාමෙන් අනතුරුව ඔහු 4 වන චූදිත විසින් කරන ලද එකී ක්‍රියාව අනුමත නොකර ඒ සම්බන්ධයෙන් බලවත් ලෙස කම්පනයට පත්වී ඇති ආකාරයද මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් පෙනී යයි. තවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව අහමඩ් ලුක්මන් තාලිබ් නැමැති පුද්ගලයා සහ මහාචාර්යවරයෙක් වන ඔහුගේ පියාද මෙම සාක්ෂිකරු හොඳින් දන්නා අඳුරන බව පෙනී යන අතර එසේම, එම අහමඩ් ලුක්මන් තාලිබ් යන අය සහ ඔහුගේ පියා ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය ලබාගෙන තිබුණද ඔවුන් දෙදෙනාම කල්ලෙළිය ග්‍රාමයේ එනම් මෙම සාක්ෂිකරුගේ ග්‍රාමයේ ජීවත් වූ පුද්ගලයන් බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිවන අතර එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව කොළඹ මරදානේ සහිරා විද්‍යාලය අසල තිබෙන මෙම සාක්ෂිකරුට 4 වන

චූදිත සමඟ සහිරා පල්ලියේදී අහමඩ් ලුක්මන් තාලිබ් යන ඕස්ට්රේලියාවේ පුරවැසිභාවය ලබාගෙන සිටින තැනැත්තාව මුණගැසී සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම තැනැත්තාගේ උපදෙස් මත තුර්කියෙහි ආත්මාරක්ෂක වැඩමුළුවක් සඳහා යාමට 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා ඉදිරිපත් වී ඇති අතර ඉන්පසුව එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය තුර්කියේදී පවා එකී අහමඩ් ලුක්මන් තාලිබ් නැමැත්තාව මුණගැසී ඇති බවට 4 වන චූදිතගෙන් දැනගත් බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවීම තුළින් එම මොහොමඩ් අහමඩ් ලුක්මන් තාලිබ් නැමැත්තාද මෙම සාක්ෂිකරු ඇතුළු අනෙකුත් තරුණයන් ව, විශේෂයෙන් 4 වන චූදිතව සිරියාවෙහි ත්‍රස්තවාදී කණ්ඩායම් සමඟ ආයුධ පුහුණුවීම් සඳහා යැවීමට උපදෙස් ලබා දී ඇති බව පෙනී යන අතර මෙම සාක්ෂිකරු විසින් සිදු කර ඇත්තේ 4 වන චූදිතට තුර්කියට යාම සඳහා අවශ්‍ය ගුවන් ටිකට් පත ඊමේල් පහසුකම් හරහා ගෙන්වාගෙන ලබා දී තිබීම බවට පෙනී යන අතර ඒ හැර මෙම සාක්ෂිකරු කිසිදු අවස්ථාවක 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයට තුර්කියට ගොස් ආයුධ සන්නද්ධ පුහුණුවීම් ලැබීමට උපදෙස් ලබා දීමක් සිදු කර නැති බව පෙනී යයි. මෙම සාක්ෂිකරුම පවසන පරිදි 4 වන චූදිත තුර්කියේ සිට සිරියාවට ගොස් ආයුධ පුහුණුව ලැබීමක් කර ඇතද ලංකාවේ එලෙස ආයුධ සන්නද්ධව යුද්ධ කිරීමක් සම්බන්ධ තත්ත්වයක් උද්ගත වී නැති බැවින් ලංකාවට එවැනි පුහුණුවීමක් ලබා තිබීමක් අවශ්‍ය

නොවන බැවින් සහ සිරියාවේ යුද්ධමය තත්ත්වයක් තිබූ බැවින් සිරියාවෙහි අල්කයිඩා ඇතුළු ත්‍රස්තවාදී සංවිධාන එරට රජයට එරෙහිව යුද්ධ කැරලි සටන් කිරීම් සිදු කිරීමක් කර ඇතද ලංකාවට එය අවශ්‍ය නොවන බවට මෙම සාක්ෂිකරුටම පෙනී ගිය බැවින් මෙම සාක්ෂිකරු විසින්ම 4 වන චූදිතට එලෙස සිරියාවට ගොස් ආයුධ පුහුණුවක් ලැබීමක් ලංකාව සම්බන්ධයෙන් අවශ්‍ය නොවන බවට මෙම සාක්ෂිකරුම පවසා ඇති බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවේ. තවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මෙම නඩුවෙහි 5 වන චූදිත වන සාහිඩ් නැමැත්තා එනම් 4 වන චූදිතගේ බාල සහෝදරයා සමඟ මෙම සාක්ෂිකරු ලුක්මන් තාලිබ් නැමැත්තා සමඟ ත්‍රිකුණාමලය ප්‍රදේශයට යාමක් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි එළිවන අතර එලෙස ත්‍රිකුණාමලය ප්‍රදේශයට ගොස් එහි මුහුදු වෙරළ ආසන්න ස්ථානයකදී එහිදී මොහිදීන් නැමැති පුද්ගලයෙකු මෙම සාක්ෂිකරු සමඟ ගිය ලුක්මන් තාලිබ් නැමැත්තාව මුණගැසී අඹගස්හේන නැමැති ස්ථානයෙහි ඉඩමක් සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමක් කර ඇති අතර මෙම සාක්ෂිකරු 5 වන චූදිත සාහිඩ් සහ ඔහු විසින් සඳහන් කරන ලද පරිදි කොළඹ සහිරා පල්ලියේදී එනම් මරදානේ සහිරා පල්ලියේදී මුණගැසී ඇති ලුක්මන් තාලිබ් නැමැත්තා සමඟ ත්‍රිකුණාමලයේ ප්‍රදේශයට ආසන්න මුතූර් හෝ තෝපූර් නැමැති ස්ථාන දෙකෙන් එකකට ගිය බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිවන අතර එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ලුක්මන් තාලිබ්

නැමැත්තා විසින් මෙම සාක්ෂිකරුට ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ තුනකට සමාන ඩොලර් ප්‍රමාණයක් ලබා දී ආචාර්ය තාරික් සුවයිදාන් නැමැති පුද්ගලයා විසින් යූටියුබ් එකෙහි සිදු කර ඇති **<u>ද ෆියුචර් ඔෆ් ඉස්ලාම්</u>** නැමැති දේශනය දමිළ භාෂාවට පරිවර්තනය කර පොතක් විදිහට මුද්‍රණය කිරීමට කටයුතු කරන ලෙසට දැනුම් දීමක් කර ඇතද එම මුදල් මෙම සාක්ෂිකරුගෙන් අතින් වියදම් වීම නිසා ඒ සම්බන්ධයෙන් ඔහු එකී ලුක්මන් තාලිබ්ට ඒ ගැන පැවසූ බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිවන අතර පසුව මෙම නඩුවෙහි 9 වන චූදිත වන මොහොමඩ් රමිස් මොහොමඩ් සාජිත් නැමැත්තා මෙම සාක්ෂිකරුට අමතා එම පොතෙහි මුද්‍රණ කටයුතු කිරීම සඳහා එම පොත 9 වන චූදිත වන සාජිත් නැමැත්තාට ලබා දුන් බවට මෙම සාක්ෂිකරු විසින් පවසා ඇති පසුබිම තුළ සහ මෙම සාක්ෂිකරු 9 වන චූදිත වන මොහොමඩ් රමිස් මොහොමඩ් සාජිත් නැමැත්තාවද හොඳින් අඳුරන අයෙක් බවට පැහැදිලිව පෙනී යන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2015 වසරේ සෞදි අරාබියට ගොස් යළි මේ රටට පැමිණ ඇත්තේ 2017 දෙසැම්බර් මාසයේ වන අතර ඉන්පසුව ඔහු මෙම නඩුවෙහි ලුක්මන් තාලිබ් සමඟ හෝ ඔහුගේ පියා සහ මෙම නඩුවෙහි 4 වන සහ චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා සමඟ හෝ 5 වන චූදිත සමඟ හෝ සම්බන්ධකම් පැවැත්වීමෙන් වැළකී සිටීමට ඔහු කටයුතු කර ඇති අතර ඊට හේතුව ලෙසට 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් සිරියාවට ගොස් ආයුධ

සන්නද්ධ පුද්ගලයන් සමඟ ආයුධ පුහුණුවක් ලබා ඇති බැවින් සහ තාලිබ් ලුක්මන් නැමැත්තාද ඒ වන විට තුර්කියේ සිට 4 වන චූදිතව මුණගැසී ඇති පසුබිම තුළ ලංකාවේ මෙරට සිටින හැටියට තමාලාට ආයුධ සන්නද්ධ කණ්ඩායමක් එක්ක සම්බන්ධකමක් අවශ්‍ය නැති නිසා තමා ඔවුන් මග හැරීමට කටයුතු කරන ලද බවට මෙම සාක්ෂිකරු පවසන සාක්ෂියෙන් හෙළිවන අතර මෙම සාක්ෂිකරු විසින් 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා මෙන්ම ඔහුගේ සහෝදරයා වන 5 වන චූදිත සාහිඩ් යන අයවද මග හැරීමට උත්සාහ කර ඇත. කෙසේ වෙතත් 2017 වසරේ දෙසැම්බර් වලින් පසු මෙම සාක්ෂිකරු ලංකාවට පැමිණීමෙන් පසු ඔහු නුවර ප්‍රදේශයේ රැකියාවක් කරමින් සිට ඇති අතර වරෙක එලෙස රැකියාව අවසන් වී නිවසට ඒමට පිටත් වූ අවස්ථාවකදී නෝම්බි උපවාසය තිබූ අවස්ථාවක නෝම්බි ඇරීම සඳහා ඔවුන්ගේ ගෙදරට එන ලෙසට 4 වන චූදිත හෝ 5 වන චූදිත තමාට දුරකථන ඇමතුමක් ලබා දී දැනුම් දුන් බවද එසේම, එම අවස්ථාවේදී තමා අකමැත්තෙන් වුවද එම ඉල්ලීමට කැමති වී ඇති අතර එනම් දීර්ඝ කාලයකට පසු තමාට එලෙස 4 වන චූදිත සහ 5 වන චූදිත ඔවුන්ගේ නිවසට එන ලෙසට ආරාධනා කිරීම මත තමා එලෙස එම නිවසට ගිය බවත් එහිදී 4 වන චූදිත තමා සමඟ කතා බහ කිරීමේදී ඔහු යම්කිසි ආකාරයක ෆාම් එකක් පවත්වාගෙන යන බවත් එය චිකන් ෆාම් එකක් හෝ වෙනත් ෆාම් එකක් විය හැකි බවත් තමාට ඒ හරියටම මතක නැති බවත් සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුළ 4 වන චූදිත එම

කාලවකවානුවේ ෆාම් එකක් පවත්වාගෙන ගොස් ඇති බව මැනවින් පෙනී යයි. එසේම, එම එලෙස මෙම සාක්ෂිකරු 4 වන චූදිතගේ නිවසට ගිය අවස්ථාවේදී 4 වන චූදිත ලැප්ටොප් එකක් මාර්ගයෙන් මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවන අපරාධ ආදී සම්බන්ධයෙන් පෙන්නුම් කරන සහ ඒ සම්බන්ධයෙන් දේශනා ඩංගු වීඩියෝ පට වීඩියෝ දර්ශන පෙන්වා ඇති අතර එම අවස්ථාවේදී ඒවායෙහි යම්කිසි කුරිරු දෙයක් තිබෙන බවට තමාට පෙනී ගිය බවත් එම අවස්ථාවේදී මෙම සාක්ෂිකරු මට මේක බලන්න වෙලාවක් නැහැයි 4 වන චූදිතට එම අවස්ථාවේම පැවසූ බවට මෙම සාක්ෂිකරු පවසා ඇති අතර එම අවස්ථාවේදීද මෙම සාක්ෂිකරු මෙම නඩුවේ 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයට අවවාද කිරීමක්ද කර 4 වන චූදිත හොඳින් අධ්‍යාපනය ලබා ඇති තැනැත්තෙකු බැවින් මුස්ලිම් ළමයින්ට අධ්‍යාපනය ලබා දීම සඳහා යම් දායක වීමක් වෙන ලෙසට 4 වන චූදිතට පැවසූ බවට මෙම සාක්ෂිකරු පවසා ඇති සාක්ෂිය විශ්වාසනීය සාක්ෂියක් වේ.

එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුවද අයිඑස් අයිඑස් සංවිධානය සිරියාවේ සහ ඉරාකයේ ප්‍රදේශයේ තිබුණ බවට හෙළිවන අතර එම සංවිධානය ආයුධ සන්නද්ධ ත්‍රස්තවාදී සංවිධානයක් බවටත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින්ම හෙළිවේ. එසේම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව පෙනී යන්නේ 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික්

අබ්දුල්ලා යන අය ආයුධ පුහුණුවක් ලබා ඇත්තේ එලෙස අයිඑස් අයිඑස් ත්‍රස්තවාදී සංවිධානයෙහි ක්‍රියාකාරීත්වයේ නිබුණු සිරියාවේදී බවට සහ එසේම, 4 වන චූදිත විසින් එලෙස තමා ආයුධ පුහුණුවක් ලැබූ බවට මෙම සාක්ෂිකරුට පවසා ඇති පසුබිම තුළ සැබැවින්ම මෙම නඩුවේ 4 වන චූදිත සිරියාවට ගොස් අයිඑස් අයිඑස් ත්‍රස්තවාදී කණ්ඩායම් සමඟ ආයුධ පුහුණුවක් කර ඇති බවට මනාව පැහැදිලි වේ.

4 වන චූදිත විසින් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී එලෙස මෙම සාක්ෂිකරු විසින් ඔහුගේ සාක්ෂියේදී පවසා සිටියේ පරිදි 4 වන චූදිත සිරියාවට යාම සම්බන්ධයෙන් සහ 4 වන චූදිත සිරියාවට ගොස් පැමිණීමෙන් පසු එලෙස 4 වන චූදිත එහි සිරියාවේදී ආයුධ පුහුණුවීම් ලද බවට මෙම සාක්ෂිකරුට පැවසුවා යැයි මෙම සාක්ෂිකරු මෙම මහාධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂිය සම්බන්ධයෙන් කිසිදු කරුණක් 4 වන චූදිත මෙම සාක්ෂිකරුගෙන් අසා නැති අතර එසේම, මෙම සාක්ෂිකරු ඒ සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය අභියෝගයකටද ලක් කිරීමක් 4 වන චූදිත විසින් සිදු කර නැත. එසේම, මෙම සාක්ෂිකරු පවසන පරිදි 2017 වසරේ දෙසැම්බර් වකවානුවේ මෙම සාක්ෂිකරු සෞදි අරාබියේ සේවය කිරීමෙන් අනතුරුව මෙරටට පැමිණීමෙන් පසු නෝම්බි ඇරීම සඳහා 4 වන චූදිතගේ සහ 5 වන චූදිතගේ නිවසට ගිය ඔවුන්ගේ ආරාධනය පරිදි ගිය අවස්ථාවක 4 වන චූදිත විසින් ආයුධ සන්නද්ධ සටන් හා සම්බන්ධ

වීඩියෝ එනම් ජිහාඩ් සම්බන්ධ දේශන සහ එසේම, මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවන කුරිරු සහාසික ක්‍රියාකාරකම් එම වීඩියෝ දර්ශන වල තිබුණ බවට මෙම සාක්ෂිකරු යම් ප්‍රමාණයක් දැක ඇති අතර ඒ අනුව සැබැවින්ම මෙම නඩුවේ 4 වන චූදිත 2017 වසරේ අග භාගයේ වන විට යම් ආකාරයකින් මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවන්නා වූ සාහසික ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යම් මතවාදී පසුබිමක සිට ඇති බව පැහැදිලිව පෙනී යන අතර 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය අයිඑස් අයිඑස් ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ක්‍රියාකාරීත්වයක් පැවැති සිරියාවට ගොස් ඇත්තේ තුර්කියේ සිට දේශසීමාව හරහා බවට පෙනී යන පසුබිම තුළ ඔහු තුර්කියට ගොස් යාමෙන් අනතුරුව සිරියාවට ගොස් ඇත්තේ යම් ආකාරයක රහසිගත ආකාරයකින් බවටද පෙනී යන අතර ඒ අනුව 4 වන චූදිත සැබැවින්ම සිරියාවට ගොස් අයි.එස් අයි.එස්(ISIS) ත්‍රස්තවාදී සංවිධානය හා සම්බන්ධ පුද්ගලයන් සමඟ යම් ආකාරයක ආයුධ පුහුණුවක් ලබා ඇති බවට පැහැදිලිව පෙනී යන අතර මෙම සාක්ෂිකරු 4 වන චූදිත සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී පැවසූ කරුණු 4 වන චූදිත විසින් හරස් ප්‍රශ්න වලදී අභියෝග කිරීමක් සිදු කර නොමැති පසුබිම තුළ 4 වන චූදිත සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය විශ්වාසනීය සාක්ෂියක් බව අපහට පෙනී යයි.

එසේම, මෙම සාක්ෂිකරු 5 වන චූදිතවද හොඳින් අඳුරන අයෙක් බවට පෙනී යන අතර 5 වන චූදිත සහ ලුක්මන් තාලිබ් නැමැත්තා සමඟ තෝපූර් හෝ මුතූර් යන ප්‍රදේශයන්ගෙන් එක් ස්ථානයකට මුහුදුබඩ ප්‍රදේශයකට එනම් ත්‍රිකුණාමලයේ ප්‍රදේශයෙහි පිහිටි ස්ථානයකට ගොස් තාලිබ් තාලිබ් ලුක්මන් විසින් මොහිදීන් නැමැත්තෙකු මුණගැසී ඉඩමක් ලබා ගැනීම සම්බන්ධයෙන් එනම් අඹගස්හේන ප්‍රදේශයේ ඉඩමක් සම්බන්ධයෙන් එම තාලිබ් ලුක්මන් සහ මොහිදීන් නැමැත්තා කරුණු සාකච්ඡා කිරීමක් කර ඇති බව පෙනී යන අතර ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් ඔහුගේ සාක්ෂියේදී පවසා ඇති කරුණු මෙම නඩුවෙහි 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නැමැත්තා නැමැති චූදිතයාගේ චූදිතයා විසින් 1979 අංක 5 අංක 48 දරන ත්‍රස්තවාදී වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16 එක වගන්තිය යටතේ සහකාර පොලිස් අධිකාරී කාවිංද පියසේකර යන අයට ලබා දී ඇති පාපෝච්චාරණයෙහි අඩංගු කරුණු සම්බන්ධ මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ස්වාධීන ආකාරයෙන් සනාථ වන්නේද යන්න සම්බන්ධයෙන් අප විසින් සළකා බැලීමට කටයුතු කරන ලදී. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් 5 වන චූදිත වන සාහිඩ් නැමැත්තාගේ අනන්‍යතාවයද 14 වන චූදිත වන ඉබ්‍රාහිම් නැමැත්තා සම්බන්ධයෙන් සහ 9 වන චූදිත වන රමිස් මොහොමඩ් රමිස් මොහොමඩ් සාජිත් නැමැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මැනවින් සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර කෙසේ

වෙතත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ප්‍රබලව ඉදිරිපත් වී ඇත්තේ මෙම නඩුවේ 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නැමැත්තා සිරියාවට ගොස් අයිඑස් අයිඑස් පුහුණුවක් ලැබීම සම්බන්ධයෙන් වන අතර මෙම සාක්ෂිකරු විසින් 4 වන චූදිතගේ සහෝදරයා වන 5 වන චූදිත වන සාහිඩ් සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂියේදී සාහිඩ් නැමැත්තා සමඟ මෙම සාක්ෂිකරු සහ තවත් කීප දෙනෙකු තාලිබ් ලුක්මන් එනම් ලුක්මන් තාලිබ් සමඟ ත්‍රිකුණාමලයේ තෝප්පූර් හෝ මුතූර් ප්‍රදේශයට ගමන් කිරීම සම්බන්ධයෙන් වූ සාක්ෂි පමණක් ඉදිරිපත් වී ඇත.

එසේම, මෙම නඩුවෙහි 9 වන චූදිත සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් ඉදිරිපත් වූ සාක්ෂි වලට අනුව මෙම සාක්ෂිකරුට ලුක්මන් තාලිබ් විසින් රුපියල් ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයකට සමාන ඇමරිකානු ඩොලර් ප්‍රමාණයක් ලබා දී ආචාර්ය තාරික් සුවයිදාන් නැමැති පුද්ගලයා විසින් යූටියුබ් එකේ පළ කර තිබූ ද ෆියුචර් ඔෆ් ඉස්ලාම් නැමැති පොත මෙම සාක්ෂිකරුගෙන් ලබා ගැනීමක් සිදු කර තිබීම පමණක් වන අතර ඒ හැර 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් සිදු කරන ලද වෙනත් අපරාධයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ 5 වන චූදිත වන සාහිඩ් නැමැත්තාද ඔහුගේ පියා වන 14 වන චූදිත ලෙස නම් සඳහන් රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් නැමැත්තා සහ 9 වන චූදිත වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් නැමැත්තා විසින් වෙනත් කිසිදු

අපරාධමය ක්‍රියාවක් සිදු කරන ලද බවට වෙනත් කිසිදු සාක්ෂියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉදිරිපත් වී නැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී 5 වන චූදිත වන සාහිඩ් නැමැත්තා සමඟ ලුක්මන් තාලිබ් නැමැත්තා සමඟ තිහාරියේ සිට ත්‍රිකුණාමල ප්‍රදේශයට වෑන් රථයකින් ගමන් කොට මොහිදීන් නැමැත්තෙකු මුණගැසීමක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව එම ගමනට මෙම සාක්ෂිකරු ගොස් ඇත්තේ 5 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමඩ් සාහිඩ් නැමැත්තාගේ ඉල්ලීම සහ අනුදැනුම මත වන අතර මෙම සාක්ෂිකරු එලෙස 5 වන චූදිත වන සාහිඩ් සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය 5 වන චූදිත විසින් මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය කිසිදු ආකාරයකින් අභියෝගයකට ලක් වී නොමැත.

5 වන චූදිත වන සාහිඩ් යන අයට හරස් ප්‍රශ්න ඇසීම සඳහා මෙම අධිකරණයෙන් අවස්ථාව ලබා දී තිබියදීත් ඔහු එලෙස හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැති වීම සහ හරස් ප්‍රශ්න නැති බවට පවසා සිටීම තුළින් එම 5 වන චූදිත සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු පැවසූ සාක්ෂිය කිසිසේත් අභියෝගයකට ලක් වී නොමැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 5 වන චූදිත සාහිඩ් සමඟ ලුක්මන් තාලිබ් නැමැත්තා ත්‍රිකුණාමලයේ ප්‍රදේශයේ තෝප්පූර් හෝ මුතූර්

යන ප්‍රදේශයට ගොස් ඉඩමක් සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමක් ගැන සාක්ෂි මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉදිරිපත් වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පසුව එකී ඉඩම කුමක්ද එසේම, ඒ කුමන අරමුණක් සඳහා භාවිතා කරන ලද ඉඩමක් සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි ඉදිරිපත් කර තිබේද යන්න සම්බන්ධයෙන් අප විසින් පසුව පරික්ෂා කර බලමු.

මෙම නඩුවේ 14 වන චූදිත වන ඉබ්‍රාහිම් නැමැත්තා විසින් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහුට යෝජනා කර ඇත්තේ ඉබ්‍රාහිම් නැමැති 14 වන චූදිත විසින් මවුලවීවරයෙකු වශයෙන් සිදු කරන ලද ආගමික ප්‍රචාරණ කටයුතු සහ දේශන සහ සමාජ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන අතර මෙම සාක්ෂිකරුද එකී කරුණු පිළිගෙන ඇති අතර එම කරුණු කිසිදු ආකාරයකින් මෙම සාක්ෂිකරු විසින් අභියෝග කිරීමක් කර නැත. එනම් 14 වන චූදිත කාන්තාවන් සම්බන්ධයෙන්ද වැඩමුළු පැවැත්වූ බවට මෙම සාක්ෂිකරු විසින්ද පිළිගෙන ඇත. 14 වන චූදිත ලෙස නම් සඳහන් රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් නැමැත්තා කිසිදු අපරාධමය ක්‍රියාවක් සිදු කරන ලද බවට වෙනත් කිසිදු සාක්ෂියක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ඉදිරිපත් වී නැත.

සමස්තයක් ලෙස ගෙන බැලීමේදී මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මෙම නඩුවෙහි 4 වන චූදිත, 5 වන චූදිත, 9 වන චූදිත සහ 14 වන චූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය

විශ්වාසනීයත්වයෙන් තොර බවට පෙන්නුම් කිරීමට තරම් කිසිදු කරුණක් මෙම සාක්ෂිකරුට යෝජනාවක් හෝ කර නොමැති පසුබිම තුළ මෙම සාක්ෂිකරු මෙම අධිකරණයේ දිවුරුම් පිට ලබා දුන් සාක්ෂියෙහි විශ්වාසනීය භාවය සම්බන්ධයෙන් අපට කිසිදු සැක සහිත භාවයක් පෙනී යන්නේ නැත. ඒ අනුව ඔහු ලබා දුන් සාක්ෂිය සත්‍ය, විශ්වසනීය සාක්ෂියක් ලෙස අප පිළිගනිමු.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 2304 මාවනාගේ හේවා ලයනල් ජයසේකර</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2304 මාවනාගේ හේවා ලයනල් ජයසේකර සාක්ෂි දෙමින්, තමා මේ වන විට විශ්‍රාමික බවත් වර්ෂ 2019.07.18 දින පානදුර අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අමරරත්න මහතාගේ නියෝග පරිදි නඩු භාණ්ඩ ප්‍රමාණයක් කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගොස් භාරදුන් බවත් කියා සිටින ලදී. එම නඩු භාණ්ඩ එවකට පානදුර අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ සේවය කළ උප පොලිස් පරීක්ෂක රුවන් කුමාර සහ පොලිස් පරීක්ෂක අමරරත්න මහතා විසින් භාරයට ගෙන තිබූ නඩු භාණ්ඩ බවත් ඔහු වැඩිදුරටත් කියා සිටින ලදී. එම නඩු භාණ්ඩ අතුරින් අංක 34 ලෙස නම් කළ දුරකථන අංක දෙකක් ඇතුළත් අභ්‍යාස පොතක

කොළ කැබැල්ල අඩංගු මුද්‍රා තබන ලද ලිපිකවරය දේපළ කුවිතාන්සි අංක PR38/2019 බව කියා සිටිමින් එකී දේපල කුවිතාන්සියේ මුල්පිටපත පැ.1222 වශයෙන් සලකුණු කරන ලදී. ඉන් අනතුරුව, දැනටමත් පැ.1112 ලෙස ලකුණු කර ඇති දේපළ කුවිතාන්සි අඩංගු කණ්ණාඩිය සහිත Hair Brush එකක් අඩංගු මුද්‍රා කළ ලිපිකවර එකයි, කළු පැහැ Hair Brush එකක් අඩංගු මුද්‍රාකළ ලිපිකවර 01, සුදු හා නිල් පැහැති දත්බුරුසු එකක් අඩංගු මුද්‍රාකළ ලිපිකවර 01, රතු පැහැති දත්බුරුසු එකක් අඩංගු මුද්‍රාකළ ලිපිකවර 01, අළු පැහැති මුස්ලිම් හිස් වැසුමක් අඩංගු මුද්‍රාකළ ලිපිකවර 01, දුඹුරු පැහැති සපත්තු ජොඩුවක් අඩංගු මුද්‍රාකළ පාර්සල් 01 අඩංගු පාර්සල් 6ක් ඇතුළත් PR 46/2019 ලේඛනය ද, දේපළ කුවිතාන්සි අංක PR 47/2019 අදාළ ලීටර් 16 මල්ටිබෝන් හිස් බූලි 01, මල්ටිබෝන් තැවරුණු නිල් පැහැති ප්ලාස්ටික් ජෝගු 01, රෝස පැහැති ප්ලාස්ටික් තැටි 01, කිලෝග්‍රෑම් 50 කැල්සියම් හයිපො ක්ලෝරයිඩ් හිස්බූලි 01 ඇතුළත් පැ.1113 ලෙස ලකුණු කර ඇති දේපළ කුවිතාන්සි හඳුනාගන්නා ලදී.

ඉන් අනතුරුව දේපළ කුවිතාන්සි අංක PR 48/2019 ඇතුළත් කර තිබූ Merry pair වර්ගයේ රෝද පුටුවක් අසුරන ලද හිස් පෙට්ටි 01, Innovex වර්ගයේ වොෂින් මැෂින් අසුරන ලද හිස් පෙට්ටි 01, මිට්ෂු වර්ගයේ විදුලි පංකාවක් අසුරන ලද හිස් පෙට්ටි 01, Camera flash gun හිස් පෙට්ටි 01, කුඩ විදුලි පංකා මිලිමීටර් 200 ස්ප්‍රෙන්ඩ්‍රයක්, 17 wrench

යතුරක්, 10 wrench යතුරක්, ඉස්කුරුප්පු නියනක් හා කළු පැහැති උපැස් යුවළක් අඩංගු මුද්‍රාකළ පාර්සල් එකයි නිල් පැහැති බොටම් 05ක්, කළු පැහැති බොටම් 02ක්, නිල් පැහැති ඩෙනිම් කලිසම් 02, දුඹුරු පැහැති දිග කලිසමක්, සුදු හා කොළ ඉරි අත්දිග ජසියක්, කළුපැහැ අත්කොට ටී ෂර්ට් එකක්, කළු ටයිපටි 01, කළු පැහැති රෙදි කැබැල්ලක්, කොළ පැහැති ඉටිදැල් රෙද්දක්, ලානිල් මල්රටා සහිත ඉටිරෙද්දක් හා සුදුපැහැ පොලිසෙන් රෙද්දක් අඩංගු මුද්‍රාකරන ලද පෙට්ටි 01 ක් ඇතුළත් නඩු භාණ්ඩ ඇතුළත් කරන ලද පැ. 1114 ලෙස ලකුණු කර ඇති දේපළ කුවිතාන්සි ද, යන ලේඛන හඳුනාගනිමින් සාක්ෂි දුන් සාක්ෂිකරු ඒවා කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ භාරකාර U.A.S.S. කුමාර මහතාට නිසි පරිදි භාරදුන් බව කියා සිටින ලදී.

කිසිදු විත්තිකරුවකු විසින් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර නැත. එබැවින් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය කිසිදු හඬ කිරීමකින් තොරව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති පසුබිම තුළ ඔහු ලබා දුන් සාක්ෂියේදී ඉහත පරිදි විස්තරාත්මකව සඳහන් කර ඇති නඩු භාණ්ඩ විධිමත්ව කොටුව මහේස්ත්‍රාත් අධිකරණ්ය වෙත ගෙන ගොස් නිසිපරිදි භාර දුන් බව තහවුරු කරයි. ඒඅනුව එම භාරණ්ඩ දාමය ආකාරය සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය මනාව තහවුරු කරයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1942 ඊබ්‍රාහිම් නිලාබ්දීන්

පැමිණිල්ලේ සාක්ෂි අංක 1942, පොලිස් සැරයන් 53261 ඊබ්‍රහීම් නිලාබ්දීන් සාක්ෂි දෙමින් තමා වර්ෂ 2020 දී ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ සේවය කළ බවත් 2019.04.21 වන දින ශ්‍රී ලංකාව තුළ සිදු වූ බෝම්බ ප්‍රහාරයට අදාළව 2020.08.27 වන දින එවකට තමාගේ ඒකකයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක පතිරණ මහතාගේ නියෝග මත පොලිස් පරීක්ෂක රත්නායක සහ පොලිස් කොස්තාපල් 8389 ප්‍රදීපන් යන නිලධාරියා සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් එහි රඳවා සිටි මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා සහ ගෆූර් මාමා වශයෙන් හඳුන්වනු ලැබූ පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කළ බවත්, තමා සමඟ ගිය පොලිස් පරීක්ෂක රත්නායක මහතා රෝහලකට අදාළ කොළ කිහිපයක් ඔහු භාරයේ රැගෙන ගිය අතර තමා විසින් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ ප්‍රකාශය සටහන් කර ගත් අතර පොලිස් කොස්තාපල් 8389 ප්‍රදීපන් විසින් ගෆූර් මාමා යනුවෙන් හඳුන්වන ලද පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කළ බවත්, පොලිස් පරීක්ෂක රත්නායක මහතා ද එම ස්ථානයේ සිටි බවත් කියා සිටින ලදී. එසේම රත්නායක මහතා විසින් ලබාදුන් රෝහල් කොළ කිහිපයකට මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අය ලවා ‘‘පොලිස් විමර්ශනයක් අවශ්‍ය නැහැ.’’ යන කොටස දෙමළ භාෂාවෙන් ලියාගත් බවත්, එසේ ලියා එහි අත්සන් කරන ලෙසටත් තමාට පොලිස් පරීක්ෂක

රත්නායක මහතා විසින් ලබාදුන් කොළ 5හිම ලියා අත්සන ලබාගත් බවත්, තමා විසින් කරන ලද එම රාජකාරිය සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගෙන ඔහුට එය පහදා දී ඔහුගේ අත්සන ලබාගත් බවත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව එකී සාක්ෂිකරුට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 36363/8/20 යන නඩුවෙහි පිටු අංක 74, 75, 76, 77 සහ 78 යන පිටුවල ඇති ලේඛන සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඒවා එදින එනම්, 2020.08.21 වන දින තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදි ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අයගෙන් ලබාගත් සටහන් සහිත කොළ බවට හඳුනාගන්නා ලද අතර ඒවා පිළිවෙළින් පැ.1552, පැ.1553, පැ.1554, පැ.1555 සහ පැ.1556 වශයෙන් සලකුණු කරන ලදී. එම ලේඛන සියල්ල නැවත සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඔහු විසින් ඒ එක් එක් කොළයෙහි දෙමළ අක්ෂරවලින් ලියා ඇති කොටසත්, සාදික් (Sadeek) ලෙස ඉංග්‍රීසියෙන් ලියා ඇති කොටසත්, අත්සනත් හඳුනාගන්නා ලද අතර එහි දෙමළ භාෂාවෙන් ලියා ඇති කොටස දෙමළ භාෂාවෙන් ශබ්ද වන ආකාරය ‘‘පොලිස් විස්සාරනෙ තේවඉල්ලෙ’’ බවත්, එහි තේරුම පොලිස් විමර්ශන අවශ්‍ය නැත, යන්න බවටත් කියා සිටි සාක්ෂිකරු, මේ සම්බන්ධයෙන් තමා දන්නේ රිල්වාන් නැමැති අයෙකු රෝහලට ඇතුළත් කළ පසු පොලිස් විමර්ශන අවශ්‍ය නොවන බවට සාදික් අබ්දුල්ලා විසින් ලියා ඇති බවට වූ විමර්ශනයේදී

අනාවරණය වූ කරුණක් බවත් කියා සිටි සාක්ෂිකරු ඔහුට පෙන්වා සිටින ලද පැ. 876 දරණ ලේඛනයේ පැ. 876 (D) යන කොටසේ ‘‘ පොලිස් විස්සාරනෙ තේවඉල්ලෙ’’ යනුවෙන් සඳහන්ව ඇති බවත් කියා සිටින ලදී.

තමා විසින් එම සටහන් ලබාගන්නා ලද පැ.1552 සිට පැ.1556 දක්වා වූ ලේඛන තමා ඉදිරිපිට දී සාදික් යන අය විසින් ස්ව කැමැත්තෙන්ම ලියා දුන් බව කියා සිටි සාක්ෂිකරු එම මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යනු මෙම නඩුවේ 04 වන චූදිත බවට විවෘත අධිකරණයේදී පෙන්වා හඳුනාගන්නා ලදී. තවද, වැඩිදුරටත් සාක්ෂි දුන් ඔහු තමා සමඟ ගිය ප්‍රදීපන් යන නිලධාරියා ගෆූර් මාමා යන අයගෙන් ප්‍රකාශයක් ගත් බවත්, ගෆූර් මාමා යන අය මෙම අධිකරණයේ 02 වන විත්තිකරු බවටත් විවෘත අධිකරණයේදී හඳුනාගන්නා ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 01, 02, 07, 08, 10, 15, 18 සහ 19 යන චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර එහිදී තමා විසින් මෙම සාක්ෂි දෙන ලද රාජකාරිය සිදු කළ දිනය වන්නේ 2020.08.27 බවත්, පැ.876 දරණ ලේඛනයේ තුවාලකරුව රෝහලට ඇතුළත් කිරීමේදි භාරකරු ලෙස සඳහන් කර තියෙන පුද්ගලයාගේ නම M.I. සාදික් වශයෙන් සඳහන්ව ඇති බවත් කියා සිටින ලදී.

04 වන චූදිත විසින් එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කරන ලද අතර සාදික් අබ්දුල්ලා යන අයගෙන් 2020.08.27 වන දින කරන ලද රාජකාරියේදී පොලිස් පරීක්ෂක රත්නායක මහතාද පැමිණි බවත්, පොලිස් පරීක්ෂක රත්නායක පැමිණෙන විට යම් ලේඛන වගයකුත් රැගෙන පැමිණි සිටි අතර එම ලේඛන මේ වන විට පැ.1552 සිට පැ.1556 දක්වා සලකුණු කර ඇති බවත් කියා සිටින ලදී. එසේම පැ.876 ලේඛනයේ ‘‘පොලිස් විමර්ශන අවශ්‍ය නැත.’’ යනුවෙන් ලියා තිබූ අතර එම ලේඛනය එම අවස්ථාවේදි පොලිස් පරීක්ෂක රත්නායක මහතාගේ ළඟ තිබුනේද? නැද්ද? යන්න තමාට මතක නොමැති අතර පැ.876හි පහළ කොටස ඉරා ඉවත් කර සෙලෝටේප් යොදා තිබෙන්නේ යයි යන යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

සාක්ෂිකරු භාරයේ තිබූ 4(D)(1) වශයෙන් සලකුණු කරන ලද පැ.876 ලේඛනයේ ඡායාපිටපත පෙන්වා සිටින ලද අතර එහි පොලිස් මුරපොළේ ඇති මුද්‍රාව ඇති බවත්, යම් අපැහැදිලි සටහනක් එහි ඇති බවත්, ‘‘පොලිස් විමර්ශන අවශ්‍ය නැත.’’ ලෙස දෙමළ භාෂාවෙන් ලියා ඇති කොටස පහළින් යම් අපහැදිලි සටහනක් ඇති අතර එම ස්ථානයෙහි ජාතික හැඳුනුම්පත් අංකයක් ඇති අතර එම ඉලක්කම් අතරින් 88-V යන කොටස පමණක් තමාට පැහැදිලි වන අතර සෙසු ඉලක්කම් අපැහැදිලි බවත් කියා සිටින ලදී.

ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ සේවය කළ කාලයේදී, 2020.08.27 දින පොලිස් පරීක්ෂක රත්නායක සහ පොලිස් කොස්තාපල් ප්‍රදීපන් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ගොස් ඇත.

එහිදී රඳවා සිටි "මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා" ගෙන් ප්‍රකාශයක් ලබාගෙන, රිල්වාන් නැමැති අය ඇතුළත් කර තිබූ කොළඹ ජාතික රෝහලේ ඇතුළත් වීමේ පත්‍රිකා 05 ක (පැ.1552 සිට පැ.1556 දක්වා) "පොලිස් විමර්ශන අවශ්‍ය නැත" (පොලිස් විසාරනෙ තේවඉල්ලෙ) යනුවෙන් දෙමළ භාෂාවෙන් ඔහුගේ ස්වකැමැත්තෙන්ම ලියා අත්සන් ලබාගෙන ඇත.

04 වන චූදිතයා විසින් සිදුකරන ලද හරස් ප්‍රශ්න විමසීමෙන් පසු මොහුගේ සාක්ෂිය අවසන් විය.

මෙම සාක්ෂිය විශ්ලේෂණාත්මකව ඇගයීමට ලක් කිරීමේදී ඔහු විසින් පැ.876 ලේඛනයේ දමිල භාෂාවෙන් ‘‘පොලිස් විමර්ශන අවශ්‍ය නැත‘‘ යනුවෙන් ලියා ඇති සටහන අත්අකුරු පරීක්ෂාව සඳහා යොමු කිරීම සඳහා ආදර්ශ අත්අකුරු සාම්පලය ලබාගෙන ඇත. ඔහුගෙන් විත්තිය විසින් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කලද එම හරස් ප්‍රශ්න මගින් ඔහුගේ සාක්ෂියේ විශ්වසනීයත්වය බිඳ වැටී නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1401 ජාසිර්කාන් ජවුෆර් සාදික්

පැමිණිල්ලේ සාක්ෂි අංක 1401, ජාසිර්කාන් ජවුෆර් සාදික් යන සාක්ෂිකරු හිගුල, දෙල්ගහගොඩ ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙක් වන අතර, ඔහු සාක්ෂි දෙමින් කියා සිටියේ, තමා දෙල්ගහගොඩ මුස්ලිම් කණිෂ්ඨ විද්‍යාලයේ තමාගේ පාසල් අධ්‍යාපනය ලබා ගත් බවත්, දැනට මොරටුව විශ්වවිද්‍යාලයේ NDT එනම්, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ලද බවත්ය. තමාගේ ගමේ එනම්, දෙල්ගහගොඩ තව්හීත් පල්ලියක් තිබෙන බවත් තමා එම පල්ලියටත් වන්දනා කරන්න යන බවත්, 2018 වර්ෂයේ Sri Lanka Islamic Student Movement මඟින් දින 04 ක් හෝ 05 ක වැඩමුළුවක් සංවිධානය කර තිබූ බවත්, එවැනි වැඩසටහන් හැම අවුරුද්දේම සංවිධානය කරන බවත්, ලංකාව පුරාවටම එවැනි වැඩමුළුවල් සංවිධානය කරන බවත් එම වැඩමුළුවල්වලට ලංකාවේ සෑම පළාත්වලම ඉදන් පුද්ගලයන් සහභාගි වෙන බවත්, මීට පෙරද එවැනි වැඩසටහන් දෙල්ගොඩ ප්‍රදේශයේ සංවිධානය කර තිබෙන බවත්, 2018 වර්ෂය වෙනකොට තමා අ.පොෙ.ස. සාමාන්‍ය පෙළ විභාගය අවසන් වී ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටිය අතර අ.පොෙ.ස. උසස් පෙළ විෂයන් සඳහා උපකාරක පන්ති වලට යෑමට පටන්ගෙන තිබූ බවත්, තමාගේ බාල මාමා කෙනෙකු වූ මුනීෆ්ගේ දැනුම් දීම මත තමාද එම වැඩමුලුවට ස්වේච්ඡා සේවකයෙකු ලෙස තේ පැන් සැපයීම වැනි කටයුතුවලට සහාය වීම සඳහා

සහභාගීවූ බවත්, තමාට උදේ වරුවේ උපකාරක පන්ති තිබූ බැවින් මෙම වැඩමුළුවට සවස් කාලයේදී පමණක් සහභාගී වූ බවත් එම වැඩමුළුවට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් සිසුන් 40ක් පමණ පැමිණ පල්ලියේ නවාතැන් ගෙන සිට ඊට සහභාගී වූ බවත්, මෙම වැඩසටහන සංවිධානය කිරීම සඳහා එම පල්ලියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබුවේ මෙම නඩුවේ 5 වන චූදිත සහ 4 වන චූදිත යන දෙදෙනා විසින් බවත්, ඔවුන් දෙදෙනා එකම පවුලේ සහෝදරයන් වන අතර මෙම නඩුවේ 14 වන චූදිතගේ පුත්‍රයන් බවත්, මෙම වැඩමුළුව අතරතුර පැවැත්වුණු දේශනවලදී අන්තවාදී ඉගැන්වීම් සිදු කරන ලද බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි.

එම වැඩමුළුවේ දෙවන දිනයේදී මෙම නඩුවෙ 9 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් සහජීවනය පිළිබඳ දේශනයක් පවත්වමින් ‘‘සහජීවනය කියල එහෙම දෙයක් නැහැ, ආගම් අතර එහෙම සහජීවනයක් පැවැත්වෙන්න බැහැ, ’’ යනුවෙන් පැවසූ බවත් එසේම ‘‘මුස්ලිම් රටක් නොවන රටක මුස්ලිම් කට්ටියට ජීවත් වෙන්න බැහැ’’ යැයි ප්‍රකාශ කළ බවත්, එසේම මුස්ලිම් රටක් නොවනවා නම් ඒ රට මුස්ලිම් රටක් විධියටම අපි චේන්ජ් කරන්න ඕනෑ.’’ ‘‘එසේම මේ අප ඉන්න රට මුස්ලිම් රටක් නොවන නිසා මේ රට මුස්ලිම් රටක් බවට අප පවත්වාගන්න ඕනෑ.’’ යැයි පැවසුව බවත්, එසේම ශ්‍රී ලංකාවේ දිගන සහ අලුත්ගම වැනි ප්‍රදේශවල සිදු වූ මුස්ලිම් විරෝධී ප්‍රහාර, බොදුබල සේනා වැනි සංවිධානවල ක්‍රියාකාරකම් සහ හිජාබ්, හලාල් වැනි ප්‍රශ්න පෙන්වා දෙමින් රට මුස්ලිම්

රටක් බවට පත් කිරීම සඳහා "සටනක්" කළ යුතු බවටත් දේශනා කළ බව මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි.

එසේම වැඩමුළුවේ අවසාන දිනයේදී මෙම නඩුවෙ 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් දේශනයක් පවත්වමින් ‘‘මුස්ලිම් නොවන රටක් මුස්ලිම් රටක් බවට පත් කරනවා නම් අපි යුද්ධයක් කරන්න ඕනේ. අපි යුද්ධයක් පටන් ගන්න යන්නේ.’’ ලෙසට 4 වන චූදිත ප්‍රකාශ කළ බව සාක්ෂිකරු පවසා සිටී. තවද, ඔහු වයිට් බෝඩ් සහ ප්‍රොජෙක්ටරයක් භාවිතා කරමින් සන්නද්ධ පුද්ගලයන්ගේ සහ යුධ උපකරණවල ඡායාරූප පෙන්වමින් පලස්තීනය වැනි අරාබි රටවල සහ ඉස්ලාම් ඉතිහාසයේ යුද්ධ පිළිබඳව කරුණු පැහැදිලි කර දුන් බවත්, අනෙක් ආගම්වල අයට විරුද්ධව කරන මෙම යුද්ධයේදී මියයන පුද්ගලයන් කෙළින්ම ස්වර්ගයට යන බව පවසා ඔවුන්ගේ සංවිධානය සමඟ එක්වී අවසානය තෙක් රැඳී සිටින ලෙසට ඉල්ලා සිටි බවත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි. එසේම ‘‘මේකෙන් එළියට ගියාට පස්සේ අනිත් කට්ටිය මේක වැරදියි කියලා කියන්න පුළුවන්. හැබැයි මේක තමයි හරි.’’ යැයි 04 වන චූදිත තවදුරටත් පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවද, 14 වන චූදිතද රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් එහි දේශනයක් පැවැත්වූ බවත්, තමා එහි යන විටත් දේශනය අවසන් වීමට ආසන්නව තිබූ

බැවින් එහි අන්තර්ගතය පිළිබඳ තමාට මතකයක් නොමැති බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදී.

වැඩමුළුව අවසානයේ තමා මෙම දේශනවල අන්තර්ගතය පිළිබඳව තම මවට පැවසූ විට, ඇය එම මතයන් වැරදි බව පවසා ඒ පිළිබඳව සිතීම පසෙකලා උසස් පෙළ විභාගයේ අධ්‍යයන කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ලෙසට තමාට උපදෙස් දුන් බවත්, ඒ අනුව තමා එම උපදෙස් පිළිපැද අධ්‍යාපන කටයුතු සඳහා යොමු වූ බවටත් පවසා සිටී. පසුව, පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් අනතුරුව 2020 ජනවාරි 22 දින තමාගේ ජංගම දුරකථන විස්තර පරීක්ෂා කිරීමෙන් පසුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) විසින් තමාව අත්අඩංගුවට ගෙන මාස නවයකට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ සහ රැඳවුම් භාරයේ තබා ගෙන සිටි බවත්, තමාට විභාගවලට පෙනී සිටීමට තිබූ බැවින් සහ පවුල රැකබලා ගැනීමට ඉක්මනින් නිදහස් වීමේ දැඩි අවශ්‍යතාවයක් තිබූ බැවින්, පොලිසියට පැවසූ දේම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ප්‍රකාශ කළහොත් ඉක්මනින් එළියට යන්න පුළුවන් බවට TID නිලධාරීන් දුන් උපදෙස් මත ඔහු මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා දී පසුව නිදහස් වූ බවටත් පවසා සිටින ලදි. කෙසේ වෙතත් ‘‘මෙහෙම මෙහෙම කියන්න ඕනේ’’ යැයි TID නිලධාරීන් තමාට කියලා දුන්නේ නැති බවත් සාක්ෂිකරු තම සාක්ෂියේදී පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 4, 9, 11 සහ 14 වන චුදිතයන් විසින් හරස් ප්‍රශ්න අසන ලදී.

4 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් මෙම සාක්ෂිකරු පවසා සිටියෙ තමා මෙම වැඩසටහන් මාලාවට සහභාගී වෙන්නට ගිය පුද්ගලයෙක් නොවෙන බවත්, එම වැඩසටහනේ තේ පැන් සංග්‍රහය කිරීම සඳහා ගිය බවත්, කෙසේ නමුත්, එම වැඩමුලුවෙ තමා හිටපු කාලයේදී තම විසින් දුටු දේවල් සම්බන්ධව තම සාක්ෂි දෙන බවටය. තවද, ‘‘එහෙම පල්ලි කඩන්න එන කට්ටියත් එක්ක තමයි එහෙම සටහන් කරන්න ඕනෙ. යුද්ධ කරන්න ඕනෙ. ඔවුන්ව මරන්න අවශ්‍යතාවයක් ආවොත් ඒ මරන්නත් ඕනෙ’’ යැයි එම දේශනාවේදී පැවසූ බවට සාක්ෂිකරු පවසා ඇත. තවද, ‘‘ සාමාන්‍ය පුද්ගලයන්ව මරන්න ඕනෙ කියලා කිව්වේ නැහැ. කියලා ඔබට මතකයක් තිබෙනවාද. සාමාන්‍ය ඉන්න තැනැත්තන්ව මරන්න ඕන කියලා එම ස්ථානයේදී කිව්වේ නැහැ කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද? ලෙස අසන ලද ප්‍රශ්නයට සාක්ෂිකරු මට ඒක මතක නැහැ යනුවෙන් උත්තර ලබා දී ඇත.

9 වන චූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී ‘‘ ඔය සහජීවනය කරගෙන රටේ නැත්තේ බොදුබල සේනා යන සංවිධානවල් මුස්ලිම් විරෝධී ක්‍රියාවන් සිදු කරන නිසාත් ඔය හිජාබ්, හලාල් වැනි ප්‍රශ්නවල් අනවශ්‍ය ලෙස අවුස්සන නිසාත් කියලා කියපු එකක් මතකද? ’’ ලෙස අසන ලද

ප්‍රශ්නයට සාක්ෂිකරු ඔව් ලෙස පිළිතුරු ලබා දී ඇත. තවද, ‘‘ දිගන සහ අලුත්ගම වැනි ප්‍රදේශවල සිදු වෙච්ච ප්‍රශ්නවලත් ඥාණසාර හාමුදුරුවෝ යන පුද්ගලයෙක් ගැන මම කතා කරලා ඒ අය ඇති කරන ප්‍රශ්න නිසා එම අවස්ථාවේදි අපේ රටේ සහජීවනයක් නැහැ. කියලා මම කියපු දෙයක් මතකද?’’ ලෙස අසන ලද ප්‍රශ්නයටත් ‘‘ඒ සිදුවීම ගැන කිව්වා’’ ලෙස සාක්ෂිකරු පිළිතුරු ලබා දී ඇත. 9 වැනි චූදිත විසින් ‘‘ මුස්ලිම් රටක් නොවන බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේදී ඔය වගේ මුස්ලිම් පිරිසට හිරිහැර ඇතිවනකොට මෙම මුස්ලිම් නොවන රටක අපට ජීවත් වීමට හැකියාවක් නැහැ. ’’, ‘‘ අපි නිකන් ඉද්දී අපිත් එක්ක නිකන් රණ්ඩුවට, සටහනට එන මිනිසුන් සමඟ ආත්මාරක්ෂක විදියට තමයි සටන් කිරීමට අනුමැතිය තියෙන්නේ. ’’ ලෙස එම දේශනාවලදී ප්‍රකාශ කළ බවට මතක තිබේදැයි සාක්ෂිකරුගෙන් ඇසූ අතර ඒ සම්බන්ධයෙන් නිශ්චිත මතකයක් නොමැති බවට සාක්ෂිකරු පවසා ඇත. 09 වන විත්තිකරු මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු දවස් 04 ක් එම වැඩ සටහනට සහභාගී වුනේ සවස් වෙලාවේ බැවින් එහි සිදු කල දේශනාවන් වල සම්පූර්ණයෙන්ම සඳහන් කලේ කුමක්ද යන්න මෙම සාක්ෂිකරුට හැකියාවක් නොමැති බවට වුවද සාක්ෂිකරු එයට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ තමා පවසා සිටින්නේ සම්පූර්ණයෙන්ම සවස් වරුවේ තමා ගොස් අහපු දේවල් බවයි. මෙම 09 වන චූදිත එදින තමා විසින් පවත්වන ලද දේශනයේදී තමා බෝම්බ ගහන්නේ කෙසේද යන්න හෝ අහිංසක මිනිස්සු

මරන ලෙසට පැවසීමක් හෝ අවි පුහුණුවක් ලබා දීමක් හෝ බෝම්බ ප්‍රහාරයක් ශ්‍රී ලංකාවේ සිදු කිරීමට මෙම සාක්ෂිකරු ඉදිරියේ දී සිදු නොකල බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 11 වන චූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, සාක්ෂිකරු 11 වන චූදිතව TID එකේදි දුටු බවත්, තමාලා එකට සිටි බවත් පවසා ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන් 11 වන චූදිත අසා ඇත්තේ මෙම සාක්ෂිකරු මෙන්ම මහේස්ත්‍රාත්වරයාට 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් දෙන්න ඕනෑ යැයි පවසා 11 වන චූදිත වන තමාවද මෙම සාක්ෂිකරු සමඟ තියාගෙන සිටිය බවට වුවද එයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එවැනි ක්‍රියාවලියක් සිදු වන බව තමා දන්න බවත් 11 වන චූදිත එලෙස ප්‍රකාශයක් ලබා දීමට කැමැත්තෙන් සිටින බවට 11 වන චූදිත තමාට පවසා තිබෙන බවත් එම ප්‍රකාශය ලියුවාද නැද්ද තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. තවදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ දිගන හා අළුත්ගම ප්‍රදේශවල සිද්ධීන් වලින් පීඩාවට පත් වුනේ මුස්ලිම් ජනතාව බවත්, පාස්කු සිද්ධි මාලාවෙන් වැඩිපුරම පීඩාවට පත් වුනේ ක්‍රිස්තියානි ජනතාව බවත් දිගන හා අළුත්ගම ප්‍රදේශවල සිදු වුන සිද්ධීන් සිදු කලේ ක්‍රිස්තියානි ජාතිකයින් යැයි කියන්න තමාට බැරි බවත්, එය කලේ කවුද යන්න තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 14 වන චූදිත රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, එහිදී සාක්ෂිකරු පවසා ඇත්තේ තමා 14 වන චූදිතගේ පොඩි පුතා සමග එකට ඉගෙන ගත්ත බවත්, තමා 14 වන චූදිතගේ නිවසටද ගොස් තිබෙන බවත් රාමසාන් උපවාස කාලයේදී දෙල්ගහගොඩ ජුම්මා පල්ලියේදී මෙන්ම තමාගේ පාසැලේ පවත්වන ලද වැඩසටහන් වලදී ද 14 වන චූදිත විසින් දේශනා පවත්වා ඇති බවක් එකී දේශනාවන් වලදී 14 වන චූදිත නීතිවිරෝධි දේවල් ගැන කිසිවක් හෝ පවසා නැති බවත් ඔහු එලෙස දේශනාවන් පැවැත්වූ නිසා තම ගමේ ප්‍රශ්න හෝ ආරවුල් ඇති වී නැති බවත්ය.

මෙම සාක්ෂිකරුගෙන් පැමිණිල්ල විසින් නැවත ප්‍රශ්න අසා ඇති අතර එම ප්‍රශ්නවලට උත්තර ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ තමා විමර්ශන කටයුතුවලදී ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන්ට සහ උගත් මහේස්ත්‍රාත්තුමාට ප්‍රකාශ ලබා දී ඇති බවත් එම ප්‍රකාශවල කිසිවිටෙක බොරුවක් පවසා නොමැති බවත්ය.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 1401 ජාසිර්කාන් ජවුෆර් සාදික් යන</u>

<u>සාක්ෂිකරුගේ සාක්ෂිය</u> විශ්ලේෂණය.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන්නේ ඔහුගේ සාක්ෂිය මගින් මෙම නඩුවෙහි 04 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය විසින් 2018 වසරේ ශ්‍රී ලංකා ඉස්ලාම් ශිෂ්‍ය සංවිධානය මගින් පැවැත්වූ වැඩමුළුවකට මෙම සාක්ෂිකරුද සහභාගී වූ අවස්ථාවේදී 04 වන චූදිත විසින් දේශනයක් පවත්වමින් ‘‘මුස්ලිම් නොවන රටක් මුස්ලිම් රටක් බවට පත් කරනවා නම් අපි යුද්ධයක් කරන්න ඕනේ. අපි යුද්ධයක් පටන් ගන්න යන්නේ.’’ ලෙසට පවසා ඇති බවයි. එසේම 4 වන චූදිත විසින් එම වැඩමුළුවේදී සන්නද්ධ පුද්ගලයන්ගේ සහ යුධ උපකරණවල ඡායාරූප ආදිය සහිත වීඩියෝ දර්ශන පෙන්වමින් පලස්තීනය වැනි අරාබි රටවල සහ ඉස්ලාම් ඉතිහාසයේ යුද්ධ පිළිබඳව කරුණු පැහැදිලි කර දී ඇති බවත්, අන්‍ය ආගම්වල අයට විරුද්ධව සිදු කරන මෙම යුද්ධයේදී මියයන පුද්ගලයන් කෙළින්ම ස්වර්ගයට යන බවද පවසා ඔවුන්ගේ සංවිධානය සමඟ එක්වී අවසානය තෙක් රැඳී සිටින ලෙසට ඉල්ලා සිට ඇති බවත්, ‘‘මේකෙන් එළියට ගියාට පස්සේ අනිත් කට්ටිය මේක වැරදියි කියලා කියන්න පුළුවන්. හැබැයි මේක තමයි හරි.’’ යැයි පවසා 04 වන චූදිත තමාගේ ආකල්ප, මතිමතාන්තර එම වැඩමුළුවට

සහභාගී වූ මුස්ලිම් තරුණයින්ගේ හිත්වලට කාවැද්දීමට කටයුතු කර ඇති බවයි.

04 වන චූදිත " අපි යුද්ධයක්පටන් ගන්න යන්නේ යැයි" පවසා ඇති පසුබිම තුළ එය සිදු කරන්නේ මුස්ලිම් නොවන රටක් මුස්ලිම් රටක් බවට පත් කිරීමට බවට ඔහු විසින් පවසා ඇති වචන තුළින්ම මැනවින් ගම්‍ය වන පසුබිම තුළ එමගින් අන්‍ය ආගමිකයින් අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජනකොටස් හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගිතිය නැතහොත් දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ වචන ඔහු විසින් පවසා ඇති බවයි. ඔහු විසින් ඉහත පරිදි පවසා ඇති වචන මඟින්, විශේෂයෙන්ම අපි යුද්ධයක් පටන් ගන්න යන්නේ යැයි පවසා ඇති වචන තුළින්ම බහුජාතික, විවිධ ආගම් අදහන ශ්‍රී ලංකාවෙහි ජාතික සමගියට ඉන් ප්‍රබල බලපෑමක් ඇතිවීම නොවැලැක්විය හැකිය. ඔහු එවන් වචන පවසා ඇත්තේ ඔහුගේ දේශනවලට සහභාගී වූ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි 40 කට අධික සිසුන් පිරිසකට වන බැවින් එමඟින් එම තරුණයන්ගේ සිත් අන්තවාදී ක්‍රියාවන් කිරීමට පෙළඹවීම නොවැළැක්විය හැකිය.

09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අය විසින්ද ඉහත වැඩමුළුවේදී දේශන පවත්වමින් "සහජීවනය කියල එහෙම දෙයක් නැහැ, ආගම් අතර එහෙම සහජීවනයක් පැවැත්වෙන්න බැහැ, " යනුවෙන් පැවසූ බවත් එසේම "මුස්ලිම් රටක් නොවන රටක මුස්ලිම්

කට්ටියට ජීවත් වෙන්න බැහැ'' යැයි ප්‍රකාශ කළ බවත්, එසේම මුස්ලිම් රටක් නොවනවා නම් ඒ රට මුස්ලිම් රටක් විධියටම අපි චේන්ජ් කරන්න ඕනෑ.'' ''එසේම මේ අප ඉන්න රට මුස්ලිම් රටක් නොවන නිසා මේ රට මුස්ලිම් රටක් බවට අප පවත්වාගන්න ඕනෑ.'' යැයි දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි 40 කට අධික සිසුන් පිරිසකට වන බැවින් එමඟින් එම තරුණ සිසුන්ගේ සිත් අන්තවාදී ක්‍රියාවන් කිරීමට පෙළඹවීම නොවැළැක්විය හැකිය.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් මෙම සාක්ෂිකරු වන ජාසිර්කාන් ජවුෆර් සාදික් යන සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි ලබා දුන් අවස්ථාව වන විට විශ්ව විද්‍යාල සිසුවෙක් ලෙස සිටින ලද අතර, ඔහු ඉහත පරිදි 04 සහ 09 චූදිතයින් විසින් අන්තවාදී දේශනා පවත්වා ඇති වැඩමුළුවට සහභාගී වී ඇත්තේ ඔහු අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් වී උසස් පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි කාලසීමාව තුළදී 2018 දෙසැම්බර් මාසයේ වන අතර, එකී දේශනාවන් පවත්වා ඇත්තේ දෙල්ගහගොඩ තවුහිද් පල්ලිය නමැති පල්ලියේ වන අතර තරුණ සිසුන්ට යුද්ධ කිරීම් පිළිබඳව කරුණු උගන්වා එසේම අවි ගත් පුද්ගලයින් සටන්වලට අදාළ රූපරාමු ආදිය පොජෙක්ටරයක් ආධාරයෙන් ප්‍රදර්ශනය කරමින් ඔවුන් සංවිධානයට කට්ටිය එකතු කර ගැනීමට පොළඹා ගැනීමට කටයුතු කර ඇති බව පෙනී යන අතර මෙම සාක්ෂිකරු ඔහුගේ මූලික සාක්ෂියේදි පවසා ඇත්තේ එම දේශනා ඇසීමෙන් තමා මේක ඇත්තද?

වැරදි ද යැයි සිතා Confusee වෙලා සිටි බවට වන අතර ඒ අනුව බලන කල, එකී අන්තවාදී දේශනා ඇසීමෙන් එවකට උසස් පෙළ අධ්‍යාපනය හදාරමින් සිටි මෙම සාක්ෂිකරු ව්‍යාකූල තත්ත්වයට පත් වී ඇති බව මනාව පැහැදිලි වේ. ඒ අනුව බලන කළ 4 සහ 9 වූදිතයින් හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුට කර ඇති යෝජනාවන් හුදු යෝජනාවන් පමණක් බවට පෙනී යන අතර සාක්ෂිකරු විසින් ඉහත පරිදි 4 සහ 9 වූදිතයින් තරුණ වයසේ පාසල් සිසුන් 40කට ආසන්න පිරිසකට ආගමික අන්තවාදී දේශනා සිදු කර මුස්ලිම් නොවන රටක් වන ශ්‍රී ලංකාව මුස්ලිම් රටක් බවට පරිවර්තනය කිරීම සඳහා යුද්ධ කළයුතු බවට දේශනා කළ බවට මෙම සාක්ෂිකරු ලබාදුන් සාක්ෂියෙහි විශ්වසනීයභාවය සම්බන්ධයෙන් කිසිදු සැකයක් අපගේ සිත් තුළ ජනිත වන්නේ නැත. ඒ අනුව, ඔහු මෙම සාක්ෂිකරු සත්‍ය පැවසූ සාක්ෂිකරුවෙකු බවට අප තීරණය කරමු.

<u>පැ.සා.2233, සෙයියදු අහමදු අස්මියා</u>

පැ.සා.2233, සෙයියදු අහමදු අස්මියා යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා මඩකලපුව කාත්තන්කුඩි ප්‍රදේශයේ ස්ථිර පදිංචිකාරියක් බවත්, විවාහ වී දරුවන් තිදෙනෙක් සිටින බවත්, තමාගේ ස්වාමි පුරුෂයා වන මොහොමඩ් නියාස් යන අය දැනට මියගොස් සිටින බවත්, ඔහු 2019 අප්‍රේල් මාසයේ සයින්දමරදු හෝ සමන්තුර ප්‍රදේශයේ (සාක්ෂිකාරියට අදාළ ප්‍රදේශය නිශ්චිත මතකයක් නොමැති බවට පවසා ඇත.) නිවසක

සිදුවූ බෝම්බ පිපිරීමකින් මිය ගිය බවත්, ඔහුගේ මෘත දේහය අම්පාර දිස්ත්‍රික් රෝහලේදී තමා විසින් හඳුනා ගත් බවත්ය. කාත්තන්කුඩි ප්‍රදේශයේ තමාගේ නිවසට ආසන්නව අෆ්රින් යන තැනැත්තියක් සිටින බවත්, ඇයගේ ස්වාමිපුරුෂයා සෙයිනි යන අය බවත්, ඔහුට මදනියා, සහරාන් සහ ඉදායා යන සහෝදරයන් සිටින බවත්, අෆ්රින් ඉදායා, සෙයිනි සහ සහරාන් යන අය දැනට මිය ගොස් සිටින බවත්, තමා අත්අඩංගුවේ සිටි කාලයේ ඒ අය මියගිය බවට තමාට දැනුම් දුන් බවටත් සාක්ෂිකාරිය පවසා සිටින ලදි. සෙයිනි යන අය කාත්තන්කුඩි ප්‍රදේශයේ තිබූ තාවුල්අදර් යන පල්ලියේ මවුලවිවරයෙකු ලෙස කටයුතු කළ බවත්, ඔහු ඔහුගේ නිවසේ සහ අනෙකුත් පුද්ගලයන්ගේ නිවෙස් වල කාන්තාවන්ට දේශනා පවත්වන බවත්, තමා කීපවිටක් එවැනි දේශනා වලට සහභාගී වී තිබෙන බවත්, එම දේශනා වලදි ආගම, මත්ද්‍රව්‍ය මර්ධනය, පවු සිදු නොකිරීම, පොළියට දීම වැනි මාතෘකා සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත්, එම දේශනා වලට තමාට අමතරව වෙනත් කාන්තාවන්ද සහභාගී වූ බවටත් කියා සිටින ලදි. එවැනි දේශනාවක් තමාගේ නිවසේද පැවැත්වූ බවත්, ඊට අමතරව මෙම නඩුවේ 02 වන චූදිතගේ නිවසේ සහ රවුෆ් යන අයගේ නිවසේත් එවැනි දේශනා පැවැත්වූ බවටත් සාක්ෂිකාරිය කියා සිටින ලදි. තවද, පාලුමුණේ ප්‍රදේශයේද මෙවැනි දේශනාවක් පැවැත්වූ බවත්, එම දේශනාවට තමාද සහභාගී වූ බවත්, එම දේශනාවේ මෙම නඩුවේ 01 වන චූදිත, සෙයිනි සහ සහරාන් යන අය දේශනා පැවැත්වූ බවත්, එදින මෙම නඩුවේ 02 වන සහ

03 වන චූදිතත් එහි සිටි බවත්, තවත් කාන්තාවන්ද එම දේශනයට සහභාගී වූ බවටත් සාක්ෂිකාරිය කියා සිටින ලදි.

මෙම සාක්ෂිකාරියගෙන් 01 වන, 03 වන සහ 14 වන චූදිතයන් හරස් ප්‍රශ්න අසා ඇත.

01 වන චූදිත විසින් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකාරිය කියා සිටියේ, පාලමුණ ප්‍රදේශයේ සිදුවූ දේශනාවේදී කාව හෝ මරන්න අවශ්‍ය ලෙස හෝ බෝම්බ පිපිරවීම සිදු කිරීමට අවශ්‍ය බවට කිසිදු දේශනාවක් සිදුකර නොමැති බවට සාක්ෂිකාරිය විසින් කියා සිටින ලදි.

03 වන චූදිත විසින් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකාරිය කියා සිටියේ, පාලමුණ ප්‍රදේශයේ සෙයිනි මවුලවි විසින් කරන ලද දේශනාවේදී මිනිස්සුන්ව මරන්න ඕනේ ලෙස හෝ බෝම්බ පුපුරවා මරන්න ඕනේ ලෙස කිසිදු දේශනාවක් සිදු නොකළ බවත්, මිනිස් සමාජයත් සමඟ ඉස්ලාමීය නීතිරීති පිළිපදිමින් එකම දෙවියෝ අල්ලාහ් බවටත්, ඔහුගේ අවසාන රසුල්වරයා මොහොමඩ් නබි (සල්ලල්ලාහු අලෙහි වසල්නා) තුමා වශයෙනුත් ඔහුගේ නියමන අනුව ජීවත් විය යුතු බවටත් ඔහු විසින් දේශනා කළ බවයි.

තවද, ෆාතිමා ජුස්නා යන 03 වන චූදිතගේ බිරිඳගේ නිවසේත් සෙයිනි මවුලවි විසින් එවැනි ආගමික දේශනාවක් පැවැත්වූ බවත්, එම

දේශනාවේදීත් මිනිස්සුන්ව මරන්න අවශයයි, ක්‍රිස්තියානි පල්ලි වලට බෝම්බ තියන්න අවශ්‍යයි යනුවෙන් කිසිදු දෙයක් නොපැවසූ බවට සාක්ෂිකාරිය කියා සිටින ලදි. තවද එම දේශනා වලදි එම දේශනා වලට සහභාගී වූ අය සියදිවි නසාගත යුතු ලෙසට කිසිවිටක සෙයිනි මවුලවි විසින් නොපැවසූ බවත්, එලෙසම එවැනි දේශනා පැවැත්වූ අවස්ථා වලදී සෙයිනි මවුලවි, සහරාන් මවුලවි හෝ නවුෆර් මවුලවි යන අය විසින් කිසිවිටක ත්‍රස්තවාදය සම්බන්ධයෙන් හෝ ජනතාව අතර මතභේදාත්මක ගැටුම් ඇති කිරීම සම්බන්ධයෙන් හෝ අහිංසක මිනිසුන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් හෝ අන්තවාදී අදහස් ඇති කිරීම සම්බන්ධයෙන් කිසිවිටක දේශනා පවත්වා නොමැති බවට සාක්ෂිකාරිය විසින් පවසා සිටින ලදි.

තවද, තමා අත්අඩංගුවේ සිටින විට තදබල මානසික පීඩනයක සිටි බවත් ‘‘අපි කියන විදියට ඔබ විනිසුරුතුමා ලගට ගිහිල්ලා කිව්ව නම් අපි ඔබව අත්හරිනවා’’ යනුවෙන් ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයේ නිළධාරීන් පැවසූ බවත්, එලෙස ප්‍රකාශයක් ලබාදුනහොත් තමාව මුදා හරින බවට එම නිළධාරීන් පොරොන්දු වූ බවත්, ඉන්පසු තමා නිදහස් වූ බවටත් සාක්ෂිකාරිය තවදුරටත් සාක්ෂි ලබා දෙමින් පවසා සිටින ලදි.

විශ්ලේෂණය

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් ඇය සයින්දමරුදු ප්‍රදේශයේදී සිදු වූ සිද්ධියෙන් මියගොස් ඇති නියාස් මවුලවි නැමැත්තාගේ බිරිඳ වන අතර, ඇය කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිව සිටිමින් මෙම නඩුවෙහි 01 චූදිත නවුෆර් මවුලවි යන අයව හොඳින් දැන හඳුනන තැනැත්තියක් වේ. එසේම ස්වයංඝාතක බෝම්බකරු වන සහරාන් නැමැත්තාවද හොඳින් දන්නා තැනැත්තියක් බවට පෙනී යන අතර, ඇය සහරාන් ඇතුළු කණ්ඩායම විසින් පාලමුන ප්‍රදේශයේ කාන්තාවන් පමණක් ඉලක්ක කරගෙන පවත්වා ඇති පුහුණු වැඩමුළුවකට සහභාගී වී ඇති බව පෙනී යන අතර, එකී වැඩමුළුවට මෙම නඩුවෙහි 03 වන චූදිත මිල්හාන් නැමැත්තාගේ භාර්යාවද සහභාගී වී ඇති බව හෙළිවේ. එසේම මෙම නඩුවෙහි 02 වන චූදිත ගෆූර් මාමා යන අයද එම වැඩමුළුව පැවැත්වුනු ගොඩනැගිල්ලෙහි ඉහළ මාලයේ සිටිනවා දුටු බවට ඇයගේ සාක්ෂිය තුළින් හෙළි වේ. මෙම සාක්ෂිකාරිය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන් විලාශය නිරීක්ෂණය කිරීමට අපහට අවස්ථාව ලැබුනු අතර, ඇය මූලික සාක්ෂි වලදී බොහෝ අදිමදි කරමින් පිළිතුරු ලබා දුන්නද චූදිතයින් විසින් හරස් ප්‍රශ්න අසන ලද අවස්ථාවේ ඉතා උනන්දුවෙන් සාක්ෂි ලබා දුන් බව අප නිරීක්ෂණය කරන ලදී. කෙසේ වුවද ඇයගේ සාක්ෂිය තුළින් පෙනී යන ප්‍රධාන කරුණක් වන්නේ සැබැවින්ම පාලමුන ප්‍රදේශයේ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් සහරාන් ඇතුළු

අනුගාමිකයින් විසින් ඔහුගේ කණ්ඩායම විසින් යම් දේශන පැවැත්වීමක් සිදු කර ඇති බවයි. කෙසේ වෙතත් එකී දේශන වලදී අන්තවාදී කරුණු සඳහන් නොකල බවට සහ ඉස්ලාම් ආගමේ අකීදාවන් එනම් මූලධර්මයන් සම්බන්ධයෙන් පමණක් කරුණු දැක්වූ බවට පැවසීමට ඇය අධික උත්සාහයක් දැරූ ආකාරය අප නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව හුදෙක් පාලමුන ප්‍රදේශයේ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ඉහත පරිදි වැඩමුළුවක් පවත්වා තිබීම සම්බන්ධයෙන් විනා වෙනත් කරුණු හෙළි කිරීමක් සිදු කර නොමැති බව පෙනී යයි.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 1719 රන්හවඩිගේ ලයනල් සමරවීර</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1719 ප්‍රධාන පොලිස් පරීක්ෂක රන්හවඩිගේ ලයනල් සමරවීර සාක්ෂි දෙමින්, තමා වර්ෂ 2012 සිට අපරාධ ස්ථාන පරික්ෂණාගාර නිලධාරියෙක් ලෙස කටයුතු කරන බවත්, 2019 අප්‍රේල් මස 21 වන දින ලංකාවේ සිදුවූ බෝම්බ ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් රාජකාරි කිරීමේදී වර්ෂ 2019.04.26 වන දින බුද්ධි අංශ තොරතුරු මත කොට්ඨාශ භාර නිලධාරීවරයා විසින් තමාට සමන්තුරේ සෙංගල් ග්‍රාම 01 හි ෆවුස් මාවතෙහි පිහිටි ස්මයිල් ලෙබ්බේ අබ්දුල් රහීම් අය විසින් කුලියට ලබා දී තිබූ ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් විමර්ෂණය

කිරීමට උප පොලිස් පරීක්ෂක සිල්වා, පොලිස් සැරයන් 1023 මැන්දිස්, පොලිස් සැරයන් 24609 කරුණාරත්න, පොලිස් කොස්තාපල් 66500 සිරිවර්ධන, පොලිස් කොස්තාපල් 61682 බණ්ඩාර යන නිලධාරීන් සමග පිටත්ව ගිය බව කියා සිටින ලදී. එම ස්ථානයට ළඟා වන විට කොට්ඨාශ භාර එවක නිලධාරී පොලිස් අධිකාරී සමන්ත විජේසේකර මහතාත්, විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් මෙන්ම වට ආරක්ෂාවේ යෙදී සිටි යුධ හමුදා නිලධාරීන්ද එම ස්ථානය ගරාජයක් ලෙස භාවිතා කළ හැකි දෙපසින් දොරවල් සහිත ඉදිරි පස රෝල් දොරක් සහිත ස්ථානයක් බවත් එම ස්ථානයෙන් ජානමය සාක්ෂි සොයා ගැනීමට හැකියාවක් ඇත්ද යන්න තම කණ්ඩායමේ ප්‍රධාන බලාපොරොත්තුව වූ අතර ඒ අනුව DNA විශ්ලේෂණය සඳහා අංක 1 ලෙස සලකුණු කර කලු පැහැති මෙම ත්‍රස්ත පිරිස ඇඳ සිටි බවට සිතිය හැකි ඇඳුමෙන් පරීක්ෂාකොට එහි කොළර දාරයේ රැඳී තිබූ කෙස්ගස් 1ක්ද, අංක 2 ලෙස සලකුණු කරන ලද දුඹුරු පැහැයෙන් යුත් සපත්තුවේ දකුණු සපත්තුවේ තිබූ කෙස්ගස් 1ක්ද, අංක 5 ලෙස සලකුණු කළ රබර්, කහපාට ග්ලව්ස්හි වම්පස අත් ග්ලවුසයේ කෙටි කෙස් හෝ රෝමකූප 7ක් ද, අංක 6 ලෙස සලකුණු කළ කලු, අළු හිස්වැසුමේ තිබූ කෙටි කෙස්ගසක් ද, අංක 12 ලෙස සලකුණු කළ දුඹුරු පසුබිමේ සුදු ඉරි රටා සහිත ටීෂර්ට්යේ තිබූ කෙටි කෙස් හෝ රෝමකූපගසක් ද නඩු භාණ්ඩ ලෙස තමා භාරයට ගත් බව කියා සිටින ලදී. එම භාණ්ඩ සියල්ලම SOCO PR65/19 කියන අංකයට 2019/04/30 වන

දින ඇතුළත් කර 2019.05.30 දින නඩු අංක 4596/2019 යටතේ සමන්තුරේ උසාවියට භාරදුන් බවත් නඩු භාණ්ඩ තමා භාරයට ගත් දින සිට ලේඛන ගතකොට අධිකරණයට භාරදුන් දින දක්වා වෙනත් භාහිර පුද්ගලයෙකුට කිසිදු ප්‍රවේෂයක් රහිතව ආරක්ෂිතව තමා භාරයේම තිබූ බව කියා සිටින ලදී. ඉන් අනතුරුව එකී භාණ්ඩ අම්පාර මූලස්ථාන පොලිස්ථානය වෙත ගෙනවිත් අම්පාර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකවරයා වෙත භාරදුන් බවත් ඒ අනුව එම භාණ්ඩ අම්පාර මූලස්ථාන පොලිසියේ නඩු බඩු කුවිතාන්සි අංක 508/2019 යටතේ ලේඛන ගත කොට අම්පාර මූලස්ථාන පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කළ බව සාක්ෂිකරු කියා සිටින ලදී. සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව එම ස්ථානයේ තිබී සොයා ගන්නා ලද නඩු භාණ්ඩ පහත පරිදි වේ.

01) කුඩා යකඩ බෝල 100 බැගින් අඩංගු පැකට් 678 ක්, 02) ඩ්‍රෝන කැමරා 01 ක්, 03) ලැප්ටොප් පරිගණක 01 ක්, 04) ලැප්ටොප් යන්ත්‍ර චාජර් 01 ක්, 05) පෙන් ඩ්‍රයිව් භාවිතා කළ 01 ක්, 06) අමතර දත්ත රදවන 01 ක්, 07) සිම් රහිත ස්විච් වර්ගයේ දුරකථනය, 08) මයික්‍රොමැක්ස් සිම් සහ බැටරි රහිත දුරකථනය, 09) දුරකථන බැටරි 07ක්, 10) නොකියා කැමරා ජංගම දුරකථන 01 ක්, 11) සැම්සුන්ග් ස්මාර්ට් ජංගම දුරකථන 04 ක්, 12) අංක 89940505143383831115 දරන එයාර්ටෙල් සිම් කාඩ් පත් 01, 13) සීසිටීවී කැමරා 04 ක්, 14) AC/DC CCTV කැමරා ඇඩප්පර 05 ක්, 15) ජෙලයිනයිට් කූරු 181 ක්, 16) චීනයේ නිෂ්පාදිත රතු පැහැති

ආවරණයකින් යුතු ජෙලයිනයිට් කූරු 01 ක්, 17) ඩෙටනේටර් කෝඩ් කුඩා රෝල් (රතු) 06 ක්, 18) කළු වයර් හෝස් 01 ක්, 19) සිහින් කම්බි කළු කුඩා රෝල් 01 ක්, 20) එම වයර් හෝස් කුඩා රෝල් 01 ක්, 21) රතු කළු බැටරි ක්ලිප් 34 ක්, 22) කළු හෙඩ් ෂෙට් 01 ක්, 23) ඩබල් ටේප් විවෘත කළ 02 ක්, 24) ඩබල් ටේප් විවෘත නොකළ 02 ක්, 25) ඊයම් රෝල් ස්වල්පයක් සහිත 01 ක්, 26) කුඩා මේස ඔරලෝසු 01 ක්, 27) පරිපථ සඳහා යොදා ගන්නා හතරැස් බැටරි 35 ක්, 28) සුපර් ග්ලූ ගම් ටියුබ් 04 ක්, 29) මල් ස්කුරුප්පු නියන් 02 ක්, 30) කුඩා කටර් අඩු 01 ක්, 31) ඇම්පියර් 5 පිවුස් 05 ක්, 32) පරිපථ සීරු මාරු ස්විච් 13 ක්, 33) කළු ටේප් රෝල් 01 ක්, 34) USB කෝඩ් 01 ක්, 35) සුදු සිරියස් බල්බ් 69 ක්, 36) රවුම් ප්‍රෙශ් බටන් ස්විච් 01 ක්, 37) වයර් ක්ලිප් සහ ටින්ටස් ඇණ කප් 01 ක්, 38) යකඩ කළු පැහැති ආරෝපණය කළ හැකි විදුලි පන්දම් 01 ක්, 39) හඳුන්කූරු පෙට්ටි 01 ක්, 40) ගෑස් මුහුණු පාවිච්චි නොකළ 08 ක්, 41) එම පිල්ටර් 10 ක්, 42) පාවිච්චි නොකළ 16GB පෙන් ඩ්‍රයිව් 95 ක්, 43) ප්‍රථමාධාර උපාංග කට්ටල 01 ක්, 44) බැටරි 06 ක් යොදා සැකසූ විදුලි පරිපථ 02 ක්, 45) අර්ධව සැකසූ විදුලි පරිපථ 06 ක්, 46) සකස් නොකළ පරිපථ පෙට්ටි 11 ක්, 47) අත්වැසුම් (රබර් කළු සහ කහ) 11 ක්, 48) LED බල්බ් 03 ක්, 49) කෝට් 05 මල්ටි ප්ලග් 03 ක්, 50) ප්ලාස්ටික් ට්‍රේ (රතු, කොළ, නිල්, රෝස) 19 ක්, 51) ගන්බුට් (කළු) ජෝඩු 02 ක්, 52) ටි කෝර් වයර් 15 KG ක් පමණ, 53)

සුදු පොලිතින් බට 2 KG ක් පමණ, 54) රතු, කළු වයර් කට්ටල 49 ක්, 55) කුඩා යකඩ බට 01 ක්, 56) තහඩු කැබලි 02 ක්, 57) කළු ට්‍රයි පොඩි 02 ක්, 58) ලී මිට සහිත මිටි 01 ක්, 59) අඟල් 02 ටේප් කළු 08 ක්, 60) අඟල් 2 ½ සුදු ටේප් 04 ක්, 61) ඇස් ආවරණ 01 ක්, 62) බැනර් (අයි එස් ලාංඡනය සහිත) 01 යි, 63) නිකල් ගෑරුප්පු 09 යි, 64) නිකල් හැදි 09 යි, 65) නිකල් පිහි 09 යි, 66) පිහි 01 යි, 67) ප්ලාස්ටික් හැදි 01 යි, 68) නයිලෝන් කේබල් (ට්‍රයිබැකට්) පැකට් 01 යි, 69) සුදු පැහැති ඇලෙනසුළු කූරු 45 යි, 70) යූරියා 50KG ප්‍රමාණයේ මිටි 05 යි, 71) යූරියා පාවිච්චි කළ ½ මිටි 02 යි, 72) මල් පොහොර 5 KG මිටි 05 යි, 73) හිස් කෑන් කළු පාට ලොකු 02 යි, 74) හිස් කෑන් කළු පාට පොඩි 05 යි, 75) හිස් කෑන් නිල් පාට ලොකු 01 යි, 76) නයිට්‍රෙට් ඇසිඩ් බවට සඳහන් දියර සහිත කළු බූලි 04 යි, 77) සල්ෆියුරික් ඇසිඩ් බවට සඳහන් සුදු බූලි 11 යි, 78) ලීටර් 5 ප්‍රමාණයේ අවර්ණ දියර සහිත සුදු කෑන් 04 යි, 79) කොහු මිටන් 01 යි, 80) ප්ලාස්ටික් ඉදල් 01 යි, 81) නිල් පාට හෝස් 02 යි, 82) චින්තා පැදුරු (ලොකු) 02 යි, 83) නිකල් ආධාරක සහිත විවිධ ප්‍රමාණයේ කල්දේරම් 12 යි, 84) ප්ලාස්ටික් බේසම් 09 යි, 85) නිල් පාට ප්ලාස්ටික් බැරල් 04 යි, 86) සෘජු ෆෝම් පෙට්ටි 09 යි, 87) උස ප්ලාස්ටික් බකට් 02 යි, 88) CPU හිස් පෙට්ටි 01 යි, 89) පාවිච්චි නොකළ වතුර මල් 01 යි, 90) ත්‍රී කොර් වයර් මීටර් 10 ක් පමණ, 91) ජංගම එෂි මැෂින් 03 යි, 92) ගමන් බෑගය (අළු/කළු) 06 යි,

93) ගෝනි පඩංගු රෝල් 01 යි, 94) නිල් පාට ටෙන්ට් රෙදි 02 යි, 95) මෙට්ටා 01 යි, 96) යකඩ ඇදන් 01 යි, 97) තුනි ඇද ලෑලි 01 යි, 98) බුර්කා ඇඳුම් 01 යි, 99) කූඩාරම් 02 යි, 100) අලෝක ආවරණ 02 යි, 101) බවුත් 02 යි, 102) හීටර් ජග් 01 යි, 103) හිස් ආවරණ 05 යි, 104) මුස්ලිම් තොප්පි 05 යි, 105) මුස්ලිම් ආගමට අදාළ පොත්පත් 07 යි, 106) ඔරෝල් කිට් නිල් පාට 02 යි, 107) නිල් පාට ඩෙනිම් 01 යි, 108) කළු පාට බොටම් 03 යි, 109) කළු පාට රෙදි තොප්පි 01 යි, 110) දුඹුරු පාට ටී ෂර්ට් 01 යි, 111) දුඹුරු සපත්තු යුගල් 01 යි, 112) හම් පටි අත්ඔරලෝසු 01 යි, 113) විවිධ ප්‍රමාණයේ වීදුරු බඳුන් 09 යි, 114) පුනිල හැඩැති බීකර 03 යි, 115) වීදුරු නළ 01 යි, 116) පාවිච්චි නොකළ ගෑස් ලිප් 01 යි, 117) ජංගම වීඩියෝ කැමරා 01 යි, 118) මල්ටි ප්‍රොජෙක්ටර් 01 යි, 119) පුපුරණ ද්‍රව්‍ය බවට සැක කරන පාර්සල් 02 ක්.

සාක්ෂිකරුට පැ.820 දරන සංයුක්ත තැටියේ අඩංගු පැ.820(A) දරන ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එම ඡායාරූපයෙන් තමා භාණ්ඩ සොයා ගන්නා ලද කාමරයේ වසා තිබූ අළු පැහැති රෝල ගේට්ටුව ඇතුළුව ස්ථානය නිරීක්ෂණය වන බව පෙන්වා සිටින ලදී. එසේම පැ.820(B) දරන ඡායාරූපයෙන් තමා සොයා ගත් සල්ෆියුරික් ඇසිඩ් බවට සඳහන් බූලි 11 සහ නයිට්‍රික් ඇසිඩ් කළු බූලි 04 නිරීක්ෂණය වන බවත් කියා සිටින ලද සාක්ෂිකරු එම පැ.820 සංයුක්ත තැටියේ ම ඇති IMG 3555 දරන ඡායරූපයෙහි තමා භාරයට ගත් පෙන්ඩ්‍රයිව්, යකඩ බෝල, 2 core wire,

CCTV කැමරා, LED බල්බ්, කොළ පැහැති වයර්, ප්ලාස්ටික් හතරැස් බේසම් සහ රතු පැහැති ප්ලාස්ටික් භාජන, රතු පැහැති වයර්, කළු පැහැති ගන් බූට් නිරීක්ෂණය වන බව සාක්ෂිකරු කියා සිටින ලදී. එම ඡායාරූපය පැ.820(C) ලෙස සලකුණු කරන ලදී. තමා භාරයට ගත් අංක 98හි සඳහන් බුර්කා ඇඳුම පැ.820 සංයුක්ත තැටියේ IMG 3566 දරන ඡායාරූපයෙහි දක්නට ඇති බව සාක්ෂිකරු කියා සිටින ලද අතර එම ඡායරූපය පැ.820(D) වශයෙන් සලකුණු කරන ලදී. පැ.820 සංයුක්ත තැටියේ IMG 3567 දරන ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එහිද සඳහන් වන්නේ පැ.820(D) හි සඳහන් ඇඳුමම බවට සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එම ඡායාරූපය පැ.820(E) වශයෙන් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව පැමිණිල්ල විසින් PR508/2019 සහ B/4596 දරන නඩු භාණ්ඩය විවෘත කර එහි කවරය පැ.1247 ලෙසටත් ඒ තුළ ඇති කාඩ්බෝඩ් පෙට්ටිය පැ.1248 ලෙසටත් සලකුණු කර ඒ තුළ තිබූ අංක 98 ලෙසට සඳහන් පොලිතීන් කවරය පැ.1249 ලෙසටත් සලකුණු කොට සාක්ෂිකරුට පෙන්වා සිටින ලදී. සාක්ෂිකරු විසින් එය තමා විසින් අංක 98 යටතේ අංක කරන ලද බුර්කා ඇඳුම් එකක් ලෙස සඳහන් ඇඳුම බවත් එහි එම ස්ථානයේ මෙය අතුරා නිරීක්ෂණය කිරීමේදී ශේෂ වූ වැලි දූවිලිද, දක්නට ඇති බවත් කියා සිටින ලදී. එම ඇඳුම පැ.1250 ලෙස ලකුණු කරන ලදී. එම ඇඳුම තමාගේ ශරීරයේ ප්‍රමාණයත් එක්ක සාපේක්ෂව ගත් කළ ගෙලේ සිට වළලුකර දක්වාත් අත්වල උරහිසේ සිට මැණික් කටුව දක්වාත්

වැසෙන සේ ඇති ඇඳුමක් බව කියා සිටින ලද සාක්ෂිකරු එකී පැ.1250 ලෙස ලකුණු කරන ලද අඳුම පැ.820(E)කියලා ලකුණු කරන ලද ඡායාරූපයේ ඇති ඇඳුමත් සමාන බවද කියා සිටින ලදී.

එසේම මෙම සාක්ෂිකරුට පැ.1249 පෙර ලකුණු කරනලද කාඩ්බෝඩ් පෙට්ටිය තුළ තිබෙන අංක 62 ලෙස අංකනය කොට ඇති PR 508/2019 යන අංකය ලේබලයක් මත සඳහන්ව ඇති පොලිතීන් කවරයකින් ආවරණයකොට මුද්‍රාකර ඇති නඩු භාණ්ඩ පාර්සලය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එහි තිබූ අංක 62 සහ PR 508/2019 යන අංක සටහන් කර ඇති ලේබලය සහිත විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ.1251 ලෙස සලකුණු කරන ලදී. පැ.1251 පොලිතීන් කවරය තුළ තිබූ සුදු පැහැති අකුරෙන් ලියන ලද යම් අක්ෂර සහ ලාංඡනයක් සහිත කළු පැහැති බැනරය සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද අතර එය පැ.1252 ලෙස සලකණු කරන ලදී. පාස්කු ප්‍රහාර සිදුවීම 2019 අප්‍රේල් 21 සිදුවීමෙන් පසුව මාධ්‍යයේ ප්‍රචාරය කළ ආකාරයට එය "IS බැනරය" ලෙසට තමා විසින් වරහන් තුළ දක්වා ඇති බවද සාක්ෂිකරු කියා සිටින ලදී. සාක්ෂිකරුහට පැ.820 සංයුක්ත තැටිය තුළ ඇති IMG_ 3659.JPG ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වන ලද අතර එම ඡායාරූපයේ පෙනෙන බැනරය සහ තමා අධිකරණයේ දී හඳුනාගත්ත බැනරය එකම බව කියා සිටින ලදී. ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද එකී IMG_3659.JPG යන ඡායාරූපය පැ. 820 (F) ලෙස ලකුණු කරන ලදී.

ඡායාරූපයේ බැනරය අල්ලාගෙන සිටින්නේ එවකට අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට අනුයුක්තව රාජකාරි කළ, තමා සමඟ අදාළ ස්ථානය විමර්ශනයට සහභාගී වූ පොලිස් සැරයන් 1023 මැන්ඩිස් නිලධාරියා බවටද සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී.

ඉන් අනතුරුව පැ.1248 කාඩ්බෝඩ් පෙට්ටිය තුළ ඇති අංක 104 ලෙස අංකනය කොට ඇති විනිවිද පෙනෙන පොලිතීන් කවරයක් පැ.1253 ලෙස ලකුණු කර, ඒ තුළ ඇති නඩු භාණ්ඩ කිහිපයක් සාක්ෂිකරුට පෙන්වන ලදී. ඒවා තමා විසින් අදාළ විමර්ශන ස්ථානයේ තිබී භාරයට ගන්නා ලද අංක 104 යටතේ ලැයිස්තු ගත කරන ලද මුස්ලිම් ජාතිකයන් පළඳින කොළපාට අර්ධ කවාකාර තොප්පි පහක් බවට සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එම තොප්පි පහ පැ.1254, පැ.1255, පැ.1256, පැ.1257 සහ පැ.1258 ලෙස සලකුණු කරන ලදී. එම තොප්පි වල Made in Turkey සහ අරාබි අක්ෂර සඳහන් වන බවත්, කියා සිටි සාක්ෂිකරු එම තොප්පි ඇතුළත්ව තිබූ Made in Turkey සහ Knitthing caps, Takke වශයෙන් සඳහන් පෙට්ටිය පැ.1259 ලෙස සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව පැ.1248 කාඩ්බෝඩ් පෙට්ටිය තුළ ඇති අංක PR508/2019 සහ අංක 108 ලෙස සඳහන් නඩු භාණ්ඩ සාක්ෂිකරුට පෙන්වන ලද අතර ඒවා අදාළ විමර්ශන ස්ථානයේ තිබී භාරයට ගන්නා ලද කළු පාට Bottam 03 බවට සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර ඒවා

ඇතුළත්ව තිබූ විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ.1260 වශයෙන් ද, කළු පාට Bottam 03 පැ.1261, පැ. 1262, පැ.1263 වශයෙන් ද සාක්ෂිකරු විසින් හඳුනාගැනීමෙන් අනතුරුව සලකුණු කරන ලදී.

සාක්ෂිකරුට පෙර අවස්ථාවකදී පැ.971 වශයෙන් සලකුණු කරනලද රෙජීෆෝම් පෙට්ටිය පෙන්වා සිටින ලද අතර එය සමන්තුරේ මා.උ.නඩු අංක P4596 නඩුවට ඇතුළත් කරන ලද නඩු භාණ්ඩයක් බවටත් කියා සිටි සාක්ෂිකරු එය තුළ තමා විසින් අදාළ විමර්ශන ස්ථානයේ තිබී භාරයට ගන්නා ලද කුඩා යකඩ බෝල 100 බැගින් අඩංගු පැකට් 678 ලෙසට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද යකඩ බෝල සහිත පෙට්ටිය මේ වන විටත් පැ.971 ලෙස ලකුණු කර ඇති බවත්, ඉන් බයිසිකල් බෝල පැකට්ටුවක් පැ.972 ලෙසත්, යකඩ බෝල අඩංගු පැකට් ප්‍රමාණයක් ඇති දුඹුරු පැහැති පෙට්ටියක් පැ.973 ලෙසත් ලකුණු කර ඇති බවත් ඒ අවස්ථාවේදී පැමිණිල්ල විසින් අධිකරණයේ අවධානයට යොමු කරන ලද අතර අනිකුත් සියලුම බයිසිකල් බෝල පැකට් සහ පෙට්ටි පැ.973(A) ලෙස ලකුණු කරන ලදී.

වැඩිදුරටත් සාක්ෂිදුන් සාක්ෂිකරු තම කණ්ඩායම විසින් පරීක්ෂාවට ලක් කරන ලද සෙන්ගල්ග්‍රාම 01, පවුස් මාවත ලිපිනයෙහි අදාළ විමර්ශන ස්ථානයේ තිබී භාරයට ගන්නා ලද ජෙලටි නයිට් කූරු 181 ක් ප්‍රමාණයක්

අංක 15 ලෙස නම් කළ බව කියා සිටින ලදී. එම වෝටර් ජෙල්හි සංකේත අංකයක් සඳහන් වන බවත් එම සංකේත අංක ලැයිස්තුව ඔස්සේ විමර්ශනය කිරීමේදී මෙම ද්‍රව්‍ය නිකුත් කරන ලද ප්‍රදේශ සහ එම පුද්ගලයින් සම්බන්ධයෙන් වාර්තාවක් ලද බවත් එම වාර්තා මගින් වෝටර් ජෙල් වශයෙන් ගල්වෙඩි කර්මාන්තයේදී යොදා ගන්නා බවට අනාවරණය වූ බවත් කියා සිටින ලදී. ඉන් අනතුරුව සාක්ෂිකරුට පැ.889 පෙට්ටිය විවෘත කොට එහි අන්තර්ගතය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එහි අඩංගු පැ. 885, පැ.886, පැ.887, පැ.888 ලෙස නම් කර තිබූ ජෙලටිනයිට් කූරු 181 ක ප්‍රමාණය හඳුනාගත් සාක්ෂිකරු, එම අවස්ථාවේදී ලැයිස්තුගත කිරීමේදී ජෙලටිනයිට් කූරු වශයෙන් සටහන් කරනු ලැබුවද ඒවා හඳුන්වන්නේ වෝටර් ජෙල් වශයෙන් බව කියා සිටින ලදී. විවෘත අධිකරණයේදී සාක්ෂිකරු හට පැ.820 සංයුක්ත තැටියේ ඇතුළත් IMG _ 3624 . JPG 1 පෙන්වා සිටින ලද අතර එහි නිරීක්ෂණය වන නිල් පැහැති බට ජෙලටිනයිට් කූරු වශයෙන් ලේඛනගත කරන ලද පසුව වෝටර් ජෙල් වශයෙන් අනාවරණය කර ගන්නා ලද වෙඩි ද්‍රව්‍යය බවත් ඊට අමතරව කළුපාට ටේප්, අවර්ණ ටේප්, ජංගම දුරකථන බැටරි සහ ප්ලාස්ටික් හතරැස් භාජන, සල්පියුරික් අම්ලය යන ද්‍රව්‍ය ද එම ඡායාරූපයේ දැකිය හැකි බවත් සාක්ෂිකරු කියා සිටින ලදී. එකී IMG_3624.JPG දරන ඡායාරූපය පැ.820(G) ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරු හට පැ.820 සංයුක්ත තැටියේ ඇතුළත් IMG _ 3666.JPG දරන ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එහි ඇති වීදුරු ශෝකේස් එක නිවෙස් හිමිකරුට අයිති එම ස්ථානයේ පෙර තිබූ වීදුරු ශෝකේස් එකක් බවට විමර්ශනයේදී අනාවරණයවූ බවත් කියා සිටිනලදී. එම ඡායාරූපයේ තමාව ද දර්ශනය වන බව කියා සිටිලද අතර පැමිණිල්ල විසින් විසින් එකී IMG_3666.JPG යන ඡායරූපය පැ.820 (H) ලෙස ලකුණු කරන ලදී.

නඩු භාණ්ඩ භාරකරු සන්තකයේ තිබූ සී. 649 සහ මතුපිට අංක 12 අංකය ඇති අම්පාර පී. ආර්. 508/2019 ලෙස සටහන් කර ඇති භාණ්ඩ පාර්සලය පාර්සලය විවෘත කර එහි කවරය පැ.1264 ලෙසත් එම කවරය තුළ තිබූ දිරාගිය තවත් කවරයක් තුල තිබූ අංක 89 ලෙස අංකනය කර ඇති විනිවිද පෙනෙන පොලිතීන් කවරයක් තුළ බහා ඇති නඩු භාණ්ඩ සාක්ෂිකරුහට පෙන්වා සිටින ලද අතර ඒවා ලැයිස්තුවේ 68 යටතේ නයිලෝන් කේබල් (Tie පැකට් 01ක්) වශයෙන් සඳහන් අම්පාර මූලස්ථාන පොලිසියේ 508/2019 නඩු භාණ්ඩ කුවිතාන්සිය යටතේ ඇතුළත් කරන ලද නයිලෝන් කේබල් ටයිට්කූරු 60 ක් අඩංගු පැකට්ටුව බවට සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. 68 ලෙස අංකනය සහිත විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ. 1265 ලෙසත් එහි අන්තර්ගතව ඇති

නයිලෝන් කේබල් ලෙස සඳහන් කරන ලද නඩු භාණ්ඩය පැ.1266 ලෙසත් පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී.

ඉන්පසුව අංක 20 ලෙස අංකයක් සඳහන් වන අම්පාර PR 508/2019 යන අංකය මුද්‍රණය කර ඇති ලේබලයක් සහිත පාර්සල් සංකේතය ලෙස H ලෙස අංකය සඳහන්ව ඇති පාර්සලයෙහි පිටත කවරය පැ.1267 ලෙස සලකුණු කරමින් එම කවරය තුළ කාඩ්බෝඩ් පෙට්ටියක් පැ.1268 ලෙස සලකුණු කර එය තුළ ඇති අංක 59 ලෙස සඳහන් විනිවිද පෙනෙන කවරයක් සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එය අම්පාර මූලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 58/2019 යටතේ ඉදිරිපත් කොට ඇති පාවිච්චි කරන ලද කළු ගම්ටේප් දෙකක් සහ පාවිච්චි නොකළ ටේප් රෝල් තුනක් අඩංගු පාර්සලය ලෙසට සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එකී කළු පැහැති සෙලෝටේප් පහක් ඇතුළත් නඩු භාණ්ඩ පාර්සලය පැ.1269 ලෙස සලකුණු කරන ලද අතර,

අංක 30 ලෙස අංක කොට ඇති විනිවිද පෙනෙන කවරයක් තුළ ඇති නඩු භාණ්ඩය අම්පාර මූලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සිපත් අංක 58/2019 ට ඇතුළත් කරන ලද පරීක්ෂාවෙන් පසු තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ අංක 30 යටතේ සඳහන් කුඩා කටර්අඩු 01 ලෙසට සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එය පැ. 1270 ලෙස සලකුණු කරන ලදී. මෙම අඩුවේ ප්‍රමාණය අනුව එය සියුම් වයර වෙන් කිරීම සහ වයරය

මතුපිට ආවරණය පළුදු කරගැනීම සඳහා භාවිතා කරන අඩුවක් බවද සාක්ෂිකරු විසින් වැඩි දුරටත් කියා සිටින ලදී.

සාක්ෂිකරුහට අංක 56 සහ PR 508/2019 ලෙස මුද්‍රිතව ඇති ලේබලයක් සහිත නඩු භාණ්ඩයක් පෙන්වන ලද අතර එය, එදින පරීක්ෂාවෙන් පසු මා භාරයට ගෙන මූලස්ථාන පොලිසියට රැගෙන එන ලද මූලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 508/2019 ට ඇතුළත් කරන ලද තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ අංක 56 යටතේ සඳහන් තහඩු කැබලි දෙකක් බවට සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී.එම තහඩු කැබලි දෙක සහ එය අන්තර්ගතව තිබූ විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ.1271 ලෙස පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී. එම තහඩු කුමක් සඳහා සාමාන්‍යයෙන් කුමක් සඳහා භාවිතා කරන්නේ ද යන්න පිළිබඳව තමාට දැනුමක් නැති බව ද සාක්ෂිකරු කියා සිටින ලදී.

සාක්ෂිකරුහට අංක 53 යන අංකය සහිතව විනිවිද පෙනෙන කවරයක් තුළ භාණ්ඩ සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එය අම්පාර මූලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක 508/2019 ඇතුළත් කොට ඇති තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ 53 යටතේ දක්වා ඇති සුදු පොලිතීන් බට කිලෝ 2 ක් පමණ ලෙස සඳහන් භාණ්ඩ බවට කියා සිටි සාක්ෂිකරු එය හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද සුදු පැහැති පොලිතීන් කිලෝ 2 ක ප්‍රමාණයක් සහ එය

ඇතුලත්ව ඇති විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ.1272 ලෙස සලකුණු සලකුණු කරන ලදී

පැමිණිල්ල විසින් පාර්සල් සංකේතය D ලෙස සඳහන්ව ඇති අම්පාර PR508/2019 යන අංකය මුද්‍රිතව ඇති ලේබලයක් සහිත නඩු භාණ්ඩ පාර්සලය විවෘත කර එහි පිටත කවරය පැ.1273 ලෙස සලකුණු කරමින්, එකී කවරය තුළ තිබූ තවත් කවරයක් පැ.1274 ලෙස සලකුණු කර, පැ.1274 තුල තුබූ PR 508/2019 ලෙස අංක සහිත ලේබලයක් ඇති විනිවිද පෙනෙන කවරයක් තුළ ඇති නඩු භාණ්ඩ ප්‍රමාණයක් සාක්ෂිකරුහට පෙන්වා සිටින ලද අතර ඒවා අම්පාර මූලස්ථාන පොලිසියට අයත් නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක 508/2019 ට අදාළව ඇතුළත් කරන ලද පිපිරීම් ස්ථානයේදී තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ අංක 46 යටතේ සඳහන් කර ඇති සකස් නොකළ පරිපථ පෙට්ටි 11 ක් බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. එසේ හඳුනා ගන්නා ලද සකස් නොකරන ලද පරිපථ පෙට්ටි 11 සහ එකී පෙට්ටි බහා ඇති විනිවිද පෙනෙන කවරය පැ.1275 ලෙස පැමිණිල්ලෙන් සලකුණු කරන ලදී.

හඳුනා ගන්නා ලද පෙට්ටි සකස් නොකරන ලද පරිපථ පෙට්ටි අර්ධව සකස් කරන ලද පරිපථයන් සඳහා උපයෝගී කරගත්ත පෙට්ටි බවත්, ඒ වනවිට උපයෝගි කරගැනීමක් සිදු කොට නොතිබුණ බවත් කියා සිටි

සාක්ෂිකරු තමා භාරයට ගන්නා ලද භාණ්ඩ අතර අර්ධව සැකසූ විදුලි පරිපථ යනුවෙන් පෙට්ටි කීපයක් ද තිබූ බව වැඩිදුරටත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව සාක්ෂිකරු හට පැ.895 නඩු භාණ්ඩය පෙන්වාසිටින ලද අතර, තමා භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ අනු අංක 17 යටතේ තිබූ ඩෙටනේටර් කෝඩ් කුඩා රෝල් (රතු) 06 න් වෙන් කර ගන්නා ලද කොටසක් බවට හඳුනා ගන්න ලදී. තවද සාක්ෂිකරු හට පැ.997, පැ.998, පැ.999 සහ පැ.1000 නඩු භාණ්ඩ පෙන්වා සිටින ලදී. ඒවා තමා භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවට අනුව අංක 73, 74, 75, 76, 77, 78 ලෙස සඳහන් කෑන් සහ බූලි බවට හඳුනා ගන්නා ලදී. එසේම සාක්ෂිකරුහට අංක 310 සහ පීආර් 508/19 ලෙස අංක සටහන් නිල් පැහැති කෑනයක් පෙන්වා සිටින ලද අතර එය සිදුවීම වූ ස්ථානයේ තිබී තමා භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ අංක 75 යටතේ හිස්කෑන් නිල්පාට ලොකු එකක් වශයෙන් සඳහන් කරන ලද අදාළ කෑන් එක එය බවට හඳුනාගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද නිල්පැහැති කෑනය පැ. 1276 ලෙස සලකුණු කරන ලදී.

එම අවස්ථාවේදී සාක්ෂිකරුට හට තවත් නඩු භාණ්ඩයක් පෙන්වා සිටින ලද අතර එය අම්පාර මූලස්ථාන පොලීසියේ නඩු බඩු කුවිතාන්සි පත් අංක 508/2019 ට අයත් තමා භාරයට ගන්නා ලද භාණ්ඩ ලේඛනයේ 78 යටතේ සඳහන් ලීටර 5 ප්‍රමාණයේ අවර්ණ දියර සහිත සිදුකෑන් 4 බවට

සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. එකී සුදුකෑන් 4 පැමිණිල්ල විසින් පැ. 1277 ලෙස සලකුණු කරන ලදී.

එසේම සාක්ෂිකරු හට මතුපිට 73 යන අංකයද සඳහන්ව ඇති රතු පැහැති මූඩිය සහිත කළු පැහැති කෑන් 4ක් සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඒවා තමා භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ සඳහන් අංක 73 යටතේ වූ කළුපාට හිස් කෑන් බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී.

සාක්ෂිකරු හට අංක 76 ලෙස ලේබල් සහිත කළු පැහැති බූලි 4 ක් සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඒවා, ඉහතින් සඳහන් නිවස පරික්ෂා කරන අවස්ථාවේදී භාරයට ගන්නා ලද අම්පාර මූලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සි 508/2019 යටතේ ඉදිරිපත් කරන ලද බූලි 4 බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද අංක 76 ලේබලය අලවා ඇති කළු බූලි 4 පැ.1278-A, 1278-B, 1278-C, 1278-D ලෙස සලකුණු කරන ලදී. අධිකරණය් දී හඳුනා ගන්නා අවස්ථාව වන විට එකී බූලි තුල නයිට්‍රික් ඇසිඩ් නොමැති බව සාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී.

සාක්ෂිකරු හට අධිකරණයේ සලකුණු කරන ලද පැ.977, පැ.998, පැ.999 සහ පැ.1000 දරන කළු පැහැති බූලි 05 ක් පෙන්වා සිටින ලද අතර ඒවා අම්පාර මුලස්ථාන පොලිසියේ නඩු භාණ්ඩ කුවිතාන්සි පත් අංක

508/2019 යටතේ ඉදිරිපත් කරන ලද තමා විසින් භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ අංක 74 යටතේ සඳහන් කර ඇති කළුපාට පොඩි හිස් කෑන් 5 ලෙස සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එසේම හඳුනා ගන්නා ලද අංක 74 ලෙස ලේබලයක් සහිත අනිකුත් බූලිය පැ.1279 ලෙස සලකුණු කරන ලදී.

අංක 85 ලෙස ලේබලයක් ඇති නඩු භාණ්ඩ 2 ක් සාක්ෂිකරු හට පෙන්වා සිටින ලද අතර ඒවා තමා විසින් භාරයට ගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ අංක අංක 85 යටතේ සටහන් කර ඇති නිල් පාට ප්ලාස්ටික් බැරල් ලෙසට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එකී බැරල් දෙක පැ. 1280A සහ පැ 1280 B ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරුහට අංක 73 සහ PR 508/19 සඳහන් නඩු භාණ්ඩ පෙන්වා සිටින ලද අතර ඒවා, සමන්තුරයෙන් අත්අඩංගුවටගත් Corrosive Nitric Acid යනුවෙන් ඉංග්‍රීසියෙන් ලේබල් දෙකක් සඳහන් වන නඩු භාණ්ඩ බව කියා සිටිමින් එකී භාණ්ඩ පැ. 1281(A), 1281(B) ලෙස සලකුණු කරන ලදී. එම භාණ්ඩ දෙකේම ලේබලයට අනුව එහි

අන්තර්ගතය නයිට්‍රික් ඇසිඩ් 68% ක සාන්ද්‍රණයකින් යුක්ත බවත්, අවධානමට අදාළ සලකුණු ද තිබෙන බවත් කියා සිටින ලදී.

සමන්තුරය ම.උ. B4596/19 දරණ නඩු අංකය යටතේ ඉදිරිපත් කර තිබූ භාණ්ඩ අතර තිබූ, Maliban Smart Cream Cracker ලෙස සඳහන්ව ඇති පෙට්ටිය තුල තිබූ කවරය තුළ ඇති නඩු භාණ්ඩයක් සාක්ෂිකරුහට පෙන්වන ලද අතර එය ලේඛනයේ 118 යටතේ ඇතුළත් කළ මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය ලෙසට හඳුනා ගන්නා ලදී. එය පැ. 1285 ලෙස සලකුණු කරන ලදී. එසේම, දෙවන කාඩ්බොඩ් පෙට්ටියහි තිබූ අංක 39 ලෙස සඳහන් වනුයේ එදින පරීක්ෂාවෙන් ලබාගන්නා ලද ඩ්‍රෝන කැමරාව සහ එහි කොටස් බවටත් හඳුනාගත් සාක්ෂිකරු එකී ඩ්‍රෝන කැමරාව, එහිඋපාංග, දුරස්ථ පාලකය සහ තටු පැ. 1287 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරුට, අංක 91 සහ අම්පාර මූලස්ථාන පොලිසියේනඩු බඩු කුවිතාන්සි පත් අංක 508/2019 ලෙස සඳහන් පෙට්ටිය පැ.1289 ලෙස සලකුණු කරන ලද අතර එය තුල තිබූ පරීක්ෂාවෙන් පසු ලබා ගන්නා ලද අංක 91 යටතේ ලැයිස්තු ගත කරන ලද Fan Heater ලෙස සඳහන්ව ඇති MEGA යන වෙළඳ නාමයට අයත් ජංගම A/C මැෂින් තුනෙන් එකක් බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද අතර එය පැ.1290 ලෙස සලකුණු

කරන ලදී. එම යන්ත්‍රය සාමාන්‍යයෙන් යම් දෙයක් වේලීම සඳහා භාවිතා කරන යන්ත්‍රයක් බව සාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී.

එසේම, අංක 105 ලෙස සඳහන් ලේබලයක් සහ බී/4596 යන අංකය සඳහන්ව තිබූ නඩු භාණ්ඩ අතර තිබූ ඉස්ලාම් ආගමට අරාබි භාෂාවෙන් සහ දමිළ භාෂාවෙන් ඇති පොත් පත් 07 හඳුනා ගත් සාක්ෂි කරු, එවා පැ.1294(A), පැ.1294(B), පැ.1294(C), පැ.1294(D), පැ.1294(E), පැ.1294(F), පැ.1294(G) වශයෙන් සලකුණු කර සිටින ලදී. එකී එක් එක් පොත් වල සඳහන් “තිරුක්කුරාන්” “ තජමා අල්කුරානිල් කරීම් ” යන වචනද, පැ. 1294 (D) ලෙස සලකුණු කරන ලද පොත එහි පිට කවරය මත “ ජිහාද් ඉස්ලාමීය පාර්වෙයි ” යනුවෙන් දෙමළ භාෂාවෙන් සඳහන් වෙන බව එම පොතෙහි 2 වන පිටුවෙහි අවසානයේ බෙදා හරින පුද්ගලයන්ගේ නම සහ ලිපිනය ලෙස Islamic book house, No.77, Dematagoda road, Colombo 9. පැ. 12 (D), 1294 (E) දෙමළ භාෂාවෙන් “ යාර් ඉන්ද ෂියාක්කර් ” පැ. 1294 (F) ලෙස සලකුණු කරන ලද පොතහි මතුපිට පිටකවරයෙහි අරාබි භාෂාව වැනි විදේශ භාෂාවකින් යුතු අක්ෂරයන් සහිත බවද, බවසාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී.

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් එවා ඇති මතුපිට CE/387/19 යන අංකය සහිත ම.උ. සමන්තුරය, නඩු අංක B4596/19 යන අංකය ඇති නඩු භාණ්ඩ අතරින් අංක 45 සහ PR508/2019 යන අංකය මුද්‍රිතව ඇති නඩු භාණ්ඩය අර්ධව සැකසූ විදුලි පරිපථ 6ක් ලෙස සඳහන් ඒවායින් 1ක් බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එය පැ.1296 ලෙස සලකුණු කරන ලදී. එය කළු පැහැති පෙට්ටියක කවාකාර සිදුරු කිරීමක් සහ ON/OFF යනුවෙන් සඳහන් රතු පැහැති ස්විචයක් අලවා විදුලිය ලබා දිය හැකි දේකට සම්බන්ධ කර සක්‍රීය හෝ අක්‍රීය කල හැකි ආකාරයෙන් සකසා ඇති බව සාක්ෂිකරු කියා සිටින ලදී.

සාක්ෂිකරුහට අංක 16 ලෙස ලේබලයක් සහිත PR508/2019 යන අංකයක්ද, සහිත මුද්‍රිතව ඇති ලේබල් දෙකක් සහිත ස්නැප්ලොස් වර්ගයේ විනිවිද පෙනෙන පොලිතීන් කවරයක් තුළ ඇති නඩු භාණ්ඩයක් පෙන්වන ලද අතර එය තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ අංක 16 යටතේ සඳහන් කර ගන්නා ලද චීනයේ නිෂ්පාදිත රතු පැහැති ආවරණයකින් යුත් ජෙලටිනයිට් කූරු 01 ක් ලෙස සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ජෙලටිනයිට් කූර පැ.1297 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරු හට අංක 17 ලෙස අංකයක් සහිත PR508/2019 යන PR අංකය සඳහන්ව ඇති ලේබලයක් නඩු භාණ්ඩය පෙන්වා සිටින ලද අතර එය අම්පාර මූලස්ථාන පොලිසියේ 508/2019 නඩු බඩු කුවිතාන්සි පත් අංකය යටතේ භාරදෙන ලද ලැයිස්තුවේ අංක 17 යටතේ වූ රතු කුඩා ඩෙටනේටර් කෝඩ් රෝල් 06 ක් වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. එම රතු පැහැති සේවා නූල් 06 ක් ලෙස සඳහන්ව ඇති නඩු භාණ්ඩය සහ එය බහා තිබූ විනිවිද පෙනෙන පොලිතීන් කවරය පැ.1298 ලෙස සලකුණු කරන ලදී.

රසපරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් එවන ලද අංක 05, CE/387/19, ම/උ සමන්තුරය නඩු අංක B 4596/19 පාර්සල් 06 ක් ලෙස සඳහන්ව ඇති නඩු භාණ්ඩ තමා විසින් අංක 45 යන අංකය යටතේ ලැයිස්තුගත කල අර්ධව සකස් කරන ලද විදුලි පරිපථ අතරින් එකක් ලෙස වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. එය පෙර හඳුනා ගන්නා ලද අර්ධව සැකසූ පරිපථයට වඩා වර්ධනය කරන ලද ස්විචයක් සහ බැටරි ක්ලික් කිරීම සඳහා යොදන ලද කොටස් තුනකින්ද සමන්විත අර්ධව සකස් කරන ලද පරිපථයක් බව ද සාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී. එහි මතුපිටින් පෙනෙන රතු පැහැති ස්විචිය සහ කොළ පැහැති ‘‘ප්‍රෙශ් බටින්" යනුවෙන් හඳුන්වන ස්විචි දෙකට ඇතුළතින් අදාළ ස්විච දෙක සම්බන්ධ කළ හැකි වන සේ ලෝහ අග්‍රයන් ඇති කොටස් 4 ක්ද සමඟ අග්‍ර 6 ක් ද සහිතව ස්විච

දෙකක් ඇති බවත් එකී අග්‍රයන් වලට එදිනෙදා ජීවිතයේ පාවිච්චි කරන සෘජුකෝණාස්‍රාකාර බැටරි 3 ක් සම්බන්ධ කළ හැකි ආකාරයෙන් සකස් කර ඇති බවත් සාක්ෂිකරු කියා සිටින ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද එකී නඩු භාණ්ඩය පැ.1301 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරු මතුපිට අංක 36 යන අංකය සහ පී. ආර්. 508/2019 යන අංකය සහිත නඩු භාණ්ඩය පෙන්වා සිටින ලද අතර එය, සොයාගත් භාණ්ඩ ලැයිස්තුවේ 36 යටතේ සඳහන් රවුම් ප්‍රෙෂ් බටන් ස්විච් එක වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද නඩු භාණ්ඩය පැ.1302 ලෙස සලකුණු කරන ලදී. එය සාමාන්‍යයෙන් අඩි 02 ක වගේ දිගකින් යුත් භාණ්ඩයකට එක් කොටසක් එක වයරය සම්බන්ධ විට, ස්විචය අඩි 1 ½ ක් 2 ක් වගේ දුරකට ඇද භාවිතා කිරීමේ හැකියාව ඇති බවත් සාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී.

සාක්ෂිකරුහට අංක 35 දරන සහ අංක පී. ආර්. 508/2019 යන නඩු භාණ්ඩය පෙන්වා සිටින ලද අතර එය ද අම්පාර නඩු බඩු කුවිතාන්සි අංක 508/19 ට ඇතුළත් කරන ලද එදින පරීක්ෂාවෙන් පසු තමා භාරයට ගන්නා ලද ලැයිස්තුවේ 35 අනු අංකයට ඇතුලත් කල සුදු සීරියස් බල්බ් 69 වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී සාක්ෂිකරු විසින් හඳුනා

ගන්නා ලද නඩු භාණ්ඩ පැ.1303 ලෙස ලෙස සලකුණු කරන ලදී. එම "සිරියස්" බල්බ් වයර් යම් කොටසක් ශේෂ වන ලෙසට වෙන්කොට බල්බ් තනි තනිව ඇති බවත් යම් විදුලි පරිපථයකට හෝ බැටරියකට හෝ වෙනත් විදුලිය ලබා දිය හැකි යාන්ත්‍රණයකට සම්බන්ධ කිරීමේ හැකියාවක් ඇති බවත් කියා සිටි සාක්ෂිකරු එම බල්බ එක එක තනියෙන් භාවිතා කොට මෙහි තුළ ඇති ෆිලමන්ට් ලෙස හැඳින්විය හැකි කොටස දැල්වීමේ හැකියාවක් ද පවතින බව වැඩි දුරටත් කියා සිටින ලදී.

සාක්ෂිකරුට 32 ලෙස සහ පී. ආර්. 508/2019 යන අංක සහිත නඩු භාණ්ඩයක් පෙන්වා සිටින ලද අතර එය අම්පාර නඩු බඩු කුවිතාන්සි 508/2019 ඇතුළත් කරන ලද ලැයිස්තුවේ අංක 32 යටතේ සඳහන් පරිපථ සිරුමාරු ස්විච් 13 අඩංගු කරන ලද කවරය වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද නඩු භාණ්ඩ සහ සෙලෝපේන් කවරය පැ.1304 ලෙස සලකුණු කරන ලදී. එවා කලින් හඳුනා ගත්ත අර්ධව සකසන ලද පරිපථ ලෙස හඳුන්වන ලද කළු පැහැති පෙට්ටිවල තිබූ රතු පැහැති ස්විචයට සමාන වන එහෙත් පැහැයෙන් නිල් පැහැති ස්විච බවද සාක්ෂිකරු වැඩි දුරටත් කියා සිටින ලදී.

සාක්ෂිකරුට අංක 31 සහ පී. ආර්. 508/19 යන අංක සහිත නඩු භාණ්ඩය පෙන්වා සිටින ලද අතර එය අම්පාර නඩු බඩු කුවිතාන්සි

508/2019 නඩු බඩු කුවිතාන්සි පත් අංකය යටතේ ඉදිරිපත් කරන ලද ඇම්පියිර් 5 පියුස් 05 වශයෙන් සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද නඩු භාණ්ඩ පැ. 1305 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරුට අංක 46 සහ PR 508/2019 හි සඳහන් සකස් නොකළ පරිපථ පෙට්ටි 11ක පිටුපස වැසුම් කවරය පෙන්වා සිටින ලද අතර එය ඉහතින් සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද අර්ධව සැකසූ විදුලිපරිපථ ඇතුළත් පෙට්ටිවල පසුපස ආවරණය බවට හඳුනාගන්නා ලදි. එය සාක්ෂිකරු විසින් පැ.1306 වශයෙන් සලකුණු කරන ලදි.

සාක්ෂිකරුට CE/387/19 ම/ඌ සමන්තුරය නඩු අංක B 4596/19ට අයත් අංක 21 ලෙස සඳහන් පී. ආර්. 508/2019 ඇතුළත් නඩු භාණ්ඩ පෙන්වන ලද අතර ඒවා තමා විසින් භාරයට ගන්නා ලද රතු කළු බැටරි ක්ලිප් 24ක් සහ කේබල් බවට කියා සිටිමින් එම නඩු භාණ්ඩ පැ.1310 ලෙස ලෙස සලකුණු කරන ලදී.

පී. ආර්. 508/2019 යටතේ වූ තවත් නඩු භාණ්ඩයක් සාක්ෂිකරුට පෙන්වන ලද අතර එය වයර් අග්‍ර 2ක් සහිත clip 65ක් ලෙසට හඳුනාගන්නා

ලද අතර එය පැ. 1311 ලෙස ද 2 core ලෙසට භාණ්ඩ ලැයිස්තුවේ දෙවැනි අයිතමය වූ වයර් කොටස පැ.1312 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් සොයා ගන්නා ලද මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය සම්බන්ධ කිරීමට ගන්නා වයරයක් පැ. 1313 ලෙස ද 2 core කොළපාට වයර් ග්‍රෑම් 950ක ප්‍රමාණය පැ.1314 ලෙසද ඉහත අයිතම 42 දරණ 16 GB pen drive 95 පැ.1317 ලෙසද, අයිතම අංක 27 යටතේ ඇතුළත් කරන ලද පරිපථ සඳහා යොදා ගන්නා ලද හතරැස් බැටරි 35 පැ.1318 ලෙසද සලකුණු කරන ලද සාක්ෂිකරු ඉහතින් විස්තර කරන ලද වයර් කොටස් සහ සම්බන්ධක මෙම බැටරි සඳහා යොදා ගත හැකි බවත්, පැ.1301 වශයෙන් සලකුණු කරන ලද විදුලි පරිපථයට සම්බන්ධ කළ හැකි 9V සහ සෝඩර් ලෙස සඳහන්ව ඇති බවත් කියා සිටින ලදි.

Panasonic 6 LR 61P/1B බැටරි 4ක් ලෙස සඳහන් වෙන PR 508/2019 යන අංකය සඳහන් නඩු භාණ්ඩය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එය සෘජුකෝණාස්‍රයක් හැඩයේ 9V අදාළ ඇසුරුම තුළම රඳවා ඇති Panasonic වර්ගයේ බැටරි 4 බවට සාක්ෂිකරු කියා සිටින ලදි. එය පැ.1319 වශයෙන් සලකුණු කරන ලද අතර, එය සලකුණු කරන ලද පැ.1301 සහ පැ.1318 සමඟ සම්බන්ධ කළ හැකි කොටස්වලින් යුක්ත බවද සාක්ෂිකරු කියා සිටින ලදි.

සාක්ෂිකරු විසින් සොයා ගත් අංක 26 ලෙසට ලැයිස්තු ගත කර ඇති කුඩා මේස ඔරලෝසුව සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද අතර එය පැ.1320 ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරුට CE/387/19 ම/උ සමන්තුරය නඩු අංක B 4596/19හි සඳහන් නඩු භාණ්ඩ පෙන්වා සිටින ලද අතර ඒවා අනු අංක 69 යටතේ ඇතුළත් කරන ලද සුදු පැහැති අලෙන සුළු ගම් කූරු 45 බවට සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එය පැ.1322 ලෙස සලකුණු කරන ලදී.

එම පාර්සලය තුළම තිබූ තවත් නඩු භාණ්ඩ කිහිපයක් සාක්ෂිකරුට පෙන්වන ලද අතර එය භාරයට ගත් භාණ්ඩ ලැයිස්තුවේ අංක 114ට ඇතුළත් කරන ලද පුනීල හැඩැති බීකර 4 වශයෙන් සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර ඒවා සියල්ලම පැ.1326 ලෙසත් තමා විසින් භාරයට ගෙන අංක 113 සහ 115 යටතේ ලැයිස්තුගත කළ විවිධ ප්‍රමාණයෙ බීකර් වීදුරු ජෝගුවක් විද්‍යාගාරවල භාවිතා කරන ආකාරයේ වීදුරු උපකරණ සහ නළ බවට කියා සිටින ලද සාක්ෂකරු ඒවා පිළිවෙළින් පැ.1308, පැ.1329, පැ.1330, පැ.1931 සහ පැ. 1332 වශයෙන් සලකුණු කරන ලදි.

තමාගේ අත්දැකීම අනුව එම භාණ්ඩ පාර්සල් විද්‍යාගාර තුළ භාවිතා කරනු ලබන ඒවා බවත් සාමාන්‍ය නිවසක දක්නට නොලැබෙන උපකරණ නොවන බවත් සාමාන්‍ය වෙළඳසැලකින් ලබාගත නොහැකි භාණ්ඩ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි.

සාක්ෂිකරුට පී.ආර්.508/2019 ඇතුළත් නඩු භාණ්ඩ 3ක් පෙන්වා සිටින ලද අතර ඒවා තමා විසින් අංක 57 යටතේ ලැයිස්තුගත කරන ලද ටයික්‍රෝට් උපාංග සහ මයික්‍රොෆෝනයක් බවට සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එම භාණ්ඩ පැ. 1336 ලෙස සලකුණු කරන ලදී.

එසේම ම/ඌ සමන්තුරය නඩු අංක B 4596/19 සහ පී. ආර්. 508/2019හි ඇතුළත් විදුලි පරිපථ කිහිපයක් පෙන්වා සිටින ලද අතර ඒවා අංක 45 යටතේ ලැයිස්තුගත කරන ලද අර්ධව සැකසූ පරිපථ ලෙසට සාක්ෂිකරු විසින් හඳුනාගෙන එම නඩු භාණ්ඩ පැ. 1340(A)(B) ලෙස සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් සොයා ගෙන අංක 40 යටතේ ලැයිස්තුගත කළේ යැයි කියූ පාවිච්චි නොකරන ලද ගෑස් මුහුණු 8ක් පෙන්වා සිටින ලද අතර එය හඳුනාගත් සාක්ෂිකරු එම නඩු භාණ්ඩ පැ.1345 ලෙස සලකුණු කරන ලදී. එම ගෑස් මුහුණු අධික දූවිල්ල, දුම, විෂ දුම පවතින අවස්ථාවන්හිදී

මුහුණු ආවරණය කිරීම සඳහා භාවිතා කරන බව සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි. එසේම එම ගෑස් මුහුණුවලට යෙදීම සඳහා භාවිතා කරනු ලබන ෆිල්ටර් 10ක් සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද අතර ඒවා අංක 41 යටතේ තමා ලැයිස්තුගත කළ භාණ්ඩ බව කියා සිටීමින් එම භාණ්ඩ පැ.1346 ලෙස සලකුණු කරන ලදී. එසේම අංක 61 වශයෙන් ලැයිස්තුගත කරන ලද ඇස් ආවරණය සඳහා භාවිතා කරනු ලබන ගොගල් එක හඳුනාගත් සාක්ෂිකරු එය පැ.1347 ලෙස සලකුණු කරන ලදී.

පරීක්ෂාවේදි ලබාගන්නා ලද භාණ්ඩ ලැයිස්තුවේ අංක 51හි සඳහන් බූට් යුගල හඳුනාගත් සාක්ෂිකරු එය පැ.1348 වශයෙන්ද අංක 47 යටතේ ඇතුළත් කරන ලද කලු සහ කර රබර් අත්වැසුම් ජෝඩු 12ක් හඳුනාගනිමින් ඒවා පැ.1349 (A), පැ.1349 (B) සහ පැ.1349 (C) ලෙස සලකුණු කරන ලදී.

එසේම අංක 103 ලෙස ලැයිස්තුගත කරන ලද හිස් ආවරණ 5 සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අරත එය සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. ඒවා පැ.1350 ලෙස සලකුණු කරන ලදී.

තමා විසින් සොයා ගෙන අංක 99 යටතේ ලැයිස්තුගත කරන ලද කූඩාරම සහ එහි කවරය සාක්ෂිකරු විසින් පැ.1351 ලෙස ද, අංක 94

යටතේ ලැයිස්තුගත කරන ලද නිල් පැහැති ටෙන්ට් රෙද්ද පැ.1352 වශයෙන් ද සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව සාක්ෂිකරු විසින් අධිකරණයේ අවසරය ඇතිව නඩු භාණ්ඩ කාමරයේ තිබූ සුදු පැහැති බූලි 11 නිරීක්ෂණයකට පැමිණ නැවතත් දිවුරුම්පිට සාක්ෂි දෙමින් තමා විසින් භාරයට ගෙන අයිතම අංක 77 යටතේ ඇතුළත් කරන ලද බූලි 11 බවට හඳුනාගත් බව කියා සිටිමින් ඉන් බූලි 7ක් පැ.1353 සිට පැ.1359 දක්වා සලකුණු කරන ලදී. (ඉන් බූලි 4ක් ඊට පෙර අවස්ථාවකදී සාක්ෂිකරුවන් විසින් පැ.992, පැ.995, පැ.996 සහ පැ.994 වශයෙන් සලකුණු කර ඇත.) ඉන් පැ.994හි Sulfuric Acid 98%ලෙසද සඳහන් වන අතර නඩු භාණ්ඩ කාමරයේදි තමා විසින් අංක 70 යටතේ ලැයිස්තුගත කරන ලද යූරියා 50kg ප්‍රමාණයේ මිටි 5 සහ අංක 71 යටතේ ලැයිස්තුගත කරන ලද භාවිතා කරන ලද යූරියා ½මිටි දෙක හඳුනාගන්නා ලද බව කියා සිටිමින් එකී යූරියා මිටි පිළිවෙළින් පැ.1360 සිට පැ.1366 දක්වා සලකුණු කරන ලදි.

මෙම නඩු භාණ්ඩ සොයා ගැනීමෙන් අනතුරුව එම සියලුම නඩු භාණ්ඩ තමා භාරයට ගෙන අම්පාර පොලිස් මූලස්ථාන පොලිස් පරීක්ෂක නිමල් භාරයේ ආරක්ෂිතව තැබූ බවත් නඩු භාණ්ඩ කුවිතාන්සිගත කිරීම,

ඒවායේ ආරක්ෂාව සහ අම්පාර මූලස්ථාන පොලිසිය විසින් සිදු කළ අතර ඉන් අනතුරුව ඒවා විශ්ලේෂණය සඳහා රජයේ රස පරීක්ෂකවරයා වෙතද DNA පරීක්ෂණ සඳහා පෙව සාම්පල් කොටස් සමන්තුරය අධිකරණයට භාරදී අධිකරණය හරහා රස පරීක්ෂකවරයා වෙත යොමු කිරීමට කටයුතු කළබවත් කියා සිටින ලදි.

2019.04.21 දින පාස්කු ප්‍රහාරයට පසුව 2019.04.27 වන දින ද එම සිද්ධියටම අදාළව තමා නින්දවූර් ප්‍රදේශයේ තවත් සැකකටයුතු දේපළක් සම්බන්ධයෙන්ද, කල්මුණේ පොලිස් වසමේ බොලිවේරියන් ග්‍රාමයේ සිදු වූ පිපිරීමක් සහ වෙඩි තැබීමක් සම්බන්ධයෙන් විමර්ශනය සඳහා අපරාධ වාර්තා කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයාගේ මෙහෙය වීම මත තමාත්, දෙහිඅත්තකණ්ඩියේ අපරාධ ස්ථාන පරීක්ෂනාගාරයේ නිලධාරීන් කණ්ඩායමක් සහ මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නිලධාරීන් කණ්ඩායමක් සමඟ කටයුතු කළ බවත්, ඉන් තම අංශයේ එක කණ්ඩායමක් නින්දවූර් ප්‍රදේශයේ තිබූ සැක කටයුතු නිවස පරීක්ෂා කිරීමේ අවස්ථාවට සම්බන්ධ කළ බවත්, තවත් නිලධාරීන් දෙදෙනෙකු දෙහිඅත්තකණ්ඩිය සහ මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන්ට සහාය වීම සඳහා යෙද වූ බවත්, තමා විසින් ඒ වන විට ගුවන් හමුදා කඳවුරට පැමිණ සිටි විශේෂඥ නිලධාරින් කල්මුණේ පුපිරුම්

ස්ථානයට රැගෙන යාම සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද බවද කියා සිටින ලදි.

වැඩිදුරටත් සාක්ෂිදුන් සාක්ෂිකරු 2019.04.26 දින සයින්දමර්දු ප්‍රදේශයේ පිපිරීමක් සිදුවී තිබූ බවත්, අම්පාර ජ්‍යෘෂ්ඨ පොලිස් අධිකාරි සහ අම්පාර අපරාධ කොට්ඨාශ අධ්‍යක්ෂකවරයාගේ සම්බන්ධීකරණයෙන් දෙහිඅත්තකණ්ඩිය අපරාධ ස්ථාන පරීක්ෂණාගාර ස්ථානාධිපති ඇතුළු කණ්ඩායමක්ද, මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති ඇතුළු කණ්ඩායමක්ද කැඳවා, පිපිරීම් සිදු වූ ස්ථානයට මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාර ස්ථානාධිපති රවිචන්ද්‍රන් ඇතුළු කණ්ඩායමද කල්මුණ ප්‍රධාන මාර්ගයේ සිට පිපුරුම් නිවස දක්වා වෙඩි තැබීම් මාර්ගය පරීක්ෂා කිරීමට දෙහිඅත්තකණ්ඩිය අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක අතුල නිලංගසේකර යෙදවූ බවත් කියා සිටි සාක්ෂිකරු, 2019.04.27 දින නින්දවූර් 2 වැනි හරස් වීදිය නො.49 පිහිටි සීනිමොහොමදු හනීෆා යන අයගේ නිවස පරීක්ෂා කිරීම සඳහා පැමිණි විශේෂ කාර්ය බලකා නිලධාරීන්ට සහාය වීම සඳහා තම අංශයේ පොලිස් පරීක්ෂක සිල්වා, පො.සැ.1023 මැන්දිස්, පො.කො.66500 සිරිවර්ධන, කාන්තා පො.කො.7625 ශාමලි යන අය යොමු කර, තමා මෙම පිපිරුම් ස්ථාන පරීක්ෂාව සඳහා පැමිණි විශේෂඥ නිලධාරීන්ගේ කටයුතු

සම්බන්ධීකරණය සහ සුබසාධනය සඳහා කටයුතු කළ බවත් කියා සිටින ලදි.

2019.04. 28 දින තමා දෙහිඅත්තකණ්ඩිය අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන් සමඟ පිපිරීමට අදාළ බොලිවේරියන් ග්‍රාමයේ පිහිටි ස්ථානය පරීක්ෂාව සඳහා ගිය බවත් එදින පැය 8. 40 සිට 13 දක්වා තමා එම ස්ථානය පරීක්ෂාකොට භාණ්ඩ සොයා ගත් බවත් ඒවා අංක 66/2019 සිට 72/2019 දක්වා දේපළ කුවිතාන්සිගත ගත කළ බවත් කියා සිටින ලදි.

එම භාණ්ඩ වන පිපිරීම සිදු වූ කාමරයේ තිබූ සොයා ගන්නා ලද රන් පැහැති කරාබු කොටස් 02 දේපළ කුවිතාන්සි අංක 66/2019 යටතේද, පිපිරීම සිදුවූ කාමරයේ දැවී ගිය යතුරු පැදිය ආසන්නයේ තිබූ EP BAT-1397 දරණ යතුරුපැදියේ පසුපස අංක තහඩුවත්, එම කාමරයේ තිබූ අංක Q71P734 AAAAA CO 464 OPTOMA වර්ගයේ ප්‍රොජෙක්ටර් එක, අඩක් පිළිස්සී ගිය කලුපාට ජැකට්ටුව දේපළ කුවිතාන්සි අංක 67/2019 ලෙසටත්, එම දේපළ කුවිතාන්සි අංකය යටතේම ත්‍රීපාද ආධාරකයක කොටස්, පිළිස්සී ගිය ජෙලටිනයිට් කොටස්, බැටරියක කොටස්ද ඇතුළත් කරන ලද බව කියා සිටින ලදි.

එසේම පෙරදින එනම්, 2019.04.27 දින පොලිස් පරීක්ෂක රවිචන්ද්‍ර මහතා විසින් පරීක්ෂා කිරීමේදි සලකුණු කරන ලද අංක 04 ලෙස සලකුණු කර තිබූ ස්ථානයේ තිබූ දේහය අසළ සුන්බුන් ඉවත් කිරීමේදි සොයා ගත් ටී-56 ජීව උණ්ඩ 11ක් සහිත පතුරම් දේපළ කුවිතාන්සි අංක 68/2019 යටතට ද, පිපුරුම් ස්ථානයෙන් සොයා ගන්නා ලද ලැප්ටොප් පරිගණකයේ කොටස් පාර්සලයක්, දැවී ගිය පරිගණක කොටස් අඩංගු පාර්සලයක්, පිළිස්සී ගිය සිම්කාඩ් අඩංගු කවරයක් දේපළ කුවිතාන්සි අංක 70/2019 යටතේ ද, එම නිවසේ තිබී දෙහිඅත්තකණ්ඩිය අපරාධ ස්ථාන පරීක්ෂණාගාර ස්ථානාධිපති විසින් අනාවරණය කරගෙන තිබූ බෑගයක් තුළ තිබූ සීඩී සංයුක්ත තැටි 01 ක්, මුස්ලිම් ආගමික පොත් 06 ක්, Celio හෑන්ඩ් ෆ්‍රී එකක්, කළු පාට බොටම් 01 ක්, දුඹුරු පසුබිමේ රතු ඉරි සහිත අත් කොට ටීෂර්ට් එකක්, සුදු කළු කොටු සහිත කලිසමක්, කොළ පාටට හුරු කොට කලිසම් 01 ක්. අත්කොට බැනියම් 01 ක්, කළු තැඹිලි පාට අත්කොට කමිසය 01 ක්, සුදු පසුබිමේ කොළ පාට මල් සහිත ෂෝල් 01 ක් වශයෙන් අඩංගු බෑගය දේපළ කුවිතාන්සි අංක 71/2019 යටතේද, අංක 9402970289942 සඳහන් ඩයලොග් වර්ගයේ සිම් ආවරණ කොටසක් දේපළ කුවිතාන්සි අංක 72/2019ට ඇතුළත් කරන ලද බව කියා සිටින ලදි.

තවද එම ස්ථානයේ පිහිටි සහරාන්ගේ බිරිඳ සහ බාල දරුවා තුවාල ලබා සිටි කාමරයේ පසෙක තිබූ ජයසුන්දර ටෙක්ස්ටයිල් ගිරිඋල්ල ආයතනයේ නම මුද්‍රිත ප්‍රමාණ දෙකකින් යුත් 50 × 70 CM සහ 39×53 CM ප්‍රමාණයේ ඉටි කවර 2 ක් එම වෙළඳසැලේ නම මුද්‍රා කරන ලද බෑග් 2 ක් සහ ඉදිරිපස විවෘත බොත්තම් 05 කින් යුත් සුදු බ්ලවුස් 03 ක්ද, ඉදිරිපස විවෘත නැති සුදු බ්ලවුස් 02 ක්ද, සුදු ක්‍රීම් පාටින් යුත් කාන්තා යට සායවල් දෙකක්ද, සුදු රෙදි 544 CM × 44 CM ප්‍රමාණයේ සුදු රෙදි කැබැල්ලද, අවර්ණ සුදු කාන්තා සාය 03 ක්ද, සුදු පැහැ සාය 02 ක්ද, සුදුපාට ශෝල් 03 ක්ද ලෙස සොයා ගෙන දේපළ කුවිතාන්සි අංක 72/2019 යටතේම වෙන වෙනම පාර්සල් වශයෙන් ඉදිරිපත් කරන ලද බව කියා සිටිමින්, 66/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1367 වශයෙන් ද, 67/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1368 වශයෙන් ද, 68/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1369 වශයෙන් ද, 69/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1370 වශයෙන් ද, 70/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1371 වශයෙන් ද, 71/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත පැ.1372 වශයෙන් සහ 72/2019 දරන දේපල කුවිතාන්සියේ මුල් පිටපත

පැ.1373වශයෙන් සලකුණු කරන ලදි. එසේම එම නඩු භාණ්ඩ නිසි පරිදි අම්පාර කොට්ඨාශ අපරාධ ස්ථානයේ නඩු බඩු භාරව කටයුතු කරන උ.පොා. ප. ගාමිණි නිලධාරියාට භාර දුන් බව කියා සිටින ලදි.

ඉහත 72/2019 දරන දේපල කුවිතාන්සියට ඇතුළත් කරන ලද කාන්තා ඇඳුම් පැ.1376, පැ.1378, පැ.1380, පැ.1382(A), පැ.1382-(B), පැ.1382(C) හා පැ.1384(A), පැ.1384(B), පැ.1386(A), පැ.1386(B), පැ.1388(A), පැ.1388(B), පැ.1390, පැ.1392(A), පැ.1392(B), පැ.1392(C) වශයෙන් ද, ජයසුන්දර ටෙක්ස්ටයිල් යනුවෙන් ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් රතු වර්ණයෙන් සහ නිල් වර්ණයෙන් සඳහන් කර ඇති කැපිටල් ඉංග්‍රීසි අකුරෙන් ගිරිඋල්ල ලෙසත්, ඒ ආසන්නයෙන් 037-2288868 දුරකථන අංකයත්, ඉන් පහලින් jayasundaratextiles@gmail.com වශයෙන් විද්‍යුත් ලිපිනයත් සඳහන් කර ඇති පොලිතින් බෑගය පැ.1393(D) වශයෙන් ද සලකුණු කරන ලදී.

සාක්ෂිකරු විසින් භාරයට ගන්නා ලද භාණ්ඩ වශයෙන් විවෘත අධිකරණයේ දී හඳුනා ගන්නා ලද ටී-56 වර්ගයේ ගිනි අවියකට යොදන මැගසිනය පැ.1397 වශයෙන් සහ එම මැගසිනය සමඟ ඇති විනිවිද පෙනෙන ප්ලාස්ටික් කවරයකට බහා ඇති ටී56 වර්ගයේ ජීව උණ්ඩ 06

පැ.1398 වශයෙනුත් සලකුණු කරන ලද අතර, පී.ආර්.67/2019 යටතේ ඔබ විසින් දැවී ගිය විවිධ කොටස් අතරේ තිබී සොයා ගන්නා ලද Optoma නම සඳහන් Multimedia Projector යන්ත්‍රය පැ.1400 වශයෙන් ද, ත්‍රීපාද ආධාරක කොටස් පැ.1402 වශයෙන්ද, විනිවිධ පෙනෙන භාජනයක බහා තිබූ රන් භාණ්ඩ යැයි සඳහන් නඩු භාණ්ඩ පැ.1404 වශයෙන්ද, දැවී ගිය පරීගණක කොටස් පැ.1406 වශයෙන් ද සලකුණු කරන ලද සාක්ෂිකරු එකී නඩු භාණ්ඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2019. 05. 29 වන දින නඩු අංක 9924/2019 දරණ කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව සඳහා ඉදිරිපත් කරන ලද බව කියා සිටින ලදි.

තවද 2019.04.28 දින නැවත නින්දවූර් 07, දෙවන හරස් වීදිය, නො. 49 නිවසට ගොස් සුදු සායක්, සුදු බ්ලවුස් 02ක්, ෂෝල් 02ක් සොයා ගත් බවත් ඒවා නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 78/2019ට ඇතුළත් කළ බවත් කියා සිටිමින් එකී නඩු භාණ්ඩ කුවිතාන්සිය පැ.1407 ලෙස සලකුණු කරන ලදී.

තවද අධිකරණ නියෝගයක් පරිදි කල්මුණේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත අබ්දුල් කාදර් ෆාතිමා කාදියා නොහොත් සිත්තියා වන

සහරාන් යන අයගේ බිරිඳගේත් දියණිය වන මොහොමඩ් සහරාන් රුදෙයිනාගේ DNA නිස්සාරණය සඳහා රුධිර සාම්පල් ලබාගෙන ඒවා අම්පාර මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා වෙත භාර දුන් බව කියා සිටින ලද අතර එසේ භාරදීමට පෙර ඒවා දේපළ කුවිතාන්සි අංක 79/2019ට සහ 80/2019 දරණ දේපළ කුවිතාන්සියට ඇතුළත් කළ බවත් කියා සිටීමින් එකී දේපළ කුවිතාන්සි පිළිවෙළින් පැ.1408 සහ පැ.1409 වශයෙන් සලකුණු කරන ලද බවත් තවද 2019. 05. 06 වන දින නඩු අංක 9924/2019 දරණ කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගත් නියෝග පරිදි මෙම නඩු භාණ්ඩ රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත භාරදුන් බවත් කියා සිටින ලදි.

<u>විශ්ලේෂණය.</u>

මෙම සාක්ෂිකරු විසින් ලබා දී ඇති දීර්ඝ සාක්ෂිය තුළින් පැමිණිල්ල පෙන්වා දී ඇත්තේ ඔහු සමන්තුරේ ශෙංගල් ග්‍රාමම් නැමැති ස්ථානයේ පිහිටි පරිශ්‍රයකින් ද නින්දවූර් ප්‍රදේශයේ සැක කටයුතු නිවසකින්ද එසේම සයින්දමරුදු ප්‍රදේශයේ බෝම්බ පිපිරීම් සිදු වූ නිවස තුළ තිබී ඔහුගේ භාරයට ගෙන ඇති නඩු භාණ්ඩ ඉතා විශාල ප්‍රමාණයක් හඳුනාගෙන ලකුණු කර ඇති බවයි. එම භාණ්ඩ අතර මෙම නඩුවට අදාළ සියළුම පිපිරුම් ස්ථානවල තිබී සොයා ගන්නා ලද පශ්චාත් පිපිරුම් ආවරණ වලට සහ

අධිබල පිපිරුම් ද්‍රව්‍ය වල ශේෂ සමඟ ගැළපෙන්නා වූ රසායනික ද්‍රව්‍ය, යකඩ බෝල, විදුලි පරිපථ කොටස් ඇතුළු මෙම චෝදනාවලට අදාළ වන්නා වූ නඩු භාණ්ඩ රාශියක් සොයාගෙන විමර්ශන නිලධාරීන් භාරයට ගත් බවත්, ඒවා නිසිපරිදි නියමිත ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය සඳහා රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කර ඇති බවත් සනාථ කරයි. තවද ඔහු සොයාගෙන ඇති නඩු භාණ්ඩ අතර ඩ්‍රෝන කැමරා, එසේම කඳවුරු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන උපකරණ, වීඩියෝ පටිගත කිරීම් සඳහා පාවිච්චි කරන උපකරණ සහ ප්‍රොජෙක්ටර් මෙන්ම මෙම නඩුවේදී පැමිණිල්ලෙන් ලකුණු කරන ලද, සහරාන් ඇතුළු ස්වයංඝාතක බෝම්බකරුවන් සිටින්නා වූ ඡායාරූපයක පසුබිමෙහි දිස් වූ අයි. එස්. අයි.එස්. ධජයට සමාන ධජයක්ද, එසේම එකී ස්වයංඝාතක බෝම්බකරුවන් යැයි හඳුනා ගන්නා ලද පුද්ගලයින් ඇඳ සිටි ගෙලේ සිට පාදය දක්වා දික් වූ ඇඳුම්වලට සමාන ආකාරයේ ඇඳුමක්ද තිබී සොයාගෙන ඇති අතර, එසේම රසායනාගාර උපකරණ රාශියක්ද එම නඩු භාණ්ඩ අතර තිබී සොයාගෙන ඇති පසුබිම තුළ මෙම නඩු භාණ්ඩ මෙම පාස්කු බෝම්බ ප්‍රහාරය හා සම්බන්ධ අනිකුත් අපරාධ ස්ථානයන්හිදී සොයාගෙන ඇති නඩු භාණ්ඩ සමඟ සහ පැමිණිල්ලේ සාක්ෂිකරුවන් විසින් සාක්ෂි ලබා දී විස්තර කර ඇති පරිදි සල්පියුරික් ඇසිඩ් නයිට්‍රික් ඇසිඩ් රසායන ද්‍රව්‍ය විශාල කෑන් වල අසුරා තබාගෙන ඇති බවද, එසේම පාස්කු ප්‍රහාරයේ බෝම්බ පිපිරීම් වලදී බෝම්බ සෑදීම සඳහා උපයෝගී

කරගෙන ඇති යකඩ බෝල වලට සමාන යකඩ බෝල සහිත පෙට්ටියක්ද තිබී සොයාගෙන ඇති පසුබිම තුළ මෙම සොයා ගෙන ඇති භාණ්ඩ හා මෙම නඩුවට අදාළ පාස්කු බෝම්බ ප්‍රහාර මාලාවට හා සම්බන්ධ අපරාධ ස්ථානයන් හා ආරක්ෂිත නිවාස සම්බන්ධයෙන් ප්‍රබල පරිවේෂණීය සාක්ෂි මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති බවට අපහට පැහැදිලිව පෙනී යයි.

ISIS සහ සහරාන්ගේ දේශණය පරිවර්තනය කිරීම

පැ.සා.2234 හුසේන් මොහොමඩ් හනාස් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ භාෂා පරිවර්තක ලෙස කටයුතු කරන බවත් පවසා භාෂා පරිවර්තනය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් පවත්වන ලද විභාගය සමත් වූ බවත් එසේම, තමා භාෂා හතරකින් දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු බවත් එලෙස තමා දිවුරුම් දුන්නේ 2007 වසරේ බවටත් පවසා තමා සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ අරාබි භාෂා පරිවර්තනයෙහි හැකියාවන් තියෙන අයෙකු බවටත් අධිකරණයට පවසා ඇත.

මෙම සාක්ෂිකරුට පීආර්63/2022 ලෙස නිසි පරිදි මුද්‍රා තබා තිබූ ලේඛනය විවෘත අධිකරණයේදී විවෘත කර බලා ඇති අතර මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ අරාබි භාෂාවෙන් ඇති එම ලේඛන තමා සිංහල භාෂාවට පරිවර්තනය කළ බවත් තමා පේරාදෙණිය විශ්ව

විද්‍යාලයෙන් කලා උපාධිය හැදෑරීමේදී අරාබි භාෂාවද විෂයක් ලෙස හැදෑරූ බවත් එයට අමතරව බේරුවල ජාමියා නලීමියා උසස් අධ්‍යාපන ආයතනයෙන් ඉස්ලාම් ආගම හා ඒ හා සම්බන්ධ දේවල් අරාබි භාෂාවෙන් ඉගෙන ගෙන තිබෙන බවත් පවසා ඇති අතර ඉස්ලාම් ආගමේ මූලික ග්‍රන්ථ සියල්ලම අරාබි භාෂාවෙන් පවතින බවත් මොහොම්ද් නබිතුමානන් කතා කළේ අරාබි භාෂාවෙන් බවත් කුරාණයේ තිබෙන්නේද අරාබි භාෂාවෙන් බවත් එසේම, ඉස්ලාම් භක්තිකයන් ලෙස තමාලා එදිනෙදා සිදු කරන යාඥාවන්ද අරාබි භාෂාවෙන්ම සිදු කරන බවත් පවසා ඇත.

තමා විසින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තකයන් දෙදෙනෙකු සමඟ වීඩියෝ පටය නරඹමින් එහි සඳහන් කටහඬවලට සවන් දෙමින් භාෂා පරිවර්තනයක් සිදු කළ බවත් අදාළ වීඩියෝ පටයෙහි වැඩි වශයෙන් දමිළ භාෂාවෙන් තිබුණු බවත් තැනින් තැන අරාබි වාක්‍ය භාවිතා කර තිබෙන බවත් පවසා මෙම සාක්ෂිකරු විසින් මෙලෙස විවෘත අධිකරණයේදී පිටු ගණනාවකින් යුතු ලේඛනයක් පෙන්වා දී ඇති අතර එහි මෙම සාක්ෂිකරු සහ තවත් සාක්ෂිකරුවෙකුද අත්සන් තබා ඇති බවට සාක්ෂිකරු හඳුනාගෙන එම ලේඛනය පැ.162 ලෙස ලකුණු කර ඇති අතර එමෙන්ම පී ආර් 63/2022 දරන මුද්‍රා සහිත කවරයක තිබූ සැනලි දාවකයක්ද පැ.163 ලෙස විවෘත අධිකරණයේ විකාශනය කර ඇති අතර ඒ අනුව මෙම සැනලිදාවකය තුළ තිබූ ගොනුව අතුරින් පළමු ගොනුව වන CFR 06/21/CTIG වශයෙන් සඳහන් ගොනුවෙහි අඩංගු එහි අඩංගු ගොනු

67 ක් අතුරින් 00460.MTS වශයෙන් තිබෙන ගොනුව විවෘත කර අධිකරණය ඉදිරියේ විකාශනය කර ඇත.

එහි පහත සඳහන් පරිදි සඳහන් වන බවට සාක්ෂිකරු විසින් පවසා ඇත. (''බලන්න මම කතා කරන්නම්. කතා කරන්න. ඔබතුමන්ලාට සාමය හා අල්ලාහ් දෙවියන්ගේ දයාව සහ අභිවෘද්ධිය ලගා වේවා. ගෞරවනීය ඉස්ලාම් සහෝදරවරුනි. අල්ලාහ් දෙවියන්ගේ භක්තිකයෙනි. අල්ලාහ් දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ වූ ආශිර්වාදයෙන් ඔහුගේ ධර්ම මාර්ගයේ එය පිරිසිදුව වටහා ගැනීම උදෙසා හරිද එනවාද'') යනුවෙන් සඳහන් වන බවත් පවසා ඇත. එසේම, එය 2019.04.20 පස්වරු 01.17.33 ට සඳහන් වන වේලාවක් බවද සඳහන් කර ඇත.

ඉන් අනතුරුව 00461 MTS අකුරින් දක්වා තිබෙන ගොනුවද විවෘත අධිකරණයේ විකාශනය කර එහි සඳහන් වන්නේ පහත පරිදි බව සඳහන් කර ඇත. (''ඔබතුමන්ලාට සාමය හා අල්ලාහ් දෙවියන්ගේ දයාව සහ සාමය ලගා වේවා. සියලු ප්‍රශංසා අල්ලාහ් දෙවියන්ගේය. අපි උන්වහන්සේට ප්‍රශංසා කරමු. අපි උන්වහන්සේගෙන් උදව් පතමු. උන්වහන්සේගෙන් සමාව අයැද සිටිමු. අපි ගත් වැරදි ක්‍රියාවලට දෙවියන්ගේ රැකවරණය පතමු හරිනේ.'') යැයි සඳහන් වන බවත් එම 00461 කියන වීඩියෝ දර්ශනය අදාළ වේලාව 2019.04.20 දින පැය 02.12.45 බවත් සාක්ෂිකරු පවසා ඇත.

එම වීඩියෝවෙහි පහත පරිදි සඳහන් වන බවද සාක්ෂිකරු විසින් පවසා ඇත. (“ඔබතුමන්ලාට සාමය හා අල්ලාහ් දෙවියන්ගේ දයාවත් සහ සාමය වේවා. සියලු ප්‍රශංසා අල්ලාහ් දෙවියන්ගේය. අපි උන්වහන්සේට ප්‍රශංසා කරමු. අපි උන්වහන්සේගෙන් උදව් පතමු. උන්වහන්සේගේ සමාව අයැද සිටිමු. අපි ගත් වැරදි ක්‍රියාවලට දෙවියන්ගේ රැකවරණය පතමු. හරිනේ. සියලු ප්‍රශංසා අල්ලාහ් දෙවියන්ටයි. අපි උන්වහන්සේගෙන් සමාව අයැද සිටිමු. අප ගත් වැරදි ක්‍රියාවලට දෙවියන්ගේ රැකවරණය පතමු. අල්ලාහ් දෙවියන් විසින් මඟ පෙන්වන තැනැත්තා නොමග නොයනු ඇත. උන්වහන්සේගෙන් නොමඟ යන්නන්ට නිවැරදි මඟක් නොලැබුණු ඇත. අල්ලාහ් දෙවියන් හැර වෙනත් දෙවියෙකු නොමැති බව ඒකාන්තය. ඔහුට සහකරුවන් නොමැති බවට සාක්ෂි දරමි. මොහොමද් යනු ඔහු විසින් එවන ලද ශාස්තaaවරයා ලෙසටද මම සාක්ෂි දරමි. ජ්‍යෙෂ්ඨ අල්ලාහ් දෙවියන් අපට අල්ලාහ් දෙවියන් හැර අනිකුත් වන්දනා මාන කරන සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ වැදගත්කම පැහැදිලි කර ඒක දේව වාදයට එරෙහි යොමු වන ආකාරයට අප පෙන්නුවේය. මග පෙන්නුවේය. අල්ලාහ් දෙවියන්ට ප්‍රශංසා වේවා. ඒක දේව වාදය ගැන පැහැදිලි කිරීමෙන් පසුව එක් දේව වාදය ක්‍රියාවෙන් යෙදවීමක් ලෙස ජිහාත් එනම් අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කිරීම යන උතුම් වූ ආගමික කටයුත්ත කෙරෙහි ජ්‍යෙෂ්ඨ අල්ලාහ් දෙවියන් විසින් අපට මග පෙන්වන ලදි. අල්ලාහ් දෙවියන්ට ප්‍රශංස වේවා. ජිහාත් මඟින් තමයි අපි මෙම ගරුත්වය ලබා ගත්තේ. අද දින

සහෝදරවරුනි අද දින ශ්‍රී ලංකා දේශයට අයත් ඉස්ලාම් දේශයට අයත් අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අපිට ඉස්තිෂ්හාත් එනම් ආගම වෙනුවෙන් ජීවිතය පූජා කිරීම යැයි කිය

ධාර මරාගෙන මැරෙන ප්‍රහාරයට අප සියලු දෙනාම එක්වී සිටින්නෙමු. මෙම ප්‍රහාරය ආශිර්වාදය ලත් ෂාම්දේශය එනම් සිරියාව සහ අවට ප්‍රදේශය වෙනුවෙන් පලිගැනීම යන යුධ මාලාව යටතේ තමයි මෙම ප්‍රහාරය දියත් කිරීමට මුජාබ් ගර් වන ගරු එනම් අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අපි එක්වී සිටින්නෙමු. ගෞරවනීය සහෝදරවරුනි, අල්ලාහ් දෙවියන්ගේ අනුගාමිකයනි ඉස්තිෂ්හාත් කුමක්ද, ඉස්තිෂ්හාත් යනු විරෝධාර මරාගෙන මැරෙන ප්‍රහාරයයි. ‘’

‘’ආත්මීය පරිත්‍යාගයෙන් කරන මරාගෙන මැරෙන ප්‍රහාරයක් යන්න එහි අර්ථයයි. අල්ලාහ් දෙවියන් වෙනුවෙන් ඔහුගේ ආගමේ උන්නතිය වෙනුවෙන් දෙවියන් ප්‍රතික්ෂේප කරන අයව මුලුමනින්ම නැති කිරීමට සහ විශ්වාසවන්තයන් වන අපගේ සහෝදරවරුන් මරාදමන, ඔවුන්ව කිසිදු අනුකම්පාවකින් තොරව තැනින් තැන මරා දමන අල්ලාහ් දෙවියන් විශ්වාස නොකරන්නන්ට විරුද්ධව පළිගැනීම සඳහා ඒ විතරක් ද, අපගේ ජීවිතය පූජා කර, ස්වර්ගය ලබා ගැනීමට විශ්වාසවන්තයන් වන අපි අල්ලාහ් දෙවියන් සමඟ සිදු කරනු ලබන ආශ්චර්යමත් ව්‍යාපාරයක් තමයි

ඉස්තිස්හාද් ලෙස පවසනු ලබන්නේ. එය ආත්මීය පරිත්‍යාගයෙන් කරන මරාගෙන මැරෙන ප්‍රහාරයක්.''

'' මේක මරාගෙන මැරෙන ප්‍රහාරයක් නෙවෙයි. ජීවිතය පූජා කරමින් සිදු කරන මරාගෙන මැරෙන ප්‍රහාරයක්. මෙය අල්ලාහ් දෙවියන් සමඟ කරනු ලබන උතුම් වූ ව්‍යාපාරයක්. ශ්‍රේෂ්ඨ අල්ලාහ් දෙවියන් අල් කුරාණයේ පෙන්වා දී ඇත්තේ, විශ්වාසවන්තයන්ගෙන් ඔවුන්ගේ ජීවිතයත්, ඔවුන්ගේ ආර්ථිකයත්, ඔවුන්ට ස්වර්ගය ලබා දීම වෙනුවෙන් අල්ලාහ් දෙවියන් නිශ්චිතවම මිලදී ගෙන ඇති බවයි. එම වාක්‍යයේ තවදුරටත් පවසන්නේ විශ්වාසවන්තයන් අල්ලාහ් දෙවියන්ගේ මාර්ගයේ ආයුධ රැගෙන සටන් කරන බවත් සතුරන්ව කපා කොටා දමන බවත් සතුරන්ගෙන් ප්‍රතිප්‍රහාරවලට ලක් වන බවත් ය.''

''මේ පිළිබඳ වූ පොරොන්දුව සත්‍ය වශයෙන්ම තව්රාත් ග්‍රන්ෂයේ ද, ඉන්ජීල් ග්‍රන්ථයේ ද, කුරාණයේ ද සඳහන් කර ඇත. අල්ලාහ් දෙවියන්ගේ මාර්ගයේ ආයුධ රැගෙන සටන් කිරීම මෝසස් නබිතුමාගේ කාලයේ සිටම ආරම්භ වූ අල්ලාහ් දෙවියන්ගේ සිරිතකි. මේ පිළිබඳ වූ පොරොන්දුව සත්‍ය වශයෙන්ම ඉන්ජීල් සහ තව්රාත් යන ග්‍රන්ථවල ඇති බවට කුරාණයේ සඳහන් කර ඇත. අල්ලාහ් දෙවියන්ට වඩා ඇත්තටම පොරොන්දු ඉටු කරන්නේ වෙන කවුද, අල්ලාහ් දෙවියන් සමඟ කරනු ලබන ව්‍යාපාරය මඟින් විශ්වාසවන්තයන් වන ඔබ එහි ප්‍රතිඵල ලබා ගන්න. මෙයයි දැවන්ත

ජයග්‍රහණය යනුවෙන් කුරාණයේ අල්ලාහ් දෙවියන් අපට පෙන්වා දෙන්නේ.''

''අද දින ශ්‍රී ලංකාවේ ඉස්තිෂ්හාද් යන වීරෝධාර මරාගෙන මැරෙන ප්‍රහාරය ඇයි සිදු කරන්නේ, පළමු හේතුව, දෙවියන්ගේ විශ්වාසවන්තයන් වන අපි ප්‍රතිපත්තිමය වශයෙන් එක් ප්‍රතිපත්තියක සිටින ජන කොටසක් වෙමු. දෙවියන් විශ්වාස නොකරන්නන් විසින් අඳිනු ලැබූ සීමා මායිම්වලින් රටක්, දේශයක් වශයෙන් බෙදුණු අය නොවෙයි. බටහිරි සිටින මුස්ලිම්වරයෙකුට වේදනාවක් නම්, බටහිර සිටින මුස්ලිම්වරයෙකුට පහර දෙන්නේ නම් නැගෙනහිර සිටින මුස්ලිම්වරයෙකුට ද එය වේදනාවයි. මෙයයි ධර්මය කියා දෙන අල්වලා. ''

''අපගේ ප්‍රතිපත්තිමය මොකක්ද කියලා දන්නවාද, විශ්වාසයේ මූලික පදනම වන්නේ අල්ලාහ් දෙවියන් වෙනුවෙන් ආදරය කිරීම සහ අල්ලාහ් දෙවියන් වෙනුවෙන් වෛර කිරීමයි. පක්ෂ පාට දෙස බලා හෝ දේශ සීමා බලා හෝ අපි ජනතාව වෙන් කරන්නේ නෑ. ඇමරිකාවේ සිටින මුස්ලිම් අය අපගේ සහෝදරවරුන්. ශ්‍රී ලංකාවේ සිටින දෙවියන් විශ්වාස නොකරන්නන් අපගේ හතුරන්.''

''ගෞරවනීය සහෝදරවරුනි, මෙම ප්‍රහාරය අප දියත් කිරීමට මූලිකම හේතුව, මුලින්ම විශ්වාසවන්තයන් කෙරෙහි ඇති සෙනෙහසයි.

දෙවනුව සාම් දේශයේ අල්ලාහ් දෙවියන් විසින් ආශිර්වාද කරන ලද දේශයේ කලීෆා අබුබක්කරු අල්බග්දාදිගේ ප්‍රධානත්වයෙන් ඉස්ලාමීය පාලනයක් පැවැතීමයි. එවැනි පාලනයක් පැවැති පුංචි ග්‍රාමයක් තමයි බාවූස් යැයි කියනු ලබන ග්‍රාමය. එම බාවූස් කියන ග්‍රාමය අල්ලාහ් දෙවියන් පමණක් විශ්වාස කළ ජනතාව විසින් අල්ලාහ් දෙවියන්ගේ ෂරියා නීතියෙන් පාලනය වූ ඒ බිම කුරුස සන්ධානයේ බල්ලෝ එහි සිටි මුස්ලිම්වරුන්ව කිසිදු වග විභාගයකින් තොරව විනාශ කළා.''

''80 කට අධික රටවල් ගණනක් තහනම් කරපු WHITE POSPEROUS යොදා සකස් කළ බෝම්බ විශාල වශයෙන් දාලා ඒ ජනතාව විනාශ කළා. ඒ උනත් ඒ ජනතාව ධර්ම මාර්ගය අත්හැරියේ නෑ. ආගම වෙනුවෙන් ඔවුන් මැරුණා. ආගම වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළා. ආගම වෙනුවෙන් මැරුණා. නමුත් ඇත්තටම ඔවුන් ජීවතුන් අතර සිටින ජනතාවක්. ඔවුන් ආගම වෙනුවෙන් දිවි පිදූ අය. ඒ වගේ පිරිසක් තමයි අස්හාබුල් උහ්දූද් සිදුවීමේ දී ගිණි වලක දමා සමූල ඝාතනය කළේ. ඒ නිසා තමයි දෙවියන් වෙනුවෙන් සටන් කරන අපි කියන්නේ බාවූස්ගේ දෙවියන්මයි අපි විශ්වාස කළේ. බාවූස්හි ජනතාව වෙනුවෙන්, ඒ ජනතාව මරණයට පත් කළ මෙම දෙවියන් විශ්වාස නොකරන්නන්ගෙන් පළි ගැනීමටයි.''

''අප සියලු දෙනාගේ ප්‍රාණය අල්ලාහ් දෙවියන් වෙනුවෙන් පුදනු ලබන්නේ. ඒ විතරක් නෙමෙයි. ඉරාකයේ මොසූල් යැයි කියනු ලබන

ඉස්ලාමීය දේශය මුස්ලිම්වරුන් විසින් පාලනය කරන ලද අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අය විසින් පාලනය කරන ලද, අල්ලාහ් දෙවියන්ගේ ෂරියා නීතිය ක්‍රියාත්මක වූ ඒකදේවවාදී ධජය ලෙළ දුන් භූමියක්. ඒ මොසූල් නගරයත්, සිරියාවේ රක්කා නගරයත්, ලිබියාවේ සිරුත්ති නගරයත් විනාශ කළ කුරුසකරුවන්ට මුළුමණින්ම විනාශ කිරීමට, අපි දෙවියන් වෙනුවෙන් ජීවිතය පූජා කිරීමට ඉදිරිපත් වුණෙමු. අපගේ දෙවියන් වෙනුවෙන් ජීවිතය පූජා කිරීමේ ප්‍රහාරයේ දී ක්‍රිස්තියානි පල්ලි ඉලක්ක කරගෙන තියෙනවා. CHURCH ඉලක්ක කරගෙන තියෙනවා. ඇයි දන්නවාද, දෙවියන් විශ්වාස නොකරන ඔබගේ ලේ අපට හලාල් එනම් අපට කැපයි කියා අපගේ ධර්ම මාර්ගය පවසනවා; අල් කුරාණයේ අල්ලාහ් දෙවියන් කියනවා; අල්ලාහ් දෙවියන්ව විශ්වාස නොකරන, මෙලොව හා පරලොව විශ්වාස නොකරන මෙන්ම අල්ලාහ් දෙවියන් සහ ඔහුගේ රසූල් එනම් අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු හරාම් එනම් අපට අකැප දේ අනුමත නොකරන, සත්‍ය ධර්මය වන ඉස්ලාම් ධර්මය, ධර්ම මාර්ගයක් ලෙසට නොපිළිගන්නා ලද ඒ ග්‍රන්ථ විශ්වාස කරන්නන් ජීසියා බද්ද එනම් ඉස්ලාම් රාජ්‍යයක වෙනත් ජාතීන් විසින් ගෙවනු ලබන බද්ද ගෙවන තුරු ඔබ ආයුධ ගෙන සටන් කරන්න කියා. මේ කාගේ වැකියක්ද, අල්ලාහ් දෙවියන්ගේ ඒ සිංහාසනයේ වැඩ සිටින රහුමාන්ගේ එනම් අල්ලාහ් දෙවියන්ගේ වැකිය යි.''

''අල් කුරාණයේ අල්ලාහ් දෙවියන් පවසන්නේ; ජිසියා බද්ද ගෙවනතුරු ඔබ ක්‍රිස්තියානි අය සමඟ සටන් කරන්න. ක්‍රිස්තියානි අය වන ඔබ ඉස්ලාම් ආගම විශ්වාස නොකරන්නන් වන ඔබ අපට පහර නොදුන්නත් ඔබ වැටෙන තුරු පහර දෙන්න කියා තමයි අපට ධර්ම මාර්ගයේ පවසන්නේ. එනමුත් අපගේ ජනතාව, මුස්ලිම්වරු බොහෝ දෙනෙක් මෙලොව සැප සම්පත්වලට අධිකව ගිජු වූ නිසා ඔවුන් ඒ OFFENSIVE JIHADH කළේ නෑ. ක්‍රිස්තියානි අය වන ඔබ ළඟටම ඇවිල්ලා, අල්ලාහ් දෙවියන්ව විශ්වාස නොකරන අය වන ඔබට ළඟටම ඇවිල්ලා එක්කෝ ඉස්ලාම් ආගමට එන්න. නැත්නම් ජිසියා බද්ද ගෙවන්න. නැත්නම් ඔබ සමඟ අපට ආයුධ සන්නද්ධ අරගලයක් ප්‍රකාශයට පත් කරන්න සිදු වේවි යැයි ඔබ ඔවුන්ට කියා තිබිය යුතුයි.''

''ධර්ම මාර්ගය එසේ කියා තිබියදී අපේ ජනතාව එය කළේ නෑ. කිහිප දෙනෙක් පමණයි එය ඉටු කිරීමට ඉදිරිපත් වුණේ. අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අයවත් ත්‍රස්තවාදීන් යැයි හංවඩු ගහමින්. කවාරිජ් එනම් ඉස්ලාම් ආගමෙන් වෙන් වී ගිය පිරිසක් යැයි හංවඩු ගහමින් අපේ ජනතාව කොන් කළා. එසේ කොන් කළ නිසාත් බහුතර ජනතාව ගං වතුරට හසු වූ පරඬැල් මෙන් සිටින නිසාත්, ක්‍රිස්තියානි අය වන ඔබ මොකද කළේ, අපේ ජනතාව මරා විනාශ කර දැමීම විනෝදාංශයක් බවට පත් කර ගත්තා.''

"නවසීලන්ත පල්ලියේ දී අපේ ජනතාව නිරපරාදේ වෙඩි තබා ඝාතනය කළා. ඒකට පළිගැනීමට තමයි අපි ක්‍රිස්ත්‍රියානි පල්ලි ඉලක්ක කරලා ප්‍රහාර දියත් කරන්නේ. ඊර්ෂ්‍යාකාර ප්‍රංශ බල්ලෝ එදා ඉදන් අද දක්වාම අපේ ජනතාව මරා විනාශ කරනවා. ඇමරිකානු ඝාතන්වරු අපේ ජනතාව මරා දැමීම ඔවුන්ගේ දවසේ කාර්යයක් බවට පත් කරගෙන තියෙනවා. රුසියාව, ඊශ්‍රායලය, ඉතාලිය, ඕලන්දය, නවසීලන්තය, ඔස්ට්‍රේලියාව, කැනඩාව, යුරෝපය යන රටවල්වල අයගේ වැඩේ මොකක්ද, අපේ ජනතාව මරා දැමීම; මේ සඳහා මුදල් විශේෂයෙන් වෙන් කිරීම; මේ සඳහා පුහුණු කරවීම; ඉරාකයේ, සිරියාවේ, කුරාඝානයේ අපේ ජනතාව මරා දමා, අපේ කාන්තාවන් වැන්දඹුවන් කර, දූෂණය කර, අපේ දරුවන් අනාථ කර, අපේ පල්ලි කඩා විනාශ කර, අල්ලාහ් දෙවියන්ගේ ධර්මය ඉරා විසි කර, අපේ ජනතාව ලේ විලක ගිල්වා දමා ඔබ ශ්‍රී ලංකාවට විනෝද චාරිකා එනවාද, ඉස්ලාම් ධර්මය හොඳින් දැනගන්න."

"ඉස්ලාම් ධර්මයේ අහිංසක මහජනතාව කියා කොටසක් නෑ. අල්ලාහ් දෙවියන් විසින් මිනිසුන් වෙන් කළේ කාෆීර් සහ මුස්ලිම් කියලා. කාෆීර් සහ මුස්ලිම් කියන වෙනස පමණයි ධර්ම මාර්ගයේ තියෙන්නේ. කාෆීර් එනම් දෙවියන් විශ්වාස නොකරන අයෙක් නම් ඔහුගේ රුධිරය සහ ආර්ථිකය හලාල්. මුස්ලිම් කෙනෙක් නම් ඔහුගේ ලේ සහ ආර්ථිකය තවත් මුස්ලිම් කෙනෙකුට හරාම්. මේක මම කියපු දෙයක් නෙවෙයි. ඉබ්නු උමර්

යන නබිතුමාගේ සමීපතමයා ඒ බව පවසා තියෙනවා. ඒක සහිලූල් බුහාරි කියන හදීස් ග්‍රන්ථයේ සටහන් වෙලා තියෙනවා.''

''අල්ලාහ් දෙවියන්ගේ රසූල් තුමා පවසනවා, අල්ලාහ් දෙවියන් හැර මිනිසුන්ට වන්දනාමාන කිරීමට සුදුසු කිසිවෙකු නොමැති බව. මුහම්මද් නබිතුමාව දේව දූතයෙක් ලෙස ස්ථිරවම විශ්වාස කර, මුස්ලිම් යාඥා ස්ථාපිත කර, සකාත් නම් බද්ද ලබා දෙන තුරු ඔවුන් සමඟ සටන් කළ යුතු යැයි මා හට අණ දෙන ලදි යනුවෙන් පවසා තියෙනවා. එහෙම කවුද කිව්වේ, අල්ලාහ් දෙවියන්ගේ රසූල් තමයි කිව්වේ. ඒ අය කලීමා එනම් අන් ආගමිකයන් ඉස්ලාම් ආගමට බැඳෙන විට අනිවාර්යෙන් කියවිය යුතු පාඨය ප්‍රකාශ කර, යාඥාව ස්ථාපිත කර, සකාත් ගෙව්වොත්, ඔවුන් තම ප්‍රාණය, තමා සතු වස්තු මගෙන් ආරක්ෂා කර ගනීවි යනුවෙන් අල්ලාහ්ගේ රසූල් කිව්වා. කලීමා කිව්වේ නැත්නම්, යාඥාව ස්ථාපිත කළේ නැත්නම්, සකාත් දුන්නේ නැත්නම් ඔබගේ ප්‍රාණය ඔබට අයිති නෑ. ඔබගේ රුධිරය හැලීම අපට හලාල්. ඔබේ ආර්ථිකය ඔයට අයිති එකක් නොවෙයි. ''

''එම වස්තු මුස්ලිම්වරුන් වන අපට ගනීමා එනම් යුධ බිමකදී අත්පත් කරගන්නා වස්තු වෙනවා. මේක අපේ දූතවරයාණන් කියපු දෙයක්. දෙවියන් විශ්වාස නොකරන ශ්‍රී ලාංකිකයන්ට කියන්න කැමතියි, පළමුව ශ්‍රේෂ්ඨ හා උතුම් වූ විශ්වයේ ගැළවුම්කරුවා වන අපගේ අල්ලාහ් දෙවියන්ට ඔබ බැන්නා. දෙවනුව අපිරිසිදු ඌරෙකුගේ රූපයක ගෞරවණීය

අල්ලාහ් යන වචනය ලියා කුලියාපිටිය ගමේදී ඔබලා උද්ඝෝෂණය කළා. තුන්වෙනි එක අල්ලාහ්ටත් රහස් ඉන්ද්‍රියක් තියෙනවා කියලා ඥානසාර කියන සාතාන් ජනතාව ඉදිරියේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා.''

''අපේ අල්ලාහ් දෙවියන්ට රහස් ඉන්ද්‍රියක් ඇති බව කියා නින්දා කළා. හතරවෙනි එක අපේ පණටත් වඩා වටින, අපේ බිරින්දෑවරුන්, දුදරුවන්, අපේ යාලුවෝ, අම්මා, තාත්තා සමස්ත මිනිස් වර්ගයා මේ හැම එකකටත් වඩා, පණටත් වැඩියෙන් අපි ආදරය කරන අල්ලාහ් දෙවියන්ගේ දූතවරයාණන්ට බල්ලන් වන උඹලා නින්දිතව බැන්නා. පස්වෙනි එක අපි පණ වගේ ආදරය කරන අපේ උතුම් අල්ලාහ් දෙවියන්ගේ ධර්මය එනම් කුරාණය ඉරා දැමුවා. ඉරා විසි කළා. මේ රටේදී උඹලා ඒක කළා.''

''හයවෙනි එක හිස නමා යාඥා කරන අල්ලාහ් දෙවියන්ගේ දේවස්ථාන සියල්ල උඹලා කඩා විනාශ කළා. හත්වෙනි එක බොරු චෝදනා එල්ල කර මුස්ලිම් අයව මරා දැම්මා. මුස්ලිම්වරුන්ගේ ආර්ථිකයට ගිණි තිබ්බා. මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය විනාශ කළා. ඉඩම් පැහැර ගත්තා. අටවෙනි එක උඹලාගේ බුද්ධි අංශ බල්ලෝ එනම් බුද්ධි අංශයේ ඉව කරන බල්ලෝ විමර්ශනය කරන මුවාවෙන් අපේ කාන්තාවන් නින්දාවට පත් කළා.''

''මේ ප්‍රවෘත්ති මාධ්‍යයේ පළ නොවන විදියට සූක්ෂමව වළක්වා ගත්තා. අල්ලාහ් වෙනුවෙන් සටන් කරන අපි මේ ගැන දන්නවා. අපේ සහෝදරියන්ව බුද්ධි අංශයේ බල්ලෝ විමර්ශනය කරන මුවාවෙන් නින්දාවට පත් කළා. නවවෙනි එක බටහිර අප්‍රිකාවේ සිටින ඉස්ලාම් දේශයේ අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අයට විරුද්ධව ජත්‍යන්තර කුරුස සම්මේලන යුද්ධයේ දී ශ්‍රී ලංකා රජය වන ඔබ ඒකට දායක වෙලා තියෙනවා.'''

''දහවෙනි එක ඔක්කෝටම වඩා ඔබ මේ කිසිවක් නොකළත් මේ හැම දේකටම වඩා භයානක වන්නේ ඔබලා අල්ලාහ් දෙවියන් සම කරමින් බහුදේවවාදයේ සිටීමයි. අල්ලාහ් දෙවියන්ව ප්‍රතික්ෂේප කරන අය ලෙස සිටිනවා. බහුදේවවාදය සම්බන්ධව අපගේ දෙවියන් මොනවද කියලා තියෙන්නේ කියලා දන්නවද, අල් කුරාණයේ අල්ලාහ් දෙවියන් මෙසේ පවසයි. මුස්ලිම්වරුන් වන අපට නියෝග කරනවා. මුෂ්රික්වරුන් එනම් අල්ලාහ් දෙවියන් හැර වෙනත් දෙවියන් අදහන පිරිස දුටු තැන කපා දමන්න. ඔවුන්ව අල්ලන්න. ඔවුන්ව වටලන්න. සෑම බංකරයකම ඔවුන් වෙනුවෙන් සැඟවී සිටින්න. ''

'' ඔවුන් තමන්ගේ පව්වලට සමාව අයැද ඉස්ලාම් ධර්මය වැළඳගෙන, යාඥාව ස්ථාපිත කර, සකාත් දුන්නොත් ඔවුන්ට ඔවුන්ගේ මාර්ගයේ යාමට ඉඩදෙන්න. මෙසේ කවුද කිව්වේ, අපේ අල්ලාහ් දෙවියන්

තමයි කීවේ. මුෂ්රික්වරුන් දුටු තැන කපා දමන්න කියන එක අපගේ දෙවියන් පැවසූ ප්‍රකාශයක්. ඒ වගේම කුරාණයේ මොනවද කියන්නේ, මුෂ්රික්වරු ඔබට සම්පූර්ණයෙන් විනාශ කරනවා වගේ, ඔබත් ඔවුන්ව සම්පූර්ණයෙන්ම මරා විනාශ කර දමන්න. නියත වශයෙන්ම අල්ලාහ් දෙවියන් තමන්ව විශ්වාස කරන අය සමඟ, අල්ලාහ් දෙවියන්ට බය අය සමඟ ළඟින්ම ඉන්නවා කියන එක දැනගන්න. ''

''ඒ වගේම කුරාණයේ අල්ලාහ් කියනවා දෙවියන් විශ්වාස කරන්නන් ප්‍රතික්ෂේප කරන අය ඔබට හමු වුණොත් සම්පූර්ණයෙන් ගෙල පිටුපසින් කපා දමන්න. දෙවියන්ව ප්‍රතික්ෂේප කරන අයවලුනි, අපෙන් ඔබ මොනවාද බලාපොරොත්තු වන්නේ, දෙවියන් වෙනුවෙන් සටන් කරන අපව ඔබ මරා දැමීමට කැමතිද, අනේ මෝඩයිනි, මැරෙන්නට තමයි අපි මේ මාර්ගයට ආවේ. මේ මාර්ගයට අපි ආවේ මැරෙන්නම තමයි. අපේ පැත්තෙන් අපි අල්ලාහ් වෙනුවෙන් ඝාතනය වීම ජයග්‍රහණයක් කියලා ඔබ දන්නවාද, අප කරන මේ ජීවිත පරිත්‍යාගය අපේ පණ දී, ලේ වගුරා, පංචස්කන්ධයම විනාශ කර ගන්නා මේ පරිත්‍යාගය දැනගන්න.''

''එය ඉතා විශාල 'මල්හමා' නම් මහා විනාශකාරී දරුණු යුද්ධයක් සඳහා වන අත්තිවාරමක් බව දැනගන්න. අපේ ප්‍රාණයන්ට වඩා අපගේ ප්‍රතිපත්තිය, 'අකීදා' එනම් විශ්වාසයේ මූලධර්මය තමයි අපට වටින්නේ

කියා ඔබ දැනගන්න. ජීවිතය කියන්නේ අකීදා සහ අකීදා වෙනුවෙන් කරන සටනක්. අල්ලාහ් දෙවියන්ගේ කැමැත්ත අනුව අපේ මේ උත්සාහය කිසි දිනක ව්‍යර්ථ වී යන්නේ නැහැ. අල්ලාගේ අනුමැතියෙන් අපේ ලේ බිඳුවල ආශිර්වාදයෙන් නියතවම මෙහි ඉස්ලාමීය විලායත් එනම් ඉස්ලාම් රාජ්‍යයක් ගොඩනැගේවි. ඉස්ලාමීය දේශයට දිවුරුම් දෙන ඉස්ලාමීය රාජ්‍යයට ISට දිවුරුම් දෙන ජනතාව ශ්‍රී ලංකාවේ බහුලව බිහි වේවි, අල්ලාහ්ගේ කැමැත්තෙන්. කැඩී බිඳී විසිර ගිය අපේ හිස්කබල්වලට වඩා, කැඩී බිඳී ගිය අපේ මස් කැබලිවලට වඩා විලායත් එනම් ඉස්ලාම් රාජ්‍යයක් මේ රටේ නිර්මාණය වේවි.''

''ඇයි දන්නවාද, ඉස්තිෂ්හාද්වරු සිටින සමාජයක් කිසිවිටෙක පරාජය වන්නේ නැහැ. මේක හොඳින් ලියලා තියාගන්න. ඉස්තිෂ්හාද්වරු සිටින සමාජයක් කිසිවිටෙක පරාජය වන්නේ නෑ. ඉන්දියාව ජයග්‍රහණය කිරීමට පැළ කරන බීජය තමයි අපේ මේ ඉස්තිෂ්හාද්. ඉන්දියාවේ සිටින දෙවියන් විශ්වාස නොකරන අයවත් අප අමතක කළේ නැහැ. ඔවුන්වත් මේ යුද්ධයේ දී අපි ඉලක්ක කරගෙන ඉන්නවා. අල්ලාහ්ගේ පණිවිඩකරු පවසනවා. නසාඊ හා මුස්නද් අහමඩ් යන හදීස් ග්‍රන්ථවල ඇති සෞහාන් නැමැති සහාබිවරයා විසින් වාර්තා කර ඇත්තේ අල්ලාහ්ගේ රසූල් මාගේ සමාජයේ කණ්ඩායම් 02 ක් අල්ලාහ් දෙවියන් විසින් අපායේ ගින්නෙන් ආරක්ෂා කර ඇති බවයි.'''

''ඉන් එකක් වන්නේ ඉන්දියාව ජයග්‍රහණය කිරීමට ඉන්දියාව සමඟ යුධ වදින කණ්ඩායමයි. අනෙක් කණ්ඩායම වන්නේ මරියම්ගේ පුතා වන ඊසා නබිතුමා සමඟ එකවී සටන් කරන කණ්ඩායමයි. මෙය ඊසා නබිතුමා සම්බන්ධ කර ප්‍රකාශ කර ඇති බැවින් අවසාන කාලයේ පැවැත්වෙන යුද්ධයක් තමයි ඉන්දියාව ජයග්‍රහණය කරනු ලබන යුද්ධය. ගවයින් අදහන්නනි, ඉන්දියාවේ සිටින ගවයින් අදහන්නනි, ගවයින් අදහන්නන් වන ඔබලාගෙන් පළි නොගෙන ශ්‍රී ලංකාවේ අල්ලාහ් වෙනුවෙන් සටන් කරන ජනතාව සහ ඉන්දියාවේ සිටින අල්ලාහ් වෙනුවෙන් සටන් කරන අය කිසිදාක අත්හරින්නේ නෑ.''

''කාශ්මීර්යේ අපේ මිනිසුන්ව මරා දමනවා. ඔයාලගෙන් කොහොමද පළිගන්නේ නැතුව ඉන්නේ. ඒ නිසා තමයි මෙම යුද්ධයේ අල්ලාහ් වෙනුවෙන් ජීවිත පූජා කිරීමේ දී ඔයාලවත් අපි ඉලක්ක කරගත්තේ. දෙවියන් විශ්වාස නොකරන්නනි, නුඹලා ගැන අපේ ස්ථාවරය වන්නේ 'මිල්ලතු ඉබ්‍රාහීම්' එනම් ඉබ්‍රාහිම්ගේ මාර්ගයයි. දැන ගන්න, 'මිල්ලතු ඉබ්‍රාහීම්' අපේ දෙවියන් කුරාණයේ කියනවා. ඉබ්‍රාහීමුයි ඉබ්‍රාහීම්ගේ පිරිසයි බහුදේවවාදීන් දෙස බලා කියා ඇත්තේ, අපි නුඹලාගෙන් ඉවත් වුණෙමු යන්නයි. අල්ලාහ් හැර නුඹලා වන්දනා කරන දේවල්වලින් අපි ඉවත් වුණෙමු. දෙවියන් විශ්වාස නොකරන නුඹලාගෙන් අපි ඉවත් වුණෙමු. නුඹලාගේ මේ පිළිම, නුඹලා මේ වන්දනා කරන ගල්, පස්,

සාතාන්වරුන්ගෙන් අපි ඉවත් වුණෙමු. ඔයාලව අපි REJECT කළා. ප්‍රතික්ෂේප කළා. ''

''එකම අල්ලාහ් දෙවියන්ව ඔබ විශ්වාස කරන තුරු ඔබත් අපත් අතර සදාකාලික සතුරුකමක් වෛරයක් ඇති වුණා. ඔබත් එක්ක අපට කිසිම සම්බන්ධකමක් නැහැ. ඔබ, දෙවියන් වෙනුවෙන් සටන් වදින අය වන අපට ත්‍රස්තවාදියෝ කියලා කියනවා. බුරුම දේශයේ අපේ මිනිසුන්ව මරා දමනවානේ. මේක ත්‍රස්තවාදය නෙමෙයිද, ඇෆ්ගනිස්ථානයේ, ඉරාකයේ, සිරියාවේ, සිනායිවල, නැගෙනහිර තුර්කිස්ථානයේ, චෙච්නියාවේ අපේ මිනිසුන්ව මරදා දමනවානේ. මේක ත්‍රස්තවාදය නෙමෙයිද, අපේ දෙවියන් තමයි අපට ආයුධ අතට ගැනීමට නියෝග කළේ. මොකටද අපි අවි දරාගත්තේ, අපේ දෙවියන් දාපු නියොගයක්. අල්කුරාණයේ අල්ලාහ් කියා තියෙනවා. විශ්වාසවන්තයන් වන ඔබ, ඔබවට කොපමණ ඒකරාශී කළ හැකිද, එපමණ බලයක් ඒකරාශි කර ගන්න.''

''අශ්ව හමුදාවත් සූදානම් කර තබා ගන්න. මොකටද දන්නවාද, මොකටද, අල්ලාහ්ගේ සතුරාට තර්ජනය කිරීමට. මේ අරාබි වචනයෙන් තමයි TERRORIST ත්‍රස්තවාදියා යන වචනය හැදිලා තියෙන්නේ.අල්ලාහ්ගේ සතුරාට සහ ඔබේ සතුරාට තර්ජනය කිරීමට ඔබ ආයුධ බලය සූදානම් කර ගන්න. මේ බව කවුද කිව්වේ, අල්ලාහ් කිව්වේ.

ආයුධ එසවීම ගැන, අපි ආඩම්බර වෙනවා. අල්ලාහ් මේ යකඩය මඟින් අපට ගෞරවය ලබා දුන්නා කියලා අපි කියනවා. හොඳින් දැනගන්න, දෙවියන් විශ්වාස නොකරන්නනි, අපි භූමියක් වෙනුවෙන් හෝ විනාශ වන ලෞකික සැප සම්පත් වෙනුවෙන් හෝ ආයුධ දැරුවේ නෑ. බහුදේවවාදය මේ භූමියෙන් තුරන් වී දෙවියන් ප්‍රතික්ෂේප කිරීම තුරන් වන තුරු, ධර්ම මාර්ගය සම්පූර්ණයෙන්ම අල්ලාහ්ටම අයිති වන තෙක් තමයි අපි ආයුධ අරන් තියෙන්නේ.''

''කුරාණයේ අල්ලාහ් දෙවියන් පවසන්නේ ; කාෆිර්වරුන් සමඟ ඔබ යුධ සටන් වදින්න කියලා. ගෞරවනීය සහෝදරවරුනි, විශ්වාසවන්තයනි, දැනගන්න ඔබගේ අල්ලාහ් දෙවියන්, විශ්වාස නොකරන අය පිළිබඳව කියලා තියෙන පණිවුඩය මේක තමයි. දෙවියන් විශ්වාස නොකරන අයට තවත් දෙයක් කියන්න කැමතියි. දෙවියන් වෙනුවෙන් සටන් කරන අප සමඟ සාකච්ඡා කර මේ යුද්ධය නවත්තන්න පුළුවන් කියා ඔබ කිසිවිටෙකත් හිතන්න එපා. මෙය අල්ලාහ් දෙවියන් ප්‍රතික්ෂේප කිරීම... හා ඉස්ලාම් ධර්මය අතර පවතින අකීදා සඳහා වූ යුද්ධයක්.''

''ජිහාද්වල දී අපි කිසිවිටෙකත් සාකච්ඡා කරන්නේ නැහැ. එක, නුඹලා කපා කොටා මරා ජයග්‍රහණය ලබා ගන්නවා. නැත්නම් ආගම වෙනුවෙන් අපි ජීවිතය විනාශ කරගන්නවා. එක්කෝ ජයග්‍රහණය නැත්නම් විරෝධාර මරණය. මේක තමයි අපේ ප්‍රතිපත්තිය. රෝම නගරයත්

දෙවියන් වෙනුවෙන් සටන් කරන අපි අත්පත් කරගෙන, දෙවියන් වෙනුවෙන් සටන් කරන අපේ සහෝදර අය අත්පත් කරගෙන, එහි යාඥා සඳහා ආරාධනා කර, යාඥා පවත්වන තෙක්, දෙවියන් විශ්වාස නොකරන නුඹලා සහ විශ්වාසවන්තයන් වන අප අතර පවතින යුද්ධය කිසිවිටෙකත් නතර වෙන්නේ නැහැ. ''

'' අපේ අවසන් තැනැත්තා මසිහුද් තජ්ජාල්ව එනම් අන්ත ක්‍රිස්තු කපා දමන තෙක් මේ යුද්ධය නතර වෙන්නේ නැහැ. අපේ ඉලක්කය වන්නේ අල්ලාහ් දෙවියන්ගේ ෂරියා නීතිය පාලන නීතිය බවට පත් කිරීමයි. අල්ලාහ්ගේ භූමියේ අල්ලාහ්ගේ ෂරියා නීතිය පාලන නීතිය බවට පත් කිරීමයි. අල්ලාහ්ගේ භූමියේ අල්ලාහ්ගේ ෂරියා නීතිය තමයි පාලනය තුළට එන්න ඕනේ. අල්ලාහ්ගේ වචනයට පණ දෙන්න ඕනේ. මේ මාර්ගයේ දිවි පුදා වීර මරණයක් ලැබීම තමයි අල්ලාහ් වෙනුවෙන් සටන් කරන අප හැම දෙනාගේම ඉලක්කය.''

''අපි මෙලොව වෙනුවෙන් ජීවත් වෙන අය නෙවෙයි. අපි මෙලොව බොරු ආටෝප සැප සම්පත් ප්‍රතික්ෂේප කරලා ආපු අය. අපි කුරාණයේ ජනතාවයි. ප්‍රාණය දී ස්වර්ගය ලබා ගන්නා අය. ඔයාලා කෙතරම් හමුදාවක් එක් රැස් කළත්, බුද්ධි අංශයේ ඉන්න ඉව කරන බල්ලන් රංචු පිටින් නුඹලා එව්වත්, දෙවියන් වෙනුවෙන් සටන් කරන අපි තමයි අවසානයේ ජයග්‍රහණය කරන්නේ. ඒක දැනගෙන ඉන්න. ඒ මොකද කියනවානම්

අපේ ගැළවුම්කාරයා ඒක තමයි අපට පොරොන්දු වෙලා තියෙන්නේ. අනිවාර්යෙන්ම අල්ලාහ් දෙවියන් පොරොන්දු කඩ කරන කෙනෙක් නෙවෙයි. අපේ දෙවියන් අපට කියපු පණිවිඩය මොකක්ද කියලා දන්නවාද, මමයි මගේ පණිවිඩකරුවනුයි තමයි අනිවාර්යෙන්ම ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ කියලා අල්ලාහ් දෙවියන් දෛවයේ ලියලා තියෙනවා. අල්ලාහ් දෙවියන් ලියාලා තියෙනවා.''

''අනිවාර්යෙන්ම අල්ලාහ් බොහෝ ශක්තියක් ඇති අයෙක්. ඔහු තමයි ශක්තිය ඇති තැනැත්තා, සියල්ලන් අභිබවා සිටින තැනැත්තා, දැනගන්න දෙවියන් අවිශ්වාස කරන්නෙනි! දෙවියන්ව ප්‍රතික්ෂේප කරන ඔයාලා මත්පැන්, කාන්තාවන් හා මෙලොව ජීවිතයට ආදරය කරනවාට වඩා අපි මරණයට ආදරය කරන උතුම් වූ ජනතාව අත්හැරලා තමයි දෙවියන් වෙනුවෙන් ජීවිතය පූජා කරන්න යන්නේ. මුස්ලිම් අයට පීඩා කරන, දෙවියන් විශ්වාස නොකරන ඔබලාට කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් ඒ ජනතාව අපායට යවාවි. දෙවියන් විශ්වාස නොකරන ඔබ හා අප අතර කතා කරන්නේ පිහිය හෝ කඩුව පමණයි. තියුණු කඩුවක්, තියුණු පිහියක්. ඉන්ෂාඅ් අල්ලාහ් අපි දෙවියන් වෙනුවෙන් කරන ජීවිත පූජාව, මේක ඉතා උතුම් මල්හමා යුද්ධයක් සඳහා වූ ආරම්භයක් බව තේරුම් ගන්න.''

''මින් පසුව දිගටම තැනින් තැන බෝම්බ පුපුරවන්නෙමු. ඔබලාගේ බෙලි කපන්නෙමු. ලේ ගංගා ගලා යන්නට සලස්වන්නෙමු. ඔබලාගේ රාත්‍රිය දහවල බවටත්, දහවල රාත්‍රිය බවටත් පත් කරන්නෙමු. ඔබේ දෙපා මුල ගිණිකඳු පුපුරවන්නෙමු. දෙවියන් වෙනුවෙන් ජීවිත පූජා කරන අය සිනාසෙමින් බෝම්බ පිරවූ වාහනවලින් ලහි ලහියේ පැමිණේවි. ඒව ඔබට ආරංචි නොවේවි. ඔබලා දකීවි. ඔබේ මිණිවලවල් ඔබම හාරගන්න. ඒ ඇයි කියනවානම්, බෝම්බය පුපුරවා ගන්න පැමිණෙන කෙනා දරුණු හා දැඩි කෙනෙක් නිසයි. කලිෆා අබුබක්කර් අල්බග්දාදිට දිවුරුම් දුන් අල්ලාහ් වෙනුවෙන් ජීවිතය පූජා කරන්නනි! අල්ලාහ් ඔයාලට කාරුණික වේවි.''

''ආගම නැතිවෙලා විනාශයට පත් වෙලා තිබෙන මේ කාලයේ ඔබලා තමයි උරබාවරු. එනම් තමන්ගේ අනන්‍යතාව හෙළිනොකර ආගමට පණ දෙන ජනතාව. දැඩි අධිෂ්ඨානයෙන් සිටින්න. මෙම මාර්ගය කරදර, බාධක බහුල මාර්ගයක්. කැපකිරීම් නොමැතිව අනිවාර්යෙන්ම අපට ජයගත නොහැකියි. කරුණු 08 ක් ඔබ පරිත්‍යාග නොකර, කිසිවිටෙකත් ඔබට ජයග්‍රහණය ළඟා කර ගත නොහැකියි. ඔබගේ දෙමව්පියන්, පියවරුන්, ඔබගේ දරුවන්, ඔබගේ සහෝදරයන්, ඔබගේ බිරින්දෑවරුන්, ඔබගේ පවුලේ සමාජිකයන්, ඔබ එක්රැස් කරගත් ධනය, කොයි මොහොතකදී හෝ විනාශ වෙලා යාවි ද කියලා ඔබ බියෙන් සිටින ඔබගේ ව්‍යාපාර, ඔබ කැමැත්තෙන් ජීවත්වන ගෙවල් යන මේවා කෙරෙහි

අල්ලාහ්ට වඩා, ඔහුගේ පණිවුඩකරුට වඩා, අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කරනවාට වඩා ඔබ කැමැත්තෙන් සිටිනවානම්, ඔබ බලාපොරොත්තු වන්න!''

''අල්ලාහ්ගේ නියෝගය, දණ්ඩනය ඔබ බලාපොරොත්තුවෙන් ඉන්න කියලා අල්ලාහ් කුරාණයේ පවසනවා. ආ... නින්ද යනවාද ඔයාට, මෙයා නිදාගෙන ඉන්නවානේ. ඒක හොඳ නෑ බායි. චික්.. මෙයා ගොඩක් නිදාගන්නවා. පටන්ගත්ත වෙලේ ඉඳන් ඔයා නිදාගෙන ඉන්නේ. වීඩියෝ එකේ හැමදෙයක්ම පටිගත වෙනවානේ. මේක හරියන්නේ නෑ. දැක්කොත් හැමෝම හිනා වේවි. විහිළුවක් වෙලා යාවි. අනෙක් අය නිදාගන්නවාද, නෑ නේද, මේ සහෝදරයා නිදාගන්නවා. මම ම කිහිප වතාවක් තට්ටු කරලා ඇහැරෙව්වා. නවත්තන්න ඕනෙ. නැවත කරමු.''

''හරිද, සියලු ප්‍රශංසා අල්ලාහ් දෙවියන්ගේය. අපි උන්වහන්සේට ප්‍රශංසා කරමු. අපි උන්වහන්සේගෙන් උදවු පතමු. උන්වහන්සේගෙන් සමාව අයැද සිටිමු. අපගේ වැරදි ක්‍රියාවලින් හා නරක ක්‍රියාවෙන් දෙවියන්ගෙන් රැකවරණය පතමු. අල්ලාහ් දෙවියන් විසින් මඟ පෙන්වන තැනැත්තා නොමඟ නොයනු ඇත. උන්වහන්සේගෙන් නොමඟ යන්නන්ට නිවැරදි මඟ ලැබෙන්නේ නැත. අල්ලාහ් දෙවියන් හැර වෙනත් දෙවියෙක් නොමැත බව ඒකාන්තයකි. ඔහුට සහකරුවන් නොමැති බවටද මම සාක්ෂි

දරමි. මුහම්මද් යනු ඔහුගේ සේවකයා ද ඔහු විසින් එවන ලද පණිවිඩකරුවා ලෙසට ද මම සාක්ෂි දරමි.''

''ගෞරවණීය ඉස්ලාම් සහෝදරවරුනි! අල්ලාහ්ගේ යටත්වැසියනි! අද දිනයේ අපි අමලියා ඉස්තිෂ්හාදියා කියනු ලබන ජීවිත පූජා කිරීමේ මෙහෙයුම වන ඉස්ලාමීය ධර්මයේ කැමැත්තක් ඇති කරවන ලද උතුම් වූ යාඥාවක් අල්ලාහ් වෙනුවෙන් ඉටු කිරීම සඳහා අපි එකට එක්වී සිටින්නෙමු. එනම්, අමලියා ඉස්තිෂ්හාදිය කියන්නේ අල්ලාහ් වෙනුවෙන්, අපේ ප්‍රාණය කැප කරන.. නැවත කරමුනේ.. මොකක්ද.. අ.. සහෝදරවරුනි! කියලා පටන් ගන්න ද, නැත්නම් දෙවියන් විශ්වාස නොකරන්නෙනි කියලා කියන්න ද, තවත් අයෙකු යමක් ප්‍රකාශ කරයි.''

''එය අපැහැදිලිය. ඊට පස්සේ.. හරි නැවත කරමු. සියලු ප්‍රශංසා අල්ලාහ් දෙවියන්ගේය. අපි උන්වහන්සේට ප්‍රශංසා කරමු. අපි උන්වහන්සේගෙන් උදව් පතමු. උන්වහන්සේගෙන් සමාව අයැදි සිටිමු. අපගේ වැරදි ක්‍රියාවලින් හා නරක ක්‍රියාවෙන් දෙවියන්ගෙන් රැකවරණය පතමු. අල්ලාහ් දෙවියන් විසින් මඟ පෙන්වන තැනැත්තා නොමඟ නොයනු ඇත. උන්වහන්සේ නොමඟ යන්නනට නිවැරදි මඟ නොපෙන්වනු ඇත. අල්ලාහ් දෙවියන් හැර වෙනත් දෙවියෙක් නොමැති බව ඒකාන්තයක් වේ. ඔහුට සහකරුවන් නොමැති බවට ද කමම සාක්ෂි දරමි. මුහම්මද් යනු

ඔහුගේ පණිවිඩකරු ද, ඔහු විසින් එවන ලද දූතයා ලෙස ද මම සාක්ෂි කරමු.''

''ගෞරවනීය ඉස්ලාමීය සහෝදරවරුනි! අල්ලාහ් දෙවියන්ගේ යටත්වැසියනි! අපට තව්හිද්වලට එනම් ඒකදේව වාදයට මඟ පෙන්වා දී, ඒ තව්හිද් ක්‍රියාත්මක කිරීම සඳහා ජිහාද් නම් වූ උතුම් මෙම යාඥාව කෙරෙහි අල්ලාහ් දෙවියන් අපට ධර්ම මාර්ගය පෙන්වා දුන්නා. ජිහාද් මාර්ගයෙන් තමයි අපට ගෞරවය ලැබුණේ. සිලාහ් කියන මෙම ආයුධය දරා ගැනීම මඟින් තමයි අපට ගෞරවය ලැබුණේ. සිලාහ් කියන මෙම ආයුධය දරා ගැනීම මඟින් තමයි අපි ශ්‍රේෂ්ඨත්වයට පත් වුනේ. අද දින අල්ලාහ් වෙනුවෙන් ඔහුගේ මාර්ගයේ පණ දෙන උතුම් වූ යාඥාවක් වෙනුවෙන් අපි හැමෝම එකතු වී සිටින්නෙමු. ඒක තමයි අමලියා අල් ඉස්තිෂ්හාදිය නම් වීරෝධාර මරාගෙන මැරෙන ප්‍රහාරය.''

''ආත්මීය පරිත්‍යාගයෙන් යුතුව කරන මරාගෙන මැරීම. මේ ආත්මීය පරිත්‍යාගයෙන් යුතුව කරන මරාගෙන මැරීම මොකටද කියලා කියනවානම්, බාහූස් කියලා කුඩා ගමක්. ශාම් ප්‍රදේශයේ පිහිටි ගමක්. අල්ලාහ් දෙවියන්ගේ නීතියෙන් පමණක් පාලනය වූ ග්‍රාමයක්. 80 කට අධික කුරුස යුධවාදී රටවල් එකතු වී අල්ලාහ්ගේ ෂරියා නීතියෙන් පාලනය වන ඒ ජනතාව සාතනය කළා. මේක කුරුස බල්ලෝ තහනම් කරන ලද වයිට් පොස්පරස් විශාල වශයෙන් හෙළා ඒ නගරය, ඒ ග්‍රාමය

සම්පූර්ණයෙන්ම විනාශ කළා. බාහුස්හි දෙවියන් අපි ද විශ්වාස කරමු. ඒ දෙවියන්ම තමයි අපි විශ්වාස කරන්නේ. ඒ ගින්නට පිළිස්සුණු බාහුස් ජනතාව වෙනුවෙන්, අල්ලාහ් දෙවියන් විශ්වාස කිරීම යන එකම හේතුව නිසා පළිගැනීමට ලක් වූ පිළිස්සී අළු වූ ඒ ජනතාව වෙනුවෙන්, අද දින මෙහෙයුමක් සිදු කිරීම සඳහා අපි එකට එකතු වී සිටින්නෙමු.''

''අපි මොකක්ද කරන්න යන්නේ. අපේ ජනතාව මරලා දාලා අපේ ළමයි අනාථයින් බවට පත් කරලා අපේ බිරින්දෑවරු, අපේ සහෝදරියන් වැන්දඹුවන් බවට පත් කරලා අල්ලාහ් වෙනුවෙන් සටන් කරන අයව මරලා දාලා මෙහි විනෝද චාරිකා සඳහා පැමිණෙන මේ දෙවියන් විශ්වාස නොකරන අය මරා විනාශ කිරීමට, ඒ සඳහා අපේම ජීවිත පරිත්‍යාග කරන උතුම් වූ අල්ලාහ් දෙවියන් සමඟ කරන ශ්‍රේෂ්ඨ වූ ව්‍යාපාරයක් වෙනුවෙන් අපි එකට එකතු වී සිටින්නේ. දෙවියන් විශ්වාස නොකරන්නනි! එක් කරුණක් දැනගන්න. බාහුස්වල සිටියේ වෙන කවුරුත් නෙමෙයි. අපේම සහෝදරවරු. විශ්වාසය නිසා එක් වූ අයයි අපි. ඒ ජනතාව වෙනුවෙන් අද දින ඒ අය මරා දැමූ කුරුසකාරයන්ගෙන් පළි ගන්නයි ඇවිත් ඉන්නේ.''

''අපේ මේ ප්‍රහාරයට ක්‍රිස්තියානි පල්ලි ඇතුළත් වෙනවා. මොකක් නිසා ද ක්‍රිස්තියානි පල්ලි තෝරාගෙන තියෙන්නේ කියලා දන්නවාද, නවසීලන්තයේ අල්ලාහ් දෙවියන් යාඥා කරන්න ගිය අපේ ජනතාව කිසිදු වග තුගක් නොමැතිව මරලා දැම්මා. ඒකට පළිගන්න, අල්ලාහ්ගේ

පල්ලියට අත තිබ්බ ඔයාලාට පාඩමක් ඉගැන්වීමට ක්‍රිස්තියානි පල්ලි පුපුරවන්න අපි එනවා. ඔයාලා හොඳට දැනගන්න ඕනේ. මේ යුද්ධය විශ්වාසය සඳහා වූ යුද්ධයක්. භූමිය සඳහා කරන යුද්ධයක් නොවේ. ප්‍රතිපත්තිය සඳහා වූ යුද්ධයක්. අල්ලාහ් වෙනුවෙන් ජීවිතය පූජා කරන අය සිටින සමාජයක් කිසිවිටෙකත් පරාජය වන්නේ නෑ.''

'' දැන ගන්න, අල්ලාහ් වෙනුවෙන් ජීවිතය පූජා කරන අය සිටින සමාජයක් කිසිවිටෙකත් පරදින්නේ නෑ. මෙලොව සහ මෙලොව බොරු ආටෝප සැප සම්පත් අපි අත් හැරියා. අපි කුරාණයේ ජනතාව. ප්‍රාණය දී ස්වර්ගය ලබාගන්නා අය. අපේ ජීවිතය මෙලොව වෙනුවෙන් නොවෙයි. අල්ලාහ් දෙවියන්ගේ වචනය ශ්‍රේෂ්ඨත්වයට පත් විය යුතුයි. අල්ලාහ්ගේ ෂරියා නීතියෙන් අල්ලාගේ භූමිය පාලනය වෙන්න ඕනේ. මේ වෙනුවෙන් තමයි අපි අවේ. ජිහාද් කියන්නෙම බස්නාහිරින් බැස යන විට නැගෙනහිරින් පායනවා කියන එක. මේ සටන සාකච්ඡා කරන ඔබලාට නතර කරන්න පුළුවන් කියා හිතන්න එපා. තැනින් තැන බෝම්බ පිපිරේවා. මේක තමයි ආරම්භය.''

''ඉන්ෂා අල්ලාහ් මෙහි ඇති භයානක බව, මෙහි ඇති අනතුරුදායක බව, ජිහාද් හි බරපතලකම ඔයාලාට හොඳින් තේරුම් යාවයි. වාහනවල බෝම්බ පුරවාගෙන අපේ සහෝදරයන් ඇවිල්ලා නුඹලාව කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් විනාශ කරාවි. අපේ විසිරී ගිය හිස්කබල් මතින් තමයි

මෙහේ ඉස්ලාම් රාජ්‍යයක් ගොඩනැගෙන්නේ. අනිවාර්යෙන්ම අපේ උත්සාහය අපතේ යන්නේ නෑ. අපේ ප්‍රාණයට වඩා අපේ විශ්වාසය තමයි, ප්‍රතිපත්තිය තමයි ශ්‍රේෂ්ඨ වන්නේ. ජීවිතය යනු ප්‍රතිපත්තිය හා ප්‍රතිපත්තිය සඳහා වූ සටනක්.''

''සහෝදරවරුනි!දෙවියන් වෙනුවෙන් සටන් කරන්නනි! ඔයාලට පණිවිඩයක් කියන්නම්. දැඩි අධිෂ්ඨානයෙන් සිටින්න. දෙවියන් විශ්වාස නොකරන අය අතහරින්න එපා. දෙවියන් විශ්වාස නොකරන අය ගැන අල්ලාහ් දෙවියන් කියපු දේවල් අමතක කරන්න එපා. අපේ ජනතාව මරලා දාලා, විනෝද චාරිකා සඳහා මෙහි එන දෙවියන් විශ්වාස නොකරන අයව අතාරින්න එපා. ශ්‍රී ලංකාවේ සිටින කාෆීර්වරුන්, මෙයාලා ලේසි පහසු අය නෙවෙයි. මොවුන් අල්ලාහ්ට දෝෂාරෝපණය කළ අය. ගෞරවනීය අල්ලාහ් දෙවියන්ගේ වචනය ඌරන්ගේ ලියලා උද්ඝෝෂණ කළ අය. අල්ලාහ් දෙවියන්ට රහස් ඉන්ද්‍රියක් ඇති බව කියා පහත් ලෙස කතා කළ අය. අපේ නබිතුමාට පහත් ලෙස විවේචනය කළ අය. කුරාණය පිළිස්සූ අය. පල්ලි කැඩූ අය. අල්ලාහ්ට සමාන කර වෙනත් දෙවිවරුන්ට ද වන්දනාමාන කරමින් ජීවත් වන අය. මොවුන් පිළිබඳව අල්ලාහ් කුරාණයේ කියනවා වගේ, මෙම මුෂ්රික්වරුන්ව දුටුතැන මරා දමන්න කියලා අල්ලාහ් කියනවා''

"මුෂ්රික්වරුන්ව දුටු තැන මරා දමන්න. දෙවියන් විශ්වාස නොකරන්නනි, දැනගන්න. නුඹලා හා අපි අතර කඩුවයි කතා කරන්නේ. ඒ හැර නුඹලා සමඟ කිසිම සාකච්ඡාවක් අපි කරන්නේ නෑ. ඉස්ලාම් ධර්මයේ අහිංසක පොදු ජනතාව, හමුදාව කියලා වෙනසක් නෑ. මුස්ලිම් සහ දෙවියන් විශ්වාස නොකරන අය කියලා තමයි ඉස්ලාම් ධර්මයේ මිනිසුන් බෙදා වෙන් කර තියෙන්නේ. දෙවියන් විශ්වාස නොකරන අය නම් ඔවුන්ගේ ලේ හලාල්. එයාලා ජිසියා බද්ද ගෙවලා, එකඟතාවකට ආවා නම් ඔවුන්ගේ ලේ අපි හලන්නේ නෑ. ඉස්ලාම් විශ්වාසය, ආරක්ෂාව දෙකම නැති නම්, දෙවියන් කෙරෙහි විශ්වාසයත් මුස්ලිම් අය සමඟ එකඟතාවක් නැතිනම් ඔබලාගේ ලේ අපට හලාල්. ඒ ලේ හලන්නෙමු."

"ඔයාලාගේ ආර්ථිකය යුධ බිමෙන් අත්පත් කර ගන්නා දේ විදියට අත්කර ගමු. මුස්ලිම් ජනතාවනි! ඔබ දෙවියන් විශ්වාස නොකරන අය සමඟ එකඟතාවයෙන් ජීවත් වෙන එක අතහැරලා දාන්න. අල්ලාහ් දෙවියන් කුරාණයේ පවසයි. දෙවියන් විශ්වාස නොකරන අයවලුන් ඔවුන්ට හැකි නම් ඔබලාගේ ආගම වෙනස් කරන තුරු ඔබලා සමඟ සටන් කරමින්ම සිටීවි. "

"නබිනායකතුමනි! ඔය යුදෙව් ක්‍රිස්තියානිවරුන්ගේ ආගම අනුගමනය කරන තුරු ඔවුන් කිසිදාක ඔබව පිළිගන්නේ නෑ. ඔබලා ආගමික සංහිඳියාව ගැන කතා කරන්න එපා. ඒ ධර්මයේ මග පෙන්වීම

නොවෙයි. එය ඉස්ලාම් ධර්මය නොවෙයි. අපට අල්ලාහ් දෙවියන් වගකීමක් ලෙස ජිහාද් අනිවාර්යය කළා. අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු කියලා තියෙනවා; වංචනික ව්‍යාපාරවල යෙදෙමින් එළදෙනුන්ගේ වලිගයේ එල්ලීගෙන කෘෂිකර්මාන්තයේ යෙදමින් ජිහාද් අත හැරියේ නම්, අල්ලාහ් දෙවියන් ඔබ පහත් නින්දිත තත්ත්වයකට පත් කරාවි. ඔබ නැවත ධර්ම මාර්ගයට හැරෙන තුරු ඒ පහත් බවින් ඔබව ඉවත් කරන්නේ නෑ කියලා අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු කිව්වා. ”

”ඒ නිසා ජිහාද් මාර්ගයට හැරෙන්න. ඉන්ෂාන් අල්ලාහ් අපේ ලේ බිඳුවලින්, අපේ විසිරී ගිය හිස්කබල්වලින්, විසිරී ගිය අපේ මස් කැබලිවලින් අපේ ඉස්ලාම් රාජ්‍යයක් ගොඩනැගේවි. කලීෆා අබුබක්කර් අල්බග්දාදි දේශයේ බයියත් නොහොත් දිවුරුම් දීම සිදු කරන ජනතාව කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් බිහිවේවි. ඉන්ෂාන් අල්ලාහ් අපේ උත්සාහය අපතේ යන්නේ නෑ. අල්ලාහ් වෙනුවෙන් අපි යමු. අල්ලාහ්ගේ ආගම වෙනුවෙන් අපි යමු. දෙවියන් විශ්වාස නොකරන්නනි! ඔබ වෙත පුපුරවා හැරීමට අපි අරගෙන එන වෙඩි බෙහෙත් තියනවානේ. ඒක අපි අපේම අත්වලින් හදපු ඒවා. දෙවියන් විශ්වාස නොකරන කෙනෙකුගේ මුදල් එහි නෑ. හරාම් වූ මුදල් එහි නෑ. දෙවියන් විශ්වාස නොකරන කිසිම කෙනෙක් අපට උදව් කළේ නෑ. දෙවියන් විශ්වාස නොකරන්නන් කොහොමද අපට, අල්ලාහ්

දෙවියෙන් වෙනුවෙන් සටන් කරන අපට උදව් කරන්නේ. අපිම වෙඩි බෙහෙත් හදලා ඔබ වෙත අරගෙන එනවා.''

''මුස්ලිම්වරුනි! ඔයාලත් උත්සාහ කරන්න. අල්ලාහ් කියනවා; අපගේ මෙම කාරණයේදී කවුරුන් හෝ උත්සාහ කරයි නම් ඒ අයට හැම මාර්ගයක්ම අපි විවෘත කර දෙන්නෙමු. මිනිසුනේ විවේචනයට බය වෙන්න එපා. කුරාණයේ අල්ලාහ් කියනවා. පළිගන්නන්ගේ පළිගැනීම්වලට අපි බය වෙන්නේ නෑ. ධෛර්යෙන් යුතුව අල්ලාහ් දෙවියන් බලා පිටත් වන්න. මිනිසුන්ගේ විවේචනයන් විසි කරල දාන්න. අල්ලාහ් දෙවියන් බලා පිටත් වන්න. මිනිසුන්ගේ විවේචනයන් විසි කරලා දාන්න. අල්ලාහ් දෙවියන්ගේ කැමැත්ත වෙනුවෙන් වැඩ කරන්න. ඔබ ශ්‍රේෂ්ඨ ජන්නතුල් ෆිර්දව්ස් නම් ස්වර්ගය ළඟා කර ගනීවි කියා අල්ලහා කියනවා.''

''අනිවාර්යෙන්ම අල්ලාහ්, අල්ලාහ් වෙනවෙන් සටන් කරන ඔවුන්ගේ ප්‍රාණයත්, ආර්ථිකයත් ඔවුන්ට ස්වර්ගය ලබාදීම වෙනුවෙන් මිලට ගත්තා. අල්ලාහ් කුරාණයේ කියනවා; ඔබ ධෛර්යෙන් යුතුව අල්ලාහ්ගේ මාර්ගයේ ඉදිරියට එන්න. අල්ලාහ්ගේ ආගම වෙනුවෙන් කැපවෙන්න. අනිවාර්යෙන්ම හෙට නබිතුමාගේ මිත්‍රවරුන් ආගම වෙනුවෙන් කැපකිරීම් කරලා, ඔවුන් අත්පා, ඇස්, කන් අහිමි කරගෙන දිවි පුදා, බිරින්දෑවරු වැන්දඹුවන් වෙලා, ළමයි අනාථයන් වෙලා, ආගම වෙනුවෙන් ඒ මිනිස්සු ඇවිල්ලා පරලොව සිටින විටදී කිසිවක් අහිමි

කරගන්නේ නැතිව, කිසිම ආකාරයක පරිත්‍යාගයෙක් සිදු නොකර, හුදෙක් යාඥා, උපවාස කර, සකාත් ගෙවා. හජ්ජි වන්දනාවේ ගියොත් පමණක් ස්වර්ගය ලබාගන්න පුළුවන් කියලා ඔබ විශ්වාස කරනවාද, සදකා එනම් අනිවාර්යය නොවන දන් දීම, සකාත් එනම් අනිවාර්යයෙන් දිය යුතු දන් දීම සහ ජිහාද් නොමැතිව කොහොමද ඔබලාට ස්වර්ගයට යන්න පුළුවන් වෙන්නේ, .''

''අල්ලාහ් දෙවියන් අවි ආයුධවලින් සටන් කිරීම ඔබලාගේ වගකීමක් බවට පත් කර ඇති බව කියනවා. ඔබලා ඒක අතහැරලා වෙන කොහේද මේ යන්නේ, ජමියතුල් උලමා සභාවේ අය මුර්තද්වරුන් එනම් ඉස්ලාම් ආගම හැර ගිය අය. ඔවුන් විශ්වාස කරන්න එපා. එයාලා නේපාලයේ සිටින කාෆීර් අයට උදව් කරාවි. මියන්මාරයේ මුස්ලිම් අය මරා දමන කොට නිහඬව සිටීවි. ඥානසාර සතාත් එළියට ගැනීම සඳහා උත්සාහ කරාවි. ආගම වෙනුවෙන් සිරගත වූ ඉබ්‍රාහීම් මව්ලවි වෙනුවෙන් කට වහගෙන නිහඬව සිටීවි. නියම මුනාෆික්වරුන් එනම් ඉස්ලාම් ලබ්දිකයන්ගේ වේශය දරා සිටින වංචාකරුවන්. ඔවුන්ව විශ්වාස කරන්න එපා. උලමා උස්සූ එනම් ව්‍යාජ විද්වතුන් ඔවුන් නරකයි.ආගම සොයාගෙන ඉගෙන ගන්න.''

''මුස්ලිම්වරුනි! තව්බා සහ අන්ෆාල් යන පරිච්ඡේද අනිවාර්යෙන්ම කියවන්න. රහික්කුල් මහ්තූම් යන අල්ලාහ්ගේ දූතයාගේ ඉතිහාසය ඉගෙන ගන්න. අබු මුසාබ් ඉබුණු සර්කා, අබු මුහම්මද් ඉබුණු අදනාන් වැනි සත්‍ය වූ

උලමාවරුන්ගේ ධර්ම දේශනා අහන්න. සෙයිහුල් ඉස්ලාම් ඉබ්නු අදනාන් වැනි සත්‍ය වූ උලමාවරුන්ගේ ධර්ම දේශනා අහන්න. සෙයිහුල් ඉස්ලාම් ඉබ්නු තයිමියා, මුහම්මදු ඉබ්නු අබ්දුල් වහාබ්, ඉබ්නුල් කය්යිම් අල් ජවුසියා, අයිමතුන් දවුවතුල් නජීදියා වැනි උලමාවරුන්ගේ ග්‍රන්ථ කියවන්න.''

''මුස්ලිම්වරුනි! ඉස්ලාමීය ධර්මයේ ඇති මුස්ලිම් අයෙකු නොදැන සිටිය නොහැකි දැන ගත යුතුම මූලික කරුණු 10 ඉගෙන ගන්න. විශ්වාසයේ මූලික කරුණු 10 ඉගෙන ගන්න. උලමාවරුන් විශ්වාස කරමින් ඔබගේ පරලොව ජීවිතය ඔබ නැති කරගන්න එපා. අපේ පවුලේ අයට..''

''.මේ පණිවුඩය කියලා තියන්න කැමතියි. ඔබගෙන් අපි වෙන්වෙලා යන්නේ ඔබ කෙරෙහි ඇති අකමැත්ත නිසා හෝ කෝපය නිසා නොවෙයි. අපි ඔයාලට ආදරය කරනවා. නමුත් ඔයාලටත් වඩා අල්ලාහ් දෙවියන්ට සහ අල්ලාහ් දෙවියන්ගේ ආගමට තමයි අපි වැඩි වැඩියෙන් ප්‍රිය කරන්නේ. අපි ජීවිතය පූජා කළා කියන ප්‍රවෘත්තිය ඔයාලට ලැබුණොත් මුලින්ම ඔයාලා ඉවසීමෙන් ඉන්න. අල්ලාහ් දෙවියන් වෙනුවෙන් හිස නමා යාඥා කරන්න. අල්ලාහු අක්බර් කියන්න. අල්ලාහ්ව ප්‍රශංසා කරන්න. අල්ලාහ් දෙවියන්ගේ කැමැත්තෙන් හෙට අපි මුහම්මද් සහ එතුමාගේ මිතුරන්ද අපි ඉන්ෂාහ් අල්ලාහ් හමුවෙමු.''

''නමුත් මම මහා කරුණාවන්තයාගෙන් සමාවක් ඉල්ලා සිටිමි. මිනිස්සු මගේ සොහොන අසලින් ගියහොත්, දෙවියන් වහන්සේ ඔහුට ප්‍රහාරයෙන් මඟ පෙන්වූ අතර, ඔහු නිවැරදි ඔබ කියන තුරු පෙන උඩට විසි වෙන පරිදි හිස කපනු ලැබීමක්, එසේත් නැතිනම් බඩවැල සහ අක්මාව සිදුරු කරන හර්රාන් හි දැතින් සකස් කරන ලද හෙල්ලයකින් ඇණීමක් ඉල්ලා සිටිමි.''

''දෙවියනි, මාගේ මරණය සඳහා වේලාව පැමිණ තිබේ නම්, එය කොළ පැහැති රෙද්දකින් පොරවන ලද ඇඳක් මත සිදු නොවේවා. මගේ සොහොන ගොදුරු බලාපොරොත්තුවෙන් අහසේ සැරිසරන රාජාලියෙකුගේ බඩෙහි විය යුතුයි. පොළොවේ භයානක මිටියාවතක දී සටන් කරන පිරිසක් අතර ජීවිත පූජා කරන්නෙකු වෙන්නෙමි. අල්ලාහ් දෙවියන් කෙරෙහි ඇති භක්තිය පදනමින් එක්වූ බැග්ඩෑඩ් හි නයිට්වරුන් යුද්ධයේදී අශ්වයන් මත සිට සටන් කරති. ඔවුන් මෙලොවෙන් නික්මව ගියහොත් ඔවුන්ගේ වේදනාව ද අවසන් වී අල් කුරාණයේ පොරොන්දු වී ඇති තැනට යන්නෝය.''

''මාගේ ස්වාමිවරුන්ගේ ස්වාමීනි, ඔබ හැර මා හට ස්වාමියෙක් නැත. ස්වාමිනි ඔබට වඩා වටිනා කිසිවෙක් නැත. මම මාගේ බලය සහ මාගේ ශක්තිය වෙතින් ඉවත් වුණෙමි. එබැවින් ඔබ මගේ ඉල්ලීම්වල දී මගේ බලය සහ මගේ ශක්තිය වී සිටින්න. මට තෘප්තිය ලබා දෙන්න. මට

භීෂණයට මුහුණ දීමට සිදු වුව ද, මා සොයන දෙය හැර මට කිසිවක් අවශ්‍ය නැත.''

''අල්ලාහ් දෙවියනි මුජාහිද්වරුන්ට පොළොවේ බලය ලබා දෙනු මැනව. අල්ලාහ් දෙවියනි තවුහිද්වාදීන්ට පොළොවේ බලය ලබා දෙනු මැනව. අල්ලාහ් දෙවියනි ඔවුන්ගේ හමුදා එක්රැස් කරනු මැනව. අල්ලාහ් දෙවියනි ඔවුන්ට ඔබගේ මාර්ගයෙන් ජීවිත පූජා කිරීමට අවස්ථාව ලබා දෙනු මැනව. යුධ බිමේ දී පළා යාමට නොව ඉදිරියට යාමට ශක්තිය ලබා දෙනු මැනව. අපිට උසස්ම ස්වර්ගයේ නබිවරුන්, සත්‍යවාදීන් සහ ආගම වෙනුවෙන් දිවි පරිත්‍යාග කරපු අය සමඟ වාසය කිරීමට අවස්ථාව ලබා දෙනු මැනව. ඒ එය හොඳ සගයන් වේ. අල්ලාහ් දෙවියන්ට ප්‍රශංසා වේවා.''

''හරි දැන් අපි දිවුරුම් දීම සිදු කරමු. එහෙම හිටගෙනම දිවුරුම් දීම සිදු කරමු. විශ්වාසවන්තයන්ගේ නායක, මුස්ලිම්වරුන්ගේ කලීෆා අෂ්ෂෙයික් අබූ බකර් අල් . බග්දාදි අල්. කුරෂි අල් . හුසේනි තුමාට අමාරු කාලයේත් අසීරු කාලයේත් සවන් දීමට සහ කීකරු වීමට සහ කූප්රයක් බවට දෙවියන් වහන්සේගෙන් ලැබුණු සාක්ෂියක් ඇති පැහැදිලි කුප්රයක් දුටුවොත් මිසක පාලකයන් සමඟ ගැටුම් ඇති කර නොගන්නා බවටත් පොරොන්දු වී දිවුරුම් දෙමු. අප පවසන දෙයට අල්ලාහ් දෙවියන් සාක්ෂිකරුවා වේ. අල්ලාහු අක්බර් කියන්න. අල්ලාහු අක්බර්. අල්ලාහු අක්බර් කියන්න. අල්ලාහු අක්බර්.''

යනුවෙන් පැ.162 ලෙස ලකුණු කර ඇති අදාළ දේශනයේ සිංහල පරිවර්තනයෙහි තමා විසින් නිවැරදිව පරිවර්තනය කරන ලද බවට සාක්ෂිකරු අධිකරණයට පවසා ඇත.

<u>විශ්ලේශණය</u>

ඉහත පැ.162 ලෙස ලකුණු කරන ලද පරිවර්තනය එනම් පැ.163 ලෙස ලකුණු කර ඇති සැනලිදාවකයේ අඩංගු වී තිබූ අදාළ ශ්‍රව්‍ය දෘශ්‍යය වීඩියෝ දර්ශනයෙහි අඩංගු කරුණු නිවැරදිව පැ.සා.2234 මොහොමඩ් හුසේන් මොහොමඩ් හනාස් යන භාෂා පරිවර්තක සාක්ෂිකරු විසින් අධිකරණයේ ලබා දුන් සාක්ෂිය පරිවර්තනය කර ඒ බවට සහතික කිරීමක්ද කර පැ.162 ලේඛනය ඉදිරිපත් කර ඇති පසුබිම තුළ එම සාක්ෂිකරුව 02, 09 සහ 23 චූදිතයන් වෙනුවෙන් පමණක් හරස් ප්‍රශ්න ඇසීමට ලක් කළද, හරස් ප්‍රශ්න ඔහුගෙන් අසා ඇත්තේ වීඩියෝ දර්ශනයේ දිස්වන බැනරයක සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් වන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය පැමිණිල්ලෙන් අවසන් කර ඇත්තේ එම බැනරය අධිකරණය ඉදිරියේ ලකුණු කිරීම සඳහා සොයාගැනීමට නොහැකි වූ බැවින් එය සොයාගත් පසු ලකුණු කිරීම සඳහා සාක්ෂිකරුව යලි සාක්ෂියට කැඳවීමට අයිතිවාසිකම් තබාගෙන වේ.

ඒ අනුව 2026-7-21 දින මෙම නඩුව වැඩිදුර විභාගයට ගත් අවස්ථාවේ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1719 ප්‍රධාන පොලිස් පරීක්ෂක ලයනල් සමරවීර යන සාක්ෂිකරු ගේ සාක්ශියට අනුව ඔහු 2019-4-26 දින වනවිට අම්පාර අපරාධ ස්ථාන පරීක්ෂනාගාරයේ ස්තානාධිපති ලෙස සිටිමින් එදින කොට්ටාශ භාරා නිළදාරියාගේ දැනුම් දීම මත සම්මන්තුරෙයි සෙංගල් ග්‍රාමය 01 හි මාර්ගයේ පසෙක වූ දෙමහල් නිවසක රෝලර් දොරක් සහිත ගරාජයක් වැනි කොටසේ තිබූ සැක කටයුතු භාණ්ඩ 119 ක් ඔහුගේ භාරයට ගත් බව සහ එම භාණ්ඩ අතුරින් අයිතම අංක 62 ලෙස තිබූ අයි.එස්.ලාංචනය සහිත බැනර් එකක් තමාගේ භාරයට ගත් බවත පවසා දේපල කුවිතාංසි අංක පී.ආර් 508/2019 ට ඇතුලත් කර තිබූ නඩුභාණ්ඩය වන බැනරය මෙම අධිකරණය ඉදිරියේ හදුනාගෙන එය පැ.1252 ලෙස ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත.

කෙසේ වෙතත් ඉහත භාෂා පරිවර්තක වරයා වන පැ.සා.2234 හුසේන් මොහොමඩ් හනාස් නැමැති සාක්ෂිකරුව යලි සාක්ෂිදීම සඳහා පැමිණිල්ලෙන් කැඳවීමක් කර නොමැති අතර කෙසේ වුවත් මෙම නඩුවේපැමිණිල්ලේ සාක්ශි අංක 1439 ආණ්ඩුවේ ජෙයෂ්ඨ සහකාර රස පරීක්ෂක දිනේශ් තීක්ෂණ ඒකනායක උඩංගමුව යන සාක්ෂිකරුගේ ගේ සාක්ෂියට අනුව ගල්කිස්ස ම.උ.බී/917/02/2019 ට අදාළව සංයුක්ත තැටි දෙකක් සහ පෙන්ඩ්‍රයිව් එකේ ඇති දර්ශන සංසන්ධනය කර බලා ඒවා එකම ස්ථානයක ද නද්ද යන්න සම්බන්ධයෙන් විශ්ලේශණය කර

විශේශන්ග මතයක් ප්‍රකාශ කරන ලෙසට කර තිබූ නියෝගය ප්‍රකාරව තමා සහ තම සහායිකා නිළධාරිණියක් විසින් එම නඩුහාණ්ඩ අතුරින් සැම්විස්ට්‍රා අල්ට්‍රා U.S.B 3.064GB ලෙස සඳහන් කර තිබූ BL 200257543Z සහ SDC 248/054G ලෙස හඳුනාගැනීමේ අංකයක් සඳහන් සනලි ධාවකය මෙම අධිකරනයේ පැ.163 ලෙස ලකුණු කර ඇති සැනලි ධාවයක බවට සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති තමාලාගේ පරික්ෂාවට එවා තිබූ සංයුක්ත තැටියේ අඩංගු වූයේ යම් පරිශ්‍රයක ඇති බිත්තියක් ඉලක්ක කරගෙන කර ඇති වීඩියෝ ගත කිරීමක් හා සම්බන්ද දර්ශනයක් බවත් පවසා පෙර අවස්ථාවක පැ.163 ලෙස ලකුණු කර ඇති සැනලි ධාවකය සාක්ෂිකරු හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර පැ.163 සැනලි ධාවකයේ අඩංගුව තිබූ වීඩියෝ දර්ශන වල රූප රාමුවල දිස් වූ පසුබි තමාලාගේ පරීක්ෂාව සඳහා අංක පැ.01-2 ලෙස අංකනය කර එවා තිබූ සංයුක්ත තැටියෙහි ගබඩා වී ඇති VTS_01_1.VOB ලෙස අංකිත වීඩියෝ පටයෙහි දර්ශනය වන රූප රාමුවල බිත්තිය, පොළොව සහ රූපරාමුවල වම්පසින් දක්නට ඇති බිත්තියෙහි එහා පොළොවෙහි ඇති නැවීම් සහිත හැඩය පැ.02 ලෙස අංකිත පෙන්ඩ්‍රයිව් උපකරණයෙහි ගබඩා වී තිබූ වීඩියෝ පටයෙහි දර්ශනය වන රූපරාමුවල ඇති බිත්තිය, පොළොව හා රූපරාමුවල වම්පසින් දක්නට ඇති බිත්තියෙහි හා පොළොවෙහි ඇති නැවීම් සහිත හැඩයට සමාන බවත්, එසේම එම සැනලිදාවකයෙහි එනම් පෙන්ඩ්‍රයිව් එකෙහි තිබෙන වීඩියෝ පටයෙහි අංකිත රූපරාමුවල ඇති බිත්තිය හා රූපරාමුවල

වම්පසින් දක්නට ඇති බිත්තියෙහි ඇති නැවීම් සහිත හැඩය සමාන බවට විශේෂඥ මතයක් HD/244/21 දරන 2021.05.19 දිනැති රජයේ රසපරීක්ෂක සංදේශය එනම් පැ.2062 ට අදාළ පිටු 12 කින් යුත් රජයේ රසපරීක්ෂක වාර්තාව එනම් පැ.2063 ලෙස ලකුණු කර ඇති ලේඛනයට අනුව පැ.163 සැනලිදාවකයෙහි අඩංගු වී තිබූ වීඩියෝ දර්ශනයන් සහ පැ.01 ලෙස අංකනය කර පරීක්ෂාව සඳහා එවා තිබූ සංයුක්ත තැටියෙහි අඩංගු දර්ශන විශ්ලේෂණාත්මකව පරීක්ෂා කර බැලීමේදී,

පැ.01-2 ලෙස අංකිත සංයුක්ත තැටියෙහි ගඩබා වී ඇති VTS_01_1.VOB ලෙස අංකිත වීඩියෝ පටයෙහි පළමු විනාඩි 1 තත්පර 25 තුළ දර්ශනය වන රූපරාමුවල ඇති බිත්තිය, පොළව හා රූපරාමුවල වම් පසින් දක්නට ඇති බිත්තියෙහි හා පොළවෙහි ඇති නැවීම් සහිත හැඩය, පැ.02 ලෙස අංකිත පෙන් ඩ්‍රයිව් උපකරණයෙහි SONY XC1 64GB Memory Card/files/video නැමැති ෆෝල්ඩරය තුළ ගබඩා වී ඇති 00460.MTS ලෙස අංකිත වීඩියෝ පටයෙහි දර්ශනය වන රූපරාමු වල ඇති බිත්තිය, පොළව හා රූපරාමුවල වම් පසින් දක්නට ඇති බිත්තියෙහි හා පොළවෙහි ඇති නැවීම් සහිත හැඩයට සමානකම් දක්වන බවත් පැ.01-2 ලෙස අංකිත සංයුක්ත තැටියෙහි ගබඩා වී ඇති VTS_01_1.VOB ලෙස අංකිත වීඩියෝ පටයෙහි පළමු විනාඩි 1 තත්පර 25 තුළ දර්ශනය වන රූපරාමු වල ඇති බිත්තිය හා රූපරාමුවල වම් පසින් දක්නට ඇති

බිත්තියෙහි ඇති නැවීම් සහිත හැඩය, පැ.02 ලෙස අංකිත පෙන් ඩ්‍රයිව් උපකරණයෙහි SONY XC1 64GB Memory Card/files/video නැමති ෆෝල්ඩරය තුළ ගබඩා වී ඇති 00465.MTS, 00466.MTS, 00467.MTS, 00468.MTS, 00469.MTS, 00470.MTS හා 00471. MTS ලෙස අංකිත වීඩියෝ පටයෙහි දර්ශනය වන රූපරාමු වල ඇති බිත්තිය හා රූපරාමු වල වම් පසින් දක්නට ඇති බිත්තියෙහි ඇති නැවීම් සහිත හැඩයට සමානකම් දක්වන බවත් පැ.01-2 ලෙස අංකිත සංයුක්ත තැටියෙහි ගබඩා වී ඇති VTS_01_1.VOB ලෙස අංකිත වීඩියෝ පටයෙහි පළමු විනාඩි 1 තත්පර 25 තුළ දර්ශනය වන රූපරාමු වල ඇති බිත්තිය හා රූපරාමුවල වම් පසින් දක්නට ඇති බිත්තියෙහි ඇති නැවීම් සහිත හැඩය, පැ.02 ලෙස අංකිත පෙන් ඩ්‍රයිව් උපකරණයෙහි Kingston 8GB USB Drive/files/video නැමති ෆෝල්ඩරය තුළ ගබඩා වී ඇති 00465.MTS, 00466.MTS, 00467.MTS, 00468.MTS, 00469.MTS, 00470.MTS, 00471. MTS හා 00481. MTS ලෙස අංකිත වීඩියෝ පටයෙහි දර්ශනය වන රූපරාමු වල ඇති බිත්තිය හා රූපරාමු වල වම් පසින් දක්නට ඇති බිත්තියෙහි ඇති නැවීම් සහිත හැඩයට සමානකම් දක්වන බවත් පවසා ඇත.

තව ද මෙම අධිකරානයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1030 මොහොමඩ් ශරීෆ් මොහොමඩ් මුස්තකීම් යන සාක්ෂි කරු එනම් සහරාන්ගේ සහෝදරියක් සමග විවාහ වී සිටින තැනත්තා සාක්ෂි දෙමින් පැ.163(A)

ලෙස මෙම අධිකරණයේ ලකුණු කර ඇති අංක 00460 දරන වීඩියෝ දර්ශන පෙල නරඹමින් ඕ දර්ශන අතර එකී වීඩියෝ දර්ශන වල සිටින්නේ ඇති වීඩියෝ දර්ශනන පෙලෙහි කකුල් නවාගෙන බිම වාඩිවී සිටින තැනත්තා සහරාන් වශයෙන් මනාව හදුනා ගෙන ඇති අතර එමෙන් ම පැ163(B) ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශන පෙලෙහි මුහුණු ආවරණය කරගෙන සිටින පුද්ගලයින් 7 දෙනෙකු අතර මුහුණ ආවරනය නොකර අතේ තුවක්කුවක් ද දරාගෙන සිටින තැනත්තා සහරාන් වශයෙන් සාක්ෂි කරු ඉතා පැහැදිලිව හදුනාගෙන සාක්ෂි ලබා දී පවසා ඇත්තේ පැ-163 වීඩියෝ දර්ශනයෙහි අඩංගු දේශනය පවත්වන්නේ 2019-4-21 දින ශැංගිලා හෝටලයේ මරාගෙන මැරුණ ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් බවට වන අතර ඒ අනුව එකී දේශනයේ අඩංගු කරුණු පැ.162 ලේඛණයේ සඳහන් වී තිබෙන බවට කිසිදු සැකයකින් තොරව සනාත වී ඇත.

ඒ අනුව මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකවරයෙකු වන පැ.සා.2234 හුසේන් මොහොමඩ් හනාස් නැමැති සාක්ෂිකරු සාක්ෂිකරු මඟින් පැ.162 ලෙස ලකුණු කර ඇති ලේඛනයේ අඩංගු කරුණු පැ.163 ලෙස විවෘත අධිකරණයේ වාදනය කර ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයෙහි අඩංගු මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් සිදු කළා යැයි පවසන අවසන් දේශනයේ අඩංගු කරුණු කිසිවක් විත්තිය විසින් හබ

කිරීමකට ලක් කර නොමැති පසුබිම තුළ පැ.162 ලේඛනයෙහි අඩංගු වන්නේ එකී අවසන් දේශනයේ නිවැරදි සිංහල භාෂා පරිවර්තනයක් බවට මෙම සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ කිසිදු සැකයකින් තොරව ඔප්පු වී ඇති බවට අප තීරණය කරමු.

කෙසේ වුවත් ඉහත කී පැ.162 ලේඛනයේ අඩංගු කරුණු මෙන් ම පැ.162 වීඩියෝ දර්ශන වල ට අනුව ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් අදාළ අවසාන දේශනය සිදු කර ඇත්තේ 2019.04.20 දින පස්වරු 1.17 සිට පස්වරු 3.32 දක්වා බවට පැ.163 ලෙස ලකුණු කර ඇති සැනලිදාවකයේ අඩංගු වීඩියෝ දර්ශන පරීක්ෂා කර බැලීමේදී මැනවින් පෙනී යයි. එනම් මෙම නඩුවට පාදක වූ, ක්‍රිස්තියානි දේවස්ථාන සහ සංචාරක හෝටල් තුළ සිදු කරන ලද ස්වයංඝාතක බෝම්බ පිපිරවීම් සිදු කල දිනට පෙර දින මොහොමඩ් සහරාන් නැමත්තා විසින් මෙම දේශණය පවත්වා ඇති බව ඒ අනුව මනාව පැහදිලි වේ. තවද මෙම වීඩියෝ දර්ශනයන් අඩංගු වී තිබී ඇත්තේ සමන්තුරේ සෙංගල ග්‍රාමම් හි පාවුස් මාවතේ පිහිටි රහීම් නැමැති තැනැත්තාට අයත්ව තිබූ නිවසක ගරාජයේ තිබී සොයා ගෙන ඇති ඉතා විශාල ප්‍රමාණයක භාණ්ඩ අතර තිබූ පෙන් ඩ්‍රයිව් එකක් සහ අමතර දත්ත රඳවන එකක් යන නඩු භාණ්ඩ විශ්ලේෂණයේදී වන අතර, එකී නඩු භාණ්ඩ සොයාගෙන ඇත්තේ 2019.04.26 වන දින එනම් පාස්කු ප්‍රහාරයෙන් පසු ඉතා ආසන්න දිනයකදී වන අතර, ඒ අනුව ගල්කිස්ස

ස්පෑන් ටවර් නැමැති මහල් නිවාසයේ සහරාන් ඇතුළු මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් සහභාගී වූ සහරාන් විසින් පැවැත්වූ අවසාන දේශනයේ දර්ශන අඩංගු වීඩියෝ පටය එහි අඩංගු වී තිබීම තුළින් මෙම භාණ්ඩය සොයාගෙන ඇති ඉහත කී සෙංගල් ග්‍රාමම් යන ස්ථානයේ පිහිටි නිවසට මෙම භාණ්ඩය ඇතුළු අනිකුත් භාණ්ඩ රැගෙන ඇති ආකාරය සම්බන්ධයෙන් මෙම නඩුවේ පැමිණිල්ල විසින් මෙයෙවන ලද සාක්ෂි සහ අනිකුත් සාක්ෂි එක්ව ගෙන බැලීමේදී පෙනී යන්නේ මෙම පාස්කු ප්‍රහාරය සැලසුම් කල ස්වයංඝාතක බෝම්බකරු වන සහරාන් ඇතුළු ස්වයංඝාතක බෝම්බකරුවන් හා එකඵල්ලේම සම්බන්ධ වන බවයි.

එසේම, මෙම සාක්ෂිකරුට අරාබි භාෂාවෙන් සඳහන් කරුණු සිංහල භාෂාවට පරිවර්තනය කිරීමට ඇති හැකියාව කිසිදු අයුරකින් හරස් ප්‍රශ්නවලදී හබ කිරීමකට ලක් වී නොමැති බැවින් ඔහු විසින් පැ.162 ලේඛනයෙහි සිදු කර ඇති පරිවර්තන පිටපතෙහි අඩංගු කරුණු නිවැරදි, සත්‍ය කරුණු බවට මෙම අධිකරණයට මැනවින් පෙනී යයි.

මෙම නඩුවේ ඇතැම් චූදිතයින් විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 (1) වගන්තිය ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරුන් වෙත සිදු කර ඇති ප්‍රකාශ සම්බන්ධව.

මෙම නඩුවේ 05වූදිත වන මොහම්ඩ් ඊබ්‍රාහිම් සහීඩ් අබ්දුල් හක්, 11 වූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් සහ 15 වූදිත වන මොහොමදු හනීෆා

සෙයිනුල් ආබ්දීන් යන චූදිතයින් විසින් මහේස්ත්‍රාත්වරුන් ඉදිරියේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 127 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයන් ලබා දී ඇති අතර එකී ප්‍රකාශයන් පහත පරිදි වේ.

පැ.174 ලෙස ලකුණු කර ඇති අ.න.වි.ස 127 (1) වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති ප්‍රකාශයෙහි පහත සඳහන් අන්තර්ගතයන් පැමිණිල්ලෙන් ලකුණු කර ඇත.

<u>05 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් විසින් පැ.සා.2140 රත්නසිංහ රාජකරුණා ජයකොඩිගේ උපුල් ටිකිරි කුමාර රාජකරුණා සාක්ෂිකරුට අ.න.වි.ස. 127 (1) වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති පැ.170 ලෙස ලකුණු කර ඇති ප්‍රකාශය ඇසුරින් ලකුණු කර ඇති කරුණු.</u>

මෙම නඩුවෙහි 05 වන චූදිත විසින් පැ.සා.2140 රත්නසිංහ රාජකරුණා ජයකොඩිගේ උපුල් ටිකිරි කුමාර රාජකරුණා සාක්ෂිකරුට අ.න.වි.ස. 127 (1) වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති පැ.170 ලෙස ලකුණු කර ඇති ප්‍රකාශයෙහි අන්තර්ගත කරුණු ප්‍රථමයෙන්ම සම්පිණ්ඩනය කර සළකා බැලීමට අප තීරණය කරමු.

පැ.170 (i): “ ඒ වගේම දිප්පිටිය ගමෙත් අය එක්ක එකට කාලා ඉන්න කාලය තුළ තමයි දිගන වගේ තැන්වල විවිධ ප්‍රශ්න සිදු වුණා ඒ කාලයේ. අපි ගොඩක් කණගාටුවෙන් ඉන්න කොට කිරළදෙනියේ සාජිත් කියන අය තමයි අපිට සහරාන්ව අදුනාගත්තේ. සහරාන් අපිට කිව්වා මුස්ලිම් සමාජයට එන ප්‍රශ්නවලට හරියට විසඳුමක් තීරණයක් මුස්ලිම් සමාජයට ලැබෙන්නේ නැහැ කියලා. මුස්ලිම් සමාජය ගොඩක් කොටස්වලට බෙදිලා ඉන්නවා ඒ ඔක්කෝම අය එකතු කර ගන්න ඕනෑ මේ රටේ මුස්ලිම් සමාජය හොඳ එකඟතාවයක් ඇති කර ගන්න ඕනෑ.”

පැ.170 (ii) : “මම, මගේ අයියා, අපි සහරාන් සමඟ එකතු උනේ 2018 ජූනි මාසයේ තමයි සම්බන්ධ උනේ. ඉන් පසුව සහරාන් නුවර එළියේ දින දෙකක් දේශන තිබ්බා. සාජිත් මවුලවී ඒක දැනගෙන එයා සමඟ තමයි මම නුවර එළියට ගියේ. නුවර එළියේ දින දෙකක් දේශනාවක් තියලා ඒකේ ආගමික දේවල් ගොඩක් ඉගැන්වුවා. දෙවන දින දහවල් කෑමට පසුව අපි 15 දෙනෙක් පමණ සිටියා. එතනදී දිවුරුම් ගත්තා. මෙහි වෙන කිසි දෙයක් එළියේ කිසි කෙනෙකුට කියන්නේ නැහැ කියලා දිවුරුම ගත්තා. ඊට පසුව අපිට කීවා මේ ලෝකෙත් ලංකාවෙත් වැරදි දේ නැති කරනවා නම් දේශනා කරලා

නවත්වන්න බැහැ. සමාජය ඔක්කොම වැරදි වලට පුරුදු වෙලා ඉන්නේ. බලය පාවිච්චි කරලා තමයි වැරදි දේවල් නතර කල යුත්තේ කියලා අපිටත් ශක්තියක් බලයක් තියෙන්න ඕනෑ කියලා තුවක්කු දෙකක් පෙන්නුවා. ටී.56 තුවක්කුවයි, පොඩි පිෂ්ටල් එකයි. ඊට පසුව දින දෙකේ වැඩසටහන ඉවර වෙලා අපි ගෙදරට ආවා. එහෙම ඉන්නකොට තවත් වැඩසටහනකට මගේ අයියා සමඟ අපේ යහලුවන් සියලු දෙනාම ඒ වගේ වැඩසටහනකට ගිහින් ආවා. ඊට පසුව අපේ අයියා මාවනැල්ල ප්‍රදේශයට නායකයා ලෙස සහරාන් පත් කලා. ඊට පස්සේ අපිට මොනවා හෝ කිව යුතු නම් අපේ අයියාගේ මාර්ගයෙන් තමයි අපි කිව යුත්තේ. එහෙම සිටියදී අපේ අයියාට සහරාන් කියලා තියෙනවා දැනට පල්ලි 114 ක් කඩලා තියෙනවා. මේ දිගන ප්‍රශ්නවලදී මුස්ලිම් සමාජයට කෝටි 850 ක් නැති වෙලා තියෙනවා. ඒ වගේම එක් අයෙක් මැරිලා තියෙනවා. මෙච්චර ලොකු සිද්ධිය කරපු අමිත් වීරසිංහ මාස 07 කින් ඇප අරන් එළියට ඇවිත් සිටිනවා. 2018 දෙසැම්බර් වලදී තමයි මේ දේවල් අයියා කියලා තියෙන්නේ මුස්ලිම් සමාජය මේවාට ප්‍රතිප්‍රහාර දෙන්නේ නැතිව ඉවසීමෙන් ඉන්න එක තමයි වැරදි. වැඩිදුරටත් මේ වගේ සිදුවීම් වෙන්නේ නිකම් සිටින විටයි. අපි ඒකට

ප්‍රතිප්‍රහාරයක් දුන්නා නම් ඕක නතර වෙලා යනවා. ඒ නිසා ඒ අය පල්ලි කඩනවා වගේ අපිත් බුදු පිළිම කැඩිවානම් ඕක නතර වෙලා යනවා. මේ වන විට පල්ලි 114 ක් කඩලා තියෙනවා. අපිත් පුලුවන් විදිහට ඒකට උත්තර දෙන්න ඕනෑ. ඒ නිසා මාවනැල්ල ප්‍රදේශයේ ඔයත් එක්ක සිටින කට්ටිය එකතු කරගෙන ගිහින් බුදු පිළිම කඩන්න කියලා සහරාන් මගේ අයියා වන සාදික් අබ්දුල්ලාට කියලා තියෙනවා. ඊට පසුව එයා මට කීවා මේ වගේ වැඩක් කරන්න තියෙනවා කියලා. ඊට පස්සේ දෙසැම්බර් 23, 24, 26 වන දිනවල හිඟුල රන්දිවෙල හන්දිය, මිරිස්කුඩු හන්දිය, වෙලම්බොඩ පාරේ, කුරුණෑගල පාරේ එක තැනක බුදු පිළිමවල් අපි කැඩුවා.''

පැ.170 (iii) : ''ඒ වගේම අපි බුදු පිළිම කඩලා අපේ එක යාලුවෙක් අෂ්වාක් අසුවුණා. ඊට පසුව මගේ අයියා සහරාන්ට දැනුම් දුන්නා මේ සිද්ධිය ගැන ඊට පසුව සහරාන් කීවා සීඅයිඩී වලින් මාව අවුරුදු 02 ක් සොයනවා. ඒත් ඒ අයට මාව අල්ලන්න බැරි උනා. මා ලඟට ඔයාලා එන්න කියලා අපිට කීවා. ඒ වෙලාවේ අපිත් කලබල වෙලා හිටිය නිසා තීරණයක් ගන්න බැරුව සහරාන් ලඟට ගියා. ඊට පසුව සහරාන්ගෙන් අපි ඇසුවා අපි පොලීසියට ගිහින් බාර උනා නම් මේ ප්‍රශ්නය මෙතනින් ඉවර වෙයි කියලා කිව්වා. එතකොට සහරාන් කීවා ඔයාලා යන්න

එපා. දැන් ඔයාලා ගියොත් මම සිටින තැන ඔයගොල්ලෝ දන්නවා. ඒ නිසා ඔයගොල්ලෝ මාව පාවලා දෙයි කියලා අපිට යන්න අනුමැතිය දුන්නේ නැහැ.''

පැ170 (iv): ''ඒකෙන් එකක් තමයි පුත්තලමේ වනාතවිල්ලුවේ මුෆිස්ට අයිති වත්තෙන් කොටසක් සහරාන් අපේ අයියා විසින් කුලියට අරන් තිබ්බා. ඒක එලු ගොවිපලක් හදනවා කියලා තමයි සහරාන් අරගෙන තියෙන්නේ. බුදුපිළිම කඩලා සහරාන් ලඟට ගියාට පසුව මට වනාතවිල්ලුවට යන්න කීවා. ඊට පසුව සහරාන්ලගේ කට්ටිය, සහරාන්, කස්තුන්, මිල්හාන්, ගපූර්, නවුෆර් මව්ලවි යන අය එහාට ආවා. ඒ කාලයේ තමයි කස්තූන් විසින් පුපුරන ද්‍රව්‍ය එහෙ හදලා තියනවා.''

පැ170 (v): '' ඒ වගේම මට සහරාන් සිංහල නමකින් හැඳුනුම්පතක් දීලා තිබුණා. ඒක මම පාවිච්චි කළා. ඒක පාවිච්චි කරලා මම මෝටර් සයිකල් අරන් තියනවා. විකුණලා තියනවා. ඇදිරිනීති පාස් අරගෙන තියනවා. මේ වගේ දේවල් මම කරපු වැරදි කියලා මම පිළිගන්නවා''

පැ170 (vi) : '' ඒ වගේම එක දවසක් මට සහරාන් කීවා මාවනැල්ල තස්ලිම්ගේ ඡායාරූප පෙන්නලා මෙයා අඳුනනවාද කියලා. මම කීවා ඔව් කියලා. ඊට පස්සේ මට කිව්වා තස්ලිම්ගේ

ගෙවල් පෙන්නන්න පුලුවන්ද කියලා. මම කීවා පුලුවන් කියලා. ඒ වෙලාවේ මම දන්නේ නෑ පෙන්වන්න කීවේ මොකටද කියලා. ඊට පස්සේ මම මිල්හාන්ට ගෙවල් පෙන්නුවා. ඊට දින 20 කට විතර පස්සේ තමයි එක දවසක් සහරාන් කීවා තස්ලිම්ට වෙඩි තියන්න යන්න ඕන කියලා. තස්ලිම් තමයි වනාතවිල්ලුව ඔක්කොම පොලිසියට ඔත්තුව දීලා තියෙන්නේ කියලා. ඊට පස්සේ රෑ 1.00 ට විතර මටයි අබ්දුල්ලාටයි, ගපූර් මාමාටයි, මිල්හාන්ටයි හතර දෙනාට තමයි යන්න ඕනෑ කියලා කිව්වේ. ගපූර් මාමාටයි, මිල්හාන්ටයි තනියම එක්කන් ගිහින් සහරාන් මොකක් හරි කිව්වා. ඒක මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒත් මට කීවා මිල්හාන් ඇවිල්ලා බයිසිකලය දුන්නාට පස්සේ ඒ බයිසිකලය අරගෙන පානදුරට එන්න ඕනෑ කියලා. ඒක තමයි මම කරන්න ඕනෑ කියලා මට කීවා. ඊට පස්සේ මිල්හාන් බයිසිකලයේ ආවා. මමයි, ගපූර් මාමයි, අබ්දුල්ලයි වෑන් එකේ ආවා. ඊට පස්සේ මාවනැල්ලට ආවට පස්සේ ගපූර් මාමා මිල්හාන් එක්ක බයිසිකලයෙන් ගියා. මමයි අබ්දුල්ලයි වෑන් එකේ සිටියා. ඊට පස්සේ පැය භාගයකට පස්සේ මිල්හාන් සහ ගපූර් මාමා ආවා. මිල්හාන් කීවා වැඩේ ඉවරයි කීවා. මට බයිසිකලය දුන්නා. ඊට පස්සේ මම බයිසිකලය අරගෙන

පානදුරට ආවා. ඒවගේම මට අර බයිසිකලය විකුණන්න කියලා කීවා. ඒක මම විකුණලා සහරාන්ට සල්ලි දුන්නා.''

පැ.170 (vii): ''ඒ වගේම කටුවාපිටිය ගෙදර සිටියදී එක දවසක් සහරාන් මට සල්ලි දුන්නා සියඹලාගස්කොටුව හරිෂ්ඛාන්ට දෙන්න කියලා. මම ඒක අරගෙන ගිහින් දුන්නා. ඒත් මොකටද කියලා මම ඒ වේලාවේ දන්නේ නැහැ. පස්සේ මම දැනගත්තා ඒක වෙඩි බෙහෙත් ගන්න තමයි දීලා තියෙන්නේ කියලා. ඊට පස්සේ එහෙම සිටියදී එක දවසක් එඩේරමුල්ලේ ගෙදරදී 2019 මාර්තු 29 වන දින නවුෆර් මවුලවි විසින් රැස්වීමක් කැඳෙව්වා. ඒ කැඳවීමට සහරාන්, නවුෆර් මව්ලවි, සාජිත් මවුලවි, ඉල්හාම්, අබ්දුල්ලා, රිස්ඛාන්, රිල්වාන්, මගේ අයියා, මම, ගපූර් මාමා යන අය සිටියා''

පැ.170 (viii): ''ඊටපස්සේ අනිත් දිනයේ සහරාන්, රිල්වාන්, ඉල්හාම්, අබ්දුල්ලා, රිෂ්කාන් යන අය වැන් එක අරගෙන පානදුර ගෙදරට ගියා."

පැ.170 (ix): ''ඊටපස්සේ මමයි ගපූර් මාමායි ඒගොල්ලන් ඉන්න පානදුර ගෙදර සහ කටුවාපිටිය ගෙදර දෙකම දවසින් දවසට ගිහින් ඒගොල්ලන් ඉන්නවා ද කියලා බලලා ආවා. ඊටපස්සේ එක

දවසක කටුවාපිටියේ ගෙදරට යනකොට ඒ ගෙදර කවුරුත් හිටියේ නැහැ"

පැ.170 (x) : "එහෙම ඉන්නකොට 2019.04.20 ඇ 9.00 ට විතර සහරාන්ගේ පැත්තේ හිටපු රිෂ්ඛාන් අපි හිටපු එඩේරමුල්ලේ ගෙදරට ඇවිත් කීවා ඔයගොල්ලන් මේ ගෙදර ඉන්න එපා උදෙන්ම කොහේ හරි යන්න කියලා. අපි ඇසුවා ඇයි කියලා. ඊට පස්සේ එයා කීවා ඒ ගෙදර අරන් තියෙන්නේ අබ්දුල්ලාගේ නමට අබ්දුල්ලාට පොලිසියෙන් ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා. ඒ නිසා හොයාගෙන මෙතනට එන්න පුළුවන් ඒ නිසා උදෙන්ම පිටත් වෙලා යන්න කියලා කීවා. "

පැ.170 (xi) : "එහෙම සිටියදී 2019.04.21 උදේ 9.00 ට විතර නැවත රිෂ්ඛාන් ආවා. ඇවිත් කීවා ඕගොල්ලෝ තවම ගියේ නැද්ද කියලා. ඊටපස්සේ අපි කීවා ඔයා ඇ ඇවිත් කියලා උදේ වෙනකොට අපි කොහේ යන්නද කියලා."

පැ.170 (xii): "ඊටපස්සේ සාජිත් මව්ලවි, නවුෆර් මව්ලවි බයිසිකලය අරගෙන ගියා. අපේ අයියා සහ නැනා සහ එයාගේ පුතා කුලී ත්‍රීරෝද රථයක ගියා. මමයි ගපූර් මාමායි ගෙදර තියෙන බඩු ටික දාගෙන වැන් එකේ නින්දවූර් යන්න ගියා. නින්දවූර්වල මිල්හාන් විසින් කුලියට ගෙයක් අරන් තිබුණා"

පැ.170 (xiii): ‘‘ඊට පස්සේ අපි නින්දවූර් යන කොට ප්‍රවෘත්තියකින් දැන ගත්තා නවුෆර් මවුලවි සහ සාජිත් මවුලවි යන දෙදෙනා දඹුල්ලේ දී අත්අඩංගුවට ගත්තා කියලා. ඊට පස්සේ අනිත් දවසේ අපි නින්දවූර්වල ඉඳලා 2019.04.23 මම වෑන් එක අරගෙන නුවරඑළියට ආවා. ගපූර් මාමා බස් එකට නැගලා කොළඹට ගියා. මම නුවරඑළියේ දවසක් ඉඳලා ඊට පස්සේ අයියා දුරකථන ඇමතුමක් දුන්නා අයියා තිහාරියේ ඉන්නවා කියලා අයියා මාත් එක්ක නුවරඑළියට එන්න මට තිහාරියට එන්න කීවා. ඊට පස්සේ මම වෑන් එක අරගෙන ගිහින් අයියා, නෑනා සහ පුතා එක්ක ගෙන නැවත මම කුලියට ගත්ත නුවරඑළියේ ගෙදරට ආවා. එහේ දින 2 ක් ඉඳලා නැවත අපි ගම්පොලට ආවා. අපි කතා කර ගත්තා මීට පස්සේ අපි සැඟවී සිටින එක බොරු වැඩක් අපි පොලිසියට ගිහින් බාර වෙමු කියලා. ඊට පස්සේ අයියා කීවා එහෙම නම් නෑනා සහ පුතා එයාලගේ ගෙදර යවලා එතැනින් භාර වෙන්න කියමු කියලා. අයියා, නෑනා සහ පුතා බස් එකේ ඇවිත් මාවනැල්ල ටවුමෙන් බස්සවලා ගෙදරට යන්න කියලා අයියා ගම්පොලට ගියා. මම මගේ ලඟ තියෙන වෑන් එක අනුරාධපුරේ ඉන්න මගේ යහලුවෙකුට දීලා එමු කියලා අනුරාධපුරයට ගියා. මගේ යහලුවා එයා බය වුනා. මම දැක්කට පස්සේ. එයා කතා කලේ

නැහැ. මට යන්න කියලා කීවා. ඊට පස්සේ මම වෑන් එක අරගෙන නාවලපිටියට ඇවිල්ලා මගේ මාමාට වෑන් එක දීලා මාමාගේ ගම්පොල තිබෙන සපත්තු කඩේට ගියා. අයියාත් එහේ තමයි හිටියේ. එහේ ගිහින් මමයි, අයියයි කථා වුනා දැන් ඔක්කොම දීලා ඉවරයි හෙට උදේට අපි දෙන්නා පොලිසියට බාර වෙමු කියලා. එහෙම ඉන්න කොට එදාම රෑ පොලිසිය, හමුදාව, එස්ටීඑෆ් එකේ කට්ටිය ඇවිත් අපි දෙන්නාව අත්අඩංගුවට ගත්තා. 2019.04.27 දින රෑ 11.55 තමයි අපි අත්අඩංගුවට ගත්තේ.''

පැ.170 (xiv): ''මම නීතීඥ මහත්තයෙකු අල්ලා මේ කිසි දෙයක් මම කරලා නැහැ කියලා බොරු කියලා නිදහස් වෙන්න දෙවියන් වහන්සේ මේ වැරදි වලට කොහොම හරි වෙන පැත්තකින් දඩුවමක් දෙනවා කියලා මම දන්නවා. ඒ නිසා මෙතනින්ම මම මගේ වැරදි ඔක්කොම පිළිගන්නවා''

පැ.170 (xv) : ''බුදුපිළිම කඩලා ගිහින් සහරාන් ලඟ ඉන්න කාලේ කොච්චිකඩේ ගෙදරක හිටියා. ඒ වගේම වනාත විල්ලුවේ හිටියා. ඊට පස්සේ කල්මුනේ පසුව කොළඹ වැල්ලවත්ත මයුරා ප්ලේස් කියන නිවාසයේ හිටියා. කටුවාපිටිය ගෙදර සිටියා. කටුවාපිටියේ ගෙදර ඉන්න කාලේ කටුවාපිටියේ

ගෙදර, එඩේරමුල්ල ගෙදර සහ පානදුර ගෙදර කියලා ගෙවල් තුනක් තිබුණා. මේ ගෙවල් වල මම ඉඳලා තියෙනවා''

මෙම ප්‍රකාශය 05 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙන ප්‍රකාශයක් බවට අප විසින් දැනටමත් තීරණය කර ඇත. තවද මෙම ප්‍රකාශයෙහි මෙම නඩුව හා සම්බන්ධ වෙනත් පුද්ගලයෙන්ගේ නම් සඳහන් කර ඇතද, අප විසින් සළකා බලනුයේ මෙම චූදිතට අදාළ කරුණු සම්බන්ධයෙන් පමණි. මෙම ප්‍රකාශයේ ඇති නෛතික වටිනාකම අප විසින් ඇගැයීමට ලක් කිරීමේදී පෙනී යන්නේ 2018 වර්ෂයේදී ඔහු සහරාන්ගේ ප්‍රධානත්වයෙන් නුවර අරුප්පල ප්‍රදේශයේ සහ නුවරඑළිය ප්‍රදේශයේ පැවැති වැඩමුළුවකට සහභාගී වූ බවත්, එසේම ඔහු ස්වයංඝාතක බෝම්බකරු වන සහරාන් නැමැත්තෙකු සමඟ ඉතා සමීපව වැඩ කටයුතු කල බවයි. එම ප්‍රකාශයේ ඉහතින් දක්වන ලද කොටස් සම්බන්ධයෙන් ස්වාධීනව සාක්ෂි ලබා දුන් පැමිණිල්ලේ සාක්ෂිකරුවන් වන පැ. සා. 1400 අනාස් යන අයගේ සාක්ෂියෙන්ද ඉහතින් විශ්ලේෂය කරන පොලිස් විමර්ශන නිලධාරීන්ගේ සාක්ෂි වලින්ද, එසේම මෙම නඩුවේ 09 වන චූදිත මොහොමඩ් රමීෂ් සාජිත් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16(1) වගන්තිය යටතේ ලබා දී ඇති පාපෝච්ඡාරණමය ප්‍රකාශයෙහි සඳහන් වී ඇති පරිදි මෙම චූදිත විසින් සහරාන් ඔහුට ලබා දුන් සිංහල නමකින් යුතු හැඳුනුම්පතක් භාවිතා කර මෝටර් සයිකලයක් මිලදී ගත් කරුණු මෙම

සාක්ෂිකරු පැ. 170(V) ප්‍රකාශයෙහි සඳහන් කර ඇති කරුණු සමඟ මනාව තහවුරු වන බවයි.

11 වන චූදිත වන හූසේයිනුල් රිස්වි කාලික් සමීර් විසින් පැ.සා.2111 ගල්කිස්ස මහේස්ත්‍රාත් චන්දිම හර්ෂණ ගම්මැද්දේගොඩ ලියනගේ යන මහෙස්ත්‍රාත්වරයාට 2020.06.25 දින අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127(1) වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති ප්‍රකාශයෙහි පහත සඳහන් කොටස් පැමිණිල්ල විසින් සලකුණු කරමින් අධිකරණයේ අවධානයට යොමු කරන ලදී.

පැ.165 (1) : "ස්වාමීණි, 2014 වර්ෂයේ මෙම පිටකොටුවේ දෙවන හරස් වීදියේ ආර් එම් මොබයිල් දුරකථන උපාංග තොග වෙලඳ සැලේ වැඩ කරගෙන ඉන්නකොට මගේම යාලුවා වන හසන් ශවාහිර් අය සමග ෆේස්බුක් එකේ ගේම් සෙල්ලම් කරන්න නෙට්කැෆේ වලට යනවා."

පැ.165 (2) : "ඒ වෙලාවේ තමයි පලවෙනි වතාවට 2014 අයි එස් අයි එස් සංවිධානයත් මෙම මිනිස්සුන්ට උදව් කරන බව අපි බැලුවේ. ද ලයිට් රිවිලේෂන් ඒ වීඩියෝ එකෙන් තමයි අපි මේ වීඩියෝ එක බලල තියෙන්නේ. ඒ වීඩියෝ එක එඩිට් කරන එක්කෙනෙක් ශ්‍රී ලංකාවේ අලුත්ගම ඉන්නවා කියලා අපිට ආරංචි වුණා. එයාගේ නම ආදිල් අමීෂ්. එයාගේ ෆේස්බුක් නම

ආදිල් AX. ඔහු ෆේස්බුක් හරහා අයි එස් අයි එස් ගැන තිබෙන සැක සහ ඒ අය සමග තිබෙන විස්තර සාකච්ඡා කිරීමට රැස්වීමක් තිබෙනවා කියලා අපට දැනුම් දුන්නා.''

පැ.165 (3) : ''ඒ දැනුම් දීම පරිදි දෙහිවල කාගිල්ස් ෆුට් සිටි එක ගාව පොඩි ශාලාවක ඒ රැස්වීම තිබුණේ. ඒ රැස්වීමට මමයි හසනුයි තමයි ගියේ. ඒ රැස්වීමට ආදීල් අමීෂ් සහ හූමෙයිර් ඉක්බාල් කියල කෙනෙකුත් ඇවිල්ලා හිටියා. ඊට අමතරව දහදෙනෙක් වගේ හිටියා. නම් දන්නේ නැහැ. ඒ අය රැස්වීම පටන් ගන්න පෙරම ඒ අයගේ නම් කිව්වා හූමෙයිර් සහ ආදීල් කියලා කිව්වා. ඒ අය රැස්වීම පැවැත්වුවේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒ වෙලාවේ මගේ ඉංග්‍රීසි භාෂාවේ අපහසුතාවයක් තිබූ නිසා ඒ අය කියන හැම දෙයක්ම තේරුම් ගන්න අපහසු වුණා. එතකොට මා ගාව හිටපු හසන්ට හොඳට ඉංග්‍රීසි දන්න නිසා එයාගේ මාර්ගයෙන් තමයි ඒ අය කියන දේ තේරුම් ගත්තේ. ඒ අය එතන කියලා තිබ්බේ අයි එස් අයි එස් සංවිධානයේ ඉතිහාසය ඒ අය කැරලි ගසන්නට හේතුව ඒ සිරියාවේ සහ ඉරාකයේ යන රටවල්වල මීට කලින් පැවැත්වුනු තත්වය පැහැදිලි කරලා දුන්නා. එය පැය එක හමාරක් විතර කාලයක් අවසන් වුණාට පසුව එතන රැස්වීම අවසන් වුණා. අපි ආයෙත් අපේ ගෙදරටම ආවා.''

පැ.165 (4) : ‘‘පසුව ෆේස්බුක් හරහා ආදීල් අමීෂ් ගේ යාලුවන් ෂස්නි අහමඩ්, අත්කම් අක්‍රම්, ඉහ්සාන් අහමඩ්, අහමඩ් සුහාර්, හුස්නි මුබාරක්, ඉන්ෂාෆ් ඉෆ්තිකාර්, යන අය සමග යාලු වෙලා අත්කම් සහ අහමඩ් ඒ අයගේ ගෙවල්වල අපි හැමෝම රැස් වෙනවා. මාසයකට සැරයක් හා සමහර වෙලාවට සතියකට සැරයක් එහෙම රැස් වෙලා කතා බහ කරනවා. එම රැස්වීම වලදී ප්‍රධානත්වය ගත්තේ උමෙයිර් ඉක්බාල්, ආදිල් අමීෂ් කොළඹට එනකොට විතරක් විහාර මහා දේවි පාර්ක් එකේ රැස් වෙනවා.’’

පැ.165 (5) : ‘‘මෙසේ ඉන්නකොට තමයි 2015 අලුතෙන් ඒ අයගේ යාලුවන් වන ඉමාත් ෆකීර්, ජමීල් (ටොපිකල් ඉන් එකේ මරාගෙන මැරුණු කෙනා), (ෂැන්ග්‍රිලා එකේ මරාගෙන මැරුණු ඉල්හාම්, (කොච්චිකඩේ කතෝලික දේවස්ථානයේ මරාගෙන මැරුණු) මුආත්, යන අය ද අපේ යාලුවන් සමග එකතු වුණා. එතකොට ඉමාත් සහ ඔහුගේ බිරිඳ අයි එස් අයි එස් එකට සම්බන්ධ වීම සඳහා තුර්කියට ගොස් අකමැති වෙලා නැවත ආපු බවට දැනගන්නට ලැබුණා. අකමැති වීමට හේතුව එයාගේ පියාට අසනීප බවක් ඇති වුණ බව කියලා අපට කිව්වා.’’

පැ.165 (6) : ‘‘ඒ අය ඔක්කොම එක්ක තමයි වට්ස්ඇප් එකේ ගෘaප් එකක් හැදුවා පර්ල්ස් ඔෆ් විස්ඩම් යන නමින්. පසුව ජමීල් විසින් ඒ නම ජමාතු මිල්ලතු ඉබ්‍රාහිම් කියලා නම මාරු කලා.’’

පැ.165 (7) : ‘‘පස්සේ මොහොමඩ් අම්ජත් කියලා කෙනෙකුත් මීගමුව හිලාම් එයාගේ තව නමක් තියෙනවා අබු හයිතම් කියලා. රිෆ්කාන් කියලා කෙනෙකුත් හිටියා. 2016 වර්ෂයේ ෆේස්බුක් සහ වට්ස්ඇප් ගෘaප් එකේ අයි එස් අයි එස් සම්බන්ධව සාකච්ඡා සහ ගැටලු ගැන කතා බහ කරමින් සිටියා. මරදාන අම්ජත් ගේ ගෙදරත් එක් රැස් වෙනවා.’’

පැ. 165 (8) : ‘‘2017 මම රාජගිරියේ අබාන්ස් ආයතනයේ වැඩ කරන කොට ෆේස්බුක් හරහා අයි එස් අයි එස් වලට සපෝර්ට් කරනවා කියලා ඉන්ස්පෙක්ටර් විරාජ් මහත්තයා මේ කණ්ඩායමට කතා කරලා තනි තනිවම විමර්ශණ කලා. මගේ දුරකථන අංකයටත් කතා කරලා බීඑම්අයි සීඑච් ඉස්සරහට එන්න කියලා විමර්ශණ කළා. එයා අපි ගැන අහලා ඇයි අයි එස් අයි එස් එකට සපෝර්ට් කරන්නේ කියලා ඇහුවා. ඒ අවස්ථාවේ සිරියාවේ සිදුවුනු අපරාධවලට අයි එස් අයි එස් සංවිධානය විසින් මිනිසුන්ට උදව් කරන බව අපි වීඩියෝස්

වල බලපු නිසා බව කිව්වා. ඒ වෙලාවේ අයි එස් අයි එස් එකට යාමට අවශ්‍යතාවයක් තිබෙනවාද කියලා අපෙන් විමසුව වෙලාවේ අපිට එහෙම වුමනාවක් නැති බව මම එයාට පැහැදිලි කරලා දුන්නා. ලංකාවේ මොකක් හරි ප්‍රශ්ණයක් තියෙනවාද කියලා ඒ අය අපෙන් ඇහුවා. ලංකාවේ අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා අපි එයාලට පැහැදිලි කරලා දුන්නා. මේ සම්බන්ධව දන්නා කට්ටිය එයා ඇහුවා.ඒ වෙලාවේ මගේ යාලුවා හැමෝගෙම නම් ටික ඒ නිලධාරියාට භාර දුන්නා. ලංකාවේ ප්‍රශ්ණයක් නැත්නම් ඇයි අයි එස් අයි එස් එකට සපෝර්ට් කරන්නේ කියලා එතුමා ඇහුවා. ලංකාවේ කිසිම ප්‍රශ්ණයක් අපට නැහැ අයි එස් අයි එස් සංවිධානයට සපෝර්ට් කිරීම සියයට සියයක් නැතුව සමහර ගැටලු තියාගෙන තමයි කියලා එයාට පැහැදිලි කරලා දුන්නා. පස්සේ මිට වඩා මොකක් හරි තොරතුරක් ලැබුනොත් එයාට කියන්න කියලා එයා එතනින් පිටත් වුණා.''

පැ.165 (9) : ''අවුරුදු 11 ක් වගේ කාලයක සිට බෞද්ධ ඉස්කෝලෙක තමයි මම ඉගෙන ගත්තේ. අවුරුදු 11 ක් මගේ දෙමව්පියන් පිටරට හිටපු නිසා මම හැදුනේ වැඩුනේ ගම්පහ පෙතියාගොඩ නැන්දාගේ ගෙදර ඒ නිසා ඉස්ලාම් ආගම කෙරෙහි කිසිම දෙයක් හරියට දැනගෙන හිටියේ නැහැ. දෙමව්පියන් ලංකාවට

ආවට පසුව මාව කොළඹට අරන් ඒ අය හමීඩ් අල් හුසේන් විදුහලට යොමු කරලා තමයි ඉගෙනගත්තේ. එයත් සිංහල භාෂාවෙන්.''

පැ.165 (10) : ''අයි එස් අයි එස් සංවිධානය කරන සෑම දෙයක්ම ඉස්ලාමයේ තියෙන බවට වටහා ගැනීමට අපි අතර ඉස්ලාම් දැනුමක් තිබ්බේ නැහැ. ඒ නිසා අපේ යාලුවන් සමඟ රැස්වෙන කොට ඒ අයගෙන් මම ගොඩක් ප්‍රශ්න අහල තියෙනවා, 2017 වර්ෂයේ වට්ස්ඇප් ගෲප් එකට ඉහ්සාන් අහමඩ් මඟින් නවුෆර් මව්ලවි කියලා මව්ලවි කෙනෙක්ව එයට සම්බන්ධ කළා. ඒ නවුෆර් මව්ලවි එයට සම්බන්ධ කරලා ඔහුගෙන් තිබෙන ප්‍රශ්න අහන්න කියලා අපි ඔක්කෝටම දැනුම් දුන්නා. 2017 දෙසැම්බර් මාසයේ 16 වන දින මල්වාන නවුෆර් මව්ලවිගේ නායකත්වයෙන් අපේ මේ යාලුවන් කණ්ඩායමට රැස්වීමක් පවත්වන බව අපට දැනුම් දුන්නා. මට අබාන්ස් එකේ වැඩ බහුලව නිසා මෙම රැස්වීමට මට යාමට නොහැකි වුණා. එම රැස්වීමෙන් පස්සේ මාගේ යාලුවන්ගෙන් ඇහුවා කව්ද ආවේ මොනවද වුනේ කියලා.''

පැ.165 (11) : ''ඒ රැස්වීමට ගියේ නැති නිසා ඉල්හාම් (ෂැංග්‍රිලා හෝටලයේ මරාගෙන මැරුණු), ජමීල් (ට්‍රොපිකල් ඉන් හෝටලයේ

මරාගෙන මැරුණු) මට දොස් කියාගෙන ගියා. පසුව ඒ අය දෙදෙනාම මාව රහසිගතව හමුවෙලා වැඩක් භාරදෙන්න එය කරන්න පුළුවන්ද කියලා ඇහුවා. ඒ මොනවද වැඩේ කියලා අහපු වේලාවේ ලංකාවේ තියෙන සෑම පල්ලියක් ගානෙම විස්තර හොයලා ඩේටාබේස් එකක් හදන්න කියලා කිව්වා. ඒක කොහොමද කරන්නේ කියලා පළවෙනි වතාවට පැහැදිලි කරලා දුන්නේ නැහැ. සතියකට සැරයක් වගේ මෙහෙම ඇවිල්ලා මා සමඟ කතා බහ කරලා ගියා. පසුව සහරාන් මව්ලවිටත් ප්‍රශ්ණයක් ඇවිල්ලා කියලා ඔහුව බේරා ගන්න ඕනි කියලත් මට කිව්වා. මොනවද ප්‍රශ්ණය කියලා පැහැදිලිව කිව්වේ නැහැ. ඒ වුනත් මම සූදානම් ද කියලා තමයි ඒ අය මගෙන් අහලා තිබ්බේ. නමුත් මාසයක් පහුවුණාට පසුව ඒ ඔබව සෝදිසි කිරීමට තමයි කියලා පැහැදිලි කරලා දුන්නා.”

පැ.165 (12) : “2018 මාර්තු 23 රෑට මාළිගාවත්ත කනත්ත අසල තියෙන පල්ලිය ගාවට මෙම කණ්ඩායමේ ඉන්න හැමෝටම ඉහ්සාන් අහමඩ විසින් පැමිණෙන ලෙස දැනුම් දුන්නා. දවස් තුනක දේශනාවක් තියෙනවා කියලා ඊට අවශ්‍ය කරන ඇඳුම් සහ අනෙකුත් දේවල් අරගෙන එන්න කියලත් නිවසට යහළුවන් සමඟ චාරිකාවක් යනවා කියලා දැනුම් දෙන ලෙසත් දුරකථනය රැගෙන එන්න එපා කියලත් වට්ස්ඇප් ගෲප් මඟින්

අපි ඔක්කෝටම කිව්වා. එතනට යන කොට කලු පැහැති ඩොල්ෆින් වෑන් රථයක් පැමිණ තිබුණා. ඒ ඩොල්ෆින් වෑන් රථයේ රියදුරා වශයෙන් රිස්වාන් කියලා කෙනෙක් හිටියා. ඒ දේශනාවට යාමට පැමිණි ඔක්කොම එතන රැස්වුණා. තම තමාගේ නම් කාටත් කියන්න එපා කියලත් අනෙක් අයගේ නම් සහ විස්තර අහන්න එපා කියලත් අපට කියලා තිබුනා. ඒ වෑන් රථයේ නැගලා මහනුවර අරුප්පල පිහිටි තට්ටු දෙකේ නිවසකට අපිව අරන් ගියා. ඒ දේශනාවට සහභාගී වුනේ ඉහ්සාන් අහමඩ්, හුමෙයිර් ඉක්බාල්, ඉන්ෆාස් ඉනායාතුල්ලා, අහමඩ් සුහාර්, අහ්කම් අක්‍රම්, මොහොමඩ් ෂස්නි, හසන් ෂවාහිර්, ෆස්හාන්, හිලාම්, මුආත් (කොච්චිකඩේ පල්ලියේ මරාගෙන මැරුණු), ජමීල් (ට්‍රොපිකල් ඉන් හෝටලයේ මරාගෙන මැරුණු), ඉන්ෂාෆ් ඉෆ්තිකාර්, ආෂිෆ් අහමඩ් යන යාලුවන් ඔක්කොම සහභාගී වුනා. අපි එහේ ගියාම සහරාන් හෂීම් (අනුවර්ත නාමය අබූ උබෙයිදා . ෂැංග්‍රිලා හෝටලයේ මරාගෙන මැරුණු), නවුෆර් මව්ලවි, මිල්හාන්, හස්තූන් (එයාගේ අනුවර්ත නාමය අබු මුහම්මද්) (කටුවාපිටිය දේවස්ථානයේ මරාගෙන මැරුණු), ආබ්දීන් කියලා කෙනෙකුත් සහරාන්ගේ රියදුරා කියලා මොහොමඩ් ෂාෆි කියලා කෙනෙකුත් ඒ ගෙදර හිටියා. එදා රෑ අපි ඔක්කොටම

කෑම අනුභව කිරීමෙන් පසුව නිදා ගැනීමට ද සූදානම් කරලා දුන්නා. උදෑසන හතර හමාරට පමණ නැගිටලා ආගම කරාට පසුව සහරාන් හෂීම්, නවුෆර් මව්ලවි, මිල්හාන්, හස්තූන් සහ අපෙන් ගිය කණ්ඩායම කාමරයක ඇතුලට ගිහිල්ලා ඒ අයගේ දේශනාව පටන් ගත්තා. දවස් දෙකක් අපි එහේ නැවතිලා හිටියා. මේ දවස් දෙක ඇතුලේ සහරාන් හෂීම් විසින් අයි එස් අයි එස් සම්බන්ධව දේශනා ද නවුෆර් මව්ලවි විසින් ඉස්ලාමීය ෂරියා නීතිය පිළිබඳව ද දේශනා කලා. හස්තූන් විසින් දුරකථන සහ පරිගණක ඉතා ආරක්ෂාකාරී විදියට පරිහරණය කරන සොෆ්ට්වෙයාර් පැහැදිලි කරලා දුන්නා. මිල්හාන් විසින් ටී 56 අවියක් රැගෙන ඇවිත් එය ගැලවීමටත් සවිකිරීමටත් සහ සුද්ද කිරීමත් එහි පතොරම් ඇතුලට දාන විදිහ ඉලක්කය ගන්නා ආකාරයත් පැහැදිලි කරලා දුන්නා. පසුව මෙම දේශනාව ඔක්කොම ඉවරවුනාට පස්සේ මාව තනියෙන්ම කාමරයකට සහරාන් හෂීම් විසින් අරගෙන මං ගැන විස්තර ඇහුවා. මගේ ටෙලිෆෝන් නම්බරය සහ ලිපිනය ද එයා ලියා ගත්තා. මේ වගේ කිහිප දෙනෙක් සමඟ එයා කතා බහ කළා. අන්තිමට මෙම දේශනාවේ මොනාද වුනේ කියලත් කවිද සම්බන්ධ වුනේ කියලත් කාටවත් කියන්න එපා කියලා සහරාන්, නවුෆර් විසින් අපට කිව්වා. දේශනාවට සම්බන්ධ

වුනු හැමෝගෙම නම් ටික ඒ අයගේ කොලයක් අරන් ඉස්ති ෂන්දි කියන්නේ මරාගෙන මැරීම සහ ඉන්ගි මාෂි කියන්නේ සටන් කිරීම වෙනුවෙන් ඔක්කෝගෙම නම් ටික ඒ අය අරගත්තා. ඒ වන විටත් මරාගෙන මැරීම පිළිබඳව විශේෂයෙන් මාගේ සිතේ ගැටලු තිබුණත් එතනදී ඔහුගෙන් ප්‍රශ්න කිරීමට මට ධෛර්යයක් තිබුණේ නැහැ. එසේ ප්‍රශ්න කළොත් ඔවුන්ගෙන් මට හානියක් වෙයි කියලා මම නිශ්ශබ්දව සිටියා. ඒ අය කියන සෑම දෙයක්ම පිළිගන්නවා කියලා අපි හැමෝම ඒ අයට පෙන්නුවා. නමුත් සමහර ගොඩක් අය ඇත්තෙන්ම කැමති වෙලා තමයි හිටියේ. දේශනාවේ අවසාන දිනයේදී හැමෝම එක්රැස් කරලා බයියත් පොරොන්දු වීමක් ඒ අය අරගත්තා. එය සහරාන් විසින් අරාබි භාෂාවෙන් කියපු නිසා මට ඒකෙ තේරුම දන්නේ නැහැ. පසුව අයි එස් අයි එස් වීඩියෝස් ඒ අයගේ ලැප් එකක දාලා පෙන්නුවා. ඉන්පසුව ඒ අයගේ වෑන් එකේම තම තමන්ගේ නිවෙස් වලට රැගෙන යන ලෙසට එයාගේ රියදුරාට අණ කළා. ඒ රැස්වීමෙන් පස්සේ මම සහ හසන් කොළඹ ඉන්න යාලුවන් සමඟ වැඩිය රැස් වුනේ නැහැ.”

පැ.165 (13) : “2018 ජූලි මාසයේ දිනක සහරාන් මට කෝල් කලා. ඒ මගේ දුරකථන අංකය 0766355229 වේ. මගේ දුරකථන

අංකයට කෝල් කරලා මාවනැල්ල ෆුට් සිටි එක ගාවට එන්න කියලා කිව්වා. මමත් මාවනැල්ල ෆුට් සිටි එක ගාවට ගියා. ඒ ගිය වෙලාවේ මොහොමඩ් සාෆි කියන සහරාන්ගේ රියදුරා සුදු වෑන් එකක ඇවිල්ලා හිටියා. සාෆි කියන පුද්ගලයා තමයි මාවනැල්ල ආබ්දීන් කියන කෙනාගේ ගෙදරට එක්කගෙන ගියේ. එහෙ ගියාම තුන්වෙනි මහලේ සහරාන් හෂීම් සහ නවුෆර් මව්ලවි, මිල්හාන්, සහරාන් හෂීම්ගේ මල්ලී වන සයින්දමාරු වල මරාගෙන මැරුණු රිල්වාන් හිටියා. ඒ වෙලාවේ මට ෆෝන් එකක් දීලා ඒ ෆෝන් එකේ සිම් එකකුත් දාලා ඒ සිම් අංකය 0762124271 වේ. මේ ෆෝන් එකේ ත්‍රී මා කියන සංනිවේදන ඇප් එකක් දාලා මින් පසුව සම්බන්ධ වෙනවා නම් ඒ ත්‍රීමා ඇප් එක ඔස්සේ සම්බන්ධ වෙන්න කියලා කිව්වා. ඊට අමතරව එම ෆොන් එකේ ලොකර් කියලා ඇප් එකකුත් තිබුණා. ඒ සිම් පත භාවිතා කරමින් කිසිදු දුරකථන ඇමතුමක් ගන්න එපා කියලා කිව්වා. මේවා කරන්නේ මින් පසුව කොළඹ මොකක් හරි වැඩක් තියෙනවා නම් එය මාව යොදා කරගන්න ඕනි කියලා තමයි කිව්වේ. ඒ වැඩ කරන කොට කාටවත් නොකියා කරන්න කියලත් මට කිව්වා. නමුත් මම මීට පෙරදී පොලිසිය විසින් විමර්ශණය කරලා තියෙනවා කියලා එයාට කිව්වා. එයාගෙන් ඈත් වීමට

එසේ කිව්වත් ඔයාගේ පිටිපස්සේ කවුරුහරි ලුහුබැන්දොත් අපිට දැනගන්න පුළුවන් වෙයි කියලා කිව්වා. ඊට අමතරව දැන් යන වැඩට (අබාන්ස් ආයතනයෙන්) අයින් වෙලා ඔහු කියන වැඩ කරන්න ඕනි කියලත් කිව්වා. එයත් සමඟ වැඩ කළොත් මාසෙකට රුපියල් හතළිස් දහසක් සහ යතුරු පැදියක් මිලදී ගැනීමට අවශ්‍ය සල්ලි දෙන බවත් පවුලේ කුමක් හෝ ප්‍රශ්නයක් හෝ උත්සවයක් පැවතුනොත් එයට අවශ්‍ය කරන මුදල් ද ලබා දෙනවා කියලා කිව්වා. විවාහ වීමෙන් පසුව මට දෙන පඩිය වැඩි කරනවා කියලත් කිව්වා. මේ පිළිබඳව කාටවත් කියන්න එපා කියලා එදා එතනින් මාව යැව්වා.”

පැ.165 (14) : “පස්සේ ත්‍රී මා මඟින් ඔහුත් එක්ක සම්බන්ධ වෙලා මොනවාද කරන්න ඕනි වැඩ කියලා ඇහුවා. ලබන මාසේ එනම් අගෝස්තු 15 වන දින ඒ ගෙදරටම එන්න කියලා කිව්වා. එහේ යන විට සහරාන් හෂීම්, නවුෆර් මව්ලවි, මිල්හාන්, හස්තූන් ඊට අමතරව බුදු පිළිම කැඩීමට සම්බන්ධ වුනු මාවනැල්ල සාදික් කියන කෙනා ඔහුගේ අනුචර්ත නාමය අබූ උමර්, ෆිර්දවුස් කියලා කෙනෙකුත්, ගපූර් මාමා කියලා කෙනෙකුත් සහරාන්ගේ රියදුරා වන සාෆි මව්ලවි කියලා කෙනෙකුත් හිටියා. එහිදී සහරාන්ගේ ප්‍රධානත්වයෙන්

කාමරයක් ඇතුලත තොරතුරු සෙවීම සඳහා කණ්ඩායමක් පටන් ගන්නවා කියලා එම කණ්ඩායමේ නායකයා වශයෙන් මිල්හාන් ඔහුගේ අන්වර්ත නාමය අබූ සිලාහ් කියන කෙනාත් අපි හතර දෙනාත් ඔහුගේ යටතේ වැඩ කරන්න ඕනි කියලා කිව්වා. මිල්හාන් ලග කොළඹ 01 සිට 15 දක්වා ඇති සෑම මාර්ගයන් පිළිබඳවත් එම මාර්ගයේ පිහිටා තිබෙන නිවෙස්, ගොඩනැගිලි, මුස්ලිම් පල්ලි, කතෝලික දේවස්ථාන, කෝවිල්, පන්සල්, පොලිස් ස්ථාන, ත්‍රිවිධ හමුදා මූලස්ථාන පාසල් යන සෑම දෙයක් ගැනම විස්තර හොයන්න ඕනි කියලා කිව්වා. ඔහුගෙන් පෞද්ගලිකව විමසීමේදී මේ ගැන මොකටද කියලා අනාගතයේදී ලංකාවේ ප්‍රශ්ණයක් ආවොත් මේවා ඒ අයට වුවමනා වෙයි කියලා කිව්වා. පස්සේ වෙනම මට කොළඹ ආශ්‍රිතව දේශනා පැවැත්වීම සඳහා ගෙයක් බලන්න කියලත් කිව්වා. එදා දවසේ මට හතළිස් දහසක මුදල දීලා යැව්වා. සෑම මසකම 15 වන දින මාවනැල්ල අබ්දීන්ගේ ගෙදරට එන්න කියලා මං කරන වැඩට පඩිය ගන්න කියලා කිව්වා. ”

පැ.165 (15) : “මෙම වකවානුවල මිල්හාන් සහ බුදුපිළිම කැඩීමට මූලික වූ සාදික් කියන කෙනා විහාර මහා දේවි පාර්ක් එකට මට එන්න කියලා රිෂ්වින් ඉස්මත් කියලා කෙනෙකුගේ ෆේස් බුක්

ඡායාරූපය පෙන්වලා මෙයා ගැනත් තොරතුරු හොයන්න ඕනි කියලා කිව්වා. රිෂ්වින් ඉස්මත් එයාගේ ප්‍රොෆයිල් එකේ ඔක්තෝබර් මාසයේ දිනක උත්සෝණයකට සහභාගි වන බව දාලා තිබුණා. ඒ බව සහරාන්ටත් දැනුම් දීලා ඔක්තෝබර් මාසයේ ඒ උද්සෝෂණය පැවැත්වෙන ස්ථානයට මමයි, මිල්හාන්, මොහොමඩ් සාෆි, සාදික් මේ හතර දෙනාම එතනට ගියා. උද්සෝෂණය පැවැත්වුනේ බත්තරමුල්ල හන්දියේ. උද්සෝෂණය අවසන් වෙලා ඔහුව ෆලෝ කරගෙන යනකොට ඔහු ඇතුල් කෝට්ටේ යෝගා කරන නිවසකට ගියා. එම නිවස ෂර්මිලා කියන එක්කෙනෙක්ගේ නිවසක් කියා අපි දැනගත්තා. ඒ ෂර්මිලාවත් ෆලෝ කරන්න ඕනි කියලා මිල්හාන් අපිට කිව්වා. එම දවසේම රිස්වින් ඉස්මත් එයාගේ ගෙදරට යාමට බස් එකේ නැගලා මරදාන දෙවන මාලිගාකන්ද පාර ඇතුළට ගියා. ඔහු සමඟ සාදික් ද පිටිපස්සෙන්ම ගියා. එයා ඔහුගේ නිවස බලලා අපිටත් පෙන්නුවා. මිල්හාන් මට කිව්වා මීට පස්සේ ඔයත් මෙතෙන්ට ඇවිල්ලා බලන්න මෙයා කීයටද වැඩට යන්නේ මොනවද කරන්නේ කියලා විස්තර දැනගන්න කියලා. පස්සේ ඒ අය පිටත් වුණා. මේ අය මිට පෙර කියලා තිබුන වැඩ කරනව ද නැද්ද කියලා බලන්න මිල්හාන් මට වරින් වර ත්‍රී මා ඔස්සේ

කතා බහ කලා. මේ අය කියන වැඩ කරනවා කියලා පෙන්වන්න මම මේ අයට අන්තර්ජාලයේ තිබෙන සමහර විස්තර එනම් පොලිස් මූලස්ථාන, ත්‍රිවිධ හමුදා මූලස්ථාන, කොල්ලුපිටිය, මාලිගාවත්ත, ග්‍රෑන්ඩ්පාස්, බොරැල්ල යන ස්ථානවල පිහිටීම සහ එහි තිබෙන පොලිස් ස්ථාන වල තිබෙන විස්තර එයාට මම ලබාදුන්නා. නමුත් එයාට මම කරන වැඩ අසම්පූර්ණ කියලා එය කොහොමද කරන්නේ කියලා මට වරින් වර පැහැදිලි කළා. රිස්වින් ඉස්මත් ව ෆලෝ කරන වැඩත් මා එච්චර උනන්දුවෙන් කළේ නැහැ. එම නිසා ඔහු අහන සෑම විටම රිස්වින් ඉස්මත්ව මට මුණගැහීමට නොහැකි වුණා කියලා මම පිළිතුරු දුන්නා.''

පැ.165 (16) : ''මෙසේ සිටියදී සහරාන් හෂීම් විසින් අනෙක් සෑම වැඩක්ම නතර කරලා ඔහුට කොළඹ ගෙයක් බලන්න කියලා මට දැනුම් දුන්නා. එම ගෙදර මාසික කුලිය පනස්දාහකටත් හැටදාහකටත් අතර තියෙන්න ඕනි කියලත් ගේ වටපිටාව ආරක්ෂිතව තියෙන්න ඕනි කියලත් මට කිව්වා. එම ගෙවල් බැලීමේදී කතා බහ කිරීමට මට වෙනම සිම් පතක් දීලා තිබුණා. ඊට අමතරව ටෙලිග්‍රෑම් ඔස්සේ මා නොදන්නා කෙනෙක් විසින් මට ගෙවල් බැලීමට ඉක්මන් ඩොට් එල් කේ වෙබ් සයිඩ් එකේ ගෙවල් වල විස්තර මට එව්වා. එම ගෙවල්

වල අයිතිකාරයන්ට සහ බාරකරවන්ට ඒ අය දීපු සිම් එකෙන් මම කෝල් කරලා එම ගෙවල් බලන්න ගිහින් එම ගෙවල්වල ඡායාරූප සහරාන්ට යවන්න කියලා කියලා තිබුණා. මේ කාලයේ මීගමුව ජනපද මාවතේ තියෙන ගෙයක් ගාමිණී කියන භාරකරු විසින් සම්බන්ධ වෙලා එම ගෙදර සහරාන්ට ගන්න ඕනි කියලා සහරාන්ගේ රියදුරා වන මොහොමඩ් සාෆි සහ හස්තූන් යන අයව යවලා තිබුණො. මොහොමඩ් සාෆි අයිතිකාරයා වශයෙනුත් හස්තූන් සාක්ෂිකරුවෙකු වශයෙනුත් එම ගෙදර අවුරුදු දෙකකට කුලියට ගන්නා බවත් ලක්ෂ දෙකක මුදලක් මුල් වතාවට ගෙවන බවත් මාසික කුලිය පනස්දාහක් බවත් නීතීඥවරයෙකු මඟින් ලියාගත්තා. පස්සේ ඒ ගෙදරට දෙතුන් වතාවක් මොහොමඩ් සාෆි සහ ගපූර් මාමා යන අය බඩු රැගෙන ආවා. ඒ බඩු වල වොෂින් මැෂින්, ශීතකරණ, ප්‍රින්ට් කරන මැෂින්, ඒ ෆෝ කට්ටල, ප්‍රින්ටර්ස් වලට යූස් කරන කාබන් සහ තවත් බඩු රැසක් අරගෙන ආවා. එනකොට සෑම වෙලාවකම මට ඒ ගෙදරට එන්න කියලත් ඒ ගෙදර ඒ අයට ඇරලා දෙන්න කියලත් සහරාන් කිව්වා. ඒ ගෙදර ගත්තට ඒ අයගේ කවුරුත් ඒ ගෙදර පදිංචියට ආවේ නැහැ. සතියකට සැරයක් ඒ ගෙදර අස්කරන්න කියලා මට තමයි කියලා තිබුණේ. ”

පැ.165 (17) : ‘‘මෙසේ ඉන්න කොට මිල්හාන් සහ මොහොමඩ් සාෆි මරදාන පුංචි පල්ලිය ගාවට එන්න කියලා සහරාන්ගේ මල්ලිට අනතුරක් වෙලා කියලත් ඔහුව මහ ඉස්පිරිතාලේ ඇඩ්මිට් කරලා කියලත් කිව්වා. ඔහුට උදැසනට සහ හවසට කෑම අරන් එන ලෙසත් කියලා තිබුණා. ඒ සඳහා අවශ්‍ය කරන මුදල් ද මට දීලා තිබුණා. කෑම අරන් යන කොට ගෆූර් මාමා මරදානේ පුංචි පල්ලිය ගාව තියෙන පොඩි ලොජ් එකක නැවතිලා ඉදලා එළියට ඇවිල්ලා තමයි මගෙන් කෑම එක අරන් යන්නේ. පසුව ගෆූර් මාමාගෙන් තමයි ඔහු බෝම්බයක් අත්හදා බැලීමේදී අනතුරට ලක්වුණා කියලා සහ මහ ඉස්පිරිතාලෙට කියලා තියෙන්නේ ගෑස් සිලින්ඩරයක් පිපිරිලා අනතුරට ලක් වුණා කියලත් මට කිව්වා. පරණ වැඩ ටික එහෙමම මට අතපසු වුණා කියලා මම මිල්හාන් ට මම දැනුම් දුන්නා. ඒකට කමක් නැහැ කියලත් රිස්වින් ඉස්මත් ව මුණගැහුණද කියලත් මගෙන් ඇහුවා. ඒකට මම නැහැ කියලා කිව්වම කමක් නැහැ දැනට මීගමුව ගෙදරත් කොළඹ මොකක් හරි වැඩක් සහරාන් මව්ලවි කිව්වොත් කරන්න කියලා මට කිව්වා. රිස්වින් ඉස්මත් සහ ෂර්මිලා කියන්නේ කවුද කියලා මම අහනකොට මේ අය ඉස්ලාම් ආගමෙන් බැහැර ගිය අය කියලා කිව්වා. ඒ අය ඉස්ලාම් ආගමට එරෙහිව ෆේස්බුක්

එකේ කටයුතු කරන නිසා ඔවුන්ව ඝාතනය කරන්න ඕනි කියලා තමයි අපි ඔයාට ඒ අයගේ තොරතුරු හොයන්න කිව්වේ කියලා කිව්වා.''

පැ. 165 (18) : ''පස්සේ සහරාන් හෂීම් විසින් එක්ලක්ෂ තිස්දාහක මුදලක් මට දෙන්න කියලා ඒ මුදලින් මට යතුරු පැදියක් අරගන්න කියලත් මිල්හාන්ට කියලා තිබුනා. ඒ අයගේ දැනුම්දීම පරිදි කුරුණෑගල නුහා මෝටර්ස් කියන තැනින් පල්සර් 135 කියන යතුරුපැදිය මිලදි ගත්තා. එහි අංකය බී ඒ කිවු 2008. මෙම යතුරු පැදියෙන් තමයි මින් පස්සේ මේ අය කියන හැම වැඩක්ම මට කරන්න කියලා තිබුනේ. දවසක් සාජිත් මව්ලවි කියල කෙනෙක්ව කොල්ලුපිටිය බස් නැවතුම්පොලින් එක්කගෙන ගිහින් කුරුණෑගල කුලියාපිටිය බස් නැවතුම්පොලට හැරලවන්න කියලා කිව්වා. ඒ වගේම මම එයාව එක්කගෙන ගියාට පස්සේ එතනට ත්‍රීවිල් එකක දෙන්නෙක් ඇවිල්ලා ඔහුව ඇතුළට අරන් ඔහුගේ ඇස් දෙක බැදගෙන යනවා මම දැක්කා. පස්සේ මම එතන ඉදන් බයික් එකේ ගෙදරට ආවා.''

පැ.165 (19) : ''පසුව 2019 ජනවාරි මාසයේ මිල්හාන් මට ත්‍රී මා මඟින් කෝල් කරලා රුපියල් දහදහසක මුදලක්

මට දීලා එම දහදාහේ මුදලින් එයාගේ තාත්තාට අවශ්‍ය කරන වොෂින් මැෂින් සර්කිට් වගයක් පිටකොටුවෙන් ගන්න කිව්වා. එයාගේ දැනුම් දීම පරිදි පිටකොටුව කයිසර් වීදියේ වොෂින් මැෂින් උපාංග විකුණන කඩයක ඔහු ඉල්ලපු XN 999 යන වර්ගයේ වොෂින් මැෂින් සර්කිට් පලවන වතාවට තුනකුත් දෙවන වතාවට 6 කුත් මිලදී ගත්තා.''

පැ.165 (20) : **''මා මිලදී ගත් සර්කිට් ටික එයා ගන්න එනවා කියලා පිටකොටුව බංගසාලා වීදියට මට එන්න කිව්වා. එතනට පැමිණ මගේ සර්කිට් ටික ඒ අය අරගෙන එයා සමඟ ආපු ගපූර් මාමා, හස්තූන් මේ අය එක්කරගෙන තවත් කඩවල් රැසකට ගියා. එහි බංගසාල වීදියේ රසායනික ද්‍රව්‍යවලට භාවිතා කරන බීකර් සහ එයට අදාළ යම් යම් දේවල් මිලදී ගත්තා. මෙවා මිලදි ගත්තේ මිල්හාන් සහ හස්තූන් සාකච්ඡා කරමින්. පසුව පලවන හරස් වීදියේ ට්‍රාන්ස් ඒෂියා කියන ෂොප් එකට ඉස්සරහා වයර් ස්වීච්** මිලදි ගන්නා ස්ථානයකට ඒ අය ගියා. එතනත් මිල්හාන් ස්විච් වර්ග කිහිපයකුත් වයර් වර්ග කිහිපයකුත් මිලදි ගත්තා. පසුව ඔවුන් පැමිණ තිබෙන වෑන් රථය ගෑස් පහ හන්දියේ තියෙනවා කියලත් ඔවුන් ඒකට පොහොර වගයක් පටවනවා කියලත් මට යන්න කිව්වා.''

පැ.165 (21) : ‘‘පසුව දෙසැම්බර් මාසය වන විට බුදු පිළිම වලට හානි කරපු මොහොමඩ් ඉබ්‍රහිම් මොහොමඩ් සාදික් ඔහුගේ අන්වර්ත නාමය අබූ උමර් සහ ඔහුගේ බිරිඳත් දරුවන් සහ ඔහුගේ මල්ලී වන මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමඩ් ෂාහිඩ් හක් එනවා කියලා ඒ අයට අවශ්‍ය කරන කෑම මට අරගෙන එන්න කියලත් සහරාන් විසින් මට දැනුම් දුන්නා. බුදු පිළිම කැඩීමෙන් පසුව ඔවුන් එම ගෙදර සැගවීමට භාවිතා කරල තියෙනවා කියලා මම වටහා ගත්තා. ඊට අමතරව එම ගෙදරට සහරාන් හෂීම් සහ ඔහුගේ කණ්ඩායමේ අය මෙහෙ ඇවිල්ලා නවාතැන් පහසුකම් අරගෙන යන බවත් මම තේරුණා.’’

පැ. 165 (22): ‘‘බුදු පිළිම කැඩීමෙන් පසුව එයට අදාළව අත්අඩංගුවට ගත් සැකකරුවන් රැගෙන එන බන්ධනාගාර බස් රථය බලන්න ඕනි කියලා මාව දවසක් මිල්හාන් සහ සාදික්ගේ දැනුම් දීම පරිදි මාව මාවනැල්ල උසාවියට යන්න කිව්වා. එම බන්ධනාගාර බස් රථයේ කී දෙනෙක් එනවා කියලත් කුමන මාර්ගයේ යනවා කියලත් ඒ අය ත්‍රී මා ඔස්සේ මගෙන් විස්තර ගත්තා. පසුව මිල්හාන් සහ සහරාන් එකට ඉදලා කතා කරන කොට මේ අය එම බස් රථයට ගහලා සැකකරුවන් මුදවා ගැනීමට කටයුතු කරනවා කියලා මම දැනගත්තා. පස්සේ ජනවාරි මාසය අවසානය ලඟා වන විට වනාතවිල්ලුව

ප්‍රදේශයේ සහරාන්ගේ කඳවුරක් පොලිසියට අහුවෙලා කියලා මම මාධ්‍ය ඔසේස් දැනගත්තා. එම අවස්ථාවේ සහරාන් මා විසින් ගත් මීගමුව ගෙදර අසල හිටියේ පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවන් බැවින් ඔවුන් මාර්ගයෙන් සහරාන් පොලිසියට හසුවෙයි කියා බයෙන් එම ගෙදර නැවතත් අයිතිකාරයටම බාර දෙන්න ඕනි කියලා කිව්වා. මේ වන විටත් සෑම මාසයේම රුපියල් හතළිස් දාහේ පඩිය මිල්හාන් විසින් මට භාර දුන්නා. ඔවුන් ලබා දුන් දුරකථන හරියාකාරව වැඩ නොකිරීම නිසා මම මිල්හාන්ට ඒ බව දැනුම් දුන්නා. ඔවුන් ලබා දුන් දුරකථනය ෆෝමැට් කරලා මල්වාන පිහිටි ගෙදරකට ඔහු මට එන්න කිව්වා. එහිදී මගේ දුරකථනයට ත්‍රීමා ඇප් එක සහ ලොකර් ඇප් එක දාලා ඊට අමතරව වෙනම මුදල් තිස්පන්දාහක් දීලා වයිෆයි ප්‍රයිම් කියන ජංගම දුරකථන දෙකක් මිලදී ගන්න කියලා කියලා තිබුණා. ඒ අයගේ කීමට අනුව කොල්ලුපිටියේ ලිබර්ටි ප්ලාසා ජංගම දුරකථන කඩයක වයිෆයි ප්‍රයිම් ෆෝන් දෙකක් මිලදී ගෙන ඒ අයට දුන්නා. පසුව දවසක් තව ගෙයක් හොයන්න ඕනි කියලා වෙනම සිම් පතක් එයට භාවිතා කරන්න ඕනි කියලා ආමර් වීදියේ ෆාතිමා ඉස්කෝලය ඉදිරිපිට ට මට සහරාන් යන්න කිව්වා. එතනට කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරුණු මුබාරක් කියන

පුද්ගලයා සිම් පතක් මට භාර දුන්නා. එම සිම් පත භාවිතා කරලා කොළඹ අවට තවත් ගෙයක් බලන්න කියලා සහරාන් කිව්වා. ඒ වෙලාවේ මාගේ ගෙදරට පොලිසියෙන් මහත්තයෙක් ඇවිල්ලා තාත්තා කොහේද කියලා ඇහුවා. මගේ තාත්තා මාලිගාවත්ත ලොකු පල්ලියේ පිරිසිදු කිරීම් කරන සහ බාංකු කියන වැඩ කරන කෙනෙක් කියලා කිව්වා. ඒ නිසා එම පොලිස් නිලධාරියාට පල්ලියට ගියොත් මුණගැහෙන්න පුලුවන් කියලා කිව්වා. එම නිලධාරියා මගේ සම්පූර්ණ නම සහ ලිපිනය තහවුරු කලාට පස්සේ පිටරට යන්න අදහසක් තියෙනවාද කියලා ඇහුවා. මම එයට නැහැ කියලා පිළිතුරු දුන්නා. මේ වන විටත් මම සහරාන් ගාව වැඩ කරනවා කියලා අම්මා තාත්තා දන්නේ නැහැ. සංචාරකයින්ට මග පෙන්වනවා කියලා තමයි මම අම්මා තාත්තාට කියලා තිබ්බේ. පසුව එම නිලධාරියා දැන් කරන රැකියාව මගෙන් ඇසූ විට මම කිසිම රැකියාවක් නැතුව අලුත් රැකියාවක් හොයමින් ඉන්නවා කියලා කිව්වා. පසුව එම නිලධාරියා ගෙදරින් පිටත් වුණා. මම මේ සිද්ධිය සහරාන්ට කිව්වේ පොලිසියෙන් ගෙදරට ඇවිල්ලා අම්මා තාත්තා සහ මාව විමර්ශණය කරලා ගෙදර සෝදිසි කළා කියලා. ගෙදර අවට ද මාව ෆලෝ කරනවා කියලා මට හැගෙනවා කියලා සහරාන්ට

ත්‍රී මා මඟින් පණිවිඩය යැව්වා. එයට පිළිතුරක් වශයෙන් සහරාන් එහෙනම් මින්පසුව ඔයා මාගේ කිසිම වැඩකට එන්න ඕනි නැහැ. එහෙම අත්‍යාවශ්‍ය වුනොත් විතරක් මම කෙනෙකුගේ මාර්ගයෙන් පණිවිඩය යවන්නම් කියලා කිව්වා. මීගමුව ගෙදරේ යතුර මං ගාව තිබෙන නිසා ඒ ගෙදර යතුර භාරදීමට අබු තාරික් එනම් රිස්කාන් කියන පුද්ගලයෙක් යවලා තිබුණා. මීගමුව ගෙදර අයිතිකාරිය පිට්ට ඉදලා ඇවිල්ලා එම ගෙදර බලන්න ඕනි කියලා මට දැනුම් දුන්නාම මම එම ගෙදර යතුර අරගෙන මීගමුව ගෙදරට ගොස් රිස්කාන් කියන පුද්ගලයාව ගෙදර අයිතිකාරියට පෙන්වලා දීලා ඔහුගේ දුරකථන අංකයත් අයිතිකාරියට දීලා මින් පසුව ඔහු සමඟ සම්බන්ධකම් පවත්වන ලෙසත් මට කෝල් කරන්න එපා කියලත් මම කිව්වා. සහරාන්ගේ යතුරු පැදිය ඔහු ඕන වෙලාවට ගන්නවා කියලත් දැනට තියාගන්න කියලත් කිව්වා. මොවුන්ගෙන් ඈත් වුනාට පසුව මම මගේ යාලුවා වන හසන්ට දැනුම් දුන්නේ රැකියාවක් නැහැයි කියලා. හසන්ව දන්නා යාලුවෙක් මාර්ගයෙන් පික්මී ආයතනයේ කෑම බෙදාහැරීමට රැකියා තියෙන බව දැනගෙන සහරාන් දුන් යතුරුපැදිය භාවිතා කරමින් එම රැකියාව මම කරගෙන හිටියා.”

පැ.165 (23): ‘‘නමුත් මාර්තු මාසයේ 25 වන දින කොච්චිකඩේ මරාගෙන මැරුණු මුආත් කියන පුද්ගලයා මාගේ සහ හසන්ගේ ගෙදරට ඇවිල්ලා සහරාන් මව්ලවිට සහ නවුෆර් මව්ලවි අතර ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා කියලත් ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට ඕගොල්ලන් දෙන්නම ගල්කිස්ස දුම්රිය පලට වෙන වෙනම එන්න කියලා කියලා තියෙනවා කියලා අපට කිව්වා. සහරාන් ගාව වැඩ කලා බව සහ ඔහුගෙන් අයින් වුණා කියලත් හසන් දන්නේ නැහැ. මං දන්න තරමට හසන් සම්බන්ධ වෙලා තිබුණේ අන්තිමට අරුප්පල දේශනාවේදී තමයි. මේ කිසිවක් එයාට දන්නේ නැති නිසා එයා සමග මුආත් කියන තැනට මං එන්නම් කියලා මුආත් සහරාන්ට කියන්න කියලා කිව්වා. ඒ වන විටත් මගේ හිතේ සැකේ තිබුනේ සහරාන් සහ නවුෆර් යන අය දෙන්නම හොඳ මිතුරන් බැවින් ඔවුන්ට ප්‍රශ්නයක් මත වීමට ඉඩ නැහැ කියලා තමයි.’’

පැ.165 (24): ‘‘මාර්තු 27 වන දින ඒ අය කිව්වා වගේම ගල්කිස්ස දුම්රිය පල අසලට අපි දෙන්නම ගියා. එම දුම්රිය පල අසල සුදු පාට වෑන් රථයක මුආත් සහ මුබාරක් (කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරුණු), ජමීල්, ඉන්ෂාෆ් ඉෆ්තිකර් යන අයත් ඇවිල්ලා හිටියා. එම වෑන් රථයෙන් අපිවත් දාගෙන පානදුර ගෙදරකට අපිව අරන් ගියා. එම ගෙදර සහරාන් සහ හස්තූන්

යන අය හිටියා. එම ගෙදර සහරාන් මාව පළවෙනි වතාවට දකිනා සේ මගේ නම ඔහු ඇහුවා. මම එයාට පිළිතුරු දුනනයින් පසුව හැමෝගෙම නම් ටික ඔහු අහගෙන එම ගෙදර සාලයේ වාඩිවෙන්න කිව්වා. එයා අපිව එම තැනට රැගෙන ඒමට හේතුව කියන්න පටන් ගත්තා. එයා එතනදී සහරාන් එයාගේ නායකත්වයෙන් අයින් වෙන බවත් නවුෆර් මව්ලවිව දෙවන නායකයා බවටත් පත් කරලා තියෙනවා කියලා කිව්වා. සහරාන් ඇතුළු විසිදෙනෙක් ප්‍රහාරයක් කරන්න යනවා කියලා එම ප්‍රහාරයට ඔයගොල්ලන් පස් දෙනත් අනිවාර්යයෙන් සහභාගී වෙන්න ඕනි කියලා කිව්වා. එම ප්‍රහාරය කරන්න හේතුව නවසීලන්තයේ මුස්ලිම් පල්ලියකට කතෝලික කෙනෙක් කරපු ප්‍රහාරයට පළිගැනීමක් වශයෙන් ද සිරියාවේ අයි එස් අයි එස් සංවිධානයට පිටරටවල් ප්‍රහාර එල්ල කිරීමට පළිගැනීමක් වශයෙන් කරන්න යනවා කියලා කිව්වා. සෑම ප්‍රහාරයක්ම එකම දවසේ කරන බවත් එම ප්‍රහාරයන් කරන ස්ථාන සහරාන් දැනුම් දෙන බවත් එම ප්‍රහාරයන් වලට සුදුසු ස්ථාන වශයෙන් සංචාරකයින් පැමිණෙන කැෆිනෝ, හෝටෙල්ස්, සහ කතෝලික දේවස්ථානත්, බුදු පිළිම කැඩීමේ සිද්ධියට අත්අඩංගුවට පත් සැකකරුවන්ට ඇප නොදුන් පොලිසිය වන

කෑගල්ල පොලිසියටත් ගහන්න ඕනි බව කියලා කිව්වා. ඒ අවස්ථාවේ මෙය අල්ලාහ් වෙනුවෙන් කරන්න යන බවත් මගදී සාතාන් විසින් ඔබගේ පවුලේ කට්ටියව හෝ ඕගොල්ලන් ආදරය කරන කාව හරි මතක් කළහොත් එය අයින් කර මෙම සියයට සීයක්ම ආගම වෙනුවෙන් දිවි පූජා කිරීම කියලා හිතාගෙන කරන්න ඕනි කියලා කිව්වා. ඒ අවස්ථාවේ ජමීල් සහ මුආත් සංතෝෂයෙන් අඩන්න පටන් ගත්තා. පසුව මුආත් විසින් කොච්චිකඩේ දේවස්ථානය ගැන ඔහු විස්තර දන්නවා කියලා ඔහු සහරාන්ට කිව්වා. ඒ වෙලාවේ ඔගොල්ලන් ස්ථාන බලන්න අවශ්‍ය නැහැ. අපි බලල ඕගොල්ලන්ට දැනුම් දෙනවා කියලා මුආත්ට කිව්වා. මේ අවුරුද්දේ රාමලාන් උපවාසය ඕගොල්ලන්ට ලැබෙන්නේ නැහැ. අද සිට ඕගොල්ලන්ගේ කාලය පටන් ගන්නවා කියලත් සහරාන් කිව්වා. මෙම බෝම්බය හදන්නේ එයාගේ මල්ලී වන (සායින්දමරුදු වල මරාගෙන මැරුණු) රිල්වාන් බව කිව්වා. එම බෝම්බය පරීක්ෂා කිරීමේදී ඔහුට අනතුරක් සිදුවුණා කියලත් එම බෝම්බය තත්පරයට මීටර් 400 ක බලයක් තියෙනවා කියලත් සහරාන් කිව්වා. ඊට අමතරව බෑගයක දාගෙන යනවා කියලා තමයි දැනට තීරණය කරගෙන තියෙන්නේ කියලා කිව්වා. මෙම බෝම්බය සාදන

ආකාරය වීඩියෝවක් පටිගත කරලා කණ්ඩායමේ දෙවන නායකයා වන නවුෆර් මව්ලවි ට භාරදෙනවා කියලා කිව්වා. බංගලාදේශයේ මෙවැනි ප්‍රහාරයක් මීට කලින් කරලා තියෙනවා කියලත් එම ප්‍රහාරය බංගලාදේශයේ හිටපු නායකයා විසින්ම කරගෙන ඇති බවත් ඒ වගේම ප්‍රහාරයක් තමයි සහරාන් කරන්න යන්නේ කියලා කිව්වා. මෙම ප්‍රහාරයට දවස් තුනකට කලින් අපි ඕගොල්ලන්ව අපේ ස්ථානයකට ගන්නවා කියලත් ප්‍රහාරයට කැමති වුණත් නැතත් ඒ අයගේ ස්ථානයට එනන් ඕනි කියලත් මෙම ප්‍රහාරය ගැන මොකක් හරි තොරතුරක් එළියට ගියොත් අපි ඝාතනය කරන්න ඕන වුණත් ඒ අය හිතන්නේ නැහැ කියලා කිව්වා. එයට අදාළව කබීර් හෂීම් තුමාගේ ලේකම්වරයාට වෙඩි තියලා තියෙනවා කියලත් කාත්තන්කුඩියේ බාවා කියලා කෙනෙක්ව ඝාතනය කරලා තියෙනවා කියලත් පොලිසියේ දෙදෙනෙක්ව ඝාතනය කරලා තියෙනවා කියලත් එතනදී අපට කිව්වා. මෙම බෝම්බ සෑදීමට යොදා ගත් පොත් කට්ටලයක් කටාර් වල ඉදලා පැමිණි පුද්ගලයෙකුගෙන් තමයි මේ අයට ලැබිලා තියෙන්නේ කියලා කිව්වා. ඔවුන් එය ඝාදලා දවස් 15 කින් එක්ස්පයර් වෙනවා කියලත් ඊට කලින් එය භාවිතා කරන්න ඕනි කියලත් කිව්වා. පසුව එම ගෙදරින්

අපිට යන්න කියලා ඊළඟට මොනවද කරන්න ඕනි කියලා මුඅාත්ගේ මාර්ගයෙන් කියන්නම් කියලත් අපට කිව්වා. මමයි හසනුයි ඒ අයගේ වැන් එකෙන් දෙහිවල ඉදන්ම බැහැලා ගෙදරට ත්‍රීවීල් එකක ගියේ. ඒ යන කොටත් අපි අතර ලොකු ගැටලුවක් මතු වෙලා තිබුණා. එය අපිව පරීක්ෂා කිරීමට මෙවැනි දෙයක් කියනවාද නැතුව ඇතත්ටම කියනවාද කියලා. පසුව මම හසන් ට කිව්වා මේ අය ආයෙත් කතා කරනකම් අපි ආයෙත් කතා කරන්න ඕනි නැහැ. අපි අපේ පාඩුවේ ඉමු කියලා.''

පැ. 165 (25) : ''නමුත් මුඅාත් හසන්ටත් මටත් මාර්තු 30 වන දා උදෙන්ම නුවරඑළිය යන්න ඕනි කියලා අපි දෙන්නටම සහරාන් කියලා තියෙනවා කියලා කිව්වා. ඔහු කිව්වේ දවස් දෙකක් එහෙ ඉදලා එහි තත්වය බලලා මුඅාත්ට කියන්න කියලයි. නමුත් අපි ගාව සල්ලි තිබුණේ නැති නිසා අපි දවසකින්ම බලලා එමු කියලා තීරණය කළා. අපි කරන වැඩ හරියට කරනවාද නැද්ද කියලා බැලීමට මුඅාත්ව දාලා තියෙනවා කියලා මුඅාත් කිව්වා. කරන්න දෙයක් නැතුව රුපියල් පන්දහසක මුදලක් එකතු කරගෙන මගේ බයික්එකෙන් හසන්වත් දාගෙන නුවරඑළියට ගියා. 30 වනදා උදේ නුවරඑළියට ගිහින් එහි පල්ලියේ නිදාගෙන දහවල් වෙනකොට කෑම අනුභව

කිරීමෙන් පසුව හවස 4 වෙනකම් එහි තිබෙන ගෙගරි ඔය ස්ථාන බලලා දම්රෝ තේ ෆැක්ටිරිය ගාව එතනත් බලලා අපි නිවෙස් වෙතට පිටත් වුණා. හසන් ද ඔහුගේ බිරිඳට කියලා තිබුණේ වැඩට යනවා කියලා. එහිදී හසන්ගේ යාලුවෙක් අපිට හමුවුනා හසන් සමඟ කතා බහ කරලා ගියා. මුආත්ට මේ ගැන දැනුම් දෙන කොට එහි සංචාරකයින් ඉන්නවාද කියලා ඇහුවා. එහි සංචාරකයින් හිටියත් අපි දෙන්නම මුආත්ට කිව්වේ එහි සංචාරකයින් එක්කෙනෙක් දෙන්නෙක් වගේ තමයි ඉන්නේ කියලා. අප්‍රෙල් මාසය පටන් ගැනුනු නිසා නුවරඑළිය ප්‍රදේශයේ මුස්ලිම් කට්ටිය වැඩියෙන් ඉන්නවා කියලා අපි දෙන්නම මුආත්ට බොරු තොරතුරක් දුන්නා. ඉන් පස්සේ මුආත් අපිට වෙන තැනක් බලනවා කියලා පස්සේ සම්බන්ධ වෙනවා කියලා කිව්වා. මේගොල්ලන්ගෙන් නැවතත් වෙන්වීම සඳහා මම හසන්ට කිව්වා එයාගේ දුරකථනය විකුණලා දාන්න කියලා. ඔහු භාවිතා කරන සිම්පත භාවිතා කරන්නේ නැතුව වෙන සිම් පතක් භාවිතා කරන ලෙසත් මම කිව්වා. ”

පැ.165 (26): “අප්‍රේල් මාසයේ 5 වන දින වගේ මුආත් මගේ ගෙදරටම පැමිණිලා මාත් එක්ක කතා කරන්න ඕනි කියලා කිව්වා. ඔහුව දැකලා මට තනියෙන් කතා කරන්න බය නිසා හසන් සමඟ

කතා කරමු කියලා හසන්ගේ මාමාගේ ගෙදර ගාවට මුආත්ව එක්කගෙන ගියා. එතනට ජමීලුත් ආවා. ඔවුන් දෙදෙනා අපි දෙදෙනාගෙන් ඇයි කිසිම සම්බන්ධවීමක් නැත්තේ කියලා ප්‍රශ්න කරන්න පටන් ගත්තා. හසන්ට හදිසියේම මුදල් අවශ්‍ය නිසා තමයි ඔහුගේ දුරකථනය විකුණලා තියෙන්නේ ඒ නිසයි අපිට සම්බන්ධ වෙන්න මාර්ගයක් නැහැ කියලා කිව්වා. පස්සේ ප්‍රහාරයට එනවා වුණත් නැති වුණත් ඕගොල්ලන් අපිට වේලාසිනින්ම කියන්න ඕනි කිව්වා. බැහැ කියලා කිව්වොත් අපිව ඒ අයගේ යටතේ ගන්නවා කියලා බයෙන් අපි එහෙම කිසිම දෙයක් පෙන්නුවේ නැහැ. අපි අතර පොඩි ගැටලුවක් තියෙනවා කියලා තමයි කිව්වේ. මුආත්ගේ ත්‍රීමා ඇප් එකේ අයිඩී එක මම අරගෙන මං කිව්වා එයාට ඕගොල්ලන් දැන් යන්න. මම පස්සේ ඕගොල්ලන්ට කතා කරන්නම් කියලා. අපි දෙදෙනාට මොනවද කරන්න ඕනි කියලා දන්නේ නැතුව කාලයක් අපි නිකන් හිටියා.”

පැ.165 (27) : “පසුව අප්‍රේල් 19 වන දින මේ අය අපට කතා බහ කරලා සති දෙකක් පසුවන නිසා මේ අය මුකුත් කරන්නේ නැහැ කියා හිතමින් අපි මේ මුආත්ගේ ත්‍රීමා අයි ඩී එකට අපි සදාකාලිකව ඕගොල්ලන්ගෙන් අයින් වනවා කියලා සහ අපෙන් කිසිම අනතුරක් වෙයි කියලා බයවෙන්න එපා කියලා

වොයිස් පණිවිඩයක් මාගේ පරණ ජංගම දුරකථනයකින් ත්‍රීමා ඇප් එකෙන් දැනුම් දුන්නා.''

මෙම ප්‍රකාශය 11 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙන ප්‍රකාශයක් බවට අප විසින් දැනටමත් තීරණය කර ඇත. තවද මෙම ප්‍රකාශයෙහි මෙම නඩුව හා සම්බන්ධ වෙනත් පුද්ගලයෙන්ගේ නම් සඳහන් කර ඇතද, අප විසින් සළකා බලනුයේ මෙම චූදිතට අදාළ කරුණු සම්බන්ධයෙන් පමණි. එහිදී ඔහුගේ ප්‍රකාශයේ ඉහතින් දක්වා ඇති 165(5) මගින් ෂැංගිලා හෝටලයේ මරාගෙන මැරුනු ස්වයංඝාතක බෝම්බකරු වන ඉල්හාමි කොච්චිකඩේ දේවස්ථානයේ මරාගෙන මැරුනු ඉල්හාම් සමඟ එකතු වී කටයුතු කල බවටත් එසේම මෙම නඩුවෙහි 01 චූදිත වන නවුෆර් මවුලවි සම්බන්ධයෙන්ද ඔහු මෙම නඩුවට අනිකුත් පුද්ගලයන් සම්බන්ධයෙන්ද මනා දැනීමක් තිබී ඇති බව පෙනී යයි. මහනුවර අරුප්පල පැවැති පුහුණු සැසියට සහභාගී වූ බවත් විශේෂයෙන්ම මෙම නඩුවේ සොයා ගන්නා ලද පිපිරුම් උපකරණ වලට අදාළ පරිපථ සොයා ගැනීම සම්බන්ධයෙන්ද සහ කටුවාපිටිය ප්‍රදේශයේ ආරක්ෂිත නිවාස කුලියට ගැනීම සම්බන්ධයෙන්ද ඔහු සම්බන්ධ බවට කියා සිට ඇති කරුණු විමර්ශන නිලධාරීන්ගෙන්ද අදාළ වෙළඳ ආයතන වල හිමිකරුවන්ගේ සාක්ෂි වලින්ද, කුලියට ගනු ලැබූ නිවාස වල නිවෙස් හිමිකරුවන්ගේද සාක්ෂි මගින් සනාථ වී ඇත. ඒ අනුව ඔහු මෙම අපරාධ නඩු විධාන සංග්‍රහ

පනතේ 127(1) ප්‍රකාශයේ සඳහන් කරුණු මත ඔහුට විරුද්ධව ඇති චෝදනා සළකා බැලීමට අප තීරණය කරමු.

15 වන චූදිත වන මොහොමදු හනීෆා සෙයිනුල් ආබ්දීන් විසින් පැ.සා.2140 රත්නසිංහ රාජකරුණා ජයකොඩිගේ උපුල් ටිකිරි කුමාර රාජකරුණා සාක්ෂිකරුට අ.න.වි.ස. 127 (1) වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති පැ.178 ලෙස ලකුණු කර ඇති ප්‍රකාශය ඇසුරින් ලකුණු කර ඇති කරුණු.

මෙම නඩුවට අදාළ පැ.සා.2140 රත්නසිංහ රාජකරුණා ජයකොඩිගේ උපුල් ටිකිරි කුමාර රාජකරුණා යන සාක්ෂිකරු යලි අධිකරණය ඉදිරියේ සාක්ෂි දීමට කැඳවා පැමිණිල්ලෙන් පෙර අවස්ථාවක තාවකාලිකව C.01, C.03 සහ C.02 A යන ලේඛනවලින් C.1 වශයෙන් තාවකාලිකව ලකුණු කරන ලද මොහොමඩ් හනීෆා සෙයිනුල් ආබ්දීන් යන 15 වන විත්තිකරු විසින් 2019.09.26 වන දින ලබා දී ඇති ප්‍රකාශයට අදාළ ලේඛනය පැ.174 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත.C.2 (A) වශයෙන් තාවකාලිකව ලකුණු කර ඇති ලේඛනය පැ.178 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත.ඒ අනුව C.3 වශයෙන් පෙර අවස්ථාවක දී තාවකාලිකව ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනය පැ.176 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත.

2019.09.26 වන දින 15 වන චූදිත විසින් අ.න.වි.ස.127 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයක් ලබා දීම මුලින්ම සිදු කර ඇති අතර පසුව 2019.10.18 දිනද අවසාන වශයෙන් 2019.11.01 දින දක්වා අදාළ ප්‍රකාශය කිරීම සිදු කර ඇති අතර ඒ අනුව දින 03 ක් තුළ 15 වන චූදිත විසින් අවස්ථා 03 කදී ඉහත පරිදි ලබා දී ඇති ප්‍රකාශයන් වෙන වෙනම සළකා බැලීම සිදු කළ යුතු අතර ප්‍රථමයෙන්ම 2019.09.26 දිනට අදාළව ලබා දී ඇති පැ.174 ලෙස ලකුණු කර ඇති ප්‍රකාශයෙහි අධිකරණය ඉදිරියේ ලකුණු කර ඇති අන්තර්ගතයන් පහත පරිදි වේ.

පැ.174. (i).: ‘‘මම මාවනැල්ලේ ඉද්දි රිස්වාන්, රිස්වි කියලා දෙදෙනෙක් හම්බ වුණා. එයාලත් එක්ක යාළුවෙලා ඉද්දි එයාලා මට කිව්වා සහරාන් කියලා කෙනෙක් ඉන්නවා කියලා කිව්වා. පසුව 2016 දෙසැම්බර් මාසයේ දී කාත්තන්කුඩියට ට්‍රිප් එකක් යන් කියලා පස්සේ අපි ගියා. ඒ ගිහිල්ලා සහරාන්ගේ පල්ලියට ගිහිල්ලා එදා රෑ එහේ ඉඳලා රෑ කෑම කෑවට පස්සේ සහරාන්ගේ පල්ලිය පිටිපස්සේ සහරාන්ගේ යහළුවෙක්ගේ ගේක දාලා තිබෙනවා CD එකක්. ඒක පිටරට යුද්ධයක් ගැන කියන එකක්. ඒක බලන්න ගියා. අරාබි භාෂවෙන් තිබ්බේ. CD එක බලන ගමන් මුළු ලෝකෙන්ම මුස්ලිම් කට්ටියට තමයි ප්‍රශ්නේ කියලා එයාලා අපිට කිව්වා. පස්සේ ඒක බලලා

සහරාන්ගේ පල්ලිය ඇතුලේ නිදා ගෙන ඉඳලා පහුවදා කෑම එහෙම කාලා දවාලේ ගමට ආවා.''

පැ.174 (ii) : ''ආවට පස්සේ මාසයකට විතර පස්සේ සහරාන් මවුලවී එනවා කියලා රිස්වාන් රිස්වි මට කිව්වා. සහරාන්ලා දෙල්ගහගොඩ පල්ලියට තමයි ඇවිත් හිටියේ. මටත් එන්න කියලා මමත් ගියා. එදත් යුද්ධ CD එකක් ගෙනල්ලා පෙන්නුවා. මමයි, රිස්වාන්, රිස්වි සහ තවත් තුන් දෙනෙක් හිටියා.''

පැ.174 (iii): ''2017.06 මාසේ විතර දිනය මට හරියට මතක නැහැ. රිස්වාන් කිව්වා දෙල්ගහගොඩ පල්ලියට සහරාන් මවුලවී තව තුන්දෙනෙක් ඇවිල්ලා ඉන්නවා. මට එන්න කිව්වා. රිස්වාන් යාළුවා නිසා මමත් ගියා. එතන ගිහිල්ලා ඉන්නකොට කාත්තන්කුඩියේ මොකක් හරි ප්‍රශ්නයක් වෙලා ඇවිත් ඉන්නේ කියලා සහරාන් රිස්වාන්ට කිව්වා. මමත් එතැන හිටියා. පස්සේ දවස් දෙකකට විතර තැනක් ඇහුවා නතර වෙන්න. පස්සේ රිස්වාන් කිව්වා නතර වෙන්න තැනක් නැහැ කියලා. ඒත් සහරාන් මවුලවී කිව්වා කොහොම හරි ඉන්න ඕන, තැනක් හොයලා දෙන්න කියලා. මට පොඩ්ඩක් පවු කියලා හිතුනා. ඒගොල්ලන්ගෙන් මම ඇහුවා ප්‍රශ්නය

මොකක්ද කියලා. කාත්තන්කුඩියේ ඉන්නවා අද්‍රොෆ් මවුලවි කියලා එයාලා කණ්ඩායමටයි සහරාන් මවුලවිගේ කණ්ඩායමටයි ආගම් කියලා ලොකු ප්‍රශ්නයක් වුනා කියලා මට කිව්වා. එතකොට එදා ඊ නිසා මම අපේ දෙවෙනි පවුලගේ ගෙදරට සහරාන් මවුලවිලව නතර වෙන්න කිව්වා.''

පැ.174 (iv) : ''තව පාරක් දෙල්ගහගොඩ පල්ලියට සහරාන් මවුලවීලා ආවා. අපේ ලංකාවෙත් මුස්ලිම් කට්ටියට ප්‍රශ්නේ බෙරුවල අම්පාරේ ප්‍රශ්න ගැන කිව්වා. ඒ අතරවාරෙදි තමයි දිගන සිද්දිය වෙන්නේ. (ප්‍රකාශකරු ජලය පානය කිරීමට අවශ්‍ය බව කියා සිටී. වතුර බෝතලයෙන් ජලය පානය කරයි) පස්සේ සහරාන් එක්ක එකතු වෙන්න හේතු වුනේ මේ මුස්ලිම් ප්‍රශ්නේ ගැන කිව්ව නිසා. මුස්ලිම් අයට ප්‍රශ්නේ, මේ ගැන හොයලා බලන්න ඕනේ. අපිට අසාධාරණ වෙනවා කියලා අපිට හිතුනා. මමයි, රිස්වානුයි, රිස්වියි තමයි සහරාන්ට එකතු වුනේ''

තවද 2019.11.01 දින ඉහත කී 15 වන චූදිත වන මොහොමදු හනීෆා සෙයිනුල් ආබ්දීන් විසින් සිදු කර ඇති ප්‍රකාශය පැ.176 ලෙස අධිකරණයෙන් ඉඩ ලබා දීම මත ලකුණු කර ඇති අතර එහි

අන්තර්ගතයන් පැමිණිල්ලෙන් පැ.176 (i) සිට පැ.176 (v) දක්වා පහත පරිදි ලකුණු කර ඇති අතර ඒවා පහත පරිදි වේ.

පැ.176 (i) : ‘‘නුවරඑළිය, ශාන්තිපුර කියන තැන දේශනාවකට මම ගියා. ඒ දේශනාව උදේ 9.00 ට විතර පටන් ගත්තා. ඒ පටන් ගනිද්දි සහරාන්, නවුෆර්, මිල්හාන්, හස්තුන්, ෂාපි, රිල්වාන් (සහරාන්ගේ මල්ලි) සහරාන්ගේ අප්පච්චි හාෂි, සහරාන්ගේ මස්සිනාලා දෙන්නෙක් ඇවිල්ලා හිටියා. එදා රැස්වීමට මමත්, මගේ යාලුවා රිස්වාන් සහ කුරුණෑගල පැත්තේ කට්ටිය ඇවිත් හිටියා. ඔක්කොමලා 18 දෙනෙක් හිටියා. මම රැස්වීමට ගියාට කෑම බීමත්, බඩු ගේන වැඩ වලට තමයි මම යන්නේ. ඔහොම ඉද්දි උදේ දේශනාව පවත්වාගෙන යද්දි 12.30 ට 1.00 ට විතර පොලීසියේ කාර් එකක් ඇවිත් නවත්තලා පොලීසියේ මහත්තුරු 05 දෙනෙක් ආවා. ඒකේ ලොකු මහත්තයෙකුත් හිටියා. ඕ.අයි.සී. මහත්තයා වෙන්න ඇති ඒ. ඇවිල්ලා දොරට තට්ටු කරලා එයාලා ඇවිත් උඩ තට්ටුවේ ඉඳලා පල්ලෙහා තට්ටුවට ආවා. අපි ඔක්කොමලා පස්සේ පොලීසියේ මහත්තුරු ඇහුවා කට්ටියගෙන් ගම් කොහේද.අයිඩෙන්ටිටි තියෙනවාද කියලා ඇහුවා. ඔක්කොමල්ලාගේ අයිඩෙන්ටිටි අතට අරගෙන ඔයගොල්ලන් මොකද කරන්නේ. කොහේද ආවේ විස්තර

ඇහුවා. අපි කිව්වා ට්‍රිප් එකක් ආවා කියලා. අපිට කලින් කියලා තිබුණා එහෙම කියන්න කියලා පොලීසියෙන් හරි කවුරු හරි ආවොත්. ඔක්කොමලාගේ බෑග් චෙක් කලා. අපිත් බෑග් ඔක්කොම දුන්නා තියෙන ටික. ඒකේ විශේෂයෙන්ම සහරාන්ගේ බෑග් එක චෙක් කරද්දි රු.5000/. මිටි 04 ක් විතර තිබුණා. ගොඩක් රත්තරන් දැක්කා මම. ඒ ලොකු මහත්තයා අඩගහලා ඇහුවා මේ බෑග් එක කාගෙද කියලා. සහරාන් කිව්වා මගේ බෑග් එක කියලා. පස්සේ මේ සල්ලි කොහෙන්ද, රත්තරන් කොහෙන්ද කියලා ප්‍රශ්න කියලා ප්‍රශ්න කරද්දි සහරාන්ට සිංහල දන්නේ නැහැ. එයා රත්තරන් බිස්නස් කරන්නේ කියලා පොලීසියේ මහත්තුරුන්ට කියන්න කියලා කුරුණෑගල කෙනෙක්ට කිව්වා. පස්සේ පොලීසියේ මහත්තුරු වටේම චෙක් කලා. රූම් 07.08 ක් විතර තිබ්බා. සහරාන්ගේ මූණ බයවෙලා තිබ්බේ. ලොකු මහත්තයා ආයිත් අඩගහලා අයිඩෙන්ටිය වෙනම අරගෙන, එඩ්‍රස් බලලා කොහේද කාත්තන්කුඩි කියලා විස්තර ඇහුවා. පස්සේ එතනින් එහාට එව්වර ඇහුවේ නැහැ. ඇතුලේ ආයුධ ටී.56 එකයි, පොඩි පිස්ටල් 01 යි මිල්හාන් ලඟ තිබ්බා කියලා මම දැනගත්තා. පොලීසියේ මහත්තුරු පස්සේ අපේ අයිඩෙන්ටි අරගෙන 3.00 ට පොලීසියට එන්න කියලා ගියා. පස්සේ පොලීසියට ගියාට

පස්සේ කිව්වා ටී.56 ලිඳට දැම්මා කිව්වා. පිස්තෝලේ එහා පැත්තේ එළවලු වත්තට දැම්මා කියලා මිල්හාන් කියන එකත් මම අහගෙන හිටියා. පොලීසියේ මහත්තුරු ගියාට පස්සේ සහරානුයි, නවුෆරුයි, හස්තුනුයි, ෂාපියි ටවුමකට දාන්න කියලා එයාලගේ බෑග් ඔක්කොම අරගෙන වාහනයේ නැගලා ගියා. පස්සේ 3.00 වෙද්දි පොලීසියට ගිහිල්ලා මමයි, රිස්වානුයි, සහරාන්ගේ මස්සිනා කෙනෙකුයි, පොලීසියට ගියා. අපි කිව්වා ට්‍රිප් එකක් ආවේ. ආගම ගැන තමයි අපි කථා කර කර හිටියේ කියලා කිව්වා. පස්සේ අයිඩෙන්ටියේ නම ලියාගෙන අයිඩෙන්ටි දුන්නාට පස්සේ අපි ආවා ගෙදරට. අයිති අයට අයිඩෙන්ටි දුන්නා.”

පැ176 (ii): “එදා එහෙම ඉවර වෙලා පහුවදා රිස්වාන් මට කිව්වා මිල්හාන් (සහරාන්ගේ මල්ලි) කියලා කියනවා එයාට අපේ වාහනේ ගිහිල්ලා මිල්හානුයි, සාදිකුයි, එනවා එයාලව දාගෙන ගිහිල්ලා ළිඳට දාලා තියන ආයුධ ගේන්න ඕනේ කියලා. පස්සේ මමයි, රිස්වානුයි, මිල්හාන්, සාදිකුයි ගියේ අපේ වාහනේ. වාහනේ නොම්මරේ 54.7721. හයර් එක දෙනවා කියලා ගිහින් එමු කිව්වා. පස්සේ අපි 8.00ට විතර ගිහිල්ලා ගම්පොළට යද්දි 9.00 ට විතර ඇති. ගිහින් ලී මෝලක නවත්තලා අඩි6 ලී 4.5 විතර අරන් ලණුත් අරගෙන

නුවරඑළිය ශාන්තිපුර රැස්වීම තිබුණ ගෙදරට ගියා. ගෙදර යතුර මිල්හාන් ගාව තිබ්බා. නුවරඑළිය කිට්ටු වෙද්දි අපි එනවා කියලා ගේ බලාගෙන ඉන්න කෙනාට කෝල් එකක් ගත්තා. පස්සේ එයා කිව්වා මම වැඩට ගිහිල්ලා ඉන්නේ 5.00 ට තමයි එන්නේ කියලා. සන්තෝෂ වුණා එයා නැති එක හොඳයි කියලා. ඒ වගේම එතනට ගිහිල්ලා ගේ බලා ගන්න කෙනාගේ නෝනට කිව්වා අපි ආවා කියලා. පස්සේ එයාට මැසේජ් එකක් දීලා තිබ්බා. මට කිව්වා ඔයා ඉස්සරහා පැත්තේ ඉන්න කියලා පැය2 ක් විතර ට්‍රයි කරලා එයාලා ආයුධ අර ගත්තා. ''

පැ176 (iii) : ''ආයුධ ගෙනිව්වේ ගෙනාපු ලී ටික අඩි 4 ට වගේ කපලා ටී56 මැදට තියලා දර මිටියක් වගේ හදලා තමයි එයාලා වාහනේ තියාගෙන ගියේ''

පැ176 (iv): ''මේවගේ නුවර කටුගස්තොට පාරේ, වේවැල්ල කියන ගෙදරක තවත් දේශනාවක් තිබ්බා දවස් 02 ක් වගේ. මේ වගේම සහරාන් සහ කට්ටිය සහ කොළඹ ළමයි 15 ක් විතර එදා රැස්වීමට ආවා. දේශන තිබ්බා. සහරාන් නවුෆර් දේශනා කළා. ආයුධ ගැන මිල්හාන් ගලවලා හයි කරන හැටිත් පෙන්නලා දුන්නා. රැස්වීමෙදි කොළඹ කෙනෙකුට හැන්දෑවේ

6.00 වෙද්දි අසනීප වුණා. එතනින්ම රැස්වීම ඉවර කරලා කොළඹ කට්ටිය ගියා ”

පැ.176 (v): “මේගොල්ලන්ගේ දේශනාවලට ගියේ මම අන්තිමට 2018/09/21 දින හම්බන්තොට රැස්වීම තිබ්බේ. ඊට කලින් තමයි නුවර රැස්වීම තිබ්බේ ”

එසේම, 2019.10.18 දින ඉහත කී 15 වන චූදිත වන මොහොමදු හනීෆා සෙයිනුල් ආබ්දීන් විසින් සිදු කර ඇති ප්‍රකාශය පැ.178 ලෙස අධිකරණයෙන් ඉඩ ලබා දීම මත ලකුණු කර ඇති අතර එහි අන්තර්ගතයන් පැමිණිල්ලෙන් පැ.178 (i) සිට පැ.178 (xi) දක්වා පහත පරිදි ලකුණු කර ඇති අතර ඒවා පහත පරිදි වේ.

පැ.178 (i): “දෙල්ගහගොඩ රිෂ්වාන් ගනේතැන්න රිෂ්වි කියන යහලුවන් නිතරම පල්ලියේ හමු වෙනවා. එතකොට අපි මේ ගැන තමයි කථා කරන්නේ. සහරාන් තමයි මේ ප්‍රශ්නය ගැන කථා කරන්නේ. වෙන මවුලවීලා කථා කරන්නේ නැහැ. සහරාන්ගේ දේශන දුරකථන වලින් මට පෙන්වනවා. (පේස්බුක් වලින්) මමත් ඒවා බලලා මම හිතනවා මුස්ලිම් අයගේ ප්‍රශ්න ගැන බොදුබල සේනාවේ ඥානසාර හාමුදුරුවන්ගේ කතාවල් ලංකාවේ ප්‍රශ්න ගැන, අනිත් මවුලවිවරු අපේ ජාතිය ගැන කථා කරන්නේ නැහැ කියලා

බැනලා ෆේස්බුක් වලින් ආවා. ඒ දේවල් බලලා මට හිතුනා ඒ ගැන සොයා බලන්න ඕනෑ කියලා හිතුවා. මගේ දුරකතනයටත් බලන්න දාලා දුන්නා. මම ඒවා බලලා ඒ ගැන ටිකක් හිතුවා. ගනේතැන්න රිස්වි මට කිව්වා පුත්තලමේ තැනක් තියෙනවා ගිහින් එමුද කියලා ඇසුවා. පසුව රිස්වි සමග පුත්තලමට ගියා කාර් එකේ. පුත්තලමේ ටවුමට ගිහින් රිස්වි සහරාන්ගේ මස්සිනා වන අන්සාර්ට දුරකතනයෙන් කතා කරලා එයා ඉන්න තැනට එන්නේ කොහොමද කියලා අහගෙන අපි ගියා. ලිපිනය කියන්න දන්නේ නැහැ. ඒ තැන සොයාගෙන ඒ අය සිටිය තැනට ගියා. දුරකතනයෙන් කථා කරලා තමයි සිටින තැන සොයාගෙන ගියේ. ඒ යන කොට සහරාන් මවුලවි සහ සහරාන්ගේ රිල්වාන් හස්තුන් සිටියා. තවත් එක්කෙනෙක් වන මිල්හාන් නොහොත් අබුසිලා කියන අය සිටියා.”

පැ178 (ii): “ මගේ දුව අසනීප වෙලා මම රෝහලට ගියා. රිෂ්වි මට දුරකථනයෙන් කතා කරන කොට මම රෝහලේ හිටියේ. මම රෝහලෙන් එළියට එන්නම් කියලා මම කියලා එළියට එනකොට රිෂ්වි සහ රිෂ්වාන් කියන දෙදෙනා රෝහලෙන් එළියේ සිටියා. ඒ අය මට කීවා සහරාන් මවුලවි දුරක.නයෙන් කතා කතා ගමනක් යන්න තියනවා ෆොටෝ ගහන්නත්

තියනවා, තියනවනම් කලුපාට ටී ෂර්ට් එකක් අරන් එන්න කියලා කිව්වා. නිකන්නේ ඉන්නේ ගමන යන්න එන්න කියලා කීවා. මගේ වාහනයේ අංකය 54-7721 වාහනයෙන් තමයි අපි මාවනැල්ලේ සිට උදේ 7.00 ට පමණ ගියේ. කුරුණෑගල කැකුනුගොල්ලේ සහරාන්ගේ නැන්දම්මගේ ගෙදරට ගියා. මම එදා තමයි දන්නේ ඒ සහරාන්ගේ බිරිඳගේ ගෙදර ඒක කියලා. අපි එහේ යනවිට සහරාන් හෂ්තූන්, අන්ෂාර්, නෆ්ලි, ෆවාස්, නවුෆර් මවුලවි කියන අය සිටියා. පළමු වතාවට නවුෆර් මවුලවි මම දකින්නේ එතනදි තමයි. ”

පැ178 (iii): “ෂාෆි මවුලවිගේ ගෙදර තමයි අනුරාධපුරයේ තියෙන්නේ. අනුරාධපුරයේ ඒ ගමේ නම මට මතක නැහැ. එහේ යන විට ෂාෆි සිටියා. මිල්හාන්, රිල්වාන්, වකාර් කියලා පොඩි එක්කෙනෙක් සිටියා. තව කලුපාට එක්කෙනෙක් සිටියා නම දන්නේ නැහැ. එතන 13 දෙනෙක් සිටියා. එදා රිල්වාන්, මිල්හාන් යන අය අතේ ටී.56 ආයුධයක් තිබුණා. ”

පැ178 (iv) : “ඒ ෆොටෝ එකට මුහුණ වැසෙන ලෙස සැකසූ ආවරණයක් යොදා ගන්න තිබුණා. ඒ ආවරණයෙන් ඇස්දෙක විතරයි පෙනෙන්නේ ”

පැ178 (v): “ නවුෆර්, සහරාන් ආයුධය අතේ තියාගෙන මාරුවෙන් මාරුවට අරාබි භාෂාවෙන් කතා වෙමින් (දබර ඇඟිල්ල දික් කරමින්) වෙන වෙනම ෆොටෝ ගත්තා ”

පැ.178 (vi): "පසුව 2017 වර්ෂයේ අවසානය වගේ සහරාන් මවුලවි නුවරඑලියට එනවා කියලා කීවා. ඒ නිසා නැවත වතාවක් මම නුවරඑලියට ගියා. ඒ අය මාවනැල්ලට වෙනත් වාහනයකින් ආවා. ඒ ඇවිත් අපේ වාහනයෙන් ගියා. ඒ ගියේ සහරාන් අන්ෂාර් (සහරාන්ගේ මස්සිනා) රිෂ්වාන්, රිෂ්වි (එයාගේ කාර් එකේආවා). නෂ්ලි ඇතුලුව එදා ඡායාරූපයට සිටි සියලු දෙනා ආවා. ඊට අමතරව සහරාන්ගේ ගමේ දෙන්නෙක් තුන්දෙනෙක් ඇතුලුව 15 දෙනෙක් පමණ නුවරඑලියට යන්න ආවා. නුවරඑළියේ නගරයේ සිට කිලෝමීටර් 02 ක් පමණ දුරින් ගෙයක් බුක් කරා. එදා උදේම සහරාන් පැයක පමණ දේශනයක් තිබුනා. නබිතුමාගේ ජීවිත කතාව ඒ ජීවිතයට අනුව අපි ජීවත් වෙන්න ඕනෑ කියලා හොඳ විදියට තමයි තිබුනේ. පසුව නවුෆර් මවිලවි දේශනාවක් කළා. ඉන්පසුව දවල් කෑම කෑවා. පසුව රිෂ්වි සහ නෂ්ලි කියන දෙන්නා ප්‍රශ්න කළා සහරාන්ගෙන් ඡායාරූපය ගැන මේ අයට ප්‍රශ්නයක් තියෙනවා. ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න කියලා කිව්වා. ඒ ඡායාරූපයට බය වෙන්න එපා. ඒකේ මුහුණ වහලානේ

තියෙන්නේ. ඒකට බය වෙන්න එපා කියලා කීවා. ඒකේ නම් නැහැ බය වෙන්න එපා කියලා කීවා. ඒ ඇරෙන්න වෙන දෙයක් කිව්වේ නැහැ. අපිට ලංකාවේ අනාගතයේ ලොකු ප්‍රශ්නයක් වෙන්න ඊට තියෙනවා. ඒ නිසා මම තවත් දෙතුන් දෙනා එකතු කරගන්න ඕනෑ. ඒ විදිහට අපි කණ්ඩායම වැඩි කරගන්න ඕනෑ කියලා එදා නුවරඑලියේදී අපිට සහරාන් කිව්වා. පසුවදා උදේ අපිට කීවා ඡායාරූපය ගැන කාටවත් කියන්න එපා. ඒකෙන් පිනක් ලැබෙනවා. ඒ නිසා ඡායා රූපය ගැන කියන්න එපා කීවා. සහරාන්ගේ මල්ලී රිල්වාන් කීවා ඡායාරූපය ගැන කවුරුහරි එලියේ කියන්න එපා. අපිට පින් ලැබෙනවා. නබිතුමා ළඟට යන්න ලැබෙනවා කියලා එදා දේශනයේදී අපිට කීවා. එදා තමයි මම දෙවන වතාවට මේ දැක්කේ. නවුෆර් එදා ISIS සංවිධානය ගැන පැය භාගයක වගේ පැහැදිලි කිරීමක් කලා"

පැ.178 (vii): "මේ විදිහට හම්බන්තොට තිබුණ පලමු රැස්වීමට ගියා. සිප්පිකුලම කියන ස්ථානයේ තමයි රැස්වීම තිබුනේ. රිස්වාන් සහ මම තමයි එතන බුක් කළේ. අපි පවුලේ විනෝද ගමනක් ගියා එතනට එකෙන් තමයි මම එතන ගැන දන්නේ එදා රැස්වීමට. මම එතන බුක් කළා. මමයි රිස්වාන් එදා අපේ වාහනයෙන් ගියේ. එදා සහරාන් වරකාපොලට ඇවිත් සිටියා.

එදා එයාගේ මල්ලී සහ මස්සිනා අන්ෂාර්, නවුෆර්, ෂාෆි කස්තුර්, මිල්හාන් කියන අය සමඟ අවිස්සාවේල්ල හරහා අපි හම්බන්තොටට ගියා. අපි කලින් බුක් කළ නවාතැන් පොලට යනවිට රාත්‍රී 10.00 පමණ ඇති. සහරාන්ගේ ගමෙන් කාත්තන්කුඩියෙන් ඇවිත් අද්දූර් රවුෆ් සහ අෂීම් කියන අය සිටියා. ඊට අමතරව අපි සියලුදෙනා එතන 20 ක් පමණ සිටියා"

පැ.178 (viii): ""මුස්ලිම් මිනිස්සුන්ට වෙන දේ ගැන කල්පනා කරන්න කියලා පසුව උදේ කෑම කාලා නැවත නවුෆර් මව්ලවිගේ දේශනය පැවැත්වුවා. එම දේශනයේදී පිටරට යුද්ධය, ඒ කියන්නේ මුස්ලිම් කියන ප්‍රශ්නයෙන් වැඩියෙන් මැරෙනවා. ISIS ගැන පොඩි පැහැදිලි කිරීමක් කළා. ඉස්ලාමී ස්ටේට් කියලා තමයි මුලින් කිව්වේ. පසුව තමයි ISIS කියලා කීවා "

පැ.178. (ix): "හම්බන්තොට රැස්වීමත් එක්ක රැස්වීම් 4 ක් තිබුණා. රිෂ්වාන් 03 ගියා. රිෂ්වි 01 තමයි කියේ. මම නම් රැස්වීම් 04 යි ගියා."

පැ.178. (x) : "නවුෆර්, සහරාන්, මිල්හාන්, රිල්වාන් (සහරාන්ගේ මල්ලි) ෂාෆි, හස්තුන් ඇතුළුව මාවනැල්ලේ සහජීත් මවුලවි, සාදික්,

සාහිඩ්, ඉබ්‍රාහිම් මවුලවි කියන අයත් රැස්වීම් 02 කට, 03 විතර ආවා. සහජිත්ගේ කණ්ඩායම රැස්වීම් 03, 04 ආවා.”

පැ.178. (xi) : “මේ රැස්වීම්වල දී සහරාන් දේශනා කරනවා. නවුෆර් ISIS ගැන දේශනාව කරනවා. සහජිත් මවුලවි එයා මාවනැල්ලේ සිටිනනේ එයත් දේශනා කරනවා. එයා මම ගමේ දි දැකලා නැහැ. හම්බන්තොටදි තමයි මම එයාව දකින්නේ. ඉබ්‍රාහිම් මවිලවි දේශනා කරනවා නබි තුමා ගැන. මිල්හාන්, සාදික් ආයුධ ගැන, ආයුධ සම්බන්ධයෙන් ඒවාගේ ඇතුලත එනම් ඒවා ඇතුල ගැලවීම් නැවත සවි කිරීම් වගේ දේවල් හස්තුන්, මිල්හාන් කියන අය බෝම්බ හදන ආකාරය ගැන කියලා දෙනවා. මේ වගේ දේවල් තමයි මේ රැස්වීම්වල දී සිදු වුනේ.”

විශ්ලේෂණය.

වඩාත් වැදගත්ම කාරණය වන්නේ අප විසින් වර්ෂ 2026.02.02 ඉතා දීර්ඝව කරුණු පැහැදිලි කරමින් 15 වන චිත්තිකරු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය යටතේ මාවනැල්ල උගත් මහේස්ත්‍රාත්තුමා වෙත කරන ලද ප්‍රකාශය ස්වෙච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයක් ලෙසට තීරණය කොට එම ප්‍රකාශයේ කොටස් පැ.174, පැ.175, පැ.176, පැ.177, පැ.178 සහ පැ.179 ලෙස සලකුණු කිරීමට අවසර දී ඇති අතර 15 වන චූදිත තමා විසින් මහේස්ත්‍රාත්තුමාට කර ඇති ප්‍රකාශයේ

නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ පිහිටි නිවාඩු නිකේතනයක, හම්බන්තොට සිප්පිකුලම් ප්‍රදේශයේ පිහිටි නිවස සහරාන්ගේ මූලිකත්වයෙන් වැඩමුළු පැවැත්වූ බවත්, එම වැඩමුළු වලදී ආයුධ සම්බන්ධයෙන් පුහුණුවීම් කටයුතු කල බවද මෙම නඩුවේ සාක්ෂි පැ. සා. 1400 ගේ සාක්ෂියෙන් මෙම චූදිතගේ එම ප්‍රකාශ කරුණු තහවුරුවේ. සහරාන්ගේ මූලිකත්වයෙන් නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී මෙම චූදිතට සහරාන් විසින් අබුහිනා යන අබූ නාමය ප්‍රදානය කරන ලද බවට මෙම චූදිත විසින් ඔහුගේ ඉහත කී ප්‍රකාශයේ සඳහන් කර ඇති අතර, එම කරුණුද ඉහත කී පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගෙන් සාක්ෂියෙන් පැහැදිලි වන අතර, එය සත්‍ය කරුණු බව පෙනී යයි.

අප විසින් ඉහතින් පෙන්වා දී ඇති කරුණු වලට අනුව මෙම 15 වන චූදිත විසින් මාවනැල්ල මහේස්ත්‍රාත්තුමාට අ. න. වි. ස. 127(1) වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති ඉහත ප්‍රකාශයේ අඩංගු කරුණු ස්වාධීන සාක්ෂි මගින් තහවුරු වී ඇති බවට අප තීරණය කරමු. එසේම එම ප්‍රකාශයේ සඳහන් කරුණු මෙම චූදිත සම්බන්ධයෙන් පමණක් අදාළ කර ගන්නා බවට අප විසින් අවධාරණය කරමු.

චූදිතයින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති පාපෝච්චාරණ.

මෙම නඩුවෙහි 1, 4, 9, 11, 12, සහ 18 යන චූදිතයින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පාපෝච්චාරණමය ස්වභාවයේ ප්‍රකාශයන් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ පැමිණිල්ලෙන් සාක්ෂි මෙහෙයවන ලද අතර, අදාළ පාපෝච්චාරණයන් වල ස්වෙච්ඡානුගතභාවය සම්බන්ධයෙන් මෙම අධිකරණය මඟින් සකාෘතා පරීක්ෂණයන් පවත්වන ලද අතර, එකී සකාෘතා පරීක්ෂණයන් අවසානයේ ස්වෙච්ඡාවෙන් සිදු කර ඇති බවට මෙම අධිකරණය මඟින් තීරණය කර ඇති පාපෝච්චාරණයන් පමණක් අප විසින් මෙම නඩුවෙහි සාක්ෂි ලෙස සළකා බලන ලදි. කෙසේ වුවද, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව එකී පාපෝච්චාරණයන්හි අඩංගු කරුණු එකී ප්‍රකාශය කළ චූදිතට මෙන්ම ඔහු සමඟ මෙම අධිකරණය ඉදිරියේ අධි චෝදනා ලබා ඇති, අදාළ පාපෝච්චාරණයන්ගෙන් තොරතුරු හෙළි වන්නා වූ චූදිතයන්ටද එරෙහිව උපයෝගී කර ගැනීමට මෙම අධිකරණයට බාධාවක් නොමැති අතර, කෙසේ වුවද, අදාළ පාපෝච්චාරණයන්හි අඩංගු

වැදගත් විස්තර ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු කර තිබීම මෙහිලා අත්‍යවශ්‍ය වන බවට අප අවධාරණය කරමු.

මෙම නඩුවේ පැමිණිල්ලෙන් අධිකරණය ඉදිරියේ ලකුණු කර ඇති මෙම නඩුවෙහි 1, 4, 9, 11, 12, සහ 18 යන චූදිතයින් ගේ පාපෝච්චාරණයන් සම්බන්ධයෙන් චූදිතයින් ගේ අනුපිළිවෙළටම සාක්ෂි මෙහෙයවීමක් සිදු කර නොමැති අතර කෙසේ වුවත් මෙම තීන්දුවේ පහසුව සඳහා එකී චූදිතයින් ට අදාළ පාපෝච්චාරණයන් අධිචෝදනා පත්‍රයේ නම් සඳහන් පරිදි චූදිතයින් ගේ නම් අනු පිළිවෙලින් ගෙන ඒවා වල අන්තර්ගතයන් සම්බන්ධයෙන් සළකා බැලීම මෙම නඩුවේ සාක්ෂි ඇගයීමේදී වඩාත් ප්‍රායෝගික බවට අප හට පෙනී යයි.

01 චූදිතගේ පාපොච්චාරණය

මෙම නඩුවේ 01 වන චූදිත වන මුහම්මදු ඉබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් මෙම නඩුවේ පැ.සා. 2095 සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට සිදු කර ඇති 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සටහන් කරන ලද ප්‍රකාශය ප්‍රකාරව දමිල භාෂාවෙන් සිදුකර ඇති ප්‍රකාශය ශක්‍යතා පරීක්ෂණයකින් අනතුරුව ස්වේච්ඡාවෙන් සිදු කරන ලද්දක් බවට මෙම අධිකරණය මඟින් තීරණය කරන ලද අතර, ඒ අනුව එකී ප්‍රකාශය 2026.06.25 දින

පැ.803 වශයෙන් සලකුණු කරන ලදී. ඉන් අනතුරුව පැමිණිල්ල විසින් එකී පැ.803 දරන ප්‍රකාශයෙහි සඳහන් පහත සඳහන් කොටස් උපුටා දක්වමින් ඒවා පහත පරිදි සලකුණු කරන ලදී.

පැ. 803 (A2)(01) "පසුව මම 2017 කාලය තුළ IS සංවිධානයේ ප්‍රතිපත්ති නිවැරදි බවට මුහුණුපොත හරහා පළ කළෙමි. මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයේදී උගත් කරුණු, ශ්‍රී ලංකාවේ සිංහල ජාතිවාදීන් විසින් එනම් කුලියාපිටිය, ගාල්ල, ගිංතොට සහ බේරුවල දර්ගා ප්‍රදේශවල දී මුස්ලිම් ජනතාවට එරෙහිව සිදුකළ ප්‍රහාර සහ අන්තර්ජාලය හරහා ලබාගත් තොරතුරු කෙරෙහි අවධානය යොමු කළ මම ඒ අකාරයෙන් පළ කළෙමි."

පැ.803 (A2) (2) " එම කාලය තුළ මම මුහුණුපොත හරහා මිල්හාන් සහ හසීම් අමඩ් යන අය හඳුනාගත්තෙමි. පසුව දෙතුන්වතාවක් මම කටාර්හි Reataurant එකක (ආපනශාලාවක) දී මිල්හාන්ව මුණගැසී, එනම් IS සංවිධානය සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත්තෙමි."

පැ.803 (A2) (3) "ඉන්පසුව ඔහු මගේ නිවසට පැමිණි අවස්ථාවකදී මගේ බිරිඳගේ අක්කාගේ දියණිය වන කාදියාට කැමැති වී ඇයව විවාහ කරදෙන මෙන් ඉල්ලා සිටි අතර, ඔවුහු ද ඇයව ඔහුට විවාහ කර දුන්හ."

පැ.803 (A2) (4) “ 2017 වසරේදී එකල IS සංවිධානය නිවැරදි බවට මම මුහුණුපොතෙහි පළ කිරීමට පටන්ගත්තෙමි.”

පැ.803 (A2) (5) “ඉන්පසු සහරාන්ව මුණගැසුනු පසු, දෙදෙනාම IS සංවිධානය ගැන සාකච්ඡා කළ අතර, ඉන්පසු සහරාන් IS සංවිධානයට අදාළ ලේඛන අඩංගු පෙන් ඩ්‍රයිව් (pen drive) එකක් මට දුන්නේය.”

පැ.803 (A2) (6)“ඉන්පසු එහි තිබූ ලේඛන සහ මා සතුව තිබූ ලේඛන පරීක්ෂා කර බැලීමෙන් පසුව, මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයේදි උගත් කරුණු, ශ්‍රී කාවේ සිංහල ජාතිවාදීන් විසින් එනම් කුලියාපිටිය, ගාල්ල, ගිංතොට සහ බේරුවල දර්ගා ප්‍රදේශවල මුස්ලිම් ජනතාවට එරෙහිව සිදු කළ ප්‍රහාරයන් සහ අන්තර්ජාලය හරහා ලබාගත් තොරතුරුවලට අනුව IS සංවිධානය නිවැරදි බවට වන තීරණයකට මම එළඹුනෙමි.”

පැ.803 (A2) (7)“ NTJ (ජාතික තවුහීද් ජමාත්) සංවිධානයට සම්බන්ධ වූ මම, අනුරාධපුර සාෆි මවුලවිගේ නිවසේදී එම සංවිධානය වෙනුවෙන් දිවුරුම් දුන්නෙමි. (ප්‍රතිඥා දුන්නෙමි.) එහි අන්සාද්, රිස්වි, රිස්වාන්, ආබ්දීන්, රමීෂ්, මිල්හාන්, කස්තූන්, රිල්වාන්, සහරාන් යන අය පැමිණ සිටියහ.”

පැ.803 (A2) (8) ‘‘කොළඹ ක්‍රියාත්මක වූ කණ්ඩායම, එනම් ඉහ්සාන්, උමයීර්, අම්ජඩ්, ආක්කම් සහ නම් නොදන්නා තවත් කීපදෙනෙකුද මගේ නිවසට පැමිණ IS සංවිධානය ගැනත්, ඔවුන් සිරියාවේ IS සංවිධානයේ සිටින නිලාම්ගේ පන්තිවලට ගිය බවත්, එහි සිටි උමයීර් සිරියාවට ගොස් පැමිණි අයෙකු බවත් පවසමින්, වෙන්වෙන්ව ක්‍රියා නොකර IS සංවිධානය වෙනුවෙන් එකට එක්ව ක්‍රියා කරමු යැයි පැවසූහ. ඔවුන් මා මුණගැසීමට පෙර සහරාන්ව මුණගැසුණු බව කීහ.’’

පැ.803 (A2) (9) ඉන් පසු මාත්, සහරානුත්, මිල්හානුත් මල්වානේ ක්‍රීඩා සමාජකයකදී ඔවුන් මුණ ගැසුණු අවස්ථාවකදී IS සංවිධානය වෙනුවෙන් එකට එක්ව ක්‍රියා කිරීමට ඔවුහු කැමැත්ත පල කලහ.

පැ.803 (A2) (10) ‘‘මා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින දෙකක work shop (වැඩමුළු) පැවැත්වූ අතර එක් එක් කඳවුර සඳහා 15-20 දෙනෙකු පමණ සහභාගී වූහ. මා සහ සහරාන් පුහුණුවට සහභාගීවන්නන්ට, එනම් මම ආගමික කරුණු සම්බන්ධවත්, IS සංවිධානය සම්බන්ධවත් දේශන පැවැත්වූවෙමි. සහරාන්ද ඒ අයුරෙන්ම ඉස්ලාමීය අරගලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර මට්ටමින් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති

ගැටලු සම්බන්ධවත් දේශන කළේය. සමහර තැන්වලදී වීඩියෝ මඟින් ගෝලීය මට්ටමෙන් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති ගැටලු සම්බන්ධවත්, IS සංවිධානයට අදාළ වීඩියෝ දර්ශනත් අපි ප්‍රදර්ශනය කළෙමු. දුරකතන භාවිතය සම්බන්ධවත්, පිහියෙන් පහරදීම සහ ආයුධ සම්බන්ධවත් කස්තූන් පුහුණුව ලබාදුන්නේය. එම වැඩසටහන් සඳහා සාෆික්, මිල්හාන්, සාජිඩ්, සාදික් යන අයද සහභාගි වූහ. එහිදී "අබූ" යන නම් තබන ලදි. ඒ අනුව එම සංවිධානය විසින් මට "අබූ ෂෙයිඩ්" යන නම තබන ලදි. මම work shop (වැඩමුළු) 09කට වගේ සහභාගී වුණෙමි."

පැ.803 (A2) (11) "අපි වත්තල එඬේරමුල්ලේ safe house (ආරක්ෂිත නිවසක) එකේ සිටියදී සහරාන් අපට මි.මී. 9 වර්ගයේ ගිනි අවියක්, වෑන්රථයක් සහ යතුරුපැදි 01 ක්ද ලබාදුන්නේය. එසේම වනාතවිල්ලුවේ සිටියදී සහරාන් සතුව මී. මී. 9 ගිනි අවියක්ද, Air Rifel තුවක්කුවක්ද, දඩයම් තුවක්කුවක්ද, T-56 ගිනිඅවියක්ද තිබුණි. ඒ ආකාරයෙන්ම මයුරා පෙදෙසේ (Mayura Place) සිටියදී සහරාන්, මුබාරක්ගේ නමින් වෑන්රථ 02ක් සහ යතුරුපැදි 02ක් මිලදී ගත්තේය. ඉන් වෑන් රථ 01ක් සහ යතුරුපැදි 01ක් මා එඬේරමුල්ලේ සිටියදී මට ලබාදුන්නේය. අබූ බරා තමයි අපගේ සංවිධානයේ ක්‍රියාකාරකම් සඳහා මුදල් ලබාදුන්නේ. නමුත් ඒවා සහරාන් විසින් ලබාදුන් මුදල්."

පැ.803-(A2) 12) "මා NTJ (ජාතික තව්හිද් ජමාද්) සංවිධානයේ දෙවන පෙළ නායකයෙකු ලෙස සහරාන් විසින් 2019.03.28 දින පත් කල බව මතකයි. දිනක් සහරාන් මා කැටුව මාවනැල්ලේ පිහිටි සාදික් සහ සාජිත් පදිංචි ප්‍රදේශයට කිහිප වතාවක්ම ගොස් ඇත්තෙමු.

පැ.803-(A2) (13) " ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් ජනතාවට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියාවලට හේතු වුනු සිංහලයින්ගේ ආගමික ස්ථානයක් වූ මාවනැල්ලේ බුදු පිළිම කඩා දමන ලෙසට සහරාන් ඔවුන්ට පැවසීමෙන් පසු සාහිද්, සාදික් යන අය යහළුවන් සමඟ එනම් ජමාතේ ස්ලාම් සංවිධානයේ තරුණයන්" එකතු කර ගෙන බුදු පිළිම කඩා දැමීම නිසා ඉන් එක් අයෙකු අත්අඩංගුවට පත් විය. සාහිද්, සාදික් හැර කිහිප දෙනෙක් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබූහ"

පැ.803-(A2)(14)"ඉන්පසු සහරාන්, පුත්තලම වනාතවිල්ලුව, ලැක්ටෝස් වත්තේ මුබිස් නැමැත්තාට අයත් ඉඩමක් සාදික් හරහා මිල දී ගත්තේය. සහරාන් එයට "අබු සුරෙයි" යන නම තැබුවේය. එය සිරියාවේ IS සංවිධානය වෙනුවෙන් මිය ගිය නිලාම් නැමැත්තා සිහිවීම පිණිස තබන ලද්දකි"

පැ.803-(A2)(15) "ඉන්පසු අපි ටික කාලයක් එහි රැඳී සිටි අතර, 2020 පළවෙනි මාසයේ දී මම කුලියාපිටියේ පැවැති සමථ මණ්ඩල

නඩුවක් සඳහා ගියෙමි. රිෂ්කාන්ගෙ නිවසට යන ලෙස පැවසුවේ ය. එහි ගිය විට සහරාන්, කස්තූන්, මිල්හාන් යන අය සිටියහ. පසුව පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තේ අප විසින් සඟවා තිබූ පුපුරණ ද්‍රව්‍ය පොලිසිය විසින් සොයාගෙන අත්අඩංගුවට ගෙන ඇති බව දැන ගත්තෙමි"

පැ.803-(A2)(16)"ඉන්පසු අපි මයුරා පෙදෙසට පැමිණි අතර, පසුව සහරාන් මල්වාන එඩේරමුල්ල, රිදීතැන්න, ස්පෑන් ටවර්, මයුරා පෙදෙස, පානදුර සරික්කාමුල්ල යන ප්‍රදේශවල නිවාස සහ ස්ථාන කුලියට ගෙන safe house එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස භාවිත කළේ ය"

පැ.803-(A2)(17)" එඩේරමුල්ලට පමණක් මම ගොස් ඇත්තෙමි. මයුරා පෙදෙසේ Safe House එකේ (ආරක්ෂිත නිවසේ) සහරාන් සමඟ සිටියදී ඔහු සතුව ටී.56 ගිනිඅවියක් තිබුණි. ඒ ගැන විමසූ විට ඔහු පැවසුවේ, එය වව්නතිව් ප්‍රදේශයේ දී පොලිස් නිලධාරීන් ඝාතනය කර ඔවුන්ගෙන් ලබාගත් ගිනිඅවියක් බවයි"

පැ.803-(A2)(18)" එසේම 2017 වසරේ දී සහරාන් පුත්තලම තිල්ලෙයියඩි ප්‍රදේශයේ safe house එකක් (ආරක්ෂිත නිවසක්) පවත්වා ගෙන ගිය අතර, එහි සහරාන් විසින් සමාජ මාධ්‍යවලට මුදා හරිනු ලබන වීඩියෝ දර්ශන පටිගත කරන කාමරයක් තිබුණි. මම 2017 දී

අන්සාර් සමග ගොස් ඇත්තෙමි. මාවනැල්ලේ ආබ්දීන්ගේ නිවසේදී ද කුඩා රැස්වීමක් පවත්වන ලදී. ”

පැ.803-(A2)(19) “මාවනැල්ලේ බුදුපිළිම කැඩීමේ සිද්ධියට සම්බන්ධ වූවන්ගේ නඩු කටයුතු සඳහා මුදල් ලබා දෙන ලෙස පවසමින් 2019 ජනවාරි මාසයේදී සහරාන් මුදල් ලබා දුන්නේය. සාජිඩ් මාවනැන්න ප්‍රදේශයට මුදල් ලබා දීමට ගියේ ය. මම මගේ බිරිඳ සමඟ පුත්තලම ප්‍රදේශයේ දී අත්අඩංගුවට පත් මුෆිස්ගේ නිවසට ගොස් ඔහුගේ බිරිඳට මුදල් ලබා දුන්නෙමි. ඒ ආකාරයෙන්ම එහි තිබූ සහරාන්ගේ ලැප්ටොප් පරිගණකය මුෆිස්ගේ බිරිඳගෙන් ලබාගෙන එය සහරාන්ට ලබා දුන්නෙමි.”

පැ.803-(A2)(20) “ එසේ තිබිය දී සහරාන් අපගේ කණ්ඩායමේ ආරක්ෂාව පතා වෙන් වී සිටින ලෙස පැවසුවේය. මම, සාදික් සහ ඔහුගේ බිරිඳ, දරුවන්, සාජිඩ්, ගෆුර් මාමා, මිල්හාන්, සාහිද්, මද්‍රසා සිසුන් වන වකාර්, ජසිල්, අල්තාෆ් යන අය සමඟ වත්තල එඩේරමුල්ලේ සිටියෙමි.”

පැ.803-(A2)(21) “2019.04.21 වන දින උදෑසන රිෂ්කාන් එහි පැමිණ “ප්‍රවෘත්ති බැලුවා ද? සහරාන් ඇතුළු පිරිස මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ලකර තිබෙනවා.” යැයි පැවසූ අතර, මම සාජිඩ්ට වහාම අන්තර්ජාලය හරහා පරීක්ෂා කර බලන ලෙස පැවසුවෙමි.

එය සත්‍යයක් වූ බැවින්, එහි සිට ආබ්දීන්ට ඇමතුමක් ලබා දී වෙනත් ස්ථානයක් සූදානම් කරන ලෙස පවසා එහි සිටි ගෆූර් මාමා සහ සාහිද් එම නිවසේ තිබූ සියලුම බඩුබාහිරාදිය ද රැගෙන නින්දවූර් බලා ගියහ.''

පැ.803-(A2)(22) ''එහි මගේ ලැප්ටොප් පරිගණකයද සහරාන් මට ලබා දුන් පිස්තෝලය ද විය. පසුව පොලීසිය විසින් ලැප්ටොප් පරිගණක කිහිපයක් අත්අඩංගුවට ගෙන පැමිණ, මගේ ලැප්ටොප් පරිගණකය ඒ අතර තිබේ නම් හඳුනා ගෙන පෙන්වන ලෙස පැවසූහ. මගේ ලැප්ටොප් පරිගණකය HP වර්ගයට අයත් එකකි. එය එහි තිබුණි. මම එය හඳුනාගෙන පෙන්වූවෙමි. මම එහි මගේ මුහුණුපොත ඇතුළු අන්තර්ජාල ක්‍රියාකාරකම් මම භාවිතා කර තිබුණෙමි. පසුව විමර්ශන නිලධාරීහු ලැප්ටොප් පරිගණකය සම්බන්ධවත් එහි තිබූ ලේඛන සම්බන්ධවත් මගෙන් ප්‍රකාශයක් ලබාගෙන තිබුණි.''

පැ.803-(A2)(23) ''සාදික් සහ ඔහුගේ බිරිඳ, දරුවා සමඟ ආබ්දීන්ගේ නිහාරියේ නිවසට ගියේය. මද්‍රසා සිසුන් වන වකාර්, ජසිල්, අල්තාෆ් යන අය 2019.04.21 ප්‍රහාර සිද්ධියට පෙරම නින්දවූර් යන බව පවසා ගියහ.''

පැ.803-(A2)(24)"මම සාජිඩ් සමඟ ස්කූටියෙන් ආබ්දීන්ගේ නිහාරියේ නිවසට ගොස් ස්කූටිය එහි නතර කර දමා මම සහ සාජිඩ් නින්දවූර් බලා යාම සඳහා බස් රථයකින් යමින් සිටියදී, ඇඳිරිනීතිය පැනවූ බැවින්, අපි දඹුල්ල ප්‍රදේශයේ කාමරයක් කුලියට ගෙන එහි රැඳී සිටිය දී පොලිස් අත්අඩංගුවට පත්ව වැඩිදුර විමර්ශන සඳහා අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී."

පැ.803-(A2)(25) "මට පැවසීමට ඇත්තේ මෙපමණයි. මගේ ප්‍රකාශය සටහන් කර ගැනීමේදී කිසිදු බලපෑමක්, පෙළවීමක් හෝ පොරොන්දුවක් ලබා දීමක් සිදු නොවීය. මගේ ප්‍රකාශය ස්වකැමැත්තෙන්ම ලබා දුන් බව මෙයින් ප්‍රකාශ කරමි. "

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා 1400 අනස් විසින් මෙම 01 වන චිත්තිකරු විසින් අන්තවාදී දේශනවලට සහභාගී වූ බව දිවුරුම් පිට කියා සිටින ලදී. පැ.803 (A2) (4) හි මෙසේ සඳහන් වේ. " 2017 වසරේදි එකල IS සංවිධානය නිවැරදි බවට මම මුහුණුපොතෙහි පළ කිරීමට පටන්ගත්තෙමි." මෙම අධිචෝදනාපත්‍රයේ කාලසීමාව ආරම්භ වන්නේ වර්ෂ 2017 වර්ෂයෙනි. එම වර්ෂයෙන් ආරම්භ වී අන්තවාදී දේශන මාලාවන් දිගටම පවත්වාගෙන ගොස් ඇති බවට පැ.සා 1400 අනස් විසින් දෙන ලද සාක්ෂියත්, අනිකුත් සාක්ෂි මගිනුත් හෙළි වී තිබීම මත ඉහත සඳහන් කොටසෙහි සත්‍යභාවය මනාව තහවුරු වේ. එසේම දැනටමත්

සාක්ෂි ලබා දෙන ලද සිවිල් සාක්ෂිකරුවන් නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ සහ නුවරඑළිය බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට ප්‍රදේශවල පවත්වන ලද වැඩමුළු සම්බන්ධයෙන් එකී සිවිල් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් තහවුරු වූ කරුණු මෙම චිත්තිකරුගේ ඉහත ප්‍රකාශයේ පැ. 803(A2) (10) මගින්ද මනාව පැහැදිලි වන අතර, එහිදී වනාතවිල්ලුව ලැක්ටෝස්වත්ත මිළඳී ගැනීම, මයුරා පෙදෙස, මල්වාන, එඩේරමුල්ල වැනි ප්‍රදේශවල පිහිටි ආරක්ෂිත නිවාස වලට ඔහුගේ සම්බන්ධතාවය විමර්ශන නිලධාරීන්ගේ සාක්ෂි වලින් සනාථ වී තිබීමත්, එකී සිද්ධි දාමයම ඉදිරිපත් වූ පරිවේෂණීය සාක්ෂි මගින් සනාථ වී තිබීමත් අප විසින් සැළකිල්ලට ගන්නා ලදී. ඔහු විසින් චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ වර්ෂ 2020 කුලියාපිටියේ සමත මණ්ඩලයට ගිය බව සඳහන් කල ඇති බව පෙනී ගියද, හුදෙක් එම කරුණ තුළින් පමණක් ඔහුගේ පාපොච්චාරණමය ප්‍රකාශයෙහි සමස්ථ සාක්ෂිමය වටිනාකම හීන නොවන බවට අප තීරණය කරමු. මන්ද චිත්තියෙන් ඒ සම්බන්ධයෙන් කැඳවන ලද පොලිස් සාක්ෂිකරුගේ සාක්ෂියේදී කුලියාපාටියේ සමථ මණ්ඩලයේ පැවැති නඩුවකට ඔහු සහභාගී වී තිබීම කියා සිටීම නොසළකා හැරියද සෙසු සියළු කරුණු මගින් එම ප්‍රකාශයේ ඇති අනුකූලභාවය බැහැර කල නොහැක.එබැවින් එම ප්‍රකාශය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16(1) වගන්තිය යටතේ අනුකූල කර ගැනීමට අප තීරණය කරමු.

<u>04 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා විසින්</u>

<u>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාවින්ද පියසේකර යන අයට</u>

<u>2020.10.04 දින 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ</u>

<u>(තාවකාලික විධිවිධාන) පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව සිදු</u>

<u>කර ඇති පාපෝච්චාරණය.</u>

මෙම අධිකරණය ඉදිරියේ ඉහත කී පාපෝච්චාරණය සාක්ෂියක් ලෙස ආවේක්ෂ කරගත හැකිද යන්න සම්බන්ධයෙන් පවත්වන ලද අතුරු පරීක්ෂණය අවසානයේ එකී පාපෝච්චාරණය 04 වන චූදිත විසින් ස්වෙච්ඡාවෙන් සිදු කර ඇති පාපෝච්චාරණයක් බවට අප විසින් 2026.05.13 දින ප්‍රකාශ කරන ලද නියෝගය මඟින් තීරණය කර ඇත.

ඒ අනුව එකී පැ 183 දරන පාපෝච්චාරණයේ සඳහන් කරුණුවලින් පහත සඳහන් කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදි.

I. මාගේ පියා රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම්. ඔහු බුදු පිළිම කැඩීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන බන්ධනාගාරයේ ඉන්නවා.

II. මට බාල මල්ලී මොහොමඩ් ඊබ්‍රාහිම් සහීඩ් අබ්දුල්ලා බුදු පිළිම කැඩීම සම්බන්ධයෙන් මාත් එක් අත්අඩංගුවට ගෙන මේ වනවිට බන්ධනාගාරයේ ඉන්නවා.

III. මා සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු ශ්‍රී ලංකා ජමාද් ඉස්ලාම් සංවිධානය යටතේ තිබූ ජමාත් ඉස්ලාම් ශිෂ්‍ය සංවිධානයට සම්බන්ධ වුණා. එම ශිෂ්‍ය සංවිධානය විසින් පැවැත්වූ දින 05 සහ 07 වැඩමුළුවලට සහභාගී වුණා.

IV. එහිදී ලෝකය පාලනය කළ යුත්තේ ඉස්ලාම් ආගම පමණයි යන තේමාව මුල් කරගෙන ලෝකයේ මුස්ලිම් මිනිසුන්ට සිදු වන හිරිහාර සහ කරදර ඇතුළත් වීඩියෝ පට පෙන්වා Caliphat (ස්ලාමීය රාජ්‍යයක්) මතවාදයෙන් මනස වෙනස් කරනවා. එසේ ටික ටික ඔළුව හෝදන්නේ ලෝකයේ ජීවත් වන ඉස්ලාම් ආගමිකයින්ට අනිකුත් ආගම් වාදීන්ගෙන් සිදුවන හිරිහැර ඇතුළත් පැරණි වීඩියෝ දර්ශන පෙනවමින්. ඒ සඳහා මුස්ලිම් ජනයා නැගි සිටිය යුතු බවට පියවරෙන් පියවර කියලා දෙනවා.

V. මෙම සංවිධානය යටතේ ඇති අරාබික් විද්‍යාල මඟින්ද තරුණයන්ගේ මනස වෙනස් කිරීම සිදු කරනවා.

VI. 2014 මුල් කාලයේදී මුන්ෂිෆ්ගේ දැනුම් දීම අනුව මම මරදාන සහිරා පල්ලියට ගියා. එහි ජමාත් ඉස්ලාම් සංවිධානයේ මුන්ෂිෆ් ඉර්ෆාන්, තවුෆික් රුඩානි සහ තවත් දෙදෙනෙක් සිටියා. එතන ඕස්ට්‍රේලියාවේ සිට පැමිණි අහමද් යන අය අපි ටික දෙනාට කතා කර ලංකාවේ මුස්ලිම් ජනතාවට සිදුවන අසාධාරණකම් ගැන පෙන්වා දී ඊට

එරෙහිව ක්‍රියා කරන්න එකතු වෙන්න පුහුණුවක් සඳහා තුර්කියට යන්න කියලා කිව්වා. එයට අවශ්‍ය පාස්පෝට් මම හදාගත්තා.

VII. මුන්ෂිෆ් විසින් ලබා දුන් තෝමර් විශ්වවිද්‍යාලයේ පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය විස්තර අරගෙන මම තුර්කි තානාපති කාර්යාලයට ගොස් එම විස්තර සමඟ අයදුම්පත් භාර දී වීසා ලබා ගත්තා. සුෆියාන් විසින් විදේශගතවීමට අදාළ ටිකට් එක මගේ ඊමේල් එකට එව්වා.

VIII. මාව යවන්නේ යුධ පුහුණුවක් සඳහා බව මුන්ෂිෆ් කිව්වා. 2014 මැයි මාසේ 14 වන දින කටුනායක හරහා තුර්කිවල ඉස්තාන්බූල් ගුවන් තොටුපොළට ගියා. මරදාන පල්ලියේදී හඳුනාගත් අහමද් ගුවන්තොටුපොළට ඇවිත් මාව එක්කන් ගිහින් ෆාතිහ් නගරයේ කාමරයක නැවැත්තුවා.

IX. මම අහමද් විසින් හඳුන්වා දුන් අයෙක් සමඟ දේශ සීමාව ආසන්නයේ ඇති නිවසකට ගොස් එහි සිටි තවත් දෙදෙනෙකු සමඟ තුර්කියේ සිට සිරියාවට යුද්ධයෙන් විපතට පත් වූ තැනැත්තන්ට රාජ්‍ය නොවන සංවිධාන විසින් ආධාර රැගෙන යනවිට ඒ අය සමඟ සිරියා රටට ඇතුළු වුණා. එහිදී කැබ් රථයකින් ඇලප්පෝ නගරයේ නිවසකට එක්කගෙන ගිහින් ජමාතුල් හත්තාබ් සංවිධානයේ නායක අබුඅබ්දුල්ලා වෙත භාර දුන්නා. අපිට පුහුණුව දෙන්න ආරම්භ කළා.

පුහුණුවට 12 දෙනෙක් සිටියා. පුහුණුවීම දුන්නේ පලස්තීන ජාතිකයෙක් වෙන ගස්සාලි යන අයයි.

X. එම පුහුණුවේදී ශාරීරික අභ්‍යාස, ටී 56, LNG, Pistol, යන අවි පුහුණුව සහ වෙඩි තැබීම, පුපුරන ද්‍රව්‍ය සම්බන්ධයෙන්, කැලෑ සටන්, දින 40 ක් කියා දුන්නා. මෙම පුහුණුව අවසන් වී සතියකින් විතර මා සංවිධානයේ තවත් සාමාජිකයෙකු සමඟ සිරියාවේ දේශ සීමාව වෙත පැමිණ ගිය ආකාරයටම තුර්කි රටට ඇවිත් ස්තාන්බුල් හෝටලයක නැවතුනා. මගේ ඊමේල් එකට අහමඩ මුන්සිෆ් නැවත පැමිණීමේ ගුවන් ටිකට් පත එව්වා. මම ලංකාවට ආවා. ශිෂ්‍ය සංවිධානයේ සුෆියාන්ව හමුවෙලා සිරියාවේ ලැබූ පුහුණුව ගැන කිව්වා. එහිදී සුෆියාන් මට කිව්වා ලෝකයේම අයි.එස්.සංවිධානය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වෙලා තියෙන්නේ ලැබූ පුහුණුවෙන් සම්බන්ධයෙන් කාටවත් කියන්න එපා කියලා. මම ජමාද් ඉස්ලාම් එකේ වැඩ කටයුතු කරගෙන හිටියා.

XI. ඊට පස්සේ මම ජමාද් ඉස්ලාම් සංවිධානයට මා විසින් සම්බන්ධ කළ තරුණයන් වන සාජිත්, අනස් මව්ලවි, පවුෂාන්, සාහිඩ්, රුස්ඩි අහමඩ්, පොලොන්නරු ෆයාස් යන අයවලුන් සම්බන්ධ කරගෙන මා ශිෂ්‍ය සංවිධානයේ සිටි කාලයේදී සිදු කළ වැඩසටහන් පවත්වාගෙන යමින් සංවිධානයේ ආකල්ප ඉදිරියට කරගෙන ගියා.

XII. 2017 වසරේ 08 වන මාසයේදී මට අහමද්ගෙන් කෝල් එකක් ආවා. එයාව හමුවෙන්න කියලා. ඒ අනුව මම අනස්, ශිරාන් හා හම්දි යන මගේ මිතුරන් සමඟ බේරුවල අහමද්ගේ මවගේ නිවසට ගියා.

XIII. එයා මට ත්‍රීමා ඇප් එක සහිත පොන් එකක් දීලා කිව්වා එයත් එක්ක කතා කරන විට මේ පොන් එකෙන් කතා කරන්න කියලා. ඊට ටික කාලයකට පස්සේ අහමද් මට කෝල් කරලා කිව්වා මාලදිවයින් කට්ටියක් ඇවිත් ඉන්නවා එයාලා ඔයාට කතා කරයි එයාලා ඉල්ලන උදව් කරන්න කියලා කිව්වා. ඒ අනුව මම මාලදිවයින් ජාතිකයා (නම දන්නේ නැහැ) දෙවතාවක් හමුවුණා. එක් වතාවක් වැල්ලවත්ත ප්‍රදේශයේ නිවාස කුලියට දෙන එජාට්මන්ට් එකකදී, අනිත් වතාවේ වැල්ලවත්ත මුස්ලිම් පල්ලියේදී. එසේ හමුවුණ අවස්ථාවකදී වලදී මාලදිවයින් ජාතිකයා මගෙන් ඉල්ලා සිටියා ඥාණසාර හාමුදුරුවෝ මුස්ලිම් අයට හිරිහැර වන ආකාරයේ ක්‍රියා කරන නිසා එයාට මොනවහරි කරන්න ඕනේ. පිටරට සිට පැමිණෙන අයවලුන්ට රහසිගතව පැමිණ නැවතී සිටීමට මුහුදු අවට ඉඩම් මිලදී ගන්න හොයලා බලන්න කියලා. උණ්ඩ හදන්න ලේත් මැෂින් එකක් ගන්න කියලා මට රුපියල් 250, 000 ක් දීලා මේවාට උදව් කරන්න කීවා. මම ලේත් මැෂින් එකක් ගන්න සල්ලි ටිකක් ෆවුෂාන්ට

දුන්නා. ෆවුෂාන් ලේත් මැෂින් එකක් අරගෙන වැඩ කටයුතු කරගෙන ගියා.

XIV. 2017 වසරේදී මා ළඟ තිබූ ටී 56 අරගෙන මාගේ මිතුරන් වන අනාස්, සාජිත්, පවුෂාන්, හනාන්, හම්දි සමඟ මා කලින් දැන සිටි හාජා මොහිදීන්ට අයත් තොප්පූර් නිවසට ගියා. මම ටී 56 අවිය භාවිතා කරන ආකාරය හා එහි හැඳින්වීමක් මිතුරන්ට ලබා දී පසු දින අපි නිවෙස්වලට ගියා.

XV. 2018 ජනවාරිවල මට සාජිත් දුරකථනයෙන් කතා කර හමුවුණා. එහිදී දිගන, බේරුවල සිද්ධීන් නිසා මුස්ලිම් ජනතාවට වන අසාධාරණකම් ගැන කතා කර සාජිත්ගේ දැනුම් දීම අනුව මම සහරාන්ව හමුවුණා.

XVI. සහරාන්, නවුෆර් සමඟ කීපවිටක් මා සහ සාජිත් හමුවන්න දෙල්ගහගොඩ නිවසට හා මද්රසා පාසලට ආවා. ඒ හැමවේලාවේම සාකච්ඡා කළේ ස්ලාම් ධර්මයට එරෙහි වන සියලු දෙනා වෙනුවෙන් මුස්ලිම් තරුණයින් ඒකරාශි කර කණ්ඩායමක් සැදී එරෙහි වන්නන්ට එරෙහිව ක්‍රියාත්මක විය යුතු බවයි. ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව පවසා මාව මාවනැල්ල ප්‍රදේශයේ නායකයා වශයෙන් පත් කළා.

XVII. සංවිධානයේ මාගේ නම අබූ උමර්. සංවිධානයේ සහරාන්ගේ නම අබූ උබෙයිදා. නවුෆර්ට අබූ සරීම්, සාජිත්ට අබූ නජා, රිස්කාන්ට අබූ තාරික්, මල්ලි සහීඩ්ට අබූ ෆලා, ආබිදීන්ට අබූ හිනා, මිල්හාන්ට අබූ සිලා, හස්තූන්ට අබූ මොහොමද්, මුබාරක්ට අබ්දුල්ලා වශයෙන් නම් දාලා තිබුණා.

XVIII. සහරාන් මට ත්‍රීමා ඇපි එක තියෙන පොන් එකක් දුන්නා. සාමාන්‍ය කෝල් ගන්න එපා කිව්වා. ඉන්පසු මම ජමාද් ඉස්ලාම් සංවිධානයේ සිටි හා මිතුරන් වන හිස්බුල්ලා, නවුෂාඩ්, සෙයිෆුල්ලා, අහ්සන්, අලි, හනාන්, අනස්, සල්මාන්, මුෆ්ති, ඉර්ෂාඩ්, මුනීෆ්, හම්දි, හුස්නි, සාජිත් මව්ලවි, පවුෂාන්, අකීල්, ආකීල්, සාජිත්, ගෙලිඔය ෆයාස්, හිදයතුල්ලා, මුෆීස්, හමාස්, සමීර්, මගේ තාත්තා වන මොහොමඩ් ඊබ්‍රාහිම් යන කීපදෙනෙකු වරින්වර වැඩසටහන් සඳහා යොමු කළා. එම දින දෙකේ වැඩසටහන් සඳහා අවස්ථා කීපයකදී මම දේශකයෙකු වශයෙන් සහභාගී වුණා. එම වැඩසටහන් නුවරඑළිය, නුවර, හම්බන්තොට ප්‍රදේශවල පැවතුනා. එම වැඩසටහන් වලදී කුරාණය සහ ආගම, අයි.එස් ඉතිහාසය, අයි.එස් සංවිධානයට සම්බන්ධ වීඩියෝ. අයි.එස් සංවිධානයේ සැලැස්ම සම්බන්ධ වීඩියෝ. ඉස්ලාම් ආර්ථිකය සම්බන්ධ වීඩියෝ, අයි.එස්.සටන් කරන ආකාරය සම්බන්ධ වීඩියෝ පෙන්නුවා. ඉන්පසු

ටී 56 අවිය හා පිස්තෝල අවිය පෙන්වා දී ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් ඉගැන්වීම් කළා. වැඩසටහන අවසානයේ සහරාන් විසින් සංවිධානයේ අඛු නම් ලබා දී ප්‍රහාරක අංශ සහ මරාගෙන මැරෙන අංශය වශයෙන් සාමාජිකයන් වෙන් කළා.

XIX. මාවනැල්ල අබ්දීන්ගේ නිවස, නවුෆර් මව්ලවිගේ නිවස තුළ සහරාන් ඇතුළු ප්‍රධානීන් වන මිල්හාන්, කස්තූන්, රිල්වාන්, ෂාෆි, සාජිත්, ඊබ්‍රාහිම් හමුවී සංවිධානයේ ආරාබි භාෂා පොත් (ජිහාඩ්) පරිවර්තනය කිරීම වැනි කටයුතු කළා.

XX. මල්වානයේ ආරක්ෂිත නිවසේදී පුහුණු කඳවුර සම්බන්ධයෙන් කතා කළා. අපි නුවරඑළිය දේශනයේදී සංවිධානය වෙනුවෙන් අබුබකර් අල් බග්දාදි වෙනුවෙන් (අයි.එස්) දිවුරුම දුන්නා.

XXI. සහරාන් පුහුණු කඳවුරු පවත්වාගෙන යාමට ඉඩම් හොයන ලෙසට දැනුම් දුන්නා. ඔය කාලයේදි මා ළඟ තිබූ ටී 56 අවියක් මම සහරාන්ට දුන්නා. මම කලින් දැනගෙන සිටි මුෆිස් මාර්ගයෙන් ඔහුට අයත් පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝ වත්ත ඉඩම ගැන හොයලා බැලුවා. එම ඉඩම පුහුණු කඳවුරකට හොඳයි කියලා මට හිතුනා. මේ ගැන මම සහරාන්ට කියලා රුපියල් ලක්ෂයක් ඉල්ලා ගෙන එය මුෆිස්ට දීලා එම වත්ත පුහුණු කටයුතු සඳහා ලබා ගත්තේ ෆාම්

එකක් කරන් කියලා. එම ඉඩම මම මිල්හාන් සමඟ ගොස් මුෆීස් සහාය ඇතිව ඉඩම වට කර වැටක් ගැහුවා.

XXII. ලැක්ටොස් වත්ත ගත්තේ සාමාජිකයන් පුහුණු කිරීම සඳහා යි.

XXIII. ඔය කාලේ තමයි මට සහරාන් කිව්වේ පිළිම සහ ගස් ගල්වලට වැදීම අපේ ආගමට අනුව වැරදියි. ඒ නිසා පිළිම කඩලා දාන්න කියලා කිව්වා. එයට හේතුව වුනේ දිගන මුස්ලිම් පල්ලිය සිංහල මිනිස්සු විසින් කඩා දැමීම නිසයි.

XXIV. සහරාන්ගේ උපදෙස් අනුව මම මාගේ මල්ලී වන සාහිඩ් සමඟ අංක වී ඕ 1117 දරන රතු පාට යතුරු පැදියෙන් ගොස් දින දෙකක රාත්‍රී කාලයේදී හිඟුල බස් හෝල්ට් එක ළඟ බුදු පිළිමය, රංදිවෙල හංදියේ බුදු පිළිමය හා මහන්තේගම මිරිස්කුඩු හංදියේ බුදු පිළිමය කැඩුවා. ඊළඟ දවසේ මල්ලී ෆවුෂාන් සමඟ හා මුෆ්ති අනීක් යන අය සමඟ යතුරු පැදි වලින් බුදු පිළිම කඩන්න යවලා මම අස්ෆාක් සමඟ බුදු පිළිම කඩන්න ගියා. මම අස්ෆාක් සමඟ කඩුගන්නාව දන්තුරේ තිබුණු බුදු පිළිමය කඩන්න උත්සාහ කළා. එයට මිටියෙන් ගැහුවත් එය කඩන්න බැරි වුණා. ඒ නිසා මම අස්ෆාක් එක්කලා කඩුගන්නාවේ සිට එනවිට ඇතුල් පාරක තිබූ බුදු පිළිමයක් මිටියෙන් ගහලා කැඩුවා. ඒක කඩලා එනවිට තමයි අස්ෆාක්ව පාරේදී පිරිසක් අල්ලාගත්තා. මම දුවලා ගිහින් බේරිලා හිඟුලට ඇවිත් මල්ලීට

කෝල් කරලා ගෙන්වාගෙන නිවසට ගියා. පොලිසිය හොයයි කියලා මම මල්ලිට නාවලපිටිය ආච්චිගේ ගෙදරට යන්න කියලා මම සහරාන්ට කතා කරලා මගේ බිරිඳත් සමඟ AAX – 3774 දරන ටී වී එස් වර්ගයේ කොල පාට ත්‍රී රෝද රථයෙන් කුරුණෑගල බම්මන්නේ අබු සනාගේ ගෙදරට ගියා. එතනින් කුලියාපිටිය අබුතාරික්ගේ (රිස්කාන්) ගෙදර, මීගමුව කොච්චිකඩේ ආරක්ෂිත නිවස, කල්මුණේ අබු මුක්තාර් නොහොත් අසාද්ගේ නිවස, කාත්තන්කුඩි අබුසෙයිද්ගේ නිවස, කාත්තංකුඩි මිල්හාන්ගේ නිවස, මයුරා ප්ලැට් වැල්ලවත්ත යන ස්ථානවල මාගේ බිරිඳ හා දරුවා සමඟ සහරාන් විසින් පැවසූ ආකාරයට රැඳී සිටියා. අවසානයට අපි තුන්දෙනා හිටියේ වත්තල එඩේරමුල්ල ආරක්ෂිත නිවසේයි. එහි සහරාන් ප්‍රහාරය එල්ල කරන තෙක් සිට වෙනත් ස්ථානයකට යනතෙක් තිහාරියේ අබ්දින් නානාට අයත් නිවසක දින 02 ක් සිටියා.

XXV. පසුව නුවරඑළිය කුලී කාමරයකත් ගම්පොල හුසේන් මාමාගේ නිවසේත් සිට ගම්පොල අනුස්දීන් මාමාගේ සපත්තු කඩයේ ඉන්න විට මාවයි මල්ලිවයි පොලිසියෙන් අල්ලා ගත්තා.

XXVI. පොලිසියෙන් අල්ලා ගන්න කලින් මයුරා පෙදෙස වැල්ලවත්ත ෆ්ලැට් එකේ ඉන්න විට සහරාන් සමග හස්තූන්, නවුෆර්, සාජිත්, මල්ලි සාහිඩ්, ෂාෆි, රිස්කාන්, මිල්හාන්, අබු බරා, රිල්වාන් හා තවත්

කට්ටිය සිටියා. අබු බරා තමයි සල්ලි වියදම් කළේ අපි එඩේරමුල්ලට ගියාට පස්සේ. සංවිධානයට සල්ලි දුන්නේ අබු බරාමයි. එක පාරක් දුන් සල්ලි වලින් බුදු පිළිම කඩලා අහුවෙලා හිටිය කට්ටියගේ නිවෙස්වලට සල්ලි ගිහින් දුන්නා.

XXVII. නවුෆර්, සංවිධානයේ දෙවන නායකයා වශයෙන් සිටියා.

XXVIII. අපි සිටි ආරක්ෂික නිවාසවල සහරාන් සහ අපගේ ආරක්ෂාවට අපි ආයුධ තියාගත්තා.

XXIX. අපි සහරාන්ගේ වැඩසටහනක් පවත්වන්න හම්බන්තොට ගිහින් සිටියදී එම වැඩසටහන තියන්න බැරුව ගියා සහරාන්ගේ මල්ලි රිස්වාන් බෝම්බයක් ටෙස්ට් කරන්න ගිහිල්ලා එය පුපුරලා තුවාල වුණ නිසා අපිට එයාව අරගෙන රෝහලකට යන්න වුණ නිසයි.

XXX. රිල්වාන්ව ගෙනාවේ කොළඹ ජාතික රෝහලටයි. සහරාන් කියපු නිසා මම එයා ළඟ නතර වුණා. එයාව රෝහලට ඇතුළත් කළේ මගේ මල්ලි සාහිඩ්ගේ නම දීලා ගෑස් සිලින්ඩරයක් පුපුරලා තුවාල වුණා කියලයි. මම රිල්වාන් ගාව දින 02 සිටියා. යනුවෙන් වේ.

XXXI. කෙසේ වුවද, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව ඉහත කී පාපෝච්චාරණයෙහි අඩංගු කරුණු එකී පාපෝච්චාරණය සිදු කළ

04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා යන චූදිතට එරෙහිව මෙන්ම ඔහු සමඟ මෙම අධිකරණය ඉදිරියේ අධි චෝදනා ලබා ඇති, ඉහත කී පැ 183 දරන පාපෝච්චාරණයෙහි තොරතුරු හෙළි වන්නා වූ අනිකුත් චූදිතයන්ටද එරෙහිව උපයෝගී කර ගැනීමට මෙම අධිකරණයට බාධාවක් නොමැති පසුබිම තුළ පැ 183 දරන පාපෝච්චාරණයෙහි අඩංගු ඉහත කී වැදගත් විස්තර ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු කර තිබේද යන්න මෙහිදී අප විසින් සළකා බලන ලදි.

<u>විශ්ලේෂණය</u>

ඉහත පරිදි 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ පැ.183 දරන පාපෝච්චාරණයට අනුව ඔහු 2017 වසරේ සිටම සහරාන් නැමැත්තා සමඟ සම්බන්ධතා පවත්වා ඇති බව හෙලිවන අතර එසේම, 2018 වසරේ ජනවාරි මාසයේ මෙම 09 වන චූදිත එනම් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් නැමැත්තා හමුවීමට සහරාන් නැමැත්තා නවුෆර් නැමැත්තා සමඟ මෙම 04 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා පදිංචිව සිටි දෙල්ගහගොඩ නිවසට සහ මද්දසා පාසලට සහරාන් සහ නවුෆර් කීපවිටක්ම පැමිණ ඉස්ලාම් ධර්මයට එරෙහි වන සියලු දෙනා වෙනුවෙන් මුස්ලිම් තරුණයින් ඒකරාශී කර කණ්ඩායමක් සැදී ඉස්ලාම් ආගමට එරෙහි වන්නන්ට එරෙහිව මුස්ලිම් තරුණයින්

ඒකරාශී වී කටයුතු කළ යුතු බවට දැනුම් දී ඇත. මෙහිදී නවුෆර් ලෙස සඳහන් කර ඇත්තේ මෙම නඩුවේ 01 වූදිත වන මුහම්මදු ඉබ්‍රාහිම් මොහම්මදු නවුෆර් යන අය බවට මෙම පාපෝච්චරණය සමස්තයක් ලෙස ගෙන කරුණු පරීක්ෂා කර බැලීමේදී පෙනී යන අතර, ඒ අනුව සහරාන් සහ 01 වන වූදිත නවුෆර් නැමැත්තා මෙම 04 වන වූදිත සාදික් අබ්දුල්ලා සහ 09 වන වූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් නැමැත්තාව එලෙස හමුවී කරුණු සාකච්ඡා කර ඇති බව පෙනී යන අතර එසේම, මෙම 04 වන වූදිත වන සාදික් අබ්දුල්ලා යන අයව අදාළ කණ්ඩායමේ මාවනැල්ල ප්‍රදේශයේ නායකයා වශයෙන්ද පත් කර මෙම 04 වන වූදිතට එම සංවිධානයේදී භාවිතා කිරීම සඳහා ‘අබු උමර්’ යන නාමයද සහරාන් නැමැත්තා විසින් ලබා දී ඇති අතර එසේම, එලෙස ඉස්ලාම් ධර්මයට එරෙහි වන පුද්ගලයන්ට එරෙහිව සහරාන් විසින් ගොඩනගා ගෙන තිබූ සංවිධානයේදී එකී සහරාන් නැමැත්තා ‘අබු උබෙයිදා’ යන නමද භාවිතා කර ඇති ආකාරය මෙම 04 වන වූදිතමොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ පාපෝච්චාරණය තුළින් පෙනී යයි. එම කරුණු පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය මඟින් මැනවින් තහවුරු වේ. එකී පැ. සා. 1400 අනස්ගේ සාක්ෂිය අනුව නුවරඑළිය වැඩමුළුවේදී 04 වන වූදිතට අබු උමර් යන අබු නාමය ලබා දුන් බවට ඔහු මෙම අධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂිය මගින් ඒ අනුව 04 වන වූදිතගේ පාපෝච්ඡාරණයෙහි සඳහන් මෙම කරුණු මැනවින් තහවුරු වේ.

තවද මෙම චූදිතගේ පාපෝච්චාරණයේදී සඳහන් කර ඇත්තේ නවුෆර්ට අබු සරීම් යන නම සහරාන් විසින් ලබා දුන් බවට වන අතර අප පෙර අවස්ථාවකද මෙම නියෝගයේදී සඳහන් කරන ලද පරිදි නවුෆර් යනු මෙම නඩුවේ පළවන චූදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මව්ලවි හෙවත් අබු සාරිම් නැමැත්තාම බවට අධිචෝදනා පත්‍රයෙහි චූදිත ලැයිස්තුවේ අංක 01 චූදිත ලෙස සඳහන් කර ඇති නම පරික්ෂාවේදී පෙනී යයි.

ඉහත කී පැ 183 ලෙස ලකුණු කර ඇති 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලාගේ ගේ පාපෝච්චාරණයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ සහරාන් නැමැත්තා විසින් සාජිත් හට අබු නජා යන නම ලබා දුන් බව වන අතර සාජිත් යනු අධිචෝදනා පත්‍රයේ 09 වන චූදිත ලෙස නම සඳහන් ‘මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් හෙවත් අබු නජා හෙවත් සාජිත් මව්ලවි’ යනුවෙන් සඳහන් කර ඇති තැනැත්තා බව පෙනී යයි.

එසේම, ඉහත පාපෝච්චාරණයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ රිස්කාන්ට ‘අබු තාරික්’ යැයි නමක් අදාළ සංවිධානය තුළ භාවිතා කිරීම සඳහා සහරාන් නැමැත්තා විසින් ලබා දී ඇති බව වන අතර රිස්කාන් යනු අධිචෝදනා පත්‍රයෙහි 06 වන චූදිත ලෙස නම සඳහන් කර ඇති ‘මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් හෙවත් අබුතාරික්’ නැමැත්තා බව පැහැදිලි වේ.

මෙම 04 වන චූදිතගේ ඉහත කී පැ183 දරන පාපෝච්චාරණයෙහි තවදුරටත් සඳහන් කර ඇත්තේ මෙම චූදිතගේ මල්ලී වන සාහිඩ් නැමැත්තාට 'අබු ෆලා' යන නම සහරාන් විසින් ලබා දී තිබූ බව වන අතර අධිචෝදනා පත්‍රයෙහි 05 වන චූදිත ලෙස සඳහන් කර ඇති 'මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් හෙවත් අබු ෆලා' යනුවෙන් සඳහන් කර ඇත්තේ ඒ අනුව මෙම 04 වන චූදිතගේ මල්ලි වන 05 වන චූදිත සාහිඩ් නැමැත්තා බව පෙනී යයි.

එසේම, ආබ්දීන් නැමැත්තාට අබු හිනා යන නම සහරාන් විසින් ඇති කරන ලද සංවිධානයේදී භාවිතා කිරීම සඳහා ලබා දී ඇති නම බවට මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයෙන් හෙලි වන අතර අධිචෝදනා පත්‍රයෙහි 15 වන චූදිත ලෙස නම සඳහන් කර ඇති 'මොහොමදු හනීෆා සෙයිනුල් ආබ්දීන් හෙවත් අබු හිනා' යනුවෙන් සඳහන් කර ඇත්තේ ඉහත පරිදි 04 වන චූදිතගේ පාපෝච්චාරණයේ සඳහන් කර ඇති ආබ්දීන් නැමැත්තා බව පෙනී යයි.

එසේම, 04 වන චූදිතගේ පාපෝච්චාරණයේදී තවදුරටත් සඳහන් කර ඇත්තේ 'මිල්හාන්ට අබු සිලා' යන නම සහරාන් විසින් ඇති කරන ලද සංවිධානයේදී භාවිතා කිරීම සඳහා ලබා දුන් බව වන අතර අධිචෝදනා පත්‍රයේ 03 වන චූදිත ලෙස නම සඳහන් කර ඇති 'හයාතු මොහොමදු අහමදු මිල්හාන් හෙවත් අබු සිලා' යනුවෙන් සඳහන් කර ඇත්තේ 04 වන

චූදිතගේ ඉහත කී පැ 183 දරන පාපෝච්චාරණයේ සඳහන් මිල්හාන් නැමැත්තා බව පෙනී යයි. පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව නුවරඑළිය වැඩමුළුවේදී මිල්හාන්ට අබු සිලා යන නම ලබා දුන් බව පවසා ඇති අතර, එම සාක්ෂිකරු තම සාක්ෂියේදී පවසා ඇත්තේ එම නුවරඑළිය වැඩමුළුවට සහභාගී වූ අය අතරින් මිල්හාන් ලෙස නම සඳහන් පුද්ගලයන් එක් අයෙක් පමණක් සිටි බවයි. ඒ අනුවද බලන කල එකී පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුට වසර 07 කට අධික කාලයකට පසුව ප්‍රථම වතාවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දීමේදී මෙම නඩුවේ 03 වන චූදිත මිල්හාන් යන අයව විවෘත අධිකරණයේදී හඳුනා ගැනීමට නොහැකි වුනද ඔහු පැවසූ නුවරඑළිය වැඩමුළුවේ දී මිල්හාන් යන නම දරන පුද්ගලයන් එක්කෙනෙක් පමණක් සිටි බවට සාක්ෂි ලබා දී පවසා තිබීම තුළින් ඔහු එලෙස පවසා ඇත්තේ මෙම නඩුවෙහි 03 වන චූදිත වන මිල්හාන් නැමැත්තා සම්බන්ධයෙන්ම බවට මනාව පැහැදිලි වේ.

එසේම, 04 වන චූදිතගේ ඉහත කී පැ183 දරන පාපෝච්චාරණයෙහි ‘හස්තූන්ට අබු මොහොමද්’ යන නම ලබා දී ඇති අතර අධිචෝදනා පත්‍රයේ පළවන චෝදනාවේ ‘දැනට මියගොස් සිටින ‘‘අච්චි මොහමඩ් හස්තූන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් හෙවත් කස්තූන් හෙවත් අබුමොහොම්මද්’’ යනුවෙන් සඳහන් කර ඇති තැනැත්තාව එලෙස සහරාන් විසින් ඔහු විසින් ඇති කරන ලද සංවිධානයේදී භාවිතා කළ යුතු

නම ලෙසට ‘අබුමොහොම්මද්’ යන නම ලබා දී ඇති බව පෙනී යන අතර එම තැනැත්තා 2019.04.21 පාස්කු ඉරුදින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී ස්වයංඝාතක බෝම්බය පුපුරවා හැරීම කරන ලද බවට ඩී එන් ඒ ජාන පරීක්ෂණ සාක්ෂි මඟින් සහ CCTV දර්ශන හා සම්බන්ධ සාක්ෂි මඟින් මෙම අධිකරණය ඉදිරියේ කරුණු තහවුරු වී ඇති හස්තූන් නැමැත්තාම බවට පැහැදිලිව කරුණු පෙනී යයි.

මෙම 04 වන චූදිතගේ පැ 183 දරන පාපෝච්චාරණයේ ‘‘මුබාරක්ට අබ්දුල්ලා වශයෙන් නම් දාලා තිබුනා.’’ යැයි සඳහන් කර ඇති කරුණේ මුබාරක් යනුවෙන් සඳහන් කර ඇති තැනැත්තා මෙම නඩුවේ අධිචෝදනා පත්‍රයේ පළවන චෝදනාවෙහි සඳහන් කර ඇති දැනට මියගොස් සිටින ‘‘ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබුඅබ්දුල්ලා’’ යන තැනැත්තා බව පෙනී යන අතර එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබුඅබ්දුල්ලා යන තැනැත්තා කිංග්ස්බරි හෝටලය යන ස්ථානයෙහි ස්වයංඝාතක බෝම්බය පුපුරවාගෙන මියගොස් ඇති තැනැත්තාම බවට ඩී එන් ඒ ජාන පරීක්ෂණ සාක්ෂි මඟින් සහ CCTV දර්ශන හා සම්බන්ධ සාක්ෂි මඟින් මෙම අධිකරණය ඉදිරියේ මැනවින් කරුණු සනාථ වී ඇති පසුබිම තුළ මෙම 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නැමැත්තාට එකී ස්වයංඝාතක බෝම්බකරු සම්බන්ධයෙන්ද මනා දැනීමක් තිබී ඇති බව පෙනී යයි.

මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයේ සඳහන් කර ඇති පරිදි ඉස්ලාම් ධර්මයට එරෙහි වන තැනැත්තන්ට එරෙහිව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර ඇති තැනැත්තා සහරාන් නැමැත්තා වන අතර එසේම, අන්තවාදී මතවාද දරමින් පිළිම සහ ගස් ගල්වලට වැඳීම අපේ ආගමට අනුව වැරදියි, ඒ නිසා පිළිම කඩලා දාන්න යැයි උපදෙස්ද ලබා දී අන්තවාදී මත ප්‍රචලිත කරමින් ආගම් අතර ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික එදිරිවාදී හැඟීම් ඇති කරන මතවාද ප්‍රචාරය කරමින් අධිශික්ෂණය ලබා දී අවි පුහුණුව ලබා දී බුදු පිළිම කඩා දැමීමට උපදෙස් ලබා දී ඇති, 2019.04.21 දින කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු කර පුද්ගලයින් ගණනාවකගේ ජීවිත අහිමි කළ, එම හෝටලයේ දේපළවලට හානි සිදු කරන ලද තැනැත්තා සමඟ මෙම 04 වන චූදිත පුහුණුවීම් කඳවුරුවලට පවා සහභාගී වෙමින් ඇතැම් අවස්ථාවල එම පුහුණු වැඩසටහන්වලදී දේශකයෙකු වශයෙන්ද මෙම 04 වන චූදිත කටයුතු කරන ලද බවට ඔහුගේම ඉහත කී පැ 183 දරන පාපෝච්චාරණය තුළින් හෙලිවන අතර එවන් පුහුණු වැඩසටහන් නුවරඑළිය, නුවර, හම්බන්තොට ප්‍රදේශවල පැවතුන බවට ද මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණය තුළින් කරුණු හෙලිවන අතර එසේම, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂි වලින් එම කරුණ මැනැවින් තහවුරු වන අතර ඔවුන්ගේ සාක්ෂි වලට අනුව එකී වැඩසටහන්වලදී කුරානය සහ ආගම, අයි.එස් ඉතිහාසය, අයි එස්

සංවිධානයට සම්බන්ධ වීඩියෝ, අයි.එස් සංවිධානයේ සැලැස්ම, අයි එස් සටන් කරන ආකාරය සම්බන්ධ වීඩියෝ නරඹමින් පුහුණුවීම් ලබා ඇති බවට පෙනී යන අතර එසේම, එම වැඩසටහන්වලදී අවි පුහුණුවක්ද ලබා දී ඇති ආකාරය මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයේ සඳහන් කර ඇති "ඉන්පසු ටී 56 අවිය හා පිස්තෝල අවිය පෙන්වා දී ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් ඉගැන්වීම් කළා. වැඩසටහන අවසානයේ සහරාන් විසින් සංවිධානයේ අබු නම් ලබා දී ප්‍රහාරක අංශ සහ මරාගෙන මැරෙන අංශය වශයෙන් සාමාජිකයන් වෙන් කළා." යැයි සඳහන් කර තිබීම තුළින් සහ 04 වන චූදිත විසින් ද මෙලෙස ටී.56 අවියක් භාවිතා කරන ආකාරය සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දුන් බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවෙකු වන පැසා.1400 අබ්දුල් ජබාර් මොහම්ඩ් අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මැනැවින් පේනී යන අතර එකී අනාස් ගේ සාක්ෂියට අනුව තෝප්පූර් ප්‍රදේශයේ වාඩියකට 04 චූදිත සහ තවත් කීපදෙනෙකු සමග සමග වැන් රථයකින් ගොස් එහි නැවතී සිටිය දී රාත්‍රී කාලයේ 04 චූදිත සාදික් අබ්දුල්ලා විසින් අවශ්‍ය වුනොත් පාවිච්චි කිරීම සඳහා ටී.56 අවියක් ගලවා සම්පූර්ණයෙන් නැවත සකස් කිරීම කියා දුන් බවට පවසා ඇති සාක්ෂියෙන් මනාව පැහැදිලි වේ.

මෙම 04 වන චූදිත මෙම නඩුවට පාදක වන 2019.04.21 දින දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු කරන ලද පාස්කු ඉරුදින මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාව සිදු කිරීම හා සම්බන්ධව කටයුතු කර ඇති දැනට

මියගොස් සිටින සහරාන් නැමැත්තා සමඟ මෙන්ම සහරාන් විසින් නිර්මාණය කරන ලද සංවිධානයෙහි ප්‍රධානීන් වන නවුෆර් මව්ලවි මිල්හාන්, කස්තූන්, රිල්වාන්, සාෆි, සාජිත් යන අය සමඟ එක්ව කටයුතු කර ඇති ආකාරය මෙන්ම 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා යන අයගේ පැ 183 දරන පාපෝච්චාරණයේ සඳහන් කරුණු මඟින් මනාව පැහැදිලි වේ.

එකී පාපෝච්චාරණයේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ **"අපි නුවරඑළිය දේශනයේදී සංවිධානය වෙනුවෙන් අබුබකර් අල්බග්දාදී වෙනුවෙන් අයි එස් දිවුරුම දුන්නා .. සහරාන් පුහුණු කඳවුරු පවත්වාගෙන යාමට ඉඩම් හොයන ලෙසට දැනුම් දුන්නා. ඔය කාලයේදී මා ළඟ තිබූ ටී 56 අවියත් මම සහරාන්ට දුන්නා. මම කලින් දැන සිටි මුෆිස් මාර්ගයෙන් ඔහුට අයත් පුත්තලම වනතාවිල්ලුව ලැක්ටෝස් වත්ත ඉඩම ගැන සොයලා බැලුවා. එම ඉඩම පුහුණු කඳවුරකට හොඳයි කියලා මට හිතුනා. මේ ගැන මම සහරාන්ට කියලා රුපියල් ලක්ෂයක් ඉල්ලාගෙන එය මුෆිස්ට දිලා එම වත්ත පුහුණු කටයුතු සඳහා ලබා ගත්තේ ෆාම් එකක් කරන්න කියලා"** යැයි සඳහන් කළ ඇති කරුණ තුළින් මෙම 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා නැමැත්තා ඔහු ළඟ තිබූ ටී 56 අවිය ඉහත කී මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාට ලබා දී වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත නැමැති ඉඩම සහරාන්

නැමැත්තාගෙන් ඉල්ලා ගත් මුදල්වලින් ලබාගෙන එම ඉඩම මුෆීස් නැමැත්තා සමඟ වට කර වැට ගසා සාමාජිකයන් පුහුණු කිරීම සඳහා එය සූදානම් කළ බවට මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයේදී පැහැදිලිව සඳහන් කර ඇති පසුබිම තුළ මෙම 04 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා යන අයට 2017 වසරේ මෙන්ම 2018 සහ 2019 වසරවලද සහරාන් නැමැත්තා සමඟ සම්බන්ධ වී අවි පුහුණුව සිදු කර ඇති බව පෙනී යන අතර එමෙන්ම එකී සහරාන් නැමැත්තාගේ උපදෙස් මත ඔහු සමඟ එක්ව කටයුතු කරමින් බුදු පිළිම කැඩීම් සිදු කර විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික එදිරිවාදී හැඟීම් ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවන් සිදු කිරීමේ වරදවල් සඳහා පොදු අරමුණක් ඇතිව එකී ක්‍රියාවන්ට අනුබල දීමට එකඟ වීමක් සිදු කර ඇති බව මනාව පෙනී යන අතර මෙම චූදිතගේ පාපෝච්චාරණයේ සඳහන් කර ඇති පරිදි විවිධාකාර අවි පුහුණුව ලබමින් ජත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධානයක් වන අයි එස් සංවිධානයට සම්බන්ධ පුද්ගලයන් සිදු කරන සටන් කිරීම් සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඇති බව පෙනී යන අතර ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තා විසින් මෙම චුදිත සහභාගී වූ වැඩසටහන් අවසානයේ ප්‍රහාරක අංශ සහ මරාගෙන මැරෙන අංශය වශයෙන් මෙම චූදිතද සහභාගී වූ මෙම චූදිතද ක්‍රියාකාරී සාමාජිකයෙකු වූ සංවිධානයේ සාමාජිකයන්ව සහරාන් විසින්

එලෙස බෙදා වෙන් කිරීමක් කරන ලද බවට මෙම චූදිත විසින් තම පාපෝච්චාරණයේ සඳහන් කර ඇති පසුබිම තුළ 2019.04.21 දින දිවයිනේ විවිධ ප්‍රදේශවල සිදු කරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන් සිදු කිරීමට අදාළ කුමන්ත්‍රණයට මෙම 04 චූදිතද සක්‍රියව දායක වී ඇති අතර, ගිනිඅවි හැසිරවීම සම්බන්ධයෙන් අවි පුහුණුව ලබාදීම් ආදියද සිදු කර ඒ සඳහා කණ්ඩායම් ස්ථානගත කිරීම සඳහා පුහුණු කඳවුරු සඳහා අවශ්‍ය ස්ථානයන්ද සොයා ගැනීමට සහභාගී වී ඇති මෙම 04 වන චූදිත අධිචෝදනා පත්‍රයේ සඳහන් ප්‍රධානම චෝදනාව වන පළවන චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කර ඇති බව පැහැදිලිව පෙනී යන අතර එකී කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් ලෙසට කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, මඩකලපුව සියෝන් දේවස්ථානය යන දේවස්ථානයන්හි මෙන්ම කොටුව කිංග්ස්බරි හෝටලයේ, කොටුව ෂැංග්‍රිලා හෝටලයේ, කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ සහ දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් නැමැති ස්ථානයේ බෝම්බ පුපුරුවා හැරීම් සිදු කිරීම සිදුවී ඇති බැවින් මෙම 04 වන චූදිතට එරෙහිවද එකී ක්‍රියාවන් සිදු කිරීම හා සම්බන්ධයෙන් පොදු අරමුණක් තිබී ඇති බව පෙනී යන අතර ඒ අනුව එකී වරදවල් සිදු කිරීම සඳහා ෙමම 04 වන චූදිත විසින්ද අනුබල දීම සිදු කර ඇති බවද මනාව පැහැදිලිය.

අධිචෝදනා පත්‍රයෙහි සඳහන් 04 වන චෝදනාව වන්නේ පළවන චෝදනාවේ සඳහන් කාල සීමාව තුළදී (2017 නොවැම්බර් 01 දින සහ 2019.04.21) මෙම චූදිත විසින් අනුරාධපුර, රඹෑව, මල්වාන, මහනුවර, නුවරඑළිය, හම්බන්තොට යන ප්‍රදේශවලදී අන්තවාදී මතවාද හෝ ජන කොටස් හෝ ආගම් අතර ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතික හෝ දුර්චේතනික හෝ එදිරිවාදි හැඟීම් ඇති කරන මතවාද ප්‍රචාරය කර අධිශික්ෂණය ලබා දීමෙන් හෝ අවි පුහුණුව ලබා දීමෙන් හෝ බෝම්බ පුපුරුවා හැර හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කර සාහසික ක්‍රියාවන් හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවන් සිදු කිරීමේ වරද සිදු කළ බවට වේ.

මෙම 04 වන චූදිතගේ පැ 183 දරන පාපෝච්චාරණයේදී ඔහු සඳහන් කර ඇත්තේ 2018 ජනවාරිවල ඔහු සහරාන් නැමැත්තාව අවස්ථා කීපයකදී මුණගැසීමක් සිදු කරන ලද බව සහ එකී සහරාන් නැමැත්තා මෙම චූදිතව හමුවීමට චූදිත පදිංචි දෙල්ගහගොඩ නිවසට සහ මද්‍රසා පාසලට පැමිණ ඉස්ලාම් ධර්මයට එරෙහි වන අයට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා කණ්ඩායමක් සංවිධානය කර අබු උමර් යන නමද ලබාගෙන මාවනැල්ල ප්‍රදේශයේ එම සංවිධානයේ නායකයා වශයෙන් කටයුතු කරමින් සිටියදී නුවරඑළිය, නුවර, හම්බන්තොට ප්‍රදේශවල පැවති දින

දෙකේ වැඩසටහන් සඳහා අවස්ථා කීපයක සහභාගී වී ජත්‍යන්තර වශයෙන් තහනම් කර ඇති ත්‍රස්ත සංවිධානයක් වන ISIS සංවිධානය සම්බන්ධයෙන් සහ එම සංවිධානය හා සම්බන්ධ සටන් වීඩියෝ පෙන්වමින් ටී 56 අවිය හා පිස්තෝල අවිය පෙන්වා දී ඒවා ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් මෙම චූදිත විසින් ඉගැන්වීම් සිදු කරන ලද බවට සහ මල්වානේ ආරක්ෂිත නිවසේදී පුහුණු කඳවුර සම්බන්ධයෙන් කතා කළ බවටද ඔහුගේ පැ 183 දරන පාපෝච්චාරණයේ සඳහන් කර ඇති පසුබිම තුළ 04 වන චෝදනාවේ සඳහන් පරිදි ඔහු විසින් අන්තවාදී මතවාද ප්‍රචාරය කර අවි පුහුණුව ලබා දීම සිදු කර ඇති බවට පැහැදිලිව පෙනී යන අතර ඒ අනුව එකී ක්‍රියාවන් මඟින් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) සමඟ කියවිය යුතු (2) (ii) වගන්ති යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවට සහ එකී වරදේ සියලුම සංඝටකයන් මනාව සනාථ වී ඇති බවට පැහැදිලි වේ.

මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයෙහි සඳහන් පරිදි **"මාවනැල්ල ආබ්දීන්ගේ නිවස, නවුෆර් මව්ලවිගේ නිවස තුළ සහරාන් ඇතුළු ප්‍රධානීන් වන මිල්හාන්, කස්තූන්, රිල්වාන්, සාෆි, සාජිත්, ඊබ්‍රාහිම් හමුවී සංවිධානයේ ආරාබි භාෂා පොත් (ජිහාඩ්) පරිවර්තනය කිරීම වැනි කටයුතු කළා. මල්වානේ ආරක්ෂිත නිවසේදී පුහුණු කඳවුර සම්බන්ධයෙන් කතා කළා. අපි නුවරඑළිය දේශනයේදී සංවිධානය වෙනුවෙන් අබු බකර්**

අල් බග්දාදි වෙනුවෙන් (අයි එස්) දිවුරුම දුන්නා. සහරාන් පුහුණු කඳවුර පවත්වාගෙන යාමට දැනුම් දුන්නා'' යනුවෙන් සඳහන් වී ඇති පසුබිම තුළ විශේෂයෙන් **''සහරාන් ඇතුළු ප්‍රධානීන් වන මිල්හාන්, කස්තූන්, රිල්වාන්, සාෆි, සාජීත්, ඊබ්‍රාහිම් හමුවී''** යැයි සඳහන් කර ඇති පසුබිම තුළ ෂැංග්‍රිලා හෝටලයේදී ස්වයංඝාතක බෝම්බ පිපිරවීම සිදු කරන ලද සහරාන් සමඟ ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු කරන ලද අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් හෙවත් කස්තූන් හෙවත් අබුමොහොම්මද් නැමැත්තා එනම් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දෙවිමැදුරේදී පාස්කු ඉරිදා දින උදේ මරාගෙන මැරෙන බෝම්බයක් පුපුරවා මිනිස් ජීවිත සිය ගණනක් බිලිගත් ස්වයංඝාතක බෝම්බකරු වන අතර එසේම, මෙම 04 වන චූදිතගේ පාපෝච්චාරණයේ සඳහන් කර ඇති සහරාන් ඇතුළු ප්‍රධානීන් අතරින් තවත් එක ප්‍රධානියෙක් ලෙස රිල්වාන්ගේ නමද සඳහන් කර ඇති අතර රිල්වාන් යනු මොහොම්මදු කාසිම් මොහොම්මදු රිල්වාන් හෙවත් මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් හෙවත් අබුකිතල් ලෙස අධිචෝදනා පත්‍රයෙහි පළවන චෝදනාවේ සඳහන් කර ඇති තැනැත්තා වන අතර ඔහු පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාර මාලාව සැලසුම් කළ ප්‍රධාන කුමන්ත්‍රණකරු වන සහරාන් නැමැත්තාගේ සහෝදරයෙකු බවට මෙම අධිකරණයේ ඉදිරිපත් වී ඇති සාක්ෂි මඟින් හෙලිවී ඇති අතර ඔහු **පාලමුණ** නැමැති ප්‍රදේශයේදී බෝම්බ පිපුරුම් උපක්‍රමයක් අත්හදා බැලීමේදී එය

පිපිරී තුවාල වීමට ලක්ව පසුව මෙම 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් කොළඹ ජාතික රෝහලේදී මෙම 04 වන චූදිතගේ මල්ලී වන සාහිඩගෙ නමින් ඇතුළත් කර සිට ඇති අතර, එම රිල්වාන් නැමැත්තා සයින්දමරුදු ප්‍රදේශයේදී සිදු වූ සිද්ධියකින් මියගොස් සිටින අයෙකි.

ඉහත පාපෝච්චාරණයෙහි සඳහන් කර ඇති සහරාන් ඇතුළු ප්‍රධානීන්ගෙන් තවත් අයෙකු ලෙස සාෆි නැමැත්තාද සඳහන් කර ඇති අතර එම සාෆි නැමැත්තා අධිචෝදනා පත්‍ර යෙහි 10 වන චූදිත ලෙස නම් සඳහන් අබ්දුල් ලතිෆ් මොහොමඩ් සාෆි හෙවත් සාෆි මව්ලවි හෙවත් අබූ ෆුර්කාන් නැමැත්තා බව පෙනී යන අතර එසේම, ඉහත පාපෝච්චාරණයේ සාහිත් ලෙස සඳහන් කර ඇති තැනැත්තා 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් හෙවත් අබූනජා හෙවත් සාජිත් මව්ලවි නැමැත්තා බව පෙනී යයි.

ඉහත පාපෝච්චාරණයෙන්ම හෙලිවන පරිදි සහරාන් විසින් සංවිධානයේ අබූ නම් ලබා දී ප්‍රහාරක අංශ සහ මරාගෙන මැරෙන අංශය වශයෙන් සාමාජිකයන් වෙන් කළ බවට සඳහන් කර ඇති පසුබිම තුළ මෙම නඩුවට අදාළ 2019.04.21 දින සිදුවූ පාස්කු ප්‍රහාර බෝම්බ පිපිරුම් මාලාවේදී එම බෝම්බ පුපුරවා ඇත්තේ මරාගෙන මැරෙන

බෝම්බකරුවන් වීම තුළින් එලෙස පැ.183 දරන පාපෝච්චාරණයේ සඳහන් කර ඇති එකී කරුණු සත්‍ය බවට මැනවින් පෙනී යයි.

ඉහත කී සහරාන් ඇතුළු ඔහුගේ සමීපතම ප්‍රධානීන් මාවනැල්ල ආඛ්දීන්ගේ නිවසේ සහ නවුෆර් මව්ලවිගේ නිවස තුළදී ඒකරාශී වී කටයුතු කර ඇති ආකාරය පෙනී යන අතර නවුෆර් මව්ලවි යනු මෙම නඩුවෙහි **පළවන චූදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මව්ලවි** හෙවත් අබුසෙයිද් නැමැත්තා වන අතර මෙම නඩුවෙහි චූදිතයන් 25 දෙනා අතරින් පළවන චූදිතට හැර වෙනත් කිසිදු චූදිතයෙකුට නවුෆර් මව්ලවි යන නමක් නොමැති බව අධිචෝදනා පත්‍රයෙහි චූදිත ලැයිස්තුව මනාව පරික්ෂා කර බැලීමේදී පෙනී යයි.

පාස්කු බෝම්බ ප්‍රහාර මාලාවේ ප්‍රධාන සැලසුම්කරු ලෙස කටයුතු කර ඇති සහ මේ වනවිට මියගොස් සිටින සහරාන් නැමැත්තා විසින් මෙම නඩුවේ 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා හට සහ ඔහුගේ සහෝදරයා වන මොහොමඩ් ඊබ්‍රාහීම් සාහිඩ් අබ්දුල් හක් හෙවත් අබුෆලා නැමැත්තාට උපදෙස් ලබා දී ඇත්තේ පිළිම සහ ගස් ගල්වලට වැඳීම අපේ ආගමට අනුව වැරදියි, ඒ නිසා පිළිම කඩලා දාන්න යනුවෙන් දැනුම් දීම මත එකී සහරාන්ගේ උපදෙස් අනුව 04 වන චූදිත සාදික් අබ්දුල්ලා සහ 05 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් අංක වී ඕ 1117 දරන රතු පාට යතුරු පැදියෙන් ගොස් දින දෙකක් රාත්‍රී කාලයේදී

හිඟුල බස් හෝල්ට් එක ළඟ බුදු පිළිමය, රන්දිවෙල හන්දිය බුදු පිළිමය හා මහත්තේගම මිරිස්කුඩු හන්දියේ බුදු පිළිමය කැඩූ බවට පැ 183 දරන පාපෝච්චාරණයෙහි සඳහන් කර ඇති අතර එයට පසු දිනද ඉහත කී 04 වන චූදිත වන සාදික් අබ්දුල්ලා ඔහුගේ මල්ලී ෆවුෂාන් සහ මුත්ති නැමැත්තෙකු සමඟ යතුරු පැදිවලින් බුදු පිළිම කඩන්නට යවා 04 වන චූදිතද අස්ෆාක් නැමැත්තෙකු සමග බුදු පිළිම කඩන්නට ගොස් කඩුගන්නාව දන්තුරේ තිබූ බුදු පිළිමය කඩන්නට උත්සාහ කළද එයට මිටියෙන් ගැසුවද එය කඩන්න බැරි වුණු බවට සහ ඉන්පසු එම අස්ෆාක් නැමැත්තා සමග කඩුගන්නාවේ එනවිට ඇතුල් පාරක තිබූ බුදු පිළිමයක් මිටියෙන් ගසා කඩා එන විට අස්ෆාක් නැමැත්තාව පාරේ සිටි පිරිසක් අල්ලාගත් බව සහ ඉන්පසු 04 වන චූදිත දුවලා ගොස් බේරිලා හිංඟුලට ඇවිත් මල්ලීට කෝල් කර ගෙන්වා නිවසට ගිය බවට සඳහන් කර ඇති අතර එම කරුණු අනුව මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු වූ එනම් කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු කර මිය ගිය සහරාන් නැමැත්තා සමග සංවිධානය වී එම සහරාන්ගේ උපදෙස් මත මෙම 04 වන චූදිත සහ ඔහුගේ සහෝදරයා වන සාහිඩ් නැමැත්තාද ඉහත පරිදි යතුරු පැදියෙන් ගොස් බුදු පිළිම කැඩීම සිදු කරන ලද බවට පවසා ඇති පසුබිම තුළ එලෙස බුදු පිළිම කඩා දමා ඇත්තේ පිළිම සහ ගස් ගල්වලට වැඳීම තමන්ගේ ආගමට අනුව වැරදියි යැයි සහරාන් විසින් ලබා දුන් උපදෙස් මත බව පෙනී යාම තුළ එලෙස බුදු පිළිම කැඩීමේ

ක්‍රියාවලියන් තුළින් ද අධිචෝදනා පත්‍රයේ සඳහන් පළවන චෝදනාවේ සඳහන් කර ඇති පරිදි එකී ක්‍රියාවන් මඟින් ආගමික කණ්ඩායම් අතර ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික එදිරිවාදී හැඟීම් ඇති විය හැකි ආකාරයේ ක්‍රියාවන් සිදු කර ඇති අතර ඒ අනුව එකී ක්‍රියාවන් තුළින් බුදු පිළිම වන්දනා මාන කරන ජන කොටස්වල සහ ආගම් අතර ජාතිවාදී අසංගතිය ඇති විය හැකි ආකාරයේ ක්‍රියාවන් සිදුවී ඇති අතර එකී ක්‍රියාවන් අන්තවාදී ක්‍රියාවන් බවට පැහැදිලි කරුණු පෙනී යන අතර සැබැවින්ම 2018 වසර කාලසීමාව තුළ මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කඩා විනාශ කිරීම් සිදු වී ඇති බව සහ එසේම, එවන් බුදු පිළිම කැඩීමේ සිද්ධියකට මෙම නඩුවේ 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නැමැත්තාද කෑගල්ල මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ලබා ඔහු ස්වෙච්ඡාවෙන්ම වරද පිළිගැනීමද සිදු කර ඇති බවට මෙම අධිකරණය ඉදිරියේ 04 වන චූදිත විසින් පැ 183 දරන පාපෝච්චාරණයට අදාළ ශක්‍යතා අතුරු පරීක්ෂණයේදී ලබා දුන් සාක්ෂිය තුළින්ම මැනවින් මෙම අධිකරණයට පැහැදිලි වේ.

04 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී සඳහන් කර ඇත්තේ මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කැඩීමේ සිද්ධියට අදාළව තමා ආතුළු පිරිසකට ගරු නීතිපති තුමා විසින් කෑගල්ල මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියුඒ නඩු පවරා තිබූ බවත් තමා ඇතුළු පිරිස එකී චෝදනා වලට වරද පිළිගෙන තමාලාට අත් හිටවූ සිරදඩුවම් ද

නියම කරන ලද බවත් ඒ අනුව එකී වරද සම්බන්ධයෙන් යලිත් වතාවක් මෙම අධිකරණයේ දී ද ඔවුනට එරෙහිව එකම චෝදනාව සම්බන්ධයෙන් නඩු පවරා තිබීම අනීතික බවත් ය.

කෙසේ වුවත් මේ වනවිට මෙම නඩුවේ විභාගයට ගෙන ඇති අතර එකී චෝදනා මනාව පරික්ෂා කර බැලීමේ දී මාවනැල්ල ප්‍රදේශයේ දී බුදු පිළිම වලට හානි කල බවට කිසිදු චෝදනාවක් මෙම නඩුවේ දී ඉදිරිපත් කර නොමති බව මනාව පෙනී යයි.

09 වන චූදිත මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිද් විසින් සහකාර පොලිස් අධිකාරී නිහාල් ජයතිලක මහතා හට ලබා දී ඇති පාපොච්චාරණයේ අඩංගු කරුණු සාරාංශය

09 වන චූදිත මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිද්ගේ 16(1) වගන්තිය යටතේ වූ ප්‍රකාශයේ පාපොච්චාරණමය ස්වභාවයට අයත් විය හැකියැයි සැලකිය හැකි කොටස් අප විසින් සළකා බලන ලද අතර, එම ප්‍රකාශයෙහි අඩංගු කරුණු වෙන්වෙන්ව සලකුණු කිරීමක් මෙම නඩුවේ පැමිණිල්ලෙන් සිදු කර නොමැති පසුබිම තුළ එකී සමස්ථ ප්‍රකාශයම අධිකරණය ඉදිරියේ පැමිණිල්ලෙන් ලකුණු කිරීමක් කර ඇති බැවින් එකී සමස්ථ ප්‍රකාශයම මෙම නඩුවේ කටයුතු සදහා සළකා බැලීමට අප හට කිසිදු නෛතික බාධාවක් නැත. ඒ අනුව එම ප්‍රකාශයේ අඩංගු පහත කරුණු කෙරෙහි අපගේ අවධානය ලක් කරන ලදී.

- *පසුව සාදික්ගේ දැනුම අනුව මම, සාදික්, පවුෂාන්, හම්දි, අනස්, හනන් යන අයවලුන් සමග මුතූර්වල නම නොදන්නා වයස පුද්ගලයෙකුගේ නිවසට ගොස් ටී-56 අවියක් ගලවලා පුරුදු වුනා. සාදික් එය හදුන්වා දුන්නා.මම, සාදික්ගේ මල්ලි සාහිඩ් සමග සහ්රාන්ගේ නායකත්වයෙන් නුවරඑළියේ පැවැත්වූ දින දෙකේ වැඩසටහනට සහභාගි වුනා.*
- *එම වැඩසටහනේදී සහ්රාන්, නවුෆර් අයි.එස්. මතවාද සහිත දේශන ලබා දුන් අතර, විදේශීය අයි.එස්. වීඩියෝ පට පෙන්නුවා. ටී-56 අවියක් සහ පිස්තෝක් පෙන්වා හදුන්වා දුන්නා.*
- *වැඩසටහන අවසානයේ එක් එක් පුද්ගලයින් හදුනා ගැනීමට වෙනත් නම් ලබා දුන්නා. මට දුන්නේ අබු නජා යන නමයි.*
- *පසුව ප්‍රහාරක හා මරාගෙන මැරෙන කණ්ඩායම් වෙන්කලා. මම නම ලබා දුන්නේ ප්‍රහාරක අංශයටයි.*
- *ඊට පසු නුවරඑළිය, හම්බන්තොට, නුවර යන ප්‍රදේශවල වැටසටහන් ක්‍රියාත්මක කලා. එම වැඩසටහන් සඳහා මමත් දේශන ලබා දෙන්න ගියා.*
- *2018 දෙසැම්බර් සහ්රාන් කියලා සාදික් එයාගේ ජමියා සිට සහ්රාන්ට එකතු වූ කට්ටියක් එක්ක එකතු වෙලා මාවනැල්ල ප්‍රදේශයේ තිබූ බුදුපිළිම කැඩුවා.*
- *එතනින් වනාතවිල්ලුව වත්තකට ගියා එතන සහ්රාන් සමග ගොඩාක් කට්ටිය හිටියා සහ්රාන් ගාව සොට් ගන් 1 යි, රිවොල්වර් 1 යි, පිස්තෝල*

1 තිබුණා මම දැක්කා. ගෆුර් මාමා හා කස්තූන් ගොස් කලු පාට නයිට්‍රික් ඇසිට් ලොකු කෑන් 6 ක් බීකර් යූරියා පොහොර දෙකතුනක් ඇතුල හාණ්ඩ අරගෙන ආවා. ඒවා වෙඩි බෙහෙත් සාදා ජැකට් හදන්න කියලා සහ්රාන් කීවා.

- *මම රට යනවා කියලා නිවසේ අයවලන්ට බොරු කියලා මම සහ්රාන්ගේ කට්ටිය එක්ක සම්බන්ධ වුනා. අපි මයුර පෙදෙස පිහිටි අක්රා රෙසිඩන්සිස් එකට ගියා. සහ්රාන් හා නවුෆර් අබු ශිලා, අබු තාරික්, අබු අබ්දුල්ලා සිටියා.*
- *ඊට පස්සේ සහ්රාන් කීවා අපි ඔක්කොම එක තැන ඉන්න හොඳ නෑ ඒ නිසා ටික දෙනෙක් එඩේරමුල්ලේ නිවසට යන්න කියලා. ඒ අනුව නවුෆර්, සාදික් හා එයාගේ බිරිඳ, මිල්හාන් සමඟ ටික දෙනෙක් එම නිවසට ආවා.*
- *සාහිඩ් මුදල් අරගෙන ආවා අපි දෙන්නා එඩේරමුල්ල බයික් සේල් එකට ගිහින් කොළ පාට බයික් එක දීලා සාහිඩ් ළඟ තිබූ සිංහල අයකුගේ හැඳුනුම්පතක් දීලා අලුතින් ස්කූටි බයික් 2 ක් ගත්තා.*
- *අපි එඩේරමුල්ල නිවසේ ඉන්න විට සහ්රාන් නවුෆර්ට පිස්තෝලයක් දිලා තිබුණා.*
- *නිවසේ තිබූ බඩු ටික වෑන් රථයෙන් ගෆුර් මාමා අත යැව්වා.*
- *දඹුල්ලෙන් බැහැලා හොටෙල් එකක නතර වෙලා හෙට යන්න කියලා මම කිව්වා. පස්සේ අපි දෙන්නා බැහැලා හෝටලයකට ගොස් සිටියදී*

පොලිසියෙන් ඇවිත් අපිව අල්ලා ගෙන පසු දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත එක්ක ආවා.

- *යන කරුණු මෙහිදී අප විසින් අපගේ සැළකිල්ලට ගනිමු.*
- *එසේම 09 වන වුදිත මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිද්ගේ 16(1) වගන්තිය යටතේ වූ ප්‍රකාශයේ සිද්ධිමය කරුණුවලට අදාළ විය හැකියැයි සැලකිය හැකි කොටස් අප විසින් පහත පරිදි උපුටා දක්වමින් සළකා බලන ලදී.*
- *මෙම ශිෂ්‍ය සංවිධානයේ සිටි සාදික් සහ රමලාන් මගේ නිවසට ඇවිත් මුස්ලිම් ජනතාවට එරෙහිව එනම් හලාල්, කාන්තාවන්ගේ ඇදුම්, ගැන කියමින් ජාතිවාදය අවුස්සනවා. එයට එරෙහිව අපි එකතු වෙන්න ඕනේ කිව්වා.*
- *එම සාකච්චාවට අයි.එස්.අයි.එස්. සංවිධානයේ ඉතිහාසය. අයි.එස්.අයි.එස්. සංවිධානයේ වර්ථමාන තත්වය හා අයි.එස්.අයි.එස්. සංවිධානයට සහය දෙන හා සහය නොදෙන පාර්ශව යන මාතෘකා යටතේ අපි තුන්දෙනෙක් දේශන පැවැත්තුවා.*
- *එම වකවානුවේම මා අයි.එස්.අයි.එස්. සංවිධානය සම්බන්ධයෙන් දෙහිවල පැවති වැඩසටහන් කිහිපයකට සහභාගි වුනා.*
- *පසුව මට නවුෆර් පණිවිඩ එවා තිබුණා. නවුෆර් හා සහ්රාන් දෙන්නා මාගේ නිවසටත් ඇවිත් මටත් එයාලා එක්ක සම්බන්ධ වෙන්න කියලා ගියා අහමද් හා මුන්ෂිෆ් මට සාදික් එක්ක සිට මුස්ලිම් අයගේ ප්‍රශ්නවලදී*

මැදිහත් වෙන්න කියා තිබූ නිසා මම සහ්රාන් හා නවුෆර් ගැන සාදික් එක්ක කතා කලා.

- *කලින් සාදික් සහ්රාන්ට සම්බන්ධ වෙන්න කැමති වුණේ නැහැ. 2018 මාර්තු මාසයේදී දිගන සිංහල හා මුස්ලිම් ජාතිවාදී ගැටුමෙන් පසු සම්බන්ධ වුනා.*
- *මම සාදික් එක්ක කතා කරලා අපි දෙන්නම ගනේතැන්න රිස්විගේ නිවසේදී නවුෆර් මව්ලවී හා සහ්රාන් මව්ලවී, තවුහික් මව්ලවී සහ සාෆි මව්ලවී හමුවුණා.*
- *යනුවෙන් සඳහන් වී ඇති ආකාරය අප විසින් අපගේ සැළකිල්ලට ගනිමු.*

09 වන චූදිත තමාගේ පාපෝච්ඡාරණයේ තමා විසින් නුවරඑළිය හම්බන්තොට ඇතුළු විවිධ ප්‍රදේශවල වැඩමුළු පවත්වා එම වැඩමුළු වලදී ආයුධ පුහුණුව ලැබූ බව පවසා ඇති අතර, එම කරුණු මෙම නඩුවේ පැ. සා. 1400 අනස් යන අයගේ සාක්ෂියේදී තහවුරු වී ඇත. තවද නඩුවේ තවත් සාක්ෂිකරුවෙක් වන පැ. සා. 1400 වන ජවුෆර් සාදික් යන අය සාක්ෂි ලබා දෙමින් මාවනැල්ල, දෙල්ගහගොඩ තව්හිද් පල්ලියේ 2018 දෙසැම්බර් මාසයේදී මුස්ලිම් තරුණයින් 40 ක් පමණ සහභාගී වූ වැඩමුළුවකදී ඔවුන්ට දැඩි අන්තවාදී මතවාදයන් ඉගැන්වීම් සිදු කර ජාතික සංහිදියාවක් නොමැති බවත්, තවද ඉදිරිපත් වූ සමස්ථ සාක්ෂිය අවධානයට ලක් කිරීමේදී සඳහන් කර තිබෙන කරුණු සත්‍ය කරුණු බව පෙනී යයි.

11 වන චූදිත තුස්තවාදය වැළැක්වීමේ පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පාපෝච්චාරණමය ප්‍රකාශය

11 වන චූදිත වන හුසේයිනුල් රිස්වි කාලිද් සමීර් විසින් පැමිණිලිකාර පාර්ශවයේ සාක්ෂි අංක 2048 සහකාර පොලිස් අධිකාරි අලගේවත්තගේ සමන් පද්මසිරි පෙරේරා යන සාක්ෂිකරුටද චූදිතගේම අත් අකුරින් ලියා දුන්නා යයි පවසන තුස්තවාදය වැළැක්වීමේ පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව පාපෝච්චාරණ ස්වභාවයේ ප්‍රකාශයක් පැමිණිල්ලෙන් 2025.11.27 දින පැ.සා.2048 අලගියවත්තගේ සමන් පත්මසිරි පෙරේරා යන සාක්ෂිකරු යලි මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂියට කැඳවා ඉහත කී ප්‍රකාශය පැ.168 ලෙස අධිකරණය ඉදිරියේ විධිමත්ව ලකුණු කර එහි අනු කොටස් පහත පරිදි ලකුණු කරන ලදි.

පැ.168 (i) එම ප්‍රකාශයේ පිටු අංක 229407 යන පිටුවෙහි පළවෙනි පේළියේ සිට 07 වන පේළිය දක්වා වූ කොටස පැ.168 (i) ලෙස ලකුණු කර ඇත.

පැ.168 (ii) එකී මුල් පේළි 07 අවසාන පේළිය අවසන් වන ස්ථානයේ පැ.සා.2048 සමන් පත්මසිරි පෙරේරා විසින් තබා ඇති අත්සන පැ.168 i (a) ලෙසද ලකුණු කර ඇති අතර එසේම, එම ප්‍රකාශයෙහි අවසාන පිටුවෙහි එනම් අංක 229413 දරන පිටුවේ

පහළ සිට ඉහළට පේළි 13 පැ.168 (ii) වශයෙන්ද ලකුණු කරන ලද අතර එසේම, එම පිටුවෙහි පැ.සා.2048 සහකාර පොලිස් අධිකාරී සමන් පත්මසිරි පෙරේරා යන අයගේ අත්සන් අන්තර්ගත ස්ථාන දෙක පැ.168 (ii) (b) ලෙස ලකුණු කර ඇත.

ඉහත කී පැ.168 ලේඛනයෙහි සෑම පිටුවකම 11 වන චූදිත විසින් අත්සන් තබා ඇත. එසේම, පැ.168 ලේඛනයෙහි 11 වන චූදිත විසින් ඔහුගේ අත් අකුරින් අදාළ ප්‍රකාශය ලිවීම ආරම්භ කර ඇති පිටුවෙහි සඳහන් කර ඇති කරුණු කීපයක් පහත පරිදි ලකුණු කිරීම් කර ඇත.

පැ.168 (iii) “නම: හුසේයිනුල් රිස්වි කාලිද් සමීර්. පුරුෂ වයස 24 යි, මුස්ලිම්/ඉස්ලාම්, අවිවාහකයි රැකියාව pickme ආයතනයේ ආහාර බෙදා හැරීම ලිපිනය: අංක 30/26A සද්ධර්ම මාවත මාලිගාවත්ත ජාතික හැඳුනුම්පත් අංකය 951404276V, දුරකථන අංකය 0766355229, 0752822893” යන කොටසද ලකුණු කර ඇත.

පැ.168 (iv) “වන මම මගේ ප්‍රකාශය පහත සටහන් කරමි.” යනුවෙන්ද ලකුණු කර ඇත.

පැමිණිල්ලෙන් අධිකරණය අමතමින් 11 වන චූදිත විසින් ඉහත පරිදි ලබා දී ඇති පැ.168 ලෙස ලකුණු කර ඇති ප්‍රකාශයේ ආරම්භයේ සිට

අවසාන පිටුව වන පිටු අංක 229413 දරන පිටුවෙහි 11 වන වුදිත විසින් ලියා ඇති සෑම වාක්‍යයක් මතම පැමිණිල්ල රදා පවතින බවට අධිකරණයට දැනුම් දී ඇත. කෙසේ වුවත් මෙම තීන්දුවේ පහසුව සඳහා එකී පැ.168 දරන ලේඛනයෙහි පැ.168 (iv) යන ලකුණු කිරීමට පසුව අඩංගු කොටස් අප විසින් පහත පරිදි අනු අංක කර සැලකිල්ලට ගන්නා ලදී.

168 (A) " මා හට සහෝදර සහෝදරියන් දෙදෙනෙක් ඉන්නවා. තුන්වැන්නා මමයි. 6 වසර දක්වා ගම්පහ පෙතියාගොඩ බෞද්ධ කණිෂ්ඨ විදුහලෙත්, 6 වසර සිට 8 වසර දක්වා ආමර්වීදියේ පිහිටි හමීඩ් අල් හුසේන් විදුහලෙත් ඉගෙන ගත්තා."

168 (B) " පසුව මා අධ්‍යාපන කටයුතු නතර කර පිටකොටුවේ 1 වන හරස් වීදියේ තියන මොබයිල් ෆෝන් අලුත්වැඩියා කරන TELSO LANKA ආයතනයට රැකියාවට ගියා. ඒ මොබයිල් ආයතනයේ සේවය කරන කොට 2014 සිරියාවේ ඉන්න ISIS සංවිධානය පොදු ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් රැඳී සිටින බව කීවා. මේ හේතුවෙන් මා Khalid Shameer නමින් පවත්වගෙන ගිය ෆේස් බුක් ගිණුම හරහා අල්ජසීරා BBC, FOX පුවත් සේවයන් ෆේස්බුක් ගිණුමට ඇඩ් කර ගත්තා. එමඟින් මට ISIS සංවිධානයට ඇලුම් කරන දැනට අත්අඩංගුවේ ඉන්න උමෙර්,

ආදිල්, අමීස්, අහ්කම් අක්‍රම්, අම්ජද්, ඉහ්සාන්, හසන්, මොහමද් ශස්නි, අහමඩ් යන අයව හඳුනා ගන්න පුළුවන් වුණා. ”

168 (C) “ ඔවුන් සමඟ ෆේස්බුක් හරහා සම්බන්ධතා පැවැත්වීමේදී ඔවුන් ISIS සංවිධානයේ ක්‍රියාකාරකම් පිළිබඳව උනන්දුවෙන් කටයුතු කළ පුද්ගලයන් බවත් ඉස්ලාම් ආගම පිළිබඳ දැනුමක් තිබෙන පුද්ගලයන් බව දැන ගත්තා. මම මොවුන් හමු වී අවස්ථා කිහිපයකදී දෙහිවල ගල්වල පාරේ පිහිටි අහ්කම් අක්‍රම්, අහමද් සහ අම්ෂද් යන අයගේ ගෙවල් වලට එකතු වී ISIS සංවිධානය පිළිබඳව සාකච්ඡා කළා. මෙම අයගේ කණ්ඩායමේ නායකයා වශයෙන් උමෙර් හිටියා. ඔහුද අපිට පන්ති පැවැත්වුවා. ඔහුට අමතර ඉමාද් යන අයෙකු අපට දේශනා පැවැත්වුවා. මේ ඉමාද් යන අය ISIS සංවිධානයට එක්වීම සඳහා Turkey යට ගොස් නැවත පැමිණි කෙනෙක් ”

168 (D) “ 2015 වසර වන විට මම දැනට අත්අඩංගුවේ ඉන්න රිෆ්කාන්, ඉමාඩ් සහ 2019.04.21 දෙහිවල ට්‍රොපිකල් හෝටලයේ මරාගෙන මැරුණු ජමෙයිල්, ෂංග්‍රිල්ලා හෝටලයේ මරාගෙන මැරුණු ඉල්හාම්, කොච්චිකඩේ පල්ලියේ මරාගෙන මැරුණු මුආද් යන අයද, අනික් යාළුවන්ගේ මාර්ගයෙන් හඳුනාගෙන

ISIS සංවිධාන පිළිබඳව සහ ඉස්ලාම් ධර්මය පිළිබඳව විස්තර සාකච්ඡා කළා.”

168 (E) “ මම 2017 කාලය වන විට අබාන්ස් ආයතනයේ රැකියාවකට ගියා. මේ වන විට මා සඳහන් කළ යාළුවන් සමඟින් ISIS සංවිධානය පිළිබඳව වැඩිපුර තොරතුරු සෙවීමටත්, ලංකාවේ මේ සම්බන්ධව කටයුතු කළ ජාතික තව්හීද් ජමාද් සංවිධානයේ ප්‍රධානියෙකු වූ ෂැංගිල්ලා හෝටලයේ මරාගෙන මැරුණු යන අයගේ දේශනද බැලීමට හා ඇසීමට ගත්තා. අපේ කණ්ඩායමට ජමාත්තු මිල්ලතු ඉබ්‍රාහීම් යන නමත් තිබ්බා. මේ කාලේ ජමිල්ගේ හැසිරීමත් එක්ක අනෙක් පිරිස ආරවුල් ඇති කර ගත්තා. මේ නිසා සහරාන් විසින් මල්වාන ප්‍රදේශයේ සාකච්ඡාවක් ලෑස්ති කළා. මම ගියේ නෑ.

168 (F) “ 2018 වසරේ මාර්තු මාසේ අවසාන හරියේදි මහනුවර අරුප්පල ප්‍රදේශයේ සහරාන්ගේ ප්‍රධානත්වයෙන් පුහුණුවක් පැවැත්වුවා. ඉමාද් හා ඉල්හාන් හැර අපි සියලු දෙනා ඒ පුහුණුවට ගියා . පුහුණුව දින 02 ක් තිබුණා. මහනුවර අරුප්පල ප්‍රදේශයේ තිබෙන තට්ටු 02 නිවසක තමා මේ පුහුණුව තිබුණේ. මම ඒක පොලිසියට පෙන්නුවා.”

168 (G) " මේ පුහුණුවට මොහොමද් සහරාන්, ජමීල්, කටුවාපිටියේ මරාගෙන මැරුනු හස්තූන් සහ දැනට අත්අඩංගුවේ අරන් ඉන්න සහරාන්ගේ රියදුරු සාෆි, මාවනැල්ලේ ආබ්දීන්, නවුෆර් මවුලවි, මිල්හාන්, අහ්කම් අක්‍රම්, උමෙර්, හසන් සවාහිර්, මොහොමඩ් ඉන්ෆාස්, මීගමුවේ හිලාම්, ඉහ්සාන් අහ්මද්, මොහොමද් සශ්නි, අහමද්, මොහොමද් ෆස්හාන්, මොහමද් ආසීන් යන අය ආවා. මේ පුහුණුවට සහරාන් විසින් එවලා තිබුණු වැන් එකෙන් අපි අරුප්පලට ගියා. පසු දින උදේ සිට දේශණා ආරම්භ කළා. සහරාන් විසින් ISIS සංවිධානයට සම්බන්ධ වීඩියෝ ඉදිරිපත් කරමින් දේශණා කළා. නවුෆර් මවුලවි විසින් ඉස්ලාම් ඉතිහාසය හා ෂරියා නීති ගැන දේශණා කළා. හස්තූන් විසින් ජංගම දුරකථන හා කොම්පියුටර් භාවිතයේ දී යොදා ගත යුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග ඉගැන්නුවා."

168 (H) "අවසන් දවසේ මිල්හාන් විසින් T 56 වර්ගයේ තුවක්කුවක් අරගෙන එය ගැලවීමටත්, ශුද්ධ කිරීමටත්, සවි කිරීමටත්, තුවක්කුවට පතොරම් ඇතුළත් කරන ආකාරයත්, වෙඩි තිබීම සඳහා ඉලක්කය ගන්නා ආකාරයත් පිළිබඳව ඉගැන්නුවා. මේ පුහුණුවෙන් පස්සේ සියලුදෙනාම ඉස්ලාම් ආගම් වෙනුවෙන්

මරාගෙන මැරීමට වුවද කැමති බව සඳහන් කරමින් ලේඛනයට අත්සන් කළා. දිවුරුමක් ද සිදු කළා.”

168 (I) “ මේ පුහුණුවේ දී රැඳී සිටි 2 වන දින රාත්‍රියේ එක් එක් අයට තනි තනිව සහරාන් කථා කළා. මගේ දුරකථන අංකය වන 0766355229 ලබා ගත්තා. මට පවරන වැඩ බව පසුව දැනුම් දෙන බව සහරාන් කිව්වා. ඒ අනුව 2018 ජූලි මාසයේ පමණ සහරාන් මට දුරකථනයෙන් කථා කර මාවනැල්ල කාගිල්ස් ෆුඩ් සිටි ලඟට පැමිණෙන ලෙසට දැනුම් දුන්නා. එතනට සහරාන්ගේ රියදුරු සාෆි සුදු පාට වෑන් රථයක් රැගෙන එම ස්ථානයට ආවා. මම පසුව දැන ගත් දැනට අත්අඩංගුවේ ඉන්න ආබ්දීන්ගේ නිවසට එක්ක ගියා. එහි යන විට සහරාන්, මිල්හාන්, සහරාන්ගේ මල්ලි සායින්දමරුදුවල මරාගෙන මැරුනු රිල්වාන්, සාෆි, නවුෆර් මවුලවි යන අයත් ඇවිත් සිටියා. මට අලුතින් මිළ දී ගත් සැම්සුන් J2 පෙරෝ වර්ගයේ ස්මාර්ට් ජංගම දුරකථනයක් ලබා දී එහි Threema සහ Locker යන ඇප් දාලා දුන්නා. සිම් පතක් ඇතුළත් කර එම අංකයෙන් දුරකථන ඇමතුම් ලබා නොගන්නා ලෙසට දන්වා සිටියා. කොළඹට ඇවිත් සහරාන්ගේ දැනුම් දීම මත කුලියට ගැනීම සඳහා ගෙවල් හෙව්වා.

168 (J) " 2018.08.15 නැවත සහරාන්ගේ දැනුම් දීම පරිදි මාවනැල්ල මුලින් මාගේ නිවසට ගියා. සහරාන්, මිල්හාන්, රිල්වාන්, ගෆුර් මාමා, නවුෆර් මවුලවි, සාදික් සහ හස්තූන් ඇවිත් සිටියා. මේ වෙලාවේ දී මිල්හාන්ගේ නායකත්වයෙන් යුතුව සාදික් එනම් අබුඋමර් යන අයත් ගෆුර් මාමාත්, කාත්තන්කුඩි ප්‍රදේශයේ නාඳුනන අයෙක් ඇතුළුව තොරතුරු සෙවීමට කණ්ඩායමක් හැදුවා.

168 (K) "මට කොළඹ ප්‍රදේශයේ ඇති පොලිස් ස්ථාන, හමුදා මූලස්ථානවල තොරතුරු ලබා ගැනීමට පැවරුවා. තවද මා හට රැකියාවෙන් ඉවත් වන ලෙසත්, රු.40, 000/. ක වැටුපක් ලබා දීමටත් පොරොන්දු වුණා. අවසාන කාලය වන තෙක් එනම් 2019 පෙබරවාරි දක්වා පඩි දුන්නා. ඒ අනුව මම කොළඹට ඇවිත් ග්‍රෑන්ඩ්පාස් පොලිසිය, බොරැල්ල, මාළිගාවත්ත, කොල්ලුපිටිය පොලිසිය දැනට මා ඉන්න පොලිස් ස්ථානය නාවික හමුදා කඳවුරුවල විස්තර ලබා ගත්තා."

168 (L) "එසේ සිටිය දී දවසක් මිල්හාන් සහ සාදික් කොළඹ විහාරමහා දේවි පාර්ක් එකට ඇවිත් හමු වුණා. මේ අවස්ථාවේ දී රිස්වින් ඉස්මත් නැමැත්තෙකු ඉස්ලාම් ආගමෙන් ඉවත් වී ඒතීස්වරයෙකු වශයෙන් කටයුතු කළ බැවින් ඔහුව ඝාතනය කිරීම සඳහා ඔහු යන එන තැන් සොයාගත යුතු බව කීවා. ශර්මිලා

නැමැත්තියගේ ද විස්තර ලබා ගත්තා. මේ සඳහා මාත් එක්ක සාදික්, මිල්හාන් සහ ගෆුර් මාමා සම්බන්ධ වුණා. මේ මරන්න හැදූ අයගේ ගෙවල් මම අත්අඩංගුවට ගත්තාට පසුව පොලිසියට පෙන්නුවා.

168 (M) "මේ කාලයේ දීම එනම් 2018 අවසන් කාලයේ සහරාන් මට නැවත කුලියට ගෙයක් සොයන්න කියලා කීවා. මම ඉක්මන් ඩොට් එල්කේ මගින් ගාමිණි යන අය සම්බන්ධ කර ගෙන මීගමුව ජනපද මාවතේ තිබෙන ගෙයක් පිළිබඳව විස්තර අරන් සහරාන්ට දුන්නා. මෙහෙම ඉන්න කොට මිල්හාන් එකවරම මරදාන පුංචි පල්ලිය ලඟට එන්න කියලා මම ගියා. ඒ යන විට මිල්හාන් සමග සහරාන්ගේ රියදුරු සාෆි ඇවිත් සිටියා. සහරාන්ගේ මල්ලි වන රිල්වාන් බෝම්බයක් හදන්න ගිහින් තුවාල වුණ බවත් කොළඹ ජාතික රෝහලේ නතර කර තිබෙන බවත් කීවා. මේ සියලුදෙනාම ජාතික තවුහිද් ජමාද් සංවිධානයේ සාමාජිකයන් බව මම දන්නවා. මේ වන විට ගෆුර් මාමා ද කොළඹට ඇවිත් සිටියා. ඔහුත් සමග මම සම්බන්ධ වී රිල්වාන්ට අවශ්‍ය උපකාර කළා. මේ සිද්ධිය හේතුවෙන් මීගමුව ගෙදර කුලියට ගැනීම ඉක්මන් වුණා. "

168 (N) “මෙසේ සිටින විට සහරාන් බයික් එකක් ගන්න රු.130, 000/. ක් දුන්නා. ඒ මුදල් වලින් කුරුණෑගල නුහා මෝටර්ස් එකෙන් පොලිසියෙන් අත්අඩංගුවට ගත් අංක BAQ 2008 දරන නිල්පාට Pulsar බයික් එක මිළ දී ගත්තා. සහරාන්ගේ උපදෙස් උඩ බයික් එකෙන් ගොස් මාවනැල්ල බුදු පිළිම සිද්ධියේ සැකකරුවන් අරන් එන බන්ධනාගාර බස් එකට ගහන්න විස්තර ද හොයන්න ගියා. මේ කාලයේම ජනපද මාවත, මීගමුව ප්‍රදේශයේ නිවස සහරාන්ගේ රියදුරු සාෆිගේ නමට ඔප්පුවක් මගින් ලිව්වා. එම ඔප්පුවේ සාක්ෂි වශයෙන් මම මුලින් සඳහන් කළ ගාමිණි යන අයත්, හස්තූන් යන අයත් අත්සන් කළා.

168 (O) “ඊට පසුව මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කැඩීමට සම්බන්ධ වූ සාදික් වනාතවිල්ලුව පුහුණු කඳවුර සොයා ගත්තාට පසුව ඔහුගේ බිරිඳ හා දරුවන් ද ඔහු මල්ලි හක් ද එයට ඇවිත් සැඟවී සිටියා. සහරාන්ගේ මල්ලි වන රිල්වාන් ද සනීප වී මෙහි සිටියා. මේ ගෙදර අයිතිකාරිය විදේශ රටක සිටිනවා. ඒ නිවස ද මා පොලිසියට පෙන්වා සිටියා.”

168 (P) “2018 දෙසැම්බර් මාසයේ දිනක මිල්හාන් රු.10, 000/. ක් ලබා දී Washing Machine වලට සවි කරන සර්කිට් 09 ක් අරන් දෙන ලෙස මට කීවා. මා ඒවා මිළ දී ගත් කඩේ සර්කිට් 03 ක් මිළ දී

ගෙන මිල්හාන්ට දුන්නා. ඊට පසුව 2019 පෙබරවාරි මාසයේ මුල් දිනක සහරාන් විසින් එවන ලද දැනට අත්අඩංගුවට අරන් ඉන්න මිල්හාන් සහ ගෆූර් මාමා වැන් එකෙන් කොළඹට ඇවිත් මාත් සමග ගොස් බෝම්බ සෑදීමට භාවිතා කළ බවට පසුව දැන ගත් බඩු මිළ දී ගත්තා. ඒ වෙලාවේ දී මම මුලින් Washing Machine, සර්කිට් 03 ක් මිළ දී ගත් කඩෙන් තවත් සර්කිට් 06 ක් මිළ දී ගත්තා."

168 (Q) " බංගසාල වීදියේ තිබෙන ඇටසැකිල්ලක් එල්ලා ඇති කඩයකින් බීකර ඇතුළු විද්‍යා උපකරණ කීපයක් ද පළවන හරස් වීදියේ තිබෙන ට්‍රාන්ස් ඒසියා වෙළඳසැල අසල විදුලි උපකරණ වෙළඳසැලෙන් ස්විච් 20, 25 ක් හා තවත් ඉලෙක්ට්‍රෝන උපකරණ කීපයක් ද එම වෙළඳසැළ අසලම පේමන්ට් එකේ විකිණීමට තිබූ පැරණි වර්ගයේ උත්සවවලට දාන බල්බ් වැල් කීපයක් ද ගත්තා. ඒ තැන් මම පොලිසියට පෙන්නුවා."

168 (R) "ගෑස්පහ හන්දියෙන් යූරියා පොහොර ගන්න තිබෙන බව කීවා. ඒ ස්ථානයට මම ගියේ නැහැ. මේවා මොවුන් රැගෙන ගියා. ඒ වෙලාවේ මේවා බෝම්බ හදන්න ගත්තා කියලා මම දැන ගෙන සිටියේ නැහැ. 2019.03.25 හසන් මට හමු වුණා. මුආද් ඇවිත් සහරාන්ට ප්‍රශ්නයක් වී ඇති බවත් ඔවුන් හමු වී යාමට ලෑස්ති වී

සිටින බවත් මට කීවා. 2019.03.27 දින පාන්දරම ගල්කිස්සට ගොස් පැමිණ සිටි හසන්, ඉන්සාෆ්, ජමීල්, මුආද් එක්ක පානදුර පැත්තේ තිබෙන පසුව මම පොලිසියට පෙන්වපු ගෙදරට එක්ක ගියා. අපි පානදුරේ එම ගෙදරට යන විට සහරාන් ඇවිත් අපිව පිළිගත්තා. සහරාන්ට නවුෆර් මවුලවි ඇතුළු කණ්ඩායම බොරු චෝදනා එල්ල කරන බවත් ඒ මත සූරා කවුන්සිලයේ නවුෆර් මවුලවි නායකයා ලෙස තෝරා ගත් බව සහරාන් කීවා.

168 (S) "මම දන්නා තරමට සූරා කවුන්සිලයේ නවුෆර් මවුලවි, මිල්හාන්, සාජිත් මවුලවි යන අය සිටිනවා. තවද නවසීලන්තයේ මුස්ලිම් පල්ලි 2 කට ගහලා මුස්ලිම් අය ඝාතනය කිරීමට සහ සිරියාවේ දී ISIS සංවිධානයට සිදු කරන ලද ප්‍රහාරයන්ට පළිගැනීමක් වශයෙන් මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කළ යුතු බවත් ඒකට අපි සියලුදෙනාවම තෝරා ගෙන සිටින බවත් කීවා. 20 ක් යොදා ගෙන මෙම ප්‍රහාරය සිදු කළ යුතු බවත් විදේශිකයන් වැඩි වශයෙන් සිටින ප්‍රසිද්ධ හෝටල්, කතෝලික පල්ලි, කැසිනෝ ආයතන, බුදු පිළිම කැඩීමේ සිද්ධියේ කට්ටිය නිදහස් කරපු නැති කෑගල්ල පොලිසියට ප්‍රහාර එල්ල කරන්න උවමනායි කීවා. මේ වෙලාවේ මුආද් කොච්චිකඩේ කතෝලික දේවස්ථානයට ප්‍රහාරයක් එල්ල කළ හැකි බවත් කීවා. ප්‍රහාර

එල්ල කරන ස්ථාන සැලසුම් කර ඇති බවත් කීවා. මේ සඳහා සදන බෝම්බ බෑග් එකක එල්ලා ගෙන යා යුතු බවත් එම බෝම්බයේ කාලය හදපු දවසේ ඉන්දලා දින 15 ක් වන බවත් එම කාලයට පෙර ප්‍රහාරයක් සිදු කළ යුතු බවත් කීවා. මෙම බෝම්බ රිල්වාන් විසින් සෑදු බවත් එය පරීක්ෂා කිරීමට යාමේ දී ඔහුගේ අත තුවාල වී ඇඟිලි අයින් වුනු බවත් කීවා."

168 (T) "බංගලාදේශයේ දී ISIS ප්‍රධානියා ඇතුළු පිරිස් මරාගෙන මැරමින් සිදු කළ ප්‍රහාරය වාගේ මෙම ප්‍රහාරයේ ද ප්‍රධානියා ලෙස සිටින සහරාන් ද මරාගෙන මැරෙන බවත් කීවා. ISIS සංවිධානයට ප්‍රහාරයට කලින් වීඩියෝ එකක් සකස් කර ඉදිරිපත් කරන බවත් සහරාන් කීවා. ISIS සංවිධානය සමග සහරාන්ගෙන් පසුව නවුෆර් මවුලවි සම්බන්ධ වන බවත් සහරාන් කීවා. ප්‍රහාරය සිදු කරන දිනය දැනුම් දෙන බවත් කීවා. අපෙන් තොරතුරු එළියට ගියහොත් අපට අත්වන ඉරණම ගැන කියමින් ඔවුන් සිදු කළ මඩකලපුව ප්‍රදේශයේ පොලිසියේ දෙදෙනෙකු මැරීම, බවා යන අය මැරීම සහ ඇමති කබීර් හෂීම්ගේ ලේකම්ට වෙඩි තැබීම විස්තර කළා. "

168 (U) "පසුව අප කොළඹට ඇවිත් ඉන්න විට 2019.03.30 දී මම හසන් සමග නුවරඑළියට ගොස් ප්‍රහාරයක් එල්ල කිරීමට සුදුසු තැනක්

බලන ලෙසට මුආද් අතේ සහරාන් පණිවිඩයක් එවා තිබුනා. හසන් සහ මම නුවරඑළියට ගොස් එම ප්‍රදේශයේ විදේශිකයන් වැඩිපුර නොමැති බවට බොරුවට සහරාන්ට දැනුම් දුන්නා. ඒ නිසා අප දෙදෙනා බේරුනා. මම මරාගෙන මැරෙන්න කැමති නැති බවට 2019.04.19 මුආද්ට පණිවිඩයක් යවලා එදාම පොන් එක විසි කළා. මට මුදල් නොමැතිකමින් මුදල් ලබා ගැනීමට මේ හැමදේම කළා. මගේ හිතේ තිබෙන දේ සියල්ලක්ම කීවාට පස්සේ දැන් මට හිතට නිදහසක් දැනෙනවා.

”

යනුවෙන් 11 වන චූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින් ඉහත කී පැ.168 දරන ඉහත කී පාපෝච්චාරණයේ දී සඳහන් කර ඇති ආකාරය කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදි.

විශ්ලේෂණය.

මෙම ප්‍රකාශය 11 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙන ප්‍රකාශයක් බවට අප විසින් දැනටමත් තීරණය කර ඇත. මහනුවර අරුප්පල පැවැති පුහුණු සැසියට සහභාගී වූ බවත් විශේෂයෙන්ම මෙම නඩුවේ සොයා ගන්නා ලද පිපිරුම් උපකරණ වලට අදාළ පරිපථ සොයා ගැනීම සම්බන්ධයෙන්ද සහ කටුවාපිටිය ප්‍රදේශයේ ආරක්ෂිත නිවාස කුලියට ගැනීම සම්බන්ධයෙන්ද ඔහු සම්බන්ධ බවට කියා සිට ඇති කරුණු

විමර්ශන නිලධාරීන්ගෙන්ද අදාළ වෙළඳ ආයතන වල හිමිකරුවන්ගේ සාක්ෂි වලින්ද, කුලියට ගනු ලැබූ නිවාස වල නිවෙස් හිමිකරුවන්ගේද සාක්ෂි මගින් සනාථ වී ඇත.

ඉහත පරිදි 11 වන චූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින් සිදු කර ඇති පැ.168 දරන පාපෝච්චාරණයේ දී මෙම නඩුවට අදාළව 2019.04.21 දින කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ දී මරාගෙන මැරුනු සහරාන් සහ ඉල්හාම් යන ස්වයංඝාතක බෝම්බකරුවන් දෙදෙනා සම්බන්ධයෙන් පැහැදිලිව සඳහන් කර ඇති අතර එසේම, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ පිපිරවීමක් සිදු කරන ලද මුආද් නැමැත්තා සම්බන්ධයෙන් ද දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේ දී ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා මරාගෙන මැරුනු ජමීල් නැමැත්තා සම්බන්ධයෙන් ද එසේම, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දෙවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් සිදු කළ හස්තූන් නැමැත්තා සම්බන්ධයෙන් ද පැහැදිලිව සඳහන් කර ඇති අතර, මෙම 11 වන චූදිත ඉහත කී ස්වයංඝාතක බෝම්බකරුවන් අවස්ථා කීපයකදීම මුණගැසී ඇති ආකාරය සහ ඔවුන් සමග 2018 වසරේ මාර්තු මස අග භාගයේ මහනුවර, අරුප්පල ප්‍රදේශයේ සහරාන් නැමති ස්වයංඝාතක බෝම්බකරුගේ ප්‍රධානත්වයෙන් පැවති පුහුණු වැඩමුළුවලට ද සහභාගි වී ඇති බව පෙනී යයි. ඒ අනුව ඔහු විසින් ලබා දී ඇති ඉහත කී

පාපෝච්ඡාරණය මෙම අධිකරණය ඉදිරියේ අප විසින් ඉහත විස්තර කර ඇති ස්වාධීන සාක්ෂි මගින් සනාථ වී ඇති බවට අප තීරණය කරමු.

<u>මෙම නඩුවේ 12 වන චුදිත මොහොමද් ස්වාහිර් මොහොමඩ් හසන් යන අය විසින් පැමිණිල්ලේ සාක්ෂි අංක 2036 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බිම්ශානි ජාසින්ආරච්චි යන අයට ලබා දී ඇති පැ.919 දරන පාපෝච්ඡාරණයෙහි අඩංගු කරුණු</u>

පැ.919(1) “2014 අවුරුද්දේ මම මගේ face book group එකේ සිරියානු යුද්ධයෙන් පීඩාවට පත් වන වැඩිහිටියන් සහ දරුවන් සම්බන්ධ බෝම්බ ගසා මරා දමන දරුවන් සම්බන්ධ වීඩියෝ හා පින්තූර දැක්කා. මෙවැනි ෆොටෝ සහ වීඩියෝ share වෙනවා දැක්කා. මගේ face book ගිණුම හසන් ස්වාහීර් නමින් තමයි තිබුනේ. Did you know කියන page එක හරහා සිරියානු යුද්ධයේ පීඩාවන් හා මරණ සම්බන්ධ updates තිබුණා. මම මේවා බැලුවා. Did you know කියන පේජ් එකේ light series කියලා වීඩියෝ වගයක් තිබුනා. ඒකේ ලෝක දේශපාලනය සිරියා, ඉරාක war සම්බන්ධ වීඩියෝ තිබුනා. මම මේවා බැලුවා. මම මගේ face book එකෙන් ආදිල් අමිස් කියලා කෙනෙක් හඳුනගත්තා. එයා හට 2014 ට දෙහිවලට එන්න කියනවා. මම

ෆේස් බුක් හරහා නරඹපු සිරයානු war එකේ පින්තූර සහ වීඩියෝ බලලා එයාලට උදව් කරන්න ඕනේ කියලා හිතුනා, ”

පැ.919(2) “මම මේ පෙන්ටගනය class එකට ගියා. එහිදී මට උමෙයර්ව meet වුනා. එයා නුවර කෙනෙක්. ඉන්ෂාෆ්ව meet වුනා, එයා මට්ටක්කුලියේ කෙනෙක්.”

පැ.919(3) “මම 2016 අක්‍රම් ඉන්වයිට් කරනවා හුස්නි මුබාරක් කියලා මරදමූනේ කෙනෙක්ගේ වෙඩින් එකකට යන්න. ඒ මරදමුනේ වෙඩින් එකට මම, ඉන්ෂාෆ්, ඉන්සාන්, අම්ජඩ්, ජමීල් ඒ අය එකතු වුනා. අපි ගියේ වෑන් එකක. වෙඩින් එකට ගිහිල්ලා පහුවෙනිදා අපි වෑන් එකෙන් එහේ මරදමූනේ ඉදලා කොළඹ එන්න පිටත් වුනා. කාත්තන්කුඩි පහුවෙනකොට ජමීල් කිව්වා අපි pray කරන්න යමු කියලා. ජමීල් කාටද කෝල් එකක් ගත්තා. කෝල් එක අරන් ඊටපස්සේ වෑන් එකක් ආවා. ඒක follow කරගෙන පිටිපස්සේ ගියා. අපි ගියේ කාත්තන්කුඩි NTJ පල්ලියට. එහිදී අපි pray කළා. ඊටපස්සේ ජමීල් එක්කෙනෙක් එක්ක කතා කරා. එයා තමයි සහරාන් කියලා කිව්වේ. එයා මම කලින් දැකලාත් නැහැ. සහරාන් IS ගැන කතා කළා. එයාගේ පල්ලිය ගැන කතා කළා. දන්න විදියට ඒ පල්ලියේ මව්ලවි සහරාන් තමයි. සහරාන් ටිකක් උස කළු මහත රැවුල තියෙන

කෙනෙක්. ජමීල් එයාට ලියුමක් දුන්නා. මේ ජමීල් කියන්නේ දෙහිවල ට්‍රොපිකල් ඉන් එකේ සූසයිඩ් කරගත්ත කෙනා. ඒ ගැන කතා කළේ නෑ. එයා ඒක බලලා ජමීල්ට කියන්නම් කියලා කිව්වා. ඊටපස්සේ අපි භවසට pray කරලා ඉදලා කොළඹට පිටත් වුනා."

පැ.919(4) "2017 දෙසැම්බර් මට දිනය මතක නැහැ. ජමීල්ව හමුවෙනවා. ශස්නිගේ දුවගේ පාටි එකට මල්වානට එන්න කියලා ජමීල් මට වට්ස්ඇප් මැසේජ් එකක් එවලා තිබුනා. මගේ 0775846554 නම්බර් එකට. මම ඒකට බස් එකේ යනවා. මම junction එකක බහිනවා. එතකොට අහක්කම් ඉමාද්, උමේර්, ඉන්ෂාෆ් ඉන්සාන් ඒ කට්ටිය බයික්වලින් ආවා. මම අහක්කම්ගේ බයික් එකට නැග්ගා. ඒගොල්ලන් මල්වාන panda sports complex එකට ගියා. ඒ රෙස්ටුරන්ට් එකක් තිබුනා. මම හිතුවා පාටි එක එහෙ කියලා. නැවැත්තුවාම ජමීල්තු ඉල්හාමුත් එහේ හිටියා. එයාලා sports complex එක ඇතුළට ගියා. අපි ගියේ auditorium එක ඇතුළට. එහේ තව තුන්දෙනෙක් හිටියා. එතනින් මම දන්නේ සහරාන් විතරයි. එක්කෙනෙක් කිව්වා නවුෆර් මව්ලවි, අනිත් කෙනා අබුසිලා මිල්හාන් සිටියේ. සහරාන් මුලින්ම කතා කරලා සහරාන් අපිට කිව්වා එකමුතුව ඉන්න කියලා, රණ්ඩු කරන්න

එපා කිව්වා. කැපවීමෙන් ඉන්න කිව්වා. සහරාන් කිව්වා ඉස්ලාම් සම්බන්ධ පොත් අරගෙන තව ඉගෙන ගන්න කිව්වා. ඊටපස්සේ නවුෆර් කතා කළා. නවුෆර් මව්ලවි ඉස්ලාම් ගැන කතා කළා. තවුහිද් ගැන කතා කළා. ඊටපස්සේ මිල්හාන් අපිට කිව්වා ෆෝන් එකක් ආරක්ෂිතව පාවිච්චි කරන විදිය ගැන කතා කළා. කියලා දුන්නා. මේ බියගම මල්වානේදී සිදුවුනු පැය 1 ½ ක විතර ක්ලාස් එකක්. අපි රෑ කෑමට ශෂ්නිගේ ගෙදර ගියා. සහරානුත් එහි ආවා."

.919(5) "2018 මාර්තුවල මට ජමීල් මැසේජ් එකක් එවනවා වට්ස්ඇප් මඟින් දවස් දෙකක ට්‍රිප් එකකට ඇඳුම් ලෑස්ති කරගෙන රෙඩි වෙලා එන්න කිව්වා. ඊටපස්සේ මාලිගාවත්ත ලී මෝල ළඟ තිබෙන පල්ලියට එන්න කිව්වා. මම එතනට රෑ 7.00 ට වගේ යනවා. එහේ ගියාම රෑ pray කළාට පස්සේ මට වෑන් එකට නගින්න කියලා ජමීල් කියනවා. ජමීල්, ආෂිෆ්, ෆෂාන්, හිලාම්, ඉන්සාන්, ඉන්ෂාෆ් යන අය පල්ලියට ඇවිත් හිටියා. එයාලත් වෑන් එකට නැග්ගා. අපිට කියලා තිබුනේ නුවරඑළියේ කියලා. රෑ 12 ට විතර නුවරට ළඟා වුනා. නුවර අරුප්පොළ නිවසකට ගියා. නවුෆර් මව්ලවි හිටියා. එයා අපිට නිදා ගන්න කිව්වා. ඒක දෙමහල් නිවසක්. ග්‍රවුන්ඩ් ෆෝ එකේ රූම් එකක මම හිටියේ.

මගේ රූම් එකේ ශෂ්නි සහ කාලිද් හිටියා. Next day උදේ අවදි වුනා. උදේ pray කරලා breakfast එකට පස්සේ සහරාන්ව meet වෙනවා. සහරාන්ව හමුවෙන්න යනවා කියලා ජමීල් අපිට කිව්වේ නැහැ. සහරාන් කියනවා ගෙදරින් එලියට ගන්න බැහැ. ජනේලය ගාවට යන්න බැහැ. ගෙදරින් එලිය බලන්න එපා කියනවා. උඩු මහලේ පොඩි බෙඩ් රූම් එකක් තිබ්බා. ඒකට අපිට එන්න කිව්වා. එයා කිව්වා උඩ ගෙයි බෙඩ් රූම් එකේ සහරාන් හිටියා මමයි, කාලිද් උමේයිර්. ෆෂාන්, ඉන්ෂාෆ් ඉන්සාන් ඉන්ෆාස් ආෂිස් ජමීල් මුවාත් ඇතුළු අපි කට්ටියයි එහේ හිටපු නවුෆර්, සහරාන්, මිල්හාන්, හස්තූන් මේ අයත් අපි ඔක්කොම් බෙඩ් රූම් එකට ඇවිල්ලා ඉදගත්තා. සහරාන් කිව්වා දවස් දෙකකට කොටස් වශයෙන් ඒගොල්ලන් කතා කරනවා කිව්වා. ඒකේදී මුලින්ම සහරාන් තමයි කතා කළේ. සහරාන් කිව්වා ජිහාද් සම්බන්ධයෙන් කතා කළා. එයා කිව්වා ෆැමිලි ඔක්කොම වැදගත් නැහැ. ඕගොල්ලෝ ජිහාද් කරන්න ඕනා කිව්වා. එයා කිව්වා ජිහාද් කළාම ස්වර්ගයට යන්න පුළුවන්. එයා කියනවා අනිවාර්යෙන්ම ජිහාද් කරන්න ඕනා. ජිහාද් සම්බන්ධයෙන් හදීස් අපිට කිව්වා. ජිහාද් කියන්නේ ෆයිට් කරන්න. හදීස් කියන්නේ නබිතුමාගේ කියමන. සහරාන් කියපු සමහර ඒවා ෆේක් හදීස්, ඊටපස්සේ නවුෆර් කතා කළේ. නවුෆර්

තවුහිද් ගැන කතා කළා. ඉස්ලාම් ගැන එක්ස්පේල්න් කළා. එයා ජිහාද් සම්බන්ධයෙන් කතා කළා. අබුමොහොමඩ් (හස්තූන්) කතා කළා. එයා ෆෝන් එකක් කොහොමද සේෆ්ටි එකේ තියාගන්නේ කියලා කතා කළා. ආරක්ෂා කරගන්නේ කොහොමද කිව්වා. ඊටපස්සේ මිල්හාන් ටී 56 ක් රූම් එකට ගෙනාවා. ශෂ්නි කියලා බෝයි කෙනෙක් ඇහුවා මේක ඔයාගේද කියලා, එවිට මිල්හාන් කිව්වා මේක මගේ ලයිසන්ස් තියෙන gun එක.මම army එකේ කියලා කිව්වා. ඊටපස්සේ මිල්හාන් ඒක ගලවලා පෙන්නුවා. ඊටපස්සේ ඇතුළේ කොටස් පෙන්නුවා. ඊටපස්සේ හයි කළා. ඊටපස්සේ අපේ අතට දුන්නා. මැග් එක ගහලා තිබ්බේ. ඊටපස්සේ ඒම් කරලා බලන්න කිව්වා. මම ගත්තා. මම ඒම් කරලා බැලුවා. ගොඩක් වෙලා මුවාත් තමයි අතේ තියාගෙන හිටියේ. ”

පැ.919(6) “ මම weapon එක aim කළේ කන්නාඩියකට, මිල්හාන් live ammunition ගොඩක් ගෙනත් තිබ්බ, ඒවා බිම තිබ්බ, මම Mag එකට ජීව උණ්ඩ 01 ක් මැගසින් එකට පිරෙව්වා. මැග් එක වෙනම තිබ්බේ. සහරාන් සහ නවුෆර් එතන බලාගෙන හිටියා. මිල්හාන් තමයි කියලා දෙන්නේ”

පැ.919(7) " ඊට පස්සේ සහරාන් ඇවිල්ල කිව්වා මේ ගැන එළියට කිව්වොත් IS එකේ වගේ වලක් හාරල වෙඩි තියනව කිව්ව "

ප්‍ර.919(8) " අරුප්පොල ඉඳල රෑ එකොළහට වගේ පිටත් වෙනවා. කොළඹට එනවා උදේ 05 ට වගේ"

පැ.919(9) " 2019 තුන්වන මාසයේ මාර්තු call එකක් එනවා දන්නේ නැති number එකකින්. ඒක Answer කළහම තිබ්බම call එක අරන් තිබ්බේ මුවාත්. එයා මාව හම්බ වෙන්න ඕන කියලා කිව්වා. මම කිව්වා ගෙදර ගාවට එයාට එන්න කියලා. මුවාත් එදා හවස අපේ මාලිගාවත්ත ගෙදර වත්තට ආවා"

පැ.919(10) " එයා දවස් 02 කින් විතර මට ආයිත් call එකක් ගන්නවා. ඒ මාර්තු 25 විතර හම්බ වෙන්න ඕන කියනවා. මම කිව්වා Office එක ලඟට එන්න කියලා. ඊට පස්සේ එයා Office එක ලඟට ඇවිල්ලා මට කියනවා පොඩි දේශනයකට එන්න කියලා"

පැ.919(11) " මම ඔයාට තැන කලින් කියපු නිසා ඔයා අනිවාර්යයෙන්ම එන්න ඕන කියලා, මීගමුවට එන්න ඕන කියලා කියනවා. මම හරි බලන්නම් කීව. කාලිත්ටත් මේ ගැන කියන්න කීව. කාලිත් කියන්නේ සහරාන්ට වැඩ කරපු කෙනෙක්. මම එයා දන්නවා. මුවාත් Whatsapp message එකක් මගේ 0775846554

අංකයට message එකක් එවනවා මාර්තු 27 ගල්කිස්ස station එක ලඟට එන්න කියල, මම බස් එකේ ගල්කිස්ස දුම්රිය ස්ථානයට 27 උදේ යනවා. එහේ රීච් වුනාට මුවාත් වැන් එකේ එනවා. එහිදි මුවාත්, මම, ජමීල්, කාලිත් ඉන්නවා ඉන්ෂාෆ් එනකන්. ඒ ආවම අපි පිටත් වෙනවා. මුවාත්ගේ වැන් එකේ අපි ඔක්කොම යනවා. යන්නේ කොහෙටද තැන කිව්වේ නෑ. මම, ජමීල්, කාලිත්, ඉන්ෂාෆ්, මුවාත්ගේ වැන් එකේ පානදුරට යනවා. පානදුර ගෙදරකට යනව. ගෙදර දොර අරින්නේ සහරාන්. ඇතුළට ඇවිත් අපිට ඉඳ ගන්න කියනවා. එයා මගෙන් ඇහුවා හසන් ඔයාද කියලා. මම ඔව් කිව්වා. එයා වැන් එක පදවගෙන ආපු ඩ්‍රයිවර්ට කෑම ගන්න යන්න කිව්වා. සහරාන් අපිට කිව්වා එයාගේ කණ්ඩායමක් තියනවා කියලා ඒකේ එයා තමයි නායකයා කිව්වා ”

පැ.919(12) “ මුලින්ම සහරාන් ඇහුව අපි සිරියාවට යන්න කැමතිද කියල. අපි එහේ කට්ටිය බේරර ගන්න ඕන කියලා. එයා කිව්වා එයා සුයිසයිඩ්(Suicide) වෙන්න යනවා කියලා කිව්වා. අපිට සහරාන් කොහේද, කවදද කරන්නේ කියලා එතනදි කිව්වේ නෑ. හස්තූන්(අබු මොහොමඩ්) එතනට ආවා. සහරාන් එතනදි කිව්වා එයා කාත්තන්කුඩිවල බාවා කියලා කෙනෙක් මැරුවා කියලා.

වවුනතිව් පොලිසියේ දෙන්නත් මැරුවේ සහරාන්ලා කියලා සහරාන් කිව්වා. . කබීර් හෂීම්ගේ සෙකට්රිවත් එයා මැරුව කියලා කිව්වා. ඊට පස්සේ එයා කිව්වා මාව follow කළේ නැත්නම් ඕගොල්ලන්ටත් මේකම වෙයි. ඕගොල්ලන්ගේ තොරතුරු අපි ගාව තියනව කිව්වා ”

පැ.919(13) “ අපි කෑම කාල එහෙන් පානදුර ගෙදරින් 11 ට වගේ පිටත් වුනා. ඊට පස්සේ දවස් 2 කින් වගේ මුවාත් මට call කළා. මුවාත් call කරලා කිව්වා නුවරඑළියට යන්න. ගිහිල්ලා දවස් 02 ක් නවතින්න කියලා. 2019 මාර්තු 29 එහෙම කිව්වේ. නුවරඑළියට ගිහින් විදේශිකයන් ගැවසෙන පොදු ස්ථාන බලලා කියන්න කිව්ව”

පැ.919(14) “ පානදුරේදි සහරාන් මට කිව්වා එයා සුයිසයිඩ් වෙන්න යනවා කියලා. එයා මටත් එන්න කියලා කිව්වා.”

පැ.919(15) : “ එයාගේ නායකත්වයෙන් එයාව අයින් කරපු නිසා තමයි එයා සුයිසයිඩ් කරනව කිව්වේ”

පැ.919(16) “අපිටත් එයත් එක්ක සුයිසයිඩ් කරන්න එන්න කිව්වා. මුවාත් මට මාර්තු 29 කිව්ව නුවරඑළියට ගිහින් විදේශිකයන් ගැවසෙන පොදු ස්ථාන බලලා කියන්න කියලා ”

පැ.919(17) " මමත් කාලිත්තුත් මාර්තු 30 උදේ 07.00 ට නුවරඑළියට යන්න කාලිත්ගේ බයික් එකේ පිටත් වෙනවා. කාලිත්ට සහරාන් ඒ බයික් එක අරන් දීලා බව මම දැන ගත්තා පස්සේ. කාලිත් නුවරඑළියෙ යන්න කැමති වුනා. අපි දෙන්නා පිටත් වුනා. අපි එකඟ වුනා විදේශිකයන් නෑ කියලා ඒගොල්ලන්ට කියන්න. "

පැ.919(18). " සඳුදා මුවාද් මට මැසේජ් එකක් එවලා තිබුණා නුවරඑළිය ගැන විස්තර අහලා. මම එයාට රිප්ලයි කළා නුවරඑළියෙ විදේශිකයන් නැහැ, ඔක්කොම ලංකාවෙ කට්ටිය ඉන්නෙ කියලා.''

පැ.919(19) "අප්‍රේල් 08 කාලිද් මට කෝල් කළා. කාලිද් ලඟ තමයි මගේ ඔෆිස් නම්බර් එක තියෙන්නේ. 0777-644304 ඔෆිස් නම්බර් එකට කොල් කරලා කොහෙද ඉන්නෙ කියලා ඇහුවා.''

පැ.919(20) " තව විනාඩි 05 කින් ආයෙත් කෝල් කරලා මට එළියට එන්න කිව්වා. මම එළියට ගියාම කාලිද් හිටියා. කාලිද් මට බයවුණා. එයා රහසින් වගේ කිව්වා මුවාද් ඇවිත් කියලා. මම බැහැලා ගියාම මුවාද් ඉස්සරහට ආවා.''

පැ.919(21) “මුවාද් මට 2019 මාර්තු 26 වැනිදා මගේ ඔෆිස් එක ලඟදි මට ත්‍රීමා කියලා ඇප් එකක් දාලා දුන්නා.’’

පැ.919(22) “ 2019 අප්‍රේල් 21 වැනිදා කාලිද් එයාගේ ෆෝන් එක කඩලා විසි කරා කියලා මට කිව්වා.

පැ.919(23) “ ඒක සහරාන් දීපු එකක්ද, කාලිද්ගේ ෆෝන් එකක්ද කියලා මම දන්නේ නැහැ.’’

පැ.919(24) “ උමයර් ඊට පස්සේ ලැප්ටොප් පරිගණකයේ ලෝකයේ මුස්ලිම්ලට සිදුවෙන අපරාධ ගැන වීඩියෝ එකක් පෙන්නුවා.’’

පැ.919(25) “ ඒ තමයි දවසක් ආනන්ද මාවතේ පිහිටි අම්ජාඩ් කියන අයගේ ගෙදරට සහරාන් ආවා. සහරාන් ඇවිල්ලා එහෙදි කිව්වා එයාගෙ පල්ලිය ගැන. එයා කොහොමද මවුලවි උනේ කියලා. පෙන්ඩ්‍රයිව් වලින් මවුලවිලට අයි.එස්.අයි.එස්. සම්බන්ධව එයා දැනුවත් කරනවා කිව්වා. එදා අම්ජාඩ් හිටියා. මම, උමයර්, සහරාන් එදා සහරාන්ගෙ මල්ලි රිල්වානුත් එක්කරගෙන ඇවිත් හිටියා.’’

පැ.919(26) “ අරුක් වල 2018.03.24 සහ 25 දිනවල පැවති පන්තිවල වීඩියෝ එකක්ද සහරාන් විසින් අප වෙත පෙන්වූ අතර එහි

කැළැවේ ඔවුන් කළු ඇඳුමින් අරාබි භාෂාවෙන් කථා කරමින් අයි.එස්.කොඩිය සහිත ටී-56 අවි දෙකක් දර්ශනය වූ අතර''

12D15-1 228146 කියන පැ.919-2 පේළි 02 කට විතර පස්සේ ඇති "ඊට පස්සේ එයාලා දැක්කේ නැහැ''

12D15-2 228147 කියන පිටුවේ Updates කියලා වචනයකට පස්සේ පේළියේ " එදා ආදිල්ගේ කතාවට පිරිස එකඟ වුණේ නෑ. එදායින් පස්සේ මම ආදිල්ව දැක්කේ නැහැ''

12D15-3 228148 කියන පිටුවේ පේපර් එකේ ඇරබික් කියලා ඉංග්‍රීසියෙන් ලියපු තැන.

12D15-4 228149 කියන පිටුවේ "එයා මුලින්ම ඉල්ලනවා එයාගේ ෆෝර්සස් අපිට එකතු කර ගන්න කියලා. ඊට පස්සේ ආයෙත් අපි එකඟ වෙන්නෙ නැහැ''

12D15-5 මම ඒ ගොල්ලො කවුරුත් එක්ක ටච් එකේ හිටියෙ

12D15–6 පැ.919-9 228153 පිටුවේ "එහිදී මම එයත් එක්ක කතා කලා එයා එයාගේ පුද්ගලික ජීවිතය ගැන කථා කලා, එයා කිව්වා වයිෆ්ට බබෙක් හම්බ වෙන්න යනවා, එයාට ඇඳුම් අරන් යනවා කියලා"

12D15–7 12D15–6 පේළියකට පස්සේ “එයා හමුවෙමු කියලා යන්න ගියා”

12D15–8 ඒ පිටුවෙම පේළි දෙකකට හෝ තුනකට පසුව “වෙලාවේ මම කියනවා මට නිවාඩු නැහැ, එන්න බැරි වෙයි”

12D15–9 228155 කියන පිටුවේ 2019 මාර්තු 29 දිනයෙන් පසු “මම කිව්වා මට නිවාඩු නැහැ ”

12D15–10 228156 කියන පිටුවේ “ ඇයි ඔයා අපි මඟරින්නේ කියලා ඇහුවාම මම කිව්වා සුවිසයිඩ් කරන එක ආගමේ වැරදි මම ඒකට එකග නැහැ කියලා කිව්වා” කියන කොටස.

12D15–11 ඊළඟ පේළියේ “ඊට පස්සේ මට එයාලා එක්ක සම්බන්ධයක් තිබුනේ නැහැ” කියන කොටස.

12D15–12 228158 කියන පිටුවේ අවසාන කොටසේ “බෝම්බ පිපිරීමක් සම්බන්ධව හෝ දිවිනසා ගැනීම් මානසිකත්වයක් මා හට නොවූ බවත්” කියන කොටස

12D15–12 “සහරාන්ගේ එම ක්‍රියා කලාපයන් ආගම අනුව වැරදියි කියලා ප්‍රකාශ කරමි” කියන කොටස

යන කොටස ආදී වශයෙන් සලකුණු කරමින් පැමිණිල්ල විසින් එම කොටස් කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කර ඇත. කෙසේ වුවද එම ප්‍රකාශය සම්බන්ධයෙන් පැවැත්වූ අතුරු පරීක්ෂණයේදී මෙම අධිකරණය විසින් සළකා බලනු ලැබුවේ එකී ප්‍රකාශය යම් බලපෑමක් කිරීමෙන්, තර්ජනයක් කිරීමෙන් සහ හෝ පොරොන්දුවක් ලබා දීමෙන් ලබා ගත් ප්‍රකාශයක් ද නැතහොත් චූදිත විසින් ස්වේච්ඡාවෙන්ම ලබා දුන් ප්‍රකාශයක්ද යන්නයි.

කෙසේ වුවද අපගේ සාක්ෂි නීතියේ ප්‍රතිපාදන මෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16(3) වගන්තිය යටතේ එම ප්‍රකාශය මතම පමණක් පිහිටා චූදිතයෙකු වරදකරු කිරීමට හැකියාවක් නොමැති අතර, එම ප්‍රකාශයේ සඳහන් ඔහු විසින් කලේ යැයි කියනු ලබන යම් වරදක් ඇත්නම් එය ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු වීමක් විය යුතු වීම පමණක් නොව එම ප්‍රකාශයේ සඳහන් අදාළ ලකුණු කර ඇති කොටස්ද ඔහු විසින් වරදක් කල බවට පාපෝච්ඡාරණය කිරීමක් හෝ ඔහුගේ වරදකාරීත්වය පෙන්නුම් කරන ස්වභාවයෙන් යුත් ඒවා විය යුතුය. කෙසේ වුවද මෙම නඩුවේදී ඉහත සඳහන් ප්‍රකාශයේදී සහ ඔහුට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සමස්ථ සාක්ෂි සැලකිල්ලට ගැනීමේදී 12 වන චූදිත විසින් මෙම අධිචෝදනාපත්‍රයේ ඔහුට විරුද්ධව නඟා ඇති චෝදනාවන් සම්බන්ධයෙන් වරදකරුවෙකු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව අපහට පෙනී යයි. ඒ අනුව මෙම ප්‍රකාශය තුළ සැබැවින්ම

පාපෝච්ඡාරණමය ප්‍රකාශයක අඩංගු විය යුතු අනිවාර්ය අංගයන් පෙන්නුම් නොකරන පසුබිම තුළ මෙම ප්‍රකාශය 12 වන චූදිත සම්බන්ධයෙන් මෙන්ම එම ප්‍රකාශයේ නම් සඳහන් කර ඇති අනිකුත් තැනැත්තන්ට එරෙහිවද උපයෝගී කර ගැනීම ප්‍රවේශම් සහගත නොවන බවට අප තීරණය කරමු.

18 චූදිත වන රාසික් රාසා හුසේයින් විසින් පැමිණිල්ලේ සාක්ෂි අංක - 2119 පොලිස් අධිකාරී දෙල්වලගේ උපුල් ලසන්ත රත්නායක යන සාක්ෂිකරුට 2021.06.14 දින කර ඇති පාපොච්චාරණමය ප්‍රකාශය

පැමිණිල්ලේ සාක්ෂි අංක - 2119 පොලිස් අධිකාරී දෙල්වලගේ උපුල් ලසන්ත රත්නායක 2026.07.10 දින සාක්ෂි දෙමින්, 18 වන චූදිතගේ ප්‍රකාශය සම්බන්ධයෙන් පවත්වන ලද අතුරු පරීක්ෂණයේ 2026.06.30 දින ප්‍රකාශයට පත් කරන ලද අතර ඒ අනුව පැ.807 වශයෙන් සලකුණු කිරීමට අවසර දෙන ලද ප්‍රකාශය වර්ෂ 2021.06.14 දින සටහන් කරන ලද රාසික් රාසා හුසේන් නැමති මෙම නඩුවේ 18 චූදිතගේ පාපෝච්චාරණමය ප්‍රකාශය පැ.807 වශයෙන් සලකුණු කරන ලදී.

ඉන් අනතුරුව පැමිණිල්ල විසින් එකී පැ.807 දරන ප්‍රකාශයෙහි සඳහන් පහත සඳහන් කොටස් උපුටා දක්වමින් ඒවා පහත පරිදි සලකුණු කරන ලදී.

පැ. 807 (1) " මම රැකියාව වශයෙන් ද, කල්මුනේ නගරයේ ඉමාරා බේබි චොයිස් නමින් රෙදි කඩයක් කරගෙන ගියා. මා එම කඩය කරගෙන යන කාලයේ සිකුරාදා දිනවල ජුම්මා දේව මෙහෙය සඳහා කාත්තණ්කුඩි, දාරුල් අදර් පල්ලියට යනවා. ඒ පල්ලියේ සභාපති වශයෙනුත් සිටියේ රවුෆ් නානායි."

පැ. 807 (2) "මෙහෙම ඉන්න කොට 2018 පෙබරවාරි මාසෙ කියලා මම හිතනවා. සිකුරාදා දවසක්. නවුෆර් මවුලවි විසින් දාරුල් අදර් පල්ලියේ දේශනාවක් කළා. ඒ දේශනාවේ මවුලවි විසින් විදේශ රටවල සිටින මුස්ලිම් ජනතාවට සිදු වන හිරිහැර සම්බන්ධයෙන් පැහැදිලි කළා."

පැ. 807(3) " එදා හවසම මම මගේ යාළුවන් සමඟ නවුෆර් මවුලවි හමුවීමට බීච් එකට ගියා. එහිදී නවුෆර් මවුලවි ඇවිල්ලා නැවතත් අපිට විදේශ රටවල මුස්ලිම් ජනතාවට සිදුවන හිරිහැර සම්බන්ධයෙන් පැහැදිලි කරලා ඒවා නැති කරන්න අපි වැඩපිළිවෙළක් හදාගෙන යනවා. ඒ ගැන අපි පසුව දැනුම් දෙන්නම් කියලා ගියා. එදා නවුෆර් මවුලවි සමඟ මිල්හාන්

කියලා කෙනෙකුත් ඇවිත් හිටියා. පසුව මිල්හාන් කියන කෙනා මගේ යාළුවෙක් වන සඟාන්ට නිතරම දුරකතනයෙන් කතා කරනවා. කතා කරලා අපි ඔක්කොටම බීච් එකට එන්න කියලා කියනවා. අපි කීපවතාවක්ම මිල්හාන්ව බීච් එකේදී හමු වෙලා තියෙනවා. ඒ අවස්ථාවලදී මිල්හාන් නවුෆර් කියපු ඒ වැඩමුළුව සම්බන්ධයෙන් තමා වැඩිපුරම කතා කරන්නේ. ”

පැ.807(4) “පසුව 2018 නෝම්බි උත්සවයෙන් පසු දිනක සඟාන් මට කෝල් එකක් අරගෙන බීච්එකට එන්න කියලා කිව්වා. මම එදිනම රෑ 9ට පමණ කාත්තණ්කුඩි බීච් එකේ ඉදිරිපිට තියෙන ගඩාෆි රෙස්ටුරන්ට් එකේ හෝල් එකේ හම්බුනා.”

පැ.807(5) “රෑ 9.30 ට පමණ එතනට සහරාන් මවුලවි, නවුෆර් මවුලවි, සහ මිල්හාන් ආවා. ඇවිල්ලා සහරාන් මවුලවි විසින් අපට දේශනාවක් කළා. එම දේශනාවේ සහරාන් ඉතිහාසයේත් නබිතුමා විසින් යුද්ධය කළ විදිය ගැන පැහැදිලි කරලා දුන්නා.”

පැ.807(6) “එහෙම ඉන්නකොට 2018 ජූනි මාසයේදී පමණ සඟාන් කිව්වා යාළුවෝ ඔක්කෝටම බීච් එකට එන්න රැස්වීමක් තියෙනවා කියලා. පසුව මම මුලින් කිව්වා යාළුවෝ නව දෙනාම බීච් එකට ගියා. මිල්හානුත් ආවා. මිල්හාන් අපට කිව්වා අර කියපු ගමන මේ මාසයේදී මැදදී යනවා. ඒකට හැමෝම ලෑස්ති වෙන්න

කියලා. යන්නේ හම්බන්තොටට, කොහොමද යන්නේ කියලා පස්සේ කියන්නම් කියලා කිව්වා. ඊටපස්සේ අපි 2018 ජූලි මාසයේදී පමණ හම්බන්තොටට ගියා."

පැ.807(7) "හම්බන්තොටට සුදු පාට ඩොල්ෆින් වෑන් එකේ තමයි ගියේ. වෑන් එක පදවා ගෙන ආවේ අසාද්"

පැ.807(8) "ඒ ගෙදරට හම්බන්තොට ටවුමේ ඉදලා විනාඩි 15 ක් දුර තිබුනේ. තනි

තට්ටුවේ ගෙදරක්. කාමර තුනක් තිබුනා. මාව අම්පාර පොලිසියෙන් මුලින්ම අත්අඩංගුවට ගත්තායින් පස්සේ මේ පිළිබඳව පරීක්ෂණ කරපු අයට කිව්වා ඒ තැන මම ඒ මහත්වරුන්ට ගිහිල්ලා ඒ ගේ තියෙන තැන පෙන්නුවා."

පැ.807(9) "දේශන තිබ්බ දවස් දෙකේ සහරාන්, රිල්වාන්, නවුෆර් මවුලවි, මිල්හාන්

අපට දේශන කළා. එහිදී ඔවුන් විදේශ රටවල හා ලංකාවේ මුස්ලිම් ජනතාවට සිදුවන හිරිහැර සම්බන්ධයෙන් පැහැදිලි කරලා. ඒ හිරිහැරවලින් මුස්ලිම් ජනතාව ආරක්ෂා කරන විදියත් කියලා දුන්නා. ඒ වගේම ISIS සංවිධානය සම්බන්ධයෙන් වීඩියෝ පෙන්වලා එම සංවිධානයේ මතවාදය හරි කියලා පැහැදිලි

කළා. තවද ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් රාජ්‍යයක් ඇති කරන්න ඕනේ කියලා කිව්වා."

පැ.807(10) "පසුව පුද්ගලයෙකු විසින් ජංගම දුරකථන පාවිච්චි කරන විදිය ගැන කියලා දීලා, ජංගම දුරකථනය ISIS සංවිධානය සම්බන්ධ වීඩියෝ බලන විදිය පැහැදිලි කරලා දුන්නා."

පැ.807(11) "ඊටපස්සේ දෙවන දින සවස රිල්වාන් සහ අබුඋමාර් යන අය විසින් T56 වර්ගයේ ගිනි අවියක් පෙන්වා ඒ අවිය ගලවලා නැවත සවි කරන විදිය, උණ්ඩ දාන විදිය, වෙඩි තියෙන විදිය, ඒකේ ක්‍රියාකාරීත්වය ගැන කියලා දුන්නා.ඒ වගේම පිස්තෝල අවියක් පෙන්වලා ඒ විදියටම පැහැදිලි කරලා දුන්නා. ඊට පස්සේ රිල්වාන් විසින් දෙපැත්ත කැපෙන උල් පිහියක් අරගෙන පිහියකින් ලේසියෙන් මිනිහෙක් මරණ විදිය කියලා දුන්නා. මිනිහෙකුගේ ශරීරය බෙල්ල, කකුලේ සහ අත්වල නහර කපන විදිය කියලා දුන්නා. පසුව සහරාන් ඔක්කොටම කතා කරලා ඔහුගේ අත උඩ අපිට අත තියන්න කියලා අරාබි භාෂාවෙන් මොනවදෝ කියලා දිවුරුම් දුන්නා."

පැ.807(12) "පස්සේ සහරාන් මට අබුමිහිජන් කියලා අබු නාමයක් දුන්නා."

පැ.807(13) “මම ඒ දවස්වල 076-5664968 ඩයලොග් දුරකථන අංකය තමයි පාවිච්චි කළේ.”

පැ.807(14) “අපි සෆාන්ගේ බයික් එකේම රවුෆ් නානාගේ ඔල්ලිකුලම ඉඩමට ගියා. ඉඩමේ වටේ තාප්පයක් බැඳලා තට්ටු දෙකක ගෙයක් තිබුණා. එලියේ රවුෆ් නානා හා අසීම් හිටියා. රවුෆ් නානා අපිට ඇතුළට ගිහිල්ලා බලන්න කිව්වා. අපි උඩ තට්ටුවට ගිහිල්ලා බැලුවා. එතනදී රිල්වාන්ගේ අත් දෙක හා මුහුණේ තුවාල වෙලා සිහිය නැතිව වගේ බිම වැටිලා සිටියා. රිල්වාන් බලලා අපි පහළට ආවා. ඊට පසුව එතනට රිල්වාන්ගේ තාත්තා කාසීම්, සහරාන්ගේ මස්සිනා නියාස් සහ රිසාත් යන අය ඇවිල්ලා හිටියා. පසුව රවුෆ් නානා කිව්වා රිල්වාන්ව අන්වර් පල්ලිය තියෙන රිල්වාන්ගේ තාත්තාගේ ගෙදරට අරන් යන් කියලා. රිල්වාන්ගේ තාත්තයි රිසාදුයි රිල්වාන්ව රතු පාට ත්‍රීවීල් එකක දාගෙන රිල්වාන්ව ඒ ගෙදරට අරගෙන ගියා. වීල් එක පස්සෙන් මායි සෆානුයි බයික් එකෙන් ගියා. මම ඒ වේලාවේ රවුෆ් නානාගෙන් ඇහුවා රිල්වාන්ට මොකද වුනේ කියලා. රවුෆ් නානා කිව්වා රිල්වාන් පාලමුණේ මුස්ලිම් පල්ලිය ගාව බෝම්බයක් ටෙස්ට් කරන්න ගිහිල්ලා ඒක පිපිරුනා කියලා. රවුෆ් මට කිව්වා රිල්වාන් තුවාල වුන තැනට ගිහිල්ලා එතන

මොනවහරි ඇති ඒවා වැලි දාලා වහලා එන්න කියලා. පස්සේ මම එතනට සෆාන්, අසීම්, අසාද් සමඟ බයික් දෙකකින් ගිහින් බැලුවා. එතනද පාලමුණේ මුස්ලිම් පල්ලිය ළඟ බෝම්බය පිපිරුනු තැන තණකොළ උඩ ලේ පැල්ලම් තිබුණා. එතන බෝක්කුවේ අනිත් පැත්තේ තිබුණු වැලි අරගෙන ලේ පැල්ලම් උඩින් වැලි දාලා වැහුවා. පස්සේ අපි රිල්වාන්ගේ තාත්තාගේ නිවසට ගියා. ඒ ගියාට පස්සේ එතනට සෙයිනි සහ සුබෙර් නානා නිල් පාට ඩීසල් ත්‍රීවිල් එකකින් ආවා. රවුෆ් නානා අපිට කිව්වා සුබෙර් ආවා ත්‍රීවීල් එකේ බෑග් එකක් තියෙනවා. ඒක ගෙනිහින් කාත්තන්කුඩි නාදියා බීච් එකේ වල දාන්න කියලා. පස්සේ සුබෙර්ගේ ත්‍රීවීල් එකේ මමයි පිරිදවුසුයි ගිහින් කාත්තන්කුඩිය නදියා බීච් එකේ වලක් හාරලා ඒ බෑග් එක වල දැම්මා. මාව අම්පාර පොලිසියෙන් අත්අඩංගුවට ගත්තාට පස්සේ මම පොලිසියේ මහත්වරුන්ට ඒ තැන පෙන්නුවා. පොලිසිය ඒ බෑග් එක හොයාගත්තා. ඒ බෑග් එකේ වෙඩි බෙහෙත්, වයර් කෑලි සහ බෝම්බ හදන්න ගත්ත බඩු තිබුනා. අපි බෑග් එක වල දාලා ආපහු රිල්වාන්ගේ තාත්තාගේ ගෙදරට ගියා. රිල්වාන්ගේ ගෙදර මිල්හාන්, ගපූර් මාමාත් ඇවිල්ලා හිටියා. පස්සේ රිල්වාන්ව වෑන් එකකට දාගෙන අරගෙන ගියා.”

පැ.807 (15) “පස්සේ දවසක රවුෆ් මට කිව්වා, රිල්වාන්ව එක්ක ගෙන ගිහිල්ලා

කොළඹ ඉස්පිරිතාලේ නවත්වලා බෙහෙත් කරනවා කියලා.”යන කොටස වශයෙනුත් සලකුණු කරන ලදී.

එසේම 18 වන චූදිතගේ ප්‍රකාශය සම්පූර්ණයෙනුත්, නිවැරදිව සටහන් කළ බවත් ඔබ එම ප්‍රකාශය අවසානයේදී නිවැරදිව යතුරුලියනය කර සහතික කිරීමක් සිදුකළ බවත් කියා සිටින ලදී.එසේම අවශ්‍ය අවස්ථාවන්හිදී භාෂණ පරිවර්ථකගේ සහායද ලබාගත බව වැඩි දුරටත් කියා සිටින ලදී. සාක්ෂිකරු ලබාදුන් සාක්ෂිය අධිකරණයේ දමිළ භාෂණ පරිවර්තක ලවා මෙම නඩුවේ සියලුම චූදිතයන්ට දමිළ භාෂාවෙන් යළි පහදා දීමට කටයුතු කරන ලදී. සියලුම චූදිතයින්ට මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිවාසිකම්ද පහදා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 01, 02, 07, 08, 10, 15, 18, 19 සහ 20 සිට 25 දක්වා චූදිතයන් වෙනුවෙන් නීතීඥ කනිල් මද්දුමගේ මහතා හරස් ප්‍රශ්න අසන ලද අතර, ප්‍රකාශයේ ඇති කරුණුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශනයක් කළේද යන්න විමසා ඇති අතර, ඒ සම්බන්ධයෙන් විමර්ශන විශාල සංඛ්‍යාවක් පැවති බවත් නිශ්චිතව එක් විමර්ශනයක් සම්බන්ධයෙන් කීමට නොහැකි බව සාක්ෂිකරු පවසා සිටින ලදී .

මෙම සාක්ෂිකරු මගින් පැ.807 ලේඛණයෙහි අඩංගු පහත කොටස් 18 වූදිත වෙනුවෙන් පහත පරිදි ලකුණු කරන ලදී.

ඉහතින් පැ.807(15) ලෙස සලකුණු කරන ලද කොටසට පසුව 18D(01) ‘‘ඉස්පිරිතාලේ කොහේද කියලා කිව්වේ නෑ. ඊට පස්සේ, ඒ කට්ටිය එක්ක මගෙ ලොකු සම්බන්ධතාවයක් තිබුණේ නෑ.”

18D(02) “මාව අම්පාර පොලිසියෙන් අත්අඩංගුවට ගත්තේ 2019/05/07 වන දිනයි.

ඊට පස්සේ, මාව කල්මුනේ උසාවියට දාලා මඩකලපුව බන්ධනාගාරයට දාලා එතනින් අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට මාරු කළා. එහෙ ඉන්නකොට තමයි මාව TID එකෙන් රැඳවුම් නියෝගයක් ලබා ගෙන මෙහි රැගෙන ආවේ.” යන කොටස 18D(02) වශයෙන් සලකුණු කරන ලදී.

මෙම පාපොච්චාරණයේ අන්තර්ඝත කරුණු මෙම අධිකරණයේ සාඛ්‍ය ලබා දුන් පැ.සා 1400 අනස් ගේ සාක්ෂියෙන් තහවුරු වන අතර් එසේම මෙම විඅර්ශන නිලධාරීන් ගේ සාක්ෂි තුලින් ද එසේම මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා 1402 අහම්ඩ් මුන්ශිෆ් යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුලින් ද තහවුරු වේ. ඉහත කී අනස් සහ මුන්ශිෆ් යන සාක්ෂිකෞර්වන් ගෙ සාක්ෂි වලට අනුව නුවර එ ළියේ මෙන්ම හන්බන්තොට පුහුණු

වැඩමුලු පැවති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති බව පෙනී යයි. ඒ අනුව මෙම පාපොච්චාරණයේ අඩංගු අන්තර්ඝතයන් ස්වාදීන සාක්ෂි මගින් තහවුරු වේ.

<u>නඩුවට අදාළ පිළිගැනීම් සම්බන්ධ නෛතික තත්වය</u>

ඉහත කී පිළිගැනීම් වලට අනුව මෙම නඩුවෙහි සියලුම චූදිතයන් වෙනුවෙන් අලවුදීන් අහමඩ් මුආත් හෙවත් මුආත්, අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොමදු මොහොමදු හස්තුන්, මුහම්මදු හසීම් සහරාන් හෙවත් මොහොමඩ් කාසීම් සහරාන් හෙවත් මුහම්මදු කසිම් මොහොමඩ් සහරාන් හෙවත් මොහොමඩ් කසිම් මොහොමඩ් සහරාන්, මොහොමඩ් ඉබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ්, මොහොමදු අසාමි මොහොමදු මුබාරක්, මොහොමඩ් ඉබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ් හෙවත් මොහොමදු ඉබ්‍රාහිම් ඉන්සාෆ් අහමඩ්, මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද්, අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මද් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් සහ මොහොමඩ් කාසීම් මොහොමඩ් ෂෙයිනි හෙවත් ෂෙයිනි මවුලවි යන දැනට මියගොස් සිටින පුද්ගලයන් ගේ අනන්‍යතාවය පමණක් පිළිගැනීම සිදු කර ඇති අතර, මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති චෝදනාවන් වලට අනුව ඉහත පුද්ගලයන් අතුරින් අවසාන තැනැත්තා වන මොහොමඩ් කාසීම් මොහොමඩ් ෂෙයිනි හෙවත් ෂෙයිනි මවුලවි යන අය හැර අනිකුත්

පුද්ගලයන් පාස්කු ඉරු දින ස්වයංඝාතක බෝම්බ ප්‍රහාරයන් සිදු කරන ලද තැනැත්තන් බවට සඳහන් කර ඇති බැවින්, එකී කරුණු එනම්, එකී පුද්ගලයන් 2019.04.21 පාස්කු ඉරු දින මරාගෙන මැරෙන බෝම්බ පුපුරුවා හැරීම සිදු කරන ලද ස්වයංඝාතක බෝම්බකරුවන් බවට සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින් වේ.

ඉහත අවසාන පුද්ගලයා වන මොහොමඩ් කාසීම් මොහොමඩ් ෂෙයිනි හෙවත් ෂෙයිනි මවුලවි නැමැත්තා සයින්දමරුදු ප්‍රදේශයේ ස්වයංඝාතක බෝම්බයක් පුපුරවාගෙන මිය ගිය තැනැත්තා බවට සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේද පැමිණිල්ල විසින්ම වන අතර, එකී කරුණු මෙම නඩුවේ චූදිතයින් විසින් පිළිගැනීමක් කර නොමැත.

<u>අධිකරණ භාෂණ පරිවර්තක දුලාලින් තුවාන් සදාම් සාක්ෂිය</u>

අධිකරණ භාෂණ පරිවර්තක දුලාලින් තුවාන් සදාම් සාක්ෂි දෙමින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 420 වගන්තිය යටතේ දෙපාර්ශවය විසින් පිළිගත් කරුණු අන්තර්ගත පිටු 07 කින් යුත් ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. එමගින්, අලවිදීන් අහමත් මුවාත් (මුආත්) යන අයගේ ජාතික හැඳුනුම්පත පැ.1182ලෙසත්, ඔහුට අයත් අංක M 2217582 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1183 ලෙසද සහ N 3157177 දරණ විදේශ ගමන් බලපත්‍රය පැ.1184 ලෙසත්, අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තුන් ගේ ජාතික හැඳුනුම්පත පැ.1185ලෙසත්, ඔහුට අයත්,

අංක N 7851276 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1186 ලෙසත්, මොහොම්මදු හාසීම් ජහ්රාන් (සහරාන්) ගේ ජාතික හැඳුනුම්පත පැ.1187ලෙස ද, ඔහුට අයත්, විදේශ ගමන් බලපත්‍ර අංක N 2017422 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1188 ලෙසටද, මොහොමඩ් ඊබ්‍රාහීම් ඉල්හාම් මොහොමඩ්ගේ ජාතික හැඳුනුම්පතට අදාළ සුචි පත්‍රය පැ.1189 ලෙසද, ඔහුට අයත් විදේශ ගමන් බලපත්‍ර අංක N 1512199 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1190 ලෙස සහ N 7063977 අංක දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1191 ලෙසද, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්ගේ විදේශ ගමන් බලපත්‍ර අංක N 6725891 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1192 ලෙසටත් මොහොමඩ් ඊබ්‍රාහීම් ඉන්ෂාෆ් අහමඩ්: ජාතික හැඳුනුම්පත පැ.1193, ඔහුට අයත් විදේශ ගමන් බලපත්‍ර අංක N 2338485 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1194, අංක N 3560923 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1195 සහ අංක N 6901667 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1196 වශයෙන් ද, මොහොම්මදු නසාර් මොහොම්මදු අශාද්: ජාතික හැඳුනුම්පත් සුචි පත්‍රය පැ.1197ලෙසද, ඔහුට අයත් විදේශ ගමන් බලපත්‍ර අංක N 5908136 දරන විදේශ ගමන් බලපත්‍රය පැ.1198ලෙසද පිළිගනීම් ඇසුරෙන් සළකුණු කරන ලදී.

සියලුම චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් විසින් මෙම ලේඛන සහ පිළිගැනීම් අවිවාදත්මකව පිළිගන්නා ලද බැවින් එම

පිළිගැනීම්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගත් කරුණු ලෙස සටහන් ලදී.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 1942 ඊබ්‍රාහිම් නිලාබ්දීන්</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1942, පොලිස් සැරයන් 53261 ඊබ්‍රහීම් නිලාබ්දීන් සාක්ෂි දෙමින් තමා වර්ෂ 2020 දී ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ සේවය කළ බවත් 2019.04.21 වන දින ශ්‍රී ලංකාව තුළ සිදු වූ බෝම්බ ප්‍රහාරයට අදාළව 2020.08.27 වන දින එවකට තමාගේ ඒකකයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක පතිරණ මහතාගේ නියෝග මත පොලිස් පරීක්ෂක රත්නායක සහ පොලිස් කොස්තාපල් 8389 ප්‍රදීපන් යන නිලධාරියා සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් එහි රඳවා සිටි මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා සහ ගෆූර් මාමා වශයෙන් හඳුන්වනු ලැබූ පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කළ බවත්, තමා සමඟ ගිය පොලිස් පරීක්ෂක රත්නායක මහතා රෝහලකට අදාළ කොළ කිහිපයක් ඔහු භාරයේ රැගෙන ගිය අතර තමා විසින් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ ප්‍රකාශය සටහන් කර ගත් අතර පොලිස් කොස්තාපල් 8389 ප්‍රදීපන් විසින් ගෆූර් මාමා යනුවෙන් හඳුන්වන ලද පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කළ බවත්, පොලිස් පරීක්ෂක රත්නායක මහතා ද එම ස්ථානයේ සිටි බවත් කියා සිටින ලදී. එසේම රත්නායක මහතා විසින් ලබාදුන් රෝහල් කොළ

කිහිපයකට මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අය ලවා ‘‘පොලිස් විමර්ශනයක් අවශ්‍ය නැහැ.’’ යන කොටස දෙමළ භාෂාවෙන් ලියාගත් බවත්, එසේ ලියා එහි අත්සන් කරන ලෙසටත් තමාට පොලිස් පරීක්ෂක රත්නායක මහතා විසින් ලබාදුන් කොළ 5හිම ලියා අත්සන ලබාගත් බවත්, තමා විසින් කරන ලද එම රාජකාරිය සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගෙන ඔහුට එය පහදා දී ඔහුගේ අත්සන ලබාගත් බවත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව එකී සාක්ෂිකරුට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 36363/8/20 යන නඩුවෙහි පිටු අංක 74, 75, 76, 77 සහ 78 යන පිටුවල ඇති ලේඛන සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඒවා එදින එනම්, 2020.08.21 වන දින තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදි ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන අයගෙන් ලබාගත් සටහන් සහිත කොළ බවට හඳුනාගන්නා ලද අතර ඒවා පිළිවෙළින් පැ.1552, පැ.1553, පැ.1554, පැ.1555 සහ පැ.1556 වශයෙන් සලකුණු කරන ලදී. එම ලේඛන සියල්ල නැවත සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඔහු විසින් ඒ එක් එක් කොළයෙහි දෙමළ අක්ෂරවලින් ලියා ඇති කොටසත්, සාදික් (Sadeek) ලෙස ඉංග්‍රීසියෙන් ලියා ඇති කොටසත්, අත්සනත් හඳුනාගන්නා ලද අතර එහි දෙමළ භාෂාවෙන් ලියා ඇති කොටස දෙමළ භාෂාවෙන් ශබ්ද වන ආකාරය ‘‘පොලිස් විස්සාරනෙ තේවඉල්ලෙ’’ බවත්, එහි තේරුම පොලිස් විමර්ශන අවශ්‍ය නැත, යන්න

බවටත් කියා සිටි සාක්ෂිකරු, මේ සම්බන්ධයෙන් තමා දන්නේ රිල්වාන් නැමැති අයෙකු රෝහලට ඇතුළත් කළ පසු පොලිස් විමර්ශන අවශ්‍ය නොවන බවට සාදික් අබ්දුල්ලා විසින් ලියා ඇති බවට වූ විමර්ශනයේදී අනාවරණය වූ කරුණක් බවත් කියා සිටි සාක්ෂිකරු ඔහුට පෙන්වා සිටින ලද පැ. 876 දරණ ලේඛනයේ පැ. 876 (D) යන කොටසේ '' පොලිස් විස්සාරනෙ තේවඉල්ලෙ'' යනුවෙන් සඳහන්ව ඇති බවත් කියා සිටින ලදී.

තමා විසින් එම සටහන් ලබාගන්නා ලද පැ.1552 සිට පැ.1556 දක්වා වූ ලේඛන තමා ඉදිරිපිට දී සාදික් යන අය විසින් ස්ව කැමැත්තෙන්ම ලියා දුන් බව කියා සිටි සාක්ෂිකරු එම මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යනු මෙම නඩුවේ 04 වන චූදිත බවට විවෘත අධිකරණයේදී පෙන්වා හඳුනාගන්නා ලදී. තවද, වැඩිදුරටත් සාක්ෂි දුන් ඔහු තමා සමඟ ගිය ප්‍රදීපන් යන නිලධාරියා ගෆූර් මාමා යන අයගෙන් ප්‍රකාශයක් ගත් බවත්, ගෆූර් මාමා යන අය මෙම අධිකරණයේ 02 වන විත්තිකරු බවටත් විවෘත අධිකරණයේදී හඳුනාගන්නා ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 01, 02, 07, 08, 10, 15, 18 සහ 19 යන චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර එහිදී තමා විසින් මෙම සාක්ෂි දෙන ලද රාජකාරිය සිදු කළ දිනය වන්නේ 2020.08.27 බවත්, පැ.876 දරණ ලේඛනයේ

තුවාලකරුව රෝහලට ඇතුළත් කිරීමේදි භාරකරු ලෙස සඳහන් කර තියෙන පුද්ගලයාගේ නම M.I. සාදික් වශයෙන් සඳහන්ව ඇති බවත් කියා සිටින ලදී.

04 වන චූදිත විසින් එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු කරන ලද අතර සාදික් අබ්දුල්ලා යන අයගෙන් 2020.08.27 වන දින කරන ලද රාජකාරියේදී පොලිස් පරීක්ෂක රත්නායක මහතාද පැමිණි බවත්, පොලිස් පරීක්ෂක රත්නායක පැමිණෙන විට යම් ලේඛන වගයකුත් රැගෙන පැමිණි සිටි අතර එම ලේඛන මේ වන විට පැ.1552 සිට පැ.1556 දක්වා සලකුණු කර ඇති බවත් කියා සිටින ලදී. එසේම පැ.876 ලේඛනයේ ‘‘පොලිස් විමර්ශන අවශ්‍ය නැත.’’ යනුවෙන් ලියා තිබූ අතර එම ලේඛනය එම අවස්ථාවේදි පොලිස් පරීක්ෂක රත්නායක මහතාගේ ළඟ තිබුනේද? නැද්ද? යන්න තමාට මතක නොමැති අතර පැ.876හි පහළ කොටස ඉරා ඉවත් කර සෙලෝටේප් යොදා තිබෙන්නේ යයි යන යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

සාක්ෂිකරු භාරයේ තිබූ 4(D)(1) වශයෙන් සලකුණු කරන ලද පැ.876 ලේඛනයේ ඡායාපිටපත පෙන්වා සිටින ලද අතර එහි පොලිස් මුරපොළේ ඇති මුද්‍රාව ඇති බවත්, යම් අපැහැදිලි සටහනක් එහි ඇති බවත්, ‘‘පොලිස් විමර්ශන අවශ්‍ය නැත.’’ ලෙස දෙමළ භාෂාවෙන් ලියා ඇති කොටස පහළින් යම් අපහැදිලි සටහනක් ඇති අතර එම ස්ථානයෙහි ජාතික

හැඳුනුම්පත් අංකයක් ඇති අතර එම ඉලක්කම් අතරින් 88-V යන කොටස පමණක් තමාට පැහැදිලි වන අතර සෙසු ඉලක්කම් අපැහැදිලි බවත් කියා සිටින ලදී.

විශ්ලේෂණය

ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ සේවය කළ කාලයේදී, 2020.08.27 දින පොලිස් පරීක්ෂක රත්නායක සහ පොලිස් කොස්තාපල් ප්‍රදීපන් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ගොස් ඇත.

එහිදී රඳවා සිටි "මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා" ගෙන් ප්‍රකාශයක් ලබාගෙන, රිල්වාන් නැමැති අය ඇතුළත් කර තිබූ කොළඹ ජාතික රෝහලේ ඇතුළත් වීමේ පත්‍රිකා 05 ක (පැ.1552 සිට පැ.1556 දක්වා) "පොලිස් විමර්ශන අවශ්‍ය නැත" (පොලිස් විසාරනෙ තේවඉල්ලෙ) යනුවෙන් දෙමළ භාෂාවෙන් ඔහුගේ ස්වකැමැත්තෙන්ම ලියා අත්සන් ලබාගෙන ඇත.

04 වන චූදිතයා විසින් සිදුකරන ලද හරස් ප්‍රශ්න විමසීමෙන් පසු මොහුගේ සාක්ෂිය අවසන් විය.

අපරාධ ස්ථානයන්හි තිබී සොයාගෙන ඇති ඇඟිලි සටහන් සම්බන්ධ සාක්ෂි සම්පිණ්ඩනය කර ඇගැයීමට ලක් කිරීම

මෙම නඩුවට අදාළ සංකීර්ණ විමර්ශන ක්‍රියාවලියේ දී ස්වයංඝාතක බෝම්බ කරුවන් සහ ඔවුන්ට සහය ලබා දී ඇති පුද්ගලයින් විසින් භාවිතා

කර ඇති ආරාක්ෂිත නිවාස පරිශ්‍රයන් සියල්ල විමර්ශන නිළධාරීන් විසින් පුළුල් ලෙස විමර්ශණයට ලක් කර සැකකටයුතු ඇඟිලි සටහන් රාශියක් සොයාගෙන ඇත. ඒ සම්බන්ධයෙන් මෙම අධිකරණය ඉදිරියේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි සියල්ල අප විසින් පහත පරිදි විශ්ලේශනාත්මකව සළකා බලනු ලබේ.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 1827 වලිමුණි දේවයලාගේ</u>

<u>ඩිලූකා දිල්රුක්ෂි වික්‍රමසිංහ.</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1827 කාන්තා පොලිස් කොස්තාපල් 9705 වලිමුණි දේවයලාගේ ඩිලූකා දිල්රුක්ෂි වික්‍රමසිංහ සාක්ෂි දෙමින් පැ.1564 වශයෙන් ඉදිරිපත් කර ඇති අත්ල සටහන රුදෙයිනා යන දරුවාගේ බවත්, එම ලේඛනය 2019.05.13 වන දින තමා විසින් ලබා ගන්නා ලද රුදෙයිනා නැමැති දැරියගේ අතුල් සහ පතුල් සටහන් ඇතුලත් ලේඛනය වන අතර එහි තමාගේ නම, නිල අංකය සහ අත්සන ඇති බවත් කියා සිටින ලද අතර, එම සලකුණු ලබාගන්නා අවස්ථාව වන විට එම දැරිය වයස අවු. 04ක දැරියක් බවත්, ඇයගේ මව වන හාදියා නැමැති තැනැත්තියද එම ස්ථානයේ සිටි අතර එම ඇඟිලි සලකුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන අංශ 1හිදී ලබාගත් බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදී. ඒ අවස්ථාව වන විට ඔවුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටි

අතර, එම ලේඛනයට අනුව එම දැරියගේ පියා ජහරාන් මොහොමඩ් කාසිම් ලෙසට සටහන් වන අතර එය රුදෙයිනා යන දැරියගේ මව වන හාදියා යන අයගෙන් අසා දැනගෙන සටහන් කළ බවත් කියා සිටින ලදී. ඉන් අනතුරුව එම සාක්ෂිකාරියට පෙන්වා සිටින ලද පැ.1564 දරණ ලේඛනය එහි සලකුණු කිරීමේ යතුරු ලියන දෝශය නිවැරදි කරමින් ඇඟිලි සටහන් පත් පෝරමය පැ.1563(1) වශයෙන් ද, අතුල් සටහන්පත් පෝරමය පැ.1563(2)වශයෙන්ද නිවැරදිව කරන ලදී.

<u>විශ්ලේෂණය</u>

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන අංශ 01 හි සේවය කරන කාලයේදී, පාස්කු ප්‍රහාරයේ විමර්ශන කටයුතු යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා සිටි සහරාන්ගේ බිරිඳ වන හාදියා සහ ඇගේ සිව් හැවිරිදි දියණිය වන මොහොමඩ් සහරාන් රුදෙයිනා යන අයගේ ඇඟිලි සලකුණු ලබාගැනීමට සම්බන්ධ වී ඇත.

2019.05.13 දින ඇය විසින් රුදෙයිනාගේ ඇඟිලි සලකුණු, අතුල් සහ පතුල් සලකුණු ලබාගෙන පොලිස් පෝරම 13ආ (පැ.1563(1)) සහ පොලිස් පෝරම 112 (පැ.1563(2)) ලේඛනවල සටහන් කර ඇත.

රුදෙයිනාගේ පියාගේ නම "ජහරාන් මොහොමඩ් කාසිම්" ලෙස සටහන් කර ඇත්තේ ඇගේ මව වන හාදියාගෙන් විමසීමෙන් පසුවය. චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න කිසිවක් විමසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1830 හේරත් පතිරන්නැහලාගේ දිනේෂ් චතුරංග ජයසිංහ

පැමිණිල්ලේ සාක්ෂි අංක 1830 පොලිස් කොස්තාපල් 83852 දිනේෂ් චතුරංග ජයසිංහ සාක්ෂි දෙමින් තමා 2019.04.29 වෙනි දින මෙම නඩුවට අදාළව සැකකරුවන් දෙදෙනෙකුගේ ඇඟිලි සටහන් ලබා ගත් බවත්, ඒ අනුව පැ.1566 ලෙස සලකුණු කරන ලද ඇඟිලි සටහන් පතට අදාළව මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ ඇඟිලි සලකුණද, පැ.1559 ලෙස සලකුණු කරන ලද ඇඟිලි සටහන් පතට අනුව මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ ඇඟිලි සලකුණු ලබා ගත් බව කියා සිටින ලදි. පැ.1566 දරන මොහොමඩ් රමීෂ් සාජිත් යන අය ඒ වනවිට වයස අවුරුදු 27 පුද්ගලයෙකු බවත්, ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 922901414V බවත්, ඔහුගේ පියාගේ නම ඇතුළු විස්තර එම පැ.1566 ලේඛනයෙහි පිටුපස තමා විසින් සටහන් කොට තමාගේ විස්තරද ඇතුළත් කළ බවත් කියා සිටින ලදි. එම රාජකාරිය සම්බන්ධයෙන් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන සැකකරුව දැනුවත් කළ බවත් ඔහු විසින්

කිසිදු විරෝධතාවයකින් තොරව එම ඇඟිලි සලකුණු ලබා දුන් බව කියා සිටින ලදි.

ඒ ආකාරයෙන්ම සැකකාර මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේද ඇඟිලි සලකුණු පැ.1559 ලේඛනයට ලබා ගත් අතර, ඒ වනවිට ඔහු වයස අවුරුදු 37 ක් බවත්, ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 812264028V බවත්, එම පිටුපස එකී විස්තරද එකී ලේඛනයට ඇතුළත් කළ බවත් සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

මෙම සාක්ෂිකරුගෙන් 09 වන චිත්තිකරු විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර එහිදී පැ.1566 දරන ලේඛනයෙහි පිටුපස සිදු කරන ලද වරද සහ වරද සිදු කළ අන්දම හා ක්‍රමය යන කොටස හිස්ව ඇති බවත්, පුද්ගලයෙක් යම්කිසි වරදක් කර ඇත්නම් පමණක් එහි සටහන් කරන බවත් පිළිතුරු දෙමින් කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

2019 වර්ෂයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලයේදී, 2019.04.29 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළදී මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් සහ මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් (වයස 27, හැඳුනුම්පත් අංකය: 922901414V) යන සැකකරුවන්ගේ ඇඟිලි සලකුණු (පැ.1559 සහ පැ.1566) ලබාගෙන ඇත.

සැකකරුවන්ට පැහැදිලි කර දී ඔවුන්ගේ කැමැත්ත මත කිසිදු විරෝධතාවයකින් තොරව මෙම ඇඟිලි සලකුණු ලබාගෙන ඇත.

09 වන චූදිතයා විසින් සිදුකළ හරස් ප්‍රශ්න විමසීමෙන් පසු මොහුගේ සාක්ෂිය අවසන් විය.

ඇඟිලි සලකුණු සමඟ ගැළපීම සම්බන්ධයෙන් පැ.සා2307 සාක්ෂි සමඟ විශ්ලේෂණය බලන්න.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1829 මොලගොඩ හේරත් මුදියන්සේලාගේ වත්තේමැද ගෙදර උදය අරුණ බණ්ඩාර

පැමිණිල්ලේ සාක්ෂි අංක 1829 පොලිස් සැරයන් 60287 මොලගොඩ හේරත් මුදියන්සේලාගේ වත්තේමැද ගෙදර උදය අරුණ බණ්ඩාර සාක්ෂි දෙමින්, 2019.04.21 වන දින සිදු වූ පාස්කු ප්‍රහාරයට අදාළ විමර්ශනයේදී තමා විසින් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන සැකකරුගේ ඇඟිලි සටහන් ලබා ගත් බව කියා සිටිමින් එම ඇඟිලි සටහන් ඇතුළත් පැ.1558 දරන ලේඛනය හඳුනා ගන්නා ලදි. තමා විසින් ඇඟිලි සලකුණු ලබා ගත් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 751540841V බවත්, ඔහුගේ පියාගේ නම හමීද් මොහොමඩ් අන්වර් ලෙසත්, ඒ වනවිට ඔහු වයස අවුරුදු 44 ක් ලෙසත් සඳහන් එම ලේඛනයේ පිටුපස ඇති විස්තරද, තමාගේ නිල අංකය ඇතුලු

විස්තරද ඇතුළත් කරන ලද බව සාක්ෂිකරු කියා සිටින ලද අතර තමා විසින් එම රාජකාරිය නිසියාකාරයෙන් සිදු කළ බවත්, ඇඟිලි සලකුණු ලබා ගැනීම පිළිබඳව සැකකරුව දැනුවත් කළ අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ විරෝධතාවයක් නොතිබූ බවත් කියා සිටින ලදි.

<u>විශ්ලේෂණය</u>

2019 පාස්කු ප්‍රහාරයේ විමර්ශන යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා සිටි, මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් නැමැති සැකකරුගේ (හැඳුනුම්පත් අංක: 751540841V) ඇඟිලි සලකුණු ලබාගැනීම මොහු විසින් සිදුකර ඇත.

2019.04.30 දින සැකකරුගේ කැමැත්ත ඇතිව, කිසිදු විරෝධතාවයකින් තොරව, අත් දෙකෙහිම සියලුම ඇඟිලිවල සලකුණු ලබාගෙන ඇඟිලි සටහන්පත (පැ.1558) සම්පූර්ණ කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු නොකෙරිණි.

ඇඟිලි සලකුණු සමඟ ගැළපීම සම්බන්ධයෙන් පැ.සා2307 සාක්ෂි සමග විශ්ලේෂණය බලන්න.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1616 උදටියාවනගේ උපාලි ජයතිලක

පැමිණිල්ලේ සාක්ෂි අංක 1616 පොලිස් සැරයන් 3612 උදටියාවනගේ උපාලි ජයතිලක සාක්ෂි දෙමින් තමා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඡායාරූප ශිල්පියෙකු වශයෙන් වසර 26 කට ආසන්න කාලයක් සේවය කරන බවත්, යම් අපරාධ ස්ථානයක් පරීක්ෂා කිරීමේදී ඇඟිලි සටහන් නිලධාරියා සමඟ ගොස් ඇඟිලි සටහන් නිලධාරියා විසින් සොයා ගනු ලබන සටහන් තමා විසින් ඡායාරූප ගත කිරීම තමාගේ රාජකාරිය වන බවත්, ඒ සඳහා ඇඟිලි සටහන් ඡායාරූප ගත කිරීම සඳහාම විශේෂයෙන් නිෂ්පාදනය වූ HORSEMEN වර්ගයේ කාර්මික කැමරාවක් භාවිතා කරන බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

2019.04.22 වන දින මෙම නඩුවට අදාළව පානදුර උතුර පොලිස් වසමේ අංක 61/2, ෂෙරිෆ් මාවත, නෂ්මියා විලා, පරත්ත පාර, කෙසෙල්වත්ත, පානදුර යන ලිපිනයට ඇඟිලි සටහන් නිලධාරී උප පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න මහතා සමඟ තමා ගමන් කළ බවත්, එම ස්ථානයට ඒ වන විටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පානදුර අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නිලධාරීන් ද පැමිණ සිටි බවත් කියා සිටින ලද අතර උප පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න මහතා විසින් පරීක්ෂා

කර බැලීමෙන් පසුව සටහන් 20 ක් සොයාගෙන ඡායාරූප ගත කිරීම සඳහා තමා වෙත දැනුම් දුන් බවත් කියා සිටින ලදි.

එසේ ඇඟිලි සටහන් නිලධාරියා විසින් එම ඇඟිලි සලකුණු සොයා ගත් විට ඔහුගේ කෙටි අත්සන සහ දිනය යෙදූ ලේබලයක් එම අදාළ සටහන් අසල යොදන බවත්, මෙම අවස්ථාවේදී සොයාගනු ලැබූ සටහන් 20 ටම අදාළව එම ලේබලය තිබූ බවත් කියා සිටින ලද සාක්ෂිකරු, ඒ අනුව පහත සඳහන් ස්ථානවලදී අදාළ සටහන් 20 තමා ඡායාරූප ගත කළ බව කියා සිටින ලදී. එනම්, අංක 01 දරන සටහන මෙම නිවසේ ඉදිරිපිට දොර අසලම ඇති ජනෙල් පියනක වීදුරුවේද, අංක 02 දරන සටහන මෙම නිවසේ සාලයේ ජනෙල් පියනක වීදුරුවේ, අංක 03 දරන සටහන කළු පැහැති ලී පුටුවක එක් ඇන්දකද අංක 03 දරන සටහනද, විනිවිද පෙනෙන කුඩා ප්‍රමාණයේ ටේප් රෝලක අංක 04 දරන සටහනද, කුඩා ප්‍රමාණයේ කළු පැහැති කාඩ්බෝඩ් පෙට්ටියක පිට පැත්තේ අංක 05 දරන සටහනද, LED බල්බ් එකක පිට පැත්තේ අංක 06 සහ 07 දරන සටහන්ද, නිවසේ සාලයේ ඇති ජනෙල් පියනක ඇතුළ් පැත්තේ වීදුරුවේ අංක 08 දරන සටහනද, රවුම් හැඩැති නිකල් බදුනක පිට පැත්තේ අංක 09 දරන සටහනද, ආයේ ජනෙල් පියන් පේළියක එක් ජනෙල් පියනක අංක 10, 11 දරන සටහන්ද, කුඩා ප්‍රමාණයේ පොලිතීන් පැකට් ඒ කියන්නේ ඉටි උරයක පිට පැත්තේ අංක 12 දරන සටහනද, කුඩා ප්‍රමාණයේ වීදුරු ජෝගුවක පිට පැත්තේ අංක 13 දරන සටහනද, ලී ප්‍රදර්ශන කබඩ් එකක ඉහළ කොටසේ එහා මෙහා කළ හැකි

වීදුරුවක පිට පැත්තේ අංක 14 දරන සටහනද, පියන් තුනකින් යුත් ජනෙල් පේළියක ජනෙල් සිරස් අතැති ලී උළුවහු කදේ ඇතුළ් පැත්තේ අංක 15 දරන සටහනද, ලී දොරක පිට පැත්තේ තල්ලුවට ඉහළින් අංක 16, 17 දරන සටහන්ද, සුදු පැහැති කුඩා ප්‍රමාණයේ පෝසලින් පිරිසි අඩු කෝප්පයක පිට පැත්තේ අංක 18, 19 දරන සටහන්ද, නාන කාමරයක කොමඩ් එකේ වතුර රඳවනයේ ඉහළ කොටසේ පිට පැත්තේ අංක 20 දරන සටහනද යන සටහන් ද බව ඔහු කියා සිටින ලදී.

ඉන් අනතුරුව තමා විසින් එම ඡායාරූප ගත කරන ලද සටහන් මුද්‍රණය කර ඡායාරූපාගාර වාර්තාව සකස් කර එක් එක් ඡායාරූපයකින් පිටපත් 04 බැගින් සකස් කරන බවත්, මෙම අවස්ථාවේදී එක් සටහනක ස්ථාන දෙකක් සම්පූර්ණ වී තිබූ බැවින් පිටපත් 76 ක් ලෙසට සකසා උප පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න මහතා වෙත ලබා දීමෙන් අනතුරුව ඔහු විසින්ද ඒවා නිවැරදි බවට පරීක්ෂා කර බලා ඔහුගේ වාර්තාවේ අත්සන් තැබූ බවත් කියා සිටිමින් 2019.04.23 වෙනි දිනැති ඡායාරූපාගාර වාර්තාව පැ.1570 වශයෙන් සලකුණු කරන ලදි.

ඉන් අනතුරුව සාක්ෂිකරුට පැ.1561 දරන ප්‍රදර්ශන පත පෙන්වා සිටින ලද අතර එහි සඳහන් පැ.1561(A) දරන ඡායාරූප ඉහත අංක 01 දරන සටහන බවටත්, එහි විශාලනය කරන ලද ඡායාරූපය පැ.1561 (A)(1) ලෙසටත්, එම සටහන තිබූ ජනේලයේ පින්තූරය පැ.1561(F) වශයෙනුත් හඳුනා ගන්නා ලදි. තමා විසින් අංක 04 වශයෙන් ඡායාරූප ගත කරන ලද

සටහන පැ.1561(D) වශයෙන් හඳුනා ගන්නා ලද සාක්ෂිකරු එහි විශාලනය කරන ලද ඡායාරූපය පැ.1561(D)(1) ලෙස සලකුණු කර ඇති බව පිළිගන්නා ලදි. එම සටහන තිබූ ටේප් රෝලෙහි ඡායාරූපය පැ.1561 (H) වශයෙන්ද හඳුනා ගන්නා ලද සාක්ෂිකරු අංක 06 සහ අංක 07 දරන LED බල්බ් එක ඇති සමීප ඡායාරූපය පැ.1561(B) සහ පැ.1561(C) වශයෙන්ද හඳුනා ගන්නා ලද අතර එහි විශාලනය කරන ලද ඡායාරූප ඇතුළත් පැ.1561 (B) (1) සහ පැ.1561(C)(1) දරන ලේඛන හඳුනා ගන්නා ලදි.

එසේම එම බල්බය සම්පූර්ණයෙන් පෙනෙනසේ ලබා ගන්නා ලද ඡායාරූපය වූ පැ.1561 (G) ද සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදි.

වැඩිදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු නිවසේ සාලයේ ජනෙල් පියන් පේළියක එක් පියනක ඇතුල් පැත්තේ වීදුරුවේ තිබූ අංක 08 දරන සටහනට අදාළව ඡායාරූපය පැ.1561(E) වශයෙන්ද, එහි විශාලනය කරන ලද ඡායාරූපය පැ.1561 (E)(1) වශයෙන්ද, අදාළ ජනෙල් පියනේ ඡායාරූපය පැ.1561(I) වශයෙන්ද සලකුණු කර ඇති බව එකී ලේඛන පරීක්ෂා කර බලා හඳුනා ගනිමින් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරුගෙන් 01, 02, 07, 08, 10, 15, 18, 19 චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර එහිදී සාක්ෂිකරු විසින් පෙන්වා දෙන ලද සෙලෝටේප් රෝල

අදාළ නිවසේ සාලයේ බිම තිබී සොයා ගත් බවත්, එය පාවිච්චි කර තිබුණේද, පාවිච්චි නොකළ අලුත්ම සෙලෝටේප් එකක්ද යන්න තමාට නිශ්චිතවම මතකයක් නොමැති නමුත් එය අඟල් තුනක පමණ පළලින් යුතු විනිවිද පෙනෙන සෙලෝටේප් එකක් බවට සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

විශ්ලේෂණය

ඇඟිලි සටහන් කාර්යාලයේ ඡායාරූප ශිල්පියෙකු ලෙස සේවය කරන පොලිස් සැරයන්වරයෙකි (3612) 2019.04.22 දින පානදුර පරත්ත පාරේ පිහිටි "නෂ්මියා විලා" නැමැති අපරාධ ස්ථානය පරීක්ෂා කිරීමට උප පොලිස් පරීක්ෂක සෙනෙවිරත්න සමඟ ගොස් ඇත.

සෙනෙවිරත්න මහතා විසින් සොයාගන්නා ලද ඇඟිලි සලකුණු 20ක් (ජනෙල් වීදුරු, පුටු ඇඳි, සෙලෝටේප් රෝල්, කාඩ්බෝඩ් පෙට්ටි, LED බල්බ ආදී ස්ථානවල තිබූ) මොහු විසින් ඡායාරූපගත කර ඇත.

ඡායාරූප මුද්‍රණය කර පිටපත් 76ක් සෙනෙවිරත්න මහතා වෙත භාර දී ඡායාරූපාගාර වාර්තාව (පැ.1570) සකස් කර ඇත. හරස් ප්‍රශ්න විමසීමේදී ඔහු ප්‍රකාශ කළේ අඟල් 3ක පළලකින් යුත් සෙලෝටේප් රෝලය සාලයේ බිම තිබී සොයාගත් බවයි.

පානදුර නෂ්මියා විලා හි තිබූ ඇඟිලි සටහන් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් සහ

සහරාන්ගේ දියණිය වන සහරාන් රුදෙයිනා යන අයගේ ඇඟිලි සලකුණු සමඟ ගැළපීම සම්බන්ධයෙන් පැ.සා2307 සාක්ෂි සමග විශ්ලේෂණය බලන්න.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2307 කලුආරච්චිගේ සේනක කලුආරච්චි යන සාක්ෂිකරු සාක්ෂි දෙමින්, තමා සාක්ෂි දෙන අවස්ථාව වන විට ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් සේවය කරන බවත්, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාලයේ වසර 33ක සේවා කාලයක් සපුරා ඇති අතර ඇඟිලි සටහන් පරීක්ෂාව, විශ්ලේෂණය සහ සංසන්දනය යන කරුණු සම්බන්ධයෙන් තමාට ශ්‍රී ලංකාව තුළත්, විදේශ රාජ්‍යවලත් අඛණ්ඩ පුහුණුවක් ඇති බවත් කියා සිටිමින් ඒ සම්බන්ධයෙන් ඔහු සතුව ඇති විශේෂඥ දැනුම පුහුණුව සහ පළපුරුද්ද සම්බන්ධයෙන් දීර්ඝ සාක්ෂියක් ලබාදෙන ලදි.

ඉන් අනතුරුව ඇඟිලි සලකුණු යම් පුද්ගලයෙක්ව හඳුනාගැනීම සඳහා ඉතා නිවැරදි ක්‍රමයක් ලෙස භාවිතා කරන බවටත් එයට ප්‍රධාන හේතුව කිසිම පුද්ගලයන් දෙදෙනෙකුගේ ඇඟිලි සලකුණු එක හා සමාන නොවන බවත් කියා සිටින ලද අතර ඒවා හඳුනා ගැනීම සඳහා වැටි දෙබල, වැටි අවසානය, තිත් වැටිය, කෙටි වැටිය, හරස් වැටිය, වැටි දෙබල, වැටි කොක්ක ඇතුළු ලක්ෂණ 8කින් යුක්ත ලක්ෂණ භාවිතා කරන බවත් කියා සිටින ලදී. යම් පුද්ගලයෙකුගේ ඇඟිලි සලකුණු යම් පෘෂ්ඨයක් මත පැවතීම එම පෘෂ්ඨයේ මතුපිට ස්වභාවය සහ එම පුද්ගලයාගේ ඇඟිලි හෝ අත්ලෙහි

දාඩිය හෝ තැවරී ඇති ද්‍රව්‍යයන්හි ස්වභාවය අනුව සිදු වන අතර සාමාන්‍යයෙන් බාහිර පරිසරයට නිරාවරණය නොවන අවස්ථාවකදී මාස 6ක, 7ක පමණ කාලයක් එම සටහන් වර්ධනය කර ගැනීමට හැකියාව ඇති බවත්, එසේ වර්ධනය කර ගැනීම සඳහා ඒ සඳහා විශේෂයෙන් භාවිතා කරනු ලබන රසායනික පවුඩර් වර්ගයක් භාවිතා කරන අතර, යම් ස්ථානයක ඇඟිලි සටහන් හඳුනාගැනීමෙන් පසුව එය හඳුනාගන්නා නිලධාරියා විසින් එම සටහනට අංකයක් සහ විස්තර ඇතුළත් කරන ලද ලේබලයක් සකසා එම ලේබලය සමඟ ඇඟිලි සටහන ඡායාරූපගතකොට එම ඡායාරූප ප්‍රතිඡායාපලකවල සටහන් කර ගැනීමෙන් අනතුරුව මුද්‍රණය කරන බවටත්, එසේ මුද්‍රණය කිරීමෙන් පසුව ඇඟිලි සටහන් ලබාගන්නා ලද නිලධාරියා විසින් ඒවා සංසන්දනයකොට නිවැරදිව ඡායාරූපගත වී ඇත්නම් ඒවා මුද්‍රණය කර ස්ථානාධිපතිවරයා වෙත ලබාදෙන අතර එසේ ස්ථානාධිපතිවරයා විසින් නැවත එය පරීක්ෂා කර බලා නිවැරදිව ඇත්නම් ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයාට භාරදීම සිදු කරන බවත්, ඉන් අනතුරුව එය රෙජිස්ට්‍රාර්ගේ ලේඛනාගාරයට ගොනු කරන බවත් කියා සිටින ලදි.

අපරාධයක් සිදු වූ ස්ථානයක හෝ යම් හඳුනාගැනීමක් අවශ්‍ය වන ස්ථානයක ඇඟිලි පවත්නා ඇඟිලි සලකුණු ලබාගත් විට ඒ හා සැසඳීම සඳහා අවශ්‍ය පුද්ගල ඇඟිලි සලකුණු අදාළ පුද්ගලයාගෙන් ඒ සඳහාම විශේෂිත පොලිස් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද පෝරමයකට ඇතුළත් කරගන්නා බවත්, ඉන් අනතුරුව ඉහතින සඳහන් කළ ඇඟිලි

සලකුණුවල ඇති ලාක්ෂණික වැටි සහ සමඟ සංසන්දනය කරන අතර අවම වශයෙන් වැටි 6ක් හෝ 7ක් මත ස්ථිරවම එම හඳුනාගැනීම සිදු කළ හැකි වුවද ශ්‍රී ලංකාව අනෙකුත් රටවල් සමඟ ඇති කරගත්තා වූ පොදු සම්මුතියක් ප්‍රකාරව අවම වශයෙන් වැටි 12ක් වත් සමපාත විය යුතු බවට සම්මතයකට පැමිණ ඇති බැවින් එවැනි සෑම අවස්ථාවකදීම එසේ අපරාධ ස්ථානයෙන් ලබාගන්නා ලද හෝ නිශ්චිත ස්ථානයෙන් ලබාගන්නා ලද ඇඟිලි සලකුණු සමඟ අදාළ පුද්ගලයාගේ ඇඟිලි සලකුණු සංසන්දනාත්මකව නිරීක්ෂණයකොට ඒවායේ සමානාත්මතාවය අනුව එම පුද්ගලයාගේ ඇඟිලි සලකුණුද යන නිගමනය සහිත වාර්තාව සකස්කොට ඉදිරිපත් කරන බව කියා සිටින ලදි.

ඇඟිලි සලකුණු සංසන්දනය කිරීම ප්‍රථමව නිලධාරියෙකු මඟින් සිදු කරන බවත්, ඉන් අනතුරුව එය දෙවන සැසඳීම් අංශයට යොමු කරන බවත්, දෙවන සැසඳීම ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් නැවත පුද්ගලිකවම සංසන්දනය කරන අතර එය නිවැරදි නම් එය දෙවන සැසඳුම් අංශයේ ස්ථානාධිපතිවරායට ඉදිරිපත් කරන අතර එසේ දෙවන සැසඳුම් අංශයේ ස්ථානාධිපතිවරයා තුන්වන වරටත් නැවත සැසඳීමක් සිදු කර අතිරේක ඇඟිලි සටහන් රෙජිස්ටාර්වරයා වෙත හෝ ඇඟිලි සටහන් රෙජිස්ටාර්වරයා වෙත ලබාදෙන බවත් ඇඟිලි සටහන් රෙජිස්ටාර් විසින්ද එය පුද්ගලිකවම සැසඳෙන්නේද යන්න සංසන්දනය කර අදාළ වාර්තාව සකස් කරන බවත් කියා සිටින ලදි.

එසේම ඇඟිලි සලකුණු සංසන්දනයේදී පරිගණකය ආශ්‍රයෙන් මෙන්ම පියවි ඇසින් භෞතිකව බැලීම යන දෙයාකාරයෙන්ම එය සිදුකරන බවත් සැසඳීම සම්බන්ධයෙන් අවසාන නිගමනය ඉදිරිපත් කරනු ලබන්නේ එකී සැසඳීම සිදු කරන සියලුදෙනාම 100%ක් සෑහීමකට පත් වීමෙන් අනතුරුව බවටත් වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙවැනි සැසඳීමකින් අනතුරුව එම වාර්තාව අධිකරණයට ඉදිරිපත් කිරීමේදී ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයාගේ අවසාන වාර්තාවට අමතරව එහි අන්තර්ගතය පැහැදිලි කිරීම සඳහා එම වාර්තාව සමඟ සැසඳෙන සටහන් සහ සටහන සොයාගත් භාණ්ඩය සැකකරුගේ ඇඟිලි, අතුල්, පතුල් සටහන් ඇතුළත් සහ සංසන්දනය කරන ලද වැටි ලක්ෂණ 12 සලකුණු කරන ලද සියලු කරුණු ඇතුළත් ප්‍රදර්ශන පත්‍රයක්ද අධිකරණයට ඉදිරිපත් කරන බවත් කියා සිටින ලදී.

මෙම නඩුව සම්බන්ධයෙන් ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්ථාන 4ක් පරීක්ෂා කළ බව සාක්ෂිකරු සිය සාක්ෂියේදී කියා සිටින ලදී. එම ස්ථාන නම් පානදුර උතුර පොලිස් වසමේ ‘‘නෂ්මියාවිලා’’ යන නිවස, ‘‘ලකී ප්ලාසා’’ යන නිවස, වත්තල පොලිස් වසමේ නිවසක් සහ දලුවාකොටුව කොච්චිකඩේ නිවසක් පරීක්ෂා කළ බවත් කියා සිටින ලදී.

ඉන් නස්මියාවිලා නැමැති ස්ථානය පානදුර උතුර, කෙසෙල්වත්ත, ෂෙරිෆ් මාවතේ අංක 61/2 දරණ ස්ථානයේ පිහිටා තිබූ බවත් 2019.04.22

පාස්කු ප්‍රහාරයට පසු දින එනම්, 2019.04.22 වැනි දින එම ස්ථානය පරීක්ෂා කර බැලූ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දෙන ලද දුරකතන පණිවිඩයක් අනුව උප පොලිස් පරීක්ෂක සෙනවිරත්න යන ඇඟිලි සටහන් නිලධාරියාත්, පො.සැ. 3612 ජයතිලක යන ඡායාරූප ශිල්පියාත් එම ස්ථානයට යොමු කර ඇති බවත් ඔවුන් විසින් ගොස් පරීක්ෂා කර බලා ඇඟිලි සටහන් 20ක් සොයා ගැනීම සිදු කර තිබූ බවත් එම ඇඟිලි සටහන් 20 අතරින් කිහිපයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එවා තිබූ ඇඟිලි සලකුණු පත් අතරින් සැකකරුවන් තිදෙනෙකුගේ ඇඟිලි සටහන් 5ක් සමඟ සැසඳීමක් සංසන්දනය වී සැසඳී තිබූ බව කියා සිටින ලද සාක්ෂිකරු පානදුර අංක 61/2 නස්මියාවිලා නැමැති ස්ථානයේ ඇඟිලි සලකුණු සටහන් සම්බන්ධයෙන් පිළියෙල කරන ලද ඇ.ස.වා. 2149/2019 සහ 2026.07.20 දින දරණ වාර්තාව පැ. 1557 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඉන් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් සහ මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් යන නම් සඳහන් සැකකරුවන් දෙදෙනාගේ ඇඟිලි සටහන් සමඟ පානදුර නස්මියාවිලාහි සොයා ගන්නා ලද ඇඟිලි සටහන් සැසඳීමක් වූ බවත්, එසේම 2019.05.19 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය විමර්ශන අංශ 1හි ස්ථානාධිපති විසින් එවන ලද මොහොමඩ් සහරාන් රුදෙයිනා නැමැති අයගේ ඇඟිලි/අතුල් සටහන්ද සමඟ එම නෂ්මියා විලාහි තිබූ සටහන් සමඟ

සංසන්දනය වීමක් සිදු වූ බවත් කියා සිටින ලද සාක්ෂිකරු මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් සහ මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ ඇඟිලි සටහන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් 60287 අරුණ බණ්ඩාර විසින් 201904.30 ලබා ගෙන ඇඟිලි සලකුණු රෙජිස්ටාර් කාර්යාලය වෙත එවා තිබූ බවත් කියා සිටිමින් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ ඇඟිලි සටහන් පථ පැ. 1558 වශයෙන් සලකුණු කරන ලදි.

එසේම මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන්ගේ ඇඟිලි සටහන් පත්‍රය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් 83852 චතුරංග විසින් 2019.04.29 වැනි දින ලබාගෙන ඇඟිලි සලකුණු රෙජිස්ටාර් කාර්යාලයට එවා තබා ඇති බව කියා සිටිමින් මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ ඇඟිලි සටහන් පථ පැ. 1559 වශයෙන් සලකුණු කරන ලදි.

තවද, මොහොමඩ් සහරාන් රුදෙයිනා යන අයගේ ඇඟිලි සටහන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාන්තා පොලිස් කොස්තාපල් 10849 රාජරත්න නිලධාරිනිය විසින් 2019.05.16 දින ලබාගෙන ඉදිරිපත් කර ඇති බව කියා සිටිමින් එම අතුල් සටහනෙහි මුල් පිටපත පැ. 1560 වශයෙන් සලකුණු කරන ලදි.

ඉන් අනතුරුව සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද පැ. 1557 දරණ ඇඟිලි සටහන් වාර්තාවට අනුරූපි ප්‍රදර්ශන පත්‍රය පැ. 1561 වශයෙන් සලකුණු කර අධිකරණයට ඉදිරිපත් කරන ලද අතර එහිදී මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ ඇඟිලි සටහන් සමඟ අදාළ ස්ථානයෙන් එනම්, නස්මියාවිලාහි ලබාගන්නා ලද ඇඟිලි සටහන් අතුරින් ආ(1) සහ ආ(2) වශයෙන් සලකුණු කරන ලද බව කියා සිටිමින් එයට අදාළ ආ(1) දරණ පිටුව පැ. 1561(A) වශයෙන් ද ආ(2) දරණ පිටුව පැ. 1561(B) වශයෙන් ද සලකුණු කරන ලදි.

අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද අංක 7 සටහන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්ගේ වම් මහපටැඟිලි සමඟ සැසඳුනු බව කියා සිටිමින් එයට තමා ආ(3) වශයෙන් අංකයක් ලබා දී ඇති බවත් කියා සිටිමින් එම සටහන ඇතුළත් පිටුව පැ. 1561 (C) වශයෙන් සලකුණු කරන ලදි.

මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ වම් දබරැඟිල්ලේ සටහන විශාලනය කර සංසන්දනාත්මකව පරීක්ෂා කර බැලීමේ පිටුව පැ. 1561(A)(1) වශයෙන් ද, ආ(2) දරණ ස්ථානයේ තිබී සොයා ගන්නා ලද වම් දබරැඟිල්ලේ සටහන් සමඟ සංසන්දනය කර විශාලනය කරනලද ඡායාරූපය සඳහන් ආ (24) දරණ පිටුව පැ. 1561 (B)(1) වශයෙන් ද, මොහොමඩ් අන්වර් රිස්කාන් යන අයගේ වම්

මහපටැඟිල්ලේ සටහන සමඟ සංසන්දනය කිරීම සඳහා විශ්ලේෂණය කරන ලද ඡායාරූපය වන ඇ(25) දරණ පිටුව පැ. 1561 (C)(1) වශයෙන් ද සලකුණු කරන ලදි.

ස්ථානයෙන් සොයා ගන්නා ලද සටහන් අංක 4හි ඇති මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ ඇඟිලි සටහන් පත්‍රයේ වම් දබරැඟිල්ල සමඟ සැසඳෙන ඇ(4) වශයෙන් ඉදිරිපත් කර ඇති ඡායාරූපය ඇතුළත් පිටුව පැ.1561 (D)වශයෙන්ද මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් යන අයගේ වම් දබරැඟිල්ලේ විශ්ලේෂණය කරන ලද ඡායාරූපය අඩංගු ඇ(26) දරණ පිටුව පැ.1561 (D) (1) වශයෙන් ද, සටහන් අංක 8 සමඟ සැසඳෙන මොහොමඩ් සහරාන් රුදෙයිනා නැමැති අයගේ දකුණු අත සමඟ සැසඳෙන අතුල් සටහන පැ.1561 (E) වශයෙන් ද ඇයගේ අතුල් සටහන් පතේ ඇති දකුණු අත්ලේ සටහන ඇතුළත් කරන ලද පිටුව පැ. 1561 (E) (1) වශයෙන්ද සලකුණු කර ඉදිරිපත් කරන ලදි.

එම ලේඛනයේ ඇ(27) දරණ පිටුව පැ. 1561(E)(1) වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදි. පැ.561 (A) වශයෙන් සලකුණු කරන ලද ඇඟිලි සටහන් පත්‍රයේ ඇඟිලි සටහන තිබුණු ස්ථානය පෙන්වන ඡායාරූපය එම වාර්තාවේ ඇ (28) දරණ පිටුවේ ඇතුළත් කර ඇති බව කියා සිටිමින් එම පිටුව පැ.1561 (F) වශයෙන් සලකුණු කරන ලදි. එසේම ඇ(2) වශයෙන් අපරාධ ස්ථානයේදී සොයා ගන්නා ලද ඇඟිලි සටහන තිබූ

ස්ථානය දැක්වෙන ප්‍රදර්ශන පත්‍රයට ඇතුළත් කර ඇති ආ (29) දරණ පිටුව පැ.1561 (G) වශයෙන් සලකුණු කරන ලදි.

වැඩිදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු ආ(2) වශයෙන් ඇඟිලි සටහනක් ඇති ස්ථානයට අදාළව ඡායාරූපය සලකුණු කරන ලද පිටුවේ අපරාධ ස්ථානයෙන් සොයාගන්නා ලද මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ ඇඟිලි සටහන සමඟ සමපාත වන සටහනක් තිබූ බව කියා සිටිමින් ඒ සටහන දැක්වෙන ඡායාරූපයේ සඳහන් පිටපත පැ. 1561 (G) වශයෙන් සලකුණු කරන ලදි.

සිය සාක්ෂිය වැඩිදුරටත් පැහැදිලි කළ සාක්ෂිකරු පැ. 1561 (F) වශයෙන් සලකුණු කරන ලද ඡායාරූපයට අනුව එම ඇඟිලි සටහන නිවසේ ප්‍රධාන දොර සමඟ තිබෙන ජනෙල් පියන් දෙකකින් එක් පියනක තිබූ බවත්, ආ(2) සහ ආ(3) වශයෙන් හඳුනාගන්නා ලද සටහන් LED බල්බයක තිබුණු බවත්, එම පෘෂ්ඨයන් දෙකම ඇඟිලි සටහන් පැහැදිලිව හඳුනාගැනීමේ හැකියාව සහිත ස්ථාන බවටත් කියා සිටින ලදි. එම ස්ථානයේ ඡායාරූපය ආ(30) වශයෙන් ප්‍රදර්ශන පත්‍රයට ඇතුළත් කළ බවත් කියා සිටිමින් ආ-30 දරණ පිටුව පැ. 1561(H) වශයෙන් සලකුණු කරන ලදි. පැ. 1561 (H) යනු සෙලෝටේප් රෝලක් වන අතර එහි තිබී සොයා ගන්නා ලද ඇඟිලි සලකුණ මොහොමඩ් මන්සූර් මොහොමඩ්

සනස්දීන්ගේ යන අයගේ බවත්, එය ඉතා සිනිඳු මතුපිටක් වන බැවින් ඇඟිලි සලකුණු සොයාගන්න පහසු වන බවත් කියා සිටින ලදි.

ආ(5) වශයෙන් හඳුනාගන්නා ලද ඇඟිලි සටහන තිබූ ස්ථානයේ ඡායාරූපයක් ආ (31) වශයෙන් ප්‍රදර්ශන පත්‍රයට ඇතුළත් කළ බව කියා සිටින ලද සාක්ෂිකරු එම පිටුව පැ. 1561 (I) වශයෙන් සලකුණු කරන ලදි. එය සුමට පෘෂ්ඨයක් වන වීදුරුවක් සහිත ජනේලයක් බවට කියා සිටින ලද සාක්ෂිකරු පරත්තපාර අංක 61/2 නස්මියාවිලා නැමැති ස්ථානය පරීක්ෂා කර සොයා ගත් ඇඟිලි සටහන් අතරින් ඇඟිලි සටහන් 5ක් එනම්, ඇඟිලි සටහන් 4ක් සහ අත්ල සටහන් 1ක් සැකකරුවන්ගේ ඇඟිලි සලකුණු සමඟ ගැළපෙන බවට කියා සිටින ලදි. එම ගැළපීම වැඩිදුරටත් පැහැදිලි කළ සාක්ෂිකරු පැ. 1561 (A) (1) වශයෙන් සලකුණු කරන ලද පිටුවෙහි ඇති මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ වම් දබරැඟිල්ලේ සටහන අංක 1 වැටි අවසානය, අංක 2 වැටි අවසානය, අංක 3 වැටි දෙබල, අංක 4 වැටි දෙබල, අංක 5 වැටි අවසානය, අංක 6 වැටි අවසානය, අංක 7 වැටි අවසානය, අංක 8 වැටි අවසානය, අංක 9 වැටි අවසානය, අංක 10 කෙටි වැටිය, අංක 11 වැටි අවසානය සහ අංක 12 වැටි අවසානය වශයෙන් සමානුපාත වන බව කියා සිටින ලදි.

එසේම මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ වම් දබරැඟිල්ලේ සටහන ඒ ආකාරයෙන්ම වැටි 12කින් සමපාත වූ බව සාක්ෂි

දෙන ලද සාක්ෂිකරු පැ. 1561 (B) (1) වශයෙන් සලකුණු කරන ලද මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ වම් දබරැහිල්ල සමඟම ද වැටි 12කින් සමපාත වීම මත එය තහවුරු කරගත් බව කියා සිටින ලදි. පැ. 1561 (C) (1) වශයෙන් සලකුණු කරන ලද මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අයගේ වම් මහපට ඇඟිල්ලෙහි සටහන ද වැටි 12ක් සමඟ එකිනෙක සමපාත වෙමින් සංසන්දනය වී සමපාත වීම හේතුකොට ගෙන හඳුනාගෙන තහවුරු කළ බව සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

පැ. 1561 (D) (1) දරණ පිටුවෙහි මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ වම් දබරැහිල්ලේ සටහන අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද ආ (4) දරණ සටහන සමඟ වැටි 12කින් සමපාත වීම මත හඳුනාගන්නා ලද බවත් ආ(27) වශයෙන් සලකුණු කර ඇති පැ.1561(E)(1) වශයෙන් සලකුණු කරන ලද මොහොමඩ් සහරාන් රුදෙයිනා යන අයගේ දකුණු අත්ල සටහන අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද ආ(5) දරණ සටහන සමඟ වැටි 12කින් සමපාත වී හඳුනාගන්නා ලද බව සාක්ෂිකරු විසින් කියා සිටින ලදි. මෙම සටහන් සොයා ගන්නා ලද්දේ වර්ෂ 2019.04.21 වන දින සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරයට පසු දිනය වන 2019.04.22 වැනි දින බවත්, එම සටහන් ඉතා පැහැදිලිව තිබූ සටහන් වන අතර ඒවා ඉතාමත් ආසන්න දිනවලදී පිහිටන ලද සටහන් බවටත් නිගමනය කළ හැකි බවටත්, එමඟින් එම ස්ථානයේ

එනම්, අංක 61/2 ෂෙරිෆ් මාවත, නස්මියාවිලා යන ස්ථානයේ මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයත් මොහොමඩ් සහරාන් රුදෙයිනා යන අයත් රැඳී සිට ඇති බව තහවුරු කළ හැකි බව කියා සිටින ලදි.

වැඩි දුරටත් සාක්ෂි දෙන ලද මෙම සාක්ෂිකරු ඉහතින් සඳහන් කළ නෂ්මියා විලා යන ස්ථානයට අමතරව, කොළඹ 03, ශාන්ත අන්තෝනි පාරේ, ලකී ප්ලාසාහි පිහිටි අංක 70/5/2 නිවස පාස්කු ප්‍රහාරයෙන් දින 04කට පසුව එනම් 2019.04.25 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද දැනුම්දීමක් මත උ.පො.ප ගලබඩ ආරච්චි ඇඟිලි සටහන් නිලධාරියා වශයෙන්ද, පො.කො.78672 නිරෝෂන් යන නිලධාරියා ඡායාරූප ශිල්පියා වශයෙන් ද පූර්ණ පරීක්ෂාවකට භාජනය කළ බව කියා සිටින ලදී. එහිදී ඇඟිලි සටහන් 29ක් සොයාගෙන ඡායාරූපගත කර තිබූ බවත් ඉන් 24ක් පරීක්ෂාවට සුදුසු මට්ටමේ තිබූ බවත් එම ඇඟිලි සලකුණු 24 අතුරින් සටහන් දෙකක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යොමුකරන ලද මොහොමඩ් සහරාන් රුදෙයිනා නැමති අයගේ ඇඟිලි සටහන් සහ අතුල් සටහන් සමඟ ගැළපුණු බවත් ඒවා පිළිවෙළින් අංක 20 ලෙස සටහන් අත්ල සටහනක් ද අංක 21 ලෙස වම් මැද ඇඟිල්ල සමග ගැලපී ඇති බවත් එය පොලිස් පරීක්ෂක රත්නායක විසින් සසඳා දෙවනුව සැසඳීම් අංශයේ ස්ථානාධිපතිවරයා විසින්ම සසඳා බලා තහවුරු කර ඇති බවත් කියා සිටිමින් එයට අදාළ 2212/2019 සහ

2026.07.20 දින දරන වාර්තාව පැ.1562 වශයෙන් සලකුණු කරන ලදී. එම වාර්තාවට අදාළ ප්‍රදර්ශන පත්‍රය පැ.1563 වශයෙන් ද, මොහොමඩ් සහරාන් රුදෙයිනා ඇයගේ ඇඟිලි සටහන් පතෙහි මුල් පිටපත පැ.1564 වශයෙන් ද, ඇතුල් සටහන් පත පැ.1565 වශයෙන් ද, සලකුණු කරමින් වම් මැද ඇඟල්ලේ ඡායාරූපය පැ.1563(A) වශයෙන් ද, එම සටහන තිබූ ස්ථානයේ ඡායාරූපය පැ.1563(B) වශයෙන් ද, වම් අත්ල සටහන සඳහා විශාලනය කරන ලද ඡායාරූපය පැ.1563(A)(1) වශයෙන් ද, වම් මා පටැගිල්ල විශාලනය කරන ලද ඡායාරූපය පැ.1563(B)(1) වශයෙන්ද ලකුණු කරන ලදී. එම සටහන් තිබූ විදුරු ජනේලයේ ඡායාරූපය පැ.1563(C) වශයෙන්ද සලකුණු කරන ලදී. එම ඇඟිලි සලකුණු සහ අත්ල සටහන් පෙර සඳහන් කළ ආකාරයටම වැටී ස්වභාවයන් 12ක් සමඟ එකිනෙක සම්පාත වීම මත තමාගේ නිගමනයට එළඹුණු බව කියා සිටින ලදී.

ඉන් අනතුරුව 2019.06.24 වන දින වත්තල, එඩේරමුල්ල, වීදිය පාරේ අංක 484/03 දරන ස්ථානය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද ලිපියක් ප්‍රකාරව ඇඟිලි සටහන් නිලධාරී පොලිස් සැරයන් 31717 ස්වර්ණතිලකද, ඡායාරූප ශිල්පී උ.පොෙ.ප.රණසිංහ යන නිලධාරීන් විසින් පරීක්ෂා කොට ඇඟිලි සටහන් 44ක් සොයාගෙන තිබූ බවත් ඉන් 05ක් පරීක්ෂාව සඳහා සුදුසු නොමැති බවට තීරණය කර අ(01) සිට අ(36) දක්වා සලකුණු කර ඇති බවත් කියා සිටින ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එවන ලද 24 දෙනෙකුගේ ඇඟිලි සලකුණු සමඟ එම

සටහන් සන්සන්දනය කරන ලද අතර එයින් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ ඇඟිලි සලකුණු සමඟ සැසඳෙන ලද ඇඟිලි සලකුණු වාර්තා අංක 3466/2019 දරන ඇඟිලි සලකුණු වාර්තාව පැ.1564 වශයෙන් සලකුණු කරන ලදී. එයට අනුරූපී ප්‍රදර්ශන පත්‍රය පැ.1565 වශයෙන් සලකුණු කරන ලද අතර එහිදී ස්ථානයෙන් සොයා ගන්නා ලද අංක 28 වශයෙන් සලකුණු කොට තිබූ දකුණු මැද ඇඟිල්ලේ සටහනත් අංක 29 දරන දකුණු වෙදැගිල්ලේ සටහනත් සමඟ සමපාත වූ බවටත් කියා සිටිමින් අංක 28 දරන ඡායාරූපය පැ.1565(A) වශයෙන් ද අංක 29 දරන සටහන සහිත ඡායාරූපය පැ.1565(B) සලකුණු කරන ලදී. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ ඇඟිලි සලකුණු සාම්පල 2019.04.29 වන දින පො.කො.83852 චතුරංග විසින් ලබාගෙන එවා තිබූ බවත් සන්සන්දනය සඳහා එම ඇඟිලි සලකුණු භාවිතා කර බවත් කියා සිටිමින් ඔහුගේ දකුණු මැද ඇඟිල්ලේ විශාලනය කරන ලද ඡයාරූපය පැ.1565(A)(1) වශයෙන්ද දකුණු වෙද ඇඟිල්ලේ විශාලන කරන ලද ඡයාරූපය පැ.1565)(B)(1) සලකුණු කරන ලදී. වත්තල, එඩේරමුල්ල, වීදිය පාරේ අංක 484/03 දරන ස්ථානයේදී සොයා ගන්නා ඇඟිලි සලකුණු එම ස්ථානයේ තිබූ RIKON ලෙස සටහන් විදුලි ස්තිරික්කයක් බහා තිබූ කාඩ්බෝඩ් පෙට්ටියක මතු පිට තිබී සොයාගෙන තිබූ බවත් කියා සිටිමින් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ ඇඟිලි සටහන් පත්‍රයෙහි මුල් පිටපත පැ.1566 වශයෙන් සලකුණු කරන ලදී. ඉහත ලිපිනයේ වූ

ස්ථානය පරීක්ෂා කිරීම 2019.06.24 දින එනම් පාස්කු ප්‍රහාරයෙන් මාස 02කට පමණ පසුව සිදුකර ඇති බවත් ඇඟිලි සටහන් නිලධාරියා විසින් වර්ධනය කර ඇති සටහන ඉතා පැහැදිලි සටහනක් නොවන අතර එය තරමක් පැරණි සටහනක් බවට තමාට කිව හැකි බවත් කියා සිටින ලද අතර සාමාන්‍යයෙන් මෙවැනි සටහනක් මාස 6ක් හෝ 7ක් පමණ කාලයක් එවැනි පෘෂ්ඨයක් මත පැවතිය හැකි බව කියා සිටින ලදී. මෙම සටහන නියමිත සම්මත නිර්නායකයන් අනුව වැටි 12ක් සමපාත වීම මත නිලධාරීන් පස් දෙනෙකු විසින් වෙන් වෙන්ව සන්සන්දනය කර සහතික කර ඇති බව වැඩිදුරටත් කියා සිටි.

වර්ෂ 2019.06.22 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද දැනුම්දීමක් මත කොච්චිකඩේ දළුවාකොටුව, ජනපද මාවතේ, අංක 546/7/1 දරන නිවස ඇඟිලි සටහන් නිලධාරී පොලිස් සැරයන් 31717 ස්වර්ණතිලකද, ඡායාරූප ශිල්පී උ.පො.ප.රණසිංහ (එවකට පොලිස් සැරයන් 28463) යන නිලධාරීන් විසින් පරීක්ෂා කොට ඇඟිලි සටහන් 05ක් සොයා ගෙන ඡායාරූප ගතකොට මුද්‍රණය කර තිබූ බවත් ඉන් එකක් සංසන්දනය සඳහා සුදුසු නොවූ අතර ඒවා (අ) 01, (අ) 02, (අ) 03, (අ) 04 ලෙස සලකුණු කළ බවත් ඒ අතුරෙන් ඇඟිලි සලකුණු 02ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යොමුකරන ලද අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි යන අයගේ ඇඟිලි සටහන් පත්‍රයේ වම් දබර ඇඟිල්ලේ සහ වම් මැපටඇඟිල්ලේ සටහනත් සමඟ සැසඳුන බවත් කියා සිටින ලදී.

එම සැසඳීම කාර්යාලීය කාර්ය පටිපාටිය අනුව නිලධාරීන් සිව් දෙනෙකු විසින් වෙන් වෙන්ව සසඳා බලා සහතික කළ බව ඔහු වැඩිදුරටත් කියා සිටින ලදී. ඒ සම්බන්ධයෙන් අංක 3467/2019 දරන වාර්තාව පැ.1567 වශයෙන් සලකුණු කරන ලදී. එහි ප්‍රදර්ශන පත්‍රය පැ.1568 වශයෙන් සලකුණු කරන ලද අතර ස්ථානයේ තිබී සොයා ගන්නා ලද වම් දබර ඇඟිල්ලේ සටහන සහ වම් මැපටඇඟිල්ලේ සටහන සහ යන සටහන් දෙකම ඇතුළත් පිටු පිළිවෙළින් පැ.1568(A) වශයෙන් ස පැ.1568(B) වශයෙන් සලකුණු කරන ලදී. ඒවායේ විශාලනය කරන ලද ඡායාරූප පැ.1568(A)(1) වශයෙන් ද, අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි යන අයගෙන් ලබාගත් ගැළපුණු සටහනේ විශාලනය කරන ලද ඡායාරූපය පැ.1568(B)(1) වශයෙන්ද, එම සලකුණු තිබූ වීදුරු දොරවල් සහිත කබඩ් එකේ ඡායාරූපය පැ.1568(C) වශයෙන්ද සලකුණු කරන ලදී. එම සටහන් තිබූ පෘෂ්ඨය ස්වභාවය අනුව පාරිසරික තත්ත්වයන්ට නිරාවරණය නොවී තිබුණේ නම් මාස 08ක පමණ කාලයක් වුවද එම සටහන් තිබීමට හැකියාව ඇති බව කියා සිටිමින් එම ඇඟිලි සටහන්ද පෙර නිර්නායකයන් අනුවම වැටි 12ක් සමපාත වීම මත තහවුරු කර ඇති බව කියා සිටිමින් අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි යන අයගේ ඇඟිලි සටහන් පත්‍රයෙහි මුල් පිටපත පැ.1569 වශයෙන් සලකුණු කරන ලදි.

1, 2, 7, 8, 10, 15, 18 සහ 19 චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතීඥ මහතා විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඇඟිලි

සලකුණු හිරු එළියට සහ වාතාවරණයට විවෘතව තිබියදී වෙනස්වීමක් සිදු නොවන බවත්, නමුත් ඒවා වර්ධනය කර ගැනීමට කාලයක් ගත වන බවත් කියා සිටින ලදී. එසේම ඇඟිලි සලකුණු තිබූ ස්ථානය එම ස්ථානය පරීක්ෂා කළ නිලධාරියාගේ වාර්තාවට ඇතුළත් කරන අතර ඇඟිලි සලකුණක් පමණක් එම ස්ථානයේ තිබූ බව ඔහු තීරණය කරන අතර එය කොපමණ කාලයක් එම ස්ථානයේ තිබුණේද යන්න නිශ්චිතව කීමට හැකියාවක් නැති බවත් එසේ වුවද එම ඇඟිලි සලකුණ පවුඩර් දමා වර්ධනය කර ගැනීමට ගත වන කාලය අනුව එය පැරණි සටහනක් ද අලුත් සටහනක්ද යන්න කිව හැකි බවත් කියා සිටින ලදී. දළුකොටුව ස්ථානයෙන් ලබා ගත් සටහන හොඳින් වර්ධනය නොවූ සටහනක් බැවින් එය අවම වශයෙන් මාස 06ක් හෝ 07කට වඩා පැරණි සටහනක් බවට නිගමනය කළ හැකි බව කියා සිටින ලදී.

09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලද අතර එහිදී පිළිතුරු වශයෙන් ඇඟිලි සටහන් සොයා ගැනීම පො.සැ.ස්වර්ණතිලක විසින්ද, ඡායාරූප ගැනීම එවකට පොලිස් සැරයන් රණසිංහ විසින්ද, සටහන් සොයා ගැනීම දළ වශයෙන් පාස්කු ප්‍රහාරයෙන් පසුව 2019.06.24 දින බවද කියා සිටින ලදී. එම ඇඟිලි සලකුණු 2019 මාර්තු මාසයේ මෙන්ම 2019.04.21 පසුව දිනයක වුවද පතිත වීමේ හැකියාවක් ඇති බවත් ඇඟිලි සලකුණු පතිත වූ නිශ්චිත දිනය කවදාද යන්න කීමට හැකියාවක් තමාට නොමැති

බවත් පිළිගන්නා ලදී. තමා විසින් සිදු කරන ලද්දේ තමාට ලැබුණු සැකකරුගේ ඇඟිලි සලකුණුත්, ස්ථානයෙන් සොයාගත් ඇඟිලි සලකුණුත් සමඟ සසඳා අනන්‍යතාවය තහවුරු කිරීම පමණක් වන අතර පතිත වූ නිශ්චිත දිනය සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට නොහැකි බව කියා සිටින ලදී. යම් ඇඟිලි සලකුණක් නිවසක තිබීම මත එම නිවස තුළ එම පුද්ගලයා සිටි බව නිගමනය වන අතර එම ඇඟිලි සටහන් පතිත වීම එම ස්ථානය භාවිතා කරන වාර ගණන යොදන පීඩනය ආදී විවිධ කරුණු මත රඳා පවතින බවත් කියා සිටින ලදී. එසේම ඇඟිලි සලකුණ සහිත ස්ථානයක එම ඇඟිලි පතිත වූයේ කුමන පසුබිමක් මත ද යන්න තමාට කීමට නොහැකි අතර එදිදෙනා භාවිතා කරන නානකාමර වැනි ස්ථාවලදී වැඩි ඇඟිලි සලකුණු ප්‍රමාණයක් දැකිය හැකි අතර සසඳා බැලීම සිදු කරන ලද සලකුණු තිබූ පෙට්ටිය චංචල දේපලක් වන අතර ඒ හැරුණු කොටගෙන යම් ආයුධයක් මත හෝ පුපුරණ ද්‍රව්‍ය මත, ඩෙටනේටරයක් මත හෝ නීති විරෝධී දේපලක් මත තිබුණු බවට වාර්තාවක් නොමැති බව කියා සිටින ලදී. ස්ථානයෙන් සොයා ගන්නා ලද ඇඟිලි සලකුණු 41න් දෙකක් පමණක් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත්ගේ අතේ ඇඟිලි දෙකක සටහන් සමඟ පමණක් සැසඳුන බවත් එම සටහන් චංචල දේපලක් මත තිබූ බව පමණක් තමාට කිව හැකි බවත් සාක්ෂිකරු විසින් නැවතත් 09 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටින ලදී.

විශ්ලේෂණය

අපරාධ වාර්තා කොට්ඨාශයේ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වේ.

ඔහු තම සාක්ෂියේ දී ඇඟිලි සටහන්වල විද්‍යාත්මක පසුබිම, වැටි ලක්ෂණ 12ක් සැසඳීමේ ශ්‍රී ලංකා ප්‍රමිතිය සහ ඇඟිලි සටහන් සංසන්දනය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳව ඔහු පැහැදිලි කරමින් සාක්ෂි ලබා දී ඇත.

ඔහු තවදුරටත් පවසා ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එවූ සැකකරුවන්ගේ ඇඟිලි සටහන් සමඟ අපරාධ ස්ථානවලින් සොයාගත් සටහන් සසඳා බලා වාර්තා (පැ.1557, පැ.1562, පැ.1564, පැ.1567) සකස් කරන ලද බවත් ඒ අනුව පානදුර නඹ්මියා විලා හි තිබූ ඇඟිලි සටහන් මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් සහ සහරාන්ගේ දියණිය වන සහරාන් රුදෙයිනා සමඟත්; කොළඹ ලකී ප්ලාසා හි තිබූ ඇඟිලි සටහන් සහරාන් රුදෙයිනා සමඟත්; වත්තල නිවසේ විදුලි ස්ත්‍රික්ක පෙට්ටියේ තිබූ ඇඟිලි සටහන් මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් සමඟත්; කොච්චිකඩේ දලුවාකොටුව නිවසේ තිබූ ඇඟිලි සටහන් අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි සමඟත් ගැළපෙන බව තහවුරු කර ඇත.

1) 06 වන චූදිත මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් තමාගේ ඇඟිලි සලකුණු පරත්ත පාර ආරක්ෂිත නිවාසයේ තිබීම සම්බන්ධයෙක් කිසිදු පැහැදිලි කිරීමක් 06 වන චූදිත විසින් සිදුකර නැත.

2) 07 වන චූදිත වන මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනාස්දීන් විසින් සිය විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී තමා විසින් රස කැවිලි ප්‍රමාණයක් පාර්සල් කිරීම සඳහා ගම් ටේප් රෝල 06 වන චූදිතට ලබාදුන් බවත් 06 වන චූදිත එය කුමන ස්ථානයටකට රැගෙන ගියේද යන්න තමා නොදන්නා බවත්, පැහැදිලි කිරීමක් වශයෙන් කියා ඇත. මෙම කරුණ දිවුරුම් පිට දෙන ලද විශේෂඥ සාක්ෂිකරුවන්ගේ සාක්ෂියත් අනෙකුත් පරිවේශනීය කරුණුත් සමග සාක්ෂිමය වශයෙන් සළකා බැලිය යුතුය.

3) 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත්ගේ ඇඟිලි සලකුණු වත්තල, එඩේරමුල්ල, වීදිය පාරේ අංක 484/03 දරන ස්ථානයේ පැවතීම සම්බන්ධයෙන් ඔහුද විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් ඔහුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව එම ස්ථානය වෙත රැගෙන ගිය බවත් එහිදී ඇඟිලි සලකුණු එම ස්ථානයේ පතිත වීමට ඇති හැකියාව ගැනත් පැහැදිලි කරන ලදී. මෙම කරුණ දිවුරුම් පිට දෙන ලද විශේෂඥ සාක්ෂිකරුවන්ගේ සාක්ෂියත් අනෙකුත් පරිවේශනීය කරුණුත් සමග සාක්ෂිමය වශයෙන් සළකා බැලිය යුතුය.

4) තවද පරත්තපාර, නිවසේ තිබී සොයා ගන්නා ලද අනෙකුත් භාණ්ඩත් ඒවා සමග සැසඳෙන තවත් විශාල භාණ්ඩ ප්‍රමාණයක් අනෙකුත් ආරක්ෂිත නිවාසවල තිබී සොයා ගැනීමත් විශේෂයෙන්ම පිපුරුම් උපකරණ සඳහා

භාවිතා කර ඇති සියලුම ද්‍රව්‍ය සමග ආරක්ෂිත නිවාස වල තිබී සොයාගත් ද්‍රව්‍ය සමාන සහ ලාක්ෂණික වීමද, සැලකිල්ලට ගත යුතුය.

බෝම්බ සැදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම හා සම්බන්ධ සාක්ෂි විශ්ලේශණය කර ඇගැයීමට ලක් කිරීම

පැමිණිල්ලේ සාක්ෂි අංක - 1410 මොහොමඩ් නන්සූර් මොහොමඩ් පෙරිදවුස් යන සාක්ෂිකරු 2026.07.13 දින සාක්ෂි දෙමින්, ඔහු කොළඹ 12, වෙල්ලවීදියේ, අංක 51 දරන ස්ථානයේ ෆින්ස් සයිකල් ට්‍රේඩර්ස් නමින් බයිසිකල් සහ බයිසිකල් සඳහා අමතර කොටස් ආනයනය කර තොග සහ සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බව කියා සිටින ලදී. එසේම ඔවුන්ගේ ගබඩාවක් නො.15, පරත්ත පාර, ගොරකාන, කෙසෙල්වත්ත, පානදුර යන ස්ථානයේ පවත්වා ගෙන යන බවද කියා සිටින ලදී. වර්ෂ 2019.03.31 වන දින තමා විසින් චීනයේ නිෂ්පාදිත K&H යන වෙළඳ සන්නාමයෙන් යුතු අඟල්1/4 ප්‍රමාණයේ යකඩ බෝල 144 ක් බැගින් අඩංගු පැකට් 600 ක් පැ. 969 ලෙස පැමිණිල්ල විසින් සලකුණු කරන ලද ඉන්වොයිස් පත්‍රය අනුව ද 2019.04.11 වන දින එවැනිම යකඩ බෝල 144 ක් බැගින් අඩංගු පැකට් 960 ක් පැ. 970 දරන ඉන්වොයිස් පත්‍රය මතද වශයෙන් යකඩ බෝල 222, 840 ක් රාසි ට්‍රේඩින් කම්පැනි යන ආයතනයේ මුෂ්ෆික් යන අයට විකුණා ඇති බව කියා සිටින ලදී. මෙම

බයිසිකල් බෝල K&H යන වෙළඳ සන්නාමයෙන් පැමිණෙන බවත් ඒවායෙහි පැකට්ටුවෙහි එම වෙළඳ සන්නාමය ඇතුළත් වන කියා සිටින සාක්ෂිකරු පැ.832 දරන සංයුක්ත තැටියේ පැ.832(12) දරන ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අවස්ථාවේදී එහි ඇති හිස් ඉටිකවර වල ඇති K&H යන වෙළඳ සන්නාමයෙන් ඒවා හඳුනා ගන්නා ලද අතර, සාක්ෂිකරුට පෙන්වන ලද පැ.832(18) දරන ඡායාරූපයෙහි පෙනෙන්නට ඇති හිස් පැකට්ටු තුළද ඉහත සඳහන් K&H යන වෙළඳ සන්නාමයෙන් සහ Steel Balls ¼ යන සලකුණ අනුව හඳුනා ගන්නා ලදී.

ඉන් අනතුරුව එකී සාක්ෂිකරුට සමන්තුරේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B/4596 දරණ නඩු අංකය යටතේ PR/508/2019 සඳහන්ව ඇති පැ.971 වශයෙන් සලකුණු කරන ලද පෙට්ටිය තුළ ඇති ද්‍රව්‍ය තම ආයතනය විසින් ආනයනය කරන K&H යන වෙළඳ සන්නාමයෙන් ඇතුළත් වන Steel ¼ බෝල බවට හඳුනාගන්නා ලදී. සාක්ෂිකරු පරීක්ෂාකර බලන ලද එක් පැකට්ටුවක් පැ.972 වශයෙන් සලකුණු කරන ලද අතර එය තුළ තිබූ යකඩ බෝල පැකට් ඇතුළත් විවෘත නොකරන ලද පෙට්ටි රාශියක් ඇතුළත් නඩු භාණ්ඩ ප්‍රමාණය හඳුනා ගන්නා ලද අතර එකී හඳුනා ගන්නා ලද යකඩ බෝල අඩංගු පැකට් රාශියක් බහා තැබූ පෙට්ටිය පැ.973 වශයෙන් සලකුණු කරන ලදී. එසේම, අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ අතර තිබූ පොලිසැක් උරයක් තුළ අඩංගු නඩු භාණ්ඩ සාක්ෂිකරුට පෙන්වන ලද අතර එම පොලිසැක් උරය තුළද තමා ඉහතින්

කියා සිටිමින් සාක්ෂිදෙන වර්ගයේ යකඩ බෝල ඇතුළත් වන බව සාක්ෂිකරු කියා සිටින ලද අතර එම පොලිසැක් උරය පැ.974 වශයෙන් සලකුණු කරන ලදී. වැඩිදුරටත් සාක්ෂි දෙන ලද ඉහත නම් සඳහන් සාක්ෂිකරුට පෙන්වන ලද සමන්තුරේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B 4596 යටතේ මෙම අධිකරණයට ඉදිරිපත් කර තිබූ දේපල කුවිතාන්සි අංක 508 දරන කාඩ්බෝඩ් පෙට්ටිය (පැ.975 වශයෙන් සලකුණු කරන ලද) තුළ ද ඉහතින් පැ.972 වශයෙන් සලකුණු කර K&H යන වෙළඳ සන්නාමයෙන් යුතු තමා විසින් හඳුනා ගන්නා ලද යකඩ බෝල ඇතුළත් බව සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා සිටින ලදී. එම යකඩ බෝල විකිණීම සම්බන්ධයෙන් බිල්පත් තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් බවත් පළමු දිනය එනම් 2019 මාර්තු 30 වන දින කොළඹ 12 වේල්ල වීදියේ පිහිටි තම ආයතනයෙන් ලබා දී ඇති බවත් ඉන්පසු 2019 අප්‍රේල් 11 වන දින භාණ්ඩ පරත්ත පාරේ පිහිටි සිය ගබඩාවෙන් ලබා දී ඇති බවත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් පස්වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් විසින් හරස් ප්‍රශ්න විමසන ලද අතර ඒවාට පිළිතුරු දෙමින් තමන් විසින් K&H යන වෙළඳ සන්නාමයෙන් යුතු බයිසිකල් බෝල වෙන අයට ද විකුණා ඇති නමුත් මෙවැනි විශාල ප්‍රමාණයක් විකුණා ඇත්තේ ‘‘රාසි’’ යන ආයතනයට පමණක් බවත් තමාට පෙන්වා සිටින ලද පැ.832(18) යන ඡායාරූපයේ ඇතුළත් බයිසිකල් බෝල ඇතුළත් කවර

තමා විසින් රාසි ආයතනයට විකුණන ලද භාණ්ඩ බවට තමාට නිශ්චිතව කිව හැකි බවටත් ඒවා තම ආයතනයෙන් ආනයනය කරන ලද භාණ්ඩ බවට තමාට කිව හැකි බවත් සාක්ෂිකරු කියා සිටින ලද අතර තවත් සමාගම් ද K&H යන වෙළඳ සන්නාමයෙන් ඇති භාණ්ඩ ආනයනය කිරීම සිදු කරන ලද බව කියා සිටින ලදී.

විශ්ලේෂණය

මෙම නඩුවේ අධිබලැති පුපුරන උපක්‍රම සඳහා අගල් ¼ ප්‍රමාණයේ යකඩ බෝල භාවිතා කර ඇති බව විශේෂඥ සාක්ෂි මගින් පැහැදිලිව අනාවරණය කර ඇත. එකී යකඩ බෝල මිලදී ගැනීම සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වැදගත් වන අතර එහි ඇති K&H යන වෙළඳ සන්නාමයෙන් යුත් යකඩ බෝල පානදුර පරත්තපාරේ සහ සමන්තුරේ සහ නින්දවූර් යන ප්‍රදේශවලදී ද සොයා ගෙන ඇති අතර එම භාණ්ඩ ඔහු විසින් රාසික් ට්‍රේඩින් කම්පැනි ආයතනයේ මුෂ්ෆික් යන අයට විකුණා ඇත.

(එම ස්ථානයට අදාළ විමර්ශන නිලධාරීන්ගේ ද අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරින්ගේද (SOCO) අධිකරණ වෛද්‍ය නිලධාරී සහ රජයේ රස පරීක්ෂකගේ වාර්තා පිළිබඳ සාක්ෂි විශ්ලේෂණය ඇතුළත් කරන්න.)

පැමිණිල්ලේ සාක්ෂි අංක - 2301 අහමඩ් මුක්තාර් මොහොමඩ් මුෂ්ෆික් යන සාක්ෂිකරුව පැමිණිල්ල විසින් සාක්ෂියට කැඳවන ලද අතර ඔහු 2026.07.13 දින සාක්ෂි දෙමින්, තමා අධිකරණයේ සාක්ෂි දෙන

අවස්ථාව වන විට මහාවීරා සයිකල් සෙන්ටර් යන ආයතනයේ සේවය කරන ලද බවත් ඊට පෙර කොළඹ 12, නව යොන් වීදිය, අංක 06 ස්ථානයෙහි පිහිටි රාසි ට්‍රේඩින් කම්පැනි යන බයිසිකල් අමතර කොටස් විකුණන ආයතනයේ අයිතිකරු වන තාහීර් ෆාසි යන අය යටතේ සේවය කළ බවත් පවසා ඇත. එම කාලයේ දී රාසි එන්ටප්‍රයිසස් මගින් භාණ්ඩ අලෙවි කිරීමේ දී තම ආයතනයේ අවශ්‍ය තොග නොමැති අවස්ථාවලදී ඒවා අවට පිහිටි අනෙකුත් කඩ වලින් භාණ්ඩ ලබා ගෙන ඇනවුම් කරන පුද්ගලයා වෙත විකිණීම සිදුකරන බවත්, වර්ෂ 2019.03.30 සහ වර්ෂ 2019.04.11 වන දින ෆින්ස් ආයතනයෙන් පිළිවෙළින් බයිසිකල් බෝල 144 බැගින් අඩංගු පැකට් 600ක් සහ 900ක් (Gross 600 සහ Gross 900) මිලදී ගෙන ඒවා වෙනත් අයෙකුට විකිණීමක් සිදුකළ බවත් කියා සිටින ලදී. ඔහු විසින් එම මිලදී ගැනීමට අදාළ පැ.970 දරන රිසිට් පත හඳුනා ගන්නා ලද අතර පැ.972 වශයෙන් සලකුණු කරන ලද බයිසිකල් බෝල අඩංගු පැකට්ටුව ග්‍රොස් 1ක් යනුවෙන් හඳුන්වනු ලබන බයිසිකල් බෝල 144 ක් අඩංගු පැකට් එක බවට හඳුනා ගන්නා ලදී. මෙම භාණ්ඩ තමාගෙන් මිලදී ගන්නා ලද පුද්ගලයා කැප් තොප්පියක් පැළඳ පැමිණි බවත් ඔහුව නොහඳුනන බව කියා සිටින ලදී. මෙම අවස්ථා දෙකෙහිදීම එසේ පැමිණි අය භාණ්ඩ ඇණවුම් කර පසු දින ත්‍රීරෝද රථයකින් පැමිණ ඒවා රැගෙන ගිය බවත් අදාළ බිල්පත් තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් බවත්, 2019 අප්‍රේල් 21 වන දින ප්‍රභාරාත්මක පිපිරීම්වල බයිසිකල්

බෝල භාවිතා කර ඇති බව දැනගත් බැවින් එම විකිණීමට අදාළ බිල්පත් තමා ඉරා විනාශ කල බවත් සාක්ෂිකරු පවසා සිටින ලදී. සාක්ෂිකරුට පැ.972 දරන නඩු භාණ්ඩය නැවත පෙන්වා දෙන ලද අතර එය සාක්ෂිකරු හඳුනා ගනිමින් සාමාන්‍ය ව්‍යවහාරයේ දී තමන් එය කාලේ බෝල වශයෙන් හඳුන්වන බවත්, කියා සිටින ලද අතර පැ.832(12) දරන ඡායාරූපයේ ඇති හිස් පැකට් එකී K&H කාලේ බෝල බවට හඳුනා ගන්නා ලදී. එසේම පැ.932(17) ඡායාරූපය හඳුනා ගන්නා ලද සාක්ෂිකරු එහි දක්නට ඇත්තේ තමා විසින් ෆින්ස් ආයතනයෙන් ලබා ගෙන විකිණීම සිදු කරන ලද බයිසිකල් බෝල බවට හඳුනා ගන්නා ලද අතර පැ.971, පැ.974, පැ.975 දරන සෘජුෆෝම් පෙට්ටිය, සුදු පාට පොලිසැක් උරය සහ කාඩ්බෝඩ් පෙට්ටිය යන නඩු භාණ්ඩ තුන ඇතුළත් භාණ්ඩ තමා විසින් 2019.03.30 සහ 2019.04.11 වන දින විකුණන ලද K&H කාලේ යකඩ බෝල බවට හඳුනා ගන්නා ලදී. එසේම පැ.973 වශයෙන් ඒ වන විටත් සලකුණු කරන ලද පෙට්ටිය තුළ තිබූ නඩු භාණ්ඩ තමා විසින් විකිණීම සඳහා තිබූ කාලේ බෝල බවට හඳුනා ගන්නා ලදී. අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව තමාගෙන් ප්‍රකාශයක් ලබා ගන්නා ලද අවස්ථාවේ දී ඡායාරූප කිහිපයක් තමාට පෙන්වා භාණ්ඩ මිලදී ගත් තැනැත්තන් තමන්ට හඳුනාගත හැකිද යන්න විමසූ බවත්, එම ඡායාරූප දුටු බවට තමා අත්සන තැබූ බවත් එම ඡායාරූපවල සිටින පුද්ගලයා හා නඩු භාණ්ඩ ලබාගත් අය සමාන වන බවත් කියා සිටින ලද අතර එකී ඡායාරූපය පැ.976 වශයෙන්

සාක්ෂිකරුගේ අත්සන පැ.976(A) වශයෙන් ද සලකුණු කරන ලදී. ඉහතින් සඳහන් කරන ලද අවස්ථාවන්වලදී හැර වෙනත් අවස්ථාවකදී මෙතරම් විශාල බයිසිකල් බෝල ප්‍රමාණයක් විකුණා නොමැති බවද ඔහු කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 1394 කෝට්ටගේ නිල්මිණි ජයකොඩි 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමාට අයත්ව තිබූ යතුරුපැදියක් තමාගේ මිතුරියකගේ ස්වාමිපුරුෂයා වන ප්‍රියන්ත යන අයට විකණීම සඳහා භාරදුන් බවත්, 2019.04.20 වන දින එම බයිසිකලය කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉඩමක පුපුරා ගොස් ඇති බව දන්වා කාත්තන්කුඩිය පොලිසියෙන් පැමිණ තමාගෙන් කට උත්තරයක් ලබා ගත් බවත් එම දිනය වන විට තමා එම යතුරුපැදිය විකිණීම සිදුකර වසරක පමණ කාලයක් ගත වී තිබූ බවත් කියා සිටින ලද අතර එය විකිණීම සිදුකරන අවස්ථාවේදී ලේඛන වලට අත්සන් තබා ලියාපදිංචි සහතිකය සමග ප්‍රියන්ත යන අයට භාරදුන් බවත් කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

පැමිණිල්ලේ සාක්ෂි මගින් හෙළි වූ පාලමුණේ කිරිකෝනා වත්ත යන ස්ථානයේ දී පුපුරවා හරිනු ලැබූ යතුරු පැදියේ මුල් අයිතිකාරියයි.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක - 1395 අධිකාරීගේ තුෂාර ප්‍රියන්ත පෙරේරා</u> යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා වර්ෂ 2011 සහ 2012 වර්ෂයේ දී පමණ භාවිතා කරන ලද යතුරු පැදි මිලට ගෙන විකිණීම සහ එසේ විකිණීම සඳහා අතරමැදියෙකු ලෙස කටයුතු කළ බවත් අනුසර මෝටර්ස් යනුවෙන් හැඳින්වෙන අරුණ වික්‍රමසේකර යන අයට අයත් ව්‍යාපාරය සමඟ 2012 දී පමණ සිට ගනුදෙනු කරන අතර තම බිරිඳගේ මිතුරියක වූ නිල්මිණි ජයකොඩි යන අයට අයත් WP-BCQ-0304 දරන යතුරුපැදිය වර්ෂ 2019 දී විකිණීම සඳහා ඒ සඳහා අවශ්‍ය පැවරීමේ ලේඛන හැඳුනුම්පත් පිටපත් සියල්ල අරුණ වික්‍රමසේකර යන අයට ලබා දුන් බවත්, පසුව පාස්කු ප්‍රහාරයට පෙර 2019.04.20 දින කාත්තන්කුඩි පොලිසියෙන් තමාට දුරකතනයෙන් අමතා එම බයිසිකලය කාත්තන්කුඩි ප්‍රදේශයේ දී ‘‘බ්ලාස්ට් එකක් කරලා තියෙනවා’’ යනුවෙන් දැනුම් දුන් බවත්, තමා ඒ සම්බන්ධයෙන් දන්නා සියලු දේ පවසමින් කාත්තන්කුඩි පොලිසියට ප්‍රකාශයක් ලබා දුන් බවත් එම යතුරුපැදියේ අයිතිකාරිය බිරිඳගේ යෙහෙළියක වන බැවින් ඒ සඳහා බ්‍රෝකර් ගාස්තුවක් ලබා නොගත් බවත් කියා සිටින ලදී. තමා එම යතුරුපැදිය අනුසර මෝටර්ස් මගින් වෙනත් අයෙකුට විකිණීම සම්බන්ධයෙන් ගනුදෙනුවට සහභාගී නොවූ බවත් කාත්තන්කුඩි පොලිසිය මගින් තමාගෙන් WP-BCY-2183 දරන වාහනය එනම් යතුරුපැදිය සම්බන්ධයෙන් ද විමසීමක් කළ බව කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 1396 මාවලගේ අරුණ වික්‍රමසේකර

යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා තනි පුද්ගල ව්‍යාපාරයක් වශයෙන් යතුරු පැදි විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත් සාක්ෂිකාර ප්‍රියන්ත පෙරේරාව (පැ.සා.1395) කලක පටන් අඳුනන බවත් ඔහු සමග යතුරු පැදි මිලදී ගැනීම සහ විකිණීම සිදු කරන බවත්, 2019.04.20 දින කාත්තන්කුඩි පොලිසියෙන් පැමිණ තමාගෙන් ප්‍රශ්න කිරීමක් සිදුකළ බවත් එහිදී කාත්තන්කුඩි ප්‍රදේශයේ වත්තක පිපිරීමක් සිදු කරන ලද බයිසිකලයක් සම්බන්ධයෙන් විමසා සිටි බවත් ඒවා තමා විසින් විකුණන ලද බයිසිකල් වන බවට තමාගෙන් විමසීමක් කළ බවත් ඒ අනුව පැ.978 දරන කුවිතාන්සිය පරිදි WP-BCQ-0304 ද දරන යතුරු පැදියද පැ.979 දරන කුවිතාන්සිය යටතේ WP-BCY-2183 දරන යතුරුපැදිය ද පැ.980 කුවිතාන්සිය යටතේ WP-BCG-2763 දරන යතුරු පැදියද යන යතුරු පැදි සම්බන්ධයෙන් ගනුදෙනුවක් සිදුකළ බවත්, එහිදී මිලදී බැනීමට පැමිණි පුද්ගලයන් සතුව තිබූ බයිසිකලයක් සහ මුදල් තමාට ලබාදී තමාගෙන් බයිසිකල් දෙකක් මිලදී ගත් බවත් කියා සිටින ලදී. එහිදී පැ.978 සහ පැ.979 යන ලේඛනවල ගැනුම්කරු වශයෙන් ද පැ.980 ලේඛනයේ විකුණුම්කරු වශයෙන් ද ජාතික හැඳුනුම්පත් අංක

981460898V යන අංකය සඳහන්ව ඇති බවත් එකී පුද්ගලයාගේ දුරකථන අංකය ලෙස 077-6857700 දුරකථන අංකය එම ලේඛනවල ඇතුළත්ව ඇති බවත් සාක්ෂිකරු කියා සිටින ලදී. තමාගෙන් ප්‍රකාශය ලබා ගන්නා අවස්ථාවේදී යම් ඡායාරූප ප්‍රමාණයක් තමාට පෙන්වා සිටි බවත් එහිදී එම ඡායාරූප දෙකකින් එම පුද්ගලයන් දෙදෙනාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දී 2020.11.26 වන දින එම ඡායාරූපයෙහි තම අත්සන තබා හඳුනාගත් බවත්ද කියා සිටින ලදී. එකී ඡායාරූප පිළිවෙලින් පැ.981 සහ පැ.982 වශයෙන් සලකුණු කරන ලදී. එසේම පැ.978, පැ.979, පැ.980 යන කුවිතාන්සිවල තම ආයතනය සතුව තිබූ කුවිතාන්සි පොත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදුන් බවත් ඔවුන් වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා හරස් ප්‍රශ්න විමසන ලද අතර, පැ.981, පැ.982 යන ඡායාරූපවල සිටින පුද්ගලයා 2020.10.09 වන දින සිට රක්ෂණාගාරයේ සිටි බවත් ඔහුගේ ඡායාරූප 2020.11.26 වන දින හඳුනාගත් බවටත් දෙන ලද සාක්ෂි අසත්‍යක් බවට යෝජනා වූ අතර එම යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී. එසේම පැ.978, පැ.979, පැ.980 යන කුවිතාන්සිවල අත්සන සිය සහෝදරියගේ බවත් කියා සිටි සාක්ෂිකරු එම අත්සන්වල වෙනසක් තිබෙන්නේ යන යෝජනාවද ප්‍රතික්ෂේප කර ඇත.

05 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් විසින්ද මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර ඇති අතර, අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේදී දෙදෙනෙක් පෙන්වා ඔවුන්ගේ ඡායාරූපවලට අත්සන් ගත්තේය යනුවෙන් ඔහු කල යෝජනාව ප්‍රතික්ෂේප කර ඇති අතර තමාට බොරුවක් කීමට අවශ්‍යතාවයක් නොමැති බවද සාක්ෂිකරු කියා සිටින ලදි.

මෙම සාක්ෂිකරුව 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් ද හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇති අතර එහිදී පිළිතුරු වශයෙන් පොලිසියටත් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවටත් ප්‍රකාශ කිහිපයක් ලබා දුන් බවටත් එහිදී යතුරුපැදිය මිලදී ගැනීමට පැමිණි දෙදෙනාගෙන් මල්ලීව හඳුනාගැනීමට හැකියාව ඇතත් අයියාව හඳුනා ගැනීමට නොහැකි බවටත් ප්‍රකාශයක් කළේද යන්න තමාට මතක නැති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රශ්න කිරීම පිපිරීමට පෙර සිදු කළ බවත්, පිපිරීමෙන් පසුව රූපවාහිනි දර්ශන මගින්ද හඳුනාගත් බව කියා සිටින ලදී.

නැවත ප්‍රශ්න වලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී පුද්ගලයන් කිහිප දෙනෙකු දුටු බවත් එයින් ඡායාරූපයේ පෙන්වන ලද අයවලුන් හඳුනාගත් බවත්, 2019.04.19-2019.04.20 දින ප්‍රකාශ ලබාදෙන අවස්ථාවේදී කිසිවෙකු එම ස්ථානයේ නොසිටි බවත් කියා සිටින ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වා යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, වර්ෂ 2018 මැයි මස 25 වන දින තමා කල්පිටියේ සිට තමා පදිංචිය සිටි කඳාන ප්‍රදේශයට බස් රතයකින් පැමිණෙමින් සිටියදී පාලවිය හන්දියේ දී බස් නතර කරන ස්ථානයේ කඩයක් අසල දී තමාගේ ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය සහ බැංකු කාඩ්පත් ද තිබූ සිය මුදල් පසුම්බිය නැති වූ බවත් තමා ඒ පිළිබඳව ඊට පසුදිනම කඳාන පොලිසියට පැමිණිල්ලක් කොට නව හැඳුනුම්පතක් සහ රියදුරු බලපත්‍රයක් ද ලබා ගත් බවත් කියා සිටින ලද අතර තමා කිසිදු දිනයකදී අනුසර මෝටර්ස් යන ආයතනයෙන් යතුරු පැදි මිලදී ගෙන නොමැති බවත් කිසිම විටෙක ලියාපදිංචි අංක WP-BCQ-0304 සහ WP-BCY-2183 දරන යතුරුපැදි මිලදී ගැනීමක් හෝ තමාගේ නමින් ලියාපදිංචි කර ගැනීමක් සිදුකර නොමැති බවත් කියා සිටින ලද අතර 2020 ජනවාරි මස 24 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් තමාගේ මුදල් පසුම්බිය හඳුනාගත් බවත් කියා සිටින ලද අතර එය නාවලපිටියේ පුද්ගලයන් දෙදෙනෙකු ළඟ තිබී සොයාගත් බවත් තමාට දැනගන්නට ලැබුණු බවත් කියා සිටින ලද අතර, පැමිණිල්ල විසින් එම අවස්ථාවේදී මාවනැල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේදී 11330/18 දරන නඩුවට අදාළ පාර්සලයක ඇතුලත් නඩු භාණ්ඩ පාර්සලය තුළ තිබූ මුදල් පසුම්බියක් සාක්ෂිකරුට පෙන්වා සිටි අතර එය තමාගේ නැතිවූ මුදල් පසුම්බිය බවට සාක්ෂිකරු හඳුනා ගන්නා ලදී. එකී මුදල් පසුම්බිය පැ. 984

වශයෙන් සලකන ලබන අතර එහි තිබූ සාක්ෂිකරු විසින් තමාගේ යයි හඳුනා ගන්නා ලද NDB කාඩ්පත පැ.985 වශයෙන් සලකුණු කරන ලදී. ඒ තුළ තිබූ සම්පත් බැංකුව සහ කොමර්ෂල් බැංකුවේ කාඩ්පත් දෙකක් පිළිවෙළින් පැ.986 සහ පැ.987 වශයෙන් සලකුණු කරන ලද අතර ඒවා තමාට අයත් බැංකු ගිණුම්ද නිශ්චිතව කීමට නොහැකි බව කියා සිටින ලදී. එකී මුදල් පසුම්බිය තුළ තිබූ 2019 අප්‍රේල් 21 දිනට අදාළ අංක 374434 දරන ඇදිරිනීති බලපත්‍රය තමාගේ නමින් නිකුත් කර තිබුනද පාස්කු ප්‍රහාරය සිදු වූ එදින සහ එදින සිටම දින තුනක් තමා සිටියේ තමාගේ නිවසෙ බවත් එහි ඇති ජාතික හැඳුනුම්පත තමාගේ 2018 මැයි 25 නැතිවූ හැඳුනුම්පතේ අංකයට සහ තමාගේ නමට WP PH 7194 දරන වාහනය සඳහා නිකුත් කරන ලද ඇදිරිනිති බලපත්‍රය තමා විසින් ලබාගන්නා ලද එකක් නොවන බවත් එවැනි වාහනයක් තමා සතුව නොතිබූ බවත් සාක්ෂිකරු කියා සිටින ලදී. සාක්ෂිකරුට 2018 මැයි 25 දිනය මතක තිබෙනුයේ මැයි මස 25 වන දින තමාගේ උපන්දිනය යෙදී තිබුණ නිසා බවත් වැඩිදුරටත් කියා සිටින ලදී.

04 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා මෙම සාක්ෂිකරුගෙන් ඔහුට පෙන්වන ලද පැ.984 දරන මුදල් පසුම්බිය සමග ඇති ද්‍රව්‍ය මොනවාද යන්න පමණක් විමසා සිටින ලදී. මෙම සාක්ෂිකරුගෙන් අනෙකුත් කිසිදු චූදිතයෙකු විසින් හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

විශ්ලේෂනය

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.1897 ප්‍රධාන පොලිස් පරික්ෂක සොයිසා යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ..... දින වන විට ඔහු නාවලපිටිය පොලිසියේ ස්තානාධිපති ව සිටිය දී ඔහුට ලද තොරතුරක් අනුව පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු නාවලපිටිය ප්‍රදේශයේ කඩයක් තුල සැගවී සිටින බවට හෙලි වීමෙන් පසු මෙම නඩුවේ 4 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා සහ 5 වූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් යන අයව අත් අඩංගුවට ගත් බවත් එම අවස්ථාවේ 05 වූදිත සන්තකයේ තිබී පැ.984 දරන මුදල් පසුම්බිය හමු වූ බවත් පවසා සාක්ෂි ලබා දී ඇති පසුබිම තුල පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී අස්ථාන ගත වී තිබූ මෙම පැමිණිල්ලේ සාක්ෂි අංක - 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වා යන සාක්ෂිකරු ට අයත් නැති වී තිබූ පැ.984 දරන මුදල් පසුම්බිය ඉහත කී වූදිතයින් අතට පත් වූයේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් කිසිදු කරුණක් හෙලි වී නොමැති අතර 4 සහ 5 වූදිතයින් විසින් පැ.984 දරන මුදල් පසුම්බියේ නීත්‍යානුකූල අයිතිකරුව සිට ඇති මෙම සාක්ෂිකරුගෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් අසා නොමැති පසුබිම තුල එම මුදල් පසුම්බිය සම්බන්ධයෙන් එකී වූදිතයින් විත්තිකූඩුවේ සිට මුල් වරට ප්‍රකාශ කර ඇති කරුණු පිලිගැනීමට හැකියාවක් නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 1398 මොහොමඩ් මුස්තාපා හසනුල් බස්රි යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා කාත්තන්කුඩි-

02 ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වන බවත් වර්ෂ 2018 දී ගල්කිස්ස ප්‍රදේශයේ පිහිටි බී.ඕ.අයි.විදේශ ආයතනයකින් **පාලමුණේ කිරිතෝනාර්වත්ත** යන ප්‍රදේශයෙන් අක්කර 42යි පර්චර් 76ක විශාල ඉඩමක් මිලදී ගෙන තිබූ බවත් එහි තිබූ කම්බිවැට ගලවා තහඩුවලින් ආවරණය කර සංවර්ධන කටයුතු කරමින් සිටි බවත් තමා දිනපතා එම ඉඩම බැලීමට ගිය බවත් ඒ අතරතුර 2019 අප්‍රේල් මාසයේ 17 වන දින තමා ඉඩමට යන විට එම ඉඩමේ ස්කූර්ටි මෝටර් සයිකලයක් පිපිරී එහි සැකිල්ල පමණක් ඉතිරිවී තිබූ බවත් තමාගේ ඉඩමේ තහඩු සියල්ල ගැලවී තිබූ බවත් තමා ඒ පිළිබඳව එදිනම පෙරවරු 11.30 ට කාත්තන්කුඩි පොලිසියට ගොස් පැමිණිලි කළ බවත් කියා සිටින ලදී. එසේම තමාගේ පැමිණිල්ල අනුව විශේෂකාර්ය බලකාය සහ පොලිසිය පැමිණ පරීක්ෂා කළ බවත් බයිසිකලයේ ආකාරයේ සැකිල්ලක් සහ පොඩි පොඩි යකඩ බෝල එම ස්ථානයේ විසිරී තිබූ බවත්, කියා සිටින ලද අතර ඒ ආසන්න මීටර් 100ක් පමණ දුරින් හමුදා කඳවුරක්ද ඇති බව කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

<u>විශ්ලේශනය</u>

මෙම පැමිණිල්ලේ සාක්ෂි අංක 1398 හසනුල් බස්රි යන සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ඔහුට අයත්

කාත්තන්කුඩිය පාලමුණේ කිරිතෝනා වත්ත නමැති ඉඩමේ දී 2019.04.18 දින ස්කූටි වර්ගයේ යතුරු පැදියක් පුපුරා යාමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාත්තන්කුඩිය පොලිසියට පැමිණිලි කර ඇති බව සහ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලද නිලධාරින් විසින් එම යතුරුපැදියේ ලියාපදිංචි අංකය WP BCQ-0304 බවට අනාවරණය කරගෙන ඇති බවත්, එම අනාවරණය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමේ දී එම යතුරු පැදිය මෙම නඩුවෙහි පැ. සා. 1394 නිල්මිණි ජයකොඩි යන අයට අයත් බවට අනාවරණය කරගෙන ඇති බව වේ. එම යතුරු පැදි අංකය ඔස්සේ විමර්ශන පැවැත්වීමේදී එම යතුරුපැදිය පැ. සා. 1394 නිල්මිණි ජයකොඩි විසින් පැ.සා.1395 තුෂාර ප්‍රියන්ත පෙරේරා යන අය හරහා පැමිණිල්ලේ සාක්ෂි අංක 1396 අරුණ වික්‍රමසේකර යන අයට අයත් අනුසර මෝටර්ස් ආයතනය වෙත විකිණීම සඳහා ලබාදී ඇති බවත් ඉහත සාක්ෂිවලින් අනාවරණය වී ඇත. එකී අනුසර මෝටර්ස්හි අයිතිකරු වන පැ. සා. 1396 අරුණ වික්‍රමසේකරගේ සාක්ෂියට අනුව ඔහු විසින් එම යතුරුපැදිය සහ තවත් යතුරුපැදියක් 2019.04.19 පුද්ගලයන් දෙදෙනෙකුට පැ.978, පැ.979, පැ.980 යන ලේඛන මත විකුණා ඇති බවට හෙළි වී ඇත. ඒ අතුරින් පැ.978 හි සඳහන් බයිසිකලය වන එනම් ඉහත විමර්ශනයේ දී අනාවරණය වී ඇති පුපුරවා හැර ඇති යතුරුපැදිය වන WP BCQ-0304 හි ගැනුම්කරු වශයෙන් වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී මුදල් පසුම්බිය නැතිවූ පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ්

යසස්ති සිල්වා නැමැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංක 981460898V ලබා දී ඇති බව සාක්ෂිවලින් පෙනී යයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ සාක්ෂියට අනුව ඔහුගේ මුදල් පසුම්බිය වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී නැතිවී ඇති අතර එය ඔහුට ආපසු හමුවී නොමැති අතර එම හැඳුනුම්පත සහ විස්තර ඇතුලත් ඔහුගේ පසුම්බිය මෙම නඩුවේ 04 වන සහ 05 වන චූදිතයින් අත්අඩංගුවට ගත් අවස්ථාවේදී 05 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් නැමැත්තා සන්තකයේ තිබී ඔවුන් අත්අඩංගුවට ගත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1897 එවකට නාවලපිටිය පොලිසියේ ස්ථානාධිපතිව සිටි පොලිස් පරික්ෂක සුජීව ද සොයිසා විසින් තම භාරයට ගෙන ඇති බව හෙළි වී ඇත. ඒ අනුව පෙනී යන්නේ පාලමුණේ කිරිතෝනා වත්තේ දී පුපුරවා හරින ලද WP BCQ-0304 දරන බයිසිකලය මිලදි ගැනීම සඳහා සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ නැතිවූ හැඳුනුම්පත උපයෝගී කරගෙන ඇති බවයි. එකී සාක්ෂි අංක 1397 ජෙරාඩ් යසස්ති සිල්වාගේ සාක්ෂියට අනුව ඔහු කිසිදු දිනයකදී අනුසර මෝටර්ස් යන ආයතනයෙන් යතුරු පැදි මිලදී ගෙන නොමැති බව හෙලිවන අතර ඔහු කිසිම විටෙක ලියාපදිංචි අංක WP-BCQ-0304 සහ WP-BCY-2183 දරන යතුරුපැදි මිලදී ගැනීමක් හෝ ඔහුගේ නමින් ලියාපදිංචි කර ගැනීමක් සිදුකර නොමැති බවට සාක්ෂි ලබා දී ඇති පසුබිම තුල පැ.984 ලෙස ලකුණු කර ඇති ඔහුගේ නැතිවූ මුදල් පසුම්බිය

නාවලපිටිය ප්‍රදේශයේ දී අත් අඩංගුවට පත් 05 වූදිත සාහිඩ් අබ්දුල් හක් යන අය සන්තකයේ තිබී පැසා.1897 ප්‍රධාන සොයා ගැනීම තුළින් එය 05 වූදිතට එරෙහිව ප්‍රබල පරිවේශණීය සාක්ෂියක් ලෙස ඉදිරිපත් වී ඇති බව අපහට පෙනී යයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 2302 අබුසාලි මොහොමඩ් නිලාම් යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා රැකියාව වශයෙන් භාවිතා කළ මෝටර් සයිකල් මිලදී ගෙන ඒවා අලුත් වැඩියා කොට විකිණීම් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත්, වර්ෂ 2018.12.27 දින ලියාපදිංචි අංක NWBAQ 2008 දරන බජාජ් පල්සර් 135 වර්ගයේ බයිසිකලයක් රුපියල් 120, 000.00 කට කොළඹ 10 සද්ධර්ම මාවතෙහි පදිංචි කාලිත් සමීර් යන අයට විකුණූ බව කියා සිටිමින්, මීට පෙර අවස්ථාවකදී අධිකරණයේ සලකුණු කර ඇති X(02) දරන බිල්පත එකී විකිණීමට අදාළ බිල්පත ලෙස හඳුනාගන්නා ලදී. කාලිද් සමීර් යනු මෙම නඩුවේ 11 වන වූදිත වන බවට විවෘත අධිකරණයේදී හඳුනාගත් සාක්ෂිකරු X(02) බිල්පත අනුව ඔහුගේ දුරකතන අංකය 076-6355299 බවත් ජාතික හැඳුනුම්පත් අංකය 951404276V බවත්, බිල්පත ඔහුගේ අත්අකුරින්ම ලියා තිබූ බවත් කියා සිටින ලදී.එම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

විශ්ලේශනය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් මෙම නඩුවේ 11 වූදිත වන හුසේයිනුල් රිස්වි කාලිද් සමීර් විසින් වර්ෂ 2018.12.27 දින ලියාපදිංචි අංක NWBAQ 2008 දරන බජාජ් පල්සර් 135 වර්ගයේ බයිසිකලයක් රුපියල් 120, 000.00 කට මිලදී ගෙන ඇති බවට පමණක් හෙලි වන අතර 11 වූදිත විසින් ගල්කිස්ස අතිරේක මහේශ්ට්‍රාත් චන්ඩිම ලියනගේ මැතිටුමාහට ලබා දී ඇති ද

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමක් සිදුකර නොමැති බැවින් මෙම සාක්ෂිකරු එලෙස ලබා දුන් සාක්ෂිය අවිවාදයෙන් මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත. මෙම සාක්ෂිය මෙම නඩුව සම්බන්ධයෙන් කවර ආකාරයෙන් වැදගත් වන්නේ ද යන්න සම්බන්ධයෙන් කරුණු පරික්ෂාකර බැලීමේ දී පෙනී යන්නේ මෙම නඩුවේ 11 වූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින් ගල්කිස්ස මහේස්ත්‍රාත් චන්දිම ලියනගේ මහතාට 2020-6-25 දින ලබා දී ඇති පැ.165 ලෙස ලකුණු කර ඇති අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127(1) වගන්තිය ප්‍රකාරව වාර්ත කර ඇති ප්‍රකාශයේ සඳහන් දරන මෙම නඩුවේ ඉදිරිපත් වූ සමස්ත සාක්ෂි පරික්ශා කිරීමෙන් පසුව තීරණය කලයුතු වේ.

පැ.සා.1395, පැ.සා.1396, පැ.සා.1397, පැ.සා.1398

සාක්ෂි විශ්ලේෂණය

පැමිණිල්ලේ සාක්ෂි අංක 1398 හසනුල් බස්රිගේ සාක්ෂි අනුව ඔහුට අයත් කාත්තන්කුඩිය පාලමුණේ කිරිකෝනා වත්තේ දී 2019.04.18 දින ස්කූටි වර්ගයේ යතුරු පැදියක් පුපුරා යාමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාත්තන්කුඩිය පොලිසියට පැමිණිලි කර ඇත. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලද නිලධාරින් විසින් එම යතුරු පැදිය ලියාපදිංචි අංකය අනාවරණය කරගෙන ඇති අතර, එම යතුරුපැදියේ ලියාපදිංචි අංක WP BCQ-0304 බවට අනාවරණය කරගෙන ඇති අතර එම අනාවරණය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමේ දී එම යතුරු පැදිය නිල්මිණි ජයකොඩි අයත් බවට අනාවරණය වී ඇත. එම යතුරු පැදි අංකය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමේදී එම යතුරුපැදිය නිල්මිණි ජයකොඩි විසින් පැ.සා.1395 තුෂාර ප්‍රියන්ත යන අය හරහා පැමිණිල්ලේ සාක්ෂි අංක 1396 අරුණ වික්‍රමසේකරට අයත් අනුසර මෝටර්ස් වෙත විකිණීම සඳහා ලබා දී ඇති බවත් ඉහත සාක්ෂිවලින් අනාවරණය වේ. අනුසර මෝටර්ස් හි අයිතිකරු වන 1396 අරුණ වික්‍රමසේකරගේ සාක්ෂියට අනුව ඔහු විසින් එම යතුරුපැදිය සහ තවත් යතුරුපැදියක් ඔහු විසින් 2019.04.19 පුද්ගලයන් දෙදෙනෙකුට පැ.978, පැ.979, පැ.980 යන ලේඛන මත විකුණා ඇත. ඒ අතුරින් පැ.978 හි සඳහන් බයිසිකලය වන එනම්

විමර්ශනයේ දී අනාවරණය වී ඇති පුපුරා ගිය යතුරුපැදිය වන WP BCQ-0304 හි ගැනුම්කරු වශයෙන් වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී මුදල් පසුම්බිය නැතිවූ පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ ජාතික හැඳුනුම්පත් අංක 981460898V ලබා දී ඇති බව සාක්ෂිවලින් පෙනී යයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ සාක්ෂියට අනුව ඔහුගේ මුදල් පසුම්බිය වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී නැතිවී ඇති අතර එය ඔහුට ආපසු හමුවී නොමැති අතර එම හැඳුනුම්පත සහ විස්තර ඇතුලත් ඔහුගේ පසුම්බිය එම නඩුවේ 04 වන සහ 05 වන විත්තිකරුවන් අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඔවුන් සන්තකයේ තිබී ඔවුන් අත්අඩංගුවට ගත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1897 එවකට නාවල පිටිය පොලිසියේ ස්ථානාධිපතිව සිටි පොලිස් පරීක්ෂක සුජීව ද සොයිසා විසින් තම භාරයට ගෙන ඇත. ඒ අනුව පෙනී යන්නේ පාලමුණේ කිරිකෝනාර් වත්තේ දී පුපුරවා හරින ලද WP BCQ-0304 දරන බයිසිකලය මිලදී ගැනීම සඳහා වෙනත් පුද්ගලයෙකුට අයත් නැතිවූ හැඳුනුම්පතක් උපයෝගී කරගෙන ඇති බවයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 836 ශ්‍රී කාර්තිගේන් සුකුමාරන් යන සාක්ෂිකරු 2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා කොළඹ 11, බංගසාල

වීදියේ, නො.141 හි Glochem නමින් රසායන ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත් විකුණන රසායනික ද්‍රව්‍ය අතර හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ්, සල්ෆියුරික් ඇසිඩ්, නයිට්‍රික් ඇසිඩ් යන ඇසිඩ් වර්ගද තොග සහ සිල්ලරට විකුණන බවත් කියා සිටින ලදී. එම සාක්ෂිකරුට අංක 12715 දරන බිල්පත සහ එයට අමුණා ඇති තවත් ඉන්වොයිස් පත්‍රය පිළිවෙළින් පැ.990 ලෙසත් සහ පැ.991 ලෙසත් සලකුණු කර පෙන්වා සිටින ලද අතර එහිදී එම පැ.990 දරන 2019.03.01 දින සහ අංක 12715 බිල්පත අනුව සල්ෆියුරික් ඇසිඩ් කිලෝ 40 කෑන් 5ක් විකුණා ඇති බව කියා සිටින ලදී. පැ.991 දරන ඉන්වොයිස් පත්‍රය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එහි අංකය 286103 බවත් දිනය 2019.03.02 වන දින බවත් ඒ අනුව කොළඹ 11, සී ස්ට්‍රීට් අංක 109, දරන ස්ථානයේ පිහිටි නව්චන්ද්‍රා යන ආයතනයට විකුණා ඇති බවත් කියා සිටින ලද අතර තමා විකුණන ලද සල්ෆියුරික් අඩංගු සුදු පාට කෑන් සහ සමන්තුරේ උසාවියේදී හඳුනාගත් බවත් එහි ඇති ලේබලය සහ ‘‘ප්‍රඩක්ට් කෝඩ්’’ එක සහ ‘‘බැච් නම්බර්’’ අනුව ඒවා තමාගේ බවට සමන්තුරේ උසාවියේදී හඳුනාගත් බවත් කියා සිටින ලදී. අම්පාර මූලස්ථාන පොලිසියේ පීඅාර් 508/2019 දරන නඩු භාණ්ඩ සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එහි ඇති කෑන් කිලෝ 40 සල්ෆියුරික් කෑන් බවටත් එහි ඇති කාණ්ඩ අංකය වන එස්.ඒ.1225 හඳුනාගන්නා ලදී. එම හඳුනාගන්නා ලද සල්ෆියුරික් කෑන් එක පැ.992 වශයෙන් සලකුණු කරන ලද අතර ඉහත නඩු භාණ්ඩ අතර තිබූ කෑන් ද පිළිවෙළින් පැ.993,

පැ.994, පැ.995, පැ.996 සලකුණු කරන ලදී. එම සල්ෆියුරික් ඇසිඩ් විකුණන ලද දිනය 2019 මාර්තු 01 වන දා බවත් ඒ වන විට ඒවා විකිණීම සඳහා බලපත්‍රයක් අවශ්‍යව නොතිබූ අතර පාස්කු ප්‍රහාරයෙන් පසුව ඒ සඳහා රෙගුලාසි පැනවූ බවත් සල්ෆියුරික් ඇසිඩ් වල පි.එච්. අගය ඉතා අඩු බැවින් එය සමට හානි කාරක බවත් කියා සිටින ලදී. එම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

<u>විශ්ලේශනය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් හෙලි වන පරිදි පැ.990 දරන 2019.03.01 දින සහ අංක 12715 බිල්පත අනුව සල්ෆියුරික් ඇසිඩ් කිලෝ 40 කෑන් 5ක් විකුණා ඇති බව පෙනී යන අතර පැ.991 දරන එමෙන් ම අංකය 286103 දරන ඉන්වොයිස් පත්‍රය අනුව 2019.03.02 වන දින කොළඹ 11, සී ස්ට්‍රීට් අංක 109, දරන ස්ථානයේ පිහිටි නව්චත්‍රා යන ආයතනයට කිලෝ 35 ක් නයිට්‍රික් ඇසිඩ් කෑන් දහයක් විකුණා ඇති බව පෙනී යන අතර ඔහු විකුණන ලද සල්ෆියුරික් අඩංගු සුදු පාට කෑන් එහි ඇති ලේබලය සහ ‘‘ප්‍රඩක්ට් කෝඩ්’’ එක සහ ‘‘බැච් නම්බර්’’ අනුව ඔහුගේම ඒවා බවට සමන්තුරේ උසාවියේදී හඳුනාගෙන ඇති අතර ඒවා මෙම අධිකරනයේ දී ද හඳුනා ගැනීම මත පැ.992 පැ.993, පැ.994, පැ.995, පැ.996 සලකුණු කර ඇති පසුබිම තුල එම ඇසිඩ් අඩංගු කෑන් සොයාගෙන ඇත්තේ .....ප්‍රදේශයේ පිහිටි සැකකටයුතු නිවසේ සගවා තිබී වීම තුළින්

සහ ඒවා සමගම ..... යන ද්‍රව්‍යය ද සොයා ගෙන තිබීම තුළින් ද ඒවා පරීක්ෂාවට ලක් කර ඇති රජයේ රස පරීක්ෂක..... යන අයගේ සාක්ෂිය තුළින් ද හෙලිවන්නේ.....

එසේම ඒවා ..... සිට, , , , ප්‍රදේශය ට ප්‍රවාහනය කර ඇත්තේ ..... වීම තුළින් ඒවා බෝම්බ සෑදීම සඳහා උපයෝගී කරගෙන ඇති බව මනාව පහැදිලි වේ.

සාක්ෂි අංක 834 වෛරවන් වෛත්‍යලිංගම් යන සාක්ශිකරුගේ සාක්ශියට අනුව ඔහු කොළඹ 12 මධයම පාරේ පිහිටි අලගේසන් ට්‍රේඩර්ස් ආයතනයේ සේවය කරන බවත් එම ආයතනය මගින් ආසිඩ් වර්ග සහ ක්ලෝරීන් ඇතුළු ද්‍රව්‍ය විකිණීම කරන බවත් පවසා 2019-3-01 දින කොළඹ 11 හෙට්ටිවීදියේ පිහිටි නව්චත්‍රා යන කඩයට කිලෝ 35 නයිට්‍රික් ඇසිඩ් කෑන් 10 ක් රු 37, 000.00 කට විකිණූම කර ඇති බවට පැ.997 දරණ බිල්පත් පරීක්ෂා කරමින් සාක්ෂි ලබා දී ඇත.මෙම සාක්ෂිකරු පැ.977 ලෙස ලකුණු කර ඇති කිලෝ 35 නයිට්‍රික් ඇසිඩ් කෑන් එක ද පැ.998, පැ.999 සහ පැ.1000 ලෙස ලකුණු කර ඇති නයිට්‍රික් ඇසිඩ් කෑන් ද හඳුනා ගෙන සාක්ෂි ලබා දි ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් ද සියලුම චූදිතයින් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට පවසා ඇත,

<u>විශ්ලේශනය</u>

මෙම සාක්ෂිකරු මගින් ලකුණු කර ඇති 2019-3-01 දින කොළඹ 11 හෙට්ටිවීදියේ පිහිටි නව්චත්‍රා යන කඩයට ලබා දී ඇති කිලෝ 35 හේ නයිට්‍රික් ඇසිඩ් කෑන් 10 ක් රු 37, 000.00 කට විකිනීම කර ඇති බවට පැ.997 දරණ බිල්පත තුළින් ද පැ.977 පැ.998, පැ.999 සහ පැ.1000 ලෙස ලකුණු කර ඇති කිලෝ 35 නයිට්‍රික් ඇසිඩ් කෑන් ඔහු හදුනා ගැනීම තුළින් ද පැමිණිල්ලේ සාක්ෂි අංක - 836 ශ්‍රී කාර්තිගේන් සුකුමාරන් යන සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය මනාව තහවුරු වේ. ඒ අනුව පාස්කු ප්‍රහාරය සඳහා නයිට්‍රික් අම්ලය සහ යූරියා නැමැති රසායනික ද්‍රව්‍ය සමග ප්‍රතික්‍රියා කිරීමෙන් සාදා ගනු ලබන යූරියා නයිට්‍රේට් යන අධිබලැති පුපුරන ද්‍රව්‍ය භාවිතා කර ඇති බව අනාවරණය වී ඇත.

පැ.සා. අංක 1298 සින්නයියා ඥානසීදන් සාක්ෂි දෙමින්, තමා කොළඹ හෙට්ටිවීදියේ නිව් නව්චත්‍රා යන නමින් රන් ආභරණ සෑදීම සඳහා ගන්නා උපකරණ සහ ඒ සඳහා භාවිතා කරනු ලබන නයිට්‍රික් ඇසිඩ් විකිණීම කරනු ලබන ව්‍යාපාරයක රැකියාව සිදුකළ බවත් එය දැනට මිය ගොස් සිටින ශංකර් නැමති අයෙකුට අයත්ව තිබූ බවත් කියා සිටින ලදී. එම ආයතනය විසින් විකිණීම සිදු කරනු ලබන අවස්ථාවන්වලදී එය කිලෝග්‍රෑම් වශයෙන් විකුණන අතර, මෙම නඩුවේ 19 වන චූදිත වන තමා හඳුනන ගනුදෙනු කරුවකු වන කව්වි මොහොම්මදු මොහොම්මදු ජෙම්සිත් යන අයට නයිට්‍රික් ඇසිඩ් විකුණූ බවත් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව විසින් තමාගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත්, කියා සිටින ලද අතර එසේම එම විකුණන ලද නයිට්‍රික් අම්ලය කිලෝ 35ක කළු පැහැති කෑන්වලින් පැවතුණු බවත් කියා සිටින ලද අතර ඒ වන විටත් පැ.997 ලෙස ලකුණු කර තිබූ අදාළ නඩු භාණ්ඩය හඳුනාගන්නා ලදී.

එම සාක්ෂිකරුගෙන් 19 යන චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතීඥ මහතා (01, 02, 07, 08, 10, 15, 18, 19 විත්තිකරුවන්ගේ නීතීඥ කනිල් මද්දුමාගේ මහතා) විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු කියා සිටියේ වර්ෂ 2019 වන විට 19 වන චූදිත අවුරුදු 3-4ක පමණ කාලයක් කඩයට පැමිණෙන බව කියා ඇති බවත්, ඔහු විටින් විට පැමිණ ව්‍යාපාර කටයුතු සිදුකළ බවත්, ඔහු අවසාන වතාවට එනම් 2019.05.11 වන දින තමා පොලිසියට ප්‍රකාශයක් ලබා දීමට පෙර පැමිණියේ කවදාද යන්න තමාට මතක නැති බවත් ය. ජෙම්සිත් යන අය රන්කරුවෙක් නැතහොත් රත්‍රන් ආශ්‍රිතව වැඩකරන අයෙකු යනුවෙන් ඔහු තමාට කියා සිටි බවත්, පැ.977 දරන කිලෝ 35 අඩංගු කළ හැකි නයිට්‍රික් ඇසිඩ් කෑනය තමා හඳුනාගත් බවත් කියා සිටින ලදී. හින්දු භක්තිකයන් අක්ෂෙ ත්‍රිදෙ යන දිනයේ දී සාමාන්‍යයෙන් රත්‍රන් බඩු ගැනීම සඳහා වැඩි නැඹුරුවක් ඇති බවද කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුගෙන් අනිකුත් චූදිතයින් වෙනුවෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නොමැත.

විශ්ලේෂණය

මෙම සාක්ෂියෙන් හෙළි වන්නේ 19 වන විත්තිකරු විසින් නව්චත්‍රා යන ආයතනයෙන් නයිට්‍රික් ඇසිඩ් මිලදී ගෙන ඇති බවයි. හබයකට ලක්වී නැති පැමිණිල්ලේ සාක්ෂි අංක 834 වෛරවන් වෛත්‍ය ලිංගම්ගේ සාක්ෂිය වන නයිට්‍රික් අම්ලය කිලෝග්‍රෑම් 350ක් නව්චත්‍රා ආයතනයට විකිණීම අනාවරණය වී ඇති අතර නව්චත්‍රා ආයතනයෙන් 19 වන චූදිත ජෙම්සිත් විසින් එකී නයිට්‍රික් අම්ලය මිලදී ගෙන ඇති බව පැහදිලි වේ.

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් රජයේ රස පරීක්ෂක නිලධාරීන් කිහිප දෙනෙකුගේම සාක්ෂි සහ ඔවුන්ගේ වාර්තා මගින් පාස්කු ප්‍රහාරය සඳහා නයිට්‍රික් අම්ලය සහ යූරියා නැමති රසායනික ද්‍රව්‍ය සමග ප්‍රතික්‍රියා කිරීමෙන් සාදා ගනු ලබන යූරියා නයිට්‍රේට් යන අධිබලැති පුපුරන ද්‍රව්‍ය භාවිතා කර ඇති බව අනාවරණය වී ඇත.

පැ.සා. අංක 1331 නත්තර් කාජා මොහිදීන් සාක්ෂි දෙමින්, තමා කොළඹ 11 හෙට්ටිවීදියේ අංක 162 දරන ස්ථානයේ ‘‘සලවතුල්ලා මාලිගෙ’’ නමින් ආභරණ සෑදීම සඳහා ගනු ලබන සහ රසායන ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත්, තමා විකුණන භාණ්ඩ අතර නයිට්‍රික් ඇසිඩ්ද අඩංගු වන බවත් ද කියා සිටින ලදී. තමන් විසින් විකුණන ලද භාණ්ඩ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තමාගෙන් ප්‍රකාශ සටහන් කරගත් අතර එම අවස්ථාවේ දී එක්ක ගෙන ඇවිත් පෙන්වන ලද පුද්ගලයා එම ප්‍රකාශයට

අදාළ භාණ්ඩ විකුණන ලද පුද්ගලයා බවත් එම කාලය තුළ මාස 6ක් අවුරුද්දක් පමණ කාලයක එනම් 2018 -2019 කාලයක සිට භාණ්ඩ මිලදී ගැනීම සඳහා පැමිණි බවත් කියා සිටින ලදී. ඔවුන් අවසාන වශයෙන් භාණ්ඩ මිලදී ගත් දිනය සිකුරාදා දිනයක් බවත් තමා පල්ලි යාමට සූදානමින් සිටි බැවින් බිල්පත්‍රයක් නිකුත් කිරීමකින් තොරව නයිට්‍රික් ඇසිඩ් කිලෝ 35 කෑන් දෙකක් හෝ තුනක් ඔහුට දුන් බවත් කියා සිටින ලදී. එසේම අධිකරණයේ සිටින විත්තිකරුවන් අතරින් 19 වන විත්තිකරුව සාක්ෂිකරු හඳුනා ගන්නා ලද අතර එම චූදිත වරින් වර පැමිණ රත්‍රන් උණු කිරීම අවශ්‍ය ද්‍රව්‍ය සහ රත්‍රන් භාණ්ඩ සැකසීම සඳහා අවශ්‍ය උපකරණ නිතර නිතර මිලදී ගැනීම හේතුකොට ගෙන ඔවුන්ව සාමාන්‍ය ගනුදෙනුකරුවන් ලෙස සළකා භාණ්ඩ ලබාදෙන බවත් නයිට්‍රික් ඇසිඩ් ප්‍රවේසමෙන් පරිහරණය කළ යුතු රසායන ද්‍රව්‍යයක් බවත්, කියා සිටින ලදී. මෙම සාක්ෂිකරු විසින් ද පැ.977 දරන නඩු භාණ්ඩය වන කෑනය හඳුනාගෙන ඇත.මෙම සාක්ෂිකරුගෙන් විත්තිය වෙනුවෙන් (01, 02, 07, 08, 10, 15, 18, 19 විත්තිකරුවන්ගේ නීතීඥ කනිල් මද්දුමාගේ මහතා) හරස් ප්‍රශ්න විමසීමේ දී 19 වන චූදිත නමින් නොහඳුනන බවත්, තමාගේ ප්‍රකාශය ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශය 2019.10.31 දිනද යන්න තමාට අමතක බවත් කියා සිටින ලදී. තමා 19 වන චූදිතව නමින් හඳුනන්නේ නැති වුවද මෙම සාක්ෂියට අදාළ මිලදී ගැනීමේ කාලය වන විට මාස දෙකු තුනකට වරක් පැමිණ උපකරණ මිලදී ගෙන ගොස්

තිබූ බැවින් ඔහුට භාණ්ඩ ලබා දුන් බවත් කියා සිටින ලද අතර ඊට පෙර 19 වන චූදිත නයිට්‍රික් ඇසිඩ් මිලදී ගෙන නොතිබූ බවත් කියා සිටින ලද අතර ඊට පෙර සිටම නයිට්‍රික් ඇසිඩ් මිලදී ගත්තේය යන යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත. එසේම ඔහු පුත්තලම ප්‍රදේශයේ තම වැඩපල පවත්වා ගෙන යන බව කියා සිටි අතර එදින සිකුරාදා දිනයක් බවත් තමා පල්ලි යාමට සූදානම් වූ අවස්ථාවේ දී මොහු පැමිණි බැවින් බිල්පත්‍රයක් නිකුත් නොකළ බවත් කියා සිටින ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළි වන්නේ 19 වන චූදිත විසින් නයිට්‍රික් ඇසිඩ් මෙම සාක්ෂිකරුගේ වෙළඳසැලෙන් ද ලබාගෙන ඇති බවයි. නමුත් ඊට පෙර අවස්ථාවලදී 19 වන චූදිත එම වෙළඳසැල සමග ගනුදෙනු කර තිබුනද ඔහු නයිට්‍රික් ඇසිඩ් මිලදී ගත් පළමු අවස්ථාව එය වන බවත් ය. මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් රජයේ රස පරීක්ෂක නිලධාරීන් කිහිප දෙනෙකුගේ ම සාක්ෂි සහ ඔවුන්ගේ වාර්තාවන්වල (සලකුණු කරන ලද රස පරීක්ෂක වාර්තා ඇතුළත් කරන්න.) මගින් පාස්කු ප්‍රහාරය සඳහා නයිට්‍රික් අම්ලය සහ යූරියා නැමති රසායනික ද්‍රව්‍ය සමග ප්‍රතික්‍රියා කිරීමෙන් සාදා ගනු ලබන යූරියා නයිට්‍රේට් යන අධිබලැති පුපුරන ද්‍රව්‍ය භාවිතා කර ඇති බව අනාවරණය වී ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක - 2302 අබුකලි මොහොමඩ් නිලාම්2026.07.14 දින සාක්ෂි දෙමින්, තමා රැකියාව වශයෙන් භාවිතා කළ මෝටර් සයිකල් මිලදී ගෙන ඒවා අලුත් වැඩියා කොට විකිණීෆම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බවත්, වර්ෂ 2018.12.27 දින ලියාපදිංචි අංක NWBEQ 2008 දරන බජාජ් පල්සර් 135 වර්ගයේ බයිසිකලයක් රුපියල් 120000කට කොළඹ 10 සද්ධර්ම මාවතෙහි පදිංචි කාලිත් සමීර් යන අයට විකුණූ බව කියා සිටිමින්, මීට පෙර අවස්ථාවකදී අධිකරණයේ සලකුණු කර ඇති X(02) දරන බිල්පත එකී විකිණීමට අදාළ බිල්පත ලෙස හඳුනාගන්නා ලදී. එකී බිල්පත පැ.989 වශයෙන් සලකුණු කරන ලදී.

කාලිද්සමීර් යනු මෙම නඩුවේ 11 වන චූදිත වන බවට විවෘත අධිකරණයේදී හඳුනාගත් සාක්ෂිකරු X(02) බිල්පත අනුව ඔහුගේ දුරකතන අංකය 076-6355299 බවත් ජාතික හැඳුනුම්පත් අංකය 951404276V බවත්, බිල්පත ඔහුගේ අත්අකුරින්ම ලියා තිබූ බවත් කියා සිටින ලදී. එම සාක්ෂිකරුගෙන් කිසිදු විත්තිකරුවෙකු හරස් ප්‍රශ්න විමසීමක් සිදුනොකරන ලදී.

<u>විශ්ලේෂණය</u>

මෙම නඩුවේ සාක්ෂිවලින් 11 වන විත්තිකාර කාලිද් සමීර් යන අයට මෙම නඩුවේ පළවන චෝදනාවේ නම් සඳහන් ස්වයංසාතක

බෝම්බකරුවකු වන මොහොමඩ් සහරාන් විසින් යතුරු පැදියක් මිලදී ගැනීමට සලස්වා ඇතිබව හෙළි වී ඇත. එම යතුරුපැදිය මිලදී ගැනීම 11 වන විත්තිකාර කාලිද් සමීර්විසින් ඔහුගේ නමින් සහ ජාතික හැඳුනුම්පත් අංකය බිල්පතට ඇතුළත් කර මිලදී ගත් බව මෙම සාක්ෂියෙන් තහවුරු වේ.

<u>විමර්ශන නිළධාරීන්ගේ සාක්ෂි විශ්ලේශනය කර ඇගැයීමට ලක් කිරීම</u>

අප විසින් මෙම තීන්දුව සකස් කිරීමේ දී මෙම නඩුවට පාදක වන 2019-4-21 වන පාස්කු ඉරිදා දිනයේ උදෑසන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, මඩකලපුව සියෝන් දේවස්ථානය යන දේවස්ථාන වල මෙන් ම එදිනම එම වේලාවන් තුළ දීම මෙරට ප්‍රධාන පෙලේ හෝටල් තුනක් වන කොළඹ කොටුව පිහිටි කිංග්ස්බරි හෝටලය, කොළඹ කොටුව පිහිටි ෂැංග්‍රිලා හෝටලය, කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය යන හෝටල් පරිශ්‍රයන්හිදී ද එයට අමතරව ඉහත දිනයේදීම දෙහිවල පිහිටි නිව් ට්‍රොපිකල් ඉන් නැමැති නවා තැන් පලේ ද ස්වයංඝාතක බෝම්බ පිළිරීම් වලට අදාළ සාක්ෂි එක් එක් ස්ථානය සම්බන්ධයෙන් වෙන වෙනම සළකා බලන ලදී. එකී ස්ථාන වලට විමර්ශන නිළධාරීන් වෙන් වෙන් ව සහභාගි වී ඇති අතර එයට අමතරව සමස්ත විමර්ශනයේ දේ එක් එක් වූදිත

සම්බන්ධයෙන් ද වෙන වෙනම විමර්ශනයන් සිදු වී ඇත. ඒ අනුව එකී විමර්ශන නිළධාරීන්ගේ සාක්ෂි පහත පරිදි වෙන් වෙන් ව සළකා බලනු ලැබේ.

සහකාර පොලිස් අධිකාරී සුජීව නාලකද සොයිසා සාක්ෂි දෙමින් තමා 1992.11.01 වැනි දින පොලිස් සේවයට බැඳුන් බවත්,2019.04.27 වැනිදා වන විට නාවලපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ලෙස සේවය කළ බවත් එදින පැය 21.07 ට පමණ ගම්පොළ කොට්ඨාශභාර පොලිස් අධිකාරීවරයා විසින් තමා හට, අංක B 198, පහල ගොරක ඔය, නාවලපිටිය කියන ලිපිනයේ පදිංචි එම්.එන්.නෆ්ලාන් යන අය 2019.04.21 වන දින සිදු වූ මරාගෙන මැරෙන බෝම්භ ප්‍රහාර වලට සම්බන්ධ සැකකරුවෙකු සමඟ සමීප සම්බන්ධ පවත්වන බවත්, මෙම නෆ්ලාන් යන අයගේ ජංගම දුරකථන අංක 0777-874799 දරණ ජංගම දුරකථනයට මෙම දිනවල අවශ්‍ය කරන සැකකරුවෙකු වන සාහීඩ් යන අයගේ අංක 076-0759803 දරණ ජංගම දුරකථනයෙන් කථා කරමින් සමීප සම්බන්ධකම් පවත්වන බවත් තොරතුරක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කළ බවත්,ඒ අනුව එම නිවසට ආයුධ සන්නද්ධ කණ්ඩායමක් සමඟ ගොස් වැටලීම් කරලා ඒ සම්බන්ධව පරීක්ෂා කරන්න කියලා උපදෙස් ලබා දීමක් ද කල බවත්,ඒ අනුව තම කණ්ඩායමත් ඒ දිනවල පොලිස් ස්ථානයට අනුයුක්ත කර සිටි යුධ හමුදා නිලධාරීන් 04 දෙනෙක් ද සමග අංක 198,

පහල ගොරක ඔය, නාවලපිටිය ලිපිනයේ එම්.එන්.නෆ්ලා යන අයගේ නිවස සොයා ගෙන ගිය බව කියා සිටින ලදී.

එම නිවසේ නෆ්ලාන් හිටිය බවත්, ඔහු සතුව සතුව ජංගම දුරකථනයක් තිබුණ අතර් ඔහුගෙන්, ප්‍රශ්න කිරීමක් කළ බවත්එම ජංගම දුරකථනයේ තොරතුරු පරීක්ෂා කිරීමෙන් පසුවතමාට ලද තොරතුර සම්බන්ධයෙන් තමා සෑහීමකට පත් වුණ බවත්, ඒ අනුව මොහොමඩ් නියාස් නෆ්ලාන් ව අත්අඩංගුවට බවත් බවත්, ඔහුගේ මහපෙන්වීම අනුව ඔහුගේ මාමා කෙනෙකු වන අබ්දුල් ජබාර් අමිස්ඩීන් යන අයකුගේ නිවස සොයා ගෙන ගොස් එම තැනැත්තාගෙන් ද ප්‍රශ්න කළ බවත්, ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත ඔහුට අයත් වෙළඳසැලක් වන ගම්පොල නගරයේ ගම්පල පොලිස් ස්ථානය මීටර් 75 ක් විතර දුරින් තිබූ තට්ටු දෙකකින් සමන්විත ගොඩනැගිල්ලක් වෙත ගිය බවත්,එම අවස්තාවේ එම ගොඩ නැගිල්ල ඉබි යතරු දමා තිබූ අතර එහි යතුරු අබ්දුල් ජබාර් අමිස්ඩීන් යන අය අත තිබූ බවත්, ඔහු ලවා ඒ දොර විවෘත කර ගෙන, වෙලඳසැල තුළට තමාත්, තමා සමඟ උ. පො. ප. ඉන්දික, උ. පො. ප. අමිල, උ. පො. ප. ප්‍රමෝද්, පො. කො. 35781 ප්‍රියන්ත ඇතුළු නිලධාරී කණ්ඩායමක් වෙළඳසැල තුළට ඇතුළු වුන අතර වෙළඳසැලතුල එක ලයිට් එකක් දැල්වෙමින් තිබූ බවත්, ඒ වන විට වෙලාව රාත්‍රී පැය 23.40 ත් 23.45 ත් අතර වූ බවත්, එම ගොඩනැගිල්ලේ පිටිපැත්තට වෙන්නට තිබූ ඉහළ මාලයට නඟින පඩිපෙළ දිගේ ඉහලට යන විට එකවරම බිම නිදාගෙන සිටි

දෙදෙනෙක් දුවන්නට පටන් ගත් බවත් ඔහුන් යටඇඳුම් පමණක් ඇඳගෙන හිටි අතර පැන යාමට නොදී සිය කණ්ඩායම ගොස් තමා එක් පුද්ගලයෙක් ද තමා සමඟ සිටි උප පොලිස් පරීක්ෂක ඉන්දික අනිත් පුද්ගලයාවද අල්ල ගත් බවත් කියා සිටින ලදී.

තමා අල්ල ගත් පුද්ගලයා මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා බවට ද තමා හඳුනාගත් අතර උප පොලිස් පරීක්ෂක ඉන්දික අත්අඩංගුවට ගෙන හිටි අය මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් බවට අනාවරණය කර ගත් බව සාක්ෂිකරු කියා සිටින ලදී.පසුව කරන ලද විමර්ශනයන්ගෙන් මෙම දෙදෙනා සහෝදරයන් බවත් ඔවුන්ගේ ලිපිනයන් අංක ඩී10/8, දෙල්ගහගොඩ, හිඟුල බවට අනාවරණය වූ බවත් කියා සිටින ලදී. තැනැත්තන් දෙදෙනාම සිටියේ යට ඇඳුම් වලින් බවත් කියා සිටින ලදී. ඒ වන විට මෙම පුද්ගලයින් පොලිස් මූලස්ථානය මගින් විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍යයෙන් ඔහුන් පාස්කු ප්‍රහාරයට අවශ්‍ය කරන සැකකරුවන් හැටියට දන්වා තිබූ බවත්, සයින්දමරුදු පිපිරීමක්ද දෙමටගොඩ නිවසක් පරීක්ෂා කරන්න ගිය අවස්ථාවේදී පිපිරීමකින් පොලිස් නිලධාරීන් ගොස් සිටි බවත්, එබැවින් තමා සමඟ ගිය නිලධාරීන්ගේ ජීවිත වලටත්, සැකකරුවන්ගේ ජීවිත වලටත් එම ස්ථානයේ තර්ජනයක් හැඟී ගිය බැවින් අත්අඩංගුවට ගත් අවස්තාවේ ඔහුන් සිටි යටඇඳුම් පිටින්ම ඔහුන් දෙදෙනාව පොලිසියට රැගෙන පැමිනි බවත් කියා සිටින ලදී.

එම ස්තානයේ DIAOWANG කියන නම සඳහන් වෙලා තිබුනා කළුපාට බෑගයක් තිබූ අතර ආරක්ෂාව හේතුවෙන් එය ඒ ආකාරයෙන් තිබීමට හැරිය බවත්, ඔවුන් නිදා සිටි ස්ථානයේ බිම ජංගම දුරකථන 2 ක් මුදල් පසුම්බියක් තිබුන අතර ඒවා නඩු භාණ්ඩ හැටියට තමාගේ බාරයට ගත් බවත් කියා සිටින ලදී.ඉන් එක් දුරකතනයක් සාදික් අබ්දුල්ලා යන අයගේ බවත්, අනික සාහිඩ් අබ්දුල් හක් යන අයගේ බවත් මුදල් පසුම්බිය මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් යන අයගෙ බවට අනාවරණය වූබවත්, එම පසුම්බිය පරික්ෂා කිරීමේදී එය තුල අංක 4135410002098920 ස්මාර්ට් වීසා කාඩ් එකක්, එන්. ඩී. බී. බැංකුවේ 4041860101705796 දරන වීසා කාඩ් එකක්, කොමර්ෂල් බැංකුවේ 4216890406002432 දරන වීසා කාඩ් එකක් සහ ඊට අමතරව මහියංගණය පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා ලද අංක 374437 දරන 2019.04.21 දින ඊ.ඒ. වයි. සිල්වා යන අයට නිකුත් කරන ලද ඇඳිරි නීති බලපත්‍රයකුත් තිබුන බව සාක්ෂිකරු කියා සිටින ලදී.

මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යනඅයට අයත් රන්වන් පාටට හුරු ජංගම දුරකථනය නඩුබඩු කුවිතාන්සි අංක 1050/2019 ට ඇතුළත්කළ බවත්,මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල් හක් යනඅයට අයත් නිල්පාට ජංගම දුරකථනය සහ කළුපාට බෑගය. නඩුබඩු කුවිතාන්සි අංක 1051/2019 ට ඇතුළත්කළ බවත් සාහිඩ් අබ්දුල්හක් යනඅයට අයත් වීසා කාඩ්පත් සහ ඔහුගේ මුදල් පසුම්බියත්, එමෙන්ම ඇඳිරිනීති බලපත්‍රයත්

නඩුබඩු කුවිතාන්සි අංක 1052/2019 ඇතුළත්කළ බවත් කියා සිටිමින්, එකී දේපළ කුවිතාන්සි අංක 50/2019 පැ.2036 ලෙසද, දේපළ කුවිතාන්සිය 1051/2019 පැ.2037 වශයෙන්ද දේපළ කුවිතාන්සි අංක 1052/2019 පැ.2038 වශයෙන්ද සලකුණු කරන ලදී. පැ.984 යනු දුඹුරුපාට මුදල් පසුම්බිය බවත්, පැ.985 යනු,NDB බැංකුවේ. අංක4041860101705796.කාඩ්පත බවත්, පැ.986 යනු සම්පත් බැංකුවේ අංක4135410002098920 දරන වීසා කාඩ්පත බවත්, පැ.987 යනු Commercial බැංකුවේ අංක වීසා 4216890406002432.කාඩ්පත බවත්, උතුමාණනි. පැ.988 යනු ස්ථානාධිපති, මහියංගණය පොලිස් ස්ථානය 2019.04.21 වනදින නිකුත්කරන ලද E.G.Y.සිල්වා යනුවෙන් සඳහන්අංක 374434 හදිසි (ඇඳිරි නීතිය) ආඥාව බවත් සාක්ෂිකරු කියා සිටිමින් තමා විසින් භාරයට ගත් භාන්ඩ හඳුනා ගන්න ලදී.

අත්අඩංගුවටගත් සැකකරුවන් ඉන්පසුව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා නියෝජ්‍ය පොලිස්පතිගේ උපදෙස් පරිදි කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවකට අධ්‍යක්ෂකව හිටියේ ශානි අබේසේකර මහතා වෙත තමාම ගෙනගොස් භාරදුන් බවත් කියා සිටිමින්, මෙම නඩුවෙහි 04 වන චූදිත ලෙස නම් සඳහන්කර ඇති මොහොම්ඩ ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා මෙම නඩුවේ 05 වන චූදිත ලෙස අධි චෝදනා පත්‍රයේ නම් සඳහන්කර ඇති මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් යනඅය විවෘත අදිකරණයේදී හඳුනා ගන්නා ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 4 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කරන ලද අතර එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය සඳහා පොලිය ඇතුළු 20 දෙනෙකුගේ කණ්ඩායමක් සහභාගී වූ බවත් ඒ වනවිට තිබූ තත්ත්වය අනුව තමාද බියට පත්ව සිටි බවත් කියා සිටින ලද අතර 4 වන සහ 5 වන චිත්තිකරුවන් ඇඳ සිටි කලිසම් සහ කමිස ගලවා සැකකරුවන්ගේ අත් සහ ඇස් ගැටගැසූ බවට කරන ලද යෝජනවා ප්‍රතික්ෂේප කර ඇත. එසේම, තමන් අත්විලංගු රැගෙන ගියබවත් වැඩිදුරටත් කියා සිටින ලදී. එම ස්ථානයේ තිබූ Biaowang යන නාමය සඳහන් බෑගය සාමාන්‍ය පාසල් බෑගයක් ලෙසට හැඳන්වුවද තමා මූලික සාක්ෂියේදී සඳහන්කළේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් භාවිතා කළ බෑගවලට සමාන ආකාරයේ බෑගයක් ලෙසට බවත් කියා සිටින ලදී. මෙහදී 4වන චිත්කිරු විසින් දීර්ඝ වශයෙන් මෙම සාක්ෂිකරු විසින් නාවලපිටිය පොලිසියේ තොරතුරු සටහන් පොත්වලත් ගම්පොළ පොලිසියේ තොරතුරු සටහන් පොත් වලත් මෙම අත්අඩංගවට ගැනීම සම්බන්ධයෙන් ඇතුළත්කර ඇති තොරතුරුවල චූදියන් දෙදෙනාගේ නම් සහ ඔවුන් භාරයේ තිබී අත්අඩංගුවට ගත් භාණ්ඩ සම්බන්ධයෙන් ඇති වෙනස්කම් සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් විමසීමක් කරඇති අතර එයට සාක්ෂිකරු විසින් පිළිතුරු ලබාදෙමින් නාවලපිටිය පොලිසියට ඇතුළත්කර ඇති සටහන තමාගේ පැමිණීමේ සහ පිටවීමේ එහි විස්තරය කෙටියෙන් සටහන්

කළබවත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දීර්ඝ සටහන් නිවැරදිය ගම්පොළ පොලිසයට ඇතුළත් කළ අතර සඳහන් කළ අතර ඉහත නම් සඳහන් සැකකරුවන් දෙදෙනාගේ නම් ඉතා සමාන බැවින්ද එම අවස්ථාවේදී තිබූ තත්ත්වය අනුව එම සටහන්වලදි යම් දෝෂයක් තිබූ නමුත් එය විවෘත අධිකරණයේදී පැහැදිලි කර නිවැරදි කළබව කියා සිටින ලදී. 5 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් ගේ මෙම චූදියන් දෙදෙනාවම එකම වරද සඳහා එකම වේලාවේදී සහ එකම ස්ථානයේදී අත්අඩංගුවට ගත් බවත් එක් සටහනක යම් වැරදීමක් සිදුවුවද තමාගේ විස්තරාත්මක සටහන්වල එම සියලු කරුණු නිවැරදිව සටහන්කර ඇතිබව කියා සිටින ලදී. සැකකරුවන් පළා යාමට උත්සාහ කළේය යන්න බොරුවක් බවට කරන ලද යෝජනවාට පිළිතුරු වශයෙන් සාක්ෂිකරු කියා සිටියේ සැකකරුවන් අත්අඩංගුවට ගත් ස්ථානයේ කොන්ක්‍රීට් ස්ලැබ් එක ආසන්නයේම කන්දයක් ඇති බවත් සැකකරුවන් දෙදෙනා එම කන්දට පැනගත්තේ නම් ඔවුන් අත්අංඩගුවට ගැනීමට හැකි නොවන බවත්ය. 4 සහ 5 වන චූදිතයන් අත්අඩංගුවට ගත් අවස්තාවේදී කා භාරයේ කුමන භාණ්ඩ තිබුණේද යන්න ඔහුගේ සටහන් අනුව අපැහැදිලි බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලද අතර ඒ අනුව 5 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීම අවසන්කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් 14 වන චූදිත හරස් ප්‍රශ්න විමසීමේදී සටහන්වල ඇති වෙනස්කම් අනුව අධිකරණයට පැමිණ සිද්ධිය සම්බන්ධයෙන් කරුණු වෙනස් කරමින්

සාක්ෂි ලබාදෙන්නේය යන යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත. නැවත ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී තමාගේ සටහන් දෛනික පවත්වාගෙන යන පොත්වල නිවැරදිව අලවා ඇතිබවත් එදින මෙම කාර්යය කාර්යය බහුල දිනයකදි පැය 5කට වඩා වැඩි කාලයකදී සිදුකරන ලද කාර්යයක් බවටත් කියා සිටින ලදී.

විශ්ලේෂණය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේශණය කිරීමේ දී හෙළිවන්නේ 4 සහ 5 වන චූදිතයන් අත්අඩංගුවට ගැනීමයි. හරස් ප්‍රශ්නවලදි සාක්ෂිකරු විසින් යොදන ලද පැමිණීමේ සටහනේ ඇති සටහනකුත් ගම්පොළ පොලිසියේදී යොදන ලද විස්තරාත්මක සටහනක් සම්බන්ධයෙන් විත්තිය විසින් අවධානය යොමුකළද සාක්ෂිකරුගේ සාක්ෂියේදී එම වෙනස්කම සිදුවීමට හේතුව පැහැදිලිකර දී ඇති අතර සාක්ෂිකරු විසින් 2019.04.27 වන දින 4 වන සහ 5වන විත්තිකරුවන් අත්අඩංගුවට ගත්තේය යන ප්‍රධාන කාරණය හබ කිරීමකට ලක්වී නැත. ඔවුන් යටඇඳුම් පිටින් පමණක් සිටියේය යන කාරණය විත්තියේ නඩුව ආරම්භ කළපසු 4, 5 විත්තිකරුවන් දෙදෙනාම විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් හි දී දැඩි සේ හබ කරමින් සදහන් කර ඇත්තේ මුස්ලිම් ජාතිකයින් වන ඔවුන් රාත්‍රී කාලයට

පවා දණහිසින් ඉහලට අධුමක් හෝ අදින්නේ නැති බවත් මෙම සාක්ෂිකරු පවසා සිටි කරුණ සම්පූර්ණයෙන් ම අසත්‍ය බවය.

කෙසේ වුවද මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඒ වනවිට රටේ පැවති තත්ත්වයත් 2019.04.21 පසුදින සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යාමේදී සහ විමර්ශනය කිරීමට යන ස්ථාන දෙකකදී බෝම්බ පිපිරී පුද්ගලයන් මියයාම සහ එවකට පැවති තත්ත්වය අනුව ඔහුට සහ ඔහුගේ කණ්ඩායමට යම් අන්තරාවක් ඇතිවූ බිය හේතුකොටගෙන සැකකරුවන් අත්අඩංගුවට ගන්න අවස්ථාවේ සිටි ආකාරයෙන්ම එනම්, ඔවුන් යටඇඳුම් ඇඳ සිටි ආකාරයෙන්ම ගම්පොළ පොලිසියට භාරදුන්නේය යන කරුණ විශ්වාසනීය නොවන බවට අපහට පෙනී යන්නේ නැත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙලි වූ පරිදි 5 වන චූදිත සාහිඩ් හක් භාරයේ තිබී සොයාගත් බවට පවසා සිටි මුදල් පසුම්බිය පාලවිය ප්‍රදේශයේ දී තමාගේ නැතිවූ මුදල් පසුම්බිය බවට පැමිණිල්ලේ 1397 වන සාක්ෂිකාර ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වා 2026.07.14 දින මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් හඳුනාගෙන ඇති අතර ඔහුගේ සාක්ෂියේ කොටසකදී පාස්කු බෝම්බයෙන් ප්‍රහාරයෙන් පසු දිනයකදි නාවලපිටියේ දෙදෙනෙක් ළඟ තිබී මෙම මුදල් පසුම්බිය හමුවී ඇති බවට තමාට දැනගන්නට ලැබෙන සාක්ෂිය සමඟ මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තහවුරු වනබව පැහැදිලිව පෙනීයයි. මෙහි ඇති වඩාත් වැදගත් කාරණය වන්නේ,

පාලමුනේ කිරිතෝනා වත්ත යන ස්ථානයේදී පුපුරුවා හරින ලද wp BAQ 0304 දරණ යතුරුපැදිය අනුසර මෝටර්ස් වෙතින් මිලදීගෙන ඇත්තේ ඉහත නම් සඳහන් පැමිණිල්ලේ 1397 වන සාක්ෂිකාර ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ නැතිවූ ජාතිකහැඳුනුම්පත භාවිතයෙන් බවට වූ සිද්ධිමය කරුණු මෙම සාක්ෂි සමඟ මනාව ගැළපීමයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1945 විශ්‍රාමික උප පොලිස් පරීක්ෂක ඩයස් පද්මසිරි යන සාක්ෂිකරු සාක්ෂි දෙමින් තමා 1985 පොලිස් කොස්තාපල්වරයෙකු වශයෙන් සේවයට බැඳී 2020.01.05 වන දින උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් විශ්‍රාම ගිය බවත්, 1990.05.17 සිට 2020.01.05 දින දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කළ බවත් කියා සිටින ලදි. 2018.12.26 දින තමා මාවනැල්ල ප්‍රදේශයට ගොස් එම කාලයේදි මාවනැල්ල ප්‍රදේශයේ බුදුපිළිම කැඩීම සම්බන්ධයෙන් විමර්ශනයකට සහභාගි වූ බවත් ඒ වන විට එනම්, 2018.12.25 වන දින බුදුපිළිම කැඩීම සම්බන්ධයෙන් මොහොමඩ් අලුෆර් මොහොමඩ් අස්ෆාක් යන සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිබූ අතර එම සිද්ධිය සම්බන්ධයෙන් සාදික් සහ සාහිඩ් නැමැති පුද්ගලයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමට විමර්ශන මෙහෙය වූ බවත්, ඔවුන් දෙදෙනා මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි සහෝදරයන් බවත් කියා සිටින ලදි.

එම පුද්ගලයන් දෙදෙනා සම්බන්ධයෙන් මාවනැල්ල සහ ලංකාවේ විවිධ ප්‍රදේශවල සොයා බැලුවද ඔවුන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ අතර පසුව ලද තොරතුරක් අනුව ෆයාස් නැමැති පුද්ගලයෙකු සම්බන්ධයෙන් විමර්ශනය කළ බවත්, එහිදී 0777616737 යන දුරකතනයෙන් ෆයාස් යන අයට ලැබී තිබූ කෙටි පණිවිඩයක් ආශ්‍රයෙන් පුත්තලම ප්‍රදේශයේ පදිංචි A.H.M. මුෆිස් යන අය සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා 2019.01.16 දින පුත්තලම ප්‍රදේශයට ගොස් එම මුෆිස් යන අය පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ පවත්වාගෙන යන්නේ යැයි කියනු ලබන කුකුල් ෆාර්ම් එකක් තිබූ ස්ථානයට ගිය බවත්, එය අක්කර 70ක් පමණ විශාල ලැක්ටෝස් වත්ත යනුවෙන් හඳුන්වන ස්ථානයක් වන අතර එහිදී මුෆිස් සහ හමාස් යන දෙදෙනා හමු වූ අතර මුෆිස් යන අය එම ස්ථානයේ පිහිටි මුරමඩුවක් වැනි ස්ථානයක් ඉදිරිපිට වළක් හාරමින් සිටි අතර එම ස්ථානය පරීක්ෂා කිරීමේදි මුෆිස් යන අයට නොගැළපෙන ප්‍රමාණයේ කලිසමක් සහ කමීසයක් ද, ඔහුගේ කකුළේ ප්‍රමාණයට නොගැළපෙන සෙරෙප්පු දෙකක් ද, තවත් දෙදෙනෙකුට වඩා වැඩි විශාල පිරිසකට ප්‍රමාණවත් වන වියළි ආහාර ද්‍රව්‍ය තිබූ බවත් නිරීක්ෂණය වූ අතර එම අවස්ථාවේදි පො.කො.දිසානායක යන නිලධාරියා විසින් එම නිවසේ තිබූ වානේ අල්මාරියක තිබී ඩෙටනේටර් 99ක් තිබූ පෙට්ටියක් සොයා ගෙන පැමිණි බවත් ඒ අනුව වැඩිදුර පරීක්ෂණ පැවැත්වූ අතර එම මුරමඩුවට දකුණුපස තිබී සැර රසායනික ද්‍රව්‍යයක් ඇති කලු

පැහැති බැරල් කිහිපයක් ද, ඉදිරිපිට මුඊස් යන අය විසින් හාරමින් සිටි ලබන වළ තුළ තිබී (හාරමින් තිබූ වළ තුළ තිබී) කලු පාට මූඩිය සහිත නිල්පාට බැරල් 3ක් ද ඒවා තුළ යම් රසායනික ද්‍රව්‍යයන් තිබූ බවද අනාවරණය වූ බවත් ඒ අනුව රජයේ රස පරීක්ෂක ඇතුළු පොලිස් නිලධාරීන් පැමිණ වැඩිදුර පරීක්ෂණ පැවැත් වූ අතර ඒ සම්බන්ධයෙන් පුත්තලම මහාධිකරණයේ නඩු කටයුත්තක් විදියට පවත්වාගෙන යන බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

මෙසේම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තෙන් සොයා ගන්නා ලද නඩුභාණ්ඩ අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත්, එම රාජකාරියේදි මෙම නඩුවේ ඉහත සඳහන් කළ සාදික් සහ සාහිඩ් යන දෙදෙනා අත්අඩංගුවට ගැනීමට නොහැකි වුවද ඔවුන්ව තමාට විවෘත අධිකරණයේ හඳුනාගත හැකි බව කියා සිටිමින් චිත්තිකරුවන් වාඩි වී සිටි ස්ථානයේ සිටි 4 වැනි සහ 5 වැනි චිත්තිකරුවන් දෙදෙනා පිළිවෙළින් සාදික් සහ සාහිඩ් වශයෙන් හඳුනාගන්නා ලදි.

ඉන් අනතුරුව වැඩිදුර විමර්ශන කිරීමේදි අනාස් යන පුද්ගලයෙකු සම්බන්ධයෙන් අනාවරණය වූ බවත්, ඔහු ඒ වන විට කෑගල්ල පොලිසිය විසින් විමර්ශන සඳහා ප්‍රකාශයක් සටහන් කර ගෙන තිබූ තැනැත්තෙකු වන අතර ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙනැවිත් ඔහුගේද

ප්‍රකාශයක් සටහන් කළ බවත් ඒ අනුව ඔහු විසින් යම් ත්‍රස්තවාදී සංවිධානයකට සම්බන්ධ වී සිටි තැනැත්තෙක් බවට තොරතුරු අනාවරණය වූ අතර තවත් සහරාන් සහ සාජිත් යන දෙදෙනෙකු සම්බන්ධයෙන් ද ඔහුගෙන් අනාවරණය වූ බවත් කියා සිටිමින්, සාජිත් යනු මෙම අධිකරණයේ චිත්තිකරුවන් අතර සිටි 9 වන චිත්තිකරු බවට හඳුනාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් සටහන් යෙදීම තමාගේ කණ්ඩායමේ ප්‍රධානියා වශයෙන් සිටි මාරසිංහ යන නිලධාරියා විසින් සිදු කළ බවත්, තමාද ඒ සටහන් නිරීක්ෂණය කළ අතර එම සටහන් නිවැරදිව ඇතුළත් වී තිබූ බවත් ඔහු වැඩිදුරටත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව 2019 ජනවාරි 23 වන දින සහරාන් යන අය සම්බන්ධයෙන් විමර්ශන පැවැත් වූ අතර ඔහුගේ බිරිඳ කැකුණගොල්ල ප්‍රදේශයේ අයෙකු බවත්, ඒ අනුව 2019.02.19 දින කැකුණගොල්ල ප්‍රදේශයට ගොස් එහිදී ලද තොරතුරු අනුව සැකකරුවන් භාවිතා කරනු ලබන්නේ යැයි කියනු ලබන වෑන් රථයක් කැකුණගොල්ල ප්‍රදේශයේ චිත්වා පටු මගෙහි <u>කුංජී මොහිදීන් මොහොමඩ් අන්සාර්</u> යන අයගේ නිවසේ තිබී සොයාගත් බවත් කියා සිටින ලදී. එහි අංකය PA 2855 දරණ බවත් එය අන්සාර් නැමැත්තෙකු විසින් <u>කුංජී මොහිදීන්</u> වෙත ලබාදුන් බව පරීක්ෂණවලදී අනාවරණය වූ බව කියා සිටින ලදී.තමන් විසින් පරීක්ෂණ පැවැත්වීම සඳහා ගියා ස්ථානයට අදාළ පුද්ගලයාගේ නම <u>මොහොමඩ් අන්සාර්</u> වන අතර ඔහුගේ වැඩිමහල් සහෝදරිය සහරාන්ගේ බිරිඳ බවත්

එම තැනැත්තියගේ නම භාදියා වන බවත් ඇයගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් සටහන් කරගත් බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

ඒ සම්බන්ධයෙන් කරන ලද වැඩිදුර විමර්ශනයේදි කුලියාපිටිය ප්‍රදේශයේ සිට මෙම සංවිධානයට සම්බන්ධ වූ සාමාජිකයන් සම්බන්ධයෙන් ද, පූනානි ප්‍රදේශය සම්බන්ධයෙන් ද තොරතුරු ලද බවත් එම තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදි රිස්කාන් නැමැති පුද්ගලයෙකු සම්බන්ධයෙන් ද තොරතුරු 2019.02.28 වන දින වන විට ලැබී තිබුණු අතර එම රිස්කාන් යන අය සම්බන්ධයෙන් ද පරීක්ෂණ පැවැත් වූ බවත් කියා සිටිමින් විවෘත අධිකරණයේදි 6 වන චූදිත වන මොහොමඩ් අන්වර් රිස්කාන් යනු එම තැනැත්තා බවට හඳුනාගන්නා ලදි.

රිස්කාන් යන අය සම්බන්ධයෙන් ඔහු එම දිනවල අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ අතර ඔහු භාවිතා කරනු ලැබූ දුරකතන සම්බන්ධයෙන් විමර්ශනයක් කළ බවත් එහිදී එම දුරකතනවලින් ඇමතුම් ලබා ගැනීම වෙනුවට දත්ත හරහා අන්තර්ජාල පහසුකම වැඩි ලෙස භාවිතා කළ හැකි බව අනාවරණය වූ බවත් ඒ අනුව රිස්කාන් යන අයව අත්අංගුවට ගැනීමට වැඩිදුර විමර්ශන පැවැත් වූ බවත් කියා සිටින ලදි. මේ සම්බන්ධයෙන් රිස්කාන්ගේ බිරිඳව ද අත්අඩංගුවට ගෙන විමර්ශන පැවැත් වූ අතර රිස්කාන් යන අය සොයා ගැනීමට නොහැකි වූ බවත් පාස්කු ප්‍රහාරය 2019.04.21 වන දින සිදු වන තුරු සාහිඩ්, සාදික්, රිස්කාන්,

සහරාන් හෝ සාජිත් යන අයව සොයා ගැනීමට නොහැකි වූ බව ඔහු වැඩිදුරටත් කියා සිටින ලදි.

තවද, වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත සොයා ගෙන යෑමේදි තමාට තොරතුරු ලබාදුන් පුද්ගලික තොරතුරුකරුවෙකුට එම තොරතුරුකරු නිවසේ සිටියදී වෙඩි තබා තිබූ බවත් ඉන් අනතුරුව 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරමාලාව දියත් වූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

2019.04.21 තමාට මෙම පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් තොරතුරු ලත් වහාම තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් නිලධාරි කණ්ඩායමක් සමඟ දෙමටගොඩ ප්‍රදේශයට ගිය බවත්, දෙමටගොඩ ඒ වන විට යම් ක්‍රියාකාරකම් සහ සැකකරුවන් රැඳී සිටි නිවසක් සම්බන්ධයෙන් තොරතුරු ලැබී තිබූ අතර තමන් එම ස්ථානයට ළඟා වන විටත් එහි බෝම්බ පිපිරීමක් සිදුව තිබූ බවත්, ඒ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නොවන වෙනත් විමර්ශන නිලධාරීන් එම ස්ථානයට ගොස් තිබූ අතර එම පිපිරීමෙන් කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් නිලධාරින්ද ජීවිතක්ෂයට පත් වූ බවත් තමාට දැනගන්නට ලැබූ අතර 2019.04 21 වන දින රාත්‍රියේදි දඹුල්ල පොලිසියෙන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගත් බවට පොලිස් අධිකාරි වික්‍රම සේකර මහතාගෙන් ලත් උපදෙස් පරිදි දඹුල්ල පොලිසියට එදිනම එනම්, 2019.04.21 වන දිනම තමාත්, පො.සැ. 4679 නන්දලාල්, පො.සැ. 34836

විජේරත්න, පො.කොං. 92170 දිසානායක නිලධාරීන් සමඟ පිටත්ව ගොස් දඹුල්ල පොලිසියේ සිරමැදිරියේ රඳවා සිටි මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර්, මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගත් බවත් කියා සිටිමින් විවෘත අධිකරණයේ චූදිතයන් අතර සිටින 1 වන චිත්තිකාර මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි යන චූදිතව හඳුනාගන්නා ලදි.එසේම 9 වන චිත්තිකරුද ඊට පෙර අවස්ථාවකදී හඳුනාගෙන තිබූ අතර එම 1 වන චිත්තිකරු සහ 9 වන චිත්තිකරුවන් එකම ස්ථානයකදී අත්අඩංගුවට ගෙන ඇති බවත් ඔවුන් බස් රථයකින් පැමිණ දඹුල්ලෙන් බැස සිටින අවස්ථාවකදී ඔත්තුකරුවන් විසින් දෙන ලද තොරතුරු මත අත්අඩංගුවට ගෙන තිබූ බවත් තමාට අනාවරණය වූ බවත්, ඔවුන් එඬේරමුල්ලේ සිට තිහාරියට පැමිණ තිහාරියේ සිට දඹුල්ල ප්‍රදේශයට පැමිණ ඇති බව තමාට අනාවරණය වූ බව වැඩිදුරටත් කියා සිටින ලදි.

මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර් යන 1 වන චූදිතගෙන් සහ 09 චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කරන ලද බවත් පසු දින එනම් 2019.04.22 දින දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපති මාරසිංහ සහ පොලිස් අධිකාරී වික්‍රමසේකර යන අය වෙත දැනුම් දී එම සැකකරුවන් දෙදෙනාත් සමඟ ඔවුන් නැවතී සිටි බවට හෙලි වූ එඬේරමුල්ල ප්‍රදේශයට පැමිණි බවත් එලෙස ඔවුන්ගේ මහපෙන්වීම මත නොං. 484, වීදී පාර, එඬේරමුල්ල,

වත්තල යන නිවසට 2019.04.22 වන දින දහවල් 2කට පමණ පැමිණි බවත් එකී විමර්ශනයේදි මෙම 1, සහ 9 චූදිතයින් පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු බවට අනාවරණය වීම මත වැඩිදුර පරීක්ෂණ පැවැත් වූ බවත් කියා සිටින ලදි.

එම ස්ථානයට විශේෂ කාර්ය බලකාය සහ අපරාධ පරීක්ෂණ නිලධාරීන් පැමිණෙන තුරු තමන් සිටි බවත්, ඒ වන විටත් නිවස වසා තිබූ අතර නිවසේ අයිතිකරු සොයා ඔහු ගෙන්වා නිවස විවෘත කර විශේෂ කාර්ය බලකායේ නිලධාරින් විසින් එම නිවස පරීක්ෂා කළ බවත් එම අවස්ථාවේදි 1 වන විත්තිකරු හෝ 9 වන විත්තිකරුව වාහනය තුළම රඳවාගෙන සිටි අතර එදින තමා එම නිවස පරීක්ෂා කිරීමක් හෝ එම නිවසට ඇතුළු වීමක් සිදු නොකළ බවත් කියා සිටින ලදි.

1 වන සහ 9 වන චූදිතයන්ව තමාගේ භාරයට ගන්නා අවස්ථාවේදි ඔවුන්ගේ ජංගම දුරකතන සහ පුද්ගලික දේපළ තමා භාරයට ලබාගෙන ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප සේවයට භාරදුන් බව කියා සිටින ලදි.

2019 ජනවාරි 17 වන දින ලැක්ටෝස්වත්ත රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පරීක්ෂාකර බලා සාම්පල් ලබාගත් බවත්, එම ස්ථානයේ තිබූ පුපුරන ද්‍රව්‍ය විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරි සමරනායක මහතා සමඟ ගෝනහේනට ගෙනගොස්

2019.04.26 දින පිපිරීමට ලක්කළ බවත්, එම සාම්පල් පරීක්ෂා කිරීම සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රනාන්දු මහතා සමඟ තමාද සහභාගී වූ බව වැඩිදුරටත් කියා සිටින ලදී. 2019.04.26 වෙනිදින වැඩිදුර පරීක්ෂණවලදි රිස්කාන් යන සැකකරුගේ බිරිඳට ජංගම දුරකථනයක් ලබාදී තිබූ බව අනාවරණය වූ බවත්, පෙර සාක්ෂියේදී සඳහන්කළ පරිදි ඇයව අත්අඩංගුවට ගත්තේ 2019.04.27 වෙනිදින බවත්, කියා සිටින ලදී. ඉන් අනතුරුව 2019.04.28 වනදින 9 වන විත්තිකාර සාජිත් සමඟ මල්වාන ප්‍රදේශයටත්, වැල්ලවත්ත මයුර පෙදෙසේ නිවාස සංකීර්ණයේ පිහිටි 50/12 ස්ථානයේ 3B දරණ නිවසට ගිය බවත් කියා සිටින ලදී.

2019.04.29 වනදින කුලියාපිටිය සුබූතිපුර අංක 1224 ලිපිනයේදී පැය 15.30ට රිස්කාන් නමැති සැකකරුව (6 වන චූදිත) අත්අඩංගුවට ගත්බවත්, එසේ අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව වැඩිදුර විමර්ශන පැවැත්වූ අතර ඒ වනවිටත් දුම්මලසූරිය පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන සිටි මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන්වද අත්අඩංගුවට ගෙන ඉදිරිපත්කර තිබූ බවත් ඉන්අනතුරුව එදින එනම්, 2019.04.29 වන දින ඔවුන්ද රැගෙන කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණි අතර 2019.04.30 වනදින ඉහත නම් සඳහන් රිස්කාන් සහ සනස්දීන් යන අයද රැගෙන පොලිස් සැරයන් 4679 නන්දලාල්, පොලිස් සැරයන් 34836 විජේරත්න, පොලිස් කොස්තාපල්

92170 දිසානායක යන නිලධාරීන් සමඟ විමර්ශන සඳහා පිටත්ව ගිය බව කියා සිටින ලදී. එසේම, ඉහත නම් සඳහන් සැකකරුවන් දෙදෙනාගෙන්ම ප්‍රශ්නකොට ප්‍රකාශ ඒ වනවිටත් ලබාගෙන තිබූ බවත්, සනස්දීන් යන අයගේ ප්‍රකාශය නන්දලාල් යන නිලධාරියා විසින් සටහන්කර තිබූ බවත්, සනස්දීන්ගේ ප්‍රකාශයට අදාළව දුරකථනයක් සහ යතුරුපැදියක් සොයාගැනීම සඳහා වැඩිදුර විමර්ශන සඳහා පිටත්ව ගිය බවත් සාක්ෂිකරු පවසා සිටින ලදී.

මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් *“ .....නිල් පාට විගෝ බයිසිකලය.....නියාස්ලගෙ ගෙදරට යන පාරේ එනම් වෙල මැදින් තියන පාරේ බෝක්කුවක් ළඟට ගිහින් මෝටර් සයිකලය වතුරට දැම්මා.....”*

යනුවෙන් ඔහු විසින් ලබා දින් ප්‍රකාශයේ ඉහත සඳහන් කොටස අධිකරණයට ඉදිරිපත් කරමින් එම කොටස පැ.2000 ලෙසට සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තියේ ප්‍රතිපාදන අනුව සලකුණු කරන ලද අතර වැඩිදුරටත් සාක්ෂි දෙමින් 2019.04. 30 වන දින 6 වූදිත රිස්කාන් සහ 7 වූදිත සනස්දීන්ව රැගෙන කුලියාපිටිය ඒදණ්ඩවල ප්‍රදේශයට ගිය බවත් එහි ප්‍රධාන පාරෙන් ගොස් අතුරු මාර්ගයක වෙල්යායක් මැදින් ගොස් එම වෙල්යාය මැද පිහිටි බෝක්කුව අසළ ඇති වතුර වළක තිබී මෙම යතුරුපැදිය සොයාගත් බවත් එම ස්ථානයට ආසන්නයෙන් නියාස් යන

අයෙකුට අයත් නිවසක් තිබූ බවත් සනස්දීන් යන චූදිත ගේ මග පෙන්වීම මත එම වතුර වළේ තිබී යතුරුපැදිය ගොඩට ගැනීමට විමර්ශන පැවැත්වූ බවත් ඒ සඳහා එම ස්ථානයට පැමිණි සිටි සිටි ප්‍රදේශවාසීන් අතුරින් ඉහත නම් සඳහන් නියාස් යන අය පැමිණ අඩි 15ක් පමණ ගැඹුරු එම වතුර වළට බැස යතුරුපැදිය එතුළින් ගොඩගැනීමට සහාය වූ බව කියා සිටින ලදී. ඉන් අනතුරුව නියාස් යනඅයගේ නිවස පිටුපස ප්‍රදේශය ද පරීක්ෂාකර බැලූ බවත්, එහි ගල්වළක තිබූ කපා දමන ලද අංක තහඩු කැබලි කිහිපයක් සොයාගත් බවත්, එය යතුරුපැදිය ගොඩගත් වතුර වළේ සිට මීටර් 50ක් පමණ දුරින් පිහිටි බවත් සාක්ෂිකරු පවසා සිටින ලදී. එම යතුරුපැදියේ අංකය WP BGV-7799 බවත් අදාළ යතුරුපැදිය සහ අංක තහඩු කැබලි කුලියාපිටිය පොලිසියේ PR 1763/19 යටතේ ඇතුලත් කළ බවත් පවසා එකී යතුරුපැදිය භාරදෙන ලද දේපළ කුවිතාන්සිය පැ.2001 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී.

තවද එලෙස 07 චූදිතගේ මගපෙන්වීම ඔස්සේ සොයා ගන්නා ලද යතුරුපැදියේ චැසි අංකය MD626AG40HIA07862 බවත් එම යතුරුපැදියට අදාළ ලේඛන 6 චූදිත රිස්කාන් භාරයේ තිබෙන බවට අනාවරණය වූ බවත් ඒ අනුව රිස්කාන්ගේ නිවසේ වහලේ තිබී එනම්, වහලේ පරාල අස්සේ තිබී එහි ලියාපදිංචි ලේඛනය තමාගේ භාරයට ගත් බවට කියා සිටිමින් මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ B 11330/18 දරණ නඩු අංකය යටතේ PR 1763/19 දරණ දේපළ කුවිතාන්සිය යටතේ

ඉදිරිපත් කර තිබූ WP BGV-7799 දරණ යතුරුපැදියේ අංක තහඩුවේ කපා ඇති කොටස් අතරින් අංක 77, අංක 9, සහ WP, V යන කොටස් සාක්ෂිකරු විවුර්ත අධිකරණයේ දී හඳුනාගන්නා ලද අතර ඒ සමඟ සොයා ගන්නා ලද නිල්පාට හෙල්මටය සහ කබාය පැ.2004 සහ පැ. 2005 වශයෙන් සලකුණු කරන ලදි

වැඩිදුරටත් සාක්ෂි ලබාදුන් සාක්ෂිකරු එම යතුරුපැදිය අනුසර මෝටර්ස් වෙතින් මිලදීගෙන තිබූ බවට තමාගේ විමර්ශනයේ දී හෙලි වූ බවත් එහිදී එම මිලදී ගැනීම සඳහා පැමිණි කණ්ඩායම විසින් ඔවුන් පැමිණි එක් යතුරුපැදියක් අනුසර මෝටර්ස් ආයතනයට විකුණා අනුසර මෝටර්ස් ආයතනයෙන් යතුරුපැදි 2ක් මිලදී ගෙන තිබූ බවත් අනාවරණය වූ බවත් අනුසර මෝටර්ස් ආයතනය විසින් පවත්වාගෙන යන කුවිතාන්සි ලේඛනයේ 186 වන පිටුවේ ඇති විස්තර අනුව WP BGV 7799 දරණ යතුරුපැදිය අනුසර මෝටර්ස් ආයතනයෙන් ලබාගෙන ඇති බවත් කියා සිටිමින් එකී ලියා අත්සන් කරන ලද කුවිතාන්සිය පැ. 980(B) වශයෙන් සලකුණු කරන ලදි. එම කුවිතාන්සියේ සඳහන් යතුරුපැදියේ අංකය WP BGV 7799 බවත් එය මොහොමඩ් හුසේන් මොහොමඩ් ඉල්ලියාස් යන නමින් මිලදී ගෙන තිබූ බවත් එවැනි පුද්ගලයෙකු සොයා ගැනීමට නොහැකි වූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.එම යතුරුපැදියට අදාළ තමා විසින් සොයා ගන්නා ලද ලියාපදිංචි සහතිකය PR 105/2019ට

ඇතුළත් කර භාරදුන් බව කියා සිටිමින් එකී දේපළ කුවිතාන්සිය පැ.2006 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදි.

එම පැ. 2006 දරණ ලියාපදිංචි සහතිකයේ අංකය LOT FJ 0894874 දරණ අංකය බවත් එය එහි සමඟ පවරන්නාගේ අත්සන පමණක් ඇති MTA 6 ආකෘති පත්‍ර කට්ටලයක් ද තිබූ බවත්, ඊට අමතරව අනුසර මෝටර්ස් ආයතනයෙන් ලබාගන්නා ලද අනෙකුත් යතුරුපැදිය කාත්තණ්කුඩිය ප්‍රදේශයේදි පුපුරුවා හැරීමක් සිදු කළ බවට අනාවරණය වූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

එසේම සනස්දීන් යන සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව කරන ලද විමර්ශනවලදී ඔහු විසින් භාවිතා කරනු ලබන ජංගම දුරකතනය ඔහුගේ නිවසේ වැසිකිළි වළේ තිබී සොයාගෙන දේපළ කුවිතාන්සි අංක 105/19ට ඇතුළත් කරන (පැ. 2006) ලද බවත් කියා සිටින ලදි.

වැඩිදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු රෂීඩ් මොහොමඩ් ඊබ්‍රහිම් යන සැකකරු වර්ෂ 2019.06.06 වැනි දින මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් පරිදි බන්ධනාගාරයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරගත් බවත්, රෂීඩ් මොහොමඩ් ඊබ්‍රහිම් සමඟ මොහොමඩ් ෆයිසාර් මොහොමඩ් මුස්ති යන සැකකරු ද පල්ලෙකැලේ බන්ධනාගාරයේ සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගත් බවත් වැඩිදුරටත් කියා සිටින ලදි. සාක්ෂිකරු විසින් එකී රෂීඩ් මොහොමඩ්

ඊබ්‍රහිම් හෝ සනස්දීන් යන අයව ඔහුට අධිකරණයේදි හඳුනාගැනීමට නොහැකි බව සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

ඉහත සඳහන් විමර්ශනවලට අමතරව වර්ෂ 2019.06.14 වන දින තමා විත්තිකරුවන් රැඳී සිටි බවට සඳහන් මීගමුව දළුවකොටුව ප්‍රදේශයේ විමර්ශනයට ගිය බවත්, එහිදී එවකට සැකකරුවෙකුව සිටි අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි ද දළුවකොටුව ප්‍රදේශයට රැගෙන ගිය බවත් එම රැගෙන ගිය ස්ථානය අංක 394, රීදිවැලි පාර, දළුවකොටුව ලිපිනයේ පිහිටි නිවසක් බවත් තමා යන විට එම නිවස ඉබියතුරු දමා තිබූ බවත් කියා සිටිමින් එකී අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන සැකකරු මෙම නඩුවේ විත්තිකරුවන් අතර සිටින 10 වන චූදිතයා බවට විවෘත අධිකරණයේදි හඳුනාගන්නා ලදි. එම නිවස සම්බන්ධයෙන් කරන ලද වැඩිදුර විමර්ශනවලදී හස්තූන් නැමැති පුද්ගලයෙකු විසින් 2017 ඔක්තෝම්බර් මාසයේ සිට 2018 මාර්තු මාසය දක්වා එම නිවස කුලියට ගෙන තිබූ බවත් 10 වැනි විත්තිකරු ද එම නිවසේ රැඳී සිටි බවට විමර්ශනවලදී අනාවරණය වූ අතර හස්තූන් ඇතුළු තවත් පිරිසක් එහි රැඳී සිටි බවත් කියා සිටින ලදි.

ඉන් අනතුරුව 2019.06.24 වන දින මෙම නඩුවේ 10 වන විත්තිකරුව වත්තල, එඩේරමුල්ල, වීදිගම අංක 484/2 යන නිවසට ගිය බවත් එම නිවසේද මෙම 10 වන විත්තිකරු රැඳී සිටි බවට විමර්ශනයේදි අනාවරණය වී තිබූ බවත් ඒ සමඟ ඇඟිලි සටහන් කාර්යාලයේ ඇඟිලි

සලකුණු ලබා ගැනීමේ නිලධාරීන් ද රැගෙන ගිය බවත් එම නිවසේ යතුර එහි හිමිකරු ගෙන්වා ලබාගෙන ඔහු ලවා නිවස විවෘත කරවා ගත් බවත් සාක්ෂිකරු පවසා සිටින ලදි.

ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ එදින විමර්ශන කටයුතු පවත්වන අවස්ථාව වන විටත් එඬේරමුල්ලේ නිවස සම්බන්ධයෙන් කරුණු අනාවරණය වී තිබූ බවත් බෝම්බ ප්‍රහාරයෙන් පසු දින මෙම නඩුවේ 1 වන සහ 9 වන විත්තිකරුවන් එම ස්ථානයට රැගෙන ගොස් තිබූ බවත් ඇඟිලි සටහන් කාර්යාලයේ නිලධාරීන් 2019.06 මාසයේ එම නිවසට යන තුරු එම නිවසේ යතුර එකී එම නිවසේ අයිතිකරු භාරයේ තිබූ බවත් <u>10 වන විත්තිකාර සාෂිව කිසිදු අවස්ථාවක</u> නිවස තුළට රැගෙන නොගිය බවත් නිවස තුළට එදින ඇතුළු වූයේ එනම්, 2019.06.24 දින නිවසට ඇතුළු වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන් පමණක් බවත්, ඔවුන් ලබාගත් ඇඟිලි සලකුණු මොනවාද යන්න සම්බන්ධයෙන් තමාට අවබෝධයක් නැති බවත් කියා සිටින ලදි. ඇඟිලි සටහන් කාර්යාලයේ නිලධාරීන් සිය රාජකාරිය අවසන් වන තෙක් තමා එතන රැඳී නොසිටි බවත් 2019.06.25 වන දින කොච්චිකඩේ දලුවාකොටුව ප්‍රදේශයට ගිය බවත් එහිදී අනාවරණය වී තිබූ සැකකරුවන් රැඳී සිටියේ යැයි කියනු ලබන නිවස එම නිවසේ අයිතිකරුගේ මව වන මේරියන් ලීනා ප්‍රනාන්දු යන අයගෙන් යතුර ලබාගෙන විවෘත කරවාගත් බවත්, ඉන් අනතුරුව ඇඟිලි සටහන්

රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පැමිණි නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරිය කරගෙන යාමට ඉඩ සලස්වා දුන් බවත් කියා සිටින ලද අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හෝ වෙනත් විමර්ශන ආයතනයක නිලධාරීන්ට එම නිවසේ හිමිකරුවන්ගේ අනුදැනුමකින් තොරව එම නිවසට ප්‍රවිෂ්ට වීමට හැකියාවක් නොතිබුණු බවත් ඒවා වසා ගේට්ටුද වසා දමා තිබූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදි.

වැඩිදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු අනුසර මෝටර්ස් ආයතනයෙන් යතුරුපැදි 2ක් මිලදී ගැනීමේදි අනුසර මෝටර්ස් ආයතනයට විකිණූ NP BCG 2763 යතුරුපැදිය පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ පුද්ගලයෙකුට විකුණා තිබියදී අත්අඩංගුවට ගෙන පුදුකුඩිඉරිප්පු පොලිසියේ දේපළ කුවිතාන්සි අංක 794/19 යටතේ ඇතුළත් කළ බවත් කියා සිටිමින් එම දේපළ කුවිතාන්සිය පැ. 2007 වශයෙන් සලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරුගෙන් 9 වන විත්තිකාර මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කරන ලද අතර එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 9 වන විත්තිකාර සාජිත් යනඅය සම්බන්ධයෙන් පළමුව තොරතුර 2019.01.23 වනදින අනාස් යනඅයගෙන් ලැබුණු බවත්, ඒ සම්බන්ධයෙන් පුද්ගලික ඔත්තුකරුවන්ගෙන් සහ විවිධ ප්‍රදේශවලට ගොස් පරීක්ෂණවලට ඒ සම්බන්ධයෙන් සටහන් යෙදීමක් සිදුනොකළ බවත්, 9 වන විත්තිකරුට එරෙහිව කිසිදු අධිකරණයකින්

විවෘත වරෙන්තුවක් ලබාගැනීමට කටයුතු නොකළ බවත්, කියා සිටින ලද අතර එහිදී 9 වන චූදිත සම්බන්ධ වී සිටියේ යැයි කියන ලබන ත්‍රස්තවාදී සංවිධානය ‘‘තවුසිද් ජමාත්’’ බවත් එය ඒ වනවිට ත්‍රස්තවාදී සංවිධානයක්ද යන්න සම්බන්ධයෙන් ප්‍රකාශගතකර තිබුණේද යන්න තමාට කිවනොහැකි අතර එම විවිධ ප්‍රදේශයන්හි සාජිත් යන 9 වන චූදිතව පරීක්ෂාකර බැලීම සම්බන්ධයෙන් එම ප්‍රදේශයන්හි පුද්ගලයන්ගෙන් සහ ග්‍රාමනිලධාරිවරුන්ගෙන් විමසා සිටියද ඒ සම්බන්ධයෙන් සටහන් ඉල්ලීමක්කර නොමැති බව කියා සිටින ලදී. එසේම, 9 වන චූදිතව මල්වාන මයුර පෙදෙස සහ ඔහු වාසයකළේ යැයි කියන ස්ථානවලට රැගෙන යාමේදී ඒ වනවිට 9 වන චූදිත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා සිටි බවත්, එවැනි අවස්ථාවකදී නිලධාරීන් විසින් රැගෙන යනවිට යා යුතු බවටත් සාක්ෂිකරුට යෝජනාකරන ලද අතර සාක්ෂිකරු එය පිළිගන්නා ලදී.

වැඩිදුරටත් 9 වන විත්තිකරුගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන් සාක්ෂිකරු එඬේරමුල්ලේ නිවසෙහි යම් පෙට්ටියක තිබී 9 වන විත්තිකරුගේ දකුණු අතේ ඇඟිලි දෙකක සලකුණු සොයාගත් බව තමා දන්නා බවත්, මයුර පෙදෙස හෝ මල්වානයේ නිවෙස්වල තිබී ඇඟිලි සලකුණු සොයාගැනීමක් පිළිබඳව තමා නොදන්නා බවත්, කියා සිටින ලදී. එසේම, එඬේරමුල්ලේ නිවසේ එනම්, 9 වන චූදිතගේ ඇඟිලි සලකුණු සොයාගත් නිවසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී 9 වන

වූදිතව මෙම සාක්ෂිකරු විසින් රැගෙනගොස් නොමැති බව කියා සිටින ලද අතර මොහොමඩ් අන්සාර් යනු සහරාන්ගේ මස්සිනා කෙනෙක් බවත්, උප පොලිස් පරීක්ෂක ගයාන් රත්නායක ඇතුළු කණ්ඩායමක් සහරාන්ගේ බිරිඳගේ නිවසේදී කරන ලද පරීක්ෂණයකදී ගයාන් රත්නායකට එම ස්ථානයෙන් ඉවත්වන ලෙසට තමා දැනුම්දීමක් නොකළ බවත්, එසේ දැනුම්දීමක් කිරීමට තමාට නෛතික හැකියාවක් නොමැති බවත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී.

එසේම, 9 වන චිත්තිකරුගේ වැඩිදුර හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන් සාක්ෂිකරු 9 වන චිත්තිකරුව 2019.04.21 වෙනිදින දඹුල්ලේදී අත්අඩංගුවට ගෙන 2019.04.22 වනදින පැය 10.45 ට දඹුල්ලෙන් පිටත්වී පැමිණි බවත්, එහිදී සැකකරුට අත්විලංගු දමා තිබූ අතර සැකකරුගේ ඉල්ලීම මත අත් පිටුපසට කරදමා තිබූ අත්විලංගුව අත් ඉදිරිපසටකර දමා ඔහුට පහසුවෙන් සිටීමට අවස්ථාව ලබාදුන් බවටත් කරන ලද යෝජනාව පිළිගන්නා ලද අතර එම එන ගමනේදී එඩේරමුල්ල නිවසේදී වාහනය නවත්වා සිටියද කිසිදු වෙලාවක 9 වන චූදිත හෝ 1 වන චූදිතව වාහනයෙන් පිටතට නොගත් බවත් සැකකරුවන් කිසිදු අවස්ථාවක එඩේරමුල්ල නිවස තුළට එදින රැගෙන නොගිය බවත්, 9 වන චූදිතව එම නිවස තුළට රැගෙනගොස් එහි මුළුතැන්ගෙයි තිබූ වතුර බෝතලයෙන් වතුරබීමට අවස්ථාව ලබාදුන්නේය යන යෝජනාව ප්‍රතික්ෂේප කරන බවත් කියා සිටින ලදී.

එසේම, කිසිදු අවස්ථාවකදී චූදිතයන්ට තර්ජනය කිරීමක් හෝ ඔවුන්ව කැළණි ගඟ අසළ වෙඩි තබා පාලමෙන් පල්ලෙහාට දානවා ලෙසට තර්ජනය කිරීමක් සිදුනොකළ බවත්, සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලදී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරුදෙමින් කියා සිටින ලදී. 2019.04.22 වනදින එඬේරමුල්ල නිවසට යනවිට එම නිවස ඉබියතුරු දමා වසා තිබුණු බවත් 2019.06.24 දින දක්වා එම නිවසට යමෙකු ඇතුල් වූයේ නම් එය විමර්ශන නිලධාරීන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත්ව සිදුවියයුතු බවත් 2019.06.24 දින පොලිස් සැරයන් 31717 ස්වර්ණතිලක සහ ඡායාරූප ශිල්පී පොලිස් සැරයන් 28463 රණසිංහ නිලධාරීන් එම ස්ථානයට ගිය අතර එම නිවසට යාම සඳහා 10 වන විත්තිකාර අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆිගේ සහය ලබාගත් බවත් එසේ යන අවස්ථාවේදී 10 වන චූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අය අතට බැන්ඩේජ් එකක් දැමීමක් හෝ ප්‍රතිකාර ගැනීම සඳහා කිසිදු අවශ්‍යතාවයක් නොතිබුණු බවත් ඇඟලි සලකුණු නිලධාරීන්ට නිවසේ අයිතිකරු දොර විවෘත කිරීමෙන් පසු ඔවුන් එම රාජකාරිය ඉටුකළ බවත්, ඔවුන් රාජකාරිය ඉටුකර කුමන වෙලාවක එම ස්ථානයෙන් බැහැරගියේද යන්න සම්බන්ධයෙන් තමාට දැනීමක් නොමැති අතර තමා කිසිදු අවස්ථාවක 2019.06.24 වෙනිදින එම නිවසට ඇතුළු නොවූ බවත් තමාත් නන්දලාල් නිලධාරියාත් වාහනයේ සිටි බවත් ASP වික්‍රමසේකර මහතා විශේෂ කාර්ය බලකා නිලධාරීන් සමඟ එම නිවස පරීක්ෂාවට සම්බන්ධවී සිටි බවත්,

ඇඟිලි සලකුණු කුමන ස්ථානවල කුමන භාණ්ඩවල තිබී සොයාගත්තේද යන්න සම්බන්ධයෙන් තමාට දැනීමක් නොමැති බවටත් සාක්ෂිකරු පවිසා සිටින ලදී.

එසේම, වර්ෂ 2019.04.22 වනදින දඹුල්ලේ සිට කොළඹට 1 වන චූදිතව සහ තමාට රැගෙන එන අවස්ථාවේදී එඩේරමුල්ලේ නිවස හඳුනාගැනීම සඳහා එම නිවස තුළට තමාව රැගෙනගිය බවත්, එම නිවස තුළ තිබී ඇඟිලි සලකුණු සොයාගැනීමේදී එසේ ඇඟිලි සලකුණු සොයාගැනීමට හේතුව 2019.04.22 වන දින තමාව එම නිවස තුළට රැගෙන යාම බවට යන ස්ථාවරය බිඳහෙළීම සඳහා තමාව එම නිවසට රැගෙන නොගිය බවට 09 චූදිත විසින් මෙම සාක්ෂිකරුට කරන ලද යෝජනාව සාක්ෂිකරු එකහෙලාම ප්‍රතික්ෂේප කරන ලදී.

ඉන් අනතුරුව 4 වන චූදිත විසින් මෙම සාක්ෂිකාර ඩයස් පද්මසිරි නිලධාරියාගෙන් හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කර ඇති අතර එහිදී වතුර වලේ තිබී සොයා ගන්නා ලද යතුරුපැදියේ අංකය WP BGV 7799 බවත්, එය පැ. 980 (B) දරණ රිසිට්පතේ සඳහන් වන බවත් එය මිලදී ගෙන තිබෙන්නේ වර්ෂ 2019.01.26 අනුසර මෝටර්ස් මඟින් බවත් කියා සිටින ලදි. ඉන් අනතුරුව සාක්ෂිකරුට පැ. 978 දරණ ලේඛනය පෙන්වන ලද අතර එසේ පෙන්වා 4 වන චිත්තිකරු විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පැ. 978 දරණ රිසිට්පතේ ඇති යතුරුපැදියේ අංකය WP

BCQ0304 බවත්, එහි දිනය 2019.03.06 දිනය බවත් කියා සිටින ලදි. (එම අවස්ථාවේදි එම ලේඛනය අපහැදිලි බැවින් විශාලනය කර බලන අත්කාවයක් මඟින් දිනය පැහැදිලි කරගන්නා ලදි.)

වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසන ලද 4 වන විත්තිකරු සාක්ෂිකරුට පැ. 979 දරණ රිසිට්පත පෙන්වා සිටින ලද අතර එහිදී එම රිසිට්පත අනුව එම රිසිට්පතේ සඳහන් යතුරුපැදිය WP BCY 2183 බවත්, පැ. 980 දරණ ලේඛනයේ සඳහන් යතුරුපැදිය WP BCG 2763 බවත් පිළිතුරු දෙමින් කියා සිටින ලදි.

පැ. 980(B) යන ලේඛනය අනුව වතුර වලේ තිබී ලබාගත් යතුරුපැදියේ අංකය WP BGV 7799 ලෙසට සටහන් වන අතර ඒ අනුව යතුරුපැදි 4ක් සම්බන්ධයෙන් රිසිට්පත් පවතින බවත් මූලික සාක්ෂියේදි යතුරුපැදි මිලදී ගැනීම සඳහා පැමිණි පිරිස විසින් අනුසර මෝටර්ස් වෙත විකුණන ලද යතුරුපැදිය පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේදි භාරයට ගත් බවත් එසේ ලබාගත් යතුරුපැදි දෙකකින් එකක් වතුර වලේ තිබී සොයාගත් බවත් කියා සිටින ලද අතර සාක්ෂිකරු විවෘත අධිකරණයේ බොරු සාක්ෂි ලබාදෙන බවට කරන ලද යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදි.

තවදුරටත් 4 වන විත්තිකරුගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන් සාක්ෂිකරු තමාට පෙන්වා සිටින ලද ලේඛන අනුව වතුර වලේ තිබී සොයා ගත් යතුරුපැදිය මිලදී ගෙන ඇත්තේ 2019 ජනවාරි 26 වන දින බවත්

පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයෙන් සොයාගත් යතුරුපැදිය විකිණීම 2019.03.06 දින සිදු කර ඇති බවත් කියා සිටින ලද අතර පැ. 2000 ලෙස සලකුණු කරන ලද යතුරුපැදිය සොයා ගැනීම සම්බන්ධයෙන් වූ උධෘත පිටපතෙහි ‘‘නියාස්ලගේ ගෙදරට’’ යනුවෙන් සඳහන්ව ඇති බවත් ඔහුගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇති අතර ප්‍රකාශය අනුව ඔහුගේ නම මොහොමඩ් සාලිම් මොහොමඩ් නියාස් බවත් කියා සිටින ලදි.

ඉන් අනතුරුව සාක්ෂිකරු විසින් වර්ෂ 2019.01.15 වන දින පුත්තලමට ගොස් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් යොදන ලද සටහන් පරීක්ෂා කර බැලීමට අවසර ඉල්ලා ඇති අතර එම ලේඛන පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව එහි දිනය 2018 වශයෙන් සඳහන් වීම යතුරුලියන දෝෂයක් බවත්, එය නිවැරදිව 2019.01.15 දිනය වියයුතු බවටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටින ලදි.

මූලික සාක්ෂියේදි කියා සිටි පරිදි පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තේදි සොයා ගන්නා ලද ද්‍රව්‍ය තුළට ධම්මික නිලධාරියාගේ ඇඟිල්ල පිව්වුණ බව හෝ ඒවා පොළොවට හැලූ විට පොළොවේ පස බුරුල් වී බුබුළු දැමීමට පටන් ගත් බවට තමා සටහනක් යොදා නොමැති බවත් එය තමා ඇසින් දුටු දෙයක් බැවින් තමාට මතකයෙන් එය කියා සිටි බවත් කියා සිටින ලදි.

වැඩිදුරටත් හරස් ප්‍රශ්න අසන ලද 4 වන චිත්තිකරු සාක්ෂිකරු විසින් අනාස් සම්බන්ධයෙන් දෙන ලද සාක්ෂියේදී තහනම් කළ සංවිධානයක් ලෙසින් සඳහන් කළේ එම සංවිධානය ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් කරන සංවිධානයක් බවට හෙළි වූ බැවින් බවත් තමා එකිනෙකට පරස්පර පිළිතුරු ලබා නොදෙන බවත් අනාස් යන පුද්ගලයා පුත්තලමට නොපැමිණි බවත් කියා සිටින ලදි. තවදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලද සාක්ෂිකරු අනාස් යන පුද්ගලයා කෑගල්ල පොලිසියේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දී ඇති බවත්, කෑගල්ල පොලිසිය මත විශ්වාසයක් නොමැති බැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සියලු විස්තර හෙළි කළ බව කියා සිටි බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීමක් නොකළ අතර අනාස් යන පුද්ගලයා ආරක්ෂක අමාත්‍යාංශයට ලේඛන සකස් කිරීමට හෝ රාත්‍රී කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රැඳී සිටීමට ඉඩ දීමක් සිදු නොකළ අතර ඔහුට ඕනෑම අවස්ථාවක අධිකරණයෙන් නඩු අංක ලබා ගැනීමේ හැකියාවක් ඇති බවත් කියා සිටින ලද අතර තමාගේ අංශයෙන් කිසිදු අවස්ථාවක එම පුද්ගලයාට විමර්ශනය සිදු කරන නඩු අංක ලබා දීමක් සිදු නොකළ බව කියා සිටින ලදි.

‘‘අබු ’’ යන අන්වර්ථ නාම මෙම නඩුවේ පැ.සා 1400 අනාස් යන අයට ලබා දුන්නේ මෙම සාක්ෂිකරු බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු

ප්‍රතික්ෂේප කරන ලද අතර එම අන්වර්ථ නාම තමාට ලබා දුන්නේ පැ.සා 1400 අනාස් අනාස් විසින් බව කියා සිටින ලදි.

ඔහුගෙ සාක්ෂියේ දී වැඩිදුරටත් පවසා ඇත්තේ පුත්තලම වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත අක්කර 75ක් පමණ විශාල ඉඩමක් බවත් එය යුධ හමුදාව සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් ද විසින් පරීක්ෂා කළ බවත් එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂකවරයෙක් වූ ශානි අබේසේකර යන මහතාද එම ස්ථානයට පැමිණ සිටි බවත් එම ස්ථානයට යාම පුද්ගලික ඔත්තුකරුවන් විසින් ලබාදුන් තොරතුරු මත සිදු වූවක් බවත් වේ.

එසේම විශේෂ කාර්ය බලකාය විසින් එම ස්ථානය පරීක්ෂා කිරීමට අදාළ රාජකාරි සඳහා තමා සහභාගි නොවූ බවත් එම ඉඩම කොපමණ කාලයක් පොලිසිය භාරයේ තිබුණේද යන්න තමා නොදන්නා බවද සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වැඩිදුරටත් කියා සිටින ලදි.

මෙම සාක්ෂිකරු විසින් මූලික සාක්ෂියේදි වැසිකිළි වළක තිබී ජංගම දුරකතනයක් සොයාගත් බවට ලබා දුන් සාක්ෂිය සම්බන්ධයෙන්ද 4 වන චූදිත විසින් හරස් ප්‍රශ්න විමසීමක් කර ඇති අතර එම ස්ථානයට නන්දලාල්, දිසානායක සහ විජේරත්න යන නිලධාරීන් සහභාගි වූ බවත්, එහිදී නන්දලාල් යන නිලධාරියාගේ සටහනෙහි ‘‘.... වැසිකිළි වළෙහි පිරිසිදු ජලය ඉවත් කරන ලදි.’’ යනුවෙන් සඳහනක් තිබෙන බවත් එය

එසේ සඳහන්ව තිබුණ ද එම ස්ථානයේ තිබුණේ අපවිත්‍ර ජලය බවත් එසේම සනස්දීන් යන අයට අයත් ලොරි රථයක් සහ ත්‍රීරෝද රථයක් ද පොලිසිය භාරයට ගත්තේ ද? යන්න සම්බන්ධයෙන් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඒ සම්බන්ධයෙන් තමා නොදන්නා බවත් එම ලොරි රථය සහ ත්‍රීරෝද රථය මුදාහැරීමකින් තොරව රඳවා ගන්නේ යැයි තර්ජනයකොට සනස්දීන් නැමත්තාගෙන්(7වූදිත) ප්‍රකාශයක් සටහන් කරගත්තේය යන යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදි.

මෙම 4 වන විත්තිකරු විසින් වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසමින් 14 වන චූදිත වන රශීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම් යන අයව පල්ලෙකැලේ බන්ධනාගාරයේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට රැගෙන ආ බවට දෙන ලද සාක්ෂිය හරස් ප්‍රශ්නවලට භාජනය කර ඇති අතර පාස්කු ප්‍රහාරයට මාස 3කට පෙර එම 14 වන චූදිත බන්ධනාගාරගතව සිටියේය යන්න සාක්ෂිකරු දන්නේද? යන ප්‍රශ්නයට තමා එය දැන සිටියේ නැති බව කියා සිටින ලදි.

5 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් ගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ රිස්වාන් සම්බන්ධයෙන් සොයා බැලීමේදි ඔහුගේ නිවසට නොගිය නමුත් අසල්වාසීන්ගෙන් ඔහු ගැන සොයා බැලූ බවට සාක්ෂිකරු පවසා සිටිය ද නිවසට නොගොස් අසල්වාසීන්ගෙන් සොයා බැලුවේය යන්න සම්පූර්ණ අසත්‍යයක් බවට

කරන ලද යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදි. එසේම තමා සැකකරුවන් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදීම මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ගිය බවට 5 වන චූදිත ගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු පවසා සිටින ලද අතර BGV-7799 දරන යතුරුපැදියේ ලේඛන 6 චූදිත රිස්කාන් යන අයගේ නිවසේ තිබී සොයාගත් බවට මෙම සාක්ෂිකරු ලබා දෙන ලද සාක්ෂිය අසත්‍යය සාක්ෂියක් බවට කරන ලද යෝජනාව ඔහු ප්‍රතික්ෂේප කරන ලදි.

මෙම සාක්ෂිකරු 01 වන චූදිත මොහොමඩ් ඊබ්‍රහිම් මොහොමඩ් නවුෆර්ගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 2019 අප්‍රේල් 22 වැනි දින උදෑසන 10ට පමණ 1 වන චූදිතව සහ 9 වන චූදිතව දඹුල්ල පොලිසියෙන් තමා භාරයට ගත් බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එම දෙදෙනාවද රැගෙන පැමිණෙන විට රාත්‍රී 8.00 පමණ වූ බවත් ඊට පෙර එසේ පැමිනෙන අතරතුරදී එඩෙරමුල්ල ප්‍රදේශයට රැගෙන ගිය බවත් එම අවස්ථාවේදි 09 වන චූදිත සාජිත් යන අයව එම නිවස තුළට රැගෙන ගියේය යන යෝජනාව මෙම සාක්ෂිකරු විසින් එකහෙලාම ප්‍රතික්ෂේප කරන ලදි.

සාක්ෂිකරු පවසා ඇත්තේ සැකකරුවන් භාරයට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රැගෙන එන තුරු ඔවුන්ට ආහාර සහ ජලය ලබාදුන් බවත් ආහාර හෝ ශරීර අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට

අවස්ථාවක් ලබාදුන්නේ නැති බවට වූ යෝජනාව තමා ප්‍රතික්ෂේප කරන බවත්, ඔවුන්ට ජලය පානය කිරීම සඳහා ඔවුන්ට ඒ මාංචු දමා තිබූ ආකාරය වෙනස්කොට අත් ඉදිරිපසට ගෙන මාංචු දමා පහසුකම් සැපයූ බවත් කියා සිටින ලදි. නැවත වතාවක් 1 වන චූදිත විසින් මෙම සාක්ෂිකරුට යෝජනා කරන ලද්දේ සාජිත් යන අයව නිවස තුළට රැගෙන ගොස් ටික වේලාවකින් ආපසු රැගෙන ආ බවයි. නමුත් එම යෝජනාව සාක්ෂිකරු විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර සැකකරුවන් දෙදෙනාම නිලධාරීන් කණ්ඩායම භාරයේ ජීප් රථයේ සිටි බව කියා සිටින ලදි.

1 වන සැකකරුව පළමු වතාවට අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමේ දිනය සාක්ෂිකරුට මතකයක් නැති බවත් 7 වන චූදිත විසින් ලබාදෙන ලද ප්‍රකාශය පො.සැ. නන්දලාල් විසින් සටහන් කරගෙන ඇති අතර නන්දලාල් නිලධාරියාට දෙමළ භාෂාව කතා කිරීමේ සහ තේරුම් ගැනීමේ හැකියාව ඇති බවත්, ඒ අනුව එම ප්‍රකාශය සටහන් කරගත් අතර 7 වන චුදිතට සිංහල භාෂාව තේරුම් ගැනීමේ හැකියාවක් තිබුණද පැහැදිලිව උත්තර දීමේ හැකියාවක් නොතිබුණු බව කියා සිටින ලදි. 2, 7, 8, 10, 15, 18 සහ 19 චූදිතයන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ මහතා 7 වන චූදිතට අඩම්තේට්ටම් කර, වධහිංසා කර ප්‍රකාශයක් ලබාගෙන ඒ අනුව අධිකරණයේ සාක්ෂි ලබාදෙන්නේ යන යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදි.

07 වන චූදිතගේ ප්‍රකාශය මත මෝටර් සයිකලය සොයාගැනීම සඳහා යාමට පෙර කුලියාපිටිය ප්‍රදේශයේ විමර්ශන කටයුත්තක් සඳහා සහභාගී වූ බවත්, ඒ අනුව 04/30 දින මොහොමඩ් රිස්කාන් මොහොමඩ් සනස්දීන් යන සැකකරුවන් සමඟ කුලියාපිටිය නාරම්මල ප්‍රදේශයට පිටත්ව ගිය බවටද, කුලියාපිටිය ඇතුල්ගහකොටුව නාරම්මල ප්‍රදේශයට ගිය බවටද සටහන් ඇතුළත්කර ඇති බවත්, වැසිකිළිවළේ තිබී දුරකථනය සොයාගත්තේ විත්තිකරුවන් විසින් ලබාදුන් තොරතුරු මත බවත් ඒ සඳහා කුලියාපිටිය මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් කුලියාපිටිය නගර සභාවට කතාකර සහාය ලබාගත් බවත් වැසිකිළිවළේ තිබූ ජංගම දුරකථනය ලබාගැනීම දිවා කාලයේ සිදුකළයුතු බැවින් එම කාරණයට මුල්තැන ලබාදී කටයුතු කළබවත් කියා සිටින ලදී.

එසේම ඒ අනුව, බයිසිකලය සොයාගැනීම සඳහා පැය 56කට වැඩි කාලයක් ගතවීම සාක්ෂි නිර්මාණය කරගැනීම සඳහා ගතකළ බවට වූ යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරඇත. යතුරුපැදිය ගොඩගත් ස්ථානයේ ගැඹුර එය උඩටගත් පුද්ගලයා විසින් කියූ පරිදි අඩි 15ක් පමණ වනබවත්, ඒ සම්බන්ධයෙන් සටහන් වන මොහොමඩ් කලීබ් මොහොමඩ් නියාස් යනඅය විසින් වතුරවළට බැස යතුරුපැදිය ගොඩගත් බවට සටහන්කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් ගමේ පිරිස සහභාගී වූ බවට සටහනක් යොදාඇති අතර එය නිර්මාණය කරන ලද සාක්ෂියක් බවට කරන ලද යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී. ලේඛන අනුව එසේ ගොඩගත්

බයිසිකලයේ අයිතිකරු මොහොමඩ් හුසෙයින් මොහොමඩ් ඉල්ලියාස් ලෙසට හෙළිවුවද එය සනස්දීන් විසින් භාවිතා කරන ලද බයිසිකලයක් බවට විමර්ශනයේදී අනාවරණය වූ බවත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ වෙනත් නිලධාරීන් පිරිසක් විසින් සිදුකළ බවත් කියා සිටින ලදී. වැසිකිළිවළේ තිබී සොයාගන්නා ලද දුරකථනය භාවිතාකර ඇත්තේ සනස්දීන් බවට විමර්ශනයේදී අනාවරණය වූ අතර එසේ නොවූයේ යැයි යන විත්තියේ යෝජනාව ප්‍රතික්ෂේප කරඇත. යතුරුපැදියට අදාළ ලියකියවිලි අතර තිබී සොයාගන්නා ලද MTA 6 හි තිබූ අත්සන් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුනොකළ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටින ලදී. එසේම, මීගමුව, දළුවාකොටුව, එඩේරමුල්ල ආදී ප්‍රදේශවල පරිශ්‍රයන් කිහිපයක් පරීක්ෂාකිරීමට ගියබව තමා පිළිගන්නා බවත් එම අවස්ථාවන්වලදි එම නිවාසවල යතුරු එම නිවාසවල අයිතිකරුවන් භාරයේ තිබූ බවත් නමුත් ඔහුනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව නිවාස විවෘත නොකරන ලෙසට උපදෙස්දී තිබූ බවත් යම්කිසි පුද්ගලයෙකු එම උපදෙස කඩා නිවසට ඇතුළු වූ බවට තමාට අනාවරණය නොවූ බවත් කියා සිටින ලදී. සාක්ෂිකරුගෙන් නඩු භාණ්ඩ අතර තිබී අංක තහඩු කැබලි කිහිපයක් සොයාගැනීම සම්බන්ධයෙන්ද හරස් ප්‍රශ්න විමසනලද අතර එහිදී එම අංකවල දර්ශනය වූයේ අංක 77, අංක 9 කොටසක්, අංක B සහ B අකුර යැයි සැකකළහැකි අක්ෂරයක කොටසක් යන්න පමණක් වනඅතර

එම කොටස් බලා අංක තහඩුවේ නිශ්චිත අංකය කීමට තමාට හැකියාවක් නොමැති බව කියා සිටින ලදී.

වැඩිදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරුදුන් එම සාක්ෂිකරු 2019.06.24 දින පැය 11.25ට සාක්ෂිකරු විසින් යොදා ඇති සටහනෙහි " සැකකරුද රැගෙන එඩේරමුල්ල මීගමුව ප්‍රදේශයට යමි." යනුවෙන් සටහන්ව ඇති බවත් එහි සටහන්වලත් මීගමුව කොච්චිකඩේ ප්‍රදේශයෙන්ද තමාට තොරතුරක් ලැබුණු අතර තමාගේ පිටවීම් සටහන්වල මීගමුව දළුවාකොටුව ප්‍රදේශයට යනබවට සටහනක් ඇති බවත්, 2019.06.24 දින කොච්චිකඩේ සටහනක් හෝ දළුවාකොටුව සටහනක් ඇතුළත්වී නොමැති බවට පිළිගන්නා බවත් කියා සිටින ලදී. මෙහිදී උගත් නීතීඥ මහතා විසින් 10 වන චූදිතට පහරදීමට සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසා ඇති අතර 10 වන චූදිතගේ අත බද්ධ වන තරමට පහරදුන්නේ යන යෝජනාව ප්‍රතික්ෂේප කරමින් තමා එම විමර්ශන රාජකාරියට සහභාගී නොවූ බවත්, 10 වන චූදිතට මීගමුව ඒත්තුකාල ප්‍රදේශයේ වෙදමහතෙකුගෙන් ප්‍රතිකාර ලබාදුන්නේය යන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත් කියා සිටින ලදී. ඉන් අනතුරුව 20 සිට 25 දක්වා විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතීඥ මහතා විසින් හරස් ප්‍රශ්න විමසා ඇති අතර යතුරුපැදිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා 2019.04.29 දින තමාට උපදෙස් ලද අතර ඒ සඳහා 04/30 දින තමාට විශේෂ රාජකාරියක් පැවරී

තිබූ බැවින් 2019.05.01 දින යතුරුපැදිය සම්බන්ධයෙන් විමර්ශන සඳහා පිටත්ව ගියබව කියා සිටින ලදී.

ඒදණ්ඩාවල ප්‍රදේශයට යනවිට වේලාව 2019.05.01 පැය 16 ට පමණ බවත් ඒ වනවිට 2019.04.30 දින සිට සැකකරුවන් තමා භාරයේ සිටි අතර 2019.05.01 දින ජංගම දුරකථන, මුදල් සහ යතුරුපැදිය සොයාගත් බවත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටින අතර සැකකරුවන්ට කිසිදු අවස්ථාවක වතුරවළ තිබෙන ස්ථානයට රැගෙන ගියේ නැති බවට වූ යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී. සොයාගන්නා ලද යතුරුපැදිය වීගෝ(Wigo) වර්ගයේ නිල් පැහැති යතුරුපැදියක් බවත් විමර්ශනවලදි එම යතුරුපැදිය පාස්කු ප්‍රහාරයෙන් පසු දිනක එම වතුරවළට දමා තිබූ බව තමාට අනාවරණය වූ බවත් සැකකරුවන් කිහිපදෙනෙකු රැගෙන ගිය බැවින් විශේෂ කාර්ය බලකායේ නිලධාරින් ආරක්ෂාව සඳහා සහයට ගිය බවත්, එහි ගැඹුර අඩි 15ක් බවට දැනුම් දුන්නේ එම වතුරවළට බැස බයිසිකලය අරන්දුන් පුද්ගලයා බවත් එම පුද්ගලයා ඉදිරිපත්වී එය කළබැවින් එහි අනතුරුදායක තත්ත්වයක් තමා නොදුටු බවත් කියා සිටින ලදී. තමාගේ සටහන්වල ඒදණ්ඩාවල මාර්ගයේ පාර අයිනේ පිහිටා ඇත යනුවෙන් ඇති බවත් කියා සිටින ලදී.

ඉන් අනතුරුව අනෙක් චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බව දන්වන ලද අතර පැමිණිල්ල විසින් නැවත ප්‍රශ්න විමසීමේදී 9 වන

විත්තිකරුව එඩේරමුල්ල නිවසට 2019.04.22 වනදින රැගෙන ගියබවත්, ඇඟිලිසටහන් නිලධාරීන් 2019.06.24 දින රැගෙන ගිය අතර 2019.04.22 9 වන විත්තිකරුව නිවස තුළට රැගෙන ගියේ නම් ඇඟිලි සලකුණු සොයාගැනීම සඳහා 2019.06.24 දින දක්වා මාස දෙකක කාලයක් ප්‍රමාද කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බවත් කියා සිටින ලදී.

එසේම, අනුසර මෝටර්ස් ආයතනයෙන් පෙන්වන ලද බිල්පත් සම්බන්ධයෙන් නැවත ප්‍රශ්නවලට පිළිතුරුදුන් සාක්ෂිකරු එම ස්ථානයෙන් අවස්ථා කිහිපයකදීම බයිසිකල් ලබාගෙන ඇති බවත්, බයිසිකලය සොයාගත්තේ 7 වන චූදිතගේ මඟපෙන්වීම මත වන බවත් එම ස්ථානයේ සිටි පුද්ගලයාගේ නිවැරදි නම නියාස් ලෙස නිවැරදි ලෙසට නිවැරදි වියයුතු බවත්, එය සටහනේ ඇති අතර එය තමාට නිරීක්ෂණය වූයේ නියාස් ලෙසට බවටත් කියා සිටින ලදී. ලැක්ටොවත්ත සම්බන්ධයෙන් නැවත ප්‍රශ්න විමසීමක් සිදුකර ඇති අතර එහිදී විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් මෙම වත්ත පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් තමා නිරීක්ෂණය නොකළ බවත් මෙම සිද්ධියේදී සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට ප්‍රමුඛතාවය ලබාදී තිබූ අතර ජංගම දුරකථනය වැසිකිළිවළෙන් තිබී සොයාගැනීම සඳහා යම් කාලයක් ගතවූ බවත්, 2019.04.30 දින රාජකාරිවලින් පසුව සැකකරුවන් දුම්මලසූරිය පොලිසිය භාරයේ තබා පසුදින ඔවුන්ව වැඩිදුර පරීක්ෂණ සඳහා භාරගෙන ඇති බවත් කියා සිටින

ලද සාක්ෂිකරු සනස්දීන් යන සැකකරුට සිංහල භාෂාව යම් ප්‍රමාණයකට තේරුම් ගැනීමේ හැකියාව තිබුණු බව කියා සිටින ලදී.

සාක්ෂිය විශ්ලේශණය

මෙම සාක්ෂිකරුගේ සක්ෂිය තුළින් හෙලිවන එක් ප්‍රධාන කරුණක් වන්නෙ 1 සහ 9 චූදිතයින් දඹුල්ල පොලිසියේ නිළධාරීන් විසින් 2019-4-21 දින සවස් කාලයේ දී අත් අඩංගුවට ගැනීමෙන් පසු මෙම සාක්ෂිකරු විසින් අපරාධ පරික්ෂන දේපාර්තමේන්තුවට රැගෙන ඒම සහ ඉන් පසුව විමර්ශනයේ දී හෙලි වූ කරුණු අනුව ,ගත් බව සනාත වීම වේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංක 02 ඇතුළු විවිධ අංශවල දීර්ඝ කාලයක් සෙවය කර ඇති මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේශණය කර ඇගැයීමට ලක් කිරීමේ දි පෙනී යන්නේ ඔහු විසින් 2018 දෙසැම්බර් මස මාවනැල්ල ප්‍රදේශයේ සිදු වූ බුද්ධ ප්‍රතිමා විනාශ කිරීමේ සිද්ධියේ සිට 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය දක්වා චූදිතයින් අතර පැවති සංවිධානාත්මක ජාලය, නීති විරෝධී පුපුරන ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය රැස් කිරීම, ආරක්ෂිත නිවාස පවත්වාගෙන යාම සහ ප්‍රහාරයන් සඳහා යටිතල පහසුකම් සපයා ගැනීම පිළිබඳව විස්තරාත්මකව මෙම අධිකරණය ඉදිරියේ කරුණු හෙලිකර ඇති බවය.

ඔහු විසින් ලබා දුන් සාක්ෂිය මගින් මෙම නඩුවේ 01 වන චිත්තිකරු වන නවුෆර් මව්ලවි, 04 වන චිත්තිකරු වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික්

අබ්දුල්ලා , 05 වන විත්තිකරු වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් , 06 වන විත්තිකරු වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන්, 09 වන විත්තිකරු වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් සහ 10 වන විත්තිකරු වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි හෙවත් සාෆි මව්ලවි යන අයවලුන් සම්බන්ධයෙන් ඔහු විසින් සිදුකර ඇති රාජකාරීන් සහ එකී චූදිතයින්ව විවුර්ත අධිකරණයේ නිවැරදිව හඳුනා ගෙන ලබා දුන් සාක්ෂියෙහි විස්වාසනීයභාවය සම්බන්ධයෙන් සැක සහිත භාවයක් පෙනී නොයන බවය.

එසේම ඔහු විසින් සදහන් කරන ලද විමර්ශන සදහා දිගු කාලයක් ගතවීම සහ මෙම නඩුවේ 07 වන විත්තිකරු සහ 14 වන විත්තිකරු සම්බිණ්දයෙන් එක් දිනක් පමණක් විමර්ශන කටයුතු සිදුකිරීමට යෙදුන නිසා ඔවුන් දෙදෙනාව විවෘත අධිකරණයේ හඳුනා ගැනීමට නොහැකි බවට අවංකව පිළිගෙන තිබීම තුළින් මෙම සාක්ෂිකරුගේ විශ්වාසනීයත්වය තවදුරටත් තහවුරු වේ.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් සාක්ෂි ආඥාපනතේ 27 වන වගන්තිය ප්‍රකාරව මෙම නඩුවේ 07 චූදිත වන වන සනස්දීන් යන අයගෙන් හෙලිවූ කරුණු එනම් ඔහුගේ ප්‍රකාශයේ පැ.2000 ලෙස ලකුණු කළ කොටස අනුව ඔහුගේ මගපෙන්වීම යටතේ කුලියාපිටිය ඒදණ්ඩවල ප්‍රදේශයේ අඩි 15 ක් පමණ ගැඹුරු වතුර වළක ගිල්වා තිබූ WP BGV-

7799 දරන නිල් පැහැති වීගෝ වර්ගයේ යතුරුපැදිය සොයා ගෙන ඇති අතර එසේම එම යතුරුපැදියේ කපා දමන ලද අංක තහඩු කොටස් නියාස් ගේ නිවස පිටුපස කැලෑවේ වතුර වළකින් සොයා ගත් බවට මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සළකා බැලීමේ දී සහ පැ.2004 ලෙස ලකුණු කල එම යතුරුපැදියට අදාළ හිස්වැස්ම සහ හා පැ.2005 ලෙස ලකුණු කරන ලද කබායසොයාගෙන තිබීම සාක්ෂි ආඥා පනතේ 27 වන වගන්තිය ප්‍රකාර ප්‍රබල කරුණු අනාවරණය කර ගෙන තිබීමත් වේ. එමෙන් ම එම යතුරුපැදියේ ලියාපදිංචි සහතිකය මෙම නඩුවේ 06 වන චූදිත වන වන රිස්කාන්ගේ නිවසේ වහලයේ පරාල අතර තිබියදී සොයා ගැනීම සම්බන්දයෙන් සහ 07 චූදිත සනස්දීන් විසින් වැසිකිළි වළකට දමා තිබූ ජංගම දුරකථනයක් ගලි බවුසරයක් යොදාගනිමින් ගොඩගැනීම කල බවට ලබා දුන් සාඅක්ෂිය මෙන් ම අනුසර මෝටර්ස් ආයතනයෙන් මෙම යතුරුපැදිය "මොහොමඩ් හුසේන් මොහොමඩ් ඉල්ලියාස්" නැමැති නමකින් රුපියල් 1,90,000 කට මිලදී ගෙන තිබූ බවට කුවිතාන්සිය (පැ.980-B) හරහා හෙළිවීම තුළින් ද 07 චූදිත ගේ සැකසහිත ක්‍රියාකලාපය මැනැවින් තහවුරු වේ.

මෙම සාක්ෂිකරු විසින් ඉහත පරිදි සොයාගන්නා ලද නඩු භාණ්ඩ වන , යතුරුපැදිය, අංක තහඩු, ජංගම දුරකථන, සහ ලේඛන කුලියාපිටිය පොලිස් ස්ථානයේ PR 1763/2019 (පැ.2001), PR 105/19 (පැ.2006), පුදුකුඩිඉරුප්පු පොලිසියේ PR 794/19 (පැ.2007) ඇතුළු දේපළ කුවිතාන්සි

යටතේ නිසි ලෙස ලේඛනගත කර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගෙන මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව තහවුරු වේ. මෙලෙස නඩු භාණ්ඩ සොයාගත් මොහොතේ සිට අධිකරණයට ඉදිරිපත් කරන තෙක්ම විධිමත් දේපළ කුවිතාන්සි සහ සටහන් පවත්වාගෙන යාම සිදුකර ඇති පසුබිම තුල නඩු භාණ්ඩ දාමය සම්බන්ධයෙන් විස්වාසනීය සාක්ෂි ඉදිරිපත් වී ඇති බව පෙනී යයි.

මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට ලක් කිරීමේ දී විත්ති පාර්ශවයේ නීතිඥවරුන් සහ විත්තිකරුවන් විසින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අභියෝගයට ලක් කිරීමට බලවත් උත්සාහයක් දරා තිබුණ ද මෙම සාක්ෂිකරු විසින් සිදු කරන ලද පැහැදිලි කිරීම් මගින් ඔහුගේ සාක්ෂියෙහි විස්වාසනීය බව වඩාත් තහවුරු වේ.

එසේම ඉහත කී 07 වූදිත ගේ ප්‍රකාශයෙන් හෙලි වූ කරුණු අනුව ඔහුගෙ මගපෙන්වීම ඔස්සේ යතුරුපැදිය සොයා ගැනීමට පැය 56 ක කාලයක් ගතවීම පිළිබඳව අසන ලද හරස් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු අධිකරණය පිළිගතහැකි ආකාරයේ පැහැදිලිකිරීම් ඉදිරිපත් කර ඇති අතර

එසේම මුල් සටහනක 2019 වෙනුවට 2018 ලෙස යෙදී තිබූ වර්ෂය පරිපාලනමය ලිපිකරු දෝෂයක් බවත්, "කියාස්" නැමැති නම "නියාස්" ලෙස කියැවුණේ අත්අකුරු නිරීක්ෂණයේ පැවති අක්ෂර සංකූලතාවයක්

නිසා බවට මෙම සාක්ෂිකරු ලබා දී ඇති පැහැදිලිකිරීම් විස්වාසනීයත්වයෙන් තොර වන්නේ නැති බව අපහට පෙනී යයි.

ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කරන ලද සැකකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටිය දී ඔවුනට බලවත් ලෙස තර්ජනය කළ බවට සහ 09 වූදිතව එඬේරමුල්ල නිවස තුළට බලහත්කාරයෙන් රැගෙන ගිය බවට කළ චෝදනා මෙම සාක්ෂිකරු විසින් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ අතර, ජීප් රථය තුළ සිටියදීම ඔවුන්ට ආහාර හා ජලය ලබා දෙමින් මාංචු ඉදිරිපසට දමා පහසුකම් සැලසූ බව ඔහුගේ සාක්ෂිය තුළින් හෙලිවන පසුබිම තුල මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි විස්වාසනීයභාවය සම්බන්ධයෙන් අපහට සැකසහිත භාවයක් පෙනී යන්නේ නැත.

සමස්තයක් ලෙස ගෙන මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සළකා බැලීමේ දී ඔහුගේ සාක්ෂිය මගින් හෙලි වූ පරිදි මාවනැල්ල ප්‍රදේශයේ බුදුපිළිම කැඩීමේ සිද්ධිය, වනාතවිල්ලුව ලැක්ටෝ වත්තේ පුපුරන ද්‍රව්‍ය රහසිගතව ගබඩා කර තිබීම මෙන් ම එඬේරමුල්ල හා දළුවාකොටුව ආරක්ෂිත නිවාස සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂි සහ 07 වූදිත ගෙන් සාක්ෂි අඟා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව හෙලි වූ කරුණු මත සොයා ගන්නා ලද WP BGV-7799 දරන නිල් පැහැති වීගෝ වර්ගයේ යතුරුපැදිය සම්බන්ධ සාක්ෂිය මගින් ද අදාළ සිද්දි දාමයන් හා සම්බන්ධ

ජාලය එකිනෙකට යා කරමින් පාස්කු ත්‍රස්ත ප්‍රහාරයේ කුමන්ත්‍රණය සහ පූර්ව සූදානම සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට තරම් ප්‍රබල පරිවේශණීය සාක්ෂි මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ඉදිරිපත් වී ඇති බවට අප තීරණය කරමු. මෙම සාක්ෂිකරු ගේ සාක්ෂියෙන් වනාතවිල්ලුව ලැක්ටෝ වත්තේ පුපුරන ද්‍රව්‍ය රහසිගතව ගබඩා කර තිබීම හෙලි වුවද එලෙස සොයාගෙන ඇති නඩුභාණ්ඩ සම්බන්ධයෙන් මේ වනවිටත් පුත්තලම මහාධිකරණයේ නඩු කටයුත්තක් පැවතීම හේතුකොටගෙන , ඒ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු මෙම නඩුවේ දී අදාළ කර නොගැනීමට අප තීරණය කරමු. ඒ අනුව මෙම සක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සත්‍ය, විශ්වාසදායක සාක්ෂියක් බවට අප තීරණය කරමු.

පැ.සා. 1822, පොලිස් සැරයන් 31717 ඉටිහාමිලාගේ කමල් ස්වර්ණතිලක යන අය සාක්ෂි ලබා දෙමින් තමා, 2019 ජුනි 24 වන දින අංක 484/3, වත්තල එඩේරමුල්ලේ පිහිටි සැකකටයුතු නිවසක් පරීක්ෂා කළ බවත්, එම පරීක්ෂණයේදී පො.සැ.28463 රණසිංහ නිළධාරියා ඡායාරූප ශිල්පියා වශයෙන් කටයුතු කළ බවත්,එම නිවසේ තිබී සටහන් 41 ක් අනාවරණය කර ගත් බවත්, ඒ සටහන් අතරින් එම නිවසේ බිම් මහළේ මුළුතැන්ගෙය ප්‍රදේශයේ තිබූ "**Rikon"** නම් සඳහන් හිස් අයන් පෙට්ටියක් මතුපිට තිබී පුද්ගලයෙකුගේ ඇඟිලි සටහන් 02 ක් අනාවරණය කර ගත් බවත්, එම ඇඟිලි සටහන් තමා විසින් අංක 28 සහ 29 වශයෙන් ලකුණු කළ බවටත් පවසා සිටින ලදි. තමා විසින් 3466/2019 අංක දරණ ඇඟිලි සටහන් වාර්තාව තමා විසින් එම සැකකටයුතු ස්ථානයේදීම සකස් කළ බවත් පවසා අදාළ වාර්තාව සාක්ෂිකරු විසින් අධිකරණයේදී හඳුනා ගන්නා ලද අතර, එකී වාර්තාව පැමිණිල්ල විසින් පැ.1581 වශයෙන් සලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 4වන සහ 9වන චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා ඇත.

04 වන චූදිත විසින් අධිකරණයේ ලකුණු කරන ලද පැ.1581 ලේඛණය පෙන්වා මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරන ලද අතර, එම

ලේඛණයේ ඇඟිලි සටහන් වර්ග ලෙස සඳහන් වන ස්ථානයේ තමා විසින් අනාවරණය කර ගන්නා ලද සටහන් කුමන වර්ගයට අයත් සටහන්දැයි සඳහන් කර නොමැත්තේ කුමන හේතුවක් මතදැයි ප්‍රශ්න කළ අතර, එයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටියේ තමා විසින් අනාවරණය කර ගන්නා ලද සටහන් අදෘෂ්‍යමාන සටහන් බවත්, එම සටහන් අනාවරණය කර ගැනීමෙන් පසුව විශ්ලේෂණය කිරීම සඳහා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්තුමාට යවන බවත්, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් විසින් එලෙස වර්ග කිරීම සිදු කරන බවය. තවද, එදින අදාළ ස්ථානය පරීක්ෂා කිරීමේදී උප පොලිස් පරීක්ෂක ඩයස් යන නිළධාරියා එම ස්ථානයේ සිටියද එම පැ.1581 දරණ ලේඛණයේ විමර්ශන නිළධාරියා යන කොටසේ ඒ මහතා විසින් අත්සන් නොකළේ කුමන හේතුවක් මතද යනුවෙන් ප්‍රශ්න කළ අතර, සාක්ෂිකරු විසින් කියා සිටියේ උ.පොා.ප. ඩයස් මහතා තමාට අපරාධ ස්ථානය පෙන්වූ නිළධාරියා පමණක් බවත්, තමා විසින් එම නිවසේ සිදුකළ රාජකාරිය සම්බන්ධයෙන් උ.පොා.ප.ඩයස් මහතාට කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවයි.

09 වන චූදිත විසින් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ, තමා විසින් මෙම නිවස පරීක්ෂා කරන අවස්ථාවේදී තමාට දැන ගැනීමට ලැබුණේ 2019 අප්‍රේල් 27 වන දින සිට එම නිවස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ භාරයේ තිබෙන බවටත්, පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සිදුවූ දිනය වන 2019

අප්‍රේල් 21 වන දින සිට 2019 අප්‍රේල් 27 දක්වා වූ කාලය තුළ එම නිවස කාගේ භාරයේ තිබුණාදැයි තමා නොදන්නා බවය. තවද, මෙම සාක්ෂිකරු විසින් ඇඟිලි සටහන් අනාවරණය කර ගන්නා ලද **"Rikon" ලෙස** නම් සඳහන් වී තිබූ හිස් අයන් කාඩ්බෝඩ් පෙට්ටිය කුමන ස්ථානයේ තිබුණේදැයි නිශ්චිතව කීමට හැකියාවක් තිබෙදැයි ප්‍රශ්න කළ අතර, එහිදී සාක්ෂිකරු, තමාගේ මතකයේ හැටියට එම නිවසේ මුළුතැන්ගෙය පරීක්ෂා කිරීමේදී එහි පොළව මත එම පෙට්ටිය තිබූ බවට තමාට මතක බවටත් පවසා සිටින ලදි.

පැ.සා. 2309 අපරාධ වාර්තා කොට්ඨාශයේ ඡායාරූප කාර්යාංශයේ උප පොලිස් පරීක්ෂක මීගල් හේවාගේ නිහාල් රණසිංහ යන අය සාක්ෂි ලබා දෙමින් තමා, 2019 ජුනි 24 වන දින වත්තල එඩේරමුල්ලේ නිවසේ තිබූ "Rikon" ලෙස සඳහන් හිස් අයන් පෙට්ටිය මත තිබූ ඇඟිලි සටහන් 41 ඡායාරූපගත කර ඡායාරූපාගාර වාර්තාව (පැ.1583) සකස් කළ බවත්, 2019 ජුනි 25 වන දින කොච්චිකඩේ දළුවාකොටුව ජනපද මාවතේ අංක 546/7/1 යන ලිපිනයේ පිහිටි නිවසේ ඉහළ මහලේ ඇති වීදුරු ප්‍රදර්ශන අල්මාරියක තිබූ ඇඟිලි සටහන් 5 (අංක 1 සහ 3 ඇතුළුව) ඡායාරූපගත කර එම වාර්තාව (පැ.1584) පිළියෙල කළ බවටත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 9වන චූදිත විසින් සහ 2, 7, 8, 10, 15, 18 සහ 19 වන චූදිතයන් වෙනුවෙන් ඔවුන්ගේ නීතීඥ මහතා විසින් හරස් ප්‍රශ්න අසා ඇත.

<u>නෝ: 484/3 වීදිය පාර වත්තල එඩේරමුල්ල ලිපිනයේ පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

ඉහත පරිදි වත්තල එඩේරමුල්ල වීදිය පාරේ අංක 484/3 යන ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධයෙන් පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඊට අදාළව පැ.සා.2248 ඉර්ෆාන් අයුබ්, 2246 අබ්දුල් වහාබ් රම්සීන් සහ, පැ.සා.2273 ඇන් චමරි විජේකෝන් යන අය විසින් සාක්ෂි ලබා දී ඇත. ඔවුන්ගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙම නඩුවේ චූදිතයන් විසින් කිසිදු හබ කිරීමකටද ලක් කර නොමැත.

ඔවුන්ගේ සාක්ෂි අනුව පෙනී යන්නේ වත්තල, එඩේරමුල්ල, වීදිය පාරේ අංක 484/3 යන ලිපිනයේ පිහිටි එම නිවස මොහොම්මද් අසාම් මොහොම්මද් මුබාරක් යන අය විසින් 2019 පෙබරවාරි මාසයේ සිට වසරක කාලයකට කුලියට ලබාගෙන ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පැ.සා.2246 ප්‍රසිද්ධ නොතාරිස් වහාබ් රම්සිත් යන අය ඉදිරියේ බදු

ගිවිසුමක්ද අත්සන් කර ඇති බවය. එම ප්‍රසිද්ධ නොතාරිස්වරයා එකී මොහොම්මද්අසාම් මොහොම්මද් මුබාරක් යන අයව එම බදු ඔප්පුව අත්සන් කළ අවස්ථාවේ දැනගෙන සිට නොමැත.පැ.831 ලෙස අධිකරණයේ ලකුණු කර තිබෙන ඡායාරූපයක් පරීක්ෂා කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් රම්සිත් මහතා කියා සිටියේ එම ඡායාරූපයේ සිටින පුද්ගලයා තමා ඉදිරියේ බදු ඔප්පුවට අත්සන් කරන ලද මුබාරක් යන තැනැත්තා බවයි. 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දින 02 කට හෝ 03 කට පසුව පොලිස් නිළධාරීන් එම නිවසට ගොස් පරීක්ෂා කර එති අතර, එහි දී හෙළි වී ඇත්තේ එකී මුබාරක් යන තැනැත්තා නිවෙස් හිමියාට කිසිදු දැනුම්දීමකින් තොරව නිවස අතහැර ගොස් සිට ඇත. තවද, මෙම මුබාරක් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ දෙපාර්ශවය විසින් ම විධිමත් පිළිගැනීම් අධිකරණය ඉදිරියේ වාර්තා කර ඇති අතර, එමඟින් එකී මුබාරක් යන අය 2019.04.21 වන දින කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බයක් පුපුරවා ගත් පුද්ගලයා ලෙසට කරුණු අනාවරණය වී ඇත.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දී ඇති පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A)

ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත සඳහන් කොටස සඳහන් වී ඇත.

> ***" අපි වත්තල, එඩේරමුල්ලේ Safe House (ආරක්ෂිත නිවසක) එකේ සිටිය දී සහරාන් අපට මී.මී.9 වර්ගයේ ගිනි අවියක්, වෑන් රථයක් සහ යතුරු පැදි 01 ක්ද ලබා දුන්නේ ය..... පසුව සහරාන් මල්වාන, එඩේරමුල්ල, රිදීකැන්න, ස්පෑන් ටවර්, මයුරා පෙදෙස පානදුර සරිකාමුල්ල යන ප්‍රදේශවල නිවාස සහ ස්ථාන කුලියට ගෙන Safe House එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස භාවිත කළේ ය. "***

ඉහත කරුණු අනුව මනාව පෙනී යන්නේ මෙම ආරක්ෂිත නිවසේ කටයුතු සඳහා සහරාන් නැමැති ස්වයංඝාතක බෝම්බකරු විසින් අපට මී.මී.9 වර්ගයේ ගිනි අවියක්, වෑන් රථයක් සහ යතුරු පැදි 01 ලබා දී ඇති බවය. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය කාතාංකුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර මෙම නඩුවේ 04 වන චුදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය මාවනැල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන අතර, 09 වන චූදිතද මාවනැල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ. එසේම 03 වන චුදිත වන මිල්හාන් යන තැනත්තා කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචි තැනත්තෙක් වේ.

මෙම නඩුවේ 04 වන චුදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය විසින් සහකාර පොලිස් අධිකාරි කාවින්ද පියසේකර යන අයට 2020.10.04 වන දින ලබා දුන් පාපොච්චාරණය පැමිණිල්ල විසින් පැ.183 ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත පරිදි 04 වන චූදිත විසින් පවසා ඇත.

" මම සහරාන්ට කතා කරලා මාගේ බිරිඳත් සමඟ AAX-3774 දරණ ටීවීඑස් වර්ගයේ කොළ පාට ත්‍රීරෝද රථයෙන් කුරුණෑගල බම්මන්නේ අබු සනාගේ ගෙදරට ගියා. එතනින් කුලියාපිටිය අබුතාරික්ගේ (රිස්කාන්) ගෙදර, මීගමුව කොච්චිකඩේ ආරක්ෂිත නිවසක, කල්මුණේ අබු මුක්තාර් නොහොත් අසාද්ගේ නිවස , කාත්තංකුඩි අබු සෙයිද්ගේ නිවස, කාත්තංකුඩි මිල්හාන්ගේ නිවස, මයුරා ප්ලැට් වැල්ලවත්ත යන ස්ථාන වල මාගේ බිරිඳ හා දරුවා සමඟ සහරාන් විසින් පැවසූ ආකාරයට රැඳී සිටියා. අවසානයට අපි තුන්දෙනා හිටියේ වත්තල එඩේරමුල්ල ආරක්ෂිත නිවසෙයි "

09 වන චූදිත මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිද් විසින් සහකාර පොලිස් අධිකාරී නිහාල් ජයතිලක මහතාට ලබා දී ඇති පාපොච්චාරණයේ පහත පරිදි පවසා ඇත.

"ඊට පස්සේ සහ්රාන් කීවා අපි ඔක්කොම එක තැන ඉන්න හොඳ නෑ ඒ නිසා ටික දෙනෙක් එඩේරමුල්ලේ නිවසට යන්න කියලා. ඒ අනුව නවුෆර්, සාදික් හා එයාගේ බිරිඳ, මිල්හාන් සමඟ ටික දෙනෙක් එම නිවසට ආවා .....එඩේරමුල්ල නිවසේ මද්රසා එක පවත්වා ගෙන ගියා. ළමයි තුන්දෙනෙක් ඉගෙන ගත්තා. සහ්රාන්ගේ පනාත් ඉගෙන ගන්න ආවා. එයා උදේට ඇවිත් සවසට යනවා. අනෙක් ළමයි තුන්දෙනා එහිම නතරව සිටියා. නවුෆර් සහ මම දරුවන්ට ඉගැන්වීම් කලා. අපි එඩේරමුල්ල නිවසේ ඉන්න විට සහ්රාන් නවුෆර්ට පිස්තෝලයක් දිලා තිබුණා. ඊට අමතරව වාහනයක් හා යතුරු පැදියක් දීලා තිබුණා"

2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දින 03 කට පසුව එනම්, 2019.04.24 වන දින කොළඹ ඇඟිලි සටහන් කාර්යාලයේ නිළධාරීන් විසින් මෙම නිවස පරීක්ෂා කර ඇති අතර, එහිදී මෙම නිවස තුළ තිබී සටහන් කීපයක් සොයා ගෙන ඇත. ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් පැ.සා.2307 සේනක කළුආරච්චි යන අයගේ සාක්ෂියට අනුව එම සටහන් අතරින් මෙම නඩුවේ 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ සටහන්ද සොයා ගෙන ඇත. තවද, පැමිණිල්ලේ සාක්ෂි අංක 1822 පොලිස් සැරයන් 31717 ඉටිහාමිලාගේ කමල් ස්වර්ණතිලක යන අයගේ සාක්ෂි අනුව, ඔහු විසින්

සටහන් සොයා ගැනීම සඳහා මෙම නිවස පරීක්ෂාවට ලක් කර ඇති අතර, 09 වන චූදිතගේ සටහන් බවට හඳුනා ගෙන තිබෙන එකී සටහන් එම නිවසේ බිම් මහලේ මුළුතැන්ගෙයි තිබූ 'Rikon' වශයෙන් නම් සඳහන් හිස් අයන් පෙට්ටියක් මත තිබූ බවටද සාක්ෂි අනාවරණය වී ඇත.

අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි මනා පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ, මෙම නඩුවේ 01 වන 04 වන සහ 09 වන චූදිතයන් විසින් වත්තල, එඩේරමුල්ල, වීදිය පාරේ 484/6 යන ලිපිනයේ පිහිටි නිවස ආරක්ෂිත නිවාසයක් ලෙස පරිහරණය කර ඇති බවටය. තවද 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් මරාගෙන මැරෙන බෝම්බකරුවන් ලෙස කටයුතු කළ මුබාරක් සහ සහරාන් යන අයවළුන් විසින්ද මෙම නිවස ආරක්ෂිත ස්ථානයක් ලෙස පරිහරණය කර ඇති අතර, එකී සහරාන් යන අයගේ උපදෙස් මත පවත්වාගෙන ගිය විවිධ ආරක්ෂිත ස්ථාන අතරින් මෙම නිවසද එක් ආරක්ෂිත ස්ථානයක් වන අතර, මෙම නඩුවේ 01,04,09 චූදිතයන් එකී සහරාන් සහ මුබාරක් යන බෝම්බකරුවන් සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන එක කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇති අතර, 01 වන සහ 09 වන චූදිතයන්ගේ පාපොච්චාරණ අනුව මෙම නිවසේ සිටියදී සහරාන් විසින් මෙම නඩුවේ 01 වන චූදිතට මිලිමීටර් 9 වර්ගයේ ගිනි අවියක්ද ලබා දී ඇත. සාක්ෂි අනුව පෙනී යන්නේ 01 වන 04 වන 09 වන චූදිතයන්

සහරාන්, මුබාරක් සහ තවත් පුද්ගලයන් සමඟ එකතු වී යම් අපරාධයක් සිදු කිරීමට සූදානම් වී තිබෙන ආකාරයයි. ඒ අනුව බලන කල දිවයිනේ විවිධ ප්‍රදේශ වල පදිංචි මෙම පුද්ගලයින් වත්තල එඩේරමුල්ල පිහිටි ඉහත නිවසේ මෙලෙස එක්ව රැඳී සිටීම තුළින්ම ඒ අනුව මෙම නඩුවේ 01 වන, 03 වන, සහ 04 වන සහ 9 වන චූදිතයන් පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී මරාගෙන මැරුණ බෝම්බකරුවෙකු වූ සහරාන් නැමත්තා විසින් ලබා දුන් මි.මී.9 වර්ගයේ ගිනි අවියක් ද තබාගෙන සිට ඇත්තේ යම් අපරාධයක් සිදු කිරීමට සූදානම් වීම සඳහාම බවට යුක්ති සහගතව නිගමනය කල හකිය.

<u>කොල්ලුපිටිය ලකී ප්ලාසා මහල් නිවාසයෙහි පැවති</u>

<u>ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 1411, පොන්නම්බලම් මුතු කුමාරන් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ 2019 වර්ෂය වන විට තමා Six Lions නමින් හඳුන්වන ආරක්ෂක නිලධාරීන් සපයන ආයතනයක රැකියාවක් කළ බවත්, ඒ කාලයේ කොළඹ කොල්ලුපිටිය ප්‍රදෙශයේ පිහිටි Lucky Plaza ගොඩනැගිල්ලට ආරක්ෂක නිලධාරියෙක් ලෙස සේවයට ගොස් තිබෙන බවත්, එම Lucky Plaza ගොඩනැගිල්ලේ Shopping Complex එකක් සහ උඩු මහල්වල නිවාස තිබුණු බවත්ය. තවද, එම ගොඩනැගිල්ලට ඇතුල් වන සහ පිටවන වාහන ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ටරයක් පවත්වාගෙන

ගිය බවට පවසමින් එම රෙජිස්ටරය විවෘත අධිකරණය හඳුනා ගත් අතර Night Hours Vehicle Parking Details නමින් හඳුන්වන එම රෙජිස්ටරය පැමිණිල්ල විසින් පැ.850 ලෙස ලකුණු කරන ලදී. පැ. 850 පරීක්ෂා කරමින් මෙම සාක්ෂිකරු කියා සිටියේ 2019.04.03 වන දින PJ-4080 අංක දරණ වාහනයක් රාත්‍රී 10.25 ට එම ගොඩනැගිල්ලෙන් පිටත් වී තිබෙන බවය. පැ.850 දරණ රෙජිස්ටරයේ තිබෙන 2019.04.03 වන දිනට අදාළ සටහන් පැමිණිල්ල විසින් පැ.850(1) ලෙස ලකුණු කරන ලදී. තවද 2019.04.18 වන දින PJ-4080 අංකය දරන එම වාහනය Lucky Plaza ගොඩනැගිල්ලෙන් රාත්‍රී 10.18 ට පිටත් වී තිබෙන බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. 2019.04.18 වන දිනට අදාළ සටහන් පැමිණිල්ල විසින් පැ.850 (2) ලෙසට ලකුණු කරන ලදී. මෙම සාක්ෂිකරුගෙන් චුදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2291 ලරිනා බී අහමඩ් මව්ලානා යන අය සාක්ෂි දෙමින් ඇය විසින් කොල්ලුපිටියේ සෙන් ඇන්තනී මාවතේ පිහිටි ලකී ප්ලාසා ගොඩනැගිල්ලෙහි නිවාස ඒකකයක් කුලියට ගෙන එය අතුරුබදු දීම සඳහා කටයුතු කළ බවත්, එය මුබාරක් යන අයෙකුට මසකට රුපියල් එක්ලක්ෂ තිස්පන්දහසක මුදලකට මාස දෙකක කාලයකට ලබා දුන් බවත්, නිවස කුලියට දීමේ සාකච්ඡා දුරකථනයෙන් සිදු වූ බවත්, යතුර භාර දීම සඳහා පමණක් ඔහු පැමිණි අතර තවත් පුද්ගලයින් දෙතුන් දෙනෙකු එම ස්ථානයට පැමිණ ආපසු ගිය බවත්, එකී මුබාරක් යන අය එම

නිවසෙහි වැඩි කාලයක් ගත නොකරන බව නිවාස ඒකකයේ ආරක්ෂක නිලධාරීන් තමාට දැන්වූ අතර, ඔහු දුරකතනට පිළිතුරු දීම මගහැරිය බවටත් කියා සිටින ලදී. මෙම සාක්ෂිකාරිය හට පැමිණිල්ල විසින් ඒ වන විටත් ලකුණු කර තිබූ පැ.834, පැ.835 දරණ ඡායාරූප පෙන්වා සිටින ලද අතර එම ඡායාරූප වල සිටින පුද්ගලයා මුබාරක් යන අය බවත්, කිංග්ස්බරි හෝටලයේ බෝම්බය පුපුරවා ගනු ලැබුවේ එම පුද්ගලයා බවට ජනමාධ්‍ය මගින් තමා දැනගත් බවටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1412 ෆයස් බොනිෆස් ජෝශප් යන අය සාක්ෂි දෙමින් ඔහු කොල්ලුපිටිය ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ කළමණාකරුවෙකු ලෙස සේවය කළ බවත්, එහි ආරක්ෂිත කැමරා සියල්ල තමාගේ කාර්යාලයේ තිබූ CCTV පද්ධතියට සම්බන්ධ කර තිබූ බවත්, පාස්කු ප්‍රහාරයෙන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ ඉල්ලීම පරිදි එම CCTV කැමරා දර්ශන සියල්ල විමර්ශන නිළධාරීන්ට තමා භාරදුන් බවත්, එම දර්ශන පරීක්ෂා කිරීමේ දී එක් මහලක 5/2 දරණ නිවස හඳුනා ගැනීමක් සිදුකළ බවත් කියා සිටින ලදි. පැ.16 දරණ සංයුක්ත තැටියේ අන්තර්ගත වූ පැ.16(1) CCTV දර්ශනය සාක්ෂිකරුට පෙන්වන ලද අතර, එය ගොඩනැගිල්ලේ රථ ගාල පැත්තකින් ඇති ඇතුල්වීමේ ස්ථානය බවත්, ශාන්ත ආන්තෝනි මාවතෙන්

පැමිණෙ රථගාලට ඇතුලු වී ගොඩනැගිල්ලට ඇතුල් වීමට හැකියාව ඇති බවටත් සාක්ෂිකරු විසින් කියා සිටින ලදී. තවද පැ.16 දරණ සංයුක්ත තැටියේ අඩංගු පැ.16(2) CCTV දර්ශනය සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර එයද තමා කලින් විස්තර කරන ලද ලකී ප්ලාසා ගොඩනැගිල්ලට පැත්තෙන් ඇතුල්වීමට ඇති Side Entrance එක බවද කියා සිටින ලදී. මෙම සාක්ෂිකරුව නැවත කැඳවා ලකී ප්ලාසා ගොඩනැගිල්ලට අදාළව CCTV දර්ශන පෙළක් පෙන්වා සිටින ලද අතර එහිදී ඒ වන විටත් සලකුණු කර තිබූ පැ. 840(1) යන දර්ශනයේ සඳහන් වන්නේ ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ Side Entrance එක බවද, එසේම, පැ. 840(3) සහ (4) දර්ශනවල ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ basement එකට කාර් පාර්ක් එකේ යට තිබෙන ලිෆ්ට් එක දර්ශනය වන අතර පැ.840(5) සහ පැ. 840 (6) දර්ශනවල ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ ලිෆ්ට් එකේ ඇතුළත දර්ශනය වන බව එම රූපරාමු නැරඹීමෙන් හඳුනාගන්නා ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2293 මොහොමඩ් අබ්දුල් සමාඩ් මොහොමඩ් යූෂුෆ් යන අය සාක්ෂි දෙමින්, තමා මොහොමඩ් මහිමීර් මොහොමඩ් ලාෆීර් යන අයගේ රියදුරු ලෙස කටයුතු කළ බවත්, ඔහුට අයත් නිවාස ඒකකයක් ලරීනා නැමැති තැනැත්තියකට කුලියට ලබා දුන්

බවත්, එම නිවාස සංකීරණයේ ලකී ප්ලාසා ගොඩනැගිල්ල තිබෙන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දැනුම් දීම මත එම ලරීනා නැමැති තැනැත්තියට ලබා දුන් නිවාස ඒකකයේ යතුර එම ස්ථානයට රැගෙන ගිය බවත්, තමා යන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ කාර්ය බලකාය සහ ලරීන් යන තැනැත්තිය එම නිවාස ඒකකය අසල සිටි බවත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 1825 ප්‍රදීප් හේමන්ත ගලබඩආරච්චි යන අය පවසා සිටියේ, තමා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාර්යාලයට අනුයුක්තව උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස සේවය කරන බවත්, 2019.04.25 වන දින කොළඹ 03 ශාන්ත අන්තෝනි පාරේ, අංක 70/05/02 දරණ ලිපිනයේ පිහිටි ‘ලකී ප්ලාසා’ නමින් හැඳින්වූ ගොඩනැගිල්ලේ ස්ථානයක් පරීක්ෂා කිරීම සඳහා පිටත්ව ගිය බවත්, තමාත් සමඟ උ.පොලිස් සඳනායක, පොලිස් සැ.28540 ජයන්ත , පොලිස් සැ.40243 කාංචන, පොලිස් කොන්. 20546 බණ්ඩාර සහ පොලිස් කොන්.78672 නිරෝෂන් යන නිළධාරීන්ද ගිය බවත්, එම ස්ථානයට යන විට පැය.10.20 ට පමණ වූ බවත්, **එම** ගොඩනැගිල්ලේ 05 වන මහළේ පිහිටා තිබූ අංක 70/05/02 දරණ නිවස සටහන් සොයා ගැනීම සඳහා සම්පූර්ණ පරීක්ෂණයකට ලක් කළ

බවත්, එදින පැය. 17.10 දක්වා එම ස්ථානයේ රැඳී සිටි බවත්, තම කණ්ඩායම යන විටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඇතුළු විමර්ශන නිළධාරීන් එහි සිටි බවත්, එදින එම ස්ථානයෙන් සොයා ගන්නා ලද සටහන් සම්බන්ධව අංක 2212/2019 දරණ ඇඟිලි පරීක්ෂණ වාර්තාව සකස් කළ බවයි. එකී වාර්තාව සාක්ෂිකරු විසින් අධිකරණයේදී හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එම ලේඛණය පැ.1579 වශයෙන් සළකුණු කරන ලදි. තවදුරටත් සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ, එම 'ලකී ප්ලාසා' ගොඩනැගිල්ලේ 05 වන මහළේ නිවාස කීපයක් තිබූ බවත්, එයින් එක නිවසක් එනම් අංක 70/05/02 දරණ නිවස තමාගේ පරීක්ෂාවට ලක් වූ බවත්, එය සාලය හා මුළුතැන්ගෙය හැරුණු විට තවත් කාමර 03 කින් සහ නාන කාමරයකින්ද සමන්විත නිවසක් බවත්, එම නිවස පරීක්ෂා කිරීමේදී ඒ තුළ තිබී සටහන් 29 ක් සොයා ගත් බවත්, නිවසෙහි ප්‍රධාන දොර, නිවසේ තිබූ TV එක සහ එම නිවසේ තිබූ වීදුරු ජනෙල් සහ දොරවල් වලද, නාන කාමර කට්ටල වල සහ කබඩ් වලද තිබූ ඇඟිලි සටහන් සහ පතුල් සටහන් තමා නිරීක්ෂණය කළ බවත්, තමා විසින් එසේ නිරීක්ෂණය කරන ලද සටහන් 29 ක් අංක 01 සිට 29 දක්වා අංකනය කළ බවයි.

එසේ තමා විසින් අංක 20 ලෙස සටහන් කරන ලද අතුල් සටහන කාමරයක වීදුරු දොර පියනෙහි තැන්පත් වී තිබූ බවත්, එම සටහන් ඡායාරූප ගත කර ගත් බවත් පවසමින් පැ.1563(A) සහ පැ.1563(A)(1)

ලෙස ලකුණු කර ඇති ඡායාරූප වල සඳහන් වන්නේ එම සටහන් බවට අධිකරණයේ හඳුනා ගන්නා ලදි. එසේම අංක 21 ලෙස සටහන් කරන ලද ඇඟිලි සටහන අදාළ නිවසෙහි දොරක තැන්පත් වී තිබූ බවත්, එම සටහන් ඡායාරූප ගත කර ගත් බවත් පවසමින් පැ.1563(B) සහ පැ.1563(B)(1) ලෙස ලකුණු කර ඇති ඡායාරූප වල සඳහන් වන්නේ එම සටහන් බවට අධිකරණයේ හඳුනා ගන්නා ලදි.

එසේම තමා විසින් සකස් කරන ලද පැ.1579 වාර්තාව ඉදිරි පියවර සඳහා ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වෙතට ඉදිරිපත් කළ බවටත් මෙම සාක්ෂිකරු විසින් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 1826 විතාන ආරච්චිලාගේ ලසංග නිරෝෂන් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා අපරාධ වාර්තා කොට්ඨාශයේ ඡායාරූප කාර්යංශයට අනුයුක්තව ඡායාරූප ශිල්පියෙකු වශයෙන් සේවය කරන බවත්, 2019.04.25 වන දින තමා විසින් මෙම නඩුවට අදාළ රාජකාරියක් සිදු කර ඇති බවයි. එනම්, එදින අපරාධ ස්ථානයක් පරීක්ෂා කර ඇඟිලි සටහන් කීපයක් ඡායාරූප ගත කළ බවත්, එම සටහන් අපරාධ වාර්තා කොට්ඨාශයේ අපරාධ ස්ථාන පරීක්ෂණ අංශයේ උප පොලිස් පරීක්ෂක හලබඩආරච්චි විසින් (මෙම නඩුවේ පැ.සා.1825 යන සාක්ෂිකරු) සොයා ගත් බවත්, එදින තමා විසින් ඡායාරූප ලබා ගැනීමේ රාජකාරිය

සම්බන්ධයෙන් ඡායාරූපාගාර වාර්තාවක් සකස් කළ බවයි. සාක්ෂිකරු විසින් එම ඡායාරූපගාර වාර්තාව විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එකී ලේඛණය පැ.1580 වශයෙන් ලකුණු කරන ලදි. එදින අදාළ ස්ථානයේ තිබූ සටහන් 29 ක් තමන් විසින් ඡායාරූප ගත කළ බවත්, පැ.1563(A) සහ පැ.1563 (A)(1) ලෙස ලකුණු කර තිබෙන ඡායාරූප තමා විසින් ලබා ගන්න ලද අංක 20 ලෙස සඳහන් කරන ලද ඇඟිලි සටහනෙහි ඡායාරූප බවත්, පැ.1563(B) සහ පැ.1563(B)(1), ලෙස ලකුණු කර තිබෙන ඡායාරූප තමා විසින් ලබා ගන්නා ලද අංක 21 ලෙස ලකුණු කර තිබෙන ඇඟිලි සටහනෙහි ඡායාරූප බවටත් හඳුනා ගන්නා ලදි.

මෙම සාක්ෂිකරුගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

කොල්ලුපිටිය ලකී ප්ලාසා මහල් නිවාසයෙහි පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේදී කොල්ලුපිටියේ සෙන් ඇන්තනීස් මාවතේ පිහිටි ලකී ප්ලාසා නමින් හඳුන්වන මහල් ගොඩනැගිල්ලේ පිහිටා තිබූ නිවසක් සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවා ඇත. ඒ සම්බන්ධව පැ.සා. 1411

මුතුකුමාරන්, පැ.සා. 2291 ලරිනා බී අහමඩ් මව්ලානා, පැ.සා.1412 බොනිෆස් ජෝෂප්, පැ.සා.2293 මොහොමඩ් යූෂුෆ් අලි යන අය සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකරුවන්ගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, ඔවුන්ගේ සාක්ෂි චූදිතයන් විසින් අභියෝගයට ලක් කර නොමැත. ඒ අනුව ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව පෙනී යන්නේ, කොල්ලුපිටිය ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ පිහිටි එම නිවස මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් මොහොමඩ් යූෂුෆ් අලී යන අයට අයත් නිවසක් බවත්, එම අයගෙන් ලරීනා බී අහමඩ් මව්ලානා යන තැනැත්තිව එකී නිවස කුලියට ගෙන වෙනත් පුද්ගලයින්ට අතුරු බදු දීම සඳහා කටයුතු කර ඇති බවත්, එම නිවස මුබාරක් යන අය විසින් මාස 02 ක කාලයකට ලරිනා බී අහමඩ් මව්ලානා යන තැනැත්තියගෙන් කුලියට ලබාගෙන ඇති බවත් ය. පැමිණිල්ල විසින් පැ.834 සහ පැ.835 ලෙස ලකුණු කර තිබෙන ඡායාරූප වල සිටින පුද්ගලයන් එකී මුබාරක් යන අය බවට පෙනී යයි.

තවද, මෙම මුබාරක් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ දෙපාර්ශවය විසින්ම මෙම අධිකරණයේ විධිමත් පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් එකී මුබාරක් යන අය 2019.04.21 වන දින කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බයක් පුපුරවා ගත් පුද්ගලයා ලෙසට කරුණු සනාථ වී ඇත.

තවද, 2019.04.03 සහ 2019.04.18 යන දිනයන්හි PJ-4080 අංක දරණ වාහනයක් ලකී ප්ලාසා ගොඩනැගිල්ලට පැමිණ තිබෙන බවට ඉහත සාක්ෂි මඟින් අනාවරණය වී ඇත. මෙකී PJ-4080 දරණ වාහනය අංක 873340312V දරණ ජාතික හැඳුනුම්පත් අංකය හිමි එම්.ඒ.එම්.මුබාරක් යන තැනැත්තා විසින් මිළදී ගනු ලැබූ වාහනයක් බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.181අබේසිංහ ආරච්චිගේ කමලාවතී, පැ.සා.274 නදුන් වීරංග රත්නායක යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මඟින් හෙළි වී ඇත. තවද, මෙම වාහනය 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිට පුද්ගලයෙකු විසින් නවතා තිබී ඇති අතර එයට පසු දින එනම්, 2019.04.22 වන දින බෝම්බ සවිකර තිබූ එකී වාහනය පිපිරී ගිය බවටද මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.1603 දිමුතු සුරංග සමරනායක සහ පැ.සා.1958 පොලිස් පරීක්ෂක දිසානායක යන විමර්ශන නිළධාරීන්ගේ සාක්ෂි මඟින් සනාථ වී ඇත.

කොළඹ 03, ශාන්ත අන්තෝනි පාරේ පිහිටි 'ලකී ප්ලාසා' නමින් හඳුන්වන ගොඩනැගිලේ පිහිටි අංක 70/5/2,දරණ මෙම නිවස 2019.04.25 වන දින කොළඹ ඇඟිලි සටහන් කාර්යාලයේ නිළධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර ඇති අතර, පැ.සා.2307ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් සේනක කළුආරච්චි මහතාගේ සාක්ශියට අනුව එම නිවස තුළ තිබී සොයා ගන්නා ලද ඇඟිලි සටහන් අතර මොහොමඩ් සහරාන් රුදෙයිනා යන අයගේ වම්

අත්ල සටහන් සොයා ගෙන ඇත. මෙම රුදෙයිනා යන තැනැත්තිය 2019.04.21 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගත් සහරාන් යන අයගේ දියණිය බවට මෙම නඩුවේ සාක්ෂි මගින් තහවුරු වී ඇත.

ඉහත කී පැ.සා.1603 දිමුතු සුරංග සමරනායක විසින් සඳහන් කර ඇති පුද්ගලයා වන්නේ 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තුල දී ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවා හරින ලද තැනැත්තා වන අතර එකී මොහොම්මදු මුවාත් සහ එම්.ඒ.එම්. මුබාරක් යන තැනැත්තන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ පිළිගැනීම් වාර්තා කර ඇත. එමඟින් 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තුළදී බෝම්බයක් පුපුරවා ගෙන මිය ගිය තැනැත්තා මොහොම්මදු මුවාත් අලවුදීන් යන අය බවට සහ කොළඹ කිංග්ස්බරි හෝටලය තුළදී බෝම්බය පුපුරවා ගෙන මිය ගිය තැනැත්තා එම්.ඒ.එම්.මුබාරක් යන අය බවට කරුණු සනාථ වී ඇත. ඒ අනුව ඉහත කී සියළු සාක්ෂි අනුව අප හට මනාව පෙනී යන්නේ කොල්ලුපිටිය ලකී ප්ලාසා ගොඩනැගිල්ලේ පිහිටි 5/2 දරණ නිවස නීති විරෝධී ක්‍රියාවන් සිදුකිරීම සඳහා සූදානම් වීම සඳහාම ආරක්ෂිත නිවසක් ලෙස භාවිතා කර ඇති බව වේ.

අට්ටාලචේන-4 ජලාල්ඩීන් පාරේ පිහිටි ආරක්ෂිත නිවස

සම්බන්ධ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 2268, ආදම් ලෙබ්බේ මොහොමඩ් ෆාසිල් සාක්ෂි දෙමින් පවසා සිටියේ තමාගේ විවාහක බිරිඳට මොහොමඩ් ශරීෆ් ෆර්සාන් නමින් සහෝදරයෙක් සිටින බවත්, ඔහුට අට්ටාලචේන 04, ජලාල්ඩීන් පාරේ නිවාස දෙකක් තිබෙන බවත්ය. එයින් එක නිවසක් ඔහුගේ ස්ථීර පදිංචි නිවස බවත්, අනිත් නිවස විටින් විට කුලියට ලබා දුන් බවත්, එම තැනැත්තා දැනට සෞදි අරාබිය රටේ රැකියාවක් සඳහා ගොස් තිබෙන බවත්ය. 2019 අප්‍රේල් මස වන විට තමාගේ මස්සිනා, එනම් මොහොමඩ් ශරීෆ් ෆර්සාන් යන අය ලංකාවේ සිටි බවත්, ඔහුගේ කුලියට දීමට තිබුණු නිවස යම් පිරිසක් ඉන්නවා නම් කුලියට දෙන බවට තමාත් සමඟ පවසා තිබූ බවත්ය. 2019 අප්‍රේල් 09 වන දින තමාගේ නිවසට යම් පුද්ගලයෙක් පැමිණ නිවසක් කුලියට තිබේදැයි විමසූ බවත්, එම තැනැත්තා ඔහුගේ නම 'නියාස්' බවත්, කාත්තන්කුඩි ප්‍රදේශයේ සිට එන බවත් පවසා ඇත. පස් දෙනෙකු පමණ කණ්ඩායමකට නිවසක් ඕනෑ වී තිබෙන බවත්, එයින් එක්කෙනෙකුට දරුවෙකු ලැබීමට තිබෙන බවටත් එම නියාස් කියන තැනැත්තා තමාට පැවසූ බවත් පවසා සිටියේය.

ඉන්පසු තමා සහ තමාගේ මස්සිනා වන ෆර්සාන් යන දෙදෙනාම නියාස් යන තැනැත්තාව ෆර්සාන්ගේ නිවසට රැගෙන ගොස් නිවස පෙන්වූ

බවත්, එවිට නියාස් යන තැනැත්තා එම නිවසේ මුළුතැන්ගෙය හා වැසිකිළි වීඩියෝ කර තවත් පුද්ගලයෙකුට යැවූ බවත්, එවිට නියාස් කියන එම පුද්ගලයා බ්‍රෝකර් කෙනෙක් හැටියට තමාට පෙනී ගිය බවත්, ඉන්පසු එම තැනැත්තා විසින් මස්සිනාට අත්තිකාරම් මුදලක් ගෙවූ බව මස්සිනා විසින් තමාට පැවසූ බවත්, ඉන්පසුව යම් පිරිසක් මගින් මස්සිනාගේ ගෙදර කුලියට ගත් බව තමා දැනගත් බවත්, නමුත් ඒ කුලියට පැමිණි පුද්ගලයින් කිසිවකුවත් තමා දැක නැති බවටත් මෙම සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙන ලදී. තමාගේ මස්සිනාගේ නිවස එම පිරිසට 2019 අප්‍රේල් 17 වන දින කුලියට දුන් බවත්, එම පිරිස අප්‍රේල් 19 වෙනිදා පදිංචියට ආ බවත්, ඉන්පසුව එම නිවසින් 2019 අප්‍රේල් 24 වන දින පිටත්වී සයින්දමරදු ප්‍රදේශයට ගිය බවත්, එම ප්‍රදේශයේ නිවසක බෝම්බ පිපිරීමක් සිදුවූ බවට තමා දැනගත් බවටත් සාක්ෂිකරු කියා සිටින ලදී. තවද තමාගේ මස්සිනාගේ නිවස කුලියට ගත් පුද්ගලයාගෙන් ඔහුගේ රියදුරු බලපත්‍රයේ පිටපතක් ලබා ගෙන තිබූ බවත්, එම රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් තමා සතුවද තිබෙන බව පවසමින් සාක්ෂිකරු විසින් අධිකරණයට රියදුරු බලපත්‍රයක ඡායාරූප පිටපතක් පෙන්වන ලදී. එම පිටපත පැමිණිල්ල විසින් පැ.875 ලෙස ලකුණු කරන ලදී.

මෙම සාක්ෂිකරුගෙන් චිත්තිකරුවන් විසින් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නොමැත.

අට්ටාලචේන-4 ජලාඩීන් පාරේ පිහිටි ආරක්ෂක නිවස

සම්බන්ධ

සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

අට්ටාලච්චේන 04, ජලාල්ඩීන් පාරේ පිහිටි නිවසක් සම්බන්ධව පැමිණිල්ලෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙම නිවස මොහොමඩ් ෂරීෆ් ෆර්සාන් යන අයට අයිති නිවසක් වන අතර, මඩකලපුව කාත්තන්කුඩි ප්‍රදේශයේ සිට පැමිණෙන බව පවසමින් නියාස් යන තැනැත්තකු පැමිණ මෙම නිවස පවුලකට පදිංචි වීමට අවශ්‍ය බව පවසා නිවස පරීක්ෂා කර ඇති අතර, ඉන්පසුව පිරිසකට එම නිවස කුලියට ලබා දී ඇති අතර, 2019.04.19 වන දින පිරිසක් පදිංචියට පැමිණ දවස් කීපයකට පසුව එනම් 2019.04.24 වන දින එම නිවසින් පිටත් වී සයින්දමරදු ප්‍රදේශයට ගොස් ඇත.

ඉදිරිපත් වී තිබෙන සාක්ෂි මනාව පරීක්ෂා කිරීමේදී මෙම නිවස කුමන පුද්ගලයකු විසින් කුමන හේතුවක් සඳහා පරිහරණය කර ඇද්ද යන්න සම්බන්ධයෙන් කිසිඳු කරුණක් අනාවරණය වී නොමැත. කෙසේ වුවද මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැමිණිල්ලේ සාක්ෂි අංක 2233 සෙයියදු අහමඩ් අස්මියා යන සාක්ෂිකාරිය ගේ සාක්ෂියට අනුව 2019.04.21 දින සිදු වූ පාස්කු ප්‍රහාරයට දින කීපයකට පසුව සයින්දමරදු

වල නිවසක සිදු වූ සිද්ධියේ දී මියගිය මොහොමඩ් නියාස් නැමත්තා තමාගේ සැමියා බවට පවසා ඇති පසුබිම තුල සහ ඉහත පරිදි සාක්ෂි ලබා දී ඇති පැමිණිල්ලේ සාක්ෂි අංක 2268 ආදම් ලෙබ්බේ මොහොමඩ් ෆාසිල් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2029.04.24 දින නියාස් ඇතුලු පිරිසක් අට්ටාලවේන ජලාල්දීන් පාරේ පිහිටි මෙම නිවසින් පිටත් වී සයින්දමරදු ප්‍රදේශයට ගිය බවත්, පසුව එම නිවසේ බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බව තමා දනගත් බවටත් පවසා ඇත.

<u>ගල්කිස්ස ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයෙහි පිහිටි</u>

<u>නිවසක</u>

<u>පවත්වාගෙන ගිය ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැ.සා.1336 ජයන්ත ධනන්ඤුරිය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 2014 වර්ෂයේ සිට Sky ray Property Private Limited නමැති ආයතනයේ සේවය කරන බවත්, එම ආයතනය ප්‍රධාන වශයෙන් ඉලෙක්ට්‍රොනික් උපකරණ ව්‍යාපාරයට සම්බන්ධ ආයතනයක් බවත්, එම ආයතනයේ ව්‍යාපාරයේ කොටසක් වශයෙන් මහල් නිවාස සංචාරකයන් සදහා කෙටි කාලීනව කුලියට ලබා දීම සිදුකරගෙන ගිය බවත්, ගල්කිස්ස ටෙම්ප්ලස්

පාරේ, අංක 41 දරණ ලිපිනයේ පිහිටි Span Tower නමින් හඳුන්වන මහල් නිවාස සංකීර්ණයේ 6/5, 9/3, 10/2 අංක දරණ තම ආයතනයට අයත් නිවාස තුනක් තිබෙන බවත්, එම නිවාස පිළිවෙළින් 6 වන, 9 වන සහ 10 වන මහළ් වල පිහිටා තිබූ බවත්, එම නිවස් සුද්ධ පවිත්‍ර කටයුතු සිදු කිරීම සඳහා ආරුමුගම් චිත්‍රසේන නමැති අයෙකු සේවයට බඳවා ගෙන තිබූ බවත්,එම නිවාස කුලියට ලබා දීම සම්බන්ධව Lanka Property සහ Ikman.lk යන වෙබ් අඩවි වල දැන්වීම් ප්‍රචාරය කර තිබූ බවත්, සංචාරකයන් තමාට හෝ ඒ කාලය වන විට එම ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කළ තාහිර් අලි දාවුද් බායි යන අයට කතා කර නිවාස වෙන් කරවා ගැනීම සිදු කළ බවත්, 2019 කාලයේ මුබාරක් නමැති අය විසින් එම මහළ් නිවාස සංකීර්ණයේ 09 වන මහළේ පිහිටි 9/3 නිවස 2019.04.19 දින සිට දින තුනක කාලයක් සඳහා වෙන් කරවා ගත් බවත්, 2019.04.19 වන දින සවස 4.00 ට - 4.30 ට පමණ යතුරු පැදියකින් පැමිණ එම තැනැත්තා අදාළ නිවසේ යතුරු ලබා ගත් බවත්, නිවස දවස් 02 ක් සඳහා වෙන් කරවා ගනු ලැබුවේ ඔහුගේ පවුලේ අයවළුන්ට නැවතී සිටීම සඳහා බවට ඔහු විසින් පැවසූ බවත්, ඒ කෙසේ වෙතත් 2019.04.19 නිවසේ යතුර භාර ගැනීමට තනිවම ස්කූටි වර්ගයේ යතුරු පැදියක පැමිණි බවත්, ඔහුට යතුර භාර දෙන අවස්ථාවේ රිසිට් පතක්ද නිකුත් කළ බවට පවසමින් එම රිසිට් පත මෙම සාක්ෂිකරු විසින් විවෘත අධිකරණයේ හඳුනා ගත් අතර, එම රිසිට් පත පැමිණිල්ල

විසින් පැ.881 වශයෙන් ලකුණු කරන ලදි. එලෙස පුද්ගලයන් සඳහා නිවාස කුලියට ලබා දෙන අවස්ථාවේදී එම පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් පරීක්ෂා කර බලන බවත්, තමා විසින් එම්.ඒ.එම්.මුබාරක් යන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතද පරීක්ෂා කළ බවත්, ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 873340312V බවත්, ඉන්පසු එදින ඔහුට එම නිවස භාර දුන් බවත්, එම තැනැත්තා 2019.04.21 දින දක්වා එම නිවස වෙන් කර තිබූ බැවින් ඊට පෙර දිනයේ එනම්, 2019. 04.20 වන දින රාත්‍රී 8.30 ට පමණ එම තැනැත්තා පසුදින පිටත් වන වේලාව සම්බන්ධයෙන් විමසීමට තමා ඔහුට දුරකථන මඟින් සම්බන්ධ වීමට උත්සාහ කළ බවත්, එම අවස්ථාවේ ඔහුගේ දුරකථනය විසන්ධි කර තිබූ බවත්, ඊට පසු දින එනම්, 2019.04.21 වන දින උදෑසන 8.30 ත් 10.00 ත් අතරතුර තමා එම මහල් නිවාස සංකීර්ණයට පැමිණි බවත්, ඉන්පසුව ආරුමුගම් චිත්‍රසේන යන තම ආයතනයේ සුද්ධ පවිත්‍ර කටයුතු සිදු කරන පුද්ගලයා සමඟ 09 වෙනි මහලේ පිහිටි එම නිවසට ගිය බවත්, එලෙස ගොස් බැලීමේදී නිවසේ දොර අඩක් විවෘත කර ඇති බව තමාට පෙනී ගිය බවත්, නිවසෙහි බෙල් එක නාද කරනු ලැබුවත් කිසිවෙකු පිටතට නොපැමිණි බවත්, ඉන්පසුව තමා හෙමින් දොර මදක් තල්ලු කළ බවත්, එවිට දොරේ යතුර බිම වැටී තිබෙනවා දුටු බවත්, එම අවස්ථාවේ නිවසේ කිසිවෙකු නොසිටි බවත්, ඒ අවස්ථාවේදී තමා චිත්‍රසේනත් සමඟ එකතු වී මුළු නිවසම පරීක්ෂා කළ බවත්, එවිට තමාගේ උපකරණ වලට හෝ නිවසට කිසිදු හානියක්

සිදුවී තිබුනේ නැති බවත්, නමුත් එම නිවසේ නැවතී සිටි පුද්ගලයන් විසින් භාණ්ඩ කිහිපයක් එනම්, රිස්ට් වොච් එකක්, ටී ෂර්ට් 02 ක්, සපත්තු 02 ක්, ගමන් මල්ලක් (Suitcase) සහ කොට කලිසමක් දමා ගොස් තිබූ බවත්, එලෙස දමා ගොස් තිබූ භාණ්ඩ ඒ අයුරින්ම තබා නිවස අගුළු දමා තමා එම ස්ථානයෙන් පිටත් වූ බවත්, ඒ වන විට ලංකාවේ තැන් කිහිපයකම බෝම්බ පිපිරීම් සිදුවී ඇති බවට තමා ප්‍රවෘත්ති මඟින් දැනගෙන සිටි බවත්, එනිසා ඉක්මනින් නිවසට යාම සඳහා එම ස්ථානයෙන් පිට වූ බවත් , තවද, එකී 9/3 නිවසේ කුලියට සිටි පුද්ගලයා දැනුම් දීමකින් තොරව නිවසින් පිටත් වී තිබෙන බවට තම ආයතනයේ අධ්‍යක්ෂකවරයාට ඒ මොහෙතේම දැනුම් දුන් බවත් සාක්ෂිකරු පවසා සිටින ලදි.

ඉන්පසු දින තමා පදිංචි වී සිටි කොළඹ 10, සිරිධම්ම මාවතේ පිහිටි නිවසේ සිට උදය වරුවේ තමාගේ බිරිඳත් සමඟ කළුතර යාමට පිටත් වූ බවත්, එලෙස ගමන් කරන අතරතුරදී ගල්කිස්ස පිහිටි ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයට ගිය බවත්, ඒ අවස්ථාවේදී එම මහල් නිවාස සංකීර්ණය අසළ පොලිස් නිළධාරීන් සහ පොලිසියට අයත් වාහන කිහිපයක් නවතා තිබූ බවත්, තමා එහි ගොස් ආරුමුගම් චිත්‍රසේන සමඟ 9 වන මහළේ තිබූ නිවසට ගොස් එම නිවස සුද්ධ පවිත්‍ර කරන ලෙසට චිත්‍රසේනට උපදෙස් ලබා දී බිරිඳත් සමඟ කළුතර යාමට පිටත්වූ බවත්, එලෙස ගමන් කරන විට බණ්ඩාරගම ආසන්නයට යන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජයසුන්දර නමැති නිලධාරියෙක්

කතා කර වහාම ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයට පැමිණෙන ලෙසට දැනුම් දුන් බවත්, එම දැනුම් දීම පරිදි තමා වාහනය හරවා නැවතත් ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයට පැමිණි බවත්, එම අවස්ථාවේ එතන සිටි නිළධාරීන් තමාව 9/3 අංක දරණ නිවස වෙතට රැගෙන ගොස් දීර්ඝ ලෙස තමාගෙන් ප්‍රශ්න කළ බවත්, ඉන්පසු තමා සහ ආරුමුගම් චිත්‍රසේන යන දෙදෙනාවම විමර්ශන කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට රැගෙන ගොස් විමර්ශනය කළ බවත්, එම විමර්ශනයේදි පැ.881 වශයෙන් ලකුණු කරන ලද රිසිට් පත තමා විමර්ශන නිළධාරීන්ට භාර දුන් බවටත් සාක්ෂිකරු සාක්ෂි දෙන ලදි. තවදුරටත් සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකරු පවස සිටියේ, එම්.ඒ.එම්.මුබාරක් යන තැනැත්තා තවත් අවස්ථාවක ගල්කිස්ස ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයේ තම ආයතනයට අයත් 6/5 අංක දරණ නිවස වෙන්කරවා ගෙන තිබෙන බවත්, එනම් 2019 අප්‍රේල් 12 දින සිට 2019 අප්‍රේල් මස 14 දින දක්වා බවත්, එම වෙන් කිරීම සම්බන්ධවත් තමා විසින් රිසිට් පතක් නිකුත් කළ බව පවසා මෙම සාක්ෂිකරු විසින් රිසිට් පතක් විවෘත අධිකරණයේදී හඳුනාගත් අතර එම රිසිට් පත පැමිණිල්ල විසින් පැ.842 ලෙස ලකුණු කරන ලදි. තවද, එකී රිසිට් පතේ එම්.ඒ.එම්.මුබාරක් යන අයගේ හැඳුනුම්පත් අංකය 873340312V ලෙස සඳහන් වී තිබෙන බවටත් සාක්ෂි ලබා දෙන ලදි.තවද, 2019 අප්‍රේල් 12 වන දින එකී එම්.ඒ.එම්. මුබාරක් යන තැනැත්තා සුදුපාට බඩී වෑන් රථයකින් තනිවම පැමිණි

බවත්, 2019 අප්‍රේල් 12 වන දින යතුරු භාර ගෙන පසුව 2019 අප්‍රේල් 14 වන දින නැවතත් යතුරු භාර දී පිටව ගිය බවටත් සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරුට පැ.834 ලෙස පැමිණිල්ල විසින් ලකුණු කරන ලද ඡායාරූපයක් පෙන්වන ලද අතර, එම ඡායාරූපයේ සිටින පුද්ගලයා තමා කලින් සඳහන් කරන ලද එම්.ඒ.එම්.මුබාරක් යන අයගේ පෙනුම (Appearance) තිබෙන පුද්ගලයෙකු බවටත් සාක්ෂිකරු විසින් පවසා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 1031, වස්තුහේවා අරුණ ප්‍රියතමද සිල්වා යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, 2019 වර්ෂය වන විට තමා ස්පෑන් ටවර් නමැති මහල් නිවාස ගොඩනෙගිල්ලේ ආරක්ෂක නිළධාරියෙකු ලෙස සේවය කළ බවත්, තමා සමඟ තවත් ආරක්ෂක නිළධාරීන් එම ස්ථානයේ සේවය කළ බවත්, ස්පෑන් ටවර් ගොඩනැගිල්ල තට්ටු 12 කින් යුත් ගොඩනැගිල්ලක් බවත්, එහි තිබෙන ඇතැම් නිවාස කුලියට ලබා දීම සිදු කරන බවත්, ස්පෑන් ටවර් ගොඩනැගිල්ල තුළ CCTV පද්ධතියක් සවි කර තිබූ බවත්, එම පද්ධතියේ DVR එක ගාඩ් රූම් එකේ සවිකර තිබූ බවත්ය. තවද ස්පෑන් ටවර් ගොඩනැගිල්ලට ඇතුල් වන සහ පිටත් වන වාහන සටහන් කර ගැනීම සඳහා වාහන රෙජිස්ට්‍රර් පොතක් පවත්වාගෙන යන

බවත්, එම පොතේ ඇතුල් වන වාහන අංකය සහ වේලාව, පිටත් වන වාහන අංකය සහ වේලාව සහ එකී වාහන පැමිණෙන නිවසේ අංකය යන විස්තර ආරක්ෂක නිළධාරීන් විසින් සටහන් කර ගන්නා බවත් පවසා සිටිමින් 2018 වර්ෂයේ ස්පෑන් ටවර් ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය වාහන රෙජිස්ටරය සාක්ෂිකරු විසින් භාදුනා ගත් අතර, එම පොත පැමිණිල්ල විසින් පැ.843 වශයෙන් ලකුණු කරන ලදි.

පැ.843 දරණ රෙජිස්ටරයේ පිටු අංක 98 හි 2019.04.12 වන දිනට අදාළ සටහන් තිබෙන බවත්, එදින පෙරවරු 10.45 ට එම ස්පෑන් ටවර් ගොඩනැගිල්ලේ 6/5 අංකය දරණ නිවසට PJ-4080 දරණ වාහනයක් පැමිණ තිබෙන බවත්, පැ.843 දරණ එම රෙජිස්ටරයේ පිටු අංක 99 හි 2019.04.13 වන දිනට අදාළ සටහන් තිබෙන බවත්, එදිනද එකී PJ-4080 දරණ වාහනය 6/5 දරණ නිවසට පෙරවරු 7.50 ට පැමිණ එදිනම පෙරවරු 8.30 ට පිටත් වී තිබෙන බවත්, එදිනම එකී 6/5 නිවසට 7.00 ට පී.ඊ.9353 අංක දරණ වාහනයක් පැමිණ 7.15 ට පිටව ගොස් තිබෙන බවත්, (සාක්ෂිකරු විසින් මෙකී වේලාව පෙරවරුද පස්වරුද යන්න සදහන් කර නොමැති බවට අධිකරණයට නිරීක්ෂණය වේ.) එකී පැ.843 හි පිටු අංක 99 හි 2019.04.14 වන දිනට අදාළ සටහන්ද තිබෙන බවත්, එදිනත් එම ගොඩනැගිල්ලේ 6/5 දරණ නිවසට ඉහත සඳහන් PJ-4080 දරණ වාහන 8.24 ට පැමිණ පෙරවරු 9.00 ට පිටත් වී තිබෙන බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, එකී පැ.843 හි පිටු අංක 103 හි

2019.04.20 වන දිනට අදාළ සටහන් තිබෙන බවත්, එදින එම ගොඩනැගිල්ලේ 9/2 අංකය දරණ නිවසට වේලාව 7.39 ට අංක PJ-4080 දරණ වාහනය පැමිණ තිබෙන බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. පැ.843 දරණ රෙජිස්ටරයේ පිටු අංක 98 පැ.843(1) ලෙසත්, පිටු අංක 99 පැ.843(2) ලෙසත්, පිටු අංක 103, පැ.843(3) ලෙසත් පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

<u>ගල්කිස්ස ස්පෑන් ටවර් මහල් නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවසක පවත්වාගෙන ගිය ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂිවිශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ ගල්කිස්ස ටෙම්ප්ලස් පාර, අංක 41 දරණ ලිපිනයේ පිහිටි Span Tower නමින් හඳුන්වන මහල් නිවාස සංකීර්ණයේ පිහිටි නිවාස 02 ක් සම්බන්ධයෙන් පැ.සා.1336 ජයන්ත ධනන්සූරිය සහ පැ.සා.1031 අරුණ ප්‍රියතමද සිල්වා යන සාක්ෂිකරුවන් මගින් පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම සියළුම සාක්ෂිකරුවන්ගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, ඔවුන්ගේ සාක්ෂි චූදිතයන් විසින් අභියෝගයට ලක් කිරීමක්ද සිදු කර නැත. ඒ අනුව ඔවුන්ගේ සාක්ෂි කිසිදු

අභියෝගයකට ලක් නොවී ඉදිරිපත් වී ඇත. ඔවුන්ගේ සාක්ෂි අනුව පෙනී යන්නේ, එම මහල් නිවාස සංකීර්ණයේ අංක 6/5 දරණ නිවස 2019 අප්‍රේල් මස 12 වන දින සිට 2019 අප්‍රේල් 14 දක්වා දින 02 ක කාලයක් සඳහා ජාතික හැඳුනුම්පත් අංක 873340312V හිමි එම්.ඒ.එම්.මුබාරක් යන අය විසින් වෙන් කරවා ගෙන ඇති බවත් ඉන්පසුව නැවතත් 2019.04.19 දින සිට 2019.04.21 දක්වා දින 03 ක කාලයක් සඳහාද එකී එම්.ඒ.එම්.මුබාරක් යන අය විසින් නැවතත් එම මහල් නිවාස සංකීර්ණයේ නිවසක්, එනම්, අංක 9/3 දරණ නිවස වෙන් කරවා ගෙන ඇති බවයි. තවද, 2019.04.21වන දින එනම්, පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සිදුවූ දින උදෑසන 8.30 වන විටත් ඔහු කිසිඳු දැනුම් දීමකින් තොරව එම නිවසින් පිටව ගොස් ඇත. එසේම එම්.ඒ.එම්.මුබාරක් යන එකී තැනැත්තා පැ.834 ලෙස පැමිණිල්ල විසින් ලකුණු කර තිබෙන ඡායාරූපයේ සිටින පුද්ගලයාට සමාන පෙනුම තිබෙන පුද්ගලයෙකු බවටද සාක්ෂිකරු පවසා සිටින ලදී.

තවද, එකී මුබාරක් යන තැනැත්තා විසින් වෙන් කරවා ගන්නා ලද අංක 6/5 අංක දරණ නිවසට 2019.04.12 , 2019.04.13 සහ 2019.04.14 වන දිනයන්හි අංක PJ-4080 දරණ වාහනය පැමිණ ගොස් ඇති බවට කරුණු අනාවරණය වේ. එලෙසම එම්.ඒ.එම්.මුබාරක් විසින් වෙන් කරවා ගන්නා ලද අංක 9/3 දරණ නිවසටද එකී අංක PJ-4080 දරණ වාහනය 2019.04.20 වන දිනද පැමිණ ගොස් ඇති බව හෙලි වේ. මෙකී PJ-4080

දරණ වාහනය අංක 873340312V දරණ ජාතික හැඳුනුම්පත් අංකය හිමි එම්.ඒ.එම්.මුබාරක් යන තැනැත්තා විසින් මිළදී ගනු ලැබූ වාහනයක් බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.181 අබේසිංහ ආරච්චිගේ කමලාවතී, පැ.සා.274 නදුන් වීරංග රත්නායක යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මඟින් හෙළි වී ඇත. තවද, මෙම වාහනය 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිට පුද්ගලයෙකු විසින් නවතා තිබී ඇති අතර, ඉන්පසු දින එනම්, 2019.04.22 වන දින බෝම්බ සවිකර තිබූ එකී වාහනය එම ස්ථානයේ දී පිපිරී ගිය බවටද මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.1603 දිමුතු සුරංග සමරනායක සහ පැ.සා.1958 පො.ප. දිසානායක යන විමර්ශන නිළධාරීන්ගේ සාක්ෂි මගින් සනාථ වී ඇත. තවද, එකී මොහොම්මදු මුවාත් අලවුදීන් සහ එම්.ඒ.එම්. මුබාරක් යන තැනැත්තන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් 2019.04.21 වන දින කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය තුළදී බෝම්බයක් පුපුරවා ගෙන මිය ගිය තැනැත්තා මොහොම්මදු මුවාත් අලවුදීන් යන අය බවට සහ කොළඹ කිංග්ස්බරි හෝටලය තුළදී බෝම්බය පුපුරවා ගෙන මිය ගිය තැනැත්තා එම්.ඒ.එම්.මුබාරක් යන අය බවට කරුණු සනාථ වී ඇත.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දී ඇති

පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත සඳහන් කොටස අන්තර්ගත වී ඇත.

> ***“ පසුව සහරාන් මල්වාන, එඩේරමුල්ල, රිදීතැන්න, ස්පෑන් ටවර්, මයුරා පෙදෙස පානදුර සරිකාමුල්ල යන ප්‍රදේශවල නිවාස සහ ස්ථාන කුලියට ගෙන Safe House එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස භාවිත කළේ ය. ”***

යනුවෙන් සඳහන් කර ඇති අතර එම කොටස පැ803(A)02(16) ලෙස ලකුණු කර ඇත.ඒ අනුව මනාව පෙනී යන්නේ ස්පෑන් ටවර් යන ස්ථානයද ආරක්ෂිත නිවසක් ලෙස භාවිතා කර ඇති බවය.

මෙම නඩු විභාගයේදී අට්ටාලච්චේන නිවසක තිබී සොයා ගන්නා ලද සැනෙලි දාවකයක් පැමිණිල්ල විසින් පැ.163 ලෙස ලකුණු කර ඇත. එම සැනෙලි දාවකයේ පටිගත වී තිබෙන වීඩියෝ දර්ශනයෙන් සහරාන් අසීම් සහ තවත් පුද්ගලයන් හත්දෙනෙකු විසින් යම් නිවසක් තුළ ප්‍රතිඥා දීමක් එනම් ‘බයියෙත් ’ ලබා දීමක් සිදු කර ඇති අතර, එම ප්‍රතිඥා දීමේදී ඔවුන් දරණ මතයට විරුද්ධ වන අයව එනම්, ‘කාෆීර්’ ලෙස හඳුන්වන අයව මරා දැමිය යුතු බවටද පවසා ඇත. එම ප්‍රතිඥා දීමේදී ඔවුන් සිටගෙන සිටි ස්ථානයට පිටුපසින් පෙනෙන කොඩියට සමාන කොඩියක් කල්මුණේ, සෙන්නල් ග්‍රාමම් යන ගම්මානයේ නිවසක තිබී සොයා ගෙන

ඇත. මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා 1400 අනස් විසින් ද එම කොඩිය සහ එහි පසුබිමේ තිබෙන අරාබි වචන වල අර්තය සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සාක්ශි ලබා දී ඇත.

"අද දින සහෝදරවරුනි, අද දින ශ්‍රී ලංකා දේශයට අයත් ඉස්ලාම් දේශයට අයත් අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අපිට ඉස්තිෂ්හාත් එනම් ආගම වෙනුවෙන් ජීවිතය පූජා කිරීම යැයි කියනු ලබන වීරෝධාර මරාගෙන මැරෙන ප්‍රහාරයට අප සියලු දෙනාම එක්වී සිටින්නෙමු."

තවද, සහරාන් ඇතුළු කණ්ඩායම විසින් එලෙස ප්‍රතිඥා දීමක් සිදු කර ඇත්තේ, මෙම ස්පෑන් ටවර් නිවාස සංකීර්ණයේ තිබූ නිවසකදී බවටත් ආණ්ඩු රස පරීක්ෂකවරයාගේ සාක්ෂියෙන් සනාථ වී ඇත.

"අපගේ දෙවියන් වෙනුවෙන් ජීවිතය පූජා කිරීමේ ප්‍රහාරයේ දී ක්‍රිස්තියානි පල්ලි ඉලක්ක කරගෙන තියෙනවා. CHURCH ඉලක්ක කරගෙන තියෙනවා. ඇයි දන්නවාද, දෙවියන් විශ්වාස නොකරන ඔබගේ ලේ අපට හලාල් එනම් අපට කැපයි කියා අපගේ ධර්ම මාර්ගය පවසනවා; අල් කුරාණයේ අල්ලාහ් දෙවියන් කියනවා; අල්ලාහ් දෙවියන්ව විශ්වාස නොකරන, මෙලොව හා පරලොව විශ්වාස නොකරන මෙන්ම අල්ලාහ් දෙවියන් සහ ඔහුගේ රසූල් එනම් අල්ලාහ් දෙවියන්ගේ පණිවිඩකරු හරාම් එනම් අපට

අකැප දේ අනුමත නොකරන, සත්‍ය ධර්මය වන ඉස්ලාම් ධර්මය, ධර්ම මාර්ගයක් ලෙසට නොපිළිගන්නා ලද ඒ ග්‍රන්ථ විශ්වාස කරන්නන් ජීසියා බද්ද එනම් ඉස්ලාම් රාජ්‍යයක වෙනත් ජාතීන් විසින් ගෙවනු ලබන බද්ද ගෙවන තුරු ඔබ ආයුධ ගෙන සටන් කරන්න කියා. මේ කාගේ වැකියක්ද, අල්ලාහ් දෙවියන්ගේ ඒ සිංහාසනයේ වැඩ සිටින රහුමාන්ගේ එනම් අල්ලාහ් දෙවියන්ගේ වැකිය යි.''

''මේක මරාගෙන මැරෙන ප්‍රහාරයක් නෙවෙයි. ජීවිතය පූජා කරමින් සිදු කරන මරාගෙන මැරෙන ප්‍රහාරයක්. මෙය අල්ලාහ් දෙවියන් සමඟ කරනු ලබන උතුම් වූ ව්‍යාපාරයක්.''

''අප සියලු දෙනාගේ ප්‍රාණය අල්ලාහ් දෙවියන් වෙනුවෙන් පුදනු ලබන්නේ. ඒ විතරක් නෙමෙයි. ඉරාකයේ මොසූල් යැයි කියනු ලබන ඉස්ලාමීය දේශය මුස්ලිම්වරුන් විසින් පාලනය කරන ලද අල්ලාහ් දෙවියන් වෙනුවෙන් සටන් කරන අය විසින් පාලනය කරන ලද, අල්ලාහ් දෙවියන්ගේ ෂරියා නීතිය ක්‍රියාත්මක වූ ඒකදේවවාදී ධජය ලෙළ දුන් භූමියක්. ඒ මොසූල් නගරයත්, සිරියාවේ රක්කා නගරයත්, ලිබියාවේ සිරුත්ති නගරයත් විනාශ කළ කුරුසකරුවන්ට මුළුමණින්ම විනාශ කිරීමට, අපි දෙවියන් වෙනුවෙන් ජීවිතය පූජා කිරීමට ඉදිරිපත් වුණෙමු. අපගේ දෙවියන්

*වෙනුවෙන් ජීවිතය පූජා කිරීමේ ප්‍රහාරයේ දී ක්‍රිස්තියානි පල්ලි ඉලක්ක කරගෙන තියෙනවා. **CHURCH** ඉලක්ක කරගෙන තියෙනවා. ඇයි දන්නවාද, දෙවියන් විශ්වාස නොකරන ඔබගේ ලේ අපට හලාල් එනම් අපට කැපයි කියා අපගේ ධර්ම මාර්ගය පවසනවා;*

“ ක්‍රිස්තියානි අය වන ඔබ ළඟටම ඇවිල්ලා, අල්ලාහ් දෙවියන්ව විශ්වාස නොකරන අය වන ඔබට ළඟටම ඇවිල්ලා එක්කෝ ඉස්ලාම් ආගමට එන්න. නැත්නම් ජීසියා බද්ද ගෙවන්න. නැත්නම් ඔබ සමඟ අපට ආයුධ සන්නද්ධ අරගලයක් ප්‍රකාශයට පත් කරන්න සිදු වේවි යැයි ඔබ ඔවුන්ට කියා තිබිය යුතුයි.”

“ ඉස්ලාම් ධර්මයේ අහිංසක මහජනතාව කියා කොටසක් නෑ. අල්ලාහ් දෙවියන් විසින් මිනිසුන් වෙන් කළේ කාෆීර් සහ මුස්ලිම් කියලා. කාෆීර් සහ මුස්ලිම් කියන වෙනස පමණයි ධර්ම මාර්ගයේ තියෙන්නේ. කාෆීර් එනම් දෙවියන් විශ්වාස නොකරන අයෙක් නම් ඔහුගේ රුධිරය සහ ආර්ථිකය හලාල්.”

*“ ඉස්ලාමීය දේශයට දිවුරුම් දෙන ඉස්ලාමීය රාජ්‍යයට **IS** ට දිවුරුම් දෙන ජනතාව ශ්‍රී ලංකාවේ බහුලව බිහි වේවි, අල්ලාහ්ගේ කැමැත්තෙන්. කැඩී බිඳී විසිර ගිය අපේ හිස්කබල්වලට වඩා, කැඩී*

බිඳී ගිය අපේ මස් කැබලිවලට වඩා විලායත් එනම් ඉස්ලාම් රාජ්‍යයක් මේ රටේ නිර්මාණය වේවි.''

'' ජිහාද්වල දී අපි කිසිවිටෙකත් සාකච්ඡා කරන්නේ නැහැ. එක, නුඹලා කපා කොටා මරා ජයග්‍රහණය ලබා ගන්නවා. නැත්නම් ආගම වෙනුවෙන් අපි ජීවිතය විනාශ කරගන්නවා.''

''දෙවියන් විශ්වාස නොකරන ඔබ හා අප අතර කතා කරන්නේ පිහිය හෝ කඩුව පමණයි. තියුණු කඩුවක්, තියුණු පිහියක්. ඉන්ෂාහ් අල්ලාහ් අපි දෙවියන් වෙනුවෙන් කරන ජීවිත පූජාව, මේක ඉතා උතුම් මල්හමා යුද්ධයක් සඳහා වූ ආරම්භයක් බව තේරුම් ගන්න.මින් පසුව දිගටම තැනින් තැන බෝම්බ පුපුරවන්නෙමු. ඔබලාගේ බෙලි කපන්නෙමු. ලේ ගංගා ගලා යන්නට සලස්වන්නෙමු. ඔබලාගේ රාත්‍රිය දහවල බවටත්, දහවල රාත්‍රිය බවටත් පත් කරන්නෙමු. ඔබේ දෙපා මුල ගිණිකඳු පුපුරවන්නෙමු. දෙවියන් වෙනුවෙන් ජීවිත පූජා කරන අය සිනාසෙමින් බෝම්බ පිරවූ වාහනවලින් ලහි ලහියේ පැමිණේවි. ඒව ඔබට ආරංචි නොවේවි. ඔබලා දකීවි. ඔබේ මිණිවලවල් ඔබම හාරගන්න. ඒ ඇයි කියනවානම්, බෝම්බය පුපුරවා ගන්න පැමිණෙන කෙනා දරුණු හා දැඩි කෙනෙක් නිසයි.

“ මේ සටන සාකච්ඡා කරන ඔබලාට නතර කරන්න පුළුවන් කියා හිතන්න එපා. තැනින් තැන බෝම්බ පිපිරේවා. මේක තමයි ආරම්භය.”

“ ඉන්ෂා අල්ලාහ් මෙහි ඇති භයානක බව, මෙහි ඇති අනතුරුදායක බව, ජිහාද් හි බරපතලකම ඔයාලාට හොඳින් තේරුම් යාවයි. වාහනවල බෝම්බ පුරවාගෙන අපේ සහෝදරයන් ඇවිල්ලා නුඹලාව කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් විනාශ කරාවි. අපේ විසිරී ගිය හිස්කබල් මතින් තමයි මෙහේ ඉස්ලාම් රාජ්‍යයක් ගොඩනැගෙන්නේ. අනිවාර්යෙන්ම අපේ උත්සාහය අපතේ යන්නේ නෑ.”

“ අපි ජීවිතය පූජා කළා කියන ප්‍රවෘත්තිය ඔයාලට ලැබුණොත් මුලින්ම ඔයාලා ඉවසීමෙන් ඉන්න. අල්ලාහ් දෙවියන් වෙනුවෙන් හිස නමා යාඥා කරන්න. අල්ලාහු අක්බර් කියන්න. අල්ලාහ්ව ප්‍රශංසා කරන්න. අල්ලාහ් දෙවියන්ගේ කැමැත්තෙන් හෙට අපි මුහම්මද් සහ එතුමාගේ මිතුරන්ද අපි ඉන්ෂාහ් අල්ලාහ් හමුවෙමු.”

මෙම අධිකරණයේ පැ.163 ලෙස ලකුණු කර ඇති, සහරාන් නැමති ස්වයංඝාතක බෝම්බකරු විසින් ගල්කිස්ස ස්පෑන් ටවර්හි පිහිටි ඉහත කී ආරක්ෂිත නිවසේ දී 2019.04.20 දින පස්වරුවේ පවත්වා ඇති ඉහත කී

බයියෙත් දේශනාවේ සිංහල පරිවර්තනය අනුව පෙනී යන්නේ ඔහු ඔහුගේ අනුගාමිකයින් ව ‘‘හෙට දින’’ එනම් 2019-4-21 දින බෝම්බ පුපුරවා හැරීමට උපදෙස් ලබා දෙන ආකාරය වේ. එසේම එකී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රකාරයන් ක්‍රිස්තියානි පල්ලි ඉලක්ක කරගනිමින් සිදුකිරීමට සැලසුම් කර ඇති ආකාරය පැ.163 මගින් මනාව පෙනී යන අතර, ඒ අනුව මෙම නඩුවේ 01 චූදිතගේ පාපොච්චාරණයේ අඩංගු කරුණු අතුරින් පැ803(A)02(16) ලෙස ලකුණු කර ඇති කරුණු වලදී ස්පෑන් ටවර් නැමැති ස්ථානයේ සහරාන් විසින් ආරක්ෂිත නිවසක් පවත්වාගෙන ගොස් ඇති බව මනාව පැහැදිලි වේ.

<u>පානදුර පරත්ත පාර, ඉරිඟ මාවත, අංක 61/2 දරණ</u>

<u>ස්ථානයේ ‘නස්මියා විලා’ නැමැති නිවසේ පවත්වාගෙන ගිය</u>

<u>ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2244 අබ්දුල් සත්තාර් මොහොමඩ් ඉල්හාම් යන අය සාක්ෂි දෙමින්, තමා දැනට වැලිගම ප්‍රදේශයේ පදිංචිව සිටින අතර, තමාට අයත් නිවසක් පානදුර පරත්ත පාර, ඉරිඟ මාවත, අංක 61/2 දරණ ස්ථානයේ ඇති බවත්, එය ‘නස්මියා විලා’ යනුවෙන් නම් කර ඇති බවටත් කියා සිටින ලදී. එහි තනි තට්ටුවේ නිවසක් ඇති අතර, පැ.832 වශයෙන් සලකුණු කර ඇති සංයුක්ත තැටිය තුළ ඇතුළත් පැ.831(1) ඡායාරූපය එම නිවස බවට අදාළ ඡායාරූපය අධිකරණයේ ඇති පුළුල් තිරය මත ප්‍රදර්ශනය

කිරීමේ දී හඳුනාගන්නා ලදී. එසේම මෙම සාක්ෂිකරු ඒ ආකාරයෙන්ම පැ.832(2) දරණ ඡායාරූපය මගින් එම නිවසේ 'නස්මියා විලා' යන නම සහ අංකය හඳුනාගන්නා ලදී. එම නිවස පිහිටි ඉඩමෙහි ප්‍රමාණය පර්චස් 18ක් පමණ වන අතර නිවස වටා තාප්පයක් ඉදි කර ඇති බවත්, නිවස කාමර 04කින් යුක්ත බවත්, එය කුලියට දීම සඳහා අන්තර්ජාලයේ දැන්වීමක් පළ කල බවටත් කියා සිටින ලදී. 077-3344209 දරණ දුරකතනයෙන් පිරිමි අයෙකු තමාව අමතා එම නිවස කුලියට ගැනීම සඳහා පරීක්ෂා කිරීමට අවශ්‍ය බව දැන්වූ බවත්, තමා වැලිගම ප්‍රදේශයේ පදිංචිව සිටි බැවින් ෆාතිමා සෙයිනා යන අයට ඒ බව දැනුම් දී නිවස කුලියට ගැනීමට සිටි පුද්ගලයාට නිවස පෙන්වන ලෙසට දැන්වූ බවටත් කියා සිටින ලදී. එම නිවස කුලියට ගැනීම සඳහා සාකච්ඡා කළ අය පාවහන් වෙළඳාම කරන බව දැන්වූ බවත්, ඒ අනුව මසකට රුපියල් 40,000/- ක මුදලකට කුලියට ගැනීමට එකඟ වූ බවත්, ඒ අනුව නීතීඥවරයෙකු ඉදිරිපිට දී බදු ඔප්පුවකට එළඹුන බවටත් කියා සිටිමින්, වර්ෂ 2019.02.13 වන දින සහ අංක 2255 දරණ ගාමිණී බී. පෙරේරා නීතීඥවරයා විසින් ලියා සහතික කරන ලද බදු ඔප්පුව එකී නිවස කොළඹ, 12 අලුත් යෝන්වීදිය, අංක 138/B හි පදිංචි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයට බදු පදනම මත ලබාදුන් ඔප්පුව බවටත් හඳුනා ගන්නා ලදී. එකී ඔප්පුව පැ.833 වශයෙන් පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී. එසේම එකී ඔප්පුවට සාක්ෂි වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 751540811V හිමි කොළඹ, 12

අලුත් යෝන්වීදිය, අංක 138B පදිංචි මොහොමඩ් අමීර් මොහොමඩ් රුස්මී යන අය අත්සන් කළ බවටත් කියා සිටින ලදී. බදු ගැනුම්කාර මුබාරක්ගේත් සාක්ෂිකාර රුස්මී යන අයගේත් අනෙක් සාක්ෂිකාරිය වශයෙන් අත්සන් කළ බිරිඳගේත් අත්සන් පැ.833 දරණ බදු ගිවිසුමෙහි ඇති බවට පෙන්වා හඳුනාගන්නා ලදී. එම අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් එකී සාක්ෂිකරු වශයෙන් අත්සන් කළ තැනැත්තා මෙම නඩුවේ විත්තිකරුවන් වශයෙන් පෙනී සිටින විත්තිකරු වන 06 වන චූදිත එම්.ඒ.එම් රිස්කාන් බවට විවෘත අධිකරණයේ දී හඳුනා ගන්නා ලදී.

තවද නිවස කුලියට ගත් මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් පාස්කු දින බෝම්බ ප්‍රහාරයේ දී මිය ගිය බව තමාට දැන ගන්නට ලැබුණු බවත්, ඔහුගේ ඡායාරූපයක් ද තමා විමර්ශන අවස්ථාවේ දී හඳුනාගත් බවත් තමා එම ඡායාරූපය හඳුනාගෙන එහි අත්සන තැබූ බවත් කියා සිටින ලද අතර සාක්ෂිකරුගේ අත්සන සහිත මුබාරක් යන අයගේ ඡායාරූපය පෙන්වා සිටි අවස්ථාවේ දී අත්සන හා ඡායාරූපය හඳුනාගන්නා ලදී. මෙම මුබාරක් යන අයගේ ඡායාරූපය සහ පැ.834 වශයෙන් ද සාක්ෂිකරුගේ අත්සන පැ.834(A) වශයෙන් ද පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී. එසේම පැ.835 දරණ ඡායාරූපය සාක්ෂිකරු හඳුනාගන්නා ලද අතර එහි සඳහන් ‘‘මා විසින් 2019.02.13 දින අංක 61/2, ෂරිෆ් මාවත, පරත්ත පාර, කෙසෙල්වත්ත, පානදුර දරණ ලිපිනයෙහි ඇති නිවස කුලියට වසරක කාලයක් සඳහා බදු ඔප්පු අංක 2225 යටතේ ලබා දුන් මොහොමඩ් අසාම්

මොහොමඩ් මුබාරක් (873340312V) යන අයගේ ඉහත සඳහන් ඡායාරූපය බවට මා විසින් හඳුනා ගත්තෙමි. මීට.ඒ.එස්.එම්.ඉල්හාම්.03.07.2019" යන සටහන තමා විසින් තබන ලද බවට පිළිගන්නා ලදී. එසේම ඔප්පුවට සාක්ෂි වශයෙන් අත්සන් කරන ලද 6 වන විත්තිකරුගේ ඡායාරූපය පැ.836 වශයෙන් ද එහි ඇති සාක්ෂිකරුගේ අත්සන පැ.836(A) වශයෙන් ද හඳුනාගෙන සලකුණු කරන ලදී. 2019-03-19 දින සිට මාස දෙකකුත් දින කීපයක් තුළ පාස්කු ප්‍රහාරය සිදුවූ බවත්, ඊට පෙර අවස්ථාවන් දෙකකදී හෝ තුනක දී තමා එම නිවසට ගොස් පරික්ෂා කළ බවත්, එක් දිනක් දුරකතනයෙන් ඇමතූ විට ඔවුන් පිළිතුරු නොදුන් බවත්, ඒ අනුව තමා නිවසට ගොස් පරික්ෂා කළ අතර ඒ දිනවල පැවති මත් ද්‍රව්‍ය විකිණීම් වැනි සැකකටයුතු ව්‍යාපාර හේතුවෙන් තමා එසේ නිවසට ගොස් පරීක්ෂා කර බැලීමට අදහස් කළ බවත් තමා නිවසට ගිය අවස්ථාවේදී 06 වන විත්තිකරු යම් තිගැස්මකට ලක්වී සිටින බව තමා නිරීක්ෂණය කල අතර ඔවුන් ව්‍යාපාර කටයුතු හේතුවෙන් කාර්යබහුල බැවින් දුරකතනයට පිළිතුරු දීමට නොහැකි වූ බව දැන්වූ බවටත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම නිවස කුලියට ලබා ගැනීම සඳහා මසකට රු.40,000 බැගින් රු.480,000ක මුදලක් එකවරම ලබාදුන් බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අඩංගුවට පත් වූ බවටත් කියා සිටින ලදි. මෙම සාක්ෂිකරුට මේ වන විටත් පැ. 832 වශයෙන් සලකුණු කර ඇති සංයුක්ත තැටියේ ඇති ඡායාරූප පෙන්වන ලද

අතර එම ඡායාරූප ඔහු විසින් පහත පරිදි හඳුනාගන්නා ලදි. පැ. 832 (3) යනු ඉහත අංක 61/2, 'නස්මියා විලා' හි පිටුපස බවත්, එහි ඇති දැවී අළු වී ගිය කොටස් තමා 6 වැනි විත්තිකරු ඇතුළු කණ්ඩායමට භාරදීමේදී එම ස්ථානයේ නොතිබූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. එම ඡායාරූපයේ ඇති ද්‍රව්‍ය තමාට අයත් හෝ තම නිවසට අයත් දේවල් නොවන බවටත් ඔහු වැඩිදුරටත් කිය සිටින ලදි.

ඉන් අනතුරුව සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද පැ. 832(4) දරණ ඡායාරූපය පරීක්ෂා කර බැලූ සාක්ෂිකරු එහි ඇති දේවල්ද තමාට හෝ තමාගේ පවුලේ අයට අයත් දේවල් නොවන බවත්, එහි ඇති විවිධ ප්‍රමාණවල ස්විච්, වයර්, PVC බට සහ ඇතුළත් මෙවලම් තමා දැනුවත්ව එම නිවසට ගෙන ආ දේවල් නොවන බවත්, තමාගේ හෝ තම පවුලේ අයගේ දේවල්ද නොවන බවටත් කියා සිටින ලදි. සාක්ෂිකරු විසින් හඳුනාගැනීමෙන් පසුව සලකුණු කරන ලද පැ.832 (5) දරණ ඡායාරූපයද, පැ. 832 (6) වශයෙන් සලකුණු කරන ලද ඡායාරූපයද පරීක්ෂා කර බලා එහි තිබූ පිළිස්සී ගිය ජංගම දුරකතන සහ ඉලෙක්ට්‍රොනික් පරිපථ ආදිය සම්බන්ධයනේ තමාගේ දැනීමක් නොමැති බවටත්, තමා නිවස භාරදෙන අවස්ථාවේදී ඒවා කිසිවක් නොතිබුණු බවටත් කියා සිටින සාක්ෂිකරු පැ.832 (6) වශයෙන් ලකුණු කරන ලද ඡායාරූපය පරීක්ෂා කර බැලීමෙන් පසුව එම ඡායාරූපයේ ඇති Decathlon යන සන්නාමය සහිත බෑගය තමාගේ නොවන බවටත්, පැ. 832 (7) වශයෙන් සලකුණු කරන ලද තම

ඉඩම තුළ පිහිටි පැරණි ළිඳක තිබූ Decathlon.lk වශයෙන් ඇති බෑගය තමාගේ හෝ තමා විසින් නිවස භාරදෙන අවස්ථාවේදී තිබූ භාණ්ඩයක් නොවන බවටත් හඳුනාගන්නා ලද අතර පැ. 832 (8) වශයෙන් ලකුණු කරන ලද ඡායාරූපයේ ඇති Innovex නැමැති වෙළඳ නාමය සහිත රෙදි සෝදන යන්ත්‍රයක ඇසුරුම ලෙස භාවිතා කරන ලද කාඩ්බෝඩ් පෙට්ටියද තමාට අයත් හෝ තමා නිවස භාරදෙන අවස්ථාවේදි තිබුණු ද්‍රව්‍යයක් නොවන බවට කියා සිටින ලදි. නිවස තුළ ආලින්දය සහ කාමර ආශ්‍රිතව ඡායාරූප කිහිපයක් සාක්ෂිකරුට පෙන්වා සිටින ලද අතර ඒවා හඳුනාගැනීමෙන් අනතුරුව පැ. 832 (8), පැ. 832(9), පැ.832 (10) වශයෙන් සලකුණු කර ඇති අතර ඉන් පැ. 832 (8) දරණ ඡායාරූපයේ ඇති අංක තහඩු, බැටරි සහ අනෙකුත් ද්‍රව්‍ය තමාට අයත් නොවන අතර, තමා මෙම නිවස කුලියට දෙන අවස්ථාවේදී නිවසේ තිබුණු ද්‍රව්‍ය නොවන බවටත් කියා සිටින ලදි. පැ.832 (9) යන ඡායාරූපයේද ඇති බැටරි කෑලි, කුඩා පොතක් සහ LED බල්බ ප්‍රමාණයක් සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කරන ලද අතර, ඒවාද තමාට අයත් හෝ නිවස කුලියට දෙන අවස්ථාවේදී තමා විසින් භාරදුන් දේපළ නොවන බවට සාක්ෂිකරු කියා සිටින ලදි.

එසේම සාලයේ ඇති Decathlon සන්නාමය මුද්‍රණය කරන ලද බෑගය මල්ටිබෝන් ලෙස සඳහන් වෙන ලෝහ කැනය, LED බල්බ ප්‍රමාණයක් ඇතුළු ද්‍රව්‍ය ඇතුළත් පැ. 832 (10) සහ පැ.832 (11) ලෙස සාක්ෂිකරුට පෙන්වා සලකුණු කරන ලද ඡායාරූපයේ ඇති ද්‍රව්‍ය ඇතුළත්

ඡායාරූපය නිරීක්ෂණය කරන ලද සාක්ෂිකරු ඒවා තමාගේ හෝ තමා 6 වැනි විත්තිකරු ඇතුළු පිරිසට එම නිවස භාරදෙන අවස්ථාවේදී භාරදෙන ලද දේවල් නොවන බවට කියා සිටින ලදි. එසේම සාක්ෂිකරුට පෙන්වා සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව සළකුණු කරන ලද පැ. 832 (12) දරණ ඡායාරූපයේ සඳහන් K&H Daio steel ball mfg. Co. Ltd යන්නෙන් සටහන්ව ඇති පොලිතින් බෑග් විශාල ප්‍රමාණයක් එම ඡායාරූපයෙන් නිරීක්ෂණය කරන ලද අතර ඒවා බයිසිකල් බෝල ඇසුරුම් බවට තමා දන්නා බවත් ඒවාද තමාගේ හෝ තමා නිවස භාරදෙන අවස්ථාවේදී තිබුණු ද්‍රව්‍ය නොවන බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි.

පැ.832 (13) වශයෙන් ලකුණු කරන ලද ඡායාරූපය සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව එහි ඇති ඉණිමඟ තමාගේ බවත්, එය නැවත 'නස්මියා විලා' නැමැති මෙම නිවසට රැගෙන එන අවස්ථාවේදී 06 වෙනි විත්තිකරුව නිවසේදි හමු වූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. එසේම ඒ ආකාරයෙන්ම සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව සලකුණු කරන ලද පැ. 832 (14) දරණ ඡායාරූපයේ ටයිල් මත ඇති බැටරි සහ බැටරි සම්බන්ධ කර ඇති වයර්ද තමාගේ නොවන බවත්, තමා නිවස භාරදෙන අවස්ථාවේ තිබූ ඒවා නොවන බවටත් කියා සිටින ලදි. තවද සාක්ෂිකරුට Calcium Hypochlorite වශයෙන් සඳහන් බැරලයක් ඡායාරූපයක් මඟින් පෙන්වා සිටින ලද අතර සාක්ෂිකරු විසින් පෙර පරිදිම එය තමාට අයත් හෝ තමා විසින් නිවස භාරදෙන අවස්ථාවේදි 6 වැනි

විත්තිකරු ඇතුළු පිරිසට භාරදෙන ලද භාණ්ඩයක් නොවන බවට කියා සිටින ලදි. එම බැරලය සහිත ඡායාරූපය පැ. 832 (15) වශයෙන් සලකුණු කරන ලදි. මේ ආකාරයෙන්ම සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කරන ලද සහ ඉන් අනතුරුව සලකුණු කරන ලද පැ. 832 (16)හි ඇති first choice,අංක 26 සහ 28, මිරානියා වීදිය, කොළඹ 12 දරණ ලිපිනය සඳහන් බෑගය හෝ එහි හිජාබ්, සපත්තු, අබායා, සෙරෙප්පු හෝ හෑන්ඩ්බෑග් තමා මිලදී ගෙන නොමැති බවත්, නිවස කුලියට දෙන අවස්ථාවේදීද එවැනි දේපළක් භාර නොදුන් බවටත් කියා සිටින ලදි. නිවස භාරදෙන අවස්ථාවේදී ගෑස් ටැංකියක් ලබා නොදුන් බව කියා සිටි සාක්ෂිකරු ඔහුට පෙන්වා සලකුණු කරන ලද පැ. 832 (17) දරණ ඡායාරූපයේ ඇති නිල්පැහැති ගෑස් සිලින්ඩරය තමාගේ නොවන බවත්, එය තමාගේ නිවසේ ගරාජයේ දකුණුපසට වන්නට ඇති බවත් කියා සිටින ලද අතර එය තමාට අයත් හෝ තමා විසින් නිවස භාරදෙන අවස්ථාවේදී 6 වැනි විත්තිකරු ඇතුළු පිරිසට එවැනි භාණ්ඩයක් භාරනොදුන් බවත් සාක්ෂිකරු කියා සිටින ලදි

නීතිඥ නියෝජනයක් නොමැති චූදිතයන් විසින් ද අනෙකුත් චූදිතයන් විසින් ද මෙම සාක්ෂිකරුවන් සාක්ෂි හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමක් සිදු කර නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2257 මොහොමඩ් මස්තූර් ෆාතිහා ෆහරියා යන අය සාක්ෂි දෙමින් ඉහත සාක්ෂිකාර මොහොමඩ් ඉල්හාම්

(පැ.සා.2244) අයත් 'නස්මියා විලා' නැමති නිවස පැ.833 දරණ බදු ගිවිසුම අනුව බදු දෙන අවස්ථාවේ දී තමා එහි සාක්ෂිකාරියක වශයෙන් අත්සන් කළ බවත්, පැ.834 දරණ ඡායාරූපයෙහි ඇති අත්සන තමාගේ වන අතර, එම පැ.834 දරණ ඡායාරූපයේ සිටින පුද්ගලයාව මේ වන විට තමාට හඳුනාගැනීමට නොහැකි බවටත් කියා සිටින ලදි.

මෙම නඩුවේ සියළුම චූදිතයින් මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා.2234 ස්මයිල් ලෙබ්බේ අබ්දුල් රහීම් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, ඔහු සමන්තුරේ සෙන්නල් ග්‍රාම 01, අංක 170/18 දරණ ලිපිනයේ පදිංචිව සිටින බවත්, රැකියාවක් ලෙස කඩයක් පවත්වාගෙන ගිය බවත්, එම ගමේම තමාට අලුතින් නිවසක් සාදා ගෙන ගිය බවත්, එම නිවස සම්පූර්ණ කර නොතිබූ බවත්, නමුත් එම නිවසේ ගරාජය සම්පූර්ණ කර තිබූ බවත්, එම ගරාජ් කාමරයට අඩි 10 ක් පළළ අඩි 12 ක් උස පහළට ඇදීමට හැකි ගේට්ටුවක් සවිකර තිබූ බවත්, 2019.04.21 වන දින පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට දින 15 කට පමණ පෙර උදෑසන තමා තමාගේ වෙළඳසැලෙහි සිටින විට පුද්ගලයෙකු පැමිණ අම්පාර ප්‍රදේශයේ පාවහන් ව්‍යාපාරයක් සිදු කරගෙන යන බව පවසා තමාගෙන් ඒ අවට නිවසක් කුලියට ගැනීමට තිබේදැයි විමසූ බවත්, තමා නිවාස කුලියට නොමැති බව පැවසූ බවත්, ඉන් දවස් 10 කට පමණ පසුව

නැවතත් එම පුද්ගලයා පැමිණි බවත්, ඒ වෙලාවේ ඔහුත් සමඟ කාන්තාවක්ද පැමිණි බවත්, එලෙස පැමිණි ඔහුගේ බිරිඳට දරුවෙකු ලැබීමට සිටින බවත්, ඔවුන් දැනට මරදමුනෙයි ප්‍රදේශයේ පදිංචි වී සිටින බවත්, එම නිවසෙහි බඩු තබා ගැනීමට ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති බැවින් කාමරයක් කුලියට ගැනීම සඳහා සොයන බවට පැවසූ බවත්, තමාගේ අලුතින් සාදන ලද නිවසෙහි ඇති ගරාජ් කාමරය එම තැනැත්තාට මසකට රුපියල් 5000/- ක මුදලකට කුලියට ලබා දුන් බවත්, එම කාමරය ඔහු විසින් කුලියට ලබා ගැනීමෙන් පසුව අලුත් ඉබි යතුරක් දමා ගත් බවත්, ඉන්පසුව තමා ඔහුව නොදුටු බවත්, කුලියට දුන් ගරාජ් කාමරයට කුමන භාණ්ඩ රැගෙන පැමිණියාදැයි තමා නොදන්නා බවත්, දින 10 කට පසුව ඔහු නැවත යතුරු පැදියකින් තමාගේ වෙළඳසැල අසළට පැමිණි බවත්, ඒ අවස්ථාවේදී ඔහුගේ දුරකථන අංකය තමාට ලබා දුන් බවත්, ඉන්පසුව අම්පාරේ යන බව පවසා පිටව ගිය බවටත් සාක්ෂි ලබා දෙන ලදි. පසුව අම්පාර පොලිසියෙන් පැමිණ තමා විසින් ගරාජ් කාමරය කුලියට ලබා දීම සම්බන්ධයෙන් විමර්ශනය කළ බවත්, ඒ අවස්ථාවේදී තමාගේ ගරාජ් කාමරය කුලියට ගත් පුද්ගලයාගේ නම නියාස් ලෙසට තමා දැන ගත් බවත්, තමා විසින් ඔවුන්ට තමාගේ ගරාජ් කාමරය පෙන්වූ බවත්, පොලිස් නිළධාරීන් විසින් එම ගේට්ටුවෙහි ඉබි යතුරු කඩා දමා විවෘත කළ බවත්, පොලිස් නිළධාරින්, යුධ හමුදා ,නාවික හමුදා සහ තවත් ආරක්ෂක අංශ වලට දැනුම් දුන් බවත්, එලෙස පොලිසිය විසින් එම

කාමරය පරීක්ෂා කරන ලද දිනයේ සයින්දමරදු ප්‍රදේශයේ නිවසක බෝම්බයක් පුපුරා ගිය බව තමා දැන ගත් බවත්, පොලිස් නිලධාරීන් විසින් එම ගරාජ් කාමරය විවෘත කිරීමෙන් පසුව ඒ තුළ භාණ්ඩ තොගයක් තිබූ බවත්, ඒවා තමාගේ භාණ්ඩ නොවන බවටත් සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකරුට සංයුක්ත තැටියක අඩංගු කර තිබූ ඡායාරූපයක් පෙන්වා සිටි අතර, එම ඡායාරූපයේ සිටි පුද්ගලයා තමාගේ ගරාජ් කාමරය කුලියට ගත් නියාස් යන පුද්ගලයා ලෙසට හඳුනා ගෙන ඇති අතර,එම ඡායාරූපය පැ.829(A) ලෙසට පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි.

මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා. 2007 මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් යන අය සාක්ෂි දෙමින් තමා, 2019.04.27 වන දින සයින්දමරදු ප්‍රදේශයේ බෝම්බ පිපිරීමක් සම්බන්ධයෙන් අම්පාර අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නිළධාරීන් සමඟ ගොස් එම ස්ථානය පරීක්ෂා කරන ලෙසට අපරාධ වාර්තා කොට්ඨාශයේ අධ්‍යක්ෂකතුමාගෙන් ලද දැනුම් දීම පරිදි සයින්දමරදු ප්‍රදේශයේ නිවසකට ගිය බවත්, එම නිවස බොලිවේරියන් පාර, අංක බී/183 දරණ ලිපිනයේ පිහිටි නිවස බවත්, එම ස්ථානයේ බෝම්බයක් පුපුරා ගොස් තිබූ බවට තමාට නිරීක්ෂණය වූ බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීමේදී එම නිවස තුළ තිබී හිස් පතොරම් කොටස් 05 ක් , උණ්ඩ කොටස් 02 ක් , ජීව උණ්ඩ 02 ක් , පුපුරා ගිය ජංගම දුරකථනයක්, බෝම්බයක් පුපුරා ගිය බවට සැක කෙරෙන සිමෙන්ති පොළවේ වළක්

සහිත ස්ථානයේ තිබූ සිමෙන්ති කොටස් හා යකඩ බෝල 03 ක්, ජෙලට් නයිට් තිබූ හිස් නිල් පැහැති ප්ලාස්ටික් ආවරණය 12 ක් සහ කුඩා පිහියක්, විදුලි බලය සවිකර නොමැති ඩෙටනේටර් 329 ක්, කොළ පැහැති වයර් සවි කරන ලද සර්කිට් 02 ක් අඩංගු ඩෙටනේටර් 27 ක් නිල් පාට ප්ලාස්ටික් ආවරණය සහිත ජෙලට් නයිට් 59 ක් අඩංගුව තිබූ දුඹුරු පැහැති රෙදි බෑගයක් සහ ජෙලට් නයිට් 56 ක් අඩංගු පාර්සලයක්, අංක R58266257 අංක දරණ රු.1000 මුදල් නෝට්ටු සහ රු.5000 මුදල් නෝට්ටු තමාගේ භාරයට ගත් බවය.

මෙම සාක්ෂිකරුගෙන් චූදිතයන් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 2308 වික්‍රමසිංහ මුදියන්සේලාගේ කුමුදු සෙනෙවිරත්න යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා ඇඟිලි සටහන් කාර්යාලයට අනුයුක්තව උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස සේවය කරන බවත්, දැනට වසර 33 ක පමණ කාලයක් එම ආයතනයේ සේවය කරන බවත්, 2019.04.22 වන දින කෙසෙල් වත්ත, ෂරිෆ් මාවත 61/2, දරණ ලිපිනයේ පිහිටි "නස්මියා විලා" නමින් හැඳින්වූ නිවසට ඇඟිලි සටහන් සෙවීමේ පරීක්ෂණයක් සඳහා එදින උදෑසන 8.30 ට පමණ පිටත්වූ බවත්, ඇඟිලි සටහන් පරීක්ෂකවරයෙකු වශයෙන් සොයා ගන්නා ලද ඇඟිලි සටහන් වාර්තා කිරීම සඳහා පොලිස් 296 ලේඛණය එනම්, පොලිස් ඇඟිලි සටහන් පරීක්ෂණ වාර්තාවද රැගෙන ගිය බවත්, තමා එම ස්ථානයට

යන විට උදෑසන 8.30 ට පමණ වූ අතර, තමා යන විටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සහ සොකෝ නිළධාරීන් එහි සිටි බවත්, එම නිවස තාප්පයකින් වට වූ තනි මහල් නිවසක් බවත්, අපරාධ වාර්තා කොට්ඨාශයේ ඡායාරූප ශිල්පි පොලිස් සැරයන් 3612 ජයතිලක නිළධාරියා තමාගේ රාජකාරියට සහාය වූ බවත්, එනම්, තමා විසින් එදින එම නිවසින් සොයා ගන්නා ලද සටහන් ජයතිලක නිළධාරියා විසින් ඡායාරූප ගත කිරීම සිදු කළ බවත් ය. තවද, එදින පැය 10.30 සිට පැය 16.30 දක්වා එම නිවසේ සියළුම ස්ථාන මනාව පරීක්ෂා කළ බවත්, ඇඟිලි සටහන් සොයා ගැනීමට භාවිතා කරනු ලබන පවුඩර් වර්ග තමා විසින් භාවිතා කළ බවත්, එම පරීක්ෂණයේදී පුද්ගලයෙකු හඳුනා ගැනීමට අවශ්‍ය කරන වැටී ලක්ෂණ විද්‍යාමාන වූ **අතුල්** සටහන් 04 ක් සහ ඇඟිලි සටහන් 16 ක් ඇතුළු සටහන් 20 ක් පමණ තමා විසින් සොයා ගත් බවටත් පවසා සිටී. තවද, තමා විසින් එදින සිදු කරන ලද පරීක්ෂණයට අදාළව 2149/2019 දරණ ඇඟිලි සටහන් වාර්තාව සකස් කළ බවට සඳහන් කරමින්, එම වාර්තාව සාක්ෂිකරු විසින් අධිකරණයේදී හඳුනා ගන්නා ලදි. පැමිණිල්ල විසින් එම වාර්තාව පැ.1571 වශයෙන් සළකුණු කර ඇත. එම සටහන් අංක 01 සිට 20 දක්වා අංකනය කළ බවත්, අංක 01 වශයෙන් හඳුනා ගන්නා ලද සටහන අදාළ නිවසෙහි ඉදිරිපස දොරින් ඇතුළු වන විට දකුණු අත පැත්තේ තිබූ පියන් 02 කින් යුත් වීදුරු ජනේලයේ එක ජනේලයක පිට පැත්තේ තිබූ බවත්, එම සටහන් ඡායාරූප ගත කර ගත්

බවටත් පවසා පැ.1561(A) ලෙස ලකුණු කර ඇති ඡායාරූපය එකී ඡායාරූපය බවට අධිකරණයේදී හඳුනා ගන්නා ලදි.

අංක 04 වශයෙන් හඳුනා ගන්නා ලද සටහන සෙලෝටේප් රෝලක් මතු පිට තිබූ බවත්, එම සටහන ඡායාරූප ගත කර ගත් බවත් පවසමින් පැ.1561(D) ලෙස ලකුණු කර ඇති ඡායාරූපය නිරීක්ෂණය කරමින් සාක්ෂිකරු විසින් එම සටහන බවට අධිකරණයේදී හඳුනා ගන්නා ලදි.

අංක 06 සහ 07 වශයෙන් හඳුනා ගන්නා ලද සටහන් එම නිවසේ සවිකර තිබූ අළුත් LED බල්බයක් මත තිබූ බවත්, එම LED බල්බය ගලවා පරීක්ෂා කිරීමේදී ඒ මත ඇගිලි සටහන් 02 ක් තිබූ බවත්, එම සටහන් ඡායාරූප ගත කර ගත් බවටත් පවසමින් පැ.1561(B) පැ.1561(C) ලෙස ලකුණු කර ඇති ඡායාරූප එකී ඡායාරූප ගත කරන ලද සටහන් බවට අධිකරණයේදී හඳුනා ගන්නා ලදි.

අංක 08 වශයෙන් හඳුනා ගන්නා ලද සටහන සාලයේ මැද ජනේලයේ වීදුරු පියනේ ඇතුල් පැත්තේ තිබූ බවත්, එම සටහන් ඡායාරූප ගත කර ගත් බවටත් පවසමින් පැ.1561(E) ලෙස ලකුණු කර ඇති ඡායාරූපය සඳහන් වන්නේ එම සටහන බවට අධිකරණයේදී හඳුනා ගන්නා ලදි.

තමා විසින් එකී රාජකාරිය අවසන් කිරීමෙන් පසුව අදාළ ඡායාරූප ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ බවටද සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් පවසා සිටින ලදි.

මෙම සාක්ෂිකරුගෙන් 1,2,7,8,10,15,18,19 චූදිතයන් වෙනුවෙන් ඔවුන්ගේ නීතීඥ මහතා විසින් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එකී ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටියේ, තමා විසින් අදාළ නිවසේ නිරීක්ෂණය කරන ලද සටහන් අළුත් සටහන් බවට තමාට පෙනී ගිය බවත්, තමාගේ අත්දැකීම අනුව එලෙස ප්‍රකාශ කළ හැකි බවය. කෙසේ වුවද, කුමන පදනමක් මත එවැනි නිගමනයකට එළඹියේද යන්න පිළිබඳව මෙම සාක්ෂිකරු විසින් පැහැදිලි කිරීමක් සිදුකර නොමැති බවට අප අවධාරණය කර සිටිමු.

තවද, මෙම සාක්ෂිකරු විසින් සෙලෝටේප් රෝල සහ LED බල්බ මත නිරීක්ෂණය කර තිබෙන ඇඟිලි සළකුණු බලෙන් උත්පාදනය කළ ඇඟිලි සළකුණු බවට කරන ලද යෝජනාවද සාක්ෂිකරු විසින් ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1633 දිසානායක මුදියන්සේලාගේ නාලනී කුමාරි දිසානායක යන අය සාක්ෂි ලබා දෙමින්, තමා 2019 වර්ෂය වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාණිජ අපරාධ විමර්ශන අංශ 3 හි ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ බවත්, 2019.04.21 වන දින පාස්කු

ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව එදින කොළඹ කිංග්ස්බරි හෝටලයට බෝම්බකරු රැගෙන ගිය වාහනය යැයි සැක කළ CDB 8510 දරණ වාහනය සම්බන්ධයෙන් සොයා බලන ලෙසට කාන්තා පොලිස් අධිකාරි දර්ශිකා කුමාරි මහත්මිය තමාට උපදෙස් දුන් බවත්, ඒ අනුව තමා එම වාහනයේ අයිතිකාරිය වන අංක 58/1ඒ ඉබ්‍රාහිම් මාවත, තොටවත්ත, පානදුර ලිපිනයේ පදිංචි ෆාතිමා නස්රා යන අයව හමු වූ බවත්, අදාළ වාහනයේ රියදුරු ලෙස ඇයගේ ස්වාමිපුරුෂයා කටයුතු කරන බවත්, ඔහුව විශේෂ කාර්ය බලකායේ පොලිස් පරීක්ෂක දිසානායක යන අය කැඳවාගෙන ගිය බවට ඇයගෙන් දැන ගත් බවත්, ඉන්පසුව පො.ප. දිසානායක යන එම නිළධාරියා සමග සම්බන්ධ වී ඒ පිළිබඳව විමසූ බවත්, එම නිළධාරියා ඒ වන විටත් පානදුර පරත්ත පාරේ පිහිටි නිවසක පරීක්ෂණ කටයුතු කරමින් සිටි බවට දැන ගත් බවත්, ඒ අනුව තමා වහාම පානදුර පරත්ත පාරේ පිහිටි එම නිවසට ගමන් කළ බවත්, 'නස්මියා විලා' නමින් හඳුන්වන එම නිවස පානදුර, පරත්ත පාර**,** අංක 2/61 දරණ ලිපිනයේ පිහිටා තිබූ බවත්, තමා එම ස්ථානයට යන විටත් විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් සහ පොලිස් නිළධාරීන් විශාල පිරිසක් පැමිණ සිටි බවත්, විශේෂ කාර්ය බලකා නිළධාරීන් යම් පුපුරණ ද්‍රව්‍යයක් තිබෙනවාදැයි සෝදිසි කරමින් සිටි බවත්, ඒ අතරතුරදී ලංකාවේ විවිධ ප්‍රදේශ වල බෝම්බ පිපිරීම් සිදු වූ බවට වාර්තා වූ බවත්, තමා පැයක පමණ කාලයක් එම ස්ථානයේ රැඳී සිට නැවතත් අදාළ වාහනයේ

හිමිකරුගේ නිවස වන අංක 58/1ඒ ඉබ්‍රාහිම් මාවත, තොටවත්ත, පානදුර යන ලිපිනයේ පිහිටි අදාළ වාහනයේ හිමිකාරියගේ නිවසට පැමිණ ඇයව අත්අඩංගුවට ගත් බවටත් සාක්ෂි ලබා දී ඇත. තවදුරටත් සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකාරිය කියා සිටියේ, පානදුර පරත්ත පාරේ අංක 2/61 දරණ ලිපිනයේ පිහිටි 'නස්මියා විලා' නමින් හඳුන්වන නිවස පරීක්ෂා කරන ලෙසට තමාට උපදෙස් ලැබුණු බවත්, එම උපදෙස් මත තමා එම ස්ථානයට 2019.04.22 වන දින පිටත්ව ගිය බවත්, තමා යන විටත් විවිධ අංශයන්ට අයත් විමර්ශන නිළධාරීන් විශාල පිරිසක් එම ස්ථානයේ සිටි බවත්, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් පැමිණි නිළධාරීන් සහ රජයේ රස පරීක්ෂක වැලිඅංග මහතාත් ඒ අතර සිටි බවත්, ඊට අමතරව සොකෝ නිළධාරීන් විසින්ද එම නිවස පරීක්ෂාවට ලක් කරමින් සිටි බවත්, **තමාට ලැබී තිබූ උපදෙස් පරිදි තමාද එම ස්ථානය පරීක්ෂා කර භාණ්ඩ 40 ක් පමණ තමාගේ භාරයට ගත් බවත්, ඒ අතර වාහන අංක තහඩු 03 ක්, වයර් කනෙක්ටර්, බැටරි 10 ක් අඩංගු පෙට්ටියක්, බෝම්බයක ආකෘතිය ඇඳ තිබූ කොපි පොතක්, බැටරි කීපයක්, වයර් කනෙක්ටර්, කුඩා සුදු බල්බ් විශාල ප්‍රමාණයක්, නිල් සහ කළු පැහැති නූල් කොටසක්, වයර් කෝඩ්, අගල් 08 ක් පමණ දිග ප්ලාස්ටික් බට කැබැල්ලක්, බයිසිකල් බෝල බහා තිබූ හිස් පැකට් අඩංගු කාඩ් බෝඩ් පෙට්ටියක්, කීල්ස් ආයතනයෙන් සහ 'New Look Al Haramain' ආයතනයෙන් නිකුත් කරන ලද බිල් පත්, පිළිස්සී ගිය ෆෝන් කොටස් 03 ක්, තඹ තහඩු යන**

භාණ්ඩද තිබූ බවටත් සාක්ෂිකාරිය සඳහන් කර ඇත. තවද, තමා විසින් එම ස්ථානයේ තිබී සොයා ගන්නා ලද එස්ලෝන් වර්ගයේ ප්ලාස්ටික් බට කැබැල්ල පරීක්ෂා කිරීමේදී යම් දෙයක් තැවරී තිබූ බවට නිරීක්ෂණය වූ බවත්, ඒ සම්බන්ධව වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම සඳහා එම භාණ්ඩ ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාට යොමු කිරීමට කටයුතු කළ බවටත් සාක්ෂිකාරිය පවසා ඇත.

මෙම සාක්ෂිකාරිය තමා විසින් සොයා ගන්නා ලද භාණ්ඩ අධිකරණයේදී හඳුනා ගෙන ඇත. තවද, 'New Look Al Haramain' නමැති වෙළඳසැලෙන් ලබා ගෙන ඇති බිල්පත් පරීක්ෂා කර මෙම සාක්ෂිකාරිය කියා සිටියේ, එම බිල්පත් නිකුත් කරන ලද වෙළඳසැලට ගොස් තමා විසින් ඒ සම්බන්ධව විමර්ශන කළ බවත්, ඒ අනුව එම වෙළඳසැලේ තිබූ පරිගණක පද්ධතියෙන් නිකුත් කර තිබූ එම බිල්පතේ පිටපත පරීක්ෂා කළ බවත්, එම බිල්පතට අනුව 'ෂෝල් 08 ක්' මිළදී ගෙන ඇති බවට දැන ගත් බවත්, එකී බිල්පත් අනුව එම 'ෂෝල් 08' 2019.04.18 වන දින මිළදී ගෙන ඇති බවත් පවසා සිටී. තවද, මෙම සාක්ෂිකාරියට CCTV දර්ශන වලින් ඡායාරූපයක් පෙන්වා සිටි අතර, එම ඡායාරූප පරීක්ෂා කරමින් සාක්ෂිකාරිය කියා සිටියේ, එම ඡායාරූපයේ දිස්වන ස්ථානය 'New Look Al Haramain' යන වෙළඳසැලට ඇතුල් වන කොටස බවත්, එම ඡායාරූපයේ පුද්ගලයින් දෙදෙනෙක් සිටින බවත්, ඒ දෙදෙනා කිංග්ස්බරි හෝටලයේ මාරාගෙන මැරුන බෝම්බකරු වූ මුබාරක් යන අය සහ

කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරුණ බෝම්බකරු වූ හස්තූන් යන අය බවටද සාක්ෂිකාරිය විසින් පවසා සිටින ලදි. වැඩිදුර පරීක්ෂණය සඳහා එම බිල්පත් අනුව මිලදී ගෙන ඇති වර්ගයේම ෂෝල් 01 ක් එම වෙළඳ සැලෙන් ලබා ගත් බවත්, එය කළු පසුබිමේ සුදු පැහැයෙන් කොටු සහිත ෂෝල් එකක් තමා විසින් ලබා ගත් බවත් පවසා එම වෙළඳසැලෙන් ලබා ගන්නා ලද අදාළ ෂෝල් එක සාක්ෂිකාරිය අධිකරණයේ හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එම නඩු භාණ්ඩ පැ.1764 වශයෙන් ලකුණු කර තිබේ. තවද, වැඩිදුර විමර්ශනයේදී මෙම ෂෝල් එකට සමාන ෂෝල් එකක් පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර දින දිවුරුම් ගැනීමේදී බෝම්බකරුවන් විසින් තමාගේ මුහුණු ආවරණය කර ගැනීමට භාවිතා කරන ලද හිස් ආවරණයට සමාන එකක් භාවිතා කර ඇති බවට අනාවරණය වූ බවට මෙම සාක්ෂිකාරිය විසින් පවසා සිටින ලද අතර, සාක්ෂිකාරිය හට පැ.163 දරණ සැනෙලි දාවකය විවෘත කර පැ.163(B) ලෙස ලකුණු කර ඇති දර්ශන පෙළක් පෙන්වීමේදී, එම දර්ශන පෙළේ පුද්ගලයන් මුහුණ වසාගෙන සිටීමට භාවිතා කර තිබෙන හිස් ආවරණය තමා විසින් අධිකරණයේ හඳුනා ගන්නා ලද පැ.1764 දරණ නඩු භාණ්ඩයට සමාන බවටද, එම දර්ශන වල සිටින පුද්ගලයන්ගෙන් කතා කරමින් සිටින පුද්ගලයන් හැර අනෙක් පුද්ගලයන් ඇස් දෙක පමණක් පෙනෙන සේ මුහුණ සහ හිස ආවරණය කිරීමට

පැ.1764 දරණ නඩු භාණ්ඩයට සමාන ෂෝල් එකක් භාවිතා කර ඇති බවට දර්ශනය වන බවද මෙම සාක්ෂිකාරිය විසින් පවසා සිටින ලදි.

තවද, එම නිවසේ Decathlon ආයතනය මඟින් භාණ්ඩ මිළදී ගත් බිල්පතක් හමු වූ බවත්, ඒ සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා බත්තරමුල්ල, ප්‍රදේශයේ පිහිටි එම අලෙවිසැලට ගොස් එහි කළමණාකරු සමීර ලලිතප්‍රිය මුණසිංහ යන අය හමු වූ බවත්, ඔහු විසින් ආයතනයේ පරිගණක පරීක්ෂා කර අදාළ බිල්පතට අනුව මිළදී ගෙන ඇති භාණ්ඩ සම්බන්ධයෙන් පරීක්ෂා කළ බවත්, එලෙස පරීක්ෂා කිරීමේදී මුබාරක් යන අයෙකු විසින් අවස්ථා 02 කදී භාණ්ඩ මිළදී ගෙන තිබෙන බවත්, එනම් 2019.04.11 වන දින බිල්පත් අංක 02 කින් එනම්, 1169 සහ 1170 දරණ බිල්පත් වලින් බැක්පැක් 10 ක් මිළදී ගෙන තිබෙන බවට අනාවරණය වූ බවත් සාක්ෂිකරු පවසා සිටින ලදි. නැවත 2019.04.18 වන දින බිල් පත් අංක 1891 යටතේ බැක්පැක්, කලිසම්, මේස්, අව් කණ්නාඩි, ටීෂර්ට්, තොප්පි, සපත්තු සහ සෙල්ලම් බෝල වැනි භාණ්ඩ 36 ක් මිළදී ගෙන තිබෙන බවත්, තවද, එම බිල්පත් වල මුබාරක් යන තැනැත්තාගේ දුරකතන අංකය ලෙසට 0779207730 ලබා දී ඇති බවටත් සාක්ෂිකාරිය පවසා ඇත තවද, තමා විසින් 'නස්මියා විලා' නමින් හැඳින්වූ එම නිවස එහි අයිතිකරු වන අබ්දුල් සතාර් මොහොමඩ් ඉල්හාම් යන අය විසින් කුලියට ලබා දීම සම්බන්ධයෙන්ද විමර්ශන සිදු කළ බවටත් සාක්ෂිකාරිය කියා සිටී. එම නිවස කුලියට දීම සම්බන්ධයෙන් සහ එම

නිවසින් නැගෙනහිර ප්‍රදේශයට භාණ්ඩ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන්ද තමා විසින් විමර්ශන සිදු කළ බවට සාක්ෂිකාරිය විසින් සාක්ෂි ලබා දී ඇත. තවද, නැගෙනහිර පළාතට භාණ්ඩ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පියවර ගත් බවත්, ඒ අනුව පානදුර, පරත්ත පාර නිවසේ සිට නැගෙනහිර ප්‍ර දේශයට භාණ්ඩ ප්‍රවාහනය කරන ලද රියදුරු සමන් කුමාර යන අයත් සමඟ ඔහුගේ මඟ පෙන්වීම මත භාණ්ඩ රැගෙන ගිය බවට සඳහන් කළ නිවෙස් වලට ගිය බවත්, ඉන් එක් නිවසක් සයින්දමරදු ප්‍රදේශයේ පිහිටි නිවසක් වන අතර, තම කණ්ඩායම එම නිවසට ගිය දිනට පෙර දින එහි බෝම්බ පිපිරීමක්ද සිදු වී තිබූ බවත්, එම නිවසින් භාණ්ඩ කිසිවක් තමාගේ භාරයට නොගත් බවත්, ඉන්පසු සෙන්නල් ග්‍රාමය ප්‍රදේශයේ පිහිටි අනිත් නිවසට පැමිණි බවත්, එම ස්ථානය ඉදිරිපිට බයිසිකල් බෝල පෙට්ටි කීපයක් විසි වී තිබූ බවට තමා නිරීක්ෂණය කළ බවත්, එම කාඩ්බෝඩ් පෙට්ටි පානදුර, පරත්ත පාර නිවසේ තමා විසින් සොයා ගන්නා ලද කාඩ්බෝඩ් පෙට්ටි වලට සමාන ඒවා බැවින් ඉදිරි විමර්ශන කටයුතු සඳහා එම කාඩ්බෝඩ් පෙට්ටි තමාගේ භාරයට ග/ත් බවත්, එම කාඩ්බේඩ් පෙට්ටි වල ස්ටීල් බෝඩ් ලෙස ලියවී තිබූ බවටත් සාක්ෂිකාරිය විසින් සඳහන් කර සිටින ලදි. තමා විසින් පානදුර, පරත්ත පාර නිවසින් සහ සෙන්නල් ග්‍රාමය යන ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද භාණ්ඩ සමන්තුරේ මහේස්ත්‍රාත් අධිකරණයේ

බී/4596/19 අංක දරණ නඩුව මඟින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කළ බවද සාක්ෂිකාරිය පවසා සිටින ලදි.

මෙම සාක්ෂිකාරියගෙන් 05 වන චූදිත විසින් හරස් ප්‍රශ්න අසන ලද අතර, හරස් ප්‍රශ්න වලදී මෙම සාක්ෂිකාරිය විසින් පානදුර පරත්ත පාර නිවසින් සොයා ගන්නා ලද අඟල් 08 දිග බවට සඳහන් කර තිබෙන එස්ලෝන් බටය සාක්ෂිකාරියට පෙන්වා අඩි කෝදුවක්ද ලබා දී එම බටය මැන එහි නිවැරදි දිග ප්‍රමාණය කුමක්දැයි පවසන ලෙසට ප්‍රශ්න කළ අතර, එහිදී සාක්ෂිකාරිය එම බටය මැන එය අඟල් 13 ක් දිගැති බටයක් බවට පවසා ඇත. සාක්ෂිකාරිය විසින් අධිකරණයේ පැ.1764 ලෙස හඳුනා ගන්නා ලද ෂෝල් එක අපරාධ ස්ථානයකින් සොයා ගන්නා ලද භාණ්ඩයක් නොවන බවත්, තමා විසින් වෙළඳසැලකින් සාම්පලයක් වශයෙන් ලබා ගන්නා ලද භාණ්ඩ බවටත් පවසා ඇත.

මෙම සාක්ෂිකාරියගෙන් පැමිණිල්ල විසින් නැවත ප්‍රශ්න අසා ඇති අතර, එහිදී ඇය විසින් පානදුර, පරත්ත පාරෙන් සොයා ගන්නා ලද එස්ලෝන් බට සම්බන්ධයෙන් ඇයගෙන් ප්‍රශ්න කළ අතර, සාක්ෂිකාරිය කියා සිටියේ සොකෝ නිළධාරීන් විසින් සොයා ගන්නා ලද එකී නඩු භාණ්ඩ 2019.04.22 වන දින තමාගේ භාරයට ගත් බවයි. තමා විසින් දිග මනිනු ලබන උපකරණ කිසිවක් එම ස්ථානයට රැගෙන නොගිය

බවත්, කෙසේ වුවද, මෙම එස්ලෝන් බටයෙන් පැ.15 ලෙස එම බටය රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යවන අවස්ථාවේදී සළකුණු කිරීමක් කර තිබෙන බවත්, එලෙස රස පරීක්ෂකවරයාට යවන ලද වාර්තාවේ අදාළ බටයේ දිග අඟල් 13.2 ලෙස බවට සඳහන් කර තිබෙන බවත්, එම බටයේ යම් ස්ථානයක වටේට ලකුණු කිරීමක් සිදු කර තිබෙන බවත්, එම ලකුණු කිරීම සිදු කර තිබෙන ස්ථානයේ සිට එක් කෙළවරක් දක්වා වූ දිග අඟල් 08 ක් බවටත් සාක්ෂිකාරිය පවසා ඇත.

<u>පානදුර පරත්ත පාර, ෂරිෆ් මාවත, අංක 61/2 දරණ</u>

<u>ස්ථානයේ 'නස්මියා විලා' නැමැති නිවසේ පවත්වාගෙන ගොස්</u>

<u>ඇති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ</u>

<u>නිගමනය</u>

මෙම නඩුවේ පානදුර,පරත්ත පාර, ෂරිෆ් මාවත, අංක 61/2 දරණ ස්ථානයේ පිහිටා ඇති 'නස්මියා විලා' යනුවෙන් හැඳින්වූ නිවස සම්බන්ධව එම නිවසෙහි හිමිකරු වූ පැ.සා.2244 අබ්දුල් සත්තාර් මොහොමඩ් ඉල්හාම් යන අය සහ ඔහුගේ බිරිඳ පැ.සා. 2257 මොහොමඩ් මස්තූර් ෆාතිහා ෆහරියා යන අය පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දී ඇත. චූදිතයන් එම සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, ඔවුන්ගේ සාක්ෂිය චූදිතයන් විසින් අභියෝගයට ලක් කරද නොමැත.

ඔවුන්ගේ සාක්ෂි අනුව අධිකරණයට පෙනී යන්නේ 'නස්මියා විලා' නමින් හැඳින්වූ පානදුර, පරත්ත පාරේ පිහිටි එම නිවස එකී අයිතිකරුගෙන් අංක 138/බී, අලුත් යොවුන් වීදිය, කොළඹ 12 දරණ ලිපිනයේ පදිංචි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයකු 2019.02.13 දින සිට අවුරුද්දක කාලයක් සඳහා කුලියට ලබා ගෙන ඇත. එසේ කුලියට ලබා ගත් අවස්ථාවේදී ප්‍රසිද්ධ නොතාරිස්වරයා ඉදිරියේ සාදන ලද මෙම නඩුවේ පැ.833 ලෙස ලකුණු කරන ලද බදු ඔප්පුවේ එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ සාක්ෂිකරු ලෙස මෙම නඩුවේ 06 වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහෙමඩ් රිස්කාන් යන අය අත්සන් කර ඇත. කෙසේ නමුත් 06 වන චූදිත ඔහුගේ සත්‍ය අනන්‍යතාවය සඟවා ඔහු අංක 138/බී, අලුත් යොවුන් වීදිය, කොළඹ 12 යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 751540811V හිමි මොහොමඩ් අමීර් මොහොමඩ් රුස්මි යන අය බවට තොරතුරු ලබා දී ඇත. මෙම නිවස කුලියට ගත් එම මුබාරක් යන තැනැත්තා පැ.834 ලෙස පැමිණිල්ලෙන් ලකුණු කරන ලද ඡායාරූපයේ සිටින පුද්ගලයා බවටත්, ඔහු ජාතික හැඳුනුම්පත් අංක 873340312V හිමි පුද්ගලයා බවටත් සාක්ෂි මඟින් අනාවරණය වී ඇත. මෙම තැනැත්තාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ පිළිගැනීම් ලකුණු කර ඇති අතර, ඒ මඟින් ඔහු කොටුව කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් පුද්ගලයා

බවට කරුණු අනාවරණය වී ඇත. මුබාරක් විසින් අදාළ නිවස කුලියට ගැනීමෙන් පසු එම නිවසේ 06 වෙනි වූදිත නැවතී සිටි බව පෙනී යයි.

2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව මෙම නිවස විමර්ශන නිළධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී ඇති අතර, පැ.සා.1605 පොලිස් පරීක්ෂක නිශාන්ත රුවන් කුමාර සහ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නාලනි කුමාරි දිසානායක යන අයවළුන්ගේ සාක්ෂි අනුව මෙම නිවසින් නඩු භාණ්ඩ කීපයක් එනම්, විවිධ ප්‍රමාණයේ ස්විච්, වයර්, බැටරි, PVC බට, මල්ටිබෝන්ඩ් ලෙස සඳහන් වන ලෝහ කෑනය, LED බල්බ් තොගයක්, Calcium Hypochlorite වශයෙන් සඳහන් බැරලයක් වැනි දේවල් සොයා ගෙන ඇති අතර, එකී භාණ්ඩ එම නිවස කුලියට ගැනීමෙන් පසුව එම නිවසට රැගෙන එන ලද භාණ්ඩ බවට පෙනී යයි. එසේම එම නිවසේ තිබී K&H Daio steel ball mfg. Co. Ltd යනුවෙන් සටහන්ව ඇති පොලිතින් බෑග් විශාල ප්‍රමාණයක්ද, Decathlon සන්නාමය සහිත බෑගයක්ද සොයා ගෙන ඇත. මෙම නිවසින් සොයා ගන්නා ලද PVC බට කැබැල්ලක් ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ පරීක්ෂාවට ලක් වී ඇති අතර, එම භාණ්ඩ මත වෝටර් ජෙල් කුරු වල අඩංගු පුපුරණ ද්‍රව්‍යයට සමාන ද්‍රව්‍යයක්, එනම්, ඇමෝනියම් නයිට්‍රේට් යන පුපුරණ ද්‍රව්‍යයේ ශේෂද හඳුනා ගෙන ඇත. අදාළ නිවසින් සොයා ගන්නා ලද ඉහත සඳහන් ද්‍රව්‍ය එකී නිවස මුබාරක් යන අය විසින් කුලියට

ගැනීමෙන් පසුව එහි නැවතී සිටි පුද්ගලයන්ගේ පරිහරණය සඳහා ගෙන එන ලද භාණ්ඩ බවට පෙනී යයි.

තවද, මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා. 2254 සමන් කුමාර යන අයගේ සාක්ෂිය අනුව 2019.04.20 වන දින මෙම නිවසේ සිට භාණ්ඩ තොගයක් නැගෙනහිර ප්‍රදේශයට එනම්, සයින්දමරදු බොලිවේරියන් ගම්මානයේ නිවසකට සහ කල්මුණේ සෙන්නල් ග්‍රාම ප්‍රදේශයේ පිහිටි නිවසකට රැගෙන ගොස් ඇති අතර, එම භාණ්ඩ පරත්ත පාර නිවසින් පැ.සා. 2254 සමන් කුමාර යන සාක්ෂිකරුගේ වාහනයට පටවා ගැනීමේදී පෙට්ටියක් තුළ තිබී ලෝහ බෝල එනම්, බයිසිකල් බෝල වැටුණු බවට සඳහන් කර ඇත. 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දවස් කීපයකට පසුව ඉහත සඳහන් සයින්දමරදු බොලිවේරියන් ග්‍රාමයේ පිහිටි නිවසින් විශාල බෝම්බ පිපිරීමක් සිදුවූ බවට මෙම නඩුවේ ඉදිරිපත්කර තිබෙන සාක්ෂි මඟින් අනාවරණය වී ඇත. තවද, 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඉහත සඳහන් කල්මුණේ සෙන්නල් ග්‍රාම ප්‍රදේශයේ පිහිටි නිවසේ තිබී නයිට්‍රික් ඇසිඩ් බූලි, සල්ෆියුරික් ඇසිඩ් බූලි, යූරියා, යකඩ බෝල, ඩෙටනේටර්ස්, ස්විච්, පරිපථ, වයර් රෝල් ඇතුළු විශාල භාණ්ඩ තොගයක් සොයා ගෙන ඇති අතර, එම භාණ්ඩ අතරින් පාස්කු ඉරු දින සිදුවූ බෝම්බ ප්‍රහාර සඳහා භාවිතා කරන ලද පිපුරුම් උපකරණ වල අඩංගුව තිබූ ද්‍රව්‍ය වලට සමාන ද්‍රව්‍ය තිබූ බවටද සාක්ෂි මඟින් හෙළි වී ඇත. තවද, පැ.සා. 2007 මඩකලපුව

අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පොලිස් පරීක්ෂක ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් යන අයගේ සාක්ෂිය අනුව 2019.04.27 වන දින මෙම නිවසේ විශාල බෝම්බ පිපිරීමක් සිදුවී ඇති බවත්, ඉන්පසු එම නිවස පරීක්ෂා කිරීමේදී එම නිවසේ තිබී ජෙලටි නයිට් තිබූ හිස් නිල් පැහැති ප්ලාස්ටික් ආවරණය 12 ක් සහ කුඩා පිහියක්, විදුලි බලය සවිකර නොමැති ඩෙටනේටර් 329 ක්, කොළ පැහැති වයර් සවි කරන ලද සර්කිට් 02 ක් අඩංගු ඩෙටනේටර් 27 ක් නිල් පාට ප්ලාස්ටික් ආවරණය සහිත ජෙලටි නයිට් 59 ක් අඩංගුව තිබූ දුඹුරු පැහැති රෙදි බෑගයක් සහ ජෙලටි නයිට් 56 ක් අඩංගු පාර්සලයක්ද සොයා ගෙන ඇත.

ඉහත සාක්ෂි පරීක්ෂා කිරීමේදී මෙම පානදුර, පරත්ත පාරෙහි පිහිටි නිවස මුබාරක් යන අය විසින් කුලියට ගැනීමෙන් පසුව යම් දෙයක් සාදා ගැනීම සඳහා බයිසිකල් බෝල විශාල තොගයක් සහ පුපුරණ ද්‍රව්‍ය එම නිවසට රැගෙනවිත් තිබෙන බවට අනුමාන කළ හැකිය.

2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දිනකට පසුව එනම්, 2019.04.22 වන දින කොළඹ ඇඟිලි සටහන් කාර්යාලයේ නිළධාරීන් විසින් මෙම නිවස පරීක්ෂා කර ඇත. එහිදී මෙම නිවස තුළ තිබී සටහන් කීපයක් සොයා ගෙන ඇති අතර, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් පැ.සා.2307 සේනක කළුආරච්චි යන අයගේ සාක්ෂියට අනුව එම සටහන් අතරින් මෙම නඩුවේ 06 වන චූදිත වන මොහොමඩ් අන්වර්

මොහොමඩ් රිස්කාන් සහ අයගේ සහ 07 වන චූදිත වන මොහොමඩ් මන්ෂූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ සටහන්ද සොයා ගෙන ඇත. එසේම මරාගෙන මැරුණ ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමත්තාගේ දියණිය වන රුදෙයිනා යන දැරියගේ අතුල් සටහනක් ද මෙම නිවස තුල තිබී සොයාගෙන තිබීම තුළින් පෙනී යන්නේ එම නිවසේ සහරන් නැමැත්තා ඔහුගේ කුඩා දියණියද සමග සිට ඇති බවය.

ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂා කිරීමේදී , මෙම නිවස මුබාරක් යන අය සහ මෙම නඩුවේ 06 වන චූදිත විසින් 2019 පෙබරවාරි මාසයේදී කුලී පදනම මත ලබා ගෙන ඇති බව පෙනී යයි. 2019.04.20 වන දින එනම්, පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට පෙර දින මෙම නිවසින් විශාල භාණ්ඩ තොගයක් කල්මුණේ, සෙන්නල් ගම්මානයේ පිහිටි නිවසකට සහ සයින්දමරදු බොලිවේරියන් ගම්මානයේ පිහිටි නිවසකට රැගෙන ගොස් ඇත. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දින කීපයකට පසුව සයින්දමරදු බොලිවේරියන් ග්‍රාමයේ පිහිටි එම නිවසේ විශාල බෝම්බ පිපිරීමක් සිදු වී ඇති අතර, එසේම කල්මුණේ, සෙන්නල් ගම්මානයේ පිහිටි නිවසේ තිබී විශාල භාණ්ඩ තොගයක් සොයා ගෙන ඇති අතර, එම භාණ්ඩ අතර පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට භාවිතා කරන ලද පිපුරුම් ද්‍රව්‍ය අඩංගු භාණ්ඩද සොයා ගෙන ඇත. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට යොදා ගන්නා ලද පිපිරුම් උපකරණ නිෂ්පාදනය කිරීමට ලෝහ බෝල භාවිතා කර ඇති අතර , එම ලෝහ බෝල ඇසුරුම් කිරීමට භාවිතා කර තිබෙන

බවට අනුමාන කළ හැකි K&H Daio steel ball mfg. Co. Ltd යනුවෙන් සටහන්ව ඇති හිස් පොලිතින් බෑග් විශාල ප්‍රමාණයක් මෙම පරත්ත පාර පිහිටි නිවසින් සොයා ගෙන ඇත. තවද, වෝටර් ජෙල් කූරු වල අඩංගු පුපුරණ ද්‍රව්‍ය වලට සමාන පුපුරණ ද්‍රව්‍යයක් වන ඇමෝනියම් නයිට්‍රේට් ශේෂ හඳුනා ගන්නා ලද PVC බට කැබැල්ලක්ද මෙම නිවසින් සොයා ගෙන ඇත. මෙම සාක්ෂි තුළින් පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට භාවිතා කර ඇති පිපුරුම් උපක්‍රම සඳහා යොදා ගෙන ඇති ද්‍රව්‍ය වලට සමාන ද්‍රව්‍යයන් පරත්ත පාරේ පිහිටි මෙම නිවසින් සොයා ඇත. ඒ අනුව මෙම නිවස මෙම නඩුවේ 06 වන චූදිත, 07 වන චූදිත සහ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී බෝම්බයක් පුපුරුවාගෙන මිය ගිය මුබාරක් යන අය විසින් පරිහරණය කළ බවට හෝ යම් පුද්ගලයෙකු විසින් එලෙස පරිහරණය කිරීමට අනුබල දී ඇති බවට හෝ කවුරු හෝ පුද්ගලයෙකු විසින් එලෙස පරිහරණය කළ බවට දැන සිට ඇති බවට අනුමාන කළ හැකිය. ඒ අනුව 2019-4-21 දින සිදු වූ පාස්කු ප්‍රහාරයන් හා හා සම්බන්ධ මෝම්බ පිපිරීම් සිදුකර ඇති ස්වයංඝාතක බෝම්බ කරුවන් මෙම අරක්ෂිත නිවසේ සිට ඇති බව පෙනී යයි. තව ද මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා. 2254 සමන් කුමාර යන අයගේ සාක්ෂිය අනුව 2019.04.20 වන දින මෙම නිවසේ සිට භාණ්ඩ තොගයක් නැගෙනහිර ප්‍රදේශයට එනම්, සයින්දමරදු බොලිවේරියන් ගම්මානයේ නිවසකට සහ කල්මුණේ සෙන්නල් ග්‍රාම ප්‍රදේශයේ පිහිටි නිවසකට රැගෙන ගොස් ඇති පසුබිම තුල

මෙම නිවසේ බෝම්බ සෑදීම මෙන්ම මෙම නිවසේ සිට බෝම්බ සෑදීමට භාවිතා කර ඇති රසායන ද්‍රව්‍ය ආදිය ද ප්‍රවහනය කර ඇති බව ද යුක්ති සහගතව අපහට නිගමනය කල හැකිය.

<u>දළුවකොටුව රිදී වැලි පාරේ පිහිටි නිවසක පවත්වාගෙන ගිය</u>

<u>ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2289 වන්නිආරච්චිගේ නන්දික සම්පත් අනුරාග යන අය සාක්ෂි දෙමින් තමාගේ වැඩිමහල් සහෝදර වන්නිආරච්චිගේ නිලංක ඉන්ද්‍රජිත් ප්‍රසන්න යන අය දැනට වසර 25 කට වැඩි කාලයක් විදේශගතව සිටින අතර ඔහුට අයත් නිවසක් කොච්චිකඩේ, දළුවාකොටුව, රීදිවැලි පාරේ, අංක 394, දරණ ස්ථානයේ තිබෙන බවත්, එය පර්චස් 24ක ඉඩමක් තුළ සම්පූර්ණ ඉඩම වටා තාප්පයකින් ආවරණය කරන ලද තට්ටු 2කින් යුක්ත නිවසක් බවටත් කියා සිටින ලදී. එය කුලියට දීම සඳහා දැන්වීම් පළකර තිබූ අතර, ඒ සඳහා තමාට ඇටර්නි බලපත්‍රයක් මගින් බලය පවරා තිබූ බවද කියා සිටින ලදී. 2017 වසරේ අග භාගයේ අන්තර්ජාල දැන්වීමක් අනුව එම නිවස කුලියට ගැනීම සඳහා මුස්ලිම් ජාතිකයන් තිදෙනෙකු පැමිණි අතර මසකට රුපියල් 75,000ක මුදලකට පූඩ් නියුමන් යන නීතීඥවරයා ඉදිරියේ සකස් කරන ලද බදු ඔප්පුවක් මත එම දේපල එම පුද්ගලයන්ට කුලියට ලබා දුන් බව කියා සිටිමින් අංක

7598 දරණ ඇටර්නි බලපත්‍රය පැ.837 වශයෙන් ද අංක 8462 දරන බදු ඔප්පුව පැ.838 වශයෙන් ද ඔහු විසින් හඳුනාගනිමින් සලකුණු කරන ලදී.

මෙම පරිශ්‍රයේ බදු ගැනුම්කරු වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 940462916V දරන අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අය අත්සන් තබමින් වර්ෂ 2017-10-10 දින සිට 2018-01-09 දින දක්වා එම නිවස බදු ගත් බව කියා සිටින ලදී. එසේම එහි සාක්ෂිකරුවන් වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 730784724V දරණ අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි සහ ජාතික හැඳුනුම්පත් අංක 873340312V දරණ ජාතික හැඳුනුම්පත් අංක හිමි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයද අත්සන් කළ බව කියා සිටින ලද අතර, එකී අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි යනුවෙන් හඳුන්වන තැනැත්තා විවෘත අධිකරණයේ සිටින 10 වන චූදිත බවට සාක්ෂි කූඩුවේ සිට හඳුනාගන්නා ලදී. බදු ගැනුම්කරු ලෙස අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අය මේ වන විට මියගොස් ඇති බවත් සඳහන් කරන ලද සාක්ෂිකරු පැ.56(2)(A) දරණ ඡායාරූපය පරීක්ෂා කල බලා එම පුද්ගලයා එහි සිටින බවත්, එම ඡායාරූපයේ පැ.56(2)(A) ලෙස සලකුණු කර ඇති පුද්ගලයා තමාගේ නිවස බදු ගන්නා අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් බවට හඳුනා ගන්නා ලදී. ඉන් අනතුරුව සාක්ෂිකරුට ඒ වන විටත් පැ.834 වර්ණ ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එම ඡායාරූපයේ සිටින පුද්ගලයා ඉහත නම් සඳහන් අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් යන අය සමග නිවස බදු ගැනීමට පැමිණි සහ

සාක්ෂිකරුවෙකු වශයෙන් අත්සන් කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් බවටද හඳුනා ගන්නා ලදී. මෙම පැ.833 දරණ බදු ඔප්පුව 2018 ජනවාරි 09 වන දිනෙන් අවසන් වූ අතර ඉන් අනතුරුව තවත් මාස 03ක කාලයක් සඳහා තමා ඉහත පැ.56(2)(A) හඳුනාගත් අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් අත්සන් තබා අංක 8671 දරණ බදු ඔප්පුව අත්සන් කල බව කියා සිටිමින් එම ඔප්පුව පැ.839 වශයෙන් පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී.

එසේම එම ඔප්පුවට සාක්ෂි වශයෙන් තමාගේ හිතවතියක වන වයෝමි පීරිස් යන අයත් පෙර බදු ඔප්පුවට අත්සන් කරන ලද අබ්දුල් ලතීෆ් මොහොමඩ් ෂාෆි යන අයත් සාක්ෂි වශයෙන් අත්සන් කළ බවත්, කියා සිටින ලද සාක්ෂිකරු එම නිවසට තමා මසකට වරක් ගොස් පරික්ෂා කර බැලූ අතර 10 වන චූදිතව එම අවස්ථාවන්හිදී හමු වූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදී.

එම සාක්ෂිකරුගෙන් 10 වන චූදිත වෙනුවෙන් පෙනී සිටින ලද උගත් නීතීඥ කනිල් මද්දුමාගේ මහතා හරස් ප්‍රශ්න විමසන ලද අතර හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අදාළ බදු ඔප්පුව ජූඩ් නිවුටන් යන නීතීඥයා විසින් ලියා සහතික කළ බවත්, බදු දුන් නිවස තමාගේ නිවසේ සිට මීටර 600කින් පිහිටි බවත්, නිවස වට කොට තාප්පයක් තිබූ බවත්, 10 වන චූදිත එම නිවසේ සිටිනවා තමා දුටු අතර එම නිවස කුලියට ලබා දෙන ලද

කාලයේ දී පැමිණිලි කිසිවක් තමාට නොලැබුණු බවත් නිවසේ රැදී සිටින ලද අය සැකකටයුතු යමක් සිදුකළ බව දැනගැනීමට ද නොලැබුණු බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදී.

අනෙකුත් සියළුම චූදිතයින් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොමැති බවට දනුම් දී ඇත.

<u>දළුවකොටුව රිදී වැලි පාරේ පිහිටි නිවසක</u>

<u>පවත්වාගෙන ගිය ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

<u>විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ කොච්චිකඩේ දළුවාකොටුව, රිදීවැලි පාරේ අංක 394 දරන ලිපිනයේ පිහිටි දෙමහල් නිවසක් සම්බන්ධව පැ.සා. 2289 නන්දික සම්පත් අනුරාග යන අය සාක්ෂි ලබා දී ඇත. ඉදිරිපත් වී ඇති සාක්ෂිය අනුව පෙනී යන්නේ, එකී නිවස 2017.10.10 දින සිට 2018.01.09 දින දක්වා ජාතික හැඳුනුම්පත් අංක 940462916V අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අය විසින් කුලියට ගෙන ඇති බවත්, ඒ සඳහා සකස් කරන ලද අංක 8462 දරණ ඔප්පුවේ එකී අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අය වෙනුවෙන් මෙම නඩුවේ 10 වන චූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අය අත්සන් තබා ඇති බවටය. තවද, එකී ඔප්පුවට තවත් සාක්ෂිකරුවෙක් ලෙස ජාතික හැඳුනුම්පත් අංක

873340312 V හිමි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයද අත්සන් කර ඇත. ඉහත සඳහන් මුබාරක් යන තැනැත්තාගේ අනන්‍යතාව සම්බන්ධව අධිකරණයේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් ජාතික හැඳැනුම්පත් අංක 873340312 V හිමි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන තැනැත්තා 2019-4-21 දින කොළඹ කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගනු ලැබූ තැනැත්තා ලෙසට කරුණු අනාවරණය වී ඇත.

තවද මෙම නිවස කුලියට ගත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අය පැමිණිල්ල විසින් 56(2)(ආ) ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේ සිටින පුද්ගලයෙක් බවට පෙනී යයි. එකී අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් අධිකරණයේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් ජාතික හැඳැනුම්පත් අංක 940462916V හිමි අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන තැනැත්තා කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගනු ලැබූ තැනැත්තා ලෙසට සාක්ෂි මඟින් තහවුරු වී ඇත.

ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව පෙනී යන්නේ, මෙම නඩුවේ 10 වන චූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අය 2021.04.21 වන සිදු වූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ මරාගෙන මැරුණ බෝම්බකරුවන්

වන අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් සහ මොහොම්මදු අසාම් මොහොම්මදු මුබාරක් යන අය සමඟ සමීප සම්බන්දතාවයක් පවත්වා ඇති අතර, ඔවුන් විසින් දළුවාකොටුව, රිදීවැලි පාරේ පිහිටි මෙම නිවස යම් නීතිවිරෝධී අරමුණක් මත කුලී පදනම මත ලබා ගෙන ඇති බවයි. ඉහත පරිදි අප විසින් විස්තර කළ මරාගෙන මැරුණු ස්වයංඝාතක බෝම්බකරුවන් දෙදෙනෙක්ම මෙම නිවස බදු ගැනීමට ඉදිරිපත් වී තිබීම තුළින් ම එය මැනවින් පෙනී යයි.

මල්වාන පැන්ඩා මල්ටි ස්පෝර්ට්ස් එරීනා යන ස්ථානයේ පවත්වා ඇති වැඩමුළුව සම්බන්ධ සාක්ෂි

පැ.සා.2230 සමරසිංහ පතිරණගේ රංගනාත් තිලකරත්න යන අය දැනට ඔස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිකරුවෙකු වන අතර, ඔහු ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ මාර්ගගත ක්‍රමය මඟින් මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇත. ඔහු සාක්ෂි දෙමින් පවසා සිටියේ දැනට වසර 02 ක් ඔස්ට්‍රේලියාවේ පදිංචිව සිටින බවත්, ඔස්ට්‍රේලියාවට පදිංචියට ඒමට පෙර ලංකාවේ තමාගේ පියාට අයත් අංක765/5,යටියන,මල්වාන, යන ලිපිනයේ පිහිටි Panda Multy Sports Erina යන Sports club යන ව්‍යාපාරය තමා විසින් කළමණාකරනය කරගෙන ගිය බවත්, එම Sports club එකේ badminton Court, Swimming pool යන පහසුකම් තිබූ බවත්, ඊට අමතරව Gym එකක් සහ අවන්හලක්ද තිබූ බවත්, එසේම 75 දෙනෙකුට පමණ එකවර

හසුන් ගැනීමට හැකි ආකාරයේ Conference Hall එකක්ද තිබූ බවටත් සාක්ෂි දෙන ලදි.

තවදුරටත් සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකරු පවසා සිටියේ, තමා පුරුද්දක් වශයෙන් තමාගේ ස්පෝට්ස් ක්ලබ් එකට හවස් වරුවේ badminton ක්‍රීඩා කිරීම සඳහා යන බවත්, තමන්ලා සමඟ එකට badminton සෙල්ලම් කිරීමට මල්වාන ප්‍රදේශයේ පදිංචි හුසේන් යන තැනැත්තා සහ ඔහුගේ ඥාතියෙකු වන සෙයිනි යන තැනැත්තාද පැමිණෙන බවත්, 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දිනයක සෙයිනි නමැති අය රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය බව පවසා තමාගේ Sports club එක වෙන් කරවා ගත් බවත්, එවැනි වෙන් කරවා ගැනීම් සටහන් කර ගැනීම සඳහා ඒ කාලය වන විට රෙජිස්ටරයක් පවත්වාගෙන ගිය බවටත් පවසමින් සාක්ෂිකරු විසින් CR පොතක් අධිකරණයේ භඳුනා ගත් අතර, එම CR පොත පැමිණිල්ල විසින් පැ.812 ලෙස ලකුණු කරන ලදි. පැ.812 පරීක්ෂා කර සාක්ෂිකරු කියා සිටියේ සෙයිනි යන තැනැත්තා විසින් 2017 දෙසැම්බර් 17 වන දිනට තමාගේ Sports club එකේ Conference Hall එක වෙන් කරවාගෙන තිබෙන බවත්, එලෙස වෙන් කිරීමෙන් පසුව අදාළ දිනයේ එනම්, 2017 දෙසැම්බර් 17 වන දින රැස්වීමක් පැවැත්වූ බවත්, එම රැස්වීමට පුද්ගලයින් 15 දෙනෙකු හෝ 16 දෙනෙකු පමණ පැමිණ සිටි බවත්, තමාගේ මතකයේ හැටියට එම රැස්වීමට පැමිණි පුද්ගලයන් සියළු දෙනාම ලාංකිකයන් වන අතර, එකී රැස්වීම පැය 04 ක්

පමණ කාලයක් පැවැත්වූ බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි. තවද, එම රැස්වීම පවත්වන ලද අදාළ දිනයේ තමාද ක්ලබ් එකේ සිටි බවත්, රැස්වීමට පැමිණි පුද්ගලයන් තමා දුටුවා වුවද, ඔවුන් සමග කතා නොකළ බවත්, ඔවුන් සම්බන්ධ විශේෂ මතකයක් දැනට තමාට නොමැති බවත්, එම රැස්වීමට සෙයිනි යන අයද සහභාගි වූ බවටත් සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

<u>මල්වාන පැන්ඩා මල්ටි ස්පෝර්ට්ස් එරීනා යන ස්ථානයේ පවත්වා ඇති වැඩමුළුව සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ අංක765/5,යටියන,මල්වාන, යන ලිපිනයේ පිහිටි Panda Multy Sports Erina යන Sports club යන ව්‍යාපාරය සම්බන්ධව පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එකී සාක්ෂි අනුව අප හට පෙනී යන්නේ, 2017 දෙසැම්බර් මාසයේ 17 වන දින මෙම ආයතනයේ තිබූ සම්මන්ත්‍රණ ශාලාවේදී රැස්වීමක් පවත්වා තිබෙන අතර, එම රැස්වීමට පුද්ගලයන් 15ක් හෝ 16 දෙනෙකු සහභාගී වී තිබෙන බවත්, එම රැස්වීම

සඳහා අදාළ සම්මන්ත්‍රණ ශාලාව සෙයිනි යන පුද්ගලයෙකු විසින් වෙන් කරවාගෙන තිබෙන බවත්ය.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දුන් පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත සඳහන් කොටස සඳහන් වී ඇත.

> ***" ශ්‍රී ලංකාවේ සිංහල ජාතිවාදීන් විසින් එනම්, කුලියාපිටිය, ගාල්ල, ගිංතොට සහ බේරුවල දර්ගා ප්‍රදේශ වල මුස්ලීම් ජනතාවට එරෙහිව සිදු කළ ප්‍රහාරයන් සහ අන්තර්ජාලය හරහා ලබා ගත් තොරතුරු වලට අනුව IS සංවිධානය නිවැරදි බවට වන තීරණයකට මම එළඹුණෙමි..... ඉන්පසු මාත්, සහරානුත්, මිල්හානුත් මල්වානේ ක්‍රීඩා සමාජයකදී ඔවුන් මුණගැසුණු අවස්ථාවේදී IS සංවිධානය වෙනුවෙන් එකට එක්ව ක්‍රියා කිරීමට ඔවුහු කැමැත්ත පළ කළහ...."***

ඉහත කරුණු අනුව පෙනී යන්නේ 01 චුදිත මොහොමඩ් නවුෆර් යන අය ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් සහ මිල්හාන් එනම්, මෙම නඩුවේ 03 වන චූදිත සමග 2017 දෙසැම්බර් මස 17 වෙනි දින Panda Multy Sports Erina Sports club යන මෙම ස්ථානයේ වැඩමුළුවක්

පවත්වා ඇති බවත්, එම වැඩමුළුවට 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝමබය පුපුරවා ගත් ඉහතින් අප විසින් සඳහන් කරන ලද සහරාන් යන අයද සහභාගී වී ඇති අතර, එම වැඩමුළුවේදී ජාත්‍යන්තර වශයෙන් තහනමට ලක් වී තිබෙන ත්‍රස්ත සංවිධානයක් වන IS සංවිධානය සම්බන්ධව සාකච්ඡා වී ඇති බවට පෙනී යයි. ඒ අනුව මෙම නඩුවේ 01 වන චූදිත එකී ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් යන අයත් සමඟ 2017 දෙසැම්බර් කලසීමාව වන විටත් සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති බවට මෙයින් කරුණු සනාථ වේ. තවද 01 චූදිතගේ පාපොච්චාරණයේ මිල්හාන් නැමත්තා සම්බන්ධයෙන් ද සඳහන් වන අතර මෙම නඩුවේ ඉදිරිපත් වූ සමස්ත සාක්ෂි සළකා බැලීමේ දී එලෙස මිල්හාන් ලෙස සඳහන් කර ඇත්තේ මෙම නඩුවේ 03 චූදිත මිල්හාන් නැමැත්තාම බවට පෙනී යයි.

<u>දළුවකොටුව ජනපද මාවතේ පිහිටි අංක</u>

<u>546/7/1නිවසේ පවත්වාගෙන ගොස් ඇති ආරක්ෂිත නිවස</u>

<u>සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2256 සේනානායක මුදියන්සේලාගේ ගාමිණි පේමශාන්ත යන සාක්ෂිකරු උද්‍යාන අලංකරණ කටයුතු කරන බවටත්, මෙම ඉහත සඳහන් ජනපද මාවත, දළුවකොටුව යන ස්ථානයෙහි

පිහිටි නිවස අනුරුද්ධිකා නමැති අයෙකුට අයත් වන අතර ඇය විදේශගතව සිටින බවත් ඇයගේ මව වන ලීනා ප්‍රනාන්දු යන අය විසින් කුලියට දීමේ බලතල සහිතව තිබූ අතර තමා එම නිවසේ තීන්ත ගෑම සඳහා ගිය අවස්ථාවකදී ඔවුන් හඳුනාගෙන ඒ මාර්ගයෙන් ඔවුන් මෙම නිවසට කුලීකරුවන් සැපයීම සිදුකළ බවත් ඒ සඳහා Ikman.lk යන අන්තර්ජාල පිටුව හරහා දැන්වීම් පළ කර තිබූ අතර තමාගේ දුරකථන අංකය වන 077-9049157 දරන දුරකථනය සහ අනුරුද්ධිකා යන අයගේ දුරකථන එහි සම්බන්ධ කරගත හැකි දුරකථන වශයෙන් සඳහන් කර තිබූ බවත් කියා සිටින ලද සාක්ෂිකරු වර්ෂ 2018.09.29 දින ප්‍රසිද්ධ නොතාරිස් සුරංගා ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 18878 දරන කුලියට දීමේ ඔප්පුව හඳුනාගන්නා ලද අතර එහිදී මේ වන විටත් එම ඔප්පු X- 17 වශයෙන් මුල් අවස්ථාවේදී සලකුණු කර තිබූ අතර සම්පූර්ණ නඩු විභාගය සඳහා එය පැ. 825 වශයෙනුත් සලකුණු කරන ලදී.

වර්ෂ 2018 සැප්තැම්බර් මස පමණ කාලිද් සමීර් නමැති අය පුත්තලමේ පදිංචි රෝගියෙකු පුත්තලමට ආපසු රැගෙන යාම අපහසු බැවින් ඔහුට ප්‍රතිකාර කිරීම සඳහා මෙම නිවස බදු ගැනීමට ඉල්ලා සිටි බවත් එකී කාලිද් සමීර් යන අය මෙම නඩුවේ 11 වන චූදිත බවට හඳුනා ගන්නා ලදි. 11 වන චූදිත නිවස කුලියට ගැනීම සම්බන්ධයෙන් කතා කරගැනීමට කීපවතාවක් පැමිණි අතර යතුරු ගැනීමට පැමිණියේ ඔහු බවත් කියා සිටින ලද සාක්ෂිකරු මේ වන විට X- 16 වශයෙන් සලකුණු කර ඇති

ඡායාරූපය කාලිද් සමීර්ගේ ඡායාරූපය බවට තමා ප්‍රකාශයක් දෙන අවස්ථාවේදී හඳුනාගත් බව කියා සිටින ලදී. X-14 වශයෙන් 2024.06.13 සලකුණු කර තිබූ දුරකථන වාර්තාව සාක්ෂිකරුට පෙන්වන අතර, එය පෙන්වා පැ.828 වශයෙන් එය සලකුණු කරන ලද අතර එහිදී 076-6629509 දරන දුරකථනය කාලිද් සමීර් විසින් තමාව ඇමතූ දුරකථනය බවටත්, 34 වතාවක් තමාව අමතා ඇති බවත් කියා සිටින ලදී. අදාළ දුරකථන අංක 077-9049157 දරන දුරකථනයට අදාළ ග්‍රාහක වාර්තාව (2024.06.13 දින X-13 ලෙස අතුරු පරීක්ෂණයේ දී සලකුණු කර ඇත.) පැ.826 ලෙස සලකුණු කරන ලදී.

තවද, 11 වන චූදිතත් සමඟ අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි මෙම ඔප්පුව ලිවීමට පෙර නිවස බැලීමට කාලිද් සමීර් සමඟ දෙපාරක් පැමිණි බවත්, එකී අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අය මෙම නඩුවේ 10 වෙනි චූදිත බවටත් සාක්ෂිකරු විසින් පවසා සිටින ලදි. පැ.825 ලෙස සලකුණු කරන ලද බදු ඔප්පුවෙහි ඇති 10 වැනි චූදිතගේ අත්සන හඳුනාගෙන එය පැ.825(A) වශයෙන් සලකුණු කරන ලදී. තමාද එක් සාක්ෂිකරුවෙකු වශයෙන් අත්සන් කළ බවත්, ඊට අමතරව ජාතික හැඳුනුම්පත් අංක 940462916V දරන හැඳුනුම්පත හිමි අච්චි මොහොමදු මොහොමඩ් හස්තූන් නමැති අයද සාක්ෂිකරුවෙකු ලෙස අත්සන් කළ බවත් කියා සිටින ලද සාක්ෂිකරු පැ.56 ලෙස මේ වන විටත් කටුවාපිටිය පල්ලිය සම්බන්ධයෙන් සලකුණු කර ඇති CD පටයෙහි පැ.56 (4) වශයෙන් සලකුණු කර ඇති

දර්ශනය නරඹමින් එහි සිටින බෑග් එකක් රැගෙන යන තැනැත්තා හස්තූන් බවට හඳුනා ගන්නා ලද අතර, ඔහුට එහි නිශ්චල ඡායාරූපයක් වන පැ.56 (2) ඡායාරූපය පෙන්වීමෙන් පසුව එහි පැ. 6 (2A-1) යන ස්ථානයේ සඳහන් කර ඇති තැනැත්තා හස්තූන් බවට හඳුනාගන්නා ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 10 වැනි චූදිත වෙනුවෙන් ඔහුගේ නීතීඥ කනීල් මද්දුමාගේ මහතා හරස් ප්‍රශ්න විමසා ඇති අතර, පැ.825 දරන බදු ඔප්පුවේ ගැනුම්කරු අබ්දුල් ලතීෆ් සාෆි බවත් 10 වන චූදිත බවත් 11 චූදිත කාලිද් සමීර් නිවස පරික්ෂා කර බැලීමට පැමිණි බවත්, 2018.09.29 ඔප්පුව අත්සන් කරන අවස්ථාවේදී 10 වන චූදිත මෙන්ම හස්තූන් සහ කාලිද් පැමිණි බවත් කියා සිටින ලදී. සාක්ෂිකරු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශයේදී බදු ගිවිසුම අත්සන් කිරීමට 10 වන චූදිත පැමිණි බවට සඳහන් නොකිරීම 10 වන චූදිත වෙනුවෙන් ඌණතාවයක් ලෙස අධිකරණයේ අවධානයට යොමු කර ඇත. එසේම, එම චූදිත සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර නැත්තේ එවැන්නක් සිදු නොවූ නිසා බවට කරන ලද යෝජනාවද සාක්ෂිකරු විසින් ප්‍රතික්ෂේප කරන ලදී. බදු දීමෙන් පසුව කවුරුන් සිටියේද යන්න තමා නොදන්නා බවත්, තමා එම නිවසට නොගිය බවත්, එළියේ සිටියදී කාලිද් යන අය පැමිණ තමා හමුවූ බවත් ඔහු කියා සිටින ලදී. 10 වන චූදිත නිවෙස තුළ සිටියේද යන්න තමා නොදන්නා බවත් මුදල් ගෙවීම ගිණුම් අංකයට ලැබුණු බවත්, 2018.09 මාසයට පෙර

ඔවුන් නිවස අතහැර ගොස් තිබූ බවත්, 2019.01.25න් පසුව කිසිවෙකුට බදු නොදුන් බවත් කියා සිටින ලදී.

11 වන චූදිත විසින් ද සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසා ඇති අතර එහිදී ‘‘කාලිද’’ සහ ‘‘කාදික්’’ ලෙස හඳුන්වා තිබීම නිසා තමාගේ නම වැරදියට සටහන් කර තිබුණු බවට 11 වන චූදිත යෝජනා කර ඇති අතර, එහිදී තමා මොහුව හඳුනන්නේ සමීර් ලෙස බවත් තමාගේ දුරකථනයේ එම නම ‘‘ Sameer’’ ලෙසට සඳහන් කර ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී තමා සමීර් ලෙසට හඳුන්වාදුන් අතර, ඔහුගේ දුරකථන අංකය 076-6629509 බවටත් කියා සිටින ලදී. මෙහිදී ඊට පෙර 2024.06.05 වන දින X-7 (11-D-1) වශයෙන් සලකුණු කරන ලද දුරකථන වාර්තාවක් පෙන්වා සිටින ලද අතර එම දුරකථන වාර්තාවේ 08, 09, 10 යන ස්ථානයන්හි සඳහන්ව ඇත්තේ විවිධ පුද්ගලයන්ගේ සහ ආයතනයක නමක් වන බවත්, එම දුරකථනය කිසිදු විටක තමාට අයත් දුරකථනයක් නොවන බවට 11 වන චූදිත සාක්ෂිකරුට යෝජනා කරන ලද අතර, අයිතිකරු සම්බන්ධයෙන් තමා නොදන්නා නමුත් කාලිද් සමීර් විසින් තමාව අමතන ලද්දේ එම දුරකථනයෙන් බවට තමා ඉතා පැහැදිලිව කියා සිටින බවටත් සාක්ෂිකරු කියා සිටින ලදී.

ඊට අමතරව ඔහු විසින් කාලිද් සමීර් යන 11 වන චූදිතගේ ශක්‍යතා පරීක්ෂණයේදී සාක්ෂි දෙන අවස්ථාවේදී මෙම නිවසේ අයිතිකාරියගේ නම

පැහැදිලිව ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම ගැන හරස් ප්‍රශ්න අසන ලද අතර, එහිදී එයට පිළිතුරු වශයෙන් සාක්ෂිකරු කියා ඇත්තේ, එම අවස්ථාවේදී 11 වන විත්තිකරුගෙන් හරස් ප්‍රශ්න අසන ලද නීතීඥවරයා ඔහුව බ්‍රෝකර්වරයකු නැතහොත් තැරැව්කරුවෙකු ලෙස හඳුන්වාදෙමින් අපහසුතාවයට පත් කළ බැවින් තමා එම අවස්ථාවේදී අපහසුතාවයට පත් වූ බවත්, තමා එම නිවස පිරිසිදු කිරීම සඳහා ඊට පෙරද කටයුතු කර ඇති බවත්, ඊට පෙර අවස්ථාවන් වලදී තමා විදේශිකයෙකුගේ නිවසේ සිටි බවත්, එම නිවසේ ගෘහ අංකය තමාට මතක නැති බවත්, සාෆි සහ හස්තූන් පැමිණි අතර හස්තූන්ගේ නම සඳහන්ව නැති වීම සම්බන්ධයෙන් 11 වන චූදිත හරස් ප්‍රශ්න අසා ඇත. පැ.827 වශයෙන් සලකුණු කරන ලද ඡායාරූපය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පෙන්වා සිටීම මත වැරදි ලෙස තමාව හඳුනාගත්තේ යැයි 11 වන විත්තිකරු විසින් කරන ලද යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී.

එසේම, මීට එම නිවස ලබා ගැනීම සඳහා එනම්, සාක්ෂි දීමට පෙර 11 වන චූදිත ව හමුවී ඇති බවත්, දුරකථන ඇමතුම් 34කට ආසන්න ප්‍රමාණයක් ලබාගෙන ඇති බවටත් සාක්ෂිකරු කියා සිටින ලදී.

09 වන චූදිත විසින්ද මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසා ඇති අතර නිවස කුලියට දීමට පෙර මුස්ලිම් ජාතිකයන් ඇසුරු කර නොමැති බවත්, සමීර් මුස්ලිම් බවට තමා දැන සිටි බවත් තමා ජාතිවාදියෙකු ලෙස

නොසලකන ලෙසටත් ඉල්ලා සිටිමින් තමාට මෙම නිවස දෙන ලෙසට අයිතිකාරියට කීපවතාවක්ම කියා සිටි බවටත් පවසා සිටින ලදි. එසේම, එසේම එම නිවසේ කිසිදු නීතිවිරෝධී ක්‍රියාවක් සිදුවූ බවට තමාට පැමිණිල්ලක් ලැබී නොමැති බවටත් මෙම සාක්ෂිකරු 09 වැනි චූදිතගේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න විමසීමේදී, එම නිවසට කුලියට ගැනීමට අදාළ බදු ගිවිසුමේ සම්පූර්ණ ගිවිසුම් කාලය වසර 01ක් නමුත්, ඔවුන් ඊට පෙර නොදන්වා නිවසෙන් පිටව ගොස් තිබූ බවත්, යතුරු ආපසු භාර නොදුන් බැවින් අගුළු කඩා අලුතින් යතුරු සවිකිරීමට සිදු වූ අතර, ඔවුන්ගේ දුරකථනද ක්‍රියාවිරහිත කර තිබූ බවත්, කාන්තාවන් සිටින බැවින් නිවස තුළට නොඑන ලෙසට ඔවුන් ඉල්ලා සිටියද තමා කාන්තාවන් නොදුටුව බවටත් කියා සිටින ලදී. 11 වන චිත්තිකරු විසින් 11 (D) (1) වශයෙන් සලකුණු කරන ලද ලේඛණයේ (2024.06.13 දින X-07වශයෙන් සලකුණු කර ඇති ලේඛනය) 08 සහ 09 දරණ ස්ථාන වල ඇති අංකය 11 වන චිත්තිකරු විසින් තමාව ඇමතූ අංකය බවට සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර සිටින ලදි.

පැ.සා. 1822, පොලිස් සැරයන් 31717 ඉටිහාමිලාගේ කමල් ස්වර්ණතිලක යන අය සාක්ෂි ලබා දෙමින් තමා, 2019.06.25 වන දින අංක 546/7/1 ජනපද මාවත, දළුවකොටුව, කොච්චිකඩේ යන ලිපිනයේ පිහිටි

නිවසක් පරීක්ෂා කළ බවත්, එම පරීක්ෂණයේදී පොසැ.28463 රණසිංහ නිළධාරියා ඡායාරූප ශිල්පියා වශයෙන් කටයුතු කළ බවත්, එම නිවස දීර්ඝ කාලයක සිට මිනිසුන් පදිංචි වී නැති නිවසක් බවට නිරීක්ෂණය වූ බවත්, එම නිවසද තම කණ්ඩායමේ නිළධාරීන්ගේ සම්පූර්ණ පරීක්ෂාවට ලක් වූ අතර, එම නිවසේ උඩුමහලේ වීදුරු අල්මාරියක තිබී ඇඟිලි සටහන් 5 ක් සොයාගත් බවත්, එම සටහන් වලින් අංක 1 සහ 3 වශයෙන් සළකුණු කරන ලද සටහන් එම අල්මාරියෙහි දොරෙහි තිබූ බවටද පවසා සිටින ලදි.

සොයා ගන්නා ලද ඇඟිලි සටහන් සම්බන්ධයෙන් අංක 3467/2019 දරණ ඇඟිලි සටහන් පරීක්ෂණ වාර්තාව එම ස්ථානයේදීම සකස් කළ බවටත් පවසමින් එම වාර්තාව අධිකරණයේදී හඳුනා ගන්නා ලද අතර, එකී වාර්තාව පැමිණිල්ල විසින් පැ.1582 වශයෙන් සලකුණු කර ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2307 ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් සේනක කළුආරච්චි යන අය සාක්ෂි ලබා දෙමින්, පැ.1567 දරණ ඇඟිලි සලකුණු වාර්තාව සහ ප්‍රදර්ශන පත්‍රය සළකුණු කරමින් කොච්චිකඩේ දළුවකොටුව ජනපද මාවතේ අංක 546/7/1 නිවසේ තිබී පොලිස් සැරයන් 31717 ස්වර්ණතිලක විසින් සොයාගන්නා ලද සහ උප පොලිස් පරීක්ෂක රණසිංහ (එවකට පොසැ 28463) විසින් ඡායාරූප ගත කරන ලද ඇඟිලි සටහන් 05 ක් අතුරින් ඇඟිලි සටහන් දෙකක් මෙම නඩුවේ 10 වුදින වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අයගේ ඇඟිලි

සලකුණු දෙකක් සමග සැසඳෙන බවට සාක්ෂි ලබා දී ඇති අතර අදාළ නිවසින් සොයා ගන්නා ලද ඇඟිලි සලකුණු සහ 10 වූදිතගේ ආදර්ශ ඇඟිලි සලකුණු පත් පැ.1568(A)1 සහ 1568(B)1 ලෙස සලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව පුද්ගලයින් දෙදෙනෙකුගේ ඇඟිලි සලකුණු කිසිසේත් එක සමාන නොවන බවට ඇඟිලි සළකුණු සැසඳීම හා සම්බන්ධ විද්‍යාත්මක කරුණු ආශ්‍රයෙන් දීර්ඝ සාක්ෂියක් ලබා දී ඇත. මෙම සාක්ෂිකරුව 10 වූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේ දී සාක්ෂිකරු පවසා ඇත්තේ, මෙම ස්ථානයෙන් සොයාගෙන ඇති ඇඟිලි සටහන් මාස 6 ක් 7 ක් පරණ ඒවා බවටය. එසේම 09 වන වූදිතගේ හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එකී ඇඟිලි සලකුණු කුමන නිශ්චිත දිනයක කුමන ආකාරයෙන් පතිත වූයේද යන්න කීමට තමාට හැකියාවක් නොමැති බවත්, අදාළ සටහන් වර්ධනය කර ගැනීමට යන කාලය අනුව එම සටහන් පැරණි සටහනක් ද අළුත් සටහනක් ද යන්න කීමට හැකියාවක් පවතින බවත්, මෙම සටහන් පතිත වන අවස්ථාවේ එම පුද්ගලයා එම ස්ථානයේ සිට ඇති බව පමණක් තමාට පැවසිය හැකි බවය.

<u>දළුවකොටුව ජනපද මාවතේ පිහිටි අංක 546/7/1නිවසේ</u>

<u>පවත්වාගෙන ගොස් ඇති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

<u>විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ කොච්චිකඩේ, දළුවාකොටුව, ජනපද මාවතේ, අංක 546/7/1 දරණ ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධයෙන් පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. පැ.සා. 2256 ගාමිණි ප්‍රේමශාන්ත යන අය ඒ සම්බන්ධව අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති අතර, එම සාක්ෂිකරුගෙන් 11 වන චූදිත සහ 10 වන චූදිත වෙනුවෙන් ඔහුගේ නීතීඥ මහතා විසින් හරස් ප්‍රශ්න අසා ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශයේදී බදු ගිවිසුම අත්සන් කිරීමට 10 වන චූදිත පැමිණි බවට සඳහන් නොකිරීම 10 වන චූදිත වෙනුවෙන් ඌණතාවයක් ලෙස අධිකරණයේ අවධානයට යොමු කර ඇතත්, පැ.825 දරන ඔප්පුවේ 10 වන චූදිත විසින් පාර්ශ්වකරුවෙකු ලෙස අත්සන් තබා ඇති පසුබිම තුළ සහ ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළු විස්තර ද පැ.825 දරණ ඔප්පුවේ පැහැදිලිව සඳහන් කර ඇති පසුබිම තුළ එකී ඌණතාවය සැලකිය යුතු ඌණතාවයක් බවට අප හට පෙනී යන්නේ නැත.

එම නිවස දැනට විදේශ ගතව සිටින දේවගිරිගේ නිර්මලී අනුරුද්ධිකා ලංකාතිලක යන අයට අයත් නිවසක් වන අතර, ඇයගේ මව වන ලීලා ප්‍රනාන්දු යන තැනැත්තිය විසින් එම නිවස 2018.09.29 දින සිට වසරක කාලයක් සඳහා කුලියට ලබා දී ඇත. එසේ කුලියට ලබා දීමේදී අංක 18878 දරණ බදු ඔප්පුවක් ලියා තිබෙන

අතර, එම ලේඛණය පැමිණිල්ල විසින් පැ.825 ලෙසට සලකුණු කර ඇත. ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂා කිරීමේදී අධිකරණයට පෙනී යන්නේ, එම නිවස මෙම නඩුවේ 10 වන චූදිත වන ජාතික හැඳුනුම්පත් අංක 730784724V හිමි අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අය විසින් වසරක කාලයකට කුලියට ලබා ගෙන ඇති අතර, එම නිවස කුලියට ලබා ගැනීම සඳහා 10 වන චූදිතත් සමඟ මෙම නඩුවේ 11 වන චූදිත වන කාලිද් සමීර් යන අයද කටයුතු කර ඇති බවයි. එකී අවස්ථාවලදී රෝගියෙකු නවත්වා ගැනීම සඳහා එම නිවස කුලියට ලබා ගන්නා බවට 11 වන චූදිත විසින් පවසා ඇත.

තවද, පැ.825 දරණ බදු ඔප්පුවේ ජාතික හැඳුනුම්පත් අංක 940462916 V හිමි මොහොමඩ් හස්තූන් යන අය සාක්ෂිකරුවෙක් ලෙස අත්සන් කර තිබෙන බවටද පෙනී යයි. එකී මොහොමඩ් හස්තූන් යන අය කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් ස්වයංක්‍රිය බෝම්බ පුපුරවා හරින ලද බෝම්බකරු ලෙස මෙම අධිකරණයේ සාක්ෂි මඟින් කරුණු අනාවරණය වී ඇත. එමඟින් එකී හස්තූන් යන තැනැත්තා සමඟ මෙම නඩුවේ 10 වන 11 වන චූදිතයන් මෙම නිවස කුලියට ලබා ගැනීම සඳහා එකට ක්‍රියා කර ඇති බව ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව අප හට පෙනී යයි.

තවද ඉහත කී අංක 546/7/1, ජනපද මාවත, දළුවකොටුව, කොච්චිකඩේ යන ලිපිනයේ පිහිටි නිවස කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිදුකල අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් නැමැත්තා හට බදු ගැනීම සඳහා ආධාර අනුබල දීම මෙම නඩුවේ 11 වූදිත වන කාලිද් සමීර් නැමත්තා විසින් ද සිදුකර ඇති බව මෙම පැ.සා.2256 ගාමිණී ප්‍රේමශාන්තගේ සාක්ෂිය තුළින් පෙනී යන අතර ඔහුගේ සාක්ෂියට අනුව ඔහු විසින් Ikman.lk යන අන්තර්ජාල පිටුව හරහා පල කර තිබූ දැන්වීම් ප්‍රකාරව ඔහුගේ ජංගම දුරකථනයට ඇමතුම් 34ක් ලබා දී ඇත්තේ, මෙම නඩුවේ 11 වූදිත බවට පෙනී යන අතර ඔහුගේ නම Sameer ලෙස තමාගේ ජංගම දුරකථනයේ ද ගබඩා කර ගත් බවට සාක්ෂි ලබා දී ඇති අතර එසේම ඔවුන් නිවස කුලියට ගැනීමෙන් අනතුරුව තමා සති දෙකකට පමණ වරක් එම නිවස බැලීමට ගිය අවස්ථාවන් හිදී Sameer යන 11 වන වූදිතට දුරකථන ඇමතුම් ලබා දී ගිය බවත්, එවිට 11 වූදිත Sameer එම නිවසින් එළියට පැමිණ තමා සමග කතා කල බවට මෙම සාක්ෂිකරු ලබා දී ඇති සාක්ෂිය අනුව ද 11 වූදිත ද මෙම ආරක්ෂිත නිවාසයේ නිරන්තරයෙන් සිට ඇති බව පෙනී යයි. ඒ වනවිටත් මෙම අධිකරණය ඉදිරියේ පැ.56 ලෙස ලකුණු කර ඇති CCTV දර්ශනයේ පැ.56(2)(A)(1) ලෙස නිශ්චල ඡායාරූපයෙහි සිටින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිදුකල අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් නැමැත්තා

හට අංක 546/7/1, ජනපද මාවත, දළුවකොටුව, කොච්චිකඩේ පිහිටි නිවස ආරක්ෂිත නිවාසයයක් ලෙස ලබා ගැනීමට 11 වූදිත කාලිද් සමීර් විසින් ආධාර අනුබල දී ඇති බව මනාව පහැදිලි වේ.

2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් මාස 02 කට පමණ පසුව එනම්, 2019.06.25 වන දින කොළඹ ඇඟිලි සටහන් කාර්යාලයේ නිළධාරීන් විසින් මෙම නිවස පරීක්ෂා කර ඇති අතර, එහිදී මෙම නිවස තුළ තිබී සටහන් කීපයක් සොයා ගෙන ඇත. ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් පැ.සා.2307 සේනක කළුආරච්චි යන අයගේ සාක්ෂියට අනුව එම සටහන් අතරින් මෙම නඩුවේ 10 වන චූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අයගේ ඇගිලි සටහන්ද සොයා ගෙන ඇත. ඒ අනුව 10 චූදිත අබ්දුල් ලතීෆ් සාෆි යන අය ද 11 චූදිත සහ කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිදුකල අච්චි මොහොමඩ් මොහොමඩ් හස්තූන් එක්ව කටයුතු කර ඇති බව පෙනී යයි.

<u>කටුවාපිටිය, දොන් ඩේවිඩ් මාවතේ, උළු අම්බලම වත්ත යන ලිපිනයේ පිහිටි ආරක්ෂිත ස්ථානයක් ලෙස පවත්වාගෙන ගොස් ඇති නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 829 නිශාදී දසුන්මලී ගුණසේකර යන සාක්ෂිකාරිය අධිකරණයේ සාක්ෂි ලබා දෙමින්, තමා නීතීඥ සහ ප්‍රසිද්ධ

නොතාරිස්වරියක් ලෙස 2010 වසරේ සිට කටයුතු කරන ලද බවත්, මෙම නඩුවට අදාළව සාක්ෂි දීම සඳහා පාදක වූ සිද්ධිය ලෙසට කටුවාපිටිය පල්ලියේ සිදු වූ බෝම්බ ප්‍රහාරයකට අදාළ බෝම්බකරුවන් පිරිසක් රැඳී සිටි ස්ථානයකට අදාළව තමා විසින් බදු ඔප්පුවක් සකස් කර ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් තමාට ප්‍රකාශයක් ලබා දීමට සිදු වූ බවට පවසා ඇත. අදාළ ඉඩම පිහිටි දේපලෙහි අයිතිකරුවන් වන කලණ නුවන් රවීන්ද්‍ර සිල්වා සහ මහතලගේ දිදුලානි ශානිකා ප්‍රියදර්ශනී යන අයගේ නීත්‍යානුකූල ඇටර්නි බලකාරිය වන අසරප්පුලිගේ මේරි ජෙනට් එමිල්ඩා සිල්වා යන අය තමා වෙත පැමිණ මෙලෙස බදු ඔප්පුවක් ලියා දෙන ලෙසට තමාගෙන් ඉල්ලා සිටි බවත්, එම තැනැත්තිය ඇටර්නි බලකාරිය බවත්, ඇයට අදාළ ඉඩමද තමා විසින්ම සින්නක්කර ඔප්පුවක් මත ලියන ලද තැනැත්තියක් බවත් මෙම සාක්ෂිකාරිය පවසා ඇති අතර, එම තැනැත්තියට අදාළ ඇටර්නි බලපත්‍රය ලියා සහතික කළේද, ලියාපදිංචි කළේද තමා විසින්ම බවත් සාක්ෂිකාරිය පවසා ඇත. අදාළ ඇටර්නි බලපත්‍රය සාක්ෂිකාරිය හඳුනාගෙන අංක 946 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය පැ.813 ලෙස මෙම සාක්ෂිකාරිය මගින් ලකුණු කර ඇත. එසේම, තමා විසින් පෙර සඳහන් කරන ලද බදු ඔප්පුව සකස් කිරීම සඳහා කටයුතු කරන ලෙසට මුලින්ම තමා මුණගැසී උපදෙස් ලබා දුන්නේ මානෙල්ගේ ජෝසප් ජස්ටින් ප්‍රනාන්දු යන අය බවත්, එම ජෝසප් ජස්ටින් ප්‍රනාන්දු යන අයව තමා පුද්ගලිකව හඳුනන්නේ නැති බවත්, ඔහු සමඟ මේරි එමිල්ඩා සිල්වා යන තැනැත්තියද පැමිණි

බවත් පවසා ඇත. එසේම, බදු ඔප්පුවට අත්සන් තබන ලද දිනයේදී හතර දෙනෙක් පැමිණි බවත්, එම හතර දෙනා වන්නේ තමා සහ අසරප්පුලිගේ මේරි ජෙනට් එමිල්ඩා සිල්වා යන අයත්, එසේම මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයත්, මොහොමඩ් අමීර් මොහොමඩ් අසාම් යන අයත්, මානෙල්ගේ ජෝසප් ජස්ටින් ප්‍රනාන්දු යන අයත් බවය. එසේම, අදාළ දේපලෙහි බදු ගැනුම්කරු ලෙස ඉදිරිපත් වූ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ බවත්, එහි සඳහන් තොරතුරු තමා විසින් සටහන් කරගත් බවත්, එහි සඳහන් ජාතික හැඳුනුම්පත් අංකය වූයේ 873340312V බවටත් සාක්ෂිකාරිය පවසා ඇති අතර, එකී හැඳුනුම්පතට අදාළ සූචියක් මෙම සාක්ෂිකාරියට පැමිණිල්ලෙන් පෙන්වා ඇති අතර, සාක්ෂිකාරිය විසින් එකී සූචියෙහි සඳහන් විස්තර තමා විසින් බදු ඔප්පුව ලියන ලද අවස්ථාවේදී සඳහන් කරන ලද විස්තර හා ගැළපෙන බවට අධිකරණය ඉදිරියේ පිළිගෙන ඇති අතර එම සූචි පත්‍රයේ සඳහන් ජාතික හැඳුනුම්පත් අංකය වන්නේද 873340312V බවත් සාක්ෂිකාරිය පවසා ඇත. එසේම, තමා විසින් එම ජාතික හැඳුනුම්පත් අංකය බදු ගිවිසුමේ සඳහන් කරන ලද බවත්, එම බදු ගැනුම්කරුගේ ලිපිනය ලෙසට අංක 138 B, නිව් යෝන් වීදිය, කොළඹ 12 ලෙසට සඳහන් කර තිබුණු බවටත් පවසා ඇති අතර, අදාළ තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතට අදාළ සූචිය සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛනය පැ.814 ලෙස ලකුණු කිරීමක් කර ඇත. එසේම, තමාගෙන් තමා ඉදිරියේ

අදාළ දේපල බදු ගැනීම සඳහා පැමිණි පැ.814 දරන ජාතික හැඳුනුම්පතට අදාළ සූචි පත්‍රයට අදාළ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සාක්ෂිකාරිය හඳුනාගෙන ඇති අතර, එය පෙර අවස්ථාවක පැ.801 ලෙස ලකුණු කර ඇති ලේඛනයක් වේ. එසේම, එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන බදු ගැනුම්කරු සමඟ පැමිණි අනික් පුද්ගලයා විසින්ද අංක 751540811 V යන ජාතික හැඳුනුම්පත තමාට ඉදිරිපත් කරන ලද බවත්, ඒ අනුව තමා පෙර සඳහන් කරන ලද පුද්ගලයන් හතර දෙනා ඉදිරියේදී 2019 පෙබරවාරි මස තුන්වන දින තමා විසින් අංක 1710 දරන බදු ගිවිසුම් ඔප්පුව සූදානම් කිරීමක් කරන ලද බවත්, එහි ඉහතකී පාර්ශවයන් අත්සන් කරන ලද බවත් පවසා ඇත. එසේම, බදු ගැනුම්කරුට හිමි විය යුතු පිටපත තමාගේ භාරයේ තබාගෙන සිටියද එය තමාගෙන් කිසිදු අවස්ථාවක බදු ගැනුම්කරු විසින් ඉල්ලා නොසිටි බවත්, ඔවුන් කිසිදු අවස්ථාවක එලෙස ඉල්ලාගෙන නොපැමිණි බවටත් සාක්ෂිකාරිය පවසා ඇති අතර තමා විසින් පිටු පහකින් සමන්විතව සකස් කරන ලද බදු ඔප්පුව සාක්ෂිකාරිය විසින් හඳුනාගෙන ඇත. එම බදු ඔප්පුව රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබී මහාධිකරණයට ලැබී තිබූ අතර, පැමිණිල්ල විසින් එම බදු ඔප්පුව ඇතුළත් කර තිබූ රජයේ රසපරීක්ෂක මුද්‍රා කවරය පැ. 815 ලෙස ලකුණු කර ඇත. එම කවරය තුළ තිබූ ලේඛන වලින් තමා විසින් සකස් කරන ලද බදු ඔප්පුවෙහි මුල් පිටපත සහ දෙවන පිටපත සහ නොතාරිස් පිටපත යන ලේඛන තුනම සාක්ෂිකාරිය හඳුනාගෙන ඇති

අතර, පැමිණිල්ල විසින් එම ලේඛණ පිළිවෙළින් පැ.816, පැ.817 සහ පැ.818 ලෙස සළකුණු කර ඇත. එසේම, තමා පෙර සඳහන් කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍ර හිමිකාරිය වන මේරි ජෙනට් එමිල්ඩා සිල්වා විසින් පැ.816 දරන ලේඛනයෙහි 40 වන පිටුවේ අත්සන් කර ඇති බවත් එසේම, එම බදු ඔප්පුවෙහි පළමුවන සාක්ෂිකරු ලෙස අත්සන් කරන ලද මොහොමඩ් අමීර් මොහොමඩ් අසාම් යන අයද එම ලේඛනයෙහි අත්සන් තබා ඇති බවට සාක්ෂිකාරිය පිළිගෙන ඇති අතර, එම තැනැත්තාගේ අත්සන පැ.816 දරන ලේඛනයෙහි මේ වන විටත් Y-01 ලෙස සලකුණු කර තිබෙන බවට පෙන්වා දී ඇත. එසේම, දෙවන සාක්ෂිකරු ලෙස පැමිණි මානෙල්ගේ ජෝසප් ජස්ටින් ප්‍රනාන්දු යන අයගේ අත්සනද පැ.816 දරන ලේඛනයෙහි 05 වන පිටුවේ තිබෙන බවට සාක්ෂිකාරිය විසින් හඳුනාගෙන ඇත. එසේම, පැ.814 ලෙස සඳහන් කරන ලද ලේඛනයේද පළමුවන සාක්ෂිකරු ලෙස අත්සන් තබන ලද පුද්ගලයාගේ අත්සන් තිබෙන බවට සාක්ෂිකාරිය පවසා ඇත. එසේම, පැ.814 ලෙස ලකුණු කරන ලද ලේඛනයෙහි 04 වන පිටුවේ Y-02 ලෙස සඳහන් කර තිබෙන අත්සනද සාක්ෂිකරු ලෙස අත්සන් තබන ලද පුද්ගලයාගේ අත්සන බවට හඳුනාගෙන ඇත. එසේම, පැ.818 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙහි 04 වන පිටුවේ ඇති අත්සනද සාක්ෂිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර, එය දැනටමත් රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේදී Y-03 ලෙස සලකුණක් යොදා ඇති බවට පෙනී යයි.

තමා ඉදිරියේ පළවෙනි සාක්ෂිකරු ලෙස පැ.816 සිට පැ.817, පැ.818 යන ලේඛන වල අත්සන් තැබූ පුද්ගලයා තමාට මේ වන විට නැවත දුටුවහොත් හඳුනා ගැනීමට අපහසු බවත්, තමා විසින් වසර හතරකට පමණ පෙර සිදු කරන ලද රාජකාරියක් සම්බන්ධ කටයුත්තක් බැවින් සහ අදාළ පුද්ගලයන් තමා ඉදිරියේ පෙනී සිටියේ විනාඩි 10ක පමණ කාලයක් වන බැවින් තමාට එම තැනැත්තාව නිවැරදිව නිශ්චිතව හඳුනා ගැනීමට හැකියාවක් නොමැති බවටද සාක්ෂිකාරිය පවසා ඇත.

මෙම සාක්ෂිකාරිය ලබා දුන් සාක්ෂිය මෙම නඩුවෙහි කිසිදු චූදිතයකු විසින් හබ කිරීමකට ලක් කර නොමැති අතර, සියලුම චූදිතයන් විසින් මෙම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට පවසා ඇත. ඒ අනුව ඇගේ සාක්ෂිය අවිවාදිතව මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 830 මෙරි ජෙනට් ඇමල්ඩා සිල්වා යන සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව ඇගේ පුතා කලණ නුවන් රවීන්ද්‍ර ද සිල්වා දැනට අබුඩාබි රටේ රැකියාවක් කරන බවත්, ඔහුට අයත් අංක 394/21 දරන නිවස තමාගේ නිවසට යාබදව තිබෙන බවත් එය තමා සහ තම ලේලිගේ පියා එක්ව මුබාරක් යන අයට කුලියට ලබා දී තිබෙන බවය.

පැමිණිල්ලේ සාක්ෂි අංක 810 මාතලගේ ජස්ටින් ජෝසප් ප්‍රනාන්දු යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහුගේ දියණිය වන මාතලගේ දිදුලානි

ශානිකා ප්‍රනාන්දු යන අය විවාහ වී සිටින්නේ කලණ නුවන් රවීන්ද්‍ර සිල්වා යන අය සමඟ බවත්, මේ වන විට ඔවුන් අබුඩාබි පදිංචිව සිටින බවත් පවසා ඇත.එසේම, මීගමුව ප්‍රදේශයේ දුවට සහ දුවගේ ස්වාමිපුරුෂයාට අයත් ගෙවල් තිබෙන බවත් ඉන් එකක් තමාලා බදු ඔප්පුවක් ලියා කුලියට දුන් බවටත් පවසා ඇත. එම සිද්ධිය සම්බන්ධයෙන් තමා පොලිසියට ප්‍රකාශයක් ලබා දුන් බවටත් සාක්ෂිකරු පවසා ඇති අතර මුබාරක් නැමැත්තෙක් සහ තවත් පුද්ගලයෙකු නිවස බැලීමට පැමිණි බවත්, තමා එම අය හමු වී කතා කළ බවත්, පසුව තමා විසින් නීතීඥ නිශාදි ගුණසේකර යන අය ඉදිරියේ බදු ගිවිසුමක් ලියා එම නිවස කුලියට ලබා දුන් බවත්, එදින බදු ගිවිසුමේ සාක්ෂිකරුවන් ලෙස තමාද, තමාගේ බිරිඳද, බිරිඳගේ අම්මාද, අත්සන් කළ බවත්, තමාද සාක්ෂිකරුවන් ලෙස අත්සන් කළ බවත් පවසා පෙර අවස්ථාවක ලකුණු කර තිබූ පැ.816 සිට 818 දක්වා ලේඛන පරික්ෂා කර බලා එම ලේඛන මත තිබෙන මෙම සාක්ෂිකරුගේ අත්සන් හඳුනාගෙන ඇත. එසේම, තමා පවසා සිටි මුබාරක් නැමැත්තා හෝටලයක සිද්ධියකින් මියගිය බවටත් පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගෙන් මෙම නඩුවේ කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමක් නොකරන ලදී.

පැ.සා.1433 ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක අකුරණගේ චමිලා සමන්ති ධර්මරත්න යන අය කටුවාපිටිය, දොන් ඩේවිඩ් මාවතේ, උළු අම්බලම වත්ත යන ලිපිනයේ පිහිටි නිවසින් සොයා ගන්නා

ලද නඩු භාණ්ඩ කීපයක් තමා වෙත පරීක්ෂණය සඳහා යොමු කළ බවත්, තමා විසින් එම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් සකස් කර ඇති බවත් පවසමින් එකී වාර්තාව පැ.1999 ලෙස ලකුණු කර ඇත. එකී JE/96/20 (CE/149/19) දරණ 2020.06.03 දිනැති එකී වාර්තාව පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ, පැ.28 ලෙස ලෝහ බෝලයක්, විදුලි රැහැන් කැබැලි, ආරක්ෂක කටුවක්, ප්ලාස්ටික් කොටසක් සහ ලේබලයක්, පැ.29 ලෙස විදුලි රැහැන් සම්බන්ධක 05 ක්, පැ.30 ලෙස පොලිතින් කැබැලි කීපයක්, පැ.31 ඇඳ ඇතිරිල්ලක්, පැ.32.ලෝහ බෝල කීපයක්. පැ.33 ලෝහ බෝල 2 ක්, පැ.34 ලෙස අර්ධ ලෙස දැවී ගිය කුඩා විදුලි බල්බ කීපයක් සහ අර්ධ ලෙස දැවී ගිය කුඩා විදුලි රැහැන් අඩංගු අළු මිශ්‍ර පස් සාම්පලයක්, කුඩා විදුලි බල්බයක්, එම වර්ගයේම විදුලි බුබුළු කීපයකට අයත් කොටස්, විදුලි රැහැන් කොටස්, ලෝහ කැබැලි රෙක්සීන හා පොලිතින් කැබැලි ලයිටරයක් හා මැලියම් ටියුබයක් ඇතුළු භාණ්ඩ සමූහයක් සහ පැ.35 ලෙස රෙදි කැබැලි හතරක් යන භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා මෙම සාක්ෂිකාරිය වෙත ඉදිරිපත් කර ඇති බවය.

සාක්ෂිකාරිය තවදුරටත් සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ, පැ.28, පැ.32 හා පැ.33 ලෝහ බෝල විෂ්කම්භයෙන් මිලිමීටර් 6.2 ක් හා බරින් ග්‍රෑම් 1.05 පමණ වන පළුදු වීම් රහිතව තිබෙන විෂ්කම්භයෙන් හා බරින් ඉහත පිපුරුම් ස්ථානයෙන් එනම්, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයෙන් සොයා ගන්නා ලද ලෝහ බෝල හා සමාන ලෝහ බෝල

බවටය. තවද, පැ.35 ලෙස ලකුණු කර තිබූ සුදු පැහැති රෙදි කැබලි යල පොටෑසියම් නයිට්‍රේට් හා ඇලුමිනියම් අඩංගු පුපුරණ ද්‍රව්‍ය මිශ්‍රණයක ශේෂ හා යූරියා නයිට්‍රේට් ශේෂ හඳුනා ගත් බවය. තවද, කටුවාපිටිය දොන් ඩේවිඩ් පටුමගේ පිහිටි නිවසේ තිබී සොයා ගන්නා ලද නඩු භාණ්ඩ සම්බන්ධයෙන් සිය වාර්තාවේ,තමා මතයක් පළ කර තිබෙන බවත් එනම්, අනුව මෙම පිපිරුම් ස්ථානයෙන් ලබාගත් භාණ්ඩ වල යූරියා හා යූරියා නයිට්‍රේට් වල වැය වූ ශේෂ සඳහා හඳුනා ගැනීම මත හා පිපිරුම් ස්ථානයෙන් ලෝහ බෝල සමූහයක් සොයා ගැනීම මත මෙම පිපිරීම සඳහා යූරියා හා නයිට්රික් අම්ලය සමඟ ප්‍රතික්‍රියා කිරීමෙන් දේශීයව සංශ්ලේෂණය කරන ලද යූරියා නයිට්‍රේට් අධිබල පුපුරණ ද්‍රව්‍යයක් භාවිතා කර ඇති බව හා ජන සමූහයක් එකවර ඝාතනය කිරීමේ චේතනාවෙන් පිපිරුම් උපක්‍රමයට ලෝහ බෝල විශාල සංඛ්‍යාවක් අඩංගු කර තිබූ බව වන් තමාගේ මතය බව සාක්ෂිකාරිය කියා සිටින ලදී.

පැ.සා.1433 ධර්මරත්න මහත්මිය විසින් සකස් කරන ලද JE/96/20 (CE/149/19) දරණ 2020.06.03 දිනැති වාර්තාව මෙම නඩුවේ පැ.1999 ලෙස ලකුණු කර ඇත. අදාළ වාර්තාව සහ එම සාක්ෂිකාරිය විසින් අධිකරණයේ ලබා දෙන ලද සාක්ෂි ඉහත සඳහන් නඩු භාණ්ඩ කටුවාපිටිය අංක 394ඒ/21, දොන් ඩේවිඩ් පටුමග, උළු අම්බලම වත්තෙන් සොයා ගෙන ඇති බවට සඳහන් කර ඇත. කෙසේ වුවද, අදාළ නඩු භාණ්ඩ සොයා ගන්නා ලද පැ.සා.1714 ප්‍රධාන පොලිස් පරීක්ෂක නිරෝෂන් දර්ශන

කොල්ලුරේ යන අය අධිකරණයේ සාක්ෂි දෙමින් පවසා සිටියේ අදාළ නඩු භාණ්ඩ අංක 21, දොන් ඩේවිඩ් මාවත, උළු අම්බලම වත්ත කටුවාපිටිය, මීගමුව ලිපිනයේ පිහිටි නිවස පරීක්ෂා කිරීමේදී සොයා ගන්නා ලද බවය. එම සාක්ෂිකරු තවදුරටත් පවසා සිටියේ අදාළ නිවස කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් පල්ලියේ සිට කිලෝමීටර් 1, ½ ක් පමණ දුරින් පිහිටා තිබූ දෙමහල් නිවසක් බවත්, එම නිවසට යාබදව එකී නිවසේ හිමිකරුවකු වන ඒ.එම්.කේ. එමිල්ඩා සිල්වා යන තැනැත්තිය පදිංචි වී සිටි බවත්, එම තැනැත්තිය පදිංචි වී සිටි නිවසේ ලිපිනය 394/ඒ/23 උළු අම්බලම වත්ත, කටුවාපිටිය, මීගමුව බවත් ය.

තවද අදාළ දේපළ සොයා ගැනීමෙන් පසු එකී දේපළ කුවිතාන්සි ගත කර ඇති අතර, අදාළ කුවිතාන්සි පත් පැ.1012 සිට 1015 දක්වා ලකුණු කර ඇත. එම කුවිතාන්සි පත් වල නඩු භාණ්ඩ සොයා ගන්නා ලද ස්ථානය ලෙස සඳහන් වී ඇත්තේ, අංක 21, දොන් ඩේවිඩ් මාවත, උළුඅම්බලම වත්ත, කටුවාපිටිය, මීගමුව ලෙසය.

තවද, අදාළ භාණ්ඩ සොයා ගැනීමෙන් පසුව එකී භාණ්ඩ මීගමුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් අංක L 95839 දරණ නඩුව මඟින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එලෙස යොමු කරන අවස්ථාවේ අධිකරණය මඟින් රජයේ රස පරීක්ෂකවරයාට ලබා දී තිබෙන නියෝගය පැමිණිල්ල විසින් පැ.1488 ලෙස මෙම අධිකරණයේ

ලකුණු කර ඇති අතර, එම නියෝගයේ අදාළ නඩු භාණ්ඩ සොයා ගන්නා ලද ස්ථානය ලෙස සඳහන් වී ඇත්තේ අංක 394,ඒ/21 ලෙසටය. ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක, ධර්මරත්න මහත්මිය තමාගේ පැ.19999 දරණ රස පරීක්ෂක වාර්තාව සකස් කරන අවස්ථාවේදී මීගමුව මහේස්ත්‍රාත්වරයා විසින් තමා වෙත යොමු කරන ලද පැ.1488 දරණ නියෝගයේ සඳහන් කර තිබූ ලිපිනය එලෙසම තමාගේ වාර්තාවෙත් සඳහන් කර ඇති බවට පෙනී යයි. අදාළ භාණ්ඩ සොයා ගන්නා ලද ඉහත සඳහන් පැ.සා. 1714 කොල්ලුරේ මහතා විසින් සඳහන් කරන ලද ඒ.එම්.කේ. ඇමිල්ඩා සිල්වා යන අය මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් අතර, ඇය පවසා සිටියේ තමාගේ පදිංචි ලිපිනය 394/ඒ/23 බවත්, තමාගේ නිවසට යාබදව තමාගේ පුතා වන ජස්ටින් ප්‍රනාන්දු යන අයගේ නිවස පිහිටා තිබෙන බවත්, එය තට්ටු 02 කින් යුත් මහල් නිවසක් බවත්, 2019.04.21 වන දින පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සිදු වූ කාලයේදී තමාගේ පුතාට අයත් එම නිවස පැ.සා.829 නිෂාදි දසුන්මලී ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස්වරිය විසින් සකස් කරන ලද අංක 1710 දරණ, මෙම නඩුවේ පැ.816, පැ.817, පැ.818 ලෙස ලකුණු කර තිබෙන බදු ඔප්පුව මඟින් යම් පිරිසකට කුලියට ලබා දී තිබූ බවත්, පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් පසුව විමර්ශන නිළධාරීන් විසින් කරන ලද විමර්ශනයේදී අදාළ නිවස කුලියට ලබා දීම සම්බන්ධයෙන් සහ එම නිවස කුලියට ලබා ගත් මුබාරක් නැමැත්තා සම්බන්ධයෙන් විමර්ශන නිළධාරීන් තමාගෙන් ප්‍රශ්න කර ප්‍රකාශයක් ලබා

ගත් බවටත් පවසා ඇත. මෙම සාක්ෂිකාරිය සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ, කුලියට ලබා දුන් තමාගේ පුතාගේ නිවසේ අංකය තමාට නිවැරදිව මතක නැති බවයි. මෙම නිවස කුලී පදනම මත ලබා දුන් අවස්ථාවේදී ලියන ලද පැ.816, පැ.817, පැ.818 බදු ඔප්පුවේ අදාළ නිවසේ අංකයක් සඳහන් නොවන අතර, එම නිවස උළු අම්බලම නමින් හඳුන්වන නිවසක් බවට සඳහන් වේ. ඉහත සඳහන් සාක්ෂි පරීක්ෂා කර බලන විට පැ.1488 ලෙස ලකුණු කර තිබෙන මීගමුව මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයේ අදාළ නිවසේ අංකය ලෙස සඳහන් වන 394,ඒ,24 යන ලිපිනය නිවැරදි නොවන බව පෙනී යයි. තවද, එකී නිවසේ නිවැරදි අංකය අංක 21, දොන් ඩේවිඩ් මාවත, උළු අම්බලම වත්ත, කටුවාපිටිය විය යුතු බවද පෙනී යයි. කෙසේ වුවද, කටුවාපිටිය, දොන් ඩේවිඩ් මාවතේ පිහිටි මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.830 මේරි ජෙනට් එමිල්ඩා සිල්වා යන අයගේ පුතා වන ජස්ටින් ප්‍රනාන්දු යන අයගේ මහල් 02 කින් යුත් නිවසේ තිබී මෙකී භාණ්ඩ සොයා ගෙන ඇති බවට පැහැදිලිවම පෙනී යන අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු සැකයක් අධිකරණයට මතු වන්නේ නැත. මෙම නඩුවේ චූදිතයන් විසින්ද ඒ සම්බන්ධයෙන් කිසිදු හබ කිරීමක් සිදු කර නොමැත.

තවද 2019.04.21 වන දින සිදු වූ බෝම්භ පිපිරීම් හා සම්බන්ධ පශ්චාත් පිපුරුම් විමර්ශන වලදී පුපුරා ගිය පිපුරුම් උපක්‍රම වල යූරියා නයිට්‍රේට් අධිබල පුපුරන ද්‍රව්‍ය හා ඉහත සඳහන් වර්ගයේ ලෝහ බෝල

භාවිතා කර ඇති බව අනාවරණය වී ඇති බවට ද සිය මතය වන බවත් සාක්ෂිකාරිය වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් චූදිතයන් හරස් ප්‍රශ්න කිසිවක් අසා නොමැත.

පැ.සා.1952 පොලිස් සැරයන් 9865 මයුර විජේරත්න යන අය සාක්ෂි ලබා දෙමින් පවසා සිටියේ, 2019 වර්ෂය වන විට තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කළ බවත්, 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය අවට තිබූ සීසීටීවී (CCTV) දර්ශන පරීක්ෂා කරන ලෙසට තමාට පොලිස් අධිකාරි ජයසිංහ මහතා විසින් උපදෙස් ලබා දුන් බවත්, එම උපදෙස් පරිදි තමා 2019.04.22 වන දින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් පල්ලිය අවට සහ දොන් ඩේවිඩ් මාවත පාර දිගට තිබූ CCTV කැමරා පරීක්ෂා කළ බවත්, අදාළ පල්ලියේ සිට දොන් ඩේවිඩ් මාවතේ කිලෝමීටරයක් පමණ ගමන් කළ විට අංක 394/ඒ/3, දරණ ලිපිනයේ පිහිටි ශාන්ත රණසිංහ නමැති පුද්ගලයකුට අයත් නිවසේ තිබූ CCTV දර්ශන පරීක්ෂා කළ බවත්, එම දර්ශන තුළ 2019.04.21 වන දින සටහන් වී තිබූ දර්ශන පරීක්ෂා කිරීමේදී මීගමුව, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට බෝම්බ ප්‍රහාරය එල්ල කරන ලද සැකකරු එම අසල නිවසක සිට එම මාර්ගයේ ගමන්

ගන්නා දර්ශන නිරීක්ෂණය වූ බවත්, 2019.04.20 දිනැති CCTV දර්ශන පරීක්ෂා කරන විට WP-AAA 5600 අංක දරණ ත්‍රීරෝද රථයක් ගමන් කර ඇති බවත්, තවද, එදිනම BFN-5558 සහ BCQ-5304 අංකයන් දරණ යතුරු පැදි 02 ක් එම පාරේ ගමන් කර ඇති බවට නිරීක්ෂණය වූ බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. තවද 2019.04.21 දිනට පෙර දිනක PJ-4080 දරණ සුදු පාට බඩී වර්ගයේ වෑන් රථයක්ද එම මාර්ගයේ ගමන් කර ඇති බවට එම CCTV දර්ශන වලින් පෙනී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා විසින් 2019.04.22 වන දින නිරීක්ෂණය කරන ලද එම දර්ශන පෙළ සාක්ෂිකරුට නැවතත් අධිකරණයේ පෙන්වා සිටින ලද අතර, එම දර්ශන තමා විසින් පෙර සඳහන් කළ පරිදි නිරීක්ෂණය කරන ලද දර්ශන බවට අධිකරණයේ හඳුනා ගෙන ඇත. පැමිණිල්ල විසින් පැ.64 ලෙස ලකුණු කර තිබෙන සංයුක්ත තැටියේ අඩංගු එම දර්ශන අධිකරණයේ වෙන් වෙන්ව ලකුණු කර ඇත.

තවද, ඉන්පසුව කටුවාපිටිය දොන් ඩේවිඩ් මාවතේ අදාළ බෝම්බකරු රැඳී සිටි බවට කරුණු අනාවරණය කර ගත් බවත්, ඒ සම්බන්ධ වැඩිදුර විමර්ශනයට තමා සහභාගී වූ බවත්, එනම් එම බෝම්බකරු නැවතී සිටි බවට කරුණු අනාවරණය වූ අදාළ නිවස එම තැනැත්තන්ට කුලියට ලබා දීමේදී ලියන ලද අංක 1410 ඔප්පුවේ පිටපත් ප්‍රසිද්ධ නොතාරිස් නිශාන්ති ගුණසේකර මහත්මියගෙන් සහ මීගමුව ඉඩම්

රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත් බවත්, ඉන්පසුව එම පිටපත් අනුව කටුවාපිටිය දොන් ඩේවිඩ් මාවතේ පිහිටි අදාළ නිවස කුලියට ලබා ගැනීමේදී සාක්ෂිකරුවෙක් ලෙස මොහොමඩ් අමීර් මොහොමඩ් අසාම් නමින් අංක 751540811V දරණ ජාතික හැඳුනුම්පත් අංකය හිමි අයෙකු පෙනී සිට ඇති බවත්, එලෙස පෙනී සිටි පුද්ගලයා මෙම නඩුවේ සැකකරුවකු වන මොහොමඩ් රිස්කාන් නමැති අය ලෙසට කරුණු අනාවරණය වූ හෙයින් ඒ සම්බන්ධව වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම සඳහා 2019 අගෝස්තු 08 වන දින අදාළ සැකකරුගෙන් ආදර්ශන අත්සන් ලබා ගෙන එකී ආදර්ශ අත්සන් සමඟ ඉහත සඳහන් ඔප්පුවේ පිටපත් රජයේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවටත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 2,7,8,10,15,18 සහ 19 චූදිතයන් වෙනුවෙන් නීතීඥ කනිල් මද්දුමාගේ මහතා විසින් අසන ලද හරස් ප්‍රශ්න පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ, මෙම නඩුවේ 07 වන චූදිත මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් නමැති අයගේ ප්‍රකාශ තමා විසින් 2020.01.09 වන දින සටහන් කර ගෙන ඇති බවත්, ඔහුට සිංහල භාෂාව කතා කිරීමට හැකියාවක් තිබෙන බවත්, ඒ සම්බන්ධ සටහන්ද තමා විසින් එම ප්‍රකාශයේ අන්තර්ගත කර තිබෙන බවයි.

කටුවාපිටිය, දොන් ඩේවිඩ් මාවතේ, උළු අම්බලම වත්ත යන ලිපිනයේ පිහිටි ආරක්ෂිත ස්ථානයක් ලෙස පවත්වාගෙන ගොස් ඇති නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේ කටුවාපිටිය දොන් ඩේවිඩ් මාවතේ පිහිටි ආරක්ෂිත ස්ථානයක් වශයෙන් පවත්වාගෙන ගිය නිවසක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත්ව ඇත. මේ සම්බන්ධයෙන් පැ.සා. 810 මාතලගේ ජස්ටින් ජෝසප් ප්‍රනාන්දු , පැ.සා. 829 දසුන් මාලි ගුණසේකර සහ පැ.සා. 830 මේරි ජෙනට් එමල්ඩා සිල්වා යන අය සාක්ෂි ලබා දී ඇති අතර, මීගමුව කටුවාපිටියේ දොන් ඩේවිඩ් මාවතෙහි පිහිටා තිබූ නිවසක් මුබාරක් නැමැත්තාට බදු ගිවිසුමක් මත ලබා දුන් බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිවන අතර එසේම, මෙම සාක්ෂිකරු විසින්ද එම බදු ඔප්පුව සකස් කිරීමේදී නීතීඥවරිය ලෙස කටයුතු කරන ලද පැමිණිල්ලේ සාක්ෂි අංක 829 නිශාදි දසුන්මලී ගුණසේකර යන අය ඉදිරියේ අදාළ ලේඛන වලට අත්සන් තබා ඇති තැනැත්තා බවටද කරුණු හෙළිවෙයි. කෙසේ වෙතත් මෙම සාක්ෂිකරුගෙන් අදාළ බදු ඔප්පුව අත්සන් කිරීමට පැමිණි තැනැත්තන් අතරින් නිවස කුලියට ගත්තේ මුබාරක් නැමැත්තා බවට සහ එම මුබාරක් නැමැත්තා හෝටලයක සිදුවූ සිද්ධියකින් මියගිය බවට සාක්ෂි ලබා දී ඇත. කෙසේ වෙතත් අදාළ බදු ඔප්පුව අත්සන් කිරීම සඳහා පැමිණි එහි

සාක්ෂිකරුවන් ලෙස සිටි අනෙකුත් සාක්ෂිකරුවන් කවරෙක්ද යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂි තුළින් කරුණු කිසිවක් හෙළි නොවේ.

තවද, ඉදිරිපත් වී තිබෙන සාක්ෂි පරීක්ෂා කිරීමේදී අදාළ නිවස කුලියට ලබා දුන් අවස්ථාවේ සකස් කරන ලද පැ.816, පැ.817 සහ පැ.818 ලෙස ලකුණු කර ඇති බදු ඔප්පුවෙහි සහ එහි පිටපත්හි බදු දීමනාකාරිය ලෙසට මේරි ජෙනට් එමිල්ඩා සිල්වා නැමැත්තිය අත්සන් තබා ඇති බවත්, ජාතික හැඳුනුම්පත් අංක 873340312V හිමි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය විසින් එම දේපලෙහි පිහිටි නිවස බදු ගැනීම සිදු කර ඇති බවද පැහැදිලිව පෙනී යයි. මෙහිදී එම දේපල බදු ගැනීම සිදු කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය මෙම නඩුවට අදාළ ස්වයංඝාතක බෝම්බ ප්‍රහාර මාලාවට අදාළ සිද්ධියේදී කොළඹ පිහිටි හෝටලයේ බෝම්බ පිපිරීම සිදු කරන ලද තැනැත්තා ලෙසට හඳුනාගෙන ඇති මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයම බවට පෙනී යන අතර, ඒ බවට ඔහුගේ අංක 873340312V යන ජාතික හැඳුනුම්පතට අදාළ සූචි පත්‍රය වන පැ.814 ලෙස ලකුණු කර ඇති ලේඛනය තුළින්ද පෙර අවස්ථාවක පැ.801 ලෙස අධිකරණය ඉදිරියේ ලකුණු කර ඇති ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත තුළින්ද මැනවින් අධිකරණයට පෙනී යයි. ඒ අනුව බලන කල ඉහත කී මරාගෙන මැරෙන බෝම්බකරුවකු වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය මීගමුව කටුවාපිටිය

ප්‍රදේශයේ පිහිටි නිවසෙහි කුලී නිවැසියකු ලෙස සිට ඇත්තේ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයම බවට තවදුරටත් කරුණු සනාථ වේ. කෙසේ වෙතත් එම මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් සමඟ එම නිවස කුලියට ගැනීම සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා පැමිණි තැනැත්තාව මෙම සාක්ෂිකාරියට විවෘත අධිකරණයේදී හඳුනා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති අතර, කෙසේ වෙතත් එම තැනැත්තා නීතීඥවරිය ඉදිරියේ බදු ඔප්පුව අත්සන් තබන ලද අවස්ථාවේදී අත්සන් කිරීමට පැමිණි තැනැත්තකු බව සහ එම තැනැත්තා මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා සමඟම පැමිණි තැනැත්තකු බව සහ ඔවුන් මුස්ලිම් ජාතිකයන් බව පමණක් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියෙන් හෙළිවේ. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය තුළින් සැබවින්ම ඉහත සඳහන් නිවස මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නමැති පුද්ගලයාට කුලියට ලබා දී තිබීම සහ එම නිවසෙහි මුස්ලිම් කාන්තාවන් දෙදෙනෙක් සහ දරුවන් දෙදෙනෙක්ද සිට ඇති කරුණ පැහැදිලිව අධිකරණයට පෙනී යයි. තවද මෙම සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව 2019 අප්‍රේල් මස 21 වන දින ඇයද කටුවාපිටිය සාන්ත සෙබස්තියන් දේවස්ථානයේ පාස්කු ඉරු දින දේව මෙහෙයට සහභාගී වීම සඳහා පල්ලියට ගොස් සිටි අවස්ථාවේදී පල්ලියෙහි පිපිරීමක් සිදු වූ බවටද අධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් වී ඇත. කෙසේ වෙතත් එම නිවස බදු ගැනීම සිදු කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන තැනැත්තාගේ අනන්‍යතාවය

සම්බන්ධයෙන් සහ ඔහු සමඟ එම නිවසට බදු ඔප්පුව අත්සන් කිරීමට පැමිණි අනෙක් තැනැත්තා එනම් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා සමඟ පැමිණි ජාතික හැඳුනුම්පත් අංක 751540811 V ලෙස සඳහන් කර ඇති ජාතික හැඳුනුම්පත් අංකය හිමි තැනැත්තා මෙම අදාළ බදු ඔප්පුවෙහි අත්සන් තබන ලද පුද්ගලයන්ගේ සැබෑ අනන්‍යතාවය සම්බන්ධයෙන් නිශ්චිතව කරුණු පවසා සිටීමට මෙම සාක්ෂිකාරියට හැකියාවක් නොමැති බවද එසේම, එම කුලියට නිවස ලබා දීමේ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා සමඟ පැමිණ බදු ඔප්පුවට අත්සන් තැබූ අනෙක් තැනැත්තාව තමාට විවෘත අධිකරණය ඉදිරියේ හඳුනා ගැනීමට හැකියාවක් නොමැති බවට මෙම සාක්ෂිකාරිය පවසා ඇති කරුණුද සැලකිල්ලට ගැනීමේදී එලෙස මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නමැති පුද්ගලයා මෙම නඩුවට අදාළ මරාගෙන මැරෙන බෝම්බකරුවකු වන බැවින් සහ ඔහු හෝටලයේදී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරමින් මියගොස් සිටින තැනැත්තා බවට මේ වන විටත් අධිකරණය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් වී ඇති පසුබිමද සැලකිල්ලට ගැනීමේදී මීගමුව, කටුවාපිටිය දොන් ඩේවිඩ් මාවතේ පිහිටි අදාළ නිවසෙහි මරාගෙන මැරෙන බෝම්බකරුවකු වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා සහ ඔහු ඇතුළු කාන්තාවන් දෙදෙනෙක්ද සමඟ ළමුන් දෙදෙනෙක්ද තවත් පිරිමි තැනැත්තෙක්ද සිට ඇති කරුණු මැනවින් අධිකරණය ඉදිරියේ සනාථ වී ඇත.

තවද, මෙම පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව මෙම නිවස ආරක්ෂක නිළධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර ඇති අතර, එහි තිබී භාණ්ඩ තොගයක් සොයා ගෙන ඇත. එම භාණ්ඩ අතර ලෝහ බෝල තිබී ඇති අතර, එම ලෝහ බෝල මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ 2019.04.21 වන දින සිදුවූ බෝම්බ ප්‍රහාරයට යොදා ගෙන තිබෙන පිපුරුම් උපක්‍රමයන්හි අඩංගු ලෝහ බෝල වලට සමාන බවට පැ.සා.1433 සහකාර රස පරීක්ෂක ධර්මරත්න මහත්මියගේ සාක්ෂිය මඟින් හෙළි වී ඇත.

තවද, 1714 ප්‍රධාන පොලිස් පරීක්ෂක කොල්ලුරේ යන අය අධිකරණයේ සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, 2019.04.23 වන දින අංක 21, දොන් ඩේවිඩ් මාවත ,උළු අම්බලම වත්ත, කටුවාපිටිය, මීගමුව ලිපිනයේ පිහිටි මෙම නිවසට ගොස් ස්ථාන පරීක්ෂණය සිදු කිරීමේදී එම නිවසේ තිබී පිරිමි සහ ගැහැණු කිහිපදෙනෙකු පාවිච්චි කළ බවට අනුමාන කළ හැකි භාණ්ඩ හමු වූ බවත්, නාන කාමරයේ සහ පිටත තාප්පය අසළ කසල ගොඩක තිබී දත් බුරුසු 03 ක්, සනීපාරක්ෂක තුවා, කාන්තා තනපටයක්, ජීලෙට් රේසරයක්, පිරිමි පුද්ගලයෙකුගේ දිග කලිසමක්, එනජයිසර් බැටරියක් සහ සිම්පත නොමැති ජංගම දුරකථනයක් සොයා ගත් බවට සාක්ෂි ලබා දී ඇත. මෙම විමර්ශනයේදී මෙම නිවසින් සොයා ගන්නා ලද තවත් භාණ්ඩ කීපයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත DNA පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කර අති අතර, පැ.සා.1436

විශ්‍රාමික අතිරේක ආණ්ඩුවේ රස පරීක්ෂක වී.ජේ. බණ්ඩාරනායක යන අයගේ සාක්ෂිය අනුව එලෙස එම නිවසින් සොයා ගත් භාණ්ඩ අතරින් පිරිමි පුද්ගලයෙකුගේ දිග කලිසමක සහ සරමක අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අයගේ DNA ඇලීල අන්තර්ගත වී තිබූ බවටත්, එම නිවසින් සොයා ගන්නා ලද දත් බුරුසුවක හයාතු මොහොම්මදු අහමදු මිල්හාන් යන අයගේ DNA ඇලීල සොයා ගත් බවටත් සාක්ෂි මඟින් තහවුරු වී ඇත.

තවද, ඉදිරිපත් වී තිබෙන සාක්ෂි මඟින් මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය විසින් එම නිවස කුලියට ලබා ගැනීමෙන් පසුව එම නිවසට 2019.04.21 වන දින සිදුවූ පාස්කු ප්‍රහාරය සඳහා භාවිතා කර ගන්නා ලද පිපිරුම් උපකරණ සෑදීමට උපයෝගී කර ගන්නා ලද ලෝහ බෝල වලට සමාන ලෝහ බෝල ගෙන ඇති බවත්, එය යමෙකු විසින් පරිහරණය කර ඇති බවටත් නිගමනය කළහැකිය. තවද, මෙම නිවසේ එකී මුබාරක් සමඟ මෙම නඩුවේ 03 වන චූදිත වන හයාතු මොහොම්මදු අහමදු මිල්හාන් සහ 2019.04.21 වන දින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තූන් යන අයද නවාතැන් ගෙන ඇති බවට පෙනී යයි. මෙම නිවස මෙකී පුද්ගලයන් විසින් ආරක්ෂිත නිවසක් ලෙස භාවිතා කර ඇති බව සාක්ෂි මඟින් මනාව තහවුරු වේ.

අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර්-02

දරණ ලිපිනයේ පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 2286 ආදම් බාවා රිස්වානා නමැති සාක්ෂිකාරිය නින්දවූර් ප්‍රදේශයේ පදිංචි තැනැත්තියක් වන අතර, ඇය අධිකරණයට සාක්ෂි ලබා දෙමින් පවසා සිටියේ, තමා අංක 213/බී, මුස්තකීම් පල්ලිය වීදියේ, නින්දවූර් 02හි පිහිටි නිවසේ ඇය සහ ඇගේ ස්වාමිපුරුෂයා පදිංචිව සිටින බවත්, ඇගේ නිවස අසල ඇති නිවසේ ඇගේ වැඩිමහල් සහෝදරිය වන සිත්තිනා උම්මා නැමැත්තිය පදිංචිව සිටින බවත්, තමාට වැඩිමහල් සහෝදරයෙක් සිටින බවත්, ඔහුගේ නම ආදම් බාවා ෆවුස්ඩීන් බවටත් පවසා ඇත. තමාගේ අක්කාගේ දියණිය විවාහ වූ පසු තමාගේ අක්කාද දියණියගේ නිවසේ පදිංචියට ගිය බවත්, තමාගේ නිවස අසලම තිබූ අක්කාගේ නිවස ඒ වන විට වසා දමා තිබූ බවත්, එම නිවසෙහි යතුර තමා සතුව තිබූ බවටත් පවසා ඇති අතර 2019 අප්‍රේල් මාසයේ 21 වන දිනට දින පහකට හයකට ප්‍රථමයෙන් තමාගේ අයියා වන ආදම් බාවා ෆවුස්ඩීන් යන අය පැමිණ තමාගේ අක්කාගේ නිවස කුලියට ඉල්ලන්න කට්ටියක් ඇවිත් ඉන්නවා යැයි තමාට පැවසූ බවත්, ඉන්පසු තමා එම නිවසෙහි යතුර නිවස කුලියට ගැනීමට පැමිණි අයට ලබා දුන් බවත්, එම අවස්ථාවේ පිරිමි තැනැත්තන් තුන් දෙනෙකු පැමිණ සිටි බවත්, තමාගෙන් යතුරු ඉල්ලා සිටියේ තමාගේ අයියා බවත්, තමා යතුර ඔහුට දුන් පසු එම පැමිණි තිදෙනාට යතුර ලබා දුන් බවත්, එම පැමිණි අයගෙන් එක්

අයෙක් මිටි අයෙක් බවත්, අනිත් පුද්ගලයන් තරුණ අය බවටත් පවසා ඇත. එම පුද්ගලයන් තිදෙනා එම නිවසට පැමිණියාට පසු තමා ඔවුන් සම්බන්ධයෙන් එතරම් විපරම් කිරීමක් කළේ නැති බවත්, එක් දිනක් තමා ඔවුන් තුන් දෙනාම පයින් යනවා දුටු බවටත් සාක්ෂිකාරිය විසින් පවසා ඇත. එසේම, එම පුද්ගලයන් තිදෙනා තමාට පවසා සිටියේ ඔවුන් ඔලුවිල් විශ්ව විද්‍යාලයේ සිටින බවත් ඔවුන්ට නිවාඩු ලැබී තිබෙනවා යැයි පවසා ඔවුන් දවස් කීපයකින් නැවත එන්නම් යැයි පවසා 2019 අප්‍රේල් මස 22 වන දින එනම් බෝම්බ පිපිරුණු දිනට පසු දිනම එම කුලී නිවසින් පිටත්වී ගිය බවත්, එදින ඔවුන් පිටත්වී ගියේ රිදී පාට බොක්ස් මාදිලියේ කුඩා වෑන් රථයක් වැනි වාහනයකින් බවටත් පවසා ඇත. එසේම, එම පුද්ගලයන් තමාගේ අක්කාගේ නිවසට කුලියට පැමිණෙන විට නිවසට මුළුතැන්ගෙට අවශ්‍ය ගෑස් සිලින්ඩරය, ගෑස් ලිප වැනි ආහාර පිසීමට භාවිතා කරන දේවල් රැගෙන ආ බවත්, ඔවුන් එම නිවසේ සිටින අතරතුර වෙනත් කවුරු හෝ ඔවුන්ව මුණගැසීමට ආවාද යන්න තමා සොයා නොබැලූ බවත් පවසා ඇත. 2019.04.22 දින තමා නිවස තුළ සිටින විට එම නිවසේ කුලියට සිටි අයගෙන් එක් අයෙකු පැමිණ යතුර ලබා දුන් බවත්, වෑන් එක තුළ සිටි අනිත් පුද්ගලයන් කවුද යන්න තමා නොදුටු බවටත් පවසා ඇත.

තවද, එම පුද්ගලයන් තමාගේ අක්කාගේ නිවස කුලියට ලබා ගැනීම සඳහා පළමුවෙන්ම පැමිණියේ වාහනයකින් බවටත් සාක්ෂිකාරිය විසින් පවසා ඇත. ඔවුන් මුලින්ම නිවසට පැමිණි දින තමාගේ අයියා යතුරු

පැදියෙන් පැමිණි බවත්, එම නිවසට කුලියට පැමිණි පුද්ගලයන් තිදෙනා වාහනයකින් පැමිණි බවත්, වාහනය පදවාගෙන පැමිණි තැනැත්තා ඔවුන්ව එම නිවසින් බස්සවා පිටත්වී ගිය බවත්, එලෙස වාහනයෙන් පිටත්වී ගිය තැනැත්තා සාමාන්‍යයෙන් රැවුල කොටට කපා සිටි පුද්ගලයෙක් බවත්, ඔහුගේ හිසේ කොණ්ඩය තිබුණු බවත්, අවුරුදු 30ක 35ක පෙනුමක් තිබූ තැනැත්තෙක් බවටත් සාක්ෂිකාරිය විසින් පවසා ඇත. පසුව ඔවුන් නිවසට කුලියට එන විට රැගෙන එන ලද ගෑස් සිලින්ඩරය ඇතුළු බඩු බාහිරාදිය ඔවුන් යන විට රැගෙන නොගිය බවත්, පසුව පොලිසියේ සහ හමුදාවේ විශාල පිරිසක් එම නිවසට පැමිණි බවත්, එක් පුද්ගලයෙකුගේ අතට මාංචු දමා රැගෙන ආ බවත්, එම තැනැත්තා නිවස ඉදිරිපිට සිටි බවත්, තමා ඔහුව ඊට පෙර දැක නොමැති තැනැත්තෙකු බවටත් සාක්ෂිකාරිය පවසා ඇත. එසේම එම කුලියට දුන් නිවස වටා තාප්පයක් තිබෙන පරණ නිවසක් බවත්, එම ඉඩම ඇතුළේම තමාගේ නිවසද පිහිටා තිබුණු බවත් නිවෙස් දෙකටම එකම ගේට්ටුවෙන් ඇතුලු වීමට තිබූ බවටත් සාක්ෂිකාරිය පවසා ඇත. තවද, ඔවුන් සිටි එම නිවස කාමර තුනක් සහ ශාලාවන් දෙකක්ද කුස්සියක් සහ වැසිකිළියක්ද තිබුණු නිවසක් බවට සාක්ෂිකාරිය විසින් පවසා ඇති අතර එලෙස එම නිවස කුලියට ලබා ගැනීමට පැමිණි පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම සඳහා ඔවුන්ගේ කිසිදු දුරකථන අංකයක් හෝ තමාට ලබා නොදුන් බවටත් සාක්ෂිකාරිය පවසා ඇත.

මෙම සාක්ෂිකාරියගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි තුළින් පෙනී යන්නේ 2019 අප්‍රේල් මස 21 වන දින කොළඹ ප්‍රදේශයේ බෝම්බ පිපිරීම සිදුවූ දිනට දින පහකට හෝ හයකට ප්‍රථමයෙන් තරුණ පුද්ගලයන් තිදෙනෙකු වාහනයකින් පැමිණ මෙම සාක්ෂිකාරියගේ වැඩිමහල් සහෝදරියගේ නින්දවූර් පිහිටි නිවසක් කුලියට ලබාගෙන සිට ඇති බව සහ 2019.04.21 දින බෝම්බ පිපිරූ දිනට පසු දිනම එලෙස පැමිණි පුද්ගලයින් එම තරුණ පුද්ගලයින් තිදෙනා බොක්ස් මාදිලියේ රිදී පාට කුඩා වෑන් රථයක නැගී පිටත්වී ගිය පසු යලි මෙම සාක්ෂිකාරියගේ වැඩිමහල් සහෝදරියගේ ඉහතකී නිවසට පැමිණ නැති අතර ඇගේ සාක්ෂියට අනුව එම පුද්ගලයන් නිවසින් පිටවී යාමෙන් පසු අවස්ථාවක පොලීසිය සහ හමුදාව පැමිණ එම නිවස පරික්ෂා කිරීමක් කර ඇති අතර එම අවස්ථාවේදී මාංචු දමා එක් පුද්ගලයෙකුද පොලීසිය සහ හමුදාව සමඟ කැඳවාගෙන පැමිණ ඔහුවද නිවස ඉදිරිපිටම සිටි බවට ඇය දැක ඇත. කෙසේ වෙතත් එලෙස මාංචු දමා රැගෙනවිත් සිටි තැනැත්තා කවරෙක්ද යන්න ඇය එදිනට පෙර දැක නැති අතර මෙම සාක්ෂිකාරියගේ සමස්ත සාක්ෂි මනාව පරික්ෂා කර විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන්නේ අංක 214 මුස්තකීම් පල්ලිය පාර නින්දවූර් 02 නමැති ලිපිනය තිබූ මෙම සාක්ෂිකාරියගේ වැඩිමහල් සහෝදරියට අයත්ව තිබූ ඒ වන විට වසා දමා තිබූ නිවස පුද්ගලයන් එනම් තරුණ වයසේ

පුද්ගලයන් තිදෙනෙකු විසින් මෙලෙස කුලියට ලබාගෙන සිට ඇති බව සහ එම පුද්ගලයන් ඔවුන් නැගෙනහිර විශ්ව විද්‍යාලයේ එනම් ඔලුවිල් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා බවට පවසා ඇති අතර එම පුද්ගලයන් තිදෙනාගේ අනන්‍යතාවයද සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂීන් කිසිදු කරුණක් ඉදිරිපත් නොවේ. එසේම, පසුව එම නිවසට හමුදාව සහ පොලීසිය නිලධාරීන් රාශියක් පැමිණීම සහ ඔවුන් සමඟ අත්වලට මාංචු දමා සිටි පිරිමි තැනැත්තෙකුද රැගෙනවිත් සිට ඇති අතර එම තැනැත්තා කවරෙක්ද යන්න හෝ මෙම සාක්ෂිකාරියට දැනීමක් තිබී නැත. ඒ අනුව සමස්තයක් ලෙස ගෙන බැලීමේදී මෙම සාක්ෂිකාරියගේ සාක්ෂීන් ගරු අධිකරණයේ සිටින කිසිදු චූදිතයෙකු සම්බන්ධයෙන් කිසිදු කරුණක් ඉදිරිපත් වී නැත.

සාක්ෂි අංක 2241 ආදම් බාවා සිත්තියා උම්මා **යන** සාක්ෂිකාරිය විසින් සාක්ෂි ලබා දෙමින් ඇය අංක 214, දෙවන හරස් වීදිය, මුස්තකීම් පල්ලිය පාරේ නින්දවූර හි පදිංචි වී සිටින බවට පවසා ඇති අතර ඇය 2019 වසරේ තමාගේ දුවගේ නිවසේ සිටි බවත් ඊට පෙර තමා සිටි අංක 214 මුස්තකීම් පල්ලිය පාර නින්දවූර් 02 ලිපිනයේ තිබුණු නිවස නිකන් තිබුණු බවත් එම නිවස අසලම තමාගේ නංගී වන රිස්වානා යන අයගේ නිවස තිබුණු බවත් තමාගේ ඉහතකී අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර 02 ලිපිනයේ තිබුණු නිවසෙහි යතුර තමා නංගිට දී තමා සිටියේ තමාගේ දියණියගේ නිවසේ බවත් තමාගේ පෙරකී අංක 214 දරන නිවසෙහි නිවස

බලා ගැනීම් සහ එහි ලයිට් දැමීම් වැනි දේවල් කළේ තමාගේ නංගී රිස්වානා විසින් බවත් ඇය පවසා ඇත.

2019 අප්‍රේල් මාසේ 21 වන දින වන විට එම නිවස යම් පුද්ගලයන් කීප දෙනෙකුට කුලියට ලබා දී තිබුණු බවත් තමාගේ මල්ලී පැමිණ නිකන් වහලා තියෙන්නේ මේ නිවස කුලියට දෙමු යැයි පැවසූ නිසා තමා එලෙස එම නිවස කුලියට දෙන ලෙසට දැනුම් දුන් බවත්, ඔවුන් එම නිවසේ දින තුනක් සිට රැඳී සිට ගොස් තිබුණු බවත් ඔවුන් කවුද යන්න තමා දැක්කේ හෝ නැති බවත් ඇය පවසා ඇත. එසේ නම් එම කාලය වන විට තමාගේ පුතා වන අබ්දුල් රහීම් මොහොමඩ් ෆස්මීර් යන අය පිටපළාතක රැකියාවක් කළ බවත්, එදින එනම් බෝම්බ ප්‍රහාරය සිදුවූ 2019.04.21 වන දින ඇගේ පුතා තමා සහ තමාගේ දියණිය සිටි නිවසට ඇවිත් සිටි බවත් එහි තමා ඉහතකී නිවස තමාගේ ඉහතකී නිවස තමාගේ මල්ලී පැමිණ නිකන් වසා තිබුණු නිසා කුලියට දෙන ලෙසට තමා පැවසූ බවට තමා තමාගේ පුතාට දැනුම් දුන් බවත් තමාගේ පුතා එදින හෝ ඊට පෙර දින එම කුලියට ගත් පුද්ගලයන් සිටි නිවසට ගිහින් ආ බවත්, තමා එම කුලියට ගත් අය සිටි නිවසට ගියේ නැති බවත් සාක්ෂිකාරිය පවසා ඇත.

මෙම සාක්ෂිකාරියගෙන් මෙම නඩුවේ කිසිදු චූදිතයෙකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට අධිකරණයට පවසා ඇත. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි ඇගයීමට ලක්

කිරීමේදී ඇගේ සාක්ෂි තුළින් ඉස්මතු වන එකම කරුණ වන්නේ 2019.04.21 දින වන විට ඇගේ අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 ලිපිනයේ පිහිටි නිවස ඇගේ මල්ලී විසින් පැමිණ කුලියට දෙන ලෙසට කරන ලද ඉල්ලීම ප්‍රකාරව එම නිවස එම නිවසේ යතුර තමාගේ නංගී වන රිස්වානා විසින් කුලියට ගත් පුද්ගලයන්ට ලබා දී ඇති බව සහ 2019.04.21 දින පාස්කු බෝම්බ ප්‍රහාරයන් සිදුවූ දිනයේ සවස භාගයේ එම මෙම සාක්ෂිකාරියගේ පුතා වන පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අය ඇගේ නිවසේ සිට ඇති බව සහ එම තැනැත්තා කුලියට නිවස ගත් පුද්ගලයන් සිටි ඉහතකී අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 ලිපිනයේ පිහිටි නිවසට සැබැවින්ම ගොස් ඇති බවට ඇගේ සාක්ෂි තුළින් හෙළි වේ.

මෙම සාක්ෂිකාරිය ලබා දුන් සාක්ෂිය සහ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් ඇගේ සහෝදරිය වන ආදම් බාවා රිස්වානා යන අයගේ සාක්ෂියද එසේම, ඇගේ පුත්‍රයා වන පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අයගේ සාක්ෂියද අතර ඒකාකාරී භාවයක් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි තුළින් මෙම නඩුවේ කිසිදු චූදිතයෙකුගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් හෝ මෙම චූදිතයන්ට එරෙහිව කිසිදු සාක්ෂියක් ඇගේ සාක්ෂි තුළින් ඉදිරිපත් වී නැත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැය 2287 ආදම් බාවා ෆවුස්දීන් නමැති සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් ආදම් බාවා රිස්වානා එනම් පැ.සා.2286 සහ පැ.සා.2241 ආදම් බාවා සිත්තියා යන අයගේ සහෝදරයා වන අතර පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අයගේ මාමා වේ. ඔහුගේ සාක්ෂියට අනුව 2019 වර්ෂයේ වන විට තමාගේ නංගී වන ආදම් බාවා සිත්තිනා උම්මා නැමැත්තියට අයිති නිවසක් තමාගේ අනිත් නංගී වන රිස්වානා යන අයගේ නිවස ළඟ තිබුණු බවත් තමාගේ අනිත් නංගී වන එකී රිස්වානා යන අය විසින් එම වසා දමා තිබූ එම නිවසෙහි ලයිට් දැමීම සහ එම නිවසෙහි යතුරු භාරගෙන සිටීම ආදී සිදුවූ බවත් සාක්ෂිකරු පවසා ඇත. ඔහු පවසා ඇත්තේ 2019 අප්‍රේල් මාස 7 වන දින පුද්ගලයන් දෙදෙනෙක් තමාගේ නිවසට පැමිණි බවත් තමාගේ නිවසේ සිට තමා පෙර සඳහන් කරන ලද තමාගේ නංගීගේ නිවසට සැතැපුමක පමණ දුර තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇති අතර එදින තමාගේ නිවසට පැමිණි පුද්ගලයන් දෙදෙනාගෙන් එක්කෙනෙක් තමාගේ වයසේ වැනි බවත් එම තැනැත්තා මවුලවී කෙනෙක් යැයි එම තැනැත්තා පවසා සිටි බවත් ඔහු සුදු දිග ඇඳුමක් ඇඳගෙන සිටි බවත් ඔහු සමග පැමිණි අනිත් තැනැත්තා සරමක් ඇඳලා සිටි බවත් ඔහු තරමක් දුරට තරුණ පුද්ගලයෙක් බවත් ඔවුන් දෙදෙනා එදින, එනම් අප්‍රේල් මස 7 වන දින සවස තුනට පමණ එලෙස යතුරු පැදියකින් පැමිණි බවත් ඔවුන් පැමිණ නිවසක් කුලියට ගන්න තියෙනවාදැයි ඔවුන් තමාගෙන් විමසා සිටි බවත්

එම අවස්ථාවේදී තමා තමාගේ නංගීගේ නිවස සම්බන්ධයෙන් පවසන විට එම නිවස පෙන්නන්න පුළුවන්දැයි ඔවුන් විමසූ බවත් ඉන්පසු තමා සවස තුනට පමණ එම ස්ථානයට ගොස් එම නිවස පෙන්නූ බවත් එම ස්ථානයට කැමතියි. ඔවුන් පැවසූ බවත් දවස් පහකට පස්සේ එන්නම් යැයි පවසා ඔවුන් පිටවී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත.

එසේම, එම අවස්ථාවේදී ඔවුන් පවසා සිටියේ මෙම නිවස ලබා ගන්නේ කිසිදු ආර්ථික පහසුකමක් නැති ළමයින්ට ඉගැන්වීම සිදු කිරීමට බවත් ඔවුන් එහි නතර වී ආගමික ඉගැන්වීම් කටයුතු සිදු කරන බවත් කිසිදු ආර්ථික පහසුකමක් නැති ළමයි හතර පස් දෙනෙක් එතනට පැමිණෙන බවටත් ඔවුන් දෙදෙනාට එම තැනැත්තන් තමාට පැවසූ බවත් එසේම, මේ කටයුත්තෙන් ඔබලටත් පිනක් ලැබේ යැයි ඔවුන් පවසා සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත.

ඒ වන විට තමාගේ වයස අවුරුදු 55ක් පමණ වගේ ඇති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමා පවසා සිටි පුද්ගලයන්ගෙන් තමාගේ වයසේ මෙන් සිටි පුද්ගලයා රැවුල කොටට කපලා සිටි බවත් කොණ්ඩෙත් කොටට කපලා සිටි බවත් තමා ඔහුව දැක්කේ එදින පමණක් බවත් ඉන්පසු තමා ඔහුව දැක්කේ නැති බවත් පවසා ඇත. එසේම, තමාට ඇස් පෙනීමේ දුර්වලතාවයකුත් තිබුණු බවත් මේ වන විට වසර අටක් ගත වෙලා තිබුණු බවත් ඒ අනුව තමාට එම තැනැත්තාව නැවත දැක්කොත් හඳුනා ගන්න

අපහසු බවත් සාක්ෂිකරු පවසා ඇත.එසේම, තමාට ඒ කාලයේ සිටම ඇස් පෙනීමේ දුර්වලතාවය තිබී ඇහේ ශල්‍යකර්මයක්ද සිදු කර තිබුණු බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, තමා එදින හමුවූ පුද්ගලයා ගැන විස්තර කර සිටියද පැහැදිලිව එම තැනැත්තාව පෙන්නා සිටීමට තමාට අපහසුතාවයක් තිබුණු බවට සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ තමාට අඩි හතරක් පමණ ආසන්නයට ගිහිල්ලා බැලුවොත් එම තැනැත්තාව හඳුනා ගන්න පුළුවන් වේ යැයි සාක්ෂිකරු පවසා ඇත. ඒ අනුව තමාට එලෙස පුද්ගලයන්ගේ ළඟටම ගිහිල්ලා බලලා තමා පැවසූ තැනැත්තා එහි සිටිනවාද යන්න පෙන්නා සිටීමට තමාට කිසිඳු ප්‍රශ්නයක් නැති බවට සාක්ෂිකරු පවසා ඇති අතර ඒ අනුව සාක්ෂිකරුට සාක්ෂි කූඩුවෙන් බැස මෙම නඩුවේ චූදිතයන් අසුන්ගෙන සිටි ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීමට ඊට අවස්ථාව ලබා දෙන අතර එලෙස ගොස් පරීක්ෂා කර බලා සාක්ෂිකරු යළි සාක්ෂි කූඩුවට පැමිණ ප්‍රතිඥා දෙමින් පවසා ඇත්තේ තමාට හඳුනා ගැනීමට අපහසු බවත් තමාගේ ඇස් පෙනීමේ දුර්වලතාවය නිසා තමාට එලෙස හඳුනා ගන්න බැරි බවයි.

සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා පවසා සිටි පරිදි එම පුද්ගලයන් එලෙස තමා මුණගැසී තමා විසින් පෙන්නා සිටි නිවස කුලියට ගැනීමට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් දින පහකට පමණ පසු ඔවුන් තමාට දුරකථන ඇමතුමක් ලබා දී අපි පැමිණ ඉන්නවා අපිට ඇවිල්ලා නිවස පෙන්නන්න යැයි පවසා සිටි බවත් එම වෙලාවේ ඔවුන් කාර් රථයකින්

පැමිණ සිටි බවත් පෙර දින ඔවුන් තමාගේ දුරකථන අංකය ඉල්ලා ගෙන ගොස් තිබුණු නිසා තමාට එලෙස ගෙදර පෙන්නන්න එන්න යැයි කිව්ව විට තමා එම ඔවුන් සිටි ස්ථානයට ගිය විට එම පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයෙක් කාර් රථය පදවාගෙන ආ බවත් අනිත් දෙදෙනා වාඩි වෙලා සිටි බවත් පසුව තමා ඔවුන් එම ස්ථානයට කැඳවාගෙන ගිය බවත් තමා මුලින් යතුරු පැදියෙන් ගිය බවත් ඔවුන් තමන්ගේ පසුපසින් කාර් රථයෙන් පැමිණි බවත් ඉන්පසු තමාගේ නංගී කෙනෙක් වන රිස්වානා යන අයගේ ගෙදර තිබූ යතුර ඉල්ලා, ඇය විසින් යතුර රැගෙනවිත් එම කුලියට දීමට කතා කරගත් නිවසේ දොර විවෘත කර දුන් බවත් ඉන්පසු කාර් රථයෙන් පැමිණි පුද්ගලයන් දෙදෙනා එම නිවස අසලට පැමිණ සිටි බවත් ඔවුන් අවුරුදු 21, 22, 23 වැනි වයස් වල අය බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, එම පුද්ගලයන් දෙදෙනා කුරානය පාරායනය කරමින් සිටිනවා තමා දැක්ක බවත් තමා ටික වෙලාවක් ඒ දෙස බලාගෙන සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. එම ස්තානයේ මවුලවී කෙනෙකුත් සිටිනවා යැයි කිව්ව නිසා ඒ ඇත්තක් දැයි බලන්න තමා මඳ වෙලාවක් එම ස්ථානයේ බලාගෙන සිටින විට එම අය කුරානය රැගෙන එය කියවනවා දැක්ක බවත් ඉන්පසු තමා එතනින් පිටවී ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම, ඔවුන් පැමිණෙන විට පොත්පත් රැගෙන ආ බවත් වෙනත් භාණ්ඩ රැගෙන එනවා තමා දැක්කේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඉන්පසු තමා තමාගේ ගොවිතැන් කටයුතු කරමින් සිටි බවත් තමා එම ස්ථානයට හෝ

නැවත ගියේ නැති බවත් තමා එම පුද්ගලයන්ව නැවත දැක්කේ නැති බවත් එම නැවතී සිටි පුද්ගලයන් නිවස වහලා එම ස්ථානයෙන් දවස් පහකට පසු පිටවෙලා ගියා යැයි තමාගේ නංගී තමාට පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත. ඔවුන් එම නිවස කුලියට ගැනීම සම්බන්ධයෙන් එක රුපියලක්වත් තමාලාට දුන්නේ නැති බවත් තමාලා මුලින් මුදල් ගැන කතා කළේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන්ද මෙම නඩුවේ සියලුම චූදිතයන් විසින් හරස් ප්‍රශ්න ඇසීමක් නොමැති බවට අවසර ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.2241 ආදම් බාවා සිත්තියා සහ පැ.සා.2286 ආදම් බාවා රිස්වානා යන අය සහ පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අය විසින් සාක්ෂි ලබා දෙමින් පවසා සිටි නිවස එනම් මෙම සාක්ෂිකරුගේ සහෝදරියකට අයිතිව සිටි වූ අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 යන ස්ථානයේ පිහිටි නිවස කුලියට ගැනීමට පුද්ගලයන් දෙදෙනෙකු පැමිණ සිටීම සම්බන්ධයෙන් සාක්ෂි හෙළි වන අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව එම නිවස කුලියට ගැනීම සඳහා මෙම සාක්ෂිකරු සමග 2019 අප්‍රේල් මස 7 වන දින කාර් රථයකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් අයෙක් තමා මවුලවී කෙනෙක් යැයි පැවසූ බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවලින් හෙළි වන අතර එම පුද්ගලයන් දෙදෙනා නොව තරුණ වයසේ එනම් අවුරුදු 21, 22, 23 වයස් වල තරුණ පුද්ගලයන් දෙදෙනෙකු එලෙස එම නිවසේ

කුලියට නැවතී සිටි බවත් ඔවුන් පැමිණියේ දෙවැනි දවසේ බවත් පවසා ඇති අතර ඒ අනුව එම පුද්ගලයන් දෙදෙනාට මෙම නිවස කුලියට ලබා ගැනීම සඳහා එම නිවස ගැන පරීක්ෂා කිරීමට 2019 අප්‍රේල් මස 7 වන දින යතුරු පැදියකින් පැමිණි පුද්ගලයන් දෙදෙනා හෝ ඉන්පසුව දින පහකට පමණ පසු කාර් රථයකින් පැමිණි තුන් දෙනෙකුගෙන් එක් අයෙක් කාර් රථය පදවාගෙන පැමිණ ඇති බව සහ අනිත් දෙදෙනා කාර් රථයේ වාඩි වී සිට ඇති බවද හෙළි වන අතර එලෙස පැමිණි එනම්, එලෙස දෙවැනි අවස්ථාවේ පැමිණි තුන් දෙනා කුරානය කියවමින් සිටිනවා එම සාක්ෂිකරු දැක ඇති ඇත. එදිනට පසු මෙම සාක්ෂිකරු එම නිවසට යළි ගොස් නැති බැවින් එම නිවසෙහි ඉන්පසු සිදුවූයේ කුමක්ද යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුට දැනීමක් තිබී නොමැත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි පවසා සිටි පරිදි 2019 අප්‍රේල් මස 7 වන දින යතුරු පැදියෙන් පැමිණි පුද්ගලයන්ගේ හැඩරුව සහ විස්තර මෙම සාක්ෂිකරු විසින් අධිකරණයට පවසා ඇති අතර ඔවුන්ට එම අයව යළි දැක්කොත් හඳුනා ගැනීමට අපහසු බවත් මෙම සාක්ෂිකරුගේ ඇසෙහි ශල්‍යකර්මයක් සිදු කර තිබුණු බවත් එසේම, එම සිද්ධි සිදුවී වසර අටක් පමණ කාලයක් ගත වී ඇති බැවින් තමාට හරියාකාරව හඳුනා ගැනීමට බැරි බවට මෙම සාක්ෂිකරු පවසා ඇති අතර ඔහු සාක්ෂි කූඩුවෙන් බැස අඩි තුන හතරක් ළඟට ගියොත් සමහර විට හඳුනා ගැනීමට උත්සාහ කිරීම හැකි වේ යැයි පවසා සාක්ෂිකරු සාක්ෂි කූඩුවෙන් බැස චූදිතයන් සිටින ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීමක්

කළද මෙම සාක්ෂිකරුට හඳුනා ගැනීමට අපහසු බවට අධිකරණයට පවසා ඇති පසුබිම තුළ සැබැවින්ම එම සාක්ෂිකරුට 2019 අප්‍රේල් මස 7 වන දින කුලී නිවසක් ලබා ගැනීම සඳහා යතුරු පැදියකින් පැමිණි මෙම සාක්ෂිකරු සමග කතා කරන ලද තැනැත්තන්ව කවරෙක්ද යන්න සම්බන්ධයෙන් මනා මතකයක් තිබී නොමැති බවද පෙනී යයි.

ඒ අනුව බලන කල මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළි වන්නේ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.2286 ආදම් බාවා රිස්වානා සහ පැ.සා.2241 ආදම් බාවා සිත්තියා යන සාක්ෂිකරුවන් දෙදෙනාගේ සහෝදරයෙකු වන මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂියට ට අනුව 2019 අප්‍රේල් මස 7 වන දිනට දින පහකට පමණ පසු පැමිණි තරුණ පුද්ගලයන් දෙදෙනෙකු අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 යන ලිපිනයේ පිහිටි මෙම සාක්ෂිකරුගේ සහෝදරියගේ නිවසෙහි කුලියට නවාතැන් ගෙන ඇති බව පමණක් හෙළි වන අතර එලෙස නවාතැන් ගෙන සිටි පුද්ගලයන් තිදෙනාගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් කිසිදු කරුණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළි වන්නේ නැත. කෙසේ වෙතත් ඉහතකී අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 යන ලිපිනයෙහි තිබූ නිවසෙහි අවුරුදු 21, 22, 23 වයසේ තරුණ පුද්ගලයන් තිදෙනෙකු දින කීපයක් නැවතී සිට ඔවුන් ඉන් පිටවී ගොස් තිබී ඇති බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින්ද මැනවින් සනාථ වේ. කෙසේ වෙතත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් මෙම

අධිකරණයේ සිටින කිසිදු චූදිතයෙකු සම්බන්ධයෙන් සාක්ෂි කිසිවක් ඉදිරිපත් වී නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2242 අබ්දුල් රහීම් මොහම්මද් ෆස්මීර් ගැන සාක්ෂිකරු මඩකලපුව වන සංරක්ෂණ කාර්යාලයේ සේවය කරන තැනැත්තෙක් බවට සාක්ෂි ලබා දී ඇති අතර ඔහු අධිකරණයට සාක්ෂි ලබා දුන් අවස්ථාව වන විට එම රැකියාව වසර 07 කාලයක සිට කරන බවට පවසා ඇත. එසේම, ඔහු එම රැකියාව 2018.11.01 දින ආරම්භ කළ බවට පවසා ඇති අතර ඔහු පදිංචිව සිටියේ නින්දවූර් 02 හි පිහිටි අංක 214, මුස්තකීම් පල්ලිය පාරෙහි පිහිටි නිවසේ බවත් ඔහුගේ මවගේ නම සිත්තිනා උම්මා බවත් මවගේ නංගී වන ආදම් බාවා රිස්වානා අධිකරණයට සාක්ෂි ලබා දුන් සාක්ෂිකාරිය බවත් පවසා ඇත. සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2018 වසරට පෙර පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු කළ බවත් ඊට පෙර ඔහු සෙලින්කෝ වීඅයිපී ආයතනයක සේවය කළ බවත් එසේම, ගුවන් විදුලි සංස්ථාවේ පුහුණුවීම් නිවේදන කටයුතු පුහුණුවීම් වලටද ගිය බවට සාක්ෂිකරු පවසා ඇත. සාක්ෂිකරු අධිකරණයට සාක්ෂි ලබා දුන්නේ සිංහල භාෂාවෙන් වන අතර ඔහු පවසා සිටියේ 2019.04.19 වන දින තමා නිවාඩුවට නින්දවූර් පිහිටි තමන්ගේ නිවසට ගොස් සිටි බවත් තමා එදින නිවසට යන විට තමාගේ අම්මා තමාගේ නංගීගේ ගෙදර සිටි බවත් එතනට ගිය පසු තමාගේ අම්මාට අයිතිව තිබූ අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02හි පිහිටි වසා

දමා තිබූ නිවස ටෙම්පරරි ළමයින්ට රෙන්ට් එකට දුන්නා යැයි තමාගේ අම්මා තමාට පැවසූ බවත් එම කුලියට සිටි අයව කැඳවාගෙන විත් ඇත්තේ තමාගේ මාමා විසින් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර ඉන්පසු තමා එම නිවසට 20 වන දින එනම් සෙනසුරාදා දින ගිය බවත් ඔවුන් එම අවස්ථාවේ නිවසේ සිටියේ නැති බවත් ඉන්පසු තමා මෙම පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් අරගෙන පොලීසියට ලියාපදිංචි කරලා තියෙනවාදැයි තමාගේ අම්මාගෙන් ඇසූ විට එවැන්නක් කළේ නැති බවට අම්මා පවසා සිටි බවත් 2019.04.21 වන දින බෝම්බ පිපිරීමේ සිද්ධිය සිදුවූ දින සවස දවසෙම තමා එම නිවසට ගොස් ඔවුන්ගේ හැඳුනුම්පත් ඉල්ලා සිටි බවත් එලෙස ඉල්ලා සිටියේ එදින සවස් වරුවේ බවත් තමා එලෙස යන විට ඔවුන්ගෙන් එක අයෙක් සිටි බවත් ඔහු මිටි පුද්ගලයෙක් බවත් ඔහු රැවුල වවලා තිබුණ තරුණ පුද්ගලයෙක් බවත් තමා ගොස් ඔවුන්ගෙන් හැඳුනුම්පත් ඉල්ලා සිටි අවස්ථාවේදී, ඔවුන් එලෙස ඉන්නවා නම් ඔවුන් පිළිබඳ විස්තර නින්දවූර් පොලීසියේ ලියාපදිංචි කළ යුතු බවට ඔවුන්ට පැවසූ බවත් ඔවුන්ගෙන් එම අවස්ථාවේ සිටියේ පුද්ගලයන් දෙදෙනෙක් බවත් තමා සමග කතා කළේ කොට මිටි පුද්ගලයෙක් බවත් තවත් වයසක පුද්ගලයෙක්ද සිටි බවත් තමා යන විට ඔහු නිවසේ තුළ සිටි බවත් සාක්ෂිකරු පවසා ඇත. තමා ගොස් නිවසේ එළියේ සිටි කොට මිටි පුද්ගලයා සමග කතා කරමින් සිටින විට නිවස තුළ සිටි වයසක තැනැත්තා උස වයසක පුද්ගලයාද එළියට පැමිණි බවත් ඔහුගේ කොණ්ඩය තිබුණේ නැති බවත් සාමාන්‍යයෙන් කොණ්ඩය

අඩුවෙන් තිබුණ බවත් ඔහුගේ රැවුල තිබුණේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. එම පුද්ගලයා තමාට දැක හඳුනා ගන්න පුළුවන් යැයි තමා සිතන බවට පවසා සාක්ෂිකරුට නියුක්ත අධිකරණයේ සිටින චූදිතයන් 24 දෙනා දෙස බලා ඔහු පවසා සිටි තැනැත්තා සිටිනවාද යන්න පෙන්වීමට පැවසූ අවස්ථාවේදී සාක්ෂිකරු නියුක්ත අධිකරණයේ සිටි සියලුම චූදිතයන් දෙස හොඳින් පරික්ෂාකාරීව බලා නියුක්ත අධිකරණයේ දෙවන ස්ථානයේ සිටි පුද්ගලයා පෙන්වා හඳුනා ගන්නා ලද අතර එම තැනැත්තා මෙම නඩුවෙහි දෙවන විත්තිකරු වන මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ හෙවත් ගපූර් මාමා යන අය වේ. සාක්ෂිකරු පවසා සිටි පරිදි තමා එම නිවසට එදින ගොස් ඔවුන්ගෙන් ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටියද ඔවුන් ඒවා පස්සේ දෙන්නම් යැයි පැවසූ බවත් එලෙස පැවසූ පසු තමා ආපහු තමාගේ නිවසට පිටවී ගිය බවත් එදිනට පසු දින ඔවුන් කාටවත් කියන්නේ නැතුව නිවසින් පිටවී ගොස් තිබුණ බවත් තමා පසු දින නිවසේ සිටියේ නැති බවත් තමා ඔවුන් පිටවී ගොස් ඇති බව දැනගත්තේ තමාගේ අම්මා සහ නැන්දා විසින් නැන්දා වන රිස්වානා විසින් පවසා සිටි නිසා බවත් සාක්ෂිකරු පවසා ඇත. පුද්ගලයන් තිදෙනෙකුට මෙලෙස කුලියට ලබා දී තිබූ නිවස කාමර තුනක් තිබෙන තනි තට්ටුවේ නිවසක් බවත් පවසා සාක්ෂිකරු එම නිවස පිළිබඳ විස්තරාත්මකව කරුණු සඳහන් කර ඇති අතර එම නිවසේ දර ලිපක් තිබුණ බවත් ඒ ඊට උඩට වෙන්නට දුම් කවුළුවක්ද තිබුණ බවත්ද පවසා සාක්ෂි ලබා දී ඇත. 02 වන චූදිත වෙනුවෙන් පෙනීසිටින නීතීඥ කනිල් බද්දුමාගේ

මහතා විසින් 02 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ 2019 අප්‍රේල් මස 21 වන දින බෝම්බ පිපිරීම් සිදුවූ දිනම සවස් වරුවේ තමා එම පුද්ගලයන් නැවතී සිටි නිවසට ගොස් ඔවුන්ගෙන් හැඳුනුම්පත් ඉල්ලා සිටි බව පවසා ඇතද මෙම සාක්ෂිකරු 2019 නොවැම්බර් මස 11 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ප්‍රකාශයෙහි මෙම සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ 2019.04.21 වන දින නිවසට යන විට එම ගෙදර වසා තිබුණු බවත් ය. මා 2019.04.22 සවස 6.30ට 7.00ට විතර ගෙදර බලන්න යනකොට දෙන්නෙක් හිටියා යනුවෙන් ප්‍රකාශ කර ඇති අතර සාක්ෂිකරු පවසා ඇත්තේ තමා සඳහන් කළේ තමා එදිනම 2019.04.21 එම නිවසට ගිය බවයි. ඔහුගේ විත්තිකරුවන් ඔහුට කරන ලද යෝජනා සහ ඔහු විසින් පොලීසියට ලබා දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී සාක්ෂිකරු පවසා ඇත්තේ එම දිනයේ යම් පැටලැවිල්ලක් වෙලා තිබුණ බවත් තමා බෝම්බය පිපිරුණ දවසේම බවත් ඊට පෙර දිනේ තමා යන විට ඔවුන් එම නිවසේ සිටියේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. කෙසේ වෙතත් සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ප්‍රකාශය එනම් 2019.11.11 දින ලබා දී ඇති ප්‍රකාශයෙහි 2019.04.21 වන දින නිවසට යන විට එම ගෙදර වසා තිබුණා යන කොටස 2 (D) (1) ලෙස පරස්පරතාවයක් ලෙස ලකුණු කර ඇත. මෙම සාක්ෂිකරු විසින් සාක්ෂි ලබා දීමේදී ඔහුගේ සාක්ෂියේදී

සඳහන් කරන ලද 2019 අප්‍රේල් වන විට ඔහු දුටු යැයි පවසන වයසක පුද්ගලයාට කොණ්ඩය තිබුණාද යන්න විමසීමේදී සාමාන්‍ය විදිහට කොණ්ඩය තිබුණ බවත් ඔහු දිගට වවාලා තිබුණේ නැති බවත් පවසා ඇති අතර 2019.04.21 හෝ 2019.04.22 දින එම තැනැත්තා දුටු පසු නැවත කොහේදිවත් දැක්කේ නැති බවට සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරු 2019.11.11 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දුන් අවස්ථාවේදී ‘‘මම 2019.04.22 වන දින සවස 6.30ට 7.00ට විතර අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 ගෙදරට යන විට එම ගෙදර හිටිය දෙදෙනා අද දින පැය 11.42ට මෙම අංශයට ගෙනවිත් ඉන්නවා’’ යැයි ඔහුගේ ප්‍රකාශයේ සඳහන් කර තිබෙනවා යැයි යෝජනා කර ඇති අතර ඔහු එලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දීමේදී විමසූ විට තමා එලෙස පැවසූ බවට සාක්ෂිකරු පිළිගෙන ඇත. 02 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ ඔහු සාක්ෂි ලබා දීමේදී 2019.04.21 හරි 2019.04.22ට හරි පස්සේ එදා නිවසේදී දැක්ක පුද්ගලයෝ දැක්කේ නැහැ යැයි පවසා සිටියද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී එම පුද්ගලයෝ දෙන්නාව දැක්ක බවට සාක්ෂිකරු විසින් ඔහුගේ 2019.11.11 දින ඇති ප්‍රකාශයේ සඳහන් කර තිබෙන බවට ඔහුට පෙන්වා දුන් අවස්ථාවේදී ඔහු පිළිතුරු දෙමින් පවසා ඇත්තේ සී.අයි.ඩී නිලධාරීන් පුද්ගලයන් දෙදෙනෙක්ව පෙන්වා මේ අයද යැයි තමාගෙන් විමසූ බව පවසා ඇති අතර විත්තිකරුවන් මෙම

සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උවමනාවට මෙම සාක්ෂිකරු විසින් මෙම නඩුවෙහි 02 වන චූදිත හඳුනා ගත්ත බවත් 02 වන චූදිතව 2019.04.21 වන දින සිද්ධිය වූ නිවසේදී මෙම සාක්ෂිකරු දුටුවේ හෝ නැති බවට සාක්ෂිකරු පවසා ඇත්තේ තමා එම 02 වන චූදිතව එම නිවසේදී දුටු බවත් තමා අධිකරණයේ පවසන්නේ සත්‍ය බවත් තමාට දිනය පමණක් පැටලිලා තිබෙන බවයි. එසේම, සාක්ෂිකරු තවදුරටත් පවසා ඇත්තේ තමාට 02 වන චූදිත සම්බන්ධයෙන් අසත්‍යයක් ප්‍රකාශ කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නැති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලපෑම මත තමා 02 වන චූදිතව හඳුනා ගැනීම නොකළ බවත් තමා 02 වන චූදිතව තමා පවසා සිටි පරිදි එම නිවසට ගිය විට එහිදී දුටු බවට සාක්ෂිකරු එකහෙලාම පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් 09 වන චූදිත වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර එහිදී මෙම සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි දීම සඳහා සිතාසි ලැබුණේ ඔහු සාක්ෂි ලබා දීමට පෙර දින බවට යෝජනා කර රාත්‍රියේදී ප්‍රවාහනය කර ඉතාම වෙහෙසට පත්වී අධිකරණයට සාක්ෂි දෙන්නට පැමිණි බවට සාක්ෂිකරු යෝජනා කර ඇති අතර සාක්ෂිකරු ඒ ඔහු යැයි පිළිතුරු ලබා දී එය පිළිගෙන ඇත.

එසේම, 9 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ ඔහු විසින් අධිකරණයේදී පෙන්වා දුන් තැනැත්තා වෙනත්

කෙනෙක් එතන ඉන්න ඇති යැයි යෝජනා කළ විට සාක්ෂිකරු පවසා ඇත්තේ ''*මම ඔහු කියලා කිව්වේ නැහැ. ඔහු වගේ කියලා තමයි කිව්වේ*'' යනුවෙනි. මෙම චූදිත 9 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලදීද මෙම සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී පුද්ගලයන් දෙදෙනෙක්ව රැගෙනවිත් ''*මේ අය නේද එම නිවසේ සිටියේ*'' යැයි නිලධාරීන් තමාගෙන් ඇසුවා නේද, යන්න අතර සාක්ෂිකරු එයට ''*ඔව්*'' යැයි පිළිතුරු ලබා දී ඇත. එසේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ යැයි අංශයක් තිබෙනවා ඔබ දන්නවා දැයි විමසූ විට තමා ඒ ගැන දන්නේ නැති බවට සාක්ෂිකරු පවසා ඇත. එසේම, මෙම සාක්ෂිකරුට 09 වන චූදිත යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරුට සිංහල භාෂාව කියවන්නට බැරි බවට ඔහු පවසා ඇති බැවින් ඔහුට කියවන්න බැරි භාෂාවකින් ඔහුගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇති බවත් මෙම සාක්ෂිකරු එම ප්‍රකාශය අත්සන් කරන විට එහි අන්තර්ගතය කුමක්ද කියලා වත් දන්නේ නැතුව අත්සන් කර ඇති බවට යෝජනා කළද සාක්ෂිකරු පවසා ඇත්තේ ඔවුන් එම ප්‍රකාශය තමාට කියවලා දුන් බවත් කියවලා දීමෙන් අනතුරුව තමා විසින් අත්සන් කළ බවයි. මෙම නඩුවෙහි අනෙකුත් සියලුම චූදිතයන් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බව පවසා ඇති අතර උගත් රජයේ නීතීඥ මහතා නැවත ප්‍රශ්න ඇසීමක් කර ඇත. එසේම, ඔහුගේ නැවත ප්‍රශ්නවලදීද පවසා ඇත්තේ තමා විසින් එම නඩුවෙහි 02 වන චූදිත වගේ කෙනෙක්ව තමා 2019.04.21 වන දින

දැක්කේ යැයි අධිකරණයේදී හඳුනා ගත්තේ කිසිවෙකුගේ බලපෑමක් මත නොවන බවත් තමා කල්මුණ ප්‍රදේශයේ සිට පැමිණි නිසා ගමන් මහන්සිය තිබෙනවා යැයි යෝජනා කළද තමාට සාක්ෂි ලබා දෙන්නට කිසිදු ශාරීරික අපහසුතාවයක් හෝ අමාරුවක් නොමැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් වන්නේ ඔහුගේ සාක්ෂියෙන් මෙම නඩුවෙහි දෙවන විත්තිකරු ලෙස සිටින පුද්ගලයා මෙම සාක්ෂිකරු අධිකරණයේදී හඳුනා ගැනීමේදී පවසා ඇත්තේ ***''අරයා වගේ තමයි මට මනක තියෙන්නේ''*** යනුවෙන් වන අතර ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් මෙම නඩුවෙහි 02 වන චූදිතව හඳුනා ගැනීම සිදු කර ඇත්තේ *''අරයා වගේ තමයි මට මනක තියෙන්නේ''* යනුවෙන් වන බැවින් ඔහුට එම පුද්ගලයා වසර ගණනාවකට පසු හඳුනා ගැනීම සම්බන්ධයෙන් යම් අවිනිශ්චිතතාවයක් තිබී ඇති බව පෙනී යයි. එසේම, මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලදීද පිළිගෙන ඇත්තේ අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 නිවසේ මෙම නඩුවේ 02 වන චූදිත ලෙස තමා පෙන්වා දුන් තැනැත්තා වන අතර එම තැනැත්තා තමා හඳුනා ගත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලපෑම මත නොවන බවත් තමාට එලෙස 02 වන චූදිතව පෙන්වා දීමට කිසිදු බලපෑමක් කිසිවෙකු විසින් සිදු කළේ නැති බවත් එලෙස එවැනි අවශ්‍යතාවයක් හෝ තමාට නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරු 09 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්නවලට ලක්වීමේදී මෙම සාක්ෂිකරු ඔහු විසින් හඳුනා ගත් තැනැත්තා සම්බන්ධයෙන් පවසා ඇත්තේ ''*මම ඔහු කියලා කිව්වේ නැහැ. ඔහු වගේ කියලා තමයි කිව්වේ*'' යනුවෙනි. ඒ අනුව බලන කල මෙම සාක්ෂිකරු මූලික සාක්ෂියේදීද පවසා ඇත්තේ ''*අරයා වගේ තමයි මට මතක තියෙන්නේ*'' යනුවෙන් වන අතර ඉන්පසු ඔහු මෙම නඩුවෙහි 02 වන චූදිතව හඳුනා ගැනීමක් කර ඇති 9 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදීද ඔහු පවසා ඇත්තේ ''*මම ඔහු කියලා කිව්වේ නැහැ. ඔහු වගේ කියලා තමයි කිව්වේ*'' යනුවෙන් වන අතර ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් නියුක්ත අධිකරණයේදී 02 වන චූදිතව හඳුනා ගැනීම ඩොක් අයිඩෙන්ටිෆිකේෂන් යන්න සළකා බැලීමේදී එම හඳුනා ගැනීමේ යම් ආකාරයක අවිනිශ්චිතතාවයක් තිබෙන බව පෙනී යයි.

02 වන චූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරු යෝජනා කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී පුද්ගලයන් දෙදෙනෙකු මෙම සාක්ෂිකරු සිටි ස්ථානයට රැගෙන ඔවුන්ව පෙන්වා මේ අයද යැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම සාක්ෂිකරුගෙන් අසා ඉන්පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලපෑමට මෙම සාක්ෂිකරු විසින් 02 වන චූදිතව හඳුනා ගෙන අධිකරණයේ සාක්ෂි ලබා දුන් බවට පවසා සිටියද තමාට එවැනි කිසිදු බලපෑමක් කිසිවෙකු හෝ කළේ නැති බවත් තමාට එලෙස ඒ ආකාරයෙන් හඳුනා ගන්නට කිසිම

අවශ්‍යතාවයක් නැති බවට සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුළ මෙම සාක්ෂිකරුට යම් චූදිතයෙකු නියුක්ත අධිකරණයේදී හඳුනා ගන්නා ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් කිසිදු පාර්ශවයක් විසින් බලපෑමක් කළ බවට පෙනී යන්නේ නැත. කෙසේ වුවද මෙම සාක්ෂිකරු විසින් නියුක්ත අධිකරණයේ සිටි 02 වන චූදිත වන මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා යන අයව හඳුනා ගැනීමක් කළද එම හඳුනා ගැනීම කර ඇත්තේ වසර හයකට පමණ පසු බව පෙනී යන අතර එසේම, සාක්ෂිකරුගේ සාක්ෂියේදී ඔහු පවසා ඇති පරිදි 02 වන චූදිතව මෙම සාක්ෂිකරු විසින් අධිකරණයේදී හඳුනා ගත්තද 09 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්නවලට ලක්වෙමින් මෙම සාක්ෂිකරු පිළිතුරු දී ඇත්තේ මම ඔහු කියලා කිව්වේ නැහැ. ඔහු වගේ කියලා තමයි කිව්වේ යනුවෙන් වන අතර ඒ බවට 2026.06.10 දින පෙබරවාරි 11.50ට නිළධරීන්ගෙන් පිටුව අංක 6 පරික්ෂා කිරීමෙන් පෙනී යයි. ඒ අනුව මෙම සාක්ෂිකරු විසින් නියුක්ත අධිකරණයේදී මෙම නඩුවේ 02 වන චූදිත හඳුනා ගැනීම සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය නීතිය ඉදිරියේ පිළිගත හැකි ආකාරයේ හඳුනා ගැනීමක් නොවන බවට පෙනී යන අතර කෙසේ වුවත් මෙම සාක්ෂිකරුගේ සමස්ත සාක්ෂිය තුළින් පෙනී යන පරිදි 2019.04.21 දින මෙම සාක්ෂිකරු අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02 නමැති ලිපිනයේ පදිංචිව සිට ඇති බව සහ ඔහු එදින එනම් 2019.04.21 දින බෝම්බ පිපිරීම සිදුවූ දින සවස් කාලයේදී මෙම සාක්ෂිකරු එම ඉහත කී ලිපිනයෙහි නිවසේ සිට ඇති

අතර එම බෝම්බ පිපිරුණ දින සවස ඔහු ඔහුගේ මවට අයිතිව තිබූ නිවසේ කුලියට පදිංචිව සිටි පුද්ගලයන් සම්බන්ධයෙන් කරුණු විපරම් කිරීමට ගිය අවස්ථාවේදී, එම අවස්ථාවේදී පුද්ගලයන් දෙදෙනෙකු සිට ඇති බව සහ එම පුද්ගලයන්ගෙන් ඔවුන්ගේ අනන්‍යතාවය පරීක්ෂා කර බැලීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටි අවස්ථාවේදී එහි සිටි පුද්ගලයන් දෙදෙනා ජාතික හැඳුනුම්පත් ලබා දීම සිදු කර නොමැති බව සහ පසුව ලබා දෙන්නම් යැයි පවසා සිටියද ඒ දිනට පසු දින ඔවුන් එම නිවසින් පිටවී ගොස් ඇති බවට මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සම්බන්ධයෙන් යම් සැක සහිත භාවයක් අපට පෙනී යන්නේ නැත. ඒ අනුව 02 වන චූදිතව හඳුනා ගැනීම සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂිය විශ්වල්‍ය වුවද ඔහු අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර් 02හි පිහිටි ඔහුගේ නිවස සහ ඒ අසලම තිබූ ඔහුගේ මවට අයත්ව තිබූ නිවස එනම් සැක සහිත පුද්ගලයන් තිදෙනෙකු විශ්ව විද්‍යාල සිසුන් යැයි පවසා පැමිණ නැවතී සිටි නිවසෙහි සිට ඇති බවට මෙම අධිකරණය මුලින්ම සාක්ෂි ලබා දුන් පැය 2286 ආදම් බාවා රිස්වානා යන අය ලබා දුන් සාක්ෂිය සහ මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය අතර පරස්පරතාවයක් පෙනී යන්නේ නැත.

මෙම සාක්ෂිකරුව 02 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන ලද අවස්ථාවේදී ලකුණු කර ඇති 2 (D) (1) ලෙස ලකුණු කර ඇති පරස්පරතාවය සහ එම පරස්පරතාවය පරීක්ෂා කර බැලීමේදී නිවසට යන විට එම ගෙදර වසා තිබුණා යන කොටස එනම් 2019.04.20 වන දින

නිවසට යන විට එම ගෙදර වසා තිබුණා යන කොටස පරස්පරතාවයක් ලෙස ලකුණු කර ඇතද සැබැවින්ම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2019.04.20 දින ඔහුගේ නිවසට ගොස් එදිනම එලෙස සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු පවසා ඇත්තේ ඒ දිනය සම්බන්ධයෙන් යම් පැටලැවිල්ලක් වෙලා තිබෙන බවයි. එකී පසුබිම තුළද සැබැවින්ම මෙම සාක්ෂිකරු පවසා සිටින පරිදි ඔහුට අධිකරණයේදී අසත්‍ය කරුණු පවසා සිටීමට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උවමනාවට පුද්ගලයෙකු හඳුනා ගැනීමක් කිරීමට කිසිදු ආකාරයක බලපෑමක් සිදු නොවූ බවට ඔහු පවසා ඇත. කරුණුද සළකා බැලීමේදී මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් කරුණු කිසිවක් අප ඉදිරියේ ඉදිරිපත් වී නොමැති බවට අප තීරණය කරමු.

මෙම අධිකරණය සාක්ෂි ලබා දී ඇති පැමිණිල්ලේ සාක්ෂි අංක 2285 අබ්දුල් රහීම් මොහොමඩ් සාලිහින් නමැති 56 වියැති සාක්ෂිකරු විවාහ වී සිටින්නේ මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් ආදම් බාවා රිස්වානා යන අය සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 2241 ආදම් බාවා සිත්තියා උම්මා යන අයගේ සහෝදරියක් සමඟ වන අතර ඔහු ගොවිතැන් කටයුතු කරමින් ජීවත් වන අයෙකු බවත් තිරස්ථානයේ අප්‍රේල් මස 21 වන දින ලංකාවේ ප්‍රදේශ කීපයක බෝම්බ ප්‍රහාර සිදුවූ බවට තමා දැනගත් බවත් පවසා ඇති අතර බෝම්බ පුපුරන දිනේ තමා කුඹුරේ ගොවිතැන් කටයුතු කරමින් සිටි බවට පවසා ඇත. එලෙස සිටියදී දින හතරක කාලයකට පුද්ගලයන් හතර

දෙනෙක් පමණ ඇවිත් තමාලාගේ නිවසක නැවතිලා සිට ඇති බවත් තමාගේ නෑනාගේ පුතෙක් විසින් ඔවුන්ගෙන් හැඳුනුම්පත් ඉල්ලා සිටි අවස්ථාවක ඔවුන් විසින් අපි නිවසට ගිහිල්ලා එන්නම් යැයි පවසා ගොස් ඇති බවත් ඉන්පසු ඔවුන් නැවත පැමිණ නැති බවත් පවසා ඇති අතර තමාගේ නෑනාගේ පුතා යැයි තමා සඳහන් කරන්නේ ෆස්මීර් යන අය බවත් එනම් මෙම නඩුවේ සාක්ෂි අංක 2242 මොහොමඩ් පස්මීර් යන අය බවත් දේ. පස්මීර් නමැති තැනැත්තා එනම් තමාගේ නෑනාගේ පුතා ගොස් එලෙස අදාළ නිවසේ කුලියට සිටි පුද්ගලයන්ගෙන් අයිඩෙන්ටිටි කාඩ් ඉල්ලුවායින් පසු ඔවුන් එම නිවසින් පිටවී ගොස් ඇති බවට සාක්ෂිකරුට දැනගන්න ලැබුණු බව පවසා ඇත. එසේම, තමා පසුව නිවසේ සිටියදී රාත්‍රී 10.00ට 11.00ට පමණ පොලිස් නිලධාරීන් ගණනාවක් තමාලාගේ නිවෙස් වලට පැමිණ කුලියට දුන් නිවසේ පදිංචි වෙලා ඉන්න පුද්ගලයන් කවුදැයි තමාලාගෙන් විමසූ විට ඔවුන් පාසලේ ඉගෙන ගන්නවා යැයි පවසා තමාලාගෙන් නිවස ගත්ත බවට සාක්ෂිකරු පවසා ඇති අතර පොලිසියට අමතරව හමුදාවෙන්ද පැමිණි බවත් පොලිසියේ අය සහ හමුදාවේ අය දැක්ක ගමන් තමන් බයට පත් වුණ බවත් එම පැමිණි පොලිස් කට්ටිය කුලියට දී තිබූ අදාළ නිවස එනම් සිත්තිනා උම්මා යන අයගේ නිවසේ යතුර ඉල්ලාගෙන එනම් රිස්වානාගෙන් අතේ තිබුණු යතුරෙන් නිවසේ දොර ඇර ඔවුන් නිවස ඇතුළට ගිය බවත් නිවසේ දොර විවෘත කළේ තමා විසින් බවත් පැමිණි නිලධාරීන් තමාවත් එක්කගෙන එම නිවස ඇතුළට

ගිය බවත් එම පැමිණි පොලිස් නිලධාරීන් සමඟ ඔලුවෙහි කෙස් නැති පුද්ගලයෙක්වද රැගෙන විත් තිබුණ බවත් එම තැනැත්තා තරුණ කෙනෙකුත් නොවන බවත් වයසක කෙනෙකුත්, එච්චර වයසක කෙනෙකුත් නොවන බවත් සාක්ෂිකරු පවසා ඇති අතර මේ වන විට තමාගේ ඇසක ප්‍රශ්නයක්ද තිබෙන බවත් තමා කණ්ණාඩිද පළඳින බවත් සාක්ෂිකරු පවසා ඇති අතර තමාගේ එක ඇසක පෙනීම අඩු බවත් තමා පවසා සිටි තැනැත්තාව හඳුනා ගන්න පුළුවන්ද යන්නෙන් සාක්ෂිකරුගෙන් විමසූ අවස්ථාවේදී සාක්ෂිකරු පවසා ඇත්තේ තමාගේ එක ඇසක් පෙනෙන බව විවෘත අධිකරණයට පෙනී සිටින පුද්ගලයින් රැවුල තියෙන නිසා තමාට හරියටම නිශ්චිතව තමා පවසා සිටි තැනැත්තා ගැන කියන්නට බැරි බවයි. තමා පවසා සිටි පරිදි එනම් පොලිස් නිලධාරීන් සමඟ පැමිණි සාමාන්‍ය පුද්ගලයාද නිවස තුළට ගොස් නිවසේ ලිපට උඩින් තිබෙන කොටස බලා ඒ තුළ යම් දෙයක් තිබෙනවා යැයි පවසා ඒක ගන්නා ලෙසට තමාට පැවසූ බවත් තමා අත තියලා බැලුවද තමාගේ උස මදි නිසා තමාට එම ස්ථානයට උස මදි වුණ බවත් එම ස්ථානයෙහි උඩ බෑග් එකක් තිබෙන බවත් එම බෑග් එක තුළ රිවෝල්වරයක් තියෙනවා තමා දැක්ක බවත් ඒ හැර වෙන මොනවත් ගත්තේ නැති බවත් එම රිවෝල්වරයේ උණ්ඩ දාලා තියෙන එකක්ද නැද්ද යන්න ගැන තමා බැලුවේ නැති බවත් එම රිවෝල්වරය පොලිසිය භාරයට ගත්තාට පසු ඔවුන් සමඟ පැමිණි ඔවුන් එක්කගෙන ආපු පුද්ගලයාට පහර දුන්න බවත් ඉන්පසු එලෙස පැමිණි

පොලිස් නිලධාරීන් එම රිවෝල්වරය රැගෙන ගිය බවත් සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් 9 වන චූදිත වන මොහොමඩ් රමීස් මොහොමඩ් සාජිත් විසින් හරස් ප්‍රශ්න අසා ඇති අතර ඔහු මෙම සාක්ෂිකරුගෙන් අසා ඇත්තේ ''*සිද්ධිය සිදුවූ දින පැමිණි පොලිස් නිලධාරීන් අතේ අවි ආයුධ තිබුණාද*'' යන්න අසා ඇති අතර එම අවස්ථාවේදී පොලිසිය හැර හමුදාවෙන්ද නිලධාරීන් පැමිණියාදැයි විමසූ විට සාක්ෂිකරු හමුදාවෙන්ද පැමිණ සිටියා යැයි පවසා හමුදාවේ අයගේ අත්වලත් ආයුධ තිබුණාදැයි විමසූ විට සාක්ෂිකරු ඔව් යැයි පිළිතුරු දී ඇති අතර පොලිසිය හා යුද හමුදාවේ කට්ටිය නිවස ඇතුළට ගියේ ආයුධත් සමඟදැයි විමසූ විට සාක්ෂිකරු ඔව් යැයි පිළිතුරු දී පවසා ඇත. ඉන්පසු මෙම සාක්ෂිකරු අධිකරණයට පවසා ඇත්තේ මොවුන් නිසා තමයි අපි මේ ස්ථානයට ඇවිල්ලා ඉන්නේ. අපි අමාරුවේ වැටුණු අය. නිකන් හිටපු අය. මොවුන් ඉගෙන ගන්නවා කියලා තමයි අපේ නිවසට පැමිණියේ. අපි නිකන් හිටපු අය. මොවුන් ඇවිල්ලා අපිට කීවේ ඔවුන් විශ්ව විද්‍යාලයක ඉගෙන ගන්න ආපු අය කියලා. ඒ නිසා තමයි අපි ඔබගේ නිවසේ නතර වෙන්නේ කියලත් ඔවුන් දින හතරක් තමයි අපේ නිවසේ නතර වුණේ. අපේ ළමයි වගේ ඒ අය ඒ නිවසේ දවස් හතරකම හිටියා. අපේ ළමයිනුත් වෙනත් ස්ථානවල ඉගෙනුම ලබලා තියෙනවා. මොවුන් මෙවැනි දේකට ඇවිල්ලා තියෙනවා කියලා මගේ අල්ලා දෙවියන්ගේ නාමයෙන් මම දැනගෙන හිටියේ නැහැ. මට දැන් වයස අවුරුදු 56ක් වෙනවා. මට

පොලිසියට යාමට අවශ්‍ය නැහැ. ඔබ අහන ප්‍රශ්නවලට මට උත්තර දෙන්න අවශ්‍යතාවයක් නැහැ යැයි සාක්ෂිකරු ආවේගශීලීව 9 වන චූදිතට පවසන ලද අතර ඒ සමඟම 9 වන චූදිත විසින් හරස් ප්‍රශ්න අවසන් බවට අධිකරණයට පවසා ඇත.

අනෙකුත් සියලුම චූදිතයන්ද හරස් ප්‍රශ්න නොඅසන බව පවසන ලද අතර සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමක් නොමැති බවට රජයේ අධිනීතීඥ මහතා පවසා ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් මෙම සාක්ෂිකරුටද එලෙස අදාළ නිවසේ නවාතැන්ගෙන සිටීමට පැමිණි තැනැත්තන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් පවසා අධිකරණය ඉදිරියේ පවසා සිටීමට හැකියාවක් තිබී නොමැති අතර මෙම සාක්ෂිකරු එක ඇසක් පමණක් පෙනෙන තැනැත්තෙකු වන අතර ඔහු අධිකරණයේදී සාක්ෂි ලබා දී පවසා ඇති පරිදි ඔහුට මෙම නඩුවේ චූදිතයින් මේ වන විට රැවුල් වවාගෙන සිටින නිසා තමා පවසා සිටි පරිදි එනම් හමුදාව සහ පොලිසිය සමඟ රැගෙන පැමිණි තැනැත්තාව අධිකරණය ඉදිරියේදී හඳුනා ගැනීමට අපහසුතාවයක් තිබෙන බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී හෙළිවන අතර කෙසේ වෙතත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් ද සිටි අවස්ථාවේ පොලිස් නිලධාරීන් විසින් රැගෙන පැමිණි පොලිස් නිලධාරියෙකු හෝ හමුදා නිලධාරියෙකු නොවන සාමාන්‍ය පුද්ගලයා නිවස තුළට කැඳවාගෙන යාමෙන් අනතුරුව එම නිවසේ

මුළුතැන්ගෙයි ලිපට උඩින් තිබෙන කොටසක් පරීක්ෂා කර බලා ඒ තුළ යමක් තිබෙන බවට පවසා ඒ ගන්න යැයි තමාට පැවසූවද තමාට ඒ ගැනීමට නොහැකි වූ බවට මෙම සාක්ෂිකරු පවසා ඔහු උස මදි නිසා තමාට ඒ නොහැකි වූ බවට පවසමින් පසු එම ස්ථානයේ තිබී බෑග් එකක් සොයාගත් බවත් එම බෑගය තුළ රිවෝල්වරයක් තිබුණ බවත් එම රිවෝල්වරය සොයා ගැනීමෙන් අනතුරුව පොලිස් නිලධාරීන් ඔවුන් විසින් එක්කගෙන ආපු පුද්ගලයාට එම ස්ථාන පහර දීමක් සිදු කළ බවත් ඉන්පසු එම නිවසේ මුළුතැන්ගෙයි ලිපට උඩින් තිබුණු කොටසෙහි තිබුණු රිවෝල්වරය පැමිණිපොලිස් නිලධාරීන් රැගෙන ගිය බවට පවසා ඇති පසුබිම තුළ මෙම සාක්ෂිකරු පවසා ඇති පරිදි විශ්ව විද්‍යාල සිසුන් යැයි පවසා එම නිවසේ දින හතරක් පමණ නැවතී සිටි පුද්ගලයන් නිසා තමාලා බොහෝ පීඩාවට ලක් වුණ බවත් මෙලෙස අධිකරණයට පවා සාක්ෂි ලබා දීමට පැමිණීමට තමාලාට සිදුවුණේ පොලිසියට යන්න සිදුවුණෙත් එලෙස එම නිවසේ එම පුද්ගලයන් පැමිණ නැවතී සිටීම නිසා බවත් පවසා ඔහු 9 වන චූදිතගේ හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී 9 වන චූදිත අසන ප්‍රශ්නවලට උත්තර දෙන්න තමාට අවශ්‍යතාවයක් නැති බවට ආවේගශීලීව 9 වන චූදිතට මෙම සාක්ෂිකරු විසින් පවසා ඇති පසුබිම තුළ සහ මෙම සාක්ෂිකරු අධිකරණයට පවසා සිටි පරිදි මගේ අල්ලා දෙවියන්ගේ නාමයෙන් මම දැනගෙන හිටියේ නැහැ. මොවුන් මෙවැනි දේකට ඇවිල්ලා තියෙනවා කියලා යැයි පවසා ඇති කරුණු තුළින් එම නිවසේ නැවතී සිට

ඇති පුද්ගලයන් යම් වැරදි ක්‍රියාවක් සිදු කිරීම සඳහා පැමිණ සිටි ඇති බවට යුක්ති සහගතව නිගමනය කළ හැකි අතර එසේම, ඉහත පරිදි එම නිවසේ මුළුතැන්ගෙයි ලිපට උඩින් තිබුණු ස්ථානයක සඟවා තිබී බෑගයක් තුළ රිවෝල්වරයක් තිබී සොයා ගැනීම තුළින්ද ඒ බව මනාව පැහැදිලි වේ.

එම නිවසේ මුළුතැන්ගෙයි ලිපට උඩින් වූ කොටස් කොටසක් තුළ සඟවා තිබී සොයා ගන්නා ලද රිවෝල්වරය කුමක්ද? එය සොයා ගන්නා ලද්දේ කවුරුන් විසින්ද? එසේම, එම රිවෝල්වරය සොයා ගැනීම සඳහා පොලිස් නිළධාරීන් විසින් කැඳවාගෙන එන ලද සිවිල් පුද්ගලයා කවුද යන්න සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි හෙළි නොවන අතර ඒ කරුණු කිසිවක් හෙළි නොවේ.

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.2171 විශ්‍රාමික ප්‍ර.පොා.ප. මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් ෆසීර් යන අය පවසා සිටියේ, 2019.04.21 වන දින මඩකලපුව සියෝන් දේවස්ථානයේ සිදුවූ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කණ්ඩායමක් පොා.ප. වීරසිංහ නිළධාරියාගේ ප්‍රධානත්වයෙන් 2019.04.24 වන දින මඩකලපුව ප්‍රදේශයට ගිය බවත්, එලෙස ගොස් කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් අත්අඩංගුවට ගෙන රඳවා ගෙන සිටි සැකකරුවකු වන මොහොමඩ් සරීබු ආදම් ලෙබ්බේ යන අයෙකු වැඩිදුර පරීක්ෂණ සඳහා

භාරයට ගත් බවත්, ඔහු මෙම නඩුවේ 02 වන චූදිත බවත්, ඉන්පසුව ඔහුගෙන් පො.ප.වීරසිංහ මහතා විසින් ප්‍රකාශයක් ලබා ගත් බවත්, ඔහුගේ ප්‍රකාශය මත වැඩිදුර විමර්ශනය සඳහා එකී මෙම නඩුවේ 02 වන චූදිතගේ මහ පෙන්වීම අනුව නින්දවූර් ප්‍රදේශයට ගිය බවත්, එහි ගොස් මුස්තකීම් පල්ලිය පාරේ පිහිටි අංක 214 දරණ නිවසට ගිය බවත්, ඒ ස්ථානයට යන විටත් විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් එම ස්ථානයට පැමිණ සිටි බවත්, එම නිවස තුළ මුළුතැන්ගෙයි තිබූ දුම් කවුළුවෙහි සවි කර තිබූ ලෑල්ලක් උඩ තිබී ෂොපින් බෑග් එකක දමා තිබූ රිවෝල්වරයක් සොයා ගත් බවටත් සාක්ෂි ලබා දී ඇත. එම රිවෝල්වරය AS3887 අංකය දරණ රිවෝල්වරයක් බවත්, එම රිවෝල්වරයේ උණ්ඩ 04 ක් තිබූ බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත.

<u>අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර්-02</u>

<u>දරණ ලිපිනයේ පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

<u>විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ අංක 214, මුස්තකීම් පල්ලිය පාර, නින්දවූර්-02 දරණ ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධව සාක්ෂි ඉදිරිපත් වී ඇත. එලෙස ඉදිරිපත් වූ සාක්ෂි සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ, මෙම නිවස පැ.සා.2241 ආදම්බාවා සිත්තියා උම්මා යන අයට අයිති නිවසක් වන අතර, ඇයගේ සහෝදරයන් වන පැ.සා.2286 ආදම්බාවා

රිස්වානා සහ පැ.සා.2287 ආදම්බාවා ෆවුස්ඩීන් යන අයවළුන් විසින් කුලියට ලබා දීම සම්බන්ධව කටයුතු කර ඇත. 2019 අප්‍රේල් 07 වන දින පුද්ගලයන් දෙදෙනෙකු පැමිණ ආදම්බාවා ෆවුස්ඩීන් යන අයව මුණගැසී කුලියට නිවසක් අවශ්‍ය බව පවසා ඇති අතර, එලෙස පැමිණි පුද්ගලයන්ගෙන් එක් අයෙක් තරුණ පුද්ගලයෙකු බවත්, අනෙක් අය තරමක් වයසක පුද්ගලයෙකු බවටත් අනාවරණය වේ. එලෙස නිවසක් ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ, කිසිදු ආර්ථික පහසුකමක් නොමැති ළමයින්ට ආගමික ඉගැන්වීම් සිදු කිරීමට බවට පවසා ඇති අතර, එලෙස ආ පුද්ගලයන් දෙදෙනාට ෆවුස්ඩීන් විසින් තමාගේ සහෝදරියගේ ඉහත සඳහන් නිවස පෙන්වා දී ඇත. ඊට දවස් කීපයකට පසුව තරුණ පුද්ගලයන් තුන්දෙනෙකු පමණ එම නිවසට පදිංචියට පැමිණ ඇත. සාක්ෂි අනුව පෙනී යන්නේ, එම තරුණ පුද්ගලයන් එලෙස මෙම නිවසේ පදිංචියට පැමිණ ඇත්තේ 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට දින 05 කට පමණ පෙර වන අතර, ඔවුන් විසින් පැ.සා.2286 ආදම්බාවා රිස්වානා යන සාක්ෂිකාරියට පවසා ඇත්තේ ඔවුන් ඔලුවිල් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුන් බවටය. 2019 අප්‍රේල් 21 දින පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව එදිනම සවස පැ.සා.2241 ආදම්බාවා සිත්තියා උම්මා යන අයගේ පුතෙකු වන පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අය මෙම නිවසට ගොස් එහි නැවතී සිටි පුද්ගලයන් සම්බන්ධයෙන් සොයා බලා ඇති අතර, ඒ අවස්ථාවේදී එම

නිවසේ තරමක් වයසක පුද්ගලයෙක් නැවතී සිට ඇත. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සිදුවූ 2019.04.21 වන දිනට පසුදින එම තරුණ පුද්ගලයන් අදාළ නිවසින් පිටත්ව ගොස් ඇත. ඉන්පසුව ආරක්ෂක නිළධාරීන් විසින් මෙම නිවස පරීක්ෂා කර ඇති අතර, මෙම නඩුවේ 02 වන චූදිත වන මොහොමඩ් ෂරීබු ආදම් ලෙබ්බේ නොහොත් ගෆූර් මාමා යන අයගේ ප්‍රකාශයක් මත එම නිවසේ මුළුතැන්ගෙයි දුම් කවුළුවට උඩින් තිබෙන කොටසක් පරීක්ෂා කර ඒ තුළ තිබී බෑග් එකක දමා තිබූ රිවෝල්වර වර්ගයේ ගිනි අවියක් සොයා ගෙන ඇත. ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂා කිරීමේදී 02 වන චූදිත මෙම නිවසේ නැවතී සිටි බවට කරුණු අනාවරණය වන අතර, ඔහු තම සන්තකයේ ගිනි අවියක්ද තබා ගෙන ඇති බවටත් පෙනී යයි. එනම්, ඔහුත් සමඟ නැවතී සිටි විශ්ව විද්‍යාල සිසුන් ලෙස තමන්ලාව හඳුන්වා දුන් පුද්ගලයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂියක් හෙලිවන්නේ නැත. කෙසේ වුවද 02 වන චූදිත ආයුධයක් සන්තකයේ තබා ගනිමින් එම නිවසේ නැවතී සිට ඇති අතර, පැ.සා.2242 මොහොමඩ් ෆස්මීර් යන අය 2019.04.21 වන දින සවස මෙම නිවසේ නැවතී සිටි පුද්ගලයන්ගෙන් ඔවුන්ගේ අනන්‍යතාවය සම්බන්ධව සොයා බැලීමේදී එලෙස නැවතී සිටි පුද්ගලයින් තමන්ගේ අනන්‍යාතවය හරියාකාරව හෙළිකර නොමැත. තවද, අදාළ නිවසෙහි පදිංචියට පැමිණ දින 05 කට පමණ පසුව ඔවුන්ගේ අනන්‍යතාවය සම්බන්ධව මෙම නිවසේ අයිතිකරුවන් විසින් විමසීමෙන් පසුව එලෙස

නැවතී සිටි එම පුද්ගලයන් පිටව ගොස් ඇත. මෙවැනි පසුබිමක් තුළ පෙනී යන්නේ මෙම නඩුවේ 02 වන චූදිත අදාළ නිවස සැඟවී සිටීමට භාවිතා කර අති බවටය. මෙම නිවස මෙම නඩුවේ 02 වන චූදිත තවත් පුද්ගලයන් සමඟ ආරක්ෂිත නිවසක් ලෙස පරිහරණය කර ඇති බවට ඉදිරිපත් වී තිබෙන සාක්ෂි අනුව අප හට පෙනී යයි.

අංක 48, 02 වන හරස් වීදිය, නින්දවූර් 07 දරණ ලිපිනයේ පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 2278 සීනි මොහොමඩ් මොහොමඩ් සකීනා යන සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් තමාගේ නිවසට ආසන්නයේ පිහිටි නින්දවූර් 07, දෙවන හරස්වීදිය, අංක 48 දරණ ගොඩනැගිල්ල කුලියට දීමට කටයුතු කළ බවත්, ඒ වන විට තමාගේ ස්වාමිපුරුෂයා වන පී.එම්.ෆසාලින් යන අය විසින් එසේ කුලියට ලබා දීම සිදු කළ බවත්, ඉර්ෂාඩ් නැමති පුද්ගලයෙකු විසින් ඒ සඳහා කුලියට ගන්නා අය සම්බන්ධ කර දුන් අතර, එම කුලියට ගත් පිරිස සෙරෙප්පු වෙළඳාමේ යෙදෙන පුද්ගලයන් වන බවත්, ගැබිනි කාන්තාවක් සහ ඇයගේ දියණියන් නිවසට අදාළ ඉවුම් පිහුම් බඩු බාහිරාදිය රැගෙන පැමිණි බවත්, ඔවුන් සමඟ වයසක පුද්ගලයෙකුද සිටි බවටත් කියා සිටින ලදී. එලෙස මෙම නිවස කුලියට ලබා දීම සිදු කරනු ලැබුවේ 2019 වර්ෂයේ සිදු වූ බෝම්බ පිපිරීමට දින කිහිපයකට පෙර බවත් සාක්ෂිකාරිය පවසා සිටී.

මෙම සාක්ෂිකාරියට ඒ වන විටත් පැ.821 වශයෙන් සලකුණු කර තිබූ සීඩී තැටියේ අන්තර්ගතව තිබූ පැ. 821(A) IMG_3686 සහ පැ.821(B) වශයෙන් සඳහන් කර තිබූ IMG_3687 දරණ ඡායාරූපයන් පෙන්වා සිටි අතර පිළිවෙලින් ඒවායේ තමාගේ නිවසට ඇතුළු වන ගේට්ටුවත්, එහි කොළපාටින් දක්වා ඇත්තේ තමාගේ නිවස අතර පිටුපසින් සුදු පාටින් ඇති නිවස සිය නැගණියගේ නිවස බවටත් සාක්ෂි දෙමින් හඳුනාගන්නා ලදී.

පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව සයින්දමර්දු ප්‍රදේශයේ නිවසක බෝම්බයක් පිපුරුණු බව තමා දැන ගත් බවත්, ඉන්පසුව තමා විසින් කුලියට ලබා දුන් නිවසේ සිටි පුද්ගලයන්ට එම නිවසින් පිටත් වන ලෙසට තමා දැන් වූ බවටත් සාක්ෂිකාරිය පවසා ඇත. එසේ ම 821(B) දරණ IMG_3687 ඡායාරූපයේ ඇති වාහනය එම පුද්ගලයන්ගේ බවට තමා පසුව දැන ගත් බවත්, ඔවුන් කාත්තන්කුඩිය ප්‍රදේශයේ පදිංචිකරුවන් බවට පසුව අනාවරණය වූ බවටත් ඇය සාක්ෂි දෙමින් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නැත.

පැ.සා. 2278 සීනි මොහොමඩ් මොහොමඩ් සකීනා යන අයගේ ස්වාමි පුරුෂයා වන පැමිණිල්ලේ සාක්ෂි අංක 2238 පිව්වේ මොහිදීන් පසාලීන් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත. ඔහු තම සාක්ෂියේදී පවසා සිටියේ නින්දවූර් 07, 02 වන හරස් වීදියේ පිහිටි නිවස කුලියට ලබා දීමට

තමා කටයුතු කළ බවත්, ඉර්ෂාඩ් නමැති තැනැත්තා විසින් පුද්ගලයෙකු කැඳවාගෙන පැමිණ තමාට හඳුන්වා දුන් බවත්, එම පුද්ගලයා කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බවත්, ඔහුට නිවසක් කුලියට ගැනීමට අවශ්‍ය බව පැවසූ බවත්, ඔහු තරමක් මහත කළු පුද්ගලයෙක් බවත්, ඔහු වාහනයක පැමිණි අතර ඔහුත් සමඟ කුඩා දරුවන් දෙදෙනෙක්, කාන්තාවන් දෙදෙනෙක් සිටි බවයි. මෙම සාක්ෂිකරුට පැ.829(A) ලෙස පැමිණිල්ල විසින් ලකුණු කර ඇති ඡායාරූපයක් පෙන්වන ලද අතර, එම ඡායාරූපයේ සිටින පුද්ගලයා තමාගෙන් නිවස කුලියට ගත් පුද්ගලයා බවත්, ඔහුව පසුව අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේදී පොලිස් නිළධාරීන් විසින් තමන්ට පෙන්වූ බවත්, තමාගෙන් නිවස කුලියට ගත් පුද්ගලයා ලෙස ඔහුව තමා හඳුනා ගත් බවටත් සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි ලබා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2240 ජමල්දීන් ඉර්ෂාන් අලි යන අය සාක්ෂි දෙමින් තමා ඉහත සාක්ෂි ලබා දුන් සාක්ෂි අංක 2238 පිව්වෙයි මොහිදීන් පසාලින් සහ සාක්ෂි අංක 2278 සීනි මොහොමඩ් මොහොමඩ් සකීනා යන අයව හඳුනන අතර, නිවසක් කුලියට ගැනීම සඳහා පැමිණි පුද්ගලයෙකුට ඉහත සාක්ෂිකරුවන්ගේ දුරකථන අංක ලබා දුන් බවත්, එම

පුද්ගලයා තමා පලතුරු වෙළඳාම කරන ස්ථානයට පැමිණ ඔහු සපත්තු වෙළඳාම කරන බවත්, ඔහුට නිවසක් කුලියට ගැනීමට අවශ්‍ය බව දන්වා සිටිමින් සකීනා ටීචර් (ඉහත නම් සඳහන් පැ.ස2240) ගේ දුරකථන අංකය ලබා දුන් බව කියා සිටින ලදී. පසුව තමාව පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බවත්, අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ දී එම නිවස කුලියට ගැනීමට පැමිණි පුද්ගලයාගේ මෘත ශරීරය හඳුනා ගත් බවත් කියා සිටිමින් පැ. 829(A) ලෙස ලකුණු කරන ලද IMG_0444 දරණ ඡායාරූපයේ සිටින්නේ එම පුද්ගලයාද යන්න තමාට අමතක බව කියා සිටින ලදී. තමාගෙන් නිවස කුලියට ගැනීමට විමසන අවස්ථාවේ දී තමාගේ දුරකථන අංකය වන 076-7677107 දරණ දුරකථන අංකය ඔහුට ලබා දුන් අතර, එම පුද්ගලයාගේ නම නියාස් බව තමා පසුව දැන ගත් බවත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

<u>අංක 48, 02 වන හරස් වීදිය නින්දවූර් 07 දරණ ලිපිනයේ පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ පැමිණිල්ල විසින් නින්දවූර්-07, 02 වන හරස් වීදියේ අංක 48 දරණ ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇත. පැ.සා.2278 මොහොමඩ් සකීනා, සාක්ෂි අංක 2238 පිව්වෙයි

මොහිදීන් පසාලින් , පැ.සා.2240 ජමාල්ඩීන් ඉර්ෂාඩ් අලි යන අයවළුන් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දී ඇති අතර, එම සාක්ෂිකරුවන්ගෙන් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, ඒ අනුව ඔවුන්ගේ සාක්ෂි කිසිදු හබ කිරීමකටද ලක් වී නොමැත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ, එම නිවස කුලියට දීම සඳහා පැ.සා.2278 මොහොමඩ් සකීනා යන තැනැත්තිය සහ ඇයගේ ස්වාමි පුරුෂයා වන පැ.සා.2238 මොහිදීන් පසාලින් යන අය පියවර ගෙන ඇති අතර, 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ පිපිරීමට දින කීපයකට පෙර එම නිවස පුද්ගලයෙකුට කුලියට ලබා දීමක් සිදු කර ඇති බවයි. එම පුද්ගලයා කාත්තන්කුඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බවත්, පාවහන් වෙළඳාම සිදු කරනු ලබන බවටත් පවසා ඇති අතර, ඔහුත් සමඟ ගැබිණි කාන්තාවක් සහ ඇයගේ දියණියද, වයසක පුද්ගලයෙකුද පැමිණ ඇත. 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ පිපිරීමෙන් පසුව සයින්දමරදු ප්‍රදේශයේද නිවසක බෝම්බ පිපිරීමක් සිදු වී ඇති අතර, ඉන්පසුව නිවසේ හිමිකරුගේ දැනුම් දීම පරිදි එම පුද්ගලයා ඔහු සමඟ නැවතී සිටි අනෙක් පුද්ගලයන් සමඟ අදාළ නිවසින් පිටත්ව ගොස් ඇත.

සයින්දමරදු 09, බොලිවේරියන් ග්‍රාමයෙහි පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි

පැ.සා.2279 අබ්දුල් මජීද් ආදම්බාවා යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා මෙම නඩුවේ සාක්ෂිකාරියක් වන පැ.සා.2280 වන සුල්තාන් හමීදා යන අයගේ ස්වාමිපුරුෂයා බවත්, සයින්දමරුදු 09, බොලිවේරියන් ග්‍රාමය, අංක 184 දරන ලිපිනයේ පදිංචිව සිටින බවත්, තමා දැනට පදිංචිව සිටින නිවස යාබදව නිවසක් මිලදී ගත් බවත්, එම නිවස නියාස් යන අයට කුලියට දුන් බවත්, නියාස් යන අය තමා නොහඳුනන අතර නියාස් යන අයට එම නිවස ලබා දීම සඳහා නියාස්ව කැඳවාගෙන පැමිණි පුද්ගලයන් දෙදෙනා ඒ අසල නිවෙස්වල පදිංචිකරුවන් දෙදෙනෙකු වන බවටත් කියා සිටින ලදී. නියාස් යන අය තරුණ, රැවුල සාමාන්‍ය ප්‍රමාණයේ වවා සිටි, සාමාන්‍ය ප්‍රමාණයේ ටිකක් උස පුද්ගලයෙක් බවටත් පවසන ලද අතර, එම පුද්ගලයා කාත්තන්කුඩි ප්‍රදේශයේ පුද්ගලයෙකු බැවින් ඔවුන්ට යතුර ලබා දීමෙන් පසුව ඔවුන් සහ තවත් පුද්ගලයන් කිහිප දෙනෙකු නිවසේ පදිංචියට පැමිණි බවත්, තමා නිවස තුළට නොගිය අතර නියාස් යන අය පමණක් නිවසින් පිටත සිටි බවටත් කියා සිටින ලදී. ඔවුන්ට නිවස කුලියට ලබා දී දින දෙකකට පසු මඩකලපුව සායනයකට යන බව දන්වා වෑන් රථයකින් පිටත්ව ගිය බවත්, එම දිනය එම මාසයේ 20 වන දිනය බවත්, (වසර සහ මාසය ඔහුට මතක නැති බව කියා සිටින ලදී.) කියා සිටින ලදී. ඉන් පසුව

26 වන දින සිකුරාදා දිනයක් බවත් එදින පිපිරීමක් සිදුවූ බවත් ය. නිවසක් කුලියට දෙන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීවරයා දැනුවත් කළ යුතුය යන කාරණය ඒ වන විට තමා නොදැන සිටි බවත්, පසුව එනම්, 26 වන දින නියාස් සහ පිරිස ආපසු පැමිණීමෙන් පසුව තමා ගොස් කුලියට ගැනීම පිළිබඳ ග්‍රාම නිලධාරීවරයා දැනුවත් කළ බවත්, ඒ වන විට ග්‍රාම නිලධාරීවරයා අසනීප තත්ත්වයෙන් රෝහලට ගොස් සිටි බැවින් ග්‍රාම නිලධාරිවරයා පසුව පැමිණ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව කියා සිට ඇති අතර ඒ වන විට නිවස පරීක්ෂා කිරීමට එම ප්‍රදේශයේ පල්ලියේ පුද්ගලයන් කිහිප දෙනෙකු සහ කලන්දරාසා හිල්මි යන අය පැමිණ තිබූ බවත්, නියාස් යන අය එළියට පැමිණ නැවත ආපසු නිවස තුළට ගිය බවත්, ඉන් අනතුරුව තුවක්කුවක්ද රැගෙන එලියට පැමිණි අතර ඔහු පුපුරවා ගැනීමට යන බව කියා සිටි බැවින් සියළු දෙනාම ඉවතට ගිය බවටත් කියා සිටින ලදී. සාක්ෂිකරුට පැ.829 ලෙස සලකුණු කරන ලද CD පටයේ ඇතුළත්ව තිබූ img_0213 දරන ඡායාරූපය පෙන්වා සිටින ලද අතර, එහි සඳහන් ගිනිඅවිය සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලදී. එකී ඡායාරූපය පැ.829(B) වශයෙන් පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි. එම අවස්ථාවේ ග්‍රාමසේවක මහතාද එම ස්ථානයට පැමිණ සිටි බවත්, තමන් නිවසේ පිටුපස තිබූ ක්‍රීඩාංගනය වෙත ගොස් සිටි අතර නිවස පුපුරා ගිණිගත් බවත් එදින රාත්‍රියේදී යුධ හමුදාව එම ස්ථානයට පැමිණි අතර, පසු දින සියළු දෙනා ඒ ආසන්නයේ පාසලට කැඳවා විමර්ශනය පැවැත්වූ බවත්, තමාව ද

අත්අඩංගුවට ගෙන රඳවා ගෙන සිටි අතර රක්ෂණ භාරයේ සිටීමට සිදුවූ බවත් කියා සිටින ලදී. 26 වන දින පස්වරු 5.30 ට පමණ 6.00 කාලයේ මහරිත් සලාතේ අවසන් වී සලාම් කියන අවස්ථාවේ දී එම බෝම්බය පිපිරූ බවත්, තමා අම්පාර පොලිසියේ රැඳවුම් නියෝග මත සිටින විට එම බෝම්බ පිපිරීමෙන් 14 දෙනෙකු මියගොස් ඇති බව තමාට දැනගන්නට ලැබුණු බවත් කියා සිටින ලදී. තමා රක්ෂණ භාරයෙන් පැමිණි පසු නිවසට ගොස් පරීක්ෂා කළ බව කියා සිටින සාක්ෂිකරු img_0993 jpg දරන ඡායාරූපයෙන් දැක්වෙන්නේ තමාගේ නිවස බවට හඳුනාගන්නා ලද අතර, එම ඡායාරූපය පැ.829 (C) වශයෙන් සලකුණු කරන ලදී. තවද එකී පැ.829 (C) ඡායාරූපයේ ඇති වෑන් රථය, නියාස් යන අය 20 වන දින මඩකලපුව ප්‍රදේශයට යාම සඳහා පිටත්ව ගිය වාහනය බවත්, එම ස්ථානයේ බෝම්බ පිපිරීම සිදු වීමට පෙර ග්‍රාමනිලධාරී මහතා පැමිණෙන විට එම වෑන් රථය එම ස්ථානයේ තිබූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලද අතර, පැ.829(D) වශයෙන් සාක්ෂිකරුට පෙන්වා සළකුණු කරන ලද img_0998 jpg ඡායාරූපයෙහි අංක 13 වශයෙන් දක්වා ඇති තුවක්කුව සහ එහි සිටින පුද්ගලයා නියාස් වශයෙන්ද හඳුනාගන්නා ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2280 සුල්තාන් හමීදා යන අය සාක්ෂි දෙමින් තමා පැමිණිල්ලේ සාක්ෂි අංක 2279 අබ්දුල් මජීද් ආදම් බාවාගේ බිරිඳ බවත්, අංක:184, බොලිවේරියන් ග්‍රාමය, සයින්දමරුදු 09 ලිපිනයේ පදිංචිව සිටින බවටත් කියා සිටින ලදී. තමා පදිංචි නිවසට යාබද නිවස

සම්බන්ධයෙන් අප්‍රේල් 05 වන දින විමසීමක් කරන ලද පුද්ගලයෙකු අප්‍රේල් මස 15 වන දින එකී නිවසට පදිංචියට පැමිණි බවත්, ඔහු සමඟ තම නිවස ආශ්‍රිත හෝටලයක සිටින සජාත් සහ තවත් අයෙකුද පැමිණි අතර නිවස කුලියට ගත් පුද්ගලයාව නියාස් යනුවෙන් හඳුන්වනු ලබන අතර ඔහු සමඟ පිරිමින්, කාන්තාවන්, සහ කුඩාදරුවන් 4 දෙනෙකු සමඟ පැමිණි බවත්, අප්‍රේල් මස 20 වන දින තමුන් මංගල උත්සවයකට සහභාගී වී පැමිණි අතර අප්‍රේල් 26 වන සිකුරාදා දින සවස 3.30ට පමණ ඔවුන් නැවත වාහනයකින් එම නිවසට පැමිණි බවටත් කියා සිටින ලදී. අදාළ නිවසේ ඡායාරූපයක් විවෘත අධිකරණයේ ස්ථාපිත කර ඇති පුළුල් තිරය මඟින් සාක්ෂිකාරියට පෙන්වා සිටි අතර එම ඡායාරූපය දිස් වන්නේ එම කුලියට ලබා දුන් නිවස බවත්, එහි පෙනෙන්නට ඇති වෑන් රථය කුලියට ගත් අයගේ වෑන් රථය බවටත් කියා සිටින ලදී. අප්‍රේල් 26 වන දින ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 21 වන දින කොළඹ හා මඩකලපු දිස්ත්‍රික්ක වල පුපුරවා ගත් අය කාත්තන්කුඩි ප්‍රදේශයේ පුද්ගලයන් බව දැනගත් බැවින්ද කුලියට ගත් නියාස් යන අය කාත්තන්කුඩි ප්‍රදේශයේ අයෙකු බවට කියූ බැවින්ද ග්‍රාමනිලධාරීවරයා වෙත එම තොරතුරු ලබා දුන් බවත් ඉන්පසු එම ස්ථානයට ග්‍රාම නිලධාරීවරයා සහ හිල්මි යන අය සමඟ පල්ලියේ පිරිසක් ද පැමිණි අතර එම අවස්ථාවේ නියාස් යන අය එළියට පැමිණ කතා කළ බවත්, එම අවස්ථාවේ හිල්මි යන අය කාන්තාවන්ට සහ තමන්ලාට එතනින් ඉවත් වන ලෙසට දැන්වූ අතර ඉන්පසු එම අවස්ථාවේ දී එම

ස්ථානයේ පිපිරීමක් සිදු වූ අතර තමා හැරී බැලීමක්වත් සිදු නොකොට දිව ගිය බවට කියා සිටින ලදි. දින තුනකට පසුව තමා එම නිවසට ගිය බවත්, නිවසෙහි දොර ඉබි යතුරු කැඩී ගොස් පිපිරීමෙන් හානි සිදු වී තිබූ බවත්, එම ස්ථානයේ පුද්ගලයින් 15 දෙනෙකු හෝ 14 දෙනෙකු මියගොස් ඇති බවට තමාට අසල්වාසීන්ගෙන් දැන ගන්නට ලැබුණු අතර ළමයෙක් සහ කාන්තාවක් දිවි ගලවා ගත් බව තමා දැනගත් බවටද කියා සිටින ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 2282 මොහොම්මදු මීරා සායිබු මොහොමදු මාහිර් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා විශ්‍රාමික ග්‍රාම නිළධාරිවරයකු වන බවත්, තමන් 2019 වර්ෂය වන විට සයින්දමර්දු- 9 ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි ලෙස කටයුතු කළ බවත්, මෙම නඩුවේ සාක්ෂිකරුවකු වන අබ්දුල් මජීත් ආදම්බාවා යන අය තමාට අයත් ග්‍රාම සේවක වසමේ බොලිවේරියන් ග්‍රාමයේ පදිංචි වී සිටි පුද්ගලයෙකු බවත්, එම බොලිවේරියන් ගම්මානයේ ඔහු පදිංචි වී සිටි නිවසට යාබදව තවත් නිවසක් ඔහු මිළදී ගත් බවත්, එලෙස මිළදී ගත් නිවස බී/182 අංක දරණ නිවස බවත්ය. නිලධාරී වසමේ බොලිවේරියන් ග්‍රාමයේ නිවසක් මිලදී ගෙන තිබූ බවත් කියා සිටින ලද අතර එම සාක්ෂිකරුට පරිගණකය ආශ්‍රයෙන් පෙන්වන ලද පැ. 829 දරණ සීඩී පටයේ අඩංගු IMG 0289-JPG යන ඡායාරූපයේ සඳහන්

නිල්පාට නිවස අබ්දුල් මජීත් යන අය පදිංචි නිවස බවට හඳුනාගන්නා ලද අතර, එම ඡායාරූපය පැ. 829 (E) වශයෙන් සලකුණු කරන ලදි. එසේම ඔහු අලුතින් මිලදී ගත් නිවසේ අංකය B-182 බවත් එය A-182 ලෙසට මතකයක් තිබෙන බවත් කියා සිටින ලදි.

2019 අප්‍රේල් 26 වැනි දින යම් පිරිසක් පැමිණ තමාට දැනුම් දීමක් කර තිබූ බවත්, ඒ අවස්ථාවේදී තමා බඩේ අමාරුවක් සඳහා රෝහලට ගොස් සිටි අතර රෝහලේ සිට ආපසු පැමිණෙන අවස්ථාවේදී සිද්දික් යන අය දුරකතනයෙන් අමතා එම නිවසට පැමිණි බවත්, එම ස්ථානයේ හිල්මි, ආදම්බාවා යන අය සිටි අතර තමා ගොස් එම නිවසට තට්ටුකොට කතා කරන විට එහි සිට පැමිණි පුද්ගලයෙක් ‘‘මාව පාවා දෙන්නද ආවේ.’’යනුවෙන් විමසා ‘‘අල්ලාහු අක්බර්’’ යනුවෙන් කියා එළියට පැමිණ තුවක්කුවෙන් අහසට වෙඩිල්ලක් තිබූ බවත්, එම පුද්ගලයා සරමක් සහ කමිසයක් ඇඳ සිටි අතර තරුණ වයසේ පුද්ගලයෙකු බවත්, රැවුල වවා තිබුණු අතර ඔහු අත තිබූ තුවක්කුව හමුදාවේ සාමාජිකයන් භාවිතා කරන තුවක්කුවක් බවටත් කියා සිටින ලද අතර, මීට ප්‍රථමයෙන් මෙම අධිකරණයේ සාක්ෂි මෙහෙය වන අවස්ථාවේදී සලකුණු කරන ලද පැ. 829(B) වශයෙන් සලකුණු කර ඇති ඡායාරූපය ඔහුට පෙන්වන ලද අතර, එය එවැනි තුවක්කුවක් බවට හඳුනා ගන්නා ලදි. ඒ අවස්ථාවේදී එම තැනැත්තා විසින් තමන්ලා හටද වෙඩි තැබිය හැකියැයි යන බියෙන් ඔවුන් දුරට වී සිටි බවත්, එම ස්ථානයේ සුදුපාට වෑන් රථයක් නවත්වා තිබූ අතර,

එය මීට ප්‍රථම පැ.829(C) වශයෙන් සලකුණු කරන ලද වැන්රථයේ ඡායාරූපය පෙන්වා සිටිය අවස්ථාවේදී හඳුනා ගන්නා ලදි. කෙසේ නමුත් මෙම අවස්ථාවේදී ඇතට වී සිටින විට තමාට බෝම්බ 3ක් පිපිරෙන ශබ්දයක් ඇසුනු බවත්, ඒ සමඟම උඩින් ගින්දර පැමිණි බවත්, හමුදාවෙන් පැමිණෙන බවට මිනිසුන් කෑ ගැසූ අතර ඒ සමඟම ඔවුනුත් ඒ දෙසට දිවගිය බවත්, පසුව පොලීසිය පැමිණි අතර තමා ග්‍රාම නිලධාරිවරයා වශයෙන් පොලීසිය සමඟ පසුදින උදේවරුවේදී එම ස්ථානයට ගිය බවටත් කියා සිටින ලදි. එම ස්ථානයේ මළ සිරුරු 15ක්, 16ක් පමණ තිබෙන බවට තමාට දැනගන්න ලැබුනු බවත් ආසන්නයේ නිවසක වහල උඩද අත්, කකුල් වැනි ශරීර අවයව තිබූ අතර ඊට දින කිහිපයකට පෙර රටේ ප්‍රධාන නගරවල දේවස්ථානවල බෝම්බ පිපිරීම් සිදු වී තිබූ බව තමා මාධ්‍ය හරහා දැනගෙන සිටි බවත් කියා සිටින ලදි.

පසුව පරීක්ෂා කිරීමේදී මෙම නිවසෙහි රැඳී සිටි පිරිස සහරාන්ගේ බිරිඳ සහ සහරාන්ගේ ඥාතීන් බවටත් සහරාන්ගේ මව, පියා සහ සහෝදරවරු බවටත් තමා දැනගත් අතර සහරාන්ගේ බිරිඳ වශයෙන් හඳුන්වනු ලැබූ කාන්තාවක් එම අවස්ථාවේදී දිවි බේරාගෙන තිබූ බව තමා දන්නා බවත් කියා සිටින ලදි. ඒ අවස්ථාවේදී පැ. 829 (A) වශයෙන් මීට පෙර නඩු විභාගයේදී සලකුණු කරන ලද වර්ණ ඡායාරූපය සාක්ෂිකරුට පෙන්වා සිටි අතර පාරට පැමිණ වෙඩි තැබූ පුද්ගලයා එම තැනැත්තා බවට

පිළිගන්නා ලද අතර, එය පැ.829 (D) වශයෙන් සලකුණු කරන ලද ඡායාරූපයෙන්ද පිළිගන්නා ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2284 කලන්දර්සා හිල්මි යන සාක්ෂිකරු සාක්ෂි දෙමින්, තමා වසර 12ක පමණ කාලයක් සයින්දමර්දු ප්‍රදේශයේ බොලිවේරියන්හි සුනාමි ගම්මානයේ පදිංචිව සිටින බවත්, 2019.04.26 දින ප.ව. 5.50ට පමණ මහරීෆ් සලාතේ සිදුකිරීමට ආසන්න වේලාවේදී තමා පල්ලිය අසල පිරිසක් සමඟ කතා කරමින් සිටි බවත්, එම ස්ථානයේ පිහිටි ආදම්බාවා නැමති අයට අයත් නිවසක සැක කටයුතු පුද්ගලයෙකු සිටින බවට දැනුම් දුන් බවත්, තමා එම නිවසට ගොස් නිවසේ සිටි පුද්ගලයන්ට කතා කළ බවත්, නිවස හිමි ආදම්බාවා යන අය සහ තමාගේ මිත්‍රයෙකු වන රිෆාන් යන අය ද එම ස්ථානයේ සිටි අතර කලු පැහැති වීදුරු දැමූ වාහනයක් එම ස්ථානයේ නවතා තිබූ බවත් කියා සිටින ලදී.

ආදම්බාවා විසින් එම නිවසෙහි ගේට්ටුවට තට්ටු කොට නිවසේ සිටි පුද්ගලයන්ට කතා කළ විට නිල් පාට ඉරි සහිත ටී ෂර්ට් එකක් හැඳ සිටි සාමාන්‍ය ප්‍රමාණයේ රැවුලක් වවා තිබූ පුද්ගලයෙකු පැමිණි අතර, තමා ඔහුගෙන් එම පුද්ගලයන් කොහේ සිට පැමිණ සිටින්නේ ද යන්න විමසා සිටි අතර එවිට ඔහු එනම් නිවසේ සිටි පුදගලයා තමා කවුද යන්න ‘‘ඒක

අහන්න ඔයා කවුද'' යනුවෙන් තමාගෙන් විමසා සිටි අතර, එවිට තමා පල්ලියේ පරිපාලන කටයුතු වල සාමාජිකයෙකු සහ ගමේ වැදගත් පුද්ගලයෙකු බවත් නිවසේ සිටි එම පුද්ගලයාට දැන් වූ විට නිවසේ සිටි එම පුද්ගලයා ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ සිට පැමිණි පුද්ගලයෙකු බවත් ත්‍රිකුණාමල ප්‍රදේශයේ ඒජන්සියක් පවත්වාගෙන ගොස් දැනට අම්පාර දිස්ත්‍රික්කයට මාරු කර ඇති බැවින් මෙහි පැමිණි බවත් කියා සිටි අතර, එවිට තමා (සාක්ෂිකරු) ඔහු සම්බන්ධයෙන් ගම්වැසියන්ට සැකයක් මතු වී ඇති බවත්, ඒ පිළිබඳව පල්ලියට සහ ග්‍රාමනිලධාරීවරයාට පැමිණිලි කර ඇති බවටත් ඔහුට පහදා දුන් අතර, ඒ වන විට කොලඹ ප්‍රදේශයේ බෝම්බ පිපිරී දින දෙක තුනක් ගතවී තිබූ බව තමා දන්නා බවත් කියා සිටින ලදී.

නිවස පරික්ෂා කිරීමට අවශ්‍ය බව තමා දැන්වූ අතර එවිට ඔහු එනම් නිවසේ සිටි පුද්ගලයා ඔවුන් උදේ 10.00ට පමණ යන බව දැන්වූ බවත්, එවිට තමා ඔහුට පිළිතුරු වශයෙන් ග්‍රාමසේවක සහ පල්ලියේ පිරිස සලාතේ කටයුතු ඉවර වුණු වහාම මෙම ස්ථානයට පැමිණෙන බැවින් තමාට(සාක්ෂිකරුට) මේ අවස්ථාවේම නිවස පරික්ෂා කර බලන්නේ නම් ප්‍රශ්නයක් ඇති නොවන බව කියා සිටින ලදී.

එවිට ඔහු එනම් නිවසේ සිටි පුද්ගලයා ''මට උදේ 10 වෙනකම් වෙලාව දෙන්න'' යනුවෙන් කීප විටක් කියා සිටි බවත්, එවිට තමාට හිනා ගිය අතර එය දැක ඔහුට තරහ ගොස් නිවස ඇතුලට ගිය අතර නිවස තුළ

හතර පස් දෙනෙකු සිටි අතර ඉන් එක් අයකු අතේ ආයුධයක් තිබූ අතර මුහුණ ආවරණය වන ලෙසට ෆර්ධාව ඇඳ සිටි අතර ඒ සමගම නිවසේ අයිතිකරුගේ බිරිඳත් එළියට පැමිණි අතර ඔබලා හිතන දේ මෙතන වෙන්නෙ නෑ මෙතන වෙන දෙයක් වෙන්නේ ඔබලා මෙතනින් පිටත් වෙන්න කියලා වටේ ඉන්න අයට ද දැනුම් දී 119 හදිසි ඇමතුම් අංකයට දැනුම් දීමක් කළ බව කියා සිටින ලදී.

තමා එම ආයුධය රැගෙන සිටි පුද්ගලයා මුස්ලිම් කාන්තාවක් අදින මුහුණේ සිට පාදය වැසෙන සේ කලු පාට ඇදුමක් ඇඳ සිටි බවත් තමා එම නිවාසයේ අයිතිකරු සහ අවට සිටි අයටත් එම ස්ථානයෙන් අයින් වන ලෙස දැනුම් දුන් අතර, ඒ වන විට ග්‍රාමසේවක මාහීර් මහතා එතනට පැමිණි අතර සාක්ෂිකරු ඔහුගේ අතින් අල්ලා ඇතුලේ යම් සිදුවීමක් සිදුවන බව දැනුම් දී ඔහු සමග නිවාස දෙකකට පමණ එහාට ගමන් කළ අතර ඒ වන විට එම අවස්ථාවේ දී පල්ලියේ ප්‍රධානියා ද එතනට පැමිණි අතර එවිට වෙඩි ශබ්ද දෙකක් සහ ‘‘අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්’’ යන හඬත් සමඟම බෝම්බ පිපිරීමේ ශබ්ද දෙකක් ඇසුණු බවත්, ඒ වන විට තමා එම පිපිරීම සිදුවූ නිවසට අඩි 80-90 පමණ දුරින් සිටි අතර දෙවන බෝම්බයේ සද්දය ඇසීමත් සමඟ එම ස්ථානයෙන් ඉවතට දිව ගිය බවත් කියා සිටින ලදී. එම සාක්ෂිකරුට පැ.829 (A) දරණ ඡායාරූපය පෙන්වන ලද අතර එම ඡායාරූපය තමා සමග කතා කළ පුද්ගලයාගේ බවත් ඔහු ඇඳ සිටින ඉරි සහිත ටී ෂර්ට් එක මගින් හඳුනාගත හැකි බව කියා සිටින අතර පැ.829 (D)

ඡායාරූපය පෙන්වා සිටින ලද අතර එම ඡායාරූපයේ සිටින පුද්ගලයා තමා සමග කතා කරන ලද පුද්ගලයා බවත් එම ඡායාරූපයේ අංක 13 වශයෙන් සඳහන් කරන ලද්දේ එම අවස්ථාවේ තිබූ ආයුධයට සමාන ආයුධයක් බවත් කියා සිටි සාක්ෂිකරු පැ.829 (E) ඡායාරූපයේ ඇත්තේ බෝම්බය පිපිරුණු ස්ථානය එනම් එම නිවස බවත් එහි ඇති වාහනය ද එම ස්ථානයේ එම ඡායාරූපයේ දක්නට ඇති බවත් හඳුනාගනිමින් සාක්ෂි ලබා දෙන ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 1627, නියෝජ්‍ය පොලිස්පති **සාමන්ත දීපාල් විජේසේකර** යන අය මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති අතර, ඔහුගේ සාක්ෂියට අනුව ඔහු 2019 අප්‍රේල් මාසය වන විට අම්පාර කොට්ඨාශය භාර පොලිස් අධිකාරි ලෙස කටයුතු කර ඇති අතර, 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් දින 05 කට පසුව එනම්, 2019.04.26 වන දින සවස් වරුවේ සයින්දමරදු ප්‍රදේශයේ ස්ථානයක සිදුව තිබූ වෙඩි හුවමාරුවක් සම්බන්ධ තොරතුරක් ලැබී ඇති අතර, ඒ සම්බන්ධව සොයා බැලීමට සයින්දමරදු බොලිවේරියන් ග්‍රාමය යන ස්ථානයට ගොස් ඇති අතර, එදින එම ප්‍රදේශයේ පිහිටි අංක 184, දරණ මෙම නිවසේ විශාල බෝම්බ පිපිරීමක් සිදුව ඇති අතර, ඉන්පසුව එම නිවස මෙම සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කර ඇත. එම සිදුවීමෙන් පුද්ගලයන් කීපදෙනෙකුගේම මෘත

ශරීර මෙම සාක්ෂිකරු විසින් නිරීක්ෂණය කර ඇති අතර, එම ස්ථානයේ සැක කටයුතු භාණ්ඩ කීපයක්ද නිරීක්ෂණය කර ඇත. ඉන්පසුව එම ස්ථානය මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා.2007 මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පො.ප.ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් විසින් පරීක්ෂා කර ඇති අතර, ඔහු විසින් එම ස්ථානයේ තිබී නඩු භාණ්ඩ තොගයක් තමාගේ භාරයට ගෙන ඇත. එකී නඩු භාණ්ඩ පසුව අම්පාර අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට භාර දී ඇති අතර, ඉන්පසුව විශ්ලේෂණය සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුවටද යවා ඇත.

සයින්දමරුදු 09, බොලිවේරියන් ග්‍රාමය, අංක 184 දරන ලිපිනයේ පිහිටි ලිපිනයේ පිහිටි ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේ සයින්දමරුදු 09 බොලිවේරියන් ග්‍රාමය, අංක B/182, දරණ ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධයෙන් පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එකී නිවස එම බොලිවේරියන් ග්‍රාමයේම පදිංචි වී සිටි පැ.සා. 2279 අබ්දුල් මජීද් ආදම් බාවා යන අයට අයත් නිවසක් වන අතර, එම නිවස කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු ලෙස තමාව හඳුන්වා දුන් නියාස් යන අය විසින් කුලියට ලබා ගෙන ඇත. එකී නිවසේ අයිතිකරු වූ අබ්දුල් මජීද් ආදම් බාවා එකී නියාස් යන අයව පෙර දැනගෙන සිට නොමැති අතර, පැ.829(D) ලෙස අධිකරණයේ ලකුණු කර ඇති

ඡායාරූපයේ අංක 03 වශයෙන් අතේ තුවක්කුවක් සහිතව සිටින පුද්ගලයා එකී නියාස් යන පුද්ගලයා ලෙසට හඳුනා ගන්නා ලදි.

තවද, පැ.සා. 2254 සමන් කුමාර යන අය මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඔහු විසින් 2019.04.20 වන දින පානදුර, පරත්ත පාරේ අංක 61/2 දරණ ලිපිනයේ පිහිටි 'නස්මියා විලා' නමින් හැඳින්වූ නිවසේ සිට භාණ්ඩ තොගයක් බොලිවේරියන් ග්‍රාමයේ පිහිටි මෙම නිවසට රැගෙන ආ බවත්, එම භාණ්ඩ පරත්ත පාර නිවසේ සිට තමාගේ වාහනයට පැටවූ අවස්ථාවේ පෙට්ටියක් තුළ තිබී ලෝහ බෝල එනම්, බයිසිකල් බෝල වැටෙනවා දුටු බවට සාක්ෂි ලබා දී ඇත. 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව එකී පරත්ත පාර නිවස පොලිසියේ නිළධාරීන් විසින් පරීක්ෂාවට ලක් කිරීමේදීඑහි තිබී මෙවැනි ලෝහ බෝල ඇසුරුම් කිරීමට භාවිතා කරන ලද පොලිතින් පැකට් විශාල ප්‍රමාණයක් සොයා ගෙන ඇත. තවද, මෙවැනි ලෝහ බෝල පාස්කු ඉරුදින භාවිතා කරන ලද පිපුරුම් උපක්‍රම සඳහා භාවිතා කර ඇති බවට මෙම අධිකරණයේ සාක්ෂි මඟින් හෙළි වී ඇත.

2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දින 05 කට පසුව එනම්, 2019 අප්‍රේල් 26 වන දින මෙම සයින්දමරුදු 09 බොලිවේරියන් ග්‍රාමයෙහි පිහිටි නිවස තුළ විශාල පිපිරීමක් සිදුව ඇති අතර, එම පිපිරීමෙන් පුද්ගලයන් කිහිපදෙනෙකුම මිය ගිය බවට මෙම

අධිකරණයේ සාක්ෂි ඉදිරිපත් වී ඇත. තවද, 2019.04.26 වන දින මෙම ස්ථානය පැ.සා.2007 මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ පො.ප. ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් විසින් ස්ථාන පරීක්ෂණයකට ලක් කර ඇති අතර, එම අවස්ථාවේදී අදාළ ස්ථානයේ තිබී භාණ්ඩ කීපයක් සොයා ගෙන ඇත. එම භාණ්ඩ අතර බෝම්බයක් පුපුරා ගිය බවට සැක කළ සිමෙන්ති පොළවේ වළක් සහිත තිබූ ස්ථානයෙන් සොයා ගන්නා ලද යකඩ බෝල, ජෙලටි නයිට් තිබූ හිස් නිල් පැහැති ප්ලාස්ටික් ආවරණ 12 ක් සහ කුඩා පිහියක්, විදුලි බලය සවිකර නොමැති ඩෙටනේටර් 329 ක්, කොළ පැහැති වයර් සවි කරන ලද සර්කිට් 02 ක් අඩංගු ඩෙටනේටර් 27 ක්, ජෙලටි නයිට් කූරු 56 ක් සොයා ගෙන ඇත.

<u>හම්බන්තොට, සිප්පිකුලම ප්‍රදේශයේ පිහිටි ආරක්ෂිත නිවස</u>

<u>සම්බන්ධ සාක්ෂි</u>

පැ.සා. 1999 සෙයියදු මසූර් මවුලානා යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ, තමා හම්බන්තොට සිප්පිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බවත්, රැකියාව ලෙස ත්‍රීරෝද රථයක් ධාවනය කරන බවත්, තමාගේ බිරිඳගේ මාමා එනම්, සෙයියදු මොහොම්මදු ෆවුහාස් මවුලානා යන අය කුවේට් රාජ්‍යයේ රැකියාවක් කළ බවත්, ඔහු තමා පදිංචි වී සිටි ස්ථානයට මීටර් 500 ක පමණ දුරකින් ඉඩමක් මිළට ගෙන නිවසක් සෑදූ බවත්, ඉන්පසු එම නිවස කෙටි කාලීන කුලී පදනම මත සංචාරකයන්ට ලබා දීම සිදු කළ

බවත්, 2018 කාල වකවානුවේ ජලීල් නමැති තැරැව්කරුවෙකු මාර්ගයෙන් මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි ආබ්දීන් යන අයෙකු හඳුන්වා දුන් බවත් එම ආබ්දීන් යන අය මෙම නඩුවේ 15 වන චූදිත බවත්, ඔහු හතර වතාවක් හෝ පස් වතාවක් පමණ තමාට දුරකථනයෙන් අමතා එම නිවාඩු නිකේතනය වෙන් කරවා ගත් බවත්, ඒ අවස්ථාවන් හතරෙහිදිම ආබ්දීන් නමැති අය වෑන් රථයකින් පැමිණි බවත්, එසේ පැමිණ තමාගේ බංගලාවේ යතුර ඉල්ලා ගෙන යන බවත්, ඒ සෑම අවස්ථාවකදීම පිරිස කිහිපදෙනෙකු පමණ පැමිණි බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් 15 වන චූදිත ආබ්දීන් විසින් 2018 කාල වකවානුවේ හම්බන්තොට සිප්පිකුලම ප්‍රදේශයේ පිහිටි, මෙම සාක්ෂිකරු විසින් පරිපාලනය කරන ලද නිවාඩු නිකේතනය අවස්ථාවන් හතරකදි වෙන්කරවාගෙන ඒ අවස්ථාවන් හතරෙහිදිම 15 වන චූදිත ආබ්දීන් නමැති අය වෑන් රථයකින් පිරිස කිහිපදෙනෙකු සමග පැමිණ නිවාඩු නිකේතනයේ යතුර ඉල්ලා ගෙන ගොස් ඇති බව පෙනී යන අතර එම පුද්ගලයන් කවුරුන්ද, ඔවුන් එම නිවාඩු නිකේතනයේ කුමක් කලේද, යන්න සම්බන්ධයෙන් කිසිදු කරුණක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළි නොවේ.

හම්බන්තොට, සිප්පිකුලම ප්‍රදේශයේ පිහිටි ආරක්ෂිත නිවස

සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේ හම්බන්තොට, සිප්පිකුලම යන ප්‍රදේශයේ පිහිටි නිවසක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇත. සෙයියදු මොහොම්මදු ෆවුහාස් යන අයට අයත් එම නිවස කෙටි කාලීන කුලී පදනම මත සංචාරකයන්ට ලබා දී ඇති අතර, 2018 කාල වකවානුවේ මෙම නඩුවේ 15 වන චූදිත වන මොහොම්මදු හනීෆා සෙයිනුල් ආබ්දීන් යන අය විසින් හතර හෝ පස් වතාවක් පමණ එම නිවස කුලියට ලබා ගෙන නැවතී ඇති අතර, ඔහු එම සෑම අවස්ථාවකදීම වෑන් රථයකින් හෝ දෙකකින් තවත් පුද්ගලයන් කිහිපදෙනෙකු සමඟ පැමිණ එලෙස නැවතී සිට ඇත. 15 වන චූදිත සමඟ එලෙස එම නිවසට පැමිණ නැවතී සිටි සියළුම පුද්ගලයන් පිරිමි අය බවද සාක්ෂි මඟින් හෙළි වී ඇත.

මෙම නඩුවේ 01 වන චූදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දුන් පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පැ.803(A2) (10) ලෙස ලකුණු කර ඇති පහත සඳහන් කොටස අන්තර්ගත වී ඇත.

"මා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බිලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින දෙකක work shop (වැඩමුළු) පැවැත්වූ අතර එක් එක් කඳවුර සඳහා 15-20 දෙනෙකු පමණ සහභාගී වූහ. මා සහ සහරාන් පුහුණුවට සහභාගීවන්නන්ට එනම් මම ආගමික කරුණු සම්බන්ධවත්, IS සංවිධානය සම්බන්ධවත් දේශන පැවැත්වූවෙමි. සහරාන්ද ඒ අයුරෙන්ම ඉස්ලාමීය අරගලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර මට්ටමින් මුස්ලිම් ජනතාවට සිදුව ඇති ගැටලු සම්බන්ධවත් දේශන කළේය. සමහර තැන්වලදී වීඩියෝ මඟින් ගෝලීය මට්ටමෙන් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති ගැටලු සම්බන්ධවත්, IS සංවිධානයට අදාළ වීඩියෝ දර්ශනත් අපි ප්‍රදර්ශනය කළෙමු. දුරකතන භාවිතය සම්බන්ධවත්, පිහියෙන් පහරදීම සහ ආයුධ සම්බන්ධවත් කස්තූන් පුහුණුව ලබාදුන්නේය. එම වැඩසටහන් සඳහා සාෆික්, මිල්හාන්, සාජිත්, සාදික් යන අයද සහභාගී වූහ. එහිදී අබූ යන නම් තබන ලදි. ඒ අනුව එම සංවිධානය විසින් මට අබූ ෂෙයිඩ් යන නම තබන ලදි. මම work shop (වැඩමුළු) 09කට වගේ සහභාගී වුණෙමි."

01 වන චූදිතගේ ඉහත ප්‍රකාශය අනුව හම්බන්තොට ප්‍රදේශයේ අන්තවාදී දේශණයන් පැවැත්වීම සඳහා වැඩමුළු පවත්වා ඇති බවට සහ එම වැඩමුළු වලදී ජාත්‍යන්තර වශයෙන් තහනමට ලක් වී තිබෙන IS සංවිධානය සම්බන්ධව සහ ඔවුන්ගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන්

සාකච්ඡා වී ඇත. තවද, එම වැඩමුළු වලට මෙම නඩුවේ 03 වන චූදිත වන මිල්හාන්, 04 වන චූදිත වන සාදික් සහ 09 වන චූදිත වන සාජිත් යන අය සහභාගී වී ඇති අතර, හස්තූන් යන 2019.04.21 වන දින කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගත් තැනැත්තා මෙම වැඩමුළු වලට සහභාගී වී ඇති අතර, ඔහු විසින් පිහියෙන් පහර දීම සහ ආයුධ සම්බන්ධයෙන් පුහුණුව ලබා දී ඇත.

අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමේදී අපහට පෙනී යන්නේ, හම්බන්තොට, සිප්පිකුලම ප්‍රදේශයේ පිහිටි මෙම නිවස මෙම නඩුවේ 15 වන චූදිත වන මොහොමඩ් හනීෆා සෙයිනුල් ආබ්දීන් යන අය 2019.04.21 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් සහරාන් සහ එදිනම කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගත් හස්තූන් යන අය සහ තවත් පිරිසක් නැවතී සිට වැඩමුළු පවත්වා ඇති අතර, එහිදී IS සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, අවිආයුධ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සහ පිහි වලින් පහර දීම සම්බන්ධයෙන් අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාකාරකම් වලට මෙම නිවස භාවිතා කර ඇති බවත්ය. තවදුරටත් පෙනී යන්නේ, මෙකී ක්‍රියාවලියන්හි මෙම නඩුවේ 15 වන චූදිත

දැනට මියගොස් සිටින ඉහත සඳහන් කර ඇති සහරාන් , හස්තූන් සහ තවත් පුද්ගලයන් සමඟ යම් වරදක් සිදු කිරීම පිණිස සංවිධානය වී එක කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇති බවටය.

<u>නුවර ධර්මාශෝක මාවත, අංක 14 දරණ ලිපිනයේ පිහිටි</u>

<u>‘Enrich bungalow’ නමැති නිවාඩු නිකේතනයේ වැඩමුළු</u>

<u>පැවැත්වීමට අදාළ සාක්ෂි</u>

නුවර අරුප්පොල ප්‍රදේශයේ වැඩමුළු පැවැත්වීම සඳහා පැ.සා.1393 අන්තෝනි දුරගේ කුෂාන් ෆීලික්ස් සිල්වා යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ, තමා රැකියාවක් වශයෙන් ව්‍යාපාරික කටයුතු වල යෙදී සිටින බවත් වර්ෂ 2016 සිට 2019 දක්වා නුවර පිටකන්ද පාරේ “La sachara Holiday” නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන ගිය බවත්, ඒ කාල වකවානුවේ නුවර ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටි දිනූප නුවන් පෙරේරා යන තැනැත්තකු තමා දැනගෙන සිටි බවත් ඔහු අංක 14, ධර්මාශෝක මාවත, නුවර යන ලිපිනයෙහි පිහිට ගොඩනැගිල්ලක ‘Enrich bungalow’ නමින් සංචාරක නිකේතනයක් පවත්වාගෙන ගිය බවත්, තමාගේ හෝටලය වෙන් කර ගැනීමට සංචාරකයන් කතා කරන අවස්ථාවලදී ඔවුන්ට ලබා දීමට තමාගේ හෝටලයේ කාමර නොමැති නම් එකී සංචාරකයින් නුවන් පෙරේරාගේ නිවාඩු නිකේතනයට යොමු කරන බවත් එලෙස කිහිප

අවස්ථාවකදීම තමා විසින් Enrich bungalow හෝටලයට සංචාරකයන් යොමු කර ඇති බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

ඉහත සාක්ෂිකරුගේ සාක්ෂියේ දී පවසා ඇති නුවර ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටි දිනූප නුවන් පෙරේරා යන අය එනම් පැ.සා. 1388 පතිරගේ දිනූප නුවන් පෙරේරා යන අය සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ, තමා සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින බවත් වර්ෂ 2017 අවසාන භාගයේ සිට නුවර අරුප්පල ප්‍රදේශයේ Enrich bungalow නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන ගිය බවත් එය කාමර 05 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් බවත්, එම ගොඩනැගිල්ලේ කාමරයක තමා නැවතී සිට ව්‍යාපාර කටයුතු සිදුකරගෙන ගිය බවත්, Ikman.lk සහ Booking.lk යන වෙබ් අඩවි වල ඒ සම්බන්ධ දැන්වීම් පළකර තිබූ බවත්, තමාගේ හෝටලය වෙන් කරවාගෙන පැමිණෙන සංචාරකයන්ගේ තොරතුරු රෙජිස්ට්‍රරයක සටහන් කර ගන්නා බවත්, ඔවුන් විසින් කරන ලද ගෙවීම් සම්බන්ධව බිල්පත් නිකුත් කරන බවටත් කියා සිටින ලදි. 2018 මාර්තු මස කුෂාන් පීරිස් යන අය විසින් පුද්ගලයන් දෙදෙනෙකු යොමු කළ බවත්, එම දෙදෙනා ලාංකික පුද්ගලයන් බවත්, ඔවුන් පැමිණ හෝටලය බැලීමෙන් අනතුරුව මුළු නිවාඩු නිකේතනයම දින 03 ක් සඳහා වෙන් කරවා ගත් බවත්, එසේ හෝටලය වෙන් කරන අවස්ථාවේදී පුද්ගලයන් 15 දෙනෙකුට හෝ 20 දෙනෙකු සඳහා එම ස්ථානය අවශ්‍ය බවට තමාට දැන්වූ බවත්, ඒ වෙනුවෙන් රුපියල් 20,000/. ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කළ බවත්,

ඉන් දින කිහිපයකට පසු වාහනයකින් ලාංකිකයින් හතර දෙනෙක් හෝ පස් දෙනෙක් පමණ හෝටලයට ආ බවත්, එම සංචාරකයන් හට යතුරු භාර දී තමා හෝටලයෙන් පිටත් වූ බවත්, ඉන්පසු තමා එම හෝටලය අසල ස්ථානයක නැවතී සිටි බවත්, සංචාරකයන් පැමිණි එම දින රාත්‍රියේ හෝටලය ඉදිරියේ වාහන කිහිපයක්ම නවතා තිබූ බවත්, තවදුරටත් සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ එම පුද්ගලයන් නැවතී සිටි කාලයේ දිනක තමාට කතා කර ගෑස් සිලින්ඩරය මාරු කර දෙන ලෙසට පැවසූ බවත්, ඒ සඳහා තමා හෝටලයට ගිය විට පුද්ගලයන් දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු තමා දුටු බවටත් පවසා සිටින ලදි. තමාගේ හෝටලය වෙන් කරන අවස්ථාවේදී බිල්පතක් ලබා දීම සඳහා පාවිච්චි කරන ලද බිල්පොත සහ හෝටලය වෙන් කරන ලද පුද්ගලයාට ලබා දෙන ලද අංක 84 දරන බිල්පතේ 02 වන පිටපත මෙම සාක්ෂිකරු විසින් විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර, එම බිල් පොත පැ.810 වශයෙන් සහ ඉහත සඳහන් අංක 84 දරන බිල්පතේ 02 වන පිටපත පැ.810(A) වශයෙන්ද පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි. පැ.810 (A) දරන බිල්පත පරීක්ෂා කර මෙම සාක්ෂිකරු කියා සිටියේ, එම 02 වන පිටපතේ අඩංගු තොරතුරු තමා විසින් ලියන ලද තොරතුරු බවත්, එම ලේඛන අනුව නිවාඩු නිකේතනය 2018.03.21 දින සිට 2018.03.26 දින දක්වා වෙන් කරවාගෙන ඇති බවත්, තමා විසින් සටහන් කර ඇති Mr. Meera Shahibu Mohoomad Naffli යන නම සහ අංක 811511806V දරන ජාතික හැඳුනුම්පත් අංකය සහ අංක 076-

4023543 දරණ දුරකථන අංකය එම වෙන් කිරීම සිදු කරන ලද පුද්ගලයා විසින් තමා හට ලබා දුන් තොරතුරු අනුව තමා විසින් සටහන් කර ගත් තොරතුරු බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරු 04 වන සහ 09 වන චූදිතයන් විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කරන ලද අතර, හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරුට යෝජනා කරන ලද්දේ, මෙම සාක්ෂිකරු විසින් පවසන ලද නිවාඩු නිකේතනය වෙන් කරන ලද පුද්ගලයා සංචාරක හෝටල් සඳහා සංචාරකයන් යොමු කරනු ලබන තැරැව්කරුවකු බවටය. සාක්ෂිකරු පවසා සිටියේ ඒ සම්බන්ධව තමා නොදන්නා බවයි.

පැ.සා. 1388 පතිරගේ දිනූප නුවන් පෙරේරා යන අය සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ, තමා සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින බවත්, වර්ෂ 2017 අවසාන භාගයේ සිට නුවර අරුප්පල ප්‍රදේශයේ Enrich bungalow නමින් නිවාඩු නිකේතනයක් පවත්වාගෙන ගිය බවත්, එය කාමර 05 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් බවත්, එම ගොඩනැගිල්ලේ කාමරයක තමා නැවතී සිට ව්‍යාපාර කටයුතු සිදුකරගෙන ගිය බවත්, Ikman.lk සහ Booking.lk යන වෙඩ් අඩවි වල ඒ සම්බන්ධ දැන්වීම් පළකර තිබූ බවත්, තමාගේ හෝටලය වෙන් කරවාගෙන පැමිණෙන සංචාරකයන්ගේ තොරතුරු රෙජිස්ටරයක සටහන් කර ගන්නා බවත්, ඔවුන් විසින් කරන ලද ගෙවීම් සම්බන්ධව බිල්පත් නිකුත් කරන බවටත් කියා සිටින ලදි. 2018

මාර්තු මස කුෂාන් පීරිස් යන අයකු විසින් පුද්ගලයන් දෙදෙනෙකු යොමු කළ බවත්, එම දෙදෙනා ලාංකික පුද්ගලයන් බවත්, ඔවුන් පැමිණෙ හෝටලය බැලීමෙන් අනතුරුව මුළු නිවාඩු නිකේතනයම දින 03 ක් සඳහා වෙන් කරවා ගත් බවත්, එසේ හෝටලය වෙන් කරන අවස්ථාවේදී පුද්ගලයන් 15 දෙනෙකුට හෝ 20 දෙනෙකු සඳහා එම ස්ථානය අවශ්‍ය බවට තමාට දැන්වූ බවත්, ඒ වෙනුවෙන් රුපියල් 20,000/- ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කළ බවත්, ඉන් දින කිහිපයකට පසු වාහනයකින් ලාංකිකයින් හතර දෙනෙක් හෝ පස් දෙනෙක් පමණ හෝටලයට ආ බවත්, එම සංචාරකයන් හට යතුරු භාර දී තමා හෝටලයෙන් පිටත් වූ බවත්, ඉන්පසු තමා එම හෝටලය අසල ස්ථානයක නැවතී සිටි බවත්, සංචාරකයන් පැමිණි එම දින රාත්‍රියේ හෝටලය ඉදිරියේ වාහන කිහිපයක්ම නවතා තිබූ බවත් ය.

තවදුරටත් සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ, එම පුද්ගලයන් නැවතී සිටි කාලයේ දිනක තමාට කතා කර ගෑස් සිලින්ඩරය මාරු කර දෙන ලෙසට පැවසූ බවත්, ඒ සඳහා තමා හෝටලයට ගිය විට පුද්ගලයන් දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු තමා දුටු බවයි. තමාගේ හෝටලය වෙන් කරන අවස්ථාවේදී බිල්පතක් ලබා දීම සඳහා පාවිච්චි කරන ලද බිල්පොත සහ හෝටලය වෙන් කරන ලද පුද්ගලයාට ලබා දෙන ලද අංක 84 දරණ බිල්පතේ 02 වන පිටපත මෙම සාක්ෂිකරු විසින් විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර, එම බිල් පොත පැ.810 වශයෙන් සහ

ඉහත සඳහන් අංක 84 දරණ බිල්පතේ 02 වන පිටපත පැ.810(A) වශයෙන්ද පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි. පැ.810(A) දරණ බිල්පත පරීක්ෂා කර මෙම සාක්ෂිකරු කියා සිටියේ, එම 02 වන පිටපතේ අඩංගු තොරතුරු තමා විසින් ලියන ලද තොරතුරු බවත්, එම ලේඛණ අනුව නිවාඩු නිකේතනය 2018.03.21 දින සිට 2018.03.26 දින දක්වා වෙන් කරවාගෙන ඇති බවත්, තමා විසින් සටහන් කර ඇති Mr. Meera Shahibu mohoomad naffli යන නම සහ අංක 811511806 V දරණ ජාතික හැඳුනුම්පත් අංකය සහ අංක 0764023543 දරණ දුරකථන අංකය එම වෙන් කිරීම සිදු කරන ලද පුද්ගලයා විසින් තමා හට ලබා දුන් තොරතුරු අනුව තමා විසින් සටහන් කර ගත් තොරතුරු බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරු 4 වන සහ 09 වන චූදිතයන් විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කරන ලද අතර, හරස් ප්‍රශ්න වලදී සාක්ෂිකරුට යෝජනා කරන ලද්දේ, මෙම සාක්ෂිකරු විසින් පවසන ලද නිවාඩු නිකේතනය වෙන් කරන ලද පුද්ගලයා සංචාරක හෝටල් සඳහා සංචාරකයන් යොමු කරනු ලබන තැරැව්කරුවකු බවටය. සාක්ෂිකරු පවසා සිටියේ ඒ සම්බන්ධව තමා නොදන්නා බවයි.

අංක 14, ධර්මාශෝක මාවත, නුවර යන ලිපිනයෙහි පිහිටි 'Enrich bungalow' දරණ සංචාරක නිවාඩු නිකේතනයේ වැඩමුළු පැවැත්වීමට අදාළ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේ නුවර ධර්මාශෝක මාවතේ, අංක 14 දරණ ලිපිනයේ 'Enrich bungalow'නමින් පවත්වාගෙන ගිය නිවාඩු නිකේතනයක් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් වී ඇත. ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී අධිකරණයට පෙනී යන්නේ කාමර 05 කින් යුත් එම මුළු නිවාඩු නිකේතනයම 2018 මාර්තු මස පුද්ගලයන් දෙදෙනෙක් පැමිණ දින 03 කට වෙන් කරවාගෙන ඇති අතර, ලේඛණ අනුව එලෙස වෙන් කිරීම සිදු කරන ලද දෙදෙනාගෙන් එක් පුද්ගලයෙක් ජාතික හැඳුනුම්පත් අංක 811511806V හිමි Meera Shahibu mohoomad naffli යන අය බවටය. ඉන්පසුව 2018.03.21 දින සිට 2018.03.26 දක්වා පුද්ගලයන් 15 ක් 20 ක් වැනි පිරිසක් පැමිණ එහි නැවතී සිට ඇති බවයි.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දුන් පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පැ.803(A2) (10) ලෙස ලකුණු කර ඇති පහත සඳහන් කොටස අන්තර්ගත වී ඇත.

"මා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින දෙකක work shop (වැඩමුළු) පැවැත්වූ අතර එක් එක් කඳවුර සඳහා 15-20 දෙනෙකු පමණ සහභාගී වූහ. මා සහ සහරාන් පුහුණුවට සහභාගීවන්නන්ට එනම් මම ආගමික කරුණු සම්බන්ධවත්, IS සංවිධානය සම්බන්ධවත් දේශන පැවැත්වූවෙමි. සහරාන්ද ඒ අයුරෙන්ම ඉස්ලාමීය අරගලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර මට්ටමින් මුස්ලිම් ජනතාවට සිදුව ඇති ගැටලු සම්බන්ධවත් දේශන කළේය. සමහර තැන්වලදී වීඩියෝ මඟින් ගෝලීය මට්ටමෙන් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති ගැටලු සම්බන්ධවත්, IS සංවිධානයට අදාළ වීඩියෝ දර්ශනත් අපි ප්‍රදර්ශනය කළෙමු. දුරකතන භාවිතය සම්බන්ධවත්, පිහියෙන් පහරදීම සහ ආයුධ සම්බන්ධවත් කස්තූන් පුහුණුව ලබාදුන්නේය. එම වැඩසටහන් සඳහා සාෆික්, මිල්හාන්, සාජිත්, සාදික් යන අයද සහභාගී වූහ. එහිදී අබූ යන නම් තබන ලදි. ඒ අනුව එම සංවිධානය විසින් මට අබූ ෂෙයිඩ් යන නම තබන ලදි. මම work shop (වැඩමුළු) 09කට වගේ සහභාගී වුණෙමි."

01 වන චූදිතගේ ප්‍රකාශයේ අන්තර්ගත වී තිබෙන ඉහත සඳහන් කරුණු අනුව නුවර ප්‍රදේශයේ වැඩමුළු පවත්වා තිබෙන අතර, එම වැඩමුළු වලට පුද්ගලයන් 15 ක් 20 ක් පමණ සහභාගී වී ඇත. එම වැඩමුළු වලට 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ

ප්‍රහාරයේදී කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් සහරාන් යන අය සහ තවත් පිරිසක් සහභාගී වී ඇති අතර, එම වැඩමුළුවේ ජාත්‍යන්තර වශයෙන් තහනමට ලක්ව තිබෙන IS සංවිධානය සම්බන්ධවද සාකච්ඡා වී ඇත. තවද, එම වැඩමුළුවේදී පිහියෙන් පහර දීම සම්බන්ධව සහ අවි ආයුධ සම්බන්ධයෙන් 2019.04.21 වන දින කටුවාපිටිය, ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේදී සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් හස්තූන් යන අය විසින් පුහුණුව ලබා දී ඇත. එම වැඩසටහනට මෙම නඩුවේ 03 වන චූදිත වන මිල්හාන්, 04 වන චූදිත වන සාදික් සහ 09 වන චූදිත වන සාජිත් යන අයද සහභාගී වී ඇත.

අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමේදී අපහට පෙනී යන්නේ, නුවර ධර්මාශෝක මාවතේ, අංක 14 දරණ ලිපිනයේ 'Enrich bungalow'නමින් පවත්වාගෙන ගිය මෙම නිවාඩු නිකේතනය පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා භාවිතා කර ඇති බවත්, එම වැඩසටහන් වලට මෙම නඩුවේ 01 වන , 03 වන , 04 වන , 09 වන චූදිතයන් සමඟ ඉහත නම් සඳහන් සහරාන්, හස්තූන් සහ තවත් පිරිසක් සහභාගි වී ඇති අතර, එහිදී IS සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, අවි ආයුධ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සහ පිහි වලින් පහර දීම සම්බන්ධයෙන් අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගෙන ඇති බවත්ය.

තවදුරටත් පෙනී යන්නේ, මෙකී ක්‍රියාවලියන්හි මෙම නඩුවේ 01, 03, 04, 09 වන චූදිතයන් දැනට මියගොස් සිටින ඉහත සඳහන් කර ඇති සහරාන් සහ තවත් පුද්ගලයන් සමඟ යම් වරදක් සිදු කිරීම පිණිස සංවිධානය වී එක කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇති බවටය.

කාත්තන්කුඩි, පාලමුණේ 10, ෆුර්කාන් මස්ජීද් පාර, හර්බලා වීදියේ අංක 20 දරණ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලෙහි පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි

පැ.සා. 2131 මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් සියාත් යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ, තමා කාත්තන්කුඩි ප්‍රදේශයේ ස්ථීර පදිංචිකරුවෙක් බවත්, රැකියාවක් ලෙස කොළඹ රත්තරන් බඩු ව්‍යාපාරයක් කරගෙන යන බවත්, තමාට කාත්තන්කුඩි පාලමුණ යන ප්‍රදේශයේ පාලමුණ 10, ෆුර්කාන් මස්ජිද් පාර, හර්බලා වීදියේ අංක 20 දරණ ලිපිනයේ සියාත් වත්ත නමින් හඳුන්වන අක්කරයක් පමණ විශාල ඉඩමක් තිබෙන බවත්, එම ඉඩම තමා 2011 වර්ෂයේ මිලදී ගෙන එම ඉඩමේ දෙමහල් ගොඩනැගිලි දෙකක් සාදාගත් බවත්, එම ඉඩම වටේටම වැට සකස් කර තිබූ බවත්, එම ඉඩමේ තිබූ ගොඩනැගිල්ල තමාගේ පවුලේ අය විසින් පාවිච්චි කළ බවත්, මාස දෙකකට හෝ තුනකට වරක් පවුලේ අය එම ස්ථානයට ගොස් දවසක් එම ස්ථානයේ රාත්‍රිය ගත කර පැමිණෙන

බවත්, ඒ කාලය වන විට එම ගොඩනැගිල්ල පිටස්තර පුද්ගලයින්ට කෙටිකාලීනව කුලියට සුහද හමු පැවැත්වීම සඳහා ලබා දුන් බවත්, 2018 වර්ෂය වන විට එම ඉඩම බලා ගැනීම සඳහා ඥානමුත්තු රත්නසිංහම් යන අයකු සිටි බවත්, එම ඉඩම කුලියට ලබා ගැනීමට අවශ්‍ය වන පිටස්තර පුද්ගලයින් දුරකථන මඟින් තමාට අමතන බවත්, ඉන්පසු තමා එම ඉඩම බලා ගන්නා ලද ඥානමුත්තු රත්නසිංහම් යන අයගේ දුරකථන අංකය ඔවුන්ට ලබා දෙන බවත්, ඉන්පසු ඥානමුත්තු රත්නසිංහම් යන අය විසින් එම පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් සලස්වා දෙන බවටත් සාක්ෂිකරු පවසා සිටී.

2018 වර්ෂයේ දවසක් අබ්දුල් රවුෆ් යන අයෙක් තමාට දුරකථනයෙන් අමතා තමාගෙන් පාලමුණේ ඉඩම වෙන්කරවා ගැනීම සම්බන්ධයෙන් කතා කළ බවත්, එසේ දුරකථනයෙන් අමතන ලද අබ්දුල් රවුෆ් යන තැනැත්තාව තමා දැනගෙන නොසිටි බවත්, තමා ඔහුට ඥානමුත්තු රත්නසිංහම්ව සම්බන්ධ කළ බවත්, ඉන්පසු කණ්ඩායමක් පැමිණ දින 02 ක් එම ඉඩමේ නැවතී සිටි බවට තමා ඥානමුත්තු රත්නසිංහම්ගෙන් දැනගත් බවත්, එලෙස දින දෙකක් තමාගේ ඉඩමේ නැවතී සිට පිටත් වෙන අවස්ථාවේදී එම ඉඩමට අදාළ කුලිය එම පුද්ගලයන් විසින් ඥානසිංහම්ට ලබා දී තිබුණ බවටත්, එලෙස පැමිණ නැවතී සිටි පුද්ගලයන් කවුරුන්දයි තමා නොදන්නා බවත්, තමාගේ ඉඩම වෙන් කරවා ගැනීම සඳහා තමාත් සමඟ දුරකථනයෙන් කතා කරන ලද

අබ්දුල් රවුෆ් යන අය දැනට මියගොස් ඇති බව තමා දැනගත් බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදී.

තවද 2019.04.21 වන දින ශ්‍රී ලංකාවේ සිදුවූ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව තමාගේ පාලමුණේ ඉඩමට විමර්ශන නිළධාරීන් දෙවතාවක් පමණ පැමිණි බවත්, එලෙස පැමිණි අවස්ථාවේදී කාන්තාවන් පිරිසක්ද රැගෙන එම ගොඩනැගිල්ල තුළට ගොස් විමර්ශනය කළ බවත්, තමාද ඒ අවස්ථාවේදී ඉඩමේ සිටි බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, තමාගේ ඉඩම දින දෙකක් කුලියට ගෙන තිබුණේ සහරාන් යන තැනැත්තෙකු විසින් වැඩමුළුවක් පවත්වාගෙන යාම සඳහා බවට විමර්ශන නිලධාරීන් මගින් තමා දැනගත් බවත්, සහරාන් යන අයව තමා පුද්ගලිකව හඳුනන්නේ නැති බවත්, නමුත් නම් වශයෙන් ඔහුව හඳුනන බවත්, ඔහු දැනට මිය ගොස් සිටින බව තමා දැනගත් බවටත් සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 03 වන චූදිත විසින් හරස් ප්‍රශ්න අසා ඇති අතර, හරස් ප්‍රශ්න වලදී මෙම සාක්ෂිකරු විසින් මූලික සාක්ෂියේදී තමාගේ ඉඩමට පැමිණ නැවතී සිටි කණ්ඩායමක් බයියෙත් කටයුතු සිදු කිරීම සඳහා පැමිණි බවට පැවසීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ අතර, එයට පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු කියා සිටියේ තමා ඒ සම්බන්ධව පුද්ගලිකව නොදන්නා බවත්, පොලිස් නිළධාරීන් විසින් තමාට එලෙස පැවසූ බවත් ය.

අනෙකුත් චූදිතයින් විසින් මෙම සක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා නොමැත.

තමාට එරෙහිව ඉදිරිපත් කර ඇති සියලුම ප්‍රධාන චෝදනා අසත්‍ය සහ ගොතන ලද ඒවා බවට පවසන 01 චූදිත මෙම නඩුවේ පැමිණිල්ලෙන් කැඳවන ලද පැ.සා.1400 අනස් නමැති සාක්ෂිකරු මගින් තමාට එරෙහිව සාක්ෂි ගොඩනැගීමට උත්සාහ කළද, අදාළ වැඩසටහන් වලදී කිසිදු අවි පුහුණුවක් හෝ බෝම්බ නිෂ්පාදන පුහුණුවක් සිදු නොවූ බව අනස් යන සාක්ෂිකරු පවා පිළිගෙන ඇති බව පෙන්වා දීමට මෙම චූදිත උත්සාහ කර

ඇත. එමෙන් ම සහරාන් සහ සෙයිනි වැනි අය සහභාගී වූ ආගමික දේශනාවලට තමා සහභාගී වුවද, ඒවායේ කිසිදු ත්‍රස්තවාදී අරමුණක් නොතිබූ බව මෙම 01 චූදිතගේ ස්ථාවරය වේ.

01 චූදිත වැඩිදුරටත් පවසන්නේ තමන් සහභාගී වූ බයාන් දේශනාවලදී කිසිදු අවි පුහුණුවක්, පුපුරන ද්‍රව්‍ය පිළිබඳ ඉගැන්වීමක් හෝ මරාගෙන මැරෙන ප්‍රහාරකයින් නම් කිරීමක් සිදු නොවූ බවයි. එසේම මෙම අධිකරණයේදී සාක්ෂි ලබා දුන් පැ.සා 1400 අනස් සහ පැ. සා. 2233 අස්මියා යන සාක්ෂිකරුවන් විසින් ඉදිරිපත් කළ ඇතැම් තොරතුරු විමර්ශන නිලධාරීන්ගේ බලපෑම මත සිදු වූ ඒවා බවත් පැ.සා 1400 අනස් නම් සාක්ෂිකරු විමර්ශන නිලධාරීන් සමඟ සමීපව කටයුතු කරමින් තොරතුරු ලබාගෙන ඇති බවත් පවසන මෙම චූදිත සඳහන් කරන්නේ පැ.සා. 2233 අස්මියා නමැති සාක්ෂිකාරිය පවා තමා විසින් පැවැත්වූ දේශනා අන්තවාදී නොවන බව පවසා ඇති බව වේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් තමාව රඳවා තබා ගෙන විවිධ ප්‍රකාශ ලබාගත් බවත්, තමා ලබා නොදුන් ප්‍රකාශයක් තමාගේ නමින් සකස් කර ඇති බවත් ඔහු පවසන අතර විශේෂයෙන්ම තමා සිංහල භාෂාව නොදන්නා බැවින් ප්‍රශ්න කිරීම්වලදී නිවැරදිව පිළිතුරු දීමට නොහැකි වූ බවත් එය සැකයට කරුණක් කරගනිමින් තමා අත්අඩංගුවට ගත් බවත් ඔහු පවසා සිටී. තමා විසින් ලබා

දුන් බව කියන පාපොච්චාරණය තමා අත්සන් කළ එකක් නොවන බවත් එවැනි පාපොච්චාරණයක් සටහන් කරගත් බව කියන නිලධාරියා තමා හඳුනන්නේවත් නැති බවත් ඔහු සඳහන් කරන අතර 01 වූදිත පවසන්නේ තමාට එරෙහිව කිසිදු නඩු භාණ්ඩයක් හෝ සාක්ෂියක් නිසි පරිදි ඉදිරිපත් කර නොමැති බවත් සියලුම චෝදනා විමර්ශන නිලධාරීන්ගේ අවශ්‍යතාවය මත ගොනු කරන ලද ඒවා බවයි.

තමාගේ පාපොච්චාරණය ලෙසට ඉදිරිපත් කරන ලද ප්‍රකාශයේ 2020 වසරේදී තමාව කුලියාපිටිය අධිකරණයට ඉදිරිපත් කළ බවට වන ප්‍රකාශය අසත්‍ය බවත්, ඒ වන විට තමා රඳවා ගැනීමේ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටි බවත් 01 වූදිත පවසා ඇත. තවද, ISIS සංවිධානයට සහාය දුන් බවට එල්ල වන චෝදනා ප්‍රතික්ෂේප කරන ඔහු, තමා ISIS පිළිබඳව පර්යේෂණයක් කර එම සංවිධානය ඉස්ලාම් විරෝධී බවට ලිපි 6ක් පළ කරමින් ජනතාව දැනුවත් කළ බව ඔහු අවධාරණය කරන ලද අතර විමර්ශන නිලධාරීන් මෙම කරුණු දැන දැනත් තමාට එරෙහිව ව්‍යාජ තොරතුරු ඇතුළත් කර ඇති බවට ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී පවසා ඇත.

සහරාන් හෂීම් සමඟ ඇති සම්බන්ධය පිළිබඳව පැහැදිලි කරමින් ඔහු පවසන්නේ තමා සහ සහරාන් අතීතයේ එක්ව කටයුතු කළද, පසුව සහරාන් එම කණ්ඩායමෙන් ඉවත් වී NTJ සංවිධානය පිහිටුවා ගත් බවත්, තමා එම

සංවිධානයේ මතවාදයට දැඩි ලෙස විරුද්ධ වූ අයෙකු බවත් ඔහු පවසා ඇත. ඔහු තවදුරටත් පවසා ඇත්තේ NTJ සංවිධානය ලියාපදිංචි කරන ලද සමාජ සේවා සංවිධානයක් ලෙස පැවති බවත් පසුව ඇති වූ දේශපාලන බලපෑම් මත සහරාන්ව එම සංවිධානයෙන්ද ඉවත් කර තිබූ බවත් වේ. 01 වූදිත විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මගින් NTJ එනම් (National Thowheeth Jama'ath) සංවිධානයේ ක්‍රියාකාරීත්වය, එහි ව්‍යුහය පිළිබඳව විස්තරාත්මක කරුණු සඳහන් කර ඇත. 01 වූදිත අවධාරණය කරන්නේ NTJ සංවිධානය යනු පුද්ගලයෙකුට පක්ෂපාතීත්වය ප්‍රකාශ කරන 'බයත්' (Bay'ah) ලබා ගන්නා රහසිගත කල්ලියක් නොවන බවත් එය දහුවා (Dawah) සංවිධාන මෙන් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිලධාරීන් පත් කරගන්නා ව්‍යුහයක් සහිත ආයතනයක් බවත්ය. එහිදී සාමාජිකයන් විසින් තෝරා පත් කරගන්නා පොදු කණ්ඩායමක් සහ විධායක කමිටුවක් හරහා සභාපති සහ ලේකම් වැනි තනතුරු සඳහා පුද්ගලයන් පත් කරන බව ඔහු පවසා ඇත.

ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, සහරාන් හෂීම් විසින් තමන්ව එම සංවිධානයේ දෙවැනි නායකයා ලෙස පත් කළ බවට පවතින චෝදනාව තමා දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන බවත් එය තමන්ගේ පාපොච්චාරණ ප්‍රකාශයට අසත්‍ය ලෙස ඇතුළත් කරන ලද්දක් බවද ඔහු පවසයි.

තවදුරටත් කරුණු දක්වන ඔහු, 2015 සහ 2016 වසරවලදී මුස්ලිම් ප්‍රජාවට එරෙහිව මෙරට තුළ ක්‍රියාත්මක වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව දීර්ඝව

විස්තරයක් කරමින්, මුස්ලිම් පල්ලි විනාශ කිරීම, දේපල කොල්ලකෑම, ශුද්ධ වූ අල් කුර්ආනය ගිනිබත් කිරීම සහ ආගමික සලකුණුවලට අපහාස කිරීම වැනි සිදුවීම් ඔහු පෙන්වා දී ඇති අතර, විශේෂයෙන්ම කුලියාපිටිය ප්‍රදේශයේදී ඌරෙකුගේ රූපයක් මත 'අල්ලාහ්' යන නාමය ලියා ප්‍රදර්ශනය කරමින් මුස්ලිම් ජනතාවගේ හැඟීම්වලට දැඩි ලෙස අපහාස කළ බවත්, මෙම සියලු අපරාධ පොලිස් නිලධාරීන් සහ ආරක්ෂක අංශ බලා සිටියදීම සිදුවූ බවටත් ඔහු චෝදනාත්මකව සඳහන් කරන අතර, එකී ප්‍රචණ්ඩ ක්‍රියා පිටුපස රජයේ අනුග්‍රහය තිබූ බවට මානව හිමිකම් කොමිසමේ හිටපු සභාපතිනී දීපිකා උඩුගම මහත්මිය වැනි විද්වතුන් පවා ප්‍රකාශ කර ඇති බව ඔහු තම චිත්ති කුඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇත. එවැනි පසුබිමක් තුළ ආගමික මවුලවිවරයෙකු ලෙස තමාගේ වගකීම වූයේ මුස්ලිම් ජනතාව ප්‍රචණ්ඩත්වයට හසු නොවී, නීතිය හා සදාචාරය රකිමින් තම ආත්මාරක්ෂාව සලසා ගැනීමට මඟපෙන්වීම බවත්, මුස්ලිම් ප්‍රජාව තම ආගමේ ඉගැන්වෙන උසස් ගුණාංග නිසි ලෙස අනුගමනය නොකිරීම මෙවැනි ගැටලු උත්සන්න වීමට එක් හේතුවක් බව ඔහු විශ්වාස කරන බවත්, එනිසා, මුස්ලිම්වරුන් යහපත් චරිතයක් ගොඩනඟා ගත යුතු බවත්, ඒ හරහා තමන්ට එරෙහිව සිටින සතුරන් පවා මිතුරන් බවට පත් කර ගැනීමටත්, අන් ආගමිකයන්ගේ ගෞරවය දිනා ගැනීමටත් කටයුතු කළයුතු බවත්, ඔහු සිය ප්‍රකාශය මගින් අවධාරණය කරන අතර, ඔහු මෙහිදී

අවධාරණය කරන්නේ ඉස්ලාම් දහමේ සැබෑ පදනම වන්නේ යහපත් ගුණාංග සහ ඉවසීම පදනම් කරගත් ජීවන රටාවක් මිස අන්තවාදය හෝ ප්‍රචණ්ඩත්වය නොවන බවයි. වර්තමානයේ මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන ගැටලුවලට ප්‍රධාන හේතුව ඔවුන් ඉස්ලාමීය යහපත් ගුණාංග අනුමනය නොකිරීම බවත්, ඒ නිසා අන්‍යාගමිකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට ඔවුන් අපොහොසත් වී ඇති බවත් ඔහු තම විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇත.

සහරාන් තම පවුලේ සාමාජිකයෙකු විවාහ කර ගැනීම නිසා ඇති වූ ඥාති සබඳතාවයක් පමණක් තමාට තිබූ බවත්, 2007 සිට 2017 දක්වා වසර දහයක පමණ කාලයක් ඔවුන් අතර කිසිදු සබඳතාවයක් නොතිබූ බවත් ඔහු පවසා ඇත. තමා කටාර් රාජ්‍යයේ සිට නැවත ලංකාවට පැමිණි පසු මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ පොදු අරමුණ මත සහරාන්ගේ ඇරයුමෙන් දේශන කිහිපයකට සහභාගී වූ බව තමා පිළිගත්තද, එම දේශන කිසිදු අයුරකින් අන්තවාදය හෝ වෙනත් ආගම්වලට වෛර කිරීම ඉගැන්වූ ඒවා නොවන බව 01 වූදිත අවධාරණය කර ඇත. තමාට එරෙහිව ඉදිරිපත් කර ඇති අධිචෝදනා පත්‍රය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන ඔහු, තමා කිසිවිටෙකත් ජාතීන් අතර අසමගිය ඇති කිරීමට හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන්ට අනුබල දීමට කටයුතු නොකළ බව පවසා සිටින ලදී.

අධිචෝදනා පත්‍රයේ සඳහන් කර ඇති පුද්ගලයින් අතුරින් සහරාන් සහ ඔහුගේ සහෝදරයා වූ රිල්වාන් හැර අන් කිසිවෙකු තමා නොදන්නා බවත්, ඔවුන් සමඟ කිසිදු රහසිගත කුමන්ත්‍රණයකට තමා සම්බන්ධ නොවූ බවත් ඔහු පවසයි. විශේෂයෙන්ම පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දුන් අස්මියා, අනස් යන සාක්ෂිකරුවන් හෝ වන්නිනායක යන නිලධාරියා විසින් ලබා දුන් සාක්ෂි මගින් හෝ තමාට අනෙකුත් සමඟ කිසිදු සබඳතාවයක් නොතිබූ බව ඔහු පෙන්වා දෙයි. තමා සන්තකයේ ටී-56 වර්ගයේ ගිනිඅවියක් හෝ 9mm පිස්තෝලයක් තිබූ බවටත්, ඒවා සහරාන්ගෙන් ලැබුණු බවටත් ඉදිරිපත් කර ඇති සාක්ෂි පදනම් විරහිත බව ඔහු පවසයි. වවුනතිව් පොලිස් නිලධාරීන්ගෙන් ලබාගත් බව කියන ගිනිඅවි පිළිබඳව තමා කිසිවක් නොදන්නා බවත්, පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ ලබා දුන් බව කියන පාපොච්චාරණ අසත්‍ය තොරතුරු මත පදනම් වූ ඒවා බවත් ඔහු පවසයි.

තමා මයිලප්පිටිය හෝ වත්තල ප්‍රදේශවලදී කිසිදු අවියක් පරිහරණය නොකළ බවත්, එවැනි කිසිදු ආයුධයක් තමා සන්තකයේ තිබී සොයා ගෙන නොමැති බවත් ඔහු පවසයි. තමාගේ දේශනවල මූලික අරමුණ වූයේ මුස්ලිම් ප්‍රජාවට සිදුවන අසාධාරණයන් පිළිබඳව ඔවුන්ව දැනුවත් කර ඔවුන්ව ආරක්ෂා කර ගැනීම මිස ත්‍රස්තවාදය පැතිරවීම නොවන බව ඔහු නැවත නැවතත් අවධාරණය කරයි. එමෙන්ම අධිචෝදනා

පත්‍රයේ සඳහන් වන කාල සීමාව තුළ මෙරට තුළ ජාතීන් අතර සැබෑ සමගියක් නොතිබූ බවත්, එවැනි නොතිබූ සමගියක් තමා විනාශ කළා යැයි පැවසීම තර්කානුකූල නොවන බවත් පවසන 01 වූදිත තමාට එරෙහි සියලු චෝදනා ප්‍රතික්ෂේප කරමින් තමා නිවැරදිකරු බව අධිකරණය හමුවේ ප්‍රකාශ කර සිටියි. 01 වූදිත පවසා සිටින්නේ සහරාන් හෂීම්ගේ අන්තවාදී ක්‍රියාකාරකම්වලට තමාගේ සෘජු දායකත්වයක් නොමැති බවත්, තමා කළේ ආගමික දැනුවත් කිරීමක් පමණක් බවත් වේ.

<u>විශ්ලේෂණය.</u>

01 වූදිත විසින් විත්තකූඩුවේ සිට කරන ලද දීර්ඝ ප්‍රකාශය අප විසින් මනාව සළකා බලන ලදී. මෙහිදී අප නිරීක්ෂණය කරන්නේ ඔහු ඔහුට එරෙහිව තිබෙන එක් එක් චෝදනාවන් විශ්ලේෂණය කරමින් තම ප්‍රකාශය සිදු කර ඇති අතර, එසේම පැමිණිල්ලෙන් මෙම අධිකරණයේ සාක්ෂි දීම සඳහා කැඳවන ලද පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරු සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 2233 සෙයියදු අහමදු අස්මියා නැමැති සාක්ෂිකාරිය ලබා දුන් සාක්ෂි විශ්ලේෂණය කරමින් කරුණු දක්වා ඇත. එකී පැමිණිල්ලේ සාක්ෂි අංක 2233 සෙයියදු අහමදු අස්මියා නැමැති සාක්ෂිකාරිය කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචි තැනැත්තියක් වන අතර, මෙම 01 වන වූදිතද පදිංචි වී සිට ඇත්තේ කාත්තන්කුඩි ප්‍රදේශයේම වන අතර, ඔහුගේ බිරිඳගේ නිවස තිබී ඇත්තේ කැකුණගොල්ල ප්‍රදේශයේ වේ. එසේම අස්මියා නැමැති

සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව ඇය පාස්කු බෝම්බ ප්‍රහාර සිද්ධිය සිදු වී දින කිහිපයකට පසු බෝම්බයක් පුපුරවා හැර මියගිය මොහොමඩ් නියාස් නැමැත්තා ඇගේ ස්වාමිපුරුෂයා බවට හෙළි වන අතර, ඇගේ සාක්ෂියට අනුව පාලමුණ ප්‍රදේශයේ තිබූ ගොඩනැගිල්ලකට කණ්ඩායමක් සමඟ ගිය බව සහ ශෙයිනි නැමැත්තා විසින් ඔහුගේ නිවසේ පවත්වන ලද ආගමික දේශනා වලට තමා තවත් කාන්තාවන් සමඟ සහභාගී වූ බවට පවසා ඇති අතර, ඇය සහභාගී වූ දේශන තිබූ ස්ථානයේ සහරාන් මෙන්ම ඔහුගේ සහෝදරයා වන රිල්වාන් නැමැත්තාද සිටි බවට ඇය පවසා ඇති අතර, එසේම තවත් මව්ලවිවරු කිහිප දෙනෙක් සිටි බවට ඇය පවසා, මෙම 01 වන චූදිත පෙන්වා හඳුනා ගැනීමක් කරමින් 01 වන චූදිතගේ නම නවුෆර් මවුලවි යැයි ඇය විසින්ම පවසා ඇත. එසේම මෙම 01 වන චූදිත විසින් එහිදී ඉස්ලාම් මූලධර්ම සම්බන්ධයෙන් එනම් අකීදා සම්බන්ධයෙන් එදින දේශනා පැවැත්වූ බවත් ඇය පවසා ඇති අතර, මෙම 01 වන චූදිත විසින්ද ඇගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහු විසින් එලෙස දේශනා පැවැත්වූ බවට ඇය හරස් ප්‍රශ්න වලදීද පවසා ඇත. මෙම 01 වන චූදිත එම අවස්ථාවේදී ඇගෙන් අසා ඇත්තේ ඔහු විසින් කල දේශනා වලදී යම්කිසි පුද්ගලයන් මැරීමට අවශ්‍ය යැයි හෝ බෝම්බ පිපිරීම් කරන්න අවශ්‍ය බවට ඔහු විසින් දේශනා කලේ නැහැ කියලා කිව්වොත් හරිද යනුවෙන් ඇයට යෝජනා කිරීමක් කර ඇති අතර, එයට පිළිතුරු වශයෙන් ඇය ඔව් යැයි පවසා ඇති බව පෙනී යයි. මෙහිදී සැබැවින්ම වැදගත් වන්නේ එම 01 වන චූදිත විසින්

පාලමුණ ප්‍රදේශයේදී කාන්තාවන්ට පවත්වා තිබූ දේශනා වැඩමුළුවලදී සැබැවින්ම දේශනා සිදු කර තිබේද යන්න සළකා බැලීම වන අතර, ඔහු එලෙස දේශන පැවැත්වූ බවට ඇය විසින් ඔහු අසන ලද හරස් ප්‍රශ්නවලදී පවා පිළිගෙන ඇති පසුබිම තුළ ඔහු එම අවස්ථාවේදී බෝම්බ පිපිරීම් සහ මිනිසුන් මැරීම් කළ යුතු බවට පැවසුවේ නැති බව සදහන් කර ඇතද සැබැවින්ම කාන්තාවන් ඉලක්ක කර ගනිමින් දේශනා පැවැත්වීමක් ඔහු විසින් සිදු කර ඇති බව ඒ අනුව පෙනී යයි.

පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියද දීර්ඝ ලෙස විශ්ලේෂණය කිරීමක් මෙම 01 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සිදු කර ඇති අතර, එම අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය අප විසින් දීර්ඝ ලෙස විශ්ලේෂනය කර ඇගයීමට ලක් කිරීමක් කර ඇති අතර, එම සාක්ෂිකරු ලබා දුන්නේ සාක්ෂියෙහි විශ්වසනීයභාවය තීරණය කළ යුත්තේ මෙම අධිකරණයේ විනිසුරුවරුන් වන අප විසින් වන අතර, එම පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරු විසින් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් අවස්ථාවේදී මෙම 01 වන චූදිත විසින් එම අනස් නැමැති සාක්ෂිකරුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න ඇසීමක් කරන ලද අතර මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා ඇත්තේ තමා කිතාල් ආයුධ සහිත සටන සම්බන්ධයෙන් තමා දේශනා පැවැත්වූයේ නැහැ යැයි එම අනස් නැමැති සාක්ෂිකරුගෙන් ඇසූ විට ඔහු

එම ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කල බවට සඳහන් කර ඇතද, එකී පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගෙන් මෙම 01 වන චූදිත විසින් 2026.06.03 වන දින අසන ලද හරස් ප්‍රශ්න විශේෂයෙන් 2026.06.03 දින ප. ව. 5.50 ට සාක්ෂි සටහන් පිටු අංක 05 මෙන්ම එදින ප. ව. 6.10 ට සාක්ෂි සටහන් වල පිටු අංක 02 සහ 03 පරීක්ෂා කර බැලීමේදී ද පැහැදිලිව පෙනී යන්නේ එකී සාක්ෂිකරු මෙම 01 වන චූදිත විසින් අසන ලද අදාළ ප්‍රශ්නවලට මැනවින් පිළිතුරු ලබා දී ඇති අතර, එම අවස්ථාවේදී තමා එවැනි දේශනා නොකළ බවට මෙම 01 වන චූදිත විසින් එම සාක්ෂිකරුට කරන ලද යෝජනාවන් සියල්ලම එම සාක්ෂිකරු විසින් එකහෙළාම ප්‍රතික්ෂේප කර ඇති බව එනම් ඒවා ඔහුට පිළිගැනීමට නොහැකි බවට පැහැදිලිවම පිළිතුරු දී ඇත. ඒ අනුව අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය හබ කරමින් ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද කරුණු විශ්වසනීයත්වයෙන් තොර බවට පෙනී යයි. පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුව මෙම 01 වන චූදිත විසින් හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී එම සාක්ෂිකරුගෙන් මෙම චූදිත විසින් හරස් ප්‍රශ්න 49 ක් අසා ඇති ආකාරය සහ එකී හරස් ප්‍රශ්න 49 ටම පැ. සා. 1400 අනස් විසින් සාක්ෂි ලබා දී ඇති ආකාරයද අදාළ නීතිකෘතීන් පරීක්ෂා කර බැලීමේදී අපහට පෙනී යයි. කෙසේ වුවද මෙම 01 චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද දීර්ඝ ප්‍රකාශයේදී (එනම් ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ප. ව. 3.30 ට ආරම්භ කර එය ප. ව. 5.30 දක්වා එක දිගටම සිදු කර ඇති බව අප

නිරීක්ෂණය කරන අතර, ඒ අනුව පැය 02 ක කාලයක් තිස්සේ ඔහු විසින් මෙලෙස දීර්ඝ ප්‍රකාශයක් කර ඇති අතර, එම ප්‍රකාශයේදී ඔහු අනස් නැමැති සාක්ෂිකරු පරස්පර ආකාරයේ සාක්ෂි ලබා දෙන බවට සඳහන් කර ඇති අතර, එම සාක්ෂිකරුව හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහු පරස්පර සාක්ෂි ලබා දීමක් සිදු කලා නම් ඒවා එම පරස්පරතාවයන් අධිකරණය ඉදිරියේ ලකුණු කිරීමට හෝ අවම තරමින් අධිකරණයේ අවධානයට ලක් කිරීමට හෝ කටයුතු කළ යුතුව තිබුනි. කෙසේ වෙතත් එවැනි කිසිදු ඉල්ලීමක් ඔහු විසින් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී මෙම අධිකරණය ඉදිරියේ සිදු කර නොමැති බව අප හට පෙනී යයි. ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී නෛතිකමය හා සිද්ධිමය කරුණු වලට වඩා ඔහු විස්තරාත්මකව සිදු කර ඇත්තේ ඉස්ලාම් ආගමේ මූලධර්මයන් සහ ශුද්ධ වූ කුරානයෙහි සඳහන් කරුණු යැයි සඳහන් කරමින් ඔහු දරන්නා වූ ඔහුගේ මතයන් ආගමික දේශනයක් ආකාරයෙන් මෙම අධිකරණය ඉදිරියේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා සිටීමක් බවට අපහට පෙනී යයි. එසේම ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, මුස්ලිම් අය ඔවුන්ගේ ආත්මාරක්ෂාව සඳහා සටහන් කල යුතු බවත් මුස්ලිම් අයට විරුද්ධව අනික් අය විසින් ප්‍රහාරයන් එල්ල කරන අවස්ථාවල ආරක්ෂක අංශයන් විසින් ඔවුන්ට ලැබිය යුතු නිසි ආරක්ෂාව ලබා නොදුන් අවස්ථාවල ඔවුන්ගේ ශාරීරික සහ දේපල ආරක්ෂා කර ගැනීමට දේපල මුස්ලිම්වරු සටන් කළ යුතු බවත් ඔහු පවසා ඇත. පැ. සා.

1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂියේදී පැහැදිලිව මෙම අධිකරණයට සදහන් කර ඇත්තේ නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී මෙම 01 වන චූදිත විසින් ජිහාදය යන්න ආයුධ සන්නද්ධව කටයුතු කිරීම බවට මෙම 01 චූදිත විසින් එහිදී දේශනා කල බවට පැ. සා. 1400 අනස් විසින් තම සාක්ෂියේදී පැහැදිලිව පවසා ඇති අතර, එකී පසුබිම තුළ මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය මෙම 01 වන චූදිතට අවශ්‍ය පරිදි අර්ථනිරූපණය කර විශ්ලේෂණය කිරීමක් ඔහු විසින් සිදු කර ඇති බව ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී අපහට පෙනී යයි.

මෙම 01 චුදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සදහන් කර ඇත්තේ නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී තමා සිදු කලේ ආගමික බයාන් දේශනාවක් පමණක් බවත් එය ත්‍රස්තවාදී දේශනාවක් බවට වර්ණගැන්වීමට එම ස්ථානයේ අවි පුහුණුවක් ලබා දුන් බව සහ අයි. එස්. කොඩිය පෙන්වූ බව සහ ස්වයංඝාතක ප්‍රහාරකයන් සහ සාමාන්‍ය ප්‍රහාරකයන් වෙන් කල බවට අනස් පැවසූ කරුණු අසත්‍ය බවට වන අතර, පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගෙන් මෙම 01 වන චූදිත හරස් ප්‍රශ්න 49 ක් අසා ඇතද, එකී එක් හරස් ප්‍රශ්නයකදී හෝ නුවරඑළිය වැඩමුළුවේදී අයි. එස්. කොඩිය පසුබිමෙහි ප්‍රදර්ශනය කර අන්තවාදී දේශනා කල බවට හෝ එසේම එම නුවරඑළියෙ වැඩමුළුවට මෙම 01 චූදිතද සහභාගී වූ බව සහ එම වැඩමුළුවේදී මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙසට පසුව මියගිය සහරාන් විසින් පැවැත්වූ එම වැඩමුළුවේ අරමුණ වූයේ

සම්පූර්ණයෙන් ඉස්ලාමීය රාජ්‍යයක් පිහිටුවා ඉස්ලාමීය Law and order පිහිටුවීම මේ අරමුණ බවත් එසේම ශ්‍රී ලංකාවද අයි. එස්. සංවිධානයට යටත් ඉස්ලාමීය රාජ්‍යයක් ලෙස සැලකීමට එම අවස්ථාවේදී සහභාගී වූ සියලු දෙනා ප්‍රතිඥාවක්ද දුන් බවට සඳහන් කර ඇති අතර, එහිදී සහරාන් විසින් පැමිණ සිටි කණ්ඩායම යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායමක් ලෙස සහ මරාගෙන මැරෙන කණ්ඩායම එනම් Suicide bombers ලා ලෙස කණ්ඩායම් දෙකක් බෙදුව බවත් පවසා සාක්ෂි ලබා දී ඇති අතර මෙම 01 චූදිත විසින් එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී එම වැඩමුළුව මූලිකයා ලෙසට පවත්වන ලද ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් විසින් එලෙස සහභාගී වූ පිරිස යුද්ධය සඳහා සහභාගී වන කණ්ඩායම සහ මරාගෙන මැරෙන කණ්ඩායම ලෙසට කණ්ඩායම් දෙකක් හැදූ බවට වන සාක්ෂිය 01 චූදිත විසින් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී කිසිදු හබ කිරීමකට ලක් කිරීමක් කර නොමැති අතර, හුදෙක් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පමණක් මෙම 01 චූදිත විසින් එම වැඩමුළුවේදී එවැනි දෙයක් සිදු වුනේ නැහැ යැයි පමණක් සඳහන් කර ඇති ආකාරය ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි 2026.08.17 දින ප. ව. 4.15 ට නීතිඥතීන් වල පිටු අංක 03 පරීක්ෂා කර බැලීමේදී අප හට පෙනී යයි.

තවද අනස් නැමැති සාක්ෂිකරු විමර්ශන නිලධාරීන් සමඟ ඉතා ළඟින් ආශ්‍රය කල අයෙක් බවට විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා ඇතද, මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී එවැන්නක් අනස් නැමැති සාක්ෂිකරුට අඩුම තරමින් යෝජනා කිරීමක් හෝ මෙම 01 චූදිත විසින් සිදු කර නොමැති බව අපහට පෙනී යයි.

මෙම 01 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදි දැනටමත් මෙම අධිකරණය ඉදිරියේ පැවැති ශක්‍යතා අතුරු පරීක්ෂණයකින් පසුව ඔහු විසින් ස්වේච්ඡාවෙන් ලබා දුන් ප්‍රකාශයක් ලෙසට පිළිගත් පාපෝච්ඡාරණමය ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කර ඇති බවට තීරණය කර මෙම අධිකරණය මඟින් පිළිගෙන ඇතද මෙම චූදිත පවසා ඇත්තේ එය ව්‍යාජ ලෙස සකස් කරන ලද ලේඛනයක් බව වේ. කෙසේ වෙතත් එම ලේඛනය ව්‍යාජ ලේඛනයක් බවට අදාළ ශක්‍යතා පරීක්ෂණයේදී කිසිදු පිළිගත හැකි සාක්ෂියක් මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වූයේ නැත. 01 චූදිත වැඩිදුරටත් පවසා ඇත්තේ මෙම අධිකරණය විසින් මේ වන විට පිළිගෙන ඇති අනෙක් පුද්ගලයන්ගේ පාපෝච්ඡාරණ ප්‍රකාශයන්හි තමා සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබෙන කොටස් අධිකරණයේ සාක්ෂි ලබා දෙන විට ඒ සම්බන්ධයෙන් තමා විසින් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දීමක් සිදු වුනේ නැති බව වේ. 01 චූදිත විසින් එලෙස පවසා ඇති කරුණ කිසිසේත් නිවැරදි නොවන අතර, මෙම අධිකරණය ඉදිරියේ මේ වන විට පිළිගෙන ඇති 4, 9, 11, 12 සහ 18

චූදිතයන්ගේ පාපෝච්ඡාරණමය ප්‍රකාශයන් ස්වේච්ඡාවෙන් සිදු කර ඇති බවට මෙම අධිකරණය මගින් තීරණය කිරීමෙන් අනතුරුව එම ප්‍රකාශයන්හි අන්තර්ගත කොටස් පැමිණිල්ලෙන් අධිකරණය ඉදිරියේ විධිමත්ව ලකුණු කර ඒවා වල අඩංගු ඇතැම් කොටස්ද අධිකරණය ඉදිරියේ ලකුණු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සියලුම චූදිතයින්ට හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිවාසිකම් අධිකරණයේ දමිල භාෂක පරිවර්තක මහතා මඟින් අප විසින් මනාව පහදා දී ඇත. එසේම 11 වන චූදිතගේ පාපෝච්ඡාරණමය ප්‍රකාශය මෙම අධිකරණය ඉදිරියේදී පැ. 168 ලෙස ලකුණු කරන ලද 2025.11.27 දින මෙම 01 චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙනී සිට හරස් ප්‍රශ්න අසා ඇති අතර, එසේම 2026.05.15 දින 04 වන චූදිතගේ පාපෝච්ඡාරණමය ප්‍රකාශය පැ.183 ලෙස ලකුණු කිරීමෙන් අනතුරුවද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සියලුම චූදිතයින්ට හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිවාසිකම් අධිකරණයේ දමිල භාෂක පරිවර්තක මහතා මඟින් අප විසින් මනාව පහදා දී ඇති අතර, එදින මෙම 01 චූදිත විසින් ඔහුට අවස්ථාව ලබා දී තිබුනද හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නැත. ඒ බව එදින පෙ. ව. 10.55 ට නීතිඥතීන් වල පිටු අංක 04 පරීක්ෂාවේදී පෙනී යයි.

එසේම 09 වන චූදිතට අදාළ පාපෝච්ඡාරණමය ප්‍රකාශය 2026.06.08 දින විධිමත්ව මෙම අධිකරණය ඉදිරියේ L-01 ලෙසම ලකුණු කර එහි අනුකොටස්ද පැමිණිල්ලෙන් ලකුණු කල පසු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සියලුම චූදිතයින්ට හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිවාසිකම් අධිකරණයේ දමිල භාෂක පරිවර්තක මහතා මඟින් අප විසින් මනාව පහදා දී ඇති අතර, 01 චූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බව පවසා ඇති බව එදින ප. ව. 12.05 ට නීතිකaතීන් වල පිටු අංක 04 පරීක්ෂා කර බැලීමේදී පෙනී යයි.

එසේම මෙම නඩුවෙහි 12 වන චූදිතට අදාළ පාපෝච්ඡාරණමය ප්‍රකාශය 2026.08.12 දින විධිමත්ව පැ.919 ලෙස ලකුණු කිරීමෙන් අනතුරුව එහි අනු කොටස්ද ලකුණු කිරීමෙන් අනතුරුව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 271 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සියලුම චූදිතයින්ට හරස් ප්‍රශ්න ඇසීමට ඇති අයිතිවාසිකම් අධිකරණයේ දමිල භාෂක පරිවර්තක මහතා මඟින් අප විසින් මනාව පහදා දී ඇති අතර, එදින 01 චූදිතට අවස්ථාව ලබා දී තිබුනද ඔහු විසින් හරස් ප්‍රශ්න ඇසීමක් කර නොමැති බව දැනුම් දී ඇති බව 2026.08.13 දින පෙ. ව. 10.35 ට නීතිකaතීන් වල පිටු අංක 09 පරීක්ෂා කර බැලීමේදී පෙනී යයි.

එසේම මෙම නඩුවෙහි 18 වන චූදිතගේ පාපෝච්ඡාරණමය ප්‍රකාශය 2026.07.10 දින අධිකරණයේ දී පැ.807 ලෙස විධිමත්ව ලකුණු කරන ලද

අවස්ථාවේදී මෙම 01 චූදිතගේ උපදෙස් මත 01 චූදිත වෙනුවෙන් එදින නීතිඥ කනිල් මද්දුමාගේ මහතා පෙනී සිට හරස් ප්‍රශ්න ඇසීමක් එම පාපෝච්ඡාරණමය ලේඛනය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇති බව එදිනට අදාළ නීතිකෘතීන් පරික්ෂා කර බැලීමේදී පෙනී යයි.

2026.06.25 දින එම පාපෝච්ඡාරණමය ප්‍රකාශය පැ.803 ලෙස ලකුණු කිරීමෙන් පසුව එම ලේඛනයෙහි අඩංගු කරුණු පැ.803A(2) 25 දක්වා සලකුණු කිරීමෙන් අනතුරුව එදින මෙම 01 චූදිත වෙනුවෙන් නීතිඥ කනිල් මද්දුමාගේ මහතා 01 චූදිතගේ උපදෙස් මත පෙනී සිටිමින් හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර ඇති අතර, එම අවස්ථාවේදී හරස් ප්‍රශ්න 23 ක්ද 01 චූදිත වෙනුවෙන් අසා ඇති අතර, ඒ අනුව 01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ඒ අනුව අනිකුත් තැනැත්තන් ලබා දුන් පාපෝච්ඡාරණමය ප්‍රකාශයන්හි තමා සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබෙන කොටස් සම්බන්ධයෙන් තමාට හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දීමක් සිදු වුනේ නැති බවට 01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර තිබීම සත්‍යයෙන් තොර බවට අපහට මනාව පෙනී යයි.

කෙසේ වුවත් 01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ඔහු සඳහන් කර ඇත්තේ තවත් චූදිතයින් විසින් ලබා දුන්නා යැයි කියන පාපෝච්ඡාරණ ප්‍රකාශ වල තමාගේ නම සඳහන් වී තිබෙන බවක්, එහි ගොඩක් ස්ථානවල තමා දේශනා පැවැත්වූ බවට සඳහන් කර තිබෙන

බවත්, තමා දේශනා පැවැත්වූයේ මුස්ලිම්වරුන්ට එරෙහිව සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව මුස්ලිම්වරුන් උත්සාහ කළ යුතු බවට ඔවුන් අවදියෙන් හා දැනුවත්ව සිටීම සඳහා බවත් තමා ජාතික සමගියට විරුද්ධව කිසිදු දේශනාවක් කලේ නැති බවත් ත්‍රස්තවාදී ක්‍රියා හෝ ත්‍රස්තවාදී දේවල් සම්බන්ධයෙන් තමා දේශනා කලේ නැති බවත් මුස්ලිම්වරුන්ට එරෙහිව එල්ල වන ප්‍රහාරයන් වලට ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් වලට විරුද්ධව කටයුතු කළ යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් පමණක් තමා දේශනා පැවැත්වූ බවට ඔහු පවසා ඇත. 01 චූදිත එලෙස පැවසුවද මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් ඉහත පරිදි 01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද ඉහත කරුණු අතිශයින් විශ්වාසනීයත්වයෙන් තොර බවට අපහට පැහැදිලිව පෙනී යයි.

01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී අධිචෝදනා පත්‍රයේ සඳහන් 01 වන චෝදනාවේ සඳහන් පුද්ගලයන් 09 දෙනාගෙන් සහරාන් තමාගේ ඥාතියෙක් බවත්, රිල්වාන් නැමැත්තා සහරාන්ගේ මල්ලි බවත්, ඉන්සාෆ්, ඉල්හාම් යන නම් සඳහන් අය තමා දැන සිටි අය නොවන බවත්, ඔවුන් සමඟ ආශ්‍රයක් හෝ තිබී නොමැති බවත් සඳහන් කර ඇති අතර, තමා එම අය සමඟ එකතු වී කුමන්ත්‍රණය කල බවට ඔහු පාස්කු ප්‍රහාරය සිදු කිරීම සඳහා සැලසුම් කල බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී

නැති බවට ඔහු පවසා ඇති අතර, තමාගේ පාපෝච්ඡාරණ ප්‍රකාශයෙහි මයුරා පෙදෙස කියන ස්ථානයේ සිටින විට සහරාන් යන පුද්ගලයා සන්තකයේ ටී.56 වර්ගයේ ආයුධයක් තිබුන බව සහ තමා ඒ ගැන ඇසූ විට එය වවුනතිව් පොලිස් නිලධාරීන්ගෙන් ලබා ගත් ආයුධයක් ලෙසට එම පාපෝච්ඡාරණයේ බොරු තොරතුරු ඇතුළත් කර තිබෙන බවත් වවුනතිව් පොලීසියෙන් ලබාගෙන තිබෙන්නේ රිවෝල්වර වර්ගයේ ගිනි අවියක් බවට යම් සාක්ෂිකරුවෙකු දැන ගත් බවට සාක්ෂියක් ලබා දී තිබෙන බවත් තමාගේ පාපෝච්ඡාරණ ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි තමාට වත්තල ප්‍රදේශයේ ඉන්න විට සහරාන් යන පුද්ගලයා රිවෝල්වර වර්ගයේ පිස්තෝලයක් කිසිදු අවස්ථාවක සහරාන් විසින් ලබා දී නැති බවත්, තමා සන්තකයේ 9 MM වර්ගයේ කිසිදු ආයුධයක් තිබී සොයා ගත්තේ නැති බවත්, තමා සන්තකයේ එවැනි ආයුධයක් තිබී සොයා ගත් බවට කිසිදු සාක්ෂියක් අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී නොමැති බවත් 01 චූදිත පවසා ඇත. 01 චූදිත විසින් එලෙස විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද කරුණු හුදෙකලාව ගෙන සළකා බැලිය නොහැකි අතර, එය සළකා බැලිය යුත්තේ මෙම නඩුවේ සමස්තයක් ලෙස ඉදිරිපත් වූ සියලුම සාක්ෂි සැළකිල්ලට ගැනීමෙන් පසුව පමණක් වන අතර, මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සියලු සාක්ෂි සැළකිල්ලට ගැනීමේදී ඉහත පරිදි 01 චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද කරුණු සත්‍යයෙන් තොර බව පෙනී යයි. ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද

ප්‍රකාශයේදී සඳහන් කර ඇත්තේ සහරාන් නැමැති පුද්ගලයා විසින් දාරුල් අදර් නැමැති සංවිධානයෙන් ඉවත් වී NTJ සංවිධානය ආරම්භ කල පසුව 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සහරාන් සමඟ තමාට කිසිම සම්බන්ධයක් තිබුනේ නැති බවට පවසා ඇත. කෙසේ වුවත් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 2018 අප්‍රේල් හෝ මැයි මාසයේ නුවරඑළියේ පැවති සහරාන්ගේ මූලිකත්වයෙන් පැවැත්වූ වැඩමුළුවේදී මෙම 01 චූදිත වන නවුෆර් මවුලවි යන අය සහභාගී වූ බව සහ එහිදී ඔහුට අබු සෙයිදි යනුවෙන් ‘‘අබූ” නමක් මෙම 01 වන චූදිත විසින් නුවරඑළියේ පැවැති එම වැඩමුළුවේදී ඉස්ලාමයේ මූලධර්ම සම්බන්ධයෙන් දේශනා පවත්වා ඉන් පසු ජිහාදය සම්බන්ධයෙන් දේශනා කර ආයුධ සන්නද්ධව සටන් කිරීම සම්බන්ධයෙන් දේශනා සිදු කරන ලද බව සහ එසේම මෙම 01 චූදිත එම නුවරඑළියේ පැවැති වැඩමුළුවට සහරාන් සමඟ නායක්තවය ලබා දුන් බවද එම ස්ථානයට පිටස්තර පුද්ගලයන් ඇතුල්වීම වැළැක්වීම සඳහා තමා සමඟ 01 වන චූදිතවද රාත්‍රී කාලයේ පැය 02 ක් මුර කිරීම් කල බවට සාක්ෂි ලබා දී ඇති පසුබිම තුළ එසේම 01 චූදිත ජිහාද් සම්බන්ධයෙන් දේශනා කරමින් ආයුධ සන්නද්ධව සටන් කළ යුතු බවට ද සඳහන් කර ඇති පසුබිම තුළ 01 චූදිත පවසන පරිදි ඔහුට 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සහරාන් සමඟ සම්බන්ධයක් තිබුනේ නැහැ යැයි පවසා ඇතද 2018 වසරේදි මෙලෙස 01 චූදිත සහරාන් සමඟ ඉතා සමීපව කටයුතු කරමින් සිට ඇති

බව පෙනී යන අතර, එමම 01 චූදිත විසින් දමිල භාෂාවෙන් සිදුකර ඇති පැ.803 දරන පාපෝච්ඡාරණමය ලේඛනයෙහි සිංහල පරිවර්තනය වන පැ.803 (A2) ලේඛනයට අනුව මෙලෙස තමා සහ NTJ ජාතික තවුහිද් ජමාද් සංවිධානයේ ප්‍රධානීන් සමඟ නුවරඑළියේ වැඩමුළුවට ගිය ආකාරය සහ සහරාන් විසින් තමාව 2019.03.28 දින ජාතික තවුහිද් ජමාද් සංවිධානයේ 2 වන පෙළ නායකයෙකු ලෙසද පත් කල බවට සඳහන් කර ඇති පසුබිම තුළ මෙම 01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ඉහත පරිදි සඳහන් කර ඇති කරුණු අතිශය විශ්වාසනීයත්වයෙන් තොර සත්‍යයෙන් තොර කරුණු බවට අපහට මනාව පැහැදිලි වේ.

01 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ අධිචෝදනාපත්‍රයෙහි සඳහන් කාලවකවානුවේ මෙරට තුළ ජාතීන් අතර සහ ආගම් අතර සමගියක් තිබුනේ නැති බවත් නොතිබූ ජාතික සමගියක් තමා විසින් නැති කල බවට අධිචෝදනා පත්‍රයේ පවසා තිබීම බොරුවක් බවට 01 චූදිත සඳහන් කර ඇත. අධිචෝදනාපත්‍රයෙහි සඳහන් කර ඇති චෝදනාවල අඩංගු කරුණු වල සත්‍යඅසත්‍යතාවය තීරණය කළ යුත්තේ අධිකරණය විසින් වන අතර, එලෙස තීරණය කිරීම සඳහා සමස්තයක් ලෙස ඉදිරිපත් වන්නා වූ සාක්ෂි සැළකිල්ලට ගැනීම කළ යුතු වේ. අප විසින් ඉහතින් විස්තරාත්මකව සඳහන් කර ඇති හේතූන් වලට අනුව මෙලෙස 01 චූදිත නවුෆර් මවුලවි විසින් පැය 02 ක කාලයක් පුරාවට විත්තිකූඩුවේ සිට සිදු කරන ලද දීර්ඝ ප්‍රකාශයේදී සඳහන් කර ඇති කරුණු

ඔහු විසින් පසුව සිතාමතා ඔහුට එරෙහිව ඇති චෝදනා වලින් ගැලවී යාම සඳහාම සිදු කර ඇති සත්‍යයෙන් තොර විශ්වාසනීයත්වයෙන් තොර ප්‍රකාශයක් බවට අප තීරණය කරමු. ඒ අනුව එකී ප්‍රකාශය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

02 චූදිත මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ නොහොත් ගෆූර් මාමා විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

02 චූදිත මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ හෙවත් ගමේ අය "ගෆූර්" ලෙස හඳුන්වන, මෙම නඩුවේ 02 චූදිත විත්ති කූඩුවේ සිට සිදු කරන ලද දීර්ඝ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ, තමාගේ උපන් ගම මඩකලපුව ප්‍රදේශයේ කාන්දි නගර් ඉරුනූරුවිල් බවත් තමා 1964 වසරේදී එහි උපත ලැබූ බවත් තමාගේ පවුලේ සහෝදරයන් සිව්දෙනෙක්, අක්කලා දෙදෙනෙක් සහ නංගී කෙනෙක් සිටින බවත් කුඩා අවධියේදීම පියා මිය යෑමෙන් පසු මව සහ වැඩිමල් අක්කා ආප්ප පුච්චා ජීවත් වූ බවත් තමාද වැඩිමහල් සහෝදරියක් ද ආප්ප විකුණමින් දැඩි ආර්ථික අපහසුතා මැද ජීවත් වූ බවය. තමා ගමේ තිබූ එකම පාසල වූ "කලවන් පාඨසාලේ" වෙත පැමිණි එකම ගුරුවරයා සතියකට දිනක් හෝ දෙකක් පමණක් පැමිණීම නිසා තමාගේ අධ්‍යාපනය 3 වන පන්තිය දක්වා පමණක් සීමා වී අඩපණ වූ බවත් ඔහු පවසා ඇත. 1985 වසරේ ඇති වූ යුද්ධය නිසා තමාගේ ගමේ සිටි මුස්ලිම් පවුල් 110 ට සරණාගතයන් ලෙස පළා යාමට සිදු වූ බවත් අම්පාර

මහඔය ප්‍රදේශයට ගිය විට එහි සිටි සිංහල ජනතාව තමාලාට ආහාර, පැන් සහ ඇඳුම් ලබා දී වාහනයකින් සම්මන්තුර ප්‍රදේශයට යවූ බවත් ඉන්පසු තමාලා කාත්තන්කුඩි ප්‍රදේශයට පැමිණ 1985 සිට එහි පදිංචිව සිටින බවත් තමා විවාහ වූයේ ද තමා මෙන්ම සරණාගත කඳවුරක සිටි කාන්තාවක් සමඟ බවත් තමාට දියණියන් දෙදෙනෙක් සහ පුතුන් තිදෙනෙක් වශයෙන් දරුවන් පස්දෙනෙකු සිටින බවත් පවසා ඇත. තමා සරණාගත කඳවුරේ සිටි කාලයේදී සහරාන් කාසීම්ගේ පියා මුණ ගැසී ඇති බවත්, ඔහු තම පවුලට ආහාරපාන සහ ඇඳුම් ලබා දෙමින් බොහෝ උපකාර කළ මිත්‍රත්වය නිසා සහරාන්ගේ මල්ලී වන සෙයිනි (ශෙයිනි මවුලවි) හට තම වැඩිමහල් දියණිය විවාහ කර දුන් බවත් පවසා ඇත. තමා වාහන සේවා (Service Station) කාර්මිකයෙකු ලෙස වසර 20-25ක් පමණ කටාර් රාජ්‍යයේ සහ කාත්තන්කුඩි ප්‍රදේශයේ රැකියාව කලද තමාට පසුව වැළඳුණු ඇඳුම රෝගය නිසා වෛද්‍ය උපදෙස් මත එම රැකියාව නතර කිරීමට සිදුවූ බවත් පසුව තමා වාලච්චේන හා කලවංචිකුඩි අතර සර්විස් ස්ටේෂන්වල පම්ප් අලුත්වැඩියා කිරීමේ නිරත වූ බවත් ඒවාට අවශ්‍ය බඩු මිලදී ගැනීමට නාරම්මල, කුරුණෑගල සහ කොළඹ ප්‍රදේශවලට ගොස් ඇති බවත් පවසා ඇත. තමා නාරම්මල ප්‍රදේශයේ නතර වී සිටින විට තමා නීතිවිරෝධී භාණ්ඩ ප්‍රවාහනය කළ බවට චෝදනා එල්ල වී තිබුණ ද, තමා රැගෙන ගියේ සර්විස් ස්ටේෂන්වලට අදාළ බඩු පමණක් බව පවසමින් 02 වූදිත එම චෝදනාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවයි පවසා ඇත. තමාගේ

ආදායම අඩු කාලයේදී තම බෑණා වන ශෙයිනි මවුලවි මල්වාන ප්‍රදේශයේ සෙරෙප්පු වැඩ සඳහා ගෙන තිබූ වත්තක රඹුටන් ඵලදාව වවුලන්ගෙන් ආරක්ෂා කිරීමට කතා කළ නිසා තමා මල්වානට ගොස් ඇති බවත් එහිදී කිසිදු නීතිවිරෝධී දෙයක් නොකළ බවත් 2 වූදිත පවසා සිටී. එක් දිනක තමා බෑණා සමඟ ගමට යාමට පිටත් වූ විට, බෑණාගේ මිතුරන් හමුවීමට හම්බන්තොට ප්‍රදේශයට ගිය බවත්, එහිදී රිල්වාන් නැමැත්තාට ගෑස් සිලින්ඩරයක් පිපිරීමෙන් තුවාල වී ඇති බව දැනගන්නට ලැබුන පසු වෑන් රථයකින් කාත්තන්කුඩි බලා ගිය බවත්, එහිදී රිල්වාන්ගේ මව, පියා සහ බිරිඳ ඔහුව කොළඹ රෝහලට රැගෙන යාමට තීරණය කළ නිසා බෑණා සහ තවත් අයෙකු සමඟ ඔහුව කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලද බවත් රිල්වාන් අන්තවාදියෙකු හෝ ත්‍රස්තවාදියෙකු බව තමා දැන සිටියේ නැති බවත්, ඔහු රන් බඩු සාදන කෙනෙකු ලෙස දැන සිටි බවත්, කුඩා කල සිට හදා වඩා ගත් පවුලේ සාමාජිකයෙකු ලෙස සළකා ජීවිතය බේරා ගැනීමට පමණක් එම උපකාරය කළ බවත් 02 වූදිත පවසා සිටී. ඔහු පවසා සිටින්නේ රිල්වාන් නැමත්තා බෝම්බයක් අත්හදා බැලීමට ගොස් තුවාල ලැබූ බව තමා දැනගත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) රැගෙන ආ පසුව බව වේ. තමා රෝහලෙන් ටිකට් කපා රිල්වාන්ව සාමාන්‍ය බස් රථයකින් කිසිදු රහසිගත බවකින් තොරව කාත්තන්කුඩියට රැගෙන ගොස් ඔහුගේ බිරිඳට භාර දුන් බවත් පවසා ඇත. 2019 අප්‍රේල් 26 වන දින තමා කොළඹ සිට කල්මුණේ බස් රථයකින් යද්දී නොච්චිමුනෙ

ප්‍රදේශයේදී කාත්තන්කුඩි පොලිසිය මඟින් ඔහුව අත්අඩංගුවට ගෙන පහර දුන් බවත් තමාගේ වැඩිමහල් පුතා වන අහමඩ් අර්කම් සහ දෙවන පුතා වන අහමඩ් අල්තාෆ් ද අත්අඩංගුවට ගෙන තමාලා තිදෙනාම එකම සිරකුටියක දැමූ බවත් පසුව තමාව ත්‍රස්ත මර්දන ඒකකයට සහ CID හි වීරසිංහ නිලධාරියාට භාර දුන් බවත් තමාව ජීප් රථයකට දමා අත්මාංචු දමා, ඇස් වසා, බිම පෙරළා ඇඟ උඩ කකුල් තබා ගෙන රැගෙන ගොස් පිට්ටනියකදී සහ එක් නිවසක් ඉදිරිපිටදී දරුණු ලෙස පහර දුන් බවත් තමා ලවා රිවෝල්වරයක් තිබූ ස්ථානයක් පෙන්නුම් කළ බවට CID ය සාක්ෂි ගොතා ඇති බවත් තමා එවැනි ප්‍රකාශයක් නොදුන් බවත් එම නිවසට තමා මීට පෙර ගොස් නැති බවත් 02 වූදිත පවසා සිටී.

02 වූදිත වැඩි දුරටත් පවසා ඇත්තේ තමා නින්දවූර් හෝ පුත්තලම් ප්‍රදේශයට ගිය බවට දුරකථන වාර්තා, ඇඟිලි සලකුණු හෝ DNA සාක්ෂි කිසිවක් මෙම අධිකරණයේ ඉදිරිපත් කර නැති බවත් තමා ට එරෙහිව CID ය පැවරූ චෝදනා සම්පූර්ණයෙන්ම තමා ප්‍රතික්ෂේප කරන බවත් ය. ඔහු වැඩි දුරටත් පවසා ඇත්තේ තමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගැනීමේදී සහකාර පොලිස් අධිකාරී තිසේරා සහ දිසානායක යන නිලධාරීන් නෝම්බි කාලයේදී තමාට බලහත්කාරයෙන් ක්‍රීම් කැකර් බිස්කට් කවා තමාගේ උපවාසය කඩා දැමූ බවත්, තමාට සිංහල නොතේරෙන නිසා ප්‍රශ්නවලට වැරදි පිළිතුරු දුන්නා යැයි පවසමින් තමාගේ පිට ප්‍රදේශයට ලේ එනතුරු දරුණු ලෙස පහර දුන් බවත්, එලෙස

පහරදීමෙන් සිහිසුන් වූ පසු සිරකුටියේ සිටි අයගේ උපකාරයෙන් තමා තුවාලවලට බෙහෙත් ගල්වාගත් බවත් වේ.

එමෙන්ම තවත් අවස්ථාවක දුරකථනයෙන් ඡායාරූපයක් තමාට පෙන්වූ විට තමා එය හඳුනන්නේ නැතැයි පැවසූ විට ස්ථානාධිපති අබේසිංහ සිරකුටිය තුළදීම තමාට පහර දුන් බවත්, තමා සහකාර පොලිස් අධිකාරීවරයා හමුවීමට යාම ප්‍රතික්ෂේප කළ විට ස්ථානාධිපතිවරයා සෙරෙප්පුවෙන් පහර දී කූඩුව තුළට තල්ලු කිරීම නිසා තමාගේ නළල තුවාල වුන බවත්, තමා එහිදී සිහිසුන් වූ පසුව රෝහල් ගත කරන ලද බවත් පොලිස් නිලධාරීන්ගේ බිය ගැන්වීම් නිසා නාන කාමරයේ ලිස්සා වැටුණු බවට තමා කාන්තා වෛද්‍යවරියට බොරු ප්‍රකාශයක් කල බවත් තමාගේ නලලට මැහුම් 4-5 ක් දැමූ බවත් 2 වූදිත පවසා ඇත. පසුව අධිකරණ වෛද්‍ය නිලධාරියා (JMO) ඉදිරියේදී ඔහු තමාට පහර දුන් බවත්, අත් මාංචු දමා ග්‍රිල් එකේ එල්ලා තැබීම නිසා දැත් එසවීමට නොහැකි බවත් පවසා ඇති අතර JMO වෛද්‍යවරයා ඔහුගේ පිටේ තිබූ පහරදීම්වල කැළැල් ඡායාරූපගත කර ඇත. මීට අමතරව, නෝම්බි කාලයකදී සහකාර පොලිස් අධිකාරී සහ දිසානායක යන නිලධාරීන් ඔහු සහරාන්ගේ මාමා යැයි පවසමින් ඇති වූ කෝපයට ඌරු මස් ගෙන්වා, එක් අතක් ජනේලයේ ග්‍රිල් එකට තබා අත්මාංචු දමා ඔහුට බලහත්කාරයෙන් ඌරු මස් කවා ඇති අතර, ඔහු මුස්ලිම් අයෙකු බැවින් එය ප්‍රතික්ෂේප කළද පහර දී එය කැවූ

බවත්, පසුව බන්ධනාගාර රෝහලේ දී ශානි අබේසේකර මහතාද මේ පිළිබඳව තමාගෙන් විමසූ බවත් පවසයි.

ඔහුගේ බිරිඳ ද 2021 දී අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් කර ඇති අතර, ඔහුගේ පුතුන් දෙදෙනා ඇතුළු පවුලේ පස් දෙනෙකු වසර 3ක් රිමාන්ඩ් භාරයේ සිට පසුව නඩුවලින් නිදහස් වී ඇත. ඔහු CID භාරයේ සිටියදී ඔහුගේ වැඩිමහල් දියණිය (ශෙයිනි සමඟ විවාහ වූ) සහ ඇයගේ දරුවන් දෙදෙනා ඇතුළු පවුලේ පිරිසක් සයින්දමරුදු ප්‍රදේශයේදී මියගිය බව දැනගෙන ඇත. ඔවුන් ස්වයංඝාතක ප්‍රහාරකයන් ලෙස නම් කළ බවට සාක්ෂි දී තිබුණ ද, තමා කිසිදු අන්තවාදී පන්තියකට ගොස් නැති බවත්, ස්වයං ඝාතකයෙකු ලෙස කිසිවෙකුගේ නමක් ලබා දී නැති බවත් පවසයි. ඉස්ලාම් ආගමේ සියදිවි නසා ගැනීම තහනම් (හරාම්) සහ අපායට යන පාපයක් බැවින් තමාට කිසිසේත් එවැනි සිතුවිල්ලක් නොතිබූ බවත්, ඔහුගේ දියණිය ඇතුළු පිරිස මියගිය ආකාරය පිළිබඳව තමාට විශාල සැකයක් ඇති බවත් පවසයි. ඔහු කිසි දිනෙක නුවරඑළිය ප්‍රදේශයට ගොස් නැති අතර, පාලමුන ප්‍රදේශයේ පැවති පන්තියකට ගිය බවට අස්මියා නැමැති සාක්ෂිකාරිය දුන් සාක්ෂිද ප්‍රතික්ෂේප කරමින් පවසන්නේ, තමා දියණියව එහි ගොස් ඇරලවා ආවා මිස ඇතුළට නොගිය බවයි. දැනට 63 හැවිරිදි වියේ පසුවන තමාට එරෙහිව CID ය අසාධාරණ ලෙස සාක්ෂි ගොතා ඇති බවත්, ඔහුගේ බිරිඳ තයිරොක්සින් රෝගයෙන් පෙළෙන බවත්, දරුවන් දෙදෙනෙකු තවමත් අධ්‍යාපනය ලබමින් සිටින බවත්,

පවසන ඔහු තමාට එරෙහිව පවතින අනෙක් නඩු 3 ද සඳහන් කරමින් මෙම නඩුවෙන් තමා නිදහස් කරන ලෙස ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටී.

<u>විශ්ලේෂණය.</u>

ඉහත පරිදි 02 වූදිත විසින්ද විත්තිකූඩුවේ සිට දීර්ඝ ප්‍රකාශයක් කර ඇති අතර, ඔහු මඩකලපුව ප්‍රදේශයේ ඉපදී වැඩුනු බව සහ තමා බොහෝ දුෂ්කරතා ඔස්සේ පාසැල් ගියද කුඩා කලම පියා මියගිය නිසා පාසැල් යාම නතර වූ බවට සඳහන් කර ඇති අතර, ඉන් පසු 1985 පැවති යුධමය වාතාවරණය ඔස්සේ තමාලා සමන්තුරේ ප්‍රදේශයට යාමට සිදු වුනු බවත්, එම ප්‍රදේශයේ සිටි පුද්ගලයන් තමාව කාත්තන්කුඩි ප්‍රදේශයට යැවීමෙන් අනතුරුව 1985 සිට මේ දක්වාම කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වුනු බවට සඳහන් කර ඇති අතර, තමාට දරුවන් පස් දෙනෙකුද සිටින බව පවසා ඇති අතර, ඔහුගේ ප්‍රකාශයට අනුව ඔහු ස්වයංසාතක බෝම්බකරු වන සහරාන් නැමැත්තාගේ පියා 1985 වසරේ සිටම දැන හඳුනන තැනැත්තෙක් බව පෙනී යයි. තමා සහරාන්ගේ පියාගේ නිවසට කුඩා කල සිටම ගිය බවට ඔහුගේ ප්‍රකාශයෙන් හෙළි වන අතර, ඒ අනුව සහරාන්ගේ සහෝදරයින් වන ශෙයිනි සහ රිල්වාන් යන අයද හඳුනන බවට එමඟින්ම හෙළි වේ. එලෙස සහරාන්ගේ පවුලේ අය සමඟ පැවැති සබඳතා හේතු කොට ගෙන සහරාන්ගේ එක් සහෝදරයෙකු වන ශෙයිනි (ශෙයිනි මවුලවි) නැමැත්තාට

ඔහුගේ දියණියව විවාහ කර දී ඇති බව පවසා ඇත. තමා 2015, 2016 කාලවකවානුවේ සර්විස් ස්ටේෂන් එකක සේවය කරන ලද බවට ඔහු පවසා ඇති අතර, එහි අළුත්වැඩියා කිරීම් වලට අදාළ භාණ්ඩ රැගෙන ඒම සඳහා නිතර කුරුණෑගල නාරම්මල ප්‍රදේශයට ගිය බවට සඳහන් කර ඇත. ඔහු තවදුරටත් පවසා ඇත්තේ ඔහුගේ බෑනා වන ශෙයිනි මවුලවි තමාට මල්වාන ප්‍රදේශයේ වැඩපලක් යොදාගෙන තිබූ ස්ථානයේ ආරක්ෂාවට සහ රඹුටන් ගස් එලදාව ආරක්ෂා කිරීම සිදු කිරීම් ආදිය ඔහු පැවසීමට උත්සාහ කර ඇත්තේ තමා එම ස්ථානයට ආවේ නීති විරෝධී කාර්යයකට නොව එම රඹුටන් ගස් තිබුන වත්තේ වැඩ කිරීම සඳහා බවයි. 2 වූදිත පවසන පරිදි ඔහු එම ස්ථානයේ ආරක්ෂා කටයුතු කරමින් සිටි කාලසීමාව තුළ එම ස්ථානයට එම නිවස අයිති පුද්ගලයන් හැර වෙනත් පුද්ගලලයින් පැමිණියේ නැති බව පෙන්වා දීමට වේ.

හම්බන්තොට ප්‍රදේශයෙහි පුහුණු වැඩමුළුවකට යාම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති චෝදනාවලට පැහැදිලි කිරීමක් වශයෙන් ඔහු සඳහන් කර ඇත්තේ තම බෑණාවන ෂෙයිනි මව්ලවි සහ තමා දිනක ගමට යන්න සූදානම්ව සිටින විට බෑණාගේ යාළුවන් කීපදෙනෙකු හම්බන්තොටට එන බව පැවසූ නිසා තමාලා දෙදෙනාම බස් රථයෙන් හම්බන්තොට ප්‍ර දේශයට ගොස් එහි තිබූ නිවසට තමාව තමාගේ බෑණා එක්කගෙන ගිය බව සහ පවසා එම ස්ථානයෙහි වැන් එකක හතරපස්දෙනෙක් සිටි බවත්, එලෙස ගොස් පැය භාගයක්වත් ගතවීමට

පෙර රිල්වාන් වැඩ කරමින් සිටින විට ගෑස් සිලින්ඩරයක් පුපුරා තුවාල වුනු බවට පවසා එවලේම යන්න ඕනා යැයි පවසා එම ස්ථානයේ තිබුනු වාහනය රැගෙන තමා සහ තම බෑණා වන ෂෙයිනි මව්ලවිත් අම්පාර හරහා කාත්තන්කුඩියට ගොස් රිල්වාන්ගේ නිවසට ගොස් සහරාන්ගේ පියාගේ ඉල්ලීම පරිදි ඔහුව කොළඹ රෝහලට ගෙන ආ බව සහ එම තීරණය ගත්තේ තමා නොව සහරාන්ගේ පියා බවත් පෙන්වා දීමටය.

මෙම 02 චූදිත පැවසීමට උත්සාහ කර ඇත්තේ එම රිල්වාන් නැමැත්තා අන්තවාදියෙකු හෝ ත්‍රස්තවාදියෙකු බවට තමා දැනගෙන හිටියේ නැති බවත්, තමා ඔහුව කුඩා කල සිට දන්නා නිසා උදව්වට ඔහුව එලෙස කොළඹට රැගෙන ආ බවයි. මෙම 02 චූදිත පැවසීමට උත්සාහ කර ඇත්තේ රිල්වාන් නැමැත්තා ත්‍රස්තවාදියෙකු හා අන්තවාදියෙකු බව තමා දැනගත්තේ තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින විට බවයි. 02 චූදිත පවසා සිටින්නේ තමා රිල්වාන්ව කොළඹ රෝහලට ඇතුළ් කිරීමේදී ඔහුව රෝහලට ඇතුළ් කිරීමට අත්සන් කළේ ඔහුට උදව්වක් වශයෙන් බවයි. මෙම 02 චූදිත විසින් එලෙස පැවසූ කරුණ සැබැවින්ම විශ්වාසනීයත්වයෙන් තොර බව පෙනී යන අතර ඔහු රිල්වාන් නැමැත්තාව කුඩා කල සිටම දන්නා හඳුනන නිසා මානුෂිකව කටයුතු කර උදව්වක් වශයෙන් ඔහුව කොළඹ ජාතික රෝහලට ඉදිරිපත් කිරීමට ඔහු පවසන පරිදි රැගෙන ආවා නම් රිල්වාන් නැමැත්තාව රෝහලට ඇතුළත් කිරීමේදී රිල්වාන් යන නම සඟවා ඒ වෙනුවට එම්.අයි. සාහීඩ්, අංක 14,

දෙල්ගහගොඩ, හිඟුල යනුවෙන් සඳහන් කර ඔහුව රෝහලට ඇතුළත් කිරීමට කිසිදු යුක්ති සහගත හේතුවක් පෙනී යන්නේ නැත. එම්.අයි.සාහීඩ් යනු මෙම නඩුවේ 05 වන චූදිත වන අතර ඔහු කාත්තන්කුඩිය ප්‍රදේශයේ පදිංචි අයෙකු නොව දෙල්ගහගොඩ, හිඟුල ප්‍රදේශයේ පදිංචි අයෙක් වේ.

ඒ අනුව එම 02 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි රිල්වාන් නැමැත්තාව එලෙස කොළඹට රැගෙන විත් රෝහලට ඇතුළත් කළේ ගෑස් සිලින්ඩරයක් පිපිරීම නිසා නම් රිල්වාන් නැමැත්තාගේ අනන්‍යතාවය සඟවා රිල්වාන් යන වෙනුවට මෙම නඩුවේ 05 වන චූදිත එම්.අයි.සාහීඩ් ලෙස එම රෝහලට ඇතුළත් කිරීමට සහ එම අවස්ථාවේදී රෝගියාගේ භාරකරු ලෙස 05 වන චූදිතගේ සහෝදරයා වන එම්.අයි.සාදික් නැමැත්තාගේ නම සඳහන් කරමින් කූට ලෙස කටයුතු කරමින් රිල්වාන් නැමැත්තාගේ අනන්‍යතාවය සැඟවීමට මෙම 02 වන චූදිතට කිසිදු සාධාරණ හෝ යුක්ති සහගත හේතුවක් තිබිය නොහැකිය.

එසේම මෙම 02 වන චූදිත ගෆූර් විසින් සිදු කරන ලද දීර්ඝ ප්‍රකාශයේදී ඔහු රිල්වාන් නැමැත්තාගේ අනන්‍යතාවය සඟවා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමට හේතුව සම්බන්ධයෙන් කිසිදු කරුණක් සඳහන් කර නොමැති අතර මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි අනුව එම අවස්ථාවේ අදාළ ශ්‍රී ලංකා රෝහලට ඇතුළත් කිරීමේ පත්‍රයෙහි රිල්වාන් නැමැති රෝගියාගේ භාරකරු ලෙස එම්.අයි.සාදික් එනම් මෙම නඩුවේ 05 චූදිත එම්.අයි.සාහීඩ්ගේ සහෝදරයාගේ විස්තර ඇතුළත්

කරමින් කටයුතු කළේ කවර හේතුවකට යන්න සම්බන්ධයෙන් කිසිදු යුක්ති සහගත පැහැදිලි කිරීමක් සිදු වී නැත.

04 වන චූදිත ද හිඟුල, දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙක් වන අතර ඒ අනුව නැගෙනහිර පළාතේ මඩකලපුවට ආසන්නයේ පිහිටි කාත්තන්කුඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන මෙම 02 වන චූදිත ඉහත කී 04 සහ 05 චූදිතයන් දෙදෙනා සම්බන්ධයෙන් දෙදෙනා මුණගැසුනේ කෙසේද, ඔවුන් දෙදෙනාවද සම්බන්ධ කරගෙන රෝහල් කාර්ය මණ්ඩලයද නොමඟ යවමින් රිල්වාන් නැමැත්තාගේ අනන්‍යතාවය සඟවා අසත්‍ය කරුණු සඳහන් කරමින් මෙම සාක්ෂිකරුම පවසන පරිදි තමා කුඩා කල සිටම අඳුරන රිල්වාන් නැමැත්තාව ඔහුගේ සැබෑ නමින් කොළඹ ජාතික රෝහලට ඇතුළත් නොකර මෙලෙස නීතිවිරෝධී ආකාරයෙන් අන්‍ය පුද්ගලයෙකුගේ විස්තර ඇතුළත් කර රෝහලට ඇතුළත් කළේ කවර හේතුවකට යන්න සම්බන්ධයෙන් කිසිදු කරුණක් 02 වන චූදිතගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන් හෙලි වන්නේ නැත.

මෙම චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය අනුවම කාත්තන්කුඩියේ සිට කොළඹට ඒමට කිලෝමීටර් 300 ක් පමණ දුර ගමන් කළ යුතු බවත්, පැය 06 ක් 07 ක් පමණ ගත වෙන බවත් පවසා ඇති අතර එසේම තමා රිල්වාන්ව රෝහල් ගත කිරීමට උදව් කළේ පවුලේ සමාජිකයෙක් නිසා බව පවසා ඇතද, මෙම 02 වන චූදිත ස්ථිරවම පදිංචිව සිට ඇත්තේ කාත්තන්කුඩිය ප්‍රදේශයේ මඩකලපුව දෙසට වන්නට ඇති

ස්ථානයක බැවින් ඉතා පහසුවෙන් රෝගියාව මඩකලපුව ශික්ෂණ රෝහලට රැගෙන යාමට ඕනා තරම් පහසුකම් තිබියදී පැය ගණනාවක් වාහනයකින් ගමන් කර පැමිණිය යුතු කොළඹ ජාතික රෝහලටම පැමිණියේ කවර හේතුවකටද යන්න සම්බන්ධයෙන් මෙම 02 වන චූදිත ගෆූර් මාමාගේ විත්තිකූඩුවේ සිට කරන ප්‍රකාශයෙහි ඉහත පරිදි සඳහන් කර ඇතද, ඔහු තමාගේ පවුලේ සාමාජිකයෙකු නම් ඔහුගේ සත්‍ය නම රෝහලට ලබා නොදී දෙල්ගහගොඩ, හිඟුල ප්‍රදේශයේ පදිංචි එම්.අයි.සාහීඩ් නැමැති මෙම නඩුවේ 05 වන චූදිතගේ නමින් රිල්වාන් නැමැත්තාව කොළඹ ජාතික රෝහලට ඇතුළත් කළේ කවර හේතුවකට ද යන්න සම්බන්ධයෙන් කිසිදු කරුණක් හෙලිවන්නේ නැත.

එසේම එකී රිල්වාන් නැමැත්තාට සහෝදරයන් කීපදෙනෙක් සිටින බවට මෙම සාක්ෂිකරුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන්ම හෙලි වී ඇති අතර ඒ අනුවද බලනකල මෙම චූදිතම පවසන පරිදි සහරාන්ගේ එක් සහෝදරයෙකු වන ෂෙයිනි මව්ලවි නැමැත්තා සමඟ හම්බන්තොට නිවසක සිට එහි තිබූ ඩොල්ෆින් වෑන් රථයක්ද රැගෙන අම්පාර හරහා කාත්තන්කුඩි යාමට තරම් තිබූ අවශ්‍යතාවය කුමක්ද යන්න 02 චූදිතගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන් කිසිසේත් හෙලි වන්නේ නැත. ඒ අනුව ඔහු ස්වයංඝාතක බෝම්බකරුවකු වන සහරාන් නැමැත්තාගේ සහෝදරයෙකු වන රිල්වාන් නැමැත්තාගේ අනන්‍යතාවය සඟවා වෙනත් අයෙකුගේ නමින් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර තිබීම තුළින්ම

මෙම 02 වන චූදිත නීතිවිරෝධි අයුරින් කටයුතු කර ඇති ආකාරය මනාව පැහැදිලි වේ.

තවද පැ.876 (A) ලෙස ලකුණු කර ඇති කරුණ එනම් නිර්වින්දන තත්ත්වයක් යටතේ රෝගියාව ප්ලාස්ටික් සැත්කමකට ලක් කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරමින් ‘‘මෙයට මාමා’’ යැයි සඳහන් කර ගත්තූර් යනුවෙන් අත්සන් කර තබා ඇත්තේ සහ රෝගියාව සුදුසු නිර්වින්දනය යටතේ ඇසේ සැත්කමකට කැමැත්ත ප්‍රකාශ කරමි යන්නට පසුවද ගත්තූර් යනුවෙන් දමිළ භාෂාවෙන් අත්සන් තබා ඇති අත්සන එනම් පැ.876(B) යන අත්සන් දෙකම තබා ඇත්තේ මෙම 02 චූදිතම බවට සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂකවරයා පැ.සා.1445 රන්බණ්ඩාර ජයසුන්දර යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන් සහ පැ.1578 ලෙස ලකුණු කර ඇති ආණ්ඩුවේ සැක කටයුතු ලේඛන පිළිබඳ වාර්තාව මඟින් මැනවින් සනාථ වී ඇති අතර එම විශේෂඥ සාක්ෂිකරුගේ සාක්ෂිය මෙම 02 චූදිත වෙනුවෙන් ඔහුගේ උපදෙස් මත 2026.07.27 දින අධිකරණයේ පෙනී සිට ඇති නීතිඥ කනිල් මද්දුමාගේ මහතා විසින් 02 චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න කිසිවක් නොමැති බවට පවසා ඇති පසුබිම තුළ 02 චූදිත විසින් පැ.876 දරන ලේඛනයෙහි තබා ඇති අත්සන් සම්බන්ධයෙන් ප්‍රබල සාක්ෂි ඔහුට එරෙහිව ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව සැබැවින්ම රිල්වාන් නැමැත්තාට තුවාල වී ඇත්තේ ගෑස් සිලින්ඩරයක් පිපිරීම නිසා නොව බෝම්බයක් අත්හදා බැලීමට යාමේදී බවට මෙම අධිකරණයේ ඉදිරියේද විශ්වාසනීය

සාක්ෂි ගණනාවක් ඉදිරිපත් වී ඇති පසුබිම තුළ හම්බන්තොට සිට කාත්තන්කුඩියට ගොස් කාත්තන්කුඩියේ සිට කොළඹ ජාතික රෝහලට රිල්වාන් නැමැත්තාව රැගෙන ගොස් අසත්‍ය තොරතුරු ලබා දී රිල්වාන් නැමැත්තාව රෝහල්ගත කර ඇති මෙම 02 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි රිල්වාන් නැමැත්තා අන්තවාදියෙකු සහ ත්‍රස්තවාදියෙකු යැයි දැනගත්තේ තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී යැයි පවසා ඇති කරුණ කිසිසේත් සත්‍ය නොවන බව පෙනී යයි.

ඔහු විසින් වැඩිදුරටත් පවසා ඇත්තේ මොහුව අත්අඩංගුවට පත් වීමෙන් පසු ඔහුට පොලිස් නිලධාරීන් විසින් දරුණු ලෙස පහර දීම් සිදු කරන ලද බව සහ එසේම ඔහු සහරාන්ගේ මාමා යැයි පවසා ඔහු කෝපයට පත්වී තමාට බලහත්කාරයෙන් ඌරු මස් කැවූ බව වන අතර මෙහිදී ඔහු පැවසීමට උත්සාහ කර ඇත්තේ තමා කිසිදු අවස්ථාවක ප්‍රකාශයක් ලබා දුන්නේ නැති බව වුවද, මෙම අධිකරණය ඉදිරියේ පැ.1912 ලෙස ලකුණු කර ඇති,

මෙම 02 චූදිත විසින් 2019.04.26 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මකඩලපුව ඒකකයෙහි ප්‍රධාන පොලිස් පරීක්ෂක වීරසිංහ යන නිලධාරියාට ප්‍රකාශයක් ලබා දී ඇති අතර එම නිලධාරියා මේ වනවිට මියගොස් ඇති අතර ඒ අනුව සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව මෙම අධිකරණය ඉදිරියේ පැ.1912 ලෙස පැමිණිල්ලේ සාක්ෂි

අංක 2171 විශ්‍රාමික ප්‍රධාන පොලිස් පරීක්ෂක මොහොමඩ් ඉස්මයින් මොහොමඩ් ෆසීර් මඟින් ලකුණු කර ඇති උධෘත කොටසක් පැ.1912 ලෙස ලකුණු කර ඇති අතර එයට අනුව නින්දවූර්වල කුලියට ගත් නිවසේ කුස්සියේ දුම් කවුළුවක ඇති ලෑල්ලක් මත තැබූ රිවෝල්වරයක් මෙම 02 වූදිතගේ මඟ පෙන්වීම ඔස්සේ සොයාගෙන ඇති අතර එම රිවෝල්වරය සොයාගත් නිවස නින්දවූර්වල පිහිටි ආරක්ෂක නිවසක් ලෙස භාවිතා කර ඇති බවට මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව මෙම 02 වන විත්තිකරු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍ර කාශයේදී පවසා ඇති පරිදි ඔහු විසින් රිවෝල්වරයක් පෙන්වීමක් හෝ කිසිදු ප්‍රකාශයක් ලබා දීමක් සිදු කළේ නැති බවට සහ එම රිවෝල්වරය සොයාගත් නිවස කොහොමද කියලාවත් දන්නේ නැහැ කියලා පැවසූ කරුණුද, තමා එම නිවසට මීට පෙර ගිහිල්ලාත් නැහැ, තමා එවැනි ආයුධයක් එම ස්ථානයේ තිබ්බෙත් නැහැ යැයි පැවසූ කරුණු සත්‍යයෙන් තොර ප්‍රකාශයන් බව මනාව පැහැදිලි වේ.

මෙම වූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා ඇත්තේ තමා නින්දවූර් නිවසක සිටි බවට තමාගේ ඇඟිලි සටහන් හෝ DNA වාර්තා හෝ කිසිවක් නොමැති බවත් වන වන අතර මෙහිදී 02 වන වූදිත නින්දවූර්හි පිහිටි අදාළ ආරක්ෂිත නිවසෙහි සිට ඇති බව සනාථ කිරීම සඳහා ඔහුගේ ඇඟිලි සටහන් හෝ DNA වාර්තා ඉදිරිපත් කිරීමක් කිසිසේත් අවශ්‍ය වන්නේ නැති අතර ඔහු එම ආරක්ෂිත නිවසේ සිට ඇති

බවට පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති ඉහත කී සාක්ෂි සැබැවින්ම ප්‍රමාණවත් වේ.

මෙම චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ඔහු CID අත්අඩංගුවේ සිටියදී පහරදීම්වලට ලක් වූ බවට පවසා ඇති අතර, 02 චූදිත වෙනුවෙන් විත්තියේ සාක්ෂි ලැයිස්තුවක් ගොනු කරමින් වෛද්‍ය ඉලංගෝවන් යන වෛද්‍යවරයා සාක්ෂි ලැයිස්තුවට ඇතුළත් කර එම සාක්ෂිකරුට සිතාසිද යවා තිබුනද, 2026.08.21 දින මෙම 02 චූදිත වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ තමා එම සාක්ෂි කැඳවන්නේ නැති බවත්, එම සාක්ෂිකරුගේ සිතාසිය ආපසු කැඳවන ලෙසත් ය.

ඒ අනුව 02 චූදිතට අදාළ විත්තියේ නඩු විභාගය අවසන් කර ඇති අතර ඒ අනුව 02 චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇති පරිදි ඔහුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටියදී ඉතා දැඩි ලෙස ශාරීරික වදබන්ධනයන්ට ලක් වූ බවට පවසා සිටියද එවැන්නක් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් මෙම අධිකරණය ඉදිරියේ 02 චූදිත වෙනුවෙන් ඉදිරිපත් කර නැත.

02 චූදිත පවසා ඇත්තේ තමා ඉස්ලාම් භක්තියෙකු ලෙස සියදිවි නසා ගැනීම සඳහා කිසිදු සිතිවිල්ලක් තමාට තිබුනේ නැති බවත්, එය තම ආගමේ හැටියට තහනම් කරපු දෙයක් බවත් පවසා ඇති අතර තමා කිසිදු අවස්ථාවක ස්වයංඝාතකයෙකු ලෙස ස්වයංඝාතකයෙකු වීමට නම දුන්නේ

නැති බවත් එවැනි අවශ්‍යතාවයක් තිබුනා නම් සයින්දමරුදු ප්‍රදේශයේ තමාගේ දුව මියගිය තැනට ගොස් තමාට පුපුරුවා ගන්නට තිබුණු බවත් පවසා ඇත.

මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි අනුව සයින්දමරුදු ප්‍රදේශයේ ස්වයංඝාතක බෝම්බ පිපිරීම් සිදු කරගෙන සහරාන් නැමැති ස්වයංඝාතක බෝම්බකරුගේ මව සහ පුතා සහ සහෝදරයින් ඇතුළු පිරිසක් මියගොස් ඇති බවට මෙම අධිකරණයේ සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර ඔවුන් එලෙස බෝම්බ පුපුරුවා ගැනීමක් සිදු කර ඇත්තේ සයින්දමරුදු බොලිවේරියන් ග්‍රාමයේ පිහිටි සුනාමි නිවසක සිටියදී ආරක්ෂක අංශ විසින් එම ස්ථානය වැටලීමට පියවර ගනිමින් සිටි අවස්ථාවේ වන අතර එම ස්ථානයේ ෂෙයිනි මව්ලවි සහ ඔහුගේ බිරිඳ එනම් මෙම 02 චූදිතගේ දියණියද මියගොස් ඇත. ඔවුන් මියගොස් ඇත්තේ බෝම්බ පුපුරුවා ගෙන බවට විශේෂඥ සාක්ෂි ද මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇත.

මෙලෙස 02 චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී තමා පාලමුණ ප්‍රදේශයේ පන්තියක් පැවැත්වෙන ස්ථානයෙහි එලියේ සිටි බවත් තමා ඇතුළටවත් ගියේ නැති බවත් තමා උඩ තට්ටුවේ ඉන්නවා දැක්ක බවට අස්මියා නැමැත්තිය සාක්ෂි දුන්නද තමා ඇයව දැක්කේ නැති බවත් පවසා ඇති අතර එසේම තමා කිසිදු දිනයක නුවරඑළිය ප්‍රදේශයට ගොස් නැති බවට තමා සහතික කරලා පවසා සිටින බවත්, 02 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී එකහෙලාම පවසා ඇතද, මෙම

අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියෙහි පැහැදිලිවම මෙම අධිකරණයට සඳහන් කර ඇත්තේ මෙම ගහූර් අන්කල් කියන කෙනා සිටි බවත් ඔහුට අබුහදීත් යන නමද සහරාන් විසින් ලබා දුන් බවත් පවසා විවෘත අධිකරණයේදී ඔහුව පෙන්වා හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එම සාක්ෂිකරුව මෙම 02 වන චූදිත විසින් දමිළ භාෂාවෙන් හරස් ප්‍රශ්න ඇසීමක්ද කරන ලද අතර එහිදී ද සාක්ෂිකරු පවසා ඇත්තේ තමා 02 වන චූදිතව දන්නේ අබුහදීත් යන නමින් බවත් පසු කාලීනව විමර්ශන කටයුතුවලට පසු ගහූර් අන්කල් යන නම දැනගත් බවයි.

අබුහදීත් යන නම එම සාක්ෂිකරුගේ ප්‍රකාශයට ඇතුළත් කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැවසූ බවට යෝජනා කළද සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කරමින් තමා ලබා දුන් ප්‍රකාශයේදී අබුහදීත් යන නම සඳහන් කර තිබෙන බවත්, එයට තහවුරු කිරීමක් වශයෙන් ඡායාරූපවලින් ගහූර් නානා, ගහූර් අන්කල් යන නම සඳහන් වෙන බවයි. එකී අනස් යන සාක්ෂිකරුට මෙම 02 වන චූදිතට එරෙහිව අසත්‍ය සාක්ෂි ලබා දීමට තරම් කිසිදු යුක්ති සහගත හේතුවක් තිබෙන බවට ඔහුව හරස් ප්‍රශ්නවලට ලක් කිරීමේදී හෝ හෙලි වී නොමැති අතර ඒ අනුව මෙම 02 වන චූදිත තම ජීවිතයේ කිසිදු දිනයක නුවරඑළිය ප්‍රදේශයට ගොස් නැති බවට මෙම 02 වන චූදිත විසින් පවසා සිටි කරුණු විශ්වාසනීයත්වයෙන් තොර බව පැහැදිලිව අප හට පෙනී යයි.

තවද මෙම අධිකරණය ඉදිරියේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද පැ.සා.181 කමලාවති නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව ඇයට අයත් සමාගමෙන් PJ 4080 දරන වෑන් රථය අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා විසින් මිලදී ගෙන ඇති අතර එම වාහනය කුෂන් කිරීම සඳහා එදිරිසිංහ කුෂන් ආයතනයට ගෙන ගොස් ඇති අතර එම වාහනය කුෂන් කිරීම සඳහා මෙම නඩුවේ 02 වන චූදිත විසින් රැගෙන එන ලද බවට පැ.සා.1420 එදිරිසිංහ කුෂන් ආයතනයේ ලක්ෂිකා දුලාංජලී විසින් හඳුනා ගැනීමේ පෙරට්ටුවකදී පවා හඳුනා ගෙන ඇති අතර එම වාහනය 2019.04.12 දින ගල්කිස්ස ස්පෑන් ටවර් නැමැති ගොඩනැගිල්ලෙහි 06/05 නිවසට යාමට පැමිණි පුද්ගලයන් පැමිණ ඇති බවට පැ.සා.1031 අරුණ ප්‍රියතම සිල්වා යන සාක්ෂිකරු එනම් ස්පෑන් ටවර්හි ආරක්ෂක නිලධාරියාගේ සාක්ෂියෙන් හෙලි වී ඇති අතර එම PJ 4080 වාහනය 2019.04.21 කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිට නවතා තිබී එය 2019.04.22 දින ඒ තුළ තිබූ බෝම්බ පුපුරුවා යාමක් සිදු වී ඇති බව සම්බන්ධයෙන් සාක්ෂි මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී ඇති අතර ඒ අනුව එලෙස අධි බලැති බෝම්බ සවිකර තිබී ඇත්තේ මෙම 02 වන චූදිත විසින් 2018 වසරේ සීට් කුෂන් කර ගැනීම සඳහා එදිරිසිංහ කුෂන් ආයතනයට ගෙන ගොස් ඇති බැවින් සහ එකී අංක PJ 4080 දරන වාහනය අබේවීර සහ සමාගමෙන් මිලදී ගෙන ඇත්තේ කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බ පුපුරුවා ගත් මොහොමඩ් අසාම් මුබාරක් වීම

තුළින්ද ගල්කිස්ස ස්පෑන් ටවර්හි 06/05 නිවස වෙන් කරගෙන ඇත්තේද එකී ස්වයංඝාතක බෝම්බකරු වන අසාම් මොහොමඩ් මුබාරක් වීමද එසේම කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිට අධි බලැති බෝම්බ සහිතව තිබී ඇත්තේද එම වාහනයම වීම තුළින් එකී මරාගෙන මැරෙන බෝම්බකරුවන් සමඟ මෙම 02 වන චූදිත මොහොමඩ් සරීඛ් ආදම් ලෙබ්බේ නොහොම් ගෆූර් මාමා යන අයට මනා සම්බන්ධතාවයක් තිබී ඇති බව මැනවින් පෙනී යන පසුබිම තුළ තමා අදහන ඉස්ලාම් ආගමේ හැටියට මරාගෙන මැරෙන ස්වයංඝාතක බෝම්බකරුවෙකු ලෙස සියදිවි නසා ගැනීම තහනම් කර ඇති බවට පවසමින් තමාට එවැනි සිතුවිල්ලක් හෝ නැති බවට මෙම 02 චූදිත විසින් පැවසූ කරුණු කිසිසේත් විශ්වාසනීය නොවන බවට අප හට පෙනී යයි.

සමස්තයක් ලෙස ගෙන මෙම 02 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී ඔහු විසින් සඳහන් කර ඇති කරුණු පසුව සිතා මතා මනා ලෙස සූදානම් වී කර ඇති ප්‍රකාශයක් බවත්, ඔහුට එරෙහිව ඇති බරපතල චෝදනාවලින් ගැලවී යාමේ අරමුණින්ම මෙම ප්‍රකාශය සිදු කර ඇති බවට අප තීරණය කරමු.

ඒ අනුව එකී ප්‍රකාශය පිළිගැනීම අප මුළුමනින්ම ප්‍රතික්ෂේප කරමු.

03 චූදිත හයාතු මොහොමදු අහමදු මිල්හාන් විසින්

විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

03 චූදිත මිල්හාන් විත්ති කූඩුවේ සිට කරන ලද දීර්ඝ ප්‍රකාශයේ දී පවසා ඇත්තේ, මෙම නඩුවේ මුල් අවස්ථාවේදී භාෂණ පරිවර්තකයා විසින් චූදිතයින්ගේ නම් අධිකරණයේ අඩ ගසන ලද අවස්ථාවේ තමාගේ නම සමග **"අබු සීලා"** යනුවෙන් නමක් සඳහන් කල බවත්, එම නම තමාගේ නොවන බවට තමා මුල් අවස්ථාවේම ඉදිරිපත් කල විරෝධතාවයෙන් පසු එය අධිකරණයේ නොකියන ලෙස එම අවස්ථාවේ සිටි විනිසුරුවරයා වූ මාරසිංහ මහතා නියෝග කළ බවත්ය.

තමා මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ උපන් 37 හැවිරිදි විවාහක පුද්ගලයෙකු වන ඔහු, උසස් පෙළින් පසු වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පියෙකු (MLT) ලෙස කටයුතු කර ඇති බවත් තමා කටාර් රාජ්‍යයේද රැකියාව කර 2017 වසරේ ලංකාවට පැමිණි ඔහු වටු කුරුල්ලන් ඇති කරන ගොවිපළක් ආරම්භ කරන ලද බවත් පවසා ඇත. 2019 අප්‍රේල් 17 වන දින තමා පවුලේ අය සමඟ උම්රා වන්දනා ගමනක් ගිය බවත්, පාස්කු ප්‍රහාරය සිදුවන අවස්ථාවේ තමා සිටියේ සෞදි අරාබියේ බවත් ඔහු පවසා ඇත. තමා නැවත ලංකාවට ඒමට සූදානම් වන විට සෞදි පොලිසිය විසින් තමාව අත්අඩංගුවට ගෙන දින 40ක් රඳවා තබා ගෙන සිටි බවත්, එහිදී ලංකාවෙන් පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු

නිලධාරියෙකු තමා පවසනදේ නොපැවසුවහොත් පවුලේ අය අත්අඩංගුවට ගන්නා බවට තමාට තර්ජනය කරන ලද බවත් ඔහු පවසා ඇත. එසේම තමාගෙන් රිල්වාන් නැමත්තාව දන්නවාද ? යනුවෙන් විමසූ බවත්, එහිදී රිල්වාන් තමාගේ මිත්‍රයෙක් බවත්, තමාගේ කෙනෙක් බව තමා පැවසූ බවත්, 3 වූදිත පවසා ඇත.

2019 ජූනි 14 වන දින තමාව ලංකාවට රැගෙන ආපසු සහකාර පොලිස් අධිකාරී තිසේරා තමාට සිංහලෙන් කතා කරන ලෙස බල කරමින් දරුණු ලෙස පහර දී තමාගේ යටි රැවුලේ රැවුල් ගස් ගැලවූ බවත්, තමාව සවුදි අරාබියේ සිට රැගෙන එන විට ඇඳ ගෙන සිටි අරාබිවරුන් අඳින ඇඳුමෙන් සිටි බවත්, එම නිලධාරියා එම ඇඳුමට කැමති නැති බව පවසා එය ගලවන ලෙසට තමාට බැන්න බවත්, තමාට සිංහල කතා කිරීමට බැරි බවට පැවසූ විට ඔහු අද ඔයා සිංහල කතා කරයි. මම සිංහල කතා කරවන්නම් යයි පවසා තමාට පහර දුන් බවත්, එදින රාත්‍රියේ යාදවී නම් දමිළ කතා කරන නිලධාරිනියක් පැමිණ, ඔවුන් පවසන පරිදි ක්‍රියා නොකළහොත් දැනටමත් රිමාන්ඩ් කර සිටින තමාගේ බිරිඳ සහ මල්ලි ජීවිත කාලයටම හිරේ තබන බව පවසා මානසිකව තමාව පීඩාවට පත් කර න ලද බවත්, පසු දින විශේෂ ඒකකයේ දිසානායක, මෙන්ඩිස් සහ ක්‍රිශෝර් යන නිලධාරීන් මුණගැසුණු විටද එම තර්ජනයම කර ඇති අතර, සිංහල කියවීමට නොදන්නා තමා ලවා මෙන්ඩිස් නිලධාරියා විවිධ ලේඛනවලට අත්සන් ලබා ගත් බවත් පවසා ඇත. වසර එකහමාරක් CID රඳවා තබා

ගැනීමෙන් පසු 2020 දෙසැම්බර් 3 වන දින තමාව මඩකලපුව බන්ධනාගාරයට පත් කරන ලද බවත්, තමාට එරෙහිව චෝදනා පත්‍රයේ 1, 3 සහ 20 යන චෝදනා ඇතුළුව තුවාලකරුවන් සහ මරණකරුවන්ගේ නම් සඳහන් කරමින් චෝදනා 700කට වඩා ඉදිරිපත් කර ඇති බවත් පවසා ඇත. තමාට එරෙහිව ඉදිරිපත් කර ඇති ජාතීන් අතර භේද ඇති කිරීමට කුමන්ත්‍රණය කිරීම (1 වන චෝදනාව), අන්තවාදී දේශන සහ අවි පුහුණුව ලබා දීම (3 වන චෝදනාව) සහ පුපුරණ ද්‍රව්‍ය මිලදී ගැනීමට ආධාර කිරීම (20 වන චෝදනාව) යන සියලුම චෝදනා තමා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත් ඔහු පවසා ඇත. මෙම නඩුව දිනපතා නඩු විභාග කිරීමේදී නීතිඥ ගාස්තු ගෙවීමට නොහැකි වීම නිසා තමාට තමා වෙනුවෙන්ම පෙනී සිටීමට සිදුවූ බවත් ඔහු පවසා ඇත. තමාට එරෙහි චෝදනාවල සඳහන් අයගෙන් ආසාද් නමැත්තා ගමේ කෙනෙකු ලෙස දැක තිබුණත්, රිල්වාන් යනු තමාගේ පාසල් මිතුරෙකු බවත්, සහරාන් යනු රිල්වාන්ගේ අයියා (සහරාන් මවුලවි) බවත් අනෙක් කිසිවෙකු ඔහු හඳුනන්නේ නැති බවත් පවසා ඇත. චෝදනාවල නැතත් රිල්වාන්ගේ පියා වන කාසිම් (තබ්ලික් ජමාද් සංවිධානයේ ආගමික කටයුතු කළ) සහ රිල්වාන්ගේ අනෙක් සොහොයුරා වන සෙයිනි මවුලවි තමා හඳුනන බවත්, සෙයිනි මවුලවි ඔහුට හඳුනා ගැනීමට ලැබුණේ "රිසාලා එෆ්.එම්." පෞද්ගලික ගුවන් විදුලියේ ඔහු නිවේදකයෙකු ලෙස කටයුතු කල කාලයේදී බවත්, 2017 දී සෙයිනි මවුලවි සහ 17 වන චූදිත අබ්දුල් රවුෆ්

විසින් පිරිමින් සහ කාන්තාවන් සඳහා පැවැත්වූ ආගමික දැනුවත් කිරීමේ වැඩසටහන්වලට තමා සිය බිරිඳ සහ පවුලේ අය සහභාගී කරවා ඇති බවත්, එක් වැඩසටහනක් තමාගේ නිවසේද පැවැත්වූ බවත් චූදිත පවසා ඇත. පාලමුනේ ප්‍රදේශයේ පැවති එවැනි වැඩසටහනක් ගැන සාක්ෂි දුන් පැමිණිල්ලේ සාක්ෂිකාරියක වන අස්මියා (සාක්ෂි අංක 2233) නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂිය විස්තර කරමින් ඇගේ සාක්ෂියට අනුව එම වැඩ සටහනේදී ඉගැන්වූයේ මත්ද්‍රව්‍ය නිවාරණය සහ යහපත් ක්‍රියා වැනි පොදු ආගමික දේවල් බවත්, ඇයව වසර තුනක් රිමාන්ඩ් කර දරුවන්ගෙන් වෙන්කර පොලිසිය කළ තර්ජන සහ පොරොන්දු නිසා ඇය මහේස්ත්‍රාත් හමුවේ බොරු ප්‍රකාශයක් කළ බවත්, අධිකරණයේදී දිවුරුම් පිට ඇය පිළිගත් බවත් චූදිත පවසා ඇත. එමෙන්ම පාලමුනේ නිවසේ අයිතිකරුට (සාක්ෂි අංක 2231) "බයියා" යන වචනය පවසන ලෙස කියා දී ඇත්තේද පොලිසිය බව හෙළි වී ඇති බවත්, මෙම චූදිත පවසා ඇත.

තවද තමාගේ ජාතික හැඳුනුම්පතට අදාළ දුරකථන අංක මහනුවර, නුවරඑළිය සහ හම්බන්තොට තිබූ බවට පොලිස් සාක්ෂිකරුවෙකු වන සාක්ෂි අංක 1641 යන සාක්ෂිකරු ඉදිරිපත් කළ සාක්ෂිවල GPS තාක්ෂණයෙන් නිශ්චිත ස්ථානය තහවුරු කර නොමැති බවත්, කුළුණක් කාර්යබහුල වන විට වෙනත් කුළුණකට ඇමතුම් මාරුවන බව එම සාක්ෂිකරු පිළිගෙන ඇති බවත් මෙම චූදිත පවසා ඇත. තමා පෞද්ගලික අවශ්‍යතාවලට රට පුරා සංචාරය කලද කිසිදු නීති විරෝධී ක්‍රියාවකට

සම්බන්ධ වී නැති බවත්, තමා අනුරාධපුර රඹෑව ප්‍රදේශයට ගොවිපළ කටයුතුවලට ගියද, එහිදී අන්තවාදී දේශන හෝ අවි පුහුණුව දුන් බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැති බවත් මල්වාන ප්‍රදේශයේදී එවැනි ක්‍රියා කල බවටද කිසිදු සාක්ෂියක් නැති බවත්, "පැන්ඩා" ක්‍රීඩාංගනයේ අයිතිකරු (සාක්ෂි අංක 2230) සහ මල්වානේ නිවසේ අයිතිකරුවන් (සාක්ෂි අංක 2296, 2247) කිසිවෙකු තමාව දැක නැති බවත් චූදිත පවසා ඇත. එසේම නුවර (මහනුවර) නිවසේ අයිතිකරු (සාක්ෂි අංක 1388) හෝ හම්බන්තොට රැකබලා ගන්නා (සාක්ෂි අංක 1399) යන සාක්ෂිකරුවන් කිසිවෙකුත් තමාව දැක නැති බවත් සැක කටයුතු කිසිවක් වාර්තා කිරීමක්ද කර නැති බවත් චූදිත පවසා ඇත. තවද නුවරඑළිය ප්‍රදේශයේදී "අබු සීලා" නමැත්තෙකු තමාට අවි පුහුණුව දුන් බවත්, පසුව ඔහු මිල්හාන් බව දැනගත් බවත් පැවසූ අනස් (සාක්ෂි අංක 1400) නැමැති සාක්ෂිකරු අධිකරණයේ සිටි චූදිතයන් 24 දෙනා දෙස බලා අබු සීලා හෝ මිල්හාන් යන පුද්ගලයා හඳුනා ගැනීමට නොහැකි බවට පවසා ඇති බවත් එසේම එම අනස් නැමැත්තා පොලිසියට සහ මහේස්ත්‍රාත්තුමාට දුන් මුල් ප්‍රකාශ කිසිවක අබු සීලා හෝ මිල්හාන් යන නම් සඳහන් කර නොතිබූ බවත්, එම අනස් යන සාක්ෂිකරුව අත්අඩංගුවට ගෙන නොමැත්තේ ඔහු පොලිසිය විසින් නිර්මාණය කල බොරු සාක්ෂිකරුවෙකු නිසා බවත් මෙම චූදිත පවසා ඇත. එමෙන්ම, නුවරඑළිය වැටලීමට ගිය පොලිස් කණ්ඩායමට සැක කටයුතු කිසිවක් හමු නොවූ බව පරීක්ෂණ කළ OIC ඉන්ද්‍රජිත් මහතා

ඔහුගේ ප්‍රකාශයේ ප්‍රකාශ කර තිබුණද, එම ප්‍රකාශය CID ය ගෙතූ කතාවට පටහැනි නිසා අනෙක් වැටලීම් නිලධාරීන්ගේ ප්‍රකාශ සටහන් කරගෙන නොමැති බවට පවසා සිටි බවත්, ඉන්ද්‍රජීත් මහතාද දැනට මියගොස් ඇති බවත් චූදිත පවසා ඇත. මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් නන්දසිරි (සාක්ෂි අංක 1925) සාක්ෂි දෙමින් 11 වන චූදිත පැවසූ බවට සඳහන් කරමින් තමාද බඩු මිලදී ගැනීමට සම්බන්ධ බව පවසා සාක්ෂි ලබා දී ඇති බවත්, හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහු පවසා ඇත්තේ මිල්හාන් කවුදැයි නොදන්නා බවට බවත් එම චූදිත පවසා ඇත.

දමිල භාෂාවෙන් තිබූ සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද "ෂුරා කවුන්සිල්" නමැති ලේඛනය සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් සාක්ෂිකරු එය කාගේ ලේඛනයක්ද කවුරු විසින් සැකසූ ලේඛනයක්ද යන්න ඔහුගෙන් ඇසූ විට එය පරිවර්තනය කරන ලද සාක්ෂිකරු තමා එය නොදන්නා බවත් පවසා ඇති අතර, නිර්නාමික එකක් බවත්, එහි සැකසූ දිනයක්, වේලාවක් හෝ හෑෂ් (hash) අගයක් නැති බවත් රජයේ රස පරීක්ෂක කාර්යාලයේ විශේෂඥයා (සාක්ෂි අංක 1429) පිළිගෙන ඇති බැවින් එය සාක්ෂිවලින් ඉවත් කරන ලෙස මිල්හාන් ඉල්ලා සිටී. කටුවාපිටියේ තිබී සොයාගත් දත් බුරුසුවක මිල්හාන්ගේ DNA තිබූ බවට රස පරීක්ෂක සාක්ෂිකාරිය (අංක 1436) පැවසුවද, ඇය හරස් ප්‍රශ්නවලදී පිළිගෙන ඇත්තේ දත් බුරුසුවක් යනු චංචල දේපලක් බවත්, එම DNA එහි තැන්පත් වූ දිනය හෝ එම ස්ථානයට දත් බුරුසුව පැමිණි දිනය කිව

නොහැකි බවත්ය. කටුවාපිටිය ප්‍රදේශය කොහේදැයි තමා නොදන්නා බවත්, කිසිදු සාක්ෂිකරුවෙකු තමා එහිදී දැක නැති බවත් පවසන මිල්හාන්, තමාගේ දත් බුරුසුව එහි ගියේ කෙසේද යන්න පිළිබඳව සිය සැකය පැහැදිලි කරයි. 2018 අගභාගයේදී ගෑස් සිලින්ඩරයක් පිපිරීමෙන් තුවාල ලබා කොළඹ ප්‍රතිකාර ලබමින් සිටි ඔහුගේ මිත්‍ර රිල්වාන්ව බැලීමට, සෙයිනි මවුලවි දුන් ලිපිනයකට අනුව වැල්ලවත්ත මයුරා ප්‍රදේශයේ තට්ටු නිවාසයකට මිල්හාන් ගොස් එක් රැයක් නතර වී ඇත. දිනකට පස් වතාවක් වන්දනා කිරීමට පෙර දත් මැදීම ඉස්ලාමීය සිරිතක් (සුන්නාවක්) බැවින් තමා නිතර දත් බුරුසුවක් ළඟ තබා ගන්නා අතර, එම නිවසේදී අතපසුවීමෙන් දමා ආ දත් බුරුසුව, රිල්වාන් ඇතුළු පිරිස වෙනත් ස්ථානයකට මාරු වන විට ඔවුන්ගේ බඩු සමඟ රැගෙන යන්නට ඇතැයි තමා සැක කරන බවත් පවසා ඇත. කටුවාපිටියේ තිබූ අනෙක් කිසිදු භාණ්ඩයක තමාගේ DNA හෝ ඇඟිලි සලකුණු නොතිබූ අතර, අනෙක් විත්තිකරුවන්ගේ ප්‍රකාශවලද තමා එහි සිටි බවක් සඳහන් නොවන බව පවසා සිටී. ඔල්ලිකුලම් ප්‍රදේශයේ තමා විසින් මෆාස් නමැත්තෙකුට විකුණූ ඉඩමක සහ අබ්දුල් රවුෆ්ගේ ඉඩමක තිබී පුපුරණ ද්‍රව්‍ය සෙවූ බවට IP දිසානායක (සාක්ෂි අංක 1958) පැවසූ සාක්ෂි අතිශයින් පරස්පරය. දිසානායක පැවසූ දේට පටහැනිව, එදා කාත්තන්කුඩි OIC කස්තුරිආරච්චි පැවසුවේ රවුෆ්ගේ ඉඩම සීල් කර තිබූ බව සහ එහි තට්ටු දෙකක නිවසක් තිබූ බවයි. එහි ගිය STF නිලධාරීන් කිසිවෙකු සාක්ෂියට කැඳවා නැති අතර

ඡායාරූප හෝ වීඩියෝ ඉදිරිපත් කර නැත. තමා සහ 8 වන විත්තිකරු එදින රවුල්ගේ නිවස ඇතුළේ රඳවා තැබූ අතර, ඔවුන් ලවා කිසිදු භාණ්ඩයක් සොයා ගැනීමක් සිදු කර නැත. එමෙන්ම 27 වන වගන්තිය යටතේ තමා ප්‍රකාශයක් දුන් බව පැවසුවද, එම ප්‍රකාශය ලියාගත් බව කියන උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස්ව සාක්ෂියට නොකැඳවා පැමිණිල්ලේ සාක්ෂි අවසන් කර ඇති බැවින්, තමාට ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලැබුනේ නැති බවත් කියා සිටී. අනෙක් විත්තිකරුවන් දුන් වගන්ති 16(1) ප්‍රකාශ ස්වේච්ඡාවෙන් දුන් ඒවා නොවන බව ඔවුන් පවසා ඇති අතර, නීතිමය වශයෙන් එක් ප්‍රකාශයකින් තවත් ප්‍රකාශයක් තහවුරු කළ නොහැකි බැවින් ඒවා සාක්ෂි ලෙස නොගන්නා ලෙස ඔහු ඉල්ලා සිටී. දේශපාලකයින් ආණ්ඩු පෙරළීමට සහ වාසි ලබා ගැනීමටත්, විවිධ පුද්ගලයින් පොත් ලියා මුදල් ඉපයීමටත් ඔවුන්ගේ නම් භාවිත කරන බවත්, පොලිසිය ඔහුගේ නිවසේ තිබූ කුකුළන්ට කෑම දෙන බටයක් "බැන්ගලෝර් ටෝපිඩෝ" පුපුරණ ද්‍රව්‍යයක් ලෙස පුවත්පත්වල පළ කර තමා ත්‍රස්තවාදියෙකු ලෙස පෙන්වීමට බොරු ප්‍රචාර කල බවත්, ඔහු පවසයි. තමා සන්තකයේ තිබී කිසිදු ආයුධයක්, ලිපිලේඛනයක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් සොයා ගෙන නැති බවත්, තමා වින්දිතයන්ගේ වාර්තා පිළිගත්තේ ඔවුන් තවදුරටත් උසාවි කැඳවා පීඩාවට පත් නොකිරීමේ යහපත් චේතනාවෙන් පමණක් බවත් පවසන මිල්හාන්, තමාට එරෙහි චෝදනා කිසිවක් සාධාරණ සැකයෙන්

ඔබ්බට ඔප්පු කර නොමැති බැවින් තමා නිදොස් කොට නිදහස් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටී.

<u>විශ්ලේෂණය</u>

03 වන චුදිත විත්තිකුඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති සියලුම චෝදනාවන් ප්‍රතික්ෂේප කර ඇති අතර, ඔහුව සවුදි රාජ්‍යයේදී අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙරටට රැගෙන ඒමෙන් පසුව පත් වූ ආකාරය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කරුණු දක්වා ඇත. ඔහු සඳහන් කර ඇත්තේ අධිචෝදනා පත්‍රයෙහි සඳහන් ඔහුට එරෙහි චෝදනාවල යම් යම් ස්ථාන සඳහන් කර තිබුනද තමා ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලංකාව පුරා බොහෝ ස්ථානවලට ගොස් ඇති බව සඳහන් කරමින් ඔහු සඳහන් කර ඇත්තේ ඔහුට එරෙහිව ඇති චෝදනාවල නම් සඳහන් කර ඇති පුද්ගලයන් තමාගේ උපන්ගම වන කාත්තන්කුඩි ප්‍රදේශයේ නිසා තමා ඔවුන්ව දන්නා අඳුනන බවයි. ඒ හැර අධිචෝදනා පත්‍රයෙහි නම් සඳහන් අනික් පුද්ගලයන් ගැන තමාට කිසිදු දැනීමක් නොමැති බව ඔහු පවසා ඇත. ඔහු අසාත් නැමැති පුද්ගලයාව කාත්තන්කුඩි ප්‍රදේශයේ පුද්ගලයෙක් බවට අධිකරණයේදී දැන ගත් බවත් ඇතැම්විට තමාගේ ගමේ කෙනෙක් නිසා තමා ඔහුව දැක ඇති බවටත් පවසා ඇත. තමා රිල්වාන් නැමැත්තා සමඟ එකම පාසලේ අධ්‍යාපනය ලබා ඇති බව සහ ඔහුගේ නිවස සහ ඔහු සමඟ

නිරන්තරයෙන්ම ආශ්‍රය කර ඇති බවද තමාලා ඉගෙන ගත්තේ එකම පාසැලේ බැවින් පාසැල් ගියේද එකට බවට පවසා ඇති අතර, ඔහු ඔහුගේ චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී රිල්වාන්ගේ අයියා වන සහරාන් මවුලවිද හඳුනන නමුත් ඔහුව ළඟින් ආශ්‍රය කර නැති බවත් පවසා මෙම චූදිත පැහැදිලි කිරීමට උත්සාහ කර ඇත්තේ තමා රිල්වාන්, සහරාන් සහ අසාද් යන තැනැත්තා යනුවෙන් සඳහන් කර තිදෙනා හැර අධිචෝදනා පත්‍රයේ නම් සඳහන් අනික් කිසිදු පුද්ගලයෙකු නොදන්නා බවයි. තමා රිල්වාන්ගේ පියාව හඳුනන බවත් රිල්වාන්ගේ අයියා වන ශෙයිනි නැමැත්තාව දන්නා හඳුනන බවත් ඔහු පවසා ඇති බව පෙනී යන අතර, තමා ඔහු සමග සම්බන්ධ වී ඔවුන් විසින් පවත්වාගෙන යන ලද පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවක නිවේදක කටයුතු කල බවට පවසා ඇත.

2017 වසරේ තමා විසින් ගොවිපලක් පටන් ගත්ත බවත් එම ගොවිපල ඉදිරිපිට මෙම නඩුවේ මියගිය 17 වන චූදිත වන රවුෆ්ගෙ ඉඩම තිබුනු බව පවසා ඇති මෙම චූදිත එම ඉඩමේ තිබී සාක්ෂි ආඥා පනතේ 27 වගන්තිය ප්‍රකාරව කිසිදු දේපලක් සොයාගත්තේ නැති බවට මෙම චූදිත පවසා ඇතද මෙම අධිකරණයේ පැ.1737 ලෙස ලකුණු කර ඇති සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාර උධෘත කොටසෙහි පැහැදිලිව සඳහන් කර ඇත්තේ ***ඩෙටනේටර්, ජෙලටිනයිට්, ඩෙටනේටර් කෝඩ්..... අඟල් 6 එස්ලොන් බට ඇතුළේ දාලා දෙපැත්තට මූඩි***

ගහලා සීල් කරලා මෆාස්ගේ ඉඩමේ වැට අයින දිගේ ස්ථාන කීපයක..... එම පුපුරණ ද්‍රව්‍ය..... තිබෙන තැන් මට පෙන්වා දෙන්න පුළුවන්. මගේ ඉඩමේ ඉදලා අඩි 100 ක් විතර පිටුපසින් තියෙන ඉඩමක වීන කඩු 50 ක් විතරයි තවත් ලෝකල් කඩු වගයකුයි පතොරොම් 300 විතර අර කලින් කියපු විදියට එස්ලොන් බටවල දාලා..... තිබෙනවා.....ඒ විදියටම ඒවා තියෙනවා.....මට ඒ පුපුරණ ද්‍රව්‍ය තිබෙන තැන් පෙන්වා දෙන්න පුළුවන්

යැයි සඳහන් කර ඇති බව වන අතර මෙම 03 වන චූදිතගේ මහපෙන්වීම ඔස්සේ එම දේපල ඔහු සඳහන් කර ඇති ස්ථානවල තිබී සොයාගත් බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1958 ලලිත ගීතාංජන දිසානායක යන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයාගේ සාක්ෂියෙන් හෙලිවන අතර එම සාක්ෂිකරුගේ සාක්ෂිවලට අනුව මෙම 03 වන චූදිත විසින් අබ්දුල් රවුෆ් නැමැත්තාගේ ඉඩමෙහි ස්ථාන දෙකක සහ මෙම චූදිත විසින් මෆාස් නැමැත්තාට විකුණා තිබූ ඉඩමේ ස්ථාන 07 ක් මෙම 03 වන චූදිත විසින්ම පෙන්වා දීම මත සහ එසේම මෙම නඩුවේ 08 වන චූදිත වන පිරිදවුස් නැමැත්තා විසින්ද එම ස්ථානයන් දෙකම පෙන්වා දුන් බවට සාක්ෂි ලබා දී එම ස්ථානයන් හෑරීමට ලක් කර එම ස්ථානයන් තුළ වල දමා තිබූ අඟල් 06 ක් පමණ ප්‍රමාණයේ විෂ්කම්භය ඇති දෙපසට ප්ලාස්ටික් කප් යොදා තිබූ බටවලින් එක් බටයක් තුළ මෙරට සාදන ලද කඩු 11 ක් ද, එසේම ඉන් එක් බටයක් තුළ විදේශ රටක නිෂ්පාදිත කඩු 19 ක් ද, එසේම

මෙම චූදිත විසින් පෙන්වා දුන් පරිදි අබ්දුල් රවුෆ් යන අයට අයත් ඉඩමේ මෙම චුදිත පෙන්වා දුන් ස්ථානය හාරා පරීක්ෂා කර බැලීමේදීද අඟල් 06 ක විෂ්කම්භයෙන් යුතු දෙපසට කප් යොදා වසා තිබූ ප්ලාස්ටික් බටයක් හමුවුනු බව සහ ඒ තුළ ටී 56 උණ්ඩ 475 ක් ද, HK උණ්ඩ 11 ක් ද, 5.56 MM ප්‍රමාණයේ උණ්ඩ 33 ක් ද, එසේම පුහුණුව සඳහා භාවිතා කරන උණ්ඩ 04 ක් ද සොයාගත් බව පවසා එසේම මෙම 03 වන චූදිතගේ මඟපෙන්වීම ඔස්සේම මෆාස් නැමැත්තාට අයිති ඉඩමක මෙම චූදිත විසින් පෙන්වූ ස්ථානයන් හාරා බැලීමේදී පොලිතීන් මඟින් ආවරණය කරන ලද ජෙලටිනයිට් සාන්ද්‍රණය අඩංගු බාල්දි දෙකක්ද සොයාගෙන ඇති අතර, එසේම අඟල් 06 විෂ්කම්භයෙන් යුතු ප්ලාස්ටික් බටයේ දෙපසට ප්ලාස්ටික් කප් යොදා වසා තිබූ බටය තුළ ජෙලටිනයිට් කූරු 81 ක් ද තිබී සොයාගෙන ඇති අතර මෙම චූදිතගේ මඟපෙන්වීම ඔස්සේම සොයාගන්නා ලද එවැනිම ආකාරයේ තවත් ප්ලාස්ටික් බටයක් පරීක්ෂා කිරීමේදී ඒ තුළද ජෙලටිනයිට් කූරු 93 ක් තිබී සොයාගත් බවට ඉහත පොලිස් නිලධාරියාගේ සාක්ෂියේදී හෙලි වී ඇති අතර එසේම මෙම 03 වන චූදිතගේම මඟපෙන්වීම ඔස්සේ තවත් ස්ථානයන් හාරා බැලීමේදී ද පෙර සඳහන් කළ ආකාරයෙන්ම බටයක් හමුවී ඒ තුළ ප්ලාස්ටික් ලන්ච් බොක්ස් 05 ක් හමුවූ බව සහ එකී එක් පෙට්ටියක් තුළ ඩෙටනේටර් 200 බැගින් පෙට්ටි 05 ඩෙටනේටර් 1000 ක් තිබී සොයාගත් බවට සාක්ෂි ලබා දී ඇති අතර එසේම මෙම චූදිතගේ මඟපෙන්වීම ඔස්සේ ඔහු පෙන්වා සිටි තවත් ස්ථානයක් හාරා බැලීමේදී එම

ස්ථානයද අඟල් 06 විෂ්කම්භයේ යුතු ප්ලාස්ටික් බටයක් තුළ රතු පැහැති සේවානුල් අඩි 35 ක් දිගැති කොටසක් සහ ජෙලටිනයිට් කූරු 87 ක් ද තිබී සොයාගෙන ඇති අතර එසේම මෙම චූදිත විසින් පෙන්වා දුන් තවත් ස්ථානයක් හාරා පරීක්ෂා කර බැලීමේදී එම ස්ථානයෙහිද ප්ලාස්ටික් කෑම පෙට්ටි තුනක ඩෙටනේටර් 500 ක් තිබී සොයාගත් බවට සාක්ෂි ලබා දී ඇති අතර එම සාක්ෂිකරු විසින් එම සියළුම නඩු භාණ්ඩ විවෘත අධිකරණයේදී හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇති අතර එකී නඩු භාණ්ඩ සොයාගෙන ඇති ආකාරය සම්බන්ධයෙන් ඉහත කී සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සළකා බැලීමේදී මෙම 03 වන චූදිත විත්තිකූඩුවේ සිට ප්‍රකාශයේ පවසා ඇති පරිදි එකී භාණ්ඩ සම්බන්ධයෙන් කිසිවක් තමා නොදන්නා බවට පවසා ඇති කරුණ කිසිසේත් පිළිගත නොහැකිය. එපමණ භාණ්ඩ ප්‍රමාණයක් අනාවරණය කරගෙන ඇත්තේ හුදෙක් භූමියක මතුපිට තිබී නොව ඒවා වැලි පොළොවෙහි යට පොළොව හාරා ඒවා තුළ සූක්ෂම ආකාරයෙන් වල දමා තිබී මෙලෙස සොයාගෙන ඇති බව පෙනී යන අතර මෙම චූදිත විසින්ම එම භාණ්ඩ තිබූ ස්ථානයන් තිබෙන ස්ථානය හෙලි නොකළා නම් එපමණ ප්‍රමාණයක් පුපුරණ ද්‍රව්‍ය, කඩු, ඩෙටනේටර්, ජෙලටිනයිට් කූරු සහ සේවානුල් ද පොළොව යට වල දමා තිබී සොයාගැනීමට ඉහත කී පැ.සා.1958 ගීතාංජන දිසානායක යන පොලිස් පරීක්ෂකවරයාට කිසිසේත් හැකියාවක් තිබීය නොහැකිය. ඒ අනුව අපහට පෙනී යන්නේ මෙම 03 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි එම භාණ්ඩ සොයාගත් ඉඩම

තමාට අයිති එකක් නොවන බව සහ එය 2019.02.19 දින නීත්‍යානුකූලව මෆාස් නැමැත්තාට විකුණූ බවට පවසා තමා ලවා එවැනි කිසිදු භාණ්ඩයක් සොයාගත්තේ නැති බවට සඳහන් කර ඇති කරුණ විශ්වාසනීයත්වයෙන් තොර බවට අපහට පෙනී යයි.

ඉහත පොලිස් නිලධාරියාගේ සාක්ෂිය අනුව මෙම 03 වන චූදිතගේ මහපෙන්වීම ඔස්සේ සාක්ෂි ආඥා පනතේ 27 වගන්තිය ප්‍රකාරව සොයාගෙන තිබෙන ඉහත කී භාණ්ඩ එනම් මෙම අධිකරණය ඉදිරියේ පැ.1741, පැ.1744, පැ.1746, පැ.1747 ආදී වශයෙන් ලකුණු කර ඇති නඩු භාණ්ඩ සියල්ල දෙස අපගේ අවධානය යොමු කිරීමේදී අපහට පැහැදිලිව පෙනීයන්නේ එපමණ ප්‍රමාණයක් පුපුරණ ද්‍රව්ය, සේවානුල් සහ පතොරොම් 300 කට අධික ප්‍රමාණයක් සොයාගෙන ඇත්තේ මෙම 03 වන චූදිතගේම මහපෙන්වීම් ඔස්සේ ඔහුට අයත්ව තිබූ ඉඩමක බාහිරින් නොපෙනෙන පරිදි පොළොව යට වල දමා තිබී සොයාගෙන ඇති බවට වන අතර ඒ අනුව 03 වන චූදිත ඒවා ගැන තමා කිසි දෙයක් දන්නේ නැති බව සහ තමා එවැන්නක් පෙන්වා දුන්නේ නැති බවට පැවසූ කරුණු අපහට පිළිගත නොහැකිය.

ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේද සඳහන් කර ඇති පරිදි ඔහු විසින් එම නඩු භාණ්ඩ සොයාගත් ඉඩම 2019.02.19 වන දින නීත්‍යානුකූලව විකුණූ බවට පවසා ඇතද, ඉහත කී විමර්ශන නිලධාරියාගේ සාක්ෂියට අනුව බාහිරින් පියවි ඇසට කිසිසේත් නොපෙනෙන

ආකාරයෙන් තිබී ඇති එම භාණ්ඩ තිබූ ස්ථානයන් පිළිබඳව පෞද්ගලිකවම දැනීමක් තිබී ඇත්තේ මෙම 03 වන චූදිතට බව පැහැදිලිව පෙනීයයි.

මෙම චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇත්තේ පැ.1737 ලෙස ලකුණු කරන ලද සාක්ෂි ආඥා පනතේ 27 වගන්තිය ප්‍රකාර සටහන් කර ඇති උධෘතයේ අඩංගු තමාගේ ප්‍රකාශය සටහන් කරගන්නා ලද උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස් යන නිලධාරියා මෙම අධිකරණයේ සාක්ෂි දීම සඳහා කැඳවා නොතිබීම නිසා තමාට එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලැබුනේ නැති බවට පවසා ඇතද, මෙහිදී වැදගත් වන්නේ පැ.1737 දරන උධෘතයේ අඩංගු ප්‍රකාශය සටහන් කරන ලද නිලධාරියා නොව එම ප්‍රකාශය ප්‍රකාරව ඉහත කී සැක සහිත නඩු භාණ්ඩ සොයාගෙන ඇති නිලධාරියා විසින් සාක්ෂි ලබා දීම වන අතර එලෙස එකී නඩු භාණ්ඩ සොයාගත් පැ.සා.1958 ප්‍රධාන පොලිස් පරීක්ෂක ගීතාංජන දිසානායක යන සාක්ෂිකරුව මෙම 03 වන චූදිත විසින් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න ඇසීමකට ලක් කර ඇති පසුබිම තුළ ඔහු පවසන පරිදි ඔහුගේ ප්‍රකාශය සටහන් කරගත්තා යැයි පවසන උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස් යන සාක්ෂිකරු සාක්ෂියට කැඳවා නොතිබූ පමණින් කිසිදු ආකාරයකින් යුක්තිය අපගමනය වීමක් සිදු නොවන බව අපහට පෙනී යයි.

මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙම අධිකරණය ඉදිරියේ ත්‍රස්තවාදය වැළැක්වීමේ

පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පිළිගෙන ලකුණු කර ඇති ප්‍රකාශවල යම් යම් ස්ථානවල තමාගේ නමත් සඳහන් වී තිබෙන බව තමාගේ අවධානයට ලක් වුනු බවත් ඒවා තහවුරු කිරීම සඳහා තමාට විරුද්ධව කිසිදු සාක්ෂියක් මෙම අධිකරණයේ ඉදිරිපත්වී නැති බව මෙම 03 වන චූදිත පවසා ඇතද මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් එම ප්‍රකාශයන්හි අඩංගු කරුණු සත්‍ය බව පෙනීයන අතර එම සාක්ෂිකරුට වසර 07 කට ආසන්න කාලයකට පසුව මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දීමේදී මෙම 03 වන චූදිතව පෙන්වා හඳුනා ගැනීමට නොහැකි වුවද ඔහු පැහැදිලිව සඳහන් කර ඇත්තේ නුවරඑළියේ පුහුණු වැඩසටහනේදී මිල්හාන් නැමැත්තා හට අබු සිලා යන නම ලබා දී තිබුණු බව සහ එම මිල්හාන් නැමැත්තා විසින් ගිනිඅවියක් භාවිතා කරන ආකාරය පුහුණු කරන ලද බව වේ.

එසේම එම වැඩසටහනට මිල්හාන් නමින් සහභාගී වී සිටියේ එක පුද්ගලයෙකු පමණක් බව අබු සිලා යැයි සඳහන් කළේද එකී තැනැත්තාම පමණක් බවත් මෙම සාක්ෂිකරු පවසා ඇති අතර ඒ අනුව 03 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි මෙම සාක්ෂිකරු පැවසූ අබු සිලා නමට අදාළ මිල්හාන් නැමැත්තා තමා නොවන බවත් සමහර විට ඔහු පවසන මිල්හාන් යන පුද්ගලයා වෙනත් කෙනෙකු වෙන්න පුළුවන් බවත් මෙම චූදිත පවස ඇත. නුවරඑළිය වැඩමුළුව සඳහා මිල්හාන් නැමැත්තා සහභාගී වූ බවට මෙම නඩුවෙහි 01 චූදිත නවුෆර්

මව්ලවිගේ පැ.803 A 2 දරන පාපොච්චාරණයේ අඩංගු කරුණු මඟින් හෙලිවන අතර මෙම අධිකරණයේ සිටින චූදිතයන් 24 දෙනා අතුරින් මිල්හාන් යන නමින් වෙනත් කිසිදු චූදිතයෙකු නොමැති පසුබිමද සැලකිල්ලට ගැනීමේදී මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සියළු පරිවේශනයන්ට අනුව පැ.සා.1400 අනස් නැමැති සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී සඳහන් කරන ලද මිල්හාන් නොහොත් අබු සිලා නැමැත්තා මෙම 03 වන චූදිතම බවට එකම සහ ඒකායන අනුමිතියකට එළඹිය හැකි වේ.

මෙම 03 වන චූදිත ඉහත පරිදි විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි විශ්ලේෂණය කරමින් කරුණු දක්වා ඇති අතර එසේම ඔහු පවසා සිටින්නේ තමාව මෙම නඩුවේ චුදිතයෙක් කර ඇත්තේ යම් දේශපාලන අරමුණු සඳහා බවත් දේශපාලකයන්ව තෘප්තිමත් කිරීම සඳහාත්, රජයේ පාලකයන්ව තෘප්තිමත් කිරීම සඳහාත්, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ව තෘප්තිමත් කිරීම සඳහාත්, ඔවුන්ට දේශපාලකයන් ලබා දුන් පොරොන්දු ඉෂ්ට කිරීම සඳහා මෙලෙස තමාට එරෙහිව එල්ල කර ඇති චෝදනාවන් නීත්‍යානුකූලව චෝදනාවන් සම්බන්ධ සාක්ෂි සළකා බලන ලෙසට මෙම චූදිත පවසා ඇති අතර එසේම මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1429 රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියා විසින් ලකුණු කර ඉදිරිපත් කරන ලද සූරා කවුන්සලය සම්බන්ධ ලේඛනය කවුරු විසින් කුමන වේලාවක සකස්

කළාද යන්න නොදන්නා නිර්නාමික ලේඛනයක් බවට පවසා එම ලේඛනය සළකා බැලීම නොකළ යුතු බවටත් 03 වන චූදිත පවසා ඇති අතර එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක 1436 රජයේ රසපරීක්ෂක විසින් කටුවාපිටිය ප්‍රදේශයේ යම් ස්ථානයකදී සොයාගත් දත් බුරුසුවලින් එකක තමාගේ DNA සාම්පල් සොයාගත් බවට සාක්ෂි ලබා දුන්නද, එය චංචල දේපලක් බැවින් එම භාණ්ඩයේ තිබූ DNA සාම්පලය කුමන දිනයක ඒ මත පතිත වුනාද යන්න නිශ්චිතව කියන්න බැරි බවත් කෙසේ වුවත් තමා එම දත් බුරුසුවේ තිබෙන DNA සාම්පල තමාගේ යන්න විද්‍යාත්මකව පවසන විට එය ප්‍රතික්ෂේප කරන්නේ නැති වුවද එම දත්බුරුසුව සොයාගත්තා යැයි කියන ස්ථානය කොහේද යන්නවත්, තමා එම ස්ථානයට ගිහින් හෝ නොමැති බවත් එම ස්ථානයේ හස්තූන් නැමැත්තාගේ DNA අඩංගු භාණ්ඩ තිබී සොයාගත් බවට සාක්ෂි ලබා දුන්නද තමා සහ හස්තූන් එකට එම ස්ථානයේ සිටි බවට කිසිදු සාක්ෂිකරුවෙකු සාක්ෂි ලබා දී නැති බව පවසා තමා නැමැදුම් කරන අවස්ථාවල දත් බුරුසු පාවිච්චි කරන බවත්, සෑම වේලාවේම තමා ළඟ දත් බුරුසුවක් තිබෙන බවත් තමා වරෙක වැල්ලවත්තේ මයුරා පෙදෙසේ තිබුණු තට්ටු නිවසකට රිල්වාන්ව බැලීම සඳහා ගිය බවත්, එම රිල්වාන් තමා කුඩා කල සිටම දන්නා කෙනෙක් බවත් ඔහු ෂෙයිනි මව්ලවිගේ මල්ලී බවත් රිල්වාන් රත්තරන් නිෂ්පාදනාගාරයේ වැඩ කරමින් සිටින විට ගෑස් සිලින්ඩරයක් පිපිරීම නිසා කොළඹ ප්‍රදේශයේ ප්‍රතිකාර ලබන බවට තමා ෂෙයිනි මව්ලවිගෙන්

දැනගත් පසු තමා ඔහුව බැලීමට ගිය බවත් මෙම චූදිත පවසා ඇති අතර 2019 වසරේ තමාට ෂෙයිනි මච්ලවිව හමුවීමට අවශ්‍යතාවයක් ඇති වී ඔහුව හමුවී කතා කළ අවස්ථාවේ රිල්වාන් කොළඹ ප්‍රදේශයේ ඔහුගේ පවුලේ අය සමඟ සිටීමින් ප්‍රතිකාර ගන්නා බවට පැවසූ බවත් පවසා තමාට වැල්ලවත්තේ මයුරා පෙදෙසේ තට්ටු නිවාසයක ලිපිනයක් ලබා දුන් බව සහ එම ස්ථානයේ රිල්වාන් සහ පවුලේ කට්ටිය සිටි බවද එදින රාත්‍රියේ තමා එම නිවසේ නතර වී සිට පහුවදා ගමට ඒමට පිටත් වූ බවත් තමා අත්වැරදීමකින් තමා පාවිච්චි කරපු දත්බුරුසුව එහි දමා යන්නට ඇති බවත් එය රිල්වාන් ඇතුළු පිරිස එම ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට මාරු වෙන විට තමාගේ දත්බුරුසුව ඔවුන්ගේ යැයි වැරදියට සිතා රැගෙන යන්නට ඇති බවත් මෙම චූදිත පවසා ඇති අතර තමාගේ දත්බුරුසුව කටුවාපිටිය ප්‍රදේශයේදී DNA සාම්පල සොයාගත්තා යැයි කියන ස්ථානය ගියේ කෙලෙසද යන්න තමා කිසිවක් දන්නේ නැති බවත් පවසා ඇත. එසේම තමාට හස්තූන් නැමැත් පුද්ගලයා ගැනද කිසිදු දැනීමක් නැති බව මෙම චූදිත පවසා ඇති අතර සමස්තයක් ලෙස මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද දීර්ඝ ප්‍රකාශයෙහි සඳහන් කර ඇති කරුණු විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් ඔහු උත්සාහ කර ඇත්තේ ඔහුගේ DNA අඩංගු දත්බුරුසුව කටුවාපිටිය ප්‍රදේශයේ තිබී සොයාගෙන තිබීම සම්බන්ධයෙන් ඔහුට කිසිදු දැනුමක් නැති බවත් පෙන්වා දීමට උත්සාහ කිරීමකි.

මෙම අධිකරණය ඉදිරියේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති ප්‍රබල පරිවේශනීය සාක්ෂි මඟින් පැහැදිලිව පෙනී යන්නේ මෙම 03 වන චූදිත මිල්හාන් යන අයගේ DNA අඩංගු දත්බුරුසුව සොයාගෙන ඇත්තේ කටුවාපිටියේ පිහිටි නිවසක් තුළින්වීම වන බවත් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ ස්වයංඝාතක බෝම්බ පිපිරීමක් සිදු කරන ලද හස්තූන් නැමැත්තාගේ DNA එම නිවස තුළ තිබූ දිග කලිසකමක් සහ සරමක තිබී සොයාගෙන තිබීම තුළින්ද එසේම කටුවාපිටිය දොන් ඩේවිඩ් මාවතේ එලෙස පවත්වාගෙන ගොස් තිබූ ආරක්ෂිත නිවස සම්බන්ධයෙන් මෙහෙයවන ලද සාක්ෂිවලදී එම නිවස බදු ගෙන ඇත්තේ කොළඹ කිංග්ස්බරි හෝටලයෙහි ස්වයංඝාතක බෝම්බ පිපිරීම සිදු කරන ලද මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා බවට හෙලිවීම තුළින්ද එසේම එම නිවස තුළ තිබී පිපිරුම් උපකරණ සෑදීමට උපයෝගී කරගන්නා ලද ලෝහ බෝල සොයාගෙන ඇති පසුබිම තුළ එම නිවසේ මෙම 03 වන චූදිත එම පරිශ්‍රයේ තිබූ දත්බුරුසුවක 03 වන චූදිතගේ DNA තිබීම තුළින් ඔහුද ඉහත කී මරාගෙන මැරෙන බෝම්බකරුවන් වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් සහ අච්චි මොහොමදු මොහොමදු හස්තූන් යන අයද සිට ඇති බවට මනාව පෙනී යන අතර ඒ අනුව මෙම 03 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇති පරිදි ඔහුගේ දත්බුරුසුව එම නිවසට කෙලෙස රැගෙන ගොස් තිබේද යන්න සම්බන්ධයෙන් පවසා සිටි කරුණු අතිශයින් විශ්වාසනීයත්වයෙන් තොර

බවට අපහට පෙනී යයි. සමස්තයක් ලෙස ගෙන මෙම 03 වන චූදිතගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී ඔහු විසින් ඉහත පරිදි පවසා ඇති කරුණු මඟින් මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රබල පරිවේශනීය සාක්ෂි සම්බන්ධයෙන් කිසිදු සැකයක් අපහට පෙනී නොයන අතර එකී පසුබිම තුළ මෙම 03 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය විශ්වාසනීයත්වයෙන් තොර, එමෙන්ම ඔහුට එරෙහිව ඉදිරිපත් වී ඇති බරපතළ චෝදනාවන්ගෙන් ගැලවී යාම සඳහාම පසුව සූදානම් වී සිදු කර ඇති ප්‍රකාශයක් බවට අප තීරණය කරමු. ඒ අනුව එය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

4 චූදිත මොහොමඩ් ඉබ්‍රාහීම් සාදික් අබ්දුල්ලා විසින්

විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

මෙම නඩුවේ 4 වන චූදිත වන මොහොමදු ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා විසින් සඳහන් කර ඇත්තේ, තමා මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි බවත්, තමාව 2019 අප්‍රේල් 27 වැනි දින අත්අඩංගුවට ගත් දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාසය සහ බන්ධනාගාර බාරයේ රිමාන්ඩ් කර සිටින බවත් තමාට එරෙහිව අධි චෝදනා පත්‍රයේ චෝදනා අංක 4 සහ 11 මෙන්ම 1 වන පොදු චෝදනාව ද තවත් අනුබල දීමේ චෝදනා ද එල්ල වී ඇති බවත් පවසා ඇත. නඩුව ආරම්භ වූ දින සිටම

තමන් එකී චෝදනාවලට නිවැරදිකරු බව ප්‍රකාශ කළ බවට ඔහු පවසා ඇත.

තමන්ට එරෙහිව පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ලෙස (සාක්ෂි අංක 1400 අනස්, සාක්ෂි අංක 1401 ජවුෆර් සාදික්, සහ සාක්ෂි අංක 1402 මුන්ෂිෆ් යන සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂිද එමෙන් ම තමන් ලබා දුන් බව කියන ත්‍රස්තවාදය වැලැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ වූ ප්‍රකාශය, එනම් පැ. 183 ද සහ රෝහල් ඇතුළත් කිරීමේ ලේඛනයක් වන පැ. 876 ද සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති බවත් ඔහු පවසා සිටින අතර, මෙම නඩුවේ අධිචෝදනා පත්‍රයේ සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) ප්‍රකාශයේ තමන්ගේ නමට අමතරව **"අබු උමර්"** යන නමද සඳහන් කර ඇතත් තමන්ට එවැනි නමක් නොමැති බව ඔහු පවසා සිටින ලදී. ඔහු තවදුරටත් පවසා ඇත්තේ පැමිණිල්ල විසින් පැ. 2057 ලෙස ලකුණු කරන ලද "සූරා සභාව" නම් ලේඛනයේ අබු උමර් යන නම වරහන් තුළ වෙනත් නමක් සමඟ සඳහන් වුවද, එහි මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා යන නම හෝ සාදික් යන නමවත් නොමැති බැවින් පැ. 183 සහ පැ. 2057 ලේඛන එකිනෙකට පරස්පර වන බවත් එම නමට අදාළ පුද්ගලයා තමන් නොවන බව ඔහු පවසා සිටින ලදී. එසේම තමන්ට එරෙහිව සාක්ෂි ලබා දුන් ප්‍රධාන සාක්ෂිකරු වූ අනස් කිසිදු දිනක අත්අඩංගුවට පත් නොවී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රැඳී සිටිමින් ආරක්ෂක අමාත්‍යාංශයට

ලේඛන යැවීමට, හඬපට සහ වීඩියෝ දර්ශන පරිවර්තනය කිරීමට මෙන්ම විමර්ශන කටයුතුවලට උදව් කල අයෙක් බවත් අනස් මහේස්ත්‍රාත් අධිකරණයේ ලබාදුන් 127 වගන්තියේ ප්‍රකාශයේ සඳහන් කර ඇති නඩු අංක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ඒවා බවත්, චූදිතයන්ගේ සැබෑ නම් සහ "අබු" නම් ඔහු දැනගත්තේ විමර්ශනයෙන් පසුව බවත් හරස් ප්‍රශ්නවලදී පිළිගෙන ඇති බවට මෙම චූදිත පවසා සිටී. උප පොලිස් පරීක්ෂක ඩයස්ගේ සාක්ෂියට අනුවද අනස් කෑගල්ල පොලිසිය කෙරෙහි විශ්වාසය නොතබා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැමැත්තෙන්ම ප්‍රකාශයක් ලබා දී ඇති අතර ඔහු එම දෙපාර්තමේන්තුව සමඟ ඉතා ළඟින් වැඩ කළ අයෙකු බව පැහැදිලි වේ. අනස් තම සාක්ෂියේදී අවි පුහුණුව ලැබූ බව, ස්වයං ඝාතකයෙකු ලෙස නම දුන් බව, අවි ආයුධ රැගෙන ගිය බව, තම නිවසේ සල්ෆර් සහ කාබන් වැනි රසායනික ද්‍රව්‍ය සඟවා තිබූ බව සහ ISIS සංවිධානයේ ලේඛන විනාශ කල බව පිළිගෙන තිබේ. සාදික් ප්‍රශ්න කරන්නේ අනස් එවැනි බරපතල වැරදි සිදු කර, සාක්ෂි විනාශ කර තිබියදීත් ඔහුව අත්අඩංගුවට නොගෙන රජයේ සාක්ෂිකරුවෙකුද නොකර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඉඩදී පසුව සාක්ෂි දීමට අධිකරණයට ඉදිරිපත් කළේ කෙසේද යන්නයි. තවද, අනස් යන සාක්ෂිකරු අධිකරණයේදී මූලධර්මවාදය සහ අන්තවාදය ගැන ආගමික කරුණු පැහැදිලි කිරීමට උත්සාහ කලද, ඔහු මවුලවි කෙනෙකු හෝ අල්-හාලිම් විභාගය සමත් වූ, ආගමික තීරණ දීමට

සුදුසුකම්ලත් අයෙකු නොවන බව හරස් ප්‍රශ්නවලදී පිළිගෙන ඇති බවට මෙම චූදිත පවසා ඇත. එසේම ඔහුට එරෙහිව සාක්ෂි ලබා දුන් අනෙක් සාක්ෂිකරු වන ජවුෆර් සාදික් මාවනැල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ පැවති වැඩසටහනක් ගැන සාක්ෂි දුන් අතර, ඔහු දහවල් කාලයේ උසස් පෙළ පන්ති ගොස් රාත්‍රියේ එම ස්ථානයට තේ සෑදීමට පැමිණි නිසා එහි සිදු වූ දේ නිසි ලෙස නොදන්නා බවත්, එම වැඩ සටහන සම්බන්ධයෙන් කෑගල්ල මහාධිකරණයේ පැවති නඩුවේදී (HC/TAB/4485) තමන් වරද පිළිගෙන දැනටමත් දඬුවම් විඳ අවසන් කර ඇති බවත් සාදික් පවසයි. මාවනැල්ල ප්‍රදේශය මෙම අධිචෝදනා පත්‍රයේ කිසිදු තැනක සඳහන් නොවන බැවින් ජවුෆර් සාදික්ගේ සාක්ෂිය මෙම චෝදනා පත්‍රයට පරිබාහිර බවත් මෙම චූදිත පවසා ඇත. සාක්ෂි අංක 1402 අහමඩ් මුන්ෂිෆ් ද සාක්ෂි දී ඇත්තේ අධි චෝදනා පත්‍රයේ කාල සීමාවට පෙර 2011-2014 කාලයේ සිදු වූ සිද්ධීන්, විදේශ ගමන් යාම සහ 2018 වසරේ සාදික්ගේ නිවසට ඉෆ්තාර් (නෝම්බි හරින) වේලාවේ පැමිණ ආහාර ගැනීම ගැන වන බවත් එහි කිසිදු නීතිවිරෝධී ක්‍රියාවක් නැති බවත් පවසා ඇත. එසේම වරදක් කළ බව පිළිගත් අනස් අත්අඩංගුවට නොගෙන සිටියදී, කිසිදු වරදක් නොකල ජවුෆර් සාදික්, මුන්ෂිෆ් සහ අස්මියා (සාක්ෂි අංක 2233) යන අය අත්අඩංගුවට ගෙන 127 වගන්තියේ ප්‍රකාශ ලබා ගැනීමෙන් පසු නිදහස් කර තිබීමෙන් පෙනී යන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාක්ෂි නිර්මාණය කර ඇති බවට මෙම චූදිත පවසා ඇත. සාදික් තමන්ගේ

16(1) පාපොච්චාරණ ප්‍රකාශය (පැ. 183) සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් පවසන්නේ 2020 ඔක්තෝබර් 4 වන දින තමන් එවැනි කිසිදු ප්‍රකාශයකට අත්සන් නොකළ බවයි. මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවකදීද අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා ඉදිරියේද තමන් කිසිදු ලේඛනයක අත්සන් නොකල බව ප්‍රකාශ කර තිබූ අතර, අධි චෝදනා පත්‍රයේ තිබූ එම ප්‍රකාශයේ පිටපතෙහි අත්සන වෙනුවට වරහන් තුළ "අත්සන" යනුවෙන් යතුරු ලියනය කර තිබුණේ සැබෑ අත්සනක් නොතිබූ නිසා බව ඔහු පවසයි. පසුව සාක්ෂි විභාගයේදී තාවකාලිකව ලකුණු කරන ලද (E1) ලේඛනය දකින විටම එය තමන්ගේ අත්සන නොවන බව හඳුනා ගෙන, එය රජයේ රස පරීක්ෂක වෙත යොමු කරන ලෙස ඉල්ලූ බවත්, තමන්ට එම ප්‍රකාශය කලින් නොලැබුණු නිසා එම ඉල්ලීම කිරීමට ප්‍රමාද වූ බවත් මෙම චූදිත පවසා සිටී.

තවද, පැ. 183 ලෙස පැමිණිල්ලෙන් ලකුණු කරන ලද ත්‍රස්තවාදය වලැක්වීමේ පනතේ 16(1) ප්‍රකාශයේ අන්තර්ගතය සම්පූර්ණයෙන්ම සාවද්‍ය සහ පරස්පර බවත්, එහි තමාගේ උපන් දිනයට අනුව වයස අවුරුදු 31ක් විය යුතු වුවද වයස අවුරුදු 29ක් ලෙස වැරදියට සඳහන් කර ඇති බවත්, බේරුවල සංචාරය ගැන එහි ඇති දිනයන් අනස්ගේ සාක්ෂිය සමඟ පරස්පර වන බවත් එම ප්‍රකාශයේ තමන් එඬේරමුල්ල නිවසේ සිටි බව සඳහන් වුවද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එඬේරමුල්ල නිවසින් සොයා ගත් ඇඟිලි සලකුණු 40ක් සමඟ තමාගේ ඇඟිලි සලකුණු සැසඳූ විට

කිසිවක් නොගැලපුණු බවට හෙලිවී ඇති බව චූදිත පවසා සිටී. තවද එම ප්‍රකාශයේ සඳහන් පරිදි තුර්කියේ සහ සීමාවෙන් ඔබ්බෙහි රැඳී සිටි දින ගණන මාස තුනකට වඩා අඩු වුවද, පැ.2067 ලෙස ලකුණු කර ඇති තමාගේ ගමන් බලපත්‍ර විස්තරයේ මාස පහක කාලයක්ද, අනස් නැමති සාක්ෂිකරුගේ සාක්ෂියේ වසරක කාලයක්ද ලෙස පරස්පරව සඳහන් වෙන බවත් චූදිත පවසා සිටී. තවද තෝපූර්හිදී T56 අවියක් ලබා ගැනීම, තමන්ගේ ජංගම දුරකථනයේ "ත්‍රීමා" (Threema) මෘදුකාංගය තිබීම සහ මුන්ෂිෆ් විසින් තමන්ව ආත්මාරක්ෂක පාඨමාලාවක් සඳහා යනාදී කරුණුද එකිනෙකට පරස්පර බවත් චූදිත පවසා ඇත. තවද, රිස්වාන් බෝම්බ අත්හදා බැලීමකදී තුවාල ලැබූ බවට 16(1) ප්‍රකාශයේ සඳහන් වුවද ඊට අදාළ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අතර, මෙම ප්‍රකාශය සටහන් කරගත් ස්ථානය, වේලාව, නිලධාරියා හෝ නීතිමය ප්‍රතිපාදන එහි සඳහන් නොවන බව පොලිස් අධිකාරී කාවින්ද පියසේකරද පිළිගෙන ඇත. නුවරඑළිය, හම්බන්තොට සහ නුවර දේශන පැවැත්වූ බවට ප්‍රකාශයේ තිබුණද නුවර ගිය බවට කිසිදු සාක්ෂියක් නැති අතර, අනස්ද සාදික් දේශන පැවැත්වූ බව පවසා නැත. ප්‍රකාශයේ මේවා "දින 2ක වැඩසටහන්" ලෙස සඳහන් වුවද පැමිණිල්ලේ අනෙක් අය පවසන්නේ "පුහුණු කඳවුරු" පැවැත්වූ බවයි. නවුෆර්ගේ අබූ නම ද ප්‍රකාශයේ "අබූ සරීම්" ලෙසත් අනස්ගේ සාක්ෂියේ "අබූ සෙයිදී" ලෙසත් පරස්පරව ඇත. සාදික් තමන් සාමාන්‍ය සමාජශීලී පුද්ගලයෙකු බව පෙන්වීමට තම පෞද්ගලික පසුබිම

ඉදිරිපත් කරයි. මව, පියා, මල්ලිලා තිදෙනෙකු සහ නංගිලා තිදෙනෙකු සිටින පවුලක ඔහු 2016 දී විවාහ වී එක් දරුවෙකු ලැබ සිටී. 2007 දී සංයුක්ත ගණිතය සහ කලා අංශයෙන් උසස් පෙළ හදාරා, NIBM ආයතනයෙන් ව්‍යාපාර පරිපාලන උසස් ඩිප්ලෝමාවක් ද, ICBT ආයතනයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධියක්ද ලබා ඇත. සාමාන්‍ය පෙළින් පහළ සිසුන්ට විද්‍යාව සහ ගණිතය ඉගැන්වූ ඔහු, පාසල් සහ විශ්ව විද්‍යාල සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශන දේශන පවත්වා ඇති අතර ජාතික පාසලක විනයහාර ස්වේච්ඡා ගුරුවරයෙකු ලෙසද සේවය කර තිබේ. ව්‍යාපාර පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා ගැනීම සඳහා ඔහු පොළේ පොල් විකිණීම, වැලි ගොඩ දැමීම, තේ කොළ පැකට් කර විකිණීම, ඇඟලුම් ව්‍යාපාර, ගොවිපළක් පවත්වා ගෙන යාම, රේන්කෝ කුඩ සමාගමට ISO සහතිකය ලබා ගැනීමට සහභාගී වීම, ත්‍රීරෝද රථ සහ වෑන් රථ පැදවීම මෙන්ම ත්‍රාසජනක ක්‍රියාකාරකම් සහ කඳු නැගීමේ උපදේශකයෙකු ලෙස ද විවිධ රැකියා කර ඇත. පාසල් කාලයේ වසර 6ක් රග්බි ක්‍රීඩා කර ජාතික මට්ටමට පැමිණි ඔහු ආත්මාරක්ෂක සටන් කලාවන් ද ප්‍රගුණ කර ඇති අතර, පාසල් සංවර්ධන සමිති වැනි පොදු මහජන සංගම්වල ක්‍රියාකාරීව කටයුතු කර තිබේ. තමන්ට එල්ල කර ඇති පළමු පොදු චෝදනාව වන ස්ථාන 8කට ප්‍රහාර එල්ල කිරීමට කුමන්ත්‍රණය කිරීම, සැලසුම් කිරීම හෝ අනුබලදීම සම්බන්ධයෙන් තමන්ට කිසිදු සම්බන්ධයක් නැති බවත්, ඊට අදාළව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවත් ඔහු

පවසයි. සිව්වන චෝදනාව වන දේශන පැවැත්වීම සම්බන්ධයෙන්ද, තමන් දේශනා පැවැත්වූ බවට කිසිදු සාක්ෂිකරුවෙකු පවසා නැත. මෙම චූදිත පවිසා සිටින්නේ දෙල්ගහගොඩ පල්ලියේදී තමන් එක් දේශනයක් කල බවත්, එය ආත්මාරක්ෂාව සඳහා පල්ලි ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ දේශනයක් පමණක් වූ බවත්ය. මෙම නඩුවේ සාක්ෂි දුන් අනස් පවසන අවි පුහුණුව, බයියත් දිවුරුම් දීම හෝ ISIS ලේඛන අඩංගු පෙන් ඩ්‍රයිව් බෙදා හැරීම වැනිදේ සමඟ තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැත. සාදික් පවසන්නේ පල්ලි ආරක්ෂා කිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සම්බන්ධවීම නිසා කෑගල්ල මහාධිකරණයේ පැවති නඩුවේදී තමන් වරද පිළිගෙන දැනටමත් දඬුවම් ලබා අවසන් කර ඇති බැවින්, එම සිද්ධීන්ම නැවත මෙම චෝදනා පත්‍රයට යොදා ගැනීම අසාධාරණ බවයි. තමන් මෙම නඩුවේ වැරදිකරුවෙකු නොවන බවත්, වැරදි කළහොත් දෙවියන්ගෙන් බේරීමට නොහැකි නිසා තමන් කිසිවක් සඟවන්නේ නැති බවත් ඔහු පවසයි. එකොළොස් වන චෝදනාව වන රිස්වාන් සහ 8 වන චූදිත බෝම්බ අත්හදා බලද්දී තුවාල ලැබීම සම්බන්ධයෙන්ද සාදික් පවසන්නේ තමන්ට ඊට කිසිදු සම්බන්ධයක් නැති බවයි. හම්බන්තොට පල්ලි ආරක්ෂා කිරීමේ වැඩමුළුව අතරතුර, සංවිධායකවරයාගේ ඉල්ලීම මත, වැඩ කරන ස්ථානයක සිලින්ඩරයක් පිපිරීමෙන් බරපතල තුවාල ලැබූ, සිංහල කතා කිරීමට නොහැකි රෝගියෙකු රෝහල් ගත කිරීමට තමන් මානුෂික පදනමින් උදව් කල බව

ඔහු විස්තර කරයි. රෝහලට ඇතුළත් කිරීමේදී රෝගියාට හැඳුනුම්පතක් නොතිබූ නිසා සාදික් තම සැබෑ හැඳුනුම්පත සහ පැරණි ලිපිනය (නො. 14, දෙල්ගහගොඩ, හිඟුල) ඉදිරිපත් කල අතර, තමන් වරදක් වසන් කිරීමට උත්සාහ කළේ නම් තම සැබෑ හැඳුනුම්පත ලබා නොදෙන බව පවසයි. රෝගියාගේ නම "එම්.එස්. ශාහිද්" ලෙස තමන් පැවසුවද, පසුව ත්‍රස්ත මර්දන ඒකකය පෙන්වූ පැ. 876 ඇඳ ඉහපත් පතෙහි 'එස්' අකුර කපා 'අයි' ලියා "එම්.අයි. ශාහිද්" ලෙස සකස් කර තිබූ බව ඔහු පවසයි. එම තුවාලය ගෑස් සිලින්ඩරයක් පිපිරීමෙන් සිදු වූවක් බව වෛද්‍යවරයාට පැවසූ විට, ඔහු ප්‍රශ්නාර්ථ ලකුණක් යොදා එය ඔක්සිජන් සිලින්ඩරයක් විය හැකි බව පැවසූ බවත් රෝගියාගේ ඇඟිලි කැපීමේ සැත්කම සඳහා තමා අත්සන් තබා ඇති බවත් වාට්ටු භාර හෙදිය හෝ වෛද්‍යවරයා එදින කිසිදු සැකයක් මතු නොකල බවත්, පසුව විශේෂඥ වෛද්‍ය බන්දුතිලක මහතා තුවාලකරුගේ ඇසේ තිබූ ඊයම් කැබලි නිසා සැකයක් මතු කළද, සාමාන්‍ය පුද්ගලයෙකු වූ තමන්ට එය බෝම්බ පිපිරීමක් බව දැන ගැනීමට හැකියාවක් නොතිබූ බවත් වූදිත පවසා සිටී. තවද, මෙම පිපිරීම ඔල්ලිකුලම් ප්‍රදේශයේ සිදු වූ බවට චෝදනාවේ තිබුණ ද, සාක්ෂිකරුවන් පවසන්නේ එය පාලමුණේ කරබලා ප්‍රදේශයේ සිදු වූ බව වන බවත් ඊට අදාළව කිසිදු සොකෝ වාර්තාවක්, වෛද්‍ය වාර්තාවක් හෝ පොලිස් වාර්තාවක් ඉදිරිපත් කර නැති බවත් පවසන වූදිත පවසන්නේ තමන් මීට පෙරද අනාථ නිවාසවල ළමුන් සහ තම ඥාතීන් රෝහල් ගත කර උදව් කල අයෙකු වන බවත් මෙහිදීද සිදු

කළේ ජීවිතයක් බේරා ගැනීම සඳහා කල මානුෂික උදව්වක් පමණක් බවයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී තමන්ට පහර නොදුන්නද, තම ප්‍රකාශවලට අත්සන් ලබා ගැනීම සඳහා තමන්ගේ පියා, මව, බිරිඳ, මල්ලිලා දෙදෙනා සහ නංගිලා (10 සහ 8 වසරවල ඉගෙනුම ලැබූ බාලම සහෝදරයන් ඇතුළුව) අත්අඩංගුවට ගෙන පීඩනයට පත් කල බවත්, එම පවුලේ අය රඳවා තබා ගෙන තම අත්සන් ලබා ගත් බවත් ඔහු හෙළි කරයි. ත්‍රස්ත මර්දන ඒකකයේ ස්ථානාධිපති පතිරණ තමන්ට පාස්කු ප්‍රහාරයට සම්බන්ධයක් නැති බව පැවසුවද කෑගල්ල නඩුවට පටලවා වසර 5-6ක් සිරගත වීමට සූදානම් වන ලෙස පැවසූ බව ඔහු පවසයි. තමන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පොලිසිය ඉතා අශෝභන ලෙස කටයුතු කල බවත්, තමන් යට ඇඳුමෙන් පමණක් සිටියදී ඇස් බැඳ, අත් මාංචු නොතිබූ නිසා තමන්ගේම කලිසම ගලවා දෑත් පිටුපසට තබා ගැටගසා, මාධ්‍ය ඉදිරියට රැගෙන ගොස් අවමානයට පත් කල බවත් ඔහු පවසයි. තමන් මීට පෙර කිසිදු අධිකරණ නඩුවකට මුහුණදී නැති අතර, සාක්ෂි කූඩුවට නැග සාක්ෂි නොදීමට තීරණය කළේ 2023 දී ගම්පොල අධිකරණයේදී දුන් ප්‍රකාශයේදී තමන්ගේ සිංහල භාෂා දැනුමේ අඩුපාඩු මත පරස්පරතා පෙන්වා එය බොරු සාක්ෂියක් කිරීමට පැමිණිල්ල උත්සාහ කල නිසා බව පවසයි. ඇතැම් වින්දිතයන්ගේ සහ ස්වයං සාතකයන්ගේ පවුල්වල සාක්ෂි හරස් ප්‍රශ්න ඇසීමෙන් තොරව පිළිගත්තේ ඔවුන් නැවත පීඩාවට පත් කිරීම වැළැක්වීමට සහ කාලය ඉතිරි කිරීමට වුවද, පසුව එය

නැවැත්වූයේ CID කාමරයේ සිටි නිලධාරීන් "අවසාන කිහිප දෙනාට සාක්ෂි මදි නිසා සාක්ෂි හදාගත යුතු බවත්, සාදික්ලා සාක්ෂි පිළිගත්තොත් සාක්ෂි සෙවීමට කාලය මදි වන බවත්" කතා වනවා ඇසුණු නිසා ඔවුන්ට සාක්ෂි ගොතන්නට කාලය නොදීමට බව ඔහු පවසයි. අවසාන වශයෙන් තමන් මෙම නඩුවේ කිසිදු වැරැද්දකට සම්බන්ධ නැති බවත්, කෑගල්ල නඩුවේ වරද පිළිගත්තේ බොරුවට වාද කිරීමට අවශ්‍ය නොවූ නිසා මිස මෙම නඩුවේ වැරදිකරුවෙකු නොවන බවත් මෙම චූදිත පවසා ඇත.

<u>විශ්ලේශණය</u>

මෙම චූදිතගේ චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය විශ්ලේශණය කර බැලීමේ දී පෙනී යන්නේ ඔහුව අත්අඩංගුවට ගැනීම සහ අත්අඩංගුවට ගත් දිනය සම්බන්ධයෙන් ඔහුගේ හඬයක් නොමැති බවය. නමුත් ඔහු ප්‍රධාන වශයෙන් හඬ කර සිටින්නේ ඔහු එම අවස්ථාවේදි යට ඇඳුමෙන් සැරසී සිටියේය යන කාරණය අසත්‍යයක් බවත්, ඉස්ලාම් භක්තිකයන් වශයෙන් ඔහු කිසිම විටෙක එසේ නොසිටින බවත්ය. නමුත් පැමිණිල්ලෙන් සාක්ෂි ලබාදුන් එවකට ප්‍රධාන පොලිස් පරීක්ෂක සුජීව සොයිසා මහතාගේ සාක්ෂිය ඉහතින් අප විසින් විශ්ලේෂණය කර ඇති අතර එම විශ්ලේෂණය නැවත ඉතා සුපරීක්ෂාකාරීව බැලූ විට පෙනී යන්නේ එම දිනය වන විට ශ්‍රී ලංකාව පුරාම භීතියට පත්ව බෝම්බ පිපිරීම් මාලාවක් සිදුවී ඇති බවත්,

එයට අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සහ එම අත්අඩංගුවට ගැනීමට යාමේදී ද බෝම්බ පිපිරීම් සිදු වී ජීවිත හානි සහ පොලිස් නිලධාරීන්ගේ හානි, ජීවිත හානි ද සිදු වී තිබීමත් ය. ඒ අනුව ඔහු විසින් මෙම ඉහතින් විග්‍රහ කරන ලද සාක්ෂි සැලකිල්ලට ගැනීමේදි සැකකරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි යට ඇඳුම් පිටින් සිටියේය යන්න සහ ඔවුන් ඒ සම්බන්ධයෙන් චිත්තිකරුවන්ගේ ආගමික පරිසරය තුළ ඔහු ඒ ආකාරයෙන් සිටින්නේ ද, නැද්ද යන්න තුලනාත්මකව සලකා බැලීමේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක සුජීව සොයිසා මහතාගේ සාක්ෂිය බැහැර කිරීමට තරම් එම ආගමික සම්ප්‍රදායන් පිළිපැද්දේය යන කාරණය පිළිගත නොහැක.

ඉන් අනතුරුව චිත්තිකරු විසින් පැ.876 නැමැති ලේඛනය සම්බන්ධයෙන් ද , රිල්වාන් නැමති අයට ප්‍රතිකාර ලැබීම සම්බන්ධයෙන් ද ඔහුගේ චිත්තිවාචකය පැහැදිලි කරන අතර සාමාන්‍යයෙන් අනතුරකට පත් වූ පුද්ගලයෙකුට මානුෂික වශයෙන් උදව් කිරීම සම්බන්ධයෙන් ඔහු එම කටයුත්ත කළ බවත් කියා සිටින ලදි. ඒ අනුව පැ. 876 ඇති ඔහුගේ අත්අකුරු, නම්, ඔහුගේ විස්තර සියල්ල හඹයක් නැතුව ඔහුම පිළිගනියි. නමුත් මෙහිදී වඩාත් වැදගත් කාරණය වන්නේ පැ. 876 සහ රිල්වාන් යන අය රෝහලට ඇතුළත් කිරීමේ සිට ඔහු රෝහලෙන් පිටවීම දක්වා රෝහල් කාර්ය මණ්ඩලය විසින් දෙන ලද සාක්ෂි ද ඔහු තුවාල ලැබීමෙන් අනතුරුව ඔහුගේ නිවස වූ කාත්තණ්කුඩි ප්‍රදේශයට රැගෙන ගොස් එහි සිට අසළ

පිහිටි මඩකලපුව ශික්ෂණ රෝහල වෙත රැගෙන නොගොස් පැ. 5 කටත් වඩා වැඩි කාලයක් කිලෝමීටර් 300කට ආසන්න දුරක් කොළඹ ප්‍රදේශයට ගමන් කර තිබීමත් අතර ඇති පරස්පරතාවය පැහැදිලි වී නොමැති වීමයි. එසේම අනෙකුත් සාක්ෂි මඟින් හම්බන්තොට සිප්පිකුලම ප්‍රදේශයේ තිබූ වැඩමුළුවක් අතහැර දමා එම කාරණයට සහභාගි වූ බව කියා සිටින අතර විශේෂයෙන්ම අක්ෂි වෛද්‍යවරයා අනෙකුත් වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සාක්ෂිවලින් එය බෝම්බ පිපිරීමකින් සිදු වූ තුවාල බවට දෙන ලද සාක්ෂියත් අනුව 4 වන චූදිත ඔහු නොදන්නා කාරණයකින් තුවාල වූ නොදන්නා පුද්ගලයෙකුට මානුෂික උපකාරයක් කිරීමට කටයුතු කළේ යැයි යන කරුණ පිළිගත නොහැක. තවද එසේ ඔහු නොදන්නා පුද්ගලයෙකුට උපකාරයක් කළේ නම් තමාගේ නම සහ සිය සහෝදරයාගෙ නම හෝ නැත්නම් අන්‍ය කෙනෙකුගේ නමක් ලබා දී එසේ රෝහලට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගෙන අතර සත්‍යවාදී පුද්ගලයෙකු වශයෙන් ඔහු නොදන්නා කරුණු නොදන්නා බවට රෝහල් කාර්ය මණ්ඩලයට කියා සිටීමට ඔහුට කිසිදු බාධාවක් තිබූ බව පෙන්වා නැත.

ඒ අනුව පෙනී යන්නේ එම කාරණය සම්බන්ධයෙන් ද 4 වන විත්තිකරු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සත්‍ය කරුණු හෙළි කරන පිළිගත හැකි ප්‍රකාශයක් නොවන බවයි. ඔහුගේ ප්‍රධානතම තර්කයක් වන්නේ පැමිණිල්ලේ සාක්ෂිකරුවන් තිදෙනෙකු වූ පැමිණිල්ලේ සාක්ෂි

අංක 1400, 1401 සහ 1402 වශයෙන් ඉහතින් නම් සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලින් වන විශ්වාසනීයත්වය බිඳ වැටී ඇති බවයි. එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙම අධිකරණය ඉදිරිපිට දී දිවුරුම් පිට ලබා දෙන අතර ඔවුන්ව ඉතා දීර්ඝ ලෙස හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලද අතර ඔහුගේ මූලික සාක්ෂියත්, හරස් ප්‍රශ්නත් අධිකණය විසින් ඉතා සාවදානව අසා සිටින ලද අතර එම සාක්ෂි සාරාංශය සහ විශ්ලේෂණය අප විසින් ඉහතින් දක්වා ඇත. ඒ අනුව එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂියේ ඇති විශ්වාසනීයත්වය හෝ බිඳු වැටී නොමැති අතර සාක්ෂියේ පිළිගතහැකිභාවය ද බිඳු වැටී නොමැති බව අප හට පැහැදිලිව පෙනී ගිය බැවින් විත්තිකරු විසින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් එකී සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පිළිනොගන්නා ලෙසට කරනු ලබන ඉල්ලීම පිළිගත නොහැක. ඔහු විසින් දක්වන ලද අනෙකුත් සාමාජීය පරිසරය, ඔහුගේ රැකියාව, විවාහකභාවය, ඔහුගේ පවුලේ සාමාජිකයන් අත්අඩංගුවට ගැනීම වැනි දේවල් සිද්ධිමය කරුණු වශයෙන් ඉදිරිපත් වී ඇති අතර ඒවා හේතුවෙන් ඔහුට එරෙහිව ඇති චෝදනාවන් සනාථ කිරීම සඳහා පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂිවලට එමඟින් සැකයක් මතු කිරීමට හැකියාවක් ඇති වී නොමැත. ඒ අනුව ඉහත දැක්වූ සියලුකරුණු සැලකිල්ලට ගැනීමේදී 4 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය භාර ගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

5 චූදිත මොහොමඩ් ඉබ්‍රාහීම් සාහීඩ් අබ්දුල් හක් විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

5 චූදිතයා වන මොහොමඩ් ඉබ්‍රාහීම් සාහීඩ් අබ්දුල් හක් සිය විත්ති වාචකය ආරම්භ කරමින් තමන් පිළිබඳව කෙටි හැඳින්වීමක් සිදු කරන ලද අතර, ඔහු උසස් පෙළ කලා අංශයෙන් හදාරා B, C, සහ S සාමාර්ථ ලබාගෙන ඇති බවත්, NIBM ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබා ඇති බවත් පවසා ඇත. පාසල් කාලයේදී සමස්ත ලංකාව නියෝජනය කරමින් රග්බි සහ පාපන්දු ක්‍රීඩා කර ඇති බවත්, බාල දක්ෂ පුහුණුකරුවෙකු ලෙස කඳු නැඟීම සහ කැලෑ සංචාර සඳහා සහභාගී වූ බවත් පවසා ඇත. තමාට භාෂා හයක් (දෙමළ, ඉංග්‍රීසි, සිංහල, අරාබි, හින්දි, මලයාලම්) කතා කිරීමේ හැකියාව තිබූ නමුත්, වසර 07 ක බන්ධනාගාර කාලය තුළ භාවිතයක් නොවීම නිසා ඉන් භාෂා 04 ක්ම අමතක වී ඇති බව ඔහු පවසා ඇත. ඉන් හින්දි සහ මලයාලම් භාෂා ඔහු ඉගෙන ගෙන ඇත්තේ කටාර් රටේ රැකියාව කරන කාලයේදී ඉන්දියානුවන් බහුලව ඇසුරු කිරීමෙන් බවත්, ඔහු පවසා ඇත. ඔහු තමන්ට එල්ල වී ඇති පස්වන චෝදනාව වන දේශනා පැවැත්වීම සහ අවි පුහුණුව ලබා දීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ, මෙම නඩුවේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන් 540 කට අධික පිරිස අතරින් කිසිදු සාක්ෂිකරුවෙකු හෝ පොලිස් නිලධාරියෙකු ඔහු දේශනා

කල බවක් හෝ අවි පුහුණුව දුන් බවක් හෝ සෘජුව හෝ වක්‍රව පවසා නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු නඩු භාණ්ඩයක්ද ලකුණු කර නොමැති බවයි. තමාට එරෙහිව ඉදිරිපත් කර ඇති පහලොස්වන චෝදනාව වන පාලමුණේ ප්‍රදේශයේ යතුරු පැදියක් පිපිරීමට ලක් කිරීමේ සිද්ධියට තමන් කිසිදු සම්බන්ධයක් නොමැති බවට ඔහු පවසා ඇත. ඔහු පවසා සිටින්නේ එම වරද කල පුද්ගලයන් කවුදැයි පැමිණිල්ල හෝ නොදන්නා පසුබිමක, තමන් ඔවුන්ට උදව් කළේ කෙසේද යන්න ඔප්පු කල නොහැකි බවත්, විමර්ශන නිලධාරීන් පවා තමන් ඊට සම්බන්ධ බව අනාවරණය නොකල බවත්ය.

එසේම එම සිද්ධිය වූ ස්ථානය අසල හමුදා කඳවුරක් තිබූ බවත්, එය හමුදාවේ අත්හදා බැලීමක් බවට ප්‍රචාරය වූ බවත් සාක්ෂිකරුවන් පවසා ඇති බැවින්, මෙම පිපිරීම හමුදාව විසින් සිදු කරන ලද්දක් විය හැකි බවට මෙම චූදිත සැක කරන බවට පවසා ඇත. මෙම අධිකරණයේ සාක්ෂි දුන් යතුරුපැදි වෙළෙන්දෙකු වන සාක්ෂි අංක 1396 අරුණ වික්‍රමසේකර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී සැකකරුවන් සිනාසෙමින් සිටිනු දුටු බව පැවසීම මෙම අධිකරණයට පැවසීම අමූලික බොරුවක් බවට මෙම චූදිත පවසමින් සඳහන් කර ඇත්තේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවන්නේ 6 වන මහලේ ඉතා කුඩා සිරකුටිවල බවත් වේ. තවද එම සාක්ෂිකරු කෝපයෙන් සිටි බවට සඳහන් කර ඇති මෙම චූදිත පවසා ඇත්තේ, යම් සාක්ෂිකරුවෙකු කෝප වී හෝ හැඟුම්බරව

සාක්ෂි දීම නිසා ඔහුගේ සාක්ෂියේ වටිනාකම හීන වන බවයි. එසේම එම සාක්ෂිකරු ඡායාරූප දෙකක් හඳුනාගෙන එම ඡායාරූප වල අත්සන් තැබූ බවට පවසා ඇති බවත්, එම ඡායාරූප දෙකම ඔහු අත්සන් කර තිබෙන්නේ 2020.11.26 දින බවත්, එම ඡායාරූප මෙම අධිකරණයේ ලකුණු කරන ලද අවස්ථාවේ එයට විරුද්ධ වීමට අදාළ නෛතික තත්ත්වය තමාට නීතීඥයෙකු නොසිටි නිසා දැනගෙන සිටියේ නැති බවත්, එලෙස ඡායාරූප ලකුණු කරනවා නම් දින 45 කට පෙර විත්තියට ලබාදිය යුතු බවට වන නෛතික තත්ත්වය තමා දැනගෙන සිටියේ නැති බවත්, මෙම චූදිත පවසා ඇත. එසේම එම ඡායාරූප වල සිටි පුද්ගලයන් දෙදෙනා ඊට මාස කීපයකට පෙරම රක්ෂිත බන්ධනාගාරගත කර තිබූ බවත්, මෙම චූදිත පවසා ඇති අතර, එසේම අදාළ සාක්ෂිකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී එම පුද්ගලයන් දෙදෙනාව පෙන්වා සිටි බවත්, එලෙස දැක්ක පසු ඔවුන්ව රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් පසු එම ඡායාරූපවලට සාක්ෂිකරු අත්සන් කර ඇති බවත්, මෙම චූදිත පවසා සිටී.

තවද පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 යසස්ති සිල්වා ගේ නැතිවූ මුදල් පසුම්බියක්, බැංකු කාඩ්පත් සහ ඇඳිරි නීති බලපත්‍රයක් පැමිණිල්ලෙන් ලකුණු කලද, ඔහුගේ ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රය අධිකරණයට ඉදිරිපත් කර නොමැති බවට මෙම චූදිත පවසා ඇත. තමන් සහ තම සහෝදරයා වන සාදික් අබ්දුල්ලා අත්අඩංගුවට ගත් බව පිළිගන්නා නමුත් තමාලා යට ඇඳුම් පිටින් සිටි බවත් බේරී දිවීමට

උත්සාහ කළ බවත් ප්‍රධාන පොලිස් පරීක්ෂක සොයිසා පැවසූ සාක්ෂි සම්පූර්ණයෙන්ම අසත්‍ය බව මෙම චූදිත පවසා සිටී. තමාලාගේ ආගමානුකූලව පිරිමියෙකු පෙකණියේ සිට දණහිස දක්වා ආවරණය කළයුතු බවත්, තමන් කොට කලිසම් නොඅඳින බවත්, පොලිස් නිලධාරීන් විසින්ම තමන්ලාගේ ටී-ෂර්ට් ගලවා, ඇස් බැඳ, කලිසම් ගලවා දැත් පිටුපසට තබා බැඳ මාධ්‍යයට පෙන්වූ බවත්, එය සාධාරණීකරණය කිරීමට පොලීසිය මෙසේ බොරු සාක්ෂි දෙන බවත් මෙම චූදිත පවසා ඇත. එසේම වැඩිදුරටත් පවසා ඇත්තේ, තමාලාව අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් නාවලපිටිය සහ ගම්පොළ පොලිස් සටහන්වල සොයාගත් භාණ්ඩ (මුදල් පසුම්බිය, කාඩ්පත් ආදිය) සම්බන්ධයෙන් එකිනෙකට පරස්පර තොරතුරු සඳහන් කර ඇති බවත්, එම මුදල් පසුම්බිය අත්අඩංගුවට ගෙන ඇත්තේ හතරවන චූදිතයාගෙන් බව පොලිස් සටහන්වල දැක්වෙන බවත් මෙම චූදිත පවසා සිටින ලදී. එසේම ගම්පොළ පොලිසියේ භාණ්ඩ භාරගත් නිලධාරියා සාක්ෂියට නොපැමිණීම නිසා තමාට ඒ ගැන හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් නොලැබුණු බවට මෙම චූදිත පවසා ඇත. එසේම ඇඳිරි නීති බලපත්‍රය නිකුත් කල බව කියන මහියංගන පොලිසියේ කිසිදු නිලධාරියෙකුද සාක්ෂියට කැඳවා නොමැති බවත්, ඔහු තවදුරටත් පවසා ඇත.

මෙම චූදිත වැඩිදුරටත් පවසා ඇත්තේ 127 වගන්තිය යටතේ ලබා දුන් ප්‍රකාශයේ තමන් යතුරු පැදියක් මිලදී ගෙන විකුණූ බව සඳහන් වුවද,

එය කාට හෝ නිකන් දුන් බවක් හෝ එහි අංකයක් සඳහන් නොවන බැවින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙලෙස පාලමුණ ප්‍රදේශයේ පිපිරුනා යැයි පවසන යතුරුපැදි සිද්ධියට කාව හෝ වැරදිකරු කරන්න ඕන කියන අරමුණින් ඔවුන් විසින් එම පිපිරීම තමන්ගේ පිට පැටවීමට උත්සාහ කර ඇති බව වේ. එම සිද්ධිය සම්බන්ධයෙන් ද මෙම නඩුවේ අධිචෝදනාපත්‍රයේ චෝදනාවක් ඇතුළත් කර තිබුනද තමා එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බව මෙම චූදිත පවසා ඇත.

තවද මෙම නඩුවෙහි අධිචෝදනාපත්‍රයෙහි 01 වන චෝදනාව වන යම් යම් ස්ථානවල යම් යම් පුද්ගලයන් සමඟ එකතු වී යම් යම් ක්‍රියාවන් කිරීම තුළින් බෝම්බ පිපිරවීම සිදු කල බවට වන චෝදනාවක් ඉදිරිපත් කර තිබෙන බවත්, එම මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් 540 කට වැඩි සාක්ෂිකරුවන්ගෙන් කිසිදු සාක්ෂිකරුවෙක් තමා 01 වන චෝදනාවේ සඳහන් පුද්ගලයන් සමඟ එකතු වී ඔවුන් සමඟ සැලසුම් කල බවට හෝ කුමන්ත්‍රණය කල බවට සාක්ෂි ලබා දී නොමැති බවක්, මෙම චූදිත පවසා ඇත.

තවදුරටත් ඔහු පවසා ඇත්තේ බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහමඩ් විසින් ඔහුගේ පවුලේ අයටත්, සේවකයන්ටත් සහ පොදුවේ සඳහන් කර ඇති හඩපට කීපයක් මෙම අධිකරණයේ ලකුණු කර වාදනය කරනු ලැබූ බවත්, එක් හඩපටයක ඔහු සඳහන් කර තිබෙන්නේ එම සිද්ධියට කාගෙන්වත් උදව්වක් නැති බවත්,

ඔවුන්ම ඒ කටයුත්ත සිදු කරන බවත් වෙනත් කිසිවෙකුගේ උදව්වක් ඊට නොතිබූ බවය.

එමෙන්ම මෙම අධිකරණයේ ප්‍රදර්ශනය කරන ලද වීඩියෝ දර්ශනයකින් සහරාන් ඇතුළු 08 දෙනෙකු එකතු වෙලා සිදු කල වීඩියෝවක් පරීක්ෂා කර බැලීමේදී එම දර්ශනය වීඩියෝ කිරීමට පවා කිසිවෙකු සිට නොමැති නිසා එක් ස්ථානයක වීඩියෝ කැමරාව සවි කර ඔහුත් එම වීඩියෝ දර්ශනය තුළට පැමිණ වාඩි වෙන ආකාරයක් පෙන්නුම් කරන බවත්, එම වීඩියෝව තුළින්ම එහි සිටින 08 දෙනා හැර ඔවුන්ට උදව් කිරීමට වෙනත් කිසිවෙකු හෝ නොමැති බව තහවුරු වන බවත්, එම දර්ශනවලින්ද ඔවුන්ට වෙනත් කිසිවෙකුගේ සහයක් නොතිබූ බව තහවුරු වන බවත් චූදිත පවසා ඇත.

එසේම තමා විසින් 127 වගන්තිය යටතේ ලබා දුන් ප්‍රකාශය අධිකරණයේ පැ.170 ලෙස ලකුණු කිරීමක් කලද, එම ප්‍රකාශයේ කොටසක් පමණක් නොව එය සම්පූර්ණයෙන්ම ගෙන සැළකිල්ලට ගන්නා ලෙසට තමා ඉල්ලා සිටින බවත්, විශේෂයෙන් එම ප්‍රකාශය අවසානයේ තමා 2019.04.21 බෝම්බ ප්‍රහාර සිද්ධිය මුලින්ම දැනගත්තේ තමා ජංගම දුරකථනය බලන විට බව එම ප්‍රකාශයේ සඳහන් වන බවත්, ඒ අනුව තමා එයට උදව් කල බවට හෝ තමන්ගේ කිසිදු කුමන්ත්‍රණයක් හෝ සැලසුමක් තිබූ බවට එහි සඳහන් වී නැති බවත්, මෙම චූදිත පවසා ඇත.

මෙම චූදිත වැඩිදුරටත් පවසා ඇත්තේ, නුවරඑළිය ප්‍රදේශයේ පැවැති පන්තියකට තමා සහභාගී වීම සම්බන්ධයෙන් සාක්ෂි දුන් සාක්ෂි අංක 1400 අනස් නමැත්තා, පොලිසිය සමඟ ඇති කරගත් එකඟතාවයක් මත නිදහස් වීමේ පොරොන්දුව පිට බොරු සාක්ෂි දෙන සාක්ෂිකරුවෙකු බවත් එම අනස් නැමැති පුද්ගලයා විසින් සිදුකල වැරදි ඔහුගේ ප්‍රකාශවලින්ම පිළිගෙන තිබියදීත්, ඔහුව අත්අඩංගුවට ගැනීමක් හෝ සිදුවී නොමැති බවත්, කිසිදු වරදක් නොකල සිය ගණනක් පුද්ගලයන් සැකකරුවන් ලෙස පාස්කු ප්‍රහාර සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවත්, එලෙස සැකපිට අත්අඩංගුවට ගත්ත පුද්ගලයන්ට කිසිදු සාක්ෂියක් නොමැතිව බොහෝ අය සිටින බවක්, මෙම චූදිත පවසා ඇති අතර, එසේම එම අනස් නැමැති සාක්ෂිකරු තමාලාට එරෙහිව සාක්ෂි ලබා දුන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔහු අත්අඩංගුවට නොගන්නා බවට ලබා දී ඇති පොරොන්දු නිසා බවත්, එම අනස් නැමැත්තා සුවිශේෂී වෙනස්ම ගණයේ සාක්ෂිකරුවෙකු බවත්, එනම් පුහුණු වැඩසටහන් වලට ගිය අයත් ඒවාට ගොස් ආපසු ආව අයත්, අත්අඩංගුවට ගෙන තිබියදී විවිධ වැරදි වලට සම්බන්ධ මෙම අනස් නැමැත්තාව අත්අඩංගුවට හෝ ගැනීමක් කර නැති බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටියදී ආරක්ෂක අමාත්‍යාංශයට යැවීම සඳහා ලේඛන පවා සකස් කර ඇති අයෙක් බවට ඔහුගේ සාක්ෂිවල සඳහන් වී තිබෙන බවත් පවසා, එසේම එම තැනැත්තාද 127 වගන්තිය යටතේ ප්‍රකාශයක්

ලබා දී තිබෙන බවත්, එසේම එම 127 ප්‍රකාශයෙ "අබූ" නාමයන් පවා පොලිසියෙන් දැනගත් ඒවා බවට පිළිගෙන ඇති බවත්, එසේම මෙම අනස් නැමැත්තා විමර්ශනවලට පවා සහභාගී වී ඇති තැනැත්තෙක් බවත් සඳහන් කරන මෙම චූදිත පවසා ඇත්තේ, අනස් නැමැත්තා ලබා දී ඇති 127 ප්‍රකාශය ඔහුට විරුද්ධව පාවිච්චි කල බවට නීතියේ සඳහන් වන බව තමා මෙම අධිකරණයේදී දැන ගත් බවත්, කෙසේ වෙතත් ඔහුට එරෙහිව 127 වගන්තිය ප්‍රකාරව කිසිදු නඩු පැවරීමක් හෝ කර නැති බවත්, 127 වගන්තිය ප්‍රකාරව අනස් විසින් ලබා දී ඇති ප්‍රකාශය අනික් චූදිතයින්ට විරුද්ධව පාවිච්චි කිරීමක් වෙලා තිබෙන බවත් මෙම චූදිත පවසා ඇත. එසේම අනස්ගෙ සාක්ෂියේදී තෝප්පූර් ප්‍රදේශයට ගිය ගමනක් සම්බන්ධයෙන් සඳහන් කර ඒ සඳහා තමාද (මෙම චූදිතද) සහභාගී වූ බවට සාක්ෂි ලබා දුන්නද, ඒ සම්බන්ධ කිසිදු දින වකවානුවක් සඳහන් කලේ නැති බවත්, එම කාලවකවානුවේ තමා 5D3) ලෙස ලේඛනයක්ද ලකුණු කල බවත් පවසා මෙම චූදිත වැඩිදුරටත් පවසා ඇත්තේ අනස් යන සාක්ෂිකරු සූදානම් කර ඉදිරිපත් කර ඇති සාක්ෂිකරුවෙකු බවත් පවසා ඇත. එසේම තමා නුවරඑළිය වැඩසටහනට සහභාගී වූ බව තමන් පිළිගන්නා බවත්, එය රට තුළ මුස්ලිම්වරුන්ට සහ දේවස්ථානවලට ප්‍රහාර එල්ල වන විට ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පමණක් බවත් මෙම චූදිත පවසා ඇත. එම ක්‍රියාව සම්බන්ධයෙන් කෑගල්ල ත්‍රිපුද්ගල මහාධිකරණයේ පැවති නඩුවකදී (නඩු

අංක එච්.සී. 4485/19) තමන් වරද පිළිගෙන දැනටමත් දඬුවම් ලබා අවසන් කර ඇති බවත්. අනස් නුවරඑළිය වැඩසටහන ගැන පවසන අතිශයෝක්ති තොරතුරු පොලිසියෙන් උගන්වන ලද දේවල් බවත් මෙම චූදිත පවසා ඇත. එසේම පැ. සා. 1402 මුන්ෂිෆ් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දීමේදී තමාට විරුද්ධව කිසිදු සාක්ෂියක් සඳහන් කර නැති බවත්, ඔහු විසින් සඳහන් කරන ලද සියළුම කරුණු චෝදනා පත්‍රයේ සඳහන් කාල සීමාවට පෙර සිදුවූ ඒවා බැවින් ඒවා මෙම චෝදනාවලින් පරිබාහිර බවත් පවසා ඇත. එසේම සාක්ෂි අංක 1401 ජවුෆර් සාදික් ලබා දුන් සාක්ෂියේ සඳහන් මාවනැල්ල දෙල්ගහගොඩ වැඩසටහනද චෝදනා පත්‍රයේ සඳහන් නොවන බැවින් එම සාක්ෂියද පරිබාහිර සාක්ෂියක් බවත්, එසේම මෙම නඩුවේ අනෙකුත් චූදිතයන් ලබාදුන් 16(1) ප්‍රකාශවල "ශාහිඩ්" යන නම සඳහන් වුවද, එහි මුල් අකුරු (එම්.අයි.) ලෙස සඳහන් කර තිබුනද එහි මොහොමඩ් ඊබ්රාහිම් හෝ අබ්දුල් හක් යන සම්පූර්ණ නම, හැඳුනුම්පත් අංකය හෝ ලිපිනය සඳහන් නොවන බැවින් එමඟින් තමන්ව නිරූපණය නොවන බවටත් පවසා ඇති අතර, ඔහු අවසාන වශයෙන් පවසා ඇත්තේ තමන් කළ වරදට දැනටමත් දඬුවම් විඳ ඇති බවත්, මෙම අධිචෝදනා පත්‍රයේ ඇති කිසිදු චෝදනාවකට තමන්ගේ සම්බන්ධයක් නොමැති බැවින් සියලුම චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් තමා නිර්දෝෂී බවත්ය.

විශ්ලේශණය

මෙම නඩුවේ 5 වන චූදිතට එරෙහිව ඇති ප්‍රධානතම සාක්ෂියක් වන්නේ ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි ඔහු සන්තකයේ තිබී පැ.සා. 1397 යසස්ති සිල්වා යන අයට මුදල් පසුම්බිය සොයා ගැනීමයි. මුදල් පසුම්බිය සොය ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක සුජීව සිල්වාගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදි එම සටහනෙහි ඔහු විසින් යොදන ලද සටහන්වල දුර්වලතා සහ වෙනස්කම් තිබෙන්නේ යැයි පැවසුවද එම සටහන් නාවලපිටිය පොලිසියේ පැමිණීමේ සහ පිටවීමේ සටහන් වශයෙන් ද ,ගම්පොළ පොලිසියේ විස්තරාත්මකව සටහන් වශයෙන් ද ඇතුළත් කර ඇති බවත් ඒවායින් මෙම සිද්ධිය සම්පූර්ණයෙන්ම නිවැරදිව සටහන් කර ඇති අතර එම අවස්ථාවේදි අත්අඩංගුවට ගන්නා ලද 4 වන සැකකරුගේ සහ 5 වන සැකකරුගේ නම් සමාන බැවින් එම පැටලීමක් සිදුවී තිබුණද තමාගේ සාක්ෂියත්, සටහනත් නිවැරදි බව සාක්ෂිකරු කියා ඇති බව අපගේ අවධානයට ලක් කර යුතුය. එසේම එම සැකකරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි මුළු ලංකාව පුරාම පැවති භීෂණකාරී තත්ත්වයත්, සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යාමේදි බෝම්බ පුපුරා මිනිස් ජීවිත හානි වීමත් නිසා ඔහුද බියෙන් සහ තැතිගැන්මෙන් සිටි බවටත් යන සාක්ෂියත් සමග ගත් කළ 5 වන චූදිත චිත්තිකූඩුවේ සිට කියා සිටින පරිදි ප්‍රධාන පොලිස් පරීක්ෂක සුජීව සොයිසාගේ සටහන් පිළි නොගැනීමට හේතුවක් නොමැති බව පෙනී යයි.

එම සාක්ෂිවලින් හෙළි වන කරුණු අනුව පෙනී යන අනෙකුත් කාරණය වන්නේ පැ. සා. 1396ගේ සාක්ෂිය වන අරුණ වික්‍රමසේකර විසින් දෙන ලද සාක්ෂියේදි WP BCQ 0304 බයිසිකලය යමම්කි සිල්වාගේ හැඳුනුම්පත් අංකය යටතේ පුද්ගලයන් දෙදෙනෙකු විසින් මිලදී ගෙන තිබීමයි. මේ සම්බන්ධයෙන් යසස්ති සිල්වාත් , අරුණ වික්‍රමසේකරත් , එම යතුරපැදියේ මුල් අයිතිකාර නිල්මිණී යන තැනැත්තියත් එම යතුරුපැදිය අරුණ වික්‍රමසේකරගේ වෙළඳ ආයතනයට ලබාදුන් පුද්ගලයාත් යන සියලුදෙනාම මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත.

WP BCQ 0304 දරණ වාහනය පාලමුණේ කිරිතෝනාවත්තේදී 2019.04.17 වන දින පිපිරීමකට ලක් වූ බවට වූ සාක්ෂිය හබ වී නැත. එහ වාහනය අරුණ වික්‍රමසේකර විසින් යසස්ති සිල්වා යන අයගේ හැඳුනුම්පත සමඟ පැමිණි පුද්ගලයන් දෙදෙනෙකුට විකුණු බවට වූ කාරණයද හබ වී නැත. එහ හැඳුනුම්පත අයිතිකරුගේ මුදල් පසුම්බිය 5 වන විත්තිකරු භාරයේ තිබයදී සෙයා ගන්නා බවට දෙන ලද පොලිස් නිලධාරියාගේද සාක්ෂිය විශ්වාසනීය සාක්ෂියක් වන බැවින් එය ප්‍රතික්ෂේප කිරීමටද හේතුවක් නැත. විත්තිකරුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදි ඔහු උගත්කම, බාහිර ක්‍රියාකාරකම් කෙසේ වුවද මෙම නඩුවේදි පැමිණිල්ලේ සාක්ෂිකරුවන් බොහෝදෙනෙකුගේ සාක්ෂි හරස් ප්‍රශ්න ඇසීමකින් තොරවම ඉදිරිත් වී ඇති අතර ඒවා බැහැර කිරීමට කිසිදු හේතුවක් නැත. 5 වන විත්තිකරු කියා සිටින අනස් නැමැත්තා සහ පැ.සා. 1400, ජවුෆර්

සාදික්ගේ (පැ.සා. 1401) සාක්ෂියේදි අධිකරණය ඉදිරියේ දිවුරුම්පිට දෙන ලද අතර හරස් ප්‍රශ්නවලට භාජනය කරමින් ඒවායේ විශ්වාසනීයත්වය පරීක්ෂා කර ඇති අතර ඉහත සාක්ෂි විශ්ලේෂණයේදි එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙම අධිකරණයේදි අප විසින් විශ්ලේෂණාත්මකව සහ මනාව පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව එම සාක්ෂි පිළිගැනීමට තීරණය කර ඇත . එබැවින් එකී සාක්ෂි සමඟ ගත් කළත් පෙර සඳහන් කරන ලද හරස් ප්‍රශ්නවලින් හබ නොවූ සාක්ෂිවලත් ගත් කළ 5 වන විත්තිකරු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගෙන ඒ මත කටයුතු කිරීමට හෝ එම ප්‍රකාශය මඟින් පැමිණිල්ලේ නඩුව කෙරෙහි යම් සැකයක් ඇති වී නොමැති බවද අප හට මනාව පෙනී යයි. ඒ අනුව 5 වන විත්තිකරුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිලිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

මෙම නඩුවේ 06 වූදිත විත්තිකූඩුවේ නිහඬව සිටින ලද අතර ඔහු වෙනුවෙන් සාක්ෂි කැඳවීමක් සිදුකර නැත.

07 චූදිත මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් විසින් චිත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

07 චූදිත වන තමන් මීගමුව රෝහලේ උපත ලබා, දුම්මලසූරිය, දෙගම්බර, ආඩිඅම්බලම ප්‍රදේශයේ හැදී වැඩුණු බව ප්‍රකාශ කරයි. දෙගම්බර මුස්ලිම් විද්‍යාලයෙන් 9 වසර දක්වා ඉගෙනුම ලබා ආර්ථික ප්‍රශ්න හේතුවෙන් කුරාන් මද්‍රාසාවක අධ්‍යාපනය වසර දෙකකින් නතර කල ඔහු, පසුව ගිරිඋල්ලේ රන් බඩු කඩයක වසර 5-6ක් වැඩ කර ඇත. 2008 වසරේදී විවාහ වී එගම්වල ආරිහාමම් ප්‍රදේශයේ තමාම රන් බඩු කඩයක් වසර දෙකක් පමණ පවත්වා ගෙන ගියද, පහසුකම් නොමැතිකම නිසා එය වසා දමා ඇත. ඉන්පසු 2014 දී කටාර් රටට ගොස් වසරක් පමණ සේවය කර නැවත ලංකාවට පැමිණි ඔහු, බිරිඳ (ඉල්මියා) සහ දරුවන් පස්දෙනා සමඟ ජීවත් වෙමින් මස්කට්, බුන්දි, පැණි වළලු වැනි රසකැවිලි සාදා තොග සහ සිල්ලර වශයෙන් විකිණීමේ ව්‍යාපාරයක නිරත වී ඇත. ඔහු මෙම ව්‍යාපාර කටයුතු සිංහල, දෙමළ සහ මුස්ලිම් යන සෑම ජන කොටසක් සමඟම විවිධ ප්‍රදේශවල පන්සල්, පල්ලි සහ ක්‍රිස්තියානි දේවස්ථානවල පැවැති උත්සව ආශ්‍රිතව සිදු කර තිබේ. 2019 අප්‍රේල් 27 වන දින දුම්මලසූරිය පොලීසිය විසින් ඔහුව අත්අඩංගුවට ගනු ලැබූ අතර, පොලිස් වාහනය තුළදී සහ පොලිස් ස්ථානයේදී නිලධාරීන් පිරිසක් ඔහුට ඉතා

දරුණු ලෙස පහරදී ඇත. පසුව කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) 4 වන මහලට ඔහුව රැගෙන ගොස් රඳවා තබා තිබේ. එහිදී, 6 වන චූදිත වන රිස්කාන් නමැත්තා තමන් හඳුනන්නේ තම කඩයෙන් රස කැවිලි මිලදී ගත් පාරිභෝගිකයෙකු ලෙස පමණක් බවත්, 2019 අප්‍රේල් 21 වන දින (පාස්කු බෝම්බ ප්‍රහාරය සිදු වූ දින) තමන් කුරුණෑගලට ත්‍රීරෝද රථයක් මිලදී ගැනීමට යන අතරතුර රිස්කාන් මුණ ගැසුණු බවත් සනස්දීන් පවසයි. එදින පනවා තිබූ ඇඳිරි නීතිය සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් රිස්කාන් සමඟ තම මස්සිනාගේ නිවසේ සහ පසුව මිතුරෙකු වූ කියාස්ගේ නිවසේ නතර වූ බව ඔහු විස්තර කරයි. රිස්කාන්ට අයත් යතුරුපැදිය විකුණා ගැනීම සඳහා තමන් කියාස් වෙත එය භාර දුන් නමුත්, එම යතුරුපැදිය සමඟ තමන්ගේ කිසිදු සබඳතාවයක් නොමැති බව ඔහු අවධාරණය කරයි. නුවරඑළිය ප්‍රදේශයේ පැවති බයාන් දේශනයකට සහභාගී වීම සඳහා වෑන් රථයකින් තවත් පිරිසක් සමඟ ගිය ගමනක් පිළිබඳවද ඔහු කරුණු දක්වයි. වාහනයේ ඇති වූ කාර්මික දෝෂ හේතුවෙන් එහි ළඟා වන විට දේශනය අවසන් වී තිබූ නිසා කිසිදු දේශනයකට සහභාගී නොවී පසුදින ආපසු පැමිණි බවත්, CIDය විසින් එයද වරදවා වටහා ගෙන තමන්ට එරෙහිව චෝදනා එල්ල කර ඇති බවත් පවසමින් එම චෝදනාව ඔහු ප්‍රතික්ෂේප කරයි. පානදුර සරික්කාමුල්ල ප්‍රදේශයේ පිහිටි නිවසකින් හමු වූ ටේප් රෝලක තම ඇඟිලි සලකුණු තිබූ බව පිළිගන්නා නමුත්, තමන්

ව්‍යාපාරික කටයුතු සඳහා විශාල වශයෙන් ටේප් රෝල් භාවිතා කරන නිසා එම ටේප් රෝල එතැනට ගියේ කෙසේදැයි තමන් නොදන්නා බවත්, තමන් කිසි දිනක පානදුර ප්‍රදේශයට හෝ එම නිවසට ගොස් නොමැති බවත් ඔහු පවසයි. CID නිලධාරීන් විසින් තම නිවසින් රුපියල් ලක්ෂ 3ක්ද, මස්සිනාගේ නිවසින් රුපියල් ලක්ෂ 13ක්ද (එළුවන් විකිණීමෙන් හා ව්‍යාපාරයෙන් උපයා මස්සිනාට ණයට දුන් මුදල්) සහ අක්කාගේ නිවසින් ලක්ෂ 2ක්ද වශයෙන් විශාල මුදලක් ලබා ගෙන ඇති නමුත් ඒවා තමන්ට පෙන්වා නැති බව ඔහු සඳහන් කරයි. වැසිකිළියකින් සොයා ගත් බව කියන ජංගම දුරකථනයද තමන්ගේ නොවන බවත්, තමන් කිසි දිනක එවැනි දුරකථනයක් භාවිතා කර නැති බවත් ඔහු පවසයි. තමන්ට කියවීමට නොහැකි නිසා සහකාර පොලිස් අධිකාරී රොෂාන් ඉදිරිපත් කල ලේඛනවලට අත්සන් කිරීම ඔහු ප්‍රතික්ෂේප කර ඇත. 2020 ඔක්තෝබර් 15 වන දින ඔහුව අධිකරණ වෛද්‍ය නිලධාරී (JMO) වෙත ඉදිරිපත් කල අවස්ථාවේදී, පොලිස් පහරදීම් නිසා අතේ ඇති වූ කැලැල් වෛද්‍යවරයා විසින් මැන බලා සටහන් කරගත් බව ඔහු පවසයි. 2019 ඔක්තෝබර් 19 වන දින මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල අවස්ථාවේදී, තමන්ට නන්දලාල්, විජේරත්න සහ ඩයස් යන නිලධාරීන් පහර දුන් බවත්, මෙම සිද්ධියට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බවත් සනස්දීන් විනිසුරුවරයාට ප්‍රකාශ කර තිබේ. අවසාන වශයෙන්, මෙම නඩුව හෝ

සිද්ධිය පිළිබඳව තමන් කිසිවක් නොදන්නා බැවින් තමන්ව නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියි.

<u>විශ්ලේෂණය.</u>

07 වන චූදිත සනස්දීන් තම විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇත්තේ පානදුර සරික්කාමුල්ල ප්‍රදේශයේ පිහිටි නිවසකින් හමු වූ ටේප් රෝලක තම ඇඟිලි සලකුණු තිබූ බව පිළිගන්නා නමුත් තමන් ව්‍යාපාරික කටයුතු සඳහා විශාල වශයෙන් ටේප් රෝල් භාවිතා කරන නිසා එම ටේප් රෝල් එතැනට ගියේ කෙසේ දැයි තමා නොදන්නා බවත් තමන් කිසි දිනෙක පානදුර ප්‍රදේශයට හෝ එම නිවසට ගොස් නොමැති බව පවසා ඇති අතර, පැමිණිල්ලේ සාක්ෂි අංක 2244 අබ්දුල් සත්තාර් මොහොමඩ් ඉල්හාම් යන අයගේ සාක්ෂියට අනුව ඔහුට අයත් නිවසක් පානදුර පරත්ත පාර, ෂරිෆ් මාවත, අංක 61/2 දරණ ස්ථානයේ ඇති බවත්, එය 'නස්මියා විලා' යනුවෙන් නම් කර ඇති බවටත් කියා සිටින ලද අතර, එලෙස පවසා ඇති නිවස 07 වන චූදිත සනස්දීන්ගේ ඇඟිලි සලකුණු සොයා ගත් නිවස වේ.

එම නිවස වර්ෂ 2019.02.13 වන දින සහ අංක 2255 දරණ ගාමිණී බී. පෙරේරා නීතීඥවරයා විසින් ලියා සහතික කරන ලද බදු ඔප්පුව ප්‍රකාරව කොළඹ, 12 අලුත් යෝන්වීදිය, අංක 138/B හි පදිංචි මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයට බදු පදනම මත ලබා දී ඇති අතර, එම බදු

ගිවිසුමට සාක්ෂිකරු වශයෙන් අත්සන් කර ඇත්තේ මෙම නඩුවේ 06 වන විත්තිකරු වන එම්.ඒ.එම් රිස්කාන් බවට එම සාක්ෂිකරු විවෘත අධිකරණයේ දී හඳුනා ගෙන සාක්ෂි ලබා දී ඇත. එකී රිස්කාන් නැමැත්තා මෙම 07 වන චූදිතගෙන් රස කැවිලි මිළදි ගත් පාරිභෝගිකයෙකු බවට පමණක් පවසා ඇතද, එසේම එම රිස්කාන්ට අයත් යතුරුපැදිය තමා විසින් තම මිතුරෙකු වූ කියාස් හට බාර දුන් බව පවසා ඇතද, එකී කරුණද විශ්වාසනීයත්වයෙන් තොර බව පෙනී යන අතර, 06 වන චූදිත හුදෙක් මෙම චූදිතගේ පාරිභෝගිකයෙකු පමණක් නම් 06 වන චූදිත රිස්කාන්ට අයත් යතුරුපැදියක් විකිණීම සඳහා මෙම 07 වන චූදිතට ලබා දී තිබීමක් කිසිසේත් විය නොහැකිය.

මන්ද පැමිණිල්ලේ සාක්ෂි අංක 1945 පොලිස් පරීක්ෂක ඩයස් පද්මසිරි යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව මෙම චුදිතගෙන් හෙලි වූ කරුණු ප්‍රකාරව එනම් පැ.2000 ලෙස ලකුණු කර ඇති උධෘත කොටස ප්‍රකාරව BGV 7799 දරන යතුරු පැදිය 2019/04/21 පාස්කු ප්‍රහාරයෙන් පසුව ඉතා සූක්ෂම ලෙස වතුර වලක් තුළ සඟවා තිබියදී විමර්ශන නිලධාරීන් විසින් මෙම 07 චූදිතගේ මඟපෙන්වීම ඔස්සේ සොයාගෙන ඇත. එකී යතුරු පැදිය කොළඹ වැල්ලවත්තේ පිහිටි මයුරා පෙදෙස ආරක්ෂත නිවාසයට 2019.02.07, 2019.02.10 දිනවලදී ඇතුළු වූ සහ පිටවූ බවට ඥාණරාජ් පෝල්රාජ් (පැ.සා.2270) යන සාක්ෂිකරුගේ සාක්ෂියේදී සලකුණු කරන ලද පැ.849

ලේඛනයෙහි පැ.849 (1) දරන සටහන අනුව මේ වනවිටත් මේ අධිකරණයට හෙලි වී ඇත්තේ මෙම 07 වන චූදිත කොළඹ වැල්ලවත්තේ මයුරා පෙදෙසේ පිහිටි ඉහත කී ආරක්ෂිත නිවසට BGV 7799 දරන යතුරු පැදියෙන් පැමිණ ඇති බව වන අතර එකී ආරක්ෂිත නිවස ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තා විසින් ආරක්ෂිත නිවසක් ලෙස භාවිතා කර ඇති ස්ථානයක් බවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇත.

ඒ අනුව එම යතුරු පැදිය ඉහත විශ්ලේෂණය කරන ලද සාක්ෂිවල සඳහන් අනුසර මෝටර්ස් නැමැති ආයතනය වෙතින් 2019 ජනවාරි මාසයේ 19 දින පැ.980 (B) දරන රිසිට් පත ප්‍රකාරව මිලදී ගෙන ඇති බවට මෙම නඩුවේදී ඉහත කී පොලිස් පරීක්ෂක ඩයස් පද්මසිරිගෙන් (පැ.සා. 1945) 04 වන විත්තිකරු විසින් අසන ලද හරස් ප්‍රශ්නවලදී තහවුරු වී ඇති පසුබිම තුළ එම යතුරු පැදිය සම්බන්ධයෙන් මෙම 07 වන චූදිත තමා විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද කරුණු සත්‍යයෙන් තොර බව අප හට පෙනී යයි.

එකී තත්ත්වය තුළ මෙම 07 වන චූදිත පවසා සිටින පරිදි එම යතුරු පැදිය රිස්කාන් නැමැති 06 වන චූදිත විසින් විකුණා දෙන බවට ඔහුට පවසා ඇති කරුණද, එසේම මෙම චූදිතව අත්අඩංගුවට පත් වූ පසු ඔහුව විමර්ශන නිලධාරීන් විසින් රැගෙන කියාස් නැමැත්තාගේ නිවස අසලට ගොස් කියාස්වත් ජීප් රථයේ දමාගෙන තමාලා සමඟ රැගෙන ගොස් බෝක්කුවක්

ළඟ නතර කර ඉන්පසු එදින කාලවේලා මදි බව පවසා පසු දින උදේ තමාවද රිස්කාන් නැමැත්තාවද කියාස් නැමැත්තාව එම ස්ථානයට රැගෙන ගිය බව පවසා කියාස් නැමැත්තා විසින් එම ස්ථානය පෙන්වා වතුර වලට බැස යතුරු පැදිය එලියට ගත් බවට සහ පැවසූ කරුණුද එසේම එම යතුරු පැදිය තමා පාවිච්චි කරපු යතුරු පැදිය නොව එය 06 වන චූදිත වන රිස්කාන් විසින් විකිණීම සඳහා තමාට ලබා දුන් යතුරු පැදියක් යැයි මෙම 07 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සම්පූර්ණයෙන් සත්‍යයෙන් තොර විශ්වාසනීයත්වයෙන් තොර කරුණු බව පෙනී යයි.

එක් චූදිතයෙකු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයක් ඔහු සමඟ චෝදනා ලබා සිටින තවත් චූදිතයෙකුට එරෙහිව ඉදිරිපත් කළ නොහැකි බවට වන නෛතික තත්ත්වය තුළ මෙම 07 චූදිත විසින් 06 වන චූදිත රිස්කාන් සම්බන්ධයෙන් මෙම චූදිතගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කරන ලද කරුණු 06 වන චූදිතට එරෙහිව කිසිසේත් සළකා නොබැලීමට අප තීරණය කරමු. කෙසේ වුවත් අප විසින් ඉහතින් සඳහන් කර ඇති කරුණු අනුව මෙම 07 වන චූදිත සනස්දීන් හට 06 වන චූදිත රිස්කාන් සමඟ ඉතා සමීප සම්බන්ධතා තිබී ඇති බව පෙනී යන අතර, පානදුර, පරත්ත පාරේ පිහිටි නස්මියා විලා නැමැති නිවසේ තිබී මෙම 07 වන චූදිතගේ පමණක් නොව 06 වන චූදිත වන රිස්කාන් නැමැත්තාගේද ඇඟිලි සලකුණු සොයා ගෙන ඇති පසුබිම තුළ මෙම 07 වන චූදිත සනස්දීන් එම නිවස තුළ සිට ඇති බව මැනවින් පැහැදිලි වේ. මෙම 07 වන

චූදිත සනස්දීන්ගේ ඇඟිලි සලකුණු 02 ක් සොයාගෙන ඇත්තේ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා විසින් බද්දට ගෙන තිබූ නස්මියා විලා නැමැති නිවස තුළ වන අතර, එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යනු කොටුව කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙස බෝම්බ පුපුරුවා ගත් තැනැත්තා බවට මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි මඟින් කිසිදු සැකයකින් තොරව සනාථ වී ඇත.

තවද පානදුර නස්මියා විලාහි අයිතිකරු වන පැ. සා. 2244 අබ්දුල් සතාර් මොහොමඩ් ඉල්හාම් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ද කොටුව කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙස බෝම්බ පුපුරුවා ගත් තැනැත්තා වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තාට බවට එම තැනැත්තාගේ ඡායාරූපය පවා අධිකරණයේදී හඳුනාගෙන සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු සිටි නිවසක් තුළ 07 වන චූදිත සනස්දීන් යන අයගේ ඇඟිලි සලකුණු තිබී සොයා ගැනීම සම්බන්ධයෙන් 07 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇති පරිදි තමා රස කැවිලි ව්‍යාපාරික කටයුතු සිදු කරන බවත්, ඒ සඳහා තමා ටේප් රෝල් විශාල වශයෙන් භාවිතා කරන බවත් පවසා තමාගේ ඇඟිලි සලකුණු තිබූ ටේප් රෝල එම නිවස තුළට ගියේ කෙසේදැයි තමා නොදන්නා බවට පැවසූ කරුණ විශ්වාසනීයත්වයෙන් තොර බව පෙනී යන අතර, මෙම 07

වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි 2019 අප්‍රේල් 14 හෝ 15 දිනක 06 වන චූදිත රිස්කාන් තමාගෙන් රස කැවිලි මිළදී ගෙන ගියා යැයි පවසා ඇති අතර, ඒ අනුව එකී 06 වන චූදිත රිස්කාන් නැමැත්තාගේ ඇඟිලි සලකුණුද මෙම චූදිතගේ ඇඟිලි සලකුණු තිබූ ඉහත කී පානදුර පරත්ත පාරේ නිවස තුළම තිබී සොයාගෙන ඇති පසුබිම තුළ එසේම රස කැවිලි පාරිභෝගිකයන්ට විකිණීමේදී ටේප් රෝල් ලබා දීමක් කිසිදු රස කැවිලි වෙළෙන්දෙකු රස කැවිලි විකිණීමේදී ඒ සමඟ ටේප් රෝල්ද ගැනුම්කරුට ලබා දීමක් කිසිසේත් විය නොහැකි අතර, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර් පැ.සා 2307 සේනක කළුආරච්චි යන සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව මෙම 07 වන චූදිත සනස්දීන් නැමැත්තාගේ ඇඟිලි සලකුණු පානදුර පරත්ත පාරේ නස්මියා විලා නැමැති නිවස තුළ තිබූ ටේප් එකක තිබී සොයාගෙන ඇති අතර, එම කරුණ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා 2307 ඇඟිලි සලකුණු රෙජිස්ට්‍රාර් සේනක කළුආරච්චි ගේ සාක්ෂි මඟින් මැනවින් තහවුරු වී ඇත. 07 වූදිත විත්තිකූඩුවේ සිට ප්‍රකාශ කරන පරිදි ඔහු 06 වන චූදිත රිස්කාන් නැමැත්තාට 2019 අප්‍රේල් 13 හෝ 14 දින වල රස කැවිලි එදින මස්කට් කාඩ්බෝඩ් පෙට්ටිවල දමා ඒවා ලබා දීමේදී එදින තමාගේ කාර්ය බහුලත්වය නිසා වෙනදා මෙන් ඒවා හොඳින් ටේප් ඔතා පොලිතින් බෑග් වල දමා ටේප් වලින් සම්පූර්ණයෙන් එතීමට තමාට නොහැකි වුන බවත් 06 වන චූදිත රිස්කාන්ට අවශ්‍ය පරිදි ඒවා පාර්සල් කර ගන්න යැයි පවසා තමා

ඔහුට ටේප් රෝල සහ බඩු ටික ලබා දුන්න බවත් ඔහු ඒවා කොහේට රැගෙන ගියාද කාට දුන්නාද යන්න තමා දන්නේ නැති බවද පවසා ඇති අතර, කෙසේ වුවත් මෙම 07 වන චූදිත සනස්දීන්ගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයට අනුව ඔහු 06 වන චූදිත රිස්කාන් නැමැත්තාව එදින වන විටත් අවුරුදු 7-8 ක් තිස්සේ හඳුනන බවට පවසා ඇති අතර ඒ අනුව ඔහුට 6 චූදිත සමග මනා පෙරහැදිනීමක් තිබී ඇති බව පෙනී යයි.

මෙම 07 චූදිතව විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී සඳහන් කර ඇති පරිදි ඔහුව අත් අඩංගුවට ගත්තේ 2019-4-27 දින බවට පෙනී යන අතර පානදුර පරත්ත පාරේ නස්මියා විලා නිවසෙ තිබී ඇගිලි සලකුණු සොයාගෙන ඇත්තේ 2019-4-22 දින වේ. ඒ අනුව පාස්කු ප්‍රහාරය සිදු වූ දිනයට පසු දිනම එම පානදුර නිවස විමර්ශන නිළ්දාරීන්ගේ දැඩි ආරක්ෂාවට පාත්‍ර වී ඇති පසුබිම තුල 7 චූදිත ගේ ඇගිලි සලකුණු අඩංගු ටේප් රෝලක් එම් නිවස තුලට ගෙන ඒමට කිසිසේත් හැකියාවක් නැත. එසේම 2019-4-22 එනම් පාස්කු බෝම්බ ප්‍රහාරයන් සිදු වූ දිනට පසු දිනම පානදුර නස්මියා විලා නිවසේ දී මෙලෙස සැකකටයුතු ඇගිලි සලකුණු සොයාගෙන ඇති අතර 7 චූදිතගේ ඇගිලි සලකුණු ලබාගෙන ඇත්තේ 2019-4-29 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් 83852 චතුරංග නිලදාරියා විසින් වේ. ඒ බවට පැ.1559 ඇගිලි සටහන් පතෙන් සහ පැ.1561-D ලෙස ලකුණු කර ඇති ලේඛණය මගින් ද පැහැදිලි වේ. තව ද 07 චූදිත සනස්දීන් ගේ ඇගිලි සටහන් සොයාගත්

නිවසේ තිබී ස්වයංඝාතක බෝම්බකරු වෙකු වන සහරාන් නැමැත්තාගේ දියණිය වන රුදෙයිනා නැමැති දැරිය ගේ අත්ල සටහන් සලකුණු ද සොයා ගෙන ඇති බව පැ.1561-E ලේඛණයෙන් පැහැදිලි වන අතර ඇය කුඩා දැරියක් වන අතර ඒ අනුව අනුව 07 වූදිතගේ ඇගිලි සලකුණු සොයාගත් නිවසේ ස්වයංඝාතක බෝම්බකරු වන සහරාන් නැමත්තා සිට ඇති බව පෙනී යයි. එසේම කොටුව කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු ලෙස බෝම්බ පුපුරුවා ගත් තැනැත්තා වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් නැමැත්තා මෙම නිවස බදු ගෙන ඇති අතර ඒ අනුව එම නිවස ස්වයංඝාතක බෝම්බකරුවන්ගේ ආරක්ෂිත නිවසක් ලෙස තිබී ඇති බව මනාව පැහැදිලි වේ.

එසේම එම නිවස තුල තිබී විවිධ ප්‍රමාණවල ස්විච්, වයර්, PVC බට සහ ඇතුළත් මෙවලම් සහ පිළිස්සී ගිය ජංගම දුරකතන සහ ඉලෙක්ට්‍රොනික් පරිපථ ආදිය, Decathlon යන සන්නාමය සහිත බෑගය, Innovex නැමැති වෙළඳ නාමය සහිත රෙදි සෝදන යන්ත්‍රයක ඇසුරුම ලෙස භාවිතා කරන ලද කාඩ්බෝඩ් පෙට්ටියද, වාහන අංක තහඩු, බැටරි කෑලි, කුඩා පොතක් සහ LED බල්බ් මල්ටිබොන් ලෙස සඳහන් වෙන ලෝහ කෑනය, Calcium Hypochlorite වශයෙන් සඳහන් බැරලයක්, K&H Daio steel ball mfg. Co. Ltd යන්නෙන් සටහන්ව ඇති පොලිතින් බෑග් විශාල ප්‍රමාණයක්, first choice, අංක 26 සහ 28, මිරානියා වීදිය, කොළඹ 12 දරණ ලිපිනය සඳහන් බෑගය හෝ එහි හිජාබ්, සපත්තු, අබායා,

සෙරෙප්පු හෝ හැන්ඩ්බෑග්, බයිසිකල් බෝල ඇසුරුම් කිසිවක් තමාට අයත් හෝ නිවස කුලියට දෙන අවස්ථාවේදී තමා විසින් භාරදුන් දේපළ නොවන බවත් තමා දැනුවත්ව එම නිවසට ගෙන ආ දේවල් නොවන බවත් තමාගේ හෝ තම පවුලේ අයගේ දේවල්ද නොවන බවටත් නිවසේ නීත්‍යානුකූල හිමිකරු වන පැ.සා. පැ. සා. 2244 අබ්දුල් සත්තාර් මොහොමඩ් ඉල්හාම් යන සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුල සහ එම නිවසේ තිබී විමර්ශන නිලදාරීන් විසින් සොයාගෙන තිබූ PVC බටයක අමෝනියම් නයිට්‍රේට් හදුනාගත් බවට පැ.සා 1440 රජයේ අතිරේක රස පරීක්ෂක රුක්ෂාන් ප්‍රනාන්දු සාක්ෂි ලබා දී ඇති පසුබිම තුල තමාගේ ඇගිලි සලකුණු එම නිවසේ තිබූ ටේප් රෝලේ තිබුණේ කෙසේද? යන්න තමා නොදන්නා බවට 7 වූදිත සනස්දීන් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී පැවසූ කරුණු කිසිසේත් පිළිගත නොහැකිය. ඒ අනුව සමස්තයක් ලෙස ගෙන සළකා බැලීමේදී අපහට පෙනී යන්නේ 07 වන වූදිත ඔහු විසින් විත්තිකූඩුවේ සිට සිදු කරන ලද ප්‍රකාශයේදී උත්සාහ දරා ඇත්තේ ඔහුට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විශ්ලේෂණය කිරීමක් කර හබ කිරීමට ලක් කිරීමක් බව පෙනී යන අතර, ඔහුට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සියලු සාක්ෂි අප විසින් මේ වන විටත් මනාව හේතු සහිතව ඇගයීමට ලක් කර ඇත. එකී පසුබිම තුළ ඔහු විසින් ඉහත පරිදි විත්තිකූඩුවේ සිට ලබා දුන් ප්‍රකාශය මඟින් ඔහුට එරෙහිව මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි

සම්බන්ධයෙන් කිසිදු සැක සහිත භාවයක් අපහට පෙනී නොයන බව මෙහිලා සඳහන් කරමු. ඒ අනුව අප විසින් ඉහතින් සඳහන් කර ඇති හේතූන් ප්‍රකාරව 07 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට ලබා දුන් ප්‍රකාශය ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති බරපතල චෝදනාවලින් ගැලවී යාම සඳහාම, පසුව සිතාබලා සූදානම් වී සිදු කර ඇති ප්‍රකාශයක් බවට අප තීරණය කරමු. ඒ අනුව ඔහු විසින් විත්තිකූඩුවේ සිට සිදු කරන ලද ප්‍රකාශය විශ්වාසනීයත්වයෙන් තොර බවට තීරණය කරමින් එය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

08 චූදිත අබ්දුල් මනාෆ් මොහොමඩ් පිරිදවුස් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය

08 චූදිත වන අබ්දුල් මනාෆ් මොහොමඩ් පිරිදවුස් විත්ති කූඩුවේ සිට කරනු ලබන ප්‍රකාශය ආරම්භ කරමින් තමා රත්නපුරයේ උපත ලබා බදුල්ල ප්‍රදේශයේ හැදී වැඩී සිංහල මාධ්‍යයෙන් 7 හෝ 8 වසර දක්වා පමණක් අධ්‍යාපනය ලැබූ බව පවසයි. පවුලේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අධ්‍යාපනය නතර කල ඔහු, පසුව පවුල පිටින්ම පියාගේ ගම වන කාත්තන්කුඩියට පදිංචියට ගොස් ඇත. එහිදී ඔහු ඇඳුම් මසන්නෙකු ලෙසත්, මහන මැෂින් අළුත්වැඩියා කර විකිණීම, ඒවායේ අමතර කොටස් අවට ගම්මානවලට ගොස් විකිණීම, රන් ආභරණ සෑදීම වැනි විවිධ ව්‍යාපාර හා රැකියා සිදුකර තිබේ. කාත්තන්කුඩි ප්‍රදේශයේ සිංහල කතා කිරීමට

කිසිවෙකු නොසිටි බැවින්, අත්අඩංගුවට පත්වන තෙක් වසර 22ක පමණ කාලයක් ඔහුට සිංහල භාෂාව කතා කිරීමට අවස්ථාවක් ලැබී නැත. කාත්තන්කුඩියට පැමිණි මුල් කාලයේ ඔවුන් ජීවත්වී ඇත්තේ මාමා කෙනෙකුගේ ඉඩමක තල් කොළ සෙවිලි කළ, පොළොවට කාඩ්බෝඩ් දැමූ කුඩා පැල්පතකය. පසුව ඔහු ඉතා අමාරුවෙන් මුදල් ඉතිරි කර ඉඩමක් මිලදී ගෙන නිවසක් සාදා, එහි කොටස් තම සහෝදරියන් දෙදෙනාට ලියාදී එක් සහෝදරියකගේ විවාහයද සිදු කරදී ඇත. කාත්තන්කුඩි ප්‍රදේශයේ විවාහයකදී දෑවැදි ලෙස නිවසක් දිය යුතු බැවින් ඔහු තමා සෑදූ නිවස සහෝදරියටදී, තමා පවුලේ අය සමඟ නැවත පැල්පතක ජීවත් වී තිබේ. වයස අවුරුදු 24 දී ඔහු විවාහ වී ඇති අතර, දෑවැදි දීමේ අපහසුතාවය දන්නා බැවින් බිරිඳගෙන් දෑවැදි ඉල්ලා නැත. පසුව කුලී නිවසක පදිංචි වූ ඔහු, තම වැඩිමල් දියණිය ඉපදී මාස 3කට පසු නිවසක් සෑදීමේ අරමුණින් විදේශගත වී ඇත. වසර දෙකයි මාස දෙකක් විදේශගතව සිට දිවා රෑ නොබලා වැඩ කර එවන ලද මුදල්වලින් ඔහු කාමර දෙකක නිවසක් සාදා ගෙන ඇත. පසුව දරුවන් සමඟ ජීවත් වීමේ අරමුණින් විදේශගත නොවී ගමේම රැකියා කරමින් ජීවත් වූ ඔහු, අනෙක් සහෝදරියටද නිවසක් සාදාදී ඇයගේ විවාහයද සූදානම් කර තිබේ. ඔහුගේ සහෝදරියගේ විවාහයට පෙර දින රාත්‍රියේ, විවාහ කටයුතු සඳහා අවශ්‍ය මුදල් සූදානම් කරගෙන සිටි ඔහු, සහෝදරියට දීමට ඇඳක් නොතිබූ බැවින් තමන්ගේ ඇඳ ඇයට දීමට බිරිඳ

සමඟ කතා කර ගෙන එදින රාත්‍රියේ නින්දට ගොස් ඇත. එදින අලුයම 1-2 ට පමණ ඔහුව අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) 4 වන මහලට රැගෙන ගොස් ඇති අතර එහිදී ඔහු පහරදීම්වලට ලක්ව තිබේ. එතැනින් ඔහුගේ ඇස් බඳිනු ලැබ පුත්තලමේ කැලෑබද ප්‍රදේශයක පිහිටි කුඩා නිවසක් වෙත රැගෙන ගොස් ඇත. එහිදී ඔහුගේ ඇස් ලිහා ඇති අතර, එම ස්ථානයේ ආරක්ෂක අංශ (STF) නිලධාරීන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සහ මෙම නඩුවේ දෙවන විත්තිකරු සිටිනු ඔහු දැක තිබේ. එහිදී පොළොව හාරා බැරලයක් ගොඩගෙන ඇති අතර, පසුව නැවතත් ඇස් බඳිනු ලැබූ ඔහුව රැගෙන ගොස් තේ බොන්නට දෙන විට එම ස්ථානය පුත්තලම පොලිසිය බව ඔහු දැනගෙන ඇත. තමා මීට පෙර කිසි දිනක පුත්තලම ප්‍රදේශයට ගොස් නැති බවත්, එහි සිදු වූ සිදුවීමට හෝ හමු වූ භාණ්ඩවලට තමාගේ කිසිදු සම්බන්ධයක් නැති බවත් ඔහු පවසයි. රිවෝල්වරයක් තිබූ තැනක් පෙන්වීමට ඔහුව එහි රැගෙන ගිය බවට සාක්ෂි දී තිබුණද, ලොරි රථයකින් අධිකරණයට ගෙන ආ හැකි තරම් විශාල නඩු භාණ්ඩ ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබූ බව ඔහු පෙන්වා දෙයි. තමා රිවෝල්වරයක් ගැන පැවසුවා නම් අනෙක් භාණ්ඩත් තමා සැඟවූ බව පැවසිය යුතු වුවත් තමා එවැනි කිසිවක් සිදු නොකල බවත්, ආරක්ෂක අංශ භාරයේ තිබූ සහ යන්ත්‍ර සූත්‍ර යොදා පරීක්ෂා කර තිබූ එම ඉඩමේ තමා කෙසේ බඩු සඟවන්නදැයි ඔහු ප්‍රශ්න කරයි. එවකට CID ප්‍රධානියා වූ ශානි

අබේසේකර මහතා යටතේ එම ස්ථානය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කර තිබූ බැවින් තමා එහි රිවෝල්වරයක් සැඟවූවා යන්න පිළිගත නොහැකි බව ඔහු පවසයි. නැවත 4 වන මහලට ගෙන ආපසු වීරසිංහ මහතා යටතේ තමාගෙන් ප්‍රකාශ ලබා නොගත් අතර, පසුව ඔහුව විශේෂ ඒකකයට මාරු කර තිබේ. එහිදී ඔහුට දැඩි ලෙස වදහිංසා පමුණුවා පහර දී ඇති අතර, ඔහු කිසිදු ස්වේච්ඡා කටඋත්තරයක් ලබා දී නැත. ඔහු තම ජීවිත තොරතුරු සටහන් කරගෙන තිබූ කුඩා පොතක කරුණු පදනම් කරගෙන සකස් කරන ලද ප්‍රකාශයකට, පහරදීම්වලට ඇති බිය නිසාම කියවන්නේ නැතිව අත්සන් තැබීමට ඔහුට සිදු වී ඇත. පසුව ඔහුව සහ මිල්හාන් නැමැත්තා මඩකලපුව ඔල්ලිකුලම් ප්‍රදේශයේ මිල්හාන් විකුණූ ඉඩම හරහා රාවුෆ් නැමැත්තාගේ ඉඩමට රැගෙන ගොස් තිබේ. එහි තිබූ දෙමහල් නිවසක් තුළ ඔවුන්ව රඳවා ගෙන සිට ආරක්ෂක අංශ භාණ්ඩ කිහිපයක් සොයා ගෙන ඇති අතර, තමා කිසිදු ස්ථානයක් පෙන්වූයේ හෝ භාණ්ඩ ලබා දීමට ප්‍රකාශයක් කළේ හෝ නැති බව ඔහු පවසයි. පොලිසිය පවසන ආකාරයට එක් බෑගයක තිබූ භාණ්ඩ ස්ථාන 9ක් හාරා ලබා ගත්තේ කෙසේදැයි ඔහු ප්‍රශ්න කරයි. එමෙන්ම මෙම සිදුවීම සම්බන්ධයෙන් එවකට කාත්තන්කුඩි පොලිස් ස්ථානාධිපතිවරුන් වූ කස්තුරිආරච්චි සහ දිසානායක යන මහත්වරුන් එකිනෙකට පරස්පර සහ බොරු සාක්ෂි ලබා දී ඇති බව ඔහු පෙන්වා දෙයි. තමාට මෙම සිදුවීම්වලට, චෝදනාවලට හෝ පාස්කු ඉරිදා

ප්‍රහාරයට කිසිදු සම්බන්ධයක් නැති බව ඔහු අවධාරණය කරයි. අධිකරණ භාෂාව සම්බන්ධයෙන් පවසමින් ඔහු කියා සිටින්නේ, තමාට දෙමළ කතා කිරීමට හැරුණු විට ලිවීමට හෝ කියවීමට නොහැකිව සිටි බවයි. පසුව මඩකලපුව බන්ධනාගාරයට පැමිණි පසු කොරෝනා වසංගතය පැවති සමයේ පවුලේ අය සමඟ සන්නිවේදනය කිරීමට තිබූ එකම ක්‍රමය ලිපි මාර්ගය වූ බැවින්, ඔහු එහිදී ඉතා අමාරුවෙන් දෙමළ ලිවීමට හා කියවීමට ඉගෙන ගෙන ඇත. ලිපි ද්‍රව්‍ය නොමැති කමින් ඇන්කර් පෙට්ටි හා කාඩ්බෝඩ් කැබලිවල ලියා පුරුදු වූ ඔහුට, පසුව ප්‍රධාන ජේලර් මෝහන් මහතා විසින් ලිපි ද්‍රව්‍ය ලබාදී ඇති අතර බන්ධනාගාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ (එස්එම් ජේලර්ගේ අත්සනින් යුතුව) ඔහු එම ඉගෙනීම් කටයුතු සිදු කර තිබේ. අවසාන වශයෙන් ඔහු පවසන්නේ තමාට එරෙහිව ඉදිරිපත් කර තිබූ 16(1) වගන්තිය යටතේ වූ ප්‍රකාශය තමා නොදැනුවත්ව අත්සන් ගත් එකක් වන අතර එය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවයි. තමාට වයස්ගත සහ රෝගී දෙමාපියන් සිටින බවත්, ඉතා හොඳින් අධ්‍යාපනය ලබන දරුවන් තිදෙනෙකු සිටින බවත් ඔහු පවසයි. ඔහුගේ වැඩිමල් දියණිය සාමාන්‍ය පෙළ විභාගයෙන් පාසලේ 4 වන ස්ථානය ලබා ඇති අතර මවුලවිවරියක වීමටද ඉගෙන ගනිමින් සිටී. දෙවන පුතා ශිෂ්‍යත්ව විභාගය සමත්ව ඇති අතර තුන්වන පුතා පන්තියේ තෙවන ස්ථානය ලබා ඇත. තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සහ රෝගී දෙමාපියන් රැකබලා

ගැනීම සඳහා තමා කිසිදු වරදකට සම්බන්ධ නොමැති බැවින්, තමා නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටී.

<u>විශ්ලේශනය</u>

මෙම 8වන චුදිතව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලදාරින් විසින් අත් අඩංගුවට ගෙන ඔහුගේ ප්‍රකාශය මත, පුත්තලම් සහ ඔල්ලිකුලම යන ප්‍රදේශවලින් විශල භාණ්ඩ තොගයක් සොයාගෙන ඇත. ඔහු තම ප්‍රකාශයේ දී කියා සිටියේ අපරාද පරීක්ෂණ දෙපර්තමේන්තුවෙන් ඔහුව අත් අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුව පුත්තලම ප්‍රදේශයට රැගෙන ගිය බවත් එම ස්තානයේ තිබී භාන්ඩ සෑහෙන ප්‍රමානයක් සොයා ගත් බවත්, නමුත්, එම භාන්ඩ තමාගේ මග පෙන්වීම මත සොයා නොගත් බවත්ය. එලෙසම, මඩකලපුව ඔල්ලිකුලම ප්‍රදෙශයටත් මිල්හාන් සමග රවුම් යන අයගේ ඉඩමට රැගෙන ගොස් එහී තිබූ නිවසේ තමාව රදවාගෙන සිටී බවත් ඒ අවස්තාවේ දි එම ඉඩමේ තිබී භාණ්ඩ සොයාගත් බවය.

මෙම 8 වන චූදිතගේ ප්‍රකාශයෙන් හෙලි වූ කරුණු මත සොයා ගන්නා ලද භාන්ඩ අතරින් පුපුරන ද්‍රව්‍ය සහ අවි ආයුධ සොයගෙන ඇත. භාන්ඩ සොයාගත් ස්තානවල තමා සිටිය බවට 8වන චූදිත පිලිගෙනද ඇත. මෙවනි තත්වයන් උඩ, තමාව විමර්ශන නිලදාරින් එම ස්තානයට රැගෙන ගියද තමා භාන්ඩ තිබූ ස්තාන පෙන්වීමක් කලේ නැති බව ට පවසන මෙම

8 වන චූදිතගේ ස්තාවරය අප හට කිසිසේත් පිලිගත නොහකිය. ඒ සම්හන්ධව ඔහු විසින් ලබා දුන් ප්‍රකාශයේ සාක්ෂියේ සත්‍යතාවයක් තිබෙන බවට අපහට පෙනීයන්නේ නැත. මෙකී තත්වය තුල මෙම 8 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරනලද ප්‍රකාශයේ සදහන් කර ඇති කරුණු අපහට විශ්වාස කල නොහැකිය. ඒ අනුව ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිලිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

<u>9 චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විත්ති කූඩුවේ</u>

<u>සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය</u>

9 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අය විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කර ඇති අතර ඔහු කියා සිටියේ තමා මාවනැල්ල ප්‍රදේශයේ උපත ලැබූ බවත්, බෙරුවල ජාමියා නලීමියා උසස් අධ්‍යාපන ආයතනයේ අරාබි සහ ඉස්ලාමීය අධ්‍යයනය පිළිබඳ අවුරුදු හතක අධ්‍යාපනයක් ලබා සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටි බවය. මෙම නඩුවේ තමාට එරෙහිව ඉදිරිපත්කර තිබෙන සියලුම චෝදනා තමා විසින් ප්‍රතික්ප කරන බවද 9 වන චූදිත ප්‍රකාශ කර ඇත. ඔහු තම ප්‍රකාශයේ තවදුරටත් කියා සිටියේ තමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටියදී තමාගෙන් බලහත්කාරයෙන් පාපොච්චාරණයක් ලබාගත් බවත්, එම පාපොච්ඡාරණය ස්වේච්ඡාවෙන් ලබාදුන් එකක් නොවන බවත් ය. කෙසේ වුවද, එම පාපොච්ඡාරණයේ

“බෝම්බ ප්‍රහාරය සිදුවූ බව තමා දැනගත්තේ ප්‍රහාරයෙන් පසුව වෙනත් පුද්ගලයෙකු පැමිණ පැවසූ විට” ලෙස සඳහන් වන බවත්, ඒ තුළින් තමාට බෝම්බ ප්‍රහාරය සම්බන්ධ පූර්ව දැනුමක් හෝ කුමන්ත්‍රණයක් නොතිබූ බවට සනාථ වන බවත්, තමා බියට පත්වී මානසිකව ඇදවැටුණු බව පැහැදිලිව පෙනෙන බවත්, එයින්ම ඔහුගේ නිර්දෝෂ වන බවත් ප්‍රකාශකර ඇත.තවද, මූතූර් ප්‍රදේශයේ අවිපුහුණුවට ගිය බවට නුවරඑළිය, හම්බන්තොට සහ මහනුවර අන්තවාදී දේශන පැවැත්වූ බවට වන චෝදනා සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන බවත් 9 වන චූදිත තම ප්‍රකාශයේ සඳහන්කර ඇත. ISIS සංවිධානය හෝ ජිහාද් සංකල්පය පිළිබඳව එකල මුස්ලිම් සමාජයේ පැවති උණුසුම් මාතෘකා මත අවබෝධයක් ලබාගැනීම සඳහා සාකච්ඡා කළද, කිසි විටත් ත්‍රස්තවාදී ක්‍රියාවක් කිරීමට හෝ මිනිසුන් මැරීමට තමා කිසිවකුට උපදෙස් ලබා නොදුන් බවත්, ආත්මාරක්ෂක ජිහාඩ් ධර්මය පිළිබඳව පමණක් සාකච්ඡා කළ බවත් ඔහු පවසා ඇත.

එඩේරමුල්ලේ නිවසේ රැඳීසිටීමින් ළමයින්ට ඉගැන්වූ බවට ඇති චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, එම නිවසින් සොයාගන්නා ලද තමාගේ ඇඟිලි සටහන් දෙක තමාව අත්අඩංගුවට ගත් පසු 2019 අප්‍රේල් 22 වන දින සි.අයි.ඩී. නිලධාරීන් විසින් එම නිවසට රැගෙන ගිය අවස්ථාවේදී වතුර බීමට බෝතලයක් ඇල්ලීම නිසා පතිත වූ සටහන් බවත් එලෙස තමාව එම නිවසට රැගෙන යාම පිළිබඳව පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු වන ඩයස් සහ නන්දලාල් තම සාක්ෂියේදී පිළිගෙන

තිබෙන බවත් ඔහු පවසා ඇත. එම නිවසේ තමා මාස ගණනක් ජීවත් වූයේ නම්, එම නිවසේ වෙනත් ස්ථාන වලද තමාගේ ඇඟිලි සලකුණු තිබිය යුතු බවක්, එලෙස වෙනත් කිසිම ඇඟිලි සලකුණක් හෝ DNA සාක්ෂියක් හමුවී නොමැති බවත් පවසා ඇත.

වනාතවිල්ලුව ප්‍රදේශයට තමා කිසිදිනක ගොස් නොමැති බවත්, 5 වන චූදිත සමඟ එකතු වී කිසිදු යතුරුපැදියක් මිලදීගෙන නැති බවත්, යතුරුපැදියක් මිලදී ගැනීම සම්බන්ධයෙන් තමාට එල්ලවී ඇති චෝදනාව අසත්‍ය බවත් 9 වන චූදිත තවදුරටත් පවසා ඇත. තම ප්‍රකාශයේ තවදුරටත් කියා සිටියේ දඹුල්ල ප්‍රදේශයේදී තමාව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී තමා සන්තකයේ කිසිදු සැකකටයුතු දෙයක් නොතිබූ බවත්, පැමිණිල්ල විසින් තමාට එල්ල කළ චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පුකර නොමැති බැවින් තමාව සියලු චෝදනාවලින් නිදහස්කොට නිදහස් කරන ලෙසට 9 වන චූදිත අධිකරණයෙන් ඉල්ලා ඇත.

<u>විශ්ලේෂණය</u>

9 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය අප විසින් මනාව පරීක්ෂා කර ඇගයීමට ලක් කරන ලදී. මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි අනුව මෙම චූදිතව අත්අඩංගුවට ගෙන ඇත්තේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සිදුවූ 2019.04.21 වනදින සවස්වරුවේ දඹුල්ල ප්‍රදේශයේ දී වන අතර එලෙස ඔහුව අත්අඩංගුවට ගැනීමෙන් පසු වැඩිදුර විමර්ශනය

සඳහා ඉන්පසු දින එනම්, 2019.04.22 වනදින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී ඇත. මෙම නඩුවට අදාළ විමර්ශනයේදී 9 වන චූදිත විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ [තාවකාලික විධිවිධාන] පනතේ 16(1) වන වගත්තිය යටතේ පාපොච්ඡාරණයක් ලබාදී ඇති අතර එකී පාපොච්ඡාරණමය ප්‍රකාශයක් 9 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් කරන ලද පාපොච්ඡාරණයක් ලෙසට අප විසින් දීර්ඝ ශකාත්‍යතා පරීක්ෂණයකින් අනතුරුව දැනටමත් තීරණය කර ඇත.

9 වන චූදිතගේ පාපොච්ඡාරණමය ප්‍රකාශය සමස්ථයක් ලෙස සලකා බැලීමේදී ඔහු සහරාන් නැමැති ස්වයංඝාතක බෝම්බකරු විසින් ඔහුගේ නායකත්වයෙන් ප්‍රදේශ කිහිපයක පවත්වා ඇති වැඩමුළුවලට සහභාගී වී ඇති අතර, එම වැඩමුළුවලදී අන්තවාදී දේශනාද පවත්වා ඇති බවට දැනටමත් මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි මගින් සනාථ වී ඇත. ඒ බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ. සා. 1400 අනස් සහ පැ. සා. 1401 ජවුෆර් සාදික් යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මගින් මැනවින් තහවුරු වී ඇත.

9 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයද අප විසින් මනාව පරීක්ෂා කර ඇත. මෙම චූදිතව අත්අඩංගුවට ගෙන ඇත්තේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සිදු වූ 2019.04.21 වන දින සවස්වරුවේ දඹුල්ල ප්‍රදේශයේදී හෝටලයක් ඉදිරිපිට වන අතර, එලෙස ඔහුව අත්අඩංගුවට

ගැනීමෙන් අනතුරුව වැඩිදුර විමර්ශනය සඳහා ඉන්පසු දින එනම්, 2019.04.22 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දී ඇත. මෙම නඩුවට අදාළ විමර්ශනයේදී 9 වන චූදිත විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ පාපොච්චාරණයක් ලබාදී ඇති අතර එකී පාපොච්චාරණමය ප්‍රකාශයක් 9 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් කරන ලද පාපොච්චාරණයක් ලෙසට අප විසින් දීර්ඝ ශක්‍යතා පරීක්ෂණයකින් අනතුරුව දැනටමත් තීරණය කර ඇත.

9 වන චූදිත ඔහුගේ පාපොච්චාරණයේ, ***"2019.04.21 වන දින උදේ අබු ෆාරුක් යන අය එඩේරමුල්ල නිවසට ඇවිත් සහරාන් ඇතුළු කට්ටිය බෝම්බ පුපුරුවා ගෙන මියගිය බව කීවා. ඒ වෙලාවේ නවුෆර් කීවා අපි දැන්ම යන්න ඕන කියලා. .....ඒ අනුව මම නවුෆර් සමඟ නිට්ටඹුව ප්‍රදේශයට ගොස් එතනින් සයින්දමර්දු යන්න බස් එකක නැගලා යන විට දඹුල්ලෙන් බැහැලා හොටල් එකක නතර වෙලා හෙට යන්න කියලා මම කිව්වා. පස්සේ අපි දෙන්නා බැහැලා හෝටලයට ගොස් සිටියදී පොලිසියෙන් ඇවිත් අපිව අල්ලාගෙන පසු දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත එක්ක ආවා"*** ලෙස සඳහන් කර ඇත. 9 වන චූදිතගේ තර්ක කරමින් පවසා සිටින්නේ, තමාගේ එකී

පාපොච්චාරණයේද එලෙස සඳහන් වී තිබෙන බැවින් තමාට බෝම්බ ප්‍රහාරය සම්බන්ධව පූර්ව දැනුමක් හෝ කුමන්ත්‍රණයක් නොතිබූ බවටය.

9 වන චූදිත විසින් ලබා දී ඇති ඔහුගේ පාපොච්චාරණය සමස්ථායක් ලෙස ගෙන පරීක්ෂා කිරීමේදි 2019.04.21 වන දින සිදු වූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ බෝම්බකරුවකු වන සහරාන් යන අයගේ සැලැස්ම සහ මූලිකත්වය ප්‍රකාරව දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු වැඩමුළුවලට සහභාගි වී තිබෙන බවට සහ එම වැඩමුළුවලදී ආයුධ සම්බන්ධ පුහුණුවද ලබාගෙන තිබෙන බවට හෙළි වී තිබෙන බවට පෙනී යයි. තවද සහරාන්, හස්තූන් ඇතුළු තවත් කිහිපදෙනෙකු සමඟ කණ්ඩායමක් ලෙස මෙවැනි වැඩමුළුවලට සහභාගි වී තිබෙන බැවින් ඔහු විසින් තර්ක කර සිටින පරිදි 2019.04.21 වන දින සිදු වූ බෝම්බ ප්‍රහාරයත් සමඟ ඔහුට කිසිදු සම්බන්ධතාවයක් නොතිබුණා නම් වත්තල ප්‍රදේශයේ ඔහු නැවතී සිටි නිවසේ සිට එලෙස හදිසියෙන්ම පිටත්ව යාමට කිසිදු අවශ්‍යතාවයක් තිබිය නොහැකිය. 9 වන චූදිත මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන අතර ඔහුව අත්අඩංගුවට ගෙන තිබෙන්නේ දඹුල්ල ප්‍රදේශයෙනි. මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන 9 වන චූදිත, නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ස්ථිර පදිංචිය තිබෙන මෙම නඩුවෙහි 01 චූදිත නවුෆර් මවුලවි සමඟ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සිදු වූ දින සවස් කාලයේ දඹුල්ල ප්‍රදේශයේ හෝටලයක් ඉදිරිපිට එම අවස්ථාවේදි සිටියේ කවර හේතුවකට යන්න සම්බන්ධයෙන් මෙම අධිකරණය සෑහීමට පත්

වන ආකාරයේ කිසිදු පැහැදිලි කිරීමක් මෙම 09 වන චූදිත විසින් කර නැති අතර, ඔහු සඳහන් කර ඇත්තේ එදින ඔහු සහ මෙම නඩුවේ 01 චූදිත වන නවුෆර් මවුලවි එදින සයින්දමරුදු ප්‍රදේශයට යාමට තීරණය කර තිබූ බවයි. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට දවස් 5කට පමණ පසුව සයින්දමරුදු ප්‍රදේශයේ බොලිවේරියන් ග්‍රාමයේ නිවසක විශාල බෝම්බ පිපිරීමක් සිදු වී ඇති අතර එම සිද්ධියේදී ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් යන අයගේ පියා, සහෝදරයා ඇතුළු පවුලේ කිහිපදෙනෙකු ද එම ස්ථානයේම මියගිය බවට මෙම නඩුවේ සාක්ෂි මඟින් අනාවරණය වී ඇත. තවද එම නිවස ආරක්ෂිත ස්ථානයක් ලෙස සහරාන් සහ ඔහුගේ කණ්ඩායම විසින් සැඟවී සිටීමට භාවිතා කළ ස්ථානයක් ලෙස සාක්ෂි ඉදිරිපත් වී ඇත.

මෙම නඩුවේ සාක්ෂි ලබාදුන් පැ.සා. 1401 ජවුෆර් සාදික්ගේ සාක්ෂියට අනුව 2018 දෙසැම්බර් මාසයේ මාවනැල්ල දෙල්ගහගොඩ තවුහීද් පල්ලියේ Sri Lanka Islamic Movement විසින් වැඩමුළුවක් 40 ක් පමණ මුස්ලිම් තරුණයින් හට පවත්වා ඇති අතර, එම වැඩමුළුව සංවිධානය කර ඇත්තේ මාවනැල්ල ප්‍රදේශයේම පදිංචි මෙම නඩුවේ 4 වන සහ 5 වන චූදිතයන් වන සහෝදරයන් දෙපළ විසින් වේ. එම වැඩමුළුවේදී සහජීවනය පිළිබඳව දේශනාවක් පවත්වමින් 9 වන චූදිත පවසා ඇත්තේ ***“ සහජීවනයක් කියලා එහෙම දෙයක් නැහැ. ආගම් අතර සහජීවනයක් පැවතිය නොහැකි ය. මුස්ලිම් නොවන රටක මුස්ලිම්වරුන්ට***

ජීවත් විය නොහැකිය.” ලෙස පවසා ශ්‍රී ලංකාවේ දිගන සහ අලුත්ගම වැනි ප්‍රදේශවල සිදු වූ මුස්ලිම් ප්‍රහාර, බොදුබල සේනා සංවිධානයේ ක්‍රියාකාරකම් සහ හිජාබ්, හලාල් හා සම්බන්ධ ප්‍රශ්න පෙන්වා දෙමින් රට මුස්ලිම් රටක් බවට පත් කිරීම සඳහා සටනක් කළ යුතු බවටත් දේශනා කර ඇත.

මෙම නඩුවේ සාක්ෂි ලබාදුන් පැ.සා. 1400 අනස් යන අයගේ සාක්ෂිය අනුව 09 වන චූදිත, සහරාන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලද වැඩමුළුවකදී අන්තවාදී දේශනා පැවැත් වූ බවට සාක්ෂි ලබා දී ඇත. තවද මෙම 9 වන චූදිත මෙම නඩුවේ 1 වන චූදිත සහ සහරාන් සමඟ ප්‍රධාන දේශකයින් ලෙස කටයුතු කර ඇති බව සාක්ෂි මඟින් හෙළි වී ඇත.

තවද මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති 1400 අනස්, පැ.සා. 1401 ජවුෆර් සාදික් යන දෙදෙනාගේම සාක්ෂි දෙස අවධානය යොමු කිරීමේදී 2019.04.21 වන දින සිදු වූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් තමා කිසිවක් දැන සිටියේ නැහැ යනුවෙන් සඳහන් කරමින් කරන ලද ප්‍රකාශය අතිශයින් විශ්වාසනීයත්වයෙන් තොර බව පෙනී යයි. මෙම නඩුවේ සාක්ෂි මඟින් හෙළි වී තිබෙන්නේ සහරාන් විසින් සංවිධානය කරන ලද වැඩමුළුවලදී ISIS සංවිධානය සම්බන්ධයෙන් හා ඔවුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කර ISIS සංවිධානය විසින් ගෙන යන ව්‍යාපාරය නිවැරදි බවට පිළිගෙන ඇති අතර, එවැනි

වැඩමුළුවල අන්තවාදී දේශනා පවත්වා ඇත. 9 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙන් ISIS සංවිධානය ජිහාද් සංකල්පය පිළිබඳව සාකච්ඡා කළ බවත් පිළිගෙන ඇත. කෙසේ වුව ද එම සංවිධාන සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා එලෙස සාකච්ඡා වූ බවත් ඔහු පවසයි. කෙසේ වුව ද එලෙස සාකච්ඡා වුණු වැඩසටහන් වලදීද, වැඩමුළුවලදීද අවි ආයුධ සම්බන්ධ පුහුණු, පිහිවලින් පහර දීම සම්බන්ධ පුහුණු වැනි පුහුණුමාලාවක් පවත්වා ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එකී පසුබිම තුළ ජාත්‍යන්තර වශයෙන් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර, තහනම් කර ඇති එනම්, ISIS සංවිධානය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා පමණක් එවැනි දේශනා පැවැත් වූ බවට 09 වන චූදිත කරන ලද ප්‍රකාශය කිසිසේත් පිළිගත නොහැකිය. ඒ අනුව ඉහත කී පසුබිම තුළ මෙම 09 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය විශ්වාසනීයත්වයෙන් තොර, පසු සිතුවිල්ලක් මත පමණක්ම සූදානම් ව මෙම ප්‍රකාශය සිදු කර ඇති බවට පැහැදිලිව අපහට පෙනී යන පසුබිම තුළ එකී ප්‍රකාශය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

10 වූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමද් සාෆි විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

මෙම චූද්ත පවසා ඇත්තේ තමා අනුරාධපුර තල්ගහවැව ප්‍රදේශයේ දුප්පත් පවුලක 1973 මාර්තු 18 වන දින උපත ලැබූ බවත්, තමා තල්ගහවැව මුස්ලිම් විද්‍යාලයේ 8 වන ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලබා ඇති බවත් පසුව තම පියා විසින් තමාව පුත්තලම මදුරන්කුලිය නල්ලමිතලුව ප්‍රදේශයේ අරාබි පාසලකට ඇතුළත් කරන ලද බවත්, එහි මවුලවිවරයා අසනීප වීම හේතුවෙන් මාස අටකට පමණ පසු තමා ඉන් ඉවත් වුන බවත් පවසා ඇත. පසුව කල්පිටිය රහ්මානියා මද්රසා පාසලේ වසර තුනක් සහ පුත්තලම කාසිනියා අරාබි විද්‍යාලයේ වසර තුනක් ආගමික අධ්‍යාපනය ලැබුවත් එය සම්පූර්ණ කිරීමට ඔහුට නොහැකි වූ බවත් ය. පසුව පුත්තලමේ කුඩා පල්ලිවල ළමුන්ට කුරාන් අධ්‍යාපනය ලබා දුන් ඔහු, 2001 ජූනි 29 දින යාපනයේ සිට පැමිණි සරණාගත කාන්තාවක සමඟ විවාහ වූ බවත් පසුව සිය සහෝදරයෙකු වන අබ්දුල් කුද්දුස්ගේ කඩයේ සේවය කළ ඔහු, ආදායම ප්‍රමාණවත් නොවීම නිසා හෝටලයක් පවත්වා ඇති අතර එයද අසාර්ථක වීමෙන් පසු වයරින් සහ විදුලි කාර්මික වැඩවල නිරත වූ බවත් පවසා ඇත. එම කුලියද ප්‍රමාණවත් නොවීම නිසා නැවත උපන් ගමට පැමිණ පියා සමඟ ගොවිතැන් කළත් ඉන් නිසි ලාභයක් නොලැබුණු අතර, පසුව මහරාගම ප්‍රදේශයෙන් ළමා ඇඳුම් ගෙනවිත් විවිධ පොළවල්වල වෙළඳාම් කලද එයද අසාර්ථක වූ බවත් 2007 වර්ෂයේදී

පමණ අක්කරෙයිපත්තු ප්‍රදේශයේ සුනාමි නිවාස යෝජනා ක්‍රමයේ වැඩ ඇති බව දැනගත් ඔහු එහි යාමට බලාපොරොත්තු වූ නමුත්, ඔහු ගමන් ගත් බස් රථයේ ඇති වූ කාර්මික දෝෂයක් හේතුවෙන් කාත්තණ්කුඩි ප්‍රදේශයෙන් බැසීමට සිදුවී ඇත. එහිදී, අබ්දුල් කුද්දූස් විසින් ලබා දුන් ඔහුගේ බෑණනුවන් වන අබ්දුල් රවුෆ්ගේ (නඩුවේ 17 වන චූදිත) නිවස සෑදීමේ මේසන් වැඩ ඔහුට ලැබුණු අතර, ආගමික වත්පිළිවෙත් සඳහා පල්ලියක් විමසූ විට අබ්දුල් රවුෆ් ඔහුව දාරුල් අදර් පල්ලියට යොමු කල බඅවත් පවසා ඇත. එම පල්ලිය මඟින් සිදු කරන ලද ශ්‍රමදාන, ලේ දන්දීම්, දුප්පතුන්ට උදව් කිරීම් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීම් වැනි සමාජ සත්කාරයන් නිසා ඔහු ඊට ආකර්ෂණය වී ස්වේච්ඡාවෙන් ඊට දායක වී වූ බවත් එම අවධියේ දාරුල් අදර් පල්ලියේ ප්‍රධානියා ලෙස කටයුතු කල සහරාන් මවුලවි ඔහුව හඳුනා ගැනීමට තමාට හැකි වූ බව පවසා ඇත. 2015 වසරේදී මේසන් වැඩ අවසන් වූ පසු, ඔහු වයරින් සහ විදුලි කාර්මික වැඩ දන්නා නිසා බිරිඳ සහ දරුවන් සමඟ කාත්තණ්කුඩියේ කුලී නිවසක පදිංචි වී ඇති අතර එහිදී NTJ නමින් සංවිධානයක් ලියාපදිංචි කර සහරාන් මවුලවි විසින් විවිධ සමාජ සේවා සිදු ල බවත් ආරම්භක කාලයේදී සහරාන් මවුලවි සහ NTJ සංවිධානය කිසිදු ජාති හෝ ආගම් භේදයකින් තොරව පොදු සමාජ සේවාවල නිරත වූ අතර, 2008 දී කරබලා ප්‍රදේශයේ පොලිස් මුරපොළක් සෑදීමට වැලි කොට්ට අදිමින් උදව් කිරීම, මල්වාන ප්‍රදේශයේ ගංවතුරින් විපතට පත් සිංහල ජනතාවට සහන සැලසීම මෙන්ම යාපනයේ

සිසුවියක වූ විද්‍යා දූෂණය කර ඝාතනය කිරීමට එරෙහිව මඩකලපුවේදී දෙමළ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්ද පැවැත්වූ බවත් මෙම සියලු කටයුතු නගර සභාවේ සහ පොලිසියේ අනුමැතිය ඇතිව සිදු කල බවත් එකල නැඟෙනහිර පළාතේ ත්‍රිවිධ හමුදා අණ දෙන නිලධාරී කොඩිප්පිළි මහතාද මොවුන් සමඟ සාකච්ඡා පවත්වා ඇති බවත් හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්ව සිටි සමයේ පැවති රැස්වීමකටද NTJ සංවිධානයට ආරාධනා කර ඇති බැවින් එය නීති විරෝධී හෝ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ඔවුන් නොදැන සිටි බවත් රජයට එරෙහි කිසිදු ක්‍රියාවකට සම්බන්ධ වී නොමැති බවත් පවසා ඇත. කෙසේ වෙතත්, 2017 මාර්තු මස කාත්තණ්කුඩි පොලිස් අනුමැතිය ඇතිව සංවිධානය කල මත්ද්‍රව්‍ය විරෝධී සම්මන්ත්‍රණයකට බදුරියා පල්ලියේ අබ්දුල් රවුෆ් මවුලවිගේ අනුගාමිකයන් විසින් ගල් ප්‍රහාර එල්ල කර එය කඩාකප්පල් කිරීමට උත්සාහ දැරූ බවත් එහිදී ඇති වූ ගැටුමෙන් පසු, පොලිසිය විසින් නිසි පරිදි අවසර ලබාගත් NTJ සංවිධානයේ පිරිස් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කල බවත් මෙම සිදුවීමෙන් පසු කාත්තණ්කුඩියේ පදිංචිය අතහැර දැමූ තමා පුත්තලම පාලවිය ප්‍රදේශයේ කුලී නිවසකට පවුල සමඟ පදිංචියට ගිය බවත් 2017 ඔක්තෝබර් මාසයේදී කොළඹට වයරින් බඩු ගැනීමට පැමිණි අවස්ථාවක තමාට හස්තූන් හමුවී හස්තූන් සිය මිතුරෙකු වූ මුබාරක් සමඟ එක්ව සපත්තු/බාටා ව්‍යාපාරයක් කරන බවත්, ඒ සඳහා කොච්චිකඩේ

දළුවකොටුව ප්‍රදේශයේ නිවසක් කුලියට ගැනීමට ලතීෆ්ගේ සහය පැතූ බවත් පවසා ඇත. ස්ථීර රැකියාවක් නොමැති වීම නිසා තමා ඔවුන්ට උදව් කිරීමට එකඟ වූ බවත් 2017 ඔක්තෝබර් 10 වන දින හස්තූන්ගේ නමින් එම නිවස කුලියට ගන්නා ගිවිසුමට සාක්ෂිකරුවෙකු ලෙස අත්සන් තැබූ බවත් පසුව 2018 මාර්තු 17 වන දින, මුබාරක්ගේ ව්‍යාපාරික කටයුතු සඳහා ගබඩාවක් ලෙස භාවිත කිරීමට මල්වාන ප්‍රදේශයෙන් නිවසක් කුලියට ගැනීමට තමා උදව් කල බවත් නිවෙස් හිමියාගේ ඉල්ලීම මත එම ගිවිසුමට තමා සහ මුබාරක් යන දෙදෙනාගේම නම් ඇතුලත් කල බවත් මෙහි මාසික කුලී මුදල් මුබාරක් විසින් තමාට ලබා දුන් පසු තමා එය නිවෙස් හිමියන්ට ගෙවා ඇති බවත් මේ සඳහා තමාට කුලී මුදලක් ලැබුන බවත් පවසා ඇත.

පසුව 2018 ඔක්තෝබර් මාසයේදී හස්තූන්ගේ රෝගී ඥාතියෙකු නතර කර තැබීම සඳහා කොච්චිකඩේ දළුවාකොටුව ජනපද මාවතේ නිවසක් කුලියට ගැනීමට උදව් කල බවත් එහිදී හස්තූන්ගේ හැඳුනුම්පත දෙමළ භාෂාවෙන් තිබීම නිසා තමාගේ සිංහල භාෂාවෙන් වූ හැඳුනුම්පත ගිවිසුමට ඇතුළත් කර හස්තූන් සාක්ෂිකරුවෙකු ලෙස අත්සන් කල බවත් මෙම නිවාස තුන ලබා ගැනීමට තමා උදව් කළේ හස්තූන් කලින් හඳුනන නිසා සහ තමාට ස්ථීර රැකියාවක් නොතිබූ නිසා ලැබුණු කුලී ආදායම වෙනුවෙන් මිස වෙනත් කිසිදු සාපරාධී චේතනාවකින් නොවන බවත් පවසා ඇත.2019 ජනවාරි මස "වීරකේසිරි" පුවත්පතේ දැන්වීමක්

මාර්ගයෙන් තමා කොළඹ වන් ගෝල්ෆේස් (One Galle Face) ආයතනයේ චීන සමාගමක විදුලි කාර්මිකයෙකු ලෙස ස්ථීර රැකියාවක් ලබාගත් බවත් පසුව ඇති වූ ආර්ථික අපහසුතා මධ්‍යයේ, සිය කුඩා දරුවන් හත්දෙනාගේ උත්සව ඇඳුම් ආදී අවශ්‍යතා පියවා ගැනීම සඳහා තමා කොළඹ ජාතික රෝහල ඉදිරිපිට ගොඩනැගිල්ලක රාත්‍රී සේවයේද නිරත වෙමින් දිවා රෑ වෙහෙස මහන්සි වී වැඩ කල බවත් 2019 අප්‍රේල් 21 වන දින බෝම්බ ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ තමා වන් ගෝල්ෆේස් හි භූගත කොටසේ වැඩට සූදානම් වෙමින් සිටි බවත් ශැංග්‍රිලා හෝටලයේ ගින්නක් ඇති වූ බව පවසමින් ආරක්ෂක අංශ විසින් තමාලාව එම ස්ථානයෙන් ඉවත් වූ බවත් දින තුනකට පසුව මෙම ප්‍රහාරය සහරාන්ගේ කණ්ඩායම විසින් සිදු කල බව තමා දැනගත් නමුත්, තමාට ඒ සමඟ කිසිදු සම්බන්ධයක් නොතිබූ නිසා බියක් නොමැතිව දිගටම ජාතික රෝහල ඉදිරිපිට ගොඩනැගිල්ලේ රාත්‍රී රැකියාවේ නිරත වූ බවත් පවසා ඇත.අප්‍රේල් 27 වන දින මැදවච්චි අපරාධ අංශයේ ස්ථානාධිපති රංජිත් නිලධාරියා දුරකථනයෙන් කල දැනුම්දීමකට අනුව, තමා පසුදින නිවසට පැමිණි බවත් එහිදී මැදවච්චි පොලිසිය විසින් තමාව අත්අඩංගුවට ගන්නා ලද බවත් අත්අඩංගුවට ගැනීමට හේතුව පැහැදිලි නොකර, ගැබිනියක වූ තමාගේ බිරිඳ සහ දරුවන් ඉදිරිපිටදීම අත්මාංචු දමා රැගෙන ගොස් දින තුනක් ප්‍රශ්න කර පසුව අනුරාධපුර බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාරගත කල බවත් එහි මාස එකහමාරක් සිටියදී, 2019 ජූනි 10 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු (CID)

නිලධාරීන් වන නන්දලාල් සහ වීරසිංහ විසින් ඔහුව භාරයට ගෙන නිවසට රැගෙන ගොස් නැවත එන අතරතුර, **"ත්‍රීමා" දුරකථනයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් පොල්ලකින් පහර දී අත කඩා දැමූ බවත්** පසුව වව්නියාවේ අවන්හලකදී දැඩි වේදනාවෙන් රාත්‍රිය ගත කල දින පහක් හයක් යනතුරු කිසිදු වෛද්‍ය ප්‍රතිකාරයක් ලබා නොදී, පසුව මීගමුවේ තොටළඟ වෙද මහත්වරුන් වෙත රැගෙන ගොස් පත්තු බැඳීමට පොලිසිය කටයුතු කල බවත් පවසා ඇත. කෙසේ වෙතත් අධිකරණයේදී නිලධාරීන් විසින් එවැනි පහරදීමක් සිදු නොවූ බවට අසත්‍ය සාක්ෂි දුන් බවත් පවසා ඇත. එඩේරමුල්ල නිවසකට තමා රැගෙන ගිය බවට ඩයස් මහතා දුන් සාක්ෂියද තමා ප්‍රතික්ෂේප කරන බවත් තමා එවැනි නිවසක් කොහේදැයි නොදන්නා බවත් තමා වෛද්‍ය ප්‍රතිකාර සඳහා රැගෙන යන අතරතුර නිලධාරීන් දෙදෙනෙකු බස්සවා ගියේ එම නිවස අසලින් විය හැකි බවත් ඔහු පවසයි. මේ වන විට වසර 7 ½ ක කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින බවත් තමාට විරුද්ධව ඇති 07 වන සහ 16 වන චෝදනා සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් අධිකරණයට ඉදිරිපත් වී නොමැති බවත් තමා එම චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත් චූදිත පවසා සිටින ලදී. තමා කුලියට ගත් බව කියන දළුවා කොටුව නිවස ප්‍රහාරයට වසර 1 ½ කට පෙරද, මල්වාන නිවස වසරකට පෙරද, ජනපද මාවත නිවස මාස 6 කට පෙරද ලබාගත් ඒවා වන අතර ගිවිසුම් කාලය අවසන් වූ පසු පළමු නිවාස දෙක නැවත භාර දී ඇති බව චූදිත පවසා සිටී. ප්‍රහාරය එල්ල කල හස්තූන්

අවසන් වරට පිටත්ව ගොස් ඇත්තේ වෙනත් නිවසක සිට බවත් තමා ලබා දුන් නිවෙස්වලින් කිසිදු පුපුරන ද්‍රව්‍යයක් හෝ නීති විරෝධී ද්‍රව්‍යයක් සොයා ගෙන නොමැති බවත් එම නිවාසවල කිසිදු නීති විරෝධී ක්‍රියාවක් සිදු නොවූ බවට නිවාස හිමියන් සහ අසල්වැසියන්ද සාක්ෂි දී ඇති බවත් ජනපද මාවත නිවසේ තිබූ තමාගේ ඇඟිලි සලකුණු මාස 6 ක් හෝ 7 ක් පැරණි එකක් බව සාක්ෂි මඟින් තහවුරු වී ඇති බවත් කුලී ගෙවීමට සහ පිරිසිදු කිරීමට එම නිවාසවලට විටින් විට ගිය නිසා එම සලකුණු තැබී ඇති බවත් චූදිත පවසා ඇත. තමාට මෙම කුරිරු ප්‍රහාරය පිළිබඳ කිසිදු පූර්ව දැනීමක් නොමැති බවත් තමා කිසිදු කුමන්ත්‍රණයක් සිදු කර නොමැති බවත් තමා විසින් සිදු කළේ හඳුනන අයට උදව් කිරීමක් පමණක් බවත් චූදිත පවසා ඇත.

<u>විශ්ලේෂණය</u>

මෙම විත්තිකරුගේ ප්‍රකාශය සමස්තයක් ලෙස විශ්ලේෂණය කිරීමේදී ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මඟින් මෙම නඩුවේ ප්‍රධානතම සිද්ධිය වන 2019.04.21 වන දින ස්වයංඝාතක බෝම්බය පුපුරුවා ගත් සහරාන්, හස්තූන් සහ මුබාරක් යන අය සමඟ එක්ව කටයුතු කළ බව පිළිගෙන ඇත. එහිදී ඔහුගේ පැහැදිලි කිරීම වන්නේ තමාට එම කාලයේදීත් රැකියාවක් නොමැති වීමත්, ආර්ථික අපහසුතාවයන් නිසාත් එසේ උදව් කිරීම මඟින් ලැබුණු කුලී ආදායම මත පදනම්ව එය කළ බවත්, කිසිදු සාපරාධී චේතනාවකින් කටයුතු නොකළ බවත් ය. නමුත්

ඉහතින් සාරාංශගත කොට විශ්ලේෂණය කර දක්වා ඇති සාක්ෂි මඟින් එසේ කුලියට ලබා ගත්තේ යැයි කියනු ලබන සෑම නිවසක්ම 2019.04.21 වන දින සිදු කරන ලද ස්ථාන කීපයකදී මරාගෙන මැරෙන බෝම්බ පිපිරීමේ ක්‍රියාවලියට සක්‍රීයව භාවිතා කර ඇති බව එම නිවාසවල අයිතිකරුවන් විසින්ද මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් රජයේ රසපරීක්ෂක නිලධාරීන්ගේ සාක්ෂිවලින්ද, අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන්ගේ (SOCO) සාක්ෂිවලින්ද ඉතා පැහැදිලිව ඉදිරිපත් වී ඇත.

විශේෂයෙන්ම 2019.04.21 වන දින කොළඹ ෂැංග්‍රිලා හෝටලය, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, කොළඹ කිංග්ස්බරි හෝටලය, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් හෝටලය, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මඩකලපුව සියෝන් දේවස්ථානය යන සෑම ස්ථානයකින්ම සොයාගන්නා ලද පශ්චාත් පිපිරුම් ආවරණවලට අදාල වන අමුද්‍රව්‍ය ඉහතින් ඔහු විසින් කුලියට ලබා ගැනීමට උදව් වූයේ යැයි කියනු ලබන නිවාසවල තිබී සොයාගෙන තිබීමත්, විශේෂයෙන්ම බැහැර කිරීමට නොහැකි ලෙස මෙම අධිකරණයට ඉදිරිපත් වී ඇති වැදගත් විද්‍යානුකූල සාක්ෂියක් වන ඇඟිලි සලකුණු වාර්තාව අනුව ප්‍රධානතම ආරක්ෂිත නිවාසයක් ලෙස සලකුණු කෙරූ සහ ඉහතින් විශ්ලේෂණාත්මකව පැහැදිලි කර ඇති ජනපද මාවත දළුවාකොටුව රිදීවැලි පාරේ අංක 394 දරන නිවාසයෙන් 10 වන චූදිතගේ ඇඟිලි සලකුණු සොයාගෙන තිබීමත්, යන කරුණුද මල්වාන නිවාසය කුලියට ගැනීමට 10

වන විත්තිකරු ලෙස ඔහු සහාය වීමක් නොව පැ.822 දරන අංක 1752 දරන ඔප්පුව ප්‍රකාරව ඔහු එය කුලියට ගැනීමේ එක් පාර්ශවකරුවෙකු වශයෙන් කිංග්ස්බරි හෝටලයට මරාගෙන මැරෙන ප්‍රහාරය එල්ල කළ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් සමඟ එක්ව කටයුතු කිරීම යන කරුණු සැලකිල්ලට ගැනීමේදී මෙම චූදිත විසින් සත්භාවයෙන් නිවාස කුලියට ගැනීම සඳහා උදව් උපකාර කළ බවට වන ප්‍රකාශය කිසිසේත්ම පිළිගැනීමට නොහැකිය.

ඒ අනුව සහරාන් ඇතුළු පිරිස විසින් ක්‍රියාත්මක කරන ලද සැලසුම් සහගත කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස 2019.04.21 දින සිදුවූ ප්‍රහාර මාලාව සිදුවීමම ඔහු දැන නොසිටියේය යන ප්‍රකාශය පිළිගත නොහැක.

එසේම මෙම 10 වන චූදිතගේ ක්‍රියාශීලි දායකත්වය 11 වන චූදිත විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයේදීත් මෙසේ සඳහන් කර ඇත.

<u>පැ.168(7)</u>

“ මේ පුහුණුවට මොහොමඩ් සහරාන්, ජමීල්, කටුවාපිටියේ මරාගෙන මැරුනු හස්තූන් සහ දැනට අත්අඩංගුවේ අරන් ඉන්න සහරාන්ගේ රියදුරු සාෆි, මාවනැල්ලේ ආබිදීන්, නවුෆර් මවුලවී, මිල්හාන්, අන්කම් අක්‍රම්, උමෙර්, හසන් සවාහිර්, මොහොමඩ් ඉන්ෆාස්, මීගමුවේ හිලාම්, ඉන්සාත්, අන්මද්, මොහොමද් සශ්නි, අන්මද්, මොහොමද් ෆස්හාන්,

මොහොමද් ආසීන් යන අය ආවා. මේ පුහුණුවට සහරාන් විසින් එවලා තිබුණු වෑන් එකෙන් අපි අරුප්පලට ගියා. පසු දින උදේ සිට දේශණා ආරම්භ කළා. සහරාන් විසින් ISIS සංවිධානයට සම්බන්ධ වීඩියෝ ඉදිරිපත් කරමින් දේශණා කළා. නවුෆර් මවුලවි විසින් ඉස්ලාම් ඉතිහාසය හා ෂරියා නීති ගැන දේශණා කළා. හස්තූන් විසින් ජංගම දුරකථන හා කොම්පියුටර් භාවිතයේ දී යොදා ගත යුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග ඉගැන්නුවා.''

<u>පැ.168 (09)</u>

'' මේ පුහුණුවේ දී රැඳී සිටි 2 වන දින රාත්‍රියේ එක්, එක් අයට තනි, තනිව සහරාන් කථා කළා. මගේ දුරකථන අංකය වන 07666355229 ලබා ගත්තා. මට පවරන වැඩ පසුව දැනුම් දෙන බව සහරාන් කිව්වා. ඒ අනුව 2018 ජූලි මාසයේ පමණ සහරාන් මට දුරකථනයෙන් කථා කර මාවනැල්ල කාගිල්ස් ෆුඩ් සිටි ලඟට පැමිණෙන ලෙසට දැනුම් දුන්නා. එතනට සහරාන්ගේ රියදුරු සාෆි සුදු පාට වෑන් රථයක් රැගෙන එම ස්ථානයට ආවා. මම පසුව දැන ගත් දැනට අත්අඩංගුවේ ඉන්න ආබ්දීන්ගේ නිවසට එක්ක ගියා. එහි යන විට සහරාන්, මිල්හාන්, සහරාන්ගේ මල්ලි සායින්දමරුදුවල මරාගෙන මැරුනු රිල්වාන්, සාෆි, නවුෆර් මවුලවි යන අයත් ඇවිත් සිටියා. මට අලුතින් මිළ දී ගත් සැම්සුන් J2 වර්ගයේ ස්මාර්ට් ජංගම දුරකථනයක් ලබා දී එහි Threema සහ Locker යන ඇප් දාලා දුන්නා. සිම් පතක් ඇතුළත් කර එම අංකයෙන් දුරකථන ඇමතුම් ලබා

නොගන්නා ලෙසට දන්වා සිටියා. කොළඹට ඇවිත් සහරාන්ගේ දැනුම් දීම මත කුලියට ගැනීම සඳහා ගෙවල් හෙව්වා.''

ඉහත උපුටා ගැනීම් මගින් ඔහු විසින් විත්තිකූඩුවේ සිට පවසන ලද කරුණු සත්‍ය නොවන බව පෙනී යයි.

මෙම චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී හස්තූන්ගේ රෝගී ඥාතියෙකු නතර කර ගැනීම සඳහා කොච්චිකඩේ දළුවාකොටුව ජනපද මාවතේ නිවසක් කුලියට ගත් බව කියා සිටිය ද ඔහු මෙම ඥාතියා කවුද, ඔහුගේ රෝගී තත්ත්වය කුමක්ද යන්න අධිකරණයට කියා සිටින්නේ නැත. නමුත් මෙම රෝගියා ලෙස හඳුන්වන තැනැත්තා මෙම අධිචෝදනා පත්‍රයේ 09, 10, 11 යන චෝදනාවන්හි සඳහන් කාත්තන්කුඩිය ඔල්ලිකුලමදී පිපිරුම් උපක්‍රමයක් පුපුරුවා හැර අත්හදා බැලීමට ගොස් තුවාල ලැබූ මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් බව 11 වන චූදිත කාලිද් සමීර් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයේදීත් මෙසේ සඳහන් කර ඇත.

<u>පැ.168 (13)</u>

''මේ කාලයේ දීම එනම් 2018 අවසන් කාලයේ සහරාන් මට නැවත කුලියට ගෙයක් සොයන්න කියලා කීවා. මම ඉක්මන් ඩොට් එල්කේ මගින් ගාමිණි යන අය සම්බන්ධ කර ගෙන මීගමුව ජනපද මාවතේ තිබෙන ගෙයක් පිළිබඳව විස්තර අරන් සහරාන්ට දුන්නා. මෙහෙම ඉන්න කොට

මිල්හාන් එකවරම මරදාන පුංචි පල්ලිය ලඟට එන්න කියලා මම ගියා. ඒ යන විට මිල්හාන් සමග සහරාන්ගේ රියදුරු සාෆි ඇවිත් සිටියා. සහරාන්ගේ මල්ලි වන රිල්වාන් බෝම්බයක් හදන්න ගිහින් තුවාල වුණ බවත් කොළඹ ජාතික රෝහලේ නතර කර තිබෙන බවත් කීවා. මේ සියලුදෙනාම ජාතික තෞහීඩ් ජමාඩ් සංවිධානයේ සාමාජිකයන් බව මම දන්නවා. මේ වන විට ගෆූර් මාමා ද කොළඹට ඇවිත් සිටියා. ඔහුත් සමග මම සම්බන්ධ වී රිල්වාන්ට අවශ්‍ය උපකාර කළා. මේ සිද්ධිය හේතුවෙන් මීගමුව ගෙදර කුලියට ගැනීම ඉක්මන් වුණා. ''

ඒ අනුව පැහැදිලිව පෙනීයන්නේ මෙම චූදිතගේ වරදකාරීත්වය ඔප්පු කිරීම සඳහා පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද විශ්වාසනීයත්වයෙන් යුතු සහ ප්‍රබල සාක්ෂි මඟහැරීම සඳහා මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට යම් උත්සාහයක් දරා ඇති බවත් පෙනී යන අතර ඒ අනුව අප විසින් ඉහතින් සඳහන් කර ඇති හේතූන් වලට යටත්ව මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

11 වන චූදිත හුසේනුල් රිස්වා කාලිද් සමීර් යන අය විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය විශ්ලේෂණය

11 වන චූදිත විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කර ඇති අතර, එම ප්‍රකාශයේ ඔහු සඳහන් කර ඇත්තේ, 2019 අප්‍රේල් 28 වන දින ඔහුව

අත්අඩංගුවට ගත් බවත්, දැනට වසර 07 කට වැඩි කාලයක් බන්ධනාගාර ගත වී සිටින බවත්, තමන් විසින් 127 වන වගන්තිය යටතේ ප්‍රකාශය ලබා දුන්නේ රජයේ සාක්ෂිකරුවෙකු කරන බවට වූ පොරොන්දුවක් මත බවත් එය ස්වාධීන සාක්ෂිකරුවෙකු වන ජවුෆර් සාදික් ද තහවුරු කර ඇති බවත් මෙම චූදිත පවසා ඇත. මෙම නඩුවට අදාළ විමර්ශනය සිදුවන අවස්ථාවේදී විමර්ශන නිළධාරීන් විසින් තමාගෙන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 16(1) වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා ගත් බවත් ඔහු පවසා ඇත.

තවද, දළුවකොටුව, ජනපද මාවතේ පිහිටි නිවස කුලියට ගැනීමට තමා උදවු කළ බවට කිසිදු සාක්ෂියක් හෙළි වී නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් ගාමිණි යන අයගේ සාක්ෂිය පිළිගත නොහැකි බවත්, එම නිවස කුලියට ගැනීමට උදව් කළ බවට තිබෙන චෝදනාව තමා ප්‍රතික්ෂේප කරන බවත් මෙම චූදිත පවසා ඇත.

තවදුරටත් 11 වන චූදිත පවසා සිටියේ, නුවර, අරුජ්පොල හෝ වෙනත් කිසිදු ස්ථානයක අවි පුහුණුව ලබා ගැනීම හෝ දේශනා වලට සහභාගී වීමක් සිදු කර නොමැති බවත්, එය සනාථ කිරීම සඳහා කිසිදු ස්වාධීන සාක්ෂියක් මෙම අධිකරණයේ හෙළි වී නොමැති බවයි. 11 වන චූදිත තවදුරටත් කියා සිටියේ, තමා ඇතුළු සැකකරුවන් 16 දෙනෙකු ට්‍රොපිකල් - ඉන් හෝටලයේ ප්‍රහාරයට හෝ වෙනත් ප්‍රහාරයන්ට

සම්බන්ධ නොමැති බවට ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ නිළධාරීන් විසින් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර එම සැකකරුවන් සම්බන්ධයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ වෙනම නඩු පවරන බවට පවසා ඇති බවත් ය. තමාට එරෙහිව ඉදිරිපත් වී තිබෙන සියළුම චෝදනා ප්‍රතික්ෂේප කරන 11 වන චූදිත ඔහුව මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙසට අධිකරණයෙන් ඉල්ලා ඇත.

<u>විශ්ලේෂණය</u>

ඉහත ප්‍රකාශය විශ්ලේෂණාත්මකව පරීක්ෂා කර බැලීම 11 වන චූදිතව මෙම නඩුවට අදාළ විමර්ශනයේදී ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය මඟින් 2019.04.28 වන දින අත්අඩංගුවට ගෙන ඇත. ඉන්පසු ඔහු විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16(1) වන වගන්තිය යටතේ සහ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේදීද අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා දී ඇති අතර, එම ප්‍රකාශයන් 11 වන චූදිත විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙන ලද ප්‍රකාශ බවට මෙම අධිකරණය විසින් තීරණය කර ඇත. එම ප්‍රකාශ දෙකෙහිදීම ඔහු විසින් නුවර අරුප්පොල ප්‍රදේශයේ වැඩමුළුවකට සහභාගී වූ බවට පවසා ඇති අතර, එම වැඩමුළුව පැවැත්වූ ආකාරය සහ එයට සහභාගී වූ පුද්ගලයන් සම්බන්ධව දීර්ඝ විස්තරයක්ද ලබා දී ඇත.

දළුවකොටුව, ජනපද මාවතේ පිහිටි ආරක්ෂිත නිවස මෙම නඩුවේ 10 වන චූදිත විසින් කුලියට ලබා ගෙන ඇති අතර, එලෙස කුලියට ලබා ගැනීමට 11 වන චූදිත සහභාගී වී ඇත. ඒ අවස්ථාවේදී රෝගියෙකු නැවැත්වීම සඳහා එම නිවස කුලියට ලබා ගැනීමට අවශ්‍ය බවට 11 වන චූදිත පවසා ඇති අතර, ඒ සම්බන්ධව පැ.සා.2256 ගාමිණී ප්‍රේමශාන්ත යන අය මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇත.

11 වන චූදිත විසින් පවසා ඇත්තේ, තමා ඇතුළු තවත් 16 දෙනෙකුට නිව් ට්‍රොපිකල් ඉන් හෝටලයේ සිදුවූ බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් කිසිදු සම්බන්ධයක් නැති බවට නීතිපති දෙපාර්තමේන්තුවේ ඉහළ නිළධාරියෙකු සමඟ කරන ලද සාකච්ඡාවකදී ලැබූ උපදෙසක් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ගොස් බී වාර්තාවක් ගොනු කරමින් මෙම 11 වන චූදිතගේ නමද මෙහි සඳහන් කර 11 වන චූදිතද ට්‍රොපිල් ඉන් නවාතැන්පලේ සිදුවූ බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ බවට කරුණු හෙලි වී නොමැති බවද වාර්තා කර ඇතද එලෙස කරුණු වාර්තා කිරීම සිදු කර ඇත්තේ, මෙම නඩුවට අදාළ සිද්ධි මාලාව සම්බන්ධයෙන් සමස්ත ලෙස කරුණු අධ්‍යයනය කිරීමකින් තොරව බවට පෙනී යන අතර, කෙසේ වෙතත් මෙම අධිකරණය කටයුතු කරන්නේ හුදෙක් එවැනි බී වාර්තාවක අඩංගු හුදු කරුණු මත රඳා පවතිමින් නොව මෙම අධිකරණය ඉදිරියේ දිවුරුම් පිට සාක්ෂිකරුවන් විසින් ලබා දුන් සත්‍යවී සාක්ෂි මනාව විශ්ලේෂණය කර බැලීම තුළින් වන අතර, ඒ අනුව අප විසින් ඉහතින්

විස්තරාත්මකව සඳහන් කර ඇති හේතූන් වලට යටත්ව මෙම 11 වන චූදිත විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගත නොහැකි, පසුව මනාව සිතා බලා, ඔහුට එරෙහිව එල්ල වී ඇති බරපතල චෝදනාවන්ගෙන් ගැලවී යාම සඳහා සිදු කර ඇති හුදු ප්‍රකාශයක් බවට ඒකමතිකව තීරණය කරමු. ඒ අනුව එකී ප්‍රකාශය පිළිගැනීම මත ප්‍රතික්ෂේප කරමි.

12 වන චූදිත වන මොහොමඩ් සවාහීර් මොහොමඩ් හසන් විත්තිකූඩුවේ සිට සිදුකරන ලද ප්‍රකාශයේ සාරාංශය

12 චූදිත වන මොහොමඩ් ස්වාහීර් මොහොමඩ් හසන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් පවසා ඇත්තේ අවු. 25දී තමාව අත්අඩංගුවට ගත් බවත් මුකර්මා ජාත්‍යන්තර පාසලෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන අතර තමාට සිංහල යම්තාක් දුරට කතා කිරීමට හැකියාව තිබුණද ලිවීමට හෝ කියවීමට හැකියාවක් නොමැති බවත් තමා විදේශ රැකියා ආයතනයක සේවය කරමින් උපාධිය හැදෑරීමට සූදානම්ව සිටියදී අත්අඩංගුවට පත් වූ බවත් තමාට එරෙහිව සිදු වූ සියලු චෝදනාවන් ප්‍රතික්ෂේප කරන බවත් කියා සිටින ලදි.

එසේම මෙම නඩුවේ සාක්ෂිකරුවන් 500කට අධික ප්‍රමාණයක් සහ නඩුභාණ්ඩ 2000කට වැඩි ප්‍රමාණයක් සලකුණු කළ ද තමාට එරෙහිව සාක්ෂි වශයෙන් ඉදිරිපත් වූයේ උප පොලිස් පරීක්ෂක මධුෂාන් යන

සාක්ෂිකරු පැ. 919 යන තමාගෙන් බලෙන් ලබාගත් පාපොච්චාරණයක් පමණක් බවත් කියා සිටි සාක්ෂිකරු එම පාපොච්චාරණය අධිකරණයෙන් පිළිගැනීමට තමා විරුද්ධ නොවූ නමුත් සහ එය බලෙන් ලබාගත් බවට අධිකරණයේදී ඔප්පු කිරීමට තමාට බැරි වූ නමුත් එම ප්‍රකාශය සම්බන්ධයෙන් තමාට කීමට ඇත්තේ පැ. 919 ප්‍රකාශයේ තමාගේ මුහුණුපොතේ IDඑක Hasan Savaheer බවත් තමා සත්‍ය වශයෙන්ම භාවිතා කරන මුහුණුපොතේ IDඑක Hassan Zawahir බවත් තමා සත්‍ය වශයෙන්ම එම පාපොච්චාරණ ප්‍රකාශය කියවා බලලා තිබුණේ නම්, එම නිවැරදි කිරීම තමා විසින් කර තිබිය යුතු බවත්, නමුත් ප්‍රකාශයේ එය ඒ ආකාරයෙන්ම පවතින බවත් ය. තමාව මල්වාන, අරුප්පල, පානදුර පිහිටි ප්‍රදේශ වෙත රැගෙන ගිය බවටත්, සහරාන් විසින් පවත්වනු ලබන පන්තිවලට තමා සහභාගි වූ බවටත් දෙන ලද සාක්ෂිය තමා ප්‍රතික්ෂේප කරන අතර තමා එවැනි ස්ථානවලට ගිය බව තහවුරු කිරීමට කිසිදු සාක්ෂිකරුවෙකු හෝ විශේෂඥ සාක්ෂිකරුවන්ගෙන් කිසිදු සාක්ෂියක් අනාවරණය නොවූ බවත් , ඇඟිලි සලකුණු, DNA , දුරකතන වාර්තා යන කිසිදු විමර්ශනයකින් තමාට විරුද්ධව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට පැමිණිල්ල අපොහොසත් වූ බවත් කියා සිටිමින් තමා කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවකට හෝ අන්තවාදී ක්‍රියාවකට උපකාරී නොකළ බවත් ප්‍රචණ්ඩත්වයට තමාගේ කිසිදු කැමැත්තක් නොතිබුණු බවත් එවැනි

චේතනාවක් තිබූ බවට තමාට විරුද්ධව කිසිදු සාක්ෂිකරුවෙකු අධිකරණය ඉදිරියේ සාක්ෂි නොදුන් බවත් කියා සිටින ලදි.

තමා අත්අඩංගුවට පත් වූයේ 2019 අප්‍රේල් 27 වන දින නිවසේ දී බවත් එහිදී තමාට මාංචු දමා, ඇස් වසා පහර දුන් බවත් පසුව ඇස් ආවරණ ඉවත් කර තමා අත්අඩංගුවට ගත්තේ හමුදා නිලධාරීන් සහ ඒ වන විට තමා ත්‍රස්ත මර්දන කොට්ඨාසයේ සිටින බව තමා දැනගත් බවත් කියා සිටින ලදි. 2019 අප්‍රේල් 29 වන දින දහවල් 12.20ට තමාව අත්අඩංගුවට ගත් බව කියා සිටියද දහවල් 12 වන විට තමා සිටියේ අධිකරණ වෛද්‍යවරයා භාරයේ සිටි බැවින් තමාව නැවත අත්අඩංගුවට පත් වීමක් සිදු වූයේ කෙසේද යන්න ප්‍රශ්නගත බවත් 2019.11.01 දින වෛද්‍යවරයා වෙත තමා විසින් කියන ලද දේවල් N-7 දරණ ලේඛනයේ වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇති බවත් 2019.04.29 දින තමා ලියාගෙන පැමිණි ප්‍රකාශයකට අත්සන් කිරීම තමා ප්‍රතික්ෂේප කළ අවස්ථාවේදි එදින මධ්‍යම රාත්‍රියේ තමා නිදාගෙන සිටින විට තමා වෙත වතුර වීසි කර පහර දුන් බවත් 2019.05.05 දින ද ප්‍රකාශයකට බලෙන් අත්සන් දමා ප්‍රතික්ෂේප කළ අවස්ථාවේදි තමාට අතපත්තු, මධුෂංක , චතුරංග සහ තවත් දෙදෙනෙකු පහර දුන් අතර ඉන් අනතුරුව එම ලේඛනවලට අත්සන් කිරීම තමා සිදු කළ බවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ ප්‍රකාශයක් නොමැතිව තමාව අත්අඩංගුවට අරගෙන තිබූ අතර තමාට සිදු වූ පහරදීම්, වධහිංසා සම්බන්ධයෙන් තමා රතුකුරුස සංවිධානයට පැමිණිලි

කර තිබූ බවත් 2019.08.01 දින තමාව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B/917/02/19 නඩුවට ඉදිරිපත් කර අතර තමා එහිදී තමාව නිදහස් කරන ලෙසට ඉල්ලා සිටි බවත් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ඉහත නඩුවෙහි 2019.07.31 වන දින ගොනු කරන ලද වැඩිදුර වාර්තාවේදි තමා මෙම සිද්ධීන් සමඟ සෘජුව හෝ වක්‍ර ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවට සඳහන් කර එම නිසා මෙම නඩුවෙන් ඔහුව මුදා හරින ලෙසට ඉල්ලීමක් සිදු කරනු ලැබූ බවත් පවසා ඇත.ඉන් අනතුරුව තමා පළමුව සහකාර පොලිස් අධිකාරි බිම්ෂානි හමු වූ අවස්ථාවේදි තමාට ප්‍රකාශයක් ලබා දීමට නොහැකි බව තමා දැන් වූ විට තමාව සහකාර පොලිස් අධිකාරි බිම්ෂානි සහ සහකාර පොලිස් අධිකාරි සමන් පෙරේරා මහතා සිටි කාමරයට ඉදිරිපත් කළ බවත්, ඉන් අනතුරුව තමාට ඔවුන් විසින් බැන වැදුණ බවත් 2019.11.09 දින තමාව කිසිදු ඉල්ලීමක් නොමැතිව වෛද්‍යවරයා වෙත රැගෙන ගිය බවත් ආපසු පැමිණෙන විට තම පවුලේ අය සිටි අතර ප්‍රකාශයට අත්සන් නොකළහොත් පවුලේ අයව අත්අඩංගුවට ගන්නා බවට තමාට තර්ජනය කළ බවත් එබැවින් එම ප්‍රකාශයට තමා අත්සන් තැබූ බවත් , තමාගෙන් එම ප්‍රකාශය ලබාගත්තේ අත්අඩංගුවට අරගෙන මාස 6කට පසුව බවත් ඔහු කියා සිටින ලදි.වෙනත් පුද්ගලයෙකු විසින් දෙන ලද ප්‍රකාශයක් මත පමණක් තමාව අත්අඩංගුවට ගෙන තිබුණද තමා මෙම කිසිදු සිද්ධියකට

හෝ පාස්කු ප්‍රහාරයට හෝ කිසිදු ආධාර හෝ අනුබල නොදුන් බවත් ඒ සඳහා චේතනාවක් නොතිබුණු බවත් ඔහු පවසා ඇත.

විශ්ලේෂණය.

චිත්තිකරු කියා සිටින පරිදිම ඔහුට විරුද්ධව ඇත්තේ ඔහු විසින් දුන්නේ යැයි කියනු ලබන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16(1) වගන්තිය යටතේ වාර්තා ගත වන ප්‍රකාශය සහ පැමිණිල්ලෙන් කැඳවන ලද මධුෂාන් යන නිලධාරියාගේ සාක්ෂිය පමණි. මධුෂාන් යන නිලධාරියා විසින් මෙම සැකකරුව යම්යම් ස්ථානවලට රැගෙන ගිය බව කියා සිටියද ඔහුගෙන් අනාවරණය කර ගත් , ඔහුව වරදකරු කිරීමට ප්‍රබල වන්නා වූ කිසිදු අනුකූල කරුණක් ඉදිරිපත් වී නොමැති අතර යම්යම් ස්ථානවලට රැගෙන යාම පමණක් සිදු කර ඇති බව පෙනෙයි. තවද ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් අනුකූල කරගන්නේද යන්න සම්බන්ධයෙන් පවත්වනු ලබන ශක්‍යතා පරීක්ෂණයකදී අධිකරණය සලකා බලන්නේ එම ප්‍රකාශය බලපෑමකින් , තර්ජනයකින්, පොරොන්දුවකින් තොරව ස්වාධීනව ලබාදී තිබෙන්නේද යන කාරණය යි. නමුත් එම ප්‍රකාශයේ ඇතුළත් කරුණු මතම පිහිටා එම ප්‍රකාශය දෙන තැනැත්තා වරදකරු කිරීමට නොහැකි අතර එසේ වරදකරු කරන්නේ නම් එම ප්‍රකාශයේ ඇතුළත් කරුණුවලින් වරදකාරිත්වය හෙළි වන කරුණු සම්බන්ධයෙන් කරුණු ස්වාධීන සාක්ෂි

මඟින් සනාථ විය යුතු ය. එසේම එම ප්‍රකාශය පාපොච්චාරණයක් විය යුතු අතර එමඟින් ඔහු විසින් යම් වරදක් කළ බව හෝ ඔහුට එරෙහිව ඇති චෝදනාවලට ඔහුව වරදකරු කිරීමට හැකි වන අන්දමේ පිළිගැනීමක් ඔහු විසින් කර තිබිය යුතු ය.

අප විසින් ඉහත නෛතික තත්ත්වය කෙරෙහි අවධානය ලක් කරමින් මෙම 12 වන චූදිත විසින් ලබා දුන් ප්‍රකාශයට අදාළ වන්නා වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය සම්බන්ධයෙන් අප විසින් ඉතා සුපරීක්ෂාකාරීව සහ මනාව අධ්‍යයනය කරන ලද අතර එමඟින් ඔහු විසින් සිදු කළේ යැයි කියන නිශ්චිත වරදක් අනාවරණය නොවන බව අපගේ මතය යි. අප විසින් ශක්‍යතා පරීක්ෂණයක් පවත්වා සැබැවින්ම 12 වන චූදිත ස්වේච්ඡාවෙන් ප්‍රකාශයක් කර තිබේද යන්න සම්බන්ධයෙන් පමණක් අතුරු පරීක්ෂණය අවසානයේදී තීරණයකට එළඹුන අතර, එම ප්‍රකාශය සැබැවින්ම පාපෝච්ඡාරණයක්ද, එසේම එම ප්‍රකාශය තුළින් 12 වන චූදිත විසින් යම් අපරාධයන් සිදු කරන ලද බවට පාපෝච්ඡාරණයන් කර තිබේද යන්න අප සළකා බැලිය යුතුය. එවැනි තත්ත්වයක් යටතේ අනෙකුත් ස්වාධීන සාක්ෂි වලින් ඔහු විසින් වරදක් සිදු කළ බවක් හෝ පාපොච්චාරණ ප්‍රකාශයෙහි සඳහන් යම් ක්‍රියාවක් වරදක් බවට සනාථ වන අන්දමේ පිළිගත හැකි සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති අවස්ථාවක එකී ප්‍රකාශය ස්වේච්ඡාවෙන් ලබාදුන් ප්‍රකාශයක් වුවද ඒ මතම පමණක් පිහිටා යම් චූදිතයෙකු වරදකරු කිරීමේ

හැකියාවක් නැත. 12 වන චූදිත විසින් සිදු කලා යැයි පවසා මෙම අධිකරණය ඉදිරියේ ලකුණු කර ඇති ප්‍රකාශය සැබැවින්ම පාපෝච්ඡාරණයක් ලෙස පෙනී නොයන පසුබිම තුළ සහ එම ප්‍රකාශයේදී 12 වන චූදිත යම් අපරාධමය ක්‍රියාවක් කරන ලද බවට පාපෝච්ඡාරණ ස්වභාවයෙ කරුණු සඳහන් කිරීමක් අප හට පෙනී නොයන පසුබිම තුළ මෙම 12 වන චූදිත විසින් සිදු කළා යැයි පවසන එකී ප්‍රකාශය පාපෝච්ඡාරණමය ප්‍රකාශයක් ලෙසට පෙනී නොයන පසුබිම තුළ එහි වෙනත් චූදිතයින් සම්බන්ධයෙන් යම් යම් කරුණු සඳහන් වී තිබුනද එකී ප්‍රකාශය මෙම නඩුවේ අනෙකුත් චූදිතයන්ට එරෙහිව උපයෝගී කර ගැනීමට නම් පළමුව එම ප්‍රකාශය පාපෝච්ඡාරණමය ප්‍රකාශයක් විය යුතු වීමේ නෛතික අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර, ඒ අනුව පැ. 919 ලෙස ලකුණු කරන ලද 12 වන චූදිත විසින් සහකාර පොලිස් අධිකාරී බිම්සානි ජාසිංආරච්චි යන නිලධාරිනියට ලබා දී ඇති ප්‍රකාශය 12 වන චූදිතට එරෙහිව මෙන්ම මෙම නඩුවේ අනෙකුත් චූදිතයන්ට එරෙහිවද නෛතික වශයෙන් අදාළ කරගත නොහැකි බවට අප තීරණය කරමු. එකී පසුබිම තුළ 12 වන චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි කුමන ස්ථාවරයක් ගත්තද ඔහුට එරෙහිව ඔහු යම් යම් සාපරාධී ක්‍රියාවන් කල බවට සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම පමණක් බවට අප තීරණය කරමි.

13 වන චූදිතයා වන මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්ෂාෆ් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

මෙම චූදිත තමන්ට එරෙහිව ඇති සියලුම චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන අතර, නඩු විභාගයේදී පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් 546 දෙනෙකු කැඳවීම සහ නඩු භාණ්ඩ 2076ක් ලකුණු කිරීම තමන් නිරීක්ෂණය කල බව පවසයි. 11 වන සහ 12 වන චූදිතයන්ගේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රකාශවල හෝ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ කළ ප්‍රකාශවල තම නම සඳහන් වීම ඔහු ප්‍රතික්ෂේප කරයි. විශේෂයෙන්ම, 2017 වසරේ මල්වානේ පැවති සහරාන්ගේ දේශනාවකට හෝ 2018 මාර්තු මාසයේ පැවති දේශනාවකට තමන් සහභාගී වූ බවත්, 2019 වසරේදී කුමන්ත්‍රණය කල බවත් කියන කරුණු ඔහු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලබයි. සහරාන් නැමැති පුද්ගලයා සමඟ තමන්ට කිසිදු පෞද්ගලික සම්බන්ධතාවයක්, ගනුදෙනුවක් හෝ දුරකථන සංවාදයක් නොතිබූ බව ඔහු පවසයි.

ඔහු කොළඹ සහිරා විද්‍යාලයේ උසස් පෙළ දක්වා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ බැවින් තමන්ට හොඳින් සිංහල කතා කිරීමට සහ ලිවීමට හැකි බවත් ප්‍රකාශ කරයි. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා ලබාගෙන ඇති ඔහු, මුල් කාලයේ 'මාවල් කොමස්' ආයතනයේ මෘදුකාංග

ගුණාත්මකභාවය සහතික කිරීමේ ඉංජිනේරුවරයෙකු (SQA Engineer) ලෙසත්, පසුව කටාර් රාජ්‍යයේ තොරතුරු තාක්ෂණ සමාගමකත් සේවය කර ඇත. ඔහු පවසන පරිදි, 2019 අප්‍රේල් 26 වන දින පස්වරු 2:00ට පමණ මුහුණු ආවරණය කරගත් පිරිසක් තම සේවා ස්ථානයට පැමිණ, කිසිදු හේතුවක් නොදන්වා තුවක්කු දික්කර සේවකයන් බලා සිටියදීම ඔහුව අත්අඩංගුවට ගෙන ඇත. ඔහුගේ ඇස් වසා, කළු ආවරණයකින් ඔළුව බැඳ, මාංචු දමා ලොරියක පටවා වෙනත් වාහනයකට මාරු කරමින් යම් ස්ථානයකට රැගෙන ගොස් ඇත. එහිදී ඔහුගේ මිතුරන්, විනෝද චාරිකා, මංගල උත්සව ඇතුළු පෞද්ගලික ජීවිතය ගැන ප්‍රශ්න කර ඇති අතර, අප්‍රේල් 21 වන දින සිදුවීම ගැන ඇසූ විට තමන් ඒ ගැන කිසිවක් නොදන්නා බවත් එම අවස්ථාවේ නිවසේ සිටි බවත් පැවසීම නිසා රළු දේකින් ඔහුගේ හිසට පහර දී ඇත. පසුව 2019 අප්‍රේල් 27 වන දින ඔහුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට (TID) භාර දුන් බවත් එහිදී ඔහුගේ ලැප්ටොප් පරිගණකය, ජංගම දුරකථන දෙක සහ මුදල් පසුම්බිය ඔවුන්ගේ භාරයට ග්ත් බවත් පවස ඇත. ඔහුගේ විමර්ශන නිලධාරියා වූ සැරයන් සිසිර, ඔහුගේ මුදල් පසුම්බියේ තිබූ කීල්ස් ආයතනයේ 'Nexus' වට්ටම් කාඩ්පත විදේශීය බැංකු කාඩ්පතක් යැයි පවසමින් ඔහුට දරුණු ලෙස පහර දී ඇති අතර, පසුව තවත් නිලධාරියෙකු පැමිණ එය බැංකු කාඩ්පතක් නොවන බව වටහා දෙන තෙක් PC මධුශංඛ සහ PC චතුරංග යන

නිලධාරීන් ද ඔහුට පහර දුන් බවත් මෙම චූදිත පවසා ඇත. අත්අඩංගුවට ගැනීමට පෙර සිටම තමන්ට මානසික අවපීඩනය (depression), භීතිකා ප්‍රහාර (panic attacks) සහ අපස්මාරය (epilepsy) තිබූ බවත්, ඒවාට බෙහෙත් ඉල්ලූ විට විමර්ශන නිලධාරියා එය ප්‍රතික්ෂේප කල බවත් පසුව රතු කුරුස සංවිධානයේ (ICRC) ඩන්කන් මහතාගේ මැදිහත් වීමෙන් දින 14කට පසුව පියාට කතා කර ඇඳුම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට ඔහුට අවස්ථාව ලැබුන් බවත් ඔහු පීඩා විඳි අර්ශස් (hemorrhoids) රෝගී තත්ත්වය හේතුවෙන් අධික ලෙස ලේ වහනය වන තෙක් TID නිලධාරීන් ප්‍රතිකාර ලබා නොදුන් අතර, සරමේ ලේ තැවරී තිබෙනු දැක බිය වූ නිලධාරීන් පසුව ඔහුව ජාතික රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබා දී ඇත. මව්පියන් ඔහුව බැලීමට පැමිණි විට, ඔවුන් බිය වේ යැයි සිතා තමන්ට PVC බට සහ කොසු මිටිවලින් පහර දුන් බව ඔහු පැවසුවේ නැති බවත් TID නිලධාරීන් ඔහුගේ මව්පියන්ට නීතිඥයන් හෝ මානව හිමිකම් සංවිධාන වෙත නොයන ලෙස අවවාද කල බවත් පහරදීම් නිසා ඇති වූ දරුණු කොන්දේ අමාරුව හේතුවෙන් කොළඹ ජාතික රෝහලේ රුමැටොලොජී සායනය වෙත යොමු කළ විට, MRI පරීක්ෂණයකින් ඔහුගේ කොඳු ඇට පෙළට හානි වී ඇති බව අනාවරණය වූ බවත් පවසා ඇත. ඔහු පවසන පරිදි, 2018 අගෝස්තු මස (ලේඛනයේ සඳහන් වන පරිදි) ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල අවස්ථාවේදී, බෝම්බ

ප්‍රහාරයට සෘජුව හෝ වක්‍රව කිසිදු සම්බන්ධයක් නැති බැවින් ඔහුව නිදහස් කරන ලෙස TID අධිකරණ අංශයේ බණ්ඩාර මහතා ඉල්ලා සිටියද, වැඩිදුර විමර්ශන සඳහා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය යටතේ කරුණු වාර්තා කිරීමට නියම විය. ඉන් පසුවද මල්ලිව අත්අඩංගුවට ගන්නා බවට සහ ආයුධ පෙන්වීමට රැගෙන ගොස් මරා දමන බවට තර්ජනය කරමින් ව්‍යාජ පාපොච්ඡාරණයකට (confession) අත්සන් ලබා ගැනීමට නිලධාරීන් උත්සාහ කල බවත් පවසා ඇත.

ඔහු තම නිර්දෝෂී බව පෙන්වීමට කරුණු දක්වමින් කියා සිටින්නේ, තමන් කිසිදු ස්ථානයක සැඟවී නොසිටි බවත්, අත්අඩංගුවට ගන්නා විට කිසිදු තහනම් ද්‍රව්‍යයක් තමන් සතුව නොතිබූ බවත්ය. ඔහුගේ ලැප්ටොප් සහ දුරකථන පිළිබඳ රස පරීක්ෂක වාර්තාවලින්ද කිසිදු අන්තවාදී හෝ ත්‍රස්තවාදී සම්බන්ධයක් අනාවරණය වී නැත. තවද, ඔහුව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2019 අප්‍රේල් 26 වන දින වුවද, රැඳවුම් නියෝගය (DO) ඊට පෙර එනම්, අප්‍රේල් 24 වන දින සකස් කර තිබීම අනීතික බව ඔහු පෙන්වා දෙයි. තවමත් TID නිලධාරීන් තම පවුලේ අයට සහ සහෝදරයන්ට බලපෑම් කරමින් සිටින බවත් පවසන ඔහු, තමන් මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස අධිකරණයෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

<u>විශ්ලේශණය</u>

මෙම 13 චූදිත විසින් ඉහත පරිදි සිදු කරන ලද ප්‍රකාශය අප සුපරික්ෂාකාරීව සලකා බලන ලද අතර ඔහුට එරෙහිව ස්වාධීන සාක්ෂි කිසිවක් මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි තුලින් පෙනී යන්නේ නැත.මෙම නඩුවේ 12 වන චූදිත වන මොහොමඩ් ස්වාහීර් මොහොමඩ් හසන් යන අය විසින් මෙම නඩුවේ පැ.919 ලෙස ලකුණු කර තිබෙන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බිම්සානි ජාසිං ආරච්චි යන අයට ලබා දී ඇති පාපොච්චාරණයේ 2018 මාර්තු මස නුවර අරුප්පොල ප්‍රදේශයට තමා පිරිසක් සමඟ ගිය බවත්, එහි ස්ථානයක නැවතී සිටි බවත්, එම ස්ථානයේ වැඩමුළුවක් පැවැත්වූ බවත්, එම වැඩමුළුවට **ඉන්ෂාෆ්** යන අයද ගිය බවටත් පවසා ඇත. කෙසේ වුවද, ඔහු විසින් එලෙස සඳහන් කර ඇති **ඉන්ෂාෆ්** යන අය මෙම නඩුවේ 13 වන චූදිත වන මොහොම්ඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්ෂාෆ් බවට සනාථ කිරීමට හෝ නුවර අරුප්පොල ප්‍රදේශයේ 2018 මාර්තු මස පැවති බවට 12 වන චූදිත විසින් පවසන එම වැඩමුළුවේ මෙම 13 වන චූදිත සිටි බවට සනාත කෙරෙන කිසිදු සාක්ෂියක් මෙම නඩුවේ ඉදිරිපත් වී නැත. මෙම නඩුවේ 11 වන චූදිත වන හුසේනුල් රිස්වි කාලිද් සමීර් යන අය ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16(1) වගන්තිය යටතේ පාපොච්චාරණයක් සිදු කර ඇති අතර, එම ප්‍රකාශයේ 2018 වර්ෂයේ මාර්තු මස නුවර අරුප්පොල ප්‍රදේශයේ

වැඩමුළුවක් පැවැත්වූ බවත්, එම වැඩමුළුවට **ඉන්ෂාෆ්** යන අයෙකු සහභාගී වූ බවත් පවසා ඇති අතර, ඔහුගේ එකී පාපොච්චාරණයේත් නුවර අරුප්පොල ප්‍රදේශයේ 2018 මාර්තු මස පැවති බවට 11 වන චූදිත විසින් පවසන එම වැඩමුළුවේ 13 වන චූදිත සිටි බවට සනාථ කෙරෙන කිසිදු සාක්ෂියක් මෙම නඩුවේ ඉදිරිපත් වී නැත.

මෙම නඩුවේ 11 වන සහ 12 වන චූදිතයන් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16(1) වන වගන්තිය යටතේ සිදු කර ඇති පාපොච්චාරණයන් මෙම නඩුවේ තවත් චූදිතයකුට එරෙහිව භාවිතා කිරීමට නම් අදාළ පාපොච්චාරණවල සඳහන් කරුණු ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු විය යුතුය. කෙසේ වුවද, මෙම නඩුවේ 11 සහ 12 වන චූදිතයන් විසින් කරන ලද පාපොච්චාරණ වල අඩංගු ඉහත සඳහන් කරුණ එනම්, ඉන්ෂාෆ් යන පුද්ගලයෙක් සම්බන්ධව සඳහන් කර ඇති කරුණ, එලෙස ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු වී නැත. එලෙස ඉන්ෂාෆ් යනුවෙන් සඳහන් කර ඇති තැනැත්තා මෙම නඩුඩවේ 13 චූදිත ම බවට නිශ්චිතව පවසා සිටීමට කිසිසේත් හැකියාවක් නැත.

තවද, මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැ.සා. 1922 උප පොලිස් පරීක්ෂක මධුෂාන් සාක්ෂි දෙමින් පවසා සිටියේ, 2019.04.21 වන සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාර මාලාවෙන් පසුව අරුප්පොල පිහිටි නිවසක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය වූ බවත්, ඒ සම්බන්ධව විමර්ශනය

කිරීමට 13 වන චූදිත සහ තවත් සැකකරුවන් කිහිපදෙනෙකු සමඟ එම ස්ථානය නිරීක්ෂණය කිරීමට ගිය බවත්ය. කෙසේ වුවද, එම සාක්ෂිය මඟින් 13 වන චූදිත එකී අරුප්පොල නිවසේ සිටි බවට හෝ කුමක් හෝ වැඩමුළුවකට සහභාගී වූ බවට ඉන් සනාථ වන්නේ නැත.

සමස්තයක් ලෙස ගෙන බැලීමේ දී මෙම නඩුවේ 13 වන චූදිතව ඔහුට එරෙහිව ඉදිරිපත් වී තිබෙන චෝදනා සමඟ සම්බන්ධ කිරීමට කිසිඳු නෛතිකමය සාක්ෂියක් ඉදිරිපත් වී නැත. මෙකී පසුබිම තුල 13 වන චූදිත විසින් මෙම අධිකරණයේ විත්ති කූඩුවේ සිට ලබා දී ඇති ප්‍රකාශය අවිශ්වාස කිරීමට කිසිදු හේතුවක් අප හට පෙනෙන්නේ නැත. එහෙයින් 13 වන චූදිත වන මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්ෂාෆ් යන අය විසින් මෙම නඩුවේ විත්ති කූඩුවේ සිට ලබා දී ඇති ප්‍රකාශය විශ්වාසනීය ප්‍රකාශයක් ලෙස අපහට පිළිගත හැකිය.

<u>14 වැනි චූදිත වන රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහීම් විසින් විත්ති කූඩුවේ සිට සිදු කරන ලද ප්‍රකාශයේ සාරාංශය</u>

මෙම නඩුවේ 14 වන චූදිත වන රෂීඩ් මොහොමඩ් ඊබ්‍රාහිම්, මාවනැල්ල, හිඟුල , දෙල්ගොඩ අංක ඩී/10/8 යන ලිපිනයේ පදිංචි වයස අවුරුදු 63 ක අයෙකු වේ. තමාගේ ප්‍රකාශයේ ඔහු කියා සිටියේ, තමා නාවලපිටියේ ඉපදුණු බවත්, එම ප්‍රදේශයෙන්ම පාසල් අධ්‍යාපනය ලබා ගත් බවයි.

පාසල් අධ්‍යාපනයෙන් පසු ජමියා නලීමියා අධ්‍යාපන ආයතනයට සම්බන්ධ වී වසර 05 ක කාලයක් අරාබි අධ්‍යාපනය හැදෑරූ බවත්, රැකියාව වශයෙන් පල්ලි වල වැඩ කළ බවත්, පසු කාලයක නූරුල් උදා නමින් අධ්‍යාත්මික උපදේශක මධ්‍යස්ථානයක් ආරම්භ කර එම ආයතනය මඟින් මානසික ආතතිවලින් පෙළුණු පුද්ගලයින්ට අධ්‍යාත්මිකව ප්‍රතිකාර කළ බවත්, ඔවුන් අතර වයස්ගත පුද්ගලයන් විවාහ වූ පුද්ගලයන්, විවාහ නොවූ පුද්ගලයන්, පවුල් ප්‍රශ්න වලට මැදි වී සිටි පුද්ගලයන්, පාසල් ශිෂ්‍යයන් වැනි විවිධ ස්ථාන වලින් මානසික පීඩා වලට පත් වූ අයවත් ඉස්ලාම් ආගමේ මග පෙන්වීම යටතේ අධ්‍යාත්මික වශයෙන් ඉස්ලාම් ආගමේ තිබෙන දිකර් යනුවෙන් හඳුන්වන භාවිනාව වැනි දේවල් මාර්ගයෙන් ඔවුන්ට මඟ පෙන්වා ඔවුන්ගේ මනස සුවපත් කරන බවත්, ඔවුන්ට හොඳ සිතුවිලි, චේතනාවන් ඇති කර ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නඟා ඔවුන්ට මඟ පෙන්වීමක් සිදු කරන බවත් ය. තවද, ඊට අමතරව සමාජ සේවාවන් වශයෙන් ගම් ප්‍රදේශ වල සිදුවන විවාහ උත්සව වලට අවමංගල්‍ය කටයුතු වලට, පොදු වැඩසටහන් වලට, පාසල් වල සිදු කරන ගුරු දෙගුරු හමු වීම් යන වැඩසටහන් වලටත් අනෙකුත් පොදු වැඩසටහන් වලටත්, පාසල් වල සිදුවන අනෙකුත් පොදු වැඩසටහන් වලටත් ගුරුවරුන්ට සහ ශිෂ්‍යන්ටට මඟ පෙන්වීමේ කටයුතු සිදු කරන බවත්, උපදේශකයෙක් ලෙස කටයුතු කළ බවත් පවසා සිටී. තවද, ජාතීන් අතර අසමගිය හෝ ප්‍රශ්න ඇති වන කාල වකවානුව

තුළ ජාතික සමගිය වෙනුවෙන්, ජාතික සංහිදියාව ඇති කිරීම වෙනුවෙන් පොදු දේවල් සඳහා සම්බන්ධ වී තිබෙන බවත් 14 වන චූදිත පවසා සිටී.

2019 ජනවාරි 21 වන දින නාවලපිටිය තමාගේ බිරිඳගේ මවගේ නිවසේ සිටියදී මාවනැල්ල පොලිසිය විසින් තමාව අත්අඩංගුවට ගෙන පැය 72 ක කාලයක් රඳවා තබා ගෙන පසුව රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්, කුමන හේතුවකට තමාව අත්අඩංගුවට ගත්තාදැයි තමාට නොපැවසූ බවත්, එලෙස බන්ධනාගාර ගතව සිටින අවස්ථාවේදී මෙරට සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව එම නඩුවට අදාළව තමාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් භාරයට ගත් බවත්, එලෙස භාරයට ගෙන රැඳවුම් නියෝගයක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මාස 06 ක කාලයක් තමාව රඳවා ගෙන සිටි බවත්, කුමන හේතුවක් මත පාස්කු ඉරු දින නඩුවට තමාව භාරයට ගත්තේදැයි තමා නොදන්නා බවත්, කෙසේ වුවද, ඒ කාලය තුළ තමාට ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදු වූ බවත්, එලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගැනීමෙන් පසුව තමාව බන්ධනාගාර ගත කළ බවටත් 14 වන චූදිත පවසා ඇත.

තමාගේ ප්‍රකාශයේදී ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ, පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් තමාට එරෙහිව මෙම නඩුවේ චෝදනා රාශියක් ගොනු කොට තිබෙන බවත්, එම සිද්ධීන් සමඟ තමාට

කිසිඳු සම්බන්ධතාවයක් නොමැති බවත්, එම සියළුම චෝදනාවන් තමා ප්‍රතික්ෂේප කරන බවත්, තමාට එරෙහිව මෙම අධිකරණයේ එම චෝදනාවල් සම්බන්ධයෙන් කිසිඳු සාක්ෂියක්ද පැමිණිල්ල විසින් ඉදිරිපත් කර නොමැති බවයි. තවද, මෙම නඩුවේ පැ.සා.1400 මොහොමඩ් අනස් යන සාක්ෂිකරු සහ පැ.සා.1401 ජවුෆර් සාදික් යන අය සාක්ෂි දෙමින් තමා විසින් යම් අවස්ථා වලදී දේශණා පැවැත්වූ බවට කියා සිටියද ඒ කිසිඳු අවස්ථාවක අන්තවාදී දේශණා පැවැත්වූ බවට එම සාක්ෂිකරුවන් පවසා නොමැති බවට 04 වන චූදිත පවසා ඇත.

තවද, පැ.සා.1400 මොහොමඩ් අනස් යන අය විසින් කැකුණුගොල්ල ප්‍රදේශයේ සිදුවූ පරිවර්තන කමිටුවක් සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් බවත්, එම කමිටුවේ තමාද සිටි බව ඔහු පැවසුවද එලෙස කමිටුවක් රැස්වූ දිනයක් සම්බන්ධව හෝ එම කමිටුව විසින් සිදු කළ වැඩක් සම්බන්ධයෙන් කිසිඳු කරුණක් හෙළි නොකළ බවටය. එහිදී අනස් යන සාක්ෂිකරු තමා එම කමිටුවට පැමිණියාද යන්න සම්බන්ධයෙන් සැකයක් ඇති බවට පවසා තිබෙන බවටත් 14 වන චූදිත ප්‍රකාශ කර තිබේ.

14 වන චූදිත තමාගේ විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා ඇත්තේ, පාස්කු ඉරු දින ප්‍රහාරයට මාස 03 කට පෙර සිටම තමාව අත්අඩංගුවට ගත් බවත්, එතැන් සිට දීර්ඝ කාලයක් තිස්සේ, එනම් අවුරුදු

7, ½ කට වැඩි කාලයක් තමා මෙලෙස බන්ධනාගාර ගත වී සිටින බවයි. එහෙයින් තමාව මෙම නඩුවෙන් නිදහස් කරන ලෙසට ඉල්ලා ඇත.

<u>විශ්ලේෂණය</u>

14 වන වූදිත විසින් මෙම අධිකරණයේ විත්ති කූඩුවේ සිට සිදු කර ඇති ප්‍රකාශය අපගේ මනා අවධානයට ලක් කර ඇත.ඔහු හිඟුල, දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන අතර, 2019 ජනවාරි 21 වන දින යම් සිද්ධියක් සම්බන්ධයෙන් ගම්පොළ පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇත. 2019 වර්ෂය වන විට ඔහු රැකියාව වශයෙන් පල්ලි වල වැඩ කරමින් සිට ඇති අතර, එනම්, පල්ලි වල සලාතේ නැමදුම් කටයුතු සිදු කිරීම, සිකුරාදා දින ජුම්මා දේශනා සිදු කිරීම යන කාර්යයන් සිදු කර ඇති අතර, නූලුර් උදා යන නමින් ආධ්‍යාත්මික උපදේශණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගොස් ඇති අතර, එම ආයතනය මඟින් මානසික ආතතිවලින් සිටි අයට ආධ්‍යාත්මික ප්‍රතිකාර ලබා දීම සිදු කර ඇත. ඔහු සමාජ සේවය වශයෙන් ඔහුගේ ගම් ප්‍රදේශයේ විවාහ උත්සවයන්, අවමංගල්‍ය කටයුතු, පොදු වැඩසටහන් සහ පාසල් වැඩසටහන් යන විවිධ කටයුතු වලට තමාව සම්බන්ධ කර ගෙන ඇති බවට ප්‍රකාශ කර ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී තිබෙන පැ.සා. 1400 මොහොමඩ් අනස්, පැ.සා. 1401 ජවුෆර් සාදික් යන අය මාවනැල්ල ප්‍රදේශයේ

පදිංචිකරුවන් වන අතර, 14 වන චූදිත හොඳින් දන්නා අයවළුන් වේ. ඔවුන් සාක්ෂි දෙමින් කියා සිටියේ, 14 වන චූදිත ඇතැම් අවස්ථා වල ඇතැම් ස්ථාන වල දේශණා පවත්වා ඇති බවයි. කෙසේ වුවද, 14 වන චූදිත විසින් අන්තවාදී අදහස් දැරූ දේශනා පැවැත්වූ බවට කිසිවිටක සාක්ෂි ලබා දී නැත. පැ.සා.1400 අනස් යන අය සාක්ෂි දෙමින් කැකුණුගොල්ල ප්‍රදේශයේ පරිවර්තන කටයුත්තක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කළ බවත්, එම කමිටුවේ තමාද සිටි බවත්, මෙම 14 වන චූදිතත් එම කමිටුවේ සිටි බවටත් සාක්ෂි ලබා දී ඇත. ඒ කෙසේ වුවද, එම කමිටුව කුමන හේතුවක් සඳහා පිහිටන ලද කමිටුවක්ද බව හෝ එම කමිටු මඟින් සිදු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන්හෝ කිසිදු කරුණක් මෙම අධිකරණයේ ඉදිරිපත් වී නැත.

මෙම නඩුවේ 14 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර තිබෙන සාක්ෂි පරීක්ෂා කිරීමේදී ඔහුට එරෙහිව ගොනු කර තිබෙන චෝදනාවන් සමඟ ඔහුව සම්බන්ධ කිරීමට කිසිදු සාක්ෂියක් පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත. මෙවැනි තත්ත්වයක් මත 14 වන චූදිත විසින් මෙම අධිකරණයේ කර තිබෙන ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමට හෝ අවිශ්වාස කිරීමට කිසිදු හේතුවක් අධිකරණයට පෙනෙන්නේ නැත. 14 වන චූදිත විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ඔහුගේ ප්‍රකාශය මනාව පරීක්ෂා කිරීමේදී එම ප්‍රකාශය පිලි නොගැනීමට තරම් යුක්ති සහගත හේතුවක් අප හට පෙනී යන්නේ නැත.

15 චූදිත මොහොමඩ් හනීපා සෙයිනුල්ආබදීන් විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය

මෙම චූදිත ඔහුගේ පවුලේ සාමාජිකයින්ගේ තොරතුරු දීර්ඝ ලෙස විස්තර කරමින් පවසා ඇති අතර. ඔහු 2010 දී මාවනැල්ලට පදිංචියට පැමිණි ඔහු හිඟුල්ඔය ප්‍රදේශයේ තට්ටු තුනක නිවසක් සාදාගත් බවත් කොළඹ සහ කෑගල්ලේ සාර්ථක ව්‍යාපාර පවත්වාගෙන යමින් හොඳ ආදායමක් ඉපයීය. 2012 දී ඔහු දරුවන් දෙදෙනෙකු සිටි වැන්දඹු කාන්තාවක් සමඟ දෙවන විවාහයක් ද සිදුකර ගත් බවත් 2017 සහ 2018 වර්ෂවල ලංකාව තුල හලාල් ප්‍රශ්නය, පල්ලිවලට ගල් ගැසීම, වෛද්‍ය සාෆි සම්බන්ධ ප්‍රශ්නය වැනි මුස්ලිම් විරෝධී ක්‍රියා ඇති වූ අතර මියන්මාරයේ ද මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවිය. ඥානසාර හිමි, ඩෑන් ප්‍රියසාද්, අමිත් වීරසිංහ සහ නාමල් කුමාර වැනි අයට එරෙහිව රජය හෝ පොලිසිය පියවර නොගත් අතර, මියන්මාරයේ සිට පැමිණි භික්ෂුවක් බේරුවල පැවැත්වූ රැස්වීමකින් පසු බේරුවල, අලුත්ගම සහ කළුතර ප්‍රදේශවල විශාල හානි සිදු වූ බව ඔහු පවසා ඇත.

සහරාන් මවුලවි 2014/2015 වර්ෂවල මාවනැල්ල අසල ගනේතැන්න ප්‍රදේශයේ කුලී නිවසක ජීවත් වෙමින් පල්ලියේ වැඩ කළ බවත් ඔහුගේ ආගමික දැනුම නිසා ජුම්මා දේශන සඳහා ආබ්දීන්ගේ නිවස අසල පල්ලියට ද පැමිණියේය. පල්ලියට පැමිණෙන අයට දහවල් ආහාරය

දීමේ පුරුද්දක් තිබූ ආබ්දීන් සමඟ සහරාන් මිත්‍ර වූ අතර, දිගන ප්‍රශ්නය සිදුවන සමයේ සහරාන් විසින් රජය හෝ පොලිසිය ආරක්ෂාව නොදෙන නිසා ආත්මාරක්ෂාව සම්බන්ධයෙන් කතා කිරීමට රැස්වීමක් පැවැත්විය යුතු බව පැවසූ බවත් තම කෑගල්ලේ කඩය ගැනද ෆේස්බුක් හි පළ කර තිබූ නිසා බියට පත්ව සහරාන් හොඳ මිනිසෙකු යැයි සිතා **නුවරඑළියේ** පැවති රැස්වීමට සහභාගී වීමට තමා එකඟ වූ බවත් නුවරඑළියේ රැස්වීම සම්බන්ධයෙන් සාක්ෂි අංක 1400 අනස් බොරු සාක්ෂි දුන් බවත් අනාස් ගිය බයාන් දේශනය පැවැත්වුණේ තමා යාමට පෙර දින වන අතර, ආබ්දීන් ගිය දිනයේ පොලිසිය පැමිණ හැඳුනුම්පත් පරීක්ෂා කළ නිසා කිසිදු දේශනයක් සිදු නොවූ බවත් මෙම චූදිත පවසා ඇත. තමා කිසිදු අවස්තාවක අවි පුහුණු කඳවුරකට සහභාගි නොවූ බවත් ඔහු පවසයි.

2019 අප්‍රේල් 28 වන දින අත්අඩංගුවට ගැනීමෙන් පසු CID නිලධාරීන්ගෙන් තමාට දැඩි බලපෑම් එල්ල වූ බවත් දිනකට ලක්ෂ එකහමාරක්-දෙකක් පමණ ආදායම් ලැබූ කෑගල්ලේ කඩය වසා දැමීමට සිදුවීමෙන් ඔහු ආර්ථිකව අසරණ වූ බවත් තම දියණියගේ මරණය සහ පුතුන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම නිසා දැඩි මානසික පීඩාවකට පත් වූ බවත් පවසා ඇත. CID නිලධාරීන් ඔහුගේ අනෙක් බිරින්දෑවරුන් සහ වැඩිමහල් පුතාව ද අත්අඩංගුවට ගන්නා බවට තර්ජනය කරමින්, මාවනැල්ල මහේස්ත්‍රාත් ඉදිරියේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් දීමට බල කළ බවත් එම 127 ප්‍රකාශය තමා ස්වකැමැත්තෙන් නොදුන් එකක්

බවත් අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳව තමා කිසිවක් නොදැන සිටි බවත්, දැන සිටියේ නම් එය ප්‍රකාශ කරන බවත් පවසන ඔහු, එදින සිංහල අවුරුදු සමයේ කඩයේ ඉතා කාර්යබහුලව සිටි අතර ප්‍රහාරය ගැන දැනගත්තේ පෙරවරු 11:00 ට පමණ බව පවසයි. ඔහු වරදක් නොකල නිසා සැඟවීමට උත්සාහ නොකර අප්‍රේල් 28 වනදා තෙක් සාමාන්‍ය පරිදි නිවසේ රැඳී සිටියේය. උසාවියේදී සීසීටීවී දර්ශන දකින විට තමාද දැඩිසේ කණගාටුවට පත් වූ බවත්, සහරාන් වැනි හොඳ යැයි සිතූ මිනිසෙකු මෙවැනි අමානුෂික දෙයක් කළේ ඇයි දැයි තවමත් ප්‍රශ්නයක් බවත් ඔහු පවසා ඇති අතර තමා 2018 ඔක්තෝබර් මාසයෙන් පසු ඔවුන් කිසිවෙකු හමු වී හෝ දුරකථන සම්බන්ධතා පවත්වා නැති බවත් පවසා ඇත.

<u>විශ්ලේශණය</u>

මෙම 15 වන චූදිත ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මඟින් ප්‍රධාන වශයෙන්ම හඹ කර සිටින්නේ පැමිණිල්ලේ සාක්ෂි අංක 1400 අනාස් යන අය විසින් ලබා දෙන ලද සාක්ෂියත් පැමිණිල්ලේ සාක්ෂි අංක 1399 මසූර් මව්ලානා විසින් දෙන ලද සාක්ෂියත් ය. එසේ වුවද ඔහුගේ ප්‍රකාශය තුළම ඔහු නුවරඑළිය පැවැත්වූ දේශනයට සහභාගී වූ බවත්, එසේම හම්බන්තොට පැවැත්වූ දේශනාවලට සහභාගී වූ බවත් පිළිගන්නා අතර මෙම අධිචෝදනා පත්‍රයේ සඳහන් කාලවකවානුවට අදාලව 2017, 2018 කාලයේදී මුස්ලිම් ජාතිකයන්ට එරෙහිව සිදුවූ යම් යම්

සිදුවීම් හේතුකොටගෙන ඒවාට එරෙහිව ආත්මාරක්ෂාව සඳහා සහරාන් මව්ලවි සමඟ එක්ව කටයුතු කළ බවද පිළිගෙන ඇත.

කෙසේ වුවද, ඉහත නම් සඳහන් පැමිණිල්ලේ සාක්ෂිකාර අනාස්ගේ සාක්ෂිය ඉහතින් සාක්ෂි විශ්ලේෂණයේදී විස්තරාත්මකව සහ පුළුල් ලෙස අප විසින් සලකා බලා මෙම සාක්ෂිය විශ්වාසනීය සාක්ෂියක් ලෙසට තීරණය කර ඇත. එබැවින් අනාස්ගේ සාක්ෂිය අසත්‍ය සාක්ෂියක් ලෙසට 15 වෙනි විත්තිකරු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය අප බැහැර කරමු.

තවද පැමිණිල්ලේ සාක්ෂි අංක 1399 මසූර් මව්ලානාගේ සාක්ෂියද ඒ ආකාරයෙන්ම පුළුල් ලෙස සහ විශ්ලේෂණාත්මකව සැලකිල්ලට ගෙන ඇති අතර ඔහුගේ සාක්ෂියේද විශ්වාසනීයත්වය හබ වී නොමැති බැවින් 15 වන විත්තිකරු විසින් ඔහුගේ සාක්ෂිය පිළිනොගන්නා ලෙසට කරන ලද ඉල්ලීම අප ප්‍රතික්ෂේප කරමු. වඩාත් වැදගත්ම කාරණය වන්නේ අප විසින් වර්ෂ 2026.02.02 ඉතා දීර්ඝව කරුණු පැහැදිලි කරමින් 15 වන විත්තිකරු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය යටතේ මාවනැල්ල උගත් මහේස්ත්‍රාත්තුමා වෙත කරන ලද ප්‍රකාශය ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රකාශයක් ලෙසට තීරණය කොට එම ප්‍රකාශයේ කොටස් පැ.174, පැ.175, පැ.176, පැ.177, පැ.178 සහ පැ.179 ලෙස සලකුණු කිරීමට අවසර දී ඇති අතර 15 වන විත්තිකරු විත්තිකූඩුවේ සිට කියා සිටින්නේ එම විමසීම අවස්ථාවේදී ඔහු අසනීප තත්ත්වයෙන් සිටි බැවින් ඔහුගේ සාක්ෂිය

හරියාකාරව ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව වුවද, එම අවස්ථාවේදී ඔහුව උගත් නීතිඥවරයෙකු විසින් නියෝජනය කර ඇති අතර එම විමර්ශනයේ කාර්ය සටහන් අනුව 15 වන චූදිත සාක්ෂි දීමට නොහැකි අන්දමේ දුබලතාවකින් පෙළුනේ යැයි අනාවරණය වීමක් සිදුවී නොමැති බැවින් 15 වන චූදිත විසින් මාවනැල්ල උගත් මහේස්ත්‍රාත්තුමාට ලබා දෙන ලද ප්‍රකාශය බැහැර කරන ලෙසට විත්තිකූඩුවේ සිට ඔහු කරන ඉල්ලීම අප ප්‍රතික්ෂේප කරන්නෙමු. එසේම එම ප්‍රකාශයේ ඇති පහත කොටස් අපගේ සාක්ෂි නීතියේ ප්‍රතිපාදන අනුව ඔහුට විරුද්ධව භාවිතා කළ හැකි බැවින් එම කොටස්වල අන්තර්ගතය ඉහතින් පෙන්වා දෙන ලද පැමිණිල්ලේ සාක්ෂිකාර අනාස් සහ පැමිණිල්ලේ සාක්ෂිකාර මසූර් මව්ලානාගේ සාක්ෂියෙන් ද තහවුරු වන බව පෙනී යයි. ඒවා නම්

පැ.174 (iv)

.....මේවගේ නුවර කටුගස්තොට පාරේ, වේවැල්ල කියන ගෙදරක තවත් දේශනාවක් තිබ්බා දවස් 02 ක් වගේ. මේ වගේම සහරාන් සහ කට්ටිය සහ කොළඹ ළමයි 15 ක් විතර එදා රැස්වීමට ආවා. දේශන තිබ්බා. සහරාන් නවුෆර් දේශනා කළා. ආයුධ ගැන මිල්හාන් ගලවලා හයි කරන හැටිත් පෙන්නලා දුන්නා. රැස්වීමෙදි කොළඹ කෙනෙකුට හැන්දෑවේ 6.00 වෙද්දි අසනීප වුනා. එතනින්ම රැස්වීම ඉවර කරලා කොළඹ කට්ටිය ගියා.....

පැ.176 (i)

.....සහරාන්ගේ මූණ බයවෙලා තිබ්බේ. ලොකු මහත්තයා ආයිත් අඩගහලා අයිඩෙන්ටිය වෙනම අරගෙන, එඩ්‍රස් බලලා කොහේද කාත්තන්කුඩි කියලා විස්තර ඇහුවා. පස්සේ එතනින් එහාට එච්චර ඇහුවේ නැහැ. ඇතුලේ ආයුධ ටී.56 එකයි, පොඩි පිස්ටල් 01 යි මිල්හාන් ලඟ තිබ්බා කියලා මම දැනගත්තා. පොලීසියේ මහත්තුරු පස්සේ අපේ අයිඩෙන්ටි අරගෙන 3.00 ට පොලීසියට එන්න කියලා ගියා. පස්සේ පොලීසියට ගියාට පස්සේ කිව්වා ටී.56 ලිදට දැම්මා කිව්වා. පිස්තෝලේ එහා පැත්තේ එළවලු වත්තට දැම්මා කියලා මිල්හාන් කියන එකත් මම අහගෙන හිටියා. පොලීසියේ මහත්තුරු ගියාට පස්සේ සහරානුයි, නවුෆරුයි, හස්තුනුයි, ෂාපියි ටවුමකට දාන්න කියලා එයාලගේ බෑග් ඔක්කොම අරගෙන වාහනයේ නැගලා ගියා.....

ඒ අනුව සහරාන් ඇතුළු පිරිස විසින් ක්‍රියාත්මක කරන ලද සැලසුම් සහගත කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස 2019.04.21 දින සිදුවූ ප්‍රහාර මාලාව සිදුවීමම ඔහු දැන නොසිටියේය යන ප්‍රකාශය පිළිගත නොහැක. එසේම 15 වන චූදිතගේ ක්‍රියාශීලි දායකත්වය 11 වන චූදිත විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයේදීත් මෙසේ සඳහන් කර ඇත.

පැ. 168(7) “ මේ පුහුණුවට මොහොමඩ් සහරාන්, ජමීල්, කටුවාපිටියේ මරාගෙන මැරුනු හස්තූන් සහ දැනට අත්අඩංගුවේ අරන් ඉන්න සහරාන්ගේ රියදුරු සාෆි, මාවනැල්ලේ ආබ්දීන්, නවුෆර් මවුලවි, මිල්හාන්, අන්කම් අක්‍රම්, උමෙර්, හසන් සවාහිර්, මොහොමඩ් ඉන්ෆාස්, මීගමුවේ

හිලාම්, ඉහ්සාත්, අහ්මද්, මොහොමද් සශ්නි, අහ්මද්, මොහොමද් ෆස්හාන්, මොහොමද් ආසීන් යන අය ආවා. මේ පුහුණුවට සහරාන් විසින් එවලා තිබුණු වෑන් එකෙන් අපි අරුප්පලට ගියා. පසු දින උදේ සිට දේශණා ආරම්භ කළා. සහරාන් විසින් ISIS සංවිධානයට සම්බන්ධ වීඩියෝ ඉදිරිපත් කරමින් දේශණා කළා. නවුෆර් මවුලවි විසින් ඉස්ලාම් ඉතිහාසය හා ෂරියා නීති ගැන දේශණා කළා. හස්තූන් විසින් ජංගම දුරකථන හා කොම්පියුටර් භාවිතයේ දී යොදා ගත යුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග ඉගැන්නුවා.”

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී 15 වන විත්තිකරු ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී තමා අඩු අධ්‍යාපනයක් ලැබුවද කිසිවෙකුට හානියක් නොකර සියලු ජාතීන් සමඟ සාමකාමීව ජීවත් වූ අයෙකු ලෙසට කරන ලද ප්‍රකාශය පිළිගත නොහැකි බව පැහැදිලිව පෙනී යයි.

ඉහත දක්වන ලද සියළු හේතූන් මත 15 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිලිගැනීම අප සම්පූර්ණයේම බැහැර කරන්නෙමු.

16 චූදිත මොහොමඩ් මුස්තෆා මොහොමඩ් හාරිස් විසින්

චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය

16 වන චූදිත චිත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් තමාට කිසිදු චෝදනාවක් නොමැති බවත්, යහපත් ජීවිතයක් ගත කරන ලද විවාහක පුද්ගලයෙකු බවත් විවාහයෙන් පසුව කුලී නිවාස ගෙවීමේ දුෂ්කරතාවය හේතුකොටගෙන 2010 වර්ෂයේදී තමාගේම නිවසක් සාදා ගැනීමට කටයුතු කළ බවත් එහිදී මුළුතැන්ගෙය සහ වැසිකිළිය සාදා ගැනීම සඳහා ඔහු විසින් 2019 වර්ෂයේ මුල් කාලයේදී සීට්ටුවකින් ලැබුනු මුදලක් සහ තවත් ආයතනයකින් ණයට ලබාගත් භාණ්ඩ භාවිතා කොට ඉතිරි ඉදිකිරීම් කටයුතු කිරීම ආරම්භ කළ බවත්, ඔහුගේ නිවස ඉදිකිරීම සිදු කළ ස්ථානයේ කුස්සිය ඉදිකිරීමට නියමිත ස්ථානය පහත් බිමක් වූ බැවින් ඒ සඳහා අවශ්‍ය කළුගල් සොයාගැනීමට යයියා නැමැති තමාගේ මස්සිනාගේ මිත්‍රයෙකු මඟින් භාණ්ඩ මිලදී ගත් බවත් ඒ සඳහා ඔහු සමඟ ජංගම දුරකථනයෙන් ඇමතුම් ලබාගත් බවත්, ඔහුද පැමිණ කුස්සිය ඉදිකිරීමට ඇති ස්ථානය පරීක්ෂා කර බලා ඒ සඳහා අදහස්ද ලබා දුන් බවත්, කියා සිටින ලද අතර ඒ අවස්ථාවේදී ඔහුගේ ගල්කොරියට භාවිතා කරන වෙඩි බෙහෙත් ඔහුගෙන් මිලදී ගත් බවත්, ඔහුවද අත්අඩංගුවට ගෙන රක්ෂණ භර ගතකොට පසුව රජයේ සාක්ෂිකරුවෙකු කළ බවත් කියා සිටින ලදි.

එසේම හූසේයින් යන පුද්ගලයා ඔහුගේ මිත්‍රයෙකු බවත් ඔහු කුකුල් ගොවිපොළක් පවත්වාගෙන ගිය අතර විදුලි බිල ගෙවා ගැනීමට නොහැකිව කුකුල් ගොවිපොළ වසා දමන බවට කියූ බැවින් තමා ඔහුට රුපියල් 25,000/- ක මුදලක් ණයට දුන් අතර ඉන් 15,000 ක මුදල ආපසු ලැබුනු බවත් ඉතිරි මුදල් 10,000 ක මුදල නැවත දෙන බවට එම තුණ්ඩුවේ ලියා තිබුනු බවත් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔහුවද රජයේ සාක්ෂිකරුවෙකු බවට පත් කළ බවත් කියා සිටින ලදි.

තවද තමා අත්අඩංගුවට ගැනීමට පෙර නිවසේ සිටි අතර ඒ වනවිට එනම් 2019.04.08 වන දින තමාගේ බිරිඳට පිරිමි දරුවෙකු ඉපදුනු බවත්, 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරයෙන් පසුව මැයි මස 01 වෙනි දින තමාගේ නිවසේ සිටියදී තමාව අත්අඩංගුවට ගත් බවත්, තමා පැනයාමට උත්සාහ දැරීමක් සිදු නොකළ අතර අත්අඩංගුවේදී තමාට පහර දුන් බවත්, එසේ පහර දී බලෙන් තමාගෙන් ප්‍රකාශවලට අත්සන් ලබා ගත් බවත්, තමා මෙම අධිචෝදනා පත්‍රයේ සඳහන් කිසිදු චෝදනාවකට කිසිදු සම්බන්ධයක් නොමැති අතර විශේෂයෙන්ම ඔහුට විරුද්ධව ඇති 17 වන චෝදනාවට කිසිදු සම්බන්ධයක් නොමැති අතර ඉදිරිපත් වූ සාක්ෂි මඟින් එවැනි චෝදනාවක් ඔප්පු කිරිමට තරම් විශ්වාසනීය සාක්ෂියක් පැමිණිල්ලෙන් ඉදිරිපත් කර නොමැති බවත් තමා භාරයේ තිබී හෝ තමාගේ ප්‍රකාශය පරිදි 27(1) වගන්තිය යටතේ කිසිදු නීතිවිරෝධී භාණ්ඩයක් සොයා නොගත් බවත් එබැවින් තමා නිර්දෝෂී පුද්ගලයෙකු බවත් තමා වසර 08 ක

කාලයක් කිසිදු වරදක් නොකොට දඬුවම් විඳින අතර කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිව පාසල් යන දරුවන් දෙදෙනෙකු තමා එනතුරු බලා සිටින බවත්, තමා කිසිදු ආකාරයකින් මෙම ප්‍රහාරවලට සම්බන්ධ නැති බවත් කියා සිටිමින් ඔහුගේ ප්‍රකාශය අවසන් කරන ලදි.

<u>විශ්ලේශණය</u>

ඉහත ප්‍රකාශයේදී 16 වන චූදිත විසින් ඔහුව අත්අඩංගුවට ගැනීම හබ නොකරයි. එසේම ඔහු විසින් එක් පසෙකින් ඔහු ඉතා ආර්ථික දුෂ්කරතාවල සිටි බැවින් ණයට භාණ්ඩ මිලදී ගත් බව කියා සිටියි. එම ප්‍රකාශයේම ඊට ප්‍රතිවිරුද්ධව හූසේයින් යන අයට රුපියල් 25,000/- ක මුදලක් ණයට ලබා දුන් බවද කියා සිටියි. එම ස්ථාවරයන් එකිනෙකට පරස්පර ස්ථාවරයන් වන බැවින් 16 වෙනි විත්තිකරු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඔහු විසින්ම ඉදිරිපත් කරන කරුණු අනුව එකිනෙකට පටහැනි සහ පරස්පරතාවයට ලක්ව ඇති බව පෙනී යයි.

එසේම 16 වන චූදිත විසින් විත්ති කූඩුවේ කරනු ලබන ප්‍රකාශයේ දී කියා සිටින ලද්දේ ඔහුට කුස්සියක් සහ වැසිකිළියක් සෑදීම සඳහා යුසුප් යන අයගෙන් ගල් වෙඩි බෙහෙත් ලබා ගත් බවත් එසේම හුසේයින් යන අයගෙන්ද ඔහුගේ මුල්‍යමය අපහසුකම් දැක අනුකම්පා කර රු.25000/- ක් ලබා දුන් බවත්ය, නමුත් එම සාක්ෂිකරුවන් දෙදෙනාම හරස් ප්‍රශ්නවලදි එම ස්ථාවරයන් ඉතා පැහැදිලිව ප්‍රතික්ෂේප කරමින් දිවුරුම් පිට සාක්ෂි

ලබා දී 16 වන චූදිත පුපුරන ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ඒවා මිළදී ගැනීම සඳහා හුසේයින් යන අයගෙන් ඉල්ලා සිටි බවට දුන් සාක්ෂිය සහ ඉසදීන් මොහොමඩ් යුසුෆ්ගේ (පැ.සා. 1371) සාක්ෂිය අනුව ලබා ගෙන ඇති වෝටර් ජෙල් කරල් ප්‍රමාණය 850 ක් වැනි විශාල ප්‍රමාණයක් වන අතර, ඩෙටනේටර් සංඛ්‍යාව 1700 කට වැඩි බව යන්න ද සැළකිල්ලට ගැනීමේ දී පැමිණිල්ලේ සාක්ෂිය පිළිනොගෙන ඉවත දැමීමට තරම් එම විත්තිකුඩුවේ සිට කරන ලද ප්‍රකාශය හේතු නොවන බව අප හට පෙනී යයි.

එබැවින් 16 වෙනි විත්තිකරු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

18 චූදිත රාසික් රාසා හුසෙයින් විසින් විත්තිකූඩුවේ සිට සිදු කරන ලද ප්‍රකාශය

18 වැනි චූදිත රාසික් රාසා හුසෙයින් විසින් විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් පවසා ඇත්තේ ඔහු නව කාත්තන්කුඩි 03 හි පදිංචි, විවාහක සහ එක් දියණියකගේ පියෙකි. 1993 ජනවාරි 3 වන දින උපත ලැබූ ඔහුගේ පියා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කර විශ්‍රාම ගත් අයෙකු වන අතර, සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති ඔහුගේ මව් භාෂාව දෙමළ වේ. ඔහු 2009 වසරේ සිට අනුරාධපුරයේ සහ කල්මුණේ රෙදි සාප්පුවල මෙන්ම කොළඹ ආයතනයක කාර්යාල සහායකයෙකු ලෙස

සේවය කර ඇති අතර, කෙටි කාලීනව කටාර් සහ සවුදි අරාබි රාජ්‍යයන් වෙතද රැකියා සඳහා ගොස් පැමිණ ඇත. පසුව කල්මුණේ ප්‍රදේශයේ තමා සේවය කල රෙදි කඩයෙන් කොටසක් කුලියට ගෙන ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබේ. ප්‍රකාශයේ සඳහන් වන පරිදි 2016 අප්‍රේල් 21 වන දින ලංකාව තුළ විවිධ ප්‍රදේශවල බෝම්බ පිපිරීම් සිදු වන අවස්ථාවේ ඔහු තම වෙළඳසැලේ සිටි අතර, පසුව 2019 මැයි 5 වන දින නිල ඇඳුම් නොඇඳ පැමිණි රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔහුව විමර්ශනයක් සඳහා රැගෙන ගොස් ඇත. එහිදී කල්මුණේ පොලිස් ඉඩම පිටුපස ගොඩනැගිල්ලකදී ඔහුගේ දෑත් පිටුපසට බැඳ හිසට ෂොපිං බෑගයක් දමා පහර දී තිබේ. එදිනම රාත්‍රියේ ඔහුව අම්පාර පොලීසියට රැගෙන ගොස් ඇති අතර, එහිදී දින කිහිපයක් තිස්සේ දණහිස යටින් පොල්ලක් දමා මේස දෙකක් අතර එල්ලා තබමින් අමානුෂික ලෙස වධහිංසා පමුණුවා ඇත. එහිදී ඔහුගේ මල්ලි, දෙමාපියන් සහ බිරිඳ ද අත්අඩංගුවට ගන්නා බවට තර්ජනය කරමින්, පොලිස් නිලධාරීන් පෙන්වූ ලේඛනවලට ඔහුගේ අත්සන් බලහත්කාරයෙන් ලබා ගෙන තිබේ. 2019 මැයි 10 වන දින ඔහුව කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව කාත්තන්කුඩි මදීනා බීච් ප්‍රදේශයට රැගෙන ගොස් ඇති අතර, එහිදී වෙනත් අත්අඩංගුවට ගත් අයෙකු සහ බැකෝ යන්ත්‍රයකින් භූමිය හාරා තිබෙනු ඔහු දැක තිබේ. මෙම නඩුවේ සාක්ෂි දුන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසේකර

මහතා ප්‍රකාශ කළේ චිත්තිකරුගේ ප්‍රකාශය මත එම වෙරළෙන් නඩු භාණ්ඩ සොයාගත් බව වුවද, හරස් ප්‍රශ්න හමුවේ ඔහු ප්‍රකාශ කල පරස්පර අදහස්වලින් පැහැදිලි වන්නේ තමා එවැනි කිසිදු පාපොච්ඡාරණයක් ලබා නොදුන් බව සහ එවැනි සිදුවීමක් සිදු නොවූ බවයි. ඉන්පසුව, අම්පාර පොලීසියේ රැඳවුම් නියෝග මත රඳවා සිටි ඔහුව කල්මුණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මඩකලපුව බන්ධනාගාරයේත්, පසුව අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරයේත් රක්ෂිත බන්ධනාගාරගත කර ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් අධිකරණයට ඉදිරිපත් නොකර සිටි පසුබිමක, 2021 අප්‍රේල් 29 වන දින ත්‍රස්ත මර්දන ඒකකය විසින් ඔහුව නැවත අත්අඩංගුවට ගෙන 'භූතානී' නම් ගොඩනැගිල්ලේ රඳවා තබා ගෙන ඇත. එහිදීද ඔහුගේ පවුලේ අය අත්අඩංගුවට ගන්නා බව පවසමින් තර්ජනය කර සිංහල භාෂාවෙන් ලියැවුණු ලේඛනවලට ඔහුගේ අත්සන් ලබාගෙන ඇති අතර, පසුව ඔහුව කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කර තිබේ. 2021 ඔක්තෝබර් මාසයේදී ඔහුව මෙම නඩුවේ 18 වන චුදිතයා ලෙස ඉදිරිපත් කර ඇති අතර, තමාට එරෙහිව ඇති පළමු චෝදනාව සහ තමාට පමණක් සීමා වූ 14 වන චෝදනාව ඇතුළු සියලු චෝදනා ඔහු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්නේ ඒවාට එරෙහිව කිසිදු සාක්ෂියක් අධිකරණයට ඉදිරිපත් කර නොමැති බැවිනි. තමා සහකාර පොලිස් අධිකාරී ලසන්ත රත්නායක යන නිලධාරියාව කිසි දිනක හමු වී නොමැති බවත්,

තමා ස්වේච්ඡාවෙන් කිසිදු පාපොච්ඡාරනයක් ලබා නොදුන් බවත් පවසන ඔහු, එම අත්සන් බලහත්කාරයෙන් ලබාගත් ඒවා බව අවධාරණය කරයි. තවද, ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසේකර මහතා පවා තමාට සිංහල කතා කිරීමට නොහැකි බව පිළිගෙන ඇති බැවින් එය අධිකරණයේ අවධානයට ලක්විය යුතු බව ඔහු පවසයි. යුධ හමුදාවේ සේවය කළ ඔහුගේ පියා ඔවුන්ව ඇතිදැඩි කර ඇත්තේ සියලු ජන කොටස් සමඟ සමගියෙන් ජීවත් වීමට වන අතර, ඔහු ව්‍යාපාර කටයුතුවලදී වැඩිපුරම ඇසුරු කර ඇත්තේ දෙමළ ක්‍රිස්තියානි ජනතාවයි. ඔහුගේ කඩය ඉදිරිපිට සහ පිටුපස ක්‍රිස්තියානි දේවස්ථාන පිහිටා තිබූ අතර, තමා ජාතීන් අතර වෛරය පතුරවන්නෙකු නොවන බවත්, තමා නිරන්තරයෙන් ලේ දන්දීමේ නිරත වන කරුණාවන්ත පුද්ගලයෙකු බවත් ඔහු පවසයි. එක් මිනිසෙකු ජීවත් කරවීමට උත්සාහ කරන පුද්ගලයා මුළු මිනිස් සංහතියම ජීවත් කරවීමට උත්සාහ කළ අයෙකු හා සමාන බව පවසන අල්කුරානයේ වාක්‍යයක් අනුගමනය කරමින් තමා ලේ දන්දීම සිදුකරන බව පවසන ඔහු, තමාට එරෙහිව ඉදිරිපත් වී ඇති අසත්‍ය කරුණු සහ සාක්ෂි විශ්ලේෂණය කර තමන්ව මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස ගරු අධිකරණයෙන් ඉල්ලා සිටියි.

විශ්ලේෂණය

මෙම අධිකරණයේ විත්ති කූඩුවේ සිට 18 වන චූදිත විසින් කර ඇති ප්‍රකාශය වෙත අපගේ අවධානය යොමු කරන ලදි. 18 වන චූදිතව 2019 මැයි 07 වන දින රාජ්‍ය බුද්ධි අංශයේ නිළධාරීන් විසින් කල්මුණ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර, ඉන්පසුව 2019.05.10 වන දින අම්පාර මූලස්ථාන පොලිසියේ ඔහුව රඳවා ගෙන සිටියදී ඔහුගේ ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගෙන ඇත. එම ප්‍රකාශයේ උධෘත කොටසක් පැමිණිල්ල විසින් පැ.1791 ලෙස මෙම අධිකරණයේ ලකුණු කර ඇති අතර, එම කොටස පහත පරිදි වේ.

“ බෝම්බ xxxxxxxxxx බඩු වලින් කොටසක් ඉතුරුවෙලා තියෙනවා. එව්වා මදීනා වෙරළේ xxxxxxxxxx පස්සේ xxxxxxxxxx මෙම වෙරළේ කහ පාට පෝර බෑග් එකක තිබුණු බඩු ටික සුදු පාට නිකල් භාජනයකට දාලා වැල්ලේ වලක් හාරලා වල දැම්මා. Xxxxxxxxxx උඩින් පොහොර උරය xxxxxxxxxx ඊට උඩින් වැලි xxxxxxxxxx මට මෙම බඩු දැම්ම තැන පොලිසියට පෙන්වා දෙන්න පුළුවන් xxxxxxxxxx ” කොටස අන්තර්ගත වී ඇත.

18 වන චූදිතගේ ප්‍රකාශය මත 2019.05.10 වන දින අම්පාර මූලස්ථාන පොලිසියේ සිට පැය 9.45 ට මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.2221 ගුණසේකර යන නිළධාරියා පොලිසියේ නිළධාරීන්

කණ්ඩායමක් සමඟ 18 වන වූදිතව රැගෙන කාත්තන්කුඩි පොලිස් වසමේ පිහිටි වෙරළ ප්‍රදේශයට ගොස් භාණ්ඩ සොයා ගැනීමක් සිදු කර ඇත. එම සොයා ගැනීම සිදු වෙන අවස්ථාවේදී එම ස්ථානයේ විශේෂ කාර්ය බලකා නිළධාරීන් සහ පොලිස් පරීක්ෂක සිරිවර්ධන, ප්‍රධාන පොලිස් පරීක්ෂක මාරසිංහ ඇතුළු තවත් නිළධාරීන් සිට ඇත. එම ස්ථානයෙන් සොයා ගන්නා ලද භාණ්ඩ අතර පුපුරණ ද්‍රව්‍යද සොයා ගෙන ඇති අතර, ප්‍රදේශයේ මහජනතාවගේ ජීවිත ආරක්ෂාව සැළකිල්ලට ගෙන එම පුපුරණ ද්‍රව්‍ය ඒ අවස්ථාවේදීම අසල ස්ථානයක තබා විශේෂ කාර්ය බලකා නිළධාරීන් විසින් පුපුරවා හැර ඇත.

එම භාණ්ඩ සොයා ගෙන ඇති කාත්තන්කුඩි ප්‍රදේශය 18 වන වූදිතව අදාළ දිනයේ රඳවා ගෙන සිටි අම්පාර මූලස්ථාන පොලිසියේ සිට විනාඩි 45 ක් හෝ පැයක කාලයක් වාහනයක ගමන් කළයුතු දුරස්ථ ප්‍රදේශයක් වන අතර, භාණ්ඩ සොයා ගැනීම සිදු වී අත්තේ පුද්ගලයන් ගැවසෙන වෙරළ ප්‍රදේශයක දවල් කාලයේදී ය. තවද, එම භාණ්ඩ සොයා ගැනීම සිදුවන අවස්ථාවේදී පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිළධාරීන් ඇතුළු විශාල නිළධාරීන් කණ්ඩායමක්ද එම ස්ථානයේ සිට ඇත. මෙකී කරුණු සළකා බැලීමේදී 18 වන වූදිතගෙන් ඔහුගේ ප්‍රකාශයක් මත පුපුරණ ද්‍රව්‍ය අඩංගු භාණ්ඩ වගයක් සොයා ගෙන ඇති බවට ඉදිරිපත් වී තිබෙන සාක්ෂිද සත්‍ය කරුණක් බව පෙනී යයි. ඔහුගේ සන්තකයේ තිබී විශාල භාණ්ඩ තොගයක් එදින සොයා ගෙන ඇති අතර, එම සියළුම

භාණ්ඩ අදාළ සාක්ෂිකරු පැ.සා.2221 ගුණසේකර විසින් මෙම අධිකරණයේ හඳුනා ගෙනද ඇත. මෙවැන් තත්ත්වයක් මත 18 වන චූදිතගේ ප්‍රකාශයක් මත සොයා ගන්නා ලද මෙම භාණ්ඩ හඳුන්වා දුන් භාණ්ඩ තොගයක් ලෙසට අනුමාන කළ නොහැකිය. චූදිත විසින් ඔහුගේ ප්‍රකාශය මත භාණ්ඩ සොයා ගැනීමක් සිදුනොකළ බවට මෙම අධිකරණයේ කර තිබෙන ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් බව පෙනී යයි.

මෙම 18 වන චූදිත විසින් සහකාර පොලිස් අධිකාරි ලසන්ත රත්නායක මහතාට ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16(1) වගන්තිය යටතේ පාපොච්චාරණයක් ලබා දී ඇති අතර, එම පාපොච්චාරණය පැමිණිල්ල විසින් පැ.807 ලෙස ලකුණු කර ඇත. එම පාපෙච්චාරණය මඟින් හෙලි වී තිබෙන්නේ මෙම 18 වන චූදිත 2019.04.21 වන දින කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරු ලෙස බෝම්බ පුපුරවා ගත් සහරාන් යන අය සමඟ සම්බන්ධකම් පවත්වා ඇති බව සහ මෙම නඩුවේ 1 වන 3 වන චූදිතයන් සමඟ වැඩමුළු වලට සහ අවි ආයුධ පුහුණු වලට සහභාගී වී ඇති බවටය. එම පුහුණු වැඩසටහන් වලදී අන්තවාදී දේශණ පවත්වා ඇති අතර, ජාත්‍යන්තර වශයෙන් තහනමට ලක් වී තිබෙන අයි.එස්. සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධව පැහැදිලි කර දී ඇති අතර, T56 වර්ගයේ ගිනි අවි ගලවා සවි කිරීම, උණ්ඩ පාවිච්චි කරන විදිය එම අවියේ ක්‍රියාකාරිත්වය

සම්බන්ධව සහ එසේම පිස්තෝල වැනි අවි සම්බන්ධවත් දැනුම සහ පුහුණුව ලබා ඇති බව පෙනේ.

18 වන චූදිත තම ප්‍රකාශයේදී අධිකරණයට පවසා ඇත්තේ, ඔහු විසින් කිසිදිනක සහකාර පොලිස් අධිකාරි ලසන්ත රත්නායක හමු වී නැති බවත්, ඔහුට පාපොච්චාරණයක් ලබා දී නොමැති බවත්, සිංහල භාෂාවෙන් සකස් කරන ලද ලේඛණයකට බලහත්කාරයෙන් ඔහුගේ අත්සන ලබා ගෙනඇති බවත්ය. කෙසේ වුවද, 18 වන චූදිත විසින් කරන ලද පැ.807 ලෙස මෙම නඩුවේ දැනටමත් ලකුණු කර ඇති එම ප්‍රකාශය ස්වේච්ඡාවෙන් ලබා දෙන ලද ප්‍රකාශයක්ද යන්න සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සකාෘතා පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එම පරීක්ෂණයෙන් අනතුරුව අප විසින් කරන ලද නියෝගය අනුව 18 වන චූදිත සහකාර පොලිස් අධිකාරි ලසන්ත රත්නායක මහතාට පැ.807 ලෙස ලකුණු කරන ලද ප්‍රකාශය කිසිදු බලපෑමක්, පොරොන්දුවක් හෝ තර්ජනයක් නොමැතිව ස්වේච්ඡාවෙන් ලබා දුන් ප්‍රකාශයක් ලෙසට අප විසින් දැනටමත් තීරණය කර ඇත. එහෙයින් සහකාර පොලිස් අධිකාරි ලසන්ත රත්නායක මහතාට ස්වවේච්ඡාවෙන් ප්‍රකාශයක් නොකළ බවට 18 වන චූදිත විසින් කරන ලද ප්‍රකාශය පිළිගත නොහැක.

18 වන චූදිත විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කර බැලීමේදී එම ප්‍රකාශය සත්‍ය ප්‍රකාශයක්

බවට පෙනී යන්නේ නැත. ඔහුට එරෙහිව මෙම අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි දෙස අවධානය යොමු කරන විට ඔහු විසින් විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් බවට අප තීරණය කර ඔහු විත්ති කූඩුවේ සිට කරන ලද එම ප්‍රකාශය අප විසින් ප්‍රතික්ෂේප කරමු.

19 වන විත්තිකරු වන කච්චි මොහම්මදු මොහම්මදු

ජෙම්සිත් විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

ඔහු පවසා ඇත්තේ රන් සහ රිදී පිරිපහදු කිරීම ඔහුගේ පවුලේ සාම්ප්‍රදායික රැකියාව බවත් ඔහුගේ මාමාවරුන් සහ සහෝදරයන් ඇතුළු පවුලේ සාමාජිකයන් විසිදෙනෙකු පමණ මෙම වෘත්තියේ නියැලී සිටින බවත් තමා වයස අවුරුදු 12, 13 තරම් කුඩා කාලයේ සිටම මද්‍රසා පාසලේ සිටියදීම නිවසේදී සිදු කෙරුණු මෙම කටයුතුවලට උදව් කල බවත් පසුව තම වැඩිමහල් සහෝදරයා වන රියාස් වෙතින් රන් මෝස්තර නිර්මාණය ඉගෙන ගත් බවත් පවස ඇත. 2012 වසරේ සිට 2017 වසර දක්වා වසර 3 ½ ක පමණ කාලයක් ඔහු කටාර් රාජ්‍යයේ සේවය කර ලංකාවට පැමිණි පසු තම සහෝදරයෙකු වන නලීන් සමඟ එක්ව නව කාත්තන්කුඩිය ක්‍රීඩා පිටිටනිය පාරේ, අංක 53 දරන ස්ථානයේ "JN පියෝ ගෝල්ඩ් ඇන්ඩ් සිල්වර් වර්ක්ෂොප්" නමින් ව්‍යාපාරයක් තමන්ගේ නමින් නගර සභාවේ ලියාපදිංචි කර ආරම්භ කර පවත්වාගෙන ගිය බවත් ඔහු පවසා ඇත. ඔහුගේ කඩය පිහිටි කාත්තන්කුඩි ප්‍රදේශය මුස්ලිම් ජනයා වෙසෙන

ප්‍රදේශයක් බැවින් සිකුරාදා දිනවල කඩවල් වසා තබන නිසා, ඔහුට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීමට සිකුරාදා දිනවල කොළඹ පැමිණීමට සිදු වී වූ බවත් ඔහු කොළඹදී සාක්ෂිකරුවෙකු වන සලවතුල්ලාගේ කඩය, නව්වත්රා ආයතනය, සන්ජුවෙලර්ස්, හාජා ජුවෙලරි, රිසානා ජෙම්ස් සහ කන්නන් කම්පැනිය වැනි කඩවලින් රසායනික ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගෙන තිබෙන බවත් ඔහුගේ රන් පිරිපහදුව සඳහා ඔහුට මාසිකව නයිට්‍රික් ඇසිඩ් කිලෝ 35 කැන් 15ක් සහ සල්ෆියුරික් ඇසිඩ් ලීටර් 20 කැන් 5ක් පමණ අවශ්‍ය බවත් කල්මුණේ, මඩකලපුව සහ ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවලින් පවා පාරිභෝගිකයන් ඔහුගේ කඩය වෙත පැමිණ තිබෙන බවත් මෙම ව්‍යාපාරයෙන් ඔහු මසකට ලක්ෂ පහක පමණ ආදායමක් උපයා ඇති බවත් ඔහු පවසයි. තමන්ට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනා සහ සාක්ෂි ප්‍රතික්ෂේප කරමින් ඔහු පෙන්වා දෙන්නේ, තමන් පුත්තලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු යැයි බොරු පවසා බඩු ගත් බවට සාක්ෂිකරු සලවතුල්ලා පවසන කතාව අසත්‍ය බවයි. තමන් වංචා සහගත ලෙස ක්‍රියා කළේ නම් සන්ජුවෙලර්ස් සහ නව්වත්රා ආයතන වෙත තමන්ගේ නියම දුරකතන අංකය, නම සහ පවුලේ විස්තර ලබා නොදෙන බව ඔහු පවසයි. සලවතුල්ලා බිල්පත් ලබා නොදෙන නිසා තමන් මිල අඩු ස්ථාන සොයා කොළඹ කඩ කිහිපයකින්ම රසායනික ද්‍රව්‍ය මිලදී ගත් බව ඔහු පවසයි. තවද, ඇසිඩ්වලින් ආරක්ෂා වීමට අත්වැසුම්, මුහුණු ආවරණ සහ ආරක්ෂිත

සපත්තු වැනි දෑද තමා මිලදී ගෙන ඇති බවත් තමා කොළඹ පැමිණි විට බැන්ග්ෂෝල් හෝටලයේ නතර වූ අතර, විමර්ශකයන් විසින් ඔහුගේ ජංගම දුරකතන අංකය 2019 මාර්තු 1 වන දින පමණක් ලකුණු කර තිබීම පක්ෂග්‍රාහී විමර්ශනයක් බවට ඔහු චෝදනා කරයි. ඔහු පවසන්නේ සහරාන්, රිල්වාන් සහ සෙයිනි යන අය තමන්ගේ අල්ලපු ගෙවල්වල පදිංචිව සිටි බවයි. රිල්වාන්ද රන් භාණ්ඩ සම්බන්ධ රැකියාවක් කළ බව සාක්ෂි මඟින් තහවුරු වී තිබියදී, තමන්ව පමණක් අත්අඩංගුවට ගෙන මෙම පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කිරීමට උත්සාහ කර ඇති බවත් තමන් කිසිදු අන්තවාදී හෝ ත්‍රස්තවාදී ක්‍රියාවකට සම්බන්ධ නැති බවත්, එවැනි චේතනාවක් කිසිවිටෙකත් නොතිබූ බවත් ඔහු අවධාරණය කරයි. මෙම නඩුවේ සාක්ෂිකරුවන් 500කට අධික ප්‍රමාණයක් සාක්ෂි ලබා දුන්නද කිසිවෙකු තමන් වරදක් කල බවට සම්බන්ධ කර පෙන්වා නැති බැවින්, තමන්ව මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටී.

<u>විශ්ලේශණය</u>

මෙම චූදිත ගේ ඉහත ප්‍රකාශය ඇගැයීමේ දී පෙනී යන්නේ ඔහු උත්සහ දරා ඇත්තේ ඔහු කොළඹ බංගසාල වීදියේ පිහිටි නව්චත්රා ආයතනය, සන්ජුවෙලර්ස්, භාජා ජුවෙලරි, රිසානා ජෙම්ස් සහ කන්නන්

කම්පැනිය වැනි කඩවලින් රසායනික ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගෙන තිබෙන බවත් ඔහුගේ රන් පිරිපහදුව සඳහා ඔහුට මාසිකව නයිට්‍රික් ඇසිඩ් කිලෝ 35 කෑන් 15ක් සහ සල්ෆියුරික් ඇසිඩ් ලීටර් 20 කෑන් 5ක් පමණ අවශ්‍ය බවත් පෙන්වා දීමට වුවද මෙම නඩුවේ පැමිණිල්ලෙන් පෙන්වා දී ඇති පරිදි 2019-3-1 දින වනවිට එනම් පාස්කු බෝම්බ ප්‍රහාර මාලාවට ඉත ආසන්න කාලසීමාවක එලෙස ඔහු විසින් නයිට්‍රික් ඇසිඩ් සහ සල්ෆියුරික් ඇසිඩ් විශාල වශයෙන් මිලදී ගෙන ඇති අයුරු මෙම අධිකරණයේ පැමිණිල්ලෙන් සාක්ෂි ලබා දුන් පැ.සා 835 සුබ්‍රමණියම් සිවකුමාර්, සහ පැසා.1298 සින්නයියා යන සාක්ෂිකරුවන් ගේ සහ පැසා.1331 කාජා මොහිදීන් යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව හෙලි වී ඇති අතර ඔහුගේම සහෝදරයා මෙම අධිකරනයේ සාක්ෂි දෙමින් ලකුණු කරන ලද බලපත්‍රය 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ එකක් වන අතර ඒ අනුව 2019-3-1 දින වනවිට ඔහු සතුව නීත්‍යානුකූල බලපත්‍රයක් තිබී නොමැති අතර ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ නිවස අසල පදිංචි මෙම චූදිත හට එලෙස 2018 වර්ෂයට පමණක් වලංගු වූ බලපත්‍රයක් තිබුණ ද 2019 වසරේ ඇසිඩ් මිලදී ගන්නා අවස්ථාවේ ඔහු සතුව ඊට අදාළ නීත්‍යානුකූල බලපත්‍රයක් හෝ තිබී නොමැති පසුබිම තුල සහ සම්මන්තුරේ **සෙන්නල් ග්‍රාමය ආරක්ෂිත නිවසෙන්** නයිට්‍රික් සහ සල්ෆියුරික් ඇසිඩ් සොයාගෙන තිබීම මෙන් ම පාස්කු බෝම්බ ප්‍රහාර මාලාවේ දී භාවිතා කර ඇති බෝම්බ සෑදීමට සල්ෆියුරික් ඇසිඩ් සහ යූරියා නයිට්‍රේට් යොදාගෙන

තිබීම සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් රජයේ රස පරීක්ෂක ගේ සාක්ෂි තුලින් හෙළි වී තිබීම සලකා බැලීමේ දී එම පරිවේශණීය සාක්ෂි මෙම 19 වූදිතට එරෙහිව එකම සහ ඒකායන අනුමිතියකට එළඹීමට පාදක වේ. ඒ අනුව සමස්තයක් ලෙස ගෙන බැලීමේ දී මෙම වූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී සඳහන් කරණ ලද කරුණු විස්වාසනීයත්වයෙන් තොර බවට අපහට පෙනී යයි. ඒ අනුව ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිලිගැනීම අප ප්‍රතික්ෂේප කරමු.

<u>20 වූදිත වන සෙයිනුල් ආබ්දීන් මොහොමඩ් ජසීම් විසින්</u>

<u>විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය</u>

සෙයිනුල් ආබ්දීන් මොහොමඩ් ජසීම් නැමැති 20 වන විත්තිකරු තමා කාත්තන්කුඩියේ උපත ලබා, සායිවා විද්‍යාලය, අන්නාසර් විද්‍යාලය සහ කාත්තන්කුඩි මධ්‍යම විද්‍යාලයෙන් කලා අංශයෙන් උසස් පෙළ හදාරා B සාමාර්ථ දෙකක් සහ C සාමාර්ථයක් ලබාගත් බව පවසයි. පවුලේ ආර්ථික අපහසුතා සහ කාලය නොමැති වීම නිසා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරම්භ කළ බාහිර උපාධිය අතරමග නතර කර විවිධ රැකියා කළ ඔහු, 2017 වර්ෂයේ සිට පරිගණකගත යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස එම්බ්‍රොයිඩරි ඇඟලුම් ආයතනයක සේවය කර ඇත. නැගෙනහිර

පළාතේ එම්බ්‍රොයිඩරි ආයතන පිහිටා ඇත්තේ කාත්තන්කුඩි සහ අට්ටාලෙයිච්චේන ප්‍රදේශවල පමණක් බැවින් ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර වැනි ප්‍රදේශවලින් රජයේ නිලධාරීන්, පාසල්, විශ්වවිද්‍යාල, ක්‍රීඩා සමාජ, විදුලිබල හා ජල සම්පාදන මණ්ඩල, පුද්ගලික සමාගම් මෙන්ම විවිධ ආගමික (මුස්ලිම්, හින්දු, ක්‍රිස්තියානි) සංවිධාන, දේවස්ථාන, රෝහල්, පොලිසිය, බන්ධනාගාර සහ නාවික හමුදාව වැනි ආයතනවලින් (සෘජුව හෝ ටේලර්වරුන් හරහා වක්‍රව) ටීෂර්ට්, තොප්පි, බෑග් වැනි දෑ සඳහා ඇණවුම් ඔවුන්ගේ ආයතනයට ලැබී ඇත. පාරිභෝගිකයින්ට අවශ්‍ය වෙළඳ ලාංඡන නිර්මාණය කිරීමට සහ ව්‍යාපාරික ප්‍රවර්ධනය සඳහා අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ඔස්සේ විවිධ පොදු ස්ථාන, උත්සව සහ දේවස්ථාන පිළිබඳ තොරතුරු සෙවීම ඔහුගේ සාමාන්‍ය රාජකාරියේ ස්වභාවය විය. ආයතනයේ හිමිකරුගේ මල්ලි සමඟ ඇති වූ ආරවුලක් නිසා ඔහු ඉවත් වූ පසු, 20%ක වැටුපක් සහ පෞද්ගලික ඇණවුම් සඳහා ලැබුණු කොමිස් මුදලක් මත විත්තිකරු විසින් මෙම ව්‍යාපාරික කටයුතු කරගෙන ගොස් ඇත. 2019 අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරයෙන් පසු ඔහුගේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අඩාල වූ අතර, 2019 මැයි 21 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) ඔහුගේ නිවස පරීක්ෂා කර ජංගම දුරකථන සහ ලැප්ටොප් පරිගණකය ලබාගෙන විමර්ශනයක් සඳහා මඩකලපුව පොලිසියේ අපරාධ අංශයට රැගෙන ගොස් තිබේ. එහිදී, 2018 දෙසැම්බර් මාසයේදී ඔහු අන්තර්ජාලයෙන් 'සියෝන් දේවස්ථානය' ඇතුළු පොදු

ස්ථාන සෙවූයේ මන්දැයි ප්‍රශ්න කර ඇති අතර, තමා රැකියාවේ ස්වභාවය අනුව සියෝන් දේවස්ථානය, ශාන්ත අන්තෝනි මේරි දේවස්ථානය ඇතුළු බොහෝ දේවස්ථාන, රෝහල්, පාසල් සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි ස්ථාන සෙවූ බව ඔහු පැහැදිලි කර ඇත. තහනම් නොකල දෙයක් සෙවීම වරදක්දැයි ඇසූ විට ප්‍රශ්න කළ නිලධාරියා පවසා ඇත්තේ ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයෙකු වීම නිසා සැකයක් පවතින බවයි. පසුව ඔහුව කොළඹට රැගෙන ගොස් මාස 3ක් රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන ප්‍රකාශ ලබාගෙන ඇති අතර, සිංහල භාෂාව කතා කිරීමට, ලිවීමට හෝ කියවීමට නොදන්නා ඔහුගේ ප්‍රකාශ ඇතැම් විට කාන්තා පොලිස් කොස්තාපල්වරියකගේ හෝ වෙනත් රැඳවියන්ගේ පරිවර්තන සහය ඇතිව ලබාගෙන ඇත. වයස 21 සිට දියවැඩියා රෝගයෙන් පෙළෙන සහ ඉන්සියුලින් ගන්නා ඔහුව, නිදහස් කරන බව පවසා 2019 අගෝස්තු 21 වන දින මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණය මඟින් රක්ෂිත බන්ධනාගාරගත කර ඇත. පසුව ඔහු මඩකලපුව බන්ධනාගාරයේ මාස 6ක්ද, කුරුවිට බන්ධනාගාරයේ දින 12ක්ද, පසුව ත්‍රිකුණාමලය බන්ධනාගාරයේද රඳවා තැබූ අතර, කුරුවිට සිටියදී ඔහුගේ මල්ලි මියගිය බව ඔහු දැනගෙන ඇත්තේ දින දෙකකට පසුව රූපවාහිනී ප්‍රවෘත්ති මඟිනි. ඔහුගේ මල්ලි සමඟ සිටි අනෙක් සැකකරුවන් නිදහස් වූ අතර, ඔහුට මල්ලිගේ දේහය බැලීමටවත් අවස්ථාවක් නොලැබුණි. කොරෝනා වසංගතය නිසා පවුලේ අයට ඔහුව බැලීමට පැමිණීමට නොහැකි වූ අතර,

දැඩි ආර්ථික අපහසුතා සහ කොළඹ නීතිඥයන් හමුවීමට නොහැකි වීම නිසා මූලික අයිතිවාසිකම් (FR) නඩුවක් පැවරීමටද ඔහුට නොහැකි විය. 2021 සැප්තැම්බර් මාසයේදී ඔහුට විරුද්ධව කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව දැනගත් පසු, 2021 ඔක්තෝබර් 4 වන දින සිට ඔහු කොළඹ බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාරගතව සිටී. පැමිණිල්ලේ නඩු විභාගය අවසන් වන තෙක්ම ඔහුට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ බවත්, අවසානයේ පොලිස් නිලධාරී එස්.අයි යසංග විසින් සාක්ෂි දෙමින් විත්තිකරු 2018 දෙසැම්බර් මාසයේදී ජංගම දුරකථනයෙන් 'සියෝන් දේවස්ථානය' සෙවූ බව ප්‍රකාශ කලද, හරස් ප්‍රශ්න කිරීම් හමුවේ පොදු ස්ථාන සෙවීම වරදක් නොවන බව එම නිලධාරියා පිළිගෙන ඇත. මීට අමතරව මුස්තකීම් නැමැති සාක්ෂිකරුවෙකු විසින් විත්තිකරු තම ගමේ අයෙකු ලෙස හඳුනා ගැනීම හැර වෙනත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත. තමා කිසිදු වරදක් නොකර වසර අටක කාලයක් බන්ධනාගාරගතව සිය තරුණ කාලය ගත කර ඇති බවත්, තමා ආගම නිවැරදිව පිළිපදින මුස්ලිම්වරයෙකු ලෙස ආගමට පටහැනිව සියදිවි නසාගැනීම්වලට කිසිදිනක සහය නොදෙන බවත් විත්තිකරු පවසයි. පාස්කු ප්‍රහාරයට, එහි මහ මොළකරුවන්ට හෝ කුමන්ත්‍රණකරුවන්ට සෘජුව හෝ වක්‍රව තමාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බව අවධාරණය කරන විත්තිකරු, තමාට එල්ල කර ඇති සියලුම චෝදනා ප්‍රතික්ෂේප

කරමින් තමා මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටී.

පැමිණිලි පාර්ශවයෙන් චිත්තිකරුට එරෙහිව ඉදිරිපත් කරන ප්‍රධාන සාක්ෂිය වන්නේ ඔහු 2018 දෙසැම්බර් මාසයේදී තම ජංගම දුරකථනයෙන් 'සියෝන් දේවස්ථානය' අන්තර්ජාලය ඔස්සේ සෙවීමයි. නමුත් අන්තර්ජාලය ඔස්සේ පොදු ස්ථානයක් සෙවීම ලංකාවේ පවතින කිසිදු නීතියකින් තහනම් කර නොමැති අතර, එය අපරාධමය ක්‍රියාවක් නොවන බව පැමිණිල්ලේ සාක්ෂිකාර පොලිස් නිලධාරී එස්.අයි. යසංග පවා හරස් ප්‍රශ්න හමුවේ පිළිගෙන ඇත.

චිත්තිකරුගේ අන්තර්ජාල සෙවීම් ඔහුගේ සාමාන්‍ය වෘත්තීය රාජකාරියේ (පරිගණකගත එම්බ්‍රොයිඩරි යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වෙළඳ ලාංඡන සහ සැලසුම් නිර්මාණය කිරීම) කොටසක් බව පැහැදිලිය ඔහු සියෝන් දේවස්ථානය පමණක් නොව, ශාන්ත අන්තෝනි මේරි දේවස්ථානය, විවිධ රෝහල්, පාසල් සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි පොදු ස්ථාන රැසක් සිය වෘත්තීය ප්‍රවර්ධන කටයුතු සඳහා සෙවුම් කර ඇත. එමඟින් කිසිදු තේරුම්ගත හැකි අපරාධකාරී චේතනාවක් කිසිසේත් පෙනී යන්නේ නැත.

මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැමිණිල්ලේ සාක්ෂි අංක 1030 මොහොමඩ් ශරීෆ් මොහොම්මදු මුස්තකීම් නැමැති සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් මෙම 12 වූදිත තමාගේ ගමේ අයෙකු ලෙස හඳුනාගෙන සාක්ෂි

ලබා දුන්න ද එම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මෙම චූදිත කිසිදු නීති විරෝධී ක්‍රියාවක් කල බවට හෝ එවැන්නකට සම්බන්ධ වූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත. එකී පසුබිම තුල මෙම 12 චූදිත විසින් මෙම නඩුවේ අධිචෝදනා පත්‍රයේ 01 චෝදනාවේ සඳහන් පරිදි මේ වනවිට ස්වයංඝාතක බෝම්බ පුපුරුවා හැර මියගොස් සිටින සහරාන් හෂීම් නැමත්තා ඇතුළු අනෙකුත් ස්වයංඝාතක බෝම්බකරුවන් සමග එක්ව එලෙස බෝම්බ පුපුරුවා හැරීමෙන් පාස්කු ප්‍රහාරය සිදු කිරීමට කුමන්ත්‍රණය කල බවට හෝ අනුබල දීමක් සිදුකර ඇති බවට (Aiding and Abetting) තීරණය කිරීමට තරම් කිසිදු සෘජු හෝ පරිවේෂණීය සාක්ෂියක් මෙම අධිකරණයේ ඉදිරිපත් වී නැත.

21 චූදිත මොහොමඩ් මුස්තාෆා මොහොමඩ් රිස්වාන් විසින් චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සාරාංශය

ඔහු තම චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී පවසා ඇත්තේ, තමා කොළඹ ප්‍රදේශයේ උපත ලබා වයස අවුරුදු පහේදී මාවනැල්ලේ ඕවත්ත ප්‍රදේශයට පදිංචියට ගිය බවත්, මාවනැල්ල සහිරා විද්‍යාලයෙන් 8 වන වසර දක්වා අධ්‍යාපනය ලැබූ බවත්, ඉන්පසු කොළඹ සිය පියාගේ අයියාගේ වෙළඳසැලක සහ මාවනැල්ලේ සිය මාමාගේ ගෘහ භාණ්ඩ වෙළඳසැලක සේවය කරන ලද බවත්ය. ඔහු රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු කුලී ගමන් යමින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද

බවත්, පසුව ඔහු ඩුබායි රාජ්‍යයේ වසර තුන හතරක්ද, නැවත ලංකාවට පැමිණ "සාරි හවුස්" ආයතනයේ රියදුරෙකු ලෙසද, ඉන්පසු සෞදි අරාබියේ වසර එකහමාරක් සහ කටාර් රාජ්‍යයේ මාස හයක්ද රියදුරෙකු ලෙස සේවය කර ඇත. 2007 වර්ෂයේදී ෆාතිමා රිස්නා සමඟ විවාහ වූ ඔහු, ඉන්පසු ටික කලක් රියදුරු රැකියාව කර, මාස හතරකට පසු කොරියාව බලා පිටත්ව ගොස් 2010 වසරේදී නැවත ලංකාවට පැමිණ කොරියාවේදී ඉතිරි කරගත් මුදලින් කුඩා වාහනයක් මිලදී ගෙන 2016 වර්ෂය වන තෙක් ගුවන් තොටුපොළ, නුවරඑළිය, වැලිමඩ, යාපනය වැනි දිවයින පුරා ප්‍රදේශවල කුලී ගමන් සිදු කර ඇති බවත්, එසේම තමාගේ ගම්පළාතේද කුලී ගමන් යාම සිදු කරන ලද බවත්, තමාගේ පැරණි නිවස කඩා අලුතින් ඉදිකිරීමේ අවශ්‍යතාවය මත තම බිරිඳගේ උපදෙස් පරිදි එම වාහනය විකුණා දැමූ බවත් පවසා ඇත. ඉන්පසු තාවකාලික කුලී ගමන්වල රියදුරෙකු ලෙස කටයුතු කරමින් සිටියදී ආබිදින් නැමැති පුද්ගලයාගේ වෑන් රථය කුලී ගමන් සඳහා තමා ලබාගත් බවත් එසේම ආබිදින්ගේ අවශ්‍යතා සඳහාද රියදුරෙකු ලෙස කටයුතු කර ඇති බවත් මෙම චූදිත පවසා ඇති අතර, 2019 අප්‍රේල් 21 වන දින දිගන ප්‍රදේශයේ කුලී ගමනක යෙදී සිටියදී මෙම ප්‍රහාරය පිළිබඳව දැනගන්නට ලැබුන බවත්, ඉන්පසු තමා කුලී ගමන ගිය පිරිස සමඟ නැවත පැමිණ සාමාන්‍ය පරිදි වෑන් රථය ආබිදින්ගේ නිවසට දමා තමන්ගේ දරුවන් සමඟ නිවසේ රැඳී සිටි බවත්, පසුව 2019 ජූනි 12 වන දින මුහුණු වසාගත් හමුදා නිලධාරීන් පිරිසක් පැමිණ විමර්ශනයක්

සඳහා යැයි පවසමින් තමාගේ ඇස් වසා රැගෙන ගිය බවත්, ඉන්පසු පැය 24ක් පුරා ඇස් වසා තැබීමෙන් පසු තමාව ත්‍රස්ත විමර්ශන ඒකකයට (TID) භාර දුන් බවත්, තමන්ව අත්අඩංගුවට ගත්තේ ඇයිදැයි විමසූ විට ඔහු කුලී ගමන් සඳහා ගොස් ඇති නිසා බවට පැවසූ බවත් චූදිත පවසා ඇත. ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ ඔහුට දරුවන් තිදෙනෙකු සිටින බැවින් එදිනෙදා ජීවත් වීමට මෙලෙස රැකියාව කල බවත්, වසර එකහමාරක කාලයක් රැඳවුම් නියෝග මත ඔහුව TID භාරයේ තබාගෙන පසුව වැලිසර කඳවුරේ, වවුනියාවේ සහ තංගල්ලේ රඳවා තබාගෙන සිටි බවත්, එහිදී තමාට නීතිඥ සහය ලබා ගැනීමට අවශ්‍ය නොවන බවත් අධිකරණයට ඉදිරිපත් කල පසු නිදහස් කරනු ඇති බවට එහි නිලධාරීන් තමාට පැවසුවද කෙසේ වෙතත්, වසරක් පමණ රක්ෂිත බන්ධනාගාරගතව සිටීමෙන් පසු 2021 ඔක්තෝබර් 4 වන දින මෙම මහාධිකරණ නඩුව පවරා ඇති බවත්, වසර පහක් පුරා නඩුව විභාග කළද තමාට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවත් මෙම නඩුවේදී පොලිස් සාක්ෂිකරුවන් තිදෙනෙකු සහ පල්ලියේදී ඔහුව දුටු බවට ඔහුගේ ගමේ අයෙකු වන ජවුෆර් සාදික් සාක්ෂි ලබා දුන් බවත්, උප පොලිස් පරීක්ෂක යසංක නැමැති සාක්ෂිකරු විසින් දුරකථන විස්තර සම්බන්ධයෙන් සූම් තාක්ෂණය ඔස්සේ සාක්ෂි ලබා දී තමාගේ දුරකථන අංකයට මෙම නඩුවේ 04 වන චූදිතගේ දුරකථන අංකයෙන් දුරකථන ඇමතුම් ලැබී තිබෙන බවට පවසා සාක්ෂි ලබා දී ඇතද, තමා වසර 13ක් පුරා තම කුලී ගමන් සහ තැරැව්කාර (බ්‍රෝකර්) කටයුතු සඳහා භාවිත

කළ, කිසි දිනක ක්‍රියා විරහිත නොකළ දුරකථන අංකය තමාට විරුද්ධව සාක්ෂියක් ලෙස ගෙන ආවද, එමඟින් තමන් කිසිදු නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකළ බව ඔහු අවධාරණය කර පවසා සිටී. එසේම මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් මධුෂාන් නැමැති නිලධාරියා තමාව අරුප්පොළ ප්‍රදේශයට රැගෙන ගොස් සමන් නැමැති නිලධාරියාට භාර දුන් බව පැවසුවද, තමා සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් සිදු කළේදැයි ඇසූ ප්‍රශ්නයට "නැත" යනුවෙන් පිළිතුරු ලබා දී ඇති බවත්, විමර්ශන නිලධාරී සමන් සාක්ෂි ලබා දෙමින් තමා ආබ්දින්ගේ වෑන් රථය පැදවූ රියදුරෙකු බව දැන ගත් බව පමණක් මෙම අධිකරණයට පවසා සිටි බවත්, මෙම චූදිත පවසා ඇත. තවද තමන් කිසිදු නීති විරෝධී ක්‍රියාවක් සිදු කර නොමැති නිසා පොලිසියෙන් හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කැඳවීමක් කළේ නම් බියකින් තොරව ඉදිරිපත් වන බවත් තමන්ට මෙම ප්‍රහාරයට කිසිදු සම්බන්ධයක් නොමැති බවත් පෙර වැරදි හෝ චෝදනා කිසිවක් තමන්ට එරෙහිව නොමැති බවත් ප්‍රකාශ කරමින් තමන් අත්අඩංගුවට ගන්නා විට වයස අවුරුදු 11, 8 සහ 3 ක් වූ දියණියන් තිදෙනා සහ බිරිඳ මේ වන විට දැඩි මානසික පීඩනයකින් සහ ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන බවත්, උසස් පෙළ හදාරන වැඩිමල් දියණිය රෝගී තත්ත්වයෙන් පසුවන බවත් පවසා සිය දරුවන් රැකබලා ගැනීමට සහ ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් යමක් කිරීමට අවස්ථාව ලබා දෙමින් තමන්ව මෙම නඩුවෙන් නිදහස් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා ඇත.

විශ්ලේෂනය

මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය අනුව ඔහු කොළඹ ප්‍රදේශයේ ඉපදී පසුව මාවනැල්ල ප්‍රදේශයේ ජීවත් වී ඇති තැනැත්තෙකු බව පෙනී යන අතර ඔහු රියදුරෙකු ලෙස වසර කීපයක් මෙරට කුලී ගමන් යමින් සිට 2003 හෝ 2004 කාලයේ ඩුබායි රාජ්‍යයේද රියදුරු රස්සාව සිදු කර මෙරට පැමිණ 2007 වසරේ විවාහ වී ඉන්පසු කොරියා රාජ්‍යයේ රැකියාවකට ගොස් යලි පැමිණ ඔහු ඉතුරු කරගෙන තිබූ මුදල්වලින් වාහනයක් මිලදී ගෙන එම වාහනයෙන් ලංකාව පුරාම ඔහුට ලැබෙන කුලී ගමන් ගොස් ඇති බව පෙනී යන අතර ඔහු ගුවන්තොටුපොළ, නුවරඑළිය, වැලිමඩ, යාපනය ආදී ප්‍රදේශවලට කුලී ගමන් ගොස් ඇති බව පෙනී යයි. පසුව එම වාහනය විකුණා දමා තාවකාලික කුලී ගමන්වල රියදුරෙකු ලෙස කටයුතු කර ඇති බව පෙනී යන අතර එලෙස සිටියදී ආබ්දීන් නැමැති පුද්ගලයා තමාට කුලී ගමන් යන්න එනම් හයර් යන්න කතා කළ බවත්, තමා එම ආබ්දීන් නැමැත්තාගේ වෑන් එක අරගෙන කුලී ගමන් ගිය බවට පවසා ඇති අතර එලෙස සිටියදී 2019.06.12 වන දින හමුදාවෙන් පැමිණ ඔහුව අත්අඩංගුවට ගත් බවට පවසා ඇති අතර ඉන්පසු වසර 1 ½ ක් තිස්සේ රැඳවුම් නියෝග තබාගෙන සිටි බව සහ ඔහුව අත්අඩංගුවට ගත් හේතුව ලෙසට ඔහු මෙලෙස හයර් ගොස් ඇති නිසා අත්අඩංගුවට ගත් බවට පැවසූ බවට මෙම චූදිත පවසා ඇත. පසුව තමා වසරක කාලයක් පමණ රක්ෂිත බන්ධනාගාර

ගතව සිටීමෙන් පසු මෙම නඩුවේ චූදිතයෙකු ලෙස නම් කර අධිචෝදනා ගොනු කර ඇති බවට ඔහු පවසා ඇත. ඔහුට අනුව, ඔහුට එරෙහිව මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇත්තේ ඔහුගේ ගමේ කෙනෙක් වෙන ජවුෆර් සාදික් යන අය ඔහුව පල්ලියේදී දුටු බව පවසා ඇත.

පැ.සා.1401 ජාසිර්කාන් ජවුෆර් සාදික් යන සාක්ෂිකරු විසින් 2026.05.29 දින පස්වරු 2.10 ට ලබා දී ඇති සාක්ෂියේදී වැඩිදුර මූලික සාක්ෂි ලබා දෙමින් දෙල්ගහගොඩ තවුහිද් ජමාත් පල්ලියේ පැවති වැඩමුළුව අතරවාරයේදී තවුහිද් පල්ලියට රිස්වාන් නැමති කෙනෙක් දවසට පස්වතාවක් වදින්න pray කරන්න එන බවත් පවසා ‘‘එයා අර වැඩසටහනේ හිටියා කියලා මට කියන්න බැහැ. අපි කොහොමත් පස්වතාවක් pray කරන්න යන නිසා පල්ලියට යනවානේ. ඒ වගේ එතනට ඇවිල්ලා ගියා මට මතකයි’’ යනුවෙන් සඳහන් කර විවෘත අධිකරණයේ සිටි මෙම චූදිතව පෙන්වා හඳුනා ගැනීමක් කර ඇතද, මෙම සාක්ෂිකරු පැහැදිලිවම සඳහන් කර ඇත්තේ එම රිස්වාන් නැමැති මෙම චූදිත සාක්ෂිකරු පැවසූ වැඩසටහනේ එනම් 04 සහ 09 චූදිතයින් දේශන පැවැත්වූ වැඩමුළුවේ සිටියා යැයි තමාට පැවසීමට බැරි බවත්, මෙම රිස්වාන් නැමැති චූදිත ආගමික වතාවත් කිරීම සඳහා පල්ලියට ඇවිත් ගිය බව තමාට මතක බවයි.

ඒ අනුව පෙනී යන්නේ මෙම 21 චූදිතව විවෘත අධිකරණයේ හඳුනාගෙන ඇති මෙම පැ.සා.1401 ජවුෆර් සාදික් යන සාක්ෂිකරුගේ

සාක්ෂිය තුළින් මෙම චූදිත එම පල්ලියේ පැවති දේශනයට සහභාගී වූ අයෙක් නොවන බවට පැහැදිලිව සඳහන් කර ඇති බවයි.

මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇති පරිදි නිරන්තරයෙන්ම පුද්ගලයින් කුලී ගමන් යාම සඳහා ඔහුගේ ජංගම දුරකථනයට ඇමතුම් ලබා දෙන බව වන අතර ඔහුගේ ජංගම දුරකථනය වසර 13 ක කාලයක් තිස්සේ භාවිතා කරන සිම්පතක් අඩංගු ජංගම දුරකථනයක් බවත්, පැය 24 පුරාම එය ක්‍රියාත්මක බවත් චූදිත පවසා ඇති අතර ඒ අනුව මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් උප පොලිස් පරීක්ෂක යසන්ක විසින් දුරකථන විස්තර වාර්තා සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් බව පවසා ඇති අතර එසේම සමන් සහ මධුශාන් නැමැති පොලිස් නිලධාරීන්ගේ සාක්ෂියේදී ඔවුන් තමාව අරුප්පොළ ප්‍රදේශයට රැගෙන ගිය බවට සාක්ෂි ලබා දුන් බවත් කෙසේ වෙතත් සමන් නැමති නිලධාරියාගේ සාක්ෂියේදී ආබ්දීන් නැමැත්තෙකුගේ වාහනය මොහු රියදුරු ලෙස කටයුතු කළ බවට සඳහන් කර ඇති බවට සාක්ෂි ලබා දුන් බවත් පවසා ඇති බවත් ඒ හැර තමා කිසිදු නීතිවිරෝධී දෙයක් කර නැති බව මෙම චූදිත පවසා ඇත.

සැබැවින්ම මෙම චූදිත සම්බන්ධයෙන් චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සළකා බැලීමේදී සහ මෙම නඩුවේ සමස්තයක් ලෙස පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි සළකා බැලීමේදී මෙම චූදිත 2019.04.21 දින පාස්කු ප්‍රහාරයේදී ස්වයංඝාතක බෝම්බකරුවන් ලෙස

මියගොස් ඇති ස්වයංඝාතක බෝම්බකරුවන් කිසිවකු සමඟ හෝ කිසියම් හෝ දැන හැඳුනුම්කමක් තිබුණු බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැති අතර ඔහුගේ නම සඳහන් කර ඇත්තේ මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයක සඳහන් කර ඇති ජවුෆර් සාදික් නැමැති සාක්ෂිකරු පමණක් බව අප හට පෙනී යන අතර අප විසින් ඉහතින් ද සඳහන් කර ඇති පරිදි මෙම චූදිත තවුහිද් පල්ලියට ගොස් ඇත්තේ දවසට පස් වතාවක් සිදු කරන ආගමික වතාවත් සිදු කිරීම සඳහා පමණක් බවට පැහැදිලිව පෙනී යන අතර එම සාක්ෂිකරුම පවසා ඇත්තේ මෙම රිස්වාන් නැමැත්තා එම පල්ලියට ආගමික වතාවත්වලට පැමිණීම විනා එම වැඩමුළුවට සහභාගී වුනේ නැති බවයි.

මෙම චූදිත කුලී රියදුරෙකු ලෙස කටයුතු කරන තැනැත්තෙක් වන අතර ඔහු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි ඔහුගේ ජංගම දුරකථනයට දුරකථන අංකය අමතා ඕනෑම අයෙකුට කුලී ගමන් යාමට ඔහුගේ සේවය ලබාගැනීමට බාධාවක් තිබිය නොහැකි අතර වාහන රියදුරෙකු ලෙස කුලී ගමන් යාම කිසිසේත් වරදක් ලෙස සළකා බැලිය නොහැකිය.

එසේම පැමිණිල්ලෙන් සාක්ෂි ලබා දී ඇති පැ.සා.1641 යසන්ක ජයසිංහ නැමැති පොලිස් පරීක්ෂකවරයාගේ සාක්ෂිය තුළින් මෙම චූදිතගේ දුරකථන අංකය යම් යම් ප්‍රදේශවල කුළුණු වාර්තාවල දුරකථන අංකය සමඟ මෙම නඩුවෙහි 04 වන විත්තිකරුගේ දුරකථන අංකය අවස්ථා 10

කදී පමණ සම්බන්ධ වී තිබුණු බවට සඳහන් කර ඇතද, 04 වන චූදිත සහ මෙම චූදිත එකම ගමේම පදිංචි පුද්ගලයන් වන පසුබිම තුළ හුදෙක් රියදුරෙකු ලෙස කුලී ගමන් යන මෙම චූදිතගේ ජංගම දුරකථනයට ඔහුගේම ගමේ පදිංචි 04 වන චූදිතගේ ජංගම දුරකථනයෙන් දුරකථන ඇමතුම් අවස්ථා 10 කදී පමණ සම්බන්ධ වී තිබීමෙන් පමණක් මෙම 21 වන චූදිතට අපරාධමය සම්බන්ධතාවයක් තිබූ බවට කිසිසේත් පෙන්වා දිය නොහැකිය.

එමෙන්ම පැ.සා.1933 සමන් කුමාර නැමැති පොලිස් නිලධාරියා විසින් ඔහුට විමර්ශනයේදී මෙම 21 වන චූදිත රියදුරෙකු වශයෙන් රැකියාව කළ බව සහ මාවනැල්ල ප්‍රදේශයේ ආබ්දීන් නැමැති පුද්ගලයෙකුට අයත් වෑන් රථයක් ධාවනය කළ බව පමණක් පවසා ඇතද, රියදුරු රැකියාව තම ජීවිකාව කරගත් 21 වන චූදිත තම එදිනෙදා කුලී රැකියා කටයුතුවලදී මාවනැල්ල ප්‍රදේශයේ ආබ්දීන් නම් පුද්ගලයෙකුට අයත් වෑන් රථයක් ධාවනය කර තිබීම කිසිසේත් අපරාධමය වරදක් ලෙස සළකා බැලිය නොහැකිය. මුස්ලිම් ජාතිකයන් බහුල වශයෙන් ජීවත් වන මාවනැල්ල ප්‍රදේශයේ ආබ්දීන් යන නමින් බොහෝ පුද්ගලයන් සිටිය හැකිය.

එකී පසුබිම තුළ මෙම 21 වන චූදිත වන මොහොමඩ් මුස්තාෆා මොහොමඩ් රිස්වාන් යන අය ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී කුමන ස්ථාවරයක් ගෙන තිබුනද, ඔහුට එරෙහිව ඇති චෝදනාවන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ

පැමිණිල්ල විසින් වන බැවින් ඔහුට ඔහුගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නීතියෙන් අපේක්ෂා කරන්නේ නැත.

ඒ අනුව ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති කරුණු සැබැවින්ම විශ්වාසනීය කරුණු බවත්, ඒ අනුව ඔහුට එරෙහිව සාපරාධී වගකීමක් පැවරෙන්න තරම් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවත්, ඔහුට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි කිසිසේත් සාපරාධී වගකීම් පැවරෙන්නට තරම් ප්‍රමාණවත් නොවන බව අප තීරණය කරමු.

22 වූදිත මීරාසාහීබ් මොහොමඩ් නෆ්ලි විසින් විත්තිකූඩුවේ සිට සිදුකරන ලද ප්‍රකාශයේ සාරාංශය

මෙම චූදිත තමාට එරෙහිව පවරා ඇති සියලුම චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ තමා රැකියාව වශයෙන් සිදුකල තැරැව්කාර (Broker) කටයුත්තක් හේතුවෙන් තමන්ව මෙලෙස අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවට ගන්නා විට වයස අවුරුදු 38ක් වූ තමා දැනට 45 වැනි වියේ පසුවන බවත්, බම්මන්න නාරංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන තමා, තම ගමේ විද්‍යාලයෙන් සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා වයස අවුරුදු 13ත් 16ත් වන කාලයේ සිටම ගමේ ධනවත් පවුල්වල නිවෙස්වලට අවශ්‍ය බඩුබාහිරාදිය කඩවලින් මිලදී

ගෙනත් දීම වැනි කුලී වැඩ සිදුකරමින් මුදල් උපයා ගත් බවත්, මෙම වැඩකටයුතු තම අධ්‍යාපනයට බාධාවක් කර නොගෙන තමා පාසල ආරම්භ වීමට පෙර එම නිවෙස්වලට පාන්, ආප්ප වැනි දෑ ගෙනවිත් දීමෙන් ලැබුණු ආහාර තම මල්ලිලාට සහ නංගිලාට ලබාදීමෙන් පසුව පාසල් ගිය බවත් තම පියා පිළිකා රෝගයෙන් මියගොස් ඇති බවත්, තමාව අත්අඩංගුවට පත්වී ටික කලකට පසු මවද පිළිකා රෝගයෙන්ම මියගිය බවත් මෙම චූදිත පවසා ඇත. තමා සාමාන්‍ය පෙළ විභාගය සමත් වීමෙන් පසුව උසස් පෙළ හැදෑරීම සඳහා කැකුණුගොල්ල ප්‍රදේශයේ විද්‍යාලයකට යාමට අවස්ථාව ලැබී, උසස් පෙළ හදාරන කාලය තුළදී සවස් කාලයේ පොල්තෙල් හිඳින ස්ථානයක වැඩකළ බවත්, තමා කෙසේ හෝ විදේශගත වීමේ අරමුණින් තම කුලී වැඩවලින් ඉතිරි කරගත් මුදලින් රියදුරු බලපත්‍රය සහ විදේශ ගමන් බලපත්‍රය සකස් කරගෙන 2003 වර්ෂයේදී කටාර් රාජ්‍යයට ගොස් වසර හතරක් නිවසක රියදුරෙකු ලෙස සේවය කර 2007 දී නැවත ලංකාවට පැමිණ වාහන තැරැව්කරුවෙකු ලෙස කටයුතු කල බවත් පවසා ඇත. ඉන් නිසි ආදායමක් නොලැබුණු නිසා 2010 දී නැවත කටාර් බලා ගොස් 2013 දී නැවත පැමිණ තම මවගේ ඥාති මාමා කෙනෙකුගේ දියණියක වන මොහොමඩ් සරූද් ෆාතිමා නස්රීනා සමඟ විවාහ වී, . විවාහයෙන් පසු තම බිරිඳ කුලී වැඩවලට යාමට අකමැති වූ බැවින් තැරැව්කාර වෘත්තිය දිගටම කරගෙන ගිය බවත්, තම බිරිඳ ඇදුම් මැසීමේ කටයුතුවල නිරත වී සිටි බවත් තමන්ලාට මොහොමඩ් නෆ්ලි මරියම් නමැති දියණියක් සහ

මොහොමඩ් නෆ්ලි හුසේන් නමැති පුතෙකු සිටින බවත්, තමාව අත්අඩංගුවට ගන්නා විට දරුවන්ගේ වයස අවුරුදු හතරක් සහ තුනක් බවත් පවසා ඇත. දරුවන් දෙදෙනාම සිසේරියන් සැත්කම් මඟින් බිහිවීම නිසා බිරිඳ යම් අපහසුතාවයකින් පසුවීම හේතුවෙන් ඔහුට බිරිඳගේ කැකුණුගොල්ල නිවසේ වැඩි කාලයක් රැඳී සිටීමට සිදුවූ බවත්, තමා තම ගමේ මෙන්ම කැකුණුගොල්ල ප්‍රදේශයේද තැරැව්කාර කටයුතු සිදුකර ඇති බවත්, කැකුණුගොල්ල ප්‍රදේශයේ පිහිටි දමිළ මාධ්‍ය ජාතික පාසලට පිට පළාත්වලින් පැමිණෙන සිසුන්ට නවාතැන් කාමර සොයාදීම, එහි ඇති කුරාන් මද්‍රසා දහයකට අධික ප්‍රමාණයකට පැමිණෙන සිසුන්ගේ දෙමාපියන් සහ ඥාතීන් වෙනුවෙන් අවශ්‍ය වාහන සහ නවාතැන් පහසුකම් සොයාදීම වැනි කටයුතුවලින් ලැබෙන කොමිස් මුදලින් තමා තම පවුලේ ආහාර, අධ්‍යාපන සහ සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන ගිය බවත්, මේ නිසා මුළු කැකුණුගොල්ල ප්‍රදේශයම තමාව හඳුනන්නේ තැරැව්කරුවෙකු (Broker) වශයෙන් බවත් ඔහු පවසා ඇත. 2019 අප්‍රේල් මස 21 වන දින ශ්‍රී ලංකාව තුළ සිදු වූ අනපේක්ෂිත, සිදු නොවිය යුතු සිදුවීම පිළිබඳව තමා දැඩි සේ කණගාටු වන බව පවසන ඔහු, ඉදිරියේදී උදාවීමට තිබූ රාමලාන් උපවාස මාසය වෙනුවෙන් බිරිඳ සමඟ එක්ව ඇඳුම් මැසීමේ කටයුතුවල නිරත වෙමින් සිටියදී 2019 මැයි මස 07 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) නිලධාරීන් විසින් තම නිවසේදී අත්අඩංගුවට ගත් බවත් තමාගේ නමින් මහනුවර ප්‍රදේශයේ නිවසක් කුලියට ගෙන ඇති

බව පවසමින් එලෙස අත්අඩංගුවට ගත් බවත්, තමා බොහෝ වාහන සහ නිවාස තැරැව්කාර කටයුතුවල නිරත වූ බැවින් 2018 මාර්තු මාසයේදී තමා එවැනි නිවසක් කුලියට ගෙන දුන් බවක් තමාට මතකයේ නැති බවත් මෙම චූදිත පවසා ඇත. දිනක් ඔහු කැකුණුගොල්ල පල්ලිය අසල සන්නිවේදන මධ්‍යස්ථානයකට (Communication) ගිය අවස්ථාවක, එහිදී ගමේ පල්ලියේදී නිතර හමුවන සහ ඇසුරු කරන පුද්ගලයෙකු තමාට කුලියට නිවසක් අවශ්‍ය බව පැවසූ බවත්, කැකුණුගොල්ල ප්‍රදේශයේ නිවාස හිඟ නිසා අසල ගමක ඇති කලින් වෙඩින් හෝල් එකක් ලෙස පැවති ස්ථානයක් යෝජනා කළද, තමාට මහනුවර ප්‍රදේශයෙන් තම ෆාම් එකේ වැඩකරන සේවකයන්ට නැවතී සිටීමට නිවසක් අවශ්‍ය බව එම පුද්ගලයා පැවසූ බවත් මහනුවර ප්‍රදේශයේ නිවාස පිළිබඳව තමා නොදන්නා බවත්, සාමාන්‍යයෙන් තොරතුරු සොයන්නේ Ikman.lk වෙබ් අඩවියෙන් බවත් පැවසූ විට, එම පුද්ගලයා කෙසේ හෝ නිවසක් සොයාදෙන ලෙසත් ඒ සඳහා අවශ්‍ය කුලිය ලබාදෙන බවත් තමාට පැවසූ බවත් ඒ අනුව Ikman.lk හරහා මහනුවර ප්‍රදේශයේ නිවසක් සොයාගෙන එහි සඳහන් දුරකථන අංකයට කතා කර, එම නිවස ලබාගත හැකි බව දැනගත් බවත්, පසුව එම පුද්ගලයා සමඟ ඔහුගේ යතුරුපැදියෙන් (ඔහුට පෙට්‍රල් ගසා දුන්) මහනුවර බලා ගොස් එහිදී නිවසේ භාරකරු මුණගැසී නිවස පරීක්ෂා කර බලා දිනකට රුපියල් 20, 000 බැගින් දින තුනක් සඳහා එම නිවස කුලියට ගැනීමට එකඟ වූ බවත් රුපියල් 20, 000ක අත්තිකාරම් මුදලක් එම

පුද්ගලයා විසින් ගෙවනු ලැබූ බවත්, එම වෙන්කිරීම ලියාපදිංචි කිරීම සඳහා අනන්‍යතාවය තහවුරු කිරීමට හැඳුනුම්පත ඉල්ලූ අවස්ථාවේදී, තමන් විසින් තම ජාතික හැඳුනුම්පත ලබාදුන් බවත්, සම්බන්ධ කරගැනීම සඳහා දුරකථන අංකයක් ඉල්ලූ විට නිවසේ නතර වන්නේ තමා නොවන බැවින් නිවසේ නතරවන එම පුද්ගලයාගේ දුරකථන අංකය ලබාදුන් බවත් මෙම චූදිත පවසා ඇත. එම ගනුදෙනුව සඳහා තමාට දිනකට රුපියල් 3, 000 බැගින් කුලියක් (කොමිස් මුදලක්) ලැබුන බවත් පසුව දිනක පල්ලියේදී එම පුද්ගලයා තමාට හමුවූ බවත්, එවිට ඔහුගේ සේවකයන් එහි පැමිණ නතරවී ගිය බව තමාට පැවසූ බවත් මෙම චූදිත පවසා ඇත. මෙම නිවස තැරැව්කරුවෙකු ලෙස තමා සොයා දුන්නද, එහි පැමිණියේ කවුරුන්ද යන්න තමා නොදන්නා බවත්, මෙම නඩුවට අදාළව වසර 7ක කාලයක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින තමාට එරෙහිව සාක්ෂිකරුවන් 547 දෙනෙකු කැඳවා තිබුණද, තමා ජාතික හැඳුනුම්පත ලබාදී නිවස වෙන් කිරීම හැර වෙනත් කිසිදු සාක්ෂියක් තමාට එරෙහිව ඉදිරිපත් වී නොමැති බවත් මෙම චූදිත පවසා ඇත. එසේම තමා පැවසූ නිවසේ අයිතිකරු වන (පැමිණිල්ලේ සාක්ෂි අංක 1388) අධිකරණයේදීද තමාව හඳුනාගෙන නොමැති බවත්, එසේම හරස් ප්‍රශ්න වලදී එම සාක්ෂිකරු පවසා ඇත්තේ නිවස බැලීමට පැමිණි පුද්ගලයා අවස්ථා තුනකදීම එහි පැමිණි නමුත් ඒ කිසිදු අවස්ථාවක තමාව දුටු බවට හෝ සාක්ෂිකරු පවසා නැති බවයි. තමාව අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරිනී මෙන්ඩිස් (පැමිණිල්ලේ

සාක්ෂි අංක 1987) පවා පවසා ඇත්තේ මොහුගේ නමට නිවස වෙන්කර තිබීම නිසා පමණක් මොහුව අත්අඩංගුවට ගත් බවත් බිල්පතේ ලියා ඇති දුරකථන අංකය විත්තිකරුගේ නොවන බවත්, එය එහි නතර වූ පුද්ගලයාගේ බවත්, එය විත්තිකරුගේ අංකයදැයි ස්ථිරවම කිව නොහැකි බවත් එම සාක්ෂිකාරිය හරස් ප්‍රශ්නවලදී පිළිගෙන ඇති බවත්ය. වර්තමාන තාක්ෂණික යුගයේ වරදක් කිරීමට බලාපොරොත්තු වන අයෙකු තම සැබෑ හැඳුනුම්පත ලබා නොදෙන බවත්, තමා නීතිවිරෝධී යමක් නොකල නිසා බියකින් තොරව තම සැබෑ හැඳුනුම්පත ලබාදුන් බවත්, මීට පෙරද වාහන ව්‍යාපාරවලදී, මිතුරන්ට ඇප තැබීමේදී සහ සිම්පත් ලබාගැනීමේදී තම සැබෑ හැඳුනුම්පත මෙලෙසම ලබාදී ඇති බව මෙම චූදිත පවසා සිටී. තැරැව්කරුවෙකු ලෙස තම වෘත්තීය කටයුත්තක් වශයෙන් සිදුකළ මෙම ක්‍රියාව ත්‍රස්තවාදී පනත යටතේ වරදක් බව තමා නොදන්නා බවත්, තමා කිසිදු වරදක් කර නොමැති බවත් පවසන ඔහු, තමාට එරෙහිව කිසිදු සාක්ෂියක් නොමැති බැවින් තමන්ව නිදොස් කොට නිදහස් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටී.

<u>විශ්ලේෂණය.</u>

මෙම 22 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මනාව විශ්ලේශනය කිරීමේ දී පෙනී යන්නේ ඔහු පවසා ඇති කරුණු අනුව සහ ඔහුට එරෙහිව මෙම අධිකරණයේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව වෘත්තීමය තැරැව්කරුවෙකු සාපරාධී චේතනාවකින් කටයුතු කර

තිබීමක් හෝ සාපරාධී හෝ කුමන්ත්‍රණකාරී සබඳතාවක් ඔහුට තිබූ බවට එම සාක්ෂි තුළින් හෙලි නොවන බවය.

ඔහු විසින් නුවර ප්‍රදේශයේ නිවසක් කුලියට ගැනීමට මැදිහත් වීම සිදුකර ඇත්තේ ඔහුගේ ජීවනෝපාය වන සාමාන්‍ය තැරැව්කාර (බ්‍රෝකර්) වෘත්තියේ රාමුව තුළ සිටිමින් බව පෙනී යන අතර ඔහු නීති විරෝධී ක්‍රියාවක් සිදුකල බවට ඉදිරිපත් වූ සක්ෂි එක්ව ගෙන සළකා බැලීමේ දී පෙනී නොයන අතර ඔහු සිය පවුලේ පෝෂණය උදෙසා කුඩා කල සිට කුලී වැඩකර, කටාර් රාජ්‍යයේ රියදුරු රැකියාවක් ද සිදු කර එමෙන්ම කැකුණුගොල්ල ප්‍රදේශයේ වාහන සහ නිවාස කුලියට ලබාදීමේ ස්වාධීන තැරැව්කාර රැකියාවක නිරත වූ බව ඔහුගෙ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ දී පෙනී යයි.

මෙම නඩුවේ පැමිණිල්ලෙන් පවසා සිටින පරිදි 2019 මැයි 07 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම චූදිතව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2018 මාර්තු මස නුවර අරුජ්පල ලෙවැල්ල ප්‍රදේශයේ නිවසක් වෙන් කරවා ගැනීමේදී ලබා දී තිබූ ඔහුගේ ජාතික හැඳුනුම්පත් විස්තර ප්‍රකාරව බව පෙනී යන අතර මෙම චූදිතගේ ස්ථාවරය වන්නේ කැකුණුගොල්ල පල්ලිය අසල සන්නිවේදන මධ්‍යස්ථානයකදී හමුවූ පුද්ගලයෙකුගේ ඉල්ලීම පරිදි, ගොවිපළක සේවකයන් පිරිසකට රැඳී සිටීම සඳහා lkman.lk වෙබ් අඩවිය ඔස්සේ ඔහු විසින් නිවසක් සොයා දී, ඔහුගේ යතුරුපැදියෙන් එම පුද්ගලයා නුවරට කැඳවාගෙන ගොස්, දිනකට රුපියල්

20, 000/- බැගින් දින තුනකට නිවස ලබා ගැනීමට මැදිහත් වූ බවය. ඒ වෙනුවෙන් ඔහුට දිනකට රුපියල් 3, 000/- ක බ්‍රෝකර් ගාස්තුවක් ලැබී ඇති බව පෙනී යන අතර එකී ක්‍රියාව නෛතික දෘෂ්ටිකෝණයකින් බලන කල, එය හුදෙක් වාණිජමය ස්වභාවයේ තැරැව්කාර සේවයක් පමණක් බව පෙනී යන අතර මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි සියල්ල සළකා බැලීමේ දී අදාළ නිවසේ පසුව නතර වූ පුද්ගලයන්ගේ අනන්‍යතාවයන් හෝ ඔවුන්ගේ නීතිවිරෝධී අරමුණු හෝ ක්‍රියාකාරකම් කිසිවක් පිළිබඳව මෙම චූදිත හට කිසිදු පූර්ව දැනුමක් තිබී නොමැති බවය.

මෙහි දී ඔහු ප්‍රශ්නගත නිවස කුලියට වෙන්කරවා ගැනීමේ දී ඔහුගේම නියම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව තාක්ෂණිකව දියුණු වර්තමාන සමාජයක, නීතිවිරෝධී හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක නිරත වන යම් පුද්ගලයෙකු තමාගේම සැබෑ හැඳුනුම්පත ලබාදීමට කටයුතුකිරීම සාමාන්‍යයෙන් සිදු නොවන අතර, එවන් අවස්ථාවලදී වෙනත් අයෙකුගේ හෝ ව්‍යාජ හැඳුනුම්පතක් භාවිතා කිරීමට පෙළඹෙන බව මෙම චූදිත විසින් විත්තිකූඩුවෙ සිට කරන ලද ප්‍රකාශයේ දී සඳහන් කර තිබීම අප විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඔහු විසින් වාහන ගනුදෙනු කිරීමේදී, සිම්පත් ලබාගැනීමේදී සහ මිතුරන්ට ඇප තැබීමේදී මෙන්ම මෙම නිවස වෙන්කරවා ගැනීමේදීත් විවෘතවම ඔහුගේ ජාතික හැඳුනුම්පත භාවිතා කර ඇති බැවින්, ඔහු තුළ වංචනික ලෙස කූඨ ලෙස

කටයුතු කිරීමක් හෝ කිසිදු අපරාධමය කරුණක් සැඟවීමේ අරමුණක් තිබූ බවට අප හට පෙනී යන්නේ නැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1388 දිනූප නුවන් පෙරේරා යන අය අදාළ නිවසේ අයිතිකරු වන අතර ඔහුගේ සාක්ෂියේ දී ඔහුට තම නිවස කුලියට වෙන්කරවාගැනීමට පැමිණි තැනත්තා ව හඳුනා ගැනීමට නොහැකි බව පවසා ඇත. එමෙන්ම, 04 වන සහ 09 වන චූදිතයන්ගේ නීතිඥවරුන් විසින් කරන ලද හරස් ප්‍රශ්න කිරීම්වලදී, අදාළ නිවසට පසුව අවස්ථා තුනකදී පැමිණි පුද්ගලයා 22 වන චූදිතයා නොවන බවත්, අත්තිකාරම් මුදල් ගෙවන අවස්ථාවේදී 22 චූදිත එහි නොසිටි බවත්, එසේම එම තැනැත්තා නැවත එම නිවසේ සිටිනවා හෝ දැක්ක බවට මතකයක්ද නැති බවට මෙම සාක්ෂිකරු පවසා ඇති අතර, ඉහත කී පැ.සා 1388 දිනූප නුවන් පෙරේරා යන සාක්ෂිකරු පිළිගෙන තිබේ. තවද, පැ.සා 1987 කන්තා පොලිස් පරීක්ෂක මෙන්ඩිස් නිලධාරිනිය ගේ සාක්ෂිය අනුව 22 චූදිතව අත්අඩංගුවට ගැනීම සිදුකළේ නිවස වෙන්කිරීමේ ලේඛනයේ ඔහුගේ හැඳුනුම්පත් අංකය තිබූ නිසා පමණක් බව පිළිගෙන ඇති අතර කෙසේ වුවත් 22 චූදිත සහ ප්‍රශ්නගත නිවසේ රැඳී සිටි පුද්ගලයන්ගේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් අතර කිසියම්ම හෝ ආකාරයක සෘජු හෝ වක්‍ර සබඳතාවක් පෙන්වා දීමට පැමිණිල්ල ඉදිරිපත් කරන ලද ඉහත සාක්ෂි මගින් අපොහොසත් වී ඇත.

මෙම 22 චූදිතගේ දුරකථන අංකය අපරාධමය ක්‍රියාවකට සම්බන්ධ බවට සාක්ෂියක්ද ඉදිරිපත් වී නොමැති අතර, මෙම 22 චූදිතට මෙම නඩුවෙහි ස්වයංඝාතක පුපුරවා හැරීම් සිදු කරන ලද බෝම්බකරුවන් හා සම්බන්ධයෙන් යම් සම්බන්ධතාවයක් තිබූ බවට පිළිගත හැකි කිසිදු සාක්ෂියක්ද ඉදිරිපත් වී නොමැත. ඒ අනුව මෙම 22 චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි සඳහන් කර ඇති පරිදි ඔහු එම නිවස වෙන්කරවා ගැනීමේ ක්‍රියාවලියේදී කටයුතු කර ඇති ආකාරය තුළින් ඔහුව අපරාධමය ක්‍රියාවකට සම්බන්ධ කිරීමට නොහැකි බවට අපහට පෙනී යන අතර, ඔහුට එරෙහිව වෙනත් ස්වාධීන, නෛතිකමය වශයෙන් පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් වී නොමැති පසුබිම තුළ ඔහු විසින් ඉහත පරිදි විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය පිළි නොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් යුක්තිසහගත හේතුවක් අපහට පෙනී නොයන බවට අප තීරණය කරමු.

23 වන චූදිත මොහොමඩ් අමීර් මොහොමඩ් ආයතුල්ලා විසින් විත්තිකූඩුවේ සිට සිදු කරන ලද ප්‍රකාශයේ සාරාංශය

කුලියාපිටිය ප්‍රදේශයේ උපත ලබා දුම්මලසූරිය දිව්රුම්පොළ ග්‍රාමයේ හැදී වැඩුණු මොහොමඩ් අමීර් මොහොමඩ් ආයතුල්ලා වන චූදිතයා පවුලේ වැඩිමහල් පිරිමි දරුවා වේ. පියර් මොහොමදු මොහොමදු

අමීර් සහ නුහුරු හුසෙයිමා යන ඔහුගේ දෙමාපියන්ට දාව උපන් ඔහුට වඩා අවුරුදු 12ක් බාල සහෝදරයෙක් සහ සහෝදරියක් සිටී. කුඩා කල සිටම පියා ඔහුව දැඩි ආගමික පරිසරයක ඇති දැඩි කළ අතර, දිනකට පස් වතාවක් පල්ලියේ ආගමික වතාවත්වලට යොමු කර, එක් වතාවක් හෝ නොගියහොත් පහර දුන් අවස්ථා ද තිබුණි. ගමේ **මනාරුල් හුදා අරාබි මද්‍රසා පාසලට** පැමිණි මවුලවිවරුන් නිතර හමු වූ ඔහු, යහපත් ෆහට යොමුවීම සඳහා පියාගේ උපදෙස් මත ජමාත් කටයුතුවලට ද සම්බන්ධ විය.

ඔහුගේ පියාට නිතර ඇති වූ හෘදයාබාධ තත්ත්වය හේතුවෙන් වයස අවුරුදු 15 දී පවුලේ වගකීම භාර ගැනීමට සිදු වූ අතර, සතියේ දිනවල 11 වසර දක්වා ඉගෙනුම ලබමින් සති අන්තයේ ආරච්චිකට්ටුව, හලාවත ප්‍රදේශයේ සති පොළේ ව්‍යාපාර කටයුතුවල නිරත විය. ඔහු බස් රථවලින් පොදි බැඳගෙන ගොස් ඉඟුරු, සුදු ළූණු සහ ගොරක වැනි දෑ විකුණූ අතර, 2001 දී ෆාතිමා රිසානා සමඟ විවාහ වී දරුවන් තිදෙනෙකු ලැබ ඇතුල්ගහකොටුව ප්‍රදේශයේ කුඩා නිවසක් සාදා ගෙන පවුල රැකබලා ගත්තේය. පසුව ව්‍යාපාරය දියුණු කර ගනිමින් නිවස විශාල කර, පැරණි ත්‍රිරෝද රථයක් සහ ලොරි රථයක් ද මිලදී ගැනීමට ඔහුට හැකි විය. ඔහු ව්‍යාපාරය කළ ආරච්චිකට්ටුව ප්‍රදේශයේ ක්‍රිස්තියානි වැසියන් මෙන්ම ඔහුට ණයට බඩු සැපයූ වගා කටයුතුවල නිරත වූ සිංහල ජනතාව සමඟ ද ඉතා සමීප සහ විශ්වාසවන්ත සබඳතාවක් පැවැත්වූ අතර, නිවාඩු කාලවලදී ආගමික දැනුම සඳහා මවුලවිවරුන් හමුවීමට සහ දේශන (භයාන්)

නැරඹීමට ද ගොස් ඇත. පාස්කු බෝම්බ පිපිරීම් සිදුවන අවස්ථාවේ ආරච්චිකට්ටුව පොලේ සිටි ඔහු, තමාට මෙයට කිසිදු සම්බන්ධයක් නොතිබූ නිසා එය එතරම් ගණන් නොගත්තේය. කෙසේ වෙතත්, දිනක් දහවල් පල්ලියේ වතාවත් නිමවා නිවසේ නිදාගෙන සිටියදී සවස 3.00 ට පමණ පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු ඔහුගේ හිසට ගිනි අවියක් තබා, කටඋත්තරයක් ගැනීමට යැයි පවසමින් ඔහුව අත්අඩංගුවට ගන්නා ලදී. නිවස පරීක්ෂා කළ ද කිසිවක් හමු නොවූ අතර, ඔහුගේ කුඩා ජංගම දුරකථනය පමණක් පොලිසිය භාරයට ගෙන, පසුදා ඔහුව අධිකරණයට ඉදිරිපත් කර වාරියපොල සහ පසුව අනුරාධපුර බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණි. තුන්වන වතාවට අධිකරණයට ඉදිරිපත් කළ විට නිදහස් කිරීමට නියමිතව තිබුණ ද බන්ධනාගාරයෙන් එළියට එන විටම **අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු (CID)** නිලධාරීන් විසින් ඔහුව නැවත අත්අඩංගුවට ගන්නා ලදී. CID නිලධාරීන් තමා අත්අඩංගුවට ගත්තේ නුවරඑළියේ පැවති "බයාන්" දේශනයකට සහභාගී වීම නිසා බව පැවසූ නමුත්, තමා කිසිදු දේශනයක් නොපැවැත්වූ බවත්, බයාන් දේශනයකට ගිය ද එයට සහභාගී නොවී ආපසු පැමිණි බවත් ඔහු ප්‍රකාශ කරයි. ඔහුගේ ගමේ මිතුරෙකු සහ ඥාතියෙකු වන "සියාප්" නම් පැමිණිල්ලේ සාක්ෂිකරු ද මෙම ගමනට එක්ව සිට ඇත. වෑන් රථයක් කුලියට ගෙන චූදිතයා විසින්ම එය පදවාගෙන ගිය අතර, ගමන අතරතුර වාහනය කිහිප වතාවක්ම කාර්මික දෝෂවලට (ස්ටාර්ට් නොවීම, වයරින්

ලැව්ගින්නක් හටගැනීම ආදී දේ) ලක්වී ඒවා මඟදී පිළිසකර කරමින් ගොස් ඇත. රම්බොඩ දියඇල්ලෙන් නා, රාත්‍රී 18.30 - 9.00 පමණ වන විට නුවරඑළියේ අදාළ ස්ථානයට ළඟා වන විට දේශනය අවසන් වී තිබූ බැවින් ඔවුන් නැවත හැරී ආහ. වාහනයේ වයිපරය ක්‍රියා නොකිරීම නිසා එදින රාත්‍රියේ නුවරඑළිය නගරයේ නැවතී, පසුදා නිකවැරටිය හරහා මිනුවන්ගැටේ වේල්ල අසලින් නාගෙන නිවෙස් බලා පැමිණ ඇත. මෙම සංචාරයට සහභාගී වීම තම ජීවිතයේ කල ලොකුම වැරැද්ද බව පවසන චූදිතයාට, මේ හේතුවෙන් තම ජීවිතයේ වටිනා වසර 7ක කාලයක් බන්ධනාගාරය තුළ අහිමි විය. ඔහු බන්ධනාගාරයේ සිටියදී ඔහුගේ මව මියගිය අතර, ඇයගේ මුහුණ අවසන් වරට බැලීමට හෝ මළගමට යාමට ඔහුට අවස්ථාවක් ලැබී නැත. ඔහුව කුඩා කල සිට ආදරයෙන් බලාගත් මවගේ පියා (සීයා) ද, පිළිකා රෝගයෙන් අසාධ්‍යව සිටි ඔහුගේ බිරිඳගේ මවද ඔහු බන්ධනාගාරගතව සිටියදී මියගොස් ඇත. බිරිඳගේ මව මිය යාමට සතියකට පෙර ඔහුව දැකීමේ දැඩි වුවමනාවෙන් ලොරියක ඇඳක් පිටින්ම බූස්ස බන්ධනාගාරයට රැගෙනවිත් ඔහුව බලා ඇත. ඔහු අත්අඩංගුවට ගන්නා විට වයස අවුරුදු 14ක් වූ ඔහුගේ වැඩිමහල් පුතා අධ්‍යාපනය අතහැර පවුල ජීවත් කරවීම සඳහා කුකුළු ගොවිපළක රැකියාවට ගිය අතර, දියණිය පියාගේ තත්ත්වය නිසා දැඩි මානසික පීඩාවකට ලක්ව සිටියද, ගුරුවරුන්ගේ සහය ඇතිව උසස් පෙළ සමත්ව පසුගිය සතියේ විශ්ව විද්‍යාලයට ඇතුලත් වී ඇත. මීට අමතරව බූස්ස බන්ධනාගාරයේ සිටියදී

දෙවතාවක් ඔහුට හෘදයාබාධ ඇති වූ අතර, ප්‍රතිකාර ප්‍රමාද වීම නිසා (සවස 3.00 ට ඇති වූ හෘදයාබාධයට ප්‍රතිකාර ලැබුණේ රාත්‍රී 11.00 ටය) ඔහුගේ **හදවතින් 70%ක්ම අක්‍රීය වී** දැනට ක්‍රියාත්මක වන්නේ 30%ක් පමණක් බව වෛද්‍යවරුන් පවසා ඇත. පසුව අධිකරණයේදී ද නැවත අසනීප වී හදිසි සැත්කමකට භාජනය කර මාස 6-7 ක් රෝහල්ගතව ප්‍රතිකාර ලැබී තමාට එරෙහිව ඇති සියලුම චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන චූදිතයා, තමා කිසිදු වරදක් කර නැති බවත්, අධිකරණයේදී තමාට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ බවත් ප්‍රකාශ කරයි. තම ව්‍යාපාරික ජීවිතයේදී හෝ සාමාන්‍ය ජීවිතයේදී කිසිම පුද්ගලයෙකුට වචනයකින් හෝ ක්‍රියාවකින් හානියක් කර නැති බවත්, ලංකාවේ ජනතාවට හානි වන කිසිදු නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී නැති බවත් පවසන ඔහු, වසර 7ක් තිස්සේ තමා එනතුරු මඟ බලා සිටින බිරිඳ සහ දරුවන් වෙනුවෙන් තමන්ව මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස අධිකරණයෙන් බැගෑපත්ව අයැද සිටියි.

<u>විශ්ලේෂණය</u>.

මෙම 23 වන චූදිත මොහොමඩ් අමීර් මොහොමඩ් ආයතුල්ලා යන අයගේ චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන්නේ ඔහු සතියේ දිනවල සහ සෙනසුරාදා ඉරිදා පොලවල් වලට ගොස් එළවළු වෙළඳාම් කිරීමෙන් ජීවිකාව ගෙන ගොස් ඇති අතර, එසේම ඔහු

සති පොල ව්‍යාපාර කටයුතුද සිදු කරමින් සිට ඇති තැනැත්තෙකු බවයි. ඔහුට නිවාඩු තිබෙන වේලාවල් වලදී ආගම ගැන දැනුම ලබා දීම සඳහා ඔහු මවුලවිවරුන් හමු වී බයාන් දේශනා වලට සහභාගී වී ඇති බව සහ මවුලවි වරුන් අතර ආගමික විවාදයන් බැලීමටද ගොස් ඇති බව පෙනී යන අතර, එකී ක්‍රියාවන් මගින් ඔහුට කිසිදු සාපරාධි වගකීමක් පැවරීමට හැකියාවක් නොමැති බව අපහට පෙනී යයි. ඔහු සඳහන් කර ඇති පරිදි ඔහුගේ ගමේ ඥාතියෙකු වන මෙම අධිකරණයට සාක්ෂි ලබා දුන් සියාබ් නැමැත්තාගේ ඉල්ලීම මත නුවරඑළිය ප්‍රදේශයේ බයාන් දේශනාවක් තිබෙනවා යැයි පැවසූ නිසා එය ට්‍රිප් එකක් ලෙසට සළකා නුවරඑළියට යාමට ඉදිරිපත් වී ඇති බවයි. එසේම එම ගමන යාම සඳහා වෑන් රථය පදවාගෙන යන ලද්දේ මෙම චූදිත විසින් බව පෙනී යන අතර, අතරමගදී අවස්ථා දෙකකදී එම වෑන් රථය කාර්මික දෝෂයන්ට ලක් වී ඇති බව ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී හෙළිවේ. එම කරුණ මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා. 1049 උදුමාලෙබ්බේ සියාබ්දීන් යන සාක්ෂිකරු විසින් මෙම අධිකරණයේ ලබා දුන් සාක්ෂි මගින් තහවුරු වේ. මෙම චූදිතව ඔහුගේ නිවසේ සිටියදී අත්අඩංගුවට පුද්ගලයන් දෙදෙනෙකු පැමිණ අත්අඩංගුවට ගෙන එම නිවස සම්පූර්ණයෙන්ම පරීක්ෂා කිරීමක් කර ඇතද, එහිදී ඔහුට එරෙහිව සාක්ෂියක් ලෙස ඉදිරිපත් කල හැකි කිසිදු සැක කටයුතු හෝ නීති විරෝධි ද්‍රව්‍යයක් සොයා ගැනීමට නොහැකි වී ඇත. මෙම චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇත්තේ,

ඔහු විසින් නුවරඑළිය ප්‍රදේශයේ පැවති බයාන් දේශනාවක් සඳහා ඔහු ඉහත කී සියාබ්දීන් නැමැති සාක්ෂිකරු ඇතුළු පිරිසක් සමග නුවරඑළියට ගොස් ඇතද, ඔවුන් ගමන් කල වාහනය අවස්ථා දෙකක කාර්මික දෝෂයට පත්වීම යථා තත්ත්වයට පත් කර ගැනීමෙන් අනතුරුව නුවරඑළියට ළඟා වෙන විට රාත්‍රී කාලය වූ බව සහ ඒ වන විටත් බයාන් දේශනාව අවසන් වී ඇති බවත් ඔවුනට ආපසු පිටවී යන ලෙසත් දැනුම් දීම මත ඔවුන් නුවරඑළිය නගරයට පැමිණ පිණි වැටිලා තිබුන නිසා වාහනයෙහි වයිපරය ක්‍රියාත්මක නොවිම නිසා ඔවුන් නුවරඑළිය ටවුමේම එළිවනතුරු සිට පහුවදා පිටත් වී තම නිවෙස්වලට පැමිණ ඇති බවට ඔහු පවසා ඇති කරුණ අප විසින් පෙරද සඳහන් කරන ලද පරිදි මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන්නේ පැමිණිල්ලේ සාක්ෂි අංක 1049 උදුමාලෙබ්බේ සියාබ්දීන් යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද මනාව තහවුරු වන අතර, එකී සියාබ්දීන්ගේ සාක්ෂියේදී ද මෙම අධිකරණයට පවසා ඇත්තේ ඔහු ද මෙම 23 වන චූදිත සමග නුවරඑළි යාමට ගියේ ආගමික දේශනාවකට සවන්දීමේ යහපත් අරමුණෙන් බවත්, නරක දෙයක් බව දැන සිටියා නම් කිසිසේත් එලෙස නොයන බව පවසා ඇති පසුබිම තුළ මෙම 23 චූදිතට හුදෙක් නුවරඑළිය ප්‍රදේශයෙහි පැවැති ආගමික දේශනාවකට සහභාගී වීම සඳහා පිටත්වී ගොස් තිබීම පමණක් පදනම් කරගෙන එකී ක්‍රියාව සඳහා කිසිදු ආකාරයකින් සාපරාධි වගකීමක් පැවරිය නොහැකි බව අප හට පෙනී යයි. නුවඑළියේ ශාන්තිපුර නිවාඩු නිකේතනයක ස්වයංඝාතක

බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ මූලිකත්වය යටතේ පැවති වැඩමුළුවට මෙම 23 වන චූදිත වන අයන්තුල්ලා යන අය සහභාගී වූ බවට එම වැඩසටහන සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් වැදගත්ම සාක්ෂිකරුවෙකු වන පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගෙන් හෝ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත. ඒ අනුව මෙම 23 වන චූදිත කිසිදු අවස්ථාවක පුහුණු වැඩමුළුවකට සහභාගී වීමක් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කර නොමැති පසුබිම තුළ මෙන්ම මෙම 23 වන චූදිත සමග නුවරඑළියේ ආගමික දේශනාවකට සහභාගී වීමට යාමට පිටත් වී ගොස් ඇති පැ. සා. 1049 උදුමාලෙබ්බේ සියාබ්දීන් යන සාක්ෂිකරු මෙම සාක්ෂිකරුගේ ආසන්න ඥාතියෙකු වීම යන කරුණද සැළකිල්ලට ගැනීමේදී සහ එම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව එම 23 වන චූදිත සමඟ සහ ඔහුගේ පවුලේ අය සමඟ එයට පෙරද ගමන්බිමන් ගොස් ඇති බවට එම සාක්ෂිකරුම පිළිගෙන ඇති පසුබිම තුළ මෙම 23 වන චූදිත හුදෙක් 2016 හෝ 2017 වසරේ එක්වරක් නුවරඑළිය ප්‍රදේශයට කණ්ඩායමක් සමඟ වෑන් රථයකින් ගමන් කිරීම පමණක් උපයෝගී කරගෙන ඔහු ඉතා බරපතල අපරාධයක් වන 2019.04.21 සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාර මාලාව සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම හෝ ස්වයංඝාතක බෝම්බකරුවන්ට ආධාර හෝ අනුබල ලබා දීමක් සිදු කල බවට කිසිසේත් නිගමනය කල නොහැකිය. ඒ අනුව මෙම 23 වන චූදිත විසින් ඉහත පරිදි විත්තිකූඩුවේ සිට ලබා දුන් ප්‍රකාශය සැළකිල්ලට

ගැනීමේදී අප විසින් ඉහතින් සාකච්ඡා කර ඇති පරිදි ඔහු විසින් මෙම අධිකරණයට ප්‍රකාශ කර ඇති කරුණු පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් ප්‍රබල හේතුවක් අපහට පෙනී යන්නේ නැත. මෙම 23 වන චූදිතට එරෙහිව චෝදිත අපරාධයන් සිදු කල බවට සෘජු හෝ පරිවේෂනීය සාක්ෂි කිසිවක් මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී නොමැති පසුබිම තුළ ද ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී ගෙන ඇති ස්ථාවරය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් කිසිදු සාධාරණ හේතුවක් අපහට පෙනී යන්නේ නැති බව අප තීරණය කරමු.

24 චූදිත මොහොමඩ් අන්සාර්ඩීන් මොහොමඩ් ඉල්මි විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි සාරාංශය

මෙම චූදිත විත්ති කූඩුවේ සිට සිදු කල ප්‍රකාශයේදී පවසා ඇත්තේ 2019 අප්‍රේල් මස 21 වෙනි දින සිදු වූ පාස්කු ප්‍රහාරයට හෝ එම සිදුවීමට තමාගේ කිසිදු සම්බන්ධයක් නැති බවත්, තමාට එරෙහි සියලු චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත්ය. තමා කුලියාපිටිය ඇතුන්ගහකොටුව ප්‍රදේශයේ උපත ලබා සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලබා ඇති බවත්, පසුව තම පියාගේ වැඩ කටයුතුවලට සහාය වෙමින්, සිංහල ජනතාව ද සමඟ එක්ව ව්‍යාපාරික කටයුතුවල නිරත වූ සාමකාමී පුද්ගලයෙක් බවත් තමා ගමේ පොදු වැඩකටයුතුවලට මෙන්ම පල්ලියේ බයාන් දේශනා ඇතුළු ආගමික වැඩසටහන්වලටද නිරන්තරයෙන් සහභාගී

වී ඇති අතර, 2007 වසරේදී විවාහ වී දැනට පුතුන් දෙදෙනෙකු සහ එක් දියණියකගේ පියෙකු වේ. තමාව මුලින්ම අත්අඩංගුවට ගනු ලැබුවේ 2019 අප්‍රේල් 26 වන සිකුරාදා දින, ඔහු ජුම්මා නැමදුම් කටයුතුවල යෙදී සිටියදී දුම්මලසූරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසිනි. එහිදී තමාගේ අයියා සහ තවත් පිරිසක් සිටි පොලිස් ජීප් රථයෙන් ඔහුව රැගෙන ගොස් දින තුනක් පොලිසියේ රඳවා ප්‍රශ්න කිරීමෙන් අනතුරුව කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර වාරියපොළ බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. බන්ධනාගාරය තුළ ඇති වූ ගැටලු නිසා පසුව තමාව අනුරාධපුර බන්ධනාගාරයට මාරු කෙරුනු අතර, එම කාලය තුළ විමර්ශනය සඳහා කිසිදු නිලධාරියෙකු පැමිණියේ නැති බවත්, මාස දෙකකට පමණ පසු අධිකරණය විසින් තමාව එම නඩුවෙන් නිදහස් කලද, එදිනම අධිකරණ පරිශ්‍රයේදී තමාගේ බිරිඳ, දරුවන් සහ ඥාතීන් ඉදිරිපිටදීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් තමාට පහර දෙමින් සහ බණිමින් ඉතා රළු අන්දමින් නැවත අත්අඩංගුවට ගන්නා ලද බවත්, ඉන්පසු කොළඹ CID 04 වන මහලේ FIU-1 ඒකකය වෙත රැගෙන ගොස් පහර දෙමින් විමර්ශනය කර ඇති අතර, නුවරඑළියේ බයාන් දේශනයකට සහභාගී වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇත. එහිදී තමන් එක් බයාන් වැඩමුළුවකට සහභාගී වීමට ගියද එය සිදු නොවීම නිසා ආපසු පැමිණි බවත්, තමන් සමඟ ගිය අය පිළිබඳව නිවැරදිව තොරතුරු හෙළි කළ බවත් ඔහු පවසයි. වසර එකහමාරක කාලයක් ඔහුව CIDයේ රඳවා තබාගෙන

ඇති අතර, එහි අඩි 4x6 ප්‍රමාණයේ කුඩා සිරකුටිවල තවත් අයෙකු සමඟ රඳවා තබමින් ඉතා දුෂ්කර ජීවිතයක් ගත කිරීමට සිදුව ඇත. සිංහල භාෂාව කතා කිරීමට හා කියවීමට ඔහුට හැකි වුවද, ප්‍රකාශ අතින් ලියාගෙන මාස තුනකට වරක් කියවීමටවත් ඉඩ නොදී යතුරුලියනය කළ ලේඛනවල අත්සන් ලබාගෙන ඇති අතර, අවසාන රැඳවුම් නියෝගයේදී ප්‍රකාශයක් හෝ අත්සනක් ලබාගෙනද නැත. 2020 ඔක්තෝබර් මාසයේදී ඔහුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර මැගසින් බන්ධනාගාරයට යොමු කළ අතර, පසුව පල්ලන්සේන, බෝගම්බර, වැලිකඩ සහ මහර ඇතුළු බන්ධනාගාර කිහිපයකටම මාරු කරමින් වසර 4ක් පමණ මහර බන්ධනාගාරයේ රඳවා තබා ගෙන තිබේ. ඔහු බන්ධනාගාරගතව සිටි කාලය තුළ තමාගේ පියා, මව සහ අයියා යන පවුලේ සාමාජිකයන් තිදෙනාම මියගියද, අවසාන වරට ඔවුන්ව බැලීමට හෝ අවමංගල්‍ය කටයුතුවලට සහභාගී වීමට අවසර ඉල්ලා සිටියත් බන්ධනාගාර නිලධාරීන් තමාව රැගෙන ගියේ නැති බවත්, CID නිලධාරීන් විසින් තමාව සහ අයතුල්ලා නැමැත්තා ගමට රැගෙන ගිය අවස්ථාවක, අසනීපයෙන් සිටි සිය මව බැලීමට නිවසට යාමට අවසර ඉල්ලූ නමුත්, නිවස ඉදිරිපිටින් රැගෙන ගියා මිස නිවස තුළට යාමට ඉඩ දී නැත. පාස්කු ප්‍රහාරය සිදු වූ දින තමා සිය අසනීප මවට ප්‍රතිකාර කිරීම සඳහා පුත්තලමට ගොස් සිටි බවද ඔහු සඳහන් කරයි. තවද, ඔහුගේ බිරිඳද 2023 වසරේදී හිසේ සැත්කමකට භාජනය කර ඇති අතර, සැමියාගේ සහ දරුවන්ගේ තත්ත්වය පිළිබඳව දැඩි ලෙස

කල්පනා කිරීම නිසා ඇයගේ අසනීප තත්ත්වය මේ වන විට නැවතත් උත්සන්න වී තිබේ. මෙම සිද්ධියට අදාළව චෝදනා 23, 000කට අධික සංඛ්‍යාවක් ගොනු කර තිබුණද, තමා මේ කිසිවකට සම්බන්ධ නැති බවත්, තමාට එරෙහිව කිසිඳු සාමාන්‍ය හෝ පොලිස් සාක්ෂියක් ඉදිරිපත් වී නැති බවත් ඔහු පවසයි. වසර 8කට ආසන්න කාලයක් රිමාන්ඩ් බන්ධනාගාර ගතව දුක් විඳින තමා, සියලු ජාතීන් සමඟ සාමකාමීව ජීවත් වූ, තමන්ගේ ආගමට අනුව නිවැරදිව ජීවත් වූ අයෙකු බැවින්, තමන්ව මෙම නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු ගරු අධිකරණයෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

<u>විශ්ලේෂණය</u>

මෙම 24 වූදිත මොහොමඩ් අන්සාර්ඩීන් මොහොමඩ් ඉල්මී යන අය විසින් විත්තිකුඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන්නේ ඔහුද පවසා ඇත්තේ ඔහු ගමේ පල්ලියේ සිදු වන බයාන් වැඩසටහන් වැනි දේවල් වලට සහ පොදු කටයුතු සඳහා නිරන්තරයෙන්ම සහභාගී වූ තැනැත්තෙක් බව වන අතර, නුවරඑළිය ප්‍රදේශයේ පැවති බයාන් දේශනාවකට සහභාගී වීම සඳහා කුලියාපිටියෙේ සිට මෙම නඩුවෙහි 23 වන වූදිත අයන්තුල්ලා සමඟ ගොස් ඇතද ඔහු එලෙස ගොස් ඇතද බයාන් දේශනාව ඒ වන විට සිදු නොවුන නිසා යළි කුලියාපිටිය ප්‍රදේශයට පැමිණි බවට ඔහු පවසා ඇති කරුණු සැළකිල්ලට ගැනීමේදී සහ මෙම නඩුවෙහි පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කිසිඳු සාක්ෂියක් මඟින්

මෙම 24 වන චූදිත හට පාස්කු බෝම්බ ප්‍රහාර මාලාව සිදු කරන ලද ස්වයංඝාතක බෝම්බකරුවන් සමඟ කිසියම්ම හෝ සම්බන්ධතාවයක් තිබූ බවට පෙනී නොයන පසුබිම තුළ සහ ඔහු යම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ බවට හෝ පාස්කු බෝම්බ ප්‍රහාර මාලාව සිදු කිරීම සඳහා කිසිවෙකු සමඟ හෝ කුමන්ත්‍රණ කල බවට හෝ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති පසුබිම තුළ ඉහත පරිදි ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී සඳහන් කර ඇති කරුණු පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් සාධාරණ හේතුවක් අපහට පෙනී යන්නේ නැත. මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ. සා. 1049 උදුමාලෙබ්බේ සියාබ්දීන් යන සාක්ෂිකරුගේ සාක්ෂියේදී කුලියාපිටියේ සිට නුවරඑළියට පිටත්වී යාම සඳහා තමාගේ ගමේදි හඳුනනන, තම ගමේ පදිංචි මස්කට් බූන්දි ආදිය විකුණන ඉල්මි නැමැත්තෙක්ද තමාලා සමඟ වෑන් රථයෙන් ගිය බවට පවසා ඇති අතර, මෙම 24 වන චූදිත තම විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී තමා නුවරඑළිය ප්‍රදේශයට සියාබ්දීන් සහ අයන්තුල්ලා යන අය ඇතුළු පිරිසක් සමඟ වෑන් රථයකින් ගිය කරුණ කිසිසේත් ප්‍රතික්ෂේප කිරීමක්ද කර නැත. මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ. සා. 1641 පොලිස් පරීක්ෂක යසංක ජයසිංහ යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ආධාර ඒකකයේ දත්ත විශ්ලේෂකයෙකු වශයෙන් සිටිමින් මෙම නඩුවට අදාළ චූදිතයින්ගේ ජාතික හැඳුනුම්පත් හා ජංගම දුරකථන අංක සම්බන්ධයෙන් විශ්ලේෂණ සිදු කිරීමේදී එම 24 වන

චූදිතගේ නමින් ලියා පදිංචි වී තිබූ ජංගම දුරකථන අංකය 2018.05.07 දින නුවරඑළිය ප්‍රදේශයේදී ක්‍රියාත්මක වී ඇති බවට සාක්ෂියක් ලබා දී ඇතද එම කරුණ තුළින් පමණක් මෙම 24 වන චූදිත හට පාස්කු බෝම්බ ප්‍රහාර මාලාව සම්බන්ධ බරපතල චෝදනාවන් සම්බන්ධයෙන් වරදකාරිත්වයක් ආරෝපණය කිරීමට එය කිසිසේත් ප්‍රමාණවත් වන්නේ නැති අතර, එකී පසුබිම තුළ මෙම 24 වන චූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති කරුණු පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමට තරම් යුක්ති සහගත කරුණු කිසිවක් අපහට පෙනී යන්නේ නැති බවට අප තීරණය කරමු.

25 චූදිත මොහොමඩ් අක්‍රම් අහක්කම් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි සාරාංශය

මොහොමඩ් අක්‍රම් අහක්කම් වන 25 වන චූදිතයා විත්තිකූඩුවේ සිට ප්‍රකාශ කරන්නේ, තමාට දෙමාපියන්ගෙන් ලැබුණු නීත්‍යානුකූල නම එය බවත් තමාට වෙනත් කිසිදු අනුවර්ත නාමයක් නොමැති බවත්ය. තමා කිසිදු පුද්ගලයෙකුට, සංවිධානයකට හෝ රාජ්‍යයකට බැඳියාවක් නොමැතිව, රටේ නීතියට ගරු කරමින් ජීවත් වන සාමාන්‍ය පවුලක සාමාජිකයෙකු බව ඔහු පවසයි. ඔහුගේ පියා ව්‍යාපාරිකයෙක් වන අතර, මව ගෘහණියක් වන අතර, සහෝදර සහෝදරියන් තිදෙනාගෙන් වැඩිමල් සහෝදරයා සහ සහෝදරිය කැනඩාවේ පදිංචිව සිටින අතර බාල සහෝදරයා දෙමාපියන්

බලා ගනිමින් ව්‍යාපාරයක නිරත වේ. ඔහු 01 සිට 07 ශ්‍රේණිය දක්වා කේම්බ්‍රිජ් විෂය නිර්දේශය ඉගැන්වූ මින්හාල් ජාත්‍යන්තර පිරිමි පාසලෙන් අධ්‍යාපනය ලබා ඇති අතර, එහිදී දෙවන භාෂාව ලෙස දෙමළ භාෂාව ඉගෙන ගෙන ඇත. පසුව දේශීය විෂය නිර්දේශයට අනුව ඉගෙන ගත යුතු යැයි පියා ගත් තීරණයක් මත ඔහු **කොළඹ සහිරා විද්‍යාලයට** ඇතුළත් වී 8 වසරේ සිට උසස් පෙළ දක්වා ඉගෙනුම ලබා ඇති අතර, එහිදීද සාමාන්‍ය පෙළ විභාගය සඳහා දෙමළ භාෂාව හදාරා ඇත්තේ ඉතා අසීරුවෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් පමණක් ලබා ගනිමිනි. මේ හේතුවෙන් ඔහුට අධිකරණයේදී සිංහල සහ ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකුගේ සහාය අවශ්‍ය වී තිබේ. උසස් පෙළින් පසුව පරිගණක අංශයෙන් උසස් තාක්ෂණ ඩිප්ලෝමාවක් හදාරා ඇති ඔහු, Wolverhampton විශ්වවිද්‍යාලයෙන් **පරිගණක තාක්ෂණ විද්‍යාව පිළිබඳ උපාධිය** හදාරන අතරතුර එහි සහකාර දේශකයෙකු ලෙසද සේවය කර ඇත. ඉන්පසු ඔහු **Virtusa ආයතනයේ සහකාර මෘදුකාංග ඉංජිනේරුවෙකු** ලෙස තේරී පත් වූ අතර, සතියේ දින පහේ එහි සේවය කරමින් සති අන්තයේ තමන් ඉගෙන ගත් විශ්වවිද්‍යාලයේ දේශන පවත්වමින් සතියේ දින හතේම ඉතා කාර්යබහුල ජීවිතයක් ගත කර ඇත. **පාස්කු ප්‍රහාරය** සිදු වූ ඉරිදා දින ඔහු සිය ආයතනයේ දේශනයක නිරතව සිටි අතර, ඊට සතියකට පසු ලැබුණු නිවාඩු කාලය තුළ නිවසේ සිටියදී, ජුම්මා යාඥාවෙන් පසුව දිවා ආහාරය ගනිමින් සිටියදී පොලිසිය සහ හමුදාව පැමිණ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ යැයි පවසමින් ඔහුව සහ

ඔහුගේ බාල සහෝදරයාව අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන්ගේ ඇස් බැඳ නොදන්නා ස්ථානයකට රැගෙන ගොස් ප්‍රශ්න කර ඇති අතර, පසුව ඔහුව **ත්‍රස්ත විමර්ශන ඒකකයේ (TID)** රඳවා තබා ගෙන තිබේ. එහිදී සති දෙක තුනක් තිස්සේ හුදකලාව රඳවා තබා ගනිමින්, **'පැරට් පර්ච්' (Parrot Perch)** ක්‍රමයට එල්ලා පොලු කැඩෙන තුරු අමානුෂික ලෙස පහර දී වධහිංසා පමුණුවා ඇති අතර, එම පහරදීම් පිළිබඳව ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරියාටද පවසා ඇත. TID භාරයේ සිටියදී විවිධ ප්‍රකාශ සඳහා ඔහුගෙන් අත්සන් ලබාගෙන ඇති අතර, පසුව ඔහුගේ නිවස පරීක්ෂා කර ඔහුගේ වැඩිමහල් සහෝදරයා ග්‍රෑනික් නිර්මාණ සඳහා භාවිතා කළ පොදු පරිගණකයද පොලිසිය භාරයට ගෙන තිබේ. ඔහු සිය කාමරයේ තිබී සොයා ගත් බව කියන අත්පත්‍රිකා සම්බන්ධයෙන් කිසිදු වගකීමක් නොගන්නා බවත්, එවැනි දෙයක් තිබූ බවක් හෝ ඔහු දැන සිට නැත. ඔහුව විමර්ශන සඳහා අනුරාධපුරය, මල්වාන සහ නුවර ලේවැල්ල යන ප්‍රදේශවලට රැගෙන ගොස් ඇති අතර, එහිදී සාක්ෂි දුන් නන්දසිරි ඇතුළු පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශ එකිනෙකට පරස්පර සහ සත්‍ය නොවන බව ඔහු පෙන්වා දෙයි. නන්දසිරි නම් නිලධාරියා පැවසුවේ චූදිතයා විසින් මහ පෙන්වීම් සිදු කළ බව වුවද, සටහන් තැබූ අනෙක් නිලධාරියාගේ වාර්තාවල දැක්වෙන්නේ චූදිතයාව දිගින් දිගටම වෑන් රථය තුළ ආරක්ෂිතව රඳවා සිටි බවයි. මල්වාන ප්‍රදේශයේ ස්ථානයක් වෙන් කරවා ගැනීම සම්බන්ධයෙන්ද නන්දසිරි පැවසූ දින සහ ස්වාධීන සාක්ෂිකරුවෙකු වූ එම පරිශ්‍රයේ

අයිතිකරු පැවසූ දින අතර පරස්පරතාවයක් පවතී. එමෙන්ම නුවර ලේවැල්ල ප්‍රදේශයට සැකකරුවන් රැගෙන ගිය අවස්ථාවේදී චූදිතයා ස්ථාන මහ පෙන්වූ බව උප පොලිස් පරීක්ෂක මධුෂාන් පැවසුවද, නන්දසිරි නිලධාරියා සිය සාක්ෂිවල එවැනි මහ පෙන්වීමක් ගැන සඳහන් කර නැතඔහු සිය පරිගණක, ජංගම දුරකථන සහ බැංකු ගිණුම්වල මුරපද ලබා දෙමින් විමර්ශන සඳහා පූර්ණ සහයෝගය ලබා දුන් නමුත්, එම උපාංග හෝ දුරකථන වාර්තා මඟින් ඔහුට එරෙහිව කිසිදු සාක්ෂියක් සොයා ගැනීමට පොලිසිය සමත් වී නැත. කොළඹ බහුසංස්කෘතික පරිසරයක හැදී වැඩුනු ඔහු, Virtusa ආයතනයේ සිටි එකම මුස්ලිම් ජාතිකයා වූ අතර, ඔහුගේ අසල්වැසියන් වූ ක්‍රිස්තියානි භක්තික වෛද්‍ය ගුණතිලක මහතා ඇතුළු කිසිවෙකු කෙරෙහි හෝ රටේ සෙසු ජනතාව කෙරෙහි කිසිදු වෛරී හැඟීමක් නොමැති බව පවසයි. තම දෙමාපියන්, සමාජය සහ ඉස්ලාම් ආගම තමාට ඉගැන්වූයේ ඉවසීම සහ කරුණාව බව ඔහු නබිතුමාගේ ආදර්ශවත් කතාවක් ඇසුරින් විස්තර කරයි. පාස්කු ප්‍රහාරයට දින කිහිපයකට පෙරද තමා වෛද්‍ය ගුණතිලක මහතා හමුවී සුහදව කතා කළ බවත්, තමා කිසිවිටෙකත් තමා ඇසුරු කළ ක්‍රිස්තියානි හෝ ඉස්ලාම් නොවන සහෝදර සේවකයන්ට හානියක් කිරීමට කුමන්ත්‍රණය නොකරන බවත් ඔහු අවධාරණය කරයි. අවසාන වශයෙන්, නඩුවේ සාක්ෂිකරුවන් 500කට අධික පිරිසක් සහ නඩු භාණ්ඩ 2000කට වඩා තිබුණද, තමාට එරෙහිව ඇති එකම සාක්ෂිය පරස්පර විරෝධී ප්‍රකාශ ඉදිරිපත් කළ පොලිස්

නිලධාරීන් තිදෙනෙකු පමණක් බවත්, තමාට එරෙහිව කිසිදු විශ්වාසනීය සාක්ෂියක් නොමැති බැවින් සියලු චෝදනාවලින් තමා නිදොස් කොට නිදහස් කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා ඇත.

<u>විශ්ලේෂණය</u>

මෙම 25 වන චූදිත මොහොමඩ් අක්‍රම් අහක්කම් යන අයගේ චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් ඔහු උසස් අධ්‍යාපන සුදුසුකම් සැපිරි තැනැත්තෙකු වන අතර, ඔහු පවසා සිටින පරිදි ඔහු සේවය කරන ලද Virtusa ආයතනයේ සහකාර මෘදුකාංග ඉංජිනේරුවරයෙකු ලෙස ඔහු දේශන පැවැත්වීම් සිදු කර සතියකට පසු නිවාඩු ලබා නිවසේ රාත්‍රී ආහාරය ගනිමින් සිටි අවස්ථාවේදී නිවස වටා කළු පැහැති නිළ ඇදුම් ඇඳගත් පොලිස් නිලධාරීන් පිරිසක් පැමිණ ඔහුගේ අනන්‍යතාවය විමසා ඔහුව පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඔහුගේ ලැප්ටොප් පරිගණකය සහ ජංගම දුරකථනයද ඔවුන් භාරයට ගෙන ත්‍රස්ත විමර්ශන ඒකකයට රැගෙන ගොස් දරුණු වදහිංසා වලට ලක් කල බවයි. ඔහුගේ කාමරයේ තිබී අත්පත්‍රිකා සොයා ගත් බවට මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දුන් පැ. සා. 1914 පොලිස් පරීක්ෂක ගයාන් දිවංක රත්නායක නැමැති නිලධාරියා සාක්ෂි ලබා දීමේදී තමාගේ නිවසේ තමා රැඳී සිටි කාමරයේ අත්පත්‍රිකා තොගයක් තිබූ බවට පවසා සිටි බවත්, එවැනි කිසිදු අත්පත්‍රිකාවක් තමාගේ

කාමරය තුළ තිබී සොයා ගත් නමුත් එම භාණ්ඩ සම්බන්ධයෙන් තමා කිසිදු වගකීමක් ගන්නේ නැති බවට ඔහු පවසා ඇත. එසේම මෙම චූදිත විසින් ඔහුට එරෙහිව මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් නන්දසිරි නැමැති නිලධාරියා වෙනත් නිලධාරියෙකු විසින් තබන ලද සටහනක් ආශ්‍රයෙන් සාක්ෂි ලබා දුන්නද නන්දසිරි නැමැති නිලධාරියාගේ සාක්ෂි සහ එම සටහනෙහි තිබූ සටහන් අතර වෙනසක් තිබෙන බවද ප්‍රකාශ කර ඇති ආකාරය අප නිරීක්ෂණය කරමු.

මෙම චූදිතගේ චිත්තිකූඩුවේ සිට ප්‍රකාශයෙහි සඳහන් කල පරිදි ඔහු සති අන්තයේ වොල්හැම්ටන් විශ්වවිද්‍යාලයේ සහකාර දේශකවරයෙකු ලෙසද සේවය කරමින් ඉතා කාර්යබහුල, වගකිවයුතු ජීවිතයක් ගත කළ සාමාන්‍ය පුරවැසියෙකු බව පෙනී යන අතර, මෙම නඩුවෙහි අධිචෝදනාපත්‍රයෙහි චූදිත ලැයිස්තුවෙහි ඔහුගේ නම සඳහන් කර ඇති ස්ථානයෙහි ඔහුට කිසිදු අනුවර්ත නාමයක් තිබෙන බවට සඳහනක් නොමැති බව පෙනී යයි. ඔහු සිය පරිගණක, ජංගම දුරකථන, ඊමේල්, බැංකු ගිණුම් සහ පේපැල් (PayPal) මුරපද සියල්ල කිසිදු පැකිලීමකින් තොරව විමර්ශන නිලධාරීන්ට ලබා දෙමින් විමර්ශනවලට පූර්ණ සහයෝගය ලබා දුන් බවට ඔහු සඳහන් කර ඇති අතර, එසේම පැ. සා. 1914 දිවංක රත්නායකගේ සාක්ෂියට අනුව ඔහුගේ නිවසේ ඔහුගේ කාමරයේ තිබුනා යැයි පවසන පැ. 1868 ලෙස ලකුණු කර ඇති අත්පත්‍රිකාවල අල්ලා දෙවියන්ගේ විරුද්ධවාදියෝ ලෙස සඳහන් කර ඇති

පත්‍රිකා එම නිවසේ තිබී සොයා ගත්තා යැයි සාක්ෂි ඉදිරිපත් කිරීම තුළින් පමණක් ඔහු මෙම 25 වන චූදිතට අපරාධමය වගකීමක් පැවරීමට එය ප්‍රමාණවත් නොවන බව අපහට පෙනී යයි. මෙම නඩුවෙහි ඔහු සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් පැ. සා. 1925 උප පොලිස් පරීක්ෂක නන්දසිරි යන සාක්ෂිකරු හෝ පැ. සා. 1914 පොලිස් පරීක්ෂක ගයාන් තිවංක රත්නායක, පැ. සා. 1922 පොලිස් පරීක්ෂක මධුෂාන් යන නිළ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි තුළින් මෙම 25 වන චූදිත විමර්ශන වලට සහාය ලබා නොදුන් බවට කිසිදු කරුණක් ඉදිරිපත් වී නැත. මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා. 1925 උප පොලිස් පරීක්ෂක නන්දසිරිගේ සාක්ෂියේදී මෙම 25 වන චූදිතගේ මග පෙන්වීම ඔස්සේ අනුරාධපුර රඹෑව ප්‍රදේශයෙහි අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන මෙම නඩුවේ චූදිතයෙකුගේ නිවසට යාබද කැලෑබද ප්‍රදේශයක් පෙන්වා දුන් බව පවසා ඇතද, මෙම චූදිත ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර ඇති අතර, ඔහුගේ ජීවිතයේ කිසිදු දවසක ඔහු අනුරාධපුරයට ගොස් නැති බව පවසා ඇත. හුදෙක් ඉහත කී පොලිස් නිලධාරීන් සාක්ෂි ලබා දෙමින් මෙම චූදිත මහනුවර, ලේවැල්ල, අරුප්පල ප්‍රදේශයේ පවත්වන ලද පුහුණු වැඩසටහනක් පැවැත්වුනා යැයි කියන ස්ථානයකට චූදිතයන්ගෙන් ප්‍රශ්න කිරීමේදී හෙළි වූ කරුණු අනුව මෙම චූදිත ඇතුළු තවත් චූදිතයින් කීප දෙනෙකුද රැගෙන ගොස් පරීක්ෂා කිරීමක් ගැන සාක්ෂි ලබා දී ඇතද, එය සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තියෙහි

විෂයපථය තුළට කිසිසේත් නොවැටෙන බැවින් සහ ඒ සම්බන්ධයෙන් ස්වාධීන සාක්ෂිකරුවන් කිසිවෙකුගේ සාක්ෂි ඉදිරිපත් වී නොමැති පසුබිම තුළ එම සාක්ෂිය මෙම චූදිතට එරෙහිව අගතිදායක ලෙස උපයෝගී කර ගැනීම සුදුසු නොවන බව අපහට පෙනී යයි.

මෙම නඩුවෙහි 01, 09 සහ 11 චූදිතයන් විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති, මේ වන විටත් අධිකරණය මගින් ශකාතා පරීක්ෂණ වලින් අනතුරුව පිළිගෙන ඇති පාපෝච්ඡාරණමය ප්‍රකාශ වල මහනුවර, අරුප්පල ප්‍රදේශයෙහි පුහුණු කඳවුරක් පැවැත්වුන බවට යම් සඳහනක් කර ඇතද, ඔවුන්ගේ ප්‍රකාශ වල සඳහන් විශේෂයෙන් 01 චූදිතගේ පැ.803 ලෙස ලකුණු කර ඇති පාපෝච්ඡාරණමය ප්‍රකාශයෙහි ‘‘ආක්කම්’’ සහ නම් නොදන්නා තවත් කීප දෙනෙකු 01 චූදිතගේ නිවසට පැමිණ IS සංවිධානය ගැන යම් කරුණු සාකච්ඡා කර ඇති බව සඳහන් කර ඇතද, එකී ප්‍රකාශයෙහි ආක්කම් ලෙසට නම සඳහන් වන්නේ මෙම 25 වන චූදිත යැයි නිශ්චිතව පැවසීමට කිසිදු ස්වාධීන සාක්ෂියක් ඉදිරිපත් වී නැත. 09 චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයගේ L-01 ලෙස ලකුණු කර ඇති පාපෝච්ඡාරණමය ප්‍රකාශයෙහි ‘‘අපි එඩේරමුල්ල සිටියදී නවුෆර් කිව්වා කොළඹ කණ්ඩායමේ අක්කම් හමු වෙන්න යමු කියලා. ඒ අනුව අපි දෙන්නා අක්කම් හමු වෙන්න දෙහිවලට ගියා. එහි අක්කම්, උමයර්, ඉහ්සාන් යන අයවළුන් සිටියා. ’’ යැයි සඳහන් කර ඇතද, එහි සඳහන්

අක්කම් යනු ඉහත කී 25 වන චූදිත යැයි නිගමනය කිරීමට තරම් ස්වාධීන සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

11 වන චූදිත කාලිද් සමීර්ගේ පැ. 168 දරන පාපෝච්ඡාරණමය ප්‍රකාශයෙහි ISIS සංවිධානයට ඇළුම් කරන අහ්කම් අක්‍රම් ඇතුළු පිරිසක් මුහුණුපොත හරහා හඳුනා ගත්තා යැයි සඳහන් කර ඇතද එසේම ‘‘දෙහිවල ගල්වල පාරේ පිහිටි අහ්කම් අක්‍රම් ..... යන අයගේ ගෙවල් වලට එකතු වී ISIS සංවිධානය පිළිබඳව සාකච්ඡා කළා යැයි සඳහන් කර ඇතද, එහි අහ්කම් අක්‍රම් යනුවෙන් සඳහන් කර ඇත්තේ මෙම නඩුවෙහි 25 වන චූදිත මොහොමඩ් අක්‍රම් අහක්කම් නැමැත්තාද යන්න සම්බන්ධයෙන් ස්වාධීන සාක්ෂියක් ඉදිරිපත් වී නැති අතර, මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති පැ. සා. 1914 පොලිස් පරීක්ෂක ගයාන් තිවංක රත්නායකගේ සාක්ෂියෙහි සඳහන් කරන මෙම නඩුවෙහි 25 චූදිතගේ නිවස අංක 186, නව විහාර පාර, දෙහිවල යන ලිපිනයෙහි තිබූ බවයි. ඒ අනුවද ඉහත කී පැ.168 දරන පාපෝච්ඡාරණයෙහි සඳහන් අහ්කම් අක්‍රම් මෙම නඩුවේ 25 වන චූදිතද යන්න සම්බන්ධයෙන් ස්වාධීන සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති පසුබිම තුළ මෙම 25 වන චූදිත විසින් විත්තකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සමස්තයක් ලෙස සැළකිල්ලට ගැනීමේදී ඔහු එම ප්‍රකාශය මගින් කුමන ස්ථාවරයක් ගෙන තිබුනද ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති බරපතල චෝදනාවන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුත්තේ මෙම නඩුවේ පැමිණිල්ල විසින්ම පමණක් බැවින් ඔහුට එරෙහිව ස්වාධීන, අපගේ සාක්ෂි

නීතියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව පිළිගත හැකි ආකාරයේ සාක්ෂි කිසිවක් ඉදිරිපත් වී නොමැති බවට අප තීරණය කරමු.

චිත්තියේ සාක්ෂි විශ්ලේෂණය කර සළකා බැලීම

1 වන චූදිත (මුහම්මදු ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර්)

වෙනුවෙන් ඉදිරිපත් කල සාක්ෂි

මෙම නඩුවේ 01 චූදිත නවුෆර් මවුලවි යන අය වෙනුවෙන් විශේෂඥ අධිකරණ වෛද්‍ය මොහොමඩ් නිසාර් රුහුල් හක් සාක්ෂියට කැඳවා 2019.06.12 දින 01 චූදිතව පරීක්ෂා කිරීමට අදාළ වෛද්‍ය වාර්තාවක් 1D (3)ලෙස ඉදිරිපත් කරඇත. එම චූදිතව 2019.06.12දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස් නමැති නිලධාරියා විසින් වෛද්‍ය මලින්ත ද සිල්වා යන වෛද්‍යවරයා වෙත මෙම චූදිතව පරීක්ෂා කිරීමට ඉදිරිපත් කරඇති බවත්, එම වෛද්‍යවරයා මේ වනවිට විදේශගතව ඇති බැවින් ඔහු වෙනුවෙන් රාජාකරි ආවරණය කිරීම සඳහා නම්කර ඇති මෙම විශේෂඥ අධිකරණ වෛද්‍ය රුහුල් හක් මෙලෙස සාක්ෂි ලබාදී ඇති බව පිළිගෙන ඇති අතර වෛද්‍ය රුහුල් හක් මහතා සාක්ෂි ලබාදී ඇත්තේ වෛද්‍ය මලින්ත සිල්වා විසින් යොදා ඇති සටහන් අනුව වන අතර චූදිතට අදාළ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයට අනුව එම චූදිව පරීක්ෂා කරඇත්තේ 06.11 දින සඳහන්කර ඇත ද, එම වෛද්‍යවරයාට ලබාදී ඇති

කෙටි ඉතිහාසයෙහි අත්අඩංගුවට ගන්නා ලද දිනය ලෙස සඳහන් කර ඇත්තේ 2019.06.21 යැයි සඳහන්කර ඇති බවත්, ඒ අනුව උප පොලිස් පරීක්ෂක ඩයස් විසින් චූදිතව මලින්ත නැමැති වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත්තේ 2019.06.12 ලෙසට සඳහන් කර තිබීම මඟින් එම දිනයේ ඔහුව අත්අඩංගුවට ගත්තා යැයි කියන 2019.06.21 යන දිනට සඳහන්කළ දිනයට පෙර දිනයක් ලෙස සඳහන් කර තිබීම නිසා බව අධිකරණයට පෙන්වා දී ඇති අතර එය කිසිසේත් වියනොහැකි දෙයක් බව වෛද්‍යවරයා පවසා ඇත. 01 චූදිත විසින් සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමේදී වෛද්‍යවරයා පවසා ඇත්තේ කෙටි ඉතිහාසයෙහි පළමු කොටසේ අත්අඩංගුවට ගත් දිනයට 2026.06.21 ලෙස සඳහන්වී ඇති බවත්, එසේම ඉතිහාසයේදී තුන්වන කොටසේ අත්අඩංගුවට ගත් දිනය ලෙසට 2019.04 21 ලෙසට සඳහන්කර තිබෙන බව වෛද්‍යවරයා සඳහන්කර ඇත. මෙම සාක්ෂිය තුළින් අධිකරණයට පෙනී යන්නේ 01 චූදිත විසින් ලබාදී ඇති කෙටි ඉතිහාසය පවා සටහන් කිරීමේදී අත්අඩංගුවට ගත් දිනය පවා වැරදියට සඳහන් කර ඇති බව වන අතර එයට අනුව 01 චූදිතගේ ශරීරයේ බාහිර තුවාල නොමැති බවට සඳහන් කිරීම පසුබිම තුළ 01 චූදිත පොලිස් පහරදීමකට ලක්වුණාද යන්න නිශ්චිතව පෙනී යන්නේ නැත. එසේම, වෛද්‍ය මලින්ත සිල්වා විසින් ඔහුව පරීක්ෂාකර ඇත්තේ 2019.06.12 වනදින පසුබිම තුළ චූදිතගේ කෙටි ඉතිහාසය අනුව 2019.04.21 දිනට සතියකටපසුව පොලිසිය කන් දෙකටම පහරදුන් බවට සඳහන් කර ඇති

පසුබිම තුළ වෛද්‍ය මලින්ත සිල්වා ඔහුව පරීක්ෂා කර ඇත්තේ මාස එකහමාරකට පමණ පසුව බවට පෙනී යන අතර ඒ අනුව, 1D (3) දරණ වෛද්‍ය වාර්තාව මඟින් මෙම නඩුවේ 01 වූදිතව අත්අඩංගුවට පත්වීමෙන් පසු පොලිස් පහරදීමක්ට ලක්වුණාද යන්න සම්බන්ධයෙන් නිශ්චිතව නිගමනයකයට එළඹීමට හැකියාවක් නැත. 1D (3) අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම 50/2019 එනම්, මෙම අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට අදාළ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පොරමය නිකුත්කර තිබෙන්නේ 2019.06.12 ලෙස සඳහන්කර ඇති බවට පෙනීයාම තුළින් මෙම වෛද්‍ය වාර්තාව මඟින් මෙම අධිකරණයෙන් සළකා බැලියයුතු තරම් සුවිශේෂී කරුණු කිසිවක් ඉදිරිපත් වී නැත.

තවද, මෙම 01 වූදිත විසින් 2016.08.17 වනදින පැය ගණනාවක දීර්ඝ විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් සිදුකර ඇතද එහි 2019 අප්‍රේල් 21 දින සවස් භාගයේ ඔහුව දඹුල්ල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බවද, ඉන් පසුව අපරාධ පරික්ෂණ දෙපාර්ත්මේන්තුවට භාරදුන් මුල් සතියේ අපරාධ පරීක්ෂණ දෙපාර්ත්මේන්තුවේ නිලධාරීන් තමාට පහරදුන් බවද තමාට සඳහන්කර ඇතද එහි කිසිදු ස්ථානයක කන්දෙකට පහරදීමක් සම්බන්ධයෙන් හෝ ඒ හේතුව නිසා කන් ඇසීම අඩුවීමක් හෝ ඒ සම්බන්ධයෙන් එක වචනයක් හෝ සඳහන්කර නොමැති බව ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සඳහන්කර නොමැති බව පෙනීයන පසුබිම තුළ සහ 1D (3) වෛද්‍ය වාර්තාවෙහි අඩංගු කරුණුවල තිබෙන

බලවත් දෝෂ සහගත තත්ත්වයන් සළකා බැලීමේදී මෙම වෛද්‍ය සාක්ෂි මඟින් මෙම චූදිත විසින් විත්තිකූඩුවේ සිට ගෙන ඇති ස්ථාවරය සම්බන්ධයෙන් කිසිදු කරුණු තහවුරු කිරීමක් සිදු නොවුණු බවට අපහට පෙනීයයි. එසේම, 1D (3) වෛද්‍ය වාර්තාවෙහි කිසිදු ස්ථානයක පොලිසිය ගහපු නිසා දකුණු කනේ ඇසීම අඩුවෙලා තිබෙන බවට කිසිදු සඳහනක් නොමැති බව වෛද්‍යවරයා විසින්ම පිළිගෙන ඇත. තවද, 01 චූදිත ඔහුට ඇස් පෙනීමේ දුර්වලතාවයක් තිබෙන බවට කිසිදු කරුණක් වෛද්‍යවරයාට සඳහන්කර නොමැති බවද, මෙම වෛද්‍ය සාක්ෂිකරු පිළිගෙන ඇත.

01 චූදිතගේ සාක්ෂි ලැයිස්තුවෙහි 03 වන සාක්ෂිකරු ලෙස උප පොලිස් පරීක්ෂක නිහාල් ජයරත්න යන සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇති අතර ඔහුගේ සාක්ෂි ඇගයීමේදී පෙනීයන කරුණක් වන්නේ 2020 ජනවාරි මාසයේ මොහොමදු ඊබ්‍රාහිම් මොහොමදු නවුෆර් යන චූදිතව සමත මණ්ඩලයකට ඉදිරිපත් කළාද යන්න පරීක්ෂාකර බැලීමේදී එලෙස ඉදිරිපත් කළබවක් තමාට පොත්පත් කිසිවක සටහනක් හමුනොවුණ බවට සාක්ෂිකරු පවසා ඇති අතර සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් යන තැනැත්තාව කටුපොත පොලිස් ස්ථානය මඟින් 2018.11.10 දින සමත මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබීමක් සම්බන්ධයෙන් වාර්තාවී ඇති බවට සඳහන්කර ඇත. එම ලේඛනයට අනුව 2018.11.13 වන දින මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් යන අයගේ බිරිඳ විසින් ඇගේ පියාට විරුද්ධව මුදල් හා භාණ්ඩ සම්බන්ධව කරඇති

පැමිණිල්ලක් සමඵ මණ්ඩලයට යොමුකිරීමක් සිදුවී එම ආරවුල නිරවුල් නොවුණ බවට වාර්තා වුණද එයට අදාළ වාර්තා කිසිවක් මේ වනවිට නොමැති බවත්, ඒවා විනාශ වී ඇති බවටත්, කරුණු හෙළිවූ බවට සාක්ෂිකරු සඳහන්කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් රජයේ අධි නීතීඥ මහතා හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදීද සමඵ මණ්ඩල විමසීම අවසන් කර තිබෙන්නේ 2018.11.15 දින බවට සාක්ෂිකරු පවසා ඇති අතර මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු පෞද්ගලිකවම ලේඛන පරීක්ෂාවක් සිදුකර නොමැති අතර ඔහු අධිකරණයට සාක්ෂි ලබාදී ඇත්තේ කටුවන පොලිසියෙන් ලැබුණා යැයි සඳහන්කරන VPN මඟින් ගෙන්වාගත් පණිවිඩයක් මඟින් බවට සඳහන්කර ඇතද කිසිදු දුරකථන පණිවිඩයක් ලැබුණා යැයි පවසා තිබුණද එවැනි කිසිදු දුරකථන පණිවිඩයක් අඩංගු ලේඛනයක් අධිකරණයේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නැත. එසේම, මෙම සාක්ෂිකරු කුලියාපිටිය ප්‍රදේශයට ගොස් එවැන්නක් පරීක්ෂා කළ බවට කිසිදු සාක්ෂියක් හෝ ඉදිරිපත් වී නැත.එකී පසුබිම තුළ මෙම සාක්ෂිකරු VPN පණිඩියකින් දැනගත්තා යැයි පවසා සිටින කරුණු හුදෙක් ප්‍රවාදකමය කරුණු පමණක් බව අපහට පෙනී යයි. 01 වූදිත විසින් මෙම සාක්ෂිකරුව කැඳවා අධිකරණයට පෙන්වාදීමට උත්සාහකර ඇත්තේ 2020 වසරේ ජනවාරි මාසයේ ඔහුව කුලියාපිටිය සමඵ මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොමැති බව පෙන්වාදීමට උත්සාහ කිරීමක් බව පෙනී යයි. මෙහිදී මෙම විත්තියේ සාක්ෂිකරු විසින් ලබාදුන් සාක්ෂිය කිසිදු

ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමක් නොකර හුදෙක් ඔහු අසා දැනගත් කරුණු ඇසුරින් පමණක් පවසා ඇති කරුණු වීම හේතුකොටගෙන සැබැවින්ම 01 වූදිතව කුලියාපිටිය ප්‍රදේශයේ සමථ මණ්ඩල නඩු කටයුත්තක් සඳහා යොමුකර තිබේද නැද්ද යන්න නිශ්චිතව තීරණය කිරීමට හැකියාවක් නොමැති අතර එමඟින් එවැනි ක්‍රියාවක් සිදුනොවුණා යැයි බැහැර කිරීමටද හැකියාවක් නැති බව අප තීරණය කරමු.

01 වන වූදිතගේ සාක්ෂි ලැයිස්තුවෙහි සාක්ෂි අංක 02 සාක්ෂි දීමට කැඳවීමක් නොකරන බවට 01 වන වුදිත වෙනුවෙන් දැනුම් දී ඇති අතර, සමස්තයක් ලෙස ගෙන 01 වන වූදිතගේ සාක්ෂි අංක 01 සහ සාක්ෂි අංක 03 යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සැළකිල්ලට ගැනීමේදී එම සාක්ෂි මගින් මෙම නඩුවෙහි පැමිණිල්ලෙන් 01 වන වූදිතට එරෙහිව ඉදිරිපත් කරන ලද සාක්ෂි වල විශ්වසනීයභාවය සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් සිදු වී නොමැති බවට අප තීරණය කරමු. 01 වූදිතට 2019.04.21 වන දින ඔහු අත්අඩංගුවට පත් වී සතියකට පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බාර දුන් අවස්ථාවේදී යම් පහරදීමකට ලක් වූ බවට ඔහු පැවසීමට උත්සාහ කර ඇතද, එලෙස පහර දීමකට ලක් වී ඇති බව සනාථ කිරීමට තරම් කිසිදු වෛද්‍ය සාක්ෂියක් මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී නැති අතර, 01 වුදිත විසින් වෛද්‍ය රුහුල් හක් මහතා මඟින් 1D3 ලෙස ලකුණු කරන ලද මෙම 01 වූදිතගේ වෛද්‍ය වාර්තාව මඟින් ද කිසිදු කරුණක් හෙළි වන්නේ නැත.

03 චූදිත හයාතු මොහමදු අහමදු මිල්හාන් වෙනුවෙන්

කැදවන ලද සාක්ෂි

03 චූදිත වන හයාතු මොහමදු අහමදු මිල්හාන් වෙනුවෙන් එක් සාක්ෂිකරුවෙකු පමණක් කැදවන ලද අතර එම සක්ෂිකරු වන්නේ මඩකලපුව දිස්ත්‍රික්කයේ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වන පුරුෂයෝත්තමන් නෙත්තියානන්දන් යන සාක්ෂිකරු වේ. එම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔප්පු අංක 2216 දරන ඔප්පුවේ සහතික කළ පිටපත පිටපතක් **3D-2** ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර එම ඔප්පුවට අනුව, හයාතු මොහොම්මදු අහමදු මිල්හාන් (හැඳුනුම්පත් අංකය: 892003629V, ලිපිනය: නව කාත්තන්කුඩි 2) විසින් මොහොමඩ් සිද්දික් මොහොමඩ් මෆාස් (හැඳුනුම්පත් අංකය: 882784592V, ලිපිනය: නව කාත්තන්කුඩි දකුණ) යන අයට 2019 පෙබරවාරි 19 වන දින විකුණුම්කරයක් මඟින් ඉඩමක් විකුණා ඇති බවත් එම ඔප්පුව සහතික කර ඇත්තේ නොතාරිස් අබ්දුල් අසීස් මොහොමඩ් රුබි මහතා විසින් බවත් එම ඉඩම මඩකලපුව දිස්ත්‍රික්කයේ ආර්යම්පති ඔල්ලිකුලම් ප්‍රදේශයේ පිහිටි පර්චස් **12.98** ක විශාලත්වයකින් යුත් ඉඩමක් බවට ඔප්පුවේ සඳහන් වන බවත් පවසා ඇත.

හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් ද සාක්ෂිකරු ප්‍රකාශ කළේ ඉඩම විකිණීමෙන් පසු එහි සිදු වූ දේ, එහි යමක් වළලා තිබුණේද යන්න හෝ එහි

ගිය ආ ගිය අය කවුද යන්න සම්බන්ධයෙන් තමන් කිසිවක් නොදන්නා බව ඔහු සාක්ෂි දී පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණය කර බැලීමේදී හුදෙක් **3D-2** ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ඔප්පු අංක 2216 යන ලේඛනය සම්බන්ධයෙන් සහ එම ඔප්පුවේ පාර්ශවකරුවන් කවර පුද්ගලයන්ද යන්න සම්බන්ධයෙන් පමණක් කරුණු ඉදිරිපත් වී ඇති අතර, ඒ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් 03 වන චූදිත මිල්හාන් විසින් උත්සාහ දරා ඇත්තේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි 2019 පෙබරවාරි මස 19 වන දින ඔහු ඔහුගේ නමින් තිබූ ඉඩමක් මෆාස් යන පුද්ගලයාට විකුණු බව සහ එලෙස තමා විකුණු ඉඩමෙහි තිබී සාක්ෂි ආඥා පනතේ 27 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ සොයාගෙන තිබීම හබ කරමින් ඒ වන විට එම ඉඩම තමා සන්තකයේ නොතිබූ බව පෙන්වා දීමට බව වේ. කෙසේ වුවත් මෙම 03 වන චූදිත මිල්හාන් වෙනුවෙන් සාක්ෂි ලබා දුන් ඉහත කී අතිරේක ඉඩම් රෙජස්ට්‍රාර්වරයාගේ සාක්ෂියට අනුව 2019 පෙබරවාරි 19 වන දින හයාතු මොහොමදු අහමදු මිල්හාන් නැමැත්තා විසින් ඔප්පු අංක 2216 යටතේ එම්. එස්. එන්. මෆාස් යන අයට විකුණා තිබූ පර්චස් 12.98 ක විශාලත්වයෙන් යුතු ඉඩම විකුණු පසු එම ඉඩමට ගියේ ආවේ කවුද යන්න සම්බන්ධයෙන් තමා කිසිවක් දන්නේ නැති බවට පවසා ඇති පසුබිම තුළ හුදෙක් එකී **3D-2** ලෙස ලකුණු කර ඇති ඔප්පුවට අදාළ ඉඩම 03 වන චූදිත මිල්හාන් විසින් මෆාස් නැමැත්තාට විකිණීමෙන්

පසුවද 03 වන චූදිත එම ඉඩමට ප්‍රවේශ නොවූ බවට කිසිසේත් නිගමනය කළ නොහැකිය. එකී ඉඩමේ වල දමා තිබී 03 වන චූදිත මිල්හාන් නැමැත්තාගේ මග පෙන්වීම ඔස්සේ සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව එනම් පැ.1737 ලෙස ලකුණු කර ඇති උද්ධෘත කොටස ප්‍රකාරව පැමිණිල්ලේ සාක්ෂි අංක 1958 ප්‍රධාන පොලිස් පරීක්ෂක ගීතාංජන දිසානායක යන සාක්ෂිකරු විසින් ඉහත 03 වන චූදිත මිල්හාන් යන අයගේ ප්‍රකාශය 2019.06.21 දින සටහන් කිරීමේදී සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව ඩෙටනේටර්, ජෙලටිනයිට්, ඩෙටනේටර් කෝඩ් ඇතුළු පුපුරන ද්‍රව්‍ය මෆාස්ගේ ඉඩමේ වැට අයින දිගේ ස්ථාන කීපයක තිබෙන බව පැවසීම මත 03 වන චුදිත මිල්හාන්ගේ මග පෙන්වීම ඔස්සේ මෆාස් නැමැත්තාට අයත් ඉඩමේ ස්ථාන 07 ක් ඔහුගේ පෙන්වා දීම මත පරීක්ෂා කර ඉහත කී දේපල සොයා ගත් බවට ලබා දුන් සාක්ෂිය හඹ කිරීමට බව පෙනී යයි. එලෙස සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව 03 චූදිත මිල්හාන් නැමැත්තාගේ මග පෙන්වීම ඔස්සේ දේපල සොයා ගැනීමට අදාළව ලබා දුන් සාක්ෂි ලබා දුන් ඉහත කී පැ.සා. 1958 ප්‍රධාන පොලිස් පරීක්ෂක දිසානායක යන සාක්ෂිකරුගේ සාක්ෂිය සහ අදාළ නඩු භාණ්ඩ වලට අදාළ නෛතික තත්ත්වය අප විසින් මෙම තීන්දුවේ දී වෙනමම කරුණු සාකච්ඡා කරනු ලැබේ. ඉහත කී අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ සාක්ෂියත් සමඟ 03 වන චූදිතට අදාළ නඩු විභාගය ඔහු විසින් අවසන් කර ඇත.

18 වූදිත රාසික් රාසා හුසේයින් වෙනුවෙන් කැඳවන ලද

සාක්ෂි

18 වූදිත වෙනුවෙන් වෛද්‍ය මොහොමඩ් රිෆාත් අබ්දුන් රහුමාන් යන සාක්ෂිකරු සාක්ෂි දෙමින් ඔහු කොළඹ ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස සේවය කරන බවත් 2021 ජූනි මාසයේදී ඔහු ජාතික විෂවේද හා අධිකරණ වෛද්‍ය කාර්යාලයේ අධිකරණ වෛද්‍යවරයෙකු ලෙස සේවය කළේය. 2021 ජූනි මස 17 වන දින ත්‍රස්ත විමර්ශන ඒකකය **(TID)** විසින් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කරන ලද රාසික් රාසා හුසේයින් (18 වන වූදිත, පදිංචිය: නව කාත්තන්කුඩිය) නැමැත්තා පරීක්ෂා කර තිබෙන බවත්, 2021.04.21 දිනට පෙර ඔහුට පහර දීමක් සිදු වූ බවට තමාට දැනුම් දී ඇතද, තමා පරීක්ෂා කරන අවස්ථාවේදී එවැනි පහර දීමක ලකුණු තිබුනේ නැති බවට වෛද්‍යවරයා පවසා ඇත. මෙම වූදිත සම්බන්ධයෙන් **18D4** ලෙස අධිකරණ වෛද්‍ය වාර්තාවක් නිකුත් කළ බව වෛද්‍යවරයා පවසා ඇත. එම වූදිතයා 2021.04.21 සිට ත්‍රස්ත විමර්ශන භාරයේ සිටි අතර, ඊට පෙර තමන්ව අහුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටියදී පහර දුන් බවට කෙටි ඉතිහාසයේ සඳහන් වන බව වෛද්‍යවරයා පැවසීය. කෙසේ වෙතත්, වෛද්‍යවරයා පරීක්ෂා කරන අවස්ථාවේදී වූදිතයාගේ ශරීරයේ පහරදීමකට අදාළ කිසිදු බාහිර තුවාලයක සලකුණක් දක්නට නොලැබුණු බවට මෙම වෛද්‍යවරයා පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් අනෙකුත් සියලුම චූදිතයින් හරස් ප්‍රශ්න කිසිවක් ඇසීමට නොමැති බව පවසා ඇති අතර, රජය වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ද වෛද්‍යවරයා පවසා ඇත්තේ එම චූදිතව අත්අඩංගුවට ගත් මුල් කාලයේ පහර දීමකට ලක් වූ බවට තමාට ලබා දුන් කෙටි ඉතිහාසයේ සඳහන් කලද තමා විසින් ඔහුගේ ශරීරය පරීක්ෂා කිරීමේදී පහර දීමකට අදාළ තුවාල කිසිවක් දක්නට ලැබුනේ නැති බවට වෛද්‍යවරයා යළිත් අවධාරණය කර ඇත.

18 චූදිත වෙනුවෙන් කැඳවන ලද මෙම සාක්ෂිය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ඔහු විත්තකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කරන ලද පරිදි ඔහුව 2019.05.05 දින නිළ ඇඳුම් නොමැති දෙදෙනෙකු පැමිණ අත්අඩංගුවට ගෙන කල්මුණ ප්‍රදේශයේ ගොඩනැගිල්ලකට රැගෙන ගොස් පහර දුන් බවත් ඉන් පසු අම්පාර පොලීසියට රැගෙන ගොස් එහිදී දින 03 ක් 04 ක් එක දිගටම පහර දුන් බවත් ඉන් පසුව තමාව මඩකලපුව බන්ධනාගාරයේ ද බන්ධනාගාරගත කර 2019.12.07 දින අගුණුකොළපැලැස්ස බන්ධනාගාරයට මාරු කරන ලද බවත්, එම බන්ධනාගාරයේ සිට 2020. මාර්තු 13 වන දින වන විට දින 14 කට සැරයක් කල්මුණ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කල බව වන අතර, කෙසේ වුවත් **18D4** දරන අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව එවැනි කිසිවක් අඩුම තරමින් රෝග ඉතිහාසය හෝ සඳහන් කර නොමැති බව පෙනී යන අතර, මෙලෙස 18 චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේදී

සඳහන් කර ඇති පරිදි ඔහුට අම්පාර පොලීසියේදී ඔහුගේ අත්දෙක පල්ලෙහාට කර ගැට ගසා දණහිසට යටින් මැදින් පොල්ලක් තමා මේස් දෙකක් අතට දමා දිගටම දින 03 ක් හෝ 04 ක් ඒ විධියටම පහර දුන් බවට පවසා ඇතද, එවැනි කිසිදු කරුණක් මෙලෙස ඔහු වෙනුවෙන් සාක්ෂි ලබා දීම සඳහා කැඳවා ඇති වෛද්‍ය රහුමාන් මහතාට එක වචනයක් හෝ සඳහන් කර නොමැති බව පෙනී යන අතර, වෛද්‍යවරයාගේ සාක්ෂියට අනුව මෙම 18 වූදිත තමාට පවසන ලද කරුණු අනුව ඔහුට අඟුණුකොළපැලැස්ස බන්ධනාගාරය භාරයේ සිටියදී පහර දුන් බවට සඳහන් කර ඇති බවක් සම්බන්ධයෙන් කරුණු සඳහන් කර ඇති අතර, ඒ අනුව 18 වන වූදිත විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයෙහි සඳහන් කර ඇති පරිදි ඔහුට පහර දුන්නා යැයි පවසන කරුණ සම්බන්ධයෙන් පැවසූ කරුණු සහ ඔහු වෙනුවෙන් කැඳවන ලද වෛද්‍ය රහුමාන්ගේ සාක්ෂියෙන් සහ **18D4** දරන මෙම වූදිතගේම අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු මඟින් බලවත් ලෙස පරස්පරතාවයට ලක් වී ඇති බව අප හට පෙනී යයි. 18 වූදිත වෙනුවෙන් වෙනත් සාක්ෂිකරුවන් කිසිවෙකු කැඳවීමක් කර නැත.

<u>09 වූදිත වෙනුවෙන් කැඳවන ලද සාක්ෂි</u>

09 වන වූදිත වෙනුවෙන් සාක්ෂිකරුවන් 22 ක් ඇතුළත් සාක්ෂි ලැයිස්තුවක් ගොනු කලද ඔහු වෙනුවෙන් සාක්ෂි දීම සඳහා කැඳවන ලද්දේ

එම සාක්ෂි ලැයිස්තුවේ පොලිස් කොස්තාපල් 18549 නාගරාජා නවීන් සහ සාක්ෂි අංක 21 මොහොමඩ් මසූර් මෙහොමඩ් යන සාක්ෂිකරුවන් දෙදෙනා පමණි. එම සාක්ෂිකරුවන් දෙදෙනාගේ සාක්ෂි පහත පරිදි අප විසින් සැළකිල්ලට ගනු ලැබේ.

09 වන චූදිතගේ සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂි අංක 18 පොලිස් කොස්තාපල් නාගරාජා නවීන් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු මුලතිව් උප ඒකකයේ ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ පොලිස් කොස්තාපල් 18549 ලෙස සේවය කරන බවත්, 2023 ඔක්තෝබර් මාසයේදී ඔහු කොළඹ පිහිටි ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාෂයේ මූලස්ථානයෙහි එනම් කිරුළපන භූතානි කැපිටල් ගොඩනැගිල්ලේ සේවය කල බවත්, 2023.10.16 දින 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත්ගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට නියෝග ලැබුණ බවත් පවසා ඇත. ඒ අනුව තමා විසින් සටහන් කල එම ප්‍රකාශය පිටු 3කින් යුත් ලේඛනයක් වන අතර, එහි දෙවන සහ තුන්වන පිටුවල චූදිතයාගේ අත්සනට ආසන්නව "**forced to sign**" (අත්සන් කිරීමට බල කරන ලදී) යනුවෙන් සටහන් කර ඇති බව ඔහු තහවුරු කළේය. තවද, එම ප්‍රකාශයේ "**සුය විරුප්පුඩන්**" යන දෙමළ වචනය සදහන් වී තිබෙන බවත් එහි සිය කැමැත්තෙන් යන වචන කපා හැර ඒ අසල චූදිතයා කෙටි අත්සනක් යොදා ඇති බව පවසා ඇත. එසේම එම ප්‍රකාශය ලබාගෙන ඇත්තේ දින 3ක

රැඳවුම් නියෝගයක් යටතේ චූදිතයා TID එකට ගෙනා අවස්ථාවේදී බවත් ඔහු පවසා ඇත.

පැමිණිල්ල වෙනුවෙන් අසන ලද හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරු පවසා ඇත්තේ, ප්‍රකාශය ලබා ගැනීමට චූදිතයා කැමැත්තක් නොදැක්වූ බවත්, කෙසේ වුවත් එම ප්‍රකාශයේ විමර්ශනයට අදාළ කිසිදු විස්තරයක් සටහන් කිරීමක් කර නොමැති බවත්, වන අතර, එහි චූදිත විසින් "**forced to sign**" යැයි සඳහන් කර ඇත්තේ චූදිතයා ප්‍රකාශයක් ලබාදෙන්න බැහැ යැය පැවසූ කරුණ සම්බන්ධයෙන් බවට පවසා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂණාත්මකව ඇගයීමේදී පෙනී යන්නේ 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් උත්සාහ දරා ඇත්තේ විමර්ශන නිලධාරීන් ප්‍රකාශ සටහන් කර ගන්නා ක්‍රමවේදය තමා ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාෂයෙහි රඳවා තබාගෙන සිටි කාලයේද ප්‍රශ්නයට ලක් කල බව පෙන්වා දීමට වන අතර, මෙම 09 වන චූදිතගේ සාක්ෂිකරු වන පොලිස් කොස්තාපල් 18549 නාගරාජා නවීන් යන සාක්ෂිකරුගේ සාක්ෂියේදී පැහැදිලිව සඳහන් කර ඇත්තේ 09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් "**forced to sign**" යැයි ලියන ලද්දේ ඔහුගෙන් ලබා ගත් ප්‍රකාශයකට අත්සන් කිරීමක් සම්බන්ධයෙන් නොව ඔහුට ප්‍රකාශයක් ලබා දෙන්න බැහැ යැයි පැවසූ කරුණ සටහන් කල පසු එයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීම බව වේ. ඒ අනුව 09 වන චූදිතගෙන් ඔහු රැඳවුම් නියෝග මත සිටියදී ඔහුගෙන් ප්‍රශ්න

කිරීම් සිදු කර විමර්ශනයට අදාළව බලහත්කාරයෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමක් මෙම 09 වන චූදිතගේ සාක්ෂිකරු වන පොලිස් කොස්තාපල් 18549 නාගරාජා නවීන් යන අයගේ සාක්ෂිය මගින් කිසිසේත් පෙනී යන්නේ නැත.

09 වන චූදිතගේ සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂි අංක 21 මොහොමඩ් මෂූර් මොහොමඩ් රිකාස් සාක්ෂි ලබා දෙමින් ඔහු වසර 30ක් පමණ ව්‍යාපාර කටයුතුවල නිරතව සිටියදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (**PTA**) යටතේ අත්අඩංගුවට පත්ව වසර දෙකක් බන්ධනාගාරගතව සිටි බවත්, පසුව එම නඩුවෙන් ඔහුව නිදහස් කළ බවත් පවසා ඇත. ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ ලංකාවේ විවිධ ආගමික හා ජන කොටස් අතර සංහිඳියාව බිඳ වැටීමේ ප්‍රශ්න පැවති බවත්, මුස්ලිම්වරුන්ට එරෙහිව බොරු ප්‍රචාර සිදුවූ බවත් ඔහු සඳහන් කර ඇති අතර, තමාද ඒ සම්බන්ධයෙන් 2016 දී ඥානසාර හිමියන්ට එරෙහිව පැමිණිල්ලක් කළ බවත්, වසර 10කට පමණ පසු 2026 දී (හෝ 2025 දී) ඥානසාර හිමියන්ට මහේස්ත්‍රාත් අධිකරණයෙන් මාස 9ක සිරදඬුවමක් සහ රුපියල් 1500ක දඩයක් නියම වූ බවත් පැවසීය.

තවද, තමා බොරැල්ල ජුම්මා පල්ලියේ වසර 16ක් භාරකාර මණ්ඩලයේ උප සභාපති ලෙස සේවය කළ බවත්, එම පල්ලියට පහර දුන් පිරිසකට එරෙහිව නඩු පවරා දඬුවම් ලබා දුන් බවත්, මුස්ලිම්වරුන් පල්ලිවලට ආදරය කරන බවත්, පල්ලියකට පහර දීමට පැමිණි විට

ආත්මාරක්ෂාව සඳහා එය ආරක්ෂා කිරීම තමන්ගේ අයිතියක් හා වගකීමක් බවත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් මුලින්ම 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර, අනෙකුත් චූදිතයින් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමක් කර නැත.

04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලාගේ හරස් ප්‍රශ්නවලට ලක් වෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ, ඔහු 2016 වසරේදී මුස්ලිම් ජනතාවට ඇති වූ ප්‍රශ්න සම්බන්ධයෙන් නඩු 04 ක් දැම්ම බවත්, ඉන් නඩ් 03 කට කුමක් වූවාද යන්න පවා තමා දන්නේ නැති බවත්, ඔහු පවසා ඇති අතර, 2014 වර්ෂයේ අළුත්ගම මුස්ලිම් දේවස්ථාන කීපයක් විනාශයට ලක් වුන බවත්, එසේම අම්පාර ප්‍රදේශයේ එක් මුස්ලිම් පල්ලියක් හානියට පත් වූ බවත්, 2018 වර්ෂයේ දිගන ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථානවලට හානි සිදු වුනු බවත්, ඒවා පිටුපස ජාතිවාදීන් සිට ඇති බවත් පොලිසිය විසින් එකී ජාතිවාදීන්ගේ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම නතර කිරීම කලේ නැති බවත්, අළුත්ගම ප්‍රදේශයේ එවැනි ප්‍රශ්න ඇති වූ විට එවැන්නක් යළි නොවීමට වගබලා ගන්නා බවට එම ප්‍රදේශයට අදාළ නියෝජ්‍ය පොලිස්පතිවරයා පැවසුවද එම ප්‍රදේශයේද එවැනි සිද්ධීන් සිදු වුන බවත්, තමාලා අදහන්නේ අල්ලා දෙවියන් බවත් තමාලා ඒ සඳහා පල්ලි පාවිච්චි කරන බැවින් තමාලා එම පල්ලි වලට අනිවාර්යයෙන්ම ආදරය කරන බවත් එවැනි පල්ලිවලට කුමන හෝ ආකාරයෙ ප්‍රශ්නයක්

ඇති වුවහොත් එකී පල්ලි ආරක්ෂා කරන්න තමාලා ආත්මාරක්ෂාවේ අයිතිය යටතේ කටයුතු කරන බවත් තමාලා පල්ලිය ආරක්ෂා කිරීම යන්නෙහි අර්ථය අන්‍ය ආගමිකයන් අතර ප්‍රශ්න ඇති කිරීම නොවන බව යමෙකු පල්ලියට පහර දෙනවා නම් එය ආරක්ෂා කිරීම තමන්ලාගේ වගකීම බවත් පවසා ඇත. තමා විසින් 2016 වසරේ ගොනු කරන ලද නඩුවේ තීන්දුව ලැබුනේ 2025 වසරේ බවත්, ඒ අතර කාලය තුළදී මුස්ලිම් පල්ලිවලට යම් යම් හානි සිදු වූ බවත් තමා නඩුව පැවරීමෙන් මාස 02 කට පසුව බොරැල්ල ජුම්මා පල්ලියට ගල් ගැසීමේ සිද්ධියක් සිදු වුන බවත්, එයට දහම් පාසැලේ ගුරුවරු පිරිසක් සම්බන්ධ බවත් ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් විභාග වී ඔවුන් වැරදිකරුවන් වී දඩුවම්ද නියම කර ඇති බවත් සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුව පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්නවලට ලක් කරන ලද අවස්ථාවේදී, ඔහු පවසා ඇත්තේ 2019.04.21 දින සිදු වූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතු කොට ගෙන සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ 20 දෙනෙක් මැරුනා යන්න තමාට පිළිගන්න පුළුවන් බවත්, එසේම 18 දෙනෙක් තුවාල ලැබුවා යන්න තමාට පිළිගන්න පුළුවන් බවත්, එසේම කිංග්ස්බරි හෝටලයේ සිදු වූ බෝම්බ පිපිරීමෙන් 09 දෙනෙක් මියගොස් 23 දෙනෙක් තුවාල ලැබූ බව තමාට පිළිගන්න පුළුවන් බවත්, එසේම ෂැංගිලා හෝටලයේ බෝම්බ ප්‍රහාරයක් සිදු වුන බවත්, මියගිය හෝ තුවාල වූ ගණන තමා දන්නේ නැති බවත් පවසා ඇත. එසේම

කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් පල්ලියේ බෝම්බ පිපිරීමෙන් පුද්ගලයන් 116 ක් මිය ගොස් 303 දෙනෙකු තුවාල ලැබූ බවත්, එසේම කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදු වූ බෝම්බ පිපිරීම නිසා පුද්ගලයන් 56 දෙනෙකු මිය ගොස් 145 දෙනෙකු තුවාල ලැබූ බව තමාට පිළිගන්න පුළුවන් බවත්, මඩකලපුව සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීමෙන් 31 දෙනෙක් මිය ගොස් 67 දෙනෙකු තුවාල තැබූ බව තමාට පිළිගන්න පුළුවන් බවත්, ට්‍රොපිකල් ඉන් නවාතැන්පලේ පුද්ගලයින් දෙදෙනෙකුද 2019.04.21 දින සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය බවට තමා දැනුවත් බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එකී සිද්ධීන්ට සම්බන්ධ වගකිව යුතු පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම දඩුවම් ලැබිය යුතු බවත් සාක්ෂිකරු පවසා ඇත.

රටේ එදිනෙදා විවිධ ස්ථානවලදී සිදු වන අපරාධ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිසිය සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන තිබෙන බවත්, ක්‍රිස්තියානි වේවා මුස්ලිම් වේවා පල්ලියකට යමෙකු ප්‍රහාර එල්ල කලහොත් එසේත් නැතිනම් පන්සලකට යමෙකු ප්‍රහාර එල්ල කලහොත් එකී ස්ථානයන් වල ඇදැහිලි කරන පුද්ගලයින්ද එය ආරක්ෂා කර ගන්න කටයුතු කරන බවත්, එසේම එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර පොලීසියට ගොස් පැමිණිලි කර නඩු දැමීම කළ යුතු බවත් තමාලාගේ පල්ලියට ගැහුවා කියා සිතන කට්ටියව වෙත ගොස් ගහන්න මරන්න බැරි බවත් බෝම්බ ගහන්න බැරි බවත්, බුදු පිළිම

සහ දේවරූප කඩන්න බැරි, බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, බෝම්බ ඇගේ බැදගෙන පුපුරවා ගන්න මුස්ලිම් බැරි බව මෙම සාක්ෂිකරුද හරස් ප්‍රශ්න වලදී පවසා ඇත. මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කැඩීම සම්බන්ධ සිද්ධියක් සිදු වී එය සිදු කල පුද්ගලයින් පිරිසක් මහාධිකරණය ඉදිරියේ වරද පිළිගත් කරුණද තමා දන්නා බවත් පවසා ඇති සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ 2019.04.21 දින සිදු වූ කිසිදු ප්‍රහාරයක් තමා අනුමත කරන්නේ නැති බවත් එදින හෝටල් වල සහ දේවස්ථාන වල සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර කිසිවක් තමා අනුමත කරන්නේ නැති බවත්, එකී බෝම්බ ප්‍රහාරයන්ට වග කිව යුතු යම් පුද්ගලයින් සිටිනවා නම් ඔවුන්ට එම ක්‍රියාවන් වලට දඬුවම් විදිය යුතු බව තමාද පිළිගන්නා බව සාක්ෂිකරු පවසා ඇත. 2019.04.21 වන දින බෝම්බ ප්‍රහාරය සිදු කල ත්‍රස්තවාදීන්ට සහ එයට අනුබල දීපු ත්‍රස්තවාදීන්ටත් අනිවාර්යයෙන්ම යම් දඬුවමක් ලැබිය යුතු බවත් මෙම සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ මෙම අධිකරණයේ සිටින චූදිතයින් අතරින් මිල්හාන් යන චූදිතව සහ ජෙම්සිත් යන චූදිතවද, තමා දන්නා හදුනන බවත් ඔවුන් බන්ධනාගාරයේ තමා සමඟ එකට සිටි අය බව පවසයි. එසේම තමාගෙන් මූලික ප්‍රශ්න අසන ලද 09 වන චූදිතව තමා දන්නේ නැති බවත්, තමාගෙන් දෙවනුවට හරස් ප්‍රශ්න අසන ලද චූදිතයාවද තමා දන්නේ නැති බවත් පවසා ඇත. මෙම සාක්ෂිකරුගෙන් 09 වන චූදිත නැවත ප්‍රශ්න ඇසීමේදී මෙම සාක්ෂිකරු මූලික සාක්ෂියේදී සඳහන් කරන ලද පරිදි ඔහු

විසින් ගොනු කරන ලද නඩුවට අදාළ විස්තර යළි අසා ඇත. එසේම නැවත ප්‍රශ්න වලදී සාක්ෂිකරු පවසා ඇත්තේ තමා විශ්වාස කරන ආගමට අනුව බෝම්බ පිපිරීම් සිදු කල අය නීතියෙන් බේරුනද ඔවුන්ට දෙවියන් වහන්සේගේ දඩුවමින් බේරෙන්නට නොහැකි බවයි. එසේම ශ්‍රී ලංකාවේ නීතිය අනුව යම්කිසි පුද්ගලයෙක් ආත්මආරක්ෂාව සඳහා කටයුතු කිරීම වරදක් නොවන බවත් සාක්ෂිකරු පවසා ඇත. එසේම මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කැඩීම හා සම්බන්ධ පැවති නඩුව මුලින්ම ත්‍රස්තවාදී පනත යටතේ තිබූ නඩුවක්ද යන්න තමා දන්නේ නැති බවත් වෙනත් ප්‍රදේශවල ආගමට අනුයුක්ත ස්ථානවලට පහර දීමක් පල්ලි කැඩීමක් සිදු වන ස්ථාන වලට අදාළ පුද්ගලයන්ට ත්‍රස්තවාදී පනත යටතේ නඩු දමා තිබෙනවාද යන්න තමා දන්නේ නැති බවත් මෙම සාක්ෂිකරු පවසා ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සමඟ 09 වන චූදිත වෙනුවෙන් විභාගය අවසන් කර ඇත.

මෙම සාක්ෂිකරුගේ සමස්ත සාක්ෂිය ඇගයීමට ලක් කිරීමේදී පෙනී යන කරුණක් නම් ඔහුව මෙම අධිකරණයෙහි සාක්ෂි දීම සඳහා කැඳවා ඇති 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයව මෙම සාක්ෂිකරු හඳුනන්නේද නැති බවයි. මෙම සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේදී සඳහන් කර ඇත්තේ 2016 වසරේ සිටම මුස්ලිම් පල්ලිවලට ප්‍රහාර සිදු වීම් සිදු වන බව සහ එවන් ජාතීවාදී සිද්ධීන් හේතු කොට ගෙන ඔහු විසින් කොළඹ අපරාධ කොට්ඨාෂයට පැමිණිලි කිරීම්ද කර ඇති බව

වන අතර, එසේම ඉස්ලාම් ආගමික ස්ථාන වන මුස්ලිම් දේවස්ථානවලට යම් යම් ප්‍රහාරයන් එල්ල වන අවස්ථා වල මුස්ලිම් භක්තිකයන් වශයෙන් එකී පල්ලි ආරක්ෂාව සඳහා ආත්මආරක්ෂක කටයුතු වල යෙදී සිටීම වරදක් නොවන බව පෙන්වා දීමට මෙම සාක්ෂිකරු මගින් උත්සාහ කර ඇති බවයි. සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව මුස්ලිම් ආගමික ස්ථානයන් වන පල්ලි වලට පමණක් නොව අනෙකුත් ආගම් වලට අදාළ ආගමික සිද්ධස්ථානයන්ට ප්‍රහාර එල්ල කරන්නේ නම් එවන් අවස්ථාවලදී එවැනි ප්‍රහාරයන්ට සම්බන්ධ පුද්ගලයන්ට දඩුවම් ලබා දීම අනිවාර්යයෙන්ම සිදු විය යුතු බව වන අතර, 09 වන චූදිත මෙම සාක්ෂිකරු කැඳවීම තුළින් පෙන්වීමට උත්සාහ දරා ඇත්තේ මුස්ලිම් ආගමික ස්ථානවලට ප්‍රහාර එල්ල වන අවස්ථාවලදී එල්ල කල පුද්ගලයන්ට එරෙහිව ආත්මාරක්ෂාවේ අයිතිය ක්‍රියාත්මක කිරීම සිදු කල යුතු බවට හුවා දැක්වීම වුවද සාක්ෂිකරුම පිළිගෙන ඇත්තේ එවැනි ක්‍රියාමාර්ගයන්ට එරෙහිව යුක්තිය පසිඳලීමේ ආයතන වෙත ගොස් පැමිණිලි කිරීම සිදු කළ යුතු බවට වේ. එසේම මුස්ලිම් පල්ලිවලට යම් ප්‍රහාරයක් එල්ල කිරීමක් සිදු වුවහොත් එය සිදු කරන ලද පුද්ගලයන්ව වෙත ගොස් ඔවුන් මරා දැමීමට හෝ බෝම්බ ගැසීමට හෝ බුදු පිළිම කැඩීමට හෝ දේව රූප කැඩීමට හෝ බෝම්බ ඇගේ බැඳගෙන ගොස් පුපුරවා ගැනීමට මුස්ලිම් අයට බැරි බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුලදීම පවසා ඇති ආකාරය පෙනී යයි. මෙම සාක්ෂිකරුද එකහෙලාම පිළිගෙන ඇත්තේ 2019.04.21 දින බෝම්බ

ප්‍රහාරය සිදු කල ත්‍රස්තවාදීන්ට සහ ඔවුනට අනුබල දුන් පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම දඩුවම් ලැබිය යුතු බවත්, එවන් පුද්ගලයන් නීතියෙන් ගැලවුනද ඔවුනට දෙවියන් වහන්සේගේ දඩුවමින් බේරෙන්නට බැරි බවයි.

13 වන චූදිතගේ සාක්ෂි

සාරංග ප්‍රභාත් දිවුලගේ යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමා ආරක්ෂක අමාත්‍යාංශයේ නීති නිලධාරියා ලෙස කටයුතු කරන බව පවසා, 13 වන චූදිත විසින් කැඳවීම මත ඔහු 13 වන චූදිතට අදාළ රැඳවුම් නියෝග 06ක් සහ ස්ථාන මාරු කිරීමේ නියෝග 02ක් නිකුත් කර ඇති බවට සාක්ෂි ලබාදී ඇති අතර, එකී රැඳවුම් නියෝගයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 09(1) වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇති බවත්, එම රැඳවුම් නියෝග වලින් 05 වන රැඳවුම් නියෝගය 13D1ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, එම ලේඛනය ආශ්‍රයෙන් සාක්ෂි ලබා දෙමින් එහි වැඩ බලන ආරක්ෂක අමාත්‍ය රුවන් විජේවර්ධන යන අය විසින් එය නිකුත් කල බවට සඳහන් වන බවත් පවසා ඇත. එසේම 2020.07.23 වන දිනට අදාළව මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්සාෆ් යන අයට අදාළව නිකුත් කර ඇති ලේඛනය 13D2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, එසේම එම ඉහත සැකකරුට අදාළ 05 වන ලේඛනයෙහි නිකුත් කරන ලද දිනය 2019 අප්‍රේල් මස 24 ලෙසට සඳහන් කර ඇති බව සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් පමණක් හරස් ප්‍රශ්න අසා ඇති අතර, පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න ඇසීමක් කර ඇත. 04 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයට MOD/LEG/PTA/137/19 යන රැඳවුම් නියෝගය සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් යන භාෂා දෙකෙන්ම තිබෙන බවත්, එහි ඔහුව රඳවා තැබිය යුතු ස්ථානය ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, නව මහලේකම් කාර්යාලය, කොළඹ 01 යැයි සඳහන්ව තිබෙන බවත්, එසේම එකී මොහොමඩ් ඉබ්‍රාහි ම් සාදික් අබ්දුල්ලා යන අයට අදාළව රැඳවුම් නියෝග නිකුත් කර ඇති කාලසීමාවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සිටි කාලවකවානුවේ ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් රාජකාරී අවස්ථාවේ ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව කරුණු සළකා බැලීමට හැකි බැවින් එතුමා විසින්ම එම රැඳවුම් නියෝග අත්සන් කර තිබෙන බවත් 20 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු ආරක්ෂක අමාත්‍යවරයෙක් පත්වීම කල බවත්, ආරක්ෂක අමාත්‍යවරයා රටින් බැහැරව ගොස් සිටින අවස්ථා වල වෙනත් කවුරු හෝ අමාත්‍යවරයෙකුට ඔහුගේ වැඩ පැවරීම සිදු කරන බවත්, ඒ අනුව එලෙස වැඩ පැවරීම ලත් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තමාලා රැඳවුම් නියෝග සම්බන්ධ ලේඛන වල අත්සන් ලබා ගන්නා බවත් පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් පැමිණිල්ල වෙනුවෙන්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, විශේෂයෙන් 13D1ලෙස ලකුණු කර ඇති 2020 අප්‍රේල් 24 වන දිනැති රැඳවුම් නියෝගය ආශ්‍රයෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එම ලේඛනයේ වැඩ බලන අමාත්‍යවරයා ලෙස රුවන් විජේවර්ධන යන නම සඳහන් වුවද එහි අත්සන් තබා තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් එය ඒ දිනවල ටයිප් කරද්දී සිදු වී ඇති කාර්යාල ප්‍රමාද දෝෂයක් බවත් මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්සාෆ් යන අයට අදාළ පළවන රැඳවුම් නියෝගය අත්සන් කර තිබෙන්නේද වැඩ බලන ආරක්ෂක අමාත්‍යවරයා වූ රුවන් විජේවර්ධන මහතා විසින් බවත් එකී කාර්යාලයීය වැරැද්ද නිවැරදිව 2020 සැප්තැම්බර් 09 වන දිනට අදාළව MOD/LEG/PTA/93/2019 දරන 2020 සැප්තැම්බර් 09 දිනැති රැඳවුම් නියෝගයේ පළවන ඡේදයේ අත්සන් තබා ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් බවත් පවසා එම රැඳවුම් නියෝගය පැ.2077 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. සාක්ෂිකරු වැඩිදුරටත් පවසා ඇත්තේ තමාගේ දැනුම සහ ලේඛන අනුව කිසිදු අවස්ථාවක 13 වන චූදිත විසින් ඔහු සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන රැඳවුම් නියෝග කිසිවක් අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කිරීමක් කර නැති බව සාක්ෂිකරු පවසා ඇත. එසේම මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් ඔහු පවසා ඇත්තේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයෙක් පත් වී නොමැති අවස්ථාවක ලංකාවේ ජාතික ආරක්ෂාව

සම්බන්ධයෙන් සියලුම වගකීම් විධායක ජනාධිපතිවරයාට පැවරෙන බවයි. එසේම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව 13D1 සහ 13D2 ලෙස ලකුණු කරන ලද රැඳවුම් නියෝගවල රුවන් විජේවර්ධන යන නම ඇතුළත් වී ඇත්තේ කාර්යාල ප්‍රමාද දෝෂයකින් පසුව බවත් එම ලේඛන දෙකට පසුව ආ රැඳවුම් නියෝගයෙහි මෙම වැරැද්ද නිවැරදි කිරීමක් කර ඇති බවයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් සමස්තයක් ලෙස පෙනී යන කරුණක් වන්නේ 13 වන චූදිත ලෙස මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්සාෆ් යන අය ඔහුට අදාළ රැඳවුම් නියෝග වල දෝෂ සහගත තත්ත්වයක් තිබෙන බවට පෙන්වා දීමට උත්සාහ කර ඇතද එකී රැඳවුම් නියෝග කිසිදු අවස්ථාවක ඉහළ අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට කටයුතු කර නොමැති බවයි. 13 වන චූදිත වන මොහොමඩ් ඉෆ්තිකාර් මොහොමඩ් ඉන්සාෆ් විසින් විත්තිකූඩුවේ සිට කරන ලද දීර්ඝ ප්‍රකාශයේදී ද ඔහුට අදාළ 2019.04.24 දිනය සඳහන් කර ඇති රැඳවුම් නියෝගය නිකුත් කර ඇත්තේ තමාව අත්අඩංගුවට ගත් 2019.04.26 දිනට පෙර බවට වන අතර, කෙසේ වෙතත් මෙම අධිකරණයේ 13 වන චූදිත වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සාරාංග ප්‍රභාත් දිවුලගේ නැමැති ආරක්ෂක අමාත්‍යාංශයේ නීති නිලධාරියාගේ සාක්ෂියට අනුව එම රැඳවුම් නියෝගය 2019.04.30 දින ආරම්භ වී තිබෙන බවට පවසා සාක්ෂි ලබා දී ඇත. කෙසේ වුවත් 13 වන චූදිත හට මෙම නඩුව ආරම්භයේ සිටම නීතිඥ නියෝජනයක් තිබී ඇති පසුබිම සළකා බැලීමේදී අදාළ රැඳවුම් නියෝගය

අනීතික බවට කිසිදු අවස්ථාවක අභියෝගයට ලක් කිරීමක් කර නොමැති පසුබිම තුළ මෙම නඩුවේ විත්තියේ විභාගය අවස්ථාවේදී පමණක් එවැන්නක් සදහන් කර ඇති බව අප නිරීක්ෂණය කරමු.

13 වන චූදිත වෙනුවෙන් සාක්ෂිකරුවෙකු ලෙස මෙම අධිකරණයේ දමිළ භාෂණ පරිවර්තක දුලාලින් තුවාන් සදාම් සාක්ෂියට කැඳවා ඇති අතර, ඔහු 13 වන චූදිත වෙනුවෙන් සාක්ෂි දෙමින් B 15759/8/19 නඩු වාර්තාවේ 2020/10/20 දිනැති ජර්නල් සටහනේ ‘‘මුල් නඩු වාර්තාව සොයා ගැනීමට අපහසු බැවින් උප ගොනුවක් මඟින් කැඳවන ලදී’’ යන කොටස (13D(3) ලෙස සලකුණු කර ඇති අතර, 2021/03/22 දිනැති ජ්‍රනල් සටහනේ ‘‘සැකකරු කොන්දේ අමාරුවකින් පෙළෙන බව කියා සිටී’’ යනුවෙන් සදහන් සටහන (13D4) ලෙසත්, 2021/07/27 දිනැති සටහනේ නඩු වාර්තාවේ 40 පිටුවේ ‘‘ අදල රැඳවුම් නියෝගය ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අත්සන් තබා ඇති බවත්, ඒ වනවිට ආරක්ෂක ධූරයේ කටයුතු කර නොමැති බවත්, අදාළ රැඳවුම් නියෝගය නීත්‍යානුකූල නොවන බවට නීතිඥ නිසර චාමර මහතා කරුණු දක්වයි’’ යන කොටස (13D5) ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයෙකු වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බව දන්වා ඇති අතර පැමිණිල්ල වෙනුවෙන් ද හරස් ප්‍රශ්න නොමැති බව දන්වා ඇත.

මෙම සාක්ෂිය විශ්ලේශනය කර බැලීමේ දී පෙනී යන කරුණක් වන්නේ මෙම සාක්ෂිකරු මගින් ඉහත පරිදි මහෙස්ත්‍රාත්තුමාගේ අවධානයට ලක් කර ඇති 13 චූදිතගේ රැඳවුම් නියෝගය සම්බන්ධයෙන් ම 13 චූදිත වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද සාරාංග ප්‍රභාත් දිවුලගේ නැමැති ආරක්ෂක අමාත්‍යාංශයේ නීති නිලධාරියාගේ සාක්ෂියේ ද කරුණු විමසා ඇති බවය. 13 චූදිත වෙනුවෙන් වෙනත් සාක්ෂි කැඳවීමක් කර නැත.

<u>11 චූදිතගේ විත්තියේ විභාගය</u>

11 චූදිත වෙනුවෙන් වෛද්‍ය සට්ටම්බිරාලලාගේ විනෝෂ් පෙරේරා යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් ඔහු කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවය කරන බව පවසා 11 වන චූදිත හුසෙනුල් රිස්වි කාලිද් සමීර් යන අයව 2019 අප්‍රේල් මස 30 වන දින ත්‍රස්ත විමර්ශන ඒකකය (TID) විසින් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද බවත් තමා ඔහුව පරීක්ෂා කළ බවත් පවසා ඔහුට අදාළ අංක 22/2019 දරන අධිකරණ වෛද්‍ය පෝරමය 11D(4) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර ඔහුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව 11D-5 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත.

එම සැකකරු ලබා දුන් රෝග ඉතිහාසයට අනුව 2019 අප්‍රේල් 28 වන දින මාලිගාවත්ත ප්‍රදේශයේදී හමුදාව විසින් අත්අඩංගුවට ගත් බවත්, එම අවස්ථාවේදී තුවාල සිදු වූ බවත් කෙටි ඉතිහාසයේ සඳහන් වන බවත්

තම ඔහුව පරීක්ෂා කර බැලීමේ දී සැකකරුගේ වම් සහ දකුණු අත්වල ඉහළ ප්‍රදේශයේ දින 3ක් පමණ පැරණි සුළු තැලීම් තුවාල නිරීක්ෂණය කළ බවත් පවසා ඇත.

මෙම සාක්ශිකරුව පැමිණිල්ලෙන් හරස් ප්‍රශ්න වලට ලක් කර ඇති අතර

වෛද්‍ය වාර්තාවේ තුවාල සිදු වූ ආකාරය ‘‘රබර් පොල්ලකින් පහරදීම’’ ලෙස තමා විසින් සටහන් කර ඇත ද එලෙස සැකකරු විසින් ලබා දුන් බව කෙටි ඉතිහාසයේ සඳහන් කර නැතත්, තුවාල නිරීක්ෂණය කිරීමෙන් පසු එය රබර් පටියකින්/පොල්ලකින් පහරදීමක් බව තමන් නිගමනය කර එසෙස සඳහන් කල බවත් වෛද්‍යවරයා සඳහන් කර ඇත.

කෙසේ වුවත් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ සඳහන් කර නොමැති එවැනි කරුණු වෛද්‍යවාර්තාවේ තමා විසින් සඳහන් කර ඇති බව සාක්ෂිකරු පිළිගෙන ඇති අතර සැකකරු ඔහුටිව ඉදිරිපත් කල ත්‍රස්ත මර්ධන හා විමර්ෂන කොට්ටාෂයෙන් ඔහුට පහර දුන් බවට කිසිවක් සඳහන් කර නැති බවත් එසේම ඔහුගේ අත් දෙකට පහර දීමක් සම්බන්ධයෙන් කෙටි ඉතිහාසයේ කිසිදු තැනක සඳහනක් නොමැති බව සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂියට අනුව 11 වුදිතව මෙම වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර ඇත්තේ 2019-4-30 දින බව පෙනී යන අතර එම අවස්ථාව වන විට ඔහුගේ අත්වල සුළු තුවාල නිරීක්ෂණය කිරීමක් කර ඇත.

මෙම 11 වූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ තමාව අත් අඩංගුවට ගත් දිනයේ රාත්‍රියේ තමාට හොදටම ගැහුව බව ට වන අතර *“ එදා රෑ හොදටම මට ගැහුවා. මට වැදුන පාරවල් කොහොමද කියලා මාව පලවෙනි වතාවට අධිකරණ වෛද්‍ය වරයට ඉදිරිපත් කරනකොට ඒ අධිකරණ වෛද්‍යවරයා ඔක්කොම ටික මාක් කර ගත්තා, කොච්චර කොච්චරද? කොත කොතනද? තුවාල තියෙන්නේ කියලා” යනුවෙන් වන අතර(2026-8-19 ප.ව.5.30 සටහන් පිටු අංක 4)*

කෙසේ වුවත් 11 වූදිතව 2019 අප්‍රේල් මස 30 වන දින ඔහුට අදාළ අංක 22/2019 දරන අධිකරණ වෛද්‍ය පෝරමය (11D(4)) ප්‍රකාරව පරීක්ෂාවට ලක් කර ඇති වෛද්‍යවරයා, එනම් 11 වූදිතව අත් අඩංගුවට ගැනීමෙන් පසුව පරතම වතාවට පරීක්ෂා කර ආඇති වෛද්‍යවරයා වන ඉහත කී වෛද්‍ය සට්ටම්බිරාලලාගේ විනෝෂ් පෙරේරා යන සාක්ෂිකරු ගේ සාක්ෂියට අනුව ඔහු නිරීක්ෂනය කර ඇත්තේ වම් සහ දකුණු අත්වල ඉහල ප්‍රදේශයේ සුළු තැලීම් තුවාල බවට පෙනී යන අතර ඒ අනුව 11 වූදිත පවසන අකාරයේ බරපතල ලෙස පහරදීමකට ලක් වූ බවට ඔහුට අදාළව 11D-5 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් කිසිසේත් අපහට පෙනී යන්නේ නැත. එසේම ඉහත කී වෛද්‍ය වරයාගේ සාක්ෂියෙන් ද අපහට පෙනී යන්නේ නැත.

11 වන වූදිත වන හුසේයිනුල් රිස්වි කාලිද් සමීර් වෙනුවෙන් මෙම අධිකරණයේ භාෂණ පරිවර්තක තුවාන් සදාම් මහතා සාක්ෂියට කැඳවමින්

ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ බී **917/2/19** නඩුවේ 2019.07.31 දිනැති වැඩිදුර වාර්තාව **11D6** ලෙසද 2019.08.07 දිනැති වැඩිදුර වාර්තාව **11D7** ලෙසද ලකුණු කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් සියලුම චූදිතයින් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දී ඇති අතර, පැමිණිල්ල වෙනුවෙන්ද හරස් ප්‍රශ්න නොමැති බවට දැනුම් දී ඇත. එම සාක්ෂිකරුගේ සාක්ෂිය අවසන් කර 11 වන චූදිත වෙනුවෙන් සාක්ෂි කැඳවීම අවසන් කරන ලදී. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේදී ලකුණු කරන ලද ඉහත කී වැඩිදුර වාර්තාවන් වල අන්තර්ගතයේ අඩංගු කිසිදු කරුණක් සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු මගින් කිසිදු සාක්ෂියක් මෙහෙයවීමට 11 වන චූදිත කටයුතු කර නොමැති බව පෙනී යයි.

12 වන චූදිත වෙනුවෙන්ද මෙම අධිකරණයේ දමිල භාෂණ පරිවර්තක තුවාන් සදාම් මහතාව සාක්ෂියට කැඳවා ඇති අතර, ඔහු මගින් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ **917/2/19** නඩුවේ 65 වන පිටුවේ අඩංගු 2019.08.07 දිනැති වැඩිදුර වාර්තාව **12D-16** ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, 2019.07 වන මාසයේ ඉදිරිපත් කර ඇති වැඩිදුර වාර්තාව **12D-17** ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එසේම මෙම සාක්ෂිකරු මගින් B **15764/8/19** යන මුල් නඩු වාර්තාවෙහි 46 වන පිටුවෙහි අඩංගු කාර්ය සටහනෙහි ‘‘සැකකරුගේ ප්‍රකාශය කියවා නොදුන් බවත්, එයට තමා අත්සන් කළ බවත් දන්වා සිටියි’’ යනුවෙන් විනිසුරුතුමා විසින් තමා ඇති කාර්ය සටහන් කොටස **12D-18** ලෙස ලකුණු කර

ඉදිරිපත් කර ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන්ද සියලුම චූදිතයින් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොමැති බවට දැනුම් දෙන ලද අතර, පැමිණිල්ල වෙනුවෙන්ද හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කර නැත. ඒ අනුව 12 වන චූදිත වෙනුවෙන් විත්තියේ විභාගය අවසන් කර ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් 12D-18 ලෙස සඳහන් කර ඇති විනිසුරුතුමා විසින් තබා ඇති කාර්ය සටහනට අනුව ‘‘සැකකරුගේ ප්‍රකාශය කියවා නොදුන් බවත්, එයට තමා අත්සන් කළ බවත් දන්වා සිටියි’’ යනුවෙන් සඳහන් කර ඇති කරුණ අප විසින් සැළකිල්ලට ගන්නා ලද අතර, මෙම නඩුවෙහි 12 වන චූදිත විසින් සහකාර පොලිස් අධිකාරී බිම්ෂානි ජාසිං ආරච්චි යන අයට ලබා දී ඇති පාපෝච්ඡාරණමය ස්වභාවයේ ප්‍රකාශය ශක්‍යතා පරීක්ෂණයකින් පසුව පැ.919 ලෙස ලකුණු කිරීමට අප විසින් ඉඩ ලබා දී ඇති අතර, එකී නියෝගය සකස් කිරීමේදී ඉහත පරිදි 12D-18 ලෙස ලකුණු කරන ලද කාර්ය සටහන ද මේ වන විටත් අපගේ සැළකිල්ලට ගෙන ඇත.

4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා වෙනුවෙන් කැදවන ලද විත්තියේ සාක්ෂි.

මෙම නඩුවෙහි 4 වන චූදිත වන මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා වෙනුවෙන් ද මෙම අධිකරණයේ දමිල භාෂණ පරිවර්තක තුවාන්

සදාම් මහතාව සාක්ෂියට කැඳවා පෙර අවස්ථාවක පැමිණිල්ලෙන් පැ. 909 ලෙස ලකුණු කර ඇති ලේඛනයේ 03 වන පිටුවේ අඩංගු ‘‘මෙම ජිහාද් වලට යන මුජාදීන්වරුන්ව බ්‍රේන් වොෂ් කරනවා යැයි කියන්නේ, මේක අමූලික බොරුවක්. මේක අමූලික චෝදනාවක්. සියලුම විෂයන්ට බ්‍රේන් වොෂ් කළ හැකියි. නමුත් ජිහාද් වෙනුවෙන් බ්‍රේන් වොෂ් කළ නොහැකි මක්නිසාද සුරතුල් තවුපාගේ දෙවන කොටසේ අල්හා දෙවියන් බාධකයන් 08 යන කොටස 4D(3) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. රෝගී සටහන් වන ආසිරි සෙන්ට්‍රල් රෝහලේ බිල්පතක් 4D-4 ලෙස ලකුණු කර ඇති අතර, 2018 නොවැම්බර් 30 දිනැති එම බිල්පතෙහි වෛද්‍යවරයාගේ නම ලෙස වෛද්‍ය කපිල බන්දුතිලක ලෙස සඳහන් වී ඇති බවත්, නවලෝක රෝහලට එයත් එම ලේඛනයෙහි රෝගියාගේ නම යන ස්ථානයෙහි Mrs. ෂාහිඩ් යැයි සඳහන් වී ඇති බවත්, සඳහන් කර ඇති අතර, මෙම සාක්ෂිකරු මගින් නවලෝක රෝහලට අයත් 2018.11.25 දිනැති ලේඛනයක් 4D-5 ලෙස ලකුණු කර ඇති අතර, එසේම තවත් 2018.12.19 දිනැති එවැනිම ලේඛනයක් 4D-6 ලෙස සඳහන් කර ඉදිරිපත් කර ඇත. එසේම එම 4D6 ලේඛනයෙහි දිනය 2018.12.19 ලෙස සඳහන් වී ඇති බවත්, එම ලේඛනයේද රෝගියාගේ නම යන කොටසෙහි Mrs. ෂාහිඩ් යනුවෙන් සඳහන් කර එම නමත් සමඟ දුරකථන අංක 076-4024994 ලෙස සඳහන් කර ඇති බවත් පවසා ඇත. සාක්ෂිකරුට 2018.11.19 දිනැති එවැනිම තවත් ලේඛනයක් පෙන්වා එය 4D-7 ලෙස ලකුණු කර ඉදිරිපත්

කර ඇති අතර, එසේම Vision Care ආයතනයට අදාළ 2018.11.21 දිනැති **4D-8** ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර, එහිද රෝගියාගේ නම ලෙසට Mrs. ෂාහිඩ් ලෙසට සඳහන් කර ඇති බවට මූලික සාක්ෂියේදී 04 වන චූදිත විසින් සාක්ෂිකරු මඟින් අධිකරණයට පෙන්වා දී ඇත.

මෙම සාක්ෂිකරුගෙන් අනිකුත් සියලුම චූදිතයින් හරස් ප්‍රශ්න කිසිවක් නොමැති බවට පවසා ඇති අතර, පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ සජිත් බණ්ඩාර මහතා පමණක් හරස් ප්‍රශ්න අසා ඇත. හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ 4D-4, 4D-6, 4D-7 ලෙස ලකුණු කර ඇති ලේඛන සියල්ලෙහිම සඳහන් කර ඇත්තේ එකම දුරකථන අංකය බවත් එසේම 4D-4, 4D-5, 4D-6, 4D-7 සහ 4D-8 යන ලේඛන සියල්ලටම ඒවා වල අඩංගු දත්ත ඇතුළත් කිරීමට අදාළ තොරතුරු ලබා දුන්නේ කවුද යන්න දැනුවත්කමක් නැති බවත් සාක්ෂිකරු පවසා ඇති අතර, එසේම පැ.909 ලේඛනයේ 03 වන පිටුවේ 4D-3, ලෙස ලකුණු කරන ලද වාක්‍ය ඛණ්ඩය සමඟම තිබෙන ඡේදය අවසානයේ " අප ජිහාද් කරන්න ඇයි කරන්න ඕනෑ ? ජිහාද් නොකර හිටියොත් මොකද ? ජිහාද් ඇයි කරන්න ඕනෑ ? අල්ලාහ් දෙවියන් කියා සිටිනවා. ඒ නිසා කරන්න ඕනෑ." යන කොටස පැමිණිල්ලෙන් පැ.909 (x) යනුවෙන් ලකුණු කර ඇති අතර, 4 වන චූදිත මොහොමද් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් නැවත ප්‍රශ්න ඇසීමක්ද සිදු කර ඇති අතර, 4D-4 ලෙස ලකුණු කර ඇති බිල්පත්‍රයේ ඔපරේටර් යන ස්ථානයේ මංගලිකා යනුවෙන් නමක් සඳහන් වී

තිබෙන බවත්, 4D-5 ලේඛනයෙහි User යන ස්ථානයේ N.M.C 1521 ලෙස සඳහන් වන බවක් 4D-6 ලේඛනයේ Receptionist යන ස්ථානයෙහි N.M.C 3897 යනුවෙන්ද 4D-7 ලේඛනයේ එලෙසම N.M.C 2059 යනුවෙන්ද 4D-8 ලේඛනයේ එම ලේඛනය ලබා දුන් පුද්ගලයාගේ නම ලෙසට උඩකඩගේ සංජීවනි වත්සලා යනුවෙන් නමක් සඳහන් වී තිබෙන බවට එම ලේඛනය ආශ්‍රයෙන් සාක්ෂිකරු පවසා ඇත.

භාෂණ පරිවර්තකගේ සාක්ෂියත් සමඟ 04 වන චූදිතට අදාළ චිත්තියේ විභාගය අවසන් කර ඇති අතර, එම සාක්ෂියත් සමඟ සමස්ත නඩුවේ චිත්තියේ විභාගය අවසන් වී ඇත.

04 වන චූදිත වෙනුවෙන් ඔහුගේ සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂි අංක 06 ලෙස සඳහන් කරන ලද පොලිස් කොස්තාපල් 76735 කපිල බණ්ඩාර ධනපාල යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ඔහු 2018 වසරේ නුවරඑළිය පොලිස් ස්ථානයේ සේවය කල බවත් පැමිණිල්ලක් මත ශාන්තිපුර ප්‍රදේශයේ පිහිටි නිවසක් පරීක්ෂාව සඳහා පොලිස් පරීක්ෂක ඉන්ද්‍රරත්න සමඟ ගොස් එම නිවස සහ එම අවස්තාවේ එම නිවසේ සිටි පුද්ගලයින් ව පරීක්ෂා කල බවත් එම අවස්තාවේ ඔවුන් සන්තකයේ තිබී සැකකටයුතාව් කිසිවක් බාරයට ගත්තේ නැති බවත් තමාලා එම නිවස පරීක්ෂා කලේ නීති මත්ද්‍රව්‍ය තෙබේ දැයි පරීක්ෂා කිරීමට බවත් පවසා ඇත.

කෙසේ වුවත් මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට ලක් වෙමින් පවසා ඇත්තේ තමාලා සිදුකලේ සාමාන්‍ය පරික්ෂණයක් පමණක් බවත් ඒ සම්බන්ධයෙන් කිසිදු සටහනක් යෙදීමක් තමා කලේ නැති බවය.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේශනය කර බැලීමේ දී අපහට පෙනී යන්නේ එම නිවසේ සිට ඇති පිරිසේ හැසිරීම සැක සහිත බවට පෙනී ගිය බවට අප විසින් මනාව සැලකිල්ලට ගත් අතර

19 වූදිතට අදාළ සාක්ෂි

කච්චි මොහොමදු මොහොමදු අජ්මීර් යන සාක්ෂිකරු කාත්තන්කුඩි පදිංචි ව්‍යාපාරිකයෙකු වන අතර 19 වන වූදිත (කච්චි මොහොමදු මොහොමදු ජෙම්සිත්) ගේ සහෝදරයා වන අතර ඔහු වෙනුවෙන් සාක්ෂි දුන්නේය. 19 වන වූදිත අත්අඩංගුවට පත්වීමට පෙර "JN Pure Gold and Silver Workshop" නමින් රන් ඔපදැමීමේ ව්‍යාපාරයක් කළ බවත්, ඒ සඳහා කාත්තන්කුඩි නගර සභාවෙන් නිකුත් කළ 2018.05.10 දිනැති වෙළඳ බලපත්‍රය (19D1) හඳුනාගෙන ලකුණු කළේය. මෙම බලපත්‍රය 2018 දෙසැම්බර් 31 වන දින දක්වා වලංගුව තිබූ බව පැවසීය. තමන් 2018 වර්ෂයේ මාස දෙකක් පමණ මෙම ව්‍යාපාරයේ වැඩ කළ බවත්, එහිදී රන් උණු කිරීම සඳහා මාසයකට නයිට්‍රික් ඇසිඩ් කිලෝ 35 කෑන් 10 සිට 15 දක්වාත්, සල්ෆියුරික් ඇසිඩ් කිලෝ 35 කෑන් 5ක් පමණත් භාවිතා කළ බවත්, ඒවා කොළඹින් ජෙම්සිත් විසින් මිලදී ගෙන ලොරි රථ මඟින්

කඩයට ගෙන්වා ගත් බවත් පැවසීය. සහරාන් සහ රිල්වාන් යන අය තම ගමේ පදිංචිව සිටි අය ලෙස තමන් හඳුනන නමුත්, ඔවුන් සමඟ කතා කර නොමැති බවත්, සහරාන් සහ රිල්වාන් සමඟ තම සහෝදරයාට තිබූ සම්බන්ධය පිළිබඳව තමන් නොදන්නා බවත් පැවසීය. තවද, සහරාන් කාත්තන්කුඩියේ පල්ලියක් (NTJ පල්ලිය) පවත්වාගෙන ගිය බව දන්නා නමුත්, තවුහිද් ජමාත් යනු කුමක්දැයි තමන් නොදන්නා බව ප්‍රකාශ කළේය. එම ව්‍යාපාරයෙන් මසකට රුපියල් ලක්ෂ 5කට නොඅඩු ආදායමක් ලැබුණු බවද සඳහන් කළේය.

<u>විශ්ලේෂනය</u>

මෙම කච්චි මොහොමදු මොහොමදු අජ්මීර් යන සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්ලේෂනය කර බැලීමේ දී මනාව පෙනී යන්නේ 19 වූදිත වෙනුවෙන් මෙම සාක්ෂිකරු මගින් ලකුණු කරන ලද වි. 19D1 වෙළඳ බලපත්‍රය ප්‍රකාරව 19 වන වූදිතගේ රන් ඔපදැමීමේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය බවට පැහැදිලි කිරීමට උත්සාහ කර ඇත. ඒඑම එම ව්‍යාපාරයේදී රන් උණු කිරීම සඳහා විශාල වශයෙන් නයිට්‍රික් ඇසිඩ් (කිලෝ 35 කෑන් 10-15) සහ සල්ෆියුරික් ඇසිඩ් (කෑන් 5ක් පමණ) භාවිත වූ බව ඔහු ප්‍රකාශ කර ආත .කෙසේ වුවත් මෙහි දි වැදගත් වන්නේ 19 වූදිත ජෙම්සිත් විසින් වූදිතයා සතුව තිබූ හෝ ඔහු මිලදී ගත් රසායනික ද්‍රව්‍ය පුපුරණ ද්‍රව්‍ය සෑදීමට නොව, ඔහු පාත්වාගෙන ගිය නීත්‍යානුකූල ව්‍යාපාරික කටයුත්තක් සඳහා භාවිත

කළ ඒවා බව සනාථ කිරීමට කරුණු ඉදිරිපත් වී තිබේද? යන්න සළකා බැලීම වේ. කෙසේ වෙතත්, 19D1 වෙළඳ බලපත්‍රය මනාව අපරික්ෂා කර බැලීමේ දී එය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන බව මනාව පැහැදිලි වේ. 19 වූදිත හෝ ඔහුගේ සහෝදරයා වන මෙම සාක්ෂිකරු විසින් එම බලපත්‍රය අළුත් කර ගත් බවට කිසිදු සාක්ශියක් ඉදිරිපත් වී නැත. මෙම අන්ඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ශි අනුව 19 වූදිත විසින් රාසායන ද්‍රව්‍ය මිලදී ගෙන ඇත්තේ 2019 වසරේ මාර්තු මස 01 දින වන අතර 19 වන විත්තිකරු 2019 මාර්තු 01 වන දින සල්ෆියුරික් ඇසිඩ් කිලෝ 40 බූලි තුනක් සහ නයිට්‍රික් ඇසිඩ් කිලෝ 35 බූලි දෙකක් මිලදී ගෙන ඇති බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා 835 සුබ්‍රමනියම් සිවකුමාර් යන සාක්ෂිකෞර්ගේ සාක්ෂියෙන් හෙලිවන අතර ඒ බව පැ.903 බිල්පතෙන් මනාව තහවුරු වී ඇත. 2019-3-1 දින, වෙළෙඳුන් තිදෙනෙකුගෙන් (PW 835, PW 1298, PW 1331) මෙම ගෙන තිබුණි1 දින ස්වර්ණාභරණ වෙළඳාමට යැයි පවසමින් නයිට්‍රික් සහ සල්ෆියුරික් ඇසිඩ් මිලදී ගෙන ඇති අතර, එම ඇසිඩ් සෙන්නල් ග්‍රාමය ආරක්ෂිත නිවසින් හමු වී ඇත. ඒවා මිලදී ගෙන ඇත්තේ 2019-3-1 දිනවල බැවින් එම අවස්ථාව වනවිට ඔහුට නීත්‍යානුකූල වලංගු බලපත්‍රයක් හෝ තිබී නැති බව මනාව පෙනී යයි. තව ද මෙම විත්තියේ සාක්ෂිකරු ගේ සාක්ෂිය අනුව ඔහු එම ස්ථානයේ වැඩ කර ඇත්තේ 2018 දී මාස දෙකක් පමණක් බවට පවසා ඇති පසුබිම තුල සහ ස්වයංසාතක බෝම්බකරුවෙකු වන සහරාන්

නැමත්තා ඔහුගේ නිවසට යාබදව පදිංචිව සිටියදීත් ඔහු සමඟ කිසිදු කතාබහක් නොතිබූ බව පවසා තිබීම ද විස්වාසනීයත්වයෙන් තොර, වියහැකිභවයෙන් තොර කරුණක් බව මනාව පෙනී යයි.

පොලිස් කොස්තාපල් ධනපාල මුදියන්සේලාගේ කපිල බණ්ඩාර ධනපාල යන සාක්ෂිකරු ඇල්ල පොලිස් ස්ථානයේ පොලිස් කොස්තාපල් 76735 වන අතර 4 වන චූදිත (මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා) වෙනුවෙන් සාක්ෂි දුන්නේය. 2018.05.08 වන දින ඔහු නුවරඑළිය පොලිසියේ සේවය කරන කාලයේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක ඉන්ද්‍රජිත් මහතා ඇතුළු තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමඟ නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ මහල් දෙකකින් යුත් නවාතැන්පළක් පරීක්ෂා කිරීමට ගිය බව පැවසීය. එම ස්ථානයේ සැකකටයුතු විෂ මත්ද්‍රව්‍ය තිබේදැයි විනාඩි 15ක් පමණ ඇතුළත පරීක්ෂා කළ නමුත් කිසිදු නීතිවිරෝධී ද්‍රව්‍යයක් හමුනොවූ බවත්, කිසිවකු අත්අඩංගුවට නොගත් බවත් ප්‍රකාශ කළේය. එහි සිටි පිරිමි පුද්ගලයන් 15 දෙනෙකු පමණ සාමාන්‍ය ඇඳුමින් සිටි අතර ඔවුන් මුස්ලිම් ජාතිකයන් සේ පෙනුණු බවත්, එම ස්ථානයේ අවි පුහුණුවක් ලබාදෙන කිසිදු සලකුණක් නිරීක්ෂණය නොවූ බවත් පැවසීය. හරස් ප්‍රශ්නවලදී ඔහු පැවසුවේ, තමන් සහ අනෙක් නිලධාරියා නිවස ඇතුළත පරීක්ෂා කරන විට ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා එහි සිටි අය සමඟ කතාබස් කරමින් සිටි බවත්, ඔවුන් කතා කළ දේ තමන් නොදන්නා බවත්,

එම නිවසෙන් පිටත කිසිවක් පරීක්ෂා කිරීමට තමන්ට අවස්ථාව නොලැබුණු බවත්ය.

දෙපාර්ශවයේ ලිඛිත දේශනවල අඩංගු කරුණු සැළකිල්ලට ගැනීම

මෙම නඩුවෙහි 01 වූදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොමදු නවුෆර් නීතිඥ සහාය ලබා නොගෙන ඔහු වෙනුවෙන් ඔහු විසින්ම පෙනී සිටිමින් මෙම නඩු විභාගයට සහභාගී වූ අතර, කෙසේ වුවද මෙම නඩුවේ විභාගය අවසානයේ නීතිඥ මයුරන් මහලිංගම් මහතා විසින් පිටු 13 කින් යුත් ලිඛිත දේශනයක් ගොනු කරන ලද අතර, x1 ලෙස විනිශ්චිත ඉන්දියානු අධිකරණ තීන්දු ගණනාවක් අමුණා ඉදිරිපත් කර ඇති අතර, ඒවා අපගේ අවධානයට ලක් කරන ලදී. ඒ අතුරින් රජීව් ගාන්ධි ඝාතනයට අදාළව ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දී ඇති තීන්දුව උපුටා දක්වමින් සඳහන් කර ඇත්තේ, මෙම නඩුවෙහි 01 වූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති කිසිදු චෝදනාවක් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවත්, ඉදිරිපත් වී ඇති සාක්ෂි මඟින් 01 වූදිත අධිචෝදනාපත්‍රයේ සඳහන් ප්‍රධානම චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවට සම්බන්ධ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවට සඳහන් කර ඇත. එසේම ඔහුට එරෙහිව ඉදිරිපත් එක් නඩු භාණ්ඩයක් හෝ ඉදිරිපත් කර නොමැති බවත්, ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති එකම සාක්ෂිකරු

වන පැ. සා. 1400 අනස් යන අයගේ සාක්ෂිය විශ්වාසනීය නොවන බවට පවසා එසේම 01 වූදිත විසින් සිදු කර ඇති විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මඟින් පැමිණිල්ලේ නඩුව කෙරෙහි සාධාරණ සැකයක් මතු කර ඇති බවට පවසමින් 01 වූදිතව ඔහුට එරෙහිව ඇති සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙසට ඉල්ලීමක් කර ඇත. 01 වූදිත විසින් මෙම ලිඛිත දේශනයෙහි පිටු අංක 02 හි සඳහන් කර ඇත්තේ, කුමන්ත්‍රණය නැමැති වරදට 01 වූදිතගේ සම්බන්ධතාවයක් තිබූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවත්, අදාළ අපරාධයන් සිදු කර ඇත්තේ සහරාන් විසින් වන බවත්, 01 වූදිත හුදෙක් සහරාන් නැමැත්තාව ඇසුරු කර තිබීම සහ ඔහුත් සමඟ වැඩ කර තිබීම තුළින් පමණක් 01 වූදිත ඔහු සමග කුමන්ත්‍රණය කල බවට තීරණය කල නොහැකි බවට 01 වූදිත කරුණු දක්වා ඇත. මෙම නඩුවෙහි පැ. සා. 2233 අස්මියා නැමැති සාක්ෂිකාරිය ලබා දුන් සාක්ෂිය උපුටා දක්වමින් ඇගේ සාක්ෂියට අනුව 01 වූදිත පාලමුන ප්‍රදේශයේදී කාන්තාවන් සඳහා පැවැති වැඩමුළුවක සිදු කරන ලද දේශනයේදී හුදෙක් ඉස්ලාම් ධර්මයේ අකීදා ලෙස හඳුන්වන සෑම මුස්ලිම්වරයෙකුම අනිවාර්යයෙන් අනුගමනය කළ යුතු කාරණා සම්බන්ධයෙන් දැනුවත් කිරීම පමණක් බවට පෙන්වා දී ඇත. 01 වූදිත විසින් මෙම නඩුවෙහි පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගේ සහ පැ. සා. 2233 අස්මියා යන සාක්ෂිකාරියගේ සාක්ෂිවලින් උපුටා ගත් කරුණු කීපයක් පමණක් පෙන්වා දෙමින් ඒවා සැළකිල්ලට ගෙන 01 වූදිතට

එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවට තීරණය කරන ලෙසයි. ඉහත කී අනස් නැමැති සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය සහ අස්මියා නැමැති සාක්ෂිකාරිය ලබා දුන් සාක්ෂිය අප විසින් වෙන් වෙන්ව ඇගයීමට ලක් කර ඇත. ඔවුන්ගේ සාක්ෂි වලින් යම් එක් කරුණක් පමණක් හුදෙකලාව ගෙන සළකා බැලිය නොහැකි අතර, සමස්ථයක් ලෙස ගෙන ඔවුන්ගේ සාක්ෂි අප විසින් සැළකිල්ලට ගන්නා ලදී. අස්මියා නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියේදී 01 චූදිතට එරෙහිව ප්‍රබල ලෙස කරුණු ඉදිරිපත් වී නොමැති වුවද සැබැවින්ම 01 චූදිත පාලමුන ප්‍රදේශයේ දේශනයක් පැවැත්වූ බවට ඇගේ සාක්ෂියෙන් සනාථ වී ඇත. පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මෙම 01 චූදිතට එරෙහිව ප්‍රබල සාක්ෂි ගණනාවක් ඉදිරිපත් වී ඇති අතර. එකී සාක්ෂි අප විසින් මෙම තීන්දුවේ ඉහත අවස්ථාවක වෙන්වෙන්ව සළකා බලා ඇත. එම අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියේදී සඳහන් කරන ලද කරුණු මඟින් 01 චූදිතට එරෙහිව කවරාකාරයේ සාක්ෂි ඉදිරිපත් වී තිබේද යන්න අප විසින් මෙම තීන්දුවේදී පුළුල්ව විශ්ලේෂණයට ලක් කරමින් ඔහුගේ සාක්ෂි විශ්වාසනීය සාක්ෂියක් බවට හේතු සහිතව නිගමනය කර ඇත. ඒ අනුව 01 චූදිතගේ ලිඛිත දේශනයේ සඳහන් කරුණු මගින් පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන සාක්ෂි විශ්වාසනීයත්වයෙන් තොර බවට කිසිසේත් නිගමනය කළ නොහැකි බවට අප තීරණය කරමු. 01 චූදිත වෙනුවෙන් x1 ලෙස ලකුණු කර ඉදිරිපත් ඇති ඉන්දියානු අධිකරණ තීන්දුවේ සඳහන් නෛතික කරුණු

සහ අප ඉදිරියේ විභාග වූ මෙම නඩුවේ සඳහන් නෛතික කරුණු එක හා සමාන නොවන අතර, ඉදිරිපත් වී ඇති සාක්ෂිද එක හා සමාන නොවන අතර, ඒ අනුව එකී අධිකරණ තීන්දුව මෙම නඩුව විනිශ්චය සඳහා අදාළ නොවන බවට අප තීරණය කරමු.

මෙම නඩුවෙහි 02 වූදිත වන මොහොමඩ් ශරීෆ් ආදම් ලෙබ්බේ වෙනුවෙන් පිටු 30 ක ලිඛිත දේශනයක් නීතිඥ විමුක්ති රාජපක්ෂ මහතා විසින් ගොනු කර ඇති අතර, 02 වූදිත වෙනුවෙන්ද තර්ක කර ඇත්තේ අධිචෝදනාපත්‍රයේ සඳහන් ප්‍රධානම චෝදනාව කුමන්ත්‍රණය නැමැති 01 වන චෝදනාවෙහි කාලපරාසය වසරකුත් මාස 05 ක් සහ දින 21 ක කාලයක් දක්වා දිවෙන බැවින් සහ එහි සඳහන් වරද සිදු කරන ලද ස්ථාන 15 ක් සඳහන් කර ඇති පසුබිම තුළ එකී චෝදනාව අවිනිශ්චිත චෝදනාවක් බවත්, ඒ අනුව එම චෝදනාව මගින් වූදිත නොමඟ යාමකට ලක් වී ඇති බවත්ය. 02 වූදිත විසින් ඔහුට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන් 10 දෙනෙකුගේ සාක්ෂි සාරාංශ ගත කර ඉදිරිපත් කරමින් එම සාක්ෂි මගින් මෙම 02 වූදිතට එරෙහිව සාපරාධී වගකීමක් පැවරීමට තරම් සාක්ෂි ඉදිරිපත් වී නොමැති බවට තර්ක කර ඇත. එසේම එකී සාක්ෂි එකිනෙකට පරස්පර බවට සඳහන් කර ඇත. පැ. සා. 2233 අස්මියා නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියට අනුව මෙම 02 වන වූදිත පාලමුනේහි යම් ස්ථානයක ආගමික දේශනයක් පැවැත්වුනු ස්ථානයකට ගොස් සිටීම සම්බන්ධයෙන් ලබා දුන් සාක්ෂි පරස්පර බවයි. තවද මෙම 02 වූදිතව

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකදී හඳුනා ගැනීමට අදාළව පැ. සා. 1420 ලක්ෂිකා දුලංජලී නැමැති සාක්ෂිකාරිය හට විවෘත අධිකරණයේදී 01 වූදිතව හඳුනා ගැනීමට නොහැකි වූ කරුණ පෙන්වා දෙමින් ඇයගේ සාක්ෂිය 02 වූදිතට එරෙහිව සළකා බැලීම නොකළ යුතු බවට සඳහන් කර ඇත. මෙම නඩුවෙහි 02 වූදිතට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සමස්ථ සාක්ෂි අප විසින් මෙම තීන්දුවේ ඉහත අවස්ථා වල වෙන් වෙන්ව විශ්ලේෂණය කර සළකා බලා ඇති අතර, එකී සාක්ෂිවලට කුමන සාක්ෂිමය වටිනාකමක් ලබා දිය යුතුද යන්න සම්බන්ධයෙන් අප විසින් හේතු සහිතව සඳහන් කර ඇත. 02 වූදිතගේ ලිඛිත දේශනයෙහි සඳහන් කර ඇති විනිශ්චිත අධිකරණ තීන්දු කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලද අතර, විශේෂයෙන් කුමන්ත්‍රණය නැමැති වරද සම්බන්ධයෙන් කරුණු දක්වමින් 02 වූදිතගේ ලිඛිත දේශනයෙහි 23, 24, 25 පිටුවල සඳහන් කරුණු සම්බන්ධයෙන් මෙම නඩුවෙහි පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සමස්ථ සාක්ෂි එක්ව ගෙන සළකා බැලිය යුතු අතර, එලෙස 02 වූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති සමස්ථ සාක්ෂි අප විසින් මේ වන විටත් මෙම තීන්දුවෙයහි ඉහත අවස්ථාවලදී පුළුල් ලෙස විශ්ලේෂණය කර ඇති අතර, අප විසින් එම සාක්ෂිවල සාක්ෂිමය වටිනාකම මෙම තීන්දුවේ පෙර අවස්ථාවක සඳහන් කර ඇති පරිදි එක් එක් වූදිතට අදාළ සාක්ෂි වෙන්වෙන්ම සළකා බැලීමේදී විස්තරාත්මකව සඳහන් කර පෙන්වා දී ඇති හේතූන් ප්‍රකාරව 02 වූදිතගේ

ලිඛිත දේශනයෙහි සඳහන් කර ඇති කරුණු මඟින් එම සාක්ෂි වල විශ්වසනීයභාවය පිළිබඳව සැකසහිත බවක් අපහට පෙනී යන්නේ නැත.

මෙම නඩුවෙහි 3 වූදිත වන භයාතු මොහොමඩ් අහමඩ් මිල්හාන් විසින් ද පිටු 55ක ලිඛිත දේශනයක් ගොනු කර ඇත. ඔහු එම ලිඛිත දේශනයේදී ප්‍රධාන වශයෙන් තර්ක කර සිටින්නේ එම නඩුවෙහි පැමිණිල්ලෙන් පවසා සිටින පරිදි අබුසිලා නොහොත් මිල්හාන් යන අය තමා නොවන බවයි. මෙම නඩුවේ සාක්ෂි ලබාදුන් පෑසා 1400 විසින් සඳහන් කරන ලද පරිදි ඔහුගේ සාක්ෂියේදී සඳහන් කරන ලද අබුසිලා නොහොත් මිල්හාන් යන අය තමා නොවන බවට සාක්ෂිකරු මෙම වූදිත එකහෙළාම පවසා ඇති ආකාරය ඔහුගේ ලිඛිත දේශනය තුළින් පෙනී යයි. මෙම තුන්වන වූදිත විසින් ඔහුගේ ලිඛිත දේශනයෙහි 37 වන ඡේදයෙහි සඳහන් කර ඇත්තේ මෙම නඩුවෙහි හතරවන වූදිතගේ සහ නවවන වූදිතගේ පාපොච්චාරණමය ප්‍රකාශයන්හි අබුසිලා, අබුශිලා යනුවෙන් මෙන්ම අබුසිලා හදී වශයෙන් එම නම සඳහන් කර තිබෙන බවත්, ඒ අනුව එලෙස සඳහන් කර ඇති නම්වලින් සඳහන් කර ඇති තැනැත්තන් එකම තැනැත්තෙක්ද යන්න සම්බන්ධයෙන් බලවත් සැක සහිත තත්ත්වයක් ඇති බවට තුන්වන වූදිත තර්ක කර ඇති බවයි. වූදිත විසින් ගොනු කර ඇති ලිඛිත දේශනයෙහි මෙම අධිකරණයේ සාක්ෂි ලබාදුන් පෑසා 1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂිය මෙන්ම සාක්ෂි ලබාදුන් පෑසා 2233 අස්මියා නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියට අදාළව කරුණු දක්වා ඇත.

එම සාක්ෂිකාරියට අදාළ පුද්ගලයා පිළිබඳ මතකයක් තිබෙන බවත්, ඔහු දැක ඇති බවට මතකයක් තියෙන බවත්, නම නොදන්නා ඔහු පාලමේ පැවති වැඩමුළුවේදී දුටු බවට පවසා ඇති බවත් සඳහන් වේ. ඇගෙන් විත්ති පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී, එම දේශනාවලදී මිනිසුන් මැරීමට හෝ ක්‍රිස්තියානි පල්ලිවලට බෝම්බ තැබීමට අවශ්‍ය යැයි දේශනා සිදු කළාද යන්න සහ සියදිවි නසා ගත්තොත් එය හරාම්ද යනුවෙන් විමසූ අවස්ථාවලදී, සියදිවි නසා ගැනීම ඉස්ලාම් ආගම යටතේ අනුමත නොකරන දෙයක් බවට ඇය පැවසූ බව තුන්වන චූදිතගේ ලිඛිත දේශනයේදී අවධාරණය කර ඇත. පෑසා 2233 අස්මියා නැමැති සාක්ෂිකාරිය අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 127 වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත්වරියකට ප්‍රකාශයක් ලබා දුන් බවට කරුණු හෙළි වුවද, ඇය එම ප්‍රකාශයෙහි සඳහන් කළේ අසත්‍ය කරුණු බවට ඇය අධිකරණයේදී පිළිගත් බව තුන්වන චූදිත විසින් ඔහුගේ ලිඛිත දේශනයේදී සඳහන් කර ඇත. මෙහිදී පෑසා 2233 අස්මියා නැමැති සාක්ෂිකාරිය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 127 වගන්තිය ප්‍රකාරව මහේස්ත්‍රාත්වරියකට ලබා දී ඇති ප්‍රකාශය අධිකරණය ඉදිරියේ ලකුණු කිරීමක් හෝ ඉදිරිපත් කිරීමක් කර නොමැති අතර, එවැනි ප්‍රකාශයක් කර තිබේද, එහි අන්තර්ගතය කුමක්ද යනුවෙන් විත්තියෙන් හරස් ප්‍රශ්නවලදී අසා තිබුණද, එවැනි ලේඛනයක් ගෙවා අධිකරණයට ලකුණු කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැත.

අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 127 වගන්තිය යටතේ යමෙකු සිදු කරන ප්‍රකාශයක් එම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි පරස්පරතාවයන් දැක්වීමේ කාර්යය සඳහා පමණක් භාවිතා කළ හැකි අතර, එම සාක්ෂිකරු හෝ සාක්ෂිකාරිය ලබා දෙන සාක්ෂි තහවුරු කිරීම සඳහා එවැනි ප්‍රකාශයක් නෛතිකව යොදා ගැනීමට හැකියාවක් නොමැත. මෙම නඩුවේදී පෑසා 2233 අස්මියා නැමැති සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී විත්තිය විසින් ඇයට යෝජනා කර ඇති කරුණු ඇය පිළිගැනීම සිදු කරමින් සාක්ෂි ලබා දී ඇති බව පෙනී යයි. මෙහිදී මෙම නඩුවෙහි පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති පෑසා 2233 අස්මියා නැමැති සාක්ෂිකාරිය හැර තවත් සාක්ෂිකරුවන් ගණනාවක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව අස්මියා නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියේදී චූදිතයන් විසින් අසන ලද හරස් ප්‍රශ්නවලදී ඔවුන්ට වාසිදායක ආකාරයෙන් යම් යම් පිළිතුරු ලබා දී තිබීමක් කර තිබුණද, මෙම නඩුවේදී චූදිතයන්ගේ සාපරාධීත්වය සළකා බැලිය යුත්තේ හුදෙක් එක් සාක්ෂිකරුවෙකු හෝ සාක්ෂිකාරියක ලබා දුන් සාක්ෂියක් මත නොව ඉදිරිපත් කරන ලද සමස්ත සාක්ෂි සැලකිල්ලට ගැනීම තුළිනි.

ඒ අනුව එකී පසුබිම තුළ මෙලෙස 3 චූදිතගේ ලිඛිත දේශනයේදී එම අස්මියා නැමැති සාක්ෂිකාරියගේ සාක්ෂියට දක්වා ඇති කරුණු පමණක් තනිව සළකා බැලීමට අධිකරණයට හැකියාවක් නැත. තුන්වන චූදිතගේ ලිඛිත දේශනයේදී පැමිණිල්ලෙන් සාක්ෂි ලබා දී ඇති පෑසා 1400 යන සාක්ෂිකරුගේ සාක්ෂිය, පෑසා 1030 එම්.එස්.එම්. මුස්තකීම් යන

සාක්ෂිකරුගේ සාක්ෂිය, සහ පෑසා 1958 සීතාංජන දිශානායක යන සාක්ෂිකරුගේ සාක්ෂි සම්බන්ධයෙන් මෙන්ම සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව එම සාක්ෂිකරුවන් මගින් ඉදිරිපත් කරන සාක්ෂි සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කරුණු විශ්ලේෂණය කරමින් ලිඛිත දේශනයෙහි සඳහන් කර ඇත. අප නිරීක්ෂණය කරන්නේ තුන්වන චූදිත මිල්හාන් විසින් ඔහුගේ චිත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති කරුණු මෙලෙස මෙම ලිඛිත දේශනයෙහි යළි යළිත් පුනරුච්චාරණය කිරීමක් සිදු කර ඇති බවයි. පෙර සඳහන් කරන ලද පරිදි මෙහිදී තුන්වන චූදිත මෙම නඩුවෙහි පළමු, හතරවන සහ නවවන චූදිතයන්ගේ පාපොච්චාරණමය ප්‍රකාශයන්හි සඳහන් කර ඇති කරුණු දක්වමින්, මිල්හාන් නොහොත් අබුසිලා යනදී නම්වලින් සඳහන් පුද්ගලයා සම්බන්ධයෙන් සඳහන් කර ඇති කරුණු උපුටා දක්වමින් කරුණු දක්වා ඇත.

එම පාපොච්චාරණමය ප්‍රකාශයන්හි අඩංගු කරුණු පිළිබඳව අප විසින් ඉහත අවස්ථාවක සවිස්තරාත්මකව කරුණු දැක්වීමක් කර ඇති අතර, ඒ අනුව ඉහතකී තුන්වන චූදිතගේ ලිඛිත දේශනය පුරාවටම තිබෙන්නේ ඔහු විසින් විනිසුරු මණ්ඩලයට කරන ලද ප්‍රකාශයේ සඳහන් කර ඇති කරුණු යළි යළිත් උපුටා දැක්වීමක් බවට පෙනී යයි. තුන්වන චූදිතගේ ඩී.එන්.ඒ. සාම්පල දත්බුරුසුවක තිබීම සහ කටුවාපිටිය යම් පරිසරයකින් ඒවා සොයාගෙන තිබීම සම්බන්ධයෙන් තුන්වන චූදිත විසින්

සඳහන් කර ඇති කරුණු සහ අන්තර්ගතයන් අපගේ සැලකිල්ලට ගන්නා ලදී. අප මෙහිදී පැහැදිලිව නිරීක්ෂණය කරන්නේ පැමිණිල්ලෙන් කැඳවා ඇති සාක්ෂි මගින් අදාළ ඩී.එන්.ඒ. සාම්පල සොයා ගැනීම හා ඒවාට සම්බන්ධ විද්‍යාත්මක විශ්ලේෂණයන් සම්බන්ධ සාක්ෂි අධිකරණය ඉදිරියේ ඉදිරිපත් කිරීමක් කර ඇති බවයි. ඒ අනුව මේ වන විටත් තුන්වන චූදිත විසින් කරන ලද දීර්ඝ ප්‍රකාශය විශ්ලේෂණාත්මකව ඇගයීමට ලක්කර ඇති පසුබිම තුළ, එහි අඩංගු කරුණු යළිත් මෙලෙස ලිඛිත දේශනය මගින් පුනරුච්චාරණය කර තිබෙන ආකාරය කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදී. අපට පෙනී යන්නේ තුන්වන චූදිතගෙන් සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව අනාවරණය කරගෙන ඇති කරුණු මත සොයාගෙන ඇති පුපුරන ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් නඩු භාණ්ඩයන් සම්බන්ධයෙන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සමස්ත සාක්ෂිවල අඩංගු කරුණු, ලිඛිත දේශනයේ අඩංගු කර ඇති කරුණු මගින් පමණක් නිෂේධනයකට ලක් නොවන බවයි.

මෙම නඩුවේ 04 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් මොහොමඩ් සාදික් අබ්දුල්ලා විසින්ද පිටු 108 කින් යුතු ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, එසේම ඔහුගේ සහෝදරයා වන 5 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් විසින්ද පිටු 70 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, එකී ලිඛිත දේශනවල අඩංගු කරුණුද අප විසින් මෙම තීන්දුව සකස් කිරීමේදී සළකා බලන ලදී. තවද 07 වන චූදිත මොහොමඩ් මන්සූර්

මොහොමඩ් සනස්දීන් විසින්ද පිටු 22 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, ඔහු එහිදී සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තියට අදාළවද ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද සාක්ෂි සම්බන්ධයෙන් කරුණු දැක්වීමක් කර ඇති අතර, එසේම ඔහු විසින්ද අධිචෝදනාපත්‍රයෙහි 01 චෝදනාව කාල පරාසයක් සඳහන් කර තිබීම දෝෂ සහගත බවට කරුණු සඳහන් කර ඇති ආකාරය අප විසින් සළකා බලන ලදී.

09 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින්ද පිටු 76 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, ඔහු එහිදී චෝදනාවල සංඝටකයන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නෛතික තර්කයන් කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදී.

10 වන චූදිත අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි වෙනුවෙන්ද පිටු 22 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති එම ලිඛිත දේශනයෙහි අඩංගු කරුණු කෙරෙහිද අපගේ අවධානය යොමු කරන ලදී. ඔහුද සඳහන් කර ඇත්තේ අධිචෝදනාපත්‍රයේ සඳහන් 01 චෝදනාව නෛතිකව පවත්වාගෙන යා නොහැකි චෝදනාවක් බවට වේ.

11 වන චූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින්ද පිටු 28 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, ඔහුද සඳහන් කර ඇත්තේ අධිචෝදනාපත්‍රයේ සඳහන් 01 චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ

චෝදනාව මෙන්ම ආධාර සහ අනුබල දීමට අදාළ චෝදනාවෙහි නෛතික තත්ත්වය හබ කරමින් කරුණු දක්වා ඇත.

12 සහ 13 වූදිතයන් වෙනුවෙන් ද වෙන් වෙන්ව ලිඛිත දේශන දෙකක් ගොනු කර ඇති අතර, එම ලිඛිත දේශන වලදීද ඔවුන් දෙදෙනාද හබ කර ඇත්තේ ඔවුන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවල සංඝටකයන් ඔප්පු කර නොමැති බවයි.

14 වන වූදිත වන රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් විසින් ගොනු කර ඇති පිටු 25 කින් යුක්ත ලිඛිත දේශනය මඟින් ඔහුට එරෙහිව මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි වල විශ්වසනීයභාවය හබ කරමින් කරුණු දැක්වීමක් කර ඇත.

15 වන වූදිත මොහොමඩ් හනීෆා සෙයිනුල් ආබ්දීන් විසින්ද පිටු 24 කින් යුතුව ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, ඔහුද හබ කරන්නේ අධිචෝදනා පත්‍රයේ සඳහන් කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව දෝෂ සහගත බවත්, එය නෛතිකව පවත්වාගෙන යාමට නොහැකි බවත්ය.

16 වන වූදිත වන මොහොමඩ් මුස්තාපා මොහොමඩ් හාරිස් විසින්ද පිටු 31 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, එම ලිඛිත දේශනයේදී පැමිණිල්ලෙන් ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද සාක්ෂි විශ්ලේෂණාත්මකව හබ කිරීමක් කර ඇත.

18 වන චූදිත වන රාසික් රාසා හුසෙයින් විසින් ගොනු කර ඇති පිටු 26 ක ලිඛිත දේශනයේදී ද අධිචෝදනා පත්‍රයේ 01 වන චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව නෛතිකව පවත්වාගෙන යා නොහැකි බවට හඬ කර ඇති අතර, එසේම ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති සාක්ෂි විශ්ලේෂණය කරමින්, එම සාක්ෂි විශ්වාසනීය නොවන බවට කරුණු දක්වා ඇත.

19 වන චූදිත කච්චි මොහොමදු මොහොමදු ජෙම්සිත් විසින්ද පිටු 30 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, එම ලිඛිත දේශනයේදී පැමිණිල්ලෙන් ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හඬ කරමින් කරුණු දක්වා ඇති අතර, එසේම අධිචෝදනාපත්‍රයෙහි 01 වන චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව නෛතිව පවත්වාගෙන යා නොහැකි බවට කරුණු දක්වා ඇත.

20 චූදිත වන සෙයිනුල් ආබ්දීන් මොහොමඩ් ජසීම් විසින් පිටු 16 ක ලිඛිත දේශනයක් ගොනු කරමින් පැමිණිල්ලෙන් ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති සාක්ෂි හඬ කරමින් කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඔහුට එරෙහිව සාපරාධී වගකීම පැවරීමට තරම් වරදක් ඔහු විසින් සිදු කර නොමැති බවට කරුණු දක්වා ඇත.

21 චූදිත වන මොහොමඩ් මුස්තාපා මොහොමඩ් රිස්වාන් විසින් පිටු 13 ක ලිඛිත දේශනයක් ගොනු කරමින් ඔහුට එරෙහිව පැමිණිල්ලෙන්

ඉදිරිපත් කරන ලද සාක්ෂි හබ කිරීමට ලක් කර ඇති අතර, ඔහුගේ ජංගම දුරකථනය අංකය සම්බන්ධයෙන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කරුණු හබ කරමින් සාක්ෂි ඉදිරිපත් කර ඇත.

22 වූදිත වන මීරා සහීඩ් මොහොමඩ් නෆීල් යන වූදිත විසින්ද පිටු 11 ක ලිඛිත දේශනයක් ගොනු කරමින් ඔහුට එරෙහිව ඇති චෝදනාවල අනිවාර්යයෙන් ඔප්පු කළ යුතු සංඝටක කිසිවක් ඔප්පු කර නොමැති බවට කරුණු දක්වා ඇත.

23 වන වූදිත මොහොමඩ් අමීර් මොහොමදු අයන්තුල්ලා යන වූදිත විසින් පිටු 16 ක ලිඛිත දේශනයක් ගොනු කර ඇති අතර, ඔහුද ඔහු සහභාගී වූ නුවරඑළිය ගමනට අදාළව පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි හබ කරමින් කරුණු දක්වා ඇති අතර, ඔහු විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත.

24 වන වූදිත මොහොමඩ් අන්සාර්ඩීන් මොහොමඩ් ඉල්මි විසින්ද පිටු 15 ක ලිඛිත දේශනයක් ගොනු කරමින් ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති සාක්ෂි හබ කරමින් කරුණු දක්වා ඇති අතර, ඔහුද අධිචෝදනා පත්‍රයේ සඳහන් 01 චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව හබ කරමින් කරුණු දක්වා ඇත.

එසේම 25 වන වූදිත වන මොහොමඩ් අක්‍රම් අහක්කම් විසින්ද පිටු 29 කින් යුත් ලිඛිත දේශනයක් ගොනු කරමින් තර්ක කර ඇත්තේ පුහුණු

වැඩසටහන් වලට ඔහු සම්බන්ධ වූ බවට පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි ප්‍රබල ලෙස හබ කරමින් කරුණු දක්වා ඇත.

ඉහත කී සියළුම ලිඛිත දේශනයන්හි අඩංගු කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලද අතර, ඔවුන් විසින් සඳහන් කර ඇති විනිශ්චිත අධිකරණ තීන්දු කෙරෙහිද අපගේ අවධානය මනාව යොමු කරන ලදී.

චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් වී ඇති චෝදනාවන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී තිබේද?

01 චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ වරද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර තිබේද?

සියලුම චූදිතයන්ට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රධානම චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව වන අතර ඒ අනුව එම චෝදනාව මෙම නඩුවේ ප්‍රධානම චෝදනාව වන බැවින් සහ අනිකුත් බොහෝමයක් චෝදනාවන් එකී පළමු චෝදනාව මත රඳා පවතින බැවින් එකී පළවන චෝදනාව සම්පූර්ණයෙන්ම පහත පරිදි අප විසින් උපුටා දක්වා ඇත.

"වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 01 වන දින සහ වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 21 වන දින අතර කාලසීමාව තුළ දී යුෂ්මතුන් දැනට මියගොස්

සිටින 17 වන චූදිත වන යාසිම් බාවා අබ්දුල් රවුෆ් හෙවත් යාසින් බාවා අබුදුල් රවුෆ් සමඟ අනුරාධපුර. රඹෑව, මල්වාන, මහනුවර, නුවරඑළිය, හම්බන්තොට, කාත්තන්කුඩිය, ඔල්ලිකුලම, පාළමුණේ, නාරම්මල, කටුවාපිටිය, මඩකලපුව, පානදුර, මෙම අධිකරණයේ බලසීමාව තුළ පිහිටි කොටහේන, කොටුව, කොල්ලුපිටිය හා දෙහිවල යන ප්‍රදේශවල දී, දැනට මිය ගොස් සිටින මුහම්මදු හාසිම් ජහ්රාන් හෙවත් මොහොමඩ් කාසීම් ජහ්රාන් හෙවත් මුහම්මදු කාසීම් මොහොමඩ් ජහරාන් හෙවත් මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් හෙවත් අබු මුහරිබ් හෙවත් අබු උබෙයිදා, මුහම්මදු කාසීම් මුහම්මදු රිල්වාන් හෙවත් මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් හෙවත් අබු කිතල්, අච්චි මොහමඩ් මොහමඩ් හස්තුන් හෙවත් අච්චි මොහොම්මදු මොහොම්මදු හස්තුන් හෙවත් කස්තුන් හෙවත් අබු මොහොම්මද්, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් හෙවත් අබු අබ්දුල්ලා, මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් හෙවත් අබු බරා, මොහමඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහමඩ් හෙවත් මොහොමඩ් ඊබ්‍රාහිම් ඉන්ෂාෆ් අහමඩ්, අබ්දුල් ලතීෆ් ජමීල් මුහම්මඩ් හෙවත් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොම්මඩ් හෙවත් අබු හම්සා, අලවුදීන් අහම්මද් මුආත් හෙවත් මුවාත්, මුහම්මදු නසාර් මුහම්මදු අෂාත් හෙවත් මොහොමඩ් නසාර් මොහොමඩ් අසාද් හෙවත් අබු මුක්තාර් සහ පැමිණිල්ල නොදත් අන් අය සමඟ යුෂ්මතුන් දැනට මියගොස් සිටින 17 වන චූදිත වන යාසිම් බාවා අබ්දුල් රවුෆ් හෙවත් යාසින් බාවා අබ්දුල් රවුෆ් කියනු ලබන නැතහොත් කියවීමට

අදහස් කරනු ලැබූ වචන මඟින් හෝ සංඥා මඟින් හෝ දෘශ්‍ය නියෝජන මඟින් හෝ අන්‍යාකාරයෙන්, එනම්, අන්තවාදී මතවාද හෝ ජන කොටස් හෝ වර්ගයන් හෝ ආගම් අතර ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කරන මතවාද ප්‍රචාරය කර, අධිශික්ෂණය (Indoctrination) ලබා දීමෙන් හෝ ලබා ගැනීමෙන් හෝ අවි පුහුණුව ලබා දීමෙන් හෝ ලබා ගැනීමෙන් හෝ වෙනත් යම් ක්‍රියාවක් හෝ ක්‍රියාවන් සිදු කර සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවක් හෝ කිහිපයක් සිදු කිරීමේ වරද හෝ වැරදි කිරීම සඳහා පොදු අරමුණක් සහිතව කලින් සම්මුතියක් හෝ පිළියෙල වීමක් ඇතිව හෝ නැතිව යම් වරදක් කිරීමට හෝ ඊට අනුබල දීමට හෝ ක්‍රියා කර වීමට එකඟ වීමෙන් කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කළ බවත් එම කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් වශයෙන් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය, කොටුව කිංග්ස්බරි හෝටලය, කොටුව ෂැංග්‍රිලා හෝටලය, කොල්ලුපිටිය සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, මඩකලපු සියෝන් දේවස්ථානය හා දෙහිවල නිව් ට්‍රොපිකල් ඉන් ඇතුළු ප්‍රදේශවල බෝම්බ පුපුරුවා හැර යුෂ්මතුන් දැනට මියගොස් සිටින 17 වන චූදිත වන යාසිම් බාවා අබ්දුල් රවුෆ් හෙවත් යාසින් බාවා අබ්දුල් රවුෆ් සාහසික ක්‍රියා හෝ විවිධ ජන

කොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්වෙතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවන් සිදු කිරීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.".

මෙම කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි මගින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර තිබේද? යන්න පරීක්ෂා කර බැලීමට ප්‍රථමව කුමන්ත්‍රණය නැමැති වරද සම්බන්ධ නෛතික තත්වය සළකා බැලීම වඩාත් සුදුසු වේ.

1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතෙහි අර්ථ නිරූපන වගන්තිය වන 31 වගන්තියෙහි කුමන්ත්‍රණය නමැති වරද සම්බන්ධයෙන් වෙනමම අර්ථ නිරූපණයක් ලබා දී නොමැති අතර, කෙසේ වෙතත් පනතෙහි 31 (2) වගන්තිය අනුව සඳහන් කර ඇත්තේ ***"මේ පනතේ යෙදී ඇත්නාවූ ද, දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථ කථනය කර ඇත්නා වූ සහ මෙහි ඉහතින් අර්ථකථනය කර නොමැත්නා***

වූද සියලු වචනවලට හා යෙදුම්වලට දණ්ඩ නීති සංග්‍රහයේ යම් අර්ථයක් දී ඇත්තේද පිළිවෙළින් ඒ වචන වල හා යෙදුම් වල ඒ අර්ථයම ඇති සේ සැළකිය යුතුය" යනුවෙන් සඳහන් කර ඇත. ඒ අනුව 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ කුමන්ත්‍රණය නමැති වරද අර්ථ නිරූපණය කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අපගේ දණ්ඩ නීති සංග්‍රහයේ ලබා දී ඇති අර්ථ නිරූපණය කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදී. දණ්ඩ නීති සංග්‍රහයේ 113 (අ) වගන්තියෙහි කුමන්ත්‍රණය නැමැති වරද විස්තර කර ඇත්තේ පහත පරිදි වේ.

"යම් වරදක් සිදු කිරීමේදි හෝ සිදු කිරීම සඳහා නැතහොත් වරදකට අනුබල දීමෙහිදි හෝ අනුබල දීම සඳහා පොදු අරමුණක් සහිතව කලින් සම්මතයක් හෝ පිළියෙලවීමක් ඇතිව හෝ නැතිව දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් එක්ව යම් වරදක් සිදු කිරීමට හෝ ඊට අනුබල දීමට හෝ ක්‍රියා කිරීමට එකඟවුවහොත්, ඒ වරද කිරීමට හෝ ඊට අනුබලදීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සඳහා අවස්ථාව පරිදි ඔවුන්ගෙන් එක් එක්කෙනෙක් වැරදිකාරයෙක් වෙයි"

යනුවෙන් වන අතර 113 (අ) (2) වගන්තියෙහි පහත පරිදි සඳහන් කර ඇත.

"ලංකාව තුළ සිටින තැනැත්තෙකු ලංකාවෙන් පිටත සිටින තැනැත්තෙකු සමග ඒ දෙදෙනා විසින් හෝ ඉන් එක්කෙනෙකු විසින් හෝ වෙනයම් තැනැත්තෙකු විසින් ලංකාව තුළදි හෝ ඉන් පිටතදි කලයුතු පරිදි යම් වරදක් කිරීම සඳහා හෝ ඊට අනුබල දීම සඳහා එකඟවීමෙන් කුමන්ත්‍රණය කිරීමේ වරදට වැරදිකාරයෙකු විය හැකිය."

තවද මේ වගන්තියේ කාර්යය සඳහා ලංකාවෙන් පිටත සිදු කල යුතු වරදක් සම්බන්ධයෙන් *" වරද යන්නෙන් මේ සංග්‍රහය යටතේ හෝ වෙනත් නීතියක් යටතේ ලංකාව තුළදි සිදු කලහොත් වරදක් වන යම් ක්‍රියාවක් අදහස් කෙරේ"* යනුවෙන් පැහැදිලිව සඳහන් කර ඇත.

කුමන්ත්‍රණය නැමැති වරද සිදු කිරීම සඳහා දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් යම් වරදක් කිරීමට පොදු අරමුණක් ඇතිව එකඟතාවයකට පැමිණිය යුතු අතර එමෙන්ම කුමන්ත්‍රණය නැමැති වරද සිදු කිරීමට සෑම කුමන්ත්‍රණකරුවෙක්ම කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලබන වරදට අදාළ සෑම ක්‍රියාවක්ම දැන ගැනීම අවශ්‍ය නැත. කෙසේ වුවද එක් එක් කුමන්ත්‍රණකරු විශේෂිත ක්‍රියාවක් කිරීමට එකඟ වීම පමණක් ප්‍රමාණවත් වේ. එසේ වුවද කුමන්ත්‍රණකරුවන් සියලුම දෙනා යම් වරදක් සිදු කිරීමට පොදු අරමුණක් ඇතිව එකඟතාවයන්ට පැමිණිය යුතුය.

ඒ අනුව බලන කල දණ්ඩනීති සංග්‍රහයේ 113(අ) වගන්තිය අනුව පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි පිරිසක්, වරදක් කිරීම හෝ වරදක් කිරීමට ආධාර කිරීම සඳහා, එකඟතාවකට (agreement) පැමිණෙන්නේ නම්, එවිට එම එකඟතාවම කුමන්ත්‍රණය වේ. තව ද කුමන්ත්‍රණය කිරීමෙ වරද ඔප්පු කිරීම සඳහා එලෙස කිරීමට එකඟ වූ වරද අවසන් කර තිබීම අත්‍යවශ්‍ය නොවේ.

මෙම නඩුවේ සියලු චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රධානම චෝදනාව වන බැවින් එම වරද 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ කවර ආකාරයකින් විස්තර කර තිබේද? යන්න සළකා බැලිය යුතුවේ.

1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 2 (1)ඌ වගන්තිය පහත පරිදි වේ.

“ කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මඟින් හෝ සංඥා මඟින් හෝ දෘශ්‍ය නියෝජනය මඟින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජනකොටස් නැතහොත් වර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගතිය නැතහොත් දුර්වේතනික

හෝ එදිරිවාදි හැඟීම් ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ" ලෙසට සඳහන් කර ඇත.

1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 3 වගන්තිය පහත පරිදි වේ.

03. (අ) වරදක් කිරීමට සුදානම් වීමක් වශයෙන් යම් ක්‍රියාවක් කරන්නා වූ,

*(ආ) වරදක් කිරීමට අනුබල දෙන්නා වූ, **කුමන්ත්‍රණය කරන්නා වූ,** අනුශාසනා කරන්නා වූ, නැතහොත් පොළඹවන්නා වූ*

(ඇ) දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩුවම් කළ හැකි ක්‍රියාවක් වන මේ පනත යටතේ යම් වරදක් කිරීමේදි යම් තැනැත්තෙකු මරණය සිදු කරන්නා වූ හෝ කවර වූ හෝ තැනැත්තෙකුට පහර දෙන්නා වූ,

යම් තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් වරදක්

වන අවස්ථාවක අවුරුදු 05 කට අඩු නොවූද, අවුරුදු 20 ක් නොඉක්මවන්නා වූද, කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ..... යනුවෙන් වේ.

1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 2 (1) (ඌ) වගන්තිය සමඟ කියවිය යුතු 3 (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇති බව ඔප්පු කිරීම සඳහා එම පනතේ 2 වගන්තියේ යටතේ විස්තර කරන වරදක් කිරීමට සැලසුමක් තිබූ බව සහ එම සැලසුම සඳහා චූදිතයින් අතර එකඟතාවක් තිබූ බව සාධාරණ සැකයකින් තොරව ඔප්පු කල යුතු අතර කුමන්ත්‍රණය නැමැති ක්‍රියාව බොහෝ විට රහසිගතව සිදුවන්නක් බැවින් එලෙස එකඟතාවක් තිබීම සෘජු සාක්ෂි මඟින් හෝ පරිවේෂණීය සාක්ෂි මගින් ඔප්පු කළ හැකිය.

අපගේ ඉහළ අධිකරණයන් මඟින් කුමන්ත්‍රණය නමැති වරද විස්තර කර ඇති ආකාරය සළකා බැලීමේදී, *King v. Cooray 51 N.L.R. 433*, නඩුවේදී, කුමන්ත්‍රණය නමැති වරදෙහි සංඝටකයන් විස්තර කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දී ඇත්තේ, දණ්ඩ නීති සංග්‍රහයේ 113 (අ) වගන්තිය ප්‍රකාරව කුමන්ත්‍රණය නමැති වරද සිදු කිරීම " *(a) if two or more persons agree, with or without any previous concert or deliberation, to commit an offence or to abet an offence, or (b) if two*

or more persons agree, with or without any previous concert or deliberation, to act together with a common purpose for or in committing or abetting an offence." යනුවෙන් සඳහන් කර ඇත.

එසේම, *The King v. Andree 42 NLR 495* යන අධිකරණ තීන්දුවේදී පෙන්වා දී ඇත්තේ, *" In a charge of conspiracy under section 113A of the Penal Code it is not necessary to prove an agreement to commit an offence ither directly or inferentially. It is sufficient to prove that the accused acted together with a common purpose for or in committing an offence"* යනුවෙන් වේ. එසේම, *Dayananda Lokugalappaththi Vs, State (2003) 03 Sri Lankan LR 54 CA* නඩුවේදී

> *"The law does not envisage the prosecution to prove any direct concert or even any meeting of the conspirators, it is not necessary to prove that they knew each other earlier. In establishing detached acts of each of the accusesd related to the main design the prosecution can proceed to establish the conspiracy itself "*

එසේම *Queen Vs Liyanage and others (67 NLR 194)* යන නඩු තීන්දුවේ දී කුමන්ත්‍රණය නැමැති වරද සම්බන්දයෙන් සඳහන් කර ඇත්තේ

"The essence of Conspiracy is the agreement to do the unlawful acts alleged; but it is not necessary that any act should in pursuance of the agreement. Whether a criminal act is done or not, the agreement, and not the act is what is penalized.

There must be proof against each conspirator that he had knowledge of the general purpose of the plot and the common design, though each need not be equally well informed of the details. Agreement, following upon intention, is enough is also of the essence of the conspiracy.

The conspiracy will persist so long as the conspirators remain in agreement, and so long as they are acting in accord, in furtherance of the objects for which they entered into agreement.

The evidence in support of an indictment charging conspiracy is generally circumstantial. It is not necessary to prove any direct concert, or even any meeting of the conspirators, as the actual fact of conspiracy may be inferred from the collateral circumstances of the case.

වන අතර එම තීන්දුවේ සඳහන් ඉහත කී කරුණු අප ඉදිරියේ පවතින මෙම නඩුව සම්බන්ධයෙන් අදාළ කර ගැනීමේ දී අපහට පෙනී යන්නේ මෙම නඩුවේ චූදිතයින්ට එරෙහිවද මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි ප්‍රධාන වශයෙන් පරිවේෂණීය සාක්ෂි වන බවයි.

මෙම තීන්දුවේ සඳහන් කර ඇති එක් එක් බෝම්බ පිපිරුම් සිද්ධීන් සම්බන්ධයෙන් සහ එකී බෝම්බ පුපුරුවා හැරීමේ ක්‍රියාවන් සිදු කල ස්වයංඝාතක බෝම්බකරුවන් හට මෙම අධිකරණයේ දැනට සිටින ඉහත සඳහන් චූදිතයින් 24 දෙනා හෝ ඔවුන් අතුරින් කිහිප දෙනෙකු කවර ආකාරයෙන් අනුබල දීමක් සිදුකර තිබේද යන්න සම්බන්ධයෙන් අප විසින් මෙම තීන්දුවේ ඉහත ස්ථානයන් කීපයකදීම කරුණු සාකච්ඡා කර ඇත. විශේෂයෙන් ආරක්ෂිත නිවාස සහ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් අප විසින් විශ්ලේෂණාත්මකව කරුණු සඳහන් කිරීමේ දී අප පෙන්වා දී ඇත්තේ 2017 වසරේ අග භාගයේ සිට 2019 අප්‍රේල් 20 දින පස් වරුවේ ගල්කිස්ස ස්පෑන් ටවර් ගොඩනැගිල්ලේ මහලක සහරාන් විසින් ස්වයංඝාතක බෝම්බකරුවන් 7 දෙනා අමතා සිදුකරන ලද අවසන් දේශණය හා සම්බන්ධ පැ-162 ලෙස ලකුණු කර ඇති වීඩියෝ දර්ශනයේ අඩංගු දේශනය පවත්වා ISIS සංවිධානයට පක්ෂපාති වීමේ බයියත් ප්‍රතිඥාව ලබා දීමේ අවස්ථාව දක්වා සිද්ධි දාමයන් සලකා බැලීමේ දී පෙනී යන්නේ 2017 වසර අවසානයේ පටන් අන්තවාදී දේශනා සිදුකරමින් වැඩමුළු පැවැත්වීම, එසේම 2018 අප්‍රේල් මැයි මාස ආසන්න කාලයේ

නුවරඑලියේ ශාන්තිපුර පවත්වා ඇති වැඩමුළුවේදී අවිආයුධ පාවිච්චිකරන ආකාරය සම්බන්ධ පුහුණුවීම් සිදු කිරීම් මෙන් ම සටන් කරන කණ්ඩායම සහ මරාගෙන මැරෙන කණ්ඩායම වශයෙන් එම වැඩමුළුවට සහභාගී වූවන් බාණ්ඩ කිරීමක් සිදුකර තිබීම , ඉන් අනතුරුව 2019-මාර්තු මස මුල් කාලයේ බෝම්බ සෑදීම සදහා උපයෝගී කරගත් යූරියා නයිට්‍රේට්, සල්ෆියුරික් ඇසිඩ් ආදී රසායන ද්‍රව්‍ය මෙන් ම බයිසිකල් යකඩ බෝල ඉතා විශාල ප්‍රමාණයක්, විදුලි පරිපථ, බැටරි, සේවා නූල් ආදිය මෙන් ම පුපුරණ ද්‍රව්‍ය ආදිය ද එක්රැස් කර තිබූ ආකාරය සම්බන්ධ සාක්ෂි මෙම නඩුවේ දී පැමිණිල්ලෙන් ඉදිරිපත් කර ඇත. එසේම බෝම්බ සෑදීම සදහා ඉතා සූක්ෂම ලෙස කටයුතු කර ඇති ආකාරය සහ කිසිවෙකුට සැක නොසිතෙන අකාරයෙන් බැක් පැක් බෑගයන් තුල අධි බලැති බෝම්බ සවිකර ඒවා ශරීරයේ පැලද ගෙන ගොස් සාමාන්‍ය සිවිල් වැසියන් අධික ලෙස ගැවසෙන ස්ථානයන් වලදී ඒවා එකම දවසේ එකම වේලාවක් තුල පුපුරුවාහැර තිබීම තුලින් ස්වයංඝාතක බෝම්බකරුවන්ගේ පූර්ව සැලැස්මක් ප්‍රකාරව කටයුතු කර ඇති ආකාරය මැනැවින් පෙනී යයි. එකී සපරාධී කුමන්ත්‍රණකාරී සැලැස්ම කෘයප්‍රාප්ත වී ඇත්තේ 2019-4-21 මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය දියත්කිරීම තුලින් වන අතර, පැ-162, පැ 163 ලෙස ලකුණු කර ඇති නඩු භාණ්ඩ තුළින් හෙළි වන පරිදි මෙම මහා කුමන්ත්‍රණයේ මූලිකයා ලෙස කටයුතු කර ඇති ස්වයංඝතක බෝම්බකරුවෙක් වන සහරාන් ගේ බයියත් දේශනාවේ සදහන් කර ඇති පරිදි තමන්ලා සිනා

සිසී බෝම්බ රැගෙන විත් පුපුරුවා හැර ජීවිත පූජාකරන බවට පවසා තිබීම මෙන්ම ප්‍රධාන වශයෙන් කිතුණු දේවස්ථානයන් ඉලක්ක කරගනිමින් මෙම ස්වයංඝාතක බෝම්බ පිපිරුවීම් කිරීම කලයුතු බවට පවසා තිබීම තුලින් සහ පාස්කු ඉරු දින උදයේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයෙ, මීගමුව කටුවපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මෙන් ම මඩකලපුව සියෝන් දේවස්ථානයේ ද ස්වයංඝාතක බෝම්බ පුපුරුවා හැරීමට කටයුතු කර තිබීම තුලින් ඉහත කී කුමන්ත්‍රණයේ අරමුණු සාක්ෂාත් කර ගෙන ඇති ආකාරය මෙම අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි මගින් මැනවින් තහවුරු වී ඇත. එසේම මෙලෙස බෝම්බ ප්‍රහාරයක් දියත් කිරීම සඳහා මෙම නඩුවේ චූදිතයින් එක් ව මෙන් ම වෙන් වෙන් ව ද සූදානම් වීම, කුමන්ත්‍රණයේ කාර්‍ය සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීම මෙම තීන්දුවේ ඉහත අවස්ථාවල අප විසින් සාකච්ඡා කරන ලද මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි තුලින් මනාව පෙනී යයි.

මෙම අධිකරණය ඉදිරියේ සිටින චූදිතයින්ගෙන් 01 චූදිත නවුෆර් මවුලවී යන අයගේ පාපොච්චාරණය අනුව ඔහු ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් සමග කටයුතු කර ඇති ආකාරය මැනැවින් පෙනී යන අතර 11 චූදිත කාලිද් සමීර් ගේ පාපොච්චාරණය අනුව සහරාන් ගේ බෝම්බ පුපුරවා හැරීම් සිදු කිරීමේ සැලැස්ම සඳහා අවශ්‍ය කරන විදුලි පරිපථ, ස්විච් ආදී උපකරණ පිටකොටුව ප්‍රදේශයේ

වෙලදසැල් වලින් මිලදී ගෙන දී ඇති ආකාරය මනාව පැහැදිලි වේ. මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි මගින් හෙලි වී ඇති පරිදි 04 වන චූදිත සාදික් අබ්දුල්ලා සිරියාවේ අවි පුහුණුව ලබා තිබීම තුලින් සහ නුවර එලියේ පැවති පුහුණු වැඩමුළුවට සහභාගි වෙමින් මෙන් ම මාවනැල්ල ප්‍රදේශයේ තව්හිද් ජමාත් පල්ලියේ දී මෙම නඩුවේ 9 චූදිත සාජිත් මවුලවී සමග එක්ව අන්තවාදී දේශනා සිදුකර ඇති ආකාරය මෙන් ම ශ්‍රී ලංකාව අයි එස් පාලනයට යටත් වන ඉස්ලාම් රාජ්‍යක් බවට පත් කල යුතු බවට අන්තවාදී දේශනාවන් සිදු කර තිබීම් තුලින් ද 9 චූදිත විසින් ද අන්තවාදී දේශනා පවත්වා ජාතික සංහිදියාවක් නැති බව සහ තිබිය නොහැකි බවට දේශනාකරමින් 40 කට ආසන්න මුස්ලිම් තරුණයන් අන්තවාදී අදහස් මතවාද වල යොමු කිරීමට කටයුතු කර ඇති ආකාරය මැනවින් පැහැදිලි වේ.

මෙම නඩුවෙහි චූදිතයින් විසින් ගොනු කර ඇති ලිඛිත දේශනවල සඳහන් කර ඇත්තේ ඔවුන් කිසිදු අවස්ථාවක කුමන්ත්‍රණය කිරීමේ ක්‍රියාවක් සිදු කර නැති බවත්, කිසිදු ආකාරයකින් සහරාන් නැමැති ස්වයංඝාතක බෝම්බකරුට බෝම්බ ප්‍රහාරයක් සිදු කිරීම සඳහා ආධාර සහ අනුබල දීමක් සිදු කර නැති බවත්ය. අප විසින් ඉහතින් විස්තරාත්මකව සඳහන් කර ඇති හේතූන් වලට අනුව මෙම නඩුවේ චූදිතයින් සියළු දෙනාම එකවර එකම ස්ථානයක පෙළගැසී සිටිමින් කටයුතු කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නැත. එසේම කුමන්ත්‍රණය සිදු කිරීමට සෘජුව හෝ

වක්‍රව, ආරම්භයේදී, මැදදී හෝ අවසානයේදී සම්බන්ධ වීමට හැකිය. මෙහිදී වැදගත් වන්නේ සියළුම කුමන්ත්‍රණකරුවන් අන්තවාදී මතවාද, ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කරන්නාවූ මතවාද ප්‍රචාරය කර අධිශික්ෂණය කිරීම් සිදු කර අවිආයුධ පුහුණුව ලබා දීම සිදු කර යම් සාහසික ක්‍රියා සිදු කිරීමට කටයුතු කර තිබීම වන අතර, මෙහිදී ඔවුන් පොදු අරමුණක් සහිතව කලින් සම්මුතියක් හෝ පිළියෙල වීමක් හෝ සූදානම් වීමක් ඇතිව හෝ නැතිව සාපරාධී වරදවල් කිරීමට අනුබල දෙමින් ඒ සඳහා එකඟ වීම සිදු කර තිබීම වන අතර, මෙම තීන්දුවේදී ද අප ඉහත අවස්ථාවල විස්තරාත්මකව පෙන්වා දී ඇති පරිදි පුපුරන ද්‍රව්‍ය එක්රැස් කිරීම් සිදු කර, බෝම්බ සෑදීමට උපයෝගී කර ගන්නා රසායනික ද්‍රව්‍ය සූක්ෂම ලෙස එක්රැස් කිරීම් කර ගබඩාකිරීම් කර, සූක්ෂම ලෙස ආරක්ෂිත නිවාස කුලියට ගෙන ඒවායේ රැඳී සිටිමින් එක්ව සහ වෙන්වෙන්ව කටයුතු කර තිබීම තුළින් ඔවුන්ගේ කුමන්ත්‍රණකාරී ක්‍රියාවලිය (Criminal Enterprise) මනාව පැහැදිලි වේ. තවද මෙම නඩුවෙහි 1, 4, 9, 11, 18 වූදිතයින් විසින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති පාපෝච්ඡාරණමය ප්‍රකාශ මේ වන විටත් අප විසින් සැළකිල්ලට ගෙන ඇති අතර, එකී පාපෝච්ඡාරණයන්හි අඩංගු කරුණුද සැළකිල්ලට ගැනීමේදී මෙම නඩුවේ වූදිතයින් මෙම නඩුවෙහි අධිචෝදනාපත්‍රයෙහි 01 චෝදනාවෙහි සඳහන් කර ඇති පරිදි 2017 නොවැම්බර් මස අග භාගයේ සිට 2019 අප්‍රේල් මස 21

දින දක්වා වූ කාලපරාසයේදී අන්තවාදී දේශනා, අවිපුහුණු පුපුරන ද්‍රව්‍ය සහ බෝම්බ සෑදීමට ගන්නා රසායනික ද්‍රව්‍ය මිළඳී ගෙන එක්රැස්කර තැබීම්, ආරක්ෂිත නිවාස මිළඳී ගෙන ඒවාහි රැඳී සිටිමින් බෝම්බ සෑදීම සිදු කර ඇති ආකාරය එකී ආරක්ෂිත නිවාස වල තිබී සොයා ගත් බෝම්බ සෑදීමේ උපකරණ, රසායනික ද්‍රව්‍ය, යකඩ බෝල ඉතා විශාල ප්‍රමාණයක් අඩංගු පෙට්ටි සහ වෝටර් ජෙල් ආදී පුපුරන ද්‍රව්‍ය එක්රැස් කර ඩෙටනේටර් ආකාරයෙන් සූදානම් කර තිබීම ආදී ක්‍රියාවන් තුළින් මෙම නඩුවේ ස්වයංඝාතක බෝම්බකරුවන් සංවිධානාත්මකව කටයුතු කර තිබීම මැනවින් පෙනී යන පසුබිම තුළ ඔවුන් සියළු දෙනා යම් සාපරාධී ක්‍රියාවන් කිරීමට පොදු අරමුණකින් යුතුව එකඟතාවයකට පැමිණ ඇති බව මැනවින් පෙනී යයි. එසේම ගල්කිස්ස ස්පෑන් ටවර් ගොඩනැගිල්ලේ දී සහරාන් ප්‍රමුඛ ස්වයංඝාතක බෝම්බකරුවන් 2019.04.20 දින ලබා දී ඇති බයියත් ප්‍රතිඥාවෙහී ද (පැ. 162, පැ.163 අනුව) සඳහන් කර ඇත්තේ ක්‍රිස්තියානි පල්ලිවලට බෝම්බ තැබීම ඔවුන්ගේ පොදු අරමුණක් බවයි. මෙම අධිකරණයේ සිටින චූදිතයින් ඉහත කී ස්වයංඝාතක බෝම්බකරුවන් සමඟ එක්ව කටයුතු කර ඇති ආකාරය මෙම අධිකරණයේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද අප විසින් ඉහත සාකච්ඡා කර ඇති පරිවේෂණීය සාක්ෂි තුලින් මැනවින් පෙනී යන අතර, මෙහිදී ඔවුන්ද ස්වයංඝාතක බෝම්බකරුවන් සමඟ කුමන්ත්‍රණකරුවන් ලෙස කටයුතු කර ඇති අතර, ඔවුන් බෝම්බ පුපුරවා හැරීම් සඳහා ස්වයංඝාතක බෝම්බකරුවන් ලෙස

සූදානම් වීමක් කර නොතිබුනද ඔවුන් විසින් වක්‍රාකාරයෙන් ලබා දී ඇති සහයෝගය හේතු කොට ගෙන ප්‍රධාන කුමන්ත්‍රණකරුවන් වන ස්වයංඝාතක බෝම්බකරුවන්ට ඔවුන්ගේ ඉලක්කයන් කරා යාමට බොහෝ සෙයින් උපකාරී වී ඇති බව මෙම නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂි පරීක්ෂා කර බැලීම තුළින් පෙනී යයි. තවද සියළුම කුමන්ත්‍රණකරුවන් එකම ක්‍රියාවත් කිරීමට එකඟවීමක් නීතිය ඉදිරියේ අපේක්ෂා නොකන අතර, එසේම කුමන්ත්‍රණයේ සෑම විස්තරයක්ම කුමන්ත්‍රණයේ සියළුම සාමාජිකයන් දැන සිටීම අත්‍යාවශ්‍ය වන්නේද නැත. තවද සාපරාධී කුමන්ත්‍රණයක අරමුණ අනිවාර්යයෙන් ඉටුවී තිබීමක් කුමන්ත්‍රණය නැමැති වරද සම්පූර්ණ වීමට අත්‍යාවශ්‍ය නොවේ.

මේ සම්බන්ධයෙන් අප ***Yakub Abdul Razak Memon Vs. State of Maharashtra*** **යන *2013.03.21*** දින ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇති අධිකරණ තීන්දුවේදී පෙන්වා දී ඇති නෛතික කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලදී. එම නඩුවට පාදක වන්නේ 1993 මාර්තු 12 දින මුම්බායි නගරයේ සිදු වූ ත්‍රස්තවාදී බෝම්බ පිපිරීම් මාලාවක් සිදු කිරීම වේ. එම නඩුවේදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය ත්‍රස්තවාදී ක්‍රියා කිරීමට සම්බන්ධ කුමන්ත්‍රණයකට සහභාගී වීම සම්බන්ධයෙන් විභාගයට ගත් නඩුවක් වන අතර, එම නඩුවේදී කුමන්ත්‍රණයේ මූලික අංග පිළිබඳව පුළුල්ව සාකච්ඡා කර ඇති අතර, එම නඩුවේදී පෙන්වා දී ඇත්තේ කුමන්ත්‍රණයේ මූලික අංගය වන්නේ එකඟතාවය බවත් සියළු

කුමන්ත්‍රණකරුවන් එකම ක්‍රියාවක් කිරීමට එකඟ වීම අවශ්‍ය නැති බවත්, එසේම කුමන්ත්‍රණයේ සෑම විස්තරයක්ම, එම කුමන්ත්‍රණයෙහි සියළුම සාමාජිකයන් දැන සිටීම අත්‍යාවශ්‍ය නොවන බවත් එසේම කුමන්ත්‍රණය සෘජු සාක්ෂි මගින් හා පරිවේෂණීය සාක්ෂි මගින් ඔප්පු කල හැකි බවත් කුමන්ත්‍රණයේ අරමුණ ඉටු වීම අපරාධය සම්පූර්ණ වීමට අත්‍යාවශ්‍ය නොවන බවටත් පෙන්වා දී ඇති ආකාරය අප ඉදිරියේ විභාග වූ මෙම නඩුවේ තීන්දුව සඳහාද සැළකිල්ලට ගතිමු.

එමෙන්ම අපගේ අභියාවනාධිකරණය විසින් ***Abdul Hameed Umar Hakthab vs Hon. Attorney General (CA/HCC 0178/2019) HC Anuradhapura Case No. 57/2010, 25/07/2024*** නඩුවේ දී සඳහන් කර ඇති

> *"The evidence clearly indicates that who the suicide bomber was and the appellant knew the suicide bomber for a considerable period before the incident. During the time that the suicide bomber was at පැ.සා.13's place, the expenses for travelling with the suicide bomber were borne by the appellant. The Government Analyst described the nature of the bomb blast, and it was such that it could affect many people's lives in the surroundings. The above*

evidence is sufficient to come to the conclusion that the appellant deliberately facilitated the assassination of Major General Janaka Perera, and the other persons died from the bomb blast." (page 20)

In the case of Queen Vs Liyanage and others (67 NLR 194) it was held that

"The essence of Conspiracy is the agreement to do the unlawful acts alleged; but it is not necessary that any act should in pursuance of the agreement. Whether a criminal act is done or not, the agreement, and not the act is what is penalized.

There must be proof against each conspirator that he had knowledge of the general purpose of the plot and the common design, though each need not be equally well informed of the details. Agreement, following upon intention, is enough is also of the essence of the conspiracy.

The conspiracy will persist so long as the conspirators remain in agreement, and so long as they are

acting in accord, in furtherance of the objects for which they entered into agreement.

The evidence in support of an indictment charging conspiracy is generally circumstantial. It is not necessary to prove any direct concert, or even any meeting of the conspirators, as the actual fact of conspiracy may be inferred from the collateral circumstances of the case.

යන කරුණු අප විසින් මෙම නඩුව සඳහාද අදාළ කර ගතිමු.

අප ඉදිරියේ විභාග වූ මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි මගින් මෙම නඩුවේ චූදිතයින් සියලු දෙනා 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 2 (1)ඌ වගන්තිය යටතේ වන්නා වූ ඉහත කී 01 චෝදනාවේ සඳහන් වන කුමන්ත්‍රණය සිදුකර ඇති බවට ඔප්පු කර තිබේද? යන්න සලකා බැලීමේ දී මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති ආරක්ෂිත නිවාස, පුහුණු කදවුරු සහ වැඩසටහන් සහ අවි පුහුණුම් සම්බන්ධ සාක්ෂි මෙන් ම ඔවුන් ස්වයංඝාතක බෝම්බකරුවන් වන සහාරාන්, හස්තූන් ඇතුළු පුද්ගලයින් සමග සංවිධානය වී කටයුතු කර ඇති ආකාරය, ඔවුන් ආරක්ෂිත නිවාස සූක්ෂම ලෙස තෝරාගෙන ඇති ආකාරය මෙන් ම පරත්ත පාර නස්මියා විලා වැනි

ආරක්ෂිත නිවාස තුල බෝම්බ සෑදීමට උපයොගී කරගන්නා පුපුරණ ද්‍රව්‍ය අත් හදා බැලීම් සහ පුපුරණ ද්‍රව්‍ය ඒකරාශි කිරීම් කර ඇති ආකාරය සම්බන්ධයෙන් මෙම තීන්දුවේ පෙර අවස්තාවල දී විස්තරාත්මකව සහ විශ්ලේශණාත්මකව කරුණු පෙන්වා දී ඇත. මෙම අධිකරණයේ දී පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද පරිවේශණීය සාක්ෂි තුලින් මෙම නඩුවේ චූදිතයින් එක් ජාලයක් ලෙස සිට කටයුතු කර ඇති අකාරය සහ ඔවුන් කටයුතු කර ඇති ආකාරය අනුව ඔවුන් අන්තවාදී අදහස් දරමින් අවි ආයුධ, පුපුරණ ද්‍රව්‍ය එක් රැස් කර ඇති ආකාරය මෙන් ම ඔවුන් බෝම්බ සෑදීම සදහා උපයෝගී කර ගෙන ඇති ද්‍රව්‍යයන් ආදිය තිබූ ආරක්ෂිත නිවාස වලට ඔවුන් සැබැවින්ම ගොස් ඇති බවට ඒවායේ නැවතී සිට ඇති බවට මෙම අධිකරණයේ ඉදිරිපත් වූ අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන්ගේ සාක්ෂි, රජයේ රස පරීක්ෂකවරුන්ගේ සාක්ෂි මඟින් මැනවින් සනාථ වී ඇත. එකී පසුබිම තුළ මෙම නඩුවෙහි චූදිතයින්ගේ වරදකාරීත්වය අප විසින් තීරණය කළ යුතු වේ. සමස්ථයක් ලෙස ගෙන බැලීමේදී අපහට පෙනී යන්නේ මෙම නඩුවෙහි චූදිතයන් අතුරින් සැළකිය යුතු පිරිසක් පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාර මාලාව හා සම්බන්ධ සාපරාධී කුමන්ත්‍රණයට දායක වී ඇති බවයි. කෙසේ වුවත් මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි සියල්ල මනාව විශ්ලේශණය කර බැලීමේ දී මෙම පලමුවන චෝදනාව වන කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව සදහා

1,2,3,4,5,6,7,8,9,10,11,15,16,18 සහ 19 වූදිතයින් හට පමණක් එරෙහිව සාක්ෂි ඉදිරිපත් වී ඇති බවය.

2, 3, 4, 5, 6, 7, 8 චෝදනාවන් වන අධිශික්ෂණය කිරීමේ චෝදනාව 1, 3, 4, 5, 9, 10, 14, වන වූදිතයන්ට එරෙහිව පමණක් ඉදිරිපත් කර ඇති චෝදනාවන් වේ. ඒ අනුව එකී වූදිතයින් අධිශික්ෂණය කිරීමේ වරද වන අතර ඒ අනුව ඉහත පළමුවන චෝදනාවේ සඳහන් කාලසීමාව තුළදී සහ එකී ක්‍රියා කලාපයේදී අනුරාධපුර, රඹෑව, මල්වාන, මහනුවර, නුවරඑළිය, හම්බන්තොට යන ප්‍රදේශවලදී එකී 01, 03, 04, 05, 09, 10, 14 වූදිතයින් විසින් කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘශ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන්, එනම් අන්තවාදී මත වාද හෝ ජන කොටස් හෝ වර්ගයන් හෝ ආගම් අතර ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කරන මතවාද ප්‍රචාරය කර, අධිශික්ෂණය, (Indoctrination) ලබා ගැනීමෙන් හෝ අවි පුහුණුව ලබා දීමෙන් හෝ බෝම්බ පුපුරුවා හැර හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකර සාහසික ක්‍රියාවන් හෝ විවිධ ජනකොටස් හෝ වාර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර, ආගමික හෝ වාර්ගීය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ ක්‍රියාවන් සිදු කිරීමේ වරද සිදු කිරීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පණත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ

(තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඌ) සමඟ කියවිය යුතු 2 (2) (ii) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදුකල බවට වේ.

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව සහ මෙම අධිකරණයේ සාක්ෂි ලබාදුන් ජවුෆර් සාදික් යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අනුව මෙම නඩුවෙහි 1, 4, 9 චූදිතයින් නුවරඑළියේ පැවති වැඩමුළුවේ මෙන්ම මහනුවර, හම්බන්තොට ප්‍රදේශවල පැවති වැඩමුළුවලදී පවත්වන ලද දේශනාවන් තුළින් අධිශික්ෂණය ලබා දීම මෙන්ම අවි පුහුණුව මෙන්ම ඔවුන් පැවසූ වචන මගින් අන්තවාදී මතවාද මෙන්ම ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කරන මතවාද ප්‍රචාරය කර එම වැඩසටහන් වලට සහභාගී වූ පුද්ගලයන්ව අධිශික්ෂණය කිරීමක් සිදුකර ඇති බව මැනවින් පෙනී යයි.

මෙම නඩුවෙහි සාක්ෂි ලබා දුන් පැ. සා. 1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියේදී පැහැදිලිව සඳහන් කර ඇත්තේ, 2018 අප්‍රේල්/මැයි කාලසීමාවේ නුවරඑළියේ ශාන්තිපුර, ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ ප්‍රධානත්වයෙන් පැවැති පුහුණු වැඩමුළුවකදී ප්‍රහාරාත්මක ජිහාද් සංකල්පයන් මෙන්ම එසේම, ISIS අයිඑස් අයිඑස් කියන එකට යටත්ව ලංකාව තුළද, ලංකාවත් ISIS අයිඑස් අයිඑස් එකට යටත් වූ රාජ්‍යයක් හැටියට භාවිතා කරන බවට ශ්‍රී ලංකාවත්

ඉස්ලාමීය රාජ්‍යයක් ලෙස සලකන බවට එම ප්‍රතිඥාව ලබා දුන් බවත් සාක්ෂිකරු පවසා ඇත. නුවරඑළියේ පැවැති වැඩමුළුවේදී ජිහාද් සම්බන්ධයෙන් දේශනා කරන විට ආයුධ සන්නද්ධව සටන් කිරීම් කළ යුතු බවට 01 චූදිත තම දේශනයේදී සඳහන් කරන ලද බවට ඉහත කී සාක්ෂිකරු පැහැදිලිව සඳහන් කර ඇති ආකාරය අප නිරීක්ෂණය කරමු.

නුවරඑළියේ වැඩමුළුවේදී 01 වන චූදිත නවුෆර් මවුලවි විසින් පැවැත් වූ දේශනාවලදී ISIS මතවාද ප්‍රචාරණය කර ශ්‍රී ලංකාව ISIS පාලනයට යටත් බවට පත් කළ යුතු බවට ආදී වශයෙන් දේශනා පැවැත්වූ බවට පැ.සා.1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් මැනවින් කරුණු හෙළි වී ඇති පසුබිම තුළ ඉහත කී 01 චූදිත ඔහුට එරෙහිව ඇති චෝදනා පත්‍රයේ සඳහන් 02 වන චෝදනාවේ සඳහන් වරද සිදුකර ඇති බවට මැනවින් පැහැදිලි වේ. එම 02 වන චෝදනාවේ සඳහන් ක්‍රියාවන් වන කියනු ලබන හෝ කියවීමට අදහස් කරනු ලැබූ වචන මඟින් හෝ දෘශ්‍ය නියෝජන මඟින් හෝ අන්‍යාකාරයෙන් අන්තවාදී මතවාද හෝ ආගම් අතර ආගමික හෝ වාර්ගිය හෝ ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කරන මතවාද හෝ ප්‍රචාරය කිරීම යන ක්‍රියාවන් වලින් එක් ක්‍රියාවක් පමණක් සිදුකර තිබීම මෙම චෝදනාව ඔප්පු කිරීම සඳහා ප්‍රමාණවත් වේ. ඒ අනුව ඉහත කී පැ.සා.1400 අනස්ගේ සාක්ෂියට අනුව නුවරඑළිය වැඩමුළුවේදී 01 චූදිත නවුෆර් විසින් ඔහුගේ දේශනාවලදී පවසා ඇති වචන මගින් ඔහු විසින් දරන ලද අන්තවාදී, ජාතිවාදී මතයන් එම

වැඩමුළුවට සහභාගී වූ පිරිසට දේශනා කර ඔවුන් ඒවා ඔවුන්ගේ සිත්වල ජාතිවාදී අසංගතිය හෝ දුර්චේතනික හේ එදිරිවාදී හැඟීම් ඇතිවීමට අදහස් කරන ක්‍රියාවන් සැබවින්ම සිදුකර ඇති බව පෙනී යයි. තවද පැ.සා.1400 අනස් සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව නුවරඑළියේ පැවති එම වැඩමුළුව 2018 වසරේ අප්‍රේල් හෝ මැයි මාසයේදී පැවැත්වූ බවට පවසා සාක්ෂි ලබා දී ඇති පසුබිම තුළ මෙන්ම පැ.803A2(10) ලෙස ලකුණු කර ඇති 01 වූදිත විසින් සහකාර පොලිස් අධිකාරීවරයා හට ලබා දී ඇති පාපෝච්ඡාරණයෙහි සඳහන් කර ඇති කරුණට තමා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින දෙකක වැඩමුළු පැවැත්වූ බව සහ එම එක් එක් කඳවුර සඳහා 15 ක් 20 ක් දෙනෙකු සහභාගී වූ බවද තමාද එම වැඩමුළුවලදී දේශනා පැවැත්වූ බව සහ අයි. එස් සංවිධානයට අදාළ වීඩියෝ දර්ශන පෙන්වමින් එලෙස දේශන පැවැත්වූ බවට සඳහන් කර ඇති පසුබිම තුළ මෙම 02 වන චෝදනාවේ සඳහන් කර ඇති 01 වන චෝදනාවේ සඳහන් කාල සීමාව තුළ දී එම ක්‍රියාවන් සිදුකරන ලද බවට වන බැවින් සහ පැ.සා.1400 අනස්ගේ සාක්ෂියට අනුව හම්බන්තොට ප්‍රදේශයේ පැවති එවැනිම පුහුණු වැඩමුළුවකට මෙම 01 වන වූදිත නවුෆර් මව්ලවිද ද සහභාගී වූ බව සහ 01 වූදිත දේශනයක් පැවැත්වූ බවද, ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් සහ මෙම 01 වූදිත විසින් සම්පත් දායකයන් ලෙස මෙම වැඩමුළුවේදී දේශන පැවැත්වූ බවට මෙම

සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුළ මෙම වැඩමුළුව පැවැත්වුනේද 2018 සැප්තැම්බර් මාසයේ බවට අනස් නැමැති සාක්ෂිකරු පවසා ඇති පසුබිම තුළ එම වැඩමුළුවටද ඉස්ලාම් ආගම අදහන සිසුන් 10 දෙනෙකු පමණ සහභාගී වූ බවද සාක්ෂිකරු පවසා ඇති අතර එම වැඩමුළුව ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ මූලිකත්වයෙන් පවත්වා ඇති පසුබිම තුළ එම වැඩමුළුව හුදෙක් සාමාන්‍ය වැඩමුළුවක් නොවන බව පෙනී යන අතර එම වැඩමුළුව පැවැත්වූ ස්ථානයට ටී 56 වර්ගයේ ආයුධයක්ද තිබුණු බව පැ.සා.1400 අනස්ගේ සාක්ෂියෙන් හෙළිවන පසුබිම තුළ පෙනී යන්නේ හම්බන්තොටදී පවත්වා ඇති වැඩමුළුව සඳහා ටී 56 ගිනිඅවියක්ද උපයෝගී කරගෙන ඇති බවයි. එහිදී ද පළමු චෝදනාව 2017 නොවැම්බර් 01 සිට 2019 අප්‍රේල් 21 යන කාල සීමාවන් සඳහන් කර ඇති බැවින් ද හම්බන්තොට අධිශික්ෂණ වැඩමුළුව පවත්වා ඇත්තේ 2018 සැප්තැම්බර් මස බවට පැ.සා.1400 අනස් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය තුළින් හෙළිවීම තුළින්ද 01 වූදිත විසින් 02 චෝදනාවේ සඳහන් අධිශික්ෂණය කිරීමේ වරද එකී කාලසීමාව තුළ දී සිදු කර ඇති බවට සනාථ වී ඇත.

ඉහත කී 03 වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ 03 වන වූදිත වන හයාතු මොහොමදු අහමදු මිල්හාන් හෙවත් අබුසිලා යන අයට එරෙහිව පමණක් වන අතර, ඉහත පරිදිම 2018 අප්‍රේල් හෝ මැයි මාසය තුළ නුවරඑළියේ පැවැති පුහුණු වැඩමුළුවේදී මිල්හාන් නොහොත් අබුසිලා

විසින් ටී.56 රයිපල් සහ 9 MM ආයුධ හඳුන්වා දෙමින් ඒවා අත්හදා බැලීමට පැමිණ සිටි තරුණ පිරිසව දැනුවත් කර ඇති බවට සඳහන් කර ඇති අතර, ආයුධ ඉලක්ක කරන්නේ කෙසේද යන්න ගැන ඔහු විසින් ඉගැන්වූ බව සහ එසේම 9 MM ආයුධ ගලවා සවිකිරීම පුහුණු කළ බවට ද එම අනස් නැමැති සාක්ෂිකරු විසින් පවසා ඇති අතර, එම සාක්ෂිකරුට අනුව නුවරඑළියේ පැවැති එම වැඩමුළුවෙහි මිල්හාන් නමින් සිටියේ එක් තැනැත්තෙකු පමණක් බවත්, එම තැනැත්තාට සහරාන් විසින් අබුසිලා යන නම ප්‍රදානය කරන ලද බවත් වන අතර, ඉහත කී අනස් නැමැති සාක්ෂිකරුට වසර 07 කට පමණ පසු විවෘත අධිකරණයේදී සාක්ෂි ලබා දීමේදී ඔහුට කල්ගත වී ඇති නිසා මිල්හාන් නැමැත්තාව හඳුනා ගැනීමට අපහසු බවට සඳහන් කර ඇතද, නුවරඑළියේ වැඩමුළුවට සහභාගී වූයේ මිල්හාන්ලා එක් අයෙකු පමණක් බවටද පවසා ඇති පසුබිම තුළ සහ මෙම නඩුවෙහි 01 වූදිත මොහොම්මදු ඊබ්‍රාහීම් මොහොම්මදු නවුෆර් යන අයගේ පැ.803 A (2) දරන පාපොච්චාරණයෙහිද එම නුවරඑළිය වැඩමුළුව සඳහා මිල්හාන්ද සහභාගී වූ බව පවසා ඇති අතර ඒ අනුව එම කරුණ පැ.සා.1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන් තවදුරටත් තහවුරු වී ඇත. තවද 01 වූදිතගේ පැ.803 A (2) දරන පාපොච්චාරණයෙහිද 01 වූදිත අනුරාධපුර සාෆි මව්ලවිගේ නිවසේදී IS සංවිධානය වෙනුවෙන් දිවුරුම් දුන් අවස්ථාවේ එම ස්ථානයට මිල්හාන් නැමැත්තාද පැමිණි බව සඳහන් කර ඇති පසුබිම තුළ ද IS සංවිධානය යනු අන්තවාදී කටයුතු සිදු කරන, ජාත්‍යන්තර

වශයෙන් තහනම් කර ඇති සංවිධානයක් වන පසුබිම තුළ 03 වන චූදිත මිල්හාන් නැමැත්තා එලෙස අනුරාධපුර මෙන්ම නුවරඑළිය සහ හම්බන්තොට ප්‍රදේශවලටද මෙලෙස අධිශික්ෂණ ක්‍රියාකාරකම් සඳහා ගොස් ඇති බව මැනවින් සනාථ වී ඇත.

ඉහකී 4,5, 9 චූදිතයින් 2018 දෙසැම්බර් මස මාවනෙල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ පිහිටි තව්හිද් පල්ලියේ දී තරුණයන් 40 කට අන්තවාදී දේශණ කල බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැසා.1401 ජවුෆර් සාධික් නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය තුලින් හෙලි වූ අතර එම වැඩමුළුව සංවිධානය කලේ 4,5 චූදිතයින් බව සාක්ෂිකරු පවසා ඇත. ඒ අනුව 4,5,6, චෝදනාවන් සනාත වී ඇත.

7 චෝදනාව 10 චූදිත ට එරෙහිව ඉදිරිපත් වී ඇති අතර ඔහු ද නුවර එළිය, සිප්පිකුලම් හම්බන්තොට වැඩමුළු වලට සහභාගි වූ බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එකී සාක්ෂි අප විසින් මෙම තීන්දුවේ ඉහත දී විස්තරාත්මකව සඳහන් කර ඇත. අවස්තාවක ඒ අනුව 7 චෝදනාව ද චෝදනාව ද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇත.

8 චෝදනාව මෙම නඩුවේ 14 චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති අතර මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් කිසිදු සාක්ෂි කරුවෙකු ගෙන් ඔහු චෝදිත වරද කරන ලද බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

9 චෝදනාව ඉදිරිපත් වී ඇත්තේ 8 චූදිත පිරිදවුස් හට එරෙහිව වේ. මෙම අධිකරණයේ ඉදිරිපත් වූ අනෙකුත් සාක්ෂි අනුව මෙන් ම 18 චූදිත වන රාසික් රාසා හුසේන් විසින් ලබා දී ඇති පාපොච්චාරණයේ අඩංගු කරුණු මගින් හෙලි වී ඇති කරුණු මගින් ද කාත්තාන්කුඩිය -ඔල්ලිකුලම දී මෙම 8 වන චූදිත පිරිදවුස් නැමැත්තා දැනට මියගොස් සිටින රිල්වාන් නොහොත් අබු කිතල් නැමැත්තා සමග පිපිරුම් උපක්‍රමයක් පුපුරුවාහැර අත් හදා බල ඇති බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති බව අප තීරණය කරමු.

10 චෝදනාව 02 චූදිත මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බෙ නොහොත් ගපූර් මාමාට එරෙහිව ඉදිරිපත්ට් කර ඇති අතර 02 චූදිත ගපූර් මාමා සහ 04 චූදිත සාදික් අබ්දුල්ලා විසින් මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් යන අය කාත්තන්කුඩිය ඔල්ලිකුලම දී පිපුරුම් උපක්‍රමයක් පුපුරුවා හැර අත්හදා බැලීමෙන් තුවාල වීමට ලක් වූ පසු රිල්වාන් යන අයගේ අනන්‍යතාවය හෙලි නොවන පරිදි ඔහුව කොළඹ ජාතික රෝහලට 04 චූදිතගේ බාල සහෝදරයා වන එම්.අයි. සාහිඩ් නැමත්තාගේ නම සැබෑ තුවාලකරු වන රිල්වාන් යන නම වෙනුවට කූට ලෙස සඳහන් කරමින් සහ එකී රිල්වාන් හෙවත් අබු කිතල් නැමැත්තා පදිංචිව සිටි කාත්තංකුඩි ලිපිනය සඟවමින් ඒ වෙනුවට 04 චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයගේ මාවනැල්ල දෙල්ගහගොඩ නැමැති ප්‍රදේශයේ පිහිටි පිහිටි ලිපිනය සඳහන් කරමින් ඇතුළත් කර ඇති අතර ඒ බවට පැ.876

ලෙස පැමිණිල්ලෙන් ලකුණු කර ඇති රෝගියා කොළඹ ජාතික රෝහලට රෝහලට ඇතුල් කිරීමට අදාළ වෛද්‍ය ලේඛන මගින් පෙනී යන අතර රිල්වාන් යන තුවාලකරුව එලෙස කොළඹ ජාතික රෝහලට ඇතුල් කිරීමේ දී භාරකරුගේ දුරකථන අංකය ලෙසට ලබා දී ඇති ජංගම දුරකථන අංකය 04 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලාගේ බවට පැ.සා.1379 අරුණි මෙනකා ප්‍රනාන්දු යන හෙදියගේ සාක්ෂියෙන් සනාථ වේ. එසේම රිල්වාන් නැමත්තාගේ නම සාහිඩ් ලෙස සඳහන් කර රෝගියාව රෝහලට බාර දී ඇත්තේ 02 වූදිත වන ගපූර් මාමා විසින්ම බවට රජයේ ප්‍රශ්නගත ලේඛන පිළිබඳ පරීක්ෂක විසින් ලබා දුන් සාක්ෂියෙන් මනාව හෙලි වී ඇත. එසේම රිල්වාන් විසින් එලෙස පිපුරුම් උපක්‍රමයක් පුපුරුවා හැර අත්හදා බැලූ බවට 11 වන වූදිත කාලිද් සමීර් යන අයගේ පැ. 168 දරන පාපෝච්චාරණ මගින් ද සනාථ වී ඇත. එසේම 04 වන වූදිත සාදික් අබ්දුල්ලා විසින් ඔහුගේ සහෝදරයා වන සාහිඩ් යන අයගේ නම සඳහන් කරමින් 2018.08.27 දින කොළඹ ජාතික රෝහලේ අංක 59 වාට්ටුවට ඇතුළත් කර ඇති තැනැත්තා සැබැවින් ම සාහිඩ් නොව කොළඹ ශැංග්‍රීලා හෝටලයේ දී 2019-4-21 දින උදයේ මරාගෙන මැරෙන බෝම්බයක් පුපුරවා හරිමින් මිනිස් ජීවිත් විශාල ප්‍රමාණයක් බිලිගත් ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන්ගේ සහෝදරයෙක් වන රිල්වාන් නැමත්තාම බවට පැමිණිල්ලෙන් ලකුණු කරන ලද ඡායාරූප මගින් මැනැවින් සනාත වී ඇත. ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන්

භෞතික චිකිත්සකවරියගේ සාක්ෂියෙන් සහ වෛද්‍ය බන්දුතිලක යන සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ද මනාව සනාථ වී ඇත.

තව ද 04 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා පදිංචි වී සිට ඇත්තේ මාවනැල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ වන අතර එකී පසුබිම තුල නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් බල ප්‍රදේශයේ පිහිටි කාතාන්කුඩි ප්‍රදේශයේ පදිංචි වී සිට ඇති ස්වයංසාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමත්තාගේ සහෝදරයෙකු වන රිල්වාන් නැමැත්තා පිපිරුම් උපක්‍රමයක් අත් හදා බැලීමේ දී පිපිරීම හෙතුකොටගෙන තුවාල වීමට ලක් වී තිබිය දී එම කරුණ වසන් කර හුදෙක් ගෑස් සිලින්ඩරයක් පිපිරී තුවාල වී ඇති බවට සදහන් කරමින් ඔහුගේ සැබෑ අනන්‍යතාවය වසන් කර කොළඹ ජාතික රෝහලට ඇතුල් කිරීම තුළින් ම 04 වූදිත හට එකී රිල්වාන් නැමත්තා සමග තිබූ සම්බන්ධතාවය මනාව හෙලි වන අතර 04 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් ඔහුගේ විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ සදහන් කර ඇති පරිදි, තමා හුදෙක් මානුෂීය හේතූන් මත වයසක අයෙකු සමඟ පැමිණි තුවාලකරුවෙකුව කොළඹ ජාතික රෝහලට ඇතුල් කිරීම කල බවට සදහන් කරමින් කරන ලද ප්‍රකාශය කිසිසේත් විශ්වාසනීය නොවන බවට අපහට මැනැවින් පෙනී යයි.

තව ද 02 වූදිත වන මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බෙ නොහොත් ගපූර් මාමා නැමැත්තා ද 04 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා

සමග එක්ව කටයුතු කරමින් ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන්ගේ නැමත්තාගේ සහෝදරයෙකු වන රිල්වාන් නැමැත්තා ව එලෙස අසත්‍ය තොරතුරු ලබා දෙමින් කොළඹ ජාතික රෝහලට ඇතුල් කර ඇති ආකාරය පැ.876 ලෙස පැමිණිල්ලෙන් ලකුණු කර ඇති ලේඛනයේ 02 චූදිත ගපූර් මාමා දමිළ භාෂාවෙන් තබා ඇති අත්සන් මගින් මැනැවින් සනාථ වේ.

02 චූදිත වන මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බෙ නොහොත් ගපූර් මාමා නැමැත්තා 04 චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා පදිංචි මාවනැල්ල දෙල්ගහගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙක් නොවන අතර කොළඹ ශැංග්‍රිලා හෝටලයේ දී 2019-4-21 දින උදයේ මරාගෙන මැරෙන බෝම්බයක් පුපුරවා හරිමින් මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් බිලිගත් ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ සහෝදරයෙක් වන සෙයිනි නැමැත්තා විවාහ වී සිට ඇත්තේ 02 චූදිත වන මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බෙ නොහොත් ගපූර් මාමා නැමැත්තාගේ දියණියක සමග බවට මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.1030 මොහොමඩ් ෂරිෆ් මොහොමඩ් මුස්තකීම් යන අයගේ සාක්ෂියෙන් සනාත වී ඇති අතර ඒ අනුව 02 චූදිත වන මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බෙ නොහොත් ගපූර් මාමා නැමැත්තා සහ 04 චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා නැමත්තා යන දෙදෙනාම එක්ව මෙලෙස කූට ලෙස කටයුතු කරමින් මෙලෙස කොළඹ ජාතික රෝහලට ව්‍යාජ තොරතුරු ලබා දෙමින්

මරාගෙන මැරෙන ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමැත්තාගේ සහෝදරයෙකු වන රිල්වාන් නැමැත්තා කාත්තන්කුඩිය ඔල්ලිකුලම දී පිපුරුම් උපක්‍රමයක් පුපුරුවා හැර අත්හදා බැලීම කර ඇති අවස්ථාවේ ඔහුගේ අත් වලට සහ දෑස් වලට ද බරපතල තුවාල සිදු වී තිබිය දී එම කරුණ වසන් කර හුදෙක් ගෑස් සිලින්ඩරයක් පිපිරීම නිසා එලෙස තුවාල වූ බවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් කටයුතු කර ඇත්තේ එකී මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් හෙවත් අබු කිතල් හට සාහිඩ් යන නමින් රෝහල් ගතව සිටීමට ඉඩ සලස්වා ඔහුට රැකවරණය සැපයීම සිදුකර ඔහුව සැඟවීම සිදු කිරීම තුළින් එකී මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් හෙවත් අබු කිතල් එකී වරදට අල්ලා ගැනීම වැළැක්වීම සිදුකර ඇති බව මනාව පැහැදිලි වේ. ඒ අනුව 2 වූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති 10 චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇත. එසේම ඉහත සාක්ෂි අනුව 04 වූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අයට එරෙහිව ඉදිරිපත් කර ඇති 11 චෝදනාව ද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇත.

12, 13 චෝදනාවන් දැනට මියගොස් සිටින 17 වූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවන් වන අතර ඒවා ඒ අනුව ඉවත් කර ගෙන ඇත.

අධිචෝදනා පත්‍රයේ සඳහන් 14 වන චෝදනාව මෙම නඩුවේ 08 වන චූදිත වන අබ්දුල් මනාෆ් මොහොමඩ් පිරිදවුස් සහ දැනට මියගොස් සිටින මෙම නඩුවේ 17 වන චූදිතට සහ 18 වන චූදිත වන රාසික් රාසා හුසේයින්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවක් වන අතර එකී චෝදනාව පහත පරිදි වේ.

වර්ෂ 2018 අගෝස්තු මස 26 වන දින හෝ ඊට ආසන්න දිනයකදී පාළමුණේ හිදී ඉහත පළමුවන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේදී 08 වන චූදිත දැනට මියගොස් සිටින 17 වන චූදිත වන යාසිම්බාවා අබ්දුල් රවුෆ් හෙවත් යාසින්බාවා අබ්දුල් රවුෆ් සහ 18 වන චූදිත වන යුෂ්මතුන් පැමිණිල්ල නොදත් අන් අය සමඟ පුපුරණ ද්‍රව්‍ය, එනම් පැමිණිල්ල ප්‍රමාණය නොදත් ආර්.ඩී.එක්ස් (RDX) සහ ටී.එන්.ටී. (TNT) තොගයක් සහ පුපුරණ සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහිලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් එනම්, විද්‍යුත් පරිපථ, විදුලි කෝෂ සහ වයර් රෝල් නීත්‍යානුකූල බලයක් නොමැතිව එකතු කිරීමෙන් යුෂ්මතුන් දැනට මියගොස් සිටින යාසිම්බාවා අබ්දුල් රවුෆ් හෙවත් යාසින්බාවා අබ්දුල් රවුෆ් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඊ) වගන්තිය සමඟ

කියවිය යුතු 2 (2) (2) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය. මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව 08 වන චූදිත වන අබ්දුල් මනාප් මොහොමඩ් පිරිදවුස් සහ 18 වන චූදිත වන රාසික් රාසා හුසෙයින් යන චූදිතයින් දෙදෙනාගෙන්ම සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව හෙළි වූ කරුණු ප්‍රකාරව පැමිණිල්ල ප්‍රමාණය නොදත් ආර්.ඩී.එක්ස් (RDX) සහ ටී.එන්.ටී. (TNT) තොගයක් සහ පුපුරණ සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහිලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් එනම්, විද්‍යුත් පරිපථ, විදුලි කෝෂ සහ වයර් රෝල් සොයාගෙන තිබීම මෙන්ම ඒවා තිබූ ස්ථානය පිළිබඳව 8 සහ 18 චූදිතයින් දෙදෙනාටම තිබූ දැනුම අනුව ඒවා පොදු චේතනාවකින් යුතුව දැනට මියගොස් සිටින 17 වන චූදිත වන අබ්දුල් රවුෆ් නැමැත්තාගෙ ඉඩමෙහි ස්ථාන 07 ක වල දමා තිබී සොයාගෙන තිබීම සහ ඒවා තිබූ ස්ථානයන් 8 සහ 18 චූදිතයින් වෙන්වෙන්ව පෙන්වා දීම මත පොළව යට තිබී ඒවා සොයාගෙන තිබීම යන කරුණු එක්ව ගෙන සැළකිල්ලට ගැනීමේදී එලෙස ඉහත කී ද්‍රව්‍ය එකී ස්ථානයන්හි පොළව යට ආරක්ෂිතව තැබීමේ ක්‍රියාවලිය සිදු කර ඇත්තේ පොදු චේතනාවෙන් බවට පෙනී යන අතර, ඒ අනුව 14 වන චෝදනාව 8 සහ 18 චූදිතයින්ට එරෙහිව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති බවට අප තීරණය කරමු.

15 සහ 16 වන අධි චෝදනා 5 වන සහ 10 වන චූදිතයින්ට එරෙහිව ඔවුන් විසින් වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 16 වන දින හෝ ඊට ආසන්න දිනයක දී පාලමුණේ කිරිතෝනවත්ත හී දී ඉහත 01 වන චෝදනාවේ සඳහන් ක්‍රියා කලාපයේ දී පැමිණිල්ල නොදත් තැනැත්තන් විසින් අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියාවක් කිරීමට සූදානම් වීමක් වශයෙන් සිදු කරන ලද ක්‍රියාවක් එනම්, පාලමුණ-කිරිතෝනවත්ත දී WP BCQ 0304 දරන යතුරු පැදිය අධිබලැති පිපුරුම් උපක්‍රම මඟින් පුපුරුවා හැරීමෙන් 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1)(උ) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 3(අ) වගන්තිය යටතේ වරදක් සිදු කරන ලද බවද, එකී වරද සිදු කිරීමට අනුබල දුන් බැවින් එකී 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 3(ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබී යුතු වරදක් සිදු කළ බවයි.

මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට අනුයුක්තව සේවය කරන පොලිස් පරීක්ෂක රවි චන්ද්‍රන් (පැ.සා. 2007) ගේ සාක්ෂිය අනුව 2019.04.18 වන දින කාත්තන්කුඩි පොලිස් වසම තුළ පිහිටි පාළමුණේ කිරිතෝනා වත්ත නමින් හඳුන්වන මොහොමඩ් මුස්තාෆා හසනුල් බස්රි යන තැනැත්තෙකුට අයත් ඉඩමක්සල අපරාධ ස්තානයක් කාත්තන්කුඩි පොලිසියේ ස්ථානාධිපති කස්තුරිආරච්චි, විමර්ශන නිළධාරීන්

උ.පොා.පමොහොමඩ්, (පැ.සා.2306.), ඇතුලු නිළධාරීන් පරීක්ෂා කල බවත්, කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් දැනුම් දී තිබුනේ ගිනි තැබීමක් සිදු වූ බවට වුවද, එම ස්ථානය නිරීක්ෂණය කරන අවස්ථාවේ එහි තිබූ අමානෝ ෂීට් තහඩු විසි වී තිබූ බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීමේදී අන්ර්ථයකට ලක්වූ යතුරු පැදියක කොටස්, එනම්, යතුරු පැදියක හැඩල් 01 ක් සහිත ට්‍රිම් එකක් සහ යතුරු පැදියක කොළ සහ සුදු පැහැති ප්ලාස්ටික් කෑලි තැනින් තැන විසි වී තිබූ බවට තමාට නිරීක්ෂණය වූ බවත්, ඒ ස්ථානයේ යකඩ බෝල්ද විසි වී තිබූ බවත්, තමා විසින් නිරීක්ෂණය කරන ලද යතුරු පැදියේ කොටසේ එම් ME4JF396FF8007612 ලෙස චැසි අංකයක් නිරීක්ෂණය වූ බවටත් තමාගේ නිරීක්ෂණය අනුව යතුරු පැදියක සවිකර තිබූ බෝම්බයක් පිපිරී යාමෙන් එම අනර්ථය සිදුවී ඇති බවට පෙනී ගිය බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. කිසිදු විත්ති කරුවෙකු එම සාක්සිකරුව හරස් ප්‍රශණ වල ට භාජනය කර නොමැතිබැවින්,එම සාක්ෂිය අවිවාදාත්මකව ඉදිරිපත් පත් වී ඇත.

පොලිස් පරීක්ෂක මොහිදීන් මොහොමඩ් ජේසුලි (පැ.සා.2306) ගේ සාක්ෂිය අනුව 2019 අප්‍රේල් 17 වන දින යතුරු පැදියක් ගිනි තබා අනර්ථයක් සිදු කළ බවට ලද පැමිණිල්ලක් මත නිරීක්ෂණය කිරීම් සිදු කළ බවත්, එහිදී යතුරු පැදියක් පුපුරවා හැරීමක් සිදු කර ඇති බවට නිරීක්ෂණය වූ බවත්, ඉන් පසුව එම ස්ථානය අවට ආරක්ෂා කිරීම සඳහා පොා.කොා. 76624, පොා.කොා.79586 යන නිළධාරීන් යොදවා, පසු දින එනම්,

2019.04.18 වන දින එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා සොකෝ නිළධාරීන් කැඳවා තමාද එම ස්ථානයට පිටත් වූ බවත්, සිදු වූ යතුරුපැදි පිපිරීම පරීක්ෂා කර චැසි අංකය (ME4JF396FF8007612) අනාවරණය කරගත් බවත්, එම යතුරුපැදියේ කොටස් (පැ.1722) සහ පස් සාම්පල් (පැ.1723) මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, එම චැසි අංකය ඔස්සේ පරීක්ෂා කිරීමේදී එහි අංකය WP BAQ 0304 බවත් අන් අයෙකුට අයත් හැඳුනුම්පතක් භාවිතා කර මෙම යතුරුපැදිය මිලදී ගෙන ඇති බවට අනාවරණය කරගත් බවටත් සාක්ෂිලබා දෙන ලදී.

මෙම සාක්ෂිකාර පොලිස් පරීක්ෂක මොහිදීන් මහතාගේ සාක්ෂයේදී වැඩිදුරටත් අනාවරණය වන්නේ කියත සඳහන් චැසි අංකය සම්බන්ධයෙන් පොලිස්ථානාධිපතිවරයා හරහා දැනුදී එහි ලියාපදිංචි අයිතිකරු සම්බන්ධයෙන් සොයා බැලීමට කණ්ඩායමක් පත් කර බවත් එහිදී විමර්ශනය උප පොලිස් පරීක්ෂක විමල සිරි මගින් තොරතුරු ලබාගෙන ඒ චැසි අංකයට අදාළ ලියාපදිංචි අංකය වන BCQ 03040 දරන යතුරු පැදියේ ලියා පදිංචි අයිතිකාරිය නිල්මිනි ජයකොඩි නැමති අයකු බව අනාවරණය කරගත් බවටත් ඇය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමේදී ඇය එම යතුරු පැදිය ඉහත නම් සඳහන් සාක්ෂිකාරන්ත ප්‍රියන්ත පෙරේරා හරහා අනුසර මෝටස් නැමති ආයතනය හරහා විකුණා ඇති බවත් අනුසර මෝටර්ස් ආයතනය මගින් එය ජෙරාඩ් ජසස්ථීද සිල්වා යන අයෙකුට විකුණාත් බවට අනාවරණය කරුනුද ජෙරාඩ් යසස්ති ද සිල්වාගේ ප්‍රකාශය

අනුව ඔහුගේ මුදල් පසුම්බිය, රියදුරු බලපත්‍රය, ජාතික හැඳුණුම් පත සහ බැංකු කාඩ් පත් සමඟ නැතිවී ඇති බව අනාවරණය කළගත් බවටත් කියා සිටින ලද එම සාක්ෂියක්මය කොටස කිසිදු විත්තිකරුවෙකු විසින් හරස් ප්‍රශන වලට භාජනය කර නැතඅතර එබැවින් එම සාක්ෂිය අවිවාදාත්මක ඉදිරිපත් වී ඇත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1398 හසනුල් බස්රිගේ සාක්ෂි අනුව ඔහුට අයත් කාත්තන්කුඩිය පාලමුණේ කිරිකෝනා වත්තේ දී 2019.04.18 දින ස්කූටි වර්ගයේ යතුරු පැදියක් පුපුරා යාමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාත්තන්කුඩිය පොලිසියට පැමිණිලි කර ඇත.

මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලද නිලධාරින් විසින් එම යතුරු පැදිය ලියාපදිංචි අංකය අනාවරණය කරගෙන ඇති අතර, එම යතුරුපැදියේ ලියාපදිංචි අංක WP BCQ-0304 බවට අනාවරණය කරගෙන ඇති අතර එම අනාවරණය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමේ දී එම යතුරු පැදිය නිල්මිණි ජයකොඩි අයත් බවට අනාවරණය වී ඇත.

එම යතුරු පැදි අංකය ඔස්සේ පරීක්ෂණ පැවැත්වීමේදී එම යතුරුපැදිය නිල්මිණි ජයකොඩි සාක්ෂි දෙමින් ඇය විසින් එම අංක WP BCQ-0304 දරන යතුරු පැදිය පැ.සා.1395 තුෂාර ප්‍රියන්ත යන අය හරහා පැමිණිල්ලේ සාක්ෂි අංක 1396 අරුණ වික්‍රමසේකරට අයත් අනුසර මෝටර්ස් වෙත විකිණීම සඳහා ලබා දී ඇති බවඇයගේ සාක්ෂියෙන් අනාවරණය වේ.

අනුසර මෝටර්ස් හි අයිතිකරු වන පැ. සා.1396 අරුණ වික්‍රමසේකරගේ සාක්ෂියට අනුව ඔහු විසින් එම යතුරුපැදිය සහ තවත් යතුරුපැදියක් ඔහු විසින් 2019.04.19 පුද්ගලයන් දෙදෙනෙකුට පැ.978, පැ.979, පැ.980 යන ලේඛන මත විකුණා ඇත. ඒ අතුරින් පැ.978 හි සඳහන් බයිසිකලය වන එනම් විමර්ශනයේ දී අනාවරණය වී ඇති පුපුරා ගිය යතුරුපැදිය වන WP BCQ-0304 හි ගැනුම්කරු වශයෙන් වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී මුදල් පසුම්බිය නැතිවූ පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ ජාතික හැඳුනුම්පත් අංක 981460898V ලබා දී ඇති බව සාක්ෂිවලින් පෙනී යයි. මෙම සාක්ෂිකරුගෙන් හතරවන චූදිත වන ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා හරස් ප්‍රශ්න විමසන ලද අතර, පැ.981, පැ.982 ඡායාරූපවල සිටින පුද්ගලයා 2020.10.09 වන දින සිට රක්ෂණාගාරයේ සිටි බවත් ඔහුගේ ඡායාරූප 2020.11.26 වන දින හඳුනාගත් බවටත් දෙන ලද සාක්ෂි අසත්‍යක් බවට යෝජනා වූ අතර එම යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී. පස් වන චූදිත වන සාදික් අබ්දුල් හක් විසින්ද මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්නවලට භාජනය කර ඇති අතර, අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේදී දෙදෙනෙක් පෙන්වා ඔවුන්ගේ ඡායාරූපවලට අත්සන් ගත්තේය යන යෝජනාවා ප්‍රතික්ෂේප කර ඇති අතර තමාට බොරුවක් කීමට අවශ්‍යතාවයක් නොමැති බවද කියා සිටින ලදි. සාක්ෂිකරුව 09 වන චිත්තිකාර රමීෂ් මොහොමඩ් සාජිත් විසින් ද හරස් ප්‍රශ්න වලට භාජනය කර

ඇති අතර සාක්ෂිකරු විසින් බොරු සාක්ෂියක් ලබාදෙන බවක් හොඳ පරස්පර සාක්ෂියක් දෙන බවක් එකී හරස් ප්‍රශ්ණ වල්දී හෙලි නොවීය. එබැවින් එම සාක්ෂිය අපි පිලිගනිමු.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1397 ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ සාක්ෂියට අනුව ඔහුගේ මුදල් පසුම්බිය වර්ෂ 2018 මැයි 25 දින පුත්තලම පාලවිය ප්‍රදේශයේ දී නැතිවී ඇති අතර එය ඔහුට ආපසු හමුවී නොමැති අතර එම හැදුනුම්පත සහ විස්තර ඇතුලත් ඔහුගේ පසුම්බිය2020 ජනවාරි මස 24 වන දින අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් තමාගේ මුදල් පසුම්බිය හදුනාගත් බවත් කියා සිටින ලද අතර එය නාවලපිටියේ පුද්ගලයන් දෙදෙනෙකු ළඟ තිබී සොයාගත් බවත් තමාට දැනගන්නට ලැබුණු බවත් කියා සිටින ලදී.

මෙම නඩුවේ 04 වන සහ 05 වන විත්තිකරුවන් අත්අඩංගුවට ගත් අවස්ථාවේදී 05 වන විත්තිකරුගේ සන්තකයේ තිබී ඔවුන් අත්අඩංගුවට ගත් එවකට නාවල පිටිය පොලිසියේ ස්ථානාධිපතිව සිටි පොලිස් පරික්ෂක සුජීව ද සොයිසා (පැමිණිල්ලේ සාක්ෂි අංක 1897) විසින් තම භාරයට ගෙන ඇත. එහිදී හබ කිරීමට ඉදිරිපත කර ඇත්තේ 4වන සහ 5 වන චූදිතයින් අත් අඩංගුවට ගත් අවස්ථාවේදී එම මුදල් පසුම්බිය 05වන විත්තිකරු භාරයේ තිබුණු බවට වූ සටහනෙහි නාවලපිටිය සහ ගම්පොළ පොලීසිය වල ඇතුලත් කරන සටහන් අතර ඇති වෙනස්කම් කීහිපයකි.

නමුත් සුජීවද සිල්වාගේ සටහනයේදී ඔහු විසින් ඉතා පැහැදිලිව එම කාරනය පැහැදිලිකර දී ඇති අතර එමගින් සහකාර පොලිස් අධිකාරී සුජීව සොයිසා මහතාගේ සාක්ෂිය එනම් එහිදී හබ කිරීමට ඉදිරිපත කර ඇත්තේ 4වන සහ 5 වන චූදිතයින් අත් අඩංගුවට ගත් අවස්ථාවේදී එම මුදල් පසුම්බිය 05වන විත්තිකරු භාරයේ තිබුණු බවට වූ සටහනෙහි නාවලපිටිය සහ ගම්පොළ පොලීසිය වල ඇතුලත් කරන සටහන් අතර ඇති වෙනස්කම් කීහිපයකි. නමුත් සුජීවද සිල්වාගේ සටහනයේදී ඔහු විසින් ඉතා පැහැදිලිව එම කාරනය පැහැදිලිකර දී ඇති අතර එමගින් සහකාර පොලිස් අධිකාරී සුජීව සොයිසා මහතාගේ සාක්ෂිය එනම් ජෙරාඩ් යසස්ති ද සිල්වාගේ මුදල් පසුම්බිය 05 විත්තිකරු සන්තකයේ තිබී සොයාගත් බවට වූ කාරණය හබ වී නොමැති බවයි. එබැවින් එම සාක්ෂිය අපි පිලිගනිමු.

BCQ-0304 දරන බයිසිකලය මිලදී ගැනීම සම්බන්ධ සාක්ෂි විෂ්වාශනීයත්වයෙන් තොර බවටත් ඒව පිලිගත නොහැකි සාක්ෂිබවටත් එම සාක්ෂිමගින් තමාට විරුද්දව කිසිදු වරද්ක ඔපු කර නැති බව 5වන චුදිත විත්තිකූඩුවේ සිට කියා සිටියද එම ප්‍රකාශය පිලෙගන ඒ මත පැමිනිල්ලේ සාක්ෂිය ප්‍රතිකශේප කිරීමට තරම් එම ප්‍රකාශය ප්‍රබල නොවන බව අප තීරණය කරමු.

ඒ අනුව පෙනී යන්නේ පාලමුණේ කිරිකෝනාර් වත්තේ දී පුපුරවා හරින ලද WP මිලදි ගැනීම සඳහා වෙනත් පුද්ගලයෙකුට එනම් ජෙරාඩ් යසස්ති ද

සිල්වාගේ අයත් නැතිවූ හැඳුනුම්පතක් උපයෝගී කරගෙන ඇති බවත්, ජෙරාඩ් යසස්ති ද සිල්වාගේ මුදල් පසුම්බිය 05 විත්තිකරු සන්තකයේ තිබී සොයා ගැනීමත් හබයකින් තොරව මෙම අධිකරණය වෙතඉදිරිපත් වූ සාක්ෂි මගින් සනාත වී ඇති බවයි.

මේ සම්බන්ධයෙන් 05 වන විත්තිකාර මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල් හක් යන චූදිත විසින් අ න වි ස 127 වන වගන්තිය ප්‍රකාරව මහෙස්ත්‍රාත් වෙත කරනු ලද ප්‍රකාශයෙහි පැ.170 , (V) හි මෙසේ කියා ඇත,

“පැ. 170 - (v) සාහිඩ් මුදල් අරගෙන ආවා අපි දෙන්නා එඩේරමුල්ල බයික් සේල් එකට ගිහින් කොළ පාට බයික් එක දීලා සාහිඩ් ළඟ තිබූ සිංහල අයකුගේ හැඳුනුම්පතක් දීලා අලුතින් ස්කූටි බයික් 2 ක් ගත්තා.”

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තියේ යටතේ කරන ලද ප්‍රකාශයක එම තැනැත්තට එරෙහිව පමනක් එය භාවිතා කළ හැකිය.

තවද 09 වන විත්තිකරු විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16 (1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහි පහත කොටස ඇතුළත්ව ඇත, “සාහිඩ් මුදල් අරගෙන ආවා අපි දෙන්නා එඩේරමුල්ල බයික් සේල් එකට ගිහින් කොළ පාට බයික් එක දීලා සාහිඩ් ළඟ තිබූ සිංහල අයකුගේ හැඳුනුම්පතක් දීලා අලුතින් ස්කූටි බයික් 2 ක් ගත්තා.”

ත්‍රස්තවාදය වැලැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16 (1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහි යටතේ කරන ලද ප්‍රකාශයක නීතිමය අනුකූල භාවය නැතහොත් චෝදනා ලත් තැනැත්තකුට එරෙහිව එය භාවිතා කළ හැකි නෛතික තත්ත්වය පහත පරිදි වේ.එනම්16 (3) උප වගන්තිය යටතේ දක්වාඇත්තේ 16 (1) වන උපවගන්තිය යටතේ ආවේශ්‍ය වන යම් ප්‍රකාශයක් ඒ ප්‍රකාශය කළ තැනැත්තා සමග එක් ව චූදිත වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව ඔප්පු කරනු ලැබිය හැකි අතර, ඒ ප්‍රකාශය එසේ ඔප්පු කළ හැක්කේ (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශවලට අමතරව ඒ ප්‍රකාශයෙහි වූ වැදගත් විස්තර වෙනත් සාක්ෂිවලින් තහවුරු වුවහොත් සහ එසේ තහවුරු වුවහොත් ම පමණි. ඒ අනුව ඉහතින් දැක්වූ සියලු ස්වාදීන සාක්ෂි මගින් තවද 09 වන විත්තිකරු විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 16 (1) වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහිඉහතින් දකවා ඇති කොටස සනාත කර ඇති බව පඅප තීරණය කරමු.

මේ සම්බන්ධයෙන් පැමිණිල්ලේ සාක්ෂි අංක1440 රජයේ රස පරීක්ෂක කුෂාන් ප්‍රනාන්දු මහතා විසින් මෙම සිදුවීමට අදාළ පිටු 3 කින් යුත් රස පරීක්ෂක වාර්තාව (JE/404/21, CE/641/19, මඩකලපුව B397/19) පැ.1856 ලෙසලෙස ලකුණු කරන ලද අතර වැඩිදුරටත් සාක්ෂිකරු පවසා ඇත්තේ, මඩකලපුව පාලමුණේ කිරිතෝන වත්තේ යතුරුපැදියක තබා පුපුරුවා හරින ලද බෝම්බය සම්බන්ධයෙන් කළ පරීක්ෂණයේදී, සොයා

ගන්නා ලද වක්‍රාකාර ලෝහ දණ්ඩ හානියට පත් නොවූ හොන්ඩා ඩියෝ (EPBHI 2961) යතුරුපැදියේ පිටුපස අසුනට පහළින් වූ ප්‍රධාන රාමු කොටසට අනුරූප වන බවත්, රියදුරු අසුනට පහළින් යූරියා නයිට්‍රේට් සහ මිලිමීටර් 6.2 ලෝහ බෝල යොදාගෙන සාදන ලද බෝම්බයක් පිටතට විහිදී යන සේ පුපුරුවා හැර ඇති බවත් තහවුරු වූ බවයි.

ඒ අනුව පෙනි යන්නේ 05 වන චූදිත විසින් ඉහත සඳහන් සාක්ෂිකාර ඇතීගේ ජෙරාඩ් යසස්ති සිල්වාගේ නැතිවූ හැඳුනුම්පත භාවිතා කර මිළදි ගන්නා ලද WP BCQ-0304 දරන යතුරු පැදිය පාලමුනේ කිරිතෝනාවත්තේ දී 2019.04.16 වන දින රාත්‍රී යේදී පිපුරුම් අත්හදා බැලීමකට යොදා ගෙන ඇති බව පැමිනිල්ල් විසින් සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇතිබවයි.

එබැවින් ඉහත කී සාක්ෂි මත 05 වන චූදිතට එරෙහිව ඉහත දක්වන ලද 15 වන චෝදනාව පැමිණිල්ල විසින්සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇති බව අප තීරණය කරමු.

කෙසේ වුවද 16 වන චෝදනාව 10 වන චූදිතට එරෙහිව එම සිද්ධිය සම්බන්ධයෙන්ම ඉදිරිපත් කර තිබුණද මෙම ඉදිරිපත් වූ කිසිදු සාක්ෂියකින් 10 වන චූදිතට එරෙහිව ඔහු විසින් එම 16 වන චෝදනාවේ සඳහන් වරද කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වි නොමැති බව අපගේ පිළිගැනිමයි. එබැවින් පැමිණිල්ල විසින් 10 වන චූදිත ට එරෙහිව අධි චෝදනා පත්‍ර යේ

සඳහන් 16 වන චෝදනාව සාධාරණ සැකයෙන් තොරව සනාථ කිරීමට අපොහොසත් වී ඇති බව අප තීරණය කරමු.

පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, බෝම්බ පුපුරුවා හැරීම ඇතුළු වැරදි

1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (ඊ) වගන්තියට අනුව යම් තුවක්කු

පීඩාකාරී ආයුධ

වෙඩි බෙහෙත් හෝ පුපුරණ ද්‍රව්‍ය

නැතහොත් පුපුරණ ද්‍රව්‍ය

නිෂ්පාදනය කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩය හෝ දෙයක් හෝ නීත්‍යානුකූල බලයක් නොමැතිව

ආනයනය කරන්නා වූ

නිෂ්පාදනය කරන්නා වූ හෝ

එකතු කරන්නා වූ හෝ ක්‍රියාවක් වරදක් වන බවට දක්වා ඇත.

එසේම 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2 (1) (උ) වගන්තියට අනුව

යම් ආරක්ෂිත ප්‍රදේශයක් තුළ නීත්‍යානුකූල බලයක් නොමැති ව

යම් තුවක්කු හෝ

යම් පීඩාකාරී ආයුධ,

වෙඩි බෙහෙත් හෝ

පුපුරණ ද්‍රව්‍ය නැතහොත් පුපුරණ ද්‍රව්‍ය

නිෂ්පාදනය කිරීමෙහිලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් සන්තකව සිටීම වරදක් බවට පෙන්වා දී ඇත.

17 වන අධි චෝදනාව 16 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇත. එනම් ඔහු විසින් වර්ෂ 2019 ක් වූ මාර්තු මස 01 වන දින හා වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 06 වන දින අතර කාලපරිච්ඡේදය තුල නාරම්මල හීදි ඉහත පළවන චෝදනාවේ සඳහන් ක්‍රියාකලාපයේ දී පුපුරණ ද්‍රව්‍ය එනම්, පැමිණිල්ල ප්‍රමාණය නොදත් ජීව උණ්ඩ හා ජෙලිටි නයිටි කූරු තොගයක් සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේහි ලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ

දෙයක් එනම්, පැමිණිල්ල ප්‍රමාණය නොදත් ඩෙටනේටර් සහ සේවා නූල් (ඩෙට් කෝඩ්) ප්‍රමාණයක් නීත්‍යානුකූල බලයක් නොමැතිව එකතු කිරීමෙන් යුෂ්මතා 1982 අංක 10 සහ 1988 අංක 22 දරන පනත් වලින් සංශෝධිත 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 2(1)(ඊ) වගන්තිය සමඟ කියවිය යුතු 2(2)(ii) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

මෙම නඩු විභාගයේදී සාක්ෂි මගින් අනාවරණය වූ ප්‍රධානතම කරුණක් වන්නේ 2019 වසරේ පාස්කු ප්‍රහාර මාලාවේ පිපිරුම් උපක්‍රම සඳහා එක සමාන පිපිරුම් ද්‍රව්‍ය භාවිතා කර ඇති බවයි. විශේෂයෙන්ම මෙම තීන්දුවේ පෙර පෙර අවස්තාවල සාක්ෂි විශ්ලේශ්ණය කිරීමේ දී අප විසින් සඳහන් කර ඇති පරිදි මෙම අධිකරණයේදී සාක්ෂි දුන් රජයේ රස පරීක්ෂකවරුන් සහ පුපුරන ද්‍රව්‍ය හා ගිනි ආවරණ සම්බන්ධ සියලුම සාක්ෂිකරුවන් කියා සිටියේ, පිපිරුම් උපක්‍රමය වැඩිදියුණු කළ පිපිරුම් උපක්‍රමයක් ලෙස සාමාන්‍ය ඩෙටනේටර් විද්‍යුත් ඩෙටනේටර් බවට පත් කර සකස් කර ඇති බවයි. මේ සඳහා කළුගල් කැඩීමට භාවිතා කරන වෝටර්ජෙල් නමැති පිපුරුම් කාරකය භාවිතා කර ඇති බව පාස්කු ප්‍රහාරයෙන් පසුව පිපිරුම් ස්ථානවලින් සොයාගත් ශේෂයන් සහ විශේෂයෙන්ම සයින්දමරුදු ප්‍රදේශයේදී සොයාගන්නා ලද ඉතිරි වී තිබූ වෝටර්ජෙල් කරල් ආශ්‍රයෙන් අනාවරණය වී ඇත.

එහිදී මෙම වෝටර්ජෙල් මිලදී ගැනීම සම්බන්ධයෙන් 16 වන චූදිතගේ ක්‍රියාකලාපය පිළිබඳව පැමිණිල්ලේ සාක්ෂිකරුවන් වන තාජුදීන් මොහොමඩ් නිහාර් (පැ.සා. 1369) සහ නිමල් ජයකොඩි (පැ.සා. 1370) විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. 2019.02.06 වන දින ඉහත සඳහන් ජේ.ඒ.ඩී. නිමල් ජයකොඩි යන තැනැත්තාට සේවානුල් මීටර් 500ක් (කැරලි 50ක්), සාමාන්‍ය ඩෙටනේටර්ස් 150ක් , ඇමෝනියම් නයිට්‍රේට් කිලෝ 75ක් සහ වෝටර්ජෙල් කිලෝ 15ක් (අංක **W28866**) අලෙවි කර ඇති බවත්, එමෙන්ම **2019/03/02** දිනද එම අය වෙත සාමාන්‍ය ඩෙටොනේටර්ස් 150ක් සහ ඇමෝනියම් නයිට්‍රේට් කිලෝ 75ක් සහ වෝටර් ජෙල් කිලෝ 15ක් (අංක **30578**) අලෙවි කර ඇති බවත්, ඉන්පසු **2019/03/08** දිනද වෝටර් ජෙල් කිලෝ 15 ක් (වෝටර්ජෙල් අංක **30568**) විකුණා ඇති බවටත් සාක්ෂි ලබා දී ඇත.

නිමල් ජයකොඩි විසින් මිලදී ගන්නා ලද වෝටර්ජෙල් කරල් ප්‍රමාණයෙන් කොටසක් සලීම් ආයතනයේ ඉතිරි වී ඇති බවට වූ කාරණය මත, එම ඉතිරි වූ වෝටර්ජෙල් වෙනත් පුද්ගලයෙකු ලබා ගත්තේ ද යන්න පිළිබඳව සැකයක් මතු කිරීමට විත්තිය උත්සාහ දරා ඇත. නමුත් එම සැකය ඉවත් කරමින් පැමිණිල්ලේ සාක්ෂි අංක 137 වන ඉසදීන් මොහොමඩ් ජියුසුෆ් සාක්ෂි දෙමින් කියා සිටියේ 2019 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් කාලයේදී අවස්ථා හතරකදී 16 වන චූදිත වන හරිස්කාන්ට වෝටර්ජෙල් කරල් 850ක්, ඩෙටනේටර් 1700ක් (හෝ 1800ක්) සහ සේවානුල් රෝල්

6ක් හෝ 7ක් විකුණූ බවයි. පැමිණිල්ලේ සාක්ෂිකාර ඉසදීන් මොහොමඩ් ජියුසුෆ්ගෙන් 11 වන සහ 16 වන චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී, තමාගේ මූලික සාක්ෂිය තහවුරු කරමින් 16 වන චූදිත අවස්ථා හතරකදී තමාගේ නිවසට පැමිණ මෙම භාණ්ඩ රැගෙන ගිය බව ප්‍රකාශ කර ඇත.

එම සාක්ෂිකරුගේ සාක්ෂිය අධිකරණය ඉදිරියේ දිවුරුම් පිට ලබා දී ඇති අතර, ඔහු අසත්‍ය සාක්ෂියක් දුන් බවට හෝ ඔහුගේ සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් තොර බවට පෙන්වා දීමට කිසිදු කරුණක් සාක්ෂි සාරාංශය අනුව පෙනී යන්නේ නැත. ඒ අනුව පැමිණිල්ලේ සාක්ෂි ඉසදීන් මොහොමඩ් ජියුසුෆ්ගේ (පැ.සා. 1371) සාක්ෂිය සම්පූර්ණයෙන්ම පිළිගත යුතු බව ප්‍රකාශ වේ. මෙහිදී ලාෆීර් නැමැති අය මියගොස් තිබීම පැමිණිල්ලේ යම් දුර්වලතාවයක් ඇති කරන්නේ ද යන්න සැලකිල්ලට ගත යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් විමර්ශන පවත්වා අදාළ ලේඛන පරීක්ෂා කළ බවත්, වෙනත් පුද්ගලයන්ට විකුණා ඇති චෝටර්ජෙල් කරල් සම්බන්ධයෙන් ද පරීක්ෂා කළ බවත් පැහැදිලි කර දී ඇත. ඒ අනුව 16 වන චූදිත විසින් 2019 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් කාලයේදී සාමාන්‍ය ඩෙටනේටර් 1700ක් (හෝ 1800ක්), චෝටර්ජෙල් කරල් 850ක් සහ සේවානූල් රෝල් 6ක් හෝ 7ක් ඉෂදීන් මොහොමඩ් යුසුෆ් නැමැති සාක්ෂිකරුගෙන් ලබාගෙන තිබීම සැකයකින් තොරව අධිකරණය ඉදිරියේ සනාථ වී ඇත.

තවද මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැමිනිල්ලේ 2266 වන සාක්ෂිකරු වන උදුමා ලෙබ්බේ මහම්මදු හුසේයින් විසින් දෙන ලද සාක්ෂියේ දී 16 වන චූදිත ඔහු විසින් සාමාන්‍ය භාෂාවේ දී කරල් යනුවෙන් හඳුන්වනු ලබන ඩයිනමයිට් කරල් 100 ක් පමණ ඉල්ලා සිටි බවට දෙන ලද සාක්ෂිය හරස් ප්‍රශ්න වලදී හබ වී නොමැති අතර එම සාක්ෂිකරුට මුදල් අපහසුතාවය නිසා රු.25000/- ක මුදලක් උදව්වක් වශයෙන් දුන්නේ යැයි යෝජනාව එම සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර තිබීම තුළින් වැඩිදුරටත් පෙනී යන්නේ 16 වන චූදිත පුපුරන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරය සිදුවීමට මාස ගණනාවට පෙර සිටම උත්සාහ දරා ඇති බවත් ඉහත සඳහන් කර යූසුප් නැමැති සාක්ෂිකරුගේ පාස්කු ප්‍රහාරයට ආසන්නතම මාස 3 ක කාලය තුලදී පුපුරන ද්‍රව්‍ය කරල් නැතහොත් වෝටර් ජෙල් 850 ක වැනි විශාල ප්‍රමාණයක්ද ඩෙටනේටර් 1700 ක් - 1800 ක් පමණ ප්‍රමාණයක් මිළදී ගත් බවට ඔහු සාක්ෂියෙන් තහවුරු වී ඇති බවයි.

16 වන චූදිත විසින් විත්ති කූඩුවේ කරනු ලබන ප්‍රකාශයේ දී කියා සිටින ලද්දේ ඔහුට කුස්සියක් සහ වැසිකිළියක් සෑදීම සඳහා යුසුප් යන අයගෙන් ගල් වෙඩි බෙහෙත් ලබා ගත් බවත් එසේම හුසේයින් යන අයගෙන්ද ඔහුගේ මුල්‍යමය අපහසුකම් දැක අනුකම්පා කර රු.25000/- ක් ලබා දුන් බවත්ය, නමුත් එම සාක්ෂිකරුවන් දෙදෙනාම හරස් ප්‍රශ්න වලදී එම ස්ථාවරයන් ඉතා පැහැදිලිව ප්‍රතික්ෂෙප කරමින් දිවුරුම් පිට සාක්ෂි ලබා දී 16 වන චූදිත පුපුරන ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ඒවා මිළදී ගැනීම සඳහා

හුසේයින් යන අයගෙන් ඉල්ලා සිටි බවට දුන් සාක්ෂිය සහ ඉසදීන් මොහොමඩ් යුසුෆ්ගේ (පැ.සා. 1371) සාක්ෂිය අනුව ලබා ගෙන ඇති වෝටර් ජෙල් කරල් ප්‍රමාණය 850 ක් වැනි විශාල ප්‍රමාණයක් වන අතර, ඩෙටනේටර් සංඛ්‍යාව 1700 කට වැඩි බව යන්න ද සැළකිල්ලට ගැනීමේ දී පැමිණිල්ලේ සාක්ෂිය පිළිනොගෙන ඉවත දැමීමට තරම් එම විත්තිකුඩුවේ සිට කරන ලද ප්‍රකාශය හේතු නොවන බව අප හට පෙනී යයි.

මෙම පුපුරණ ද්‍රව්‍ය 16 වන චූදිත වෙත ලබා දීම සම්බන්ධයෙන් විමර්ශන පවත්වන ලද කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක රසාංගා නිල්මිණි මෙන්ඩිස් (පැ.සා. 1987) විසින් දෙන ලද සාක්ෂිය ඉහත සාරාංශ ගත කොට දක්වා ඇති අතර එහිදී ඉතා පැහැදිලිවම 16 වන චූදිත සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ වලදී ඉහත නම් සඳහන් සාක්ෂිකරුවන්ගේ එකී පුපුරන ද්‍රව්‍ය නැතහොත් වෝටර් ජෙල් 16 වන චූදිතට විකුණූ බව කියන මොහොමඩ් යූසුප් යන අයගේ ප්‍රකාශ සටහන් කර තිබීමත් ඒ අනුව ඉහත සඳහන් සලීම් හලීම් ගේ සිට නිමල් ජයකොඩි දක්වාත් වැන්සියස් ලාවුස් යන අය සම්බන්ධයෙන් ද විමර්ශනය කර ඇති බව අනාවරණය වන අතර ඇයගේ සාක්ෂියේ වැදගත් කරුණක් එනම් මෙම වෝටර් ජෙල් මිළදී ගත් අය අතරින් කරුණාරත්න නැමැති අයකු විසින් ද වෝටර් ජෙල් මිළදී ගත්තද ඒවා ලේඛන ගත කොට නිසි පරිදි ගල්කොරියේ වැඩ කටයුතු සඳහා යොදා ගෙන තිබූ බව අනාවරණය වූ බවට කියා සිටීම සැලකිල්ලට ගැනීමේ දී එම විමර්ශනය විධිමත්ව

නිසියාකාරව කර ඇති බවට පැහැදිලිව සනාථ වන බැවින් ඉහත සාක්ෂි කරුවන්ගේ සාක්ෂි විමර්ශනයෙන් අනාවරණය වී ඇති කරුණු අනුව ඉහත 17 වන චෝදනාවේ සඳහන් පරිදි එම කාලය තුළදී ජෙලිටි නයිට් කූරු තොගයක් සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේහි ලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් එනම්, පැමිණිල්ල ප්‍රමාණය නොදත් ඩෙටනේටර් සහ සේවා නූල් (ඩෙට් කෝඩ්) ප්‍රමාණයක් නීත්‍යානුකූල බලයක් නොමැතිව එකතු කර ඇති බවත් ඉහත සාක්ෂි මගින් පැහැදිලිව සනාථ වී ඇත.

ඒ අනුව පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි මගින් 16 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් 17 වන චෝදනාව සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇති බව අප තීරණය කරමු.

එසේම මෙම නඩුවේ 18 චෝදනාව 02 චූදිත ගපූර් යන අයට එරෙහිව ඉදිරිපත් කර ඇති අතර එකී චෝදනාවේ සඳහන් කරුණු මෙම නඩුවේ පැමිනිල්ලෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂි මගින් ඔප්පු වී ඇති බවට අප නිරීක්ෂණය කරමු.

19 චෝදනාව 8 චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති අතර 20 චෝදනාව 3 චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති ඔවුන් දෙදෙනා විසින් ම මෙම නඩුවේ 16 චූදිත හට ඩෙටනේටර් සහ සේවා නූල් එක්‍රැස් කිරීමට ආධාර හා අනුබල දීම සිදු කර ඇති ආකාරය මෙම නඩුවේ ඉදිරිපත් වූ

සාක්ෂි ලබා දුන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිද් දිසානායකගේ සාක්ෂිය අනුව මෙම 3 සහ 8 චූදිතයින් ගේ ප්‍රකාශයන් තුලින් හෙලි වූ කරුණු අනුව ඔවුන්ගේ ප්‍රකාශයන් මත 2019-6-27 දින ඔල්ලිකුලම යන ප්‍රදේශයේ දී ජෙලටිනයිට් කූරු සහ ඩෙටනේටර්ස් විශාල තොගයක් සාක්ෂි පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව සොයාගෙන තිබීම තුලින් සහ අදාල ලකුණු කරන ලද නඩු භාණ්ඩ තුලින් ඉහත කී චෝදනාවන් ද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවට අප තීරණය කරමු.

අධිචෝදනා පත්‍රයෙහි 221 සිට 245 වගන්තිය දක්වා වූ චෝදනාවන් එනම් යම් නිශ්චිත තැනැත්තෙකු වන වෙල්සි ඩෙකමිනාඩා යන අයගේ මරණය සිදුකිරීම සම්බන්ධයෙන් වේ. වෙල්සි ඩෙකැමිනාඩා යන අය කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ 2019-4-21 දින සිදු වූ සිදුවීමේ දී මියගොස් ඇති කරුණ මෙම නඩුවේ දෙපාර්ශවය විසින් ම පිළිගැනීමක් ලෙස වාර්තා කර ඇත. මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි අංක 1852 කාන්තා පොලිස් පරීක්ෂක චමිලා නිරෝෂිණි අමරසිරි විසින් සලකුණු කරන ලද පැ. 2031 දරන ලේඛනයට අමුණා ඇති ඇමුණුම අනුව

“The purpose of TRAN-LUU and DECAMINADA's travel was for official U.S. Government business. After breakfast, TRAN-LUU could not sleep and suggested to DECAMINADA they find the conference room in the hotel, which was the location for the next

day's workshop that TRAN-LUU and DECAMINADA organized for four partner nations. TRAN-LUU stated they departed their hotel rooms at approximately 8:00am After locating the conference room, TRAN-LUU suggested they visit a restaurant in the hotel to have coffee. The two women arrived at the restaurant where TRAN-LUU examined the buffet, poured a cup of coffee, picked some fruit from the buffet, and sat down at a table by the entrance to the restaurant. TRAN-LUU's back was to the restaurant entrance, while DECAMINADA sat across from TRAN-LUU at the table, facing the restaurant entrance. From the brief layout described, TRAN-LUU faced the restaurant and the buffet. Within what TRAN-LUU remembered as a few minutes after sitting down, an explosion took place.” යනුවෙන් සඳහන් කර ඇති කරුණු අනුව ද වෙල්සි ඩෙකැමිනාඩා යන අය ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රික කටයුත්තක් සම්බන්ධව මෙරටට පැමිණි නිලධාරිණියක් බව මනාව තහවුරු වී ඇත. ඒ අනුව අධිචෝදනා පත්‍රයෙහි 221 සිට 245 වගන්තිය දක්වා වූ චෝදනාවන් වල සංඝටකයන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇත.

කෙසේ වෙතත් අප මෙම තීන්දුවේ දී 01 චෝදනාව වන කුමන්ත්‍රනය කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් මෙම නඩුවේ චූදිතයින් අතුරින් 1,2,3,4,5,6,7,8,9,10,11,15,16,18 සහ 19 චූදිතයින් හට පමණක්

එරෙහිව සාක්ෂි ඉදිරිපත් වී ඇති පසුබිම තුල එකී චූදිතයින් ට එරෙහිව පමණක් මෙම 221 සිට 245 වගන්තිය දක්වා වූ චෝදනාවන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති බව අප තීරණය කරමු.

මෙම නඩුවේ අධි චෝදනා පත්‍රයේ සඳහන් 246 චෝදනාවේ සිට 23270 දක්වා චෝදනාවන් වලින් මේ වනවිට පැමිණිල්ලෙන් ඉවත් කරගෙන ඇති චෝදනාවන් හැර ඉතිරි අනිකුත් චෝදනාවලින් එක් එක් බෝම්බ පිපිරුණු ස්ථාන වලදී මරණයට පත් වූ සහ තුවාල ලබූ තැනැත්තන්ට අදාල චෝදනා වන අතර 01 චෝදනාවේ සඳහන් කුමන්ත්‍රණයේ ප්‍රතිපලයක් ලෙස එකී වරදවල් සිදු වී ඇති පසුබිම තුල, විශේෂයෙන් 01 චෝදනාවේ සඳහන් වන කුමන්ත්‍රණය කිරීමේ වරදේ ප්‍රතිපලයක් වශයෙන් ඉහත කී බෝම්බ පුපුරුවාහැරීම් සිදු වී ඇති පසුබිම තුල, අප විසින් මෙම තීන්දුවේ පෙර අවස්ථාවල සමස්ථ සාක්ෂි ඇගැයීමේ දී සඳහන් කර ඇති හෙතූන් ප්‍රකාරව මෙම නඩුවේ චූදිතයින් අතුරින් 1,2,3,4,5,6,7,8,9,10,11,15,16,18 සහ 19 චූදිතයින් පමණක් ඉහත කී බෝම්බ පිපිරුම් සිදු කරන ලද මරාගෙන මැරුන එක් එක් බෝම්බ කරුවන් හට අනුබල දීම සිදු කර ඇති බව සධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති බව අප විසින් ඒකමතිකව තීරණය කරමු.

මෙම නඩුවේ 6 වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් ඔහුගේ නඩු විභාගය ඔහු විසින් ම පවත්වාගෙන ගිය අතර ඔහුට

එරෙහිව මෙම නඩුවේ පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනිකුත් චූදිතයින් ට මෙන්ම ඔහුට ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 271 වගන්තිය ප්‍රකාරව දමිළ භාෂාවෙන් ද යලි පහදා දීමට අප මෙමම් නඩුව පුරාවටම කටයුතු කරන ලද අතර ඔහුට සක්ෂිකරුවන් ගෙන් හරස් ප්‍රශ්න ආසීමට අවස්තාව හිමි බවට සැම් විටම පහදා දුන්න ද ඔහු හරස් ප්‍රශ්න ඇසීමක් නොකරන ලදී. ඒ අනුව ඔහුට එරෙහිවපැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂි අවිවාදිතව ඉදිරිපත් වී ඇත. පැමිණිල්ලේ නඩුව අවසානයේ චූද්තයින්ගෙන් විත්ති වාචකය කැදවූ අවස්තාවේ ද ඔහුට වයවස්තාපිතව උරුම වී ඇති අයිතිවාසිකම් අප විසින් පහද දුන්න ද ඔහු විත්තිකූඩුවේ නිහඩව සිටින බවට පවසා එසේ නිහඩව සිටින ලදී.

පානදුර පරත්ත පාරේ පිහිටි නස්මියා විලා නැමැති නිවස මෙම නඩුවට අදාල ස්වයංසාඅතක බෝම්බකරුවන් විසින් ආරාක්ෂිත නිවසක් ලෙස භවිතා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පැමිණිල්ලෙන් සාක්ෂි මෙහෙයවන ලද අතර එම නිවස තුල බෝම්බ සෑදීමට උපයෝගී කරගත් ද්‍රව්‍ය වන ලෝහ බෝල, පුපුරණ ද්‍රව්‍ය, මරාගෙන මරුණ බෝම්බ කරුවන් විසින් පාවිච්චිකරන ලද ඩෙකතලන් ආයතනයෙන් මිලදී ගෙන ඇති බැක් පැක් බෑග ආදිය ට අදාල ඩෙකතලන් සන්නාමය අඩංගු හිස් බෑග් ආදිය, තිබී සොයාගෙන ඇත. එසේම ඉහත ආරක්ෂිත නිවසට අදාල පැ.833 ලෙස ලකුණු කරන ලද බදු ඔප්පුවේ එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ එනම් කිංග්ස්බරි හෝටලයේ ස්වයංසාතක බෝම්බ

පිපිරීම සිදුකල තැනත්තාගේ සාක්ෂිකරු ලෙස මෙම 06 වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහෙමඩ් රිස්කාන් යන අය අත්සන් කර ඇත. එසේම එම නිවස තුල තිබී මෙම නඩුවේ සාක්ෂි දුන් **පැ.සා.1605 පොලිස් පරීක්ෂක නිශාන්ත රුවන් කුමාර සහ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නාලනි කුමාරි දිසානායක යන අයවළුන්ගේ සාක්ෂි අනුව මෙම නිවසින් නඩු භාණ්ඩ කීපයක් එනම්, විවිධ ප්‍රමාණයේ ස්විච්, වයර්, බැටරි,** PVC **බට, මල්ටිබෝන්ඩ් ලෙස සඳහන් වන ලෝහ කෑනය,** LED **බල්බ් තොගයක්,** Calcium Hypochlorite **වශයෙන් සඳහන් බැරලයක් වැනි දේවල් සොයා ගෙන ඇති අතර, එකී භාණ්ඩ එම නිවස කුලියට ගැනීමෙන් පසුව එම නිවසට රැගෙන එන ලද භාණ්ඩ බවට පෙනී යයි. එසේම එම නිවසේ තිබී** K&H Daio steel ball mfg. Co. Ltd **යනුවෙන් සටහන්ව ඇති පොලිතින් බෑග් විශාල ප්‍රමාණයක්ද,** Decathlon **සන්නාමය සහිත බෑගයක්ද සොයා ගෙන ඇත. මෙම නිවසින් සොයා ගන්නා ලද** PVC **බට කැබැල්ලක් ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ පරීක්ෂාවට ලක් වී ඇති අතර, එම භාණ්ඩ මත වෝටර් ජෙල් කූරු වල අඩංගු පුපුරණ ද්‍රව්‍යයට සමාන ද්‍රව්‍යයක්, එනම්, ඇමෝනියම් නයිට්‍රේට් යන පුපුරණ ද්‍රව්‍යයේ ශේෂද හඳුනා ගෙන ඇත.**

තවද 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් දිනකට පසුව එනම්, 2019.04.22 වන දින කොළඹ ඇඟිලි සටහන්

කාර්යාලයේ නිළධාරීන් විසින් මෙම නිවස පරීක්ෂා කර ඇත. එහිදී මෙම නිවස තුළ තිබී සටහන් කීපයක් සොයා ගෙන ඇති අතර, ඇඟිලි සටහන් රෙජිස්ට්‍රාර් පැ.සා.2307 සේනක කළුආරච්චි යන අයගේ සාක්ෂියට අනුව එම සටහන් අතරින් මෙම 06 වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් ගේ මෙන් ම මරාගෙන මැරුණ ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් නැමත්තාගේ දියණිය වන රුදෙයිනා යන දැරියගේ අතුල් සටහනක් ද මෙම නිවස තුල තිබී සොයාගෙන තිබීම තුලින් පෙනී යන්නේ එම නිවසේ සහරාන් නැමැත්තා ඔහුගේ කුඩා දියණියද සමග සිට ඇති බවට වන අතර ඔවුන්සමග මෙම ඔ6 චූදිත ද එම නිවසේ සිට ඇති බව වේ. ඒ අනුව බලන කල එපමණ පරිවේශණීය සාක්ෂි මෙම **06** චූදිතට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කර තිබිය දී ඒ සම්බන්ධයෙන් කිසිදු පැහැදිලිකිරීමක් නොකර මෙම චූදිත නිහඬව නිෂ්ශබ්ධව සිටීම ඔහුට එරෙහිවම යුක්තිසහගත අනුමිතියකට එලඹීමට අපහට කිසිදු බාධාවක් නැත.

තවද මෙම **6** චූදිත තමා සමග කටුවාපිටිය නිවසක සිට තමාගේ ලොරියට එම තැනැත්තා තමා සමග ලොරියේ වාඩි වී ගිය බවත් ඉන්පසු ඔහු සමග කල්මුණේට ගොස් කල්මුණේ සමන්තුරේ නමැති ප්‍රදේශයට ගිය බවත් සමන්තුරේ සහ නින්දවූර් ප්‍රදේශවලට ගිය බවත් තමාලා මුලින්ම ගියේ සමන්තුරේ නිවසට බවත් එම ස්ථානය සෙන්නෙල් ග්‍රාමම් නමැති

ප්‍රදේශය බවට පසුව තමා දැනගත් බවත් සාක්ෂිකරු පවසා ඇත. එම තට්ටු දෙකේ ගෙදර ගේට්ටුව දමා හොඳට තාප්පයක් ගසා තිබුණු බවත් රෝලර් ඩෝර් වර්ගයේ දොරක් දමා තිබුණු බවත් එම රෝලර් ඩෝර් එක තිබුණු කාමරයට තමාලා බඩු බෑම සිදු කළ බවත් පවසා ඇත.

පසුව විමර්ශන නිලධාරීන් විසින් එම නිවසෙන් සොයාගෙන තිබූ භාණ්ඩ රාශියක් මෙම අධිකරණයේ ලකුණු කරන ලද අතර් නිල්පාට ප්ලාස්ටික් බූලි **11**ක් සහ කළු පාට වර්ණයෙන් යුත් ප්ලාස්ටික් බූලි **04**ක්ද තිබෙන ආකාරය සාක්ෂිකරු විසින් හඳුනාගෙන ඇත. එම බූලි වල නයිට්‍රික් ඇසිඩ්, සල්ෆියුරික් ඇසිඩ් තිබූ බවට රජයේ රස පරීක්ෂකගේ සාක්ෂි තුලින් හෙලි වී ඇත.

එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක **838** ශාන්ත ලාල් විසින් මෙම **6** වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන තැනැත්තා ව අධිකරණයේ දී ද හඳුනාගෙන තමා සමග තම ලොරියෙන් ඉහත් අපරිඩ්ජ්හි තමා සමගම වාඩි වී ගමන් කරන ලද තැනත්තා ම බවට හඳුණාගෙන සාක්ෂි ලබා දීම තුලින් මෙම **6** චූදිත මෙම සාක්ශිකරුගේ ලොරියෙන් කටුවාපිටියේ නිවසේ සිට ඉහත පරිදි නැගෙනහිර පලාතේ සම්මන්තුරෙ, නින්තවුර්, සෙන්නල් ග්‍රාමම් ආදී ප්‍රදේශවල පිහිටි නිවෙස් වලට රැගෙන ගොස් ඇත්තේ බෝම්බ සෑදීමට අවශ්‍ය කරන ද්‍රව්‍ය ආදිය බව ට මෙම අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි තුලින් මනාව හෙලි වී ඇත. එවන්

පසුබිමක් තුල මෙම 6 චූදිත කිසිදු පැහැදිලිකිරීමක් හෝ ඉහත සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමක් හෝ නොකර නිශ්ෂබ්දව සිටීම තුලින් ම එය ඔහුට එරෙහිව අනුමිතීන්ට එලඹීමට අපහට බාධාවක් නැත. අපරාධ නඩුවල දී ඔප්පුකිරීමෙ භාරය සම්පූර්ණයෙන් පැවරෙන්නේ පැමිණිල්ලට පමණක් බවත් චූදිතයෙකු හට එරෙහිව පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පුකරන තුරු චූද්තට නිහඬව සිටිය හැකි බවටත් වන නෛතික තත්වය අප මනාව අවබෝධකරගෙන සිටින අතර මෙහි දී එලන්බරෝ සිද්ධාන්තය (Ellenborough Dictum) මෙම 6 චූදිත සම්බන්ධයෙන් අදාල කර ගැනීමට අප තීරණය කරමු. එකී නෛතික තත්වය *Mohamed Niyas Noufer(Potta Noufer) vs AG (SC)Appeal (TAB) 01/2006 (HC Colombo-TAB 2365/2005* යන නඩුවේ දී අපගේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විස්තරාත්මකව පෙන්වා දී ඇත. **තව ද *Ajith Samarakoon vs Republic(Kobeigane Murder case) 2004(2) SLR-209*** යන නඩුවේ දී පෙන් වා දී ඇති

“ The incriminating circumstances established against him gave rise to presumptions and inferences which shifted the evidential burden as opposed to the legal burden to explain away the highly incriminating circumstances". යන්න අප මෙම නඩුවේ 6 චූදිත සම්බන්ධයෙන් ද අදාල කර ගනිමු. එමෙන් ම **අභියාචනාධිකරණය විසින්**

Malwanne Hewavitharanage Samantha Pushpakumara vs AG(C/A) HC/87/2010 යන නඩුවේ දී පෙන්වා දී ඇති

"Although there cannot be a direction that the accused person must explain each and every circumstance relied on by the prosecution and the fundamental principle being that no person accused of a crime is bound to offer any explanation of his conduct, there are permissible limitations in which it would be necessary for a suspect to explain the circumstances of suspicion which are attached to him."

ඉහත සියළු පරිවේශණයන් හ නෛතික තත්වයන් එක්ව ගෙන සලකා බැලීමේ දී මෙම නඩුවේ දී 6 වූදිත ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති සාක්ෂි සම්බන්ධයෙන් හුදෙක් නිශ්ෂබ්ධව සිටීම සම්බන්ධයෙන් ඉහත කී නෛත්ක සිද්ධාන්තයන් ඔහුට එරෙහිව ආරෝපණය කර ගැනීමට අප තීරණය කරමු.ඒ අනුව මෙම නඩුවේ සියළු සාක්ෂි සැලකිල්ලට ගැනීමේ දී 6 වූදිත රිස්කාන් හට එරෙහිව ඉදිරිපත් කර ඇති සියළුම චෝදනාවන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී ඇති බවට අප ඒකමතිකව තීරණය කරමු.

<u>අවසාන නිගමනය</u>

මෙම තීන්දුව අප තිදෙනාම පොදුවේ ඒකමතිකව පිළියෙල කරන ලද තීන්දුවක් වන අතර, එසේ වුවද මෙම නඩුවට අදාළව දෙපාර්ශවය විසින් ම ඉදිරිපත් කරන ලද සියලුම සාක්ෂි මුල් අවස්ථාවේදී වෙන් වෙන්ව විශ්ලේෂණය කර සළකා බැලීමෙන් පසු වෙන් වෙන්ව තීරණයන්ට එළඹුන අතර, අප තිදෙනාගේ එකී සියළු තීරණයන් ඒකමතික වීම හේතුවෙන් විනිසුරුවරුන් තිදෙනාම මෙලෙස එක් තීන්දුවක් සමස්ථ අධිකරණයේ තීන්දුවක් (Judgment of Court) ලෙස පිළියෙල කර මෙසේ ප්‍රකාශ කිරීමට කටයුතු කරන ලදී.

අප විසින් මෙම තීන්දුවට එළඹීම සඳහා මෙම නඩු විභාගයේදී ඉදිරිපත් වූ සියළු සාක්ෂි මෙන්ම දෙපාර්ශවය විසින් ම ගොනු කරන ලද ලිඛිත දේශනයන් හි අඩංගු කරුණු ද අපගේ සැලකිල්ලට ගන්නා ලදී. එසේම මෙම නඩුවේ මේ වනවිට සිටින චූදිතයින් 24 දෙනාට එරෙහිව ඉදිරිපත් කරන ලද සියළු සාක්ෂි අප විසින් එක් එක් චූදිත සම්බන්ධයෙන් වෙන් වෙන් ව සළකා බලන ලදී. එසේම මෙම නඩුවේ 6 චූදිත වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් හෙවත් අබු තාරික් යන චූදිත හැර අනිකුත් සියළුම චූදිතයින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් සියල්ලම අප විසින් මනාව විශ්ලේශණය කර ඇගැයීමට ලක් කරන ලදී. ඒ අනුව එකී විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් හි සාක්ෂිමය වටිනාකම

සම්බන්ධයෙන් අප එලඹුණු නිගමනයන් සහ එකී නිගමනයන්ට එලඹීමට හේතූන් සියල්ල ද අප විසින් මෙම ඒකමතික තීන්දුවේ ඉහතින් විස්තරාත්මකව සඳහන් කර ඇත.

අපරාධ නඩුවක් වන මෙම නඩුවේ සියළුම චූදිතයින් ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවන් වල අනිවාර්යයෙන් ඔප්පු කලයුතු සංඝටකයන් මෙන් ම පැමිණිල්ල විසින් එක් එක් චෝදනාවේ සංඝටකයන් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතු බවට වන නෛතික ඔප්පුකිරීමේ භාරය සහ සියළුම චූදිතයින් ගේ නිර්දෝෂීභාවයේ පූර්ව නිගමන අප මෙම නඩුවේ ආරම්භයේ සිට අවසානය දක්වාම අපගේ සිත් වල යලි යලිත් ධාරණය කරන ලදී.

මෙම නඩුවේ සියළුම චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවන් ඉතා බරපතළ ගණයේ චෝදනාවන් වන අතර අප විසින් විවෘත මනසින් යුතුව එකී සියළුම චෝදනාවන් වෙන් වෙන් ව සළකා බලන ලදි. මෙම නඩුවෙහි සිද්ධිමය කරුණු වල ස්වභාවය තුල මෙම නඩුවේ චූදිතයින් සම්බන්ධයෙන් විවිධ සමාජ මාධ්‍යයන් ඔස්සේ පල කෙරෙන්නා වූ විවිධ වූ උපකල්පනයන් සහ අදහස් දැක්වීම් මෙම නඩුවෙහි කිසිදු චූදිතයෙකුට එරෙහිව කිසිසේත් අප විසින් සළකා නොබැලූ අතර අප විසින් මෙම ඒකමතික තීන්දුවෙහි මතු සඳහන් කෙරෙන අවසාන

නිගමනයන් සඳහා අප ඉදිරියේ ඉදිරිපත් වූ නෛතිකමය සාක්ෂි පමණක් අප විසින් සැලකිල්ලට ගන්නා ලදී.

මෙම නඩුවේ පැමිණිල්ලෙන් පරිවේශණීය සාක්ෂි ගනණාවක් ඉදිරිපත් කර ඇති අතර් එකී සියළුම සාක්ෂි අප විසින් විශ්ලේශණාත්මකව සැලකිල්ලට ගන්නා ලදී. අප විසින් මෙම තීන්දුවේ සඳහන් කර ඇති නිගමනයන් ට එලඹීම සඳහා එකී සියළු පරිවේශණයන් එක්ව සැලකිල්ලට ගෙන එකම සහ ඒකායන අනුමිතියකට අප තිදෙනාම ඒකමතිකව එලඹෙන ලදී.

ඒ අනුව අප විසින් ඒකමතිකව සඳහන් කර ඇති හේතූන් වලට යටත්ව මෙම නඩුවේ 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 11, 15, 16, 18 සහ 19 යන චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් කර ඇති සියළුම චෝදනාවන් මෙම නඩුවේ පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවට අප තිදෙනා ඒකමතිකව තීරණය කරමු.

තවද මෙම නඩුවේ 10 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවන් අතුරින් 16 වන චෝදනාව හැර අනෙකුත් සියළුම චෝදනාවන් පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවට අප තිදෙනා ඒකමතිකව තීරණය කරමු.

මෙම නඩුවේ 01 චූදිත වන මුහම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මව්ලවි යන අයව ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති 1, 2,

21, 46, 71,96, 121, 146, 171, 196, 221, 246, 271, 296, 321, 346, 371, 396, 421, 446, 471, 496, 521, 546, 571, 596, 621, 646, 671, 696, 721, 746, 771796, 821, 846, 871, 896, 921, 946, 971, 996, 1021, 1046, 1071, 1096, 1121, 1146, 1171, 1196, 1221, 1246, 1271, 1296, 1321, 1346, 1371, 1396, 1421, 1446, 1471, 1496, 1521, 1546, 1571, 1596, 1621, 1646, 1671, 1696, 1721, 1746, 1771, 1796, 1821, 1846, 1871, 1896, 1921, 1946, 1971, 1996, 2021, 2046, 2071, 2096, 2121, 2146, 2171, 2196, 2221, 2246, 2271, 2296, 2321, 2346, 2371, 2396, 2421, 2446, 2471, 2496, 2521, 2546, 2571, 2596, 2621, 2646, 2671, 2696, 2721, 2746, 2771, 2796, 2821, 2846, 2871, 2896, 2921, 2946, 2971, 2996, 3021, 3046, 3071, 30963121, 3146, 3171, 3196, 3221, 3246, 3271, 3296, 3321, 3346, 3371, 3396, 3421, 3446, 3471, 3496, 3521, 3546, 3571, 3596, 3621, 3646, 3671, 3696, 3721, 3746, 3771, 3796, 3821, 3846, 3871, 3896, 3921, 3946, 3971, 3996, 4021, 4046, 4071, 4096, 4121, 4146, 4171, 4196, 4221, 4246, 4271, 4296, 4321, 4346, 4371, 4396, 4421, 4446, 4471, 4496, 4521, 4546, 4571, 4596, 4621, 4646, 4671, 4696, 4721, චෝදනා අංක 4746, 4771, 4796, 4821, 4846, 4871, 4896, 4921, 4946, 4971, 4996, 5021, 5046, 5071, 5096, 5121, 5146, 5171, 5196, , 5221, 5246, 5271, 5296, 5321, 5346, 5371, 5396, 5421, 5446, 5471, 5496, 5521, 5546, 5571, 5596, 5621,

5646, 5671, 5696, 5721, 5746, 5771, 5796, 5821, 5846, 5871, 5896, 5921, 5946, 5971, 5996, 6021, 6046, 6071, 6096, 6121, 6146, 6171, 6196 , 6221, 6246, 6271, 6296, 6321, 6346, 6371, 6396, 6421, 6446, 6471, 6496, 6521, 6546, 6571, 6596, 6621, 6646, 6671, 6696, 6721, 6746, 6771, 6796, 6821, 6846, 6871, 6896, 6921, 6946, 6971, 6996, 7021, 7046, 7071, 7096, 7121, 7146, 7171, 7196, 7221, 7246, 7271, 7296, 7321, 7346, 7371, 7396, 7421, 7446, 7471, 7496, 7521, 7546, 7571, 7596, 7621, 7646, 7671, 7696, 7721, 7746, 7771, 7796, 7821, 7846, 7871, 7896, 7921, 7946, 7971, 7996, 8021, 8046, 8071, 8096, 8121, 8146, 8171, 8196, 8221, 8246, 8271, 8296, 8321, 8346, 8371, 8396, 8421, 8446, 8471, 8496, 8521, 8546, 8571, 8596, 8621, 8646, 8671, 8696, 8721, 8746, 8771, 8796, 8821, 8846, 8871, 8896, 8921, 8946, 8971, 8996, 9021, 9046, 9071, 9096, 9121, 9146, 9171, 9196, 9221, 9246, 9271, 9296, 9346, 9371, 9396, 9421, 9446, 9471, 9496, 9521, 9546, 9571, 9596, 9621, 9646, 9671, 9696, 9721, 9746, 9771, 9796, 9821, 9846, 9871, 9896, 9921, 9946, 9971, 9996, 10046, 10071, 10096, 10121, 10146, 10171, 10196, 10221, 10246, 10271, 10296, 10321, 10346, 10371, 10396, 10421, 10446, 10471, 10496, 10521, 10546, 10571, 10596, 10621, 10646, 10671, 10696, 10721, 10746, 10771, 10796, 10871, 10896, 10921, 10946, 10971, 10996,

11021, 11046, 11071, 11096, 11121, 11146, 11171, 11196, 11221, 11246, 11271, 11296, 11321, 11346, 11371, 11396, 11421, 11446, 11471, 11496, 11521, 11546, 11571, 11596, 11621, 11646, 11671, 11696, 11721, 11746, 11771, 11796, 11821, 11846, 11871, 11896, 11921, 11946, 11971, 11996, 12021, 12046, 12071, 12096, 12121, 12146, 12171, 12196, 12221, 12246, 12271, 12296, 12321, 12346, 12371, 12396, 12421, 12446, 12471, 12496, 12521, 12546, 12571, 12596, 12621, 12646, 12671, 12696, 12721, 12746, 12771, 12796, 12821, 12846, 12871, 12896, 12921, 12946, 12971, 12996, 13021, 13046, 13071, 13096, 13121, 13146, 13171, 13221, 13246, 13271, 13296, 13321, 13346, 13396, 13421, 13446, 13471, 13496, 13521, 13546, 13571, 13596, 13621, 13646, 13671, 13696, 13721, 13746, 13771, 13796, 13821, 13846, 13896, 13921, 13946, 13971, 13996, 14021, 14046, 14071, 14096, 14121, 14146, 14171, 14196, 14221, 14246, 14296, 14321, 14346, 14371, 14396, 14421, 14446, 14471, 14496, 14521, 14571, 14596, 14621, 14646, 14671, 14696, 14721, 14746, 14771, 14796, 14821, 14846, 14871, 14896, 14921, 14946, 14971, 14996, 15046, 15071, 15096, 15121, 15146, 15171, 15196, 15221, 15246, 15321, 15346, 15371, 15396, 15421, 15446, 15471, 15496, 15521, 15546, 15571, 15596, 15621, 15646, 15671, 15696,

15721, 15746, 15771, 15796, 15821, 15846, 15871, 15896, 15921, 15946, 15971, 15996, 16021, 16046, 16071, 16096, 16121, 16146, 16171, 16196, 16221, 16246, 16271, 16296, 16321, 16346, 16371, 16396, 16421, 16446, 16471, 16496, 16521, 16546, 16571, 16596, 16621, 16646, 16671, 16696, 16721, 16746, 16771, 16796, 16821, 16846, 16871, 16896, 16921, 16946, 16971, 16996, 17021, 17046, 17071, 17096, 17121, 17146, 17171, 17196, 17221, 17246, 17271, 17296, 17321, 17346, 17371, 17396, 17421, 17446, 17471, 17496, 17521, 17546, 17571, 17596, 17621, 17646, 17671, 17696, 17721, 17746, 17771, 17796, 17821, 17846, 17871, 17896, 17921, 17946, 17971, 17996, 18021, 18046, 18071, 18096, 18121, 18146, 18171, 18196, 18221, 18246, 18271, 18296, 18321, 18346, 18371, 18396, 18421, 18446, 18471, 18496, 18521, 18546, 18571, 18596, 18621, 18646, 18671, 18696, 18721, 18746, 18771, 18796, 18821, 18846, 18896, 18921, 18946, 18971, 18996, 19021, 19046, 19071, 19096, 19121, 19146, 19171, 19196, 19221, 19246, 19271, 19296, 19321, 19346, 19371, 19396, 19421, 19446, 19471, 19496, 19521, 19546, 19571, 19596, 19621, 19646, 19671, 19696, 19721, 19746, 19771, 19796, 19821, 19846, 19871, 19896, 1992119946, 19971, 19996, 20021, 20046, 20071, 20096, 20121, 20146, 20171, 20196, 20221,

2024620271, 20296, 20321, 20346, 20371, 20396, 20421, 20446, 20471, 20496, 20521, 20546, 2057120596, 20621, 20646, 20671, 20696, 20721, 20746, 20771, 20796, 20821, 20846, 20871, 2089620921, 20946, 20971, 20996, 21021, 21046, 21071, 21096, 21121, 21146, 21171, 21196, 2122121246, 21271, 21296, 21321, 21346, 21371, 21396, 21421, 21446, 21471, 21496, 21521, 21546, 21571, 21596, 21621, 21646, 21671, 21696, 21721, 21746, 21771, 21796, 21821, 21846, 21871, 21896, 21921, 21946, 21971, 21996, 22021, 22046, 22071, 22096, 22121, 22146, 22171, 22196, 22221, 22246, 22271, 22296, 22321, 22346, 22371, 22396, 22421, 22446, 22471, 22496, 22521, 22546, 22571, 22596, 22621, 22646, 22671, 22696, 22721, 22746, 22771, 22796, 22821, 22846, 22871, 22896, 22921, 22946, 22971, 22996, 23021, 23046, 23071, 23096, 23121, 23146, 23171, 23196, 23221, 23246 යන චෝදනා වලට වෙන් වෙන්ව වරදකරු කරනු ලැබේ.

මෙම නඩුවේ 02 වූදිත වන මොහොමඩ් සරිබු ආදම් ලෙබ්බේ හෙවත් මොහොමඩ් සරීෆ් ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා හෙවත් අබු හදීත් යන අයව ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති 10, 18, 22, 47, 72, 97, 122, 147, 172, 197, 222, 247, 272, 297, 322, 347, 372, 397, 422, 447, 472, 497, 522, 547, 572, 597, 622, 647, 672, 697, 722, 747, 772, 797,

